තුන්වැනි කොටස

තුන්වැනි කොටස

මහ බැංකුවේ සහ ශ්‍රී ලංකාවේ බැංකු ආයතනවල වැඩ කටයුතු හා මෙහෙයුම්වලට අදාළ රජය හා මුදල් මණ්ඩලය විසින් වසර තුළදී උපයෝගී කරගනු ලැබූ පරිපාලන විධිවිධාන

මෙහෙයුම් උපදෙස්, චක්‍රලේඛ, නියෝග සහ නිවේදන

		යොමු අංකය	පිටුව
බැංකු අධීක්ෂණ			
1.	චක්‍රලේඛය 2021 අංක 01 : කුඩා හා මධ්‍ය පරිමාණ වී මෝල් ව්‍යාපාරිකයන්ට එරෙහිව ගනු ලබන ණය ආපසු අයකරගැනීමේ ක්‍රියාමාර්ග අත්හිටුවීම		1
2.	බැංකු පනත් විධාන 2021 අංක 01 : බලපත්‍රලාභී බැංකුවල අභිමතානුසාරී ගෙවීම් මත පනවනු ලබන සීමාවන්		1
3.	බැංකු පනත් විධාන 2021 අංක 02 : බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සිදු කරනු ලබන ඉදිරි විකුණුම් සහ විදේශ විනිමය මිල දී ගැනුම්		2
4.	බැංකු පනත් විධාන 2021 අංක 03 : බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා බාසල් III යටතේ ප්‍රාග්ධන අවශ්‍යතා සම්බන්ධ විධානයන්ට සිදු කරනු ලබන සංශෝධන		3
5.	චක්‍රලේඛය 2021 අංක 02 : ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 09 : මූල්‍ය උපකරණ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත භාවිතා කිරීමට අදාළව නිකුත් කරන ලද 2018 අංක 04 දරන මාර්ගෝපදේශයට කරන ලද සංශෝධන		4
6.	චක්‍රලේඛය 2021 අංක 03 : මගී ප්‍රවාහන අංශයේ ව්‍යාපාර සහ පුද්ගලයන් විසින් ලබාගත් කල්බදු පහසුකම් සඳහා වන සහන		4
7.	බැංකු පනත් විධාන 2021 අංක 04 : බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව මගින් ශ්‍රී ලංකා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර වල සිදු කරන ආයෝජන		6
8.	චක්‍රලේඛය 2021 අංක 04 : කොවිඩ්-19 නිසා බලපෑමට පත් සංචාරක ක්ෂේත්‍රයේ නියුතු ව්‍යාපාර හා පුද්ගලයන් වෙත ලබා දුන් ණය සහන කාලය දීර්ඝ කිරීම		6
9.	බැංකු පනත් විධාන 2021 අංක 05 : බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව මගින් ශ්‍රී ලංකා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර වල සිදුකරන ආයෝජන		7
10.	මුදල් නීති පනත් නියෝගය 2021 අංක 01 : ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශ වලට ණය ලබාදීම සම්බන්ධව බලපත්‍රලාභී වාණිජ බැංකු හා බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා ප්‍රමුඛතා අංශ ණය දීමේ ඉලක්ක		8
11.	බැංකු පනත් විධාන 2021 අංක 06 : බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව මගින් ශ්‍රී ලංකා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර වල සිදුකරන ආයෝජන		9
12.	බැංකු පනත් විධාන 2021 අංක 07 : බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සිදු කරනු ලබන ඉදිරි විකුණුම් සහ විදේශ විනිමය මිල දී ගැනුම්		9
13.	බැංකු පනත් විධාන 2021 අංක 08 : බලපත්‍රලාභී බැංකු විසින් සිදු කරනු ලබන විදේශ විනිමය ණය ගැනීම් පිළිබඳව වන 2018 අංක 11 දරන බැංකු පනත් විධාන සංශෝධනය කිරීම		10

		යොමු අංකය	පිටුව
14.	චක්‍රලේඛය 2021 අංක 05 : කොවිඩ්-19 වසංගතය හේතුවෙන් බලපෑමට ලක්වූ ව්‍යාපාර සහ පුද්ගලයන්ට සහන සැලසීම		10
15.	චක්‍රලේඛය 2021 අංක 06 : කොවිඩ්-19 වසංගතය මධ්‍යයේ බැංකු සේවා සැපයීම		12
16.	බැංකු පනත් විධාන 2021 අංක 09 : බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා ප්‍රතිසාධන සැලසුම්		13
17.	බැංකු පනත් විධාන 2021 අංක 10 : බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව මගින් ශ්‍රී ලංකා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල ආයෝජනය කිරීම පිළිබඳ බැංකු පනත් විධානය		16
18.	බැංකු පනත් නියෝග 2021 අංක 01 : බැංකුකරණ (අක්වෙරළ බැංකුකරණ ව්‍යාපාර යෝජනාක්‍රමය) නියෝග - නම්කරන ලද විදේශ ව්‍යවහාර මුදල්		16
19.	බැංකු පනත් විධාන 2021 අංක 11 : බලපත්‍රලාභී බැංකුවල අභිමතානුසාරී ගෙවීම් මත පනවනු ලබන සීමා		17
20.	චක්‍රලේඛය 2021 අංක 07 : පවතින නිරෝධායන ඇඳිරිනීති කාලසීමාව තුළ බැංකු සේවා සැපයීම		18
21.	මුදල් නීති පනත් නියෝගය 2021 අංක 02 : බලපත්‍රලාභී වාණිජ බැංකු වල හා ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙහි විදේශ විනිමය තැන්පතු සඳහා වන උපරිම පොලී අනුපාත		19
22.	චක්‍රලේඛය 2021 අංක 08 : කොවිඩ්-19 නිසා බලපෑමට ලක්වූ ව්‍යාපාර සහ පුද්ගලයන්ට සහන සැලසීම		19
23.	චක්‍රලේඛය 2021 අංක 09 : ලංකා රේටිං ඒජන්සි ලිමිටඩ් පිළිගත හැකි ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනයක් ලෙස නම්කිරීම		22
24.	බැංකු පනත් විධාන 2021 අංක 12 : ආනයනවලට එරෙහිව ආන්තික අවශ්‍යතා		22
25.	චක්‍රලේඛය 2021 අංක 10 : කොවිඩ්-19 නිසා බලපෑමට ලක්වූ සංචාරක ක්ෂේත්‍රයේ නිරත ව්‍යාපාර හා පුද්ගලයන් හට ලබාදුන් ණය සහන කාලය දීර්ඝ කිරීම		23
26.	බැංකු පනත් විධාන 2021 අංක 13 : බලපත්‍රලාභී බැංකු වල ණය පහසුකම් වර්ගීකරණය, හඳුනාගැනීම හා මිනුම් කිරීම		25
27.	බැංකු පනත් විධාන 2021 අංක 14 : බලපත්‍රලාභී බැංකු වල ණය පහසුකම් නොවන අනෙකුත් මූල්‍ය වත්කම් වර්ගීකරණය, හඳුනාගැනීම සහ මැනීම		33
28.	චක්‍රලේඛය 2021 අංක 11 : බලපත්‍රලාභී බැංකුවල ණය පහසුකම් සහ අනෙකුත් මූල්‍ය වත්කම් වර්ගීකරණය, හඳුනාගැනීම සහ මිනුම්කරණය පිළිබඳ බැංකු පනතේ විධාන සඳහා පරිපූරක චක්‍රලේඛය		37
29.	බැංකු පනත් විධාන 2021 අංක 15 : ආනයනවලට එරෙහිව ආන්තික අවශ්‍යතා		38
30.	චක්‍රලේඛය 2021 අංක 12 : මගී ප්‍රවාහන ක්ෂේත්‍රයේ නියුතු ව්‍යාපාර සහ පුද්ගලයින් විසින් ලබා ගෙන ඇති කල්බදු පහසුකම් සඳහා සහන සැලසීම		38
31.	බැංකු පනත් විධාන 2021 අංක 16 : බලපත්‍රලාභී බැංකු වල තාක්ෂණික අවදානම් කළමනාකරණය හා ඔරොත්තු දීමේ හැකියාව සඳහා වන නියාමන රාමුව		39
32.	චක්‍රලේඛය 2021 අංක 13 : කොවිඩ්-19 නිසා බලපෑමට පත් ණය ගැනුම්කරුවන්ට එරෙහිව ණය ආපසු අයකරගැනීමේ ක්‍රියාමාර්ග කල් දැමීම		40
33.	බැංකු පනත් නීර්ණය 2021 අංක 01 : බලපත්‍රලාභි වාණිජ බැංකු සහ බලපත්‍රලාභි විශේෂිත බැංකු සඳහා වාර්ෂික බලපත්‍ර ගාස්තු		41

		යොමු අංකය	පිටුව
34.	මුදල් නීති පනත් නියෝගය 2021 අංක 03 : බලපත්‍රලාභී වාණිජ බැංකු වල හා ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙහි විදේශ මුදල් තැන්පතු සඳහා වන උපරිම පොලී අනුපාත		41
35.	මුදල් නීති පනත් නියෝගය 2021 අංක 04 : උකස්කර මත ලබා දෙන නිවාස ණය සඳහා අයකළ හැකි උපරිම පොලී අනුපාත සඳහා වන 2020 අංක 03 දරන මුදල් නීති පනත් විධානය සඳහා සංශෝධනය		43
ව්‍යවහාර මුදල්			
36.	ශ්‍රී ලංකා මුදල් නෝට්ටු ප්‍රතිනිෂ්පාදනය පිළිබඳ මාර්ගෝපදේශ		44
දේශීය මෙහෙයුම් කටයුතු			
37.	චක්‍රලේඛ අංක : 2021 අංක 01 වෙළඳපොළ මෙහෙයුම් කටයුතු සඳහා වන ඒකාබද්ධ මෙහෙයුම් උපදෙස්		48
38.	මෙහෙයුම් උපදෙස් අංක 35/01/005/0007/18 : සංචිත අවශ්‍යතා		63
39.	ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් 1949 අංක 58 දරන මුදල් නීති පනතේ අංක 103 වන වගන්තියේ විධිවිධානවලට අනුව ණයවර ලිපි මත මුදල් ආන්තික තැන්පතු පවත්වාගෙන යාමේ අවශ්‍යතාව පිළිබඳ නියෝගය		64
40.	ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් 1949 අංක 58 දරන මුදල් නීති පනතේ අංක 103 වන වගන්තියේ විධිවිධානවලට අනුව ණයවර ලිපි මත මුදල් ආන්තික තැන්පතු පවත්වාගෙන යාමේ අවශ්‍යතාව පිළිබඳ නියෝගය - (ඉහත නියෝගය ඉවත් කරගැනීම)		70
විදේශ විනිමය			
41.	2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2021 අංක 01 දරන විධානයන් : බලපත්‍රලාභී මූල්‍ය සමාගම් සඳහා තාවකාලික විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් සම්බන්ධයෙන් බලයලත් වෙළඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්		70
42.	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය (අතිවිශෙෂ) : අංක 2213/34 - 2021 පෙබරවාරි මස 03 වැනි බදාදා - 2017 අංක 12 දරන විදේශ විනිමය පනත	2213/34	71
43.	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය (අතිවිශෙෂ) : අංක 2213/35 - 2021 පෙබරවාරි මස 03 වැනි බදාදා - 2017 අංක 12 දරන විදේශ විනිමය පනත	2213/35	79
44.	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය (අතිවිශෙෂ) : අංක 2213/36 - 2021 පෙබරවාරි මස 03 වැනි බදාදා - 2017 අංක 12 දරන විදේශ විනිමය පනත	2213/36	90
45.	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය (අතිවිශෙෂ) : අංක 2213/37 - 2021 පෙබරවාරි මස 03 වැනි බදාදා - 2017 අංක 12 දරන විදේශ විනිමය පනත	2213/37	96
46.	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය (අතිවිශෙෂ) : අංක 2213/38 - 2021 පෙබරවාරි මස 03 වැනි බදාදා - 2017 අංක 12 දරන විදේශ විනිමය පනත	2213/38	100
47.	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය (අතිවිශෙෂ) : අංක 2213/39 - 2021 පෙබරවාරි මස 03 වැනි බදාදා - 2017 අංක 12 දරන විදේශ විනිමය පනත	2213/39	104
48.	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය (අතිවිශෙෂ) : අංක 2213/40 - 2021 පෙබරවාරි මස 03 වැනි බදාදා - 2017 අංක 12 දරන විදේශ විනිමය පනත	2213/40	107

		යොමු අංකය	පිටුව
49.	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය (අතිවිශෙෂ) : අංක 2215/39 - 2021 පෙබරවාරි මස 18 වැනි බ්‍රහස්පතින්දා	2215/39	108
50.	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය (අතිවිශෙෂ) : අංක 2218/38 - 2021 මාර්තු මස 09 වැනි අඟහරුවාදා	2218/38	109
51.	2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2021 අංක 02 දරන විධානයන් : ජංගම ගනුදෙනු සම්බන්ධයෙන් බලයලත් වෙළඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්		110
52.	2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2021 අංක 03 දරන විධානයන් : විද්‍යුත් මුදල් මාරු කිරීමේ කාඩ්පත් සම්බන්ධයෙන් බලයලත් වෙළඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්		116
53.	2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2021 අංක 04 දරන විධානයන් : පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් පිළිබඳව බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්		120
54.	2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2021 අංක 05 දරන විධානයන් : ව්‍යාපාරික විදේශ ව්‍යවහාර ගිණුම් (BFCAs) පිළිබඳව බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්		124
55.	2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2021 අංක 06 දරන විධානයන් : රාජ්‍යතාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (DFCAs) සහ රාජ්‍යතාන්ත්‍රික රුපියල් ගිණුම් (DRAs) පිළිබඳව බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරන විධානයන්		131
56.	2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2021 අංක 07 දරන විධානයන් : ජ්‍යෙෂ්ඨ විදේශීය ජාතිකයන්ගේ - විශේෂ ගිණුම් පිළිබඳව බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්		133
57.	2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2021 අංක 08 දරන විධානයන් : නේවාසික ආගන්තුකයින් සඳහා වන යෝජනා ක්‍රමය - (විශේෂිත ගිණුම්) පිළිබඳව බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්		136
58.	2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2021 අංක 09 දරන විධානයන් : ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හිමියන් සඳහා වූ ණය පහසුකම් සම්බන්ධයෙන් බලයලත් වෙළඳුන් වෙත නිකුත් කරන ලද විධානයන්		140
59.	2017 අංක 17 දරන විදේශ විනිමය පනත යටතේ 2021 අංක 10 දරන විධානයන් : විදේශයන්හි සේවා නියුක්ත ශ්‍රී ලාංකිකයන් (විගාමිකයන් හැරුණු කොට) හට ණය සහ අත්තිකාරම් ලබා දීම පිළිබඳව බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්		143
60.	2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2021 අංක 11 දරන විධානයන් : ශ්‍රී ලංකාවෙන් පිටත වෙනත් රටක නිත්‍ය වාසික වීසා (PR) සහ ද්විත්ව පුරවැසිභාවය ලබා සිටින ශ්‍රී ලංකිකයන්හට ලබා දෙන ණය පිළිබඳ බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්		146
61.	2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2021 අංක 12 දරන විධානයන් : බලයලත් වෙළෙඳුන් සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සඳහා අනුමත නියෝජිතයින් ලෙස පත් කරන ලද ප්‍රාථමික වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්		149
62.	2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ වන 2021 අංක 13 දරන විධානයන් : විදේශ විනිමය විකුණුම් (1 පෝරමය) සහ විදේශ විනිමය මිල දී ගැනුම් (2 පෝරමය) පිළිබඳව බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්		150

		යොමු අංකය	පිටුව
63.	2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2021 අංක 14 දරන විධානයන් : ප්‍රතිමුබ ආයෝජන ගිණුම් පිළිබඳව බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්		154
64.	2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2021 අංක 15 දරන විධානයන් : ආමුබ ආයෝජන ගිණුම් සම්බන්ධයෙන් බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්		160
65.	2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2021 අංක 16 දරන විධානයන් : ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් පිළිබඳ බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්		165
66.	2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2021 අංක 17 දරන විධානයන් : විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුම් සම්බන්ධයෙන් බලයලත් වෙළඳුන් වෙත නිකුත් කරන ලද විධානයන්		172
67.	2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2021 අංක 18 දරන විධානයන් : අනේවාසික රුපියල් ගිණුම් පිළිබඳව බලයලත් වෙළඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්		176
68.	2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2021 අංක 19 දරන විධානයන් : විදේශීය වාණිජ ණය ගැනීමේ ගිණුම් පිළිබඳව බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්		180
69.	2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2021 අංක 20 දරන විධානයන් : ජංගම හා ප්‍රාග්ධන ගනුදෙනුවලට අදාළ ඇපකර නිකුත් කිරීම හා අලුත් කිරීම පිළිබඳව බලයලත් වෙළඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්		183
70.	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය (අතිවිශෙෂ) : අංක 2220/69 - 2021 මාර්තු මස 26 වැනි සිකුරාදා - 2017 අංක 12 දරන විදේශ විනිමය පනත	2220/69	186
71.	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය (අතිවිශෙෂ) : අංක 2222/37 - 2021 අප්‍රේල් මස 07 වැනි බදාදා - 2017 අංක 12 දරන විදේශ විනිමය පනත	2222/37	187
72.	2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2021 අංක 21 දරන විධානයන් : විශේෂ තැන්පතු ගිණුම පිළිබඳව බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරන විධානයන්		187
73.	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය (අතිවිශෙෂ) : අංක 2222/60 - 2021 අප්‍රේල් මස 09 වැනි සිකුරාදා - 1949 අංක 58 දරන මුදල් නීති පනත	2222/60	194
74.	2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2021 අංක 22 දරන විධානයන් : ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි හෝටල් වෙත නිකුත් කරනු ලබන විධානයන්		194
75.	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය (අතිවිශෙෂ) : අංක 2229/5 - 2021 මැයි මස 25 වැනි අඟහරුවාදා - 2017 අංක 12 දරන විදේශ විනිමය පනත	2229/5	196
76.	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය (අතිවිශෙෂ) : අංක 2229/9 - 2021 මැයි මස 28 වැනි සිකුරාදා - 1949 අංක 58 දරන මුදල් නීති පනත	2229/9	197
77.	2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2021 අංක 23 දරන විධානයන් : රාජ්‍ය තාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් සහ රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුම් පිළිබඳව බලයලත් වෙළඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්		198
78.	2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2021 අංක 24 දරන විධානයන් : ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම පිළිබඳව බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්		198

		යොමු අංකය	පිටුව
79.	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය (අතිවිශෙෂ) : අංක 2234/19 - 2021 ජූනි මස 30 වැනි බදාදා - 2017 අංක 12 දරන විදේශ විනිමය පනත	2234/19	199
80.	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය (අතිවිශෙෂ) : අංක 2234/20 - 2021 ජූනි මස 30 වැනි බදාදා - 2017 අංක 12 දරන විදේශ විනිමය පනත	2234/20	200
81.	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය (අතිවිශෙෂ) : අංක 2234/49 - 2021 ජූලි මස 02 වැනි සිකුරාදා - 2017 අංක 12 දරන විදේශ විනිමය පනත	2234/49	201
82.	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය (අතිවිශෙෂ) : අංක 2235/22 - 2021 ජූලි මස 06 වැනි අඟහරුවාදා - 2017 අංක 12 දරන විදේශ විනිමය පනත	2235/22	202
83.	2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2021 අංක 25 දරන විධානයන් : විශේෂ තැන්පතු ගිණුම් පිළිබඳව බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරන විධානයන්		204
84.	2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2021 අංක 26 දරන විධානයන් : කොළඹ කොටස් හුවමාරුවෙහි විදේශ ව්‍යවහාර මුදලින් නිරූපිත ආයෝජන සඳහා පහසුකම් සැලසීම සඳහා පවත්වාගෙන යන විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් සම්බන්ධව බලයලත් වෙළෙඳුන් හට නිකුත් කෙරෙන විධානයන්		210
85.	2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2021 අංක 27 දරන විධානයන් : ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් සම්බන්ධයෙන් බලයලත් වෙළඳුන් වෙත නිකුත් කරන ලද විධානයන්		213
86.	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය (අතිවිශෙෂ) : අංක 2251/42 - 2021 ඔක්තෝම්බර් මස 28 වැනි බ්‍රහස්පතින්දා - 1949 අංක 58 දරන මුදල් නීති පනත	2251/42	213
87.	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය (අතිවිශෙෂ) : අංක 2258/23 - 2021 දෙසැම්බර් මස 15 වැනි බදාදා - 2017 අංක 12 දරන විදේශ විනිමය පනත	2258/23	215
88.	2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2021 අංක 28 දරන විධානයන් : ජංගම ගනුදෙනු සඳහා පහසුකම් සැලසීමට ආයෝජිතයා සඳහා විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (SFCA - ආයෝජිතයා) පිළිබඳව බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරන විධානයන්		215
89.	2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2021 අංක 29 දරන විධානයන් : ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හිමියන්හට ලබා දෙන පහසුකම් පිළිබඳව බලයලත් වෙළඳුන් වෙත නිකුත් කරන ලද විධානයන්		217

මූල්‍ය බුද්ධි ඒකකය

90.	චක්‍රලේඛ අංක 01/2021 : මාර්ගගත ගෙවීම් පද්ධතීන් හා සම්බන්ධ වන පාර්ශ්වයන්ට අදාලව මුදල් විශුද්ධිකරණය වැලැක්වීම හා ත්‍රස්තවාදීන්ට අරමුදල් සැපයීම මැඩපැවැත්වීමට අදාල ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම	037/05/006/0004/018	217
91.	චක්‍රලේඛ අංක 02/2021 : ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර හරහා විදේශ මුදල් පිටතට ගලා යාමේ ප්‍රවණතා : විදේශයන්හි දී මුදල් ආපසු ගැනීම්	037/03/009/0001/021	218
92.	චක්‍රලේඛ අංක 03/2021 : කොවිඩ්-19 වසංගතයේ තුන්වන රැල්ල සමග නැගී එන මුදල් විශුද්ධිකරණය/ත්‍රස්තවාදයට අරමුදල් සැපයීමේ අවදානම අවම කිරීමට අවශ්‍ය අතිරේක පියවර	037 /05/003/0005/016	218

		යොමු අංකය	පිටුව
93.	මාර්ගෝපදේශ අංක 02/2021 : මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීමේ අරමුණ ඇතිව සංවෘතරූපවාහිනී පද්ධති (CCTV) මෙහෙයුම් සම්බන්ධයෙන් මූල්‍ය ආයතන වෙත නිකුත් කරනු ලබන 2021 අංක 02 දරන මාර්ගෝපදේශයන්	037/06/008/0006/020	219
94.	චක්‍රලේඛ අංක 04/2021 : 2021 අංක 18 දරන මුදල් පනත යටතේ කරන ලද තැන්පතු		222

ජාත්‍යන්තර මෙහෙයුම්

95.	"විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සඳහා දිරි දීමනා යෝජනා ක්‍රමය" සම්බන්ධයෙන් බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස් සඳහා සංශෝධන	33/04/012/0011/005	223
96.	"විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සඳහා දිරි දීමනා යෝජනා ක්‍රමය" සම්බන්ධයෙන් බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස් සඳහා සංශෝධන	33/04/012/0011/006	224
97.	බලපත්‍රලාභී බැංකු සඳහා "අපනයන ආදායම ශ්‍රී ලංකාවට ආපසු ගෙන්වා ගැනීම" හා සම්බන්ධ මෙහෙයුම් උපදෙස්	33/04/012/0011/007	225
98.	"විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සඳහා දිරි දීමනා යෝජනා ක්‍රමය" සම්බන්ධයෙන් බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස් සඳහා සංශෝධන	33/04/ 012/ 0011/008	229
99.	"අපනයන ආදායම ශ්‍රී ලංකාවට ආපසු ගෙන්වා ගැනීම" සම්බන්ධයෙන් බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස් සඳහා සංශෝධන	33/04/012/ 0011/ 009	229
100.	ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වනු ලබන, එක්සත් ජනපද ඩොලර්/ ශ්‍රී ලංකා රුපියල් ගැණුම් - විකුණුම් හුවමාරු විදේශ මුදල් ගිවිසුම් වෙන්දේසි සඳහා සහභාගීවීමට අදාළව බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව වෙත මෙහෙයුම් උපදෙස්	33/04/012/0011/002	229
101.	"විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සඳහා දිරි දීමනා යෝජනා ක්‍රමය" සම්බන්ධයෙන් බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස්	33/04/012/0011/10	231
102.	"අපනයන ආදායම ශ්‍රී ලංකාවට ආපසු ගෙන්වා ගැනීම" සම්බන්ධයෙන් බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස්	33/04/012/0011/11	232
103.	අපනයන ආදායම අපනයනකරුවන්ගේ අදාළ (විදේශ මුදල්) ගිණුම් වෙත බැර කිරීම සම්බන්ධයෙන් බලපත්‍රලාභී බැංකු වෙත මෙහෙයුම් උපදෙස්	33/ 04/012/0011/ 12	234
104.	"අපනයන ආදායම ශ්‍රී ලංකාවට ආපසු ගෙන්වා ගැනීම" සම්බන්ධයෙන් බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලද සංශෝධිත මෙහෙයුම් උපදෙස්	33/04/012/0011/13	234
105.	"විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සඳහා ලබා දෙන අතිරේක දිරි දීමනා යෝජනා ක්‍රමය" පිළිබඳ මෙහෙයුම් උපදෙස්	33/04/012/0011/014	237
106.	"අතැ'ති විදේශ මුදල් තැන්පත් කිරීම, හුවමාරු කිරීම සහ ආයෝජනය කිරීම සඳහා මහජනතාව වෙත ලබාදී ඇති දිරිගැන්වීම්" පිළිබඳ මෙහෙයුම් උපදෙස්	33/04/012/0011/015	237
107.	"අතැ'ති විදේශ මුදල් තැන්පත් කිරීම, පරිවර්තනය කිරීම සහ ආයෝජනය කිරීම සඳහා මහජනතාව දිරිගැන්වීම" පිළිබඳ සංශෝධිත මෙහෙයුම් උපදෙස්	33/04/012/0011/016	240
108.	"සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සඳහා දිරිගැන්වීමේ යෝජනා ක්‍රමය", "අපනයන ආදායම ශ්‍රී ලංකාවට ආපසු ගෙන්වා ගැනීම", "සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සඳහා අමතර දිරි දීමනා යෝජනා ක්‍රමය" සහ "අතැ'ති විදේශ මුදල් තැන්පත් කිරීම, පරිවර්තනය කිරීම සහ ආයෝජනය කිරීම සඳහා මහජනතාව දිරිගැන්වීම" පිළිබඳ සංශෝධිත මෙහෙයුම් උපදෙස්	33/04/012/0011/017	241

		යොමු අංකය	පිටුව
රාජ්‍ය ණය			
109.	මාර්ගෝපදේශ අංකය : SSSS/01/2021 : ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු තොරතුරු වාර්තා කිරීම සහ නිර්ලේඛිත සුරැකුම්පත් පියවීමේ පද්ධතිය වෙත සුරැකුම්පත් පියවීමේ උපදෙස් එවීම සඳහා වන මාර්ගෝපදේශයන්	08/25/001/0005/001	242
110.	චක්‍රලේඛ අංකය: PDD/01/2021: චක්‍රලේඛය - රජයේ සුරැකුම්පත් ගනුදෙනු වාර්තාකරණය (ද්විතීයික වෙළඳපොළ)	08/25/001/0005/001	242
111.	භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රාථමික නිකුතුව සඳහා වන විධානයන්	08/21/005/012/007	245
ගෙවීම් සහ පියවීම්			
112.	ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 01/2021 : ලංකාසෙට්ල් පද්ධතියේ දෛනික මෙහෙයුම් කාල සටහන සංශෝධනය කිරීම	34/07/029/0001/002	245
113.	ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 02/2021 : 2021 අප්‍රේල් 30 වන දින සඳහා වූ ලංකාසෙට්ල් පද්ධතියෙහි විශේෂිත දෛනික මෙහෙයුම් කාල සටහන	34/07/029/0001/002	248
114.	ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 03/2021 : 2021.05.11, 2021.05.12 සහ 2021.05.13 දින වලට අදාළ ලංකාසෙට්ල් පද්ධතියේ විශේෂිත දෛනික මෙහෙයුම් කාල සටහන	34/07/029/0001/002	249
115.	ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 04/2021 : 2021 මැයි 17 දින සිට ලංකාසෙට්ල් පද්ධතියේ දෛනික මෙහෙයුම් වේලාවන් සීමා කිරීම	34/07/029/0001/002	252
116.	ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 05/2021 : ලංකාසෙට්ල් පද්ධතියේ දෛනික මෙහෙයුම් කාල සටහන සංශෝධනය කිරීම	34/07/029/0001/002	254
117.	ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 06/2021 : 2021.05.28 වන දින සිට ලංකාසෙට්ල් පද්ධතියේ මෙහෙයුම් වේලාවන් සීමා කිරීම	34/07/029/0001/002	256
118.	අතිරේකය 3 - ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 02/2019 දේශීය ගෙවීම් සඳහා ජාතික QR කේත ප්‍රමිතියක් පිහිටුවීම	34/01/025/0038/003	259
119.	ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 07/2021 : 2021.06.23 සහ 2021.06.25 දෙදින සඳහා වූ ලංකාසෙට්ල් පද්ධතියෙහි විශේෂිත දෛනික මෙහෙයුම් කාල සටහන	34/07/029/0001/002	259
120.	ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 08/2021 : 2021.07.12 දින සිට ලංකාසෙට්ල් පද්ධතියේ දෛනික මෙහෙයුම් කාල සටහන	34/07/029/0001/002	262
121.	ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 09/2021 : ලංකාසෙට්ල් පද්ධතියේ නීති නව සංස්කරණය - 2.2 සංස්කරණය	34/07/029/0001/002	265
122.	ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 10/2021 : 2021 දෙසැම්බර් 09 සහ 10 දිනයන්හිදී ලංකාසෙට්ල් පද්ධතියේ සජීව මෙහෙයුම් කටයුතු ප්‍රතිප්‍රාප්ති වැඩබිමෙහි සිට සිදු කිරීම	34/01/024/0106/06	265
123.	ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 11/2021 : 2021 දෙසැම්බර් 24 වන දින සඳහා වූ ලංකාසෙට්ල් පද්ධතියෙහි විශේෂිත දෛනික මෙහෙයුම් කාල සටහන	34/07/029/0001/002	266
124.	අතිරේකය 4 - ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 02/2019 දේශීය ගෙවීම් සඳහා ජාතික QR කේත ප්‍රමිතියක් පිහිටුවීම	34/01/025/0038/003	268

		යොමු අංකය	පිටුව
ප්‍රාදේශීය සංවර්ධන			
125.	සෞභාග්‍යා කොවිඩ් - 19 පුනරුද පහසුකම : සංචාරක කර්මාන්තය තුළ ව්‍යාපාර සහ තනි පුද්ගල ව්‍යාපාර සඳහා ලබාදෙන ලද සහන දීර්ඝ කිරීම.	32/04/034/0001/001	269
126.	නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමයෙහි මෙහෙයුම් උපදෙස් සඳහා වන සංශෝධනය - 'සරුසාර' ණය ඇප ආවරණය සහ පොලී සහනාධාර යෝජනා ක්‍රමය	RDD/ NCRCS/2011/2021/01	270
127.	නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමයේ මෙහෙයුම් උපදෙස් සඳහා වන සංශෝධන	RDD/ NCRCS/2011/2021/02	283
128.	දේශීය කෘෂිකාර්මික සංවර්ධන (DAD) වැඩසටහන - නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වන මෙහෙයුම් උපදෙස්	RDD/DAD-PP/2021/01	284
129.	සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකම : සහන දීර්ඝ කිරීම	32/04/034/0001/001	306
130.	සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද ණය සහන ණය පහසුකම: සංචාරක කර්මාන්තයේ නියුතු ව්‍යාපාර සහ පුද්ගලයින් සඳහා ලබා දුන් සහන දීර්ඝ කිරීම, සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකම : සහන දීර්ඝ කිරීම	32/04/034/0001/001	308
131.	මෙහෙයුම් උපදෙස් : ශ්‍රී ලංකාවේ සහල් මෝල් හිමියන් වෙත ලබා දීමට නියමිත ණය සඳහා ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය	RDD/CG/ RM/2021/01	308
132.	සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ දෙවන ණය ප්‍රතිපාදනය සම්බන්ධ මෙහෙයුම් උපදෙස් සංශෝධනය සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ලියාපදිංචි අයදුම්පත් යොමු කිරීමේ ක්‍රියාවලිය සරල කිරීම	RDD/PR/2010/03 (A-06)	318
133.	සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකම: සංචාරක ක්ෂේත්‍රයෙහි ව්‍යාපාර සහ පුද්ගලයන් සඳහා සපයන ලද සහන දීර්ඝ කිරීම, සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකම: සහන දීර්ඝ කිරීම.	32/04/034/0001/001	328
134.	ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක කරන ලද ණය යෝජනාක්‍රම යටතේ ණය ඇප ආවරණ ඉල්ලීම් ඉදිරිපත් කිරීම සඳහා උපදෙස්	32/04/034/0001/001	329
135.	2021.09.01 දිනැති 2021 අංක 08 දරන මුදල් මණ්ඩල චක්‍රලේඛනය ප්‍රකාරව කුඩා පරිමාණ තේ සහ රබර් පුනර්ජීවන ව්‍යාපෘතිය යටතේ ලබා ගත් ණය සඳහා ලබා දීමට අපේක්ෂිත සහන		329
136.	2021.09.01 දිනැති 2021 අංක 08 දරන මුදල් මණ්ඩල චක්‍රලේඛනය ප්‍රකාරව කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගිත්ව වැඩසටහන (SAPP) යටතේ ක්‍රියාත්මක කරන ලද ණය යෝජනා ක්‍රම යටතේ ලබා ගත් ණය සඳහා ලබාදීමට අපේක්ෂිත ණය සහන		331
137.	සෞභාග්‍යා කොවිඩ් - 19 පුනරුද සහන ණය පහසුකම: සංචාරක කර්මාන්තයේ නියුතු ව්‍යාපාර සහ තනි පුද්ගල ව්‍යාපාර සඳහා සපයන ලද සහන දීර්ඝ කිරීම,සෞභාග්‍යා කොවිඩ් - 19 පුනරුද සහන ණය පහසුකම : සහන කාලය දීර්ඝ කිරීම.	32/04/034/0001/001	333
138.	2021.09.01 දාතම 2021 අංක 08 දරන මුදල් මණ්ඩල චක්‍රලේඛය ප්‍රකාරව සැපයුම් දාම යළි ශක්තිමත් කිරීමේ ණය යෝජනා ක්‍රමය යටතේ ලබා ගත් ණය සඳහා ප්‍රදානය කළ සහන		336
139.	කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගිත්ව වැඩසටහන (SAPP) යටතේ ක්‍රියාත්මක චක්‍රීය (RF) ණය යෝජනා ක්‍රමයෙහි මෙහෙයුම් උපදෙස් සඳහා වන දෙවන සංශෝධනය	RDD/ SAPP/RF/2019/01 (සංශෝධනය - 02)	337

		යොමු අංකය	පිටුව
140.	කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගිත්ව වැඩසටහන (SAPP) යටතේ ක්‍රියාත්මක 4P ණය යෝජනා ක්‍රමයෙහි මෙහෙයුම් උපදෙස් සඳහා වන දෙවන සංශෝධනය	RDD/SAPP/ 4P/2019/01 (සංශෝධනය - 02)	338
141.	මෙහෙයුම් උපදෙස් : රාජ්‍ය ව්‍යවසායයන් යළි නඟා සිටුවීම සඳහා නව ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රමය : (සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකම අදියර IV)	RDD/COVID19- Phase IV/2021/01	339
142.	"ස්වශක්ති - රැකියා මිලියනයක් කරා" යන ණය යෝජනා ක්‍රමය යටතේ ලබා ගත් ණය සඳහා ප්‍රදානය කිරීමට නියමිත සහන.	32/004/021/001/005	350
143.	ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද ණය යෝජනාක්‍රම යටතේ ණය ලබාගත් ණය ගනුදෙනුකරුවන් සඳහා ලබා දුන් සහන		352
144.	මෙහෙයුම් උපදෙස් : ශ්‍රී ලංකාව තුළ ඉස්සන් වගා කිරීමේ ගොවිපළ වැඩි දියුණු කිරීම සඳහා වන පොලී සහනාධාර ණය යෝජනා ක්‍රමය	RDD/IS/SF/2021/01	352

නිරාකරණ සහ බලගැන්වීම

145.	2021 අංක 1 දරන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය පිළිබඳ රෙගුලාසි (2010 අංක 1 දරන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය පිළිබඳ රෙගුලාසි සඳහා සංශෝධන)	362
146.	2021 අංක 2 දරන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය පිළිබඳ නව රෙගුලාසි	363

බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ

147.	මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරනු ලබන 2021 අංක 01 දරන විධානය : නිශ්චල දේපල තක්සේරු කිරීමේ විධානය සංශෝධනය කිරීම	370
148.	කල්බදු මූල්‍යකරණ පනත යටතේ නිකුත් කරනු ලබන 2021 අංක 01 දරන විධානය : නිශ්චල දේපල තක්සේරු කිරීමේ විධානය සංශෝධනය කිරීම	371
149.	මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරනු ලබන 2021 අංක 02 දරන විධානය : මෝටර් වාහන සඳහා ණය පහසුකම් ලබා දීමේ දී වටිනාකම් මත ණය අනුපාත විධානය සංශෝධනය කිරීම	372
150.	කල්බදු මූල්‍යකරණ පනත යටතේ නිකුත් කරනු ලබන 2021 අංක 02 දරන විධානය : මෝටර් වාහන සඳහා ණය පහසුකම් ලබා දීමේ දී වටිනාකම් මත ණය අනුපාත විධානය සංශෝධනය කිරීම	372
151.	2021 අංක 04 දරන චක්‍රලේඛය : මගී ප්‍රවාහන සේවයේ නියුතු ව්‍යාපාර හා පුද්ගලයන් විසින් ලබා ගත් කල්බදු මූල්‍යකරණ පහසුකම් (ලීසිං) සඳහා ලබා දෙන සහන යෝජනා ක්‍රමය	372
152.	2021 අංක 05 දරන චක්‍රලේඛය : කොවිඩ්-19 නිසා බලපෑමට පත් සංචාරක ක්ෂේත්‍රයේ නියුතු ව්‍යාපාර හා පුද්ගලයන් වෙත ලබා දුන් ණය සහන කාලය දීර්ඝ කිරීම	374
153.	මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරනු ලබන 2021 අංක 03 දරන විධානය : ද්‍රවශීල වත්කම් විධානය සංශෝධනය කිරීම	375
154.	කල්බදු මූල්‍යකරණ පනත යටතේ නිකුත් කරනු ලබන 2021 අංක 03 දරන විධානය : ද්‍රවශීල වත්කම් විධානය සංශෝධනය කිරීම	376

		යොමු අංකය	පිටුව
155.	මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරනු ලබන 2021 අංක 04 දරන විධානය : විදේශ ව්‍යාවහාර මුදල් ණය ගැනීම්		376
156.	2021 අංක 06 දරන චක්‍රලේඛය : කොවිඩ්-19 නිසා බලපෑමට ලක් වූ ව්‍යාපාර හා පුද්ගලයන් සඳහා සහන සැලසීම		378
157.	දේශීය භාණ්ඩාගාර බිල්පත් අඥාපනත සහ ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් අඥාපනත යටතේ නිකුත් කරනු ලබන 2021 අංක 01 දරන විධානය : ප්‍රාථමික අලෙවිකාර සමාගම්වල අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය		380
158.	2021 අංක 07 දරන චක්‍රලේඛය : කොවිඩ්-19 නිසා බලපෑමට ලක් වූ ව්‍යාපාර හා පුද්ගලයන් සඳහා සහන සැලසීම සඳහා නිකුත් කරන ලද 2021 අංක 06 දරන චක්‍රලේඛය සඳහා සංශෝධන		383
159.	2021 අංක 08 දරන චක්‍රලේඛය : ලංකා රේටින් ඒජන්සි ලිමිටඩ් පිළිගත හැකි ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනයක් ලෙස පිළිගැනීම		383
160.	2021 අංක 09 දරන චක්‍රලේඛය : කොවිඩ්-19 හේතුවෙන් බලපෑමට ලක් වූ ව්‍යාපාර සහ පුද්ගලයන් සඳහා ලබා දුන් සහන දීර්ඝ කිරීම		384
161.	මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරනු ලබන 2021 අංක 05 දරන විධානය : ආයතනික යහපාලනය		386
162.	මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරනු ලබන 2021 අංක 06 දරන විධානය : ප්‍රධාන වගකිව යුතු පුද්ගලයන්ගේ යෝග්‍යතාවය තක්සේරු කිරීම		406

චක්‍රලේඛය 2021 අංක 01 2021 ජනවාරි 13

කුඩා හා මධ්‍ය පරිමාණ වී මෝල් ව්‍යාපාරිකයන්ට එරෙහිව ගනු ලබන ණය ආපසු අයකරගැනීමේ ක්‍රියාමාර්ග අත්හිටුවීම

කොවිඩ්-19 වසංගතය හේතුවෙන් බලපෑමට පත් කුඩා හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් හට එළඹෙන අස්වනු නෙලීමේ කාලය සඳහා සහන සැලසීමට රජය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග සලකා බලමින්, බලපත්‍රලාභී වාණිජ බැංකු හා බලපත්‍රලාභී විශේෂිත බැංකු (මින් ඉදිරියට බලපත්‍රලාභී බැංකු ලෙස හැඳින්වෙන) විසින් කුඩා හා මධ්‍ය පරිමාණ වී මෝල් ව්‍යාපාරිකයන්ගෙන් ණය ආපසු අය කර ගැනීමේ ක්‍රියාමාර්ග, 2021 ජනවාරි 01 සිට මාස 06ක කාල සීමාවක් සඳහා අත්හිටුවිය යුතුය.

1. බලපත්‍රලාභී බැංකු විසින් 1990 අංක 04 දරන බැංකු විසින් ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ ප්‍රතිපාදන) පනත හෝ 1949 අංක 06 දරන සංශෝධිත උකස් පනත හෝ 2000 අංක 56 දරන මූල්‍ය කල්බදු පනත හෝ වෙනත් යම් අදාළ පනතක් යටතේ, ණය ආපසු අයකර ගැනීමේ ක්‍රියාමාර්ග අරඹා හෝ ඇරඹීමට දැන්වීම් යවා ඇති අවස්ථාවන් හිදී, එම ක්‍රියාමාර්ග, බලපත්‍රලාභී බැංකුව සහ ගනුදෙනුකරු විසින් ණය ආපසු ගෙවීම සඳහා ගිවිසුමකට එළඹීමේ කොන්දේසිය යටතේ අත්හිටුවිය යුතුය

2. බලපත්‍රලාභී බැංකු විසින් ඉහත පනත් යටතේ ණය හා අත්තිකාරම් නැවත අය කර ගැනීම් සම්බන්ධයෙන් නව යෝජනා සම්මත කර ගැනීම් කල් දැමිය යුතුය. දැනටමත් ණය අයකර ගැනීම සඳහා සම්මත වී ඇති යෝජනා සඳහා වත්කම් වෙන්දේසි කිරීම් 2021.06.30 දක්වා කල් දැමිය යුතුය.

3. ණය ආපසු අය කර ගැනීම සම්බන්ධව අධිකරණයක දැනටමත් නඩු කටයුත්තක් පවතින අවස්ථාවක, ඉහත (1) හි සඳහන් අවශ්‍යතාවන්ට අනුකූල වීම සඳහා ගනුදෙනුකරු විසින් අධිකරණයට දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කර එකඟතාවයකට එළඹීමට අවසර ඇත.

4. බලපත්‍රලාභී බැංකු විසින් අනෙකුත් නීතිමය ක්‍රියාමාර්ග හෝ ණය ආපසු අයකර ගැනීමේ ක්‍රියාමාර්ග 2021.06.30 දක්වා අත්හිටුවිය යුතුය.

අත්සන් කළේ
මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

බැංකු පනත් විධාන 2021 අංක 01 2021 ජනවාරි 19

බලපත්‍රලාභී බැංකුවල අභිමතානුසාරී ගෙවීම් මත පනවනු ලබන සීමාවන්

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් කොවිඩ්-19 ව්‍යාප්තිය හේතුවෙන් බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකුවල (මින් මතු බලපත්‍රලාභී බැංකු ලෙස හැඳින්වෙන) ද්‍රවශීලතාව සහ අනෙකුත් ප්‍රධාන කාර්යසාධන දර්ශක මත ඇති විය හැකි අහිතකර බලපෑම සහ බලපත්‍රලාභී බැංකු තුළ සුදුසු ද්‍රවශීලතා මට්ටම් හා ප්‍රාග්ධන ස්වාරක්ෂක පවත්වා ගෙන යෑමේ වැදගත්කම සැලකිල්ලට ගෙන, බලපත්‍රලාභී බැංකුවල අභිමතානුසාරී ගෙවීම් මත පනවනු ලබන සීමාවන් සම්බන්ධයෙන් පහත විධාන නිකුත් කරනු ලැබේ.

1. බලගැන්වීම	1.1	1988 අංක 30 දරන සංශෝධිත බැංකු පනතේ 46(1) සහ 76 (ඒ) (1) වගන්ති ප්‍රකාරව, බැංකු පද්ධතියේ අඛණ්ඩතාව තහවුරු කිරීම සඳහා, සියලුම නැතහොත් ඕනෑම බලපත්‍රලාභී බැංකුවකට බැංකු ව්‍යාපාරකරණයට අදාළ ඕනෑම පැතිකඩක් සම්බන්ධව විධානයන් නිකුත් කිරීමේ හැකියාව මුදල් මණ්ඩලය සතුවේ.
2. මෙම විධානයන්ගේ අදාළත්වය	2.1	ශ්‍රී ලංකාව තුළ සංස්ථාගත කරන ලද නැතහොත් පිහිටුවන ලද සෑම බලපත්‍රලාභී බැංකුවකට ම සහ ස්වාධීන පදනමක් මත, ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථා ගත කරන ලද නැතහොත් පිහිටුවන ලද බැංකුවක ශාඛාවක් වන, සෑම බලපත්‍රලාභී බැංකුවකට ම මෙම විධානය අදාළ වේ.
3. අභිමතානුසාරී ගෙවීම් මත පනවන සීමා	3.1	ශ්‍රී ලංකාව තුළ සංස්ථා ගත කරන ලද නැතහොත් පිහිටුවන ලද සෑම බලපත්‍රලාභී බැංකුවක් ම එහි බාහිර විගණක විසින් 2020 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ විගණනය අවසන් කරනු ලබන තෙක් ලාභාංශ මුදලින් ගෙවීම කල් දැමිය යුතුය.

3.2 ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථා ගත කරන ලද සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් ම එහි බාහිර විගණක විසින් 2020 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන විගණනය අවසන් කරනු ලබන තෙක් 2019 සහ 2020 මූල්‍ය වර්ෂයන් සඳහා දැනටමත් ප්‍රකාශයට පත් නොකළ ලාභ මෙරටින් බැහැර කිරීම ප්‍රමාද කළ යුතුය.

3.3 බලපත්‍රලාභී බැංකු විසින් මුදලින් ලාභාංශ ගෙවීම සහ ලාභ මෙරටින් බැහැර කිරීමේ දී බලපත්‍රලාභී බැංකු සඳහා නිකුත් කර ඇති බාසල් III ප්‍රාග්ධන අවශ්‍යතා පිළිබඳව වන 2016 අංක 01 දරන බැංකු පනත් විධානයේ අවශ්‍යතා වන අපේක්ෂිත වත්කම් වර්ධනය, ව්‍යාපාර පුළුල් කිරීම සහ කොවිඩ්-19 වසංගතයේ බලපෑම යනාදිය කෙරෙහි නිසි සැලකිල්ල දැක්විය යුතුය.

3.4 වහාම ක්‍රියාත්මක වන පරිදි, බලපත්‍රලාභී බැංකු, 2021 ජූනි 30 වන දින තෙක්;

(අ) ස්වකීය කොටස් ආපසු මිලට ගැනීමෙන් වැළකීම;

(ආ) කළමනාකාරිත්වය සඳහා ගෙවනු ලබන දීමනා සහ අධ්‍යක්ෂ මණ්ඩල වෙත කරනු ලබන ගෙවීම් ඉහළ නැංවීමෙන් වැළකීම;

(ඇ) ප්‍රචාරණය, ව්‍යාපාර ප්‍රවර්ධන, ත්‍යාග යෝජනා ක්‍රම, විනෝදාස්වාදය, අනුග්‍රාහකත්වයන්, සංචාරය සහ පුහුණු කටයුතු යනාදී අත්‍යවශ්‍ය නොවන වියදම් සිදු කිරීමෙන් හැකිතාක් වැළකී සිටීම සහ විචක්ෂණශීලීව ක්‍රියා කිරීම; සහ

(ඈ) ප්‍රාග්ධන වියදම් සිදු කරන්නේ නම්, එහිදී නිසි සැලකිල්ලෙන් සහ ඉතා විචක්ෂණශීලීව කටයුතු කළ යුතුය.

අත්සන් කළේ
මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

බැංකු පනත් විධාන 2021 අංක 02 2021 ජනවාරි 25

බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සිදු කරනු ලබන ඉදිරි විකුණුම් සහ විදේශ විනිමය මිල දී ගැනුම්

1988 අංක 30 දරන සංශෝධිත බැංකු පනතේ 46(1) වගන්තියෙන් පැවරී ඇති බලය ප්‍රකාරව නිකුත් කරන ලදී.

විදේශ විනිමය වෙළඳපොල තුළ පවතින අධික උච්චාවචනය සහ එමඟින් බැංකුවල අවදානම් කළමනාකරණය මත ඇති වන බලපෑම අවම කිරීමේ අරමුණින්, වහාම ක්‍රියාත්මක වන පරිදි, තෙමසක කාලයක් දක්වා විදේශ විනිමය ඉදිරි ගිවිසුම්වලට පිවිසීමෙන් වළකින ලෙස බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

අත්සන් කළේ
මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

බැංකු පනත් විධාන 2021 අංක 03 2021 ජනවාරි 25

බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා බාසල් III යටතේ ප්‍රාග්ධන අවශ්‍යතා සම්බන්ධ විධානයන්ට සිදු කරනු ලබන සංශෝධන

බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා බාසල් III යටතේ ප්‍රාග්ධන අවශ්‍යතා සම්බන්ධව නිකුත් කරන ලද 2016 අංක 01 දරන බැංකු පනත් විධානයන්, පහත විධානයන් මඟින් ප්‍රතිස්ථාපනය කර, සංශෝධනය කරනු ලැබේ.

උපලේඛනය I

පරිශිෂ්ඨය IV

III (අ) කොටස - ණය අවදානම සඳහා අවදානම මත බර තබන ලද අගය ගණනය කිරීම

වෙබ් පදනම් කර ගත් වාර්තාකරණ කේතය	වත්කම්	අවදානම් මත බර තැබීම (%)
20.3.1.1.1.2	**මධ්‍යම රජය සම්බන්ධ විදේශීය හිමිකම්** ශ්‍රී ලංකා රජය සම්බන්ධ සියලු විදේශීය හිමිකම් (අවදානම මත තබන ලද සංශෝධිත බර 2021 වර්ෂය සඳහා පමණක් අදාළ වේ)	10
20.3.1.9.0.0	**නේවාසික දේපළ මඟින් සුරක්ෂිත හිමිකම්** නියාමන ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා සුදුසුකම් ලබන නේවාසික දේපළ මඟින් සුරක්ෂිත අගය සහ නියාමන ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා සුදුසුකම් නොලබන නේවාසික දේපළ මඟින් සුරක්ෂිත හිමිකම්වල අගය සමඟ මෙම අගය සම විය යුතුයි. (වාර්තාකරණ කේත 20.3.1.9.1.0 සිට 20.3.1.9.2.0 දක්වා) ව්‍යාපාරික ඉඩම් සහ දේපළ සඳහා උකස්කර මඟින් සුරක්ෂිත නිරාවරණ මේ සඳහා ඇතුළත් නොකළ යුතුය.	
20.3.1.9.1.0	**නියාමන ප්‍රාග්ධන අරමුණු සඳහා සුදුසුකම් ලබන හිමිකම්** අ) පහත කොන්දේසිවලට යටත්ව, ණය ගැනුම්කරු විසින් අත්පත් කර ගන්නා ලද නැතහොත් අත්පත් කර ගෙන ඇති, හෝ කුලියට දී ඇති එවැනි නේ වාසික දේපළ මඟින් ප්‍රාථමික උකස්කර මඟින් පූර්ණ වශයෙන් සුරක්ෂිත නේවාසික නිවාස ණය. ආ) වරණීය අවදානම් බර භාවිතා කිරීමට හැකි වීම සඳහා හිමිකම්පෑම් පහත සඳහන් සුදුසුකම් නිර්ණායක තදින් සපුරාලිය යුතුය • නවතම තක්සේරු වාර්තාව මත පදනම්ව දේපළවල බලාත්මක විකුණුම් අගය මත අවම වශයෙන් 25% ක ආන්තිකයක්; • දේපළ තක්සේරුකරණය: බැංකු පනත යටතේ නිකුත් කරන ලද ණය සහ අත්තිකාරම් වර්ගීකරණය, ආදායම් හඳුනා ගැනීම සහ ප්‍රතිපාදන වෙන්කිරීම් සම්බන්ධ විධාන තුළ සඳහන් කොන්දේසිවලට යටත්ව බාහිර ස්වාධීන තක්සේරුකරුවෙකු හෝ දේපළ අගයෙහි වර්තමාන අභ්‍යන්තර තක්සේරුවක් මඟින් සිදු කිරීම. ඇ) ඉහත කොන්දේසි වලට යටත්ව, ප්‍රාථමික උකස්කර හැර අනෙකුත් උකස් එම අවදානම් බර සඳහා පහත දක්වා ඇති නිර්ණායක සැපිරීම මත සුදුසුකම් ලබයි. • උකස්කරය එම බැංකුව සමඟ ම පවතියි නම්; • ණය මුදලෙහි අරමුණ නේවාසික අරමුණක් වන්නේ නම්;	35
20.3.1.9.2.0	**නියාමන ප්‍රාග්ධන අරමුණු සඳහා සුදුසුකම් නොලබන හිමිකම්** ඉහත දී ඇති නිර්ණායකය හා අනුකූල නොවන සක්‍රිය හිමිකම්	100

අත්සන් කළේ
මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

චක්‍රලේඛය 2021 අංක 02 2021 ජනවාරි 25

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 09: මූල්‍ය උපකරණ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත භාවිතා කිරීමට අදාළව නිකුත් කරන ලද 2018 අංක 04 දරන මාර්ගෝපදේශයට කරන ලද සංශෝධන

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවතින සුවිශේෂි තත්ත්වයන්, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර පිළිබඳ නව අයවැය යෝජනාව සැලකිල්ලට ගනිමින් සහ බලපත්‍රලාභී බැංකු විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - SLFRS 09: මූල්‍ය උපකරණ ක්‍රියාවට නැංවීමේදී ඒකාකාරී ක්‍රමවේදයක් ඇති කිරීමේ අරමුණින්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 09 මූල්‍ය උපකරණ, බලපත්‍රලාභී බැංකු වලට මාර්ගෝපදේශ සැපයීම සඳහා නිකුත් කරන ලද 2018 අංක 04 දරන චක්‍රලේඛයේ ඇමුණුම 1 සඳහා සංශෝධනයක් මෙයින් නිකුත් කරනු ලැබේ.

මාර්ගෝපදේශය - 2.5 (ආ) ට පසුව මාර්ගෝපදේශ 2.5 (ඇ) පහත පරිදි ඇතුළත් කළ යුතුය:

2.5 (ඇ)	කෙසේ වෙතත් , 2021 වර්ෂය සඳහා අපේක්ෂිත අලාභ ගණනය කිරීමේදී අවම වශයෙන් සියයට 10 ක "ණය පැහැරහැරීමක දී ඇතිවන අලාභය" (Loss Given Default) ආදේශ කිරීමට අවසර ඇත.

බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ

චක්‍රලේඛය 2021 අංක 03 2021 මාර්තු 10

මගී ප්‍රවාහන අංශයේ ව්‍යාපාර සහ පුද්ගලයන් විසින් ලබාගත් කල්බදු පහසුකම් සඳහා වන සහන

දැනට පවතින කොවිඩ්-19 වසංගතය හේතුවෙන් මගී ප්‍රවාහන ක්ෂේත්‍රයේ නියුතු ව්‍යාපාරිකයන් හා පුද්ගලයන් මුහුණ පා ඇති අභියෝගයන් සැලකිල්ලට ගනිමින් කොවිඩ්-19 න් බලපෑමට ලක්වූ මගී ප්‍රවාහන සේවයේ නියුතු ව්‍යාපාර හා පුද්ගලයන් විසින් ලබාගත් කල්බදු පහසුකම් සඳහා 2021 අප්‍රේල් 01 සිට ආරම්භ වන පරිදි මාස 6ක් සඳහා පහත පරිදි (මෙතැන් සිට යෝජනා ක්‍රමය ලෙස හඳුන්වනු ලබන) සහන ලබා දෙන මෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු හා බලපත්‍රලාභී විශේෂිත බැංකු (මෙතැන් සිට බලපත්‍රලාභී බැංකු ලෙස හැඳින්වෙන) වෙතින් ඉල්ලා සිටී.

ඒ අනුව, සියළුම බලපත්‍රලාභී බැංකු විසින් මෙම යෝජනා ක්‍රමය ඒකාකාරී අයුරින් ක්‍රියාත්මක කිරීම සඳහා මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

1. කල්බදු වාරික කල් දැමීමේ කාල සීමාව

1.1 සුදුසුකම් ලබන ණය ගනුදෙනුකරුවන් හට ඔවුන් විසින් මුහුණ පා ඇති මූල්‍ය දුෂ්කරතා සැලකිල්ලට ගනිමින් බලපත්‍රලාභී බැංකු විසින් 2021 අප්‍රේල් 01 වනදා සිට මාස 6ක් හෝ සුදුසු පරිදි ඊට කෙටි කාලයක් සඳහා කල්බදු වාරික කල් දැමිය යුතුය.

1.2 බලපෑමට ලක්වූ පුද්ගයන් විසින් කරන ලද ඉල්ලීම මත කල්බදු වාරිකය (මුල් මුදල සහ පොලිය යන දෙකම) කල් දැමිය යුතුය.

2. අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා අවසාන දිනය

2.1 සුදුසුකම් ලත් පුද්ගලයන්ට කල්බදු වාරික කල් දැමීම සඳහා 2021 අප්‍රේල් 19 දින හෝ ඊට පෙර ලිඛිතව හෝ විද්‍යුත් මාර්ගයෙන් ඉල්ලා සිටිය හැක. බලපත්‍රලාභී බැංකු විසින් සුදුසුකම් ලත් සියළුම ණය ගනුදෙනුකරුවන් වෙත විද්‍යුත් තැපෑල සහ කෙටි පණිවිඩ ඇතුළු මුද්‍රිත හා/හෝ විද්‍යුත් මාධ්‍ය හරහා අදාළ සහන අයදුම්පත් කැඳවීමට අදාළ අවසාන දින සහ අයදුම්පත් ආකෘතිය යනාදිය කඩිනමින් සන්නිවේදනය කළ යුතුය.

2.2 පිළිගත හැකි හේතු මත, 2021 අප්‍රේල් 19 දිනෙන් පසුව වුවද ඉදිරිපත් කෙරෙන ඕනෑම ඉල්ලීමක් සලකා බැලීමට බලපත්‍රලාභී බැංකු කටයුතු කළ යුතුය.

3. සුදුසුකම් ලත් ණය ගනුදෙනුකරුවන්

3.1 පොදු මගී ප්‍රවාහනය, පාසල් ප්‍රවාහන සේවය, කාර්යාල ප්‍රවාහන සේවය, ත්‍රීරෝද රථ ඇතුළු කුලී රථ වැනි පෞද්ගලික මගී ප්‍රවාහනය සහ සංචාරක අංශයට මගී ප්‍රවාහන සේවා සැපයීමේ නිරත ව්‍යාපාර හා පුද්ගලයන්.

3.2 ඉහත 3.1 හි දක්වා ඇති අංශ වලට මගී ප්‍රවාහන පහසුකම් සැපයීම සඳහා වාහනය භාවිතා කරන බවට සහතික වීම සඳහා අවශ්‍ය ලියකියවිලි ඉදිරිපත් කරන ලෙස බලපත්‍රලාභී ණය ගැනුම්කරුගෙන් ඉල්ලුම් කළ හැක.

4. සුදුසුකම් ලත් ණය පහසුකම්

ඉහත 3 වන ඡේදය යටතේ දක්වා ඇති සුදුසුකම් ලත් ණය ගනුදෙනුකරුවන් විසින් ලබා ගෙන ඇති, 2021 මාර්තු 31 දින වන විට ණය සහන යෝජනා ක්‍රමයකට සහභාගී වී සිටින කල්බදු පහසුකම් ඇතුළුව සක්‍රිය කාණ්ඩයේ පවතින කල්බදු පහසුකම්.

5. ණය සහන වල සැකැස්ම

5.1 පවත්නා කල්බදු පහසුකම් දීර්ඝ කිරීම

(අ) බලපත්‍රලාභී බැංකු විසින් කල් දැමීම සඳහා සුදුසුකම් ලබන කල්බදු පහසුකම් වල දැනට පවතින ආපසු ගෙවීමේ කාලය, අදාළ කල් දැමීමේ කාල සීමාවෙන් දීර්ඝ කළ යුතුය.

(ආ) බලපත්‍රලාභි බැංකු විසින් දීර්ඝ කරන කාල සීමාව සඳහා පොලී අය කිරීමේ දී, 2021 අප්‍රේල් 01 දිනට පැවති ආසන්නතම දින-364 ක භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසි අනුපාතයට සියයට එකක් එකතු කළ වාර්ෂික පොලී අනුපාතය නොඉක්මවන පොලී අනුපාතයක්, කල් දමන ලද කාල සීමාව තුළ ගෙවිය යුතුව පැවති කල්බදු වාරික සඳහා පමණක් කල් දැමූ කාල සීමාව සඳහා අය කළ හැකිය.

(ඇ) මෙම පොලිය, එම කාලය සඳහා අයවීමට පැවති කල්බදු වාරික සමඟ 2023 අප්‍රේල් මාසයේ සිට අයකර ගැනීම ආරම්භ කළ යුතුවේ. කල්බදු පහසුකමෙහි ආපසු ගෙවීමේ කාලය 2023 අප්‍රේල් මාසයට පෙර අවසන් වන කල්බදු පහසුකම් සඳහා මෙම පොලිය අයකර ගැනීම, අදාළ කල්බදු පහසුකමේ ඉතිරි ආපසු ගෙවීමේ කාලසීමාව අවසන් වූ පසු ආරම්භ කළ හැකිය.

(ඈ) දැනට පවත්නා කල්බදු පහසුකමෙහි ඉතිරි ආපසු ගෙවීමේ කාලය අවසන් වූ, ණය ගනුදෙනුකරුවන් විසින්, ඉහත 5.1 (අ) ඡේදයේ සඳහන් පරිදි කල් දමන ලද වාරික ආපසු ගෙවීම ආරම්භ කළ යුතුය.

5.2 ණය අය කර ගැනීමේ ක්‍රියාමාර්ග අත්හිටුවීම

(අ) පාසල්, (බොහෝ ප්‍රවාහන සේවා සපයන්නන් විසින් මාසික ගාස්තු අයකිරීම අඛණ්ඩව සිදු කරනු ලැබේ), කාර්යාල, ගුවන්තොටුපොල ආදිය නැවත විවෘත කිරීම සමඟ පොදු හා පෞද්ගලික ප්‍රවාහන භාවිතය ක්‍රමයෙන් යථා තත්වයට පත්වීම, දීර්ඝ කළ ණය පමා සහන කාලය නිසා බැංකු වෙත ඇතිවිය හැකි බලපෑම, දැනට පවත්නා එන්නත් කිරීමේ වැඩසටහන යනාදිය සැලකිල්ලට ගනිමින් බලපත්‍රලාභි බැංකු විසින් 2019 අප්‍රේල් 1 සිට 2020 මාර්තු 31 දක්වා, 2020 අප්‍රේල් 01 සිට 2020 සැප්තැම්බර් 30 දක්වා සහ 2020 ඔක්තෝබර් 01 සිට 2021 මාර්තු 31 දක්වා කාලය (මෙතැන් සිට ණය දීර්ඝ කළ කාලසීමාව ලෙස හැඳින්වේ) තුළ ලබාදී ඇති ණය සහන කාලසීමා සඳහා අයවිය යුතු වාරික අයකර ගැනීම ඉහත 5.1 (අ) ඡේදයේ සඳහන් පරිදි පවත්නා කල්බදු පහසුකම් කල් දමන ලද කාල සීමාව තුළදී සිදු කළ යුතුය.

(ආ) පවත්නා කල්බදු පහසුකමේ කල් තබන ලද කාලය (ඉහත 5.1 (අ) ඡේදයේ සඳහන් පරිදි) අවසන් වූ පසු, ණය සහන කාලය තුළ ගෙවිය යුතු වාරික ගෙවීම, දැනට පවත්නා කල්බදු පහසුකමෙහි දීර්ඝ කරන ලද කාලය ඇතුළු ආපසු ගෙවීමේ කාලය අවසන්වන තුරු කල් තැබිය යුතුය.

(ඇ) එලෙස ණය සහන කාලය තුල අයවීමට නියමිත කල්බදු වාරික කල් තබන ලද කාලසීමාව සඳහා පොලියක් අය කෙරෙන අතර, එය 2021 අප්‍රේල් 01 දිනට පැවති ආසන්නතම දින-364 ක භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසි අනුපාතයට සියයට එකක් එකතු කළ වාර්ෂික පොලී අනුපාතය නොඉක්මවන පොලී අනුපාතයක් විය යුතුය.

(ඈ) එම පොලී අය කරගැනීම ඉහත 5.1(ආ) සහ (ඇ) හි සඳහන් පොලී ගෙවා අවසන් කළ වහාම, දැනට පවතින කල්බදු පහසුකමට අදාළ වාරික සහ ණය සහන කාලයට අදාළ කල් දමන ලද වාරික සමඟ අය කරගත යුතුය.

(ඉ) පවත්නා කල්බදු පහසුකම කල් දැමූ කාලය ඇතුළුව ඉතිරි කාලය අවසන් වූ පසු, ණය ගනුදෙනුකරුවන් විසින් ඉහත 5.2 (ආ) ඡේදයේ සඳහන් ණය සහන වලට අදාළව කල් දැමූ වාරික ආපසු ගෙවීම ආරම්භ කළ යුතුය.

5.3 කල් දමන ලද කාලසීමාව තුළ අයවිය යුතු කල්බදු වාරික, (ණය සහන කාලසීමාවට අදාළ ගෙවීම් සහ කල් දැමීම සඳහා අයවිය යුතු පොලී ඇතුළුව) කලින් ගෙවා අවසන් කිරීමට ණය ගනුදෙනුකරු විසින් ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කරන්නේ නම් ඒ සඳහා බලපත්‍රලාභි බැංකු විසින් අවස්ථාව ලබා දිය යුතුය. එවැනි අවස්ථාවන්හිදී, බලපත්‍රලාභී බැංකුව සහ ණය ගැනුම්කරු විසින් ඒ සඳහා සුදුසු සැලැස්මක්, පොලී අනුපාතයක් සහ ආපසු ගෙවීමේ කාලසීමාව සඳහා එකඟ විය යුතුය. මෙහිදී අයකරනු ලබන පොලී අනුපාතය වත්මන් වෙළඳපොළ අනුපාතයට අනුකූල විය යුතුය.

5.4 බලපත්‍රලාභි බැංකු විසින් ණයගැතියාගේ ඉල්ලීම පරිදි ණය ගැනුම්කරුවන්ට අමතර විකල්ප මෙම චක්‍රලේඛය යටතේ ලබා දෙන ප්‍රතිලාභ වලට වඩා අඩු නොවන ආකාරයෙන් ලබා දිය හැක. එවැනි අවස්ථාවකදී බලපත්‍රලාභි බැංකු එවැනි සහනයක් අනුමත කිරීමට පෙර මෙම චක්‍රලේඛයේ යෝජනා කර ඇති ව්‍යුහය ඇතුළුව සියළු විකල්පයන් යටතේ පොලී ගණනය කිරීම පැහැදිළිව පැහැදිලි කළ යුතුය.

5.5 බලපත්‍රලාභි බැංකු විසින් 2021 අප්‍රේල් 1 දිනට එක් වී ඇති සහ නොගෙවන ලද දඩ පොලිය ඇත්නම් ඒවා කපාහැරිය යුතුය. කල් දමන ලද කාලසීමාව සීමාව තුළ දඩ පොලී ගණනය කිරීම හෝ අයකිරීම නොකළ යුතුය.

5.6 බලපත්‍රලාභි බැංකු විසින් සහන ලබාදීමට අදාළව අධික ගාස්තු හෝ අයකිරීම් සිදු නොකළ යුතුය.

5.7 ණය ගැනුම්කරුවෙකු විසින් කළ ඉල්ලීමක් ප්‍රතික්ෂේප වූ කල, බලපත්‍රලාභි බැංකු එවැනි ප්‍රතික්ෂේප කිරීමට අදාළ හේතුව පැහැදිලිව සඳහන් කළ යුතුය.

6. කල්බදු වාරික කල්දැමීම පිළිබඳ ගිණුම් තැබීම

බලපත්‍රලාභී බැංකු විසින් කල්බදු වාරික කල් තැබීම සම්බන්ධව ගිණුම් තැබීම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සහ මූල්‍ය වාර්තාකරණයේ දී කොවිඩ්-19 ව්‍යාප්තිය සලකා බැලීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් යම් අතිරේක මග පෙන්වීම් සපයන්නේ නම් ඒ අනුව සිදු කළ යුතුය. බලපත්‍රලාභි බැංකු හට මේ සම්බන්ධයෙන් අමතර මග පෙන්වීමක් හෝ පැහැදිලි කිරීම් අවශ්‍ය නම් ඒ සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයෙන් සහ විගණකවරුන්ගෙන් උපදෙස් ලබා ගත හැකිය.

7. වාර්තාකරණ අවශ්‍යතා

බලපත්‍රලාභි බැංකු විසින් සෑම මාසයකම 30 වන දින සිට වැඩ කරන දින 15ක් ඇතුළත සිය ණය ගනුදෙනුකරුවන් විසින් ලබාගෙන ඇති කල්බදු වාරිකයන් පිළිබඳ විස්තර අමුණා ඇති ආකෘතියට අනුව බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවට වාර්තා කළ යුතුය.

අත්සන් කලේ,
මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති හා
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

බැංකු පනත් විධාන 2021 අංක 04 2021 මාර්තු 18

බලපත්‍රලාභි වාණිජ බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව මඟින් ශ්‍රී ලංකා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර වල සිදුකරන ආයෝජන

1988 අංක 30 දරන සංශෝධිත බැංකු පනතේ 46(1) සහ 76(ඒ) (1) වගන්ති මඟින් ලබාදී ඇති බලතල අනුව නිකුත් කරනු ලැබේ.

මෙරට විදේශ විනිමය අනුපාතය මත ඇති පීඩනය ලිහිල් කිරීම සහ බැංකු මඟින් විශාල පරිමාණයෙන් විදේශ විනිමය පිටතට යාම හෝ පිටතට යාමේ හැකියාව සහ එමඟින් බැංකු වල අවදානම් කළමනාකරණය කෙරෙහි ඇති බලපෑම යනාදිය සලකා බලමින්, බලපත්‍රලාභි වාණිජ බැංකු හා ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් ශ්‍රී ලංකා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර මිලදී ගැනීම 2021 මාර්තු 23 සිට ක්‍රියාත්මක වන පරිදි 2021 අප්‍රේල් 9 දක්වා අත්හිටුවන ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දන්වා සිටී.

අත්සන් කලේ,
මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති හා
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

චක්‍රලේඛය 2021 අංක 04 2021 මාර්තු 19

කොවිඩ්-19 නිසා බලපෑමට පත් සංචාරක ක්ෂේත්‍රයේ නියුතු ව්‍යාපාර හා පුද්ගලයන් වෙත ලබා දුන් ණය සහන කාලය දීර්ඝ කිරීම

පවත්නා කොවිඩ්-19 වසංගත තත්ත්වය හමුවේ, සංචාරක ව්‍යාපාරයේ නිරත ව්‍යාපාර හා පුද්ගලයන් විසින් මුහුණ දෙනු ලබන අභියෝගයන් සැලකිල්ලට ගනිමින් 2020 අගෝස්තු 26 වැනි දින නිකුත් කරන ලද 2020 අංක 08 දරන චක්‍රලේඛය මඟින් සංචාරක ක්ෂේත්‍රය වෙත පිරිනමන ලද ණය සහන කාල සීමාව, 2021 අප්‍රේල් 1 දින සිට පහත සඳහන් පරිදි, තවත් මාස හයක කාලයක් සඳහා දීර්ඝ කරන මෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු (මින් මතුවට බලපත්‍රලාභී බැංකු ලෙස හැඳින්වෙන) වෙතින් ඉල්ලා සිටී. කෙසේ වෙතත්, ගනුදෙනුකරුවන් විසින් සිදුකරනු ලබන ඉල්ලීම් මත පදනම්ව මෙම චක්‍රලේඛය මඟින් පිරිනමනු ලබන සමස්ත ප්‍රතිලාභයන්ට වඩා අඩු නොවන පරිදි, ගනුදෙනුකරුවන් වෙත වෙනත් අමතර විකල්පයන් පිරිනැමීම සඳහා බලපත්‍රලාභී බැංකු හට අවස්ථාව ඇත. ඉහත ණය සහන කාල සීමාව දීර්ඝ කිරීම සිදු කරනු ලබන්නේ ගනුදෙනුකරුවන් හට දීර්ඝ කාලීන වැඩපිළිවෙලක් සඳහා යෝජනා ඉදිරිපත් කිරීමට ප්‍රමාණවත් කාලයක් ලබාදීමේ අවශ්‍යතාවය මත වන අතර, ගනුදෙනුකරුවන් විසින් මෙම දීර්ඝ කරන ලද ණය සහන කාලය අවසන් වීමට පෙර, තම ණය පහසුකම් දීර්ඝ කාලයක් සඳහා ප්‍රතිව්‍යුහගත කිරීමට පිළිගත හැකි සැලැස්මක් බලපත්‍රලාභී බැංකු වෙත ඉදිරිපත් කළ යුතුය. බලපත්‍රලාභී බැංකු විසින් එවැනි සැලසුම් ඒ ඒ අවස්ථානුකූලව සලකා බැලීමට කටයුතු කළ යුතු අතර, ඉහත ණය සහන යෝජනා ක්‍රමය සියළු බලපත්‍රලාභී බැංකු විසින් ඒකාකාරීව ක්‍රියාවට නැංවීම තහවුරු කිරීම සඳහා මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

2020 අංක 08 දරන චක්‍රලේඛයේ පහත සඳහන් ප්‍රතිපාදන, මෙහි සඳහන් වන ආකාරයට සංශෝධනය වනු ඇති අතර, එම චක්‍රලේඛයේ අනෙකුත් ප්‍රතිපාදනයන් නොවෙනස්ව පවතී.

1. **පොදු කොන්දේසි හා නියමයන්**

1 (iii) ණය සහන කාලය යනුවෙන් අදහස් කෙරෙන්නේ 2021 අප්‍රේල් 01 දින සිට 2021 සැප්තැම්බර් 30 වැනි දින දක්වා තවත් මාස හයක කාල සීමාවක් සඳහා මූලික ණය මුදල සහ පොලිය කල් තැබීම වේ.

1 (iv) මෙම ණය සහන ලබා ගැනීමට අපේක්ෂා කරන, සුදුසුකම් ලබන ණය ගනුදෙනුකරුවන් 2021 අප්‍රේල් 19 දින හෝ ඊට පෙර සිය බලපත්‍රලාභී බැංකුව වෙත ඉල්ලීමක් කළ යුතුය. කෙසේ වෙතත්, ගනුදෙනුකරුවන් විසින්, 2021 අප්‍රේල් 19 දිනෙන් පසුව කරනු ලබන ඉල්ලීම් සාධාරණ හේතු මත සලකා බැලීමට කටයුතු කරන මෙන් බලපත්‍රලාභී බැංකු වෙත දන්වා සිටී. තවද, මෙම ණය සහන ලබා ගැනීමට සුදුසුකම් ලබන, එහෙත් තම ණය ආපසු ගෙවීම සඳහා හැකියාවක් ඇති ගනුදෙනුකරුවන් මෙම ණය සහන කාලය දීර්ඝ කිරීමට අයදුම් නොකොට, සිය ණය පහසුකම් ආපසු ගෙවීමට කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

2. **ණය සහන යෝජනා ක්‍රමයේ සැකැස්ම**

2 (i) 2021 අප්‍රේල් 01 දින සිට 2021 සැප්තැම්බර් 30 දින දක්වා ණය සහන කාල සීමාව තුළ අයවීමට නියමිත මූලික ණය මුදල සහ පොලිය කාලීන ණයකට හැරවීමට බලපත්‍රලාභී බැංකු කටයුතු කළ යුතුය. ණය සහන කාල සීමාව තුළ අය කළ හැකි උපරිම පොලිය 7% කට සීමා කර ඇති සම වටිනාකමින් යුතු වාරික ණය (EMI loans) හැර අනෙකුත් ණය පහසුකම් සඳහා, පෙර ණය සහන කාල සීමා සඳහා අයවීමට නියමිත මූලික ණය මුදල සහ පොලිය සහ 2021 අප්‍රේල් 01 දින සිට 2021 සැප්තැම්බර් 30 දින දක්වා අයවීමට නියමිත මූලික ණය මුදල සහ පොලිය බලපත්‍රලාභී බැංකු විසින් එකතු කරනු ඇත.

2 (ii) බලපත්‍රලාභී බැංකු විසින් මෙලෙස හරවන ලද ණය යළි අයකර ගැනීම ආරම්භ කිරීම, දීර්ඝ කරන ලද ණය සහන කාලය අවසන් වීමෙන් පසුව සිදු කළ යුතුය.

2 (v) මෙම චක්‍රලේඛය යටතේ සුදුසුකම් ලබන ණය සඳහා, බලපත්‍රලාභී බැංකු විසින් 2021 අප්‍රේල් 01 දින වන විට එකතු වී නොපියවා ඇති දඩ පොලී, කපා හැරිය යුතුය. තවද, ණය සහන කාල සීමාව තුළදී දඩ පොලී එකතුකිරීම හෝ අය කිරීම නොකළ යුතුවේ.

අත්සන් කලේ,
මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති හා
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

බැංකු පනත් විධාන 2021 අංක 05 2021 අප්‍රේල් 09

බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව මඟින් ශ්‍රී ලංකා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර වල සිදුකරන ආයෝජන

1988 අංක 30 දරන සංශෝධිත බැංකු පනතේ 46(1) සහ 76(ඒ) (1) වගන්ති මඟින් පැවරී ඇති බලතල අනුව නිකුත් කෙරේ.

මෙරට විදේශ විනිමය අනුපාතය මත ඇති පීඩනය ලිහිල් කිරීම සහ බැංකු මඟින් විශාල පරිමාණයෙන් විදේශ විනිමය පිටතට යාම හෝ පිටතට යාමේ හැකියාව සහ එමඟින් බැංකු වල අවදානම් කළමනාකරණය කෙරෙහි ඇති බලපෑම යනාදිය සැලකිල්ලට ගනිමින්, බලපත්‍රලාභී වාණිජ බැංකු හා ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් ශ්‍රී ලංකා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර මිලදී ගැනීම 2021 අප්‍රේල් 23 දක්වා අත්හිටුවන ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව දන්වා සිටී.

අත්සන් කලේ,
මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති හා
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

මුදල් නීති පනත් නියෝගය 2021 අංක 01 2021 අප්‍රේල් 21

ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශ වලට ණය ලබාදීම සම්බන්ධව බලපත්‍රලාභී වාණිජ බැංකු හා බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා ප්‍රමුඛතා අංශ ණය දීමේ ඉලක්ක

දේශීය ආර්ථික වර්ධනය සහ අපනයන ඉපැයීම් අනුව ඉහළ විභවයක් සහිත ආර්ථික අංශ ප්‍රවර්ධනය කිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන ඇති තත්වයක, ආර්ථිකයේ පුළුල් පදනම් පුනර්ජීවනයට හේතු වන ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයේ පුද්ගලයන්ට හා ව්‍යාපාර වලට බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු (මෙතැන් සිට බලපත්‍රලාභී බැංකු ලෙස හඳුන්වනු ලැබේ) විසින් ලබාදෙන ණය සඳහා ප්‍රමුඛතා අංශයේ ණය ලබා දීමේ ඉලක්ක ශ්‍රී ලංකා මහ බැංකුව පහත පරිදි හඳුන්වා දෙයි.

1. **සවිබල ගැන්වීම**

1.1 1949 අංක 58 දරන සංශෝධිත මුදල් නීති පනතේ 101 (1) (ආ) වගන්තියට අනුව වරින් වර බලපත්‍රලාභී බැංකු විසින් නිශ්චිත කාල සීමාවන් තුළ ණය හා ආයෝජන ප්‍රමාණය වැඩි කළ හැකි අනුපාතයන්ට අදාළව මුදල් මණ්ඩලය විසින් සීමාවන් නියම කරනු ලැබේ.

2. **ප්‍රමුඛතා අංශ සඳහා ණය දීමේ ඉලක්කය**

2.1 බලපත්‍රලාභී බැංකු විසින් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයේ පුද්ගලයන්ට සහ ව්‍යාපාර වලට ණය ලබා දිය යුතු අතර පසුගිය වසර අවසානයේදී ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයට ලබා දී ඇති හිඟ ණය ප්‍රමාණයට වඩා වාර්ෂිකව සියයට 20 කට නොඅඩු වර්ධන වේගයක් සහතික කළ යුතුය.

2.2 පුළුල් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය තුළ, දේශීය වර්ධනය සහ අපනයන ඉපැයීම් අනුව ඉහළ විභවයක් පෙන්නුම් කරන පහත සඳහන් ආර්ථික උප අංශයන්ට ඉහත 2.1 හි ණය දීමේ ඉලක්ක සඳහා ප්‍රමුඛතාවය දෙනු ලබන නමුත් එම අංශවලට පමණක් ණය ලබාදීම සීමා නොවිය යුතුය.

(i) ආහාර හා පාන සැකසීම

(ii) වෛද්‍ය උපයෝගිතා හා ඒ ආශ්‍රිත නිෂ්පාදන නිෂ්පාදනය

(iii) දුරස්ථ ඉගෙනුම් පහසුකම් සංවර්ධනය කිරීම

(iv) දේශීය ගෘහ කර්මාන්ත

(v) රබර් හා රබර් නිෂ්පාදන

(vi) නැව් හා බෝට්ටු තැනීම

(vii) ආලේපන

(viii) බතික් හා අත්යන්ත්‍ර රෙදිපිළි

(ix) මැණික් හා ස්වර්ණාභරණ

(x) සෞඛ්‍යය හා සුවතාවය

(xi) ඉලෙක්ට්‍රොනික හා විදුලි උපාංග

(xii) මෝටර් වාහන එකලස් කිරීම

(xiii) ඖෂධ නිෂ්පාදනය

(xiv) පෝසිලේන්, පිගන් මැටි හා මැටි භාණ්ඩ

3.1 ණය පහසුකම් සඳහා ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයේ සියළුම ව්‍යාපාර සහ පුද්ගලයන් සඳහා බලපත්‍රලාභී බැංකු විසින් ශ්‍රී ලංකා රුපියල් වලින් සහ විදේශ මුදලින් ලබා දී ඇති ශේෂ පත්‍ර නොවන අයිතම ඇතුළු කාලීන ණය, කල්බදු, අයිරා සහ වෙළඳ මූල්‍ය පහසුකම් ඇතුළත් වේ.

3.2 බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා බාසල් III යටතේ ප්‍රාග්ධන අවශ්‍යතා පිළිබඳ 2016 අංක 01 දරන බැංකු පනත් විධානය සංශෝධනය කරමින් නිකුත් කර ඇති 2020 අංක 07 දරන බැංකු පනත් විධානයෙහි දක්වා ඇති සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයේ අර්ථ දැක්වීමට අනුකූලව මෙම නියෝගයේ අරමුණ උදෙසා වාර්ෂික පිරිවැටුම රු. මිලියන 1,000 ක් නොඉක්මවූ ව්‍යාපාර ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ලෙස සලකනු ලැබේ.

4. **බැහැර කිරීම**

4.1 ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයේ පුද්ගලයන්ට සහ ව්‍යාපාර වලට බලපත්‍රලාභී බැංකු විසින් ලබා දී ඇති උකස් ණය අත්තිකාරම් ඉහත 2.1. හි ප්‍රමුඛතා අංශයේ ණය ඉලක්කයන්ගෙන් බැහැර කරනු ලැබේ.

5. අධීක්ෂණය හා වාර්තා කිරීම

5.1 මෙම නියෝගය යටතේ ණය පහසුකම් ලබා දීමෙන් පසු, බලපත්‍රලාභී බැංකු වලට අඛණ්ඩ අධීක්ෂණ යාන්ත්‍රණයක් ස්ථාපිත කළ යුතුය.

5.2 බලපත්‍රලාභී බැංකු විසින් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය වෙත ණය ලබා දීමේ තොරතුරු ඇමුණුම I හි ආකෘතියෙන්, ආර්ථික පර්යේෂණ අධ්‍යක්ෂ හා බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ වෙත 2021 අප්‍රේල් 01 සිට සෑම කාර්තුවකම අවසානයේ සිට දින 30ක් ඇතුළත වාර්තා කළ යුතුය.

මෙයට විශ්වාසී
මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

බැංකු පනත් විධාන 2021 අංක 06 2021 අප්‍රේල් 23

බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව මඟින් ශ්‍රී ලංකා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර වල සිදුකරන ආයෝජන

1988 අංක 30 දරන සංශෝධිත බැංකු පනතේ 46(1) සහ 76(ඒ) (1) වගන්ති මඟින් ලබාදී ඇති බලතල අනුව නිකුත් කරනු ලැබේ.

මෙරට විදේශ විනිමය අනුපාතය මත ඇති පීඩනය ලිහිල් කිරීම සහ බැංකු මඟින් විශාල පරිමාණයෙන් විදේශ විනිමය පිටතට යාම හෝ පිටතට යාමේ හැකියාව සහ එමඟින් බැංකු වල අවදානම් කළමනාකරණය කෙරෙහි ඇති බලපෑම යනාදිය සලකා බලමින්, බලපත්‍රලාභී වාණිජ බැංකු හා ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් ශ්‍රී ලංකා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර මිලදී ගැනීම නැවත දැනුම් දෙනතුරු අත්හිටුවන ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව දන්වා සිටී.

අත්සන් කලේ,
මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති හා
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

බැංකු පනත් විධාන 2021 අංක 07 2021 අප්‍රේල් 25

බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සිදු කරනු ලබන ඉදිරි විකුණුම් සහ විදේශ විනිමය මිල දී ගැනුම්

1988 අංක 30 දරන බැංකු පනතෙහි (සංශෝධිත) වගන්ති 46(1) මඟින් පවරා ඇති බලතල ප්‍රකාරව නිකුත් කරන ලදී.

විදේශ විනිමය වෙළඳපොල තුළ අධික උච්චාවචනය අවම කිරීම සහ බැංකු ආයතනයන්හි අවදානම් කළමනාකරණය මත ඇති වන බලපෑම වැළැක්වීමේ අරමුණැතිව, බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පහත කරුණුවල දී හැර, තත්කාලීන දිනයට (Spot date) ඔබ්බෙන් යෙදෙන වටිනාකම් දිනයක් සහිත විදේශ විනිමය ඉදිරි ගිවිසුම්වලට නැවත දැනුම් දෙන තුරු පිවිසීමෙන් වැළකිය යුතුය.

(i) අපනයනකරුවන්ගෙන් ඇතුළු බැංකුවල ගනුදෙනුකරුවන්ගෙන් සිදු කෙරෙන විදේශ විනිමය ඉදිරි මිල දී ගැනුම්.

(ii) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද විදේශ විනිමය මුදල් ණය වලින් හට ගන්නා, ඔවුන්ගේ විදේශ විනිමය නිරාවරණ සීමා කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන බලපත්‍රලාභී විශේෂිත සමාගම් සහ බලපත්‍රලාභී මූල්‍ය සමාගම්වල විදේශ විනිමය මුදල් ණය මත විදේශ විනිමය හුවමාරු ගිවිසුම් සඳහා පහසුකම් සැලසීම.

(iii) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද, විදේශ ව්‍යවහාර මුදල් ණයවලින් හට ගන්නා ඔවුන්ගේ විදේශ විනිමය නිරාවරණ සීමා කිරීමට ආයතනික සේවාලාභීන්ගේ විදේශ විනිමය මුදල් ණය මත විදේශ විනිමය හුවමාරු ගිවිසුම් සඳහා පහසුකම් සැලසීම.

(iv) ගනුදෙනුවල සද්භාවය සත්‍යාපනය කිරීමෙන් පසු, සේවාලාභීන්ගේ ප්‍රකාශිත ඉල්ලීම් මත පදනම් කර ගත් ඓතිහාසික අනුපාතිකවලට සේවාලාභීන්ගේ පවතින ඉදිරි/ විදේශ විනිමය හුවමාරු ගිවිසුම්වල වටිනාකම් දිනය සංශෝධනය කිරීම/නැතහොත් දීර්ඝ කිරීම.

(v) තනි ප්‍රතිපාර්ශ්ව (එනම්, බැංකු දෙකක් අතර පමණක්) සමඟ අන්තර් බැංකු ඉදිරි සහ විදේශ විනිමය හුවමාරු ගනුදෙනුවලට පිවිසීම.

(vi) හරස් ව්‍යවහාර මුදල් (cross-currency) ඉදිරි ගනුදෙනු වලට පිවිසීම.

අත්සන් කලේ,
මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති හා
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

බැංකු පනත් විධාන 2021 අංක 08 2021 මැයි 25

බලපත්‍රලාභී බැංකු විසින් සිදු කරනු ලබන විදේශ විනිමය ණය ගැනීම් පිළිබඳව වන 2018 අංක 11 දරන බැංකු පනත් විධාන සංශෝධනය කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය, මූර්ත ආර්ථිකය තුළ ප්‍රාග්ධන සම්පාදනය උත්තේජනය කිරීම සහ රටේ විදේශ ව්‍යවහාර මුදල් අවශ්‍යතා සලකා බැලීමෙන් පසු, බලපත්‍රලාභී බැංකු විසින් සිදු කරනු ලබන විදේශ විනිමය ණය ගැනීම් පිළිබඳව වන 2018 අංක 11 දරන බැංකු පනත් විධාන මෙමඟින් පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

ඒ අනුව බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු (මින් මතු බලපත්‍රලාභී බැංකු ලෙස හැඳින්වෙන) වෙත පහත කරුණු මෙයින් දැනුම් දෙනු ලැබේ:

1. කෙටි කාලීන විදේශ ව්‍යවහාර ණය ගැනීම්වලට පූර්වයෙන්, බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ වෙත බලපත්‍රලාභී බැංකු විසින් ගනු ලබන විදේශ ව්‍යවහාර ණය පිළිබඳව 2018 අංක 11 දරන බැංකු පනත් විධානයන්හි 9.1 විධානය තුළ දක්වා ඇති නිශ්චිත තොරතුරු දැනුම් දෙමින් සහ එම විදේශ විනිමය ණය ගැනීම් මඟින් කිසිදු අධික විදේශ විනිමය අවදානමකට හේතු නොවන සේ, සුදුසු අවදානම් අවම කිරීමේ ක්‍රියාමාර්ග ඔස්සේ තහවුරු කරමින්, පවතින සමස්ත විදේශ ව්‍යවහාර ණය ගැනීම් සීමාව බලපත්‍රලාභී බැංකු වෙත සියයට 10ක් දක්වා යටත්ව, වහාම බලපැවැත්වෙන පරිදි, වසරක කාලයක් සඳහා, දැනට පවතින කෙටි කාලීන විදේශ ව්‍යවහාර ණය ගැනීම් සීමා අහෝසි කෙරේ.

2. බලපත්‍රලාභී බැංකු ඉහත දක්වන ලද විධානයෙහි ප්‍රකාශිත අනෙකුත් සියලු විධාන සමඟ අනුකූල වන බවට තහවුරු කළ යුතුය.

3. බලපත්‍රලාභී බැංකු පහත අමුණා ඇති ආකෘතියට අනුව, සෑම මසකම අවසාන දිනට සමස්ත විදේශ ව්‍යවහාර ණය ගැනීම්වල තත්ත්වය 2021 ජූනි 30න් ඇරඹෙන, වැඩ කරන දින 15ක් ඇතුළත බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත වාර්තා කළ යුතුය.

අත්සන් කලේ,
මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති හා
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

චක්‍රලේඛය 2021 අංක 05 2021 මැයි 25

කොවිඩ්-19 වසංගතය හේතුවෙන් බලපෑමට ලක්වූ ව්‍යාපාර සහ පුද්ගලයන්ට සහන සැලසීම

කොවිඩ්-19 ව්‍යසනයේ තෙවන ව්‍යාප්තිය හමුවේ පීඩාවට පත් ණය ගැනුම්කරුවන්/පාරිභෝගිකයන්ට සහන සැලසීම සම්බන්ධව රාජ්‍ය ආයතන හා අනෙකුත් පාර්ශව රැසක් ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ඉල්ලීම් කර ඇත. ඒ අනුව කොවිඩ්-19 වසංගතයේ තෙවන ව්‍යාප්තිය නිසා ව්‍යාපාර හා පුද්ගලයන් විසින් මුහුණ පා ඇති ගැටළු සලකා බලමින්, බලපත්‍රලාභි වාණිජ බැංකු සහ බලපත්‍රලාභි විශේෂිත බැංකු (මින් ඉදිරියට බලපත්‍රලාභි බැංකු ලෙස හැඳින්වෙන) විසින් බලපෑමට ලක්වී ඇති ව්‍යාපාර හා පුද්ගලයන් වෙත ලබා දී ඇති ණය සහන යෝජනා ක්‍රමය (මින් ඉදිරියට යෝජනා ක්‍රමය ලෙස හැඳින්වෙන) යටතේ තවදුරටත් පහත සහනයන් ලබාදීමට කටයුතු කරන ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව බලපත්‍රලාභී බැංකු වෙතින් ඉල්ලා සිටී. කොවිඩ්-19 ව්‍යාප්තිය හේතුවෙන් පීඩාවට පත් ව්‍යාපාර හා පුද්ගලයන් ගේ ඉල්ලීම පරිදි, මෙම චක්‍රලේඛය යටතේ ලබා දී ඇති සමස්ත ප්‍රතිලාභ අඩු නොවන අයුරින් අමතර සහන සැලසීම සඳහා බලපත්‍රලාභි බැංකු හට හැකියාව ඇත. මෙම යෝජනා ක්‍රමය සියළු බලපත්‍රලාභි බැංකු විසින් ඒකාකාරීව ක්‍රියාත්මක කරවීම සඳහා සහ ව්‍යාපාර හා ආදායම් ඉපයීමේ කටයුතු වල සිදුව ඇති ඇණහිටීම් හේතුවෙන් ණය ගැනුම්කරුවන් හට ණය වාරික ආපසු ගෙවීමේදී ඇතිවන පීඩාව ලිහිල් කිරීමේ අරමුණින් මෙම චක්‍රලේඛය නිකුත් කර ඇත.

01. 2021 මැයි 15 දින වන විට සක්‍රියව පැවති ණය පහසුකම් කල් දැමීම හෝ ප්‍රතිව්‍යුහගත කිරීම.

(අ) සුදුසුකම් ලත් ණය ගනුදෙනුකරුවන් මුහුණ දී ඇති මූල්‍ය දුෂ්කරතා, එනම් රැකියා අහිමිවීම, ආදායම් අහිමිවීම හෝ ආදායම / වැටුප් අඩු වීම හෝ විකුණුම් අඩු වීම, ව්‍යාපාර වසා දැමීම යනාදිය සලකා බලා කොවිඩ්-19 හි තෙවන රැල්ලෙන් පීඩාවට පත් වූ ණය ගනුදෙනුකරුවන්ගේ දැනට පවතින ණය පහසුකම් වල මුල් ණය මුදල හෝ පොලිය හෝ එම කොටස් දෙකම හෝ, 2021 අගෝස්තු 31 දක්වා කාලය තුළ එක් එක් අවස්ථාව අනුව අයකර ගැනීම කල් දැමීමට බලපත්‍රලාභී බැංකු විසින් කටයුතු කළ යුතුය.

(ආ) සුදුසුකම් ලත් ණය ගනුදෙනුකරුවන්ගේ රුපියල්වලින් හෝ විදේශ මුදල්වලින් ලබා දී ඇති ණය පහසුකම් එකක් හෝ ඊට වැඩි ගණනක මුල් ණය මුදල හෝ පොලිය හෝ ඒ දෙකම ගෙවීම කල් දැමීම, එම ගනුදෙනුකරුවන් විසින් මුහුණ පා ඇති මූල්‍ය දුෂ්කරතා සහ ගනුදෙනුකරුගේ ආපසු ගෙවීමේ හැකියාව සැලකිල්ලට ගනිමින් සිදුකළ යුතුය.

(ඇ) ඉහත ආපසු ගෙවීම කල් දමන ලද ඕනෑම රුපියල් ණය පහසුකමක් සම්බන්ධයෙන්, බලපත්‍රලාභී බැංකු විසින් කල් දමන ලද කාල සීමාව සඳහා සහ කල් දමන ලද මුදල මත පමණක්, 2021 මැයි 19 දින පැවති දින-364 භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසි

අනුපාතය ට සියයට 1ක් එකතු කළ අගය නොඉක්මවන වාර්ෂික පොලී අනුපාතයක් අය කළ හැකිය (එනම් 5.18% + 1% = වසරකට 6.18%). විදේශ මුදලින් ගත් ණය සඳහා බලපත්‍රලාභී බැංකු විසින්, පවත්නා අඩු පොලී අනුපාත සැලකිල්ලට ගනිමින් සහනදායී පොලී අනුපාතයක් අය කළ හැක.

(ඇ) විකල්පයක් ලෙස, ණය ගනුදෙනුකරුගේ ආපසු ගෙවීමේ හැකියාව සහ පිළිගත හැකි ව්‍යාපාර නඟාසිටුවීමේ සැලැස්මක් (Revival plan) ඉදිරිපත් කිරීම සැලකිල්ලට ගනිමින්, දැනට පවතින ණය පහසුකම් දීර්ඝ කාලයක් සඳහා ප්‍රතිව්‍යුහගත කිරීමට බලපත්‍රලාභී බැංකුවලට හැකියාව පවතින අතර, මෙහිදී, බලපත්‍රලාභී බැංකුව සහ ණය ගැනුම්කරු විසින් දැනට පවතින අඩු පොලී අනුපාතයන් සැලකිල්ලට ගනිමින් සුදුසු පොලී අනුපාතයකට එකඟ විය යුතුය.

(ඉ) 2021 මැයි 15 සිට 2021 අගෝස්තු 31 දක්වා කාලය තුළදී පියවීමට යෙදෙන, කාරක ප්‍රාග්ධන, උකස් අත්තිකාරම්, තාවකාලික අයිරා, කෙටිකාලීන වෙළඳ මූල්‍ය පහසුකම් ඇතුළු අනෙකුත් චක්‍රීය ණය පහසුකම් සඳහා පියවීමේ දින 2021 අගෝස්තු 31 දක්වා දීර්ඝ කිරීමට බලපත්‍රලාභී බැංකු කටයුතු කළ යුතු අතර, ඒ සම්බන්ධයෙන් කල් තබන ලද කාලසීමාව සඳහා පොලී අයකිරීම ඉහත 1(ඇ) හි සඳහන් පරිදි කල් දමන ලද මුදල මත පමණක් සිදුකළ යුතුය.

(ඊ) ණය සහන කාලය තුළ, එනම් 2021 මැයි 15 සිට 2021 අගෝස්තු 31 දක්වා, දඩ පොලිය එකතු කිරීමක් හෝ අය කිරීමක් සිදු නොකළ යුතුය.

(උ) දැනට පවතින සංචරණ සීමාවන් හේතුවෙන් බලපෑමට පත් ගනුදෙනුකරුවන් විසින්, ණය ආපසු ගෙවීම් නියමිත දිනය දින කිහිපයකින් (උපරිම වැඩ කරන දින 10ක් දක්වා) කල් දැමීමට කෙරෙන ඕනෑම ඉල්ලීමක් සඳහා ණය පහසුකම් කල්දැමීමක් හෝ ප්‍රතිව්‍යුහගත කිරීමක් ලෙස සැලකීමෙන් තොරව අවස්ථාව ලබා දිය යුතු අතර, බලපත්‍රලාභී බැංකු විසින් ගනුදෙනුකරුවන්ගේ එවැනි ප්‍රමාදයන් සඳහා කිසිදු අමතර පොලියක් හෝ වෙනත් ගාස්තු අය නොකළ යුතුය.

(ඌ) 2021 මාර්තු 13 දින නිකුත් කරන ලද 2021 අංක 03 චක්‍රලේඛය යටතේ කල්බදු (ලීසිං) පහසුකම් ආපසු ගෙවීම් කල් දැමීමේ සහන භුක්ති විඳින හෝ 2021 මාර්තු 19 දින නිකුත් කරන ලද 2021 අංක 04 චක්‍රලේඛය යටතේ, ණය සහන ලබා ගත් ණය ගනුදෙනුකරුවන් ඉහත සහන සඳහා සුදුසුකම් නොලබනු ඇත.

02. 2021 මැයි 15 දිනට අක්‍රීය කාණ්ඩයේ පැවති ණය පහසුකම් සඳහා හිමිවන සහන

(අ) ණය ලබා ගත් තැනැත්තාගේ ආපසු ගෙවීමේ හැකියාව සහ පිළිගත හැකි ව්‍යාපාර නගාසිටුවීමේ සැලැස්මක් ඉදිරිපත් කිරීම සැලකිල්ලට ගනිමින්, 2021 මැයි 15 වන විට අක්‍රිය තත්ත්වයේ පවතින ණය පහසුකම්, දීර්ඝ කාලයක් සඳහා ප්‍රතිලේඛනගත කිරීමට බලපත්‍රලාභී බැංකු වෙත හැකියාව පවතින අතර, මෙහිදී, පොලී අනුපාතය ඇතුළු නියමයන් හා කොන්දේසි සම්බන්ධව බලපත්‍රලාභී බැංකුව සහ ණය ගැනුම්කරු එකඟතාවයකට පැමිණිය යුතුවේ.

(ආ) මෙම යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලේඛනගත කිරීම සඳහා සලකනු ලබන පහසුකම් සඳහා 2020 අප්‍රේල් 1 සිට 2021 මැයි 15 දක්වා කාලය තුළ එකතු කර ඇති හෝ අය කර ඇති දඩ පොලී කපා හැරීමට බලපත්‍රලාභී බැංකු විසින් කටයුතු කළ යුතුය.

(ඇ) බලපත්‍රලාභී බැංකු විසින් 2020 අප්‍රේල් 01 දින හෝ ඊට පසුව අක්‍රීය ලෙස වර්ගීකරණය කර ඇති ණය පහසුකම් වලට අදාළව සියළුම අත්පත්කර ගැනීමේ ක්‍රියාමාර්ග 2021 අගෝස්තු 31 දක්වා අත්හිටුවිය යුතුය.

03. බලපත්‍රලාභී බැංකු විසින් ණය සහන ලබාදීමේදී අධික ගාස්තු හෝ අයකිරීම් එකතු නොකළ යුතුය.

04. රුපියල් 500,000 ට අඩු චෙක්පත් වලංගු කාලය 2021 ජූනි 30 දක්වා දීර්ඝ කිරීමට බලපත්‍රලාභී බැංකු විසින් කටයුතු කළ යුතුය.

05. බලපත්‍රලාභී බැංකු විසින් 2021 ජූනි 30 දක්වා කාලය තුළ සියළු චෙක්පත් ගනුදෙනු සම්බන්ධයෙන් අගරුවූ චෙක්පත් සහ චෙක්පත් ගෙවීම් නතර කිරීම් සඳහා ගාස්තු අයකිරීමෙන් වැළකිය යුතුය.

06. පැහැදිලිවම පීඩාවට පත් ගනුදෙනුකරුවන් සඳහා, 2021 ජූනි 30 දක්වා කාල සීමාව තුළ, ණය කාඩ්පත් සහ වෙනත් ණය පහසුකම් සඳහා ප්‍රමාද ගාස්තු අයකිරීම අත්හිටුවීම සඳහා බලපත්‍රලාභී බැංකු විසින් කටයුතු කළ යුතුය.

07. පවත්නා ණය පහසුකම/පහසුකම් කල්දැමීම හෝ ප්‍රතිව්‍යුහගත කිරීම වෙනුවට, ණය ගනුදෙනුකරුවෙකු විසින් ඔහුගේ/ඇයගේ පවත්නා ණය පහසුකම් 2021 අගෝස්තු 31 දිනට හෝ ඊට පෙර පියවා අවසන් කිරීමට ඉල්ලා සිටී නම් එවැනි පහසුකම් සඳහා කිසිඳු පූර්ව පියවීමේ ගාස්තුවක් අයකිරීමෙන් වැළකී සිටීමට බලපත්‍රලාභී බැංකු කටයුතු කළ යුතුය.

08. ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය (CRIB) වෙත වාර්තා කිරීම්

(අ) බලපත්‍රලාභී බැංකු විසින් මෙම යෝජනා ක්‍රමය යටතේ සුදුසුකම් ලබන ණය ගනුදෙනුකරුවන්ගේ ණය අයදුම්පත්, හුදෙක් අසතුටුදායක ණය තොරතුරු (CRIB) වාර්තාවක් මත පමණක් පදනම්ව ප්‍රතික්ෂේප කිරීමෙන් වැළකිය යුතුය.

(ආ) මෙම යෝජනා ක්‍රමයට සහභාගී වීම ණය ගැනුම්කරුවන්ගේ ඉදිරි ණය තොරතුරු වාර්තා සහ අනාගත ණය ශ්‍රේණිගත කිරීම් කෙරෙහි බලපෑමක් ඇති නොවන ආකාරයෙන්, මෙම යෝජනා ක්‍රමය යටතේ ලබා දී ඇති ණය ආපසු ගෙවීම කල්දැමීම්/ප්‍රතිව්‍යුහගත කිරීම් වාර්තා කිරීම සඳහා ක්‍රමවේදයක් බලපත්‍රලාභී බැංකු විසින් ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය සමඟ සාකච්ඡා කොට සකස් කළ යුතු වේ.

09. ඉල්ලීම් ඉදිරිපත් කිරීම සඳහා අවසාන දිනය

(අ) ඉහත ණය සහන සඳහා සුදුසුකම් ලත් ණය ගනුදෙනුකරුවන් විසින් 2021 ජූනි 21 දිනට හෝ ඊට පෙර ලිඛිතව හෝ විද්‍යුත්

මාර්ගයෙන් සිය ඉල්ලීම් අදාළ බැංකු වෙත යොමු කළ යුතු අතර, බලපත්‍රලාභී බැංකු විසින් මෙම ණය සහනයන්, අයදුම් කළ හැකි අවසාන දිනය සහ අයදුම්පත් ඉදිරිපත් කල යුතු ආකෘතිය ආදී තොරතුරු සුදුසුකම් ලත් සියලුම ණය ගනුදෙනුකරුවන් වෙත විද්‍යුත් තැපෑල සහ කෙටි පණිවුඩ ඇතුළු මුද්‍රිත හා/හෝ විද්‍යුත් මාධ්‍ය ඔස්සේ කඩිනමින් සන්නිවේදනය කළ යුතුය.

(ආ) පිළිගත හැකි හේතු සහිතව 2021 ජූනි 21න් පසුව වුවද කරනු ලබන ඕනෑම ඉල්ලීමක් සලකා බැලීමට බලපත්‍රලාභී බැංකු වෙත හැකියාව ඇත.

(ඇ) සුදුසුකම් ලද මුත් ණය ආපසු ගෙවීමේ හැකියාව ඇති ණය ගනුදෙනුකරුවන් විසින් ණය පහසුකම් කල්දැමීම හෝ ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා අයදුම් කිරීම වෙනුවට ණය ආපසු ගෙවීම් සඳහා කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

(ඈ) මෙම ණය සහන සඳහා අයදුම් කරනු ලබන ණය ගනුදෙනුකරුවන්ගේ ඉල්ලීම් අනුමත කිරීමට පෙර අදාළ ණය පහසුකම් කල්දැමීමේ හෝ ප්‍රතිව්‍යුහගත කිරීමේ ආකාරය පිළිබඳව දැනුවත් කිරීමට බලපත්‍රලාභී බැංකු කටයුතු කළ යුතු අතර, එවැනි ඉල්ලීම් ප්‍රතික්ෂේප කිරීමේ දී ද, ඒ සඳහා හේතු පැහැදිලිව සඳහන් කිරීමට බලපත්‍රලාභී බැංකු කටයුතු කළ යුතුය.

10. ණය සහන කාල සීමාව සම්බන්ධව ගිණුම් තැබීම

බලපත්‍රලාභී බැංකු විසින් ණය සහන කාල සීමාවට අදාළව ගිණුම් තැබීමේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2020 ඔක්තෝබර් 28 දින නිකුත් කරන ලද 2020 අංක 09 දරන චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතු අතර, මේ සම්බන්ධව අමතර මඟ පෙන්වීමක් අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා බලපත්‍රලාභී බැංකු හට ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයෙන් හෝ විගණකවරුන්ගෙන් මගපෙන්වීමක් උපදෙස් පැතිය හැක.

11. වාර්තාකරණ අවශ්‍යතා

බලපත්‍රලාභී බැංකු විසින් 2021 ජූනි 30 වන දින සිට වැඩකරන දින 15 ක් ඇතුළත, සෑම මසකම 30 වන දින වන විට තම ණය ගනුදෙනුකරුවන් විසින් ලබා ගත් සහන පිළිබඳ තොරතුරු බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවට වාර්තා කළ යුතු අතර, අදාළ වාර්තාකරණ ආකෘති බලත්‍රලාභී බැංකු වෙත ඉදිරි කාලයේදී යොමු කරනු ඇත.

අත්සන් කලේ,
මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති හා
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

චක්‍රලේඛය 2021 අංක 06 2021 ජූනි 07

කොවිඩ්-19 වසංගතය මධ්‍යයේ බැංකු සේවා සැපයීම

දැනට පවතින සංචරණ සීමාවන් යටතේ බැංකු සේවා සැපයීමේදී කොවිඩ්-19 පැතිරීම පාලනය කිරීම සඳහා නිකුත් කර ඇති අදාළ සියලුම ආරක්ෂක පියවරයන් සහ මාර්ගෝපදේශ දැඩි ලෙස පිළිපැදීමට යටත්ව, අත්‍යාවශ්‍ය බැංකු සේවා පවත්වාගෙන යන ලෙස, ශ්‍රී ලංකා මහ බැංකුව විසින්, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ පොලිස්පතිගේ අනුමැතිය/එකඟතාව ලබා ගැනීමෙන් පසු, බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු (බලපත්‍රලාභී බැංකු) වෙතින් දැනටමත් ඉල්ලා ඇත.

1. ඒ අනුව, සියලුම බලපත්‍රලාභී බැංකු විසින් කොවිඩ්-19 ව්‍යාප්තිය පවතින අවස්ථාවන් හිදී පහත සඳහන් කරුණුවලට අනුකූලව බාධාවකින් තොරව බැංකු සේවා සැපයීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කළ යුතුය.

   (i) වෙළෙඳ මූල්‍යකරණය, භාණ්ඩාගාර මෙහෙයුම්, නිෂ්කාශන කටයුතු, විශ්‍රාම වැටුප්/වැටුප් ගෙවීම, ගනුදෙනුකරුවන්ගේ අනෙකුත් හදිසි ඉල්ලීම්/ විමසීම් වලට ප්‍රතිචාර දැක්වීම වැනි අත්‍යවශ්‍ය සේවා සැපයීම සඳහා පමණක් බැංකු ශාඛා විවෘත කිරීම;

   (ii) බලපත්‍රලාභී බැංකුවල සේවයට වාර්තා කිරීමට අවසර දී ඇති කාර්ය මණ්ඩල සංඛ්‍යාව එක් ශාඛාවකට 15 නොඉක්මවිය යුතුය;

   (iii) කාර්ය මණ්ඩලය සේවා මුර පදනම මත සේවයට වාර්තා කළ යුතුය, නැතහොත් එක් එක් ශාඛාවේ ගනුදෙනුකරුවන්ගේ නිශ්චිත අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් නිශ්චිත දිනවලදී පමණක් බැංකු ශාඛා විවෘත කළ යුතුය; සහ

   (iv) අදාළ කාර්ය මණ්ඩලයේ ගමනාගමනය සඳහා ශාඛා කළමනාකරුවන් විසින් මෙහි අමුණා ඇති ආකෘතියේ දක්වා ඇති තොරතුරු ඇතුළත් කරමින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් ලිපියක් මඟින් ළඟම ඇති පොලිස් ස්ථානයෙන් පූර්ව අනුමැතිය ලබා ගත යුතුය.

2. බලපත්‍රලාභී බැංකු විසින් පහත සඳහන් ක්‍රියාමාර්ග ගත යුතු වේ.

   (i) අත්‍යාවශ්‍ය බැංකු සේවා ලබා ගත හැකි ආකාරය පිළිබඳව සාමාන්‍ය ජනතාව දැනුවත් කරමින් දැන්වීම් පළ කිරීම.

   (ii) මෙම කාල සීමාව තුළ අත්‍යවශ්‍ය බැංකු සේවා ලබා ගැනීම සඳහා බැංකුව හා සම්බන්ධ විය හැකි ආකාරය ගැන තොරතුරු, ශාඛාවේ කාර්ය මණ්ඩලය සම්බන්ධ කරගත හැකි ක්ෂණික ඇමතුම් අංක ඇතුළු විවිධ ගනුදෙනු ක්‍රම ආදිය සම්බන්ධව බැංකු ගනුදෙනුකරුවන් දැනුවත් කිරීමට ප්‍රමාණවත් පියවර ගැනීම.

(iii) පාරිභෝගික විමසුම් සඳහා කඩිනම් පිළිතුරු සහ විසඳුම් ලබා දීම සහතික වීම; සහ

(iv) ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATM), මුදල් තැන්පතු යන්ත්‍ර (CDM), මුදල් ප්‍රතිචක්‍රීකරණ යන්ත්‍ර (CRM) සහ ජංගම බැංකු වාහන ඇතුළු ඉලෙක්ට්‍රොනික/ඩිජිටල් නාලිකා භාවිතයට පහසුකම් සැලසීම දිගටම පවත්වාගැනීම.

මෙහි ඇමුණුම 1 පහත සබැඳිය ඔස්සේ ලබා ගත හැක.

https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/laws/cdg/bsd_circul%_no_6_of_2021_e.pdf

අත්සන් කලේ,
මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති හා
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

බැංකු පනත් විධාන 2021 අංක 09 2021 ජූනි 16

බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා ප්‍රතිසාධන සැලසුම්

1988 අංක 30 දරන බැංකු පනතේ 46 (1) සහ 76 (ඒ) (1) වගන්ති මඟින් පැවරෙන බලතල ප්‍රකාරව, මුදල් මණ්ඩලය විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා ප්‍රතිසාධන සැලසුම් පවත්වා ගෙන යෑමේ අවශ්‍යතාව පිළිබඳව වන මෙම විධාන නිකුත් කරනු ලැබේ. ඒ අනුව බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු (මින් ඉදිරියට බලපත්‍රලාභී බැංකු ලෙස හැඳින්වෙන) වෙත පහත කරුණු මෙයින් දැනුම් දෙනු ලැබේ.

1. බලගැන්වීම

1.1 1988 අංක 30 දරන බැංකු පනතේ 46(1) සහ 76 (ඒ) (1) වගන්ති ප්‍රකාරව, සියලුම බලපත්‍රලාභී බැංකුවලට එවැනි බැංකුවක් නැතහොත් බැංකුවල ව්‍යාපාරයන්හි ඕනෑම පැතිකඩක් සිදු කළ යුතු ආකාරය සම්බන්ධව විධානයන් නිකුත් කිරීමට හැකියාව ඇත.

2. මෙම විධානයේ අදාළත්වය

2.1 බලපත්‍රලාභී බැංකු වල ආයතන-විශේෂිත ආතතීන්, වෙළඳපල පුරා ඇති ආතතීන් හෝ මේ දෙආකාරයේම සංකලනයකින් පැන නඟින ප්‍රාග්ධනය, ද්‍රවශීලතාවය සහ අනෙකුත් සියලුම පැතිකඩයන්ට ඇති විය හැකි කම්පනයන්ට මුහුණ දීම සඳහා පුළුල් පරාසයක ප්‍රතිසාධන විකල්පයන් ප්‍රතිසාධන සැලසුම් මඟින් හඳුනාගත යුතුය.

2.2 සෑම බලපත්‍රලාභී බැංකුවකට ම ප්‍රතිසාධන සැලැස්මක් තිබිය යුතු අතර, ඊට පහත දෑ ඇතුළත් විය යුතුය.

(අ) බලපත්‍රලාභී බැංකුවේ ස්වභාවය, පරිමාණය, සංකීර්ණභාවය සහ අන්තර් සබඳතාව සලකා බලමින් සම්පාදනය කළ ප්‍රතිසාධන සැලැස්මෙහි විෂය පථය

(ආ) බැංකු සමූහයේ ප්‍රතිසාධන රාමුව මඟින් ආවරණය වන ආයතන

3. අතිශය වැදගත් කාර්යයන් සහ අතිශය වැදගත් හවුල් සේවා

3.1 ප්‍රතිසාධන රාමුව මඟින් අතිශය වැදගත් කාර්යයන් සහ අතිශය වැදගත් හවුල් සේවා පැහැදිලිව හඳුනා ගැනීම සහ නිර්වචනය කළ යුතුය.

3.2 සමස්ත බැංකුව වෙතම හවුල් සේවාවන් අඛණ්ඩව ලබා ගැනීම තහවුරු වන ආකාරයෙන්, සිදු කළ හැකි ප්‍රතිසාධන සහ නිරාකරණ විකල්ප යටතේ අතිශය වැදගත් කාර්යයන් සහ අතිශය වැදගත් හවුල් සේවා සංවිධානය කළ යුතුය.

4. ප්‍රතිසාධන ප්‍රේරකයන් සහ දර්ශක

4.1 සෑම බලපත්‍රලාභී බැංකුවකට ම ප්‍රතිසාධන සැලැස්මක් තිබිය යුතු අතර, ඊට පහත දෑ ඇතුළත් විය යුතුය.

(අ) ප්‍රතිසාධන ක්‍රියාමාර්ග කාලීනව ක්‍රියාත්මක කිරීමට හැකි වන සේ ප්‍රතිසාධන සැලැස්මට නිසි දර්ශක, ප්‍රේරක සහ ක්‍රියා පිළිවෙල ඇතුළත් විය යුතුය.

(ආ) හඳුනා ගත් දර්ශක සහ ප්‍රේරක ප්‍රමාණාත්මක සහ ගුණාත්මක ප්‍රේරක ගණනාවකින් සමන්විත විය යුතුය.

(ඇ) ප්‍රමාණාත්මක දර්ශක සහ ප්‍රේරණ අදාළ සෑම විටකදීම, ඊට ආශ්‍රිත නියාමන අවශ්‍යතාවයන්ට වඩා වැඩි මට්ටම්වලින් තැබිය යුතුය.

(ඈ) එවැනි ප්‍රේරකවලට අමතරව, අධීක්ෂණය සඳහා ඍණාත්මක ප්‍රවණතා හඳුනා ගැනීමට පූර්ව අනතුරු ඇඟවීමේ දර්ශක භාවිත කළ යුතුය.

5. ප්‍රතිසාධන විකල්ප

5.1 බලපත්‍රලාභී බැංකු වල ආයතන-විශේෂිත ආතතීන්, වෙළඳපල පුරා ඇති ආතතීන් හෝ මේ දෙආකාරයේම සංකලනයකින් පැන නගින ප්‍රාග්ධනය, ද්‍රවශීලතාවය සහ අනෙකුත් සියලුම පැතිකඩයන්ට ඇති විය හැකි කම්පනයන්ට මුහුණ දීම සඳහා පුළුල් පරාසයක ප්‍රතිසාධන විකල්පයන් ප්‍රතිසාධන සැලසුම් මඟින් හඳුනාගත යුතු අතර, අවමයක් ලෙස එහි පහත දෑ ඇතුළත් විය යුතුය.

(අ) විකල්පය නිසා ප්‍රාග්ධනය, ද්‍රවශීලතාවය සහ/හෝ වෙනත් ඕනෑම පරාසයක් වෙත යම් අපේක්ෂිත බලපෑම හෝ ප්‍රතිඵලයක් ඇත්නම් එය,

(ආ) විකල්පය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කාලය සහ සම්පත්.

(ඇ) විකල්පය ක්‍රියාත්මක කිරීමේ දී ඇති විය හැකි බාධක.

(ඈ) බාධකවලට පිළියම් යෙදීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග.

(ඉ) ක්‍රියාත්මක කිරීමේ පිරිවැය සම්බන්ධ විස්තර.

(ඊ) විකල්පය සඳහා නිශ්චිත සන්නිවේදන සැලසුම්කරණය පිළිබඳ විස්තර.

5.2 බැංකුවක ප්‍රතිසාධන විකල්ප සාධාරණ කාල රාමුවක් තුළ ක්‍රියාත්මක කළ හැකි ඒවා විය යුතු අතර, මෙම විකල්පයන්හි තිරසාරභාවය සහ ජීව්‍යතාව පිළිබඳ ගැඹුරින් ඇගයීමට ලක් කළ යුතුය.

5.3 ප්‍රතිසාධන සැලසුම් මඟින් පෙර තත්ත්වයට යළි පැමිණීමේ දී පැන නැගිය හැකි නෛතික, කීර්ති නාමය සහ මෙහෙයුම් කටයුතු සම්බන්ධ බාධක සලකා බලා ප්‍රතිසාධන විකල්ප නිසි කලට වේලාවට ක්‍රියාත්මක කිරීම තහවුරු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාපටිපාටි සම්පාදනය කළ යුතුය.

5.4 සෑම බලපත්‍රලාභී බැංකුවක් ම ප්‍රතිසාධන සැලසුම් සම්පාදනය කිරීමේ දී ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම්කරණ ක්‍රියාමාර්ග ද නිසි ආකාරයෙන් ඇතුළත් කළ යුතුය.

6. අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකාරීත්වය

6.1 සෑම බලපත්‍රලාභී බැංකුවක් ම එහි ප්‍රතිසාධන ක්‍රියාවලිය පාලනය කිරීමට ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ සාමාජිකයෙකු පත් කළ යුතු අතර, ප්‍රතිසාධන ක්‍රියාවලියට සහාය ලබා දීමට ශක්තිමත් පාලන ව්‍යුහයක් සහ ප්‍රමාණවත් සම්පත් නිසි තැන්හි යෙදවිය යුතුය. ප්‍රතිසාධන ක්‍රියාවලියෙහි නිරත වී සිටින සෑම පුද්ගලයෙකුගේ ම කාර්යභාරයන් සහ වගකීම් බැංකුව තුළ පැහැදිළිව පැවරිය යුතු අතර, එය ප්‍රතිසාධන සැලැස්ම තුළ නිශ්චිතව දැක්විය යුතුය.

6.2 දේශීය වශයෙන් සංස්ථාපිත බලපත්‍රලාභී බැංකුවක් සඳහා ප්‍රතිසාධන සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ද, ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපිත බලපත්‍රලාභී බැංකුවක් සඳහා කලාපීය/ගෝලීය ප්‍රධාන කාර්යාලය විසින් ද අනුමත හෝ පිටසන් කරනු ලැබිය යුතුය.

6.3 ප්‍රතිසාධන සැලැස්ම කාලානුරූපව වෙනස්වන ක්‍රියාවලියක් විය යුතු අතර, අවම වශයෙන් වාර්ෂිකව යාවත්කාලීන කළ යුතු අතර, පවතින අවදානම් කළමනාකරණ රාමුව සහ ක්‍රියාවලි සමඟ ඒකාබද්ධ විය යුතුය.

6.4 ප්‍රතිසාධන සැලැස්ම සම්පාදනය කිරීම, පවත්වා ගෙන යෑම/නිතිපතා සමාලෝචනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ සක්‍රීය කිරීම සඳහා ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය, අදාළ දෙපාර්තමේන්තු/අංශ සහ වෙනත් අදාළ නිලධාරීන්ගේ පැහැදිලි වගකීම් පැවරිය යුතු අතර ලේඛනගත කළ යුතුය.

6.5 ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපිත බලපත්‍රලාභී බැංකු වෙනත් කරුණු අතර ඔවුන්ගේ ප්‍රතිසාධන සැලැස්ම තුළ පහත කරුණු ඇතුළත් කළ යුතුය.

(අ) දේශීය මෙහෙයුම් මව් බැංකුවේ ප්‍රතිසාධන සහ යෝජනා සම්මත රාමුවට ඒකාබද්ධ කොට ඇති ආකාරය

(ආ) ප්‍රතිසාධන සැලැස්ම පිළිබඳ දේශීය නියාමන ආයතනයට සිදු කර ඇති යොමු කිරීම් ඇත්නම් ඒවායෙහි කෙටි විස්තරයක්.

(ඇ) එවැනි බැංකුවක් ඇති විය හැකි අවස්ථාව අනුව, මහ බැංකුවේ නියෝගය මත, ශ්‍රී ලංකාව තුළ එය විසින් සිදුකර ගෙන යනු ලබන ව්‍යාපාරයේ දී හෝ ඒ හා සම්බන්ධව ඇති වන සියලු වගකීම් ඉටු කිරීමට අවශ්‍ය අරමුදල් සපයන බව සඳහන් කරමින්, සංශෝධිත පරිදි 1988 අංක 30 දරන බැංකු පනතෙහි වගන්ති 3 (2) (ආ) (i) යටතේ, ප්‍රධාන කාර්යාලයේ නැතහොත් මව් ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මතයක් මඟින් සහාය ලද ලිඛිත ප්‍රතිඥාවක පිටපතක්.

7. කළමනාකරණ තොරතුරු සහ සන්නිවේදන සැලසුම්කරණය

7.1 සෑම බලපත්‍රලාභී බැංකුවක් ම බැංකුවේ ප්‍රතිසාධන ක්‍රියාවලිය සඳහා අවශ්‍ය තොරතුරු නිෂ්පාදනය කිරීමට හැකියාව පවතින කළමනාකරණ තොරතුරු පද්ධති තුළ තොරතුරු පවත්වා ගෙන යා යුතුය.

7.2 සෑම බලපත්‍රලාභී බැංකුවක් ම පහත දක්වා ඇති අංශ පිළිබඳ යාවත්කාලීන වූ තොරතුරු පවත්වා ගෙන යා යුතු අතර, ඒවාට පමණක් සීමා නොවිය යුතුය:

(අ) ගිණුම් අංකය, තැන්පතු වර්ගය, තැන්පතු ශේෂය, සම්බන්ධ කර ගැනීමේ විස්තර සහ වෙනත් අදාළ ඕනෑම විස්තරයක් ඇතුළුව තැන්පතුකරුවන්ගේ ලැයිස්තුව.

(ආ) බලපත්‍රලාභී බැංකුවේ සියලු ගිවිසුම් පිළිබඳ තොරතුරු.

(ඇ) අන්තර් කාණ්ඩ ගනුදෙනු පිළිබඳ තොරතුරු.

7.3 ප්‍රතිසාධන සැලැස්ම පිළිබඳ අභ්‍යන්තර සහ බාහිර පාර්ශ්වකරුවන් සමඟ කාලීන සන්නිවේදනයක් තහවුරු කිරීමට සන්නිවේදන සැලැස්මක් නිසි තැන්හි තිබිය යුතුය.

8. නියාමන වාර්තා කිරීම්

8.1 2022 වර්ෂය ආරම්භයේ සිට, රුපියල් ට්‍රිලියන 1 ට වඩා වැඩි වත්කම් සහිත බලපත්‍රලාභී බැංකු වාර්ෂිකව එක් එක් වර්ෂයේ ජූනි 30 වන දින වන විට හෝ ප්‍රතිසාධන සැලැස්ම කැපී පෙනෙන ලෙස සංශෝධනය වූ විට, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ-වරයා වෙත සම්පාදනය කර යොමු කළ යුතුය.

8.2 2022 වර්ෂය ආරම්භයේ සිට, රුපියල් ට්‍රිලියන 1ට අඩු වත්කම් සහිත බලපත්‍රලාභී වාණිජ බැංකු 2022 ජූනි 30 වන දින සිට ප්‍රතිසාධන සැලසුම් පවත්වා ගෙන යා යුතු අතර, එවැනි ප්‍රතිසාධන සැලසුම් අදාළ බැංකුවේ ව්‍යවස්ථාපිත පරීක්ෂණ වලදී සමාලෝචනය කිරීමට යටත් වනු ඇත.

8.3 බැංකුවක් ප්‍රතිසාදන සැලසුම් ක්‍රියාමාර්ග සක්‍රීය කරමින් ප්‍රේරක අවස්ථාවකට ළඟා වන විට දී හෝ බලපත්‍රලාභී බැංකුවක් ඉහළ ආතති මට්ටමක් අත්දකින විට දී බලපත්‍රලාභී බැංකු වහාම බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා වෙත දැනුම් දිය යුතුය.

8.4 බලපත්‍රලාභී බැංකුවලට ප්‍රතිසාධන සැලැස්මක් කෙටුම්පත් කිරීම සඳහා පුළුල් මාර්ගෝපදේශයක් සැපයීමේ ආදර්ශක ආකෘතියක් I උපලේඛනයෙහි අමුණා ඇත. කෙසේ වෙතත්, ප්‍රමාණය, බැංකු ව්‍යාපාර ආකෘතිය, සංකීර්ණභාවය, අන්තර් සම්බන්ධිතභාවය, අවදානම් පැතිකඩ සහ එක් එක් බැංකුවේ පද්ධතිමය වැදගත්කම මත පදනම්ව, ප්‍රතිසාධන සැලැස්මෙහි සංයුතිය සහ ඉදිරිපත් කිරීම සාධාරණ ප්‍රමාණයකින් වෙනස් වීම අපේක්ෂා කෙරේ.

9. අර්ථකථන

9.1 තීරණාත්මක කාර්යයන් යන්නෙන් බැංකුකරණ සමූහයේ ප්‍රමාණය සහ වෙළඳපොල කොටස, බාහිර සහ අභ්‍යන්තර අන්තර් සම්බන්ධතාව, සංකීර්ණභාවය සහ හරස් දේශ සීමා කටයුතු හේතුවෙන් මූර්ත ආර්ථිකය සහ මූල්‍ය ස්ථාවරභාවයේ ක්‍රියාත්මක කිරීම සඳහා අත්‍යාවශ්‍ය වන සේවා ඇණ හිටීමකට තෙවන පාර්ශ්වයන් වෙත සිදු කරන කටයුතුවල අපොහොසත් වීමක් මඟ පාදනු ඇති, එවැනි කටයුතු යන්න අර්ථවත් විය යුතුය.

9.2 තීරණාත්මක හවුල් සේවා යන්නෙන් ආයතනය තුළ ක්‍රියාත්මක කරනු ලබන නැතහොත් තෙවන පාර්ශ්වයන් වෙත බහිස්සේවාර්පණය කළ ක්‍රියාකාරකම් යන්න අර්ථවත් විය යුතු අතර, එවැනි සේවාවක් සැපයීමට අපොහොසත් වීම මඟින් තීරණාත්මක කාර්යයන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වීමේ තත්ත්වයකට මඟ පාදනු ඇත. තවද, එහි ප්‍රතිඵලයක් ලෙස, මූල්‍ය ස්ථාවරභාවය සඳහා මූර්ත ආර්ථිකයේ ක්‍රියාකාරීත්වයට අත්‍යාවශ්‍ය වන සේවාවන්හි බිඳ වැටීමකට එය තුඩු දෙනු ඇත.

9.3 තෙවන පාර්ශ්වයන් විසින් බලපත්‍රලාභී බැංකුව සමඟ ව්‍යාපාර සබඳතාවකට පිවිසී ඇති සියලු ආයතන සහ පුද්ගලයන් ඇතුළත් කළ යුතුය.

මෙම විධානයන්ගේ සටහන 1 පහත සබැඳිය ඔස්සේ ලබා ගත හැක.

https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/laws/cdg/Banking_Act_Directions_No_9_of_2021.pdf

මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති හා
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

බැංකු පනත් විධාන 2021 අංක 10 2021 ජූනි 16

බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව මඟින් ශ්‍රී ලංකා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල ආයෝජනය කිරීම පිළිබඳ බැංකු පනත් විධානය

1988 අංක 30 දරන සංශෝධිත බැංකු පනතේ 46(1) සහ 76(ඒ)(1) යන වගන්ති ප්‍රකාරව නිකුත් කරන ලදී.

1. ශ්‍රී ලංකා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් ආයෝජනය කිරීම පිළිබඳ සඳහන් 2021 අප්‍රේල් 23 වන දිනැති 2021 අංක 06 දරන බැංකු පනත් විධානය, මෙම විධානයේ දක්වා ඇති කොන්දේසීන්ට යටත්ව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෙයින් අවලංගු කරනු ලබයි.

2. පහත සඳහන් කොන්දේසීන්ට යටත්ව ද්විතීයික වෙළඳපොළින් ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර මිලදී ගැනීමට බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුවට හැකියාව ඇත.

   (i) අරමුදල් ප්‍රභවය විදේශයන්ගෙන් ලබා ගත් නව ණය මුදල් වලට සීමා විය යුතු අතර, ඒ බව ශ්‍රී ලංකා මහ බැංකුවට තෘප්තිමත් විය හැකි ලෙසින් සනාථ කළ යුතුය. මේ සඳහා, බලපත්‍රලාභී බැංකු විසින් විදේශ ව්‍යවහාර මුදල් ණය ගැනීම් පිළිබඳ නිකුත් කරන ලද 2018 අංක 11 දරන බැංකු පනතේ 9.1 විධානයේ සඳහන් කර ඇති අයුරින් විදේශ ණය ගැනීම් සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා වෙත ලේඛන ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ.

   (ii) ඉහත 2 (i) හි දක්වා ඇති අයුරින් සම්පාදනය කරගත් අරමුදල්, ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සහ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල සියයට 50 බැගින් සමානුපාතිකව ආයෝජනය කළ යුතු අතර, බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සහ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරයන්හි ආයෝජනය කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් තොරතුරු බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා සහ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ අධිකාරීවරයා වෙත යොමු කළ යුතු වේ.

      අ) ආයෝජනය කළ දිනය

      ආ) ජාත්‍යන්තර සුරැකුම්පත් හඳුනාගැනීමේ අංකය

      ඇ) ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජිත ප්‍රමාණය

   (iii) දැනට නිර්දිෂ්ඨ/අනුගමනය කරනු ලබන අනිකුත් අවදානම් අවම කරගැනීමේ ක්‍රියාමාර්ගයන්ට අමතරව, සිදු විය හැකි ඕනෑම කෙටි කාලීන කල් පිරීමේ නොගැළපීම් මඟ හරවා ගැනීම සඳහා සුදුසු අවදානම් අවම කරගැනීමේ පිළියම් යෙදීමෙන් බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව ණය ගැනීම් සහ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර/ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර අතර වන කල්පිරීමේ නොගැළපීම් වළක්වාලීම සඳහා අවදානම් අවම කරගැනීමේ ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතු වේ.

අත්සන් කලේ,
මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති හා
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

බැංකු පනත් නියෝග 2021 අංක 01 2021 ජූනි 18

බැංකුකරණ (අක්වෙරළ බැංකුකරණ ව්‍යාපාර යෝජනාක්‍රමය) නියෝග නම්කරන ලද විදේශ ව්‍යවහාර මුදල්

සංශෝධිත 1988 අංක 30 දරන බැංකු පනතේ 23, 25 සහ 26 වගන්ති යටතේ අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් කරන ලද නියෝගය.

1. නම්කරන ලද විදේශ ව්‍යවහාර මුදල්

   1.1 මෙම නියෝගයේ පහත උපලේඛනයේ දක්වා ඇති විදේශ ව්‍යවහාර මුදල්, බැංකුකරණ (අක්වෙරළ බැංකුකරණ ව්‍යාපාර යෝජනාක්‍රමය) නියෝගය යටතේ නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් ලෙස නිර්ණය කරනු ලැබේ.

   1.2 මෙම නියෝගයේ උපලේඛනය, 2011.10.27 දිනැති 2011 අංක 01 දරන බැංකුකරණ (අක්වෙරළ බැංකුකරණ ව්‍යාපාර යෝජනාක්‍රමය) නියෝගයේ උපලේඛනය ප්‍රතිස්ථාපනය කරනු ලබයි.

අත්සන් කලේ,
මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති හා
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

සටහන

නම්කරන ලද විදේශ ව්‍යවහාර මුදල්

1. ඔස්ට්‍රේලියානු ඩොලර්
2. කැනේඩියානු ඩොලර්
3. චීන රෙන්මින්බි
4. ඩෙනිෂ් ක්‍රෝනර්
5. යුරෝ
6. හොංකොං ඩොලර්
7. ජපාන යෙන්
8. නවසීලන්ත ඩොලර්
9. නෝර්වේජියානු ක්‍රෝනර්
10. ස්ටර්ලිං පවුම්
11. සිංගප්පූරු ඩොලර්
12. ස්වීඩිෂ් ක්‍රෝනර්
13. ස්විස් ෆ්‍රෑන්ක්
14. තායි බාත්
15. ඇමරිකා එක්සත් ජනපද ඩොලර්

බැංකු පනත් විධාන 2021 අංක 11 2021 ජූලි 13

බලපත්‍රලාභී බැංකුවල අභිමතානුසාරී ගෙවීම් මත පනවනු ලබන සීමා

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් කොවිඩ් - 19 ව්‍යාප්තිය හේතුවෙන් බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකුවල (මින්මතු බලපත්‍රලාභී බැංකු ලෙස හැඳින්වෙන) ද්‍රවශීලතාව සහ අනෙකුත් ප්‍රධාන කාර්යසාධන දර්ශක මත ඇති විය හැකි අහිතකර බලපෑම සහ බලපත්‍රලාභී බැංකු තුළ නිසි ද්‍රවශීලතා මට්ටම් සහ ප්‍රාග්ධන ස්වාරක්ෂක පවත්වා ගෙන යාම යනාදි කරුණු සම්බන්ධව සලකා බැලීමෙන් අනතුරුව, බලපත්‍රලාභී බැංකුවල අභිමතානුසාරී ගෙවීම් මත පනවන සීමා සම්බන්ධව මෙම විධානයන් නිකුත් කරනු ලැබේ.

1. **බලගැන්වීම**

1.1 බැංකු පනතේ 46 (I) වගන්තිය ප්‍රකාරව, බැංකු පද්ධතියේ අඛණ්ඩතාව තහවුරු කිරීම සඳහා, සියළුම බලපත්‍රලාභී බැංකුවලට බැංකු ව්‍යාපාරවලට අදාළ ඕනෑම ව්‍යාපාර පැතිකඩක් සම්බන්ධව විධානයන් නිකුත් කිරීමේ හැකියාව මුදල් මණ්ඩලය සතු වේ.

1.2 බැංකු පනතේ 76 (ඒ) (I) ප්‍රකාරව, බලපත්‍රලාභී විශේෂිත බැංකුවලට හෝ බලපත්‍රලාභී වාණිජ බැංකුවකට එහි ඕනෑම ව්‍යාපාර කටයුත්තක් සිදු කළ යුතු ආකාරය සම්බන්ධව විධාන දීමේ හැකියාව මුදල් මණ්ඩලය සතු වේ.

2. **මෙම විධානයේ අදාළත්වය**

2.1 මෙම විධානයන් ශ්‍රී ලංකාව තුළ සංස්ථාගත සෑම බලපත්‍රලාභී බැංකුවකට ම සහ ස්වාධීන පදනමක් මත, ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත නැතහොත් පිහිටු වන ලද බැංකුවක ශාඛාවක් වන, සෑම බලපත්‍රලාභී බැංකුවකට ම අදාළ වේ.

3. **අභිමතානුසාරී ගෙවීම් මත පනවනු ලබන සීමා**

3.1 2021 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශ/ අතුරු මූල්‍ය ප්‍රකාශ අවසන් කොට, බාහිර විගණකවරයෙකු විසින් විගණනය කරනු ලබන තෙක්, ශ්‍රී ලංකාව තුළ සංස්ථාගත නැතහොත් පිහිටු වන ලද සෑම බලපත්‍රලාභී බැංකුවක් ම මුදල් ලාභාංශ ගෙවීම ප්‍රමාද කළ යුතුය.

3.2 ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් ම, 2021 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශ/ අතුරු මූල්‍ය ප්‍රකාශ අවසන් කොට, බාහිර විගණකවරයෙකු විසින් විගණනය කරනු ලබන තෙක්, 2020 සහ 2021 යන මූල්‍ය වර්ෂ සඳහා දැනටමත් ප්‍රකාශ කර නොමැති ලාභ පෙරලා සිය රටට යැවීමෙන් වැළකිය යුතුය.

3.3 බලපත්‍රලාභී බැංකු විසින් මුදල් ලාභාංශ ගෙවීම සහ ලාභ සිය රටට පෙරළා යැවීම පිළිබඳ තීරණ ගැනීමේ දී බලපත්‍රලාභී බැංකු සඳහා බාසල් III යටතේ නියම කර ඇති ප්‍රාග්ධන අවශ්‍යතා, අපේක්ෂිත වත්කම් වර්ධනය, ව්‍යාපාර ප්‍රසාරණය, කොවිඩ් - 19 වසංගතයෙන් ඇති විය හැකි බලපෑම සහ පවතින වෙළඳපොල තත්ත්වයන් යනාදී වූ කරුණු වෙත නිසි සැලකිල්ල යොමු කළ යුතු වේ.

3.4 බලපත්‍රලාභී බැංකු විසින් 2021 දෙසැම්බර් 31 වන දින තෙක් පහත දෑ සඳහා අනුකූල විය යුතුය.

(අ) ස්වකීය කොටස් ආපසු මිලට ගැනීමෙන් වැළකී සිටීම.

(ආ) කළමනාකරණ දීමනා ඉහළ නැංවීමෙන් සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ගෙවීම් සිදු කිරීමෙන් වැළකී සිටීම

(ඇ) ප්‍රචාරණය, ව්‍යාපාර ප්‍රවර්ධන, ත්‍යාග යෝජනා ක්‍රම, විනෝදාස්වාදය, අනුග්‍රාහකත්වයන්, සංචාරය කිරීම සහ පුහුණුව යනාදී අත්‍යාවශ්‍ය නොවන වියදම් ඇති කර ගැනීමෙන් හැකිතාක් ප්‍රමාණයකට වැළකී සිටීම සහ විචක්ෂණභාවයෙන් කටයුතු කිරීම.

(ඈ) ප්‍රාග්ධන වියදම් සිදු කරන්නේ නම්, එහිදී නිසි සැලකිල්ලෙන් සහ විචක්ෂණශීලීව කටයුතු කළ යුතුය.

4. ක්‍රියාත්මක වන දිනය

4.1 මෙම විධානය 2021 ජූලි මස 01 වන දින සිට ක්‍රියාත්මක වේ.

අත්සන් කලේ,
මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති හා
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

චක්‍රලේඛය 2021 අංක 07 2021 අගෝස්තු 21

පවතින නිරෝධායන ඇඳිරිනීති කාලසීමාව තුළ බැංකු සේවා සැපයීම

2021 අගෝස්තු 20 දින රාත්‍රී 10 සිට 2021 අගෝස්තු 30 වන දින පෙරවරු 4 දක්වා ක්‍රියාත්මක වන නිරෝධායන ඇඳිරි නීති කාලසීමාව තුළ සිදු කිරීමට අවසර ලබා දී ඇති කටයුතු සම්බන්ධව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කර ඇති 2021 අගෝස්තු 20 දිනැති මාධ්‍ය නිවේදනය සැලකිල්ලට ගනිමින්, අත්‍යවශ්‍ය බැංකු සේවා බාධාවකින් තොරව සිදු කරන ලෙසට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු (මෙතැන් සිට බලපත්‍රලාභී බැංකු ලෙස හැඳින්වේ) වෙතින් ඉල්ලා සිටී. ඒ අනුව, සියලුම බලපත්‍රලාභී බැංකු පහත සඳහන් කරුණුවලට අනුකූලව මෙම කාලසීමාව තුළ බැංකු සේවා සැපයීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කළ යුතුය.

(i) වෙළෙඳ මූල්‍යකරණය, භාණ්ඩාගාර මෙහෙයුම්, නිෂ්කාශන කටයුතු, වැටුප් ගෙවීම, ගනුදෙනුකරුවන්ගේ අනෙකුත් හදිසි ඉල්ලීම්/විමසීම්වලට ප්‍රතිචාර දැක්වීම වැනි අත්‍යවශ්‍ය සේවා සැපයීම සඳහා පමණක් බැංකු ශාඛා විවෘත කිරීම;

(ii) ඉතා සීමිත, අත්‍යාවශ්‍ය බැංකු සේවාවන් සැපයීම සඳහා අවශ්‍ය අවම කාර්ය මණ්ඩලයක් සමඟ සේවා මුර පදනමින් ක්‍රියාත්මක වීම හෝ එක් එක් ශාඛාවේ ගනුදෙනුකරුවන්ගේ නිශ්චිත අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් නිශ්චිත දිනවලදී පමණක් ශාඛා විවෘත කිරීමට කටයුතු කිරීම;

(iii) අදාළ සියලුම ආරක්ෂක පියවරයන් සහ මාර්ගෝපදේශයන් දැඩි ලෙස පිළිපැදීම;

(iv) අත්‍යාවශ්‍ය බැංකු සේවා ලබා ගත හැකි ආකාරය සම්බන්ධයෙන් මහජනතාව දැනුවත් කිරීම සඳහා නිවේදන පලකිරීම;

(v) මෙම කාල සීමාව තුළ අත්‍යවශ්‍ය බැංකු සේවා ලබා ගැනීම සඳහා බැංකුව හා සම්බන්ධ විය හැකි ආකාරය ගැන තොරතුරු, ශාඛාවේ කාර්ය මණ්ඩලය සම්බන්ධ කර ගත හැකි ක්ෂණික ඇමතුම් අංක ඇතුළු විවිධ ගනුදෙනු ක්‍රම ආදිය සම්බන්ධව බැංකු ගනුදෙනුකරුවන් දැනුවත් කිරීමට ප්‍රමාණවත් පියවර ගැනීම;

(vi) පාරිභෝගික විමසුම් සඳහා කඩිනම් පිළිතුරු සහ විසඳුම් ලබා දීම සහතික වීම; සහ

(vii) ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATM), මුදල් තැන්පතු යන්ත්‍ර (CDM), මුදල් ප්‍රතිචක්‍රීකරණ යන්ත්‍ර (CRM) සහ ජංගම බැංකු වාහන ඇතුළු ඉලෙක්ට්‍රොනික/ඩිජිටල් නාලිකා භාවිතයට පහසුකම් සැලසීම සහ දිගටම පවත්වාගැනීම.

අත්සන් කලේ,
මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති හා
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

මුදල් නීති පනත් නියෝගය 2021 අංක 02 2021 අගෝස්තු 24

බලපත්‍රලාභී වාණිජ බැංකු වල හා ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙහි විදේශ විනිමය තැන්පතු සඳහා වන උපරිම පොලී අනුපාත

1949 අංක 58 දරන මුදල් නීති පනතේ (සංශෝධිත) 104(1)(ආ) වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලදී.

බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් රුපියල් සහ විදේශ මුදල් තැන්පතු සඳහා පිරිනමන සහ ගෙවන පොලී අනුපාතයන් හි විෂමතා සැලකිල්ලට ගනිමින්, බලපත්‍රලාභී වාණිජ බැංකු හා ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින් විදේශ මුදල් තැන්පතු සඳහා ගෙවිය යුතු උපරිම පොලී අනුපාත සඳහා නියෝගයක් මුදල් මණ්ඩලය විසින් මෙමඟින් නිකුත් කරනු ලැබේ.

1.	මුදල් නීති පනත යටතේ බලගැන්වීම	1.1	බලපත්‍රලාභී වාණිජ බැංකු හා බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින් විවිධ වර්ගයේ තැන්පතු සඳහා අය කරන උපරිම පොලී අනුපාතයන් වරින් වර තීරණය කිරීමට මුදල් නීති පනතේ 104 (1) (ආ) වගන්තිය අනුව මුදල් මණ්ඩලයට හැකියාව ඇත.
2.	විදේශ විනිමය තැන්පතු සඳහා වන උපරිම පොලී අනුපාත	2.1	බලපත්‍රලාභී වාණිජ බැංකුවක් සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් සියලුම විදේශ මුදල් තැන්පතු සඳහා පිරිනැමිය හැකි හෝ ගෙවිය හැකි උපරිම පොලී අනුපාත සියයට 5ක් දක්වා වූ වාර්ෂික ඵලදායී අනුපාතය නොඉක්මවිය යුතුය.
		2.2	විශේෂ විදේශ මුදල් තැන්පතු සඳහා පිරිනමනු ලබන හෝ ගෙවනු ලබන අතිරේක පොලී අනුපාතිකය ඉහත 2.1 හි සඳහන් අනුපාතිකය ඉක්මවිය යුතුය.
3.	නියාමන වාර්තා කිරීම් හා හෙළිදරව් කිරීම්	3.1	සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු හා ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින්;
			(i) විදේශ විනිමය තැන්පතු සඳහා වන පොලී අනුපාත පිළිබඳ තොරතුරු "පොලී අනුපාත" යන සති වාර්තාව අනුව භාරදිය යුතුය.
			(ii) ගණුදෙනුකරුවන් සඳහා පිරිනමනු ලබන විදේශ විනිමය තැන්පතු සඳහා වන පොලී අනුපාත පිළිබඳ තොරතුරු දැනුම් දීමට හා ප්‍රදර්ශනය කිරීමට කටයුතු කළ යුතුය
4.	ක්‍රියාත්මක කිරීම	4.1	මෙම නියෝගය නිකුත් කළ දින සිට බලපැවැත්වෙන අතර, නව විදේශ මුදල් තැන්පතු, පවත්නා විදේශ මුදල් ඉතුරුම් තැන්පතු සහ කාලීන තැන්පතු අලුත් කිරීම් සඳහා අදාළ වේ.

අත්සන් කලේ,
මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති හා
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

චක්‍රලේඛය 2021 අංක 08 2021 සැප්තැම්බර් 01

කොවිඩ්-19 නිසා බලපෑමට ලක්වූ ව්‍යාපාර සහ පුද්ගලයන්ට සහන සැලසීම

(මෙය 2021 සැප්තැම්බර් 01 දින නිකුත් කරන ලද 2021 අංක 08 දරන චක්‍රලේඛයේ සිංහල පරිවර්තනයකි.)

ශ්‍රී ලංකාව තුළ කොවිඩ්-19 වසංගත තත්ත්වය යලි ඉහළ යාමත් සමඟ, 2021 මැයි 25 දිනැති 2021 අංක 05 දරන චක්‍රලේඛය යටතේ බලපෑමට පත් ගනුදෙනුකරුවන් වෙත ලබා දී තිබූ ණය සහන දීර්ඝ කිරීමට සලකා බලන ලෙස බොහෝ පාර්ශව විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඉල්ලීම් කර ඇත. ඒ අනුව, දැනට පවතින කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ව්‍යාපාර සහ පුද්ගලයින් විසින් මුහුණ පා ඇති අභියෝගයන් සැලකිල්ලට ගනිමින්, 2021 මැයි 25 දිනැති 2021 අංක 05 දරන චක්‍රලේඛය යටතේ ලබා දී ඇති ණය සහන පහත සඳහන් පරිදි දීර්ඝ කරන ලෙසට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු (බලපත්‍රලාභී බැංකු) වෙතින් ඉල්ලා සිටී. තවද, කොවිඩ්-19 ව්‍යාප්තිය හේතුවෙන් පීඩාවට පත් ව්‍යාපාර හා පුද්ගලයන් ගේ ඉල්ලීම පරිදි, මෙම චක්‍රලේඛය යටතේ ලබා දී ඇති සමස්ත ප්‍රතිලාභයන්ට වඩා අඩු නොවන අයුරින් අමතර සහන සැලසීම සඳහා බලපත්‍රලාභී බැංකු හට හැකියාව ඇත.

වර්තමානයේ ව්‍යාපාර/ආදායම් උත්පාදන කටයුතු වලට මතුවී ඇති බාධා හේතුවෙන් පීඩාවට පත් වූ ණය ගනුදෙනුකරුවන්ට, තම බැංකු ණය නිසි ලෙස පියවාගත නොහැකි වීමෙන් ඇතිවන අපහසුතා ලිහිල් කිරීම සඳහා සියළු බලපත්‍රලාභී බැංකු හරහා මෙම යෝජනා ක්‍රමය ඒකාකාරී ලෙස ක්‍රියාත්මක කිරීමේ අරමුණින් මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ. සංචාරක කර්මාන්තය සඳහා ලබා දුන් ණය සහන ලබා ගැනීමට සුදුසුකම් ලත් සංචාරක අංශයේ ණය ගනුදෙනුකරුවන් සඳහා මෙම චක්‍රලේඛය අදාළ නොවනු ඇත.

1. 2021 සැප්තැම්බර් 01 දින වන විට සක්‍රීයව පැවති ණය පහසුකම් කල් දැමීම හෝ ප්‍රතිව්‍යුහගත කිරීම.

(අ) කොවිඩ්-19 ව්‍යසනයේ ව්‍යාප්තිය හේතුවෙන් පීඩාවට පත් වූ ණය ගනුදෙනුකරුවන්ගේ දැනට පවතින ණය පහසුකම් සඳහා, මුල් ණය මුදල හෝ පොලිය හෝ ඒ දෙකම හෝ 2021 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ අයකර ගැනීම කල් දැමීමට ඒ ඒ අවස්ථානුකූලව බලපත්‍රලාභී බැංකු විසින් කටයුතු කළ යුතුය. මෙහිදී, එවැනි ණය ගනුදෙනුකරුවන් මුහුණ දී ඇති මූල්‍ය දුෂ්කරතා, එනම් රැකියාව අහිමි වීම, වැටුප්/ආදායම හෝ වෙළඳාම් අඩු වීම හෝ අහිමිවීම, ව්‍යාපාර කටයුතු අඩාල වීම, බිඳවැටීම හෝ ව්‍යාපාර වසා දැමීම යනාදිය සැලකිල්ලට ගත යුතු වේ.

(ආ) ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයන්හි නියුතු ණය ගනුදෙනුකරුවන් විසින් සහන ලබා ගැනීම සඳහා කරනු ලබන ඉල්ලීම් සඳහා අවස්ථාව ලබා දීමට ප්‍රමුඛත්වය දැක්වීමට බලපත්‍රලාභී බැංකු කටයුතු කළ යුතුය.

(ඇ) සුදුසුකම් ලත් ණය ගනුදෙනුකරුවන් විසින් මුහුණ පා ඇති මූල්‍ය දුෂ්කරතා සහ ගනුදෙනුකරුගේ ආපසු ගෙවීමේ හැකියාව සැලකිල්ලට ගනිමින්, එම ගනුදෙනුකරුවන්ගේ රුපියල් වලින් හෝ විදේශ මුදලින් ඇති ණය පහසුකම් එකක් හෝ ඊට වැඩි ගණනක මුල් ණය මුදල හෝ පොලිය හෝ ඒ දෙකම ගෙවීම කල් දැමීම සිදු කළ යුතුය.

(ඈ) බලපත්‍රලාභී බැංකු විසින් කලින් පැවති ණය සහන/වාරික කල් දැමීමේ යෝජනා ක්‍රම සම්බන්ධයෙන් ගෙවිය යුතු මුදල් (එනම් මුල් ණය මුදල, පොලිය සහ එම ණය සහන කාලයට/කල්දැමීමට අදාළ පොලී මුදල) සහ මෙම යෝජනා ක්‍රමය තුළ ගෙවිය යුතු ප්‍රමාණය (එනම් මුල් ණය මුදල සහ පොලිය) ඒකාබද්ධ කර නව ණය පහසුකමකට හැරවිය යුතුය. මෙම නව ණය පහසුකම සඳහා, පහත 1(ඉ) හි සඳහන් පරිදි 2021 සැප්තැම්බර් 01 දින සිට ඇරඹෙන පරිදි පොලී අය කළ හැකි අතර, එය පහත 1(ඊ) සහ (උ) සඳහන් පරිදි ගිවිසගත් කාල සීමාව සඳහා වෙනම ණය පියවීමේ ක්‍රමක්ෂය සටහනක් (loan amortization schedule) අනුව අය කළ යුතුය.

(ඉ) ඉහත ආපසු ගෙවීම කල්දමන ලද ඕනෑම රුපියල් ණය පහසුකමක් සම්බන්ධයෙන්, 2021 අගෝස්තු 31 දින පැවති දින-364 භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසි අනුපාතයට සියයට 1 එකතු කළ අගය නොඉක්මවන වාර්ෂික පොලී අනුපාතයක් (එනම්, 5.93%+1% = 6.93%) අය කළ හැකිය. විදේශ මුදලින් ගත් ණය සඳහා බලපත්‍රලාභී බැංකු විසින් පවත්නා අඩු පොලී අනුපාත සැලකිල්ලට ගනිමින් සහනදායී පොලී අනුපාතයක් අය කළ හැකිය. තවද, කල් දැමීමේ කාලය අවසන් වූ පසු දැනට පවතින පහසුකමෙහි කල්දැමූ මුල් මුදල (deffered capital amount) හැර ඉතිරි මුල් මුදල් ශේෂය (capital outstanding) සඳහා වූ පොලිය, ගිවිසුම්ගත පොලී අනුපාත යටතේ අඛණ්ඩව ගණනය වේ.

(ඊ) කල්බදු පහසුකම් ඇතුළුව වාරික ණය සම්බන්ධයෙන්, ඉහත සඳහන් 1 (ඈ) හි සඳහන් නව ණය පියවීම සඳහා බලපත්‍රලාභී බැංකු සහ අදාළ ණය ගනුදෙනුකරුවන්, ඉහත 1(අ) හි දක්වා ඇති පරිදි, ණය ගනුදෙනුකරුවන් මුහුණ දෙන මූල්‍ය දුෂ්කරතා සැලකිල්ලට ගනිමින්, 2022 ජූලි 01 දින සිට මාස 6 දක්වා ආපසු ගෙවීමේ කාලසීමාවකට එකඟ විය යුතුය. මෙම ණය මුදල, ණය ගනුදෙනුකරුවන්ට අවශ්‍ය නම් ඊට පෙර වුවද ආපසු ගෙවීම ආරම්භ කළ හැකිය. කෙසේ වෙතත්, ණය ගනුදෙනුකරුවන්ගේ දැනට පවතින පහසුකම් ආපසු ගෙවීම 2022 ජනවාරි 01 දින සිට ඇරඹිය යුතු වේ.

(උ) ඉහත සඳහන් 1 (ඈ) හි සඳහන් නව ණය පියවීම සඳහා ගනුදෙනුකරුවෙකු විසින් මාස 6 කට වඩා වැඩි කාලයක් ඉල්ලා සිටින අවස්ථාවක, ණය ගනුදෙනුකරුවෙකු සහ බැංකුව විසින් මාස 6ට පසු කාල සීමාව සඳහා සුදුසු සහන පොලී අනුපාතයකට එකඟ විය යුතුය.

(ඌ) ගනුදෙනුකරුවන් විසින් කල්දැමූ ණය මුදල් ආපසු ගෙවීම ඉක්මනින් ආරම්භ කිරීම දිරි ගැන්වීම සඳහා, බලපත්‍රලාභී බැංකු විසින් එසේ ණය මුදල් ආපසු ගෙවීම කලින් ආරම්භ කිරීමේ ප්‍රතිලාභ සහ ආපසු ගෙවීමේ කාලය දීර්ඝ කිරීමේ ප්‍රතිඵල පිළිබඳව ණය ගනුදෙනුකරුවන් දැනුම්වත් කළ යුතුය.

(එ) විකල්පයක් ලෙස, ණය ගනුදෙනුකරුගේ ආපසු ගෙවීමේ හැකියාව සහ පිළිගත හැකි ව්‍යාපාර නගා සිටුවීමේ සැලැස්මක් (Revival plan) ඉදිරිපත් කිරීම සැලකිල්ලට ගනිමින්, දැනට පවතින ණය පහසුකම් දීර්ඝ කාලයක් සඳහා ප්‍රතිව්‍යුහගත (restructure) කිරීමට බලපත්‍රලාභී බැංකුවලට හැකියාව පවතී. මෙහිදී, දැනට පවතින අඩු පොලී අනුපාතිකයන් සැලකිල්ලට ගනිමින්, බලපත්‍රලාභී බැංකුව සහ ණය ගනුදෙනුකරුවන් විසින් සුදුසු පොලී අනුපාතයකට එකඟ විය යුතු වේ.

(ඒ) 2021 සැප්තැම්බර් 01 සිට 2021 දෙසැම්බර් 31 දක්වා කාලය තුල පියවීමට ඇති, කාරක ප්‍රාග්ධන, උකස් අත්තිකාරම්, තාවකාලික අයිරා, කෙටිකාලීන වෙළඳ මූල්‍ය පහසුකම් ඇතුළු අනෙකුත් චක්‍රීය ණය පහසුකම් පියවීම සඳහා 2021 දෙසැම්බර් 31 දක්වා කල් ලබා දීමට බලපත්‍රලාභී බැංකු කටයුතු කළ යුතු අතර, ඒ සම්බන්ධයෙන් කල් තබන ලද කාලසීමාව සඳහා පොලී අයකිරීම ඉහත 1(ඉ) හි සඳහන් පරිදි කල් දමන ලද මුදල මත පමණක් සිදු කළ යුතුය.

(ඔ) ණය සහන කාලය තුළ, එනම් 2021 සැප්තැම්බර් 01 සිට 2021 දෙසැම්බර් 31 දක්වා, දඩ පොලිය එකතු කිරීමක් හෝ අය කිරීමක් සිදු නොකළ යුතුය.

(ඕ) දැනට පවතින සංචරණ සීමාවන් හේතුවෙන් බලපෑමට පත් ගනුදෙනුකරුවන් විසින්, ණය ආපසු ගෙවීමට නියමිත දිනය දින කිහිපයකින් (උපරිම වැඩ කරන දින 15 ක් දක්වා) කල් දැමීමට කෙරෙන ඕනෑම ඉල්ලීමක් සඳහා ණය පහසුකම් කල්දැමීමක් හෝ ප්‍රතිව්‍යුහගත කිරීමක් ලෙස සැලකීමෙන් තොරව අවස්ථාව ලබා දිය යුතු අතර, ගනුදෙනුකරුවන්ගේ එවැනි ප්‍රමාදයන් සඳහා බලපත්‍රලාභී බැංකු විසින් කිසිදු අමතර පොලියක් හෝ වෙනත් ගාස්තුවක් අය නොකළ යුතුය.

2. 2021 සැප්තැම්බර් 01 දිනට අක්‍රීය කාණ්ඩයේ පැවති ණය පහසුකම් සඳහා හිමිවන සහන

(අ) ණය ගනුදෙනුකරුගේ ආපසු ගෙවීමේ හැකියාව සහ පිළිගත හැකි ව්‍යාපාර නගාසිටුවීමේ සැලැස්මක් ඉදිරිපත් කිරීම සැලකිල්ලට ගනිමින්, 2021 සැප්තැම්බර් 01 වන විට අක්‍රිය තත්ත්වයේ පවතින ණය පහසුකම්, ඒ ඒ අවස්ථානුකූලව දීර්ඝ කාලයක් සඳහා ප්‍රතිලේඛනගත (reschedule) කිරීමට බලපත්‍රලාභී බැංකු වෙත හැකියාව පවතින අතර, මෙහිදී දැනට පවතින අඩු පොලී අනුපාතික සැලකිල්ලට ගනිමින් සුදුසු පොලී අනුපාතයක් ඇතුළු නියමයන් හා කොන්දේසි සම්බන්ධව බලපත්‍රලාභී බැංකුව සහ ණය ගනුදෙනුකරු විසින් එකඟතාවයකට පැමිණිය යුතුවේ.

(ආ) මෙම යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලේඛනගත කිරීම සඳහා සලකනු ලබන පහසුකම් සඳහා 2020 අප්‍රේල් 1 සිට 2021 සැප්තැම්බර් 01 දක්වා කාලය තුළ එකතු කර ඇති හෝ අය කර ඇති දඩ පොලී කපා හැරීමට බලපත්‍රලාභී බැංකු විසින් කටයුතු කළ යුතුය.

(ඇ) බලපත්‍රලාභී බැංකු විසින් 2020 අප්‍රේල් 01 දින හෝ ඊට පසුව අක්‍රීය ලෙස වර්ගීකරණය කර ඇති ණය පහසුකම් වලට එරෙහිව ක්‍රියාත්මක කර ඇති සියළුම ආකාරයේ ණය නැවත අයකර ගැනීමේ ක්‍රියාමාර්ග 2021 දෙසැම්බර් 31 වන දින දක්වා අත්හිටුවිය යුතුය. තවද, ඉහත සඳහන් ණය ගනුදෙනුකරුවන් සම්බන්ධව සාමාන්‍ය ණය ආපසු අයකිරීමේ ක්‍රියාවලියේ කොටසක් වශයෙන්, ණය ගනුදෙනුකරු අපහසුතාවයට ලක්වන ලෙස අධික ලෙස ඇමතුම් ලබා දීම/බල කිරීම හෝ හමුවීමට යාම වැළැක්වීම සඳහා බලපත්‍රලාභී බැංකු සියළු පියවර ගත යුතුය. ණය අයකර ගැනීම සම්බන්ධව අධිකරණයේ නඩු කටයුතු පවතින අවස්ථාවලදී, මෙම සහනය ලබා ගැනීම සඳහා ගනුදෙනුකරු විසින් අධිකරණය හමුවේ එකඟතාවයකට පැමිණිය යුතුය.

3. බලපත්‍රලාභී බැංකු විසින් ණය සහන ලබා දීමේදී අධික ගාස්තු හෝ අය කිරීම් සිදු නොකළ යුතු අතර, එවැනි ගාස්තු හෝ අය කිරීම් සම්බන්ධයෙන් ණය ගනුදෙනුකරුවන් ලිඛිතව දැනුවත් කළ යුතුය.

4. රුපියල් 500,000 ට අඩු චෙක්පත් වලංගු කාලය 2021 ඔක්තෝම්බර් 31 දක්වා දීර්ඝ කිරීමට බලපත්‍රලාභී බැංකු විසින් කටයුතු කළ යුතුය.

5. බලපත්‍රලාභී බැංකු විසින් 2021 සැප්තැම්බර් 30 දක්වා සියළු චෙක්පත් ගනුදෙනු සම්බන්ධයෙන් අගරු වූ චෙක්පත් සහ චෙක්පත් ගෙවීම් නතර කිරීම් සඳහා ගාස්තු අය කිරීමෙන් වැළකිය යුතුය.

6. පැහැදිලිවම පීඩාවට පත් ගනුදෙනුකරුවන් සඳහා, 2021 ඔක්තෝම්බර් 31 දක්වා කාල සීමාව තෙක්, සියලුම ණය කාඩ්පත් සහ වෙනත් ණය පහසුකම් සඳහා ප්‍රමාද ගාස්තු අයකිරීමෙන් වැළකීමට බලපත්‍රලාභී බැංකු කටයුතු කළ යුතුය.

7. මෙම යෝජනා ක්‍රමය යටතේ සහන ලබා ගැනීමට සුදුසුකම් ඇති ණය ගනුදෙනුකරුවෙකු, එම සහන ලබා ගැනීම වෙනුවට, දැනට පවතින ණය පහසුකම් හෝ අත්හිටුවන කාල සීමාව තුළ ගෙවිය යුතු මුදල් කලින් පියවීමට කැමැත්ත ප්‍රකාශ කර තිබේ නම්, එවැනි ගනුදෙනුකරුවන්ට පොලී ප්‍රතිදානයන් (interest rebate) ලබා දෙන ලෙසට බලපත්‍රලාභී බැංකු දිරිගන්වනු ලැබේ. තවද, එවැනි පහසුකම් සඳහා කිසිදු පූර්ව පියවීමේ ගාස්තු හෝ කල්බදු පහසුකම් වල අනාගත පොලිය අයකිරීමෙන් වැළකීමට බලපත්‍රලාභී බැංකු කටයුතු කළ යුතුය.

8 ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය (CRIB) වෙත වාර්තා කිරීම්

(අ) බලපත්‍රලාභී බැංකු විසින් මෙම යෝජනා ක්‍රමය යටතේ සුදුසුකම් ලබන ණය ගනුදෙනුකරුවන්ගේ ණය අයදුම්පත්, හුදෙක් අසතුටුදායක ණය තොරතුරු කාර්යාංශ (CRIB) වාර්තාවක් මත පමණක් පදනම්ව ප්‍රතික්ෂේප කිරීමෙන් වැළකිය යුතුය.

(ආ) මෙම යෝජනා ක්‍රමයට සහභාගී වීම ණය ගැනුම්කරුවන්ගේ ඉදිරි ණය තොරතුරු වාර්තා සහ අනාගත ණය ශ්‍රේණිගත කිරීම් කෙරෙහි බලපෑමක් ඇති නොවන ආකාරයෙන්, මෙම යෝජනා ක්‍රමය යටතේ ලබා දී ඇති ණය ආපසු ගෙවීම කල්දැමීම්/ප්‍රතිව්‍යුහගත කිරීම් වාර්තා කිරීම සඳහා ක්‍රමවේදයක් බලපත්‍රලාභී බැංකු විසින් ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය සමඟ සාකච්ඡා කොට සකස් කළ යුතු වේ.

9. ප්‍රතිමූල්‍ය/පොලී සහනාධාර යෝජනා ක්‍රම යටතේ ණය පහසුකම් සඳහා සහන

විවිධ ප්‍රතිමූල්‍යකරණ හෝ පොලී සහනාධාර යෝජනා ක්‍රම යටතේ ලබා දෙන ණය පහසුකම් සඳහා සහන සැලසීම සම්බන්ධයෙන් බලපත්‍රලාභී බැංකු අදාළ ආයතනවලින් අවශ්‍ය මඟ පෙන්වීම් ලබා ගත යුතුය.

10. ඉල්ලීම් ඉදිරිපත් කිරීම සඳහා අවසාන දිනය

(අ) බලපත්‍රලාභී බැංකු විසින් මෙම චක්‍රලේඛය සියලුම ශාඛා වෙත දින 3ක් ඇතුළත සංසරණය කළ යුතු අතර දින 7ක් ඇතුළත අවශ්‍ය අභ්‍යන්තර මාර්ගෝපදේශ/ චක්‍රලේඛ ලබා දිය යුතුය.

(අ) සුදුසුකම් ලත් ණය ගනුදෙනුකරුවන්ට ඉහත සඳහන් ණය සහන සඳහා 2021 සැප්තැම්බර් 21 දින හෝ ඊට පෙර ලිඛිතව හෝ විද්‍යුත් මාධ්‍ය මඟින් ඉල්ලුම් කළ හැකිය. බලපත්‍රලාභී බැංකු විසින් මෙම ණය සහනයන්, අයදුම් කළ හැකි අවසාන දිනය සහ අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකෘතිය ආදී තොරතුරු සුදුසුකම් ලත් සියලුම ණය ගනුදෙනුකරුවන් වෙත විද්‍යුත් තැපෑල සහ කෙටි පණිවුඩ ඇතුළු මුද්‍රිත හා/හෝ විද්‍යුත් මාධ්‍ය ඔස්සේ කඩිනමින් සන්නිවේදනය කළ යුතුය.

(ඇ) පිළිගත හැකි හේතු සහිතව 2021 සැප්තැම්බර් 21න් පසුව වුවද කරනු ලබන ඕනෑම ඉල්ලීමක් සලකා බැලීමට බලපත්‍රලාභී බැංකු වෙත හැකියාව ඇත.

(ඈ) සුදුසුකම් ලද මුත් ණය ආපසු ගෙවීමේ හැකියාව ඇති ණය ගනුදෙනුකරුවන් විසින් ණය පහසුකම් කල්දැමීම හෝ ප්‍රතිව්‍යුහගත

කිරීම සඳහා අයදුම් කිරීම වෙනුවට ණය ආපසු ගෙවීම් සඳහා කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

(ඉ) මෙම ණය සහන සඳහා අයදුම් කරනු ලබන ණය ගනුදෙනුකරුවන් ගේ ඉල්ලීම් අනුමත කිරීමට පෙර අදාළ ණය පහසුකම් කල්දැමීමේ හෝ ප්‍රතිව්‍යුහගත කිරීමේ ආකාරය පිළිබඳව දැනුවත් කිරීමට බලපත්‍රලාභී බැංකු කටයුතු කළ යුතු අතර ඒ සඳහා ගනුදෙනුකරුගේ කැමැත්ත ලිඛිතව හෝ විද්‍යුත් ආකාරයෙන් ලබා ගත යුතුය.

(ඊ) අයදුම්පතක් ප්‍රතික්ෂේප කිරීමකදී, බලපත්‍රලාභී බැංකු විසින් වඩාත් සුදුසු ලෙස දින 14ක් තුළදී ලිඛිත ව හෝ විද්‍යුත් මාධ්‍ය මඟින් එසේ ප්‍රතික්ෂේප කිරීමට හේතු අයදුම්කරුට දැනුම් දිය යුතු අතර අයදුම්කරුට තම අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමට එරෙහිව අභියාචනයක් අධ්‍යක්ෂ, මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව (FCRD), ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඉදිරිපත් කිරීමට අවස්ථාවක් තිබෙන බව දැනුම් දිය යුතුය. තවද, ණය ගනුදෙනුකරුට අවශ්‍ය නම් එම තීරණය සමාලෝචනය කිරීමේ අවස්ථාව ලබා ගැනීමට අයිතියක් පවතින බව බලපත්‍රලාභී බැංකුව විසින්, එම ලිපියේ ම දැක්විය යුතුය.

11. ණය සහන කාල සීමාව සම්බන්ධ ගිණුම් කටයුතු

බලපත්‍රලාභී බැංකු විසින් ණය සහන කාලසීමාවට අදාළව ගිණුම් තැබීමේදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2020 ඔක්තෝබර් 28 දින නිකුත් කරන ලද 2020 අංක 09 දරන චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. බලපත්‍රලාභී බැංකු විසින් වැඩි අවදානමක් සහිත ණයගැතියන් හෝ අංශ සඳහා ප්‍රමාණවත් වෙන් කිරීම් සිදු කළ යුතු අතර මේ සම්බන්ධව අමතර මඟපෙන්වීමක් අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයෙන් හෝ විගණකවරුන්ගෙන් උපදෙස් පැතිය හැක.

12. වාර්තාකරණ අවශ්‍යතා

බලපත්‍රලාභී බැංකු විසින් 2021 සැප්තැම්බර් 30 වන දින සිට වැඩකරන දින 15 ක් ඇතුළත, සෑම මසකම 30 වන දින වන විට තම ණය ගනුදෙනුකරුවන් විසින් ලබා ගත් සහන පිළිබඳ තොරතුරු බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවට වාර්තා කළ යුතු අතර, අදාළ වාර්තාකරණ ආකෘති බලපත්‍රලාභී බැංකු වෙත ඉදිරි කාලයේදී යොමු කරනු ඇත.

අත්සන් කලේ,
මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති හා
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

චක්‍රලේඛය 2021 අංක 09 2021 සැප්තැම්බර් 08

ලංකා රේටිං ඒජන්සි ලිමිටඩ් පිළිගත හැකි ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනයක් ලෙස නම්කිරීම

බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු වල බාසල් III ප්‍රාග්ධන අවශ්‍යතා සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2016 අංක 01 දරන බැංකු පනත් විධානයන් සහ බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකුවල අනෙකුත් නියාමන අවශ්‍යතා සඳහා පිළිගත හැකි බාහිර ණය තක්සේරු කිරීමේ ආයතනයක් ලෙස ලංකා රේටිං ඒජන්සි ලිමිටඩ් ආයතනය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නම්කර සිටී.

ඒ අනුව, බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු වල බාසල් III ප්‍රාග්ධන අවශ්‍යතා සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2016 අංක 01 දරන බැංකු පනත් විධානයන්හි උපලේඛන I හි IV වන උපග්‍රන්ථයේ අයිතම අංක 2.3 යටතේ වගුව 1 සහ වගුව 3 පහත ඇමුණුමේ පරිදි සංශෝධනය කෙරේ.

අත්සන් කලේ,
මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති හා
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

මෙහි ඇමුණුම පහත සබැඳිය ඔස්සේ ලබා ගත හැක.

https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/laws/cdg/bsd_circular_no_9_of_2021_e.pdf

බැංකු පනත් විධාන 2021 අංක 12 2021 සැප්තැම්බර් 08

ආනයනවලට එරෙහිව ආන්තික අවශ්‍යතා

1988 අංක 30 දරන බැංකු පනතේ සංශෝධිත 46 (1) සහ 76 (ඒ) (1) වගන්ති ප්‍රකාරව නිකුත් කරන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බැංකු පද්ධතියෙහි විනිමය අනුපාතිකයේ සහ විදේශ මුදල් ද්‍රවශීලතාවෙහි ස්ථාවරභාවය පවත්වා ගෙන යෑමේ අරමුණැතිව, වහාම බලපැවැත්වෙන පරිදි නැවත දැනුම් දෙන තුරු, ඇතැම් අත්‍යවශ්‍ය නොවන සහ හදිසි නොවන භාණ්ඩ ආනයන මත පහත පියවර අනුගමනය කරන මෙන් බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරි කිරීමේ බැංකු වෙත දැනුම් දෙනු ලැබේ.

1. ප්‍රතිග්‍රහණ මත ලියවිලි ලබා දීමේ කොන්දේසි යටතේ, ''අ'' උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති ඉන්වොයිසි අගය මත පොලී නොදරන සියයට සියයක මුදල් ආන්තිකයක් තැබිය යුතුය.

2. ජාතික ඉතිරි කිරීමේ බැංකුව සලකා බැලීමේ දී, ඉහත 1 විධානයෙහි නිශ්චිතව දක්වා ඇති ආන්තික අවශ්‍යතා, ණයවර ලිපි (LC) නියමයන් යටතේ සිදු කළ එවැනි ආනයන සඳහා අදාළ වේ.

3. මෙම විධානය මඟින් ආවරණය කෙරෙනු ලබන භාණ්ඩ ආනයනය ආවරණය කරනා, දැනට පවතින ප්‍රතිග්‍රහණ මත ලියවිලි ලබා දීම් වල දී, ඉහත 1 විධානයෙන් අවශ්‍ය වන පරිදි මුදල් ආන්තික තැන්පතු මඟින් අගයේ ඉහළ යෑමක් ආවරණය කරනු ලබන්නේ නම් මිස, බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින් එවැනි ප්‍රතිග්‍රහණ මත ලියවිලි ලබා දීමේ අගයෙහි කිසිදු ඉහළ යෑමකට අවසරය ලබා නොදිය යුතුය.

4. ආනයනකරු විසින් ලේඛන ප්‍රතිග්‍රහණය කරන කාලයේ දී, ලේඛන මුදා හරින බැංකුව සමඟ එවැනි පොලී නොදරන මුදල් ආන්තිකයක් තැබිය යුතුය.

5. මෙම විධාන යටතේ ආවරණය නොකෙරෙන භාණ්ඩ ඇතුළත් වන එම ඉන්වොයිසිය නොතකමින්, ඉන්වොයිසියේ මුළු අගය මත, එවැනි පොලී නොදරන ආන්තික මුදල් අවශ්‍යතාවක් පවත්වා ගත යුතුය.

6. ඉන්වොයිසිය සඳහා ආන්තික තැන්පතු ලබා ගෙන ඇති බවට බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින් පිටසන් කළ යුතුය.

7. ශ්‍රී ලංකාව තුළ බැංකුකරණ මාර්ග ඔස්සේ ගෙවීම් මත ලේඛනමය සාක්ෂි සැපයීම සහ ආනයන නිෂ්කාශනයට අදාළව රේගු ලේඛන සැපයීම මත ආන්තික තැන්පතුව නිදහස් කළ හැකිය.

8. බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව මෙම ආනයනවලට අදාළව ආන්තික තැන්පතු තැබීම සඳහා ආනයනකරුවන්ට හැකියාව ලබා දීමට කිසිදු ණය පහසුකමක් ලබා නොදිය යුතුය.

9. භාණ්ඩ ආනයනයට අදාළව ඕනෑම නීතියක් ප්‍රකාරව හඳුන්වා දෙනු ඇති එවැනි වෙනත් අවශ්‍යතා සහ දැනට ක්‍රියාත්මකව පවතින ඕනෑම අවශ්‍යතාවකට අමතරව මෙම විධානයන්හි විධිවිධාන බලාත්මක වනු ඇත.

අත්සන් කලේ,
මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති හා
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

මෙම විධානයේ සටහන 1 පහත සබැඳිය ඔස්සේ ලබා ගත හැක.

https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/laws/cdg/Banking_Act_Directions_No_12_of_2021.pd

චක්‍රලේඛය 2021 අංක 10 2021 සැප්තැම්බර් 13

කොවිඩ්-19 නිසා බලපෑමට ලක්වූ සංචාරක ක්ෂේත්‍රයේ නිරත ව්‍යාපාර හා පුද්ගලයන් හට ලබාදුන් ණය සහන කාලය දීර්ඝ කිරීම

(මෙය 2021 සැප්තැම්බර් 13 දින නිකුත් කරන ලද 2021 අංක 10 දරන චක්‍රලේඛයේ සිංහල පරිවර්තනයකි.)

දැනට පවතින කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් බලපෑමට පත් සංචාරක ක්ෂේත්‍රයේ නිරත ව්‍යාපාර හා පුද්ගලයන් විසින් මුහුණ පා ඇති අභියෝග සැලකිල්ලට ගනිමින්, 2020 අගෝස්තු 26 වන දිනැති 2020 අංක 08 දරන චක්‍රලේඛය (මින් ඉදිරියට යෝජනා ක්‍රමය ලෙස හැඳින්වෙන) යටතේ සංචාරක ක්ෂේත්‍රය සඳහා ලබා දී ඇති ණය සහන කාලය 2021 ඔක්තෝම්බර් 01 දින සිට තවත් මාස නවයක් සඳහා පහත දක්වා ඇති පරිදි දීර්ඝ කරන ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු (මින් ඉදිරියට බලපත්‍රලාභී බැංකු ලෙස හැඳින්වෙන) වෙතින් ඉල්ලා සිටී. කෙසේ වුවද, මෙම චක්‍රලේඛය මඟින් ලබා දී ඇති සමස්ත ප්‍රතිලාභයන්ට වඩා අඩු නොවන පරිදි, ගනුදෙනුකරුවන්ගේ ඉල්ලීම මත, අමතර ණය සහන ලබාදීම සඳහා බලපත්‍රලාභී බැංකු වෙත හැකියාව ඇත. ඒ අනුව, ඉහත යෝජනා ක්‍රමය සියලු බලපත්‍රලාභී බැංකු ඔස්සේ ඒකාකාරීව ක්‍රියාත්මක කිරීම තහවුරු කිරීම සඳහා මෙම චක්‍රලේඛය නිකුත් කරන ලදී.

අ. 2020 අංක 08 දරන චක්‍රලේඛයේ පහත සඳහන් ප්‍රතිපාදන සංශෝධනයට ලක් කරන ලද අතර, 2020 අංක 08 දරන චක්‍රලේඛයේ අනෙකුත් ප්‍රතිපාදන නොවෙනස්ව පවතී.

1. පොදු කොන්දේසි හා නියමයන්

1 (i) (ආ) කොවිඩ්-19 නිසා බලපෑමට පත් ව්‍යාපාර වල සේවා නියුක්තිකයන් සහ සංගම් වල සාමාජිකයන්. මෙහිදී, අදාළ සේවා නියුක්තිකයන් සහ සාමාජිකයන් ඉහත (අ) හි සඳහන් අදාළ ආයතන සමඟ ව්‍යාපාරය හෝ සංගමය ලියාපදිංචි කිරීම ප්‍රමාණවත් ලෙස සැලකිය යුතුය.

1 (iii) ණය සහන කාලය යන්නෙන්, 2021 ඔක්තෝම්බර් 01 දින සිට 2022 ජූනි 30 දින දක්වා තවදුරටත් මාස නවයක කාලසීමාවකට මූලික ණය මුදල සහ පොලිය කල් තැබීම අදහස් කෙරේ.

1 (iv) මෙම ණය සහන ලබා ගැනීමට අපේක්ෂා කරන, සුදුසුකම් ලබන ණය ගනුදෙනුකරුවන් 2021 ඔක්තෝම්බර් 15 දින හෝ ඊට පෙර අදාළ බලපත්‍රලාභී බැංකුව වෙත ඉල්ලීමක් කළ යුතුය. 2021 ඔක්තෝම්බර් 15 දිනෙන් පසුව වුවද, පිළිගත හැකි හේතුන් මත ප්‍රමාදවී සිදු කරන ඉල්ලීම් ද භාරගන්නා ලෙස බලපත්‍රලාභී බැංකු වෙත දන්වා ඇත. කෙසේ නමුත්, මෙම ණය සහන ලබා ගැනීමට සුදුසුකම් ලබන, එහෙත් තම ණය ආපසු ගෙවීම සඳහා හැකියාවක් ඇති ගනුදෙනුකරුවන් මෙම ණය සහන කාලය දීර්ඝ කිරීමට අයදුම් නොකොට, සිය ණය පහසුකම් ආපසු ගෙවීමට කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

2. ණය සහනයන් හි සැකැස්ම

2 (i) 2021 ඔක්තෝම්බර් 01 දින සිට 2022 ජූනි 30 දින දක්වා ණය සහන කාල සීමාව තුළ අයවීමට නියමිත මූලික ණය මුදල සහ පොලිය, කාලීන ණයකට (term loan) හැරවීමට බලපත්‍රලාභී බැංකු කටයුතු කළ යුතුය. බලපත්‍රලාභී බැංකු විසින් මින් පෙර ලබාදුන් ණය සහන කාලය සඳහා අයවීමට නියමිත මූලික ණය මුදල සහ පොලිය සහ 2021 ඔක්තෝම්බර් 01 දින සිට 2022 ජූනි 30 දින දක්වා අයවීමට නියමිත මූලික ණය මුදල සහ පොලිය ඒකාබද්ධ කළ යුතුය.

2 (ii) දීර්ඝ කරන ලද ණය සහන කාලය අවසන් වූවායින් පසු, මෙලෙස හරවන ලද ණය යළි අයකර ගැනීම ආරම්භ කළ යුතු වේ.

2 (v) මෙම චක්‍රලේඛය යටතේ සුදුසුකම් ලබන සක්‍රිය ණය සඳහා, බලපත්‍රලාභී බැංකු විසින් 2021 ඔක්තෝම්බර් 01 දින වන විට එකතු වී ඇති සහ නොපියවා ඇති දඩ පොලී කපා හැරිය යුතුය. ණය සහන කාල සීමාව තුළදී දඩ පොලී එකතුකිරීම හෝ අය කිරීම නොකළ යුතුය.

3. වාර්තාකරණ අවශ්‍යතා

බලපත්‍රලාභී බැංකු විසින් 2020 අංක 08 දරන චක්‍රලේඛයේ නිර්දේශ කර ඇති වාර්තාකරණ ආකෘතිය අනුව, සෑම මසකම 30 වන දින වන විට තම ණය ගනුදෙනුකරුවන් විසින් ලබා ගෙන ඇති ණය සහන පිළිබඳ තොරතුරු, වැඩ කරන දින 15ක් තුළ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ වෙත වාර්තා කළ යුතුය.

ආ. මෙම චක්‍රලේඛයේ පහත සඳහන් නව ප්‍රතිපාදන ඇතුළත් වේ.

1. විකල්පයක් ලෙස, ණය ගනුදෙනුකරුගේ ආපසු ගෙවීමේ හැකියාව සහ පිළිගත හැකි ව්‍යාපාර නගා සිටුවීමේ සැලැස්මක් (Revival plan) ඉදිරිපත් කිරීම සැලකිල්ලට ගනිමින්, දැනට පවතින ණය පහසුකම් දීර්ඝ කාලයක් සඳහා ප්‍රතිව්‍යුහගත (restructure) කිරීමට බලපත්‍රලාභී බැංකුවලට හැකියාව පවතී. මෙහිදී, බලපත්‍රලාභී බැංකුව සහ ණය ගනුදෙනුකරුවන් විසින් දැනට පවතින අඩු පොලී අනුපාතිකයන් සැලකිල්ලට ගනිමින්, සුදුසු සහන පොලී අනුපාතිකයක් ද ඇතුළුව කොන්දේසි හා නියමයන්ට එකඟ විය යුතු වේ.

2. මෙම යෝජනා ක්‍රමය යටතේ සහන ලබා ගැනීමට සුදුසුකම් ඇති ණය ගනුදෙනුකරුවෙකු, එම සහන ලබා ගැනීම වෙනුවට, දැනට පවතින ණය පහසුකම් හෝ අත්හිටුවන කාල සීමාව තුළ ගෙවිය යුතු මුදල් ගෙවා නිම කිරීමට කැමැත්ත ප්‍රකාශ කර තිබේ නම්, එවැනි ගනුදෙනුකරුවන්ට පොලී ප්‍රතිදානයන් (interest rebate) ලබා දෙන ලෙසට බලපත්‍රලාභී බැංකු දිරි ගන්වනු ලැබේ. තවද, එවැනි පහසුකම් සඳහා කිසිඳු ආකාරයක පූර්ව පියවීමේ ගාස්තු, වෙනත් ගාස්තු හෝ කල්බදු පහසුකම් වල අනාගත පොලිය අයකර ගැනීමේ ගාස්තු අයකිරීමෙන් වැළකීමට බලපත්‍රලාභී බැංකු කටයුතු කළ යුතුය.

3. බලපත්‍රලාභී බැංකු විසින් 2020 අප්‍රේල් 01 දින හෝ ඊට පසුව අක්‍රීය ලෙස වර්ගීකරණය කර ඇති ණය පහසුකම් වලට එරෙහිව ක්‍රියාත්මක කර ඇති සියළුම ආකාරයේ ණය නැවත අයකර ගැනීමේ ක්‍රියාමාර්ග 2022 ජූනි 30 දක්වා අත්හිටුවිය යුතුය. තවද, ඉහත සඳහන් ණය ගනුදෙනුකරුවන් සම්බන්ධව සාමාන්‍ය ණය ආපසු අයකිරීමේ ක්‍රියාවලියේ කොටසක් වශයෙන්, ණය ගනුදෙනුකරු අපහසුතාවයට ලක්වන ලෙස අධික ලෙස ඇමතුම් ලබා දීම/බල කිරීම හෝ හමුවීමට යාම වැළැක්වීම සඳහා බලපත්‍රලාභී බැංකු සියළු පියවර ගත යුතුය. ණය අයකර ගැනීම සම්බන්ධව අධිකරණයේ නඩු කටයුතු පවතින අවස්ථාවලදී, මෙම සහනය ලබා ගැනීම සඳහා ගනුදෙනුකරු විසින් අධිකරණය හමුවේ එකඟතාවයකට පැමිණිය යුතුය.

4. මෙම යෝජනා ක්‍රමය යටතේ බලපත්‍රලාභී බැංකු විසින් ලබා දී ඇති ණය සහන සඳහා ගිණුම් තැබීමේ දී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 09 : මූල්‍ය උපකරණ, සඳහා බලපත්‍රලාභී බැංකු වෙත ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කර ඇති මාර්ගෝපදේශ අනුව සිදු කළ යුතුය. බලපත්‍රලාභී බැංකු විසින් සංචාරක ක්ෂේත්‍රය අවදානම වැඩි වී ඇති ක්ෂේත්‍රයක් ලෙස සලකා ඒ අනුව සුදුසු පරිදි ප්‍රමාණවත් වෙන්කිරීම් සිදු කළ යුතු වේ. බලපලත්‍රලාභි බැංකු වෙත මේ සම්බන්ධව අමතර මඟපෙන්වීමක් අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයෙන් හෝ විගණකවරුන්ගෙන් මඟපෙන්වීම් / පැහැදිලි කිරීම් ලබාගත හැක.

5. විවිධ ප්‍රතිමූල්‍ය හෝ පොලී සහන යෝජනා ක්‍රමයන් යටතේ ලබාදුන් ණය පහසුකම් සඳහා සහන ලබා දීම පිළිබඳව බලපත්‍රලාභී බැංකු විසින් ඊට අදාළ නියෝජිත ආයතනයන්ගෙන් අවශ්‍ය මාර්ගෝපදේශ ලබා ගත යුතු වේ.

6. බලපත්‍රලාභී බැංකු විසින් මෙම ණය සහන අනුමත කිරීමට පෙර, එය අයදුම් කළ ණය ගනුදෙනුකරුවන් අදාළ ණය පහසුකම් කල්දැමීමේ හෝ ප්‍රතිව්‍යුහගත කිරීමේ සැකැස්ම පිළිබඳව දැනුවත් වී ඇතිබව තහවුරු කරගත යුතු ය. අයදුම්පතක් ප්‍රතික්ෂේප කිරීමකදී, හැකි සෑම විටකදීම බලපත්‍රලාභී බැංකු විසින් දින 14ක් තුළ ලිඛිත ව හෝ විද්‍යුත් මාධ්‍ය මඟින් එසේ ප්‍රතික්ෂේප කිරීමට හේතු අයදුම්කරුට දැනුම් දිය යුතු අතර අයදුම්කරුට තම අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමට එරෙහිව අභියාචනයක් අධ්‍යක්ෂ, මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව (FCRD), ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඉදිරිපත් කිරීමට අවස්ථාවක් තිබෙන බව දැනුම් දිය යුතුය. තවද, ණය ගනුදෙනුකරුට අවශ්‍ය නම් එම තීරණය සමාලෝචනය කිරීමේ අවස්ථාව ලබා ගැනීමට අයිතියක් පවතින බව බලපත්‍රලාභී බැංකුව විසින්, එම ලිපියේ ම දැක්විය යුතුය.

7. බලපත්‍රලාභී බැංකු විසින් මෙම චක්‍රලේඛය දින 3ක් ඇතුළත සියලු ශාඛාවන් අතර සංසරණය කළ යුතු අතර දින 7ක් ඇතුළත අවශ්‍ය අභ්‍යන්තර මාර්ගෝපදේශ/චක්‍රලේඛ ලබා දීමට කටයුතු කළ යුතුය.

අත්සන් කලේ,
මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති හා
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

බැංකු පනත් විධාන 2021 අංක 13 2021 සැප්තැම්බර් 14

බලපත්‍රලාභී බැංකු වල ණය පහසුකම් වර්ගීකරණය, හඳුනාගැනීම හා මිනුම් කිරීම

1988 අංක 30 දරන සංශෝධිත බැංකු පනතේ 46(අ), 46(1) සහ 76(ඒ) (1) වගන්ති මඟින් ලබාදී ඇති බලතල අනුව ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් බලපත්‍රලාභී බැංකුවල ණය පහසුකම් වර්ගීකරණය, හඳුනා ගැනීම හා මිනුම් කිරීම පිළිබඳ නීති රාමුව, මූල්‍ය උපකරණ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (මෙතැන් සිට SLFRS 09 ලෙස හැඳින්වෙන) සමඟ තවදුරටත් ශක්තිමත් කිරීමට සහ සුසංයෝග කිරීමටත් බැංකු කර්මාන්තයේ ඒකාකාරී සහ විචක්ෂණ පරිචයන් ඇති කිරීමටත් බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු වල (මෙතැන් සිට බලපත්‍රලාභී බැංකු ලෙස හැඳින්වෙන) ණය පහසුකම් වර්ගීකරණය, හඳුනා ගැනීම හා මිනුම් කිරීම පිළිබඳ පහත සඳහන් පනත් විධාන නිකුත් කරන ලදී.

1. බලගැන්වීම

1.1 බැංකු පනතේ 46(1) වගන්ති ප්‍රකාරව බැංකු පද්ධතියේ අඛණ්ඩතාව තහවුරු කිරීමට, බැංකුවකට හෝ බැංකුවලට ව්‍යාපාර කළ යුතු ආකාරය පිළිබඳ විධාන සියළුම බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත නිකුත් කිරීමට මුදල් මණ්ඩලයට බලය ඇත.

1.2 බැංකු පනතේ 76(ඒ)(1) වගන්ති ප්‍රකාරව, බලපත්‍රලාභී විශේෂිත බැංකුවලට හෝ ඕනෑම වර්ගයක විශේෂිත බැංකු වලට කටයුතු සිදු කළ යුතු ආකාරය සම්බන්ධව විධානයන් නිකුත් කිරීමට මුදල් මණ්ඩලයට බලය ඇත.

2. විෂය පථය හා අදාළත්වය

2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අවශ්‍යතාවන් වලට අමතරව මෙම විධානය යටතේ පවත්නා සියලුම අවශ්‍යතාවන් ද බලපත්‍රලාභී බැංකු සඳහා බලපැවැත්වේ.

3. නිර්වචනයන්

3.1 මෙම විධානයේ කටයුතු සඳහා පහත නිර්වචනයන් අදාළ වේ.

3.1.1 ණය පහසුකම් යනු:

(අ) ක්‍රමක්ෂිත පිරිවැය හෝ විස්තීර්ණ ආදායම අනුව සාධාරණ අගය යටතේ පවත්නා ශේෂ පත්‍ර ණය හා අත්තිකාරම් හෝ ලැබිය යුතු කල්බදු වත්කම් හි ශුද්ධ ආයෝජනය ; සහ

(ආ) අසම්භාව්‍ය වගකීම් පිළිගැනීමට පවත්නා බැඳීම්, ඇපකර, බැඳුම්කර,ණයවර ලිපි, ණය කාඩ්පත් හා බැංකු අයිරා ආදී ණය පහසුකම් වල පිළිගත් හා ලබා නොගත් ණය කොටස ශේෂ පත්‍රයෙන් පරිබාහිර වත්කම් යන්නට ඇතුළත් වේ.

3.1.2 ණය ගැනුම්කරුවන් යන්නට තනි පුද්ගලයන්,සමාගම්, ශ්‍රී ලංකා රජය, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතන, ආයතන, රජය සතු ව්‍යාපාර, පුද්ගල සංගම් හා අනෙකුත් ආයතන අයත් වේ.

3.1.3 අධ්‍යක්ෂ මණ්ඩලය යන්නෙන් අදහස් වන්නේ දේශීය සංස්ථාපිත බැංකුවක් නම් එහි අධ්‍යක්ෂ මණ්ඩලය වන අතර, විදේශීය බැංකුවක් නම් එහි ප්‍රධාන කාර්යාලය හෝ කලාපීය කාර්යාලයයි.

3.1.4 බැංකු පනත යටතේ ප්‍රධාන විධායක නිලධාරි සහ ප්‍රධාන කළමණාකරණ නිලධාරීන් යන්නෙන් අදහස් වන්නේ බලපත්‍රලාභී බැංකු වල විධායක මට්ටමේ කටයුතු සිදු කරන නිලධාරීන් සහ ප්‍රධාන විධායක නිලධාරියා වේ.

4. ණය පහසුකම් සඳහා වන යහපාලන රාමුව

4.1 ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි, අදාළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ අදාළ නියාමන සහ අධීක්ෂණ මාර්ගෝපදේශ වලට අනුව ණය අවදානම කළමනාකරණය කිරීම උදෙසා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ඇතුළුව, බලපත්‍රලාභී බැංකු සතුව ශක්තිමත් ණය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ භාවිතයන් ඇති බව සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය, ප්‍රධාන විධායක නිලධාරි සහ අදාළ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් වගකිව යුතුය.

4.2 බලපත්‍රලාභී බැංකු සඳහා වන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුව පිළිබඳ බැංකු පනත් විධාන වල අවශ්‍යතා වලට අමතරව බලපත්‍රලාභී බැංකුවේ ණය ප්‍රතිපත්තියට අවම වශයෙන් පහත සඳහන් දෑ ඇතුළත් වන බව අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කළ යුතුය:

4.2.1 ණය පහසුකම් වර්ගීකරණය, හඳුනාගැනීම සහ මැනීම පිළිබඳ ප්‍රතිපත්තියක්;

4.2.2 සම්පූර්ණ ණය චක්‍රය ආවරණය වන පරිදි කාලානුරූපව ණය අවදානම හඳුනා ගැනීම, මැනීම, අධීක්ෂණය කිරීම, වාර්තා කිරීම සහ අවම කිරීම සඳහා ප්‍රමාණවත් ණය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ ක්‍රියාවලීන් තිබිය යුතු අතර ණය සහ අත්තිකාරම්වල ණය අවදානම තක්සේරු කිරීම සහ මැනීම සඳහා ශක්තිමත් ක්‍රමවේද, ක්‍රියාපටිපාටි සහ පාලනයන් අනුගමනය කරමින් එවැනි ක්‍රියාවලීන් ලේඛනගත කළ යුතුය;

4.2.3 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ නියාමනයට අනුකූලව ණය පහසුකම් කාලීන හඳුනාගැනීමට, ඌන ක්‍රියාකාරී/අක්‍රිය වත්කම් කළමනාකරණය කිරීමට, ප්‍රමාණවත් ණය හානි වෙන්කිරීමක් තීරණය කිරීමට සහ ණය අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට ප්‍රමාණවත් ප්‍රතිපත්ති සහ ක්‍රියාවලි;

4.2.4 පහත දෑ පිළිබඳ පැහැදිලි මාර්ගෝපදේශ සපයා ඇති බවට තහවුරු කළ යුතුය;

(අ) විභව අවදානම් නිර්ණායක මත පදනම්ව අදියර 2 සහ 3 ණය වෙන්කර හඳුනා ගන්නේ කෙසේද යන්න ඇතුළුව ණය අදියර වෙන් කිරීම පිළිබඳව;

(ආ) ණය හානි වෙන් කිරීම් උදෙසා අදාළ වන, ණය හානි සඳහා පැහැර හැරීමේ සම්භාවිතාව, ණය පැහැර හැරීමේ අවදානම හා ආර්ථික සාධක ගැළපීමේ ක්‍රමවේද සහ අනෙකුත් ක්‍රමවේද පිළිබඳව;

(ඇ) ණය හානි වෙන් කිරීම් උදෙසා තක්සේරු සීමාවන් සහ ණය ගැණුම්කරු අනුව තනි තනිව තක්සේරු කළ යුතු ණය පහසුකම් සඳහා පවත්නා ආවරණයන් පිළිබඳව;

(ඈ) ණය හානි වෙන් කිරීම් උදෙසා සලකා බැලිය යුතු ඇපකර සහ එවැනි ඇපකර තක්සේරු කිරීමේ අවශ්‍යතා සහ තාක්ෂණික ක්‍රමවල පිරිවිතරයන් සහ පහත සඳහන් 12 විධානයට අනුකූලව එවැනි තක්සේරු කිරීම් සඳහා භාවිතා කළ යුතු දත්ත පිළිබඳව;

(ඉ) අපේක්ෂිත අලාභ ගණනය කිරීමේදී, විභව ආර්ථික කම්පන පිළිබිඹු කිරීම තහවුරු කිරීමට වෙනත් ආකාරයකින් අනාවරණය වී නොමැති කළමණාකරණ ආවරණ භාවිතා කර ඇත්නම් ඒ පිළිබඳව හා කළමණාකරණ ආවරණ සැලකිල්ලට ගෙන නොමැතිනම් ඒ පිළිබඳව, සහ

(ඊ) පහත දැක්වෙන II විධානයට අනුකූලව ණය පහසුකම් වැඩිදියුණු කිරීම පිළිබඳව.

4.2.5 බැංකු විසින් භාවිතා කළ යුතු පැහැදිලි භූමිකාවන් සහ වගකීම්, වලංගු කිරීමේ වාර ගණන සහ ක්‍රියාපිළිවෙත් හා ක්‍රමවේද ඇතුළත්ව බලපත්‍රලාභී බැංකුවල ණය පහසුකම් වර්ගීකරණය, හඳුනාගැනීම සහ මැනීම සඳහා භාවිතා කරන ආකෘති සම්බන්ධයෙන් පුළුල් වලංගු කිරීමේ ප්‍රතිපත්තියක්;

4.2.6 සමීප පසු විපරම් ක්‍රියාවන් සහතික කිරීම සහ නැවත අයකර ගැනීමේ ක්‍රියාවලිය අධීක්ෂණය හා විධිමත් කිරීම සඳහා අක්‍රිය ණය පහසුකම් අනෙකුත් ණය පහසුකම් වලින් වෙන් කිරීමට යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම;

4.2.7 ප්‍රවේශය, බලාධිකාරය, නොසැලකිලිමත් සහ නුසුදුසු පසු විපරම් සඳහා වගවීම, ස්වාධීන සමාලෝචනය සහ විගණනය, අඛණ්ඩ අධීක්ෂණය, වාර්තා කිරීම යනාදිය නිරූපණය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මනා ලෙස සැලසුම් කරන ලද කපා හැරීමේ ලිඛිත ප්‍රතිපත්තියක් ඇති කළ යුතුය. උකස්කර, ඇපකර ආදිය බලාත්මක කිරීම සඳහා උපරිම සුන්බුන් වටිනාකම නැවත අයකර ගැනීම ද එම ප්‍රතිපත්ති මඟින් අරමුණු කරන අතර;

4.2.8 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් හා පවත්නා නියාමන රාමුව යටතේ ඇති අවශ්‍යතාවන් හඳුනා ගැනීමට, සංසන්දනය කිරීමට සහ වාර්තා කිරීමට ප්‍රමාණවත් දත්ත/වාර්තා සහ පද්ධති පවත්වාගෙන යාම සහ මහජන හෙළිදරව් කිරීම් හරහා බලපත්‍රලාභී බැංකුවල කාලෝචිත, අදාළ, නිවැරදි සහ ප්‍රයෝජනවත් තොරතුරු සැපයීම සඳහා යාන්ත්‍රණ ස්ථාපිත කිරීමෙන් විනිවිදභාවය සහ සංසන්දනාත්මක බව සහතික කිරීම ද කළ යුතුය.

4.3 බලපත්‍රලාභී බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් විසින් ණය පහසුකම් පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රතිපත්ති , ක්‍රියාපටිපාටි සහ ක්‍රියාවලීන් අපේක්ෂිත පරිදි ක්‍රියාත්මක කරන බවට සහතික විය යුතු අතර, එය සහතික කිරීම සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන සහ වලංගු කිරීමේ ක්‍රියාවලීන් ස්ථාපිත කර තිබිය යුතුය.

4.4 බලපත්‍රලාභී බැංකු විසින් එම බැංකු විසින් කිසියම් ණය ගැණුම්කරුවෙකුට ලබා දී ඇති ඕනෑම ණය පහසුකමක් අයකර ගැනීමට අරමුදල් සම්පාදනය නොකළ යුතුය.

5. ණය පහසුකම් වර්ගීකරණය

5.1 බලපත්‍රලාභී බැංකු විසින් ණය හානි තක්සේරු කිරීම, අවදානම් අවම කිරීම සහ අධීක්ෂණය සඳහා සියලුම ණය පහසුකම් පහත පරිදි ක්‍රියාකාරී සහ අක්‍රිය ණය සහ අත්තිකාරම් ලෙස වර්ග කළ යුතුය.

5.1.1 ක්‍රියාකාරී ණය පහසුකම් යනු :

(අ) ක්‍රමක්ෂිත පිරිවැය හෝ විස්තීර්ණ ආදායම අනුව සාධාරණ අගය යටතේ පවත්නා ශේෂ පත්‍ර ණය හා අත්තිකාරම් හෝ ලැබිය යුතු කල්බදු වත්කම් හි ශුද්ධ ආයෝජනය ; සහ

(ආ) ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ හා SLFRS 09 යටතේ 2 වන අදියරෙහි වර්ගීකරණය කර ඇති සියලුම ණය පහසුකම් (සක්‍රිය ණය පහසුකම් යටතේ).

5.1.2 අක්‍රිය ණය පහසුකම් (NPCF) යනු ගනුදෙනුකරුවෙකුගේ ගිවිසුම්ගත ගෙවීම් දින 90 කට වැඩි කාලයක් හිඟ හිටි සියලුම ණය පහසුකම් (ගෙවීමේ කොන්ත්‍රාත්තුවේ නියමිත ගෙවිය යුතු දින සිට හිඟ හිටි දින ගණන ගණනය කරනු ලැබේ.) හෝ SLFRS 09 යටතේ 3 වන අදියරෙහි ණය පහසුකමක් ලෙස වර්ගීකරණය කර ඇති සහ දින 90 කට වඩා වැඩි කාලයක් සඳහා අනුමත සීමාව ඉක්මවා ඇති ණය පහසුකම් වේ. (විභව අවදානම් සහ ණය හානිකරණය සහිතව උපදවන ලද මූල්‍ය වත්කම් මත පදනම් කරගෙන අක්‍රිය ලෙස පහසුකම් වර්ගීකරණය කරනු ලැබේ.)

5.2 බලපත්‍රලාභී බැංකුවක් ණය පහසුකමක වර්ගීකරණ තත්ත්වය තීරණය කිරීමේදී ඔවුන්ගේ ණය පහසුකම්වලට එරෙහිව බැංකුව විසින් ලබා ගන්නා ලද සුරැකුම් වල වටිනාකම සහ සුරැකුම් වර්ගය සැලකිල්ලට නොගත යුතුය.

5.3 ණය ගැණුම්කරුවෙකුට බැංකුව සමඟ උපරිම අයිරා සීමාවන් සහිත ජංගම ගිණුම් කිහිපයක් තිබේ නම්, අයිරා වර්ගීකරණය කිරීමේ දී එවැනි සියලුම ගිණුම්වල සමස්ත අනුමත සීමාව සහ සමස්ත දෛනික ශේෂය සලකා බලනු ලැබේ.

6. අක්‍රිය ණය පහසුකම් උප වර්ගීකරණය

6.1 බලපත්‍රලාභී බැංකුව පහත සඳහන් නිර්ණායක මත පදනම්ව පහත සඳහන් කාණ්ඩවලට අක්‍රිය ණය පහසුකම් උප වර්ගීකරණය කළ යුතුය.

6.1.1 විශේෂයෙන් සඳහන් කරන ලද ණය වර්ගය

(අ) හිඟ හිටි දින පදනම් කරගෙන: දින 90 කට වැඩි, නමුත් දින 180 කට අඩු හෝ සමාන කාලයක් සඳහා ගිවිසුම්ගත ගෙවීම් දින හිඟ හිටි සහ අනුමත සීමාව ඉක්මවා ඇති සියලුම ණය පහසුකම්

(ආ) විභව අවදානම පදනම් කරගෙන: කාලානුරූපීව නිවැරදි නොකෙරෙන, ඉදිරි දිනයකදී ණය ගැනුම්කරුගේ ණය ආපසු ගෙවීම කෙරෙහි අහිතකර බලපෑම් විය හැකි හා බලපත්‍රලාභී බැංකු විසින් සමීප අවධානය අවශ්‍ය වන විභව දුර්වලතාවයන් පෙන්නුම් කරන සියලුම ණය පහසුකම්.

6.1.2 අඩමාණ

(අ) හිඟ හිටි දින පදනම් කරගෙන: දින 180 කට වැඩි, නමුත් දින 270කට අඩු හෝ සමාන කාලයක් සඳහා ගිවිසුම්ගත ගෙවීම් දින හිඟ හිටි සහ අනුමත සීමාව ඉක්මවා ඇති සියලුම ණය පහසුකම්.

(ආ) විභව අවදානම පදනම් කරගෙන: ව්‍යාපාරය ඇසුරු කරගත් හෝ ණය ගැනුම්කරුගේ මුදල් ප්‍රවාහය හෝ මූල්‍ය තත්ත්වය සම්බන්ධයෙන් නිශ්චිත දුර්වලතා පෙන්නුම් කරන සියලුම ණය පහසුකම්, පවතින කොන්දේසි මත ආපසු ගෙවීමේ දී අවදානමට ලක්විය හැකි අතර, එම කොටස හෝ සම්පූර්ණ පහසුකම ආපසු ගෙවනු ලබන බවට අවිනිශ්චිතතාවයක් පවතින විට ණය ගැනුම්කරුගේ අසතුටුදායක ණය සේවා වාර්තාව/මූල්‍ය තත්ත්වය ඇපකර ප්‍රමාණවත් නොවීම හෝ වර්තමාන ආපසු ගෙවීමේ නියමයන්ට අනුකූල වීමට ණය ගැනුම්කරුට ඇති හැකියාව පිළිබඳව යම් සැකයක් ඇති කරන වෙනත් සාධක හේතුවෙන් සාමාන්‍ය ප්‍රමාණයට වඩා වැඩි අලාභ අවදානමක් පවතින සියලුම ණය පහසුකම්.

6.1.3 බොල් ණය

හිඟ හිටි දින පදනම් කරගෙන: දින 360 කට වැඩි කාලයක් සඳහා ගිවිසුම්ගත ගෙවීම් දින හිඟ හිටි සහ අනුමත සීමාව ඉක්මවා ඇති සියලුම ණය පහසුකම්.

විභව අවදානම පදනම් කරගෙන: එකතු කළ නොහැකි යැයි සලකනු ලබන හෝ ආපසු නොගෙවනු ඇතැයි තහවුරු කරන සහ අක්‍රිය ණය පහසුකම් ලෙස වර්ගීකරණය කර ඇති නමුත් විශේෂයෙන් සඳහන් කරන ලද, අවප්‍රමාණ, අඩමාණ යන කාණ්ඩ යටතේ ඇතුළත් නොවන සියලුම ණය පහසුකම්.

7. ඉහළ ණය අවදානම/ පැහැර හරින ලද ණය

7.1 SLFRS 09 අනුව මුළු ණය කාලසීමාව සඳහාම අපේක්ෂිත ණය හානිය ගණනය කිරීම සඳහා අවම වශයෙන් පහත දැක්වෙන සාධක/තත්වයන් එකක් හෝ කිහිපයක් ළඟා වන්නේ නම් එය සැලකිය යුතු ලෙස ණය අවදානම ඉහළ යාමක් ලෙස හෝ පැහැර හරින ණය පහසුකමක් ලෙස සැලකිය හැකිය.

7.1.1 ගනුදෙනුකරුවෙකුගේ ගිවිසුම්ගත ගෙවීම් කාලය දින 30 කට වඩා හිඟ වන්නේ නම් (ප්‍රමිතියේ සඳහන් පරිදි බිඳ හෙලිය හැකි යැයි සැලකෙන උපකල්පනයට යටත්ව);

7.1.2 බාහිර ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනයක් විසින් ශ්‍රී ලංකා ජාතික ණය පරිමාණ ගත කිරීමට අනුව ණය ගැතියෙකුගේ ණය අවදානම පසුකාලීනව B+ හෝ ඊට අඩු ලෙස පහත දැමීම;

7.1.3 බලපත්‍රලාභී බැංකුවල අභ්‍යන්තර ශ්‍රේණිගත කිරීමේ ස්ථාන දෙකකින් පහත වැටීම. බලපත්‍රලාභී බැංකු සිය අභ්‍යන්තර ණය අවදානම් ශ්‍රේණිගත කිරීම, බාහිර ණය තක්සේරු කිරීමේ ආයතනය විසින් නිකුත් කර ඇති ශ්‍රේණිගත කිරීමකට අනුරූපී කළ යුතුය. බලපත්‍රලාභි බැංකු මේ සඳහා ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා බැංකු පනත් විධාන වල සඳහන් බාහිර ණය අනුරූපී කිරීම පරිහරණය කළ යුතුය.

7.1.4 ගණුදෙනුකරු/ගණුදෙනුකාර කණ්ඩායම්, ආයෝජන කළඹ හෝ මූල්‍ය උපකරණවල කාර්ය සාධනයන් කෙරෙහි ඍජුව අහිතකර ලෙස බලපාන අනාගත ආර්ථික තත්ත්වයන් පිළිබඳ සාධාරණ සහ තහවුරු කළ හැකි පුරෝකථන පැවතීම.

7.1.5 ගණුදෙනුකරු/ගණුදෙනුකාර කණ්ඩායම්, ආයෝජන කළඹ හෝ මූල්‍ය උපකරණවල කාර්යසාධනයන් කෙරෙහි ඍජුව බලපාන ස්වභාවික විපතක් හෝ සැලකිය යුතු භූගෝලීය වෙනස්කමක් පැවතීම.

7.1.6 සුරැකුම් වටිනාකම සැලකිය යුතු ලෙස අඩු වීමකදී හෝ/සහ සුරැකුම් උපලබ්ධි වීම සැක සහිත අවස්ථාවකදී වාණිජ බැංකු මඟින් අදාළ සීමාවන් පවත්වා ගැනීම සහ ලේඛනගත කිරීම සිදු කළ යුතුය.

7.1.7 ණය පහසුකමේ කාර්යසාධනය කෙරෙහි ඍජු බලපෑමක් ඇති කළ හැකි ආකාරයේ ගණුදෙනුකරු යම් නීතිමය ක්‍රියාමාර්ගයකට යටත් වීම.

7.1.8 ආයතනික ගණුදෙනුකරුවකුගේ ඉහළ කළමනාකාරිත්වයේ නිරන්තරයෙන් සිදුවන වෙනස්කම් පැවතීම.

7.1.9 ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීම මූලිකව ගිවිසගත් දින සිට වසර දෙකකට වඩා ප්‍රමාද වීම.

7.1.10 ගිවිසුම සංශෝධනය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස කාලය දීර්ඝ කිරීමක්, ගෙවීම් කල් දැමීමක් හෝ කොන්දේසි අත්හැරීමක් වැනි සහනයක් ලැබීම;

7.1.11 ණය ගණුදෙනුකරු මිය යාම/බුන්වත් වීම;

7.1.12 බලපත්‍රලාභී බැංකුවට ගණුදෙනුකරු සම්බන්ධ කර ගැනීමට හෝ සොයා ගැනීමට නොහැකි වීම; සහ

7.1.13 ගණුදෙනුකරුගේ පෙර මූල්‍ය වර්ෂය හා සැසඳීමේ දී එක දිගට අවුරුදු 2 ක් ආදායමේ සහ/හෝ බදු පෙර ලාභයේ සියයට 50 කට වඩා සිදු වන අඩු වීම සහ/හෝ පෙර වර්ෂය හා සැසඳීමේ දී ශුද්ධ වටිනාකමේ (ලාභාංශ ප්‍රතිපත්ති යේ සහ කොටස් ව්‍යුහයේ සිදු වන වෙනස් වීම් වලට අමතරව) සියයට 25 කට වඩා සිදුවන අඩු වීම;

7.1.14 පහත සඳහන් විධාන 10හි මාර්ගෝපදේශ අනුව ප්‍රතිලේඛන ගත කළ සහ ප්‍රතිව්‍යුහගත කළ ණය පහසුකම්;

7.2 ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ යාමක් ලෙස තීරණය කිරීමේදී බලපත්‍රලාභී බැංකු විසින් 7.1.2 සිට 7.1.14 දක්වා ඇති නිර්ණායක එකක් හෝ වැඩි ගණනක් පහත සඳහන් කරුණු වලට යටත්ව බිඳ හෙලනු ඇත.

7.2.1. අවදානම් කළමණාකරණ කාර්යයේ ප්‍රධානත්වය දරන ප්‍රධාන කළමණාකරණ නිලධාරියා විසින් එවැනි බිඳ හෙලිය හැකි නිර්ණායක අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ

කළ යුතු අතර, එවැනි නිර්ණායක මඟින් බැංකුවට ණය අවදානම සැලකිය යුතු ලෙස වැඩි නොවන බව සහතික කිරීම සඳහා වලංගු තාර්කික සහ සාධාරණීකරණයන් සැපයිය යුතු අතර ලබා දී ඇති තොරතුරු සලකා බැලීමෙන් පසු අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා දීම හෝ යෝජනාව ප්‍රතික්ෂේප කිරීම සිදු කළ යුතුය.

7.2.2. විගණනය කරන ලද වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල අදාළ බැංකුවේ බිඳ හෙලන ලද නිර්ණායක තිබේ නම් එම නිර්ණායක සහ ණය හානිකරණ සඳහා වෙන් කිරීම් සහ ලාභදායිතාව කෙරෙහි එවැනි බිඳ හෙලන ලද නිර්ණායක වල ඇස්තමේන්තුගත බලපෑම හෙළි කළ යුතුය.

8. ණය පහසුකම් සඳහා ණය හානිකරණ

8.1 බලපත්‍රලාභී බැංකු විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කලින් කලට නිකුත් කරන ලද විධාන /මාර්ගෝපදේශ අනුව ණය පහසුකම් සඳහා ණය හානිකරණ මැනිය යුතුය.

8.2 ණය හානිකරණ මැනීම ශක්තිමත් ක්‍රමවේදයන් මත සිදු කළ යුතු අතර, එය අදාළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව අපේක්ෂිත ණය හානි, සුදුසු හා කාලෝචිත ලෙස හඳුනා ගැනීමට හේතු විය යුතුය.

8.3 මූල්‍ය උපකරණයක ණය අවදානම, මුල් හඳුනා ගැනීමේ සිට විශාල ලෙස ඉහළ ගොස් ඇත්නම්, බලපත්‍රලාභී බැංකුව විසින් ණය පහසුකම් සඳහා ණය හානි වෙන් කිරීම මුළු ණය කාල සීමාව සඳහාම අපේක්ෂිත ණය හානියට සමාන අගයකින් සෑම වාර්තාකරණ දිනයකදීම මැනිය යුතුය (ණය හානිකරණය සහිතව මිලට ගත් හෝ උපදවන ලද ණය පහසුකම් හැර).

8.4 ණය හානිකරණය සහිතව මිලට ගත් හෝ උපදවන ලද මූල්‍ය වත්කම් සඳහා පහත විධාන 11 ට අනුව වැඩි දියුණු කර නැත්නම් මුලු ණය කාලසීමාව සඳහාම අපේක්ෂිත ණය හානිය මැනිය යුතුය.

8.5 මූලධර්මයක් ලෙස මුලු ණය කාලසීමාව සඳහාම අපේක්ෂිත ණය හානිය සහ/හෝ ණය හානි සහිත ණය, තනි පදනම මත ඉදිරිපත් කළ යුතුය. කෙසේ වුවත්, බලපත්‍රලාභී බැංකු විසින් සාමූහික පදනම යටතේ යෝග්‍ය කාණ්ඩ හෝ ආයෝජන කළඹ අනුව හෝ තක්සේරු කළ හැකිය.

8.6 හානිකරණ වෙන්කිරීම සමන්විත වනුයේ සමූහ පදනම හෝ තනි පදනම මත වුවත් එය නොසලකා බලපත්‍රලාභී බැංකුවල මුලු හානිකරණ දීමනාවම අදාළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්හි පරමාර්ථ වලට අනුව ප්‍රමාණවත් සහ අනුරූපී විය යුතුය.

8.7 අදියර 1හි ණය පහසුකම් සඳහා ණය හානිකරණ

8.7.1 2022.01.01 දින සිට බලපත්‍රලාභී බැංකු විසින් අවම වශයෙන් අදියර 1හි ණය පහසුකම් සඳහා ණය හානිකරණ ප්‍රතිශතය, මුලු අදියර 1හි ණය පහසුකම් වලින් 0.5% ක ප්‍රතිශතයක් ලෙස පවත්වා ගත යුතුය. එනම්, අදියර 1හි ණය පහසුකම් සඳහා ණය හානිකරණ/ අදියර 1හි ණය පහසුකම් වල එකතුව

8.7.2 බලපත්‍රලාභී බැංකු විසින් අවම වශයෙන් අදියර 1හි ණය පහසුකම් සඳහා ණය හානිකරණ ප්‍රතිශතය, මුලු අදියර 1හි ණය පහසුකම් වලින් 0.5% ක ප්‍රතිශතයක් ලෙස පවත්වා නොගන්නේනම්, එම හිඟ කොටස ප්‍රාග්ධනයට එරෙහිව විශේෂ සංචිත වෙන්කිරීමක් ලෙස පවත්වා ගත යුතුය.

8.7.3 බලපත්‍රලාභී බැංකු විසින් එම සංචිත වෙන්කිරීම ලාභාංශ ගෙවීම් සඳහා යොදා නොගත යුතුය.

8.7.4 කෙසේවුවත් මෙය, අදියර 1හි ණය පහසුකම් සඳහා අවම ණය හානිකරණ අගයක් ලෙස පමණක් යොදා ගත යුතු අතර බලපත්‍රලාභී බැංකු විසින් අදියර 1හි ණය පහසුකම් සඳහා ණය හානිකරණ වල ප්‍රමාණාත්මක බව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් අනුව තහවුරු කළ යුතුය.

8.8 බලපත්‍රලාභී බැංකු වල ණය පහසුකම් සඳහා ණය හානිකරණ පිළිබඳ අතිරේක විධාන ඇමුණුම 1හි සපයා ඇත.

9. ණය හානි ගණනය කිරීම සඳහා වන ආකෘති

9.1 බලපත්‍රලාභී බැංකු වල ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් විසින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සපයා ඇති මාර්ගෝපදේශ වලට අනුව පහත කරුණු තහවුරු කළ යුතුය:

9.1.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත යටතේ අපේක්ෂිත ණය අලාභයන් තීරණය කිරීම සඳහා බලපත්‍රලාභී බැංකු විසින් බැංකු ව්‍යාපාර ආකෘතිය හා අවදානම් ව්‍යුහය පිළිබිඹු වන ශක්තිමත් ආකෘතින් සංවර්ධනය කළ යුතුය;

9.1.2 අපේක්ෂිත ණය හානි ගණනය කිරීමේදී වාණිජ බැංකු මඟින් සියලුම අභ්‍යන්තර හා බාහිර දත්තයන් සැලකිල්ලට ගත යුතු අතර එමඟින් ඇස්තමේන්තු වල ශක්තිමත් බව, අපක්ෂපාතී බව සහ වර්තමාන නිරාවරණයන් නිරූපනය වන බව තහවුරු කළ යුතුය;

9.1.3 බලපත්‍රලාභී බැංකු විසින් මෙම කාර්යය සඳහා යොදා ගනු ලබන ආකෘති අවබෝධ කර ගැනීම සඳහා අදාළ නිලධාරීන් ප්‍රමාණවත් පුහුණුවකින් සහ ප්‍රවීණත්වයෙන් යුතු වීම තහවුරු කළ යුතුය.

9.1.4 ආකෘති ගොඩනැගීම සම්බන්ධයෙන් බාහිර විකුණුම්කරුවන්ගෙන් හා උපදේශකයන්ගෙන් සහාය ලබා ගැනීමේදී දැඩි ආයතනික පාලනයක් හා අභ්‍යන්තර ක්‍රියාවලීන් අනුගමනය කළ යුතුය.

9.1.5 විවිධ වූ ආයෝජන කළඹ හා මූල්‍ය උපකරණ සඳහා විවිධ ආකෘති භාවිතා කරන්නේ නම් බලපත්‍රලාභී බැංකු විසින් තෝරා ගන්නා ලද ආකෘතිය සුදුසු වන්නේ ඇයිද යන්න ලිඛිතව සටහන් කළ යුතු අතර සියලු ණය ආකෘතීන් අවම වශයෙන් වාර්ෂිකව සමාලෝචනය කළ යුතුය.

9.1.6 ණය අවදානම තක්සේරු කිරීම හා මැනීමේ ක්‍රමවේදය තුළින් නිරන්තරයෙන් නිවැරදිව, ස්ථාවරව සහ අපක්ෂපාතී පුරෝකථන ඇස්තමේන්තු තැනීමට හැකි වන පරිදි ඵලදායී ලෙස ආකෘති ඇගයීමේ ක්‍රියාවලියක් ස්ථාපිත කළ යුතුය.

9.1.7 ලාභ සුමට කිරීමේ අරමුණින් ආකෘති සඳහා භාවිතා කරන ලද පරාමිතීන්, යෙදවුම් සහ උපකල්පනවල වෙනස්කම් සිදු කිරීමෙන් වැළකිය යුතුය. අපේක්ෂිත ණය හානි වෙන් කිරීමේ ආකෘතිවල යම් වෙනස්කම් සිදු කිරීම තාර්කික හා යුක්ති සහගත බව ප්‍රධාන අවදානම් නිලධාරීන්, ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් ඇගයීමට ලක් කළ යුතු අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ යුතුය.

9.2 ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපනය කරන ලද බැංකු, සිය ප්‍රධාන කාර්යාලය හෝ ප්‍රාදේශීය කාර්යාල මඟින් සකස් කරන ලද ආකෘතින් භාවිත කරන්නේ නම්, ඒවා ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් යෝග්‍ය හා අදාළ වන්නේ ද යන්න තහවුරු කර ගැනීම සඳහා මෙම ප්‍රමිතය ප්‍රධාන කළමනාකරණ මණ්ඩලයක් විසින් මෙහෙයවන දේශීයව ක්‍රියාත්මක කරනු ලබන කණ්ඩායමක් විසින් යෝග්‍ය වලංගු කිරීමේ ක්‍රියාවලියක් දේශීයව අනුගමනය කළ යුතුය.

10. ප්‍රතිව්‍යුහගතකළ සහ ප්‍රතිලේඛන ගත කළ ණය පහසුකම්

10.1 ප්‍රතිව්‍යුහගත කළ ණය පහසුකම්

10.1.1 ඉහත 5.1.1 විධානයන්ට අනුව සක්‍රීය ණය ලෙස පවතින අතරතුර ණය පහසුකමෙහි ගුණාත්මක බව පිරිහීම නිසා ණය ගෙවීමේ මුල් කොන්දේසි සංශෝධනය කළ ණය පහසුකම්, ප්‍රතිව්‍යුහගත කළ ණය පහසුකම් ලෙස හැඳින්වේ.

10.1.2 පහත විධාන 11 හි පරිදි උසස් කරන ලද ණය පහසුකම් හැර දෙවතාවක් දක්වා ප්‍රතිව්‍යුහගත කළ ණය පහසුකම් SLFRS 09 අනුව අදියර 2 හි පහසුකම් වශයෙන් වර්ගීකරණය කළ යුතුය.

10.1.3 පහත විධාන 11 හි පරිදි උසස් කරන ලද ණය පහසුකම් හැර දෙවතාවකට වැඩි වාර ගණනක් ප්‍රතිව්‍යුහගත කළ ණය පහසුකම් SLFRS 09 අනුව අදියර 2 හි පහසුකම් වශයෙන් වර්ගීකරණය කළ යුතුය.

10.2 ප්‍රතිලේඛන ගතකළ ණය පහසුකම්

10.2.1 ඉහත 5.1.2 විධානයන්ට අනුව අක්‍රිය ණය ලෙස පවතින අතරතුර ණය පහසුකමෙහි ගුණාත්මක බව පිරිහීම නිසා ණය ගෙවීමේ මුල් කොන්දේසි සංශෝධනය කළ ණය පහසුකම්, ප්‍රතිලේඛන ගත කළ ණය පහසුකම් වේ.

10.2.2 පහත විධාන 11 හි පරිදි උසස් කරන ලද ණය පහසුකම් හැර සියලුම ප්‍රතිලේඛන ගත කළ ණය පහසුකම් SLFRS 09 අනුව අදියර 3 හි පහසුකම් වශයෙන් වර්ගීකරණය කළ යුතුය.

10.3 බලපත්‍රලාභී බැංකු වල ණය ගුණාත්මකභාවයේ කිසියම් පිරිහීමක් තක්සේරු කිරීමේදී ඉහත 7.1 විධානය යටතේ ලැයිස්තුගත කර ඇති සාධක සලකා බැලිය යුතුය. කෙසේ වෙතත්, එවැනි තක්සේරු 7.1 විධානයේ දක්වා ඇති සාධකවලට සීමා නොවිය යුතු අතර ණය අවදානමේ සැලකිය යුතු වැඩි වීමකට සරිලන පරිදි ප්‍රතිව්‍යුහගත සහ ප්‍රතිලේඛන ගත කළ ණය පහසුකම් සම්බන්ධයෙන් ප්‍රමාණවත් ප්‍රතිපාදන සලසා ඇති බවට සහතික විය යුතුය.

10.4 නව ණය පහසුකම අක්‍රිය ණය ලෙස වර්ගීකරණය කර ඇත්නම් මිස බලපත්‍රලාභී බැංකු එම ණය ගැනුම්කරුට අක්‍රිය ණය ආපසු ගෙවීම සඳහා නව ණය පහසුකම් ලබා නොදිය යුතුය.

11. ණය පහසුකම් උසස් කිරීම

11.1 පහත කරුණු මත බලපත්‍රලාභී බැංකු විසින් ඉහළ අදියරක (අදියර 3 හෝ 2) සිට පහළ අදියරකට (අදියර 2 හෝ 1) ණය පහසුකම් උසස් කිරීම සිදු කළ හැකඃ

11.1.1 ණය පහසුකම් උසස් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලත් ප්‍රතිපත්තීන් අනුව සිදු කළ යුතු අතර එවැනි උසස් කිරීමක් සඳහා වන තර්කයන් ප්‍රමාණවත් පරිදි ලේඛනගත කළ යුතුය. එවැනි ප්‍රතිපත්තීන් අවම වශයෙන් පහත කරුණු තහවුරු කළ යුතුයඃ

(අ) හිඟ හිටි ගෙවීම් පියවීම

(i) ගනුදෙනුකරු විසින් සම්පූර්ණයෙන් ගෙවන ලද දුර දක්නා අනාගත කාලයක් දක්වා ගනුදෙනුකරුට ණය පියවීමේ හැකියාවක් පවතින බවට බැංකුව තක්සේරු කරන්නේ නම් අදියර 3 හි ප්‍රතිව්‍යුහගත කළ ණය පහසුකම් හා ප්‍රතිලේඛනගත කළ ණය පහසුකම් උසස් කිරීම සිදු කළ හැකියඃ

(ආ) අදියර 3 හි සිට උසස් කරන ලද ප්‍රතිව්‍යුහගත කළ ණය පහසුකම් සහ ප්‍රතිලේඛනගත කළ ණය පහසුකම්

(i) බලපත්‍රලාභී බැංකු විසින් අක්‍රිය ණය/ඌන ක්‍රියාකාරී ණය උසස් කිරීමේ දී විචක්ෂණශීලී විය යුතුය. සහ

(ii) වැඩි දියුණු කරන ලද වර්ගීකරණ තත්වය තහවුරු කිරීමට උසස් කරන ලද ණය පහසුකම තිරසාර ප්‍රවණතාවක්/තත්වයක් පෙන්නුම් කළ යුතුය.

11.1.2 ප්‍රතිලේඛනගත කළ සහ ප්‍රතිව්‍යුහගත කළ ණය පහසුකම් උසස් කිරීම සිදු කළ යුත්තේ අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් පමණක් වන අතර එය ණය සමාලෝචන යාන්ත්‍රණයෙන් ස්වාධීනව සිදු විය යුතුය.

12. ණය හානිකරණය සඳහා සුරැකුම් තක්සේරු කිරීම

12.1 බලපත්‍රලාභී බැංකු විසින් වත්කම් අගය කිරීම විචක්ෂණශීලීව සිදු කළ යුතු අතර පැහැර හැරීමෙන් ඇති වන අලාභ/මුදල් ප්‍රවාහයන් තක්සේරු කිරීමේදී පවත්නා විශ්වසනීය වෙළඳපොළ තක්සේරු සලකා බැලිය යුතුය. ගැටලු සහිත දේපළ ඈවර කිරීමේදී ඒ සමඟ බැඳී පවතින ආවේනික අවිනිශ්චිතතාව නිසි පරිදි නිවැරදිව පිළිබිඹු කළ යුතුය. (එවැනි වත්කම් විකිණීම සඳහා ගත වන කාලය ද ඇතුළත්ව)

12.2 බලපත්‍රලාභි බැංකු විසින් තක්සේරු කිරීම් වල කිසියම් වර්ධනයක් ඇත්නම්, එවන් වර්ධනයන් තිරසාර වන බවට අදාළ සාක්ෂි මඟින් තහවුරු කළ යුතුය.

12.3 බලපත්‍රලාභී බැංකු විසින් වඩාත් තාත්වික ඇස්තමේන්තු සැපයීමට ණය අවදානම අවම කරන උපකරණයන්හි ශුද්ධ උපලබ්ධිත අගය ඇස්තමේන්තුගත කිරීම හෝ සුරැකුම් වල බලාත්මක විකුණුම් වටිනාකම භාවිතා කිරීම කළ යුතුය. හානිකරණ අගය කිරීමේදී ණය අවදානම අවම කරන උපකරණයන්හි යාවත්කාලීන හා තාත්වික අගය කිරීම සැලකිල්ලට ගත යුතුය.

12.4 ඇපකරයක් ලෙස සැලකිය හැකි වත්කම්, මුදල්, තැන්පතු, දේපල උකස් කිරීම, රජයේ, මහ බැංකුවේ සහ බලපත්‍රලාභි බැංකු වල ඇපකර, ජීවිත රක්ෂණ ප්‍රතිපත්ති පැවරීම, රන් භාණ්ඩ, කොටස් පැවරීම, මෝටර් වාහන, කම්හල්, යන්ත්‍රසූත්‍ර මත උකස්කර, උපකරණ, ලැයිස්තු ගත ණයකර මත උකස්කර සහ කොටස් වලට සීමා වන අතර බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ විසින් තනි තනි අවස්ථා මත අනුමත කරන ලද වෙනත් ඕනෑම ආකාරයක සුරැකුම්පත් ද ඇතුළත් වේ.

12.5 ඇපකර තක්සේරු කිරීම සම්බන්ධයෙන් බලපත්‍රලාභී බැංකු පහත සඳහන් කරුණුවලට අනුකූල විය යුතුයඃ

12.5.1 බලපත්‍රලාභී බැංකුවල නිශ්චල දේපල තක්සේරු කිරීම පිළිබඳ නියාමන රාමුව සඳහා වන ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වරින් වර නිකුත් කරන ලද බැංකු පනත් විධාන.

12.5.2 මූල්‍ය වාර්තාකරණය සඳහා දේපළ, පිරියත සහ උපකරණ, ආයෝජන දේපළ සහ ජීව විද්‍යාත්මක වත්කම් තක්සේරු කිරීම පිළිබඳ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ.

13. පොලී අදායම හඳුනා ගැනීම

13.1 බලපත්‍රලාභී බැංකු විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් මත පදනම්ව ණය පහසුකම් සඳහා පොලී ආදායම හඳුනාගත යුතුය.

14. අභ්‍යන්තර විගණනයේ කාර්යභාරය

14.1 අභ්‍යන්තර විගණන ඒකකය, බලපත්‍රලාභී බැංකුවල ණය අවදානම් තක්සේරුවෙහි සඵලතාවය, මිනුම් පද්ධති සහ ක්‍රියාවලි වල සඵලතාවය ස්වාධීනව ඇගයීමට ලක් කළ යුතු අතර ණය විනිශ්චයන් පිළිගත හැකි බව තහවුරු කළ යුතුය.

14.2 අභ්‍යන්තර විගණන ඒකකය විසින් අවම වශයෙන් වාර්ෂිකව, සියලු ණය අවදානම් තක්සේරු ආකෘති, දත්ත සුමට කිරීම සඳහා යොදා ගත් ආදාන හා උපකල්පන (ඇත්නම් පමණක්) වලංගු කිරීම හා ඇගයීම සිදු කළ යුතුය.

14.3 අභ්‍යන්තර විගණන කාර්යයේදී, ප්‍රධාන මෙහෙයුම් සාධක හඳුනා ගනිමින් ඒවා නිවැරදිව යොදා ගෙන ඇති බවට තහවුරු කිරීම පිණිස පසුගාමී පරීක්ෂා කිරීමේ ප්‍රමාණාත්මක බව හා කාර්යක්ෂමතාවය පිළිබඳව ද සහතික විය යුතුය.

15. ව්‍යවස්ථාපිත වාර්තා කිරීම්

15.1 බලපත්‍රලාභී බැංකුව විසින් පහත දක්වා ඇති පරිදි හෝ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ විසින් වෙනත් ආකාරයකින් නියම කර ඇති පරිදි, මෙම විධාන මඟින් හඳුන්වා දී ඇති ව්‍යවස්ථාපිත වාර්තා ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ.

15.1.1 මාසික වාර්තා ඊළඟ මාසයේ 15 වැනි දින හෝ ඊට පෙර.

15.1.2 කාර්තුමය වාර්තා කාර්තුවක අවසානයේ සිට 15 වැනි දින හෝ ඊට පෙර.

15.2 බලපත්‍රලාභී බැංකු විසින් කාර්තුමය සහ වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත තොරතුරු මත පදනම්ව පහත මූලික කාර්ය සාධන දර්ශක ප්‍රකාශයට පත් කළ යුතුය.

15.2.1 අදියර 3 ණය, මුළු ණයෙහි (අදියර 3 හි ණය හානි ගළපන ලද) කොටසක් ලෙස

15.2.2 අදියර 3 ණය, වල ණය හානි, මුළු අදියර 3 ණයෙහි කොටසක් ලෙස

16. ක්‍රියාත්මක දිනය

16.1 2022 ජනවාරි 01 වන දා සිට බලපැවැත්වෙන පරිදි මෙම විධානය ක්‍රියාත්මක වේ.

17. අවලංගු කිරීම්

17.1 පහත විධාන/චක්‍රලේඛ 2022 ජනවාරි 01 වන දා සිට අවලංගු කරනු ලැබේ:

17.1.1 2008 මැයි 08 දින නිකුත් කළ 2008 අංක 3 හා 4 දරන බැංකු පනත් විධානයන් ණය සහ අත්තිකාරම් වර්ගීකරණය, ආදායම් හඳුනාගැනීම සහ වෙන් කිරීම.

17.1.2 2010 සැප්තැම්බර් 27 දින නිකුත් කළ 2010 අංක 3 හා 4 දරන බැංකු පනත් විධානයන් ණය සහ අත්තිකාරම් වර්ගීකරණය, ආදායම් හඳුනාගැනීම සහ වෙන් කිරීම සඳහා වන සංශෝධන.

17.1.3 2018 දෙසැම්බර් 31 දින නිකුත් කළ 2018 අංක 04 දරන චක්‍රලේඛය: ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 09: මූල්‍ය උපකරණ, පිළිබඳ බලපත්‍රලාභී බැංකුවලට මාර්ගෝපදේශ - SLFRS 09 යටතේ ඇති වන විගණනය කළ අමතර ණය අලාභ, රඳවා ගත් ලාභ සඳහා පළමු දින බලපෑමේ වෙනත් ගැලපුම්වලින් පසු හා බදු බලපෑමෙන් පසු එලෙසම පවත්වා ගැනීමට එක වරක් පමණක් ලබා දෙන ලද අවසරය 2021 දෙසැම්බර් 31 දක්වා ක්‍රියාත්මක වනු ඇත.

17.1.4 2019 අප්‍රේල් 26 දින නිකුත් කළ 2019 අංක 06 දරන චක්‍රලේඛය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය - SLFRS 9 මූල්‍ය උපකරණ, බලපත්‍රලාභි වාණිජ බැංකුවල ක්‍රියාවට නැංවීම පිළිබඳව නිකුත් කළ 2018 අංක 04 දරන චක්‍රලේඛය සඳහා ඌන පූරණය.

අත්සන් කලේ,
මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති හා
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

මෙම විධානයන්ගේ ඇමුණුම 1 පහත සබැඳිය ඔස්සේ ලබා ගත හැක.

https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/laws/cdg/Banking_Act_Directions_No_13_of_2021.pdf

බැංකු පනත් විධාන 2021 අංක 14 2021 සැප්තැම්බර් 14

බලපත්‍රලාභී බැංකු වල ණය පහසුකම් නොවන අනෙකුත් මූල්‍ය වත්කම් වර්ගීකරණය, හඳුනාගැනීම සහ මැනීම

1988 අංක 30 දරන සංශෝධිත බැංකු පනතේ 46(1) සහ 76(ඒ) (1) වගන්ති මඟින් ලබාදී ඇති බලතල අනුව ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් බලපත්‍රලාභී බැංකුවල ණය උපකරණ වර්ගීකරණය, හඳුනා ගැනීම හා මිනුම් කිරීම පිළිබඳ නීති රාමුව, මූල්‍ය උපකරණ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (මෙතැන් සිට SLFRS 09 ලෙස හැඳින්වෙන) සමඟ තවදුරටත් ශක්තිමත් කිරීමට සහ සුසංයෝග කිරීමටත් බැංකු කර්මාන්තයේ ඒකාකාරී සහ විචක්ෂණ පරිචයන් ඇති කිරීමටත් බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු වල (මෙතැන් සිට බලපත්‍රලාභී බැංකු ලෙස හැඳින්වෙන) ණය පහසුකම් නොවන අනෙකුත් මූල්‍ය වත්කම් වර්ගීකරණය, හඳුනා ගැනීම හා මිනුම් කිරීම පිළිබඳ පහත සඳහන් පනත් විධාන නිකුත් කරන ලදී.

1. බලගැන්වීම

1.1 බැංකු පනතේ 46(1) වගන්ති ප්‍රකාරව බැංකු පද්ධතියේ අඛණ්ඩතාව තහවුරු කිරීමට, බැංකුවකට හෝ බැංකුවලට ව්‍යාපාර කළ යුතු ආකාරය පිළිබඳ විධාන සියළුම බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත නිකුත් කිරීමට මුදල් මණ්ඩලයට බලය ඇත.

1.2 බැංකු පනතේ 76(ඒ)(1) වගන්ති ප්‍රකාරව, බලපත්‍රලාභී විශේෂිත බැංකුවලට හෝ ඕනෑම වර්ගයක විශේෂිත බැංකු වලට කටයුතු සිදු කළ යුතු ආකාරය සම්බන්ධව විධානයන් නිකුත් කිරීමට මුදල් මණ්ඩලයට බලය ඇත.

2. විෂය පථය හා අදාළත්වය

2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අවශ්‍යතාවන් වලට අමතරව මෙම විධානය යටතේ පවත්නා සියලුම අවශ්‍යතාවන් ද බලපත්‍රලාභී බැංකු සඳහා බලපැවැත්වේ.

3. නිර්වචනයන්

3.1 මෙම විධානයෙහි අරමුණු උදෙසා පහත නිර්වචනයන් අදාළ වේ.

3.1.1 මෙම විධානයන් මඟින් ආවරණය වන මූල්‍ය වත්කම් යනු SLFRS 09 යටතේ ආවරණය වන සියලුම මූල්‍ය වත්කම් වන අතර ණය පහසුකම් වර්ගීකරණය, මැනීම සහ හඳුනා ගැනීම පිළිබඳ බැංකු පනත් අංක 13 විධානයන්වල උපදෙස් මඟින් ආවරණය වන මූල්‍ය වත්කම් බැහැර කරයි.

3.1.2 තනි පුද්ගලයන්, සමාගම්, ශ්‍රී ලංකා රජය, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතන, ආයතන, රජය සතු ව්‍යාපාර, පුද්ගල සංගම් හා අනෙකුත් ආයතන ණය ගැනුම්කරුවන් යන්නට අයත් වේ.

3.1.3 අධ්‍යක්ෂ මණ්ඩලය යන්නෙන් අදහස් වන්නේ දේශීය සංස්ථාපිත බැංකුවක් නම් එහි අධ්‍යක්ෂ මණ්ඩලය වන අතර, විදේශීය බැංකුවක් නම් එහි ප්‍රධාන කාර්යාලය හෝ කලාපීය කාර්යාලයයි.

3.1.4 බැංකු පනත යටතේ ප්‍රධාන විධායක නිලධාරි සහ ප්‍රධාන කළමණාකරණ නිලධාරීන් යන්නෙන් අදහස් වන්නේ බලපත්‍රලාභී බැංකු වල විධායක මට්ටමේ කටයුතු සිදු කරන නිලධාරීන් සහ ප්‍රධාන විධායක නිලධාරියා වේ.

4. ණය පහසුකම් නොවන අනෙකුත් මූල්‍ය වත්කම් සඳහා වන යහපාලන රාමුව

4.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සහ අදාළ අධීක්ෂණ හා නියාමන මග පෙන්වීම් අනුව, බලපත්‍රලාභී බැංකුවල මූල්‍ය වත්කම් වර්ගීකරණය, හඳුනා ගැනීම හා මිනුම් කිරීම සඳහා වන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුව පිළිබඳ වන බැංකු පනත් විධානයන්ට අමතරව අවම වශයෙන් අනුමත ව්‍යාපාර ආකෘතියක් සහ ප්‍රතිපත්තියක් ඇති බවට සහතික කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ, ප්‍රධාන විධායක නිලධාරි සහ අදාළ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ වගකීම වේ .

4.2 එම ප්‍රතිපත්ති අවම වශයෙන්,

4.2.1 පවත්නා පදනමක් මත මූල්‍ය වත්කම් සඳහා වන ව්‍යාපාර ආකෘති ඇඟයීමට ප්‍රමාණවත් ක්‍රියාපටිපාටින් සහ පද්ධතීන් සමග පරමාර්ථ, නිර්වචන, ලක්ෂණ, නිර්ණායක හා මෙහෙයුම් ප්‍රතිපත්ති හඳුනා ගැනීම.

4.2.2 ව්‍යාපාර ආකෘති තීරණ සඳහා තීරණ ගනු ලබන බලධාරීන්, සුලභ නොවන සහ නොවැදගත් යැයි සලකා බැලිය යුතු විකුණුම් මට්ටම, අලෙවි කටයුතු සඳහා සලකා බැලීමට මෑතකාලීන විකිණීම සඳහා වන කාල සීමාව, ලාභ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් සඳහා සාධාරණ අගය විකල්පය තෝරා ගැනීම; සහ

4.2.3 ප්‍රමිතිගත ක්‍රියාවලීන් ලේඛනගතව පවත්වා ගැනීම, හුදෙක් ප්‍රාග්ධනය හා පොලිය ගෙවීම සඳහා වන ලක්ෂණ ඇතුළත් නිෂ්පාදිත හා ගිවිසුම් අගය කිරීමට හා හඳුනා ගැනීමට විස්තරාත්මක සෝදිසි ලැයිස්තු සහ රුක් සටහන් ඇතුළත් විය යුතුය.

4.3 බලපත්‍රලාභී බැංකුවල අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අදාළ අනාවරණයන් සහ ප්‍රමාණවත් දත්ත/වාර්තා පවත්වා ගැනීමෙන් මෙන්ම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත හා පවතින නියාමන රාමුව අනුව වාර්තාකරණ අවශ්‍යතා හඳුනා ගැනීම, සැසඳීම හා වාර්තා කිරීමට පවතින පද්ධති මඟින් කාලීන, අදාළ හා ඵලදායි තොරතුරු ලබා දීම තුළින් විනිවිදභාවය සහ සංසන්දනාත්මකභාවය බව තහවුරු කළ යුතුය.

4.4 ණය පහසුකම් නොවන මූල්‍ය වත්කම් වර්ගීකරණය, හඳුනාගැනීම හා මිනුම් කිරීම සම්බන්ධයෙන් ඇති ආකෘති, අදාළ බැංකුවේ කාර්ය භාරය හා වගකීම්, අනුමත කිරීමේ වාර ගණන , බැංකුව යොදා ගනු ලබන ක්‍රියාපටිපාටින් ඇතුළත් සම්පූර්ණ අනුමත ප්‍රතිපත්තියක් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය පිහිටුවිය යුතුය;

4.5 අධ්‍යක්ෂ මණ්ඩල අනුමත ප්‍රතිපත්තියක් තුළ පහත කරුණු සම්බන්ධයෙන් පැහැදිලි මඟ පෙන්වීමක් ඇතුළත් විය යුතුය;

4.5.1 ආයෝජන අදියර වලට වෙන්කිරීම (විභව අවදානම් නිර්ණායක මත අදියර 2 හා අදියර 3 ණය පහසුකම් වෙන්කිරීම);

4.5.2 ණය හානි ගණනය කිරීම සඳහා ණය පැහැර හැරීමේ සම්භාවිතාව, ණය පැහැර හැරීමේ අලාභය සහ ආර්ථික සාධක ගැලපුම යනාදිය නිර්ණය කිරීමට ක්‍රමෝපායයන්;

4.5.3 ණය හානි ගණනය කිරීම සඳහා සලකා බැලිය යුතු ඇපකර , එවැනි ඇපකර මත තක්සේරු අවශ්‍යතා සහ එවැනි තක්සේරු කිරීම් සඳහා අවශ්‍ය දත්ත හා උපක්‍රම පිළිබඳ නිශ්චිතයන්;

4.5.4 බැංකුවල කාර්යභාරය සහ වගකීම්, අනුමත කිරීමේ වාර ගණන හා ක්‍රියාවලීන් හා උපක්‍රම පැහැදිලිව සඳහන් කරන විස්තරාත්මක ආකෘති අනුමත කිරීමේ ප්‍රතිපත්තියක්;

4.5.5 අන් අයුරකින් හඳුනා නොගැනෙන, අපේක්ෂිත අලාභ ගණනය කිරීම විභව ආර්ථික කම්පනයන් නිරූපණය කරන බව තහවුරු කිරීමට ණය හානි ආකෘතීන් සඳහා ආවරණයන් යොදා ගැනීම ; සහ

4.5.6 පහත විධාන 9 සමඟ යා වන ආයෝජන උසස් කිරීමේ මාර්ගෝපදේශ.

4.6 බලපත්‍රලාභී බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් විසින් මූල්‍ය වත්කම් පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි සහ ක්‍රියාවලීන් අපේක්ෂිත පරිදි ක්‍රියාත්මක කරන බවට සහතික විය යුතු අතර, එය සහතික කිරීම සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන සහ වලංගු කිරීමේ ක්‍රියාවලීන් ස්ථාපිත කර තිබිය යුතුය.

5. මූල්‍ය වත්කම් (ණය පහසුකම් නොවන) හා මූල්‍ය වගකීම් වර්ගීකරණය

5.1 බලපත්‍රලාභී බැංකු විසින් ණය පහසුකම් නොවන මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් වර්ගීකරණය කිරීම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව සිදු කළ යුතුය. මූල්‍ය වත්කම් සහ වගකීම් වර්ගීකරණය සහ පසුව මැනීම පිළිබඳ පුළුල් සාරාංශයක් ඇමුණුම I හි ඇතුළත් වේ.

5.2 බලපත්‍රලාභී බැංකුවක් විසින් මූල්‍ය වගකීම් ලාභ හෝ අලාභ නම් කරන ලද මූල්‍ය වගකීම් ලෙස ගිණුම්ගත කරයි නම්, බලපත්‍රලාභී බැංකුව විසින් අධ්‍යයනය කර ස්වකීය ණය අවදානමේ වෙනස හේතුවෙන් මූල්‍ය වගකීම් වල වටිනාකමෙහි වෙනස වෙනත් විස්තීර්ණ ආදායම හරහා ගිණුම් ගත කළ යුතුය. බලපත්‍රලාභී බැංකුව මේ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත අභ්‍යන්තර මාර්ගෝපදේශ සකස් කළ යුතුය.

6. ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ/ මූල්‍ය වත්කම් (ණය පහසුකම් නොවන) පැහැරහරින ලද

6.1 SLFRS 09 අනුව මුළු ණය කාලසීමාව සඳහාම අපේක්ෂිත ණය හානිය ගණනය කිරීම සඳහා අවම වශයෙන් පහත දැක්වෙන සාධක/තත්ත්වයන් එකක් හෝ කිහිපයක් ළඟා වන්නේ නම් එය සැලකිය යුතු ලෙස ණය අවදානම ඉහළ යාමක් ලෙස හෝ පැහැර හරින ණය පහසුකමක් ලෙස සැලකිය හැකිය.

6.1.1 ගනුදෙනුකරුවෙකුගේ ගිවිසුම්ගත ගෙවීම් කාලය දින 30 කට වඩා හිඟ වන්නේ නම් (ප්‍රමිතියේ සඳහන් පරිදි බිඳ හෙලිය හැකි යැයි සැලකෙන උපකල්පනයට යටත්ව);

6.1.2 බාහිර ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනයක් විසින් ශ්‍රී ලංකා ජාතික ණය පරිමාණ ගත කිරීමට අනුව ණයගැතියෙකුගේ ණය අවදානම පසුකාලීනව B+ හෝ ඊට අඩු ලෙස පහත දැමීම.

6.1.3 බලපත්‍රලාභී බැංකුවල අභ්‍යන්තර ශ්‍රේණිගත කිරීමේ ස්ථාන දෙකකින් පහත වැටීම. බලපත්‍රලාභී බැංකු සිය අභ්‍යන්තර ණය අවදානම් ශ්‍රේණිගත කිරීම බාහිර ණය

තක්සේරු කිරීමේ ආයතනය විසින් නිකුත් කර ඇති ශ්‍රේණිගත කිරීමකට අනුරූපී කළ යුතුය. බලපත්‍රලාභී බැංකු මේ සඳහා ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා බැංකු පනත් විධාන වල බාහිර ණය අනුරූපි කිරීම පරිහරණය කළ යුතුය.

6.1.4 ගනුදෙනුකරු/ගනුදෙනුකාර කණ්ඩායම්, ආයෝජන කළඹ හෝ මූල්‍ය උපකරණවල කාර්යසාධනයන් කෙරෙහි සෘජුව අහිතකර ලෙස බලපාන අනාගත ආර්ථික තත්ත්වයන් පිළිබඳ සාධාරණ සහ තහවුරු කළ හැකි පුරෝකථන පැවතීම.

6.1.5 ගනුදෙනුකරු/ගනුදෙනුකාර කණ්ඩායම්, ආයෝජන කළඹ හෝ මූල්‍ය උපකරණවල කාර්ය සාධනයන් කෙරෙහි සෘජුව බලපාන ස්වභාවික විපතක් හෝ සැලකිය යුතු භූගෝලීය වෙනස්කමක් පැවතීම.

6.1.6 අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ නිරන්තර වෙනස්වීම් සහ නිකුත් කරන්නාගේ ව්‍යාපාර පවත්වාගෙන යාම පිළිබඳ ගැටලුවක් පැවතීම.

6.1.7 ගනදෙනුකරුගේ පෙර මූල්‍ය වර්ෂය හා සැසඳීමේ දී එක දිගට අවුරුදු 2ක් ආදායමේ සහ/හෝ බදු පෙර ලාභයේ සියයට 50 කට වඩා සිදු වන අඩු වීම සහ/හෝ පෙර වර්ෂය හා සැසඳීමේ දී ශුද්ධ වටිනාකමේ (ලාභාංශ ප්‍රතිපත්තියේ සහ කොටස් ව්‍යුහයේ සිදුවන වෙනස්වීම් වලට අමතරව) සියයට 25 කට වඩා සිදුවන අඩු වීම.

6.1.8 ණය ගනුදෙනුකරු මිය යාම/බුන්වත් වීම.

6.1.9 අඛණ්ඩව වසර තුනක කාලයක් සඳහා ලාභාංශ/ප්‍රතිලාභ නොලැබීම (ශුද්ධ වත්කම් වටිනාකම සියයට 30 හෝ ඊට වැඩි සමුච්චිත අගයකින් පහත වැටීමක් සමඟ) සහ

6.1.10 වසර තුනකට වැඩි කාලයක් ආයෝජන වටිනාකම පිරිවැයට වඩා අඩු වීමත් සමඟ වෙළඳපොළ මිලෙහි අඛණ්ඩව පහත වැටීමේ ප්‍රවණතාවක් පැවතීම.

6.2 ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ යාමක් ලෙස තීරණය කිරීමේදී බලපත්‍රලාභී බැංකු විසින් 6.1.2 සිට 6.1.10 දක්වා දක්වා ඇති නිර්ණායක එකක් හෝ වැඩි ගණනක් පහත සඳහන් කරුණු වලට යටත්ව බිඳ හෙලනු ඇත.

6.2.1 අවදානම් කළමණාකරණ කාර්යයේ ප්‍රධානත්වය දරන ප්‍රධාන කළමණාකරණ නිලධාරියා විසින් එවැනි බිඳ හෙලිය හැකි නිර්ණායක අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ කළ යුතු අතර, එවැනි නිර්ණායක මගින් බැංකුවට ණය අවදානම සැලකිය යුතු ලෙස වැඩි නොවන බව සහතික කිරීම සඳහා වලංගු තාර්කික සහ සාධාරණීකරණයන් සැපයිය යුතු අතර ලබා දී ඇති තොරතුරු සලකා බැලීමෙන් පසු අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා දීම හෝ යෝජනාව ප්‍රතික්ෂේප කිරීම සිදු කළ යුතුය.

6.2.2 විගණනය කරන ලද වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල අදාළ බැංකුවේ බිඳ හෙලන ලද නිර්ණායක තිබේ නම් එම නිර්ණායක සහ ණය හානිකරණ සඳහා වෙන් කිරීම් සහ ලාභදායිතාව කෙරෙහි එවැනි බිඳ හෙලන ලද නිර්ණායක වල ඇස්තමේන්තුගත බලපෑම හෙළි කළ යුතුය.

7. ණය පහසුකම් හැර අනෙකුත් මූල්‍ය වත්කම් සඳහා ණය හානි වියදම්

7.1 බලපත්‍රලාභී බැංකු විසින් ණය පහසුකම් සඳහා වන ණය හානි වියදම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත හා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කාලයෙන් කාලයට නිකුත් කරනු ලබන විධානයන්ට අනුව ගණනය කළ යුතුය.

7.2 ණය හානි වෙන්කිරීම් ශක්තිමත් ක්‍රමෝපායයන් මත ගොඩ නැංවිය යුතු අතර එමඟින් සුදුසු හා කාලීන ණය හානි හඳුනාගැනීමක්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව සිදු කළ යුතුය.

7.3 ණය හානි සඳහා වෙන්කිරීමේ එකතුව, තනි හෝ සාමූහික වශයෙන් ගණනය කළ ද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව ඒකාකාරී විය යුතුය.

7.4 බලපත්‍රලාභී බැංකු වල ණය හානි පිළිබඳ අතිරේක මාර්ගෝපදේශ ඇමුණුම II හි සපයා ඇත.

8. ණය පහසුකම් හැර වෙනත් මූල්‍ය වත්කම් සඳහා ණය හානි ගණනය කිරීම සඳහා ආකෘති

8.1 බලපත්‍රලාභී බැංකුව විසින් පහත දෑ සිදුකරන බවට, අධ්‍යක්ෂ මණ්ඩලයේ මග පෙන්වීම යටතේ ප්‍රධාන විධායක නිලධාරී සහ අනෙකුත් අදාළ ප්‍රධාන කළමණාකරණ නිලධාරීන් විසින් තහවුරු කල යුතුය.

8.1.1 බලපත්‍රලාභී බැංකුවේ ව්‍යාපාර ආකෘතිය සහ අවදානම් පැතිකඩට අනුරූප වන පරිදි, අපේක්ෂිත ණය හානි ගණනය කිරීම සඳහා ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත අනුව ශක්තිමත් ආකෘති සංවර්ධනය කිරීමට;

8.1.2 අපේක්ෂිත ණය හානි තක්සේරු කිරීමේදී පවතින සහ අදාළ සියලු අභ්‍යන්තර හා බාහිර දත්ත සලකා බැලීම සහ එම තක්සේරු ශක්තිමත්, අපක්ෂපාති මෙන්ම වර්තමාන නිරාවරණයන්වල පිළිබිඹුවක් වීම ;

8.1.3 හොඳින් පුහුණු වූ, නිපුණතා සහිත, බැංකුව විසින් යොදා ගනු ලබන ආකෘති පිළිබඳ ගැඹුරු අවබෝධයක් සහිත නිලධාරීන් වීම.

8.1.4 ආකෘති සංවර්ධනය කිරීම සඳහා බාහිර සැපයුම්කරුවන්ගේ/ උපදේශකවරුන්ගේ සහය ලබා ගන්නා විට දැඩි යහපාලන සහ අභ්‍යන්තර පාලන ක්‍රියාවලීන්ට අනුගත වීම.

8.1.5 විවිධ කළඹ සහ උපකරණවලට විවිධ ආකෘතින් යොදාගනු ලබන අවස්ථාවන්හිදී, නිශ්චිත ආකෘතියක්, යෝග්‍ය ආකෘතිය ලෙස තෝරා ගැනීමට හේතු ලේඛනගත කිරීම සහ සියලුම ණය ආකෘති අවම වශයෙන් වාර්ෂිකව සමාලෝචනය කිරීම.

8.1.6 ණය අවදානම් ඇගයීමේ සහ මැනීමේ ක්‍රමයක් පවත්නා පදනමක් මත නිවැරදි, ඒකාකාරී හා අපක්ෂපාති අනාවැකි තක්සේරු ලබා දෙන බවට සඵලදායි ආකෘති වලංගු කිරීමේ ක්‍රියාවලියක් පිහිටුවීම ; සහ

8.1.7 ලාභ සුමට කිරීම සඳහා යොදා ගනු ලබන පරාමිතීන්, ආදාන සහ උපකල්පනවල වෙනස්කම් සිදු නොකිරීම. කෙසේවෙතත්,ණය ආකෘති වල කිසියම් වෙනසක් අවශ්‍ය නම් එවැන්නක තර්කය හා සාධාරණීයත්වය ප්‍රධාන අවදානම් නිලධාරියා, ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් ඇගයීමට ලක් කළ යුතු ය.

8.2 ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපනය කරන ලද බලපත්‍රලාභී බැංකු ඔවුන්ගේ ප්‍රධාන කාර්යාලය හෝ ප්‍රාදේශීය කාර්යාලය මඟින් සංවර්ධනය කරන ලද ආකෘති භාවිත කරයි නම් එවැනි බැංකු ශ්‍රී ලාංකික වටපිටාව තුළ ආකෘතිවල යෝග්‍යතාව ඇගයීම කළ යුතු ය. ප්‍රධාන කළමනාකරණ කණ්ඩායම ප්‍රමුඛ දේශීය කණ්ඩායමක් මඟින් වලංගු කිරීමේ ක්‍රියා පටිපාටි සිදු කළ යුතු ය.

9. ණය පහසුකම් හැර අනෙකුත් මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය

9.1 බලපත්‍රලාභී බැංකු වල මූල්‍ය වත්කම් සඳහා ව්‍යාපාර ආකෘතිය වෙනස් වී ඇති අවස්ථාවක හා පෙර ආකෘති ඇගයීමට තවදුරටත් අදාළ නොවන විටෙක දී, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවල වෙන්කිරීම් අනුව බලපත්‍රලාභී බැංකු විසින් මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය සිදු කළ හැකිය.

9.2 අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ව්‍යාපාර ආකෘතියේ එවැනි වෙනස්වීම් සහ නැවත වර්ගීකරණයන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවල අවශ්‍යතාවන්ට අනුරූපව අනුමත කළ යුතු අතර එවැනි අනුමත කිරීමක සිට වැඩ කරන දින 7ක් තුළ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ දැනුවත් කළ යුතු ය.

10. ණය පහසුකම් හැර අනෙකුත් මූල්‍ය වත්කම් වැඩිදියුණු කිරීම

10.1 බලපත්‍රලාභී බැංකු විසින් මූල්‍ය වත්කම් ඉහළ අදියරකට වැඩි දියුණු කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් අනුමත කරන ලද ප්‍රතිපත්තියකට අනුව සිදු කළ යුතු අතර එවැනි වැඩි දියුණු කිරීමක තාර්කිකත්වය නිසි පරිදි ලේඛන ගත කළ යුතුය.

10.2 බලපත්‍රලාභී බැංකු විසින් මූල්‍ය වත්කම් ඉහළ නැංවීමේදී විචක්ෂනශීලී විය යුතු අතර, ඉහළ නංවන ලද වත්කම් තිරසාර ප්‍රවණතාවක්/ වැඩි දියුණු කිරීමේ තත්වයක් පෙන්නුම් කරන බව තහවුරු කළ යුතු ය.

11. ණය පහසුකම් හැර අනෙකුත් මූල්‍ය වත්කම්වල සාධාරණ වටිනාකම් මැනීම

11.1 බලපත්‍රලාභී බැංකු විසින් මූල්‍ය උපකරණ පසුව සාධාරණ අගයට මිනුම් කිරීමේදී ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත අංක 13: සාධාරණ අගයට මිනුම් කිරීම යන්නෙහි අවශ්‍යතාවලට අනුව කටයුතුකළ යුතු ය :

11.1.1 ප්‍රමාණවත් දත්ත සහිත සුදුසු අගය කිරීමේ උපක්‍රමයක් භාවිත කිරීම;

11.1.2 තෝරාගත් අගය කිරීමේ උපක්‍රමය ඒකාකාරීව යොදා ගත යුතුය;

11.1.3 නිරීක්ෂණය කළ හැකි අදාළ ආදාන උපරිම වශයෙන් භාවිතා කිරීම. ඇති විශේෂ අවස්ථා වල පමණක් නිරීක්ෂණය කළ නොහැකි ආදාන යොදා ගත හැකිය ; එමෙන්ම,

11.1.4 3 වන මට්ටමේ ධුරාවලිය යටතේ අදාළ ආදාන වල සුදුසු බව සහ විශ්වසනීයත්වය පිළිබඳ සහතිකය ප්‍රධාන අවදානම් නිලධාරියාගෙන් ලබා ගත යුත්තේ අදාළ ආදාන නියමිත තක්සේරු ක්‍රමය භාවිත කරන්නේ නම් පමණි.

12. අභ්‍යන්තර විගණනයේ කාර්යභාරය

12.1 අභ්‍යන්තර විගණන කාර්ය මඟින් ණය අවදානම් නිර්ණය කිරීමේ ඵලදායිතාවය, බලපත්‍රලාභී බැංකුවල ක්‍රියාවලීන් සහ මිනුම් පද්ධති ස්වාධීනව ඇගයීමට ලක් කළ යුතු අතර ණය තීරණවල පිළිගත හැකි බව තහවුරු කළ යුතු ය.

12.2 අභ්‍යන්තර විගණන කාර්ය අවම වශයෙන් වාර්ෂිකව සියලුම ණය අවදානම් නිර්ණය කිරීමේ ආකෘතින් වල ආදාන හා උපකල්පන වලංගු කිරීම හා ඇගයීම කළ යුතු ය.

12.3 අභ්‍යන්තර විගණන කාර්යය මඟින් පසු පරීක්ෂණයේ ප්‍රමාණාත්මක බව සහ සඵලදායිත්වය පිළිබඳ සහතිකයක් ලබා දිය යුතු අතර එමඟින් වැදගත් ධාවකයන් සියල්ල අඩංගු බවට තහවුරු කළ යුතු ය.

13. නියාමන වාර්තාකරණය

13.1 බලපත්‍රලාභී බැංකු විසින් මෙම විධානයන් මඟින් හඳුන්වා දී ඇති ව්‍යවස්ථාපිත වාර්තා පහත දක්වා ඇති පරිදි හෝ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ විසින් නිර්ණය කරන අයුරින් සැපයීම කළ යුතුය.

13.1.1 මාසික ඉදිරිපත් කිරීම ඊළඟ මාසයේ 15 වැනි දින හෝ ඊට පෙර

13.1.2 කාර්තුමය ඉදිරිපත් කිරීම කාර්තුවක අවසානයේ සිට 15 වැනි දින හෝ ඊට පෙර.

14. බලපැවැත්වෙන දිනය

14.1 මෙම උපදෙස් 2022 ජනවාරි 01 සිට ක්‍රියාත්මක වේ.

15. විධානයන් අවලංගු කිරීම

15.1 පහත උපදෙස් 2022 ජනවාරි 01 සිට අවලංගු කෙරේ

15.1.1 බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා නිකුත් කරන ලද 2006.03.01 දිනැති බැංකුවල යෝජනා කළඹ වර්ගීකරණය, තක්සේරුකරණය සහ මෙහෙයුම් පිළිබඳ විචක්ෂණතා සම්මතයන් පිළිබඳ බැංකු පනත් විධානයන්.

අත්සන් කලේ,
මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති හා
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

මෙම විධානයන්ගේ ඇමුණුම් පහත සබැඳිය ඔස්සේ ලබා ගත හැක.

https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/laws/cdg/Banking_Act_Directions_No_14_of_2021.pdf

චක්‍රලේඛය 2021 අංක 11 2021 සැප්තැම්බර් 30

බලපත්‍රලාභී බැංකුවල ණය පහසුකම් සහ අනෙකුත් මූල්‍ය වත්කම් වර්ගීකරණය, හඳුනාගැනීම සහ මිනුම්කරණය පිළිබඳ බැංකු පනතේ විධාන සඳහා පරිපූරක චක්‍රලේඛය

බලපත්‍රලාභී බැංකු වල ණය පහසුකම් සහ අනෙකුත් මූල්‍ය වත්කම් වර්ගීකරණය, හඳුනාගැනීම සහ මිනුම්කරණය සම්බන්ධව නිකුත් කරන ලද 2021 අංක 13 සහ 14 දරන නව බැංකු පනත් විධානයන්ට සමගාමීව, කොවිඩ්-19 ව්‍යාප්තිය හමුවේ, බලපත්‍රලාභී බැංකු විසින් මූල්‍ය උපකරණ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - SLFRS 09 ක්‍රියාවට නැංවීම ඒකාකාරීව සිදුකිරීම සඳහා, 2022 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි, මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

1. කොවිඩ්-19 ව්‍යාප්තිය හමුවේ ඇති වූ සුවිශේෂී වාතාවරණයන් හමුවේ, ණය සහ අත්තිකාරම් හානිකරණය සඳහා අදියරගත කිරීමට අදාළ ප්‍රතිපත්ති සඳහා බලපත්‍රලාභී බැංකු විසින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිතව පැහැදිළි මාර්ගෝපදේශ ඇතුළත් කළ යුතුය.

2. කොවිඩ්-19 ව්‍යාප්තිය හේතුවෙන් ආර්ථික ක්‍රියාකාරකම් සඳහා සෘජු තාවකාලික සීමාවන් පැනවී ඇති අවස්ථාවකදී, බලපත්‍රලාභී බැංකු විසින් ණය පහසුකම් අදියර 3හි පහසුකම් ලෙස වර්ගීකරණය කළ යුතුද නැද්ද යන්න, එක් එක් අවස්ථානුකූලව, විචක්ෂණශීලීව තීන්දු කිරීමට කටයුතු කළ හැක.

(අ) ව්‍යාපාරය යළි පණ ගැන්වීමට සහ ආර්ථික ක්‍රියාකාරකම් සඳහා පැනවී ඇති සීමාවන් ඉවත් වීමෙන් පසු ණය පහසුකම් ආපසු ගෙවීමට ප්‍රමාණවත් මුදල් ප්‍රවාහයක් උත්පාදනය කිරීමට ණය ගැනුම්කරුට ඇති නොහැකියාව මත; සහ

(ආ) කොවිඩ්-19 ව්‍යාප්තිය සහ/හෝ පාස්කු ඉරිදා ප්‍රහාරය නිසා ඇතිවූ අහිතකර ආර්ථික තත්ත්වය හමුවේ ණය පහසුකම් දෙවතාවකට වඩා ප්‍රතිව්‍යුහගත කර ඇත්නම්, එය සැලකිල්ලට ගනිමින්,

3. ස්වෛරී රාජ්‍යයන් විසින් නිකුත් කරන ලද විදේශ මුදල් වර්ගවල නිරාවරණ සඳහා ණය පැහැර හැරීමේ සම්භාවිතාව ගණනය කිරීම සම්බන්ධයෙන් වැඩිදුර මාර්ගෝපදේශ ලබා ගැනීම සඳහා බලපත්‍රලාභී බැංකු විසින් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ අයතනයෙන් සහ විගණකවරුන්ගෙන් උපදෙස් පැතිය හැක.

4. සංචාරක අංශය ඇතුළුව කොවිඩ්-19 නිසා බලපෑමට ලක් වූ ව්‍යාපාරිකයන් සහ පුද්ගලයන් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වරින් වර නිකුත් කරන ලද චක්‍රලේඛවලට අනුව ලබා දෙන සහන යටතේ සලකා බලන සියලුම ණය පහසුකම් සඳහා ද මෙම උපදෙස් අදාළ වේ.

5. මූල්‍ය උපකරණ සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත-SLFRS 09 අනුගමනය කිරීම පිළිබඳ බලපත්‍රලාභී බැංකු සඳහා වන මාර්ගෝපදේශ ඇතුළත් 2018 අංක 04 දරන චක්‍රලේඛයට සංශෝධන ලෙස 2020 ඔක්තොම්බර් 28 වැනි දින නිකුත් කරන ලද 2020 අංක 09 දරන චක්‍රලේඛය, 2022 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක පරිදි අවලංගු කෙරේ.

බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ

බැංකු පනත් විධාන 2021 අංක 15 2021 ඔක්තෝබර් 01

ආනයනවලට එරෙහිව ආන්තික අවශ්‍යතා

1988 අංක 30 දරන බැංකු පනතේ සංශෝධිත 46 (1) සහ 76 (ඒ) (1) වගන්ති ප්‍රකාරව නිකුත් කරන ලදී.

ආනයනවලට එරෙහිව ආන්තික අවශ්‍යතා සම්බන්ධයෙන් 2021 සැප්තැම්බර් 08 දින නිකුත් කරන ලද 2021 අංක 12 දරන චක්‍රලේඛය මෙමඟින් ඉවත් කරනු ලැබේ.

අත්සන් කලේ,
නිවාඩ් අජිත් ලෙස්ලි කබ්රාල්
මුදල් මණ්ඩලයේ සභාපති හා
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

චක්‍රලේඛය 2021 අංක 12 2021 ඔක්තෝබර් 05

මගී ප්‍රවාහන ක්ෂේත්‍රයේ නියුතු ව්‍යාපාර සහ පුද්ගලයන් විසින් ලබාගෙන ඇති කල්බදු පහසුකම් සඳහා සහන සැලසීම

කොවිඩ්-19 වසංගතය හමුවේ සංචාරක ක්ෂේත්‍රයේ ප්‍රවාහන සේවා ඇතුළුව පොදු හා පෞද්ගලික මගී ප්‍රවාහන සේවාවන් සැපයීමේ ව්‍යාපාර සහ පුද්ගලයින් මුහුණ පා ඇති අභියෝගයන්ට මුහුණ දීමේ අරමුණින් 2021 මාර්තු 10 දිනැති 2021 අංක 03 දරන චක්‍රලේඛය යටතේ මගී ප්‍රවාහන අංශයේ ව්‍යාපාර සහ පුද්ගලයින් විසින් ලබාගත් කල්බදු පහසුකම් සඳහා ලබා දුන් සහන පහත පරිදි දීර්ඝ කරන ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු (මෙතැන් සිට බලපත්‍රලාභී බැංකු ලෙස හැඳින්වෙන) වෙතින් ඉල්ලා සිටී.

(i) කොවිඩ් -19 බලපෑමට පත් වූ සංචාරක ක්ෂේත්‍රයේ මගී ප්‍රවාහන සේවා සපයන ව්‍යාපාර සහ පුද්ගලයින් විසින් ලබා ගත් කල්බදු පහසුකම් සඳහා 2021 සැප්තැම්බර් 13 දිනැති 2021 අංක 10 දරන චක්‍රලේඛය යටතේ සහන සැලසීම,

(ii) කොවිඩ් -19 බලපෑමට පත් වූ අනෙකුත් මගී ප්‍රවාහන සේවා සපයන ව්‍යාපාර සහ පුද්ගලයින් විසින් ලබා ගත් කල්බදු පහසුකම් සඳහා 2021 සැප්තැම්බර් 01 දිනැති 2021 අංක 08 දරන චක්‍රලේඛය යටතේ සහන සැලසීම.

බලපත්‍රලාභී බැංකු ඉහත (i) සහ (ii) ඉක්මනින් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කළ යුතුවේ.

අත්සන් කලේ,
නිවාඩ් අජිත් ලෙස්ලි කබ්රාල්
මුදල් මණ්ඩලයේ සභාපති හා
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

බැංකු පනත් විධාන 2021 අංක 16 2021 ඔක්තෝබර් 05

බලපත්‍රලාභී බැංකු වල තාක්ෂණික අවදානම් කළමනාකරණය හා ඔරොත්තු දීමේ හැකියාව සඳහා වන නියාමන රාමුව

1988 අංක 30 දරන සංශෝධිත බැංකු පනතේ 46(1) සහ 76 (ඒ) (1) වගන්ති ප්‍රකාරව, බලපත්‍රලාභී බැංකු වල තාක්ෂණික අවදානම් කළමනාකරණය සහ ඔරොත්තු දීමේ හැකියාව තවදුරටත් තහවුරු කිරීමේ අරමුණින්, මුදල් මණ්ඩලය විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු හා බලපත්‍රලාභී විශේෂිත බැංකු (මින් මතුවට බලපත්‍රලාභී බැංකු ලෙස හැඳින්වෙන) සඳහා තාක්ෂණික අවදානම් කළමනාකරණය සහ ඔරොත්තු දීමේ හැකියාව සඳහා වන නියාමන රාමුව සම්බන්ධයෙන් පහත විධානයන් නිකුත් කරනු ලබයි.

1.	**බැංකු පනත යටතේ බලගැන්වීම**	1.1	බැංකු පනතේ 46(1) වගන්ති ප්‍රකාරව බැංකු පද්ධතියේ ස්ථාවරත්වය තහවුරු කිරීමට, ඕනෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවකට එවැනි බැංකුවක් නැතහොත් බැංකුවල ව්‍යාපාරයන්හි ඕනෑම පැතිකඩක කටයුතු සිදු කළ යුතු ආකාරය සම්බන්ධව විධානයන් නිකුත් කිරීමට මුදල් මණ්ඩලයට හැකියාව ඇත.
		1.2	බැංකු පනතේ 76 (ඒ) (1) වගන්ති ප්‍රකාරව ඕනෑම බලපත්‍රලාභී විශේෂිත බැංකුවකට එවැනි බැංකුවක් හෝ ඕනෑම බලපත්‍රලාභී විශේෂිත බැංකු වර්ගයක කටයුතු සිදු කළ යුතු ආකාරය සම්බන්ධව විධානයන් නිකුත් කිරීමට මුදල් මණ්ඩලයට හැකියාව ඇත.
2.	**විෂය පථය හා අදාළත්වය**	2.1	සෑම බලපත්‍රලාභී බැංකුවකටම, නියෝජිතයන් සහ තෙවැනි පාර්ශව සේවා සපයන්නන් හරහා සිදු කර ගනු ලබන මෙහෙයුම් කටයුතු ද ඇතුළුව, මෙම විධාන අදාළ වේ.
3	**තාක්ෂණික අවදානම් කළමනාකරණය හා ඔරොත්තු දීමේ හැකියාව උදෙසා වන රෙගුලාසිමය රාමුව**	3.1	මෙම විධානයෙහි උපලේඛන 1 හි දක්වා ඇති පරිදි සියළුම බලපත්‍රලාභී බැංකු වල අවදානම් කළමනාකරණය සහ ඔරොත්තු දීමේ හැකියාව සඳහා වන නියාමන රාමුව (මින් මතුවට නියාමන රාමුව ලෙස හැඳින්වෙන) මඟින් පැනවූ අවශ්‍යතාවන් හා අනුගත විය යුතුය.
		3.2	නියෝජිතයන් සහ තෙවැනි පාර්ශව සේවා සපයන්නන් හරහා සිදු කර ගනු ලබන මෙහෙයුම් කටයුතු ද ඇතුළුව බැංකු පද්ධතියේ සමස්ත මෙහෙයුම් කටයුතු සඳහා නියාමන රාමුවෙහි සඳහන් අවශ්‍යතාවන් අදාළ වේ.
4	**අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම**	4.1	බලපත්‍රලාභී බැංකු වල අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියාමන රාමුවෙහි දක්වා ඇති තාක්ෂණික අවදානම් කළමනාකරණය හා ඔරොත්තු දීමේ හැකියාව උදෙසා පවත්නා අවශ්‍යතාවන් ක්‍රියාවට නැංවීම තහවුරු කිරීම සඳහා ප්‍රමාණවත් අධීක්ෂණ ක්‍රියාමාර්ග සකස් කළ යුතුය.
5	**යහපාලන රාමුව**	5.1	තාක්ෂණික අවධානම විචක්ෂණශීලීව කළමනාකරණය කිරීම තහවුරු කිරීම සඳහා බලපත්‍රලාභී බැංකු විසින් මෙම නියාමන රාමුවෙහි 4 වැනි කොටසෙහි සඳහන් කර ඇති අවශ්‍යතාවන් හා අනුගත වන අයුරින්, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ඵලදායී යහපාලන රාමුවක් ස්ථාපනය කිරීමට කටයුතු කළ යුතුය.
6	**සුපරීක්ෂණ සමාලෝචන ක්‍රියාවලිය යටතේ තාක්ෂණික අවදානම් තක්සේරු කිරීම**	6.1	බලපත්‍රලාභී බැංකු විසින් බැංකුවේ අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මක බව තක්සේරු කිරීමේ ක්‍රියාවලියේ විස්තීර්ණ අවදානම් තක්සේරු කිරීමේ කොටසක් ලෙස තාක්ෂණික අවදානම තක්සේරු කළ යුතු අතර, ඉදිරියේ දී ඇති විය හැකි තාක්ෂණික අවධානම් වලට මුහුණ දීම සඳහා ප්‍රමාණාත්මක ප්‍රාග්ධන මට්ටමක් පවත්වා ගත යුතු වේ.
7.	**අභ්‍යන්තර විගණනයේ කාර්යභාරය**	7.1	අවදානම් කළමණාකරණය පිළිබඳ නියාමන අවශ්‍යතා හා අනුගත වීම නිසි ලෙස මැන බලා අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව හරහා බලපත්‍රලාභී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අවම වශයෙන් වාර්ෂිකව වාර්තා කරන්නේ ද යන්න බලපත්‍රලාභී බැංකුවේ අභ්‍යන්තර විගණන ක්‍රියාවලිය මඟින් තහවුරු කළ යුතුය.

8. **අනුගත වීම තහවුරු කිරීමේ පියවරයන්**

8.1 මෙම විධානයන් ක්‍රියාත්මක වන දිනයේ සිට ම, බලපත්‍රලාභී බැංකු විසින් සියලුම නව තාක්ෂණික මූලපිරීම්, මෙම නියාමන රාමුවෙහි 09 වන කොටසේ, තොරතුරු පද්ධති යටිතල පහසුකම් හිමිකම, කළමනාකරණය සහ ස්ථානය මත පදනම් වන අවශ්‍යතා හා අනුකූල වන බවට තහවුරු කළ යුතුය.

8.2 බලපත්‍රලාභී බැංකු විසින්, නියාමන රාමුවෙහි සඳහන් අනෙකුත් සියලුම අවශ්‍යතාවන්, නියාමන රාමුවෙහි 10වන කොටසෙහි සඳහන් සංක්‍රාන්ති ක්‍රියාපිළිවෙත් සඳහා අදාළ කාල රාමු හා අනුගත වන බවට තහවුරු කළ යුතුය.

8.3 පද්ධතිමය වැදගත්කමක් සහිත බැංකු ලෙස නම් කර ඇති බැංකු විසින් පද්ධතිමය වැදගත්කමක් සහිත බැංකු සඳහා විශේෂයෙන් අදාළ වන අවශ්‍යතාවන් සඳහා අනුගත වීම, පද්ධතිමය වැදගත්කමක් සහිත බැංකුවක් ලෙස නම් කිරීමේ නිවේදනය ලැබී මාස 12ක් ඇතුළත හෝ මෙම නියාමන රාමුවෙහි 10වන කොටසෙහි දක්වා ඇති කාල රාමුව පරිදි හෝ යන දෙකෙන් පසුව එළඹෙන අවස්ථාව අනුව සිදු කළ යුතුය.

අත්සන් කලේ,
නිවාඩ් අජිත් ලෙස්ලි කබ්රාල්
මුදල් මණ්ඩලයේ සභාපති හා
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

මෙම විධානයන්ගේ උපලේඛණය 1 පහත සබැඳිය ඔස්සේ ලබා ගත හැක.
https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/laws/cdg/Banking_Act_Directions_No_16_of_2021.pdf

චක්‍රලේඛය 2021 අංක 13 2021 දෙසැම්බර් 22

කොවිඩ්-19 නිසා බලපෑමට පත් ණය ගැනුම්කරුවන්ට එරෙහිව ණය ආපසු අයකරගැනීමේ ක්‍රියාමාර්ග කල් දැමීම

දැනට පවතින කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ව්‍යාපාරිකයන් හා පුද්ගලයන් මුහුණ පා ඇති අභියෝගයන් සැලකිල්ලට ගනිමින්, පහත දැක්වෙන පරිදි, පරාටේ නීතිය ක්‍රියාත්මක කරවීම සහ කල්බදු පහසුකම් යටතේ ලබා ගන්නා ලද වත්කම් යළි අත්පත්කර ගැනීම් ඇතුළුව ණය ආපසු අයකර ගැනීම සඳහා ගනු ලබන සියළුම ආකාරයේ ක්‍රියාමාර්ග අත්හිටුවන මෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු හා බලපත්‍රලාභී විශේෂිත බැංකු (මෙතැන් සිට බලපත්‍රලාභී බැංකු ලෙස හැඳින්වෙන) වෙතින් ඉල්ලා සිටී.

1. කොවිඩ්-19 නිසා බලපෑමට පත් ව්‍යාපාරිකයන් සහ පුද්ගලයන් හට සහන සැලසීම සඳහා 2021 සැප්තැම්බර් 01 වැනි දින නිකුත් කරන ලද 2021 අංක 08 දරන චක්‍රලේඛයේ සඳහන් කර ඇති ණය ආපසු අයකර ගැනීම සඳහා ගනු ලබන සියළුම ආකාරයේ ක්‍රියාමාර්ග අත්හිටුවීමේ කාල සීමාව 2022.03.31 දක්වා දීර්ඝ කිරීමට බලපත්‍රලාභී බැංකු කටයුතු කළ යුතු වේ.

2. කොවිඩ්-19 නිසා බලපෑමට පත් සංචාරක ක්ෂේත්‍රයේ නියුතු ව්‍යාපාරිකයන් සහ පුද්ගලයන් හට සහන සැලසීම සඳහා 2021 සැප්තැම්බර් 13 දින නිකුත් කරන ලද 2021 අංක 10 දරන චක්‍රලේඛයේ සඳහන් 2022.06.30 දක්වා වන ණය ආපසු අයකර ගැනීම සඳහා ගනු ලබන සියළුම ආකාරයේ ක්‍රියාමාර්ග අත්හිටුවීමේ කාල සීමාව නොවෙනස්ව පවතී.

අත්සන් කලේ,
නිවාඩ් අජිත් ලෙස්ලි කබ්රාල්
මුදල් මණ්ඩලයේ සභාපති හා
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

බැංකු පනත් නිර්ණය 2021 අංක 01 2021 දෙසැම්බර් 27

බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා වාර්ෂික බලපත්‍ර ගාස්තු

1988 අංක 30 දරන සංශෝධිත බැංකු පනතේ 8 වන හා 76 (ඇ) (6) යන වගන්ති ප්‍රකාරව ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය මඟින් නිකුත් කරන ලද නිර්ණය.

1988 අංක 30 දරන බැංකු පනතේ 8(1) සහ 76 (ඇ) (6) වගන්ති ප්‍රකාරව, සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු හා බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින්, 2022 වර්ෂය සඳහා වාර්ෂික බලපත්‍ර ගාස්තු, 2021 වසර අග සමස්ත වත්කම් මත පදනම්ව, පහත වගුවේ දක්වා ඇති පරිදි, 2022 ජනවාරි 31 හෝ එදිනට පෙර ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ගෙවන ලෙසට මුදල් මණ්ඩලය විසින් නිර්ණය කර ඇත.

2022 වසර සඳහා වාර්ෂික බලපත්‍ර ගාස්තු

2021 වසර අවසානයේ මුළු වත්කම් (රු. බිලියන)	බලපත්‍ර ගාස්තුව (රු. මිලියන)
2,000 ට වැඩි	38.0
1,000 සිට 2,000 දක්වා	35.0
500 සිට 1,00 දක්වා	28.5
200 සිට 500 දක්වා	25.0
125 සිට 200 දක්වා	18.5
75 සිට 125 දක්වා	12.5
25 සිට 75 දක්වා	6.5
25 ට අඩු	3.3

අත්සන් කලේ,
නිවාඩ් අජිත් ලෙස්ලි කබ්රාල්
මුදල් මණ්ඩලයේ සභාපති හා
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

මුදල් නීති පනත් නියෝගය 2021 අංක 03 2021 දෙසැම්බර් 30

බලපත්‍රලාභී වාණිජ බැංකු වල හා ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙහි විදේශ මුදල් තැන්පතු සඳහා වන උපරිම පොලී අනුපාත

1949 අංක 58 දරන මුදල් නීති පනතේ (සංශෝධිත) 104(1) (ආ) වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලදී.

වත්මන් සහ අපේක්ෂිත සාර්ව ආර්ථික ප්‍රවණතා සහ බලපත්‍රලාභී බැංකු විසින් විදේශ මුදල් තැන්පතු සඳහා පවතින පොලී අනුපාත සලකා බලමින්, බලපත්‍රලාභී වාණිජ බැංකු හා ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින් විදේශ මුදල් තැන්පතු සඳහා ගෙවිය යුතු උපරිම පොලී පිළිබඳ විධානයන් නිකුත් කරනු ලබයි.

1.	**මුදල් නීති පනත යටතේ බලගැන්වීම**	1.1	බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින් විවිධ වර්ගයේ තැන්පතු සඳහා අය කරන උපරිම පොලී අනුපාතයන් වරින් වර තීරණය කිරීමට මුදල් නීති පනතේ 104 (1) (ආ) වගන්තිය අනුව මුදල් මණ්ඩලයට හැකියාව ඇත.
2.	**විදේශ මුදල් තැන්පතු සඳහා වන උපරිම පොලී අනුපාත**	2.1	බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින් විදේශ මුදල් තැන්පතු සඳහා ලබා දෙන හෝ ගෙවනු ලබන උපරිම පොලී අනුපාත පහත සඳහන් පරිදි විය යුතුය. (i) වසරක් හෝ ඊට අඩු කල් පිරීමේ කාලසීමාවක් සහිත තැන්පතු සඳහා වන පොලී අනුපාත පසුගිය කාර්තුවේ අවසාන මාසයෙහි පැවති වෙන්දේසියක දී තීරණය කරන ලද දින 364 භාණ්ඩාගාර බිලපත් සාමාන්‍ය ප්‍රාථමික වෙළඳපල සඵල අනුපාතිකයට පදනම් අංක 150ක් අඩු කරන ලද අගයට හෝ සියයට 5 යන අගයන්ගෙන් වැඩි අගය අදාළ වේ. (ii) වසරකට වැඩි කල් පිරීමේ කාලසීමාවක් සහිත තැන්පතු සඳහා වෙළඳපල හැසිරීම මත තීරණය කළ යුතුය.
		2.2	විශේෂ විදේශ මුදල් තැන්පතු ගිණුම් සඳහා ලබාදෙන හෝ ගෙවනු ලබන අතිරේක පොලී අනුපාතිකය ඉහත 2.1 සඳහන් අනුපාතිකය ඉක්මවිය යුතුය.
3.	**ගණනය කිරීම සඳහා පසුබිම**	3.1	ඉහත සාමාන්‍ය අනුපාතිකය ගණනය කිරීමට අදාළව වෙන්දේසි තෝරා ගැනීමේදී අදාළ මාසය තුළ පියවීමේ දිනය නොව වෙන්දේසි දිනය පදනම් කර ගත යුතුය.
		3.2	ඉදිරි කාර්තුව සඳහා උපරිම පොලී අනුපාත, වර්තමාන කාර්තුවෙහි අවසාන දිනයේදී ගණනය කළ යුතුය.
4.	**මුදල් හුවමාරු ගිවිසුමෙහි පිරිවැය**	4.1	ඇමරිකා එක්සත් ජනපද ඩොලර් / ශ්‍රී ලංකා රුපියල් දේශීය හුවමාරු වෙළඳපල තුළ මෑත කාලයේදී පවත්නා අධික විචලනයන් සැලකිල්ලට ගනිමින් සහ එහි ක්‍රමවත් ක්‍රියාකාරිත්වය තහවුරු කිරීමට බලපත්‍රලාභී බැංකු විසින් එ.ජ.ඩො/ ශ්‍රී. ල.රු., එ.ජ.ඩො. සියයට 10ක පොලී අනුපාතිකයක් යටතේ සිදු කිරීමට කටයුතු කළ යුතුය. ඒ අනුව අදාළ කාල සීමාවන් සඳහා නැවත දැනුම් දෙන තුරු එ.ජ.ඩො/ ශ්‍රී. ල.රු. හුවමාරු අනුපාතයන් ඉහත පදනම් එ.ජ.ඩො. පොලී අනුපාතිකය හා අනුකූල විය යුතුය.
5.	**නියාමන වාර්තා කිරීම් හා හෙළිදරව් කිරීම්**	5.1	සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු හා ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින්; (i) විදේශ මුදල් තැන්පතු සඳහා වන පොලී අනුපාත පිළිබඳ තොරතුරු "පොලී අනුපාත" යන සති වාර්තාව අනුව භාරදිය යුතුය. (ii) විදේශ මුදල් තැන්පතු සඳහා ලබාදෙන පොලී අනුපාත ගණුදෙනුකරුවන්ට දැනුම් දීමට හා ප්‍රදර්ශනය කිරීමට කටයුතු කළ යුතුය.
6.	**ක්‍රියාත්මක කිරීම**	6.1	මෙම විධානය 2021 දෙසැම්බර් 31 වන දා සිට බලපැවැත්වෙන අතර නව විදේශ මුදල් තැන්පතු, පවත්නා විදේශ මුදල් ඉතුරුම් තැන්පතු සහ කාලීන තැන්පතු අලුත් කිරීම් සඳහා අදාළ වේ.
7.	**අවලංගු කිරීම්**	7.1	බලපත්‍රලාභී වාණිජ බැංකු වල සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙහි විදේශ මුදල් තැන්පතු සඳහා වන උපරිම පොලී අනුපාත වලට අදාළව 24.08.2021 දින නිකුත් කළ 2020 අංක 02 දරන මුදල් නීති විධානය මෙමඟින් අවලංගු කරනු ලැබේ.

අත්සන් කලේ,
නිවාඩ් අජිත් ලෙස්ලි කබ්රාල්
මුදල් මණ්ඩලයේ සභාපති හා
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

මුදල් නීති පනත් නියෝගය 2021 අංක 04 2021 දෙසැම්බර් 31

උකස්කර මත ලබා දෙන නිවාස ණය සඳහා අයකළ හැකි උපරිම පොලී අනුපාත සඳහා වන 2020 අංක 03 දරන මුදල් නීති පනත් විධානය සඳහා සංශෝධනය

1949 අංක 58 දරන මුදල් නීති පනතේ (සංශෝධිත) 104(1)(ආ) වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලදී.

දැනට පවත්නා සහ අපේක්ෂිත සාර්ව ආර්ථික ප්‍රවණතා සහ බලපත්‍රලාභී බැංකු විසින් රුපියල් ණය සහ අත්තිකාරම් සඳහා ලබා දෙන වෙළෙඳපොළ පොලී අනුපාත සලකා බලමින්, මුදල් මණ්ඩලය විසින් උකස්කර මත ලබා දෙන නිවාස ණය සඳහා අයකළ හැකි උපරිම පොලී අනුපාත සඳහා වන 2020 අංක 03 දරන මුදල් නීති පනත් නියෝගය සඳහා සංශෝධනය නිකුත් කරනු ලැබේ.

ඒ අනුව, මුදල් නීති පනත් නියෝගයෙහි විධාන 3.1 පහත පරිදි සංශෝධනය විය යුතුය.

3. වැටුප් ලබන සේවකයන් විසින් උකස්කර මත ලබා ගන්නා නිවාස ණය සඳහා වන පොලී අනුපාත සහ ආපසු ගෙවීමේ කාලය

3.1 විධාන 2.1 යටතේ දක්වා ඇති උකස්කර මත ලබා දෙනු ලබන නිවාස ණය සඳහා අයකළ හැකි උපරිම පොලී අනුපාත පහත පරිදි වේ.

(i) ස්ථාවර පොලී අනුපාතිකය, ණය පහසුකමේ පළමු වසර පහ සඳහා ණය ලබා දෙන අවස්ථාවේදී පැවති මාසික සාමාන්‍ය බරිත ප්‍රමුඛ ණය අනුපාතය (Monthly Average Weighted Prime Lending Rate (AWPR) විය යුතුය.

(ii) මුල් වසර 5න් අනතුරුව, ණයෙහි ඉතිරි කාල සීමාව සඳහා වන පොලී අනුපාතිකය මාසික සාමාන්‍ය බරිත ප්‍රමුඛ ණය අනුපාතයට වාර්ෂිකව පදනම් අංක 200ක් එකතු කළ අනුපාතය මත පදනම් වූ විචල්‍ය පොලී අනුපාතිකයක් වනු ඇති අතර මාස 6ට වතාවක් ණය මුදල ප්‍රතිමිල ගැන්වෙනු ඇත.

(iii) ණය පහසුකමේ පළමු වසර පහ තුළ මාසික වාරික ගණනය කිරීමේ දී, සම්පූර්ණ ණය කාලසීමාව සඳහා ම පොලිය ණය ලබා දෙන අවස්ථාවේදී පැවති මාසික සාමාන්‍ය බරිත ප්‍රමුඛ ණය අනුපාතය සැලකිල්ලට ගනිමින් සිදු කළ යුතුය.

2022 ජනවාරි 01 වන දා සිට බලපැවැත්වෙන පරිදි මෙම විධානය ක්‍රියාත්මක වේ.

අත්සන් කලේ,
නිවාඩ් අජිත් ලෙස්ලි කබ්රාල්
මුදල් මණ්ඩලයේ සභාපති හා
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

ශ්‍රී ලංකා මුදල් නෝට්ටු ප්‍රතිනිෂ්පාදනය පිළිබඳ මාර්ගෝපදේශ

1. **හැඳින්වීම**

1.1 1949 අංක 58 දරන මුදල් නීති පනතේ 49 වන වගන්ති ප්‍රකාරව, ශ්‍රී ලංකාවේ මුදල් නෝට්ටු සහ කාසි නිකුත් කිරීමේ පරම අයිතිය සහ බලය ශ්‍රී ලංකා මහ බැංකුව සතු වේ.

1.2 මුදල් නීති පනතේ 58 (ඇ) වගන්ති ප්‍රකාරව, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ අනුමැතියකින් තොරව, කිසියම් පුද්ගලයෙක් විසින් ඕනෑම මුදල් නෝට්ටුවක් ඕනෑම ස්වරූපයකින් ප්‍රතිනිෂ්පාදනය හෝ සමරූපී පිටපතක් නිෂ්පාදනය කිරීම දඬුවම් ලැබිය හැකි වරදක් වේ. මෙම ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයේ අරමුණ වන්නේ ව්‍යාජ නෝට්ටු අච්චු ගැසීම වැළැක්වීම හෝ අවම කිරීම සහ ව්‍යවහාර මුදලේ අඛණ්ඩතාවය පිළිබඳ ව පවතින මහජන විශ්වාසය සහ ප්‍රතිරූපය වැඩි දියුණු කිරීම වේ.

1.3 ශ්‍රී ලංකා මුදල් නෝට්ටු ප්‍රතිනිෂ්පාදනය පිළිබඳ මෙම මාර්ගෝපදේශවල අරමුණ වන්නේ ඕනෑම ව්‍යවහාර මුදල් නෝට්ටු ප්‍රතිනිෂ්පාදනයක් සම්බන්ධයෙන් කොන්දේසි පැනවීම (මෙතැන් සිට ව්‍යවහාර මුදල් ලෙස හඳුන්වනු ලැබේ) සහ මුදල් නීති පනතේ 58 (ඇ) වගන්ති ප්‍රකාරව මුදල් මණ්ඩලයේ අනුමැතිය ඉල්ලුම් කිරීම සම්බන්ධයෙන් අයදුම්පතක් ඉදිරිපත් කිරීමේ ක්‍රියා පටිපාටියක් හඳුන්වාදීමයි.

1.4 මෙම මාර්ගෝපදේශ, ව්‍යවහාර මුදල් ප්‍රතිනිෂ්පාදනය කිරීමට අදහස් කරනු ලබන නෛතික පුද්ගලයෙක් හෝ ස්වාභාවික තැනැත්තෙක් වන ඕනෑම අයකුට, ඔහුගේ හෝ ඇයගේ ජාතිය හා ප්‍රදේශය යනාදිය නොසලකා අදාළ වේ.

2. **ප්‍රතිනිෂ්පාදනය අර්ථ දැක්වීම**

i. ප්‍රතිනිෂ්පාදනය යනු ව්‍යවහාර මුදල් නෝට්ටුවක කිසියම් කොටසක් (මුදල් නෝට්ටුවක 25% කට වඩා වැඩි) හෝ මුදල් නෝට්ටුවක සමස්ත දෘශ්‍ය රූපය හෝ අන්තර්ගතය හෝ ස්වරූපය පිටපත්කිරීම, ප්‍රතිවලිත කිරීම, අනුකරණය කිරීම හෝ නිර්මාණය කිරීමයි.

ii. නිදර්ශන, සිතුවම්, ඡායාරූප, පින්තූර, විද්‍යුත් රූප හා අන්තර්ජාලය, රූපවාහිනිය හා චිත්‍රපට ඇතුළු මුද්‍රිත හෝ විද්‍යුත් මාධ්‍ය හරහා ප්‍රතිනිෂ්පාදනය කළ හැකිය.

3. **ප්‍රතිනිෂ්පාදනය සඳහා වූ කොන්දේසි**

පහත 3.2 සිට 3.7 දක්වා වූ කොටස්වල නියම කර ඇති කොන්දේසි සපුරාලන පුද්ගලයෙකුට, 3.1 කොටසේ දක්වා ඇති අරමුණු සඳහා මුදල් මණ්ඩලයේ අනුමැතියට යටත්ව හෝ වෙනත් ආකාරයකින් නියම කර ඇති පරිදි ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල් නෝට්ටු ප්‍රතිනිෂ්පාදනය කිරීමට අවසර ලබා දිය හැකි වේ.

3.1 අවසරලත් අරමුණු

i. **අධ්‍යාපනික** - පෙළපොත්, සඟරා, අධ්‍යාපනික ලිපි, පර්යේෂණ ප්‍රකාශන, තොරතුරු අත් පත්‍රිකා, අතථ්‍ය කෞතුකාගාර, පුස්තකාල, විද්‍යුත් මාධ්‍යයෙහි පළවන අධ්‍යාපනික ලිපි යනාදිය සඳහා ප්‍රතිනිෂ්පාදනය

ii. **වාණිජ** - මුද්‍රිත හෝ විද්‍යුත් ආකාරයේ වෙළඳ දැන්වීම් සහ වාණිජ අරමුණු සඳහා වන වෙනත් ආකාරයේ ප්‍රතිනිෂ්පාදන

iii. **වෙනත්** - මුදල් මණ්ඩලයට පිළිගත හැකි වෙනත් ඕනෑම අරමුණක්

3.2 ඕනෑම මුදල් ප්‍රතිනිෂ්පාදනයක් මඟින් ව්‍යවහාර මුදලේ ගෞරවනීයභාවය හා ප්‍රතිරූපය සහ ඒවායේ අඩංගු ඕනෑම ලාංඡනයක් සහ සැලසුම් නිර්මාණයක් ඒ අයුරින්ම පවත්වා ගත යුතුය.

3.3 මත්පැන්, දුම්පානය හෝ ප්‍රචණ්ඩත්වය හෝ කාමුක දර්ශන වැනි අහිතකර සන්දර්භයන් හා සම්බන්ධ හෝ ඕනෑම දේශපාලන අන්තර්ගතයකට අදාල වන හෝ සම්බන්ධවන හෝ මහජන යහපතට එරෙහිව සිදුකරන ප්‍රතිනිෂ්පාදනයන්ට අවසර නොලැබේ. තවද, අසභ්‍යත්වය, සූදුව හෝ වෙනත් සමාජීය වශයෙන් පිළිගත නොහැකි ක්‍රියාවන් දිරිමත් කරනු ලබන වාණිජ වෙළඳ දැන්වීම් සඳහා ප්‍රතිනිෂ්පාදනයන් භාවිතා නොකළ යුතුය.

3.4 **මුද්‍රිත මාධ්‍යයේ ප්‍රතිනිෂ්පාදනය**

(අ) ප්‍රතිනිෂ්පාදනයේදී නුසුදුසු හෝ පරිහවාත්මක ආකාරයකින් මුදල් නෝට්ටුවේ ස්වරූපය හෝ එහි කොටසක ස්වරූපය වෙනස් කිරීමක් හෝ විකෘති කිරීමක් නොකළ යුතු අතර එවැනි සන්දර්භයක් තුළ භාවිතා නොකළ යුතුය.

(ආ) ඕනෑම මුදල් නෝට්ටුවක ප්‍රතිනිෂ්පාදනය සැබෑ මුදල් නෝට්ටුවේ ප්‍රමාණයට සමාන නොවිය යුතුය. තවද, එය කුඩා නම්, එය අදාළ මුදල් නෝට්ටුවේ ප්‍රමාණයෙන් තුනෙන් දෙකකට (2/3) වඩා අඩු විය යුතු අතර එය විශාල නම් එය අදාළ මුදල් නෝට්ටුවේ මුල් ප්‍රමාණයෙන් අවම වශයෙන් 150% ක් විය යුතුය. ව්‍යවහාර මුදල් නෝට්ටුවක ඕනෑම කොටසක ප්‍රතිනිෂ්පාදනයකට වුවද අදාළ සියලු කොන්දේසි සපුරාලිය යුතුය.

(ඇ) ප්‍රතිනිෂ්පාදනය කළ යුත්තේ මුදල් නෝට්ටු සඳහා භාවිතා කරන කඩදාසි වලින් (එනම්, කපු පල්පය භාවිතයෙන් නිපදවන කඩදාසි) පැහැදිලිව වෙනස් හා වෙන් කොට හඳුනාගත හැකි ද්‍රව්‍ය මත ය.

(ඈ) ප්‍රතිනිෂ්පාදනයට "SPECIMEN" යන වචනය ඇතුළත් විය යුතු අතර එය ප්‍රතිනිෂ්පාදනයේ ප්‍රමාණයෙන් තුනෙන් එකකට (1/3) නොඅඩු අකුරෙන් මුදල් නෝට්ටුවේ පහළ පැහැදිලි තද අකුරින් දෘශ්‍ය ලෙස මුද්‍රණය කළ යුතුය. අතිච්ඡාදනය වන ලෙස නෝට්ටු ප්‍රතිනිෂ්පාදනය කිරීමේදී, "SPECIMEN" යන වචනය ඉහත දක්වා ඇති පරිදි මුදල් නෝට්ටුවේ වඩාත් කැපී පෙනෙන ස්ථානයේ මුද්‍රණය කළ යුතුය. කෙසේ වෙතත්, මෙම කොන්දේසියට අනුකූල වීම

සහ ප්‍රතිනිෂ්පාදනය කිරීමේ අරමුණ සාක්ෂාත් කර ගැනීම ප්‍රායෝගික නොවන බව පැහැදිලි වේ නම් අයදුම්කරුට මෙම අවශ්‍යතාවය ඉවත්කර ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුවේ ව්‍යවහාර මුදල් අධිකාරී වෙතින් ඉල්ලා සිටිය හැකිය. ව්‍යවහාර මුදල් අධිකාරී විසින් එවැනි ඉල්ලීමක් සලකා බලා ඔහු හෝ ඇය එම ඉල්ලීම පිළිබඳව සෑහීමකට පත්වේ නම් නිදහස් කිරීම ලබා දිය යුතුය.

(ඉ) ප්‍රතිනිෂ්පාදනය මුදල් නෝට්ටුවේ එක් පැත්තක පමණක් විය යුතුය. සැබෑ මුදල් නෝට්ටුවකට සමාන වන පරිදි මුදල් නෝට්ටුව දෙපසම සමගාමීව මුද්‍රණය නොකළ යුතුය.

(ඊ) කුපනයක් හෝ වවුචරයක් සඳහා ප්‍රතිනිෂ්පාදනය භාවිතා නොකළ යුතුය.

(උ) මුදල් අමාත්‍යවරයාගේ සහ මහ බැංකු අධිපතිගේ අත්සන මුද්‍රණයෙන් හෝ වෙනත් ක්‍රමයකින් මකා දැමිය යුතුය.

(ඌ) ශ්‍රී ලංකා මහ බැංකුවේ නම හෝ ලාංඡනය කිසිදු ප්‍රතිනිෂ්පාදනයකට සම්බන්ධ කරනොගත යුතුය.

(එ) "මෙම ප්‍රතිනිෂ්පාදනය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කර ඇත" යන වචන ප්‍රතිනිෂ්පාදනය කරන ලද මුදල් නෝට්ටුවට මදක් පහළින් දැක්විය යුතුය.

3.5 **නිශ්චල පින්තූර ලෙස වෙබ් අඩවි සහ වෙනත් ඩිජිටල් මාධ්‍ය ඇතුළු විද්‍යුත් මාධ්‍යවල ප්‍රතිනිෂ්පාදනය**

මෙම ආකාරයේ ප්‍රතිනිෂ්පාදනයන් ඉහත 3.3 (අ), (ආ), (ඇ), (ඊ), (උ) සහ (ඌ) කොන්දේසි වලට අනුකූල විය යුතුය. තවද, විද්‍යුත් නිදර්ශනයක්, මුල් ප්‍රමාණයෙන් විභේදනය 72dpi නොඉක්මවිය යුතුය.

3.6 **චිත්‍රපට, රූපවාහිනී තිර, වීඩියෝ සහ වෙනත් චලනය වන පින්තූර ඇතුළු විද්‍යුත් මාධ්‍යවල ප්‍රතිනිෂ්පාදනය**

මෙම ආකාරයේ ප්‍රතිනිෂ්පාදනයන් 3.3 (අ) සහ (උ) කොන්දේසි වලට අනුකූල විය යුතුය.

3.7 සියලුම ඩිජිටල් ලිපිගොනු, අනුඡායා පටල, ගුරු තහඩු හෝ වෙනත් ලිපිගොනු, රූපයක් අඩංගු හෝ මුදල් නෝට්ටුවල ප්‍රතිනිෂ්පාදන භෞතික හෝ විද්‍යුත් ආකාරයෙන්, සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් නිර්මාණය කිරීමට යොදාගන්නා හෝ ඒවා ගබඩා කර තබාගන්නට භාවිතා කරන මෙවලම් හෝ උපාංග යනාදිය කිසිදු අනිසි භාවිතයකින් වළක්වා ගැනීම සඳහා ආරක්ෂිතව ගබඩා කර තැබිය යුතුය.

3.8 තවද, ඉහත 3.7 හි සඳහන් සියලුම අයිතමයන් භාවිතයෙන් පසු ස්ථිරවම විනාශ කිරීම හෝ මකා දැමීම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලබා දී ඇති අවසරයේ වලංගු කාල සීමාව ඉකුත්වී මාසයක් ඉක්මවා යාමට පෙර සිදුකළ යුතුය. මෙම ක්‍රියාව පිළිබඳව දිවුරුම් ප්‍රකාශයක් ශ්‍රී ලංකා මහ බැංකුවේ ව්‍යවහාර මුදල් අධිකාරී වෙත යොමු කළ යුතු අතර එහි පිටපතක් ශ්‍රී ලංකා පොලීසියේ අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවට යොමු කළ යුතුය.

4. ඇගයීමේ සහ අනුමත කිරීමේ ක්‍රියා පටිපාටිය

4.1 මුද්‍රිත හෝ විද්‍යුත් ස්වරූපයෙන් සිදුකරන ප්‍රතිනිෂ්පාදනයන්ට අදාළ සාම්පල, 5.1 සහ 5.2 වගන්ති යටතේ නිශ්චිතව දක්වා ඇති ව්‍යතිරේකයන්ට යටත්ව, ඇමුණුම (අ) හි අඩංගු අයදුම් පත්‍රය සහ පිරික්සුම් ලැයිස්තුව සමඟ අවම වශයෙන් දින 30 කට පෙර අයදුම්කරු විසින් ව්‍යවහාර මුදල් අධිකාරී වෙත ඉදිරිපත් කළ යුතුය.

4.2 ව්‍යවහාර මුදල් අධිකාරී විසින් මුදල් ප්‍රතිනිෂ්පාදනය පිළිබඳ ලැබෙන සියලුම අයදුම්පත් සමාලෝචනය කර එම අයදුම්පත මාර්ගෝපදේශයන්ට අනුකූල වීම සලකා බලා, අදාළ නිර්දේශයන් මුදල් මණ්ඩලයට ඉදිරිපත් කරනු ඇත. මුදල් මණ්ඩලය විසින් ව්‍යවහාර මුදල් අධිකාරීගේ නිර්දේශ සලකා බැලීමෙන් අනතුරුව ප්‍රතිනිෂ්පාදනය සඳහා ඉල්ලීම කරන ලද අරමුණ වෙනුවෙන් අනුමැතිය ලබා දේ. අනුමැතිය හිමිවන උපරිම කාලය අයදුම්පතේ සඳහන් කර ඇති අරමුණ මත රඳා පවතී. ඒවා පහත පරිදි වේ.

i. **අධ්‍යාපනික අරමුණු** - අධ්‍යාපනික පෙළපොත් සම්බන්ධයෙන් ගත් කල, ලබා දී ඇති අනුමැතිය වලංගු වන්නේ පෙළපොත් නැවත මුද්‍රණය වන තෙක් වන අතර අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් පෙළපොත් සඳහා, විෂය නිර්දේශයේ වෙනසක් හේතුවෙන් පෙළපොත වෙනස් වන තෙක් ලබා දී ඇති අනුමැතිය වලංගු වේ. විදේශ මහ බැංකු සහ මූල්‍ය බලධාරීන්ට ඔවුන්ගේ මුදල් කෞතුකාගාරවල ප්‍රදර්ශනය කිරීම සඳහා එක් වරක් අනුමැතිය ලබා දෙන අතර අනෙකුත් අයදුම්කරුවන්ට වසර හතරක් (04) දක්වා අනුමැතිය ලබා දේ.

ii. **වාණිජ අරමුණු** - අනුමැතිය සඳහා උපරිම කාලය වසරකි.

iii. **වෙනත් අරමුණු** - අනුමැතිය සඳහා උපරිම කාලය වසර දෙකකි.

4.3 මුදල් ප්‍රතිනිෂ්පාදනය සඳහා වන ඉල්ලීමක් නියමිත මාර්ගෝපදේශවලට අනුකූල නොවන බවට ව්‍යවහාර මුදල් අධිකාරි හට හැඟී යන්නේ නම්, එවැනි ඉල්ලීමක් ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව අධීක්ෂණය කරනු ලබන නියෝජ්‍ය අධිපතිතුමාගේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු ප්‍රතික්ෂේප කළ හැකිය. ව්‍යවහාර මුදල් අධිකාරීගේ තීරණය පිළිබඳව අයදුම්කරු සෑහීමකට පත් නොවන්නේ නම්, ඔහුට / ඇයට එම තීරණයට එරෙහිව මාසයක් ඇතුළත මුදල් මණ්ඩලය වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය. එවැනි අභියාචනයන් මුදල් මණ්ඩලය විසින් සලකා බලනු ලබන අතර ඒ සම්බන්ධව මුදල් මණ්ඩලයේ තීරණය පිළිබඳව අයදුම්කරුට දන්වනු ලැබේ.

4.4 අනුමැතියේ වලංගු කාල සීමාව දීර්ඝ කිරීම සඳහා ලිඛිත ඉල්ලුම් පත්‍රයක් එම අනුමැතිය අවසන් වීමට මසකට පෙර ව්‍යවහාර මුදල් අධිකාරී වෙත ඉදිරිපත් කළ යුතුය.

4.5 ඕනෑම යෝජිත ප්‍රතිනිෂ්පාදනයක් මාර්ගෝපදේශවලට අනුකූල නොවන්නේ නම්, අයදුම්කරුට එහි අදාළ වෙනස්කම් සිදුකර අනුමැතිය සඳහා ඔහුගේ අයදුම්පත නැවත ඉදිරිපත් කිරීමට හෝ එසේ නොමැතිනම් මුදල් නෝට්ටු ප්‍රතිනිෂ්පාදනය කිරීමෙන් වැළකී සිටීමට සිදු වේ.

5. පොදු නිදහස් කිරීම්

5.1 පහත දැක්වෙන ආකාරයේ ව්‍යවහාර මුදල් ප්‍රතිනිෂ්පාදනයන් 2 (i) වන වගන්තියේ දක්වා ඇති ප්‍රතිනිෂ්පාදනය අර්ථ දැක්වීමට අයත් නොවේ. මෙහිදී ප්‍රතිනිෂ්පාදනයන්,

අ) මුදල් නෝට්ටුවේ සුළු කොටසක් (25% ට වඩා අඩු) පමණක් ලෙස

ආ) කළු සුදු වර්ණවලින් පමණක් සමන්විත වන ලෙස හෝ

ඇ) ඉහත 5.1 (අ) ට යටත්ව මුද්‍රිත හෝ විද්‍යුත් මාධ්‍යවල ව්‍යවහාර මුදල් භාවිතා කිරීමේ අභිනයන් මඟින් සිදුකරයි නම්, ඔවුන් මුදල් මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමෙන් නිදහස් වේ.

5.2 ඉහත 5.1 හි (අ) සිට (ඇ) දක්වා ඇති ව්‍යතිරේකයන්ට අයත් මුදල් නෝට්ටුවක් ප්‍රතිනිෂ්පාදනය කිරීමට අදහස් කරන පුද්ගලයින්, යෝජිත ප්‍රතිනිෂ්පාදනයේ අනුපිටපතක් සහිතව එවැනි ප්‍රතිනිෂ්පාදනයට මසකට පෙර ව්‍යවහාර මුදල් අධිකාරී වෙත දැනුම් දිය යුතුය. ව්‍යවහාර මුදල් අධිකාරී, එවැනි තොරතුරු සලකා බැලීමෙන් පසු, එවැනි ප්‍රතිනිෂ්පාදනයක් සඳහා විරෝධයක් නොමැති බවට ලිපියක් මඟින් දැනුම්දීම හෝ අදාළ මාර්ගෝපදේශයන්ට අනුකූලව මුදල් නෝට්ටු ප්‍රතිනිෂ්පාදනය සඳහා ඉල්ලුම්කරු විසින් නව අයදුම්පතක් ඉදිරිපත් කිරීම සිදු කළ යුතු බව දන්වනු ලැබේ.

5.3 5.2 වගන්තිය යටතේ ව්‍යවහාර මුදල් ප්‍රතිනිෂ්පාදනය සඳහා ව්‍යවහාර මුදල් අධිකාරී විසින් නිකුත් කරන ලද විරෝධතාවක් නොමැති බව දැනුම්දෙන ලිපිය වලංගු වන්නේ එම නිශ්චිත අරමුණ සහ නිශ්චිත කාල සීමාව සඳහා පමණි. වලංගු කාලය කල් ඉකුත්වීමට දින 14 කට පෙර එම කාලය දීර්ඝ කිරීම සඳහා ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කළ යුතුය.

6. අනුකූල නොවන අවස්ථා

6.1 මාර්ගෝපදේශ වල දක්වා ඇති කොන්දේසි සහ ක්‍රියා පටිපාටි වලට අනුගත වීමට අපොහොසත් වීම මුදල් නීති පනතෙහි 58 (ඇ) වගන්තිය සහ දණ්ඩනීති සංග්‍රහයේ 478 (අ) (1), 478 (ආ), 478 (ඇ) හෝ 478 (ඇ) වගන්ති ප්‍රකාරව අවුරුදු විස්ස දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක, බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතුය (ඇමුණුම (ආ)).

6.2 තවද, එම ප්‍රතිනිෂ්පාදනය හෝ එහි ඕනෑම පිටපතක් හෝ එවැනි ප්‍රතිනිෂ්පාදනයකට සම්බන්ධ ඕනෑම ආකාරයක වෙනත් අයිතමයක් මුදල් මණ්ඩලය විසින් තම අභිමතය පරිදි වහාම විනාශ කිරීමට කටයුතු කළ හැකිය. එවැනි අවස්ථාවකදී, අදාළ ප්‍රතිනිෂ්පාදනයන් විනාශ කළබව සනාථ කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත දිවුරුම් ප්‍රකාශයක් ලබා දිය යුතුවේ.

ඇමුණුම (අ)

අයදුම්කරුගේ තොරතුරු		
1	නම	
2	ජාතික හැඳුනුම්පත් / විදේශ ගමන් බලපත්‍ර අංකය	
3	තනතුර	
4	ආයතනයේ නම හා ලිපිනය	
5	ව්‍යාපාරයේ ලියාපදිංචි අංකය (එහි පිටපතක් ඇමිණිය යුතුයි)	
6	ඊ මේල්	වෙබ් ලිපිනය
7	දුරකථන අංක (ස්ථාවර හා ජංගම)	

ප්‍රතිනිෂ්පාදනය හා සම්බන්ධ තොරතුරු		
8	ප්‍රතිනිෂ්පාදනයට බලාපොරොත්තුවන මුදල් කාණ්ඩ/ය	
9	ප්‍රතිනිෂ්පාදනයේ ස්වභාවය (අදාළ තැන් පමණක් සම්පූර්ණ කරන්න)	
	අ	අමුද්‍රව්‍ය (කඩදාසියේ පිරිවිතර)
	ආ	යොදාගන්නා මාධ්‍ය (මුද්‍රිත මාධ්‍ය, සමාජ මාධ්‍ය, රූපවාහිනී, වෙබ්අඩවි ....)
	ඇ	පිටපත් ප්‍රමාණය (එක් එක් මුදල් නාමිකයට වෙන වෙනම - අදාළ වේ නම්)
10	ප්‍රතිනිෂ්පාදනයෙහි "SPECIMEN" යන වචනය බැහැර කිරීමට අනුමැතිය ඉල්ලා සිටීද (මාර්ගෝපදේශ අංක 3.4 අනුව)	

අයදුම්කරුගේ ප්‍රකාශය		
11		
	අ	ව්‍යවහාර මුදල් නෝට්ටු ප්‍රතිනිෂ්පාදනය සම්බන්ධව මාගේ වගකීම් සම්බන්ධයෙන් දැනුවත්භාවයෙන් හා අවබෝධයෙන් සිටිමි.
	ආ	ව්‍යාජ මුදල් නෝට්ටු සැකසීමට අදාල වන වැරදි සම්බන්ධව මුදල් නීති පනතේ සහ දණ්ඩ නීති සංග්‍රහයේ පවතින විධිවිධාන පිළිබඳ දැනුවත්භාවයෙන් සිටිමි (ඇමුණුම (ආ)).
	ඇ	සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි වන බවත් යෝජිත ප්‍රතිනිෂ්පාදනය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශයන්ට අනුකූල වන බවත් ප්‍රකාශකර සිටිමි.
	ඈ	මුදල් ප්‍රතිනිෂ්පාදනය සඳහා අවසරය ලබාදීම හෝ ප්‍රතික්ෂේප කිරීම ශ්‍රී ලංකා මහ බැංකුවේ අභිමතය පරිදි සිදුවන බවත් මාර්ගෝපදේශයන්ට අනුකූල වීම අවසර ලබා දීමේ සහතිකයක් නොවන බවටත් දැනුවත්භාවයෙන් සිටිමි.
	ඉ	ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඕනෑම අවස්ථාවක පූර්ව දැනුම්දීමකින් තොරව පෙර ලබාදුන් අනුමැතියක් සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම කළ හැකි අතර මාර්ගෝපදේශ සංශෝධනය කිරීමට ද හැකි බව දනිමි.

....

දිනය අයදුම්කරුගේ අත්සන / රබර් මුද්‍රාව

(දිනය) සිට ආරම්භ වන (කාල සීමාව) සඳහා මුදල් නෝට්ටු ප්‍රතිනිෂ්පාදනය සඳහා අනුමැතිය ලබා දීමේ පිරික්සුම් ලැයිස්තුව

අවශ්‍යතාවය		අනුකූල වේ	අනුකූල නොවේ	වෙනත් සටහන්
අරමුණ	අධ්‍යාපනික			
	වාණිජ			
	වෙනත්			
කොන්දේසි	ප්‍රමාණය			
	අමුද්‍රව්‍ය / උපස්තරය			
	“SPECIMEN” වචනය ඇතුලත් කිරීම			
	ප්‍රතිනිෂ්පාදනය කළු සහ සුදු වර්ණයෙන් පැවතීම			
	“මෙම ප්‍රතිනිෂ්පාදනය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කර ඇත” යන වචන ඇතුලත් කිරීම			
	එක් පැත්තක් පමණක් මුද්‍රණය කිරීම			
	අත්සන් මකා දැමීම			
	විකෘති කර නොමැති වීම			

.....

බලයලත් නිලධාරීයාගේ නම අත්සන හා නිල මුද්‍රාව

අයදුම්පත සමග පහත ලියකියවිලි අමුණා එවන්න.

1. යෝජිත ශ්‍රී ලංකා ව්‍යවහාර මුදල් ප්‍රතිනිෂ්පාදනයේ ස්වභාවය අනුව දෘඩ හෝ මෘදු පිටපතක්
2. ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ සහතික කළ පිටපතක් (අදාළ වේ නම්)

ඇමුණුම (ආ)

මුදල් නෝට්ටු ප්‍රතිනිෂ්පාදනය හා සම්බන්ධ නෛතික විධිවිධාන

(අ) මුදල් නීති පනතේ 58 (ඇ) වගන්ති ප්‍රකාරව, "ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ අනුමැතියකින් තොරව, ඕනෑම මුදල් නෝට්ටුවක් ඕනෑම ස්වරූපයකින් ප්‍රතිනිෂ්පාදනය හෝ සමරූපී පිටපතක් නිෂ්පාදනය කරනු ලබන ඕනෑම පුද්ගලයෙකු දඬුවම් ලැබිය හැකි වරදකරුවෙක් වේ".

(ආ) දණ්ඩ නීති සංග්‍රහයේ 478 (අ) සිට 478 (ඇ) දක්වා වගන්ති ප්‍රකාරව:

478 (අ.) (1) යම් මුදල් නෝට්ටුවක් හෝ බැංකු නෝට්ටුවක් කුට ලෙස සාදන හෝ කුට ලෙස තනන හෝ කුට ලෙස තැනීමේ හෝ සෑදීමේ වැඩෙහි යම් කොටසක් දැන දැනම ඉෂ්ට කරන තැනැත්තකුට අවුරුදු විස්ස දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක, බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතුය.

478 (ආ.) කුට ලෙස තනනු ලැබූ හෝ සාදනු ලැබූ මුදල් නෝට්ටුවක් හෝ බැංකු නෝට්ටුවක් කුට ලෙස තනනු ලැබූ හෝ සාදනු ලැබූ බව දනිමින් හෝ විශ්වාස කිරීමට කරුණු තිබිය දී යමකු එකී කුට ලෙස තනනු ලැබූ හෝ සාදනු ලැබූ මුදල් නෝට්ටුවක් හෝ බැංකු නෝට්ටුවක් වෙනත් තැනැත්තකුට විකුණුවහොත්, වෙනත් තැනැත්තකුගෙන් මිලයට ගතහොත් හෝ ලබා ගතහොත් හෝ වෙනත් ලෙස අලෙවි කරතහොත් හෝ සත්‍ය වූවක් ලෙස පාවිච්චි කරතහොත් ඔහුට අවුරුදු විස්ස දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතුය. ඔහු දඩයකට ද යටත් විය යුතුය.

478 (ඇ.) කුට ලෙස තනනු ලැබූ හෝ සාදනු ලැබූ මුදල් දනිමින් හෝ විශ්වාස කිරීමට කරුණු තිබිය දී සත්‍ය වූවක් ලෙස පාවිච්චි කිරීමේ අදහසින් හෝ සත්‍ය වූවක් ලෙස පාවිච්චි කළ හැකි වන ලෙස යම් කුට ලෙස තනනු ලැබූ හෝ සාදනු ලැබූ මුදල් නෝට්ටුවක් හෝ බැංකු නෝට්ටුවක් ස්වාමිත්වයෙහි තබා ගන්නා වූ තැනැත්තකුට අවුරුදු විස්ස දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතුය.

478 (ඈ.) යම් මුදල් නෝට්ටුවක් හෝ බැංකු නෝට්ටුවක් කුට ලෙස තැනීමට හෝ සෑදීමට පාවිච්චි කිරීමේ කාර්යය සඳහා හෝ පාවිච්චි කිරීමට අදහස් කරනු ලැබූ බව දනිමින් හෝ විශ්වාස කිරීමට කරුණු තිබිය දී යම් යන්ත්‍රෝපකරණයක්, උපකරණයක් හෝ ද්‍රව්‍යයක් සාදන්නා වූ හෝ සෑදීමේ වැඩක යම් කොටසක් ඉෂ්ට කරන්නා වූ හෝ මිලයට ගන්නා වූ හෝ විකුණන්නා වූ හෝ අලෙවි කරන්නා වූ හෝ ස්වාමිත්වයෙහි තබා ගන්නා වූ තැනැත්තකුට අවුරුදු විස්ස දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතුය. ඔහු දඩයකට ද යටත් විය යුතුය.

චක්‍රලේඛ අංක : 2021 අංක 1 2021 මැයි 21

සියලුම සහභාගීත්ව ආයතන වෙත,

වෙළඳපොළ මෙහෙයුම් කටයුතු සඳහා වන ඒකාබද්ධ මෙහෙයුම් උපදෙස්

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2016 ඔක්තෝබර් 31 දක්වා විවට වෙළඳපොළ කටයුතු සහ නිත්‍ය පහසුකම් සම්බන්ධයෙන් සහභාගීත්ව ආයතන වෙත නිකුත් කරන ලද සියලුම මෙහෙයුම් උපදෙස්/චක්‍රලේඛ ඇතුළත් කරමින්, 2016 නොවැම්බර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි නිකුත් කරන ලද වෙළඳපොළ මෙහෙයුම් කටයුතු සඳහා වන ඒකාබද්ධ මෙහෙයුම් උපදෙස් අංක 35/03/016/007/001 හා සම්බන්ධවයි.

විවට වෙළඳපොළ කටයුතු සහ නිත්‍ය පහසුකම සම්බන්ධයෙන් මේ දක්වා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වරින් වර නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස්/චක්‍රලේඛ ඒකාබද්ධ කරමින් ''වෙළඳපොළ මෙහෙයුම් කටයුතු සඳහා වන ඒකාබද්ධ මෙහෙයුම් උපදෙස්'' චක්‍රලේඛනය සංශෝධනය හා යාවත්කාලීන කර ඇත.

ඒ අනුව, සියලුම සහභාගීත්ව ආයතන 2021 ජූනි 01 දින සිට බලපැවැත්වෙන පරිදි යාවත්කාලීන කරන ලද වෙළඳපොළ මෙහෙයුම් කටයුතු සඳහා වන ඒකාබද්ධ මෙහෙයුම් උපදෙස් (චක්‍රලේඛ අංක 2021 අංක 01) සඳහා අනුකූල වීම මෙමඟින් අවශ්‍ය වේ.

අධ්‍යක්ෂ
දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව

චක්‍රලේඛ අංක : 2021 අංක 01 ඇමුණුම I

වෙළඳපොළ මෙහෙයුම් කටයුතු සඳහා වන ඒකාබද්ධ මෙහෙයුම් උපදෙස්

1.0 2016 ඔක්තෝබර් 31 දක්වා විවට වෙළඳපොළ කටයුතු සහ නිත්‍ය පහසුකම සම්බන්ධයෙන් සහභාගිත්ව ආයතන වෙත නිකුත් කරන ලද සියලුම මෙහෙයුම් උපදෙස්/චක්‍රලේඛන ඇතුළත් කරමින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2016 නොවැම්බර් 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි "වෙළඳපොළ මෙහෙයුම් කටයුතු සඳහා වන ඒකාබද්ධ මෙහෙයුම් උපදෙස් චක්‍රලේඛනය" නිකුත් කරන ලදී. සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු, බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් (බලපත්‍රලාභී වාණිජ බැංකු හැර ප්‍රාථමික අලෙවිකරුවන් ලෙස පත්කරන ලද සමාගම්) සහ සේවක අර්ථසාධක අරමුදල සහභාගිත්ව ආයතන ලෙස හඳුන්වනු ලැබේ.

2.0 විවට වෙළඳපොළ කටයුතු සහ නිත්‍ය පහසුකම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2021 මැයි මස 20 දක්වා නිකුත් කරන ලද පහත සඳහන් මෙහෙයුම් උපදෙස්/චක්‍රලේඛන (වගන්ති අංක 3.0 පරිදි) ඒකාබද්ධ කරමින් "වෙළඳපොළ මෙහෙයුම් කටයුතු සඳහා වන ඒකාබද්ධ මෙහෙයුම් උපදෙස් චක්‍රලේඛනය" සංශෝධනය කර ඇත. ඒ අනුව, පහත දක්වා ඇති මෙහෙයුම් උපදෙස්/චක්‍රලේඛ ඉවත් කරනු ලබන අතර, 2021 ජුනි 01 දින සිට වෙළඳපොළ මෙහෙයුම් කටයුතු සඳහා වන නව ඒකාබද්ධ මෙහෙයුම් උපදෙස් බලපැවැත්වෙනු ඇත.

3.0 ඒකාබද්ධ කරන ලද චක්‍රලේඛන

	චක්‍රලේඛ අංකය	නිකුත් කරන ලද දිනය	මාතෘකාව
1	35/03/016/007/001	2016 නොවැම්බර් 01	වෙළඳපොළ මෙහෙයුම් කටයුතු මත වන ඒකාබද්ධ මෙහෙයුම් උපදෙස්
2	35/03/021/0013/001	2018 අගෝස්තු 23	ශ්‍රී ලංකා මහ බැංකුවේ විවට වෙළඳපොළ කටයුතු
3	35/03/016/007/002	2019 පෙබරවාරි 14	වෙළඳපොළ මෙහෙයුම් කටයුතු මත වන ඒකාබද්ධ මෙහෙයුම් උපදෙස්
4	35/03/016/007/003	2019 සැප්තැම්බර් 05	විවට වෙළඳපොළ කටයුතු සඳහා වන සංශෝධිත කාලසටහන
5	35/03/016/007/004	2019 සැප්තැම්බර් 05	විවට වෙළඳපොළ කටයුතු යටතේ වන ස්ථිර පදනම මත වෙන්දේසි
6	35/03/021/0013/002	2019 සැප්තැම්බර් 05	විවට වෙළඳපොළ කටයුතු යටතේ බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් හට ද්‍රවශීලතා ආධාරක පහසුකම සැපයීම සඳහා වන මෙහෙයුම් උපදෙස්
7	35/03/021/0013/003	2019 සැප්තැම්බර් 05	ශ්‍රී ලංකා මහ බැංකුවේ විවට වෙළඳපොළ කටයුතු
8	35/03/016/007/005	2020 පෙබරවාරි 11	විවට වෙළඳපොළ කටයුතු යටතේ වන ස්ථිර පදනම මත වෙන්දේසි
9	35/03/016/007/006	2020 ජුනි 29	විවට වෙළඳපොළ කටයුතු යටතේ නිත්‍ය පහසුකම සඳහා පවතින පද්ධතිය තුළ හඳුන්වා දෙන ලද නවීකරණ

I වන කොටස : හැඳින්වීම

4.0 ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පොලී අනුපාතික කොරිඩෝව (Standing Rate Corridor), එනම් නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝව තුළ බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය (AWCMR) ස්ථායීව පවත්වා ගැනීම සඳහා සහභාගිත්ව ආයතන සමඟ විවට වෙළඳපොළ කටයුතු පවත්වනු ලබයි. කෙසේ වෙතත්, විවට වෙළඳපොළ කටයුතු යටතේ බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා පමණක් ප්‍රතිවිකුණුම් වෙන්දේසි පවත්වනු ලබන අතර, බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් සඳහා ද්‍රවශීලතා ආධාරක පහසුකම යටතේ ප්‍රතිවිකුණුම් වෙන්දේසි පවත්වනු ලැබේ. නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝවේ පහළ සීමාව සහ ඉහළ සීමාව පිළිවෙලින් නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය ලෙස හැඳින්වේ. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝව වසරකට අට වතාවක් විවරණය කරනු ලබන අතර, අවශ්‍ය සංශෝධන සිදු කරනු ලබයි.

5.0 මුදල් වෙළඳපොළ දෛනික හා කෙටිකාලීන ද්‍රවශීලතා ඇස්තමේන්තු, වෙළඳපොළ වර්ධනයන් සහ ප්‍රතිපත්ති වාතාවරණය පදනම් කරගෙන, ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙළඳපොළ මෙහෙයුම් කමිටුව විසින් වෙළඳපොළට ද්‍රවශීලතාව ලබාදිය යුතු ද, වෙළඳපොළෙන් ද්‍රවශීලතාව අවශෝෂණය කළ යුතු ද යන්න සහ එසේ සිදු කරයි නම් භාවිතා කළ යුතු උපකරණ වර්ගය, ප්‍රමාණය සහ පරිණත කාලය තීරණය කරනු ලබයි.

6.0 (i) එක් එක් කාණ්ඩය යටතේ දක්වා ඇති පරිදි විවට වෙළඳපොළ කටයුතු අනුව සහභාගිත්ව ආයතනවලට පහත සඳහන් උපකරණ සඳහා ප්‍රවේශය හිමි වේ.

අ. කෙටිකාලීන වෙන්දේසි
- අ. කෙටිකාලීන ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසි
- ආ. කෙටිකාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි

ආ. දිගුකාලීන වෙන්දේසි
- අ. දිගුකාලීන ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසි
- ආ. දිගුකාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි

ඇ. ද්‍රවශීලතා ආධාරක පහසුකම
- අ. කෙටිකාලීන ද්‍රවශීලතා ආධාරක පහසුකම
- ආ. දිගුකාලීන ද්‍රවශීලතා ආධාරක පහසුකම

ඈ. ස්ථිර පදනමක් මත වූ වෙන්දේසි
- අ. ස්ථිර පදනමක් මත සුරැකුම්පත් අලෙවි කිරීමේ වෙන්දේසි
- ආ. ස්ථිර පදනමක් මත සුරැකුම්පත් මිලදී ගැනීමේ වෙන්දේසි

ඉ. ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් හා සම්බන්ධ ගනුදෙනු
- අ. වෙන්දේසි ක්‍රමය යටතේ ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් නිකුත් කිරීම
- ආ. වෙන්දේසි ක්‍රමය යටතේ මහ බැංකු සුරැකුම්පත් විශ්‍රාම ගැන්වීම
- ඇ. ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් නැවත මිලදීගැනීමේ (Buy-back) පහසුකම

ඊ. විදේශ විනිමය හුවමාරු ගනුදෙනු
- අ. ගැනුම්විකුණුම් විදේශ විනිමය හුවමාරු ගිවිසුම්
- ආ. විකුණුම්ගැනුම් විදේශ විනිමය හුවමාරු ගිවිසුම්

(ii) නිත්‍ය පහසුකම් යටතේ සහභාගිත්ව ආයතනවලට පහත සඳහන් උපකරණ සඳහා ප්‍රවේශය හිමි වේ.
- අ. නිත්‍ය තැන්පතු පහසුකම
- ආ. නිත්‍ය ණය පහසුකම

2 වන කොටස : සහභාගිත්ව ආයතන සඳහා පොදු උපදෙස්

7.0 ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වෙළඳපොළ මෙහෙයුම් කමිටුවේ තීරණය විද්‍යුත් ලංසු තැබීමේ පද්ධතිය (OEBS) සහ මධ්‍යම ඒකාබද්ධ වෙළඳපොළ නිරීක්ෂණ පද්ධතිය (CIMM) භාවිතා කොට වෙළඳපොළට නිවේදනය කරනු ලබයි. නිත්‍ය පහසුකම හැර අනෙකුත් පහසුකම් ලබාදීමේ දී විවට වෙළඳපොළ කටයුතු පැවැත්වීම සඳහා වෙන්දේසි ක්‍රමය භාවිතා කරනු ලැබේ. පහත ඡේදයෙහි සඳහන් අවස්ථාවක හැර අනෙකුත් සෑම අවස්ථාවන්හිදී සහභාගිත්ව ආයතනවලට තම ගනුදෙනු/ලංසු විද්‍යුත් ලංසු තැබීමේ ක්‍රමය හරහා ඉදිරිපත් කළ හැක.

8.0 යම්කිසි සහභාගිත්ව ආයතනයක්හට කාර්මික දෝෂයක් හේතුවෙන් විද්‍යුත් ලංසු තැබීමේ පද්ධතියට ප්‍රවේශ විය නොහැකි අවස්ථාවකදී ලංසුවට අදාළව ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන විස්තර දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ විවට වෙළඳපොළ කටයුතු අංශයට දුරකථන මාර්ගයෙන් එම අදාළ වෙන්දේසිය පැවැත්වෙන කාලසීමාව තුළ දී හෝ නිත්‍ය පහසුකමක් නම් එය නිම වීමට බලාපොරොත්තු වන කාලසීමාවට පෙර, අදාළ පරිදි දැනුම් දිය යුතුය. එසේ දුරකථන මාර්ගයෙන් ඉදිරිපත් කරන ලංසු, වෙන්දේසීන් හෝ නිත්‍ය පහසුකම් යටතේ වන වටිනාකම අදාළ කාලසීමාව නිමාවී විනාඩි 15 ක් ඇතුළත බලයලත් නිලධාරීන් දෙදෙනෙකුගේ අත්සන සහ කාර්මික දෝෂයේ ස්වභාවය විස්තර සහිතව දක්වමින් ෆැක්ස් හෝ විද්‍යුත් තැපෑල මඟින් දැනුම් දිය යුතුය. දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව එම ගනුදෙනුව පද්ධතියට ඇතුළත් කිරීම සඳහා අදාළ සියලුම තොරතුරු එවැනි ගනුදෙනුවක/ලංසුවක ඇතුළත් විය යුතුය. සහභාගිත්ව ආයතනය විසින් ලබාදෙන ලද තොරතුරු මත පදනම්ව එවැනි ගනුදෙනුවක්/ලංසුවක් එම ආයතනය වෙනුවෙන් අදාළ පද්ධතියට ඇතුළත් කිරීම සඳහා කරන ලද ඉල්ලීමක් ලෙස එම නිවේදනය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සලකා බලනු ඇත. දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන ලද වැරදි හෝ අසම්පූර්ණ තොරතුරු හේතුවෙන්, ශ්‍රී ලංකා මහ බැංකුවට අදාළ අයැදීම ප්‍රතික්ෂේප කළ හැක. ඉහත සඳහන් කාලසීමාවට පසු ඉදිරිපත් කෙරෙන (ෆැක්ස් හෝ විද්‍යුත් තැපෑල මාර්ගයෙන්) කිසිදු ලංසුවක් භාරගනු නොලැබේ. එම පණිවිඩයේ මුල් පිටපත එදිනම, දිනයේ ව්‍යාපාරික කටයුතු අවසන් වීමට ප්‍රථම ශ්‍රී ලංකා මහ බැංකුවේ දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත ලැබීමට සැලැස්විය යුතුය.

9.0 මෙම ඒකාබද්ධ මෙහෙයුම් උපදෙස්හි කාණ්ඩ 4, 5 සහ 6 විධිවිධාන යටතේ, සහභාගිත්ව ආයතනයක් ශ්‍රී ලංකා මහ බැංකුව සමග ප්‍රතිමිලදීගැනුම් සහ ප්‍රතිවිකුණුම් ගනුදෙනු සඳහා සහභාගි වීම, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය සමග සහභාගිත්ව ආයතන එළඹී ඇති ප්‍රතිමිලදීගැනුම් සහ ප්‍රතිවිකුණුම් සඳහා වන ප්‍රධාන ගිවිසුම්හි සඳහන් වන කොන්දේසීන්ට යටත් වනු ඇත. ප්‍රතිමිලදීගැනුම් සහ ප්‍රතිවිකුණුම් සඳහා වන ප්‍රධාන ගිවිසුම්හි සඳහන් කොන්දේසි, මෙම මෙහෙයුම් උපදෙස්හි සඳහන් කොන්දේසිවලට සමාන වේ.

10.0 මෙම ඒකාබද්ධ මෙහෙයුම් උපදෙස් කාණ්ඩ 3 විධිවිධාන යටතේ සහභාගිත්ව ආයතනයක්, ශ්‍රී ලංකා මහ බැංකුව සමග කෙරෙන නිත්‍ය තැන්පතු පහසුකම් සහ නිත්‍ය ණය පහසුකම් ගනුදෙනු ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය සමඟ සහභාගිත්ව ආයතන එළඹ ඇති නිත්‍ය පහසුකම සඳහා වන ප්‍රධාන ගිවිසුමෙහි කොන්දේසිවලට යටත් වේ. නිත්‍ය පහසුකම සඳහා වන ප්‍රධාන ගිවිසුමෙහි සඳහන් වන කොන්දේසි මෙම මෙහෙයුම් උපදෙස්වල එපරිදිම වේ.

11.0 සහභාගිත්ව ආයතනවලට පෙර දැනුම්දීමකින් අනතුරුව, මෙම ඒකාබද්ධ මෙහෙයුම් උපදෙස්හි කිසියම් නියමයක් සහ හෝ කොටසක් වෙනස් කිරීමේ, අලුත් කිරීමේ හෝ සංශෝධනය කිරීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතුව ඇත.

12.0 ප්‍රතිමිලදීගැනුම් හා ප්‍රතිවිකුණුම් සඳහා වන ප්‍රධාන ගිවිසුම හා/හෝ ප්‍රධාන නිත්‍ය පහසුකම් ගිවිසුම සමග මෙම ඒකාබද්ධ මෙහෙයුම් උපදෙස් අතර යම් පරස්පර බවක් හෝ නොගැලපීමක් පවතින විට මෙම ඒකාබද්ධ මෙහෙයුම් උපදෙස් බලපැවැත්වෙනු ඇත.

13.0 ඉදිරිපත් කරන මිල ගණන් අවමය රුපියල් මිලියනයක් (රු.1,000,000.00) විය යුතු අතර, එම මිල ගණන් රුපියල් මිලියනෙහි ගුණාකාර විය යුතුය.

14.0 විද්‍යුත් ලංසු තැබීමේ පද්ධතියේ යම් කාර්මික දෝෂයක් නිසා කිසියම් ආයතනයකට මින් මතුව විස්තර කෙරෙන ගනුදෙනුවලට අදාළව තහවුරු කිරීමේ පිටපතක්/පිටපත් ලබාගත නොහැකි වූ විටක දී ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් සහභාගිත්ව ආයතනයේ ඉල්ලීම පරිදි පිටපතක්/පිටපත් ෆැක්ස් කරනු ලැබේ.

15.0 යම් ගනුදෙනුවක්/ලංසුවක් වෙන්දේසියට ඉදිරිපත් කරන විට, එම ගනුදෙනුව/ලංසුවට අදාළව ශ්‍රී ලංකා මහ බැංකුවට පවරා ගනු ලබන සුරැකුම්පතෙහි මුහුණත අගය, එම සුරැකුම්පතට අදාළව ශ්‍රී ලංකා මහ බැංකුවේ නිල ගැනුම් මිල පදනම් කොටගෙන පද්ධතිය විසින් ස්වයංක්‍රීයව ගණනය කරනු ලබයි. මෙම නිල මිල ගණන් ලංකාසෙක්‍යු (LankaSecure) පද්ධතියේ සටහන්ව ඇති අතර විද්‍යුත් ලංසු තැබීමේ පද්ධතියෙන් ද ලබාගත හැක.

16.0 සහභාගිත්ව ආයතනයකට යම් ගනුදෙනුවක්/ලංසුවක් සඳහා ජාත්‍යන්තර සුරැකුම්පත් හඳුනා ගැනීමේ අංක සහිත සුරැකුම්පත් (ISIN) ඕනෑම සංඛ්‍යාවක් යොදා ගත හැකිය. නිත්‍ය ණය පහසුකම් ගනුදෙනුවකට හෝ ප්‍රතිවිකුණුම් ලංසුවකට, එකට වඩා වැඩි ජාත්‍යන්තර සුරැකුම්පත් හඳුනා ගැනීමේ අංක සහිත සුරැකුම්පත් සංඛ්‍යාවක් පවරා ඇත්නම් අවසාන පියවීමේ කටයුතුවලදී එකී සුරැකුම්පත් වෙනම ගනුදෙනුවක්/ලංසුවක් ලෙස සැලකේ.

17.0 අලාභ ප්‍රතිපූර්ණය

අ. සහභාගිත්ව ආයතනයක් ගනුදෙනුව පියවීම් දිනයේදී ලංසුවක්/ගනුදෙනුවක් සම්පූර්ණ කිරීමට අසමත් වීම.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සහභාගිත්ව ආයතනයක ගනුදෙනුවක්/ලංසුවක් භාරගත් පසු, එම ගනුදෙනුව සම්පූර්ණ කිරීමට සහභාගිත්ව ආයතනය බැඳී සිටියි. යම් ලෙසකින් අදාළ සහභාගිත්ව ආයතනය ගනුදෙනුව පියවීම් දිනයේ ලංකාසෙක්‍යුහි ව්‍යාපාරික කටයුතු අවසන් වීමට ප්‍රථම, පියවීම් ගිණුමේ හෝ සහභාගිත්ව ආයතනය ස්වකීය ගිණුමේ (own account) ප්‍රමාණවත් අරමුදල් හෝ ප්‍රමාණවත් සුරැකුම්පත් තැබීමට අසමත් වුවහොත්, අදාළ ගනුදෙනුවෙහි පොලී ආන්තිකය හානි පූර්ණයක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවට ගෙවිය යුතුය. මෙම හානිය පූර්ණය සඳහා වූ මුදල, ගනුදෙනු පියවීම් දිනට පසුව එළඹෙන ප්‍රථම ව්‍යාපාරික දිනයේ දී අදාළ සහභාගිත්ව ආයතනයේ ශ්‍රී ලංකා මහ බැංකුවේ ඇති පියවීම් ගිණුමට හර කරනු ලැබේ.

ආ. සහභාගිත්ව ආයතනයක් ගනුදෙනුව කල්පිරෙන දිනයේ දී එය පියවීම පැහැර හැරීම.

යම්කිසි සහභාගිත්ව ආයතනයක් ගනුදෙනුව කල්පිරෙන දිනයේදී (ආපසු ගෙවන දිනයේ දී) ලංකාසෙක්‍යු පද්ධතියෙහි ව්‍යාපාරික කටයුතු අවසන් වීමට ප්‍රථම, ආපසු විකුණුම් වටිනාකම (මිලදීගත් වටිනාකම සහ පොලී ආන්තිකය) ගෙවීම සඳහා ප්‍රමාණවත් අරමුදල් තම පියවීම් ගිණුමෙහි පවත්වා ගැනීමට අපොහොසත් වුවහොත් ආපසු විකුණුම් වටිනාකමට අමතරව ආදළ ගනුදෙනුවෙහි හානිය සඳහා වූ පොලී ප්‍රමාණය, හානි පූර්ණයක් ලෙස එක් දිනක් සඳහා ප්‍රතිශතාංක දහයෙන් එකකට (0.1%) සමාන වූ ගෙවීම් පැහැර හැරීම සඳහා වූ හානි පූර්ණයක්, ශ්‍රී ලංකා මහ බැංකුවට ගෙවීමට අදාළ සහභාගිත්ව ආයතනය බැඳී සිටී.

ඇ. ඉහත ආ තුළින් හට ගන්නා මුදල්, ගනුදෙනු පියවීමේ දිනයට පසුව එළඹෙන ප්‍රථම ව්‍යාපාරික දිනයේ දී ශ්‍රී ලංකා මහ බැංකුවේ ඇති අදාළ සහභාගිත්ව ආයතනයේ පියවීම් ගිණුමට හර කරනු ලැබේ.

ඈ. ලිත් වර්ෂයක් තුළ සහභාගිත්ව ආයතනයක් විසින් එක් වරකට වඩා ලංසුව/ගනුදෙනුව එකඟ වූ පරිදි සිදු නොකිරීම හෝ එම ගනුදෙනුව නිසි පරිදි පියවීම පැහැර හැරීම

18.0 සහභාගිත්ව ආයතනයකට වෙන්දේසියේ අදාළ කාලසීමාව නිම වූ පසු කිසිදු හේතුවක් මත, ඉදිරිපත් කරන ලද ලංසුවක් සංශෝධනය කළ නොහැක.

සහභාගිත්ව ආයතනයක් ලිත් වර්ෂයක් තුළ ලංසුව/ගනුදෙනුව එක් වරකට වඩා එකඟ වූ පරිදි සිදු නොකළ විට, එම සහභාගිත්ව ආයතනයට, ශ්‍රී ලංකා මහ බැංකුව සමග එවැනි ගනුදෙනු කිරීමට ලබාදී ඇති පහසුකම, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තීරණය කරනු ලබන කාලසීමාවක් සඳහා අහෝසි කළ හැකිය. සහභාගිත්ව ආයතනයක් විසින් ලිත් වර්ෂයක් තුළ තුන් වරකට වඩා ගනුදෙනු නිසි පරිදි පියවීම පැහැර හැරීම සිදු කළ හොත්, ගෙවීම් පැහැර හැරීමේ පොලී අනුපාතිකය, එක් දිනක් සඳහා ප්‍රතිශතාංක දහයේ දෙකක් (0.2%) දක්වා ඉහළ නැංවීම හෝ එකී සහභාගිත්ව ආයතනයට ශ්‍රී ලංකා මහ බැංකුව සමග එවැනි ගනුදෙනු කිරීමට ලබාදී ඇති පහසුකම, මහ බැංකුව විසින් තීරණය කරනු ලබන කාලසීමාවක් සඳහා අහෝසි කිරීමට කටයුතු කළ හැකිය.

19.0 ශ්‍රී ලංකා මහ බැංකුව සාමාන්‍යයෙන් පවත්වන වෙන්දේසිවලට අමතරව, අවශ්‍ය යැයි හැඟී යන්නේ නම් එකම දිනය තුළ දී අතිරේක වෙන්දේසි පැවැත්විය හැක.

20.0 සහභාගිත්ව ආයතනයක, ඕනෑම ලංසුවක්/ගනුදෙනුවක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ පූර්ණ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතු වේ.

21.0 ශ්‍රී ලංකා මහ බැංකුව විසින් භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කරවල නිල ගැනුම් සහ විකුණුම් මිල ගණන්, වර්තමාන වෙළඳපොළ මිල ගණන් හා එහි වෙනස්වීම් මත පදනම්ව දෛනිකව ගණනය කෙරේ.

22.0 ගනුදෙනුව කල්පිරීමට නියමිත දිනය, රජය හදිසියේ ප්‍රකාශ කළ බැංකු නිවාඩු දිනයක් වන්නේ නම්, යම් පාර්ශ්වයක් හා අදාළව එදිනට නියමිත වූ ගනුදෙනුව පිළිබඳව කටයුතු කිරීම ඊළඟට එළඹෙන ප්‍රථම ව්‍යාපාරික දිනයේ දී සිදු කරනු ඇත.

23.0 විවට වෙළඳපොළ කටයුතු සඳහා භාවිතා කරන උපකරණ පිළිබඳ සාරාංශයක් ඇමුණුමේ දක්වා ඇත.

24.0 නිත්‍ය තැන්පතු පහසුකම හැර අනෙකුත් සියලු කටයුතු ගෙවීමට එදිරි මුදාහැරීමේ (Delivery Versus Payment) පදනම මත සිදු කරනු ලබයි.

25.0 කඩඉම් මිල යටතේ සාර්ථක ලංසු එකකට වඩා ඉදිරිපත් කර ඇති අවස්ථාවල දී ඉදිරිපත් කර ඇති ලංසුවල වටිනාකමට සමානුපාතික වන පරිදි (Pro rata basis) ලංසු තැබූ ආයතන වෙත අරමුදල් ප්‍රදානය කරනු ලැබේ. ඒ අනුව කඩඉම් මිල යටතේ ඉදිරිපත් කර ඇති ලංසුවල මුළු ප්‍රමාණයෙන් කිසියම් කොටසක් පමණක් පිළිගැනීමක් සිදු වනු ඇත.

26.0 දෛනික ව්‍යාපාරික කටයුතු නිමවන වේලාව, ලංකාසෙට්ල් පද්ධති නීති (LankaSettle System Rules) 4 කාණ්ඩයෙහි සහ ලංකාසෙට්ල් පද්ධති නීති 2.1 පිටපතෙහි සංශෝධිතයන්ට අනුව හෝ එහි නවතම පිටපතෙහි නිරූපිත පරිදි වේ. සාමාන්‍යයෙන්, ලංකාසෙක්‍යුහි (LankaSecure) ව්‍යාපාරික කටයුතු නිමවන වේලාව 16:30 පැය වේ. කෙසේ වෙතත්, අනපේක්ෂිත අවස්ථාවන් හමුවේ ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් කාරක සටහනට අවස්ථානුකූල වෙනස්කම් සිය අභිමතය පරිදි සිදු කරයි. මෙවන් අවස්ථාවක දී, ශ්‍රී ලංකා මහ බැංකුව ව්‍යාපාරික කටයුතු නිමවන වේලාව වෙනස් කොට එය සහභාගිත්ව ආයතන වෙත දැනුම් දෙනු ඇත.

27.0 සහභාගිත්ව ආයතන විසින් පියවීමේ උපදෙස් ලබාදීම අවශ්‍ය නොවේ.

28.0 නිත්‍ය ණය පහසුකම (SLF)" කෙටිකාලීන ප්‍රතිවිකුණුම් (STRRP), දිගුකාලීන ප්‍රතිවිකුණුම් (LTRRP) සහ ද්‍රවශීලතා ආධාරක පහසුකම් (LSF) ගනුදෙනු හා සම්බන්ධව ඉදිරිපත් කළ සුරැකුම්පත් ආදේශ කිරීමට අවසර නොලැබේ.

29.0 සහභාගිත්ව ආයතනවලට දේශීය මෙහෙයුම් සඳහා වූ එක්දින ප්‍රතිමිලදීගැනුම් ගිණුමේ (Domestic Operations Repurchase Account - DOP) ඇති සුරැකුම්පත් ගනුදෙනු කළ නොහැක.

3 වන කොටස: නිත්‍ය පහසුකම

30.0 සියලුම සහභාගිත්ව ආයතනවලට ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුදල් තැන්පත් කිරීම සඳහා නිත්‍ය තැන්පතු පහසුකම ද අදාළ සුරැකුම්පත් ඉදිරිපත් කිරීමෙන් පසු අරමුදල් ණයට ගැනීම සඳහා නිත්‍ය ණය පහසුකම ද දෛනික පහසුකම් ලෙස භාවිතා කළ හැක. නිත්‍ය පහසුකම යටතේ තැන්පත් කරන හෝ ණයට ගන්නා අරමුදල් ප්‍රමාණය එකී ආයතනයන්ගේ අභිමතය මත සිදු වේ. නිත්‍ය තැන්පතු පහසුකම/නිත්‍ය ණය පහසුකම යටතේ සහභාගිත්ව ආයතන විසින් විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතිය හරහා තැන්පත් කරන/ඉල්ලුම් කරන ප්‍රමාණය සම්බන්ධ සම්පූර්ණ වගකීම අදාළ සහභාගිත්ව ආයතනය සතුවේ. අදාළ සහභාගිත්ව ආයතන විසින් ඉදිරිපත් කරන ලද ලංසු මහ බැංකුව විසින් අනුමත කළ පසු, කිසිදු හේතුවක් මත, එසේ ඉදිරිපත් කරන ලද ලංසුවලට කිසිදු සංශෝධනයක් සිදු කළ නොහැකි වේ.

3.1 නිත්‍ය තැන්පතු පහසුකම

31.0 නිත්‍ය තැන්පතු පහසුකම ලබා ගැනීමට බලාපොරොත්තු වන සහභාගිත්ව ආයතන අදාළ ගනුදෙනුව 15:30 පැයට පෙර විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතිය වෙත ඉදිරිපත් කළ යුතුය.

32.0 නිත්‍ය තැන්පතු පහසුකම සඳහා අදාළ වන පොලී අනුපාතිකය ශ්‍රී ලංකා මහ බැංකුවේ නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය වන අතර, එයට අදාළ පොලී ප්‍රමාණය තැන්පතුව පවත්වා ගෙන යනු ලබන කාලසීමාවට අනුව ගණනය කරනු ඇත.

33.0 ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුව විසින් සහභාගිත්ව ආයතන විසින් නිත්‍ය තැන්පතු පහසුකම යටතේ තැන්පත් කිරීමට බලාපොරොත්තු වන අරමුදල් ප්‍රමාණය එම ආයතනවල පියවීම් ගිණුම්වලින් ලංකාසෙට්ල් පද්ධති නීතිවල දෛනික මෙහෙයුම් කාලසටහන අනුව එදිනම ඍජුවම හර කරනු ලැබේ.

34.0 ලංකාසෙට්ල් පද්ධතියේ සහභාගිත්ව ආයතනවල බ්‍රවුසර් එක හරහා සහභාගිත්ව ආයතන විසින් සිය පියවීම් ගිණුමෙහි අදාල හර වටිනාකම තහවුරු කිරීමක් කරනු ලැබේ.

35.0 නිත්‍ය තැන්පතු පහසුකමෙහි තැන්පත් කරනු ලැබූ මුදලට සමාන මුදලක් ගිණුමට හර වූ බවට තහවුරු කිරීමට, FIN 900 යටතේ තහවුරු කිරීමේ අන්තර් බැංකු මූල්‍ය තොරතුරු සන්නිවේදන සංගමය (SWIFT) හරපත් පණිවිඩය අදාළ ගිණුම් හිමියාට යවනු ලැබේ.

36.0 කල්පිරෙන දිනයේ දී, ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් 08:30 පැයට හෝ ඊට ප්‍රථම, මූලික තැන්පතු අගය සහ අදාළ පොලිය සහභාගිත්ව ආයතනයෙහි පියවීම් ගිණුමට බැර කරනු ලැබේ.

37.0 කල්පිරෙන දිනයේ දී, 08:30 පැයට හෝ ඊට ප්‍රථම, ඉහත මුදල ගිණුමට බැර වූ බවට තහවුරු කිරීමට FIN 910 යටතේ තහවුරු කිරීමේ අන්තර් බැංකු මූල්‍ය තොරතුරු සන්නිවේදන සංගමය (SWIFT) බැරපත් පණිවිඩය අදාළ ගිණුම් හිමියාට යවනු ලැබේ.

3.2 නිත්‍ය ණය පහසුකම

38.0 ප්‍රතිවිකුණුම් ගනුදෙනු මූලධර්ම මත නිත්‍ය ණය පහසුකම ක්‍රියාත්මක වේ. නිත්‍ය ණය පහසුකම යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් භාණ්ඩාගාර බිල්පත් සහ/හෝ භාණ්ඩාගාර බැඳුම්කර යම් එකඟ වූ මිලකට (ප්‍රතිමිලදීගැනුම් මිල/ආපසු විකිණීමේ මිල) යම් එකඟ වූ දිනයක දී ආපසු විකිණීමේ ගිවිසුමක් මත සහභාගිත්ව ආයතනයන්ගෙන් මිලදී ගනු ලැබේ.

39.0 ප්‍රතිමිලදීගැනුම් මිල අදාළ සුරැකුම්පතෙහි ගැනුම් මිල සහ අදාළ ගනුදෙනුවෙහි පොලී ප්‍රමාණයෙහි එකතුවෙන් සමන්විත වේ.

40.0 නිත්‍ය ණය පහසුකම සඳහා අදාළ වන පොලී අනුපාතිකය ශ්‍රී ලංකා මහ බැංකුවේ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය වන අතර එය අදාළ ණය මුදල් ලබාගන්නා කාලසීමාව සඳහා ගණනය කරනු ඇත.

41.0 නිත්‍ය ණය පහසුකම ලබාගැනීමට බලාපොරොත්තු වන ආයතන එම ගනුදෙනු සහ ඊට අදාළ සුරැකුම්පත්වල විස්තර 15:30 පැයට පෙර විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතිය වෙත ඉදිරිපත් කළ යුතුය.

42.0 ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් සහභාගිත්ව ආයතනයේ පියවීම් ගිණුමට සුරැකුම්පත්වල ගැනුම් මිල (අයදුම් කළ ප්‍රමාණය) බැර කිරීමෙන් සහ ලංකාසෙක්‍යුහි (LankaSecure) ඇති ශ්‍රී ලංකා මහ බැංකුවේ දේශීය මෙහෙයුම් සඳහා වූ ප්‍රතිවිකුණුම් ගිණුමට (DRP) මිලදී ගත් සුරැකුම්පත් ලැබීමත් සමග එදිනම 16:15 පැය වන විට ගනුදෙනුව පියවනු ලැබේ.

43.0 පිළිගත් වටිනාකම, ජාත්‍යන්තර සුරැකුම්පත් හඳුනා ගැනීමේ අංක සහිත සුරැකුම්පත්, මුහුණත අගයන්, එලදා අනුපාතිකය සහ පරිණත දිනය සහිතව නිත්‍ය ණය පහසුකම් ගනුදෙනුවේ තහවුරුවක් ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් අදාළ සහභාගිත්ව ආයතනයට විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතිය ඔස්සේ එදිනම 16:15 පැය වන විට ඉදිරිපත් කරනු ලබයි.

44.0 පරිණත වන දිනයේ දී, සුරැකුම්පත්වල නැවත විකුණුම් අගයට (ප්‍රතිවිකුණුම් මිලට) අදාළ අරමුදල් ශ්‍රී ලංකා මහ බැංකුවේ පියවීම් ගිණුමට ලැබීමත් සමගම, එදින 11:00 පැය වනවිට, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලංකාසෙක්‍යුහි (LankaSecure) සහභාගිත්ව ආයතනයේ සුරැකුම්පත් ගිණුමට මිලට ගත් සුරැකුම්පත් හුවමාරු කිරීම සිදු කරයි.

4 වන කොටස : කෙටිකාලීන වෙන්දේසි

45.0 කෙටිකාලීන වෙන්දේසි ප්‍රතිමිලදීගැනුම් සහ ප්‍රතිවිකුණුම් ගනුදෙනු යන දෙයාකාරයට සිදු වේ. කෙටිකාලීන වෙන්දේසිවල කාල සීමාව දිනක සිට දින 7ක් (සතියක්) දක්වා වේ. මෙම ඒකාබද්ධ මෙහෙයුම් උපදෙස් වගන්ති 5.0 හි සඳහන් ආකාරයට වෙළඳපොළ මෙහෙයුම් කමිටුව, වෙන්දේසියට අදාළ කාල සීමාව සහ එහි ප්‍රමාණය තීරණය කරනු ලබයි. විවට වෙළඳපොළ වෙන්දේසි පිළිබඳ පියවීම් කටයුතු එදිනම පියවීමේ පදනම මත (T+0) සිදු වේ.

46.0 ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වෙළඳපොළ මෙහෙයුම් කමිටුවේ තීරණය එදින 09:30 පැය වන විට නිවේදනය කරනු ලබයි. මෙම නිවේදනයෙහි ඉදිරිපත් කර ඇති වෙන්දේසිය වර්ගය (කෙටිකාලීන ප්‍රතිමිලදීගැනුම් හා කෙටිකාලීන ප්‍රතිවිකුණුම්), ඉදිරිපත් කළ වටිනාකම සහ පරිණත වන දිනය (කාලය) ඇතුළත් වේ. කෙටිකාලීන ප්‍රතිමිලදීගැනුම් සහ කෙටිකාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි ඇමුණුම යටතේ දක්වා ඇති විවට වෙළඳපොළ කටයුතු සඳහා යොදා ගැනෙන උපකරණ සහ කාලසටහන අනුව පැවැත්වේ.

47.0 එක් වෙන්දේසියක් සඳහා උපරිම වශයෙන් සහභාගිත්ව ආයතනයකට ලංසු 3 ක් ඉදිරිපත් කළ හැකි අතර, ලංසුවල මුළු වටිනාකම එම වෙන්දේසියෙහි වටිනාකමට සීමා වේ. එක් එක් ලංසුවෙහි තම තමන් ආයෝජනය කිරීමට හෝ ණයට ලබා ගැනීමට බලාපොරොත්තු වන වටිනාකම සහ අනුරූපව ලංසු තබන පොලී අනුපාතිකය සඳහන් විය යුතුය.

48.0 කෙටිකාලීන ප්‍රතිමිලදීගැනුම්, කෙටිකාලීන ප්‍රතිවිකුණුම් සහ කෙටිකාලීන ද්‍රවශීලතා ආධාරක පහසුකම් වෙන්දේසීන්හි ප්‍රතිඵලය, ලැබුණු මුළු ලංසු ප්‍රමාණය, පිළිගත් මුළු ප්‍රමාණයත්, බරිත සාමාන්‍ය පොලී අනුපාතිකය සහ සාර්ථක ලංසුවක උපරිම හා අවම අනුපාතිකයන් වැනි තොරතුරු සඳහන් කරමින් විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතිය සහ මධ්‍යම ඒකාබද්ධ වෙළඳපොළ නිරීක්ෂණ පද්ධතිය හරහා සහභාගිත්ව ආයතනවලට වෙන්දේසියේ ප්‍රතිඵලය (ප්‍රතික්ෂේප, පිළිගත් හෝ කොටසක් පමණක් පිළිගත් ලංසු) අදාළ වෙන්දේසිය අවසාන වී විනාඩි 30 ක කාලයකට පසු විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතිය හරහා නිවේදනය කරනු ලබයි.

49.0 එක් එක් සාර්ථක ලංසු වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ නිල විකුණුම් මිල ගණන් භාවිතා කොට කෙටිකාලීන ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසි සඳහා සරිලන පරිදි සුරැකුම්පත් වෙන් කිරීම සිදු කරනු ලබයි. කෙටිකාලීන ප්‍රතිමිලදීගැනුම්, කෙටිකාලීන ප්‍රතිවිකුණුම් හා කෙටිකාලීන ද්‍රවශීලතා ආධාරක පහසුකම් වෙන්දේසි සඳහා ගනුදෙනුව සාර්ථක වූ සහභාගිත්ව ආයතන වෙත විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතිය තුළින් ප්‍රතිඵල නිකුත් කර පැයක් ඇතුළත දී, විද්‍යුත්මය ගනුදෙනු තහවුරු කිරීමක් නිකුත් කරනු ලැබේ. මෙම තහවුරුව තුළ ජාත්‍යන්තර සුරැකුම්පත් හඳුනා ගැනීමේ අංකය (අංක) සහ අදාළ මුහුණත වටිනාකම (වටිනාකම්), අදාළ වෙන්කිරීම් (කොටස් වශයෙන් පිළිගැණුනු ලංසුවකට අදාළව නැවත ගණනය කරන ලද මුහුණත වටිනාකම), පිළිගත් ප්‍රමාණය සහ ප්‍රතිමිලදීගැනුම් සහ ප්‍රතිවිකුණුම් වටිනාකම්වලින් සමන්විත වේ.

4.1 කෙටිකාලීන ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසි

50.0 කෙටිකාලීන ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසියෙහි ආයෝජනය කිරීමට කැමති සහභාගිත්ව ආයතන තම ලංසුව විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතිය මඟින් අදාළ වෙන්දේසි නිවේදනය යටතේ ඉදිරිපත් කළ යුතුය. නිත්‍ය ණය පහසුකම් අනුපාතිකයට හෝ ඊට ඉහළ අනුපාතිකයකට ඉදිරිපත් වන ලංසු ප්‍රතික්ෂේප කෙරේ.

51.0 අදාළ වෙන්කිරීම් සිදු කෙරෙන්නේ සාර්ථක ලංසු තබන්නන් විසින් ඉදිරිපත් කළ ලංසුවල පොලී අනුපාතිකයන්ගේ ආරෝහණ පිළිවෙළටය.

52.0 ගනුදෙනු පියවීම, ලංකාසෙට්ල් (LankaSettle) හි සැසඳූ ගනුදෙනු යොමු කිරීමේ (Matched Trade Feed (MTF)) පහසුකම යටතේ සිදු කරනු ලැබේ. අලෙවි කළ සුරැකුම්පත්වල විකුණුම් වටිනාකම වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ පියවීම් ගිණුමට අරමුදල් (පිළිගත් ප්‍රමාණය) ලැබීමත් සමග ඒ සඳහා ලබාදිය යුතු සුරැකුම්පත් අදාළ සහභාගිත්ව ආයතනයෙහි දේශීය මෙහෙයුම් ගිණුමට (DOP) මාරු කිරීමෙන්, ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුව විසින් 13:15 පැය හෝ ඊට පෙර ගනුදෙනු පියවනු ලබයි.

53.0 වෙන්දේසියේ සාර්ථක වූ සහභාගිත්ව ආයතන විසින් මිලදීගත් සුරැකුම්පත්වල වටිනාකම (පිළිගත් ප්‍රමාණය) පියවීම සඳහා 13:15 පැය වන විට පියවීමේ ගිණුමේ ප්‍රමාණවත් ශේෂයක් පවත්වා ගැනීමට වගබලා ගත යුතු වේ.

54.0 විකුණන ලද සුරැකුම්පත් කල්පිරෙන දිනයේ (ප්‍රතිමිලදීගැනුම් දින) ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුව විසින් ලංකාසෙක්‍යුහි (LankaSecure) ශ්‍රී ලංකා මහ බැංකුවේ ස්වකීය (Own Account) ගිණුමට හෝ දේශීය කටයුතු ණය ගිණුමට (Domestic Operations

Borrowed Account - DOB) ලැබීමත් සමග, 08:30 පැය හෝ ඊට පෙර අදාළ ප්‍රතිමිලදීගැනුම් වටිනාකම, සහභාගිත්ව ආයතනයන්හි පියවීමේ ගිණුමට ගෙවනු ලැබේ.

55.0 ප්‍රතිමිලදීගැනුම් වටිනාකම, ගැනුම් මිල (පිළිගත් ප්‍රමාණය) සහ සහභාගිත්ව ආයතන විසින් ඉදිරිපත් කරන ලද ලංසු සඳහා පොලී අනුපාතිකය මත ගණනය කළ පොලී ප්‍රමාණයෙහි එකතුවෙන් සමන්විත වේ. පිළිගත් ප්‍රමාණය, සහභාගිත්ව ආයතනයෙහි එම ලංසුවට අදාළ පොලී අනුපාතිකය සහ ගිවිසුමට අදාළ කාලසීමාව පදනම්ව පොලී ප්‍රමාණය ගණනය කළ යුතු වේ.

56.0 සහභාගිත්ව ආයතන විසින් කල් පිරෙන දිනයේ (ප්‍රතිමිලදීගැනුම් දින) කෙටිකාලීන ප්‍රතිමිලදීගැනුම් ගනුදෙනුව සම්පූර්ණයෙන් ප්‍රතිවර්තනය කිරීම සඳහා 08:30 පැය වන විට ලංකාසෙක්‍යුහි (LankaSecure) දේශීය කටයුතු ප්‍රතිමිලදීගැනුම් ගිණුමෙහි (DOP) ශ්‍රී ලංකා මහ බැංකුවෙන් පිළිගත් සුරැකුම්පත් රඳවා තබා ගැනීමට වගබලා ගත යුතුය.

4.2 කෙටිකාලීන ප්‍රතිවිකුණුම් ගනුදෙනු

57.0 කෙටිකාලීන ප්‍රතිවිකුණුම් ගනුදෙනු වෙන්දේසියෙහි ආයෝජනය කිරීමට බලාපොරොත්තු වන සහභාගිත්ව ආයතන විසින් ඔවුන්ගේ ලංසු, ස්ථාපිත කර ඇති විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතිය මගින් අදාළ වෙන්දේසි නිවේදනය යටතේ ඉදිරිපත් කළ යුතුය. සහභාගිත්ව ආයතන සිය ලංසුව සමග ජාත්‍යන්තර සුරැකුම්පත් හඳුනා ගැනීමේ අංකයන් ඉදිරිපත් කළ යුතුය. නිත්‍ය තැන්පතු අනුපාතිකය හෝ ඊට පහළ අනුපාතිකයන්ට ඉදිරිපත් කරන ලංසු ප්‍රතික්ෂේප කෙරේ.

58.0 ආදළ වෙන්කිරීම් සිදු කරනු ලබන්නේ සාර්ථක ලංසු තබන්නන් ඉදිරිපත් කළ මිල අනුපාතිකයන්ගේ අවරෝහණ පිළිවෙළටය.

59.0 ගනුදෙනු පියවීම ලංකාසෙට්ල්හි (LankaSettle) සැසඳූ ගනුදෙනු යොමු කිරීමේ (MTF) පහසුකම යටතේ එදිනම 13:15 පැයට සිදු කරනු ලැබේ. ලංකාසෙක්‍යුහි ඇති ශ්‍රී ලංකා මහ බැංකුවේ දේශීය මෙහෙයුම් ප්‍රතිවිකුණුම් ගිණුමට (DRP) මිලදීගත් සුරැකුම්පත් ප්‍රමාණය ලැබීමත් සමග ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් සහභාගිත්ව ආයතනයේ පියවීම් ගිණුමට සුරැකුම්පත්වල ගැනුම් මිල (පිළිගත් ප්‍රමාණය) බැර කරනු ලැබේ.

60.0 කල්පිරෙන දිනයේදී (ප්‍රතිවිකුණුම් දිනයේ දී) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මිලදීගත් සුරැකුම්පත්වල ආපසු විකිණීම් වටිනාකම ශ්‍රී ලංකා මහ බැංකුවේ පියවීම් ගිණුමට ලැබීමත් සමගම මහ බැංකුව ලංකාසෙක්‍යුහි ඇති සහභාගිත්ව ආයතනයේ සුරැකුම්පත් ගිණුමට මිලදීගත් සුරැකුම්පත් 11:00 පැයට පෙර නැවත මාරු කරනු ලැබේ.

61.0 නැවත විකිණීමේ වටිනාකම සුරැකුම්පතෙහි මිලදීගත් වටිනාකම (පිළිගත් වටිනාකම) සහ අදාළ ලංසුවේ පොලී ආන්තිකයෙන් සමන්විත වේ. අදාළ ලංසුවේ පොලී ආන්තිකය පිළිගත් වටිනාකම සහ ගිවිසුමට අනුව සහභාගිත්ව ආයතනවල ලංසුවේ කාලසීමාව සහ ඊට අදාළ පොලී අනුපාතිකය පදනම් කොටගෙන ගණනය කරනු ලැබේ.

5 වන කොටස : දිගුකාලීන වෙන්දේසි

62.0 දිගුකාලීන වෙන්දේසි ප්‍රතිමිලදීගැනුම් සහ ප්‍රතිවිකුණුම් වෙන්දේසිවලින් සමන්විත වේ. දිගුකාලීන වෙන්දේසිවල කාලසීමාව දින 7 කට වඩා (සතියකට වඩා) වැඩි වේ.

63.0 පැය 09:30 වනවිට, දිගුකාලීන වෙන්දේසියක් පැවැත්වීම සම්බන්ධයෙන්, වෙළඳපොළ මෙහෙයුම් කමිටුවේ තීරණය වෙන්දේසිය පවත්වනු ලබන දිනයේ හෝ ඊට පෙර වැඩකරන දිනයේ දී මහ බැංකුව විසින් නිවේදනය කරනු ලැබේ. පවත්වනු ලබන වෙන්දේසි වර්ගය (දිගුකාලීන ප්‍රතිමිලදීගැනුම්, දිගුකාලීන ප්‍රතිවිකුණුම් හෝ දිගුකාලීන ද්‍රවශීලතා ආධාරක වෙන්දේසි), සඳහා ඉදිරිපත් කරනු ලබන වටිනාකම, පරිණත වන දිනය (කාලසීමාව), වෙන්දේසිය පවත්වනු ලබන දිනය සහ පියවීම් කටයුතු සිදුවන දිනය මෙම නිවේදනයේ ඇතුළත් වේ.

64.0 එක් වෙන්දේසියක් සඳහා උපරිම වශයෙන් සහභාගිත්ව ආයතනයකට ලංසු 6 ක් ඉදිරිපත් කළ හැකි අතර, ලංසුවල මුළු වටිනාකම එම වෙන්දේසියේ වටිනාකමට සීමා වේ. සෑම ලංසුවකම ඔවුන් විසින් ආයෝජනය/ණයට ගැනීමට බලාපෙරොත්තු වන වටිනාකම සහ ඊට අදාළ පොලී අනුපාතික සඳහන් කළ යුතුය. දිගුකාලීන ප්‍රතිමිලදීගැනුම්, දිගුකාලීන ප්‍රතිවිකුණුම් සහ දිගුකාලීන ද්‍රවශීලතා ආධාරක පහසුකම් වෙන්දේසි ඇමුණුම යටතේ දක්වා ඇති කාලසටහන සහ විවට වෙළඳපොළ කටයුතු යටතේ වන උපකරණවල සාරාංශය අනුව පැවැත්වේ.

65.0 දිගුකාලීන ප්‍රතිමිලදීගැනුම්, දිගුකාලීන ප්‍රතිවිකුණුම් සහ දිගුකාලීන ද්‍රවශීලතා ආධාරක පහසුකම් වෙන්දේසීන්හි ප්‍රතිඵලය, ලැබුණු මුළු ලංසු ප්‍රමාණය, පිළිගත් මුළු ලංසු ප්‍රමාණය, බරිත සාමාන්‍ය පොලී අනුපාතිකය සහ සාර්ථක ලංසුවල උපරිම හා අවම අනුපාතිකයන් වැනි තොරතුරු සඳහන් කරමින් විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතිය සහ මධ්‍යම ඒකාබද්ධ වෙළඳපොළ නිරීක්ෂණ පද්ධතිය හරහා සහභාගිත්ව ආයතනවලට වෙන්දේසියේ ප්‍රතිඵලය (ප්‍රතික්ෂේප, පිළිගත් හෝ කොටසක් පමණක් පිළිගත් ලංසු) අදාළ වෙන්දේසිය අවසාන වී විනාඩි 30 ක කාලයකට පසු නිවේදනය කරනු ලබයි.

66.0 එක් එක් සාර්ථක ලංසු වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ නිල විකුණුම් මිල ගණන් භාවිතා කොට දිගුකාලීන ප්‍රතිමිලදීගැනුම්, වෙන්දේසි සඳහා ඊට සරිලන පරිදි සුරැකුම්පත් වෙන්කිරීම සිදු කරනු ලබයි. දිගුකාලීන ප්‍රතිමිලදීගැනුම්, දිගුකාලීන ප්‍රතිවිකුණුම් සහ දිගුකාලීන ද්‍රවශීලතා ආධාරක පහසුකම් යන වෙන්දේසි සඳහා ගනුදෙනුව සාර්ථක වූ සහභාගිත්ව ආයතන වෙත විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතිය තුළින් ප්‍රතිඵල නිකුත් කර පැයක් ඇතුළත දී, විද්‍යුත් ගනුදෙනු තහවුරු කිරීමක් නිකුත් කරනු ලැබේ. මෙම තහවුරුව තුළ ජාත්‍යන්තර සුරැකුම්පත් හඳුනා ගැනීමේ අංකය (අංක) වෙන්කරන ලද අදාළ මුහුණත වටිනාකම/වටිනාකම්, පිළිගත්

ප්‍රමාණය, ප්‍රතිමිලදීගැනුම් වටිනාකම, ප්‍රතිවිකුණුම් වටිනාකම සහ පරිණත වන දිනය යන තොරතුරුවලින් සමන්විත වේ.

5.1 දිගුකාලීන ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසි

67.0 දිගුකාලීන ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසියකට සහභාගිවීමට අපේක්ෂා කරනු ලබන සහභාගිත්ව ආයතන විසින් ඔවුන්ගේ ලංසු අදාළ වෙන්දේසි නිවේදනයට අනුව විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතිය හරහා දැනුම් දිය යුතු වේ.

68.0 සාර්ථක ලංසු තබන්නන් විසින් ලබාදුන් පොලී අනුපාතික ආරෝහණ ක්‍රමයට සකසා ඒ මත පදනම්ව අදාළ වෙන්කිරීම් සිදු කරනු ලබයි.

69.0 පියවීම් දිනයේදී ලංකාසෙටිල් පද්ධතියේ සැසඳූ ගනුදෙනු යොමු කිරීමේ පහසුකම (MTF) හරහා ගනුදෙනු පියවනු ලැබේ. අලෙවි කළ සුරැකුම්පත්වල විකුණුම් වටිනාකම වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ පියවීම් ගිණුමට අරමුදල් (පිළිගත් ප්‍රමාණය) ලැබීමත් සමඟ ඒ සඳහා ලබාදිය යුතු සුරැකුම්පත් අදාළ සහභාගිත්ව ආයතනයෙහි දේශීය මෙහෙයුම් ගිණුමට (DOP) මාරු කිරීමෙන් ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුව විසින් 8.30 පැය හෝ ඊට පෙර ගනුදෙනුව පියවනු ලබයි.

70.0 ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුවට සුරැකුම්පත්හි විකුණුම් වටිනාකම (පිළිගත් ප්‍රමාණය) සම්පූර්ණයෙන් අයකර ගැනීමට හැකිවන පරිදි වෙන්දේසියේ දී සාර්ථක වූ සෑම සහභාගිත්ව ආයතනයක්ම පියවීම් දිනයේ දී පැය 08:30 වන විට ප්‍රමාණවත් ශේෂයක් තම පියවීම් ගිණුමේ පවත්වා ගැනීමට වගබලා ගත යුතුය.

71.0 විකුණන ලද සුරැකුම්පත් කල්පිරෙන දිනයේ (ප්‍රතිමිලදීගැනුම් දින) ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුව විසින් ලංකාසෙක්‍යුහි (LankaSecure) ශ්‍රී ලංකා මහ බැංකුවේ ස්වකීය (Own Account) ගිණුමට හෝ දේශීය කටයුතු ණය ගිණුමට (Domestic Operations Borrowed Account - DOB) ලැබීමත් සමග, 08:30 පැය හෝ ඊට පෙර අදාළ ප්‍රතිමිලදීගැනුම් වටිනාකම, සහභාගිත්ව ආයතනයන්හි පියවීමේ ගිණුමට ගෙවනු ලැබේ.

72.0 ප්‍රතිමිලදීගැනුම් වටිනාකම, ගැනුම් මිල (පිළිගත් ප්‍රමාණය) සහ සහභාගිත්ව ආයතන විසින් ඉදිරිපත් කරන ලද ලංසු සඳහා පොලී අනුපාතිකය මත ගණනය කළ පොලී ප්‍රමාණයෙහි එකතුවෙන් සමන්විත වේ. පිළිගත් ප්‍රමාණය, සහභාගිත්ව ආයතනයෙහි එම ලංසුවට අදාළ පොලී අනුපාතිකය සහ ගිවිසුමට අදාළ කාලසීමාව පදනම්ව පොලී ප්‍රමාණය ගණනය කළ යුතු වේ.

5.2 දිගුකාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි

73.0 දිගුකාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි තුළින් මුදල් ලබා ගැනීමට බලාපොරොත්තු වන සහභාගිත්ව ආයතන විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතිය හරහා තම ලංසු අදාළ වෙන්දේසි නිවේදනය යටතේ ඉදිරිපත් කළ යුතුය. සහභාගිත්ව ආයතන තමන් විකිණීමට බලාපොරොත්තු වන සුරැකුම්පත් ප්‍රමාණය, ජාත්‍යන්තර සුරැකුම්පත් හඳුනා ගැනීමේ අංක සහිත සුරැකුම්පත් ප්‍රමාණය ද ලංසු සමග ඉදිරිපත් කළ යුතුය.

74.0 සාර්ථක ලංසු තබන්නෙකු විසින් ඉදිරිපත් කළ ලංසුවල පොලී අනුපාතිකවල අවරෝහණ පිළිවෙළට වෙන්කිරීම් සිදු කරනු ලබයි.

75.0 ගනුදෙනුව පියවීම ඊළඟ ව්‍යාපාරික දිනයේ දී ලංකාසෙටිල්හි සැසඳූ ගනුදෙනු යොමු කිරීමේ (MTF) පහසුකම යටතේ එදිනම 08:30 පැයට හෝ ඊට ප්‍රථම සිදු කරනු ලැබේ. ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුව විසින් ලංකාසෙක්‍යු පද්ධතියෙහි ඇති ශ්‍රී ලංකා මහ බැංකුවේ දේශීය මෙහෙයුම් ප්‍රතිවිකුණුම් ගිණුමට (DRP) පිළිගත් සුරැකුම්පත් ප්‍රමාණය ලැබීමත් සමග සහභාගිත්ව ආයතනයේ පියවීම් ගිණුමට සුරැකුම්පත්වල ගැනුම් මිල (පිළිගත් ප්‍රමාණය) බැර කරනු ලැබේ.

76.0 කල්පිරෙන දිනයේදී (නැවත විකුණුම් දිනය) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මිලදී ගත් සුරැකුම්පත්වල ආපසු විකිණීමේ වටිනාකම (ප්‍රතිමිලදීගැනුම් මිල) ශ්‍රී ලංකා මහ බැංකුවේ පියවීම් ගිණුමට ලැබීමත් සමගම ලංකාසෙක්‍යුයෙහි ඇති සහභාගිත්ව ආයතනයේ සුරැකුම්පත් ගිණුමට මිලදී ගත් සුරැකුම්පත් 11:00 පැයට ප්‍රථම නැවත මාරු කරනු ලැබේ.

77.0 නැවත විකිණීමේ වටිනාකම, සුරැකුම්පතෙහි මිලදී ගත් වටිනාකම (පිළිගත් වටිනාකම) සහ අදාළ ලංසුවේ පොලී ආන්තිකයෙන් සමන්විත වේ. අදාළ ලංසුවේ පොලී ප්‍රමාණය ගණනය කරනු ලබන්නේ පිළිගත් වටිනාකම සහ ගිවිසුමට අනුව අදාළ සහභාගිත්ව ආයතනයේ ලංසුවේ කාලසීමාව සහ අදාළ පොලී අනුපාතිකය පදනම් කොටගෙනය.

6 වන කොටස: ද්‍රවශීලතා ආධාරක පහසුකම

78.0 බලපත්‍රලාභී වාණිජ බැංකු හැර ප්‍රාථමික අලෙවිකරුවන් ලෙස පත්කර ඇති සමාගම් එනම් බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන්ට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රතිවිකුණුම් ගනුදෙනු යටතේ ද්‍රවශීලතා ආධාරක පහසුකමක් හඳුන්වා දෙනු ලැබේ. බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් සඳහා වන මෙම ද්‍රවශීලතා ආධාරක පහසුකම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකුවලට එක්දින ප්‍රතිවිකුණුම් වෙන්දේසියක් පවත්වන අවස්ථාවේ දී හෝ මහ බැංකුව විසින් තීරණය කරනු ලබන අවස්ථාවක දී ලබාදෙනු ඇත.

79.0 ද්‍රවශීලතා ආධාරක පහසුකම යටතේ අරමුදල් ලබාගැනීමට බලාපොරොත්තු වන බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් විසින් විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතිය හරහා නිවේදනය කර ඇති අදාළ වෙන්දේසිය යටතේ ඔවුන්ගේ ලංසුව/ලංසු ඉදිරිපත් කිරීම සිදු කළ යුතුය. බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් විසින් ඔවුන්ගේ ලංසු, සුරැකුම්පත් තොරතුරු සමඟ එනම් ජාත්‍යන්තර සුරැකුම්පත් හඳුනා ගැනීමේ අංක වැනි තොරතුරු ඇතුළත්ව ඉදිරිපත් කළ යුතුය.

80.0 එදින බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා පවත්වනු ලැබූ ප්‍රතිවිකුණුම් වෙන්දේසියේ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිළිගත් ලංසුවලට අදාළ වූ උපරිම ලංසු අනුපාතිකය පදනම් කොටගෙන ද්‍රවශීලතා ආධාරක පහසුකම යටතේ වන වෙන්දේසිය සඳහා අවම ලංසු අනුපාතිකය තීරණය කරනු ලබයි. ද්‍රවශීලතා ආධාරක පහසුකම යටතේ වෙන්දේසියක් ආරම්භ කිරීමට ප්‍රථම ඊට අදාළ වන අවම

ලංසු අනුපාතිකය මධ්‍යම ඒකාබද්ධ වෙළඳපොළ නිරීක්ෂක පද්ධතිය සහ විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතිය හරහා ප්‍රකාශයට පත්කරනු ලැබේ. අවම අනුපාතිකයට (Floor Rate) වඩා අඩුවෙන් ඉදිරිපත් කරනු ලබන කිසිදු ලංසුවක් පිළිනොගැනේ.

81.0 සාර්ථක ලංසු තබන්නන් විසින් ඉදිරිපත් කරන ලංසුවල පොලී අනුපාතිකයන්හි අවරෝහණ පිළිවෙළ පදනම් කරගනිමින් වෙන්දේසියෙහි අදාළ වෙන් කිරීම් සිදු කරනු ලැබේ.

82.0 ද්‍රවශීලතා ආධාරක පහසුකම සඳහා ඉදිරිපත් කරනු ලැබූ සුරැකුම්පත් වෙනුවට වෙනත් සුරැකුම්පත් ආදේශ කිරීමට අවසර නොලැබේ.

83.0 ගනුදෙනු පියවීම, එදිනම 13:15 පැය හෝ ඊට පෙර සිදු කරනු ලැබේ. ලංකාසෙක්‍යු පද්ධතියේ ඇති දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ දේශීය මෙහෙයුම් සඳහා ප්‍රතිවිකුණුම් ගිණුමට (DRP) මිලදී ගත් සුරැකුම් ප්‍රමාණය ලැබීමත් සමඟ ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුව විසින් අදාළ බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුගේ පියවීම් ගිණුමට මිලදීගත් සුරැකුම්පත් වටිනාකම (පිළිගත් ප්‍රමාණය) හර කරනු ලැබේ.

84.0 පරිණත වන දිනයේ දී, (අදාළ බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරු විසින් නැවත ප්‍රතිවිකුණුම් කරන දිනය) සුරැකුම්පත්වල ආපසු විකුණුම් වටිනාකමට අදාළ අරමුදල් ශ්‍රී ලංකා මහ බැංකුවේ පියවීමේ ගිණුමට ලැබීමත් සමගම, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 11:00 පැය ඉක්මවීමට පෙර මිලදී ගත් සුරැකුම්පත් ලංකාසෙක්‍යුහි ඇති බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන්ගේ සුරැකුම්පත් ගිණුමට හුවමාරු කිරීම සිදු කරයි.

85.0 ප්‍රතිමිලදීගැනුම් මිල, සුරැකුම්පත් මිලදීගැනුම් වටිනාකම (පිළිගත් ප්‍රමාණය) සහ අදාළ ලංසුව සඳහා වන පොලී අනුපාතික මත ගණනය කළ පොලී ප්‍රමාණයෙහි එකතුවෙන් සමන්විත වේ. අදාළ ලංසුවෙහි පොලී ප්‍රමාණය පිළිගත් ලංසුවේ ප්‍රමාණය, අදාළ බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන්ගේ එම ලංසුවට අදාළ පොලී අනුපාතිකය සහ ගිවිසුමට අදාළ කාලසීමාව පදනම් කරගෙන ගණනය කරනු ලබයි.

7 වන කොටස : ස්ථිර පදනම මත වෙන්දේසි

86.0 ශ්‍රී ලංකා මහ බැංකුව සතුව ඇති භාණ්ඩාගාර බිල්පත් හෝ බැඳුම්කර විකිණීමට (ස්ථිර පදනමින් ද්‍රවශීලතාව අවශෝෂණය සඳහා) හෝ ද්විතීයික වෙළඳපොළෙන් භාණ්ඩාගාර බිල්පත් හා/හෝ බැඳුම්කර මිලට ගැනීමට (ස්ථිර පදනමින් ද්‍රවශීලතාව ලබාදීම සඳහා) ස්ථිර පදනම මත වූ වෙන්දේසි පැවැත්වීමට ශ්‍රී ලංකා මහ බැංකුවට තීරණය කළ හැක. සියලුම සහභාගිත්ව ආයතනවලට ස්ථිර පදනම මත වන වෙන්දේසි සඳහා ප්‍රවේශ විය හැකිය.

87.0 වෙළඳපොළ මෙහෙයුම් කමිටුවේ තීරණය අනුව, ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසි පැවැත්වීම පිළිබඳව එම වෙන්දේසි පවත්වනු ලබන දිනයේ 09:30 පැය වනවිට හෝ ඊට පෙර ව්‍යාපාරික දිනයේදී මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කරනු ලබන අතර, ස්ථිර පදනම මත භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසි සඳහා අවම වශයෙන්, වෙන්දේසි පැවැත්වීමට දිනකට පෙර වන ව්‍යාපාරික දිනයේදී, මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කරනු ලැබේ. අදාළ වෙන්දේසියේ වර්ගය (නිත්‍ය පදනම මත භාණ්ඩාගාර බිල්පත් විකිණීම හෝ මිලට ගැනීම), ඉදිරිපත් කරනු ලබන/පිරිනමන ප්‍රමාණය (අදාළ සුරැකුම්පතෙහි මුහුණත වටිනාකම), පරිණත වන දිනය, පරිණත වීම සඳහා ඇති දින ගණන, වෙන්දේසි පවත්වනු ලබන දිනය සහ පියවීම් කටයුතු සිදුවන දිනය යනාදියෙන් මෙම ප්‍රකාශය සමන්විත වේ. ස්ථිර පදනම මත සිදුවන වෙන්දේසිවල පියවීම් කටයුතු වෙන්දේසිය පැවැත්වූ දිනට පසු පළමු ව්‍යාපාරික දිනයේ දී සිදු කරනු ලැබේ.

88.0 සෑම සහභාගිත්ව ආයතනයක් විසින්ම උපරිමය ලංසු 6 කට යටත්ව ඇමුණුමෙහි දක්වා ඇති කාලසීමාවන්ට යටත්ව ලංසු තැබීම සිදු කළ යුතු අතර ලංසු තැබිය හැකි මුළු වටිනාකම අදාළ වෙන්දේසිය සඳහා ඉදිරිපත් කළ වටිනාකමට සීමා වේ. සෑම ලංසුවක්ම ඔවුන් විසින් මිලදී ගැනීමට හෝ විකිණීමට අදහස් කරන සුරැකුම්පත්වල මුහුණත වටිනාකම, මිලදී ගැනීමට හෝ විකිණීමට අදාළ භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කරවල පරිණත කාලසීමාව, මිලදී ගනු ලබන භාණ්ඩාගාර බැඳුම්කරවල කුපන් අනුපාතිකය සහ කුපන් දිනය, අපේක්ෂිත පොලී අනුපාතිකය (ඵලදා අනුපාතිකය) සහ අපේක්ෂිත මිල යනාදියෙන් සමන්විත විය යුතුය.

89.0 අදාළ වෙන්දේසිය පවත්වා අවසාන වී පැය 3 කින් පසුව ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර විකිණීමේ වෙන්දේසියට අදාළ ප්‍රතිඵල ලැබුණු මුළු ලංසු ප්‍රමාණය, පිළිගනු ලැබූ ලංසු ප්‍රමාණය සහ එහි බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය වැනි තොරතුරු ලබා දෙමින් විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතිය යටතේ නිවේදනය කරනු ලැබේ. අදාළ වෙන්දේසිය පැවැත්වූ දිනයේ දී සෑම ලංසු තබන්නෙකුටම (අදාළ ලංසුව ප්‍රතික්ෂේප වීම, පිළිගැනීම හෝ කොටසක් පිළිගැනීම) වෙන්දේසියේ ප්‍රතිඵලය සුරැකුම්පතට අදාළ විකුණුම් මිල ගණන් විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතිය හරහා දැනුම් දෙනු ලැබේ.

7.1 ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර විකිණීමේ වෙන්දේසි

90.0 ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් විකිණීමේ වෙන්දේසියකදී භාණ්ඩාගාර බිල්පත් හෝ බැඳුම්කර මිලට ගැනීමට අදහස් කරනු ලබන සහභාගිත්ව ආයතන විසින් අදාළ වෙන්දේසි නිවේදනයට අනුරූපව ඔවුන්ගේ ලංසුව අදාළ වෙන්දේසි දිනයේදී විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතිය හරහා ඉදිරිපත් කළ යුතුය.

91.0 සාර්ථක ලංසු තබන්නෙකු විසින් ඉදිරිපත් කරන ලද පොලී අනුපාතිකවල (ඵලදා අනුපාතික) ආරෝහණ පිළිවෙළට පදනම්ව විකිණීම සිදු කරනු ලැබේ.

92.0 පියවීම් දිනයේ දී, ලංකාසෙට්ල්හි සැසඳූ ගනුදෙනු යොමු කිරීමේ (MTF) පහසුකම හරහා අදාළ පියවීම් කටයුතු සිදු කරනු ලබයි. පියවීම් දිනයේ 08:30 පැයේ දී හෝ ඊට පෙර විකුණන ලද සුරැකුම්පත්වල වට්ටම් කරන ලද වටිනාකම

ශ්‍රී ලංකා මහ බැංකුවෙහි පියවීමේ ගිණුමට ලැබීමත් සමග ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් සාර්ථක ලංසුකරුවන්ගේ ස්වකීය ගිණුම්වලට විකුණන ලද සුරැකුම්පත් මාරු කිරීමෙන් ගනුදෙනුව පියවනු ලැබේ.

93.0 විකුණන ලද සුරැකුම්පත්වල වට්ටම් කරන ලද වටිනාකම ගණනය කිරීමේදී සාර්ථක වූ ලංසුකරුවන් විසින් භාණ්ඩාගාර බිල්පත් හෝ භාණ්ඩාගාර බැඳුම්කර සඳහා ලංසු තබන ලද පොලී අනුපාතිකය (එලදා අනුපාතිකය), සහ භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර පරිණත වන දිනය යනාදිය පදනම් කරගනු ලබයි.

7.2 භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර ස්ථිර පදනම මත මිලදී ගැනීමේ වෙන්දේසි

94.0 ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් මිලට ගැනීමේ වෙන්දේසියක දී භාණ්ඩාගාර බිල්පත් හෝ බැඳුම්කර විකිණීමට අදහස් කරනු ලබන සහභාගිත්ව ආයතන විසින් අදාළ වෙන්දේසි නිවේදනයට අනුරූපව ඔවුන්ගේ ලංසුව අදාළ වෙන්දේසි දිනයේ දී විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතිය හරහා ඉදිරිපත් කළ යුතුය.

95.0 සාර්ථක ලංසු තබන්නෙකු විසින් ඉදිරිපත් කරනු ලබන පොලී අනුපාතිකවල (එලදා අනුපාතික) අවරෝහණ ක්‍රමයට පදනම්ව අදාළ මිලදී ගැනීම් සිදු කරනු ලබයි.

96.0 ගනුදෙනු පියවීම, ලංකාසෙට්ල්හි සැසඳූ ගනුදෙනු යොමු කිරීමේ පහසුකම (MTF) යටතේ සිදු කරනු ලබයි. පියවීම් දිනයේ 08:30 පැයේ දී හෝ ඊට පෙර මිලදී ගන්නා සුරැකුම්පත් ශ්‍රී ලංකා මහ බැංකුවෙහි ස්වකීය (Own Account) ගිණුමට ලැබීමත් සමඟ ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් සුරැකුම්පත්වල වට්ටම් කරන ලද වටිනාකම අදාළ සාර්ථක ලංසු තැබූ සහභාගිත්ව ආයතනවල පියවීමේ ගිණුමට බැර කිරීමෙන් ගනුදෙනුව පියවනු ලැබේ.

97.0 සාර්ථක වූ ලංසුකරුවකු විසින් භාණ්ඩාගාර බිල්පත් හෝ භාණ්ඩාගාර බැඳුම්කර සඳහා ලංසු තබන ලද පොලී අනුපාතික (එලදා අනුපාතිකය) සහ භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර පරිණත වන දිනය පදනම් කොට ගෙන මිලදී ගනු ලබන සුරැකුම්පත්වල වට්ටම් කරන ලද වටිනාකම ගණනය කරයි.

8 වන කොටස : මහ බැංකු සුරැකුම්පත්

98.0 ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කලින් කල ඇතිවන අවශ්‍යතාවන්ට අනුව ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් (මහ බැංකු සුරැකුම්පත්) නිකුත් කිරීම තීරණය කරනු ඇත. මේවා නිකුත් කරනු ලබන්නේ 1949 අංක 58 දරන මුදල් නීති පනතේ (422 ඡේදයෙහි) 91 (1) (ආ) කොටස යටතේ වෙළඳපොළෙහි ඇති අතිරික්ත ද්‍රවශීලතාව උකහා ගැනීම සඳහා සිදු කරන විවට වෙළඳපොළ කටයුතුවල කොටසක් ලෙසිනි.

99.0 ශ්‍රී ලංකා මහ බැංකුවට

(i) වෙන්දේසි ක්‍රමය යටතේ මහ බැංකු සුරැකුම්පත් නිකුත් කිරීම.

(ii) වෙන්දේසි ක්‍රමය යටතේ මහ බැංකු සුරැකුම්පත් නියමිත පරිණත කාලයට පෙර පියවීම.

(iii) මහ බැංකු සුරැකුම්පත් නැවත විකිණීමේ (Sell-back) පහසුකම භාවිතා කිරීම යනාදී තීරණ ගත හැකිය.

100.0 මෙම සුරැකුම්පත්වල ප්‍රධාන ලක්ෂණ පහත සඳහන් පරිදි වෙයි.

(i) මහ බැංකු සුරැකුම්පත් නිර්ලේඛන සුරැකුම්පත් ලෙස නිකුත් කරනු ලබයි.

(ii) මහ බැංකු සුරැකුම්පත් ගනුදෙනු කළ හැකිය.

(iii) මහ බැංකු සුරැකුම්පත් ගනුදෙනු පියවීමේදී සහ හුවමාරු කිරීමේ දී, නිර්ලේඛන සුරැකුම්පත් පියවීමේ පද්ධතිය සහ මධ්‍යම තැන්පතු පද්ධතිය සඳහා අදාළ වන නීති හා රෙගුලාසි අදාළ වනු ඇත.

(iv) මහ බැංකු සුරැකුම්පත් වෙළඳපොළෙහි ගනුදෙනු කළ හැක. එහෙත් මෙම සුරැකුම්පත් ශ්‍රී ලංකා මහ බැංකුවේ එක්දින ද්‍රවශීලතා පහසුකම, නිත්‍ය ණය පහසුකම හෝ ප්‍රතිවිකුණුම් ගනුදෙනු සඳහා ඇප වශයෙන් භාවිතා කළ නොහැක.

(v) රජයේ භාණ්ඩාගාර බිල්පත් මෙන්ම මහ බැංකු සුරැකුම්පත් ද නිකුත් කරනු ලබන්නේ වට්ටමක් සහිතවය.

(vi) සහභාගිත්ව ආයතන මෙම සුරැකුම්පත් ශ්‍රී ලංකා මහ බැංකුවෙන් මිලදී ගැනීමට සුදුසුකම් ලබයි. මහජනතාවට මෙම සුරැකුම්පත් ද්විතීයික වෙළඳපොළෙහි සහභාගිත්ව ආයතනවලින් මිලදී ගත හැකිය.

(vii) රජයේ සුරැකුම්පත් මෙන්ම, මෙම සුරැකුම්පත් ද ප්‍රාථමික වෙළඳපොළ නිකුතුවේදී පොලී මත රඳවා ගැනීමේ බද්දට යටත් වනු ඇත.

(viii) මහ බැංකු සුරැකුම්පත්වල පරිණත කාලසීමාව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තීරණය කරනු ලබයි.

8.1 වෙන්දේසි ක්‍රමය යටතේ මහ බැංකු සුරැකුම්පත් නිකුත් කිරීම (කෙටිකාලීන හා දිගුකාලීන)

101.0 මහ බැංකුව සුරැකුම්පත් නිකුත් කිරීම සඳහා වෙන්දේසියක් පැවැත්වීම සම්බන්ධව වෙළඳපොළ මෙහෙයුම් කමිටුවේ තීරණය අදාළ වෙන්දේසිය පවත්වනු ලබන දින හෝ ඊට පෙර ප්‍රථම ව්‍යාපාරික දිනයේ දී නිවේදනය කරනු ලැබේ. අදාළ වෙන්දේසි වර්ගය (කෙටිකාලීන හෝ දිගුකාලීන), පිරිනමනු ලබන සුරැකුම්පත්වල වටිනාකම (මුහුණත අගය) සහ විකිණීමට බලාපොරොත්තු වන සුරැකුම්පත්වල පරිණත කාල සීමාව, වෙන්දේසිය පවත්වනු ලබන දිනය, වේලාව සහ එහි පියවීම් දිනය නිවේදනයේ ඇතුළත් වේ.

102.0 ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මහ බැංකු සුරැකුම්පත් නිකුත් කළ යුත්තේ කෙටිකාලීන පරිණත කාලයකින් ද දිගුකාලීන පරිණත කාලයකින් ද යන්න තීරණය කරනු ලබයි. කෙටිකාලීන මහ බැංකු සුරැකුම්පත් දින 1-7 දක්වා ද දිගුකාලීන මහ බැංකු සුරැකුම්පත් දින 7 ට වඩා වැඩි පරිණත කාලයකින් ද සමන්විත වේ.

103.0 මෙම වෙන්දේසි ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් විකිණීමේ වෙන්දේසි මෙන් විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතිය හරහා පවත්වනු ලබයි. අදාළ වෙන්දේසියේදී මහ බැංකු සුරැකුම්පත් මිලදී ගැනීමට බලාපොරොත්තු වන සහභාගිත්ව ආයතන විසින් ඔවුන් මිලදී ගැනීමට බලාපොරොත්තු වන වටිනාකමට අනුව තමන්ගේ ලංසු තැබීම් (මිලදී ගැනීමට බලාපොරොත්තු වන සුරැකුම්පත්වල මුහුණත වටිනාකම) සහ වෙන්දේසිය පවත්වනු ලබන දිනට ලංසු තබන පොලී අනුපාතිකය (ඵලදා අනුපාතිකය) වෙන්දේසි නිවේදනයෙහි දක්වා ඇති කාලසීමාව තුළදී අදාළ විකුණුම් වෙන්දේසිය තෝරා ගනිමින් විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතිය හරහා ඉදිරිපත් කළ යුතුය.

104.0 යම් සහභාගිත්ව ආයතනයකට යම් පරිණත කාලසීමාවක් සඳහා උපරිම ලංසු 6ක් ඉදිරිපත් කළ හැකි අතර, එම ලංසුවල මුළු වටිනාකම වෙන්දේසියේ දී ඉදිරිපත් කරනු ලබන මුළු වටිනාකමට සීමා විය යුතුය.

105.0 සහභාගිත්ව ආයතන විසින් ඉදිරිපත් කරනු ලබන පොලී අනුපාතික (ඵලදා අනුපාතික) රඳවා තබා ගැනීමේ බදු ඇතුළත් ඵලදා අනුපාතිකයක් වේ. රජයේ බදු පද්ධතියෙහි සිදුවන ඕනෑම වෙනසක් සුදුසු පරිදි අදාළ වේ.

106.0 සාර්ථක ලංසු තබන්නෙකු විසින් ඉදිරිපත් කරනු ලබන පොලී අනුපාතික (ඵලදා අනුපාතික) ආරෝහණ ක්‍රමයට පෙළගස්වා ඒ මත පදනම්ව අදාළ වෙන් කිරීම් සිදු කරනු ලබයි.

107.0 ලැබුණු මුළු ලංසු ප්‍රමාණය, පිළිගනු ලැබූ ලංසු ප්‍රමාණය සහ එහි බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය වැනි තොරතුරු ලබා දෙමින් විද්‍යුත් මංගත ලංසු තැබීමේ ක්‍රමය යටතේ අදාළ වෙන්දේසිය පවත්වා අවසාන වී විනාඩි 30කින් පසුව ප්‍රතිඵල නිකුත් කරනු ලැබේ. අදාළ වෙන්දේසිය පැවැත්වූ දිනයේ දී සෑම ලංසු තබන්නෙකුටම (අදාළ ලංසුව ප්‍රතික්ෂේප වීම, පිළිගැනීම හෝ කොටසක් පිළිගැනීම) එහි ප්‍රතිඵලය සුරැකුම්පතට අදාළ ගැනුම් මිල ගණන් ද රඳවා තබා ගැනීමේ බදු ද සමග අදාළ වෙන්දේසිය අවසාන වී විනාඩි 30කට පසුව විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතිය තුළින් දැනුම් දෙනු ලැබේ.

108.0 සෑම සාර්ථක ලංසුවකම විකුණුම් මිල (රඳවා තබා ගැනීමේ බදු සහිතව) අදාළ සුරැකුම්පතේ පරිණත කාලසීමාව සඳහා රඳවා තබා ගැනීමේ බදු ගැලපීමෙන් පසුව අදාළ සහභාගිත්ව ආයතනය විසින් ඉදිරිපත් කරන ලද පොලී අනුපාතික (ඵලදා අනුපාතික) අදාළ සුරැකුම්පතෙහි මුහුණත වටිනාකම මත වට්ටම් කොට ගණනය කරනු ලැබේ.

109.0 ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පැයක් ඇතුළත ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් අදාළ සහභාගිත්ව ආයතනවලට පිළිගනු ලැබූ වටිනාකම, ජාත්‍යන්තර සුරැකුම්පත් හඳුනා ගැනීමේ අංකය, මුහුණත වටිනාකම සහ පරිණත කාලසීමාව පිළිබඳ තහවුරුවක් විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතිය තුළින් නිකුත් කරනු ලබයි.

110.0 ලංකාසෙට්ල්හි (LankaSettle) සැසඳ ගනුදෙනු යොමු කිරීමේ (MTF) පහසුකම හරහා අදාළ පියවීම් කටයුතු සිදුකරනු ලැබේ. පියවීම් සිදු කරනු ලබන දිනයේ දී පහත 111.0 වන වගන්තියේ සඳහන් කොට ඇති කාලසීමාවන්ට යටත්ව ශ්‍රී ලංකා මහ බැංකුවේ පියවීමේ ගිණුම්වලට සුරැකුම්පත් විකිණූ වටිනාකම (රඳවා තබාගැනීමේ බදු සහිතව විකුණන ලද සුරැකුම්පත්වල වට්ටම් වටිනාකම) ලැබීමත් සමග විකුණන ලද සුරැකුම්පත්වල මුහුණත වටිනාකම අදාළ සහභාගිත්ව ආයතනයේ ස්වකීය ගිණුම්වලට (Own Account) හුවමාරු කරමින් ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් අදාළ පියවීම් කටයුතු සිදු කරනු ලැබේ.

111.0 පියවීම් කාලසීමාවන් පහත පරිදි වේ.

(i) කෙටිකාලීන පරිණත කාලසීමාවන් සහිත මහ බැංකු සුරැකුම්පත්වල පියවීම් කටයුතු වෙන්දේසි දිනයේ දී අදාළ වෙන්දේසිය අවසාන වී පැය දෙකක් ඇතුළත සිදු කරනු ලැබේ.

(ii) දිගුකාලීන පරිණත කාලසීමාවක් සහිත මහ බැංකු සුරැකුම්පත්වල පියවීම් කටයුතු අදාළ පියවීම් දිනයේ 08:30 පැය වන විට සිදු කරනු ලබයි.

112.0 පරිණත වන දිනයේ දී, මහ බැංකුවේ ස්වකීය සුරැකුම්පත් ගිණුමට (Own Account) අදාළ සුරැකුම්පත් ස්වයංක්‍රීයව මාරුවීම සිදුවන අතර පරිණත වන සුරැකුම්පත්වලට අදාළ ලැබීම් (අදාළ සුරැකුම්පත්වල මුහුණත වටිනාකම) පරිණත දිනයට පෙර පළමු ව්‍යාපාරික දිනයේ දී සුරැකුම්පත් තබාගත් සහභාගිත්ව ආයතනයේ පියවීම් ගිණුමට පරිණත වන දිනයේ 08:30 පැය වන විට බැර කරනු ලැබේ.

8.2 පෙර තීරණය කරන ලද අනුපාතිකයකට මහ බැංකු සුරැකුම්පත් නිකුත් කිරීම

113.0 මහ බැංකුව විසින් පෙර තීරණය කරන ලද ඵලදා අනුපාතිකයකට සහභාගිත්ව ආයතනවලට මහ බැංකු සුරැකුම්පත් නිකුත් කළ හැකිය.

114.0 වෙළඳපොළ මෙහෙයුම් කමිටුව විසින් පරිණතවන කාලසීමාව, ඵලදා අනුපාතිකය (රඳවා තබාගැනීමේ බදු සහිතව) සහ පරිණතවන දිනය සඳහන් කරමින් කලින් තීරණය කරනු ලබන ඵලදා අනුපාතිකයකට මහ බැංකු සුරැකම්පත් නිකුත් කිරීමට තීරණය කරනු ලබන අතර, එය විද්‍යුත් මංගත ලංසු තැබීම් ක්‍රමය/මුදල් වෙළඳපොළ අධීක්ෂණ ක්‍රමය හෝ වෙනත් සන්නිවේදන මාධ්‍යයක් භාවිතා කොට, අදාළ ව්‍යාපාරික දිනයේ 11:00 සහ 14:30 පැය අතර කාලසීමාවේ දී දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ විවට වෙළඳපොළ කටයුතු අංශය සමග මිලදී ගැනීමේ ගනුදෙනුවකට එළඹීම සඳහා සහභාගිත්ව ආයතනවලට දන්වනු ලබයි.

115.0 සහභාගිත්ව ආයතන විසින් මෙසේ කලින් තීරණය කරන ඵලදා අනුපාතිකයකට මහ බැංකු සුරැකුම්පත් මිලට ගැනීමට අපේක්ෂා කරනු ලබයි නම් එම වෙන්දේසිය පවත්වනු ලබන දිනයේ 14:30 පැය වනවිට මිලදී ගැනීමට බලාපොරොත්තු වන ප්‍රමාණය/වටිනාකම (මුහුණත අගය) සඳහන් කරමින් දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ විවට වෙළඳපොළ කටයුතු අංශය සමග මිලදී ගැනීමේ ගනුදෙනුවකට එළඹීම සඳහා සහභාගිත්ව ආයතනවලට දන්වනු ලබයි.

116.0 සහභාගිත්ව ආයතනවලට විද්‍යුත් ලංසු තැබීමේ ක්‍රමය යටතේ (නිත්‍ය පහසුකම, ස්ථිර පදනම යටතේ භාණ්ඩාගාර බිල්පත් විකිණීම) මිලට ගැනීමට බලාපොරොත්තු වන වටිනාකම (මුහුණත වටිනාකම) 15:00 පැය වන විට ඉදිරිපත් කළ යුතුය.

117.0 සහභාගිත්ව ආයතනවලට පිළිගත් ලංසුව පිළිබඳව, විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතිය මඟින් (නිත්‍ය පහසුකම, ස්ථිර පදනම යටතේ භාණ්ඩාගාර බිල්පත් විකිණීම) එදිනම 15:00 පැය වන විට දැනගත හැක.

118.0 ගනුදෙනු සිදු කරන ලද දිනයේම, පියවීම් යෙදෙන අවස්ථාවන්හි දී සැසඳූ ගනුදෙනු යොමු කිරීමේ (MTF) ගොනුව ලංකාසෙක්‍යු වෙත එදිනම 15:00 පැයට පෙර ඉදිරිපත් කරනු ලැබේ. පියවීම් දිනය, ගනුදෙනු කරන ලද දිනයට පසු දිනට යෙදේ නම් සැසඳූ ගනුදෙනු යොමු කිරීමේ ගොනුව ලංකාසෙක්‍යු වෙත ඉදිරිපත් කරනු ලබන්නේ පියවීම් කරන දිනයේ 08:30 පැයට පෙරය.

119.0 විකුණන ලද සුරැකුම්පත්වලට අදාළ පියවීම වට්ටම් කරන ලද විකුණුම් වටිනාකම පියවීම් පද්ධතිය මඟින් ශ්‍රී ලංකා මහ බැංකුවේ පියවීම් ගිණුමට බැර කරනු ලබන අතර, සහභාගිත්ව ආයතනවල ස්වකීය ගිණුම්වලට (Own Account) සුරැකුම්පත් හුවමාරු කිරීම සිදු කරනු ලැබේ.

120.0 මෙහිදී සුරැකුම්පත්වල මුහුණත අගය (රඳවා තබා ගැනීමේ බදු සහිත විකුණුම් මිල) අදාළ ඵලදා පොලී අනුපාතික මත කල්පිරෙන කාලය සඳහා වට්ටම් කරමින්, විකුණුම් අගය ගණනය කරනු ලැබේ.

121.0 කල්පිරෙන දිනයෙහි දී එයට අදාළ පියවීම් කටයුතු ස්වයංක්‍රීයව සිදු කෙරේ. ඒ සඳහා අදාළ සුරැකුම්පත් ශ්‍රී ලංකා මහ බැංකුවේ (Own Account) ගිණුමට ප්‍රේෂණය කර කල්පිරුණු වටිනාකම, කල්පිරීමට පෙර දවසේ එම සුරැකුම්පත් අයත්ව තිබූ සහභාගිත්ව ආයතනයෙහි පියවීම් ගිණුමට බැර කරනු ලැබේ.

122.0 අවශ්‍ය විටක දී පෙර තීරණය කළ පොලී අනුපාතික සහිත වූ මහ බැංකු සුරැකුම්පත්වල ඵලදා අනුපාතික සහ පරිණත කාලය වෙනස් කිරීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතුවේ. එවැනි වෙනස්වීම් විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතිය/මුදල් වෙළඳපොළ අධීක්ෂණ පද්ධතිය හෝ වෙනත් දැනුම් දීමේ ක්‍රමයක් මඟින් ඒවා බලපැවැත්වෙන දිනයෙහි 09:30 පැයට පෙර සහභාගිත්ව ආයතන වෙත දැනුම් දෙනු ලැබේ.

8.3 වෙන්දේසි ක්‍රමය යටතේ පරිණත දිනට පෙර මහ බැංකු සුරැකුම්පත් විශ්‍රාම ගැන්වීම

123.0 වෙළඳපොළ මෙහෙයුම් කමිටුව විසින් අවශ්‍ය යැයි හැඟෙන විටක දී මහ බැංකු සුරැකුම්පත් පරිණත දිනයට ප්‍රථම විශ්‍රාම ගැන්වීම පිළිබඳව තීරණය කරනු ඇත.

124.0 පරිණත දිනයට ප්‍රථම මහ බැංකු සුරැකුම්පත් විශ්‍රාම ගැන්වීම (මිලදී ගැනීම) පිළිබඳ වෙළඳපොළ මෙහෙයුම් කමිටු තීරණය වෙන්දේසිය පැවැත්වෙන දිනයේ හෝ ඊට ප්‍රථම ව්‍යාපාරික කටයුතු සිදු කෙරෙන පළමු දිනයේ සහභාගිත්ව ආයතන වෙත දැනුම් දෙනු ලැබේ. එම නිවේදනයේ සුරැකුම්පත් ප්‍රමාණය (මුහුණත වටිනාකම), කල්පිරෙන දිනය, මිලදී ගන්නා සුරැකුම්පතේ ජාත්‍යන්තර සුරැකුම්පත් හඳුනා ගැනීමේ අංකය, වෙන්දේසිය පැවැත්වෙන දිනය හා වේලාව සහ පියවීම් සිදුවන දිනය ඇතුළත් වේ.

125.0 සහභාගිත්ව ආයතනයක් අදාළ මහ බැංකු සුරැකුම්පත් වෙන්දේසියකදී සුරැකුම්පත් විකිණීමේදී ලංසුවේ වටිනාකම (විකිණීමට අපේක්ෂා කරන සුරැකුම්පත්වල මුහුණත වටිනාකම) සහ පොලී අනුපාතික (ඵලදා) වෙන්දේසි දින පැය 13:00 සහ පැය 14:00 අතර විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතිය හරහා ස්ථිර පදනම මත මිලදී ගැනීමේ වෙන්දේසි යටතේ අදාළ වෙන්දේසිය තෝරා ලංසු ඉදිරිපත් කළ යුතු වේ. ගනුදෙනු පියවීම එදිනට පසුව එළඹෙන ව්‍යාපාරික දිනයේ පැය 08:30 ට පෙර සිදු කරනු ලැබේ.

126.0 එක් සහභාගිත්ව ආයතනයකට එක් සුරැකුම්පතක් වෙනුවෙන් ලංසු 6ක් ඉදිරිපත් කළ හැකි අතර ලංසුවල මුළු වටිනාකම අදාළ වෙන්දේසියේ වටිනාකම නොඉක්මවිය යුතුය.

127.0 වෙන්දේසියේ දී මිලදී ගැනීම සිදු කරනු ලබන්නේ සාර්ථක ලංසු තබන්නෙකු විසින් ඉදිරිපත් කළ පොලී (ඵලදා) අනුපාතිකයන්ගේ අවරෝහණ පටිපාටියට අනුවය.

128.0 වෙන්දේසියේ ප්‍රතිඵලය වෙන්දේසිය අවසන් වී විනාඩි 30 කට පසු විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතිය හරහා ලබාදෙනු ලැබේ. මෙහි ඇතුළත් වන්නේ ලැබූ මුළු ලංසු ප්‍රමාණය, පිළිගත් ලංසු ප්‍රමාණය සහ වෙන්දේසියේ බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකයයි. වෙන්දේසි දිනයේ වෙන්දේසිය අවසන් වී විනාඩි 30ක් ඇතුළත ලංසුවේ අවසන් ප්‍රතිඵලය (ප්‍රතික්ෂේප කිරීම, පිළිගැනීම හෝ කොටසක් පමණක් පිළිගැනීම) සහ මහ බැංකු සුරැකුම්පත් මිලදී ගන්නා අගය විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතිය හරහා ඒ ඒ සහභාගිත්ව ආයතන වෙත දැනුම් දෙනු ලැබේ.

129.0 ගනුදෙනු පියවීම ලංකාසෙට්ල්හි (LankaSettle) සැසඳූ ගනුදෙනු යොමු කිරීමේ පහසුකම් (MTF) හරහා වෙන්දේසි දිනයේ දී පැය 08:30 ට හෝ ඊට පෙර සිදුවේ. ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් ලංකාසෙක්‍යුහි ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුමට මාරු කිරීමත් සමඟ සුරැකුම්පත්වල ගැනුම් මිල (මිලදී ගත් මහ බැංකු සුරැකුම්පත්වල වට්ටම් කළ අගය) සහභාගිත්ව ආයතනයේ තත්කාලීන දළ පියවීම් පද්ධතිය යටතේ ඇති පියවීම් ගිණුමට බැර කිරීමෙන් ගනුදෙනුව පියවීම සිදු කෙරේ.

130.0 මහ බැංකු සුරැකුම්පත්වල ගැනුම් මිල ඒ ඒ සහභාගිත්ව ආයතන විසින් ඉදිරිපත් කර තිබූ ඵලදා අනුපාතිකයෙන් මිලදී ගන්නා සුරැකුම්පත්වල මුහුණත වටිනාකම කල්පිරීමට ඉතිරිව තිබෙන කාල සීමාව සඳහා වට්ටම් කිරීම මඟින් ගණනය කරනු ලැබේ.

8.4 මහ බැංකු සුරැකුම්පත් නැවත විකිණීමේ පහසුකම සහ පෙර තීරණය කරන ලද අනුපාතිකයකට මහ බැංකු සුරැකුම්පත් විශ්‍රාම ගැන්වීම

131.0 ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් සම්බන්ධව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පහත සඳහන් පහසුකම් සහභාගිත්ව ආයතන වෙත ලබාදෙනු ලැබේ.

(අ) ඔවුන් සතු මහ බැංකු සුරැකුම්පත් පරිණත වීමට පෙර, නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය යටතේ නැවත ශ්‍රී ලංකා මහ බැංකුවට විකිණීම.

(ආ) පරිණත වීමට පෙර, කලින් තීරණය කරන ලද අනුපාතිකයකට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මහ බැංකු සුරැකුම්පත් විශ්‍රාම ගැන්වීම (මිලදී ගැනීම).

132.0 131.0 (අ) අනුව සහභාගිත්ව ආයතනයකට ශ්‍රී ලංකා මහ බැංකු නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය යටතේ අදාළ මහ බැංකු සුරැකුම්පතේ ඉතිරි පරිණත කාලයට වට්ටම් කළ මිලකට මහ බැංකු සුරැකුම්පත් පරිණත වීමට පෙර නැවත විකිණීමට හැක. 131.0 (ආ) අනුව ශ්‍රී ලංකා මහ බැංකුව පෙර තීරණය කරන ලද ඵලදා අනුපාතිකයකට පරිණත වීමට පෙර විශ්‍රාම ගැන්වීමට තීරණය කරනු ලබයි. එහිදී පොලී අනුපාතිකය කල් පිරෙන දිනය සහ ජාත්‍යන්තර සුරැකුම්පත් හඳුනා ගැනීමේ අංකය නිවේදනය කරනු ලැබේ.

133.0 මෙම පහසුකම භාවිතා කිරීමට කැමති සහභාගිත්ව ආයතන නැවත විකිණීමට බලාපොරොත්තු වන මහ බැංකු සුරැකුම්පත්හි මුහුණත අගය දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ විවට වෙළඳපොළ කටයුතු අංශය වෙත එදිනම පැය 15:15 ට පෙර දුරකථන මාර්ගයෙන් හෝ ෆැක්ස් මාර්ගයෙන් දැනුම් දිය යුතු වේ.

134.0 සහභාගිත්ව ආයතන ගනුදෙනුව (විකුණනු ලබන ප්‍රමාණය සහ ජාත්‍යන්තර සුරැකුම්පත් හඳුනා ගැනීමේ අංකය) එදින පැය 15:15 ට පෙර විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතියේ ස්ථිර පදනමක් මත මිලදී ගැනීම යටතේ තහවුරු කළ යුතු වේ. මීට අදාළ පියවීම් කටයුතු එදිනම (T+0) සිදු කරනු ලැබේ.

135.0 ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් පිළිගත් ලංසු ප්‍රමාණය ජාත්‍යන්තර සුරැකුම්පත් හඳුනා ගැනීමේ අංකය, මුහුණත වටිනාකම සහ ඵලදා අනුපාතිකය ලබා දෙමින් ගනුදෙනුව තහවුරු කිරීම 16:15 පැය වන විට විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතිය හරහා සහභාගිත්ව ආයතන වෙත දැනුම් දෙනු ලබයි.

136.0 මහ බැංකු සුරැකුම්පත් මිලදී ගැනීමේ අගය (මිලදී ගැනීමේ වටිනාකම) සුරැකුම්පත්වල මුහුණත අගය 131 (අ) හිදී ශ්‍රී ලංකා මහ බැංකු නිත්‍ය ණය පහුසකම් අනුපාතිකයෙන් ද 131 (ආ) හිදී පෙර තීරණය කරන ලද පොලී අනුපාතිකයෙන් ද සුරැකුම්පත් කල්පිරීමට ඉතිරිව තිබෙන කාලසීමාව සඳහා වට්ටම් කිරීමෙන් ගණනය කරනු ලැබේ.

137.0 ගනුදෙනු පියවීම ලංකාසෙට්ල්හි (LankaSettle) සැසඳූ ගනුදෙනු යොමු කිරීමේ පහසුකම (MTF) හරහා සිදු කරනු ලැබේ. ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් මිලදීගත් සුරැකුම්පත් ලංකාසෙක්‍යුහි ශ්‍රී ලංකා මහ බැංකුවේ සුරැකුම්පත් ගිණුමට (Own Account) මාරු කිරීමත් සමගම සුරැකුම්පත්වල ගැනුම් මිල (මිලදී ගත් මහ බැංකු සුරැකුම්පත්වල වට්ටම් කළ මිල) අදාළ සහභාගිත්ව ආයතනයන්ගේ පියවීම් ගිණුමට පැය 16:15 වන විට මාරු කිරීමෙන් ගනුදෙනුව පියවනු ලැබේ.

9 වන කොටස : විදේශ විනිමය හුවමාරු ගනුදෙනු

138.0 මෙම කොටසේ අඩංගු ක්‍රියාමාර්ග, මාර්ගෝපදේශ, නියමයන් සහ කොන්දේසි අදාළ වන්නේ බලපත්‍රලාභී වාණිජ බැංකුවලට පමණි.

139.0 මුදල් ප්‍රතිපත්ති මෙහෙයුම් උපකරණයක් ලෙස වෙළඳපොළ තුළින් ද්‍රවශීලතාව අවශෝෂණය කර ගැනීමට හෝ සැපයීමට විදේශ විනිමය හුවමාරු ගනුදෙනු (Foreign Exchange Swap Transaction) පැවැත්වීමට වෙළඳපොළ මෙහෙයුම් කමිටුව විසින් තීරණය කිරීමට ඉඩ ඇත. මෙහිදී එක් ව්‍යවහාර මුදල් වර්ගයකට එරෙහිව වෙනත් ව්‍යවහාර මුදල් වර්ගයක් යම්කිසි දිනයකදී මිලදී ගෙන අනාගත දිනයකදී නිශ්චිත අනුපාතිකයකට එම ව්‍යවහාර මුදල් වර්ගය නැවත හුවමාරු කර ගැනීම සඳහා ගිවිසුමකට යටත් වීමක් සිදුවේ. විදේශ විනිමය හුවමාරු ගිවිසුම් ප්‍රතිමිලදීගැනුම් ගිවිසුම්වලට සමාන වන නමුත් සුරැකුම් වශයෙන් රජයේ සුරැකුම්පත් වෙනුවට විදේශ විනිමය භාවිතා කරනු ලැබේ.

140.0 සියලුම විදේශ විනිමය හුවමාරු ගිවිසුම් සිදු කරනුයේ බලපත්‍රලාභී වාණිජ බැංකු හා මහ බැංකුව අතර වේ. විවට වෙළඳපොළ කටයුතු යටතේ මහ බැංකුව දෙයාකාරව විදේශ විනිමය හුවමාරු ගිවිසුම් සඳහා ඇතුළත් වනු ලැබේ.

(අ) විකුණුම් ගැනුම් විදේශ විනිමය හුවමාරු

(ආ)ගැනුම් විකුණුම් විදේශ විනිමය හුවමාරු

141.0 මෙම කොටසේ දක්වා ඇති නියමයන් සහ කොන්දේසි විකුණුම් ගැනුම් සහ ගැනුම් විකුණුම් විදේශ විනිමය හුවමාරු ගනුදෙනු යන දෙවර්ගයම සඳහා අදාළ වේ.

142.0 විකුණුම් ගැනුම් සහ ගැනුම් විකුණුම් විදේශ විනිමය හුවමාරු ගනුදෙනු උපරිම වශයෙන් දින 365 කට සීමා වේ.

143.0 විකුණුම් ගැනුම් හෝ ගැනුම් විකුණුම් විදේශ විනිමය හුවමාරු වෙන්දේසි පැවැත්වීම පිළිබඳ වෙළඳපොළ මෙහෙයුම් කමිටුවේ තීරණය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වෙන්දේසිය පැවැත්වෙන දින පැය 09:30 ට පෙර හෝ ඊට ප්‍රථම ව්‍යාපාරික දිනයේදී නිවේදනය කරනු ලැබේ. එම නිවේදනයේ වෙන්දේසියේ දී පිරිනමනු ලබන ප්‍රමාණය, වෙන්දේසිය සිදු කරනු ලබන දිනය, පරිණත කාලය සහ පළමු අදියරේ පියවීම් දිනය සහ දෙවන අදියරෙහි පරිණත දිනය ඇතුළත් වේ.

144.0 බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් ශ්‍රී ලංකා මහ බැංකුව සමග විදේශ විනිමය හුවමාරු ගිවිසුමකට එළඹීමට අපේක්ෂා කරන්නේ නම් විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතිය හරහා නිවැරදි වෙන්දේසි නිවේදනය තෝරා වෙන්දේසි දිනයේදී ලංසු ඉදිරිපත් කළ යුතු වේ.

145.0 විදේශ විනිමය හුවමාරු වෙන්දේසි සඳහා වෙන්දේසි දිනයේ දී පැය 13:00 ත් පැය 14:00 ත් අතර ලංසු ඉදිරිපත් කළ හැකි වේ.

146.0 එක්සත් ජනපද ඩොලර්වලින් පමණක් ලංසු භාරගනු ලැබේ.

147.0 එක් ටෙන්ඩරයක් වෙනුවෙන් උපරිම වශයෙන් ලංසු 6ක් ඉදිරිපත් කිරීමට බලපත්‍රලාභී වාණිජ බැංකුවකට හැකියාව ඇත. ලංසුවක අවම වටිනාකම ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියනයක් ($ 1,000,000) වන අතර, ලංසුවක් එක්සත් ජනපද ඩොලර් ලක්ෂයක ($ 100,000) ගුණාකාර විය යුතුය. සෑම ලංසුවකම එක්සත් ජනපද ඩොලර් ප්‍රමාණය සහ හුවමාරු අංක (SWAP points) (විචල්‍ය අනුපාතික ටෙන්ඩර්) ඇතුළත් විය යුතුය.

148.0 හුවමාරු අංක විද්‍යුත් ලංසු තැබීමේ පද්ධතියට ඇතුළත් කළ යුත්තේ දශමස්ථාන දෙකක් සහිත රුපියල් ශතවලිනි. උදා: 0.20 = ශත විස්සයි.

149.0 ලංසු වෙන් කිරීම සිදු වන්නේ සාර්ථක ලංසු තැබූවන් විසින් ඉදිරිපත් කළ හුවමාරු අංක පදනම් කර ගැනීමෙනි.

150.0 වෙන්දේසියට ඉදිරිපත් කළ ප්‍රමාණය ඉක්මවා සමාන හුවමාරු අංකයකට ලංසු ඉදිරිපත් කර ඇති අවස්ථාවන්හි දී විකුණුම් ගැනුම් සහ ගැනුම් විකුණුම් විනිමය හුවමාරු සඳහා ඉතිරි වී තිබෙන ප්‍රමාණය සමානුපාතික වන අනුපාතික පදනම මත අදාළ ලංසු තැබූ ආයතන වෙත වෙන් කරනු ලැබේ. ඒ අනුව, එම හුවමාරු අංකයට ඉදිරිපත් වූ ලංසුවලින් කොටසක් පමණක් පිළිගෙන තිබිය හැක.

151.0 විදේශ විනිමය හුවමාරු වෙන්දේසියේ ප්‍රතිඵල වෙන්දේසි දින, වෙන්දේසිය අවසන් වී විනාඩි 30 කට පසු විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතිය හරහා ලැබුණු මුළු ලංසු ප්‍රමාණය, පිළිගත් ප්‍රමාණය සහ වෙන්දේසියේ බරිත සාමාන්‍ය, විදේශ විනිමය ගිවිසුම් හුවමාරු අංකය ලබාදෙමින් සිදු කරනු ලැබේ.

152.0 ලංසු තැබූවන් හට ඔවුන්ගේ ලංසුවේ ප්‍රතිඵලය (ප්‍රතික්ෂේප වීම, පිළිගැනීම හෝ කොටසක් පමණක් පිළිගැනීම) සමග පිළිගත් ප්‍රමාණය විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතිය හරහා වෙන්දේසි දින වෙන්දේසිය අවසන් වී විනාඩි 30කට පසු දැනුම් දෙනු ලැබේ.

153.0 විදේශ විනිමය හුවාමාරු ගනුදෙනු පිළිබඳ තහවුරු කිරීමක් සෑම සාර්ථක ලංසු තැබූවෙකු හටම වෙන්දේසි ප්‍රතිඵලය නිකුත් කිරීමෙන් පැයකට පසු විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතිය හරහා පිළිගත් ප්‍රමාණය, පරිණත කාලය, පරිණත දිනය සහ හුවමාරු අංක ලබා දෙමින් සිදු කරනු ලැබේ.

154.0 ශ්‍රී ලංකා මහ බැංකුවේ ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් විකුණුම් ගැනුම් හෝ ගැනුම් විකුණුම් විදේශ විනිමය හුවමාරු ගනුදෙනු සිදු කරනු ලබන අතර, සෑම සාර්ථක ලංසු තැබූවෙකු හටම ගනුදෙනු තහවුරු කිරීමත් සිදු කරනු ලැබේ.

155.0 විකුණුම් ගැනුම් හෝ ගැනුම් විකුණුම් විදේශ විනිමය හුවමාරු ගනුදෙනු පියවීමේ ක්‍රියාපිළිවෙළ අනෙකුත් විදේශ විනිමය හුවමාරු ගනුදෙනු පියවීමේ ක්‍රියාපිළිවෙළටම සමාන වේ.

අධ්‍යක්ෂ
දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව

ඇමුණුම

විවට වෙළඳ කටයුතු සඳහා යොදා ගැනෙන උපකරණ සහ කාලසටහන

උපකරණ								
තොරතුරු	කෙටිකාලීන ප්‍රතිමිලදීගැනුම් සහ ප්‍රතිවිකුණුම් වෙන්දේසි	කෙටිකාලීන ද්‍රවශීලතා ආධාරක පහසුකම	දිගුකාලීන ප්‍රතිමිලදීගැනුම් සහ ප්‍රතිවිකුණුම් වෙන්දේසි	ස්ථිර පදනම මත විකිණීම/මිලට ගැනීම	දිගුකාලීන ද්‍රවශීලතා ආධාරක පහසුකම	විදේශ විනිමය හුවමාරු ගිවිසුම්	නිත්‍ය පහසුකම්	මහ බැංකු සුරැකුම්පත්
වෙන්දේසි කාලය	10:00-10:30 පැය	11:00 - 11:30 පැය	13:00 - 13:30 පැය	13:00 - 14:00 පැය	14:00 - 14:30 පැය	13:00 - 14:00 පැය	නිමවන වේලාව 15:30 පැය	නිකුතු - 11:00 - 14:30 පැය විශ්‍රාම ගැන්වීම - 13:00 - 14:00 පැය
විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතියේ පියවීම්	T+0	T+0	T+1	T+1	T+1	T+2	T+0	15:00 පැය වන විට
පියවීම් කාලය	13:15 පැය වන විට	13:15 පැය වන විට	T+1 08:30 පැය වන විට	T+1 08:30 පැය වන විට	T+1 08:30 පැය වන විට	T+2	නිත්‍ය තැන්පතු පහසුකම - 16:00 පැය වන විට නිත්‍ය ණය පහසුකම් - 16:15 පැය වන විට	08:30 පැය වන විට නැවත විකිණීමට බලාපොරොත්තු වන මහ බැංකු සුරැකුම්පත් පහසුකම - T+0 16:15 පැය වන විට විශ්‍රාම ගැන්වීම T+1 08:30 පැය වන විට
කල්පිරෙන දින පියවීම් කටයුතු	ප්‍රතිමිලදීගැනුම් 08:00 පැය වන විට ප්‍රතිවිකුණුම් 11:00 පැය වන විට	11:00 පැය වන විට	ප්‍රතිමිලදීගැනුම් 08:00 පැය වන විට ප්‍රතිවිකුණුම් 11:00 පැය වන වි	අදාළ නොවේ	11:00 පැය වන විට	ව්‍යාපාර කටයුතු නිම වන විට	නිත්‍ය ණය පහසුකම් - 11.00 පැය වන විට	08:30 පැය වන විට
පාර්ශ්වකරුවන්	බලපත්‍රලාභී වාණිජ බැංකු/සේවක අර්ථසාධක අරමුදල	බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන්	බලපත්‍රලාභී වාණිජ බැංකු/සේවක අර්ථසාධක අරමුදල	බලපත්‍රලාභී වාණිජ බැංකු, බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් සහ සේවක අර්ථසාධක අරමුදල	බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන්	බලපත්‍රලාභී වාණිජ බැංකු	බලපත්‍රලාභී වාණිජ බැංකු, බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් සහ සේවක අර්ථසාධක අරමුදල	බලපත්‍රලාභී වාණිජ බැංකු, බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් සහ සේවක අර්ථසාධක අරමුදල
කාලසීමාව	දින 1 - 7	දින 1 - 7	දින 7 ට වඩා වැඩි	අදාළ නොවේ	දින 7 ට වඩා වැඩි	වසරක් දක්වා	එක් දින	වසරක් දක්වා

මෙහෙයුම් උපදෙස් අංක : 35/01/005/0007/18 2021 අගෝස්තු 19

සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන් වෙත,

සංචිත අවශ්‍යතා

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් මුදල් නීති පනත (ලංකා නීති ප්‍රඥප්තියේ 422 වන අධිකාරිය) සංශෝධිත පරිදි 10(ඇ), 93, 94, 96 සහ 97 වැනි වගන්ති යටතේ 2013 අප්‍රේල් 12 වැනි දින අංක 1805/39 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද සංශෝධිත (ඇ) නිවේදනය සම්බන්ධයෙන් ඔබගේ අවධානය යොමු කරවනු ලැබේ.

2. ඉහත සඳහන් නිවේදනය ප්‍රකාර සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදලින් පවත්වා ගෙන යනු ලබන මුළු තැන්පතු වගකීම්වලින් සියයට හතරක (4.00%) ප්‍රමාණයක් සංචිතයක් ලෙස පවත්වාගෙන යා යුතුය.

3. 2020 ජුනි 17 වැනි දින මෙහෙයුම් උපදෙස් අංක 35/01/005/0007/17 හි (අ) උපලේඛනය මෙහි අමුණා ඇති (අ) උපලේඛනය ලෙස ප්‍රතිෂ්ඨාපනය වේ.

4. ඉහත සඳහන් සංශෝධනය 2021 සැප්තැම්බර් 01 දිනෙන් ආරම්භ වන සංචිත කාල පරිච්ඡේදයේ සිට බලපැවැත්වෙනු ඇත. 2013 අප්‍රේල් 22 වැනි දින අංක 35/01/005/0007/06 දරන මෙහෙයුම් උපදෙස්වල අඩංගු අනෙකුත් සංශෝධිත උපදේශන තවදුරටත් බලපැවැත්වෙනු ඇත.

ආචාර්ය ආර්. ඒ. අනිල් පෙරේරා
අධ්‍යක්ෂ/දේශීය මෙහෙයුම් කටයුතු

'අ' උපලේඛනය

වාර්තා කිරීමේ ආකෘතිය

දෛනික තැන්පතු වගකීම් සාමාන්‍ය පිළිබඳ වාර්තාව

බැංකුවේ නම : .....

කාල වකවානුව : ..... සිට ..... දක්වා
(දිනය) (දිනය)

වෙත : අධ්‍යක්ෂ,
දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා මහ බැංකුව,
කොළඹ 01.

ඉහත දක්වා ඇති කාල පරාසයේ එක් එක් දිනයට අදාළ දෛනික ව්‍යාපාර කටයුතු අවසානයේ දී, බැංකුවේ පොත්වල සඳහන් තැන්පතු ශේෂය පදනම් කරගෙන පහත සඳහන් ආකාරයට තැන්පතු වගකීම් හි සාමාන්‍යය වාර්තා කළ යුතුය.

(i)	(ii)	(iii)	(iv)
ඉල්ලුම් තැන්පතු	**කාලීන හා ඉතුරුම් තැන්පතු**	**ණයවර ලිපි / ප්‍රතිග්‍රහණය මත ලියවිලි සඳහා ආන්තික අවශ්‍යතාව**	**අනෙකුත් සියළුම තැන්පතු වගකීම්[1]**

1. **තැන්පතු සහතික සම්බන්ධයෙන් ගෙවිය යුතු මුදල විය යුත්තේ ප්‍රකාශ කළ වටිනාකමයි.**

සංචිත අවශ්‍යතා

අදාළ සංචිත කාල පරිච්ඡේදය : .....

අයිතමය	අගය ශ්‍රී ලංකා රුපියල් වලින්
1. ණයවර ලිපි සඳහා වන සියයට 100 ක සාමාන්‍ය දෛනික සමස්ත ආන්තික අවශ්‍යතාව පහත දක්වා ඇති ණයවර ලිපි සඳහා අවස්ථානෝචිතව සුදුසු පරිදි: (අ) (i) 2018 සැප්තැම්බර් මස 19 දින අංක 35/01/005/0010/20 දරන "මෝටර් රථ ආනයනය කිරීම සඳහා වන ණයවර ලිපි" චක්‍රලේඛය මඟින් දක්වා ඇති ආන්තික අවශ්‍යතාව හෝ (ii) 2018 සැප්තැම්බර් මස 29 දින අංක 35/01/005/0010/21 දරන "මෝටර් රථ හා අත්‍යවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයනය කිරීම සඳහා වන ණයවර ලිපි" චක්‍රලේඛය මඟින් දක්වා ඇති ආන්තික අවශ්‍යතාව. (ආ) 2018 ඔක්තෝබර් මස 11 දින චක්‍රලේඛ අංක 2 දරන ප්‍රතිග්‍රහණය මත ලියකියවිලි ලබා දීමේ කොන්දේසිය අනුව සිදුකරන ආනයන සඳහා වන ආන්තික අවශ්‍යතාව.	

අයිතමය	අගය ශ්‍රී ලංකා රුපියල් වලින්
2. ඉහත අංක 1 හැර දෛනික රුපියල් තැන්පතු වගකීම්වල මුළු එකතුවේ සාමාන්‍ය අගයෙන් සියයට 4.0 ක්.	
3. ඉහත (1) සහ (2) මඟින් ආවරණය වන තැන්පතු වගකීම්වල සාමාන්‍යයෙන් සියයට 2 ට වඩා වැඩියෙන් නමුත් සියයට 3 නොඉක්මවා තබාගෙන ඇති ශ්‍රී ලංකා රුපියල් කාසි හා නෝට්ටුවල සාමාන්‍යය.	
4. සංචිත නඩත්තු කාලය තුළ පවත්වා ගෙන යා යුතු මුළු සංචිත අවශ්‍යතාවය (1 + 2 - 3).	

ඉහත සඳහන් ප්‍රකාශය නිවැරදි සහ මෙම බැංකුවේ පොත්වලට අනුකූල බව ද, ශ්‍රී ලංකා මහ බැංකුවේ තත්කාර්යය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නියම කර ඇති නියෝගවලට අනුකූල බව ද අපි / මම සහතික කරමු / කරමි.

....

දිනය නිල මුද්‍රාව

සටහන -

(අ) බලපත්‍රලාභී වාණිජ බැංකු හැර වෙනත් ඕනෑම ආයතනයක් විසින් සිදු කරන තැන්පතු සහ ස්ථාන ගත කිරීම්, නියම කර ඇති අනුපාතවලට අනුව සංචිත අනුපාත පවත්වා ගෙන යාම සඳහා ගිණුම්ගත කළ යුතුය.

(ආ) සියලු අගයන් ආසන්න රුපියලට දැක්විය යුතුය.

2021 සැප්තැම්බර් 08

සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත,

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් 1949 අංක 58 දරන මුදල් නීති පනතේ අංක 103 වන වගන්තියේ විධිවිධානවලට අනුව ණයවර ලිපි මත මුදල් ආන්තික තැන්පතු පවත්වාගෙන යාමේ අවශ්‍යතාව පිළිබඳව නියෝගය

1. වහාම ක්‍රියාත්මක වන පරිදි බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් මෙහි අමුණා ඇති ලේඛනයේ සඳහන් කොට ඇති අයිතම ආනයනය සඳහා ණයවර ලිපි විවෘත කරන අවස්ථාවේ දී සියයට සියයක් (100%) ආවරණය වන පරිදි පොලී හිමිකම රහිත මුදල් ආන්තික තැන්පතුවක් ණයවර ලිපි විවෘත කරන බලපත්‍රලාභී වාණිජ බැංකුවෙහි තැන්පත් කර නොමැති අවස්ථාවක දී ණයවර ලිපි විවෘත නොකළ යුතු බව සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත මෙමඟින් දැනුම් දෙනු ලැබේ.
2. මෙම නියෝගය මඟින් ආවරණය වන අයිතම ආනයනය සඳහා තවදුරටත් පහත කොන්දේසි ද අදාළ විය යුතු බව බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත දැනුම් දෙයි.
   - අ) යම් ඉන්වොයිසියක, මෙම නියෝගය මඟින් ආවරණය නොවන අයිතම ඇතුළත් වුවද, මුදල් ආන්තික තැන්පතු අවශ්‍යතාව ඉන්වොයිසියේ මුළු වටිනාකම මත විය යුතුය.
   - ආ) ඉහත (1) හි සඳහන් මුදල් ආන්තික තැන්පතු කොන්දේසිවලට පරිබාහිරව මෙම නියෝගය මඟින් ආවරණය වන අයිතම ආනයනය සඳහා දැනටමත් විවෘත කර ඇති ණයවර ලිපිවල වටිනාකම වැඩි කිරීමට බලපත්‍රලාභී වාණිජ බැංකු අවසර නොදිය යුතුය.
   - ඇ) මෙම නියෝගය මඟින් පනවා ඇති අවම ආන්තික තැන්පතු අවශතාව සපුරා ගැනීමට හැකි වන පරිදි බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ගනුදෙනුකරුවන්ට අත්තිකාරම් ලබා නොදිය යුතුය.
   - ඈ) බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් මෙම නියෝගයට අනුකූලව මුදල් ආන්තික තැන්පතුව පවත්වා ගෙන යන බවට අදාළ ඉන්වොයිසිය මත පිටසන් කළ යුතුය.
   - ඉ) ආනයන නිෂ්කාශන සම්බන්ධව රේගු ලේඛන හා ශ්‍රී ලංකාවේ බැංකු පද්ධතිය හරහා ගෙවීම් පිළිබඳ ලේඛනමය සාක්ෂි ඉදිරිපත් කළ පසු ආන්තික තැන්පතුව නිදහස් කළ යුතුය.
3. දැනට බලපැවැත්වෙන ඕනෑම අවශ්‍යතාවක් සහ භාණ්ඩ ආනයනය කිරීමේදී වෙනත් ඕනෑම නීතියක් යටතේ හඳුන්වාදෙනු ලැබිය හැකි අවශ්‍යතාවන්ට අමතරව මෙම නියෝගයේ විධිවිධාන ද බලපැවැත්වේ.

ආචාර්ය ආර්. ඒ. අනිල් පෙරේරා
අධ්‍යක්ෂ/දේශීය මෙහෙයුම් කටයුතු

ඇමුණුම

අංකය	සංයෝජිත වර්ගීකරණ අංකය	අංකය	සංයෝජිත වර්ගීකරණ අංකය	අංකය	සංයෝජිත වර්ගීකරණ අංකය	අංකය	සංයෝජිත වර්ගීකරණ අංකය
1	030441	33	180620	65	220510	97	34011920
2	030449	34	180631	66	220820	98	34013020
3	030451	35	180632	67	220830	99	340600
4	030461	36	180690	68	22084010	100	40111010
5	030462	37	190211	69	220850	101	40111090
6	030469	38	190219	70	220860	102	40112011
7	030474	39	190220	71	220870	103	40112019
8	04029990	40	190230	72	240210	104	401130
9	040310	41	190240	73	24022050	105	401170
10	040390	42	190410	74	24022060	106	40118010
11	040510	43	190420	75	24031990	107	40118090
12	040620	44	20091190	76	24039990	108	40129010
13	040630	45	200971	77	33030010	109	40129090
14	040690	46	200979	78	33030021	110	401692
15	08041020	47	200990	79	33030022	111	420100
16	08051010	48	220210	80	33030029	112	420211
17	08052110	49	220291	81	330410	113	420212
18	080610	50	22029910	82	330420	114	420219
19	080620	51	22029930	83	330430	115	420221
20	080810	52	22029940	84	330491	116	420222
21	08109090	53	22029951	85	330499	117	420229
22	110412	54	22029959	86	330510	118	420231
23	110419	55	22029961	87	330520	119	420232
24	110422	56	22029969	88	330530	120	420239
25	110423	57	22029970	89	330590	121	420291
26	110429	58	22029991	90	330610	122	420292
27	110430	59	22029999	91	330690	123	420299
28	110510	60	22030010	92	330710	124	420310
29	110520	61	22030020	93	330720	125	420321
30	110710	62	22030090	94	330730	126	420329
31	110720	63	220410	95	330749	127	420330
32	110814	64	220421	96	33079090	128	420340

ඇමුණුම

අංකය	සංයෝජිත වර්ගීකරණ අංකය
129	42050010
130	430400
131	44219990
132	570292
133	570320
134	570330
135	570500
136	610120
137	610130
138	610190
139	610210
140	610220
141	610230
142	610290
143	610310
144	610322
145	610323
146	610329
147	610331
148	610332
149	610333
150	610339
151	610341
152	610342
153	610343
154	610349
155	610413
156	610419
157	610422
158	610423
159	610429
160	610431

අංකය	සංයෝජිත වර්ගීකරණ අංකය
161	610432
162	610433
163	610439
164	610442
165	610443
166	610444
167	610449
168	610452
169	610453
170	610459
171	610461
172	610462
173	610463
174	610469
175	610510
176	610520
177	610590
178	610610
179	610620
180	610690
181	610711
182	610712
183	610719
184	610721
185	610729
186	610791
187	610799
188	610811
189	610819
190	610821
191	610822
192	610829

අංකය	සංයෝජිත වර්ගීකරණ අංකය
193	610831
194	610832
195	610839
196	610891
197	610892
198	610899
199	610910
200	610990
201	611011
202	611012
203	611019
204	611020
205	611030
206	611090
207	611120
208	611130
209	611190
210	611211
211	611212
212	611219
213	611231
214	611239
215	611241
216	611249
217	611300
218	611420
219	611430
220	611490
221	611510
222	611529
223	611530
224	611594

අංකය	සංයෝජිත වර්ගීකරණ අංකය
225	611595
226	611596
227	611599
228	611610
229	611691
230	611692
231	611693
232	611699
233	611710
234	61178010
235	61178020
236	620111
237	620112
238	620113
239	620119
240	620192
241	620193
242	620199
243	620211
244	620212
245	620213
246	620219
247	620291
248	620292
249	620293
250	620299
251	620311
252	62031290
253	62031990
254	62032290
255	62032390
256	62032990

ඇමුණුම

අංකය	සංයෝජිත වර්ගීකරණ අංකය
257	620331
258	62033290
259	62033390
260	62033990
261	620341
262	62034290
263	62034390
264	62034990
265	62041290
266	62041390
267	62041990
268	62042290
269	62042390
270	62042990
271	620431
272	62043290
273	62043390
274	62043990
275	620441
276	62044290
277	62044390
278	62044490
279	62044990
280	62045290
281	62045390
282	62045990
283	620461
284	62046290
285	62046390
286	62046990
287	62052090
288	62053090

අංකය	සංයෝජිත වර්ගීකරණ අංකය
289	62059090
290	62061090
291	620620
292	62063090
293	62064090
294	62069090
295	620711
296	620719
297	62072290
298	62079190
299	62079990
300	62081190
301	62082190
302	62082290
303	62082990
304	62089190
305	62089290
306	62089990
307	620920
308	620930
309	620990
310	621010
311	621020
312	621030
313	621040
314	621050
315	621111
316	621112
317	621120
318	62113290
319	62113390
320	62113990

අංකය	සංයෝජිත වර්ගීකරණ අංකය
321	62114219
322	62114292
323	62114299
324	62114319
325	62114392
326	62114399
327	62114919
328	62114992
329	62114999
330	621210
331	621220
332	621230
333	621290
334	62132090
335	62139090
336	62141090
337	62144090
338	62149090
339	621510
340	621520
341	621590
342	621600
343	630110
344	630120
345	630130
346	630140
347	630190
348	630210
349	63022190
350	63022290
351	63022990
352	63023190

අංකය	සංයෝජිත වර්ගීකරණ අංකය
353	63023290
354	63023990
355	630240
356	63025190
357	63025990
358	63026090
359	63029190
360	63029390
361	63029990
362	630312
363	630319
364	630391
365	630392
366	630399
367	630411
368	63041990
369	630420
370	630491
371	63049290
372	63049390
373	63049990
374	63051090
375	630520
376	630532
377	630533
378	630539
379	630590
380	630612
381	630619
382	630622
383	630629
384	630630

ඇමුණුම

අංකය	සංයෝජිත වර්ගීකරණ අංකය
385	630640
386	630690
387	630710
388	630720
389	640212
390	64021910
391	64021919
392	640220
393	640291
394	640299
395	640312
396	64031910
397	64031919
398	640320
399	640340
400	640351
401	640359
402	640391
403	640399
404	640411
405	640419
406	640420
407	640510
408	640520
409	640590
410	650100
411	650200
412	650400
413	65050010
414	65050090
415	65069110
416	65069190

අංකය	සංයෝජිත වර්ගීකරණ අංකය
417	65069910
418	65069990
419	650700
420	660110
421	660191
422	660199
423	670300
424	670411
425	670419
426	670420
427	670490
428	69120010
429	701310
430	701322
431	701328
432	701333
433	701337
434	701341
435	701342
436	701349
437	701391
438	70139990
439	701810
440	701820
441	732111
442	732112
443	732119
444	732181
445	732182
446	732189
447	732310
448	732391

අංකය	සංයෝජිත වර්ගීකරණ අංකය
449	732392
450	732393
451	732394
452	732399
453	73241010
454	73241090
455	732421
456	732429
457	732490
458	76151020
459	76151090
460	821599
461	830520
462	830629
463	841451
464	841459
465	84151021
466	84151022
467	84151023
468	84151024
469	84151029
470	84151032
471	84151033
472	84151034
473	84151035
474	84151039
475	84158190
476	84158290
477	84158390
478	84159019
479	84159029
480	84181090

අංකය	සංයෝජිත වර්ගීකරණ අංකය
481	84182190
482	84182920
483	84182990
484	84501110
485	84501131
486	84501132
487	84501133
488	84501134
489	84501139
490	84501141
491	84501142
492	84501143
493	84501144
494	84501149
495	84501210
496	84501231
497	84501232
498	84501233
499	84501234
500	84501239
501	84501910
502	84501931
503	84501932
504	84501933
505	84501934
506	84501939
507	850811
508	850940
509	850980
510	851010
511	851020
512	851030

ඇමුණුම

අංකය	සංයෝජිත වර්ගීකරණ අංකය
513	85131010
514	85131090
515	851610
516	851621
517	851629
518	851631
519	851632
520	851633
521	851640
522	851650
523	85166010
524	85166090
525	851671
526	851672
527	85167910
528	85167920
529	851680
530	851711
531	85171210
532	85171220
533	85171290
534	851718
535	85258090
536	852712
537	852713
538	852719
539	852721
540	852729

අංකය	සංයෝජිත වර්ගීකරණ අංකය
541	852791
542	852792
543	852799
544	85285990
545	852869
546	85287120
547	85287190
548	85287210
549	85287231
550	85287232
551	85287233
552	85287234
553	85287235
554	85287236
555	85287239
556	85287241
557	85287249
558	85287291
559	85287299
560	85287320
561	85287390
562	85291010
563	85291090
564	852990
565	85392110
566	85392190
567	85392210
568	85392220

අංකය	සංයෝජිත වර්ගීකරණ අංකය
569	85392290
570	853929
571	85392910
572	85392990
573	85393110
574	853949
575	853950
576	853990
577	900410
578	910121
579	910211
580	910219
581	910221
582	910229
583	910521
584	920290
585	920710
586	920890
587	94012090
588	94013090
589	94017190
590	94019090
591	94032090
592	94039090
593	94051010
594	94051020
595	94051090
596	94052010

අංකය	සංයෝජිත වර්ගීකරණ අංකය
597	94052020
598	94052090
599	940530
600	94054010
601	94054020
602	94054030
603	94054040
604	94054090
605	94055010
606	94055020
607	94055090
608	940560
609	940591
610	940592
611	94059910
612	94059990
613	95030010
614	95030030
615	95030050
616	95030070
617	95030090
618	950420
619	950440
620	950450
621	95049090
622	950510
623	961590

2021 ඔක්තෝබර් 01

සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත,

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් 1949 අංක 58 දරන මුදල් නීති පනතේ අංක 103 වන වගන්තියේ විධිවිධානවලට අනුව ණයවර ලිපි මත මුදල් ආන්තික තැන්පතු පවත්වා ගෙන යාමේ අවශ්‍යතාව පිළිබඳ නියෝගය

1949 අංක 58 දරන මුදල් නීති පනතේ අංක 103 වන වගන්තියේ විධිවිධානවලට අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් 2021 සැප්තැම්බර් 08 දිනැතිව නිකුත් කරන ලද ණයවර ලිපි මත මුදල් ආන්තික තැන්පතු පවත්වා ගෙන යාමේ අවශ්‍යතාව පිළිබඳ නියෝගය අද දින (2021 ඔක්තෝබර් 01) සිට බලපැවැත්වෙන පරිදි අහෝසි කරන ලද බව සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත මෙමඟින් දන්වනු ලැබේ.

ආචාර්ය ආර්. ඒ. අනිල් පෙරේරා
අධ්‍යක්ෂ/දේශීය මෙහෙයුම් කටයුතු

විදේශ විනිමය දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා මහ බැංකුව

2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2021 අංක 01 දරන විධානයන්

බලපත්‍රලාභී මූල්‍ය සමාගම් සඳහා තාවකාලික විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් සම්බන්ධයෙන් බලයලත් වෙළඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්

2017 අංක 03 දරන විදේශ විනිමය (විදේශ විනිමය ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යෑම) නියෝග සහ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි 6 වන වගන්තිය සමඟ කියවිය යුතු 2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි 9 වන වගන්තිය ප්‍රකාරව, පහත සඳහන් කරුණුවලට යටත්ව විදේශ ව්‍යවහාර ණය මුදල් ආපසු ගෙවීම සම්බන්ධයෙන් වන විදේශ විනිමය අවදානම ආවරණය කිරීම සඳහා බලපත්‍රලාභී මූල්‍ය සමාගම් වලට තාවකාලික විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් විවෘත කර පවත්වාගෙන යෑමට අවසර ලබා දී ඇත.

1.1 සුදුසුකම් ලත් තැනැත්තන්

(අ) 2011 අංක 42 දරන මූල්‍ය ව්‍යාපාර පනතේ යටතේ බලපත්‍ර හිමි බලපත්‍රලාභී මූල්‍ය සමාගම් (සංශෝධනය කළ හැකි පරිදි)

1.2 ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යෑම

(අ) ණය මුදල සඳහා අදාළ වන විදේශ ව්‍යවහාර මුදල් ඒකකයෙන් දේශීය බැංකු ඒකකයක් තුළ ඉතුරුම් හෝ කාලීන තැන්පතු ලෙස තාවකාලික විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් විවෘත කර පවත්වාගෙන යා හැක.

1.3 අවසරලත් හර කිරීම්

(අ) විදේශීය ණය ලබාදෙන්නාගේ ආමුඛ ආයෝජන ගිණුම් තුළින් ගලා එන විදේශ ව්‍යවහාර මුදල් ණය හා සම්බන්ධ ලැබීම්.

(ආ) අවශ්‍ය වන විටක දී, ශ්‍රී ලංකා රුපියල් විදේශ ව්‍යවහාර මුදල් බවට පරිවර්තනය කර සිදු කරනු ලබන පොලී සහ ණය සම්බන්ධ අනෙකුත් අය කිරීම්, ආපසු ගෙවීම්.

(ඇ) වෙනත් බලයලත් වෙළන්දෙකුගෙන් ද්වීපාර්ශවික/ ප්‍රතිපාර්ශවීය ගිවිසුම් කල් පිරීමෙන් පසු විදේශ ව්‍යවහාර මුදල් හුවමාරු කිරීම හෝ අදාළ ණය සම්පූර්ණයෙන් ගෙවන තෙක් වෙනත් ඕනෑම ව්‍යුත්පන්න උපකරණයක්

(ඈ) ගිණුමේ ඇති අරමුදල් මත විදේශ ව්‍යවහාර මුදලින් උපයන පොලිය.

1.4 අවසරලත් බැර කිරීම්

(අ) විදේශ විනිමය හුවමාරු ගිවිසුමකට හෝ අදාළ ගිවිසුම් අනුව වෙනත් ඕනෑම ව්‍යුත්පන්න උපකරණයක් වෙත යොමු වීම සඳහා වෙනත් බලයලත් වෙළන්දෙකු වෙත විදේශ ව්‍යවහාර මුදල් හුවමාරු කිරීම

(ආ) දාළ ගිවිසුම්හී සඳහන් ආපසු ගෙවීමේ නියමයන් අනුව, විදේශ ව්‍යවහාර මුදල් ණය ආපසු ගෙවීම සඳහා (ප්‍රාග්ධන, පොළිය, ගාස්තු හා අනෙකුත් අයකිරීම් ඇතුළත්ව) විදේශීය ණය ලබාදෙන්නාගේ ආමුඛ ආයෝජන ගිණුමට අරමුදල් මාරු කිරීම.

(ඇ) ශ්‍රී ලංකා රුපියල් වලින් ශ්‍රී ලංකාව තුළ වන මුදල් වියදම්.

2. අනිකුත් කොන්දේසි

(අ) කිසිඳු තත්ත්වයක් යටතේ තාවකාලික විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුමේ සීමාව ඉක්මවා නොයා යුතු ය.

(ආ) බලපත්‍රලාභී මූල්‍ය සමාගම් විසින් ලබා ගත් සෑම ණය මුදලක් සඳහා ම බලයලත් වෙළඳුන් විසින් එක් තාවකාලික විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් පමණක් පවත්වාගෙන යා යුතු වේ. තාවකාලික විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් විවෘත කරන

අවස්ථාවේ දී බලපත්‍රලාභී මූල්‍ය සමාගම් වෙතින් මේ සම්බන්ධයෙන් දිවුරුම් ප්‍රකාශයක් බලයලත් වෙළඳුන් විසින් ලබා ගත යුතු වේ.

(ඇ) තාවකාලික විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම හරහා සිදු කරන ලද ගනුදෙනුහී සත්‍යතාවය සනාථ කිරීම සඳහා සහ මෙම විධානයන් හා අනුගත වීම තහවුරු කිරීම සඳහා ප්‍රමාණවත් ලේඛනමය සාක්ෂි ලබා ගත යුතු වේ.

(ඈ) තාවකාලික විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම පවත්වාගෙන යන කාල සීමාව තුළ දී, ව්‍යවස්ථාපිත වාර්තා තබා ගැනීමේ අවශ්‍යතා ඉක්මවා, ගිණුම හරහා සිදු කරන ගනුදෙනු පිළිබඳව ප්‍රමාණවත් ලේඛනමය සාක්ෂි (දෘඪ පිටපතක් හෝ ඉලෙක්ට්‍රොනික්/ ඩිජිටල් මාධ්‍යයෙන්) පවත්වාගෙන යා යුතු වේ.

3. **තාවකාලික විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් වැසීම**

(අ) ගැනුම්කරුවා විසින් අදාළ ණය මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කිරීමෙන්/ ආපසු ගෙවීමෙන් පසු බලයලත් වෙළඳුන්හට තාවකාලික විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම වැසිය හැකි වේ.

(ආ) ගිණුම වසා සතියක කාලයක් ඇතුළත අධ්‍යක්ෂ / විදේශ විනිමය දෙපාර්තමේන්තුව වෙත dfem@cbsl.lk විද්‍යුත් ලිපිනය මගින් ඊමේල් පණිවුඩයක් යොමු කිරීමෙන් බලයලත් වෙළඳුන් විසින් එවැනි දැනුම් දීම් කළ යුතු වේ.

4. මෙම විධානයන්ගේ විෂය පථයෙන් පරිබාහිර ඕනෑම අරමුණක් සඳහා තාවකාලික විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට ඕනෑම ගනුදෙනුවක්/ මුදල් මාරු කිරීමක්, ගිණුම ට/මෙන් සිදු කිරීමට බලයලත් වෙළඳුන් විසින් විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකගෙන් පූර්ව අවසරයක් ගත යුතු වේ.

5. **වාර්තාකරණ අවශ්‍යතා**

තාවකාලික විශේෂ විදේශ ව්‍යවහාර ගිණුමේ හර හා බැර තහවුරු කරමින් එවිය යුතු වාර්තා, කාර්තුමය පදනමින් හෝ පසු මාසයේ 15 වන දිනට හෝ ඊට පෙර අදාල බලයලත් වෙළෙඳුන්ගේ අනුකූලතා නිලධාරියා මඟින් විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත dfem@cbsl.lk යන විද්‍යුත් ලිපිනය ඔස්සේ ඊමේල් පණිවුඩයකින් වාර්තා කළ යුතු ය.

6. **මෙකී විධානයන්ගේ අරමුණු සඳහා**

(අ) "විදේශ ව්‍යවහාර මුදල් ණය" යනු 2011 අංක 42 දරන මූල්‍ය ව්‍යාපාර පනත (සංශෝධනය කළ හැකි පරිදි) ප්‍රකාරව, ශ්‍රී ලංකාවෙන් පිටත වාසිකයන් (විදේශ ණය හිමියන්) වෙතින් ලබා ගන්නා ණය වේ.

7. බලයලත් වෙළඳුන් හෝ මෙම විධානයන් යටතේ විදේශ විනිමය වෙළඳාම් කරනු ලබන තැනැත්තන් මෙම විධානයන්ගෙන් අවසර ලබා දෙන දෑ වෙනත් නීතියක විධිවිධාන හා අනුගත වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් වීමට, විශෝධනයට හෝ වැළැක්වීමට අර්ථකථනය නොකළ යුතුය.

අතිරේක අධ්‍යක්ෂ/ විදේශ විනිමය
දෙපාර්තමේන්තුව
2021 ජනවාරි 15

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2213/34- 2021 පෙබරවාරි මස 03 වැනි බදාදා - 2021.02.03

I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

රජයේ නිවේදන

2017 අංක 12 දරන විදේශ විනිමය පනත

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ (පනත) 7 වන වගන්තිය සමග කියවිය යුතු 29 වන වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

මහින්ද රාජපක්ෂ,
මුදල් අමාත්‍ය.

2021 පෙබරවාරි මස 03 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 2021 අංක 1 දරන විදේශ විනිමය (ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු වර්ග) නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර 2021 මාර්තු මස 22 වන දින සිට ක්‍රියාත්මක විය යුතුය.

2. ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත සිදු කරනු ලබන මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ප්‍රාග්ධන ගනුදෙනු, මේ නියෝගවල සහ මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති එම සීමා, නියම සහ කොන්දේසිවලට යටත්ව, පනතේ 4 වන වගන්තියේ නිශ්චිතව සඳහන් ප්‍රමාණයට බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු විසින් සිදු කරනු ලැබීමට අවසර දෙනු ලැබූ බලයලත්, විදේශ විනිමයෙන් වූ ප්‍රාග්ධන ගනුදෙනු වර්ග විය යුතු ය.

3. මේ නියෝග යටතේ විදේශ විනිමයෙන් වූ ප්‍රාග්ධන ගනුදෙනු සිදු කිරීමේ දී සෑම බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු විසින් ම පනතේ 9 වන වගන්තිය යටතේ, කලින් කලට, මහ බැංකුව විසින්, ඒ සම්බන්ධයෙන් නිකුත් කරනු ලබන විධානවලට අනුකූල විය යුතු ය.

4. (1) මේ නියෝග යටතේ විදේශ විනිමයෙන් වූ ප්‍රාග්ධන ගනුදෙනු සිදු කිරීමේ නිරත වන සෑම බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු විසින් ම -

(අ) ගනුදෙනුව සිදු කරනු ලබන තැනැත්තාගේ සද්භාවය ; සහ

(ආ) එම ගනුදෙනුව මේ නියෝගවලට අනුකූල වන බව,

ඒ සඳහා වූ ලේඛනගත සාක්ෂි ලබාගැනීම මගින් නිශ්චය කරගනු ලැබිය යුතු ය.

(2) මේ නියෝග යටතේ ප්‍රාග්ධන ගනුදෙනුවල නිරත වන සෑම තැනැත්තකු විසින් ම (1) වන ඡේදයේ කාර්යය සඳහා යම් බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු වෙත අවශ්‍ය සියලු ලේඛනගත සාක්ෂි සපයනු ලැබිය යුතු ය.

(3) මේ නියෝග යටතේ විදේශ විනිමයෙන් වූ ප්‍රාග්ධන ගනුදෙනු සිදු කිරීමේ දී සෑම බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු විසින් ම පූර්ණ නිසි උද්යෝගයෙන් කටයුතු කරනු ලැබිය යුතු ය.

5. මේ නියෝගවලට අනුකූලව ක්‍රියා කිරීමට අපොහොසත්වන, යම් බලයලත් වෙළෙන්දකු, පරිසීමිත වෙළෙන්දකු හෝ බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු නොවන යම් තැනැත්තකු සම්බන්ධයෙන් පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් අවශ්‍ය වන බවට සලකනු ලැබිය හැකි පරිදි යම් ක්‍රියාමාර්ග ගනු ලැබිය හැකි ය.

6. (1) මේ නියෝගවල කාර්යය සඳහා "නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල්" යන්නෙන් -

(අ) එක්සත් ජනපද ඩොලර් (එ.ජ.ඩො);

(ආ) යූරෝ;

(ඇ) ස්විට්ස්ලිං පවුම්;

(ඈ) ඕස්ට්‍රේලියානු ඩොලර්;

(ඉ) සිංගප්පූරු ඩොලර්;

(ඊ) ස්වීඩන ක්‍රෝනර්;

(උ) ස්විස් ෆ්‍රෑන්ක්;

(ඌ) කැනේඩියානු ඩොලර්;

(එ) හොංකොං ඩොලර්;

(ඒ) ජපන් යෙන්;

(ඔ) ඩෙන්මාර්ක ක්‍රෝනර්;

(ඕ) නෝර්වීජියානු ක්‍රෝනර්;

(ක) චීන රෙන්මින්බිඳ සහ

(ග) නවසීලන්ත ඩොලර්.

අදහස් වේ.

(2) මහ බැංකුව විසින්, පනතේ 9 වන වගන්තිය යටතේ ඒ සම්බන්ධයෙන් නිකුත් කරනු ලබන විධාන මගින්, කලින් කලට (1) වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ එකතු කිරීම සිදුකරනු ලැබිය හැකි ය.

7. 2017 නොවැම්බර් මස 17 වන දින අංක 2045/56 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද 2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ සාදනු ලැබූ 2017 අංක 1 දරන විදේශ විනිමය (බලයලත් වෙළෙන්දන් වන බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සිදුකරනු ලබන විදේශ විනිමයෙන් වූ ප්‍රාග්ධන ගනුදෙනු වර්ග) නියෝග, ඒ යටතේ කරන ලද කිසිවකට අගතියක් නොමැතිව මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

එසේ වුව ද, ඉහත සඳහන් නියෝග පරිච්ඡින්න කිරීම නොතකා, 2020 දෙසැම්බර් මස 18 වන දින අංක 2206/25 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද නියමය මගින් වලංගු කාල සීමාව දීර්ඝ කරන ලද, 2020 ජූලි මස 2 වන දින අංක 2182/37 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද සහ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 22 වන වගන්තිය යටතේ කරන ලද නියමය, එසේ දීර්ඝ කරන ලද කාල සීමාව තුළ දී බල පැවැත්විය යුතු ය.

8. මේ නියෝගයන්හි කාර්යය සඳහා -

"පනත" යන්නෙන්, 2017 අංක 12 දරන විදේශ විනිමය පනත අදහස් වේ;

"බලයලත් වෙළෙන්දා" යන්නට, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"ප්‍රාග්ධන ගනුදෙනුව" යන්නට, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"මහ බැංකුව" යන්නට, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"කොළඹ කොටස් හුවමාරුව" යන්නෙන්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ පිහිටුවා ලියාපදිංචි කරන ලද සහ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක් වශයෙන් ක්‍රියා කිරීම සඳහා 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත යටතේ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් බලපත්‍ර ප්‍රදානය කළ කොළඹ කොටස් හුවමාරුව අදහස් වේ.

"ඇපයෙන් සීමිත සමාගම්" යන්නට, 2007 අංක 7 දරන සමාගම් පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"සුදුසුකම්ලත් නේවාසික ආයෝජකයා" යන්නෙන්, මේ නියෝගවල උපලේඛනයේ i වන කොටසේ 3 වන ඡේදයේ සඳහන් වූවන් හැර මේ නියෝගවල උපලේඛනයේ i වන කොටසේ 2 වන ඡේදයේ 1 වන වගුවෙහි 1 වන තීරයේ නිශ්චිතව දක්වා ඇති පරිදි වන සුදුසුකම්ලත් නේවාසික ආයෝජකයකු අදහස් වේ;

"විගාමිකයා" යන්නට, කලින් කලට සංශෝධනය කරනු ලැබිය හැකි පරිදි වන 2021 පෙබරවාරි මස 03 දිනැති අංක 2213/36 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2021 අංක 3 දරන විදේශ විනිමය (විගාමිකයන් විසින් අරමුදල් ප්‍රේෂණය කිරීම) නියෝගවල දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"සේවක කොටස් හිමිකම් සැලැස්ම හෝ සේවක කොටස් වරණීය ක්‍රමය" යන්නෙන් ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද සමාගමක් එහි කොටස් හෝ සමූහ සමාගමේ කොටස්, ශ්‍රී ලංකාව තුළ ඇති එම සමාගමේ ශාඛාවක හෝ පාලිත සමාගමක සේවකයන් හට අත්කර ගැනීම සඳහා අවස්ථාවක් පිරිනමන සැලැස්මක් හෝ ක්‍රමයක් අදහස් වේ;

"සමීපත ම පවුලේ සාමාජිකයන්" යන්නෙන් අදාළ තැනැත්තාගේ දෙමාපියන්, කලත්‍රයා සහ දරුවන් අදහස් වේ;

"ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව" යන්නෙන්, 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව අදහස් වේ;

"බලපත්‍රලාභී වාණිජ බැංකුව" යන්නට, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"බලපත්‍රලාභී විශේෂිත බැංකුව" යන්නට, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"මුදල් මණ්ඩලය" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"විදේශ සමාගම" යන්නට, 2007 අංක 7 දරන සමාගම් පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"ඉවත් කරන ලද විනිමය පාලන පනත" යන්නෙන්, (423 වන අධිකාරය වූ) විනිමය පාලන පනත අදහස් වේ;

"පරිසීමිත වෙළෙන්දා" යන්නට, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව" යන්නෙන්, 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව අදහස් වේ;

"ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන" යන්නට, 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම) පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය.

(2 වන නියෝගය)

උපලේඛනය

I වන කොටස

ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු

1. යම් සුදුසුකම්ලත් නේවාසික ආයෝජකයකු වෙත-

(අ) ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද සමාගම් විසින් නිකුත් කරන ලද සාමාන්‍ය කොටස් හෝ වරණීය කොටස් හෝ ණයකර හෝ සංස්ථායී බැඳුම්කර, නියාමනය කරන ලද ඒකක භාරවල හෝ අන්‍යෝන්‍ය අරමුදල්වල ඒකක සහ ආයෝජනය සිදු කරන අවස්ථාවේ දී ශ්‍රී ලංකාවේ ස්වෛරී ණය ශ්‍රේණිගත කිරීමක ශ්‍රේණියට හෝ ඊට ඉහළින් ශ්‍රේණිගත කර ඇති විදේශීය රජයන් විසින් නිකුත් කරනු ලබන ස්වෛරීත්ව බැඳුම්කර අත්කර ගැනීම, දැරීම හෝ බැහැර කිරීම සඳහා;

(ආ) (තනි පුද්ගලයකු විසින් හැර) විදේශ රටක ශාඛාවක්, සම්බන්ධීකරණ, අලෙවිකරණ, අනුයෝජිත, ව්‍යාපෘති, නියෝජිත හෝ වෙනත් ඒ හා සමාන කාර්යාලයක් (විදේශීය කාර්යාලයක්) පිහිටුවීම සඳහා සහ පවත්වා ගෙන යාම සඳහා, අවසර දෙනු ලැබේ.

2. (1) ඉහත 1 වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති ප්‍රාග්ධන ගණුදෙනුවලට අදාළ ප්‍රතිමුඛ ප්‍රේෂණ, මේ නියෝගවල විධිවිධානවලට සහ පහත දැක්වෙන 1 වන වගුවේ නිශ්චිතව දක්වා ඇති සීමාවන්ට යටත්ව, සුදුසුකම්ලත් නේවාසික ආයෝජකයකු විසින්, බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු සමඟ විවෘත කර පවත්වාගෙන යනු ලබන ප්‍රතිමුඛ ආයෝජන ගිණුමක් හරහා සිදු කරනු ලැබිය යුතු ය.

1 වන වගුව - ප්‍රතිමුඛ ආයෝජන සඳහා වන සීමාවන්

	I වන තීරය සුදුසුකම්ලත් නේවාසික ආයෝජකයා	II වන තීරය අවසරලත් සීමාවන්	III වන තීරය ආයෝජන වර්ගය
(i)	කොළඹ කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගත සමාගම්	ලිත් වර්ෂයක් සඳහා එක්සත් ජනපද ඩොලර් (එ.ජ.ඩො.) 2,000,000 හෝ වෙනත් යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් ඊට සමාන ප්‍රමාණයක්	සාමාන්‍ය කොටස්, ඒකක, වරණීය කොටස්, සංස්ථායී බැඳුම්කර, ණයකර සහ ස්වෛරීත්ව බැඳුම්කර
(ii)	කොළඹ කොටස් හුවමාරුවෙහි ලැයිස්තු ගත නොකළ සමාගමක්	ලිත් වර්ෂයක් සඳහා එ.ජ.ඩො. 500,000 හෝ වෙනත් යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් ඊට සමාන ප්‍රමාණයක්	
(iii)	මහ බැංකුව, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව හෝ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව යටතේ (ඉහත (i) සහ (ii) යටතේ සුදුසුකම්ලත් ආයෝජකයන් හැර) නියාමනය කරනු ලබන හෝ බලපත්‍රලාභී අස්ථිත්වයන්	ලිත් වර්ෂයක් සඳහා එ.ජ.ඩො. 500,000 හෝ වෙනත් යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් ඊට සමාන ප්‍රමාණයක්	

1 වන වගුව - ප්‍රතිමුඛ ආයෝජන සඳහා වන සීමාවන්

	I වන තීරය සුදුසුකම්ලත් නේවාසික ආයෝජකයා	II වන තීරය අවසරලත් සීමාවන්	III වන තීරය ආයෝජන වර්ගය
(iv)	1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ පිහිටුවන ලද සේවක අර්ථසාධක අරමුදල හෝ කම්කරු කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරන ලද වෙනත් යම් අර්ථසාධක අරමුදලක්	ලිත් වර්ෂයක් සඳහා එ.ජ.ඩො. 500,000 හෝ වෙනත් යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් ඊට සමාන ප්‍රමාණයක්	සාමාන්‍ය කොටස්, ඒකක, වරධෑය කොටස්, සංස්ථායී බැඳුම්කර, ණයකර සහ ස්වෛරීත්ව බැඳුම්කර
(v)	ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලද හවුල් ව්‍යාපාරයක්	ජීවිත කාලයටම, එ.ජ.ඩො. 300,000ක් හෝවෙනත් යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් ඊට සමාන ප්‍රමාණයක්	
(vi)	පුද්ගලයකු හෝ (සමස්තයක් වශයෙන්) එකී පුද්ගලයාගේ තනි පුද්ගල ව්‍යාපාරයක්	ජීවිත කාලයටම, එ.ජ.ඩො. 200,000 හෝ වෙනත් යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් ඊට සමාන ප්‍රමාණයක්	
(vii)	සමාගමක් හෝ හවුල් ව්‍යාපාරයක්	ලිත් වර්ෂයක් සඳහා එ.ජ.ඩො. 300,000 හෝ වෙනත් යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් ඊට සමාන ප්‍රමාණයක්	විදේශීය කාර්යාල
(viii)	බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු	ලිත් වර්ෂයක් සඳහා එ.ජ.ඩො. 500,000 හෝ වෙනත් යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් ඊට සමාන ප්‍රමාණයක්	ශාඛා කාර්යාල
සීමාවන්ට යටත් නොවන අවසරලත් ආයෝජන			
(ix)	පුද්ගලයකු	සේවක කොටස් හිමිකම් සැලැස්මෙහි හෝ සේවක කොටස් වරණීය ක්‍රමයෙහි සංස්ථා ප්‍රකාශයේ ඇති මුදල් ප්‍රමාණය දක්වා	සේවක කොටස් හිමිකම් සැලැස්මෙහි/සේවක කොටස් වරණීය ක්‍රමයෙහි කොටස්වල ආයෝජනය කිරීම.
(x)	බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු (ආයෝජනය, විදේශයන්හි බැංකු කටයුතු සඳහා වන්නේ නම් පමණක්)	ආයෝජිත රටෙහි නියාමකවරයා විසින් පනවනු ලබන සීමාව දක්වා	පාලිත සමාගමක කොටස්වල ආයෝජනය කිරීම හෝ ශාඛා කාර්යාලයක ආයෝජනය කිරීම

(2) ඉහත 1 වන වගුවේ නිශ්චිතව දක්වා ඇති ආයෝජන සඳහා වන සමස්ත සීමා, මේ නියෝග යටතේ සිදු කරන ලද සමස්ත ආයෝජන සහ ඉවත් කරන ලද විනිමය පාලන පනත ප්‍රකාර නිකුත් කරන ලද 2011 ජනවාරි මස 1 වන දිනැති අංක 1686/50 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද නියමය සහ 1686/52 සහ 1686/53 දරන අති විශේෂ ගැසට් පත්‍රවල පළකරන ලද දැන්වීම් සහ 2017 නොවැම්බර් මස 17 වන දිනැති අංක 2045/56 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද 2017 අංක 1 දරන විදේශ විනිමය (බලයලත් වෙළෙන්දන් වන බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සිදු කරනු ලබන විදේශ විනිමයෙන් වූ ප්‍රාග්ධන ගනුදෙනු වර්ග) නියෝග මගින් ප්‍රදානය කරන ලද පොදු අවසරය ප්‍රකාරව මින් පෙර සිදු කරන ලද යම් ප්‍රතිමුඛ ගෙවීම්වලින් සමන්විත විය යුතු ය.

3. ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන, ඇපයෙන් සීමිත සමාගමක් සහ ඉවත් කරන ලද විනිමය පාලන පනතේ විධිවිධාන යටතේ යම් සිවිල් හෝ අපරාධ නඩුවක් හෝ නීති කෘත්‍යයක් හෝ, පනතේ විධිවිධාන ප්‍රකාරව අභිචෝදනා කිරීමක්, විමර්ශනයක් හෝ යම් ආපසු අය කර ගැනීමේ නඩුවක් පවතින්නේ ශ්‍රී ලංකාවේ යම් නේවාසික තැනැත්තකුට එරෙහිව ද එකී තැනැත්තා උපලේඛනයේ මේ කොටස යටතේ අවසර ලබා දී ඇති කාර්යයන් සඳහා ප්‍රාග්ධන ගණුදෙනු සිදු කිරීමට සුදුසුකම් නොලැබිය යුතු ය.

4. උපලේඛනයේ මේ කොටසේ 2 වන ඡේදයේ 1 වන වගුවේ නිශ්චිතව දක්වා ඇති සීමාවන් නොතකා, නිකුත් කරන්නා විසින් සිදු කරන ලද සංස්ථායී ක්‍රියාවක් ප්‍රකාරව හෝ මේ නියෝග යටතේ අත්පත් කරගන්නා ලද වරණීය කොටස්, ණයකර හෝ සංස්ථායී බැඳුම්කර පරිවර්තනය කිරීමක් මගින්, ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද සමාගම්වල ඒකාබද්ධ වීමක් හෝ සම්බන්ධනය වීමක් මගින් එම ආයෝජකයා වෙත පැවරෙන කොටස් අත්පත් කර ගැනීම හෝ දැරීම සඳහා උපලේඛනයේ මේ කොටසේ 1 වන ඡේදය යටතේ ආයෝජනය කරන ලද යම් සුදුසුකම්ලත් නේවාසික ආයෝජකයෙකු වෙත අවසර ලබා දෙනු ලැබේ.

5. ප්‍රතිෂ්ඨාවක් නොමැතිව විදේශයන්හි වත්කම් හෝ ආයෝජන අත්පත්කර ගැනීම.

(1) විදේශ විනිමයෙන් හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් හෝ වත්කම් ආකාරයෙන් හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද සමාගමකින් හෝ ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික යම් තැනැත්තකුගෙන් ලැබිය යුතු දෙයකට හුවමාරුවක් වශයෙන් හෝ කිසිඳු ප්‍රතිෂ්ඨාවක් ගෙවීමට සිදු නොවන අවස්ථාවක දී, විදේශයන්හි යම් වත්කමක් හෝ ආයෝජනයක් අත්පත් කර ගැනීම සහ දැරීම සඳහා ශ්‍රී ලංකාවේ නේවාසික යම් තැනැත්තකුට අවසර ලබා දෙනු ලැබේ.

(2) සේවක කොටස් හිමිකම් සැලැස්මක් හෝ සේවක කොටස් වරණීය ක්‍රමයක් හෝ යටතේ ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකුගෙන්, උරුමයක් ලෙස හෝ ත්‍යාගයක් ලෙස ප්‍රවර්ධන කොටස් හෝ රන් කොටස් වශයෙන් තනි පුද්ගල ආයෝජකයකුට ප්‍රතිෂ්ඨාවක් නොමැතිව ලැබුණු කොටස් සහ එවැනි ආයෝජකයකුට නිකුත් කරන්නාගේ සංස්ථායී ක්‍රියාවක් ප්‍රකාරව හෝ ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපිත සමාගම්වල ඒකාබද්ධ වීම හෝ සම්බන්ධවීම ප්‍රකාරව පසුව පැවරුණු කොටස් ඉහත අනුඡේදය සඳහා ඇතුළත් විය හැකි ය.

(3) එකී අත්පත් කර ගැනීම් උපලේඛනයේ මේ කොටසේ 2 වන ඡේදයේ 1 වන වගුවේ නිශ්චිතව දක්වා ඇති සීමාවන්ට යටත් නොවිය යුතු ය.

6. සේවක කොටස් හිමිකම් සැලැස්මෙහි හෝ සේවක කොටස් වරණීය ක්‍රමවල ආයෝජන

(1) සිය සේවකයන් වෙනුවෙන් ශ්‍රී ලංකාව තුළ පිහිටුවනු ලැබූ පාලිත සමාගමකින් හෝ ශාඛාවකින් ගොනු මුදලක් ලෙස ප්‍රේෂණය කිරීමක් මත යම් විදේශ සමාගමකට ප්‍රතිෂ්ඨාවක් වශයෙන් ප්‍රතිමුඛ ප්‍රේෂණයක් සිදු කිරීම සඳහා යම් නියම කිරීමක් පවතින්නේ නම්, ගණුදෙනුවේ සද්භාවය පිළිබඳ සෑහීමට පත්වීමෙන් පසු බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු හරහා, ශ්‍රී ලංකාවේ පිහිටුවන ලද එකී පාලිත සමාගමේ හෝ ශාඛාවේ ගිණුමකින් එම අරමුදල් මාරු කිරීම සිදු කරනු ලැබිය හැකි ය.

(2) සිය සේවකයන් වෙනුවෙන් එවැනි ගොනු මුදලක් ලෙස වූ ප්‍රේෂණයක් හෝ ප්‍රේෂණ සිදු කිරීම සඳහා අදහස් කරන ශ්‍රී ලංකාව තුළ පිහිටුවනු ලැබූ පාලිත සමාගම හෝ ශාඛාව, මේ නියෝග යටතේ අරමුදල් ප්‍රේෂණය කිරීමට පෙර විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගෙන් එක් එක් සේවකයා වෙනුවෙන් නිෂ්කාශන ලිපියක් ලබාගත යුතු අතර එකී ප්‍රේෂණය සිදු කරන ලද දින සිට සතියක් ඇතුළත එකී ප්‍රේෂණයේ විස්තර විදේශ විනිමය දෙපාර්තමේන්තුව වෙත සපයනු ලැබිය යුතු ය.

7. ආයෝජනවල ආදායම් හෝ බැහැර කිරීමෙන් හෝ ඈවර කිරීමෙන් ලැබෙන ප්‍රතිෂ්ඨා මුදල් ශ්‍රී ලංකාව වෙත යැවීම.

(1) උපලේඛනයේ මේ කොටසේ 1, 2 සහ 4 වන ඡේද යටතේ අවසරලත් ආයෝජනයන්හි යම් ආදායමක් සහ යම් ප්‍රාග්ධන ලැබීමක් එය ලද දිනයේ සිට මාස තුනක කාලයක් තුළ, ආරම්භක ආයෝජනය සිදු කරනු ලැබූ ප්‍රතිමුඛ ආයෝජන ගිණුම හරහා ම ශ්‍රී ලංකාව තුළට රැගෙන ආ යුතු ය.

(2) සේවක කොටස් වරණීය ක්‍රමයක් හෝ සේවක කොටස් හිමිකම් සැලැස්මක් ප්‍රකාරව ලාභාංශ ආපසු සියරට යැවීමේ අවශ්‍යතාවය, ලාභාංශ එකී සේවක කොටස් වරණීය ක්‍රමයේ හෝ සේවක කොටස් හිමිකම් සැලැස්මේ කොටස්වල නැවත ආයෝජනය කිරීමේ යම් අනිවාර්ය හෝ වරණීය නියම කිරීමකට යටත් විය හැකි ය. උපලේඛනයේ මේ කොටසේ 6 ඡේදයේ (1) වන අනු රේදය යටතේ අවසර ලබා දී ඇති පරිදි සේවක කොටස් වරණීය ක්‍රමය හෝ සේවක කොටස් හිමිකම් සැලැස්ම යටතේ ආයෝජනය සඳහා ගොනු මුදලක් ලෙස වන ප්‍රේෂණ ආකාරයෙන් අරමුදල් තම සේවකයන් වෙනුවෙන් ප්‍රේෂණය කර තිබෙන්නා වූ ශ්‍රී ලංකාව තුළ සංස්ථාගත කරනු ලැබූ සමාගමක් හෝ ශාඛාවක් සම්බන්ධයෙන් වන විට දී, එකී තනි පුද්ගල සේවකයන් විසින්, එම තනි පුද්ගල ආයෝජකයා බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු සමග විවෘත කරනු ලැබූ ප්‍රතිමුඛ ආයෝජන ගිණුමක් හරහා එකී ආයෝජනවල ආදායම හෝ බැහැර කිරීමෙන් ලද ඉපැයුම් ශ්‍රී ලංකාව වෙත රැගෙන එනු ලැබිය යුතු ය.

(3) අදාළ වන පරිදි උපලේඛනයේ මේ කොටසේ 5 වන ඡේදය යටතේ අවසර ලබා දී ඇති පරිදි අත්පත් කර ගනු ලැබූ යම් විදේශයක පිහිටි වත්කම් හෝ ආයෝජනවලින් ලද යම් ආදායම් සහ ඒවා බැහැර කිරීමෙන් ලද යම් ඉපැයුම් ලැබීමක දී, එකී ලැබීම සිදුවූ දින සිට මාස තුනක් ඇතුළත උපලේඛනයේ මේ කොටසේ 8 වන ඡේදයේ (1) වන අනුඡේදයට සහ උපලේඛනයේ මේ කොටසේ නිශ්චිතව දක්වා ඇති වෙනත් කොන්දේසිවලට යටත්ව බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු සමග එකී නේවාසික ආයෝජකයා විවෘත කරනු ලැබූ ප්‍රතිමුබ ආයෝජන ගිණුමක් හෝ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් හෝ දැනට පවතින ව්‍යාපාර විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් හරහා ශ්‍රී ලංකාව තුළට ගෙන එනු ලැබිය යුතු ය.

8. ප්‍රතිමුබ ආයෝජන ගිණුමක් හරහා කරන ලද ආයෝජන උරුම වීම

(1) උපලේඛනයේ මේ කොටසේ 5 වන ඡේදය යටතේ අවසර ලබා දී ඇති පරිදි ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයකු විසින් ප්‍රතිමුබ ආයෝජන ගිණුමක් හරහා සිදු කරනු ලැබූ, ආයෝජනයක්, උරුමකරුවකු හෝ අර්ථලාභියකු වන ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තකු වෙත උරුමයෙන් ලැබුණු හෝ තෑගි කරන ලද අවස්ථාවක දී, එම ආයෝජනවල වන යම් ආදායමක් හෝ ප්‍රාග්ධන ලැබීම්, එකී උරුමකරු හෝ අර්ථලාභියා විසින් විවෘත කරනු ලැබූ ප්‍රතිමුබ ආයෝජන ගිණුමක් හරහා ශ්‍රී ලංකාව වෙත ගෙන එනු ලැබිය යුතු ය.

(2) ප්‍රතිමුබ ආයෝජන ගිණුමක් හරහා ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයකු විසින් සිදු කරනු ලබන ආයෝජනයක්, අදාළ වන උරුම සහ අනුප්‍රාප්තික නීතියට යටත්ව ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකු වෙත පවරනු ලැබිය හැකි ය.

9. විගාමිකයකු බවට පත්වන නේවාසික තනි පුද්ගල ආයෝජකයකු සම්බන්ධයෙන් වන විට ඒ පුද්ගලයා ශ්‍රී ලංකාවේ නේවාසිකයකු ලෙස සිටින අතරතුර ප්‍රතිමුබ ආයෝජන ගිණුමක් හරහා ඒ පුද්ගලයා ස්ථිර පදිංචිය ලබා ඇති රටෙහි කරන ලද යම් ආයෝජනයක මුළු වටිනාකම එකී පුද්ගලයාගේ සුදුසුකම් ලත් සංක්‍රමණික දීමනාවෙන් අඩු කරනු ලැබිය යුතු ය.

10. නේවාසික ආයෝජකයන් සඳහා දිරිදීමනා, ප්‍රතිමුබ ආයෝජන ගිණුම වෙත බැර කරනු ලැබූ පෙර සිදු කරන ලද ප්‍රතිමුබ ආයෝජනයන්ගේ ප්‍රාග්ධන ලාභ සියයට පනහ දක්වා අරමුදල් උපයෝගී කර ගනිමින් උපලේඛනයේ මේ කොටසේ 2 වන ඡේදයේ 1 වන වගුවෙහි නිශ්චිතව දක්වා ඇති අවසරලත් සීමාවන්ට යටත්වීමකින් තොරව, උපලේඛනයේ මේ කොටස යටතේ අවසරලත් කාර්යයන් සඳහා ආයෝජන සිදු කිරීමට සුදුසුකම්ලත් ආයෝජකයකු වෙත අවසර ලබා දෙනු ලැබිය හැකි ය.

11. සංස්ථායී ඇපකර සහ කොටස් ඔඩපනය කිරීම

(1) ශ්‍රී ලංකාවේ සංස්ථාගත කරන ලද සමාගමක් (එනම් ආයෝජකයා) විසින් එකී ආයෝජකයා කොටස් හිමියකු වන්නා වූ ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද සමාගමකට (එනම් ආයෝජකයා) එකී ආයෝළැඑයසතයා හට මූල්‍ය ආයතනයකින් පහසුකම් ලබා ගැනීම සඳහා හෝ ආයෝජිතයා විසින් එළඹ ඇති ගිවිසුමක් සඳහා පහසුකම් සලසා ගැනීම සඳහා සංස්ථායී ඇපකරයක් ලබාදීමට අවශ්‍ය වන විට දී, ඉවත් කළ විනිමය පාලන පනතේ හෝ මේ පනතේ විධිවිධානවලට අනුකූලව එකී ආයෝළැඑයසතයා තුළ එකී ආයෝජනය සිදු කර ඇත්තේ නම් සහ සංස්ථායී ඇපකරයේ වගකීම දැරීම සඳහා එම සමාගමේ මූල්‍ය ශක්තිය ප්‍රමාණවත් නම්, එ.ජ.ඩො. 1,000,000 ක උපරිම සීමාවකට යටත්ව සංස්ථායී ඇපකරයක් නිකුත් කරනු ලැබිය හැකි ය. සංස්ථායී ඇපකර තුළින් පැන නගින යම් අවිනිශ්චිත වගකීමකට මුහුණදීම සඳහා සමාගම සතුව මූල්‍ය ශක්තිය පවතින බවට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික විය යුතු ය. ඇපකරයේ වටිනාකම යම් නිශ්චිත අවස්ථාවක දී එකී ආයෝළැඑයසතයා තුළ ඇති ආයෝජකයාගේ කොටස් හිමිකාරීත්වයේ ප්‍රතිශතයට සමානුපාතික විය යුතු අතර ආයෝළැඑයසතයා විසින් (සංස්ථායී ඇපකරයේ සහ අදාළ අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතයේ පිටපත් ද ඇතුළුව) ඉහත අවසරය යටතේ නිකුත් කරන ලද එකී එක් එක් සංස්ථායී ඇපකරයේ විස්තර, එකී ඇපකරය බලාත්මක වන දින සිට දින 14 ක් ඇතුළත මහ බැංකුවේ විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වෙත ලබා දීම අවශ්‍ය වන්නේ ය.

(2) පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධානවලට යටත්ව, බලයලත් වෙළෙන්දකුට හෝ පරිසීමිත වෙළෙන්දකුට ඉහත (1) වන අනුඡේදයෙහි සඳහන් සංස්ථායී ඇපකරවලට අදාළ වලංගු හිමිකම්වලින් පැන නගින ප්‍රතිමුබ ප්‍රේෂණ සිදු කිරීම සඳහා ද අවසර ලබා දෙනු ලැබේ.

(3) මේ නියෝගවල හෝ ඉවත් කරන ලද විනිමය පාලන පනතේ විධිවිධානවල අවසර ලබා දී ඇති පරිදි, ආයෝජකයා තුළ නේවාසික ආයෝජකයකු විසින් අත්පත් කර ගෙන ඇති කොටස්, මූල්‍ය ආයතනයකින් ආයෝජිතයා විසින් ලබාගැනීමට අදහස් කරන පහසුකම් සුරක්ෂිත කිරීම සඳහා හෝ ආයෝජිතයා විසින් බැඳී සිටින ගිවිසුම් සඳහා පහසුකම් සැලසීම සඳහා ලියමක් ලෙස භාවිත කරනු ලැබිය හැකි ය. ලියම, ආයෝජිතයා තුළ ආයෝජකයා විසින් දරනු ලබන කොටස් හිමිකමේ සීමාවට සමානුපාතික විය යුතු ය.

(4) ඉහත (1) වන සහ (3) වන අනුඡේද යටතේ අවසර ලබා දී ඇති ඇපකර හෝ ලියම සඳහා පහත දැක්වෙන කොන්දේසි ද බලපැවැත්විය යුතු ය;

(අ) (පැහැර හැරීමක් සිදුවන අවස්ථාවක දී) හිමිකමේ වටිනාකම ආපසු අයකර ගැනීම සඳහා සංස්ථායී ඇපකරය නිකුත් කිරීමට හෝ ලියමට එළඹීමට පෙර, නේවාසික ආයෝජකයා විසින් ආයෝළැඑයසතයා සමග සුදුසු නීතිමය ගිවිසුමක් ඇති කර ගත යුතු ය.

(ආ) වලංගු හිමිකම් පෑමක දී, හිමිකමේ උපරිම සීමාව, පාදක පහසුකමේ ඉතිරිව පවතින වගකීමට සමානුපාතික හෝ ඊට වඩා අඩු හෝ විය යුතු ය.

(ඇ) ඉහත (අ) අයිතමයේ සඳහන් පරිදි වූ එකී ආපසු අයකර ගැනීම්, ආයෝජනය සිදු කරනු ලැබූ ප්‍රතිමුඛ ආයෝජන ගිණුමටම රැගෙන එනු ලැබිය යුතු ය.

12. වෙනත් නියම හා කොන්දේසි

(1) සුදුසුකම්ලත් නේවාසික ආයෝජකයකු විසින් බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු හරහා උපලේඛනයේ මේ කොටසේ 1 වන වගුව යටතේ නිශ්චිතව දක්වා ඇති ආයෝජන සඳහා එක් එක් ප්‍රතිමුඛ ප්‍රේෂණයක් සිදු කිරීමට පෙර විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගෙන් නිෂ්කාශන ලිපියක් ලබා ගත යුතු ය. පසුකාලීනව විදේශ ආයෝජන සිදු කිරීමට අදහස් කරනු ලබන යම් සුදුසුකම්ලත් නේවාසික ආයෝජකයකු විසින් මේ නියෝග යටතේ හෝ ඉවත් කරන ලද විනිමය පාලන පනත යටතේ ප්‍රදානය කරන ලද පොදු අවසරයක් ප්‍රකාරව ඒ බව සනාථ කරන ලේඛනද, සමග එකී සුදුසුකම් ලත් ආයෝජකයා විසින් පෙර සිදු කරන ලද ආයෝජනයන්හි ප්‍රගතිය සහ තත්ත්වය පිළිබඳව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරයන්ගේ ආයතනයේ අධි සාමාජිකයකුගෙන් හෝ වරලත් මූල්‍ය විශ්ලේෂකයන්ගේ (සී.එෆ්.ඒ. ආයතනයේ) බලපත්‍ර දරන්නකුගෙන් ලබා ගත් සහතිකයක් විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වෙත සපයනු ලැබිය යුතු ය. එකී සුදුසුකම් ලත් ආයෝජකයා විසින් පෙර සිදුකරන ලද ආයෝජනයන්හි ප්‍රගතිය පිළිබඳ සෑහීමකට පත්වීමෙන් පසුව සහ උපලේඛනයේ මේ කොටසේ 3 වන ඡේදයට යටත්ව, විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා විසින් එකී නිෂ්කාශන ලිපිය නිකුත් කළ යුතු ය.

(2) මේ නියෝග යටතේ හෝ ඉවත් කරන ලද විනිමය පාලන පනත යටතේ ශ්‍රී ලංකාවෙන් පිටත ලැයිස්තුගත නොකළ සමාගමක අවසරලත් ආයෝජනයක් සිදු කර ඇති ආයෝජක සමාගමක අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, එකී ආයෝජනයන්හි ප්‍රගතිය පිළිබඳ වාර්ෂිකව සමාලෝචනයක් සිදු කළ යුතු අතර ආයෝළැඑයසතයාගේ ලාභ සහ පාඩු, ආයෝජිතයා විසින් ප්‍රකාශිත ලාභාංශ හෝ ආයෝජකයා වෙත ලාභාංශ ලැබීම පිළිබඳ විස්තර ඇතුළත් ඒ පිළිබඳව වූ වාර්තාව ඊළඟ වර්ෂයේ මාර්තු 31 වන දින හෝ ඊට පෙර හෝ විශේෂිත ආයෝජනයක් සම්බන්ධයෙන් විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා විසින් නිශ්චය කරනු ලැබිය හැකි වෙනත් එවැනි දිනයක අදාළ බලයලත් වෙළෙන්දා හෝ පරිසීමිත වෙළෙන්දා වෙත පිටපතක් ද සහිතව විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වෙත යවනු ලැබිය යුතු ය.

(3) (තනි පුද්ගලයන් හැර) සුදුසුකම්ලත් ආයෝජකයා විසින් මේ නියෝග යටතේ අවසරලත් ආයෝජනය සිදු කිරීම සඳහා සුදුසුකම් ලැබීම පිණිස පසුගිය වසර තුන සඳහා යහපත් මූල්‍ය තත්ත්වයක් සහ කාර්යසාධනයක් පවත්වාගනු ලැබ තිබිය යුතු ය. විදේශයක වූ නියාමනය කරන ලද ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක් තුළ වන අවසර ලත් ආයෝජන හැර, සුදුසුකම්ලත් ආයෝජකයා විසින්, මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධානවල නිශ්චිතව දක්වනු ලැබිය හැකි පරිදි, වරලත් ගණකාධිකාරිවරයන්ගේ ආයතනයේ අධි සාමාජියකුගෙන් හෝ වරලත් මූල්‍ය විශ්ලේෂකයන්ගේ ආයතනයේ බලපත්‍ර දරන්නකුගෙන් එකී ආයෝජකයාගේ මූල්‍ය තත්ත්වය සහ කාර්යසාධනය සම්බන්ධයෙන් වන නිර්දේශයක් සහ යෝජිත ආයෝජනයේ ශක්‍යතාවය, පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධානවලට යටත්ව, බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු වෙත ලබා දිය යුතු ය.

II වන කොටස

පනත ක්‍රියාත්මක වීමට පෙර ප්‍රදානය කර ඇති යම් (සාමාන්‍ය හෝ විශේෂ) අනුමැතියක් යටතේ සිදු කරනු ලබන සහ මේ නියෝගවල නිශ්චිතව දක්වා ඇති ප්‍රාග්ධන ගනුදෙනුවලට සාරානුකූලව සමාන වන්නා වූ දැනට පවතින සියලු ප්‍රාග්ධන ගනුදෙනු, මේ නියෝග මගින් හෝ යම් පසුකාලීන නියෝග මගින් විශේෂයෙන් වෙනස් කරනු ලබන්නේ නම් මිස එකී අනුමැතිය යටතේ නිශ්චිතව දක්වා ඇති නියම සහ කොන්දේසිවලට යටත්ව අඛණ්ඩව සිදු කරනු ලැබිය යුතු ය.

III වන කොටස

ගිණුම් විවෘත කිරීමේ හා පවත්වාගෙන යාමේ බලය

1. **ප්‍රතිමුඛ ආයෝජන ගිණුම්**

මේ නියෝගයටතේ නිශ්චිතව දක්වා ඇති ප්‍රාග්ධන ගනුදෙනු සිදු කිරීම සඳහා පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධානවලට යටත්ව, පහත දැක්වෙන සුදුසුකම්ලත් තැනැත්තන්ගේ නමින් ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් විවෘත කිරීම සහ පවත්වා ගෙන යාම සඳහා බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු වෙත බලය තිබිය යුතු ය.

(අ) ඇපයෙන් සීමිත සමාගමක් නොවන 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාව තුළ සංස්ථාගත කරන ලද සමාගම්ද

(ආ) බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක්ද

(ඇ) මහ බැංකුව, ශ්‍රී ලංකා සුරැකුම් සහ විනිමය කොමිෂන් සභාව හෝ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව යටතේ (ඉහත (අ) සහ (ආ) යටතේ වන සුදුසුකම්ලත් ආයෝජකයන් හැර) නියාමනය කරන ලද හෝ බලපත්‍රලාභී අස්ථිත්වයන්ද

(ඈ) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ පිහිටුවන ලද සේවක අර්ථසාධක අරමුදල හෝ කම්කරු කොමසාරිස් ජනරාල් විසින් අනුමත කරන ලද වෙනත් යම් සේවක අර්ථසාධක අරමුදලක්,

(ඉ) ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි කරන ලද හවුල් ව්‍යාපාරයක්ද සහ

(ඊ) (අදාළ විය හැකි පරිදි) ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයකු හෝ/එකී පුද්ගලයා විසින් ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි කරන ලද තනි පුද්ගල ව්‍යාපාරයක් සහිත ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයකු

2. වෙනත් නියම සහ කොන්දේසි

(1) ප්‍රතිමුඛ ආයෝජන ගිණුමක් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම සඳහා සහ එකී ගිණුම් සඳහා වන අවසරලත් හර කිරීම් සහ බැර කිරීම් සඳහා වන නිර්ණායක, පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන අදාළ විධාන මගින් නිශ්චිතව සඳහන් කරනු ලබන පරිදි විය යුතු ය.

(2) මේ කොටසේ 1 වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම සඳහා අපේක්ෂා කරන තැනැත්තන්, එකී ගිණුම් විවෘත කිරීම සහ පවත්වා ගෙන යාම සඳහා මහ බැංකුව විසින් නිකුත් කරන ලද අදාළ විධානවල නිශ්චිතව දක්වා ඇති නිර්ණායක යටතේ සුදුසුකම් ලබන්නේ ද යන්න පිළිබඳව නිශ්චය කිරීම සඳහා බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු විසින් නිසි උද්යෝගයෙන් සහ සාධාරණ සැලකිල්ලෙන් ක්‍රියා කළ යුතු ය. සෑම බලයලත් වෙළෙන්දෙකු හෝ පරිසීමිත වෙළෙන්දකු ම විසින් ගිණුම් පවත්වාගෙන යන කාලය තුළ සහ එකී ගිණුම් වසා දැමීමෙන් පසු වසර හයකට නොඅඩු කාල සීමාවක් සඳහා, ගිණුම් හිමියන්ගේ සුදුසු බව සනාථ කිරීමක් වශයෙන් ඔවුන් සම්බන්ධ තොරතුරු සහ ලේඛනගත සාක්ෂි පවත්වාගෙන යා යුතු ය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2213/35- 2021 පෙබරවාරි මස 03 වැනි බදාදා - 2021.02.03

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස : (I) වැනි ඡේදය – සාමාන්‍ය

රජයේ නිවේදන

2017 අංක 12 දරන විදේශ විනිමය පනත

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වන වගන්තිය සමඟ කියවිය යුතු 29 වන වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග

මහින්ද රාජපක්ෂ,
මුදල් අමාත්‍ය.

2021 පෙබරවාරි මස 03 වැනි දින,

කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 2021 අංක 2 දරන විදේශ විනිමය (ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව තුළ දී සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු වර්ග) නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර 2021 මාර්තු මස 22 වන දින සිට ක්‍රියාත්මක විය යුතුය.

2. ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවේ දී සිදු කරනු ලබන මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ප්‍රාග්ධන ගනුදෙනු, මේ නියෝගවල සහ මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති යම් සීමාවන්, නියම සහ කොන්දේසිවලට යටත්ව, පනතේ 4 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ප්‍රමාණයට යම් බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු විසින් සිදු කරනු ලැබීමට අවසර දෙනු ලැබූ විදේශ විනිමයෙන් වූ බලයලත් ප්‍රාග්ධන ගනුදෙනු වර්ග විය යුතු ය.

3. මේ නියෝග යටතේ විදේශ විනිමයෙන් වූ ප්‍රාග්ධන ගනුදෙනු සිදු කිරීමේ දී සෑම බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු විසින්ම පනතේ 9 වන වගන්තිය යටතේ, කලින් කලට, මහ බැංකුව විසින්, ඒ සම්බන්ධයෙන් නිකුත් කරනු ලබන විධානවලට අනුකූල විය යුතු ය.

4. (1) මේ නියෝග යටතේ විදේශ විනිමයෙන් වූ ප්‍රාග්ධන ගනුදෙනු සිදු කිරීමේ නිරත වන සෑම බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු විසින්ම -

(අ) ගනුදෙනුව සිදු කරනු ලබන තැනැත්තාගේ සද්භාවය; සහ

(ආ) එම ගනුදෙනුව මේ නියෝගවලට අනුකූල වන බව,

ඒ සම්බන්ධයෙන් වූ ලේඛනගත සාක්ෂි ලබා ගැනීම මගින් නිශ්චය කරගනු ලැබිය යුතු ය.

(2) මේ නියෝග යටතේ ප්‍රාග්ධන ගනුදෙනුවල නිරත වන සෑම තැනැත්තකු විසින්ම, (1) වන ඡේදයේ කාර්යය සඳහා, යම් බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු වෙත අවශ්‍ය සියලු ලේඛනගත සාක්ෂි සපයනු ලැබිය යුතු ය.

(3) මේ නියෝග යටතේ විදේශ විනිමයෙන් වූ ප්‍රාග්ධන ගනුදෙනු සිදු කිරීමේ දී සෑම බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු විසින්ම පූර්ණ නිසි උද්යෝගයෙන් කටයුතු කළ යුතු ය.

5. මේ නියෝග සමඟ අනුකූල වීමට අපොහොසත් වන යම් බලයලත් වෙළෙන්දකු, පරිසීමිත වෙළෙන්දකු හෝ බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු නොවන යම් තැනැත්තකු සම්බන්ධයෙන් පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් අවශ්‍ය වන බවට සලකනු ලැබිය හැකි යම් ක්‍රියාමාර්යක් ගනු ලැබිය හැකි ය.

6. මේ නියෝගවල නිශ්චිතව දක්වා ඇති ප්‍රාග්ධන ගනුදෙනුවලට සම්බන්ධ (සියලු අතරමැදියන්, ව්‍යාපාර වස්තු තැරැව්කරුවන්, ඒකක භාර, අන්‍යෝන්‍ය අරමුදල් සහ මූල්‍ය ආයතන ඇතුළුව) ශ්‍රී ලංකාව තුළ නේවාසික යම් තැනැත්තකු විසින්, එම ප්‍රාග්ධන ගනුදෙනු සිදු කිරීමේ දී මේ නියෝග සමඟ අනුකූල වී ඇති බවට සහතික වීමට වගබලා ගත යුතු ය.

7. මෙහි උපලේඛනයේ 1 වන කොටසේ "ආ" ශීර්ෂය යටතේ 1 වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති සෑම විදේශීය සමාගමක් විසින්ම එම සමාගම, මෙහි උපලේඛනයේ 1 වන කොටසේ "ආ" ශීර්ෂය යටතේ නිශ්චිතව දක්වා ඇති නියමයන් සහ කොන්දේසි සමඟ අනුකූල වන බවට සහතික වීමට වග බලා ගත යුතු ය.

8. (1) මේ නියෝගවල කාර්යය සඳහා "නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල්" යන්නෙන් -

(අ) එක්සත් ජනපද ඩොලර් (එ.ජ.ඩො.);

(ආ) යුරෝ;

(ඇ) ස්විට්ස්ලිං පවුම්;

(ඈ) ඕස්ට්‍රේලියානු ඩොලර්;

(ඉ) සිංගප්පූරු ඩොලර්;

(ඊ) ස්වීඩන ක්‍රෝනර්;

(උ) ස්විස් ෆ්‍රෑන්ක්;

(ඌ) කැනේඩියානු ඩොලර්;

(එ) හොංකොං ඩොලර්;

(ඒ) ජපන් යෙන්;

(ඔ) ඩෙන්මාර්ක් ක්‍රෝනර්;

(ඕ) නෝර්වීජියානු ක්‍රෝනර්;

(ක) චීන රෙන්මින්බි; සහ

(ග) නවසීලන්ත ඩොලර්,

අදහස් වේ.

(2) මහ බැංකුව විසින්, පනතේ 9 වන වගන්තිය යටතේ ඒ සම්බන්ධයෙන් නිකුත් කරනු ලබන විධාන මගින්, කලින් කලට (1) වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ එකතු කිරීම සිදු කරනු ලැබිය හැකි ය.

9. 2019 පෙබරවාරි මස 28 වන දින අංක 2112/25 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වන වගන්තිය සමඟ කියවිය යුතු 29 වන වගන්තිය යටතේ සාදන ලද නියෝග, ඒ යටතේ කරන ලද කිසිවකට අගතියක් නොවන පරිදි මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

10. මේ නියෝගවල කාර්යය සඳහා -

"පනත" යන්නෙන් 2017 අංක 12 දරන විදේශ විනිමය පනත අදහස් වේ;

"බලයලත් වෙළෙන්දා" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්යම තිබිය යුතු ය;

"ප්‍රාග්ධන ගනුදෙනුව" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"මහ බැංකුව" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"ඇපයෙන් සීමිත සමාගම්" යන්නට 2007 අංක 7 දරන සමාගම් පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"කොටස් වලට පරිවර්තනය කිරීම්" යන්නෙන් -

(අ) 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාව තුළ සංස්ථාගත කරන ලද සමාගමක් විසින් නිකුත් කරනු ලබන වරණීය කොටස් මේ නියෝග යටතේ හෝ ඉවත් කරන ලද විනිමය පාලන පනත යටතේ සාමාන්‍ය කොටස් බවට පරිවර්තනය කිරීමක්;

(ආ) 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාව තුළ සංස්ථාගත කරන ලද සමාගමක් විසින් ලබා ගනු ලබන හෝ නිකුත් කරනු ලබන ණය හෝ ණය සුරැකුම්පත්, මේ නියෝග යටතේ හෝ ඉවත් කරන ලද විනිමය පාලන පනත යටතේ සාමාන්‍ය කොටස් බවට පරිවර්තනය කිරීමක්; හෝ

(ඇ) නිෂ්පාදකවරයා හෝ නිෂ්පාදකවරයාගේ බලයලත් නියෝජිතයා විසින් තක්සේරු කරන ලද, ආනයනික යන්ත්‍රෝපකරණවල වටිනාකම, එම යන්ත්‍රෝපකරණවල පිරිවැය දරනු ලැබූ ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද සමාගමක නාමයෙන් සාමාන්‍ය කොටස් බවට පරිවර්තනය කිරීමක්;

අදහස් වේ;

"විගාමිකයා" යන්නට, කලින් කලට සංශෝධනය විය හැකි පරිදි වන 2021 පෙබරවාරි මස 03 දිනැති අංක 2213/36 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද 2021 අංක 3 දරන විදේශ විනිමය (විගාමිකයන් විසින් අරමුදල් ප්‍රේෂණය කිරීම) නියෝගවල දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"කොටස් සඳහා හිමිකම" යන්නෙන්, නිකුත් කරන්නා විසින් කරන ලද සංස්ථායී ක්‍රියාවන් ප්‍රකාරව හෝ ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සමාගම්වල ඒකාබද්ධවීම් හෝ සම්බන්ධවීම් ප්‍රකාරව හෝ උරුමය සහ අනුප්‍රාප්තියට අදාළ නීතිය ප්‍රකාරව (විගාමිකයකු ඇතුළුව) නේවාසික නොවන පුද්ගලයකු වෙත උරුම වීම ප්‍රකාරව හෝ සමීපතම පවුල් සාමාජිකයකු විසින් (විගාමිකයකු ඇතුළුව) නේවාසික නොවන පුද්ගලයකු වෙත ත්‍යාග වශයෙන් හෝ අධිකරණ නියෝගයක් යටතේ බේරුම් කිරීමක් වශයෙන් හෝ නිකුත් කරන ලද හෝ පවරන ලද යම් කොටස් අදහස් වේ;

"සමීපතම පවුල් සාමාජිකයන්" යන්නෙන්, දෙමව්පියන්, සීයා, ආච්චි, කලත්‍රයා සහ දරුවන් අදහස් වේ;

"බලපත්‍රලාභී වාණිජ බැංකුව" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"බලපත්‍රලාභී මුදල් සමාගම" යන්නෙන් 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ බලපත්‍රලාභී මුදල් සමාගමක් අදහස් වේ;

"බලපත්‍රලාභී මූල්‍ය ආයතනය" යන්නෙන් -

(අ) බලපත්‍රලාභී වාණිජ බැංකුවක්;

(ආ) බලපත්‍රලාභී විශේෂිත බැංකුවක්;

(ඇ) 2016 අංක 6 දරන ක්ෂුද්‍රමූල්‍ය පනත යටතේ බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගමක්; හෝ

(ඈ) බලපත්‍රලාභී මූල්‍ය සමාගමක්,

අදහස් වේ;

"බලපත්‍රලාභී විශේෂිත බැංකුව" යන්නට, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"අමාත්‍යවරයා" යන්නට, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"මුදල් මණ්ඩලය" යන්නට, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"විදේශ සමාගම" යන්නට, 2007 අංක 7 දරන සමාගම් පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"ඉවත් කරන ලද විනිමය පාලන පනත" යන්නෙන් (423 වන අධිකාරය වූ) විනිමය පාලන පනත අදහස් වේ;

"පරිසීමිත වෙළෙන්දා" යන්නට, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"සිල්ලර වෙළඳාම" යන්නෙන්, පෞද්ගලික හෝ ගෘහස්ථ පරිභෝජනය හෝ පාවිච්චිය සඳහා අලුත් සහ භාවිත කළ

භාණ්ඩ පොදු මහජනතාව වෙත නැවත විකිණීම (වෙනස්කම් සිදු කිරීමකින් තොරව විකිණීම) අදහස් වේ;

"විශේෂිත කල්බදු සමාගම" යන්නෙන් කල්බදු මූල්‍යකරණ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සඳහා 2000 අංක 56 දරන

කල්බදු මූල්‍යකරණ පනත යටතේ ලියාපදිංචි කරන ලද සමාගමක් අදහස් වේ;

"රාජ්‍ය හිමිකම සහිත ව්‍යවසාය" යන්නෙන්, කොටස් ප්‍රාග්ධනයෙන් සියයට පනහකට වැඩි ප්‍රමාණයක හිමිකම ශ්‍රී ලංකා රජය විසින් දරනු ලබන, ශ්‍රී ලංකා රජයේ රාජ්‍ය හිමිකම සහිත ව්‍යවසායයක් අදහස් වේ

"ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර" යන්නෙන්, ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් නාමනය කරන ලද ණය සාධන පත්‍රයක් අදහස් වේ.

(2 වන සහ 7 වන නියෝග)

උපලේඛනය

I වන කොටස

ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව තුළ සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු

අ. අවසරලත් ආයෝජන

1. ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකු, ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටුවන ලද දේශීය අරමුදල්, ප්‍රාදේශීය අරමුදල්, ආයෝජන අරමුදල් සහ අන්‍යෝන්‍ය අරමුදල් (නේවාසික නොවන ආයෝජකයින්) විසින්, ශ්‍රී ලංකාවේ දී පහත දැක්වෙන වර්ගවල ප්‍රාග්ධන ගනුදෙනුවල නිරත වනු ලැබිය හැකි ය:

(1) උපලේඛනයේ මේ කොටසේ "අ" ශීර්ෂය යටතේ 7 සහ 8 වන ඡේදවල දක්වා ඇති බැහැර කිරීම් සහ සීමා කිරීම්වලට යටත්ව, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාව තුළ සංස්ථාගත කරන ලද සමාගම් විසින් නිකුත් කරනු ලැබූ, කොටස් සඳහා වූ හිමිකමක් හෝ කොටස්වලට පරිවර්තනය කිරීමක් යටතේ වන සියලු වර්ගවල කොටස් අත්පත් කර ගැනීම, දැරීම හෝ අත්හැර දැමීම;

(2) (බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු, බලපත්‍රලාභී මූල්‍ය සමාගම්, විශේෂිත කල්බදු සමාගම් සහ ඇපයෙන් සීමිත සමාගම් සහ ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි කරන ලද විදේශීය සමාගම් හැර) 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාව තුළ සංස්ථාගත කරන ලද සමාගම් විසින් නිකුත් කරන ලද වසර 3 ක් හෝ ඊට වැඩි කාලයක් සඳහා වන (ලැයිස්තුගත ණය සුරැකුම්පත් හැර) ණය සුරැකුම්පත්වල නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලින් හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් ආයෝජනය කිරීම;

(3) බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු, බලපත්‍රලාභී මූල්‍ය සමාගම් හෝ විශේෂිත කල්බදු සමාගම් විසින් අදාළ නියාමන අධිකාරීන්හි අනුමැතිය සහිතව නිකුත් කරන ලද ණය සුරැකුම්පත්වල නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලින් හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් ආයෝජනය කිරීම;

(4) (බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු, බලපත්‍රලාභී මූල්‍ය සමාගම්, විශේෂිත කල්බදු සමාගම් සහ ඇපයෙන් සීමිත සමාගම් සහ විදේශීය සමාගම් හැර) 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාව තුළ සංස්ථාගත කරන ලද සමාගම් වෙත වසර 3 ක් හෝ ඊට වැඩි කාලයක් සඳහා නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලින් හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් ණය ප්‍රදානය කිරීම;

(5) ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරනු ලැබූ මව් සමාගම විසින් 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ විදේශීය සමාගමක් ලෙස ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි කරන ලද එම විදේශීය සමාගමේ ශාඛා කාර්යාලයක් වෙත හෝ ව්‍යාපෘති කාර්යාලයක් වෙත නම්කරන ලද විදේශ ව්‍යවහාර මුදලින් හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් ණය ප්‍රදානය කිරීම;

(6) අදාළ රේඛීය අමාත්‍යාංශයෙන් සහ වෙනත් යම් අදාළ අධිකාරියකින් අනුමැතිය ලබා ගැනීමට යටත්ව ශ්‍රී ලංකා රජය වෙත හෝ රාජ්‍ය හිමිකම සහිත ව්‍යවසායයන් වෙත ණය ප්‍රදානය කිරීම;

(7) අදාළ නියාමන අධිකාරිවල අනුමැතියට යටත්ව, බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු, බලපත්‍රලාභී මූල්‍ය සමාගම් සහ විශේෂිත කල්බදු සමාගම් වෙත විදේශ ව්‍යවහාර මුදලින් හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් ණය ප්‍රදානය කිරීම.

(8) වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට හෝ සීමාකිරීම්වලට යටත්ව -

(අ) ඒකක භාරවල හෝ අන්‍යෝන්‍ය අරමුදල්වල ඒකකයන්හි;

(ආ) රජයේ සුරැකුම්පත්වල (භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර සහ ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරනු ලබන වෙනත් යම් සුරැකුම්පත්);

(ඇ) ශ්‍රී ලංකා මහ බැංකුව හෝ යම් රාජ්‍ය හිමිකම සහිත ව්‍යවසායයක් හෝ වෙනත් යම් ව්‍යවස්ථාපිත මණ්ඩලයක් විසින් නිකුත් කරනු ලබන සුරැකුම්පත්වල;

(ඈ) ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල (ශ්‍රී.ල.ස.බැ.);

(ඉ) පනතේ 4 වන වගන්තියට යටත්ව, ශ්‍රී ලංකා රුපියල්වලින් හෝ යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් බලපත්‍රලාභී මූල්‍ය ආයතනවල කාලීන තැන්පතුවල;

(ඊ) නිශ්චල දේපළවල; හෝ

(උ) ලැයිස්තුගත ණය සුරැකුම්පත්වල;

ආයෝජනය කිරීම.

(9) ණය ලබා ගන්නාගේ විදේශ විනිමය ඉපැයුම්වලින් එම ණයවල සියලු ආපසු ගෙවීම් සිදු කරන්නේ නම්, ණය ලබා ගන්නාගේ ක්‍රියාකාරී ප්‍රාග්ධන අවශ්‍යතා වෙනුවෙන් ණය මුදල භාවිත කිරීමේ කාර්යය සඳහා ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්හිමි,

ශ්‍රී ලංකාව තුළ පිහිටි 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ අර්ථ නිරූපණය කර ඇති පරිදි වන සමාගම් වෙත අවුරුදු තුනකට අඩු කාලයක් සඳහා වන ණය ප්‍රදානය කිරීම.

(10) අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලැබිය හැකි යම් විධානවලට අනුකූලව මුදල් මණ්ඩලය විසින් අනුමත කරනු ලබන වෙනත් යම් ආයෝජන වර්ගයක ආයෝජනය කිරීම.

2. නේවාසික නොවන පුද්ගලයකු විසින්, සමීපතම පවුල් සාමාජිකයෙකුගෙන් ත්‍යාගයක් වශයෙන් හෝ උරුමය සහ අනුප්‍රාප්තියට අදාළ නීතිය ප්‍රකාරව උරුමයක් වශයෙන්, හෝ අධිකරණ නියෝගයක් යටතේ වූ බේරුම්කිරීමක් වශයෙන් උපලේඛනයේ මේ කොටසේ "අ" ශීර්ෂය යටතේ 1 වන ඡේදයේ (1) වන, (2) වන, (3) වන සහ (8) වන අනුඡේදවල දක්වා ඇති වත්කම් අත්පත්කර ගනු ලැබිය හැකි ය.

3. විගාමිකයකු විසින්, නේවාසික තැනැත්තකු හෝ විගාමිකයකු වන්නා වූ දෙමව්පියන්ගෙන්, සීයා හෝ ආච්චීගෙන්, සහෝදර සහෝදරියන්ගෙන් හෝ කලත්‍රයාගෙන් ත්‍යාගයක් වශයෙන්, ශ්‍රී ලංකාවේ යම් වත්කමක් අත්පත්කර ගනු ලැබිය හැකි ය. විගාමිකයකු විසින්, උරුමය සහ අනුප්‍රාප්තියට අදාළ නීතිය ප්‍රකාරව උරුමයක් වශයෙන් ශ්‍රී ලංකාවේ යම් වත්කමක් අත්පත්කර ගනු ලැබිය හැකි ය.

4. උපලේඛනයේ මේ කොටසේ 'අ' ශීර්ෂය යටතේ 1 වන, 2 වන සහ 3 වන රේදවල නිශ්චිතව දක්වා ඇති සියලු ප්‍රාග්ධන ගනුදෙනු, පහත දැක්වෙන කොන්දේසිවලට යටත් විය යුතු ය:-

(1) අවසරලත් ආයෝජනවලට අදාළව අරමුදල් ශ්‍රී ලංකාව තුළට රැගෙන ඒමට හෝ ශ්‍රී ලංකාවෙන් පිටතට යැවීමට සැලැස්වීමේ යාන්ත්‍රණය,

(අ) ඉහත සඳහන් කරන ලද අවසරලත් ආයෝජන සඳහා ගෙවනු ලැබිය යුතු ප්‍රතිෂ්ඨා මුදල්, යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් විවෘතකර පවත්වාගෙන යන්නා වූ ආමුඛ ආයෝජන ගිණුමක් හරහා ගෙවනු ලැබිය යුතු ය;

(ආ) එම ආයෝජනවලින් උපයා ගනු ලබන සියලු ආදායම් සහ යම් ප්‍රාග්ධන ලැබීම්, එම ආයෝජනය සිදු කරන ලද ආමුඛ ආයෝජන ගිණුම වෙත බැර කරනු ලැබිය යුතු ය;

(ඇ) උපලේඛනයේ මේ කොටසේ "අ" ශීර්ෂය යටතේ 1 වන ඡේදයේ (මුදල් මණ්ඩලය විසින් එසේ අවසර ලබා දී ඇත්නම්) (4) වන, (5) වන, (6) වන, (7) වන, (8) (අ) වන සහ (9) වන අනුඡේද යටතේ අවසර ලබා දී ඇති ආයෝජන සඳහා සහ (8) වන අනුඡේදය යටතේ අවසර ලබා දී ඇති වෙනත් යම් ආයෝජන සඳහා, ඉහත (අ) සහ (ආ) අයිතමයන්හි නිශ්චිතව දක්වා ඇති, නේවාසික නොවන ආයෝජකයකුගේ ආමුඛ ආයෝජන ගිණුමක් හරහා අරමුදල් ගෙවීමේ අවශ්‍යතාවය අනිවාර්ය නොවේ.

(ඈ) උපලේඛනයේ මේ කොටසේ 'අ' ශීර්ෂය යටතේ 1 වන ඡේදයේ (8) වන අනුඡේදයේ (අ) අයිතමය යටතේ අවසර ලබා දී ඇති ආයෝජන සඳහා සෘජුවම ප්‍රේෂණ සිදු කරනු ලබන අවස්ථාවක දී සහ බලපත්‍රලාභී වාණිජ බැංකුවලට, බලපත්‍රලාභී විශේෂිත බැංකුවලට, ශ්‍රී ලංකා රජයට සහ රාජ්‍ය හිමිකම සහිත ව්‍යවසායයන් වෙත ණය ප්‍රදානය කර ඇති අවස්ථාවක දී එම ආයෝජනවලින් ලැබෙන සියලු ආදායම් සහ ප්‍රාග්ධන ලැබීම්, ආයෝජිතයා විසින් නේවාසික නොවන ආයෝජකයා වෙත සෘජුවම සියරට යවනු ලැබිය හැකි ය;

(ඉ) උපලේඛනයේ මේ කොටසේ "අ" ශීර්ෂය යටතේ 1 වන ඡේදයේ (9) වන අනුඡේදයේ සඳහන් කර ඇති ණය මුදල, ණය ලබා ගන්නා විසින් විවෘත කර පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරික විදේශ ව්‍යවහාර ණය මුදල් ගිණුමකට බැර කළ යුතු අතර පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධානවලට යටත්ව එම ව්‍යාපාරික විදේශ ව්‍යවහාර ණය මුදල් ගිණුම හරහා ම එම ණය මුදලේ සියලු ආපසු ගෙවීම් සිදු කළ යුතු ය. කිසිඳු අවස්ථානුගත කරුණු යටතේ වුව ද රුපියල් පරිවර්තනය කිරීමක් ආකාරයෙන් එම ණය මුදල් පියවීමට අවසර ලබා නොදිය යුතු ය.

(2) ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකුගෙන් ණය වශයෙන් මුදල් ලබා ගන්නා වූ, බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු, ශ්‍රී ලංකා රජය සහ රාජ්‍ය හිමිකම සහිත ව්‍යවසායයන් හැර ශ්‍රී ලංකාවේ නේවාසික යම් තැනැත්තකු විසින්, එම ණය මුදල් ලබා ගැනීම සඳහා සහ ණය සේවා කිරීම සහ ණය ආපසු ගෙවීම සඳහා පනත යටතේ මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධානවලට යටත් ව විදේශීය වාණිජ ණය ගැනීමේ ගිණුමක් විවෘත කර පවත්වා ගෙන යා යුතු ය.

(3) උපලේඛනයේ මේ කොටසේ 'අ' ශීර්ෂය යටතේ 1 වන ඡේදයේ (6) වන සහ (7) වන අනුඡේද යටතේ සිදු කරන ලද ණය ලබා ගැනීම් පිළිබඳ වාර්තා කිරීම -

(අ) බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින් ණය ලබා ගැනීම් සිදු කරනු ලබන අවස්ථාවක දී, එම ණය ලබාගැනීම් පිළිබඳ විස්තර (දිනය, ණය මුදලේ ප්‍රමාණය සහ ව්‍යවහාර මුදල් වර්ගය, ණය කාල සීමාව සහ ණය ලබා දෙන්නා පිළිබඳ විස්තරය ඇතුළුව) ඊළඟ මාසයේ පහළොස් වන දින හෝ ඊට පෙර විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වෙත වාර්තා කරනු ලැබිය යුතු ය;

(ආ) ශ්‍රී ලංකා රජය සහ රාජ්‍ය හිමිකම සහිත ව්‍යවසායයන් විසින් ණය ලබා ගැනීම සිදු කරනු ලබන අවස්ථාවක දී, (දිනය, ණය මුදලේ ප්‍රමාණය සහ ව්‍යවහාර මුදල් වර්ගය, ණය කාල සීමාව සහ ණය ලබා දෙන්නා පිළිබඳ විස්තරය ඇතුළුව) එම ණයමුදල් ලබා ගැනීම් පිළිබඳ විස්තර, ණය මුදල් ලැබීමෙන් එක් මසක් ඇතුළත, (අදාළ වන පරිදි) මුදල් අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව සහ ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වෙත වාර්තා කරනු ලැබිය යුතු ය;

(4) උපලේඛනයේ මේ කොටසේ 'අ' ශීර්ෂය යටතේ 1 වන ඡේදයේ (4) වන සහ (5) වන අනුඡේද යටතේ ලබාගෙන ඇති ණය, ණය ලබාගන්නා විසින්, ණය කාල සීමාව අවසානයේදී සම්පූර්ණයෙන් ම ගෙවනු ලැබිය හැකි හෝ ණය ගිවිසුමේ නියමයන්ට අනුකූලව ණය කාල සීමාව තුළ ක්‍රමක්ෂය කරනු ලැබිය යුතු ය.

(5) උරුමයෙන් ලද හෝ ත්‍යාග වශයෙන් ලැබුණු හෝ අධිකරණ නියෝගයක් යටතේ ලැබුණු ආයෝජනවලින් හෝ වත්කම්වලින් ලද ලැබීම් ආපසු සියරට බලා යැවීම.

(අ) (අදාළ වන පරිදි) උරුමය සහ අනුප්‍රාප්තියට අදාළ නීතිය ප්‍රකාරව හෝ සමීපතම පවුල් සාමාජිකයකුගෙන් ත්‍යාගයක් වශයෙන් හෝ යම් අධිකරණ නියෝගයක් යටතේ බේරුම් කිරීමක් වශයෙන් නේවාසික නොවන පුද්ගලයකු වෙත ලැබුණු අවසරලත් ආයෝජනවල යම් ආදායම් සහ යම් ප්‍රාග්ධන ලැබීම්, එකී ආයෝජනය මේ නියෝගවලට අනුකූලව මුල් ආයෝජකයා විසින් සිදු කරනු ලැබ ඇත්තේ නම්, ප්‍රතිලාභියා විසින් විවෘත කරන ලද ආමුබ ආයෝජන ගිණුමක් හරහා පමණක් ආපසු සියරට යවනු ලැබිය හැකි ය.

(ආ) (අදාළ වන පරිදි) උරුමය සහ අනුප්‍රාප්තිය පිළිබඳ නීතිය ප්‍රකාරව හෝ සමීපතම පවුල් සාමාජිකයකුගෙන් ත්‍යාගයක් වශයෙන් හෝ යම් අධිකරණ නියෝගයක් යටතේ බේරුම් කිරීමක් වශයෙන් නේවාසික නොවන පුද්ගලයකු වෙත ලැබුණු අවසරලත් ආයෝජනවල යම් ආදායම් සහ යම් ප්‍රාග්ධන ලැබීම්, එකී ආයෝජනය, 2017 නොවැම්බර් මස 20 වන දිනට පෙර මුල් ආයෝජකයාගේ (ආමුබ ආයෝජන ගිණුමක් ලෙස නැවත නම් කරන ලද) සුරැකුම්පත් ආයෝජන ගිණුමක් හෝ වෙනත් යම් ගිණුමක් හරහා සිදු කරන ලද ආමුබ ප්‍රේෂණ මගින් සිදු කරනු ලැබ ඇත්තේ නම්, ප්‍රතිලාභියා විසින් විවෘත කරන ලද ආමුබ ආයෝජන ගිණුමක් හරහා පමණක් ආපසු සියරට යවනු ලැබිය හැකි ය.

(ඇ) (විගාමිකයකු හැර) නේවාසිකයකු නොවන පුද්ගලයකු වෙත, මියගිය නේවාසික තැනැත්තකුගෙන්, උරුමය සහ අනුප්‍රාප්තිය පිළිබඳ නීතිය ප්‍රකාරව උරුම වී ඇති හෝ නේවාසිකයකු වන සමීපතම පවුල් සාමාජිකයකුගෙන් ත්‍යාග වශයෙන් ලැබී ඇති හෝ නේවාසිකයකු විසින් දරනු ලබන වත්කම් සම්බන්ධයෙන් අධිකරණ නියෝගයක් යටතේ බේරුම් කිරීමක් වශයෙන් ලැබී ඇති යම් අවසරලත් ආයෝජනයක යම් ආදායමක් සහ යම් ප්‍රාග්ධන ලැබීම් පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධානවලට අනුව, එ.ජ.ඩො. 30,000ක වාර්ෂික දීමනාවට යටත්ව, ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුමකට බැර කර එය හරහා ආපසු සියරට යවනු ලැබිය යුතු ය.

(ඈ) වෙනත් විගාමිකයකු හෝ විගාමිකයකු වන සමීපතම පවුල් සාමාජිකයකු විසින් යම් ආයෝජනයක් එම විගාමිකයා විසින් ශ්‍රී ලංකාවේ නේවාසිකයකුව සිටින අතරතුර දී, සිදු කරනු ලැබූ හෝ ඔහුගේ හෝ ඇයගේ ශ්‍රී ලංකා රුපියල් ගිණුම් හරහා මෙම නියෝග ක්‍රියාත්මක වීමට පෙර සිදු කරනු ලැබූ හෝ උපලේඛනයේ මේ කොටසේ 'අ' ශීර්ෂය යටතේ 6 වන ඡේදය යටතේ අවසර ලබා දී ඇති පරිදි සිදු කරනු ලැබ ඇති අවස්ථාවක දී, වෙනත් විගාමිකයාගෙන් හෝ විගාමිකයකු වන සමීපතම පවුලේ සාමාජිකයාගෙන්, (විගාමිකයකු හැර) නේවාසික නොවන තනි පුද්ගලයකු වෙත, උරුමය සහ අනුප්‍රාප්තිය පිළිබඳ නීතිය ප්‍රකාරව උරුම වී ඇති හෝ ත්‍යාග වශයෙන් ලැබී ඇති යම් අවසරලත් ආයෝජනයක යම් ආදායමක් සහ යම් ප්‍රාග්ධන ලැබීම් පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධානවලට අනුව, එ.ජ.ඩො. 30,000ක වාර්ෂික දීමනාවකට යටත්ව, ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුමකට බැර කර එය හරහා ආපසු සියරට යවනු ලැබිය යුතු ය.

(ඉ) උපලේඛනයේ මේ කොටසේ 'අ' ශීර්ෂය යටතේ 3 වන ඡේදය යටතේ අවසර ලබා දී ඇති පරිදි යම් විගාමිකයකු වෙත උරුම වන හෝ ත්‍යාග වශයෙන් ලැබුණු යම් ආදායමක් සහ යම් වත්කමක යම් ප්‍රාග්ධන ලැබීම්, කලින් කලට සංශෝධනය විය හැකි පරිදි වන 2021 පෙබරවාරි මස 03 දිනැති අංක 2213/36 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද 2021 අංක 3 දරන විදේශ විනිමය (විගාමිකයන් විසින් අරමුදල් ප්‍රේෂණය කිරීම) නියෝගවලට යටත්ව ආපසු සියරට යවනු ලැබිය යුතු ය.

(6) 2017 නොවැම්බර් මස 20 වැනි දිනට පෙර සිදු කරන ලද ආයෝජනවල ලැබීම් ආපසු සියරට යැවීම-

(අ) 2017 නොවැම්බර් මස 20 වන දිනට පෙර සිදු කරන ලද ඉහත ආයෝජනවල යම් ආදායම් සහ යම් ප්‍රාග්ධන ලැබීම්, ආයෝජනය සඳහා වන ආමුබ ප්‍රේෂණවල සාක්ෂි ඉදිරිපත් කිරීමට යටත්ව, ආයෝජකයා විසින් විවෘත කරනු ලැබ ඇති ආමුබ ආයෝජන ගිණුමක් හරහා හෝ ඒකක භාරවල ඒකකවල ආයෝජන සිදු කරන ලද අවස්ථාවක දී, සෘජුවම, ආයෝජකයාගේ ශ්‍රී ලංකාවෙන් පිටත ගිණුමක් වෙතට පමණක් ආපසු සියරට යවනු ලැබිය හැකි ය.

(ආ) 2010 ජනවාරි මස 1 වන දිනට පෙර සිදු කරන ලද ආයෝජන සඳහා ආමුබ ප්‍රේෂණ පිළිබඳ සාක්ෂි නොපවතින අවස්ථාවක දී, එකී ආයෝජනයේ යම් ආදායම් සහ යම් ප්‍රාග්ධන ලැබීම්, බලයලත් වෙළෙන්දා හෝ පරිසීමිත වෙළෙන්දා විසින් සිදුකරන ලද ගනුදෙනුවේ සද්භාවය පිළිබඳ සෑහීමකට පත් වීමෙන් පසුව, නේවාසික නොවන ආයෝජකයා විසින් විවෘත කරන ලද ආමුබ ආයෝජන ගිණුමක් හරහා හෝ ඒකක භාරවල ඒකකවල ආයෝජන සිදු කරන ලද අවස්ථාවක දී ආයෝජකයාගේ ශ්‍රී ලංකාවෙන් පිටත ගිණුමක් වෙත සෘජුවම ප්‍රේෂණය කිරීමෙන් පමණක් ආපසු සියරට යවනු ලැබිය හැකි ය.

(7) උපලේඛනයේ මේ කොටසේ 'අ' ශීර්ෂය යටතේ 4 වැනි ඡේදයේ (5) වැනි අනුඡේදයේ (ආ) අයිතමය යටතේ සඳහන් කරන ලද ආයෝජන සඳහා හෝ 2010 ජනවාරි මස 1 වන දින සිට 2017 නොවැම්බර් මස 20 වන දින දක්වා කාලසීමාව තුළදී සිදු කරන ලද ආයෝජන සඳහා ආමුඛ ප්‍රේෂණ පිළිබඳ සාක්ෂි නොපවතින අවස්ථාවක දී, එම ආයෝජනවල යම් ආදායම් හෝ ප්‍රාග්ධන ලැබීම්, අවස්ථාවෝචිත පරිදි, ආයෝජකයා විසින් හෝ ප්‍රතිලාභියා විසින් විවෘත කරන ලද, අවස්ථාවෝචිත පරිදි, ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුමක් වෙත හෝ නේවාසික නොවන රුපියල් ගිණුමක් වෙත බැර කරනු ලැබිය යුතු අතර පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධානවලට අනුව එ.ජ.ඩො. 30,000ක වාර්ෂික දීමනාවකට යටත්ව ආපසු සියරට යවනු ලැබිය යුතු ය.

(8) බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු, බලපත්‍රලාභී මූල්‍ය සමාගම් හෝ විශේෂිත කල්බදු සමාගම් විසින්, මෙම නියෝග යටතේ නිකුත් කරන ලද හෝ ලබා ගන්නා ලද ණය සුරැකුම්පත් හෝ ණය, අදාළ නියාමන අධිකාරියේ අනුමැතියට යටත්ව, සාමාන්‍ය කොටස් බවට පරිවර්තනය කරනු ලැබිය හැකි ය. 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කරන ලද සමාගම් විසින් නිකුත් කරන ලද හෝ ලබා ගන්නා ලද ලැයිස්තුගත නොකළ ණය සුරැකුම්පත් හෝ ණය, අවස්ථාවෝචිත පරිදි, නිකුත් කිරීමේ හෝ ලබා ගැනීමේ දින සිට මාස 18ක් ඉකුත් වීමෙන් පසුව සාමාන්‍ය කොටස් බවට පමණක් පරිවර්තනය කරනු ලැබිය හැකි ය. 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාව තුළ සංස්ථාගත කරන ලද සමාගම් විසින් නිකුත් කරන ලද ලැයිස්තුගත ණය සුරැකුම්පත්, කොළඹ කොටස් හුවමාරුවේ නියෝගවලට අනුකූලව සාමාන්‍ය කොටස් බවට පමණක් පරිවර්තනය කරනු ලැබිය හැකි ය.

5. නේවාසික නොවන ආයෝජකයින් විසින්, ශ්‍රී ලංකාවේ යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක අක්වෙරළ බැංකු ඒකකවල පවත්වාගෙන යන ගිණුම් හරහා අරමුදල් සැපයීම මගින්, කිසිඳු සීමා කිරීම්වලින් තොරව, ශ්‍රී ලංකාව තුළ සංස්ථාගත නොකළ සහ ශ්‍රී ලංකාවේ කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කළ සමාගම්වල කොටස්වල හෝ ණය සුරැකුම්පත්වල ආයෝජනය කළ හැකි ය.

6. නේවාසික නොවන රුපියල් ගිණුම්වල පවත්වාගෙන යනු ලබන අරමුදල්වලින් විගාමිකයන් විසින් සිදු කරනු ලබන ආයෝජන.

(1) යම් විගාමිකයකුට, එම විගාමිකයාගේ නේවාසික නොවන රුපියල් ගිණුමක පවත්වාගෙන යනු ලබන අරමුදල්වලින්, උපලේඛනයේ මේ කොටසේ 'අ' ශීර්ෂය යටතේ 1 වන ඡේදයේ (8) වන අනුඡේදයේ (ඈ) අයිතමය හැර, උපලේඛනයේ මේ කොටසේ 'අ' ශීර්ෂය යටතේ 1 වන ඡේදයේ (1) වන, (2) වන, (3) වන සහ (8) වන අනුඡේද යටතේ අවසර ලබා දී ඇති ආයෝජන සිදු කිරීම සඳහා අවසර ඇත.

(2) එම ආයෝජනවල සියලු ආදායම් සහ ප්‍රාග්ධන ලැබීම් එම ආයෝජන සිදු කරන ලද්දේ කවර නේවාසික නොවන රුපියල් ගිණුම හරහා ද එම අදාළ නේවාසික නොවන රුපියල් ගිණුම් වෙත බැර කරනු ලැබිය යුතු ය.

(3) එම ආයෝජනවලින් උපයා ගනු ලබන සියලු ආදායම්, පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධානවලට අනුව, සුදුසුකම්ලත් සංක්‍රමණ දීමනාවට යටත් නොවෙමින්, (අදාළ වන පරිදි) අදාළ ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම හෝ විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුම හරහා පමණක් ආපසු සියරට යවනු ලැබිය හැකි ය.

(4) එම ආයෝජනවල යම් ප්‍රාග්ධන ඉපැයුම්, පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධානවලට අනුව, සුදුසුකම්ලත් සංක්‍රමණ දීමනාවට යටත්ව, අදාළ ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම හරහා පමණක් ආපසු සියරට යවනු ලැබිය හැකි ය.

7. බැහැර කිරීම්- මේ කොටසේ 'අ' ශීර්ෂය යටතේ 1 වන ඡේදයේ (1) වන අනුඡේදය යටතේ වන අවසරය පහත දැක්වෙන ව්‍යාපාරවලින් යම් ව්‍යාපාරයක් සිදු කිරීමට යෝජනා කරන හෝ සිදු කරගෙන යන සමාගමක ඡන්දය දීමේ අයිතිය හිමි කොටස් සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය -

(1) භාණ්ඩ උකසට ගැනීම.

(2) (ධීවර විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විසින් අර්ථ දක්වනු ලබන පරිදි) වෙරළබඩ මසුන් ඇල්ලීම.

(3) ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තන් විසින් දායකත්වය දරනලද ප්‍රාග්ධනය, එ.ජ.ඩො. මිලියන 5 ට අඩුවන අවස්ථාවක දී, සිල්ලර වෙළඳාම.

8. සීමා කිරීම් -

(1) උපලේඛනයේ මේ කොටසේ 'අ' ශීර්ෂය යටතේ 1 වන ඡේදයේ (1) වන අනුඡේදය යටතේ වන අවසරය, පහත සඳහන් ව්‍යාපාරවලින් යම් ව්‍යාපාරයක් කරගෙන යන හෝ කරගෙන යාමට යෝජනා කරන සමාගමක ඡන්දය දීමේ අයිතිය හිමි කොටස් සම්බන්ධයෙන් එකී සමාගමේ සම්පූර්ණයෙන් ගෙවන ලද ඡන්දය දීමේ අයිතිය හිමි කොටස් සංඛ්‍යාවෙන් 40% ක ප්‍රතිශතයක් දක්වා පමණක් හෝ යම් සමාගමක විදේශ ආයෝජනයන්හි වඩා ඉහළ ප්‍රතිශතයක් සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් විශේෂ අනුමැතියක් ප්‍රදානය කර ඇත්නම්, එකී ඉහළ ප්‍රතිශතය දක්වා පමණක් අදාළ විය යුතු ය.

(අ) ශ්‍රී ලංකාවේ අපනයන ජාත්‍යන්තර වශයෙන් නිශ්චය කරන ලද සලාක සීමා කිරීම්වලට යටත් වන අවස්ථාවක දී, භාණ්ඩ නිෂ්පාදනය;

(ආ) තේ, රබර්, පොල්, කොකෝවා, සහල්, සීනි සහ කුළුබඩු වගා කිරීම සහ මූලික වශයෙන් සකස් කිරීම;

(ඇ) පුනර්ජනනීය නොවන ජාතික සම්පත් කැණීම සහ මූලික වශයෙන් සකස් කිරීම;

(ඈ) දේශීය දැව භාවිතයෙන් සිදු කරනු ලබන දැව පදනම් කරගත් කර්මාන්ත;

(ඉ) ධීවර විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විසින් අර්ථ දක්වනු ලබන පරිදි) ගැඹුරු මුහුදෙහි මසුන් ඇල්ලීම;

(ඊ) ජන සන්නිවේදනය;

(උ) අධ්‍යාපනය;

(ඌ) භාණ්ඩ ප්‍රවාහනය;

(එ) සංචාරක නියෝජ්‍යායතන;

(ඒ) නැව් ප්‍රවාහන නියෝජ්‍යායතන;

(2) උපලේඛනයේ මේ කොටසේ 'අ' ශීර්ෂය යටතේ 1 වන ඡේදයේ (1) වන අනුඡේදය යටතේ වන අවසරය, මෙහි පහත නිශ්චිතව දක්වා ඇති ව්‍යාපාරවලින් යම් ව්‍යාපාරයක් කරගෙන යන හෝ කරගෙන යාමට යෝජනා කරන සමාගමක ඡන්දය දීමේ අයිතිය හිමි කොටස් සම්බන්ධයෙන්, ශ්‍රී ලංකා රජය විසින් එකී ව්‍යාපාරයන්හි විදේශ ආයෝජන සඳහා අනුමැතිය ලබා දීම පිණිස පිහිටුවා ඇති අදාළ නීතිමය හෝ පරිපාලන අධිකාරියක් මඟින් ප්‍රදානය කරනු ලබන සාමාන්‍ය හෝ විශේෂ අනුමැතියක් ලබා දී ඇත්තේ කවර කොටස් ප්‍රතිශතයක් සඳහා ද, එම සමාගමේ සම්පූර්ණයෙන් ගෙවන ලද ඡන්දය දීමේ අයිතිය හිමි කොටස් සංඛ්‍යාවේ ප්‍රතිශතය දක්වා පමණක් අදාළ විය යුතු ය.

(අ) ගුවනින් ප්‍රවාහනය කිරීම;

(ආ) (නාවික විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විසින් අර්ථ දක්වනු ලබන පරිදි) වෙරළබඩ නැව් ප්‍රවාහනය;

(ඇ) 1990 අංක 46 දරන කර්මාන්ත ප්‍රවර්ධන පනතේ දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කර්මාන්තමය ව්‍යවසායයන්; එනම්,

(i) ආයුධ, පතරොම්, පුපුරන ද්‍රව්‍ය, යුධ වාහන සහ උපකරණ, ගුවන් යානා සහ අනෙකුත් යුධමය දෘඩාංග නිෂ්පාදනය කරනු ලබන යම් කර්මාන්තයක්.

(ii) විෂ, මාදක, මද්‍යසාර, අන්තරායකර ඖෂධ සහ විෂ සහිත, උපද්‍රවකාරී හෝ පිළිකාකාරක ද්‍රව්‍ය නිෂ්පාදනය කරනු ලබන යම් කර්මාන්තයක්.

(iii) ව්‍යවහාර මුදල්, කාසි හෝ සුරැකුම්පත් ලේඛන, නිපදවනු ලබන යම් කර්මාන්තයක්.

(ඈ) මහා පරිමාණ යාන්ත්‍රික මැණික් කැණීම.

(ඉ) ලොතරැයි.

ආ. ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර ස්ථානයක් ආරම්භ කිරීම සහ පවත්වාගෙන යාම.

1. (1) 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති විදේශීය සමාගමකට ශ්‍රී ලංකාව තුළ,

(අ) උපලේඛනයේ මේ කොටසේ "ආ" ශීර්ෂය යටතේ 3 වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති ක්‍රියාකාරකම් හැර, යම් වාණිජමය, වෙළඳ හෝ කර්මාන්ත ක්‍රියාකාරකමක් කරගෙන යා හැකි ය. එසේ වුව ද උපලේඛනයේ මේ කොටසේ "ආ" ශීර්ෂය යටතේ 4 වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් විදේශ ආයෝජන සඳහා අනුමැතිය ප්‍රදානය කිරීමට ශ්‍රී ලංකා රජය විසින් පිහිටුවා ඇති අදාළ නෛතික හෝ පරිපාලන අධිකාරියක පූර්ව අවසරය ලබා ගෙන තිබිය යුතු යත හෝ

(ආ) සම්බන්ධීකරණ කාර්යාලයක්, නියෝජිත කාර්යාලයක්, ප්‍රාදේශීය කාර්යාලයක් හෝ වෙනත් ඒ හා සමාන කාර්යාලයක් විසින් සිදු කිරීමට භාරගෙන ඇති හෝ සිදු කරනු ලබන්නා වූ, එසේ වුව ද එම ක්‍රියාකාරකම් සිදු කිරීමෙන් ශ්‍රී ලංකාව තුළ වූ විදේශ සමාගමට ඍජුව හෝ වක්‍රව යම් ආදායමක් ජනනය කරනු නොලබන්නා වූ, යම් වාණිජ, වෙළඳ හෝ කර්මාන්ත නොවන යම් ක්‍රියාකාරකමක් සිදු කරනු ලැබිය හැකි ය.

(2) ඉහත සඳහන් යම් ක්‍රියාකාරකමක් සිදු කරගෙන යාමට භාරගෙන ඇති හෝ සිදු කරනු ලබන 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති යම් විදේශීය සමාගමක,

(අ) ව්‍යාපාර ස්ථානය, ශාඛා කාර්යාලයක්, ව්‍යාපෘති කාර්යාලයක් හෝ වෙනත් ඒ හා සමාන කාර්යාලයක් වන අවස්ථාවක දී, ශ්‍රී ලංකාවේ බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු සමඟ විදේශයේ පිහිටි මව් සමාගම විසින් විවෘත කර ඇති ආමුබ ආයෝජන ගිණුමක් හරහා යොමු කරන ලද අවම වශයෙන් එ.ජ.ඩො. 200,000ක හෝ ඊට සමාන නම් කරන ලද වෙනත් යම් විදේශ ව්‍යවහාර මුදලකින් වන ආයෝජනයක් එකී විදේශ සමාගමේ ගිණුමක බැරට ලැබිය යුතු අතර, එකී ආයෝජනය සනාථ කිරීම සඳහා වන සාක්ෂි ලියාපදිංචි කිරීමේ දින සිට දින අනූවක් (90) ඇතුළත සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව වෙත සැපයිය යුතු ය. එකී අරමුදල් ආයෝජනයක් වශයෙන් සමාගමේ පොත්වල සටහන් කළ යුතු අතර ශ්‍රී ලංකාව තුළ සමාගම එහි ව්‍යාපාර කටයුතු අවසන් කරන තුරු සමාගමේ පොත්වල ඇති එම සටහන් පවත්වාගෙන යා යුතු ය.

(ආ) ව්‍යාපාර ස්ථානය, සම්බන්ධීකරණ කාර්යාලයක්, නියෝජිත කාර්යාලයක් හෝ වෙනත් ඒ හා සමාන කාර්යාලයක් වන අවස්ථාවක දී, එකී ව්‍යාපාරික ස්ථානය පිහිටුවීම සහ පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය අරමුදල්, විදේශයේ පිහිටි මව් සමාගම විසින් ශ්‍රී ලංකාවේ බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු සමඟ විවෘත කරන ලද ආමුබ ආයෝජන ගිණුමක් හරහා විදේශ සමාගමේ ගිණුමක බැරට ලැබිය යුතු ය.

2. උපලේඛනයේ මේ කොටසේ 'ආ' ශීර්ෂය යටතේ 1 වන ඡේදයේ (1) වන අනුඡේදයේ සඳහන් විදේශ සමාගමක් විසින්, ආයෝජනය සිදු කරනු ලැබූ එහි මව් සමාගමේ ආමුබ ආයෝජන ගිණුම හරහා ඔවුන්ගේ ලාභය, රාජ්‍ය භාගය, වරලත් ව්‍යාපාරික ගාස්තු හෝ ඊට සමාන වෙනත් ගෙවීම් හෝ ගිණුම අවසන් කරනු ලබන අවස්ථාවේ දී පවතින අතිරික්ත අරමුදල්, බදු අඩු කළ පසු, ශ්‍රී ලංකාවෙන් පිටතට ප්‍රේෂණය කරනු ලැබිය හැකි ය. 2017 නොවැම්බර් මස 20 වන දිනට පෙරාතුව ලියාපදිංචි කරන ලද විදේශීය සමාගමක් විසින්, බලයලත් වෙළෙන්දා හෝ පරිසීමිත වෙළෙන්දා විසින් ගනුදෙනුවේ සද්භාවය පිළිබඳව සෑහීමට පත් වීමෙන් පසු, එකී ගෙවීම්, මව් සමාගමේ ආමුබ ආයෝජන ගිණුමක් හරහා ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය.

3. උපලේඛනයේ මේ කොටසේ 'ආ' ශීර්ෂය යටතේ 1 වන ඡේදයේ (1) වන අනුඡේදයේ (අ) අයිතමයේ කාර්යය සඳහා, පහත දැක්වෙන වාණිජමය, වෙළඳ සහ කර්මාන්ත ක්‍රියාකාරකම්, විදේශ සමාගමක් විසින් සිදු කිරීම සඳහා අවසර දෙනු නොලැබේ-

(1) (1988 අංක 30 දරන බැංකු පනත යටතේ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලද විදේශ බැංකු ශාඛා හැර) මුදල් ණයට දීම;

(2) භාණ්ඩ උකසට ගැනීම;

(3) ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තන් විසින් දායකත්වය දරන ලද ප්‍රාග්ධනය, ආයෝජනයෙන් පසු, එ.ජ.ඩො. මිලියන 5 කට අඩු වන අවස්ථාවක දී, සිල්ලර වෙළඳාම;

(4) (ධීවර විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විසින් අර්ථ දක්වනු ලබන පරිදි) වෙරළබඩ මසුන් ඇල්ලීම;

(5) තේ, රබර්, පොල් සහ සහල් වගාකිරීම සහ මූලික වශයෙන් සකස් කිරීම;

(6) පුනර්ජනනීය නොවන ජාතික සම්පත් කැණීම සහ මූලික වශයෙන් සකස් කිරීම;

(7) භාණ්ඩ ප්‍රවාහනය;

(8) නැව් ප්‍රවාහන නියෝජිත ව්‍යාපාරය;

(9) යාන්ත්‍රික මැණික් කැණීම; සහ

(10) ලොතරැයි.

4. උපලේඛනයේ මේ කොටසේ 'ආ' ශීර්ෂයේ 1 වන ඡේදයේ (1) වන අනුඡේදයේ (අ) අයිතමයේ කාර්යය සඳහා, විදේශ ආයෝජන සඳහා අනුමැතිය ප්‍රදානය කිරීමට ශ්‍රී ලංකා රජය විසින් පිහිටුවන ලද අදාළ නීතිමය හෝ පරිපාලන අධිකාරියේ පූර්ව අවසරය සහිතව පහත දැක්වෙන කටයුතු සිදු කිරීම සඳහා අවසර ලබා දෙනු ලැබේ-

(1) ශ්‍රී ලංකාවේ අපනයන ජාත්‍යන්තර වශයෙන් නිශ්චය කරන ලද සලාක සීමාකිරීම්වලට යටත් වන අවස්ථාවක දී, භාණ්ඩ නිෂ්පාදනය;

(2) සීනි, කොකෝවා සහ කුළුබඩු වගාකිරීම සහ මූලික වශයෙන් සකස් කිරීම;

(3) දේශීය දැව භාවිතයෙන් සිදු කරනු ලබන දැව පදනම් කරගත් කර්මාන්ත;

(4) (ධීවර විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විසින් අර්ථ දක්වනු ලබන පරිදි) ගැඹුරු මුහුදෙහි මසුන් ඇල්ලීම;

(5) ජන සන්නිවේදනය;

(6) අධ්‍යාපනය;

(7) ශ්‍රී ලංකාවෙන් පිටත සංචාරක නියෝජිත ව්‍යාපාරය;

(8) දේශීය ගුවන් ප්‍රවාහනය;

(9) (අ) ආයුධ, පතරොම්, පුපුරන ද්‍රව්‍ය, යුධ වාහන සහ ගුවන් යානා උපකරණ සහ වෙනත් යුධමය දෘඩාංග;

(ආ) විෂ, මාදක, මද්‍යසාර, අන්තරායකර ඖෂධ සහ විෂ සහිත උපද්‍රවකාරී හෝ පිළිකාකාරක ද්‍රව්‍යත සහ

(ඇ) ව්‍යවහාර මුදල්, කාසි සහ සුරැකුම්පත් ලේඛන,

නිෂ්පාදනය කරනු ලබන හෝ නිපදවනු ලබන යම් කර්මාන්තයක්.

II වන කොටස

ශ්‍රී ලංකා රජය විසින් ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කරනු ලැබීම සඳහා වන අවසරය

ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික යම් තැනැත්තකු වෙත යම් විදේශ ව්‍යවහාර මුදලකින් ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර හෝ වෙනත් වර්ගවල ණය සුරැකුම්පත් නිකුත් කිරීම සහ නිකුත් කිරීමට අදාළව එකී තැනැත්තන් වෙත යම් ගෙවීමක් සිදුකිරීම සඳහා, ඒ සම්බන්ධයෙන් වන අදාළ අධිකාරීන් හි අවසරයන්ට යටත්ව ශ්‍රී ලංකා රජයට අවසර ලබා දෙනු ලැබේ.

III වන කොටස

නේවාසික තැනැත්තන් සඳහා වන අවසර

1. මේ නියෝග යටතේ දක්වා ඇති ප්‍රාග්ධන ගනුදෙනු සිදු කිරීම සඳහා මේ උපලේඛනයේ I වන කොටස යටතේ නිශ්චිතව සඳහන් යම් නේවාසික තැනැත්තකු හට, මේ නියෝගවල විධිවිධානවලට හෝ ශ්‍රී ලංකාවේ වෙනත් යම් ලිඛිත නීතියකට යටත්ව, කොටස් හෝ අවසර ලද යම් සුරැකුම්පත් සහ බැඳුම්කර නිකුත් කිරීම සඳහා හෝ නිශ්චල දේපළ ණයට ගැනීම සඳහා හෝ නිශ්චල දේපළ විකිණීම සඳහා සහ තැන්පතු භාර ගැනීම සඳහා අවසර දෙනු ලැබේ.

2. මේ නියෝගවල විධිවිධානවලට හෝ ශ්‍රී ලංකාවේ වෙනත් යම් ලිඛිත නීතියකට යටත්ව, අවසර ලද යම් සුරැකුම්පත් සහ බැඳුම්කර නිකුත් කිරීම හෝ ණයට ගැනීම සඳහා උපලේඛනයේ I වන කොටස යටතේ නිශ්චිතව දක්වා ඇති ශ්‍රී ලංකා රජයට අවසර දෙනු ලැබේ.

3. කොටස් අත්පත් කරගැනීමේ හෝ පැවරීමේ ක්‍රම නොසලකා, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කරන ලද සමාගම් විසින්, මේ නියෝගවලට යටත්ව, නේවාසික නොවන ආයෝජකයකුගේ නමින් කොටස් නිකුත් කිරීම, පැවරීම සහ ලියාපදිංචි කිරීම කරනු ලැබිය යුතු ය.

4. විගාමිකයකුගේ දෙමාපියන්ගෙන් අයෙකු, සීයා හෝ ආච්චි, සහෝදරයකු හෝ සහෝදරියක හෝ කලත්‍රයකු වන නේවාසික පුද්ගලයකුට, විගාමිකයාට දෙනු ලබන ත්‍යාගයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ඇති යම් වත්කමක් පැවරීම සඳහා අවසර ලබාදෙනු ලැබේ.

5. මහ බැංකුව විසින් කාලය දීර්ඝ කිරීමක් ප්‍රදානය කරනු ලැබුවේ නම් මිස, ආයෝජනය සඳහා ආමුඛ ප්‍රේෂණ ලද දින සිට මාස තුනක් (3) ඇතුළත, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ අර්ථ නිරූපණය කර ඇති පරිදි වන සමාගම් හෝ ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන් විසින්, උපලේඛනයේ I වන කොටසේ 'අ' ශීර්ෂය යටතේ 1 වන ඡේදයේ (1) වන සහ (2) වන අනුඡේද යටතේ අවසර ලබා දී ඇති (අදාළවන අවස්ථාවක දී) කොටස් සහ ණය සුරැකුම්පත් නිකුත් කිරීම, පැවරීම හෝ ලියාපදිංචි කිරීම කරනු ලැබිය යුතු ය.

6. 2017 නොවැම්බර් මස 20 වන දිනට පෙර ලැබුණු ආමුඛ ප්‍රේෂණ හෝ මේ නියෝග ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දිනට පෙර ආයෝජකයන්ගේ ආමුඛ ආයෝජන ගිණුමක් හරහා ලැබුණු ආමුඛ ප්‍රේෂණ, මේ නියෝග ගැසට් පත්‍රයේ පළ කරන ලද දින සිට දින අනූවක් (90) ඇතුළත උපලේඛනයේ I වන කොටසේ 'අ' ශීර්ෂය යටතේ 7 වන සහ 8 වන ඡේදවල සඳහන් බැහැරකිරීම් සහ සීමාවන්ට යටත්ව කොටස් නිකුත් කිරීම සඳහා 2007 අංක 7 දරන සමාගම් පනතේ අර්ථ දක්වා ඇති පරිදි වන සමාගම්වලට අවසර ලබා දෙනු ලැබේ. ආයෝජනය සඳහා වන ආමුඛ ප්‍රේෂණය සඳහා සාක්ෂි ඉදිරිපත් කිරීමෙන් පසු ආයෝජකයා විසින් විවෘත කරන ලද ආමුඛ ආයෝජන ගිණුමක් හරහා පමණක් එම ආයෝජනවල සියලුම ආදායම සහ යම් ප්‍රාග්ධන ලැබීම් ආපසු සියරට යවනු ලැබිය යුතු ය.

IV වන කොටස

පනත ක්‍රියාත්මක වීමට පෙරාතුව ප්‍රදානය කරන ලද යම් (සාමාන්‍ය හෝ විශේෂ) අනුමැතියක් යටතේ සිදු කරනු ලබන සහ මේ නියෝගවල නිශ්චිතව සඳහන් ප්‍රාග්ධන ගනුදෙනුවලට සාරානුකූලව සමාන වන්නා වූ දැනට පවතින සියලු ප්‍රාග්ධන ගනුදෙනු, මේ නියෝග මඟින් හෝ යම් පසුව සාදනු ලබන නියෝග මඟින් නිශ්චිත වශයෙන් වෙනස් කරනු ලැබුවහොත් මිස එම අනුමැතිය යටතේ වන එකී ගනුදෙනු සඳහා නිශ්චිතව දක්වා ඇති නියම සහ කොන්දේසිවලට යටත්ව අඛණ්ඩව සිදු කරගෙන යනු ලැබිය හැකි ය.

V වන කොටස

දැනට පවතින ගිණුම් නැවත නම් කිරීම ආදිය

1. ඉවත් කරන ලද විනිමය පාලන පනතේ විධිවිධාන යටතේ විවෘත කරන ලද දැනට පවතින සියලු විදේශීය වාණිජ ණය ගැනීමේ ගිණුම්, ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසිකයන්ගෙන් එකී විදේශීය වාණිජ ණය ගැනීමේ ගිණුම් හරහා නේවාසික ණය ගැනුම්කරුවන් විසින් ලබා ගන්නා ලද විදේශ ව්‍යවහාර ණය මුදල් සම්පූර්යෙන් පියවන තෙක් අඛණ්ඩව ක්‍රියාත්මක විය යුතු ය.

2. 2017 නොවැම්බර් මස 17 වන දිනැති අංක 2045/56 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2017 අංක 2 දරන විදේශ විනිමය (ප්‍රාග්ධන ගනුදෙනුවල යෙදීමේ කාර්යය සඳහා ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම) නියෝග යටතේ නැවත නම් කරන ලද සියලු ආමුබ ආයෝජන ගිණුම්, එම නියෝග පරිච්ඡින්න කිරීම නොතකා නැවත නම් කරන ලද පරිදි අඛණ්ඩව ක්‍රියාත්මක විය යුතු ය.

VI වන කොටස

ගිණුම් විවෘත කර පවත්වාගෙන යාමේ බලය

1. ආමුබ ආයෝජන ගිණුම්

මේ නියෝග යටතේ නිශ්චිතව දක්වා ඇති ප්‍රාග්ධන ගනුදෙනු සිදු කිරීම සඳහා පහත සඳහන් සුදුසුකම් ලත් තැනැත්තන්ගේ නමින් ආමුබ ආයෝජන ගිණුම් විවෘත කර පවත්වාගෙන යාම සඳහා, බලයලත් වෙළෙන්දෙකුට හෝ පරිසීමිත වෙළෙන්දකුට බලය තිබිය යුතු ය -

(1) ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික විජාතිකයෙකු;

(2) ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික ශ්‍රී ලාංකික ද්විත්ව පුරවැසියෙකු;

(3) ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික, වෙනත් රටක නිත්‍ය වාසිකත්වය හෝ පුරවැසිභාවය ලබා ගෙන ඇති ශ්‍රී ලාංකික ජාතිකයෙකු;

(4) (විගාමිකයන් හැර) ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික, විදේශයක සේවයෙහි නියුක්ත ශ්‍රී ලාංකික පුරවැසියෙකු;

(5) ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද සමාගමක්;

(6) ශ්‍රී ලංකාවෙන් පිටත ලියාපදිංචි කරන ලද හවුල් ව්‍යාපාරයක්;

(7) ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටුවන ලද දේශීය අරමුදල්, ප්‍රාදේශීය අරමුදල්, අන්‍යෝන්‍ය අරමුදල්, ඒකක භාර සහ විදේශීය ආයතනික ආයෝජකයන්;

(8) බලයලත් වෙළෙන්දෙකු හෝ පරිසීමිත වෙළෙන්දෙකු සමඟ ආමුබ ආයෝජන ගිණුමක් පවත්වාගෙන යනු ලැබූ මියගිය තැනැත්තෙකුගේ බූදලයේ අද්මිනිස්ත්‍රාසිකරුවෙකු හෝ පොල්මඃකරුවෙකු;

(9) බලයලත් වෙළෙන්දෙකු හෝ පරිසීමිත වෙළෙන්දෙකු සමඟ ආමුබ ආයෝජන ගිණුමක් පවත්වාගෙන යනු ලැබූ සමාගමක ප්‍රතිග්‍රාහකයෙකු හෝ ඈවරකරුවෙකු;

(10) කලින් කලට මහ බැංකුව විසින් බලය ලබා දෙනු ලැබිය හැකි වෙනත් යම් තැනැත්තකු හෝ පුද්ගල ගණයක්.

2. විදේශීය වාණිජ ණය ගැනීමේ ගිණුම්

පනතේ විධිවිධාන යටතේ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තන්ගෙන් ණයට ගැනීම සඳහා අවසර ලත් තැනැත්තන්ගේ නමින් විදේශීය වාණිජ ණය ගැනීමේ ගිණුම් විවෘත කර පවත්වාගෙන යාම සඳහා බලයලත් වෙළෙන්දෙකුට හෝ පරිසීමිත වෙළෙන්දෙකුට බලය තිබිය යුතු ය.

3. වෙනත් නියම සහ කොන්දේසි

(1) ආමුබ ආයෝජන ගිණුම් සහ විදේශීය වාණිජ ණය ගැනීමේ ගිණුම් විවෘත කර පවත්වාගෙන යාම සඳහා සහ එම ගිණුම් සම්බන්ධයෙන් වන අවසර ලත් හරකිරීම් සහ බැරකිරීම් සඳහා වන නිර්මාණයක, පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් නිකුත් කරන ලද විධානයන් මගින් නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු ය.

(2) උපලේඛනයේ මේ කොටසේ 1 වන සහ 2 වන ඡේදයන්හි නිශ්චිතව දක්වා ඇති ගිණුම් විවෘතකර පවත්වාගෙන යාමට අපේක්ෂා කරන තැනැත්තන්, පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් නිකුත් කරන ලද අදාළ විධානවල නිශ්චිතව දක්වා ඇති නිර්ණායක යටතේ එම ගිණුම විවෘත කර පවත්වාගෙන යාම සඳහා සුදුසුකම් ලබන්නේ ද යන වග නිශ්චය කර ගැනීම සඳහා බලයලත් වෙළෙන්දෙකු හෝ පරිසීමිත වෙළෙන්දෙකු විසින් නිසි උද්යෝගයෙන් සහ සාධාරණ සැලකිල්ලක් ඇතිව කටයුතු කළ යුතු ය. සෑම බලයලත් වෙළෙන්දෙකු හෝ පරිසීමිත වෙළෙන්දෙකු විසින්, ගිණුම පවත්වාගෙන යනු ලබන කාල සීමාවේ දී සහ එකී ගිණුම් වසා දැමීමෙන් පසු අවුරුදු හයකට නොඅඩු කාල සීමාවක්, ගිණුම් හිමියන්ගේ සුදුසුකම් සනාථ කිරීමේ සාක්ෂියක් වශයෙන් ඔවුන්ට අදාළ තොරතුරු සහ ලේඛනගත සාක්ෂි පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2213/36 - 2021 පෙබරවාරි මස 03 වැනි බදාදා - 2021.02.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

රජයේ නිවේදන

2017 අංක 12 දරන විදේශ විනිමය පනත

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වන වගන්තිය සමග කියවිය යුතු 29 වන වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග

මහින්ද රාජපක්ෂ,
මුදල් අමාත්‍ය

2021 පෙබරවාරි මස 03 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 2021 අංක 3 දරන විදේශ විනිමය (විගාමිකයන් විසින් අරමුදල් ප්‍රේෂණය කිරීම) නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර 2021 මාර්තු මස 22 වන දින සිට ක්‍රියාත්මක විය යුතුය.

2. මෙහි උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති ගනුදෙනුවලට අදාළව විගාමිකයන් විසින් අරමුදල් ප්‍රේෂණය කිරීම, මේ නියෝගවල සහ මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති යම් සීමාවන්, නියම සහ කොන්දේසිවලට යටත්ව, මේ පනතේ 4 වන වගන්තිය යටතේ නිශ්චිතව දක්වා ඇති තාක් දුරට බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු විසින් සිදු කරනු ලැබීමට අවසර දෙනු ලැබූ, විදේශ විනිමයෙන් වූ බලයලත් ප්‍රාග්ධන ගනුදෙනු වර්ග විය යුතු ය.

3. මේ නියෝග යටතේ විදේශ විනිමයෙන් වූ ප්‍රාග්ධන ගනුදෙනු සිදු කිරීමේ දී, සෑම බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු විසින් ම පනතේ 9 වන වගන්තිය යටතේ, කලින් කලට, මහ බැංකුව විසින්, ඒ සම්බන්ධයෙන් කරනු ලබන විධාන වලට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු ය.

4. (1) මේ නියෝග යටතේ විදේශ විනිමයෙන් වූ ප්‍රාග්ධන ගනුදෙනු සිදු කිරීමේ නිරත වන සෑම බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු විසින් ම -

(අ) ගනුදෙනුව සිදු කරනු ලබන තැනැත්තාගේ සද්භාවය ; සහ

(ආ) එම ගනුදෙනුව මේ නියෝගවලට අනුකූල වන බව,

ඒ සම්බන්ධයෙන් වූ ලේඛනගත සාක්ෂි ලබා ගැනීම මගින් නිශ්චය කරගනු ලැබිය යුතු ය.

(2) මේ නියෝග යටතේ ප්‍රාග්ධන ගනුදෙනුවල නිරත වන සෑම තැනැත්තකු විසින් ම, (1) වන ඡේදයේ කාර්යය සඳහා යම් බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු වෙත අවශ්‍ය සියලු ලේඛනගත සාක්ෂි සපයනු ලැබිය යුතු ය.

(3) මේ නියෝග යටතේ විදේශ විනිමයෙන් වූ ප්‍රාග්ධන ගනුදෙනු සිදු කිරීමේ දී සෑම බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු විසින් ම පූර්ණ නිසි උද්යෝගයෙන් යුතුව ක්‍රියා කළ යුතු ය.

5. මේ නියෝග සමඟ අනුකූල වීමට අපොහොසත් වන, යම් බලයලත් වෙළෙන්දකු, පරිසීමිත වෙළෙන්දකු හෝ බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු නොවන යම් තැනැත්තකු සම්බන්ධයෙන් පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් අවශ්‍ය වන බවට සලකනු ලැබිය හැකි යම් ක්‍රියාමාර්ගයක් ගනු ලැබිය යුතු ය.

6. (1) මේ නියෝගවල කාර්යය සඳහා "නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල්" යන්නෙන් -

(අ) එක්සත් ජනපද ඩොලර් (එ.ජ.ඩො.);

(ආ) යූරෝ;

(ඇ) ස්ටර්ලිං පවුම්;

(ඈ) ඕස්ට්‍රේලියානු ඩොලර්;

(ඉ) සිංගප්පූරු ඩොලර්;

(ඊ) ස්වීඩන ක්‍රෝනර්;

(උ) ස්විස් ෆ්‍රෑන්ක්;

(ඌ) කැනේඩියානු ඩොලර්;

(එ) හොංකොං ඩොලර්;

(ඒ) ජපන් යෙන්;

(ඔ) ඩෙන්මාර්ක ක්‍රෝනර්;

(ඕ) නෝර්වීජියානු ක්‍රෝනර්;

(ක) චීන රෙන්මින්බි; සහ

(ග) නවසීලන්ත ඩොලර්,

අදහස් වේ.

(2) මහ බැංකුව විසින්, පනතේ 9 වන වගන්තිය යටතේ ඒ සම්බන්ධයෙන් නිකුත් කරනු ලබන විධාන මගින්, කලින් කලට (1) වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ එකතු කිරීම සිදු කරනු ලැබිය හැකි ය.

7. 2017 නොවැම්බර් මස 17 වන දින අංක 2045/56 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද 2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ සාදන ලද 2017 අංක 1 දරන විදේශ විනිමය (බලයලත් වෙළෙන්දන් වන බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සිදු කරනු ලබන විදේශ විනිමයෙන් වූ ප්‍රාග්ධන ගනුදෙනු වර්ග) නියෝග පරිච්ඡින්න කිරීම නොතකා, 2020 දෙසැම්බර් මස 18 වන දින අංක 2206/25 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද නියමය මගින් වලංගු කාල සීමාව දීර්ඝ කරන ලද, 2020 ජූලි මස 2 වන දින අංක 2182/37 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද සහ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 22 වන වගන්තිය යටතේ කරන ලද නියමය, එසේ දීර්ඝ කරන ලද කාල සීමාව තුළ දී බලපැවැත්විය යුතු ය.

8. මේ නියෝගවල කාර්යය සඳහා-

"පනත" යන්නෙන්, 2017 අංක 12 දරන විදේශ විනිමය පනත අදහස් වේ;

"බලයලත් වෙළෙන්දා" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"ප්‍රාග්ධන ගනුදෙනුව" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"මහ බැංකුව" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"විගාමිකයා" යන්නෙන්,

(අ) වෙනත් රටක නිත්‍ය නේවාසික තත්ත්වය හෝ පුරවැසිභාවය ලබාගෙන ඇති ශ්‍රී ලාංකිකයකු;

(ආ) මව හෝ පියා ශ්‍රී ලංකාවේ උපත ලද ශ්‍රී ලංකාවේ ද්විත්ව පුරවැසියකු; හෝ

(ඇ) (i) මව හෝ පියා ශ්‍රී ලංකාවේ උපත ලබා ඇති; සහ

(ii) සිය උපත ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර ඇති,

ශ්‍රී ලාංකික පුරවැසියකු නොවන තැනැත්තකු

අදහස් වන අතර, (අ), (ආ) සහ (ඇ) යන ඡේදවල සඳහන් තැනැත්තන්ගේ බාලවයස්කරුවන් ද ඇතුළත් වේ;

"සේවක අර්ථසාධක අරමුදල" යන්නෙන්, 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ පිහිටුවන ලද සේවක අර්ථසාධක අරමුදල අදහස් වේ;

"සේවා නියුක්තයන්ගේ භාර අරමුදල" යන්නෙන් 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත යටතේ පිහිටුවන ලද සේවා නියුක්තයන්ගේ භාර අරමුදල අදහස් වේ;

"සමීපතම පවුල් සාමාජිකයන්" යන්නෙන්, අදාළ තැනැත්තාගේ දෙමව්පියන්, සීයා හෝ ආච්චි, සහෝදර සහෝදරියන් සහ කලත්‍රයා අදහස් වේ;

"බලපත්‍රලාභී වාණිජ බැංකුව" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"අමාත්‍යවරයා" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"මුදල් මණ්ඩලය" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"මාපිය සංක්‍රමණ යෝජනා ක්‍රමය" යන්නෙන්, යම් විදේශ රටක නිත්‍ය වාසික තත්ත්වය හෝ පුරවැසිභාවය ලබාගෙන ඇති තැනැත්තකුගේ ශ්‍රී ලාංකික දෙමව්පියන්ට එම විදේශ රටේ නිත්‍ය වාසික තත්ත්වය ලබාගැනීමට හැකියාව ලබා දෙමින් එම විදේශ රට විසින් මෙහෙයවනු ලබන යෝජනා ක්‍රමයක් අදහස් වේ;

"ඉවත් කරන ලද විනිමය පාලන පනත" යන්නෙන්, (423 වන අධිකාරය වූ) විනිමය පාලන පනත අදහස් වේ;

"පරිසීමිත වෙළෙන්දා" යන්නට, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"තාවකාලික නේවාසික වීසා" යන්නෙන්, නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, අනාගත දිනක දී එම රටේ නිත්‍ය වාසික තත්ත්වය හෝ පුරවැසිභාවය ලබාගැනීමට පුද්ගලයකුට හැකියාව ලබා දෙන්නා වූ වීසා වර්ගයකට අයත්වන ශ්‍රී ලංකාවේ පුරවැසියකු විසින් ලබාගන්නා ලද වීසා අදහස් වේ.

(2 වන නියෝගය)

උපලේඛනය

I වන කොටස

විගාමිකයන් විසින් අරමුදල් ප්‍රේෂණය කිරීම

1. වයස අවුරුදු 18 හෝ ඊට වැඩි විගාමිකයකු මේ නියෝගවල සඳහන් කර ඇති සීමාවන්, නියම සහ කොන්දේසිවලට යටත්ව, ශ්‍රී ලංකා රුපියල්, විදේශ ව්‍යවහාර මුදල් බවට පරිවර්තනය වීමක් සිදුවන සංක්‍රමණික දීමනාවට හිමිකම් පෑමට සුදුසුකම් ලබයි.

2. (1) ශ්‍රී ලංකාවේ නේවාසිකයකුව සිටිය දී (චංචල, නිශ්චල, ස්පෘශ්‍ය සහ අස්පෘශ්‍ය වත්කම් ඇතුළුව) විගාමිකයාට අයිතිව තිබූ හෝ මේ නියෝග බලාත්මක වීමට පෙර එම තැනැත්තාගේ ශ්‍රී ලංකා රුපියල් ගිණුම හරහා අරමුදල් භාවිත කර අත්පත් කරගත් හෝ උපලේඛනයේ මේ කොටසේ 8 වන ඡේදය යටතේ අවසර ලබා දී ඇති පරිදි අත්පත් කරගත් ශ්‍රී ලංකාව තුළ ඇති යම් වත්කමකින් උපචිත වූ යම් ලැබීම්වලින්;

(2) ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තකුගෙන් විගාමිකයාට උරුම වූ (පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වල හෝ ආමුඛ ආයෝජන ගිණුම්වල ඇති අරමුදල් හැර, චංචල, නිශ්චල, ස්පෘශ්‍ය සහ අස්පෘශ්‍ය වත්කම් ඇතුළුව) ශ්‍රී ලංකාව තුළ ඇති යම් වත්කමකින් උපචිත වූ යම් ලැබීම්වලින්;

(3) ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තකු වන සමීපතම පවුල් සාමාජිකයකුගෙන් විගාමිකයකු ත්‍යාගයක් ලෙස ලබන (පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වල හෝ ආමුඛ ආයෝජන ගිණුම්වල ඇති අරමුදල් හැර චංචල, නිශ්චල, ස්පෘශ්‍ය සහ අස්පෘශ්‍ය වත්කම් ඇතුළුව) ශ්‍රී ලංකාව තුළ ඇති යම් වත්කමකින් උපචිත වූ යම් ලැබීම්වලින්;

(4) ශ්‍රී ලංකාවේ නේවාසිකයකුව සිටිය දී සිදුකරන ලද හෝ මේ නියෝග බලාත්මක වීමට පෙර ඔහුගේ හෝ ඇයගේ ශ්‍රී ලංකා රුපියල් ගිණුම් හරහා සිදු කරන ලද හෝ පැවරුම්කරු වෙත උරුමයෙන් ලද හෝ පැවරුම්කරු විසින් ත්‍යාගයක් ලෙස ලද හෝ උපලේඛනයේ මේ කොටසේ 8 වන ඡේදය යටතේ අවසර ලබා දී ඇති පරිදි සිදු කරන ලද ආයෝජනයන්ගෙන්, සමීපතම පවුල් සාමාජිකයකු වන වෙනත් විගාමිකයකුගෙන්, (එනම්, පැවරුම්කරු) විගාමිකයකු වෙත උරුම වූ හෝ ත්‍යාගයක් වශයෙන් ලැබුණු (පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හෝ ආමුඛ ආයෝජන ගිණුම්වල ඇති අරමුදල් හැර, චංචල, නිශ්චල, ස්පෘශ්‍ය සහ අස්පෘශ්‍ය වත්කම් ඇතුළුව) ශ්‍රී ලංකාව තුළ ඇති යම් වත්කමකින් උපචිත වූ යම් ලැබීම්වලින්;

(5) සමීපතම පවුල් සාමාජිකයකුගෙන් විගාමිකයා ලද (චංචල, නිශ්චල, ස්පෘශ්‍ය සහ අස්පෘශ්‍ය වත්කම් ඇතුළුව) ශ්‍රී ලංකාව තුළ ඇති යම් වත්කමකින් උපචිත වූ අරමුදල් වන මුදල් ත්‍යාගවලින්,

සංක්‍රමණික දීමනාවට හිමිකම් කියනු ලැබිය යුතු ය.

3. මේ උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති සංක්‍රමණික දීමනාව සඳහා පහත දැක්වෙන සීමාවන් අදාළ විය යුතු ය -

(1) විගාමිකයකු සඳහා එ.ජ.ඩො. 200,000 බැගින්වූ ආරම්භක සංක්‍රමණික දීමනාවක්,

(2) එ.ජ.ඩො. 30,000ක වාර්ෂික සංක්‍රමණික දීමනාවක්; ආරම්භක සංක්‍රමණික දීමනාව සම්පූර්ණයෙන් භාවිත කිරීමෙන් මාස 12ක අවම කාලයක් ඉකුත් වීමෙන් පසුව එකී පළමු වාර්ෂික දීමනාව පැවරිය හැකි ය. පළමු වාර්ෂික දීමනාව හැර පසුව වන දීමනා ලිත් වර්ෂයක් පාසා පවරනු ලැබිය යුතු අතර, (පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධානවලට යටත්ව එම කාල සීමාව සඳහා බැංකු ගිණුමක් වෙත අරමුදල් බැර කර පවත්වාගෙන ගොස් ඇත්නම්) එකතු කොට පැවරීම සිදු කරනු ලැබිය හැකි ය.

(3) 2017 නොවැම්බර් මස 20 වන දිනට පෙර ආරම්භක සංක්‍රමණික දීමනාවේ කොටසකට හිමිකම් පෑම සිදු කර ඇති විගාමිකයකු

සඳහා එ.ජ.ඩො. 150,000හි ඉතිරිය සහ උපලේඛනයේ මේ කොටසේ 3 වන ඡේදයේ (2) වන අනුඡේදයේ සඳහන් කර ඇති පරිදි වන එ.ජ.ඩො. 30,000ක පසුව ගෙවනු ලබන වාර්ෂික දීමනාව;

(4) 2017 නොවැම්බර් මස 20 වන දිනට පෙර ආරම්භක සංක්‍රමණික දීමනාව සම්පූර්ණයෙන් ම භාවිත කර ඇති විගාමිකයකු සඳහා 2013, 2014, 2015 සහ 2016 වර්ෂ සඳහා ලිත් වර්ෂයකට එ.ජ.ඩො. 20,000ක් බැගින් වූ සමුච්ඡිත වාර්ෂික දීමනාවක් සහ උපලේඛනයේ මේ කොටසේ 3 වන ඡේදයේ (2) වන අනුඡේදයේ සඳහන් කර ඇති පරිදි වන එ.ජ.ඩො. 30,000ක පසුව ගෙවනු ලබන වාර්ෂික දීමනාව.

4. විගාමිකයකු විසින් ශ්‍රී ලංකාවේ නේවාසිකයකුව සිටිමින් එකී පුද්ගලයා විසින් නිත්‍ය වාසිකත්වය හෝ පුරවැසිභාවය ලබාගෙන ඇති රටේ ප්‍රතිමුඛ ආයෝජන ගිණුමක් හරහා සිදුකරන ලද මුළු ආයෝජනවල වටිනාකම, සුදුසුකම්ලත් සංක්‍රමණික දීමනාවට හිමිකම් පාන අවස්ථාවේ දී, සුදුසුකම්ලත් සංක්‍රමණික දීමනාවෙන් අඩුකරනු ලැබිය යුතු ය.

5. විදේශ රටවල් විසින් මෙහෙයවනු ලබන "මාපිය සංක්‍රමණ යෝජනා ක්‍රම" සම්බන්ධයෙන් වන අවස්ථාවක දී, එකී පුද්ගලයන් විසින් වීසා ලබාගැනීම සඳහා විදේශ අධිකාරීන්ට සිදු කිරීමට ඇති ගෙවීම් සඳහා වන අරමුදල්, පනතේ විධිවිධාන යටතේ මහබැංකුව විසින් නිකුත් කරනු ලබන විධානවලට යටත්ව, එකී පුද්ගලයන් විසින් විවෘත කරන ලද ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුමක් හරහා ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය. එකී ගෙවීම සිදු කරනු ලැබූ රට තුළ නිත්‍ය වාසිකත්වය ලැබීමෙන් පසුව, සුදුසුකම්ලත් සංක්‍රමණික දීමනාවට හිමිකම්පාන අවස්ථාවේ දී එකී පුද්ගලයාගේ සුදුසුකම් ලත් සංක්‍රමණික දීමනාවෙන්, එම ගෙවීම්වල එකතුව අඩු කරනු ලැබිය යුතු ය.

6. ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික සහ වෙනත් රටක තාවකාලික නේවාසික වීසා ලබාගෙන ඇති වයස අවුරුදු 18 හෝ ඊට වැඩි ශ්‍රී ලාංකික පුද්ගලයකු, පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධානවලට යටත්ව එ.ජ.ඩො. 30,000ක උපරිමයක් සඳහා හිමිකම් පෑම සිදු කරනු ලැබිය හැකි ය. එම තැනැත්තන් විසින් විවෘත කරන ලද ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුමක් හරහා එකී දීමනාව සඳහා හිමිකම් පානු ලැබිය හැකි ය. සංක්‍රමණික දීමනාවට හිමිකම්පාන අවස්ථාවේ දී සුදුසුකම් ලැබූ සංක්‍රමණික දීමනාවෙන් එසේ හිමිකම්පාන ලද ප්‍රමාණය අඩු කරනු ලැබිය යුතු ය.

7. ආපසු සියරට යැවීමේ ක්‍රමය -

(1) උපලේඛනයේ මේ කොටසේ 5 වන සහ 6 වන ඡේද යටතේ නිශ්චිතව දක්වා ඇති විගාමිකයන් හෝ තැනැත්තන් විසින් සුදුසුකම්ලත් දීමනා ආපසු සියරට යැවීමේ කාර්යය සඳහා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධානවලට යටත්ව, බැංකු පද්ධතිය තුළ එක් ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුමක් පමණක් විවෘත කර පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

(2) උපලේඛනයේ මේ කොටසේ 7(4) වන අනුඡේදයේ දක්වා ඇති විගාමිකයකුගේ ආදායම ආපසු සියරට යැවීමේ කාර්යය සඳහා ඔහුට හෝ ඇයට වෙනම ගිණුමක් විවෘත කර පවත්වාගෙන යාමට අවශ්‍ය නම්, පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධානවලට යටත්ව එම කාර්යය සඳහා ම එම තැනැත්තා විසින් බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු සමඟ එක් විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුමක් පමණක් විවෘත කර පවත්වාගෙන යනු ලැබිය හැකි ය. එසේ වුව ද, ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම සහ විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුම යන දෙකම එකම බලයලත් වෙළෙන්දා හෝ පරිසීමිත වෙළෙන්දා සමඟ විවෘත කර පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

(3) සංක්‍රමණික දීමනාව විගාමිකයාගේ ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුමෙන් ඉල්ලුම්කරුගේ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමට හෝ ආමුඛ ආයෝජන ගිණුමට හෝ ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී වාණිජ බැංකුවක අක්වෙරළ බැංකු ඒකකයක ගිණුමකට හෝ විගාමිකයාගේ ශ්‍රී ලංකාවෙන් පිටත ගිණුමකට මාරුකරනු ලැබිය හැකි ය.

(4) උපලේඛනයේ මේ කොටසේ 2 වන ඡේදයේ දක්වා ඇති යම් වත්කම්වලින් උපචිත වන යම් ආදායමක් සහ (සේවක අර්ථසාධක අරමුදල (EPF), සේවා නියුක්තයන්ගේ භාර අරමුදල (ETF), පාරිතෝෂිකය සහ විශ්‍රාම වැටුප් හෝ වෙනත් යම් විශ්‍රාම ප්‍රතිලාභ ඇතුළුව) විශ්‍රාම ප්‍රතිලාභ අවස්ථාවෝචිත පරිදි අදාළ ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුමට හෝ විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුමට හෝ අනේවාසික රුපියල් ගිණුමට බැර කරනු ලැබිය හැකි අතර, සුදුසුකම්ලත් සංක්‍රමණික දීමනාවට යටත් නොවී, විගාමිකයාගේ ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම හෝ විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුම හරහා පමණක් ආපසු සියරට යැවිය යුතු ය. එම අරමුදල් විගාමිකයාගේ ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුමෙන් හෝ විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුමෙන් විගාමිකයාගේ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට හෝ ආමුඛ ආයෝජන ගිණුමකට හෝ ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී වාණිජ බැංකුවක අක්වෙරළ බැංකු ඒකකයක ගිණුමකට හෝ ශ්‍රී ලංකාවෙන් පිටත ගිණුමකට මාරු කරනු ලැබිය හැකි ය.

8. විගාමිකයන් විසින් ශ්‍රී ලංකාවේ දරනු ලබන අරමුදල් වලින් කරනු ලබන ආයෝජන

(1) විගාමිකයකුට, එම විගාමිකයාගේ අනේවාසික රුපියල් ගිණුමේ ඇති අරමුදල්වලින්, 2021 පෙබරවාරි මස 03 දිනැති අංක 2213/35 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 2021 අංක 2 දරන විදේශ විනිමය (ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව තුළ දී සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු වර්ග) නියෝග යටතේ අවසර ලබා දී ඇති පරිදි ශ්‍රී ලංකාව තුළ ආයෝජන සිදු කිරීමට අවසර ඇත.

(2) එම ආයෝජනවල සම්පූර්ණ ආදායම සහ ප්‍රාග්ධන ඉපැයුම්, ආයෝජනය සිදුකරන ලද අදාළ අනේවාසික රුපියල් ගිණුම්වලට බැරකරනු ලැබිය යුතු ය.

(3) එම ආයෝජනවල සම්පූර්ණ ආදායම පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධානවලට අනුව, සුදුසුකම්ලත් සංක්‍රමණික දීමනාවට යටත් නොවී, විගාමිකයාගේ අදාළ ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම හෝ විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුම හරහා පමණක් ආපසු සියරට යවනු ලැබිය යුතු ය.

(4) එම ආයෝජනවල යම් ප්‍රාග්ධන ලැබීම්, පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධානවල නිශ්චිතව දක්වනු ලැබිය හැකි පරිදි සුදුසුකම්ලත් සංක්‍රමණික දීමනාවට යටත්ව, ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම හරහා පමණක් ආපසු සියරට යවනු ලැබිය හැකි ය.

9. විගාමිකයකු විසින්, ඔහු විසින් ශ්‍රී ලංකාවේ දරන ශ්‍රී ලංකා රුපියල් භාවිතයෙන් මිල දී ගනු ලැබූ හෝ උරුමයෙන් ලද නිශ්චල දේපළක් ශ්‍රී ලංකාවේ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික යම් තැනැත්තකුට විකුණන අවස්ථාවක දී, එම දේපළ විකිණීමට අදාළ ප්‍රතිෂ්ඨාව ගෙවීම ශ්‍රී ලංකා රුපියල්වලින් සිදුකළ යුතු අතර, එය විගාමිකයාගේ අනේවාසික රුපියල් ගිණුමකට හෝ ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුමකට පමණක් බැරකරනු ලැබිය යුතු ය.

10. වෙනත් නියම සහ කොන්දේසි.

(1) විගාමිකයකු විසින් ඔහු හෝ ඇය නිත්‍ය වාසිකත්වය ලබාගත් රටේ ස්ථිරවම පදිංචිවීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකාව හැරයාමට අදහස් කරන විට දී, එකී පුද්ගලයාගේ ශ්‍රී ලංකා රුපියල් ගිණුම්, අනේවාසික රුපියල් ගිණුම් ලෙස නැවත නම් කිරීම සඳහා ඔහුගේ හෝ ඇයගේ සංක්‍රමණය සම්බන්ධයෙන් ඔහු හෝ ඇය ශ්‍රී ලංකා රුපියල් ගිණුම් පවත්වාගෙන යනු ලබන බලයලත් වෙළෙන්දාට දැනුම් දෙනු ලැබිය යුතු ය. දැනටමත් විගාමිකයකු වන පුද්ගලයකු විසින් මේ නියෝග ක්‍රියාත්මක වීමෙන් මාස 6ක් ඇතුළත එසේ කිරීමට කටයුතු කළ යුතු ය.

(2) සංක්‍රමණික දීමනාවට, ශ්‍රී ලංකාව හැරයන අවස්ථාවේ දී (පළමුව හෝ පසුව) හෝ ශ්‍රී ලංකාවෙන් පිටත විගාමිකයා නේවාසිකව සිටින අවස්ථාවේ දී පමණක් හිමිකම් පෑම සිදුකළ යුතු ය.

II වන කොටස

පනත ක්‍රියාත්මක වීමට පෙර ප්‍රදානය කර ඇති යම් (සාමාන්‍ය හෝ විශේෂ) අනුමැතියක් යටතේ සිදු කරනු ලබන සහ මේ නියෝගවල නිශ්චිතව දක්වා ඇති ප්‍රාග්ධන ගනුදෙනුවලට සාරානුකූලව සමාන වන්නා වූ දැනට පවතින සියලු ප්‍රාග්ධන ගනුදෙනු, මේ නියෝග මගින් හෝ යම් පසුකාලීන නියෝග මගින් විශේෂයෙන් වෙනස් කරනු ලබන්නේ නම් මිස එම අනුමැතිය යටතේ එම ගනුදෙනු සඳහා නිශ්චිතව දක්වා ඇති නියම සහ කොන්දේසිවලට යටත්ව අඛණ්ඩව සිදු කරනු ලැබිය හැකි ය.

III වන කොටස

ගිණුම් නැවත නම් කිරීම ආදිය

1. මහ බැංකුව විසින් ලියාපදිංචි කිරීමේ අංකයක් නිකුත් කර ඇති ගිණුම් හැර සියලු ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම්, පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධානවලට යටත්ව, මේ නියෝග *ගැසට් පත්‍රයේ* පළ කරන ලද දිනයේ සිට මාස තුනක් ඇතුළත අනේවාසික රුපියල් ගිණුම් ලෙස නැවත නම් කර තවදුරටත් පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

2. ශ්‍රී ලංකාවෙන් පිටත ලියාපදිංචි කරන ලද විදේශ ආයතන සහ සමාගම් සහ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික විදේශයන්හි සේවා නියුක්ත ශ්‍රී ලාංකිකයන් විසින් පවත්වාගෙන යනු ලබන දැනට පවතින සියලු ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම්, පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධානවලට යටත්ව, මේ නියෝග *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දින සිට මාස 3ක් ඇතුළත, පිළිවෙළින් අනේවාසික රුපියල් ගිණුම් සහ ශ්‍රී ලංකා රුපියල් ගිණුම් ලෙස නැවත නම් කර තවදුරටත් පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

3. ඔහු හෝ ඇය නිත්‍ය වාසිකත්වය ලබාගත් රටේ ස්ථිරව ම පදිංචි වීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකාව හැරයාමට අදහස් කරනු ලබන විගාමිකයකු විසින් පවත්වාගෙන යනු ලබන සියලු ශ්‍රී ලංකා රුපියල් ගිණුම් පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන යම් විධානයකට යටත්ව, එම විගාමිකයාගේ සංක්‍රමණය පිළිබඳව බලයලත් වෙළෙන්දා හෝ පරිසීමිත වෙළෙන්දකු දැනගත් මොහොතට ඉක්බිතිව ම බලාත්මක වන පරිද්දෙන් අනේවාසික රුපියල් ගිණුම් ලෙස නැවත නම් කර තවදුරටත් පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

4. විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා විසින් නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ අංකය සමඟ දැනටමත් ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් විවෘත කර ඇති විගාමිකයන්ගේ නමින්, පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් නිකුත් කරන ලද යම් විධානයකට යටත්ව, විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුම් විවෘත කර පවත්වාගෙන යාම සඳහා බලයලත් වෙළෙන්දකුට හෝ පරිසීමිත වෙළෙන්දකුට අවසරය ඇත.

IV වන කොටස

ගිණුම් විවෘත කර පවත්වාගෙන යාමේ බලය.

1. ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම්

මේ නියෝග යටතේ නිශ්චිතව දක්වා ඇති ප්‍රාග්ධන ගනුදෙනුවලදී ගනුදෙනු කිරීමට පහත දැක්වෙන සුදුසුකම්ලත් තැනැත්තන්ගේ නමින් ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් විවෘත කර පවත්වාගෙන යාම සඳහා බලයලත් වෙළෙන්දකුට හෝ පරිසීමිත වෙළෙන්දකුට බලය තිබිය යුතු ය -

(1) ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික විගාමිකයකු;

(2) බාලවයස්කරුවකු ද ඇතුළුව ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික විජාතිකයකු;

(3) වයස අවුරුදු 18 හෝ ඊට වැඩි වෙනත් රටක තාවකාලික නේවාසික වීසා යටතේ වෙනත් රටකට පිටත් වීමට අදහස් කරනු ලබන ශ්‍රී ලාංකික පුද්ගලයකු;

(4) මාපිය සංක්‍රමණ යෝජනා ක්‍රමයක් යටතේ අනාගත සංක්‍රමණිකයකු වන ශ්‍රී ලාංකික පුද්ගලයකු;

(5) ඉහත (1) සහ (2) අනුඡේදවල සඳහන් තැනැත්තකු මියගියහොත්, එම තැනැත්තාගේ බූදලය අද්මිනිස්ත්‍රාසි කර අවසන් වන තෙක් එම මියගිය තැනැත්තාගේ බූදලයේ අද්මිනිස්ත්‍රාසිකරු හෝ පොල්මඃකරු;

(6) මහ බැංකුව විසින් කලින් කලට බලය ලබා දිය හැකි වෙනත් යම් තැනැත්තකු හෝ තැනැත්තන් වර්ග.

2. විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුම්

යම් විගාමිකයකු විසින් ගෝලීය වශයෙන් උපචය කරගන්නා ලද වර්තමාන ආදායම හඳුනාගැනීම සඳහා එම විගාමිකයා ස්ථිර වශයෙන් නේවාසිකව සිටින රටේ නියාමන අවශ්‍යතාවයක් පවතින්නේ නම් පමණක්, මේ උපලේඛනයේ 1 වන කොටසේ 7(4) වන අනුඡේදයේ සඳහන්, ශ්‍රී ලංකාව තුළ උපචය වූ ඔහුගේ හෝ ඇයගේ වර්තමාන ආදායම ආපසු සියරට යැවීමේ කාර්යය සඳහා පහත දැක්වෙන සුදුසුකම්ලත් තැනැත්තන්ගේ නාමයෙන් විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුම් විවෘත කර පවත්වාගෙන යෑම සඳහා බලයලත් වෙළෙන්දකුට හෝ පරිසීමිත වෙළෙන්දකුට බලය තිබිය යුතු ය -

(අ) විගාමිකයකු;

(ආ) මහ බැංකුව විසින් කලින් කලට බලය ලබා දිය හැකි වෙනත් යම් තැනැත්තකු හෝ තැනැත්තන් වර්ග;

3. අනේවාසික රුපියල් ගිණුම්

මේ නියෝගවල මේ උපලේඛනයේ 1 වන කොටසේ 8 වන ඡේදයේ දක්වා ඇති ශ්‍රී ලංකාවේ දේශීය ගනුදෙනු සහ අවසරලත් ආයෝජනවලට පහසුකම් සැලසීම සඳහා, කලින් කලට සංශෝධනය කරනු ලැබිය හැකි පරිදි වන 2021 පෙබරවාරි මස 03 දිනැති අංක 2213/38 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2021 අංක 5 දරන විදේශ විනිමය (විදේශ විනිමය ගනුදෙනුවල නිරත වීමේ කාර්යය සඳහා ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම) නියෝග ප්‍රකාරව විගාමිකයන් සඳහා අනේවාසික රුපියල් ගිණුම් විවෘත කර පවත්වාගෙන යාම සඳහා බලයලත් වෙළෙන්දකුට හෝ පරිසීමිත වෙළෙන්දකුට අවසර ලබා දෙනු ලැබේ.

4. වෙනත් නියම සහ කොන්දේසි

(1) මේ උපලේඛනයේ මේ කොටසේ 1 වන ඡේදය යටතේ නිශ්චිතව දක්වා ඇති පරිදි යම් සුදුසුකම්ලත් තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවේ බැංකු පද්ධතිය තුළ එක් ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුමක් පමණක් විවෘත කරනු ලැබිය යුතු ය.

(2) මේ උපලේඛනයේ මේ කොටසේ 2 වන ඡේදය යටතේ නිශ්චිතව දක්වා ඇති පරිදි යම් සුදුසුකම්ලත් තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවේ බැංකු පද්ධතිය තුළ එක් විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුමක් පමණක් විවෘත කරනු ලැබිය යුතු ය.

(3) ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම සහ විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුම යන ගිණුම් දෙකම එකම බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු සමඟ විවෘත කර පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

(4) ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් හෝ විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුම විවෘත කර පවත්වාගෙන යාම සඳහා වන නිර්ණායක, එම ගිණුම් සඳහා අවසර ලත් හර කිරීම්, බැර කිරීම් පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන අදාළ විධානවල නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු ය.

(5) උපලේඛනයේ මේ කොටස යටතේ නිශ්චිතව දක්වා ඇති ගිණුම් විවෘත කර පවත්වාගෙන යාම සඳහා ඉල්ලා සිටින තැනැත්තන්, මේ නියෝග සහ පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් කලින් කලට නිකුත් කරනු ලබන විධාන ප්‍රකාරව එම ගිණුම් විවෘත කර පවත්වාගෙන යාම සඳහා සුදුසුකම් සහිත තැනැත්තන් වන බවට නිශ්චය කර ගැනීම සඳහා බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු විසින් නිසි උද්යෝගයෙන් සහ සාධාරණ සැලකිල්ලෙන් යුතුව කටයුතු කරනු ලැබිය යුතු ය. සෑම බලපත්‍රලාභී වෙළෙන්දකුම හෝ පරිසීමිත වෙළෙන්දකු ම විසින් ගිණුම පවත්වාගෙන යන කාලය අතරතුර සහ එම ගිණුම් වසා දැමීමෙන් අවම තරමේ අවුරුදු හයක කාලයක් සඳහා ගිණුම් හිමියන් සුදුසුකම් සහිත බවට තහවුරු කිරීමේ සාක්ෂියක් ලෙස ගිණුම් හිමියාට අදාළ තොරතුරු සහ ලිඛිත සාක්ෂි පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2213/37- 2021 පෙබරවාරි මස 03 වැනි බදාදා - 2021.02.03

I වැනි කොටස : (I) වැනි ඡෙදය – සාමාන්‍ය

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

රජයේ නිවේදන

2017 අංක 12 දරන විදේශ විනිමය පනත

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වන වගන්තිය සමග කියවිය යුතු 29 වන වගන්තිය යටතේ සාදනු ලබන නියෝග.

මහින්ද රාජපක්ෂ,
මුදල් අමාත්‍ය.

2021 පෙබරවාරි මස 03 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 2021 අංක 4 දරන විදේශ විනිමය (විවිධ ප්‍රාග්ධන ගනුදෙනු වර්ග) නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර 2021 මාර්තු මස 22 වන දින සිට ක්‍රියාත්මක විය යුතුය.

2. මෙහි උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් විවිධ ප්‍රාග්ධන ගනුදෙනු වර්ග, පනතේ 4 වන වගන්තියේ නිශ්චිතව සඳහන් කරනු ලැබූ ප්‍රමාණයට බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු විසින් සිදු කරනු ලැබීමට අවසර දෙනු ලැබූ විදේශ විනිමයෙන් වූ බලයලත් ප්‍රාග්ධන ගනුදෙනු වර්ග විය යුතු ය.

3. මේ නියෝග යටතේ විදේශ විනිමයෙන් වූ විවිධ ප්‍රාග්ධන ගනුදෙනු සිදු කිරීමේ දී සෑම බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු විසින් ම, පනතේ 9 වන වගන්තිය යටතේ, කලින් කලට, මහ බැංකුව විසින්, ඒ සම්බන්ධයෙන් නිකුත් කරනු ලබන විධානවලට අනුකූල විය යුතු ය.

4. (1) මේ නියෝග යටතේ විදේශ විනිමයෙන් වූ විවිධ ප්‍රාග්ධන ගනුදෙනුවල නිරත වන සෑම බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු විසින් ම -

(අ) ගනුදෙනුව සිදුකරනු ලබන තැනැත්තාගේ සද්භාවය; සහ
(ආ) එම ගනුදෙනුව මේ නියෝගවලට අනුකූලව සිදු කර ඇති බවට,

ඒ සම්බන්ධයෙන් වූ ලේඛනගත සාක්ෂි ලබා ගැනීම මගින් නිශ්චය කරනු ලැබිය යුතු ය.

(2) මේ නියෝග යටතේ විවිධ ප්‍රාග්ධන ගනුදෙනුවල නිරත වන සෑම තැනැත්තකු විසින් ම, (1) වන ඡේදයේ කාර්යය සඳහා යම් බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු වෙත අවශ්‍ය සියලු ලේඛනගත සාක්ෂි සපයනු ලැබිය යුතු ය.

(3) මේ නියෝග යටතේ විදේශ විනිමයෙන් වූ විවිධ ප්‍රාග්ධන ගනුදෙනු සිදුකිරීමේ දී සෑම බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු විසින් ම පූර්ණ නිසි උද්යෝගයෙන් කටයුතු කරනු ලැබිය යුතු ය.

5. මේ නියෝගවලට අනුකූල වීමට අපොහොසත් වන යම් බලයලත් වෙළෙන්දකු, පරිසීමිත වෙළෙන්දකු හෝ බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු නොවන වෙනත් යම් තැනැත්තකු සම්බන්ධයෙන් පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින්, අවශ්‍ය වන බවට සලකනු ලැබිය හැකි යම් ක්‍රියාමාර්ගයක් ගනු ලැබිය හැකි ය.

6. 2 වන නියෝගයේ සඳහන් සෑම බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු විසින් ම සහ එම බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු හරහා මේ නියෝග යටතේ විවිධ ප්‍රාග්ධන ගනුදෙනුවල නිරත වන තැනැත්තන් විසින්, ඔවුන් නිරත වන විවිධ ප්‍රාග්ධන ගනුදෙනු මේ නියෝග යටතේ අවසර ලත් ගනුදෙනු වන බව ඔප්පු කිරීම සඳහා වන සියලු තොරතුරු සහ ලේඛනගත සාක්ෂි, එම ගනුදෙනුවේ දින සිට වසර හයක කාලසීමාවක් සඳහා රඳවා තබා ගනු ලැබිය යුතු ය.

7. පනත ක්‍රියාත්මක වීමට පෙරාතුව ප්‍රදානය කරන ලද යම් (සාමාන්‍ය හෝ විශේෂ) අනුමැතියක් යටතේ සිදු කරනු ලැබූ සහ මේ නියෝගවල නිශ්චිතව දක්වා ඇති විවිධ ප්‍රාග්ධන ගනුදෙනුවලට සාරානුකූලව සමාන වන්නා වූ දැනට පවතින සියලුම විවිධ ප්‍රාග්ධන ගනුදෙනු, මේ නියෝග මගින් හෝ යම් පසු කාලීන නියෝග මගින් විශේෂ වශයෙන් වෙනස් කරනු ලබන්නේ නම් මිස එම අනුමැතිය යටතේ එම ගනුදෙනු සඳහා නිශ්චිතවම දක්වා ඇති නියම සහ කොන්දේසිවලට යටත්ව අඛණ්ඩව සිදු කරගෙන යනු ලැබිය හැකි ය.

8. (1) මේ නියෝගවල කාර්යය සඳහා "නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල්" යන්නෙන් -

(අ) එක්සත් ජනපද ඩොලර් (එ.ජ.ඩො.);
(ආ) යුරෝ;
(ඇ) ස්ටර්ලිං පවුම්;
(ඈ) ඕස්ට්‍රේලියානු ඩොලර්;
(ඉ) සිංගප්පූරු ඩොලර්;
(ඊ) ස්වීඩන ක්‍රෝනර්;
(උ) ස්විස් ෆ්‍රෑන්ක්;
(ඌ)කැනේඩියානු ඩොලර්;
(එ) හොංකොං ඩොලර්;
(ඒ) ජපන් යෙන්;
(ඔ) ඩෙන්මාර්ක ක්‍රෝනර්;
(ඕ) නෝර්වීජියානු ක්‍රෝනර්;
(ක) චීන රෙන්මින්බි; සහ
(ග) නවසීලන්ත ඩොලර්,

අදහස් වේ.

(2) මහ බැංකුව විසින්, පනතේ 9 වන වගන්තිය යටතේ ඒ සම්බන්ධයෙන් නිකුත් කරනු ලබන විධාන මඟින්, කලින් කලට, (1) වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ එකතු කිරීම සිදු කරනු ලැබිය හැකි ය.

9. 2019 ඔක්තෝබර් මස 17 වන දිනැති අංක 2145/49 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වන වගන්තිය සමඟ කියවිය යුතු 29 වන වගන්තිය යටතේ සාදන ලද නියෝග, ඒ යටතේ සිදුකරන ලද කිසිවකට අගතියක් නොමැතිව මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

10. මේ නියෝගවල කාර්යය සඳහා -

"පනත" යන්නෙන්, 2017 අංක 12 දරන විදේශ විනිමය පනත අදහස් වේ;

"බලයලත් වෙළෙන්දා" යන්නට, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"ප්‍රාග්ධන ගනුදෙනුව" යන්නට, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"මහ බැංකුව" යන්නට, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"ජංගම ගනුදෙනුව" යන්නට, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"සමීපතම පවුලේ සාමාජිකයන්" යන්නෙන්, දෙමාපියන්, කලත්‍රයා සහ දරුවන් අදහස් වේ;

"අමාත්‍යවරයා" යන්නට, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"මුදල් මණ්ඩලය" යන්නට, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"පරිසීමිත වෙළෙන්දා" යන්නට, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"රාජ්‍ය හිමිකම සහිත ව්‍යවසාය" යන්නෙන්, 2021 පෙබරවාරි මස 03 වන දිනැති අංක 2213/35 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2021 අංක 2 දරන විදේශ විනිමය (ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව තුළ දී සිදුකරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු වර්ග) නියෝගවල දී ඇති අර්ථය ම තිබිය යුතු ය.

(2 වන නියෝගය)

උපලේඛනය

විවිධ ප්‍රාග්ධන ගනුදෙනු වර්ග

(අ) ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තන්ට ශ්‍රී ලංකාව තුළදී ණය සහ අත්තිකාරම් ප්‍රදානය කිරීම.

පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන අදාළ විධානවලට යටත්ව බලයලත් වෙළෙන්දන් හෝ පරිසීමිත වෙළෙන්දන් පහත දැක්වෙන තැනැත්තන්ට විදේශ ව්‍යවහාර මුදලින් හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් නම් කරන ලද ණය සහ අත්තිකාරම් ප්‍රදානය කරනු ලැබිය හැකි ය -

(1) ශ්‍රී ලංකාවේ නේවාසික දේපළක් අත්පත් කරගැනීමේ, ඉදිකිරීමේ, සංවර්ධන කිරීමේ හෝ නවීකරණය කිරීමේ කාර්යය සඳහා වෙනත් රටක නිත්‍ය නේවාසිකයන් සහ ද්විත්ව පුරවැසියන් වන ශ්‍රී ලාංකිකයන්ට;

(2) යම් කාර්යයක් සඳහා ශ්‍රී ලංකාව තුළ දී භාවිත කිරීම පිණිස සහ ශ්‍රී ලංකාවෙන් පිටත සේවයෙහි නියුක්ත ශ්‍රී ලාංකිකයන්ගේ නේවාසික සමීපතම පවුලේ සාමාජිකයන්ගේ ජංගම ගනුදෙනුවල කාර්යය සඳහා, ශ්‍රී ලංකාවෙන් පිටත සේවයෙහි නියුක්ත ශ්‍රී ලාංකිකයන්ට.

(ආ) ශ්‍රී ලංකාවෙන් පිටත අධ්‍යාපනයේ නියුතු ශ්‍රී ලාංකික සිසුන් විසින් ණය ලබාගැනීම්.

1. පිටරට අධ්‍යාපනයේ යෙදී සිටින අතරතුර දී සිය අධ්‍යාපන ගාස්තු, ජීවන වියදම් සහ අධ්‍යාපනයට අදාළ වෙනත් වියදම් සපුරා ගැනීමේ කාර්යය සඳහා විදේශ රටවල පවතින බැංකුවලින්, මූල්‍ය ආයතනවලින්, විශ්වවිද්‍යාලවලින් හෝ අධ්‍යාපනික ආයතනවලින් ණය ලබා ගැනීම සඳහා සහ ශ්‍රී ලංකාවෙන් අරමුදල් ප්‍රේෂණය කිරීම මගින් එම ණය මුදල පියවීම සඳහා අධ්‍යාපනික කාර්යය සඳහා ශ්‍රී ලංකාවෙන් පිටතට ගොස් සිටින යම් ශ්‍රී ලාංකික පුරවැසියකුට අවසර ලබා දෙනු ලැබේ.

2. යම් බලයලත් වෙළෙන්දකු සහ පරිසීමිත වෙළෙන්දකු විසින්, ගනුදෙනුවේ සද්භාවය පරීක්ෂා කිරීමෙන් සහ අවශ්‍ය ලේඛනගත සාක්ෂි ලබාගැනීමෙන් පසු අධ්‍යාපනික කාර්යය සඳහා ශ්‍රී ලංකාවෙන් පිටතට ගොස් සිටින ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ ශ්‍රී ලංකාවේ සිටින දෙමාපියන් හෝ භාරකරුවන් විසින් ණය මුදල් ගෙවීම සහ පියවීම වශයෙන් ණය ලබා දෙන ලද අදාළ ආයතනවලට ප්‍රතිමුඛ ප්‍රේෂණ සිදු කරනු ලැබිය හැකි ය.

3. ඉහත කී ශ්‍රී ලංකා පුරවැසියකු විසින්, වෙනත් රටක නිත්‍ය නේවාසිකත්වය හෝ වෙනත් රටක පුරවැසිභාවය සඳහා හිමිකම් ලබන තාවකාලික නේවාසික වීසා බලපත්‍රයක් හෝ (ද්විත්ව පුරවැසිභාවය ද ඇතුළු ව) වෙනත් රටක පුරවැසිභාවය ලබා සිටින අවස්ථාවක දී, ණය මුදල් පියවීමට අදාළ ප්‍රතිමුඛ ප්‍රේෂණ, එම තැනැත්තාගේ සුදුසුකම්ලත් සංක්‍රමණික දීමනාවට යටත් විය යුතු ය.

ඇ. මූල්‍ය ව්‍යුත්පන්න ගනුදෙනුවලට අදාළ ගෙවීම්.

පාදක ගනුදෙනුවල සද්භාවය පිළිබඳ සෑහීමට පත්වීමෙන් පසු සහ මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධානවලට අනුකූලව, බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු විසින්, පනත යටතේ අවසර දෙන ලද ජංගම ගනුදෙනුවලට සහ ප්‍රාග්ධන ගනුදෙනුවලට (එනම් පාදක ගනුදෙනු) අදාළ මූල්‍ය ව්‍යුත්පන්න ගනුදෙනු සඳහා විදේශ ව්‍යවහාර මුදලින් ගෙවීම් සිදු කරනු ලැබිය හැකි ය.

ඈ. තාවකාලික නේවාසික වීසා බලපත්‍ර යටතේ ශ්‍රී ලංකාව හැර යාමට අදහස් කරන තැනැත්තන් වෙත විදේශ විනිමය නිදහස් කිරීම.

ශ්‍රී ලංකා ආගමන හා විගමන පාලක ජනරාල්වරයා හෝ වෙනත් අදාළ අධිකාරියක් විසින් නිකුත් කරන ලද විදේශ ගමන් බලපත්‍රයේ කරන ලද සුදුසු පිටසනක් සමඟ එ.ජ.ඩො. 15,000ක් හෝ වෙනත් විදේශ ව්‍යවහාර මුදලකින් ඊට සමාන ප්‍රමාණයක උපරිමයකට යටත්ව (අනාගත දිනයක දී යම් රටක නිත්‍ය වාසිකත්වය හෝ පුරවැසිභාවය ලබාගැනීම සඳහා පුද්ගලයකුට හිමිකම් ලබාදෙන තාවකාලික නේවාසික වීසා හැර) තාවකාලික නේවාසික වීසා බලපත්‍රයක් යටතේ ශ්‍රී ලංකාව හැරයාමට අදහස් කරන ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තකු වෙත එම තැනැත්තන්ගේ විදේශයක ආරම්භක පදිංචි කටයුතුවල කාර්ය සඳහා වන මූලික දීමනාව වශයෙන් බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු විසින් විදේශ විනිමය සාධාරණ ප්‍රමාණයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

ඉ. භාණ්ඩ අපනයනකරුවන් විසින් අපනයන ඉපැයුම් ශ්‍රී ලංකාව වෙත ආපසු සියරට රැගෙන ඒම.

1. සෑම භාණ්ඩ අපනයනකරුවකු විසින්ම, අපනයනය කිරීම සිදු කරන ලද දින සිට දින 180ක් ඇතුළත හෝ මහ බැංකුව විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි වෙනත් කාල සීමාවක් ඇතුළත භාණ්ඩ අපනයනය කිරීම සඳහා ලද ගෙවීම් ශ්‍රී ලංකාව වෙත ආපසු සියරට රැගෙන එනු ලැබිය යුතු ය.

2. සෑම භාණ්ඩ අපනයනකරුවකු විසින් ම, එක් එක් අපනයනය සම්බන්ධයෙන් අදාළ ලේඛනගත සාක්ෂි ගෙවීම ලබන අදාළ බලයලත් වෙළෙන්දා වෙත හෝ පරිසීමිත වෙළෙන්දා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

3. භාණ්ඩ අපනයනකරුවන් විසින් මේ ශීර්ෂය යටතේ වන නියමයන්ට අනුකූලවීම අධීක්ෂණය කිරීම සඳහා මහ බැංකුව විසින් යාන්ත්‍රණයක් හඳුන්වා දෙනු ලැබිය හැකි අතර, අවස්ථාවෝචිත පරිදි පනතේ 11 වන වගන්තිය හෝ 26 වන වගන්තිය යටතේ අවශ්‍ය යැයි සලකනු ලැබිය හැකි යම් ක්‍රියාමාර්ගයක් ගනු ලැබිය හැකි ය.

ඊ. ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකු වෙනුවෙන් මූල්‍ය ඇපකර නිකුත් කිරීම.

1. පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධානවලට යටත්ව, ජංගම ගනුදෙනු සහ ප්‍රාග්ධන ගනුදෙනු සම්බන්ධයෙන්, අවස්ථාවෝචිත පරිදි, බැංකු ඇපකර, බැඳුම්කර හෝ පොරොත්තු ණයවර ලිපි නිකුත් කිරීම සඳහා සහ අලුත් කිරීම සඳහා බලයලත් වෙළෙන්දකුට හෝ පරිසීමිත වෙළෙන්දකුට අවසර ලබා දෙනු ලැබේ.

2. ජාත්‍යන්තර බැඳුම්කර නිකුත් කිරීම සඳහා හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකුගෙන් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල්වලින් ණයට ගැනීම සඳහා ශ්‍රී ලංකා රජයට හෝ රාජ්‍ය හිමිකම සහිත ව්‍යවසායයන්ට හැකියාව ලබාදීම පිණිස, ස්වෛරීත්ව ඇපකර නිකුත් කිරීමට ශ්‍රී ලංකා රජයට අවසර ලබා දෙනු ලැබේ.

3. පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධානවලට යටත්ව, එවැනි බැංකු ඇපකර, බැඳුම්කර හෝ පොරොත්තු ණයවර ලිපි නිකුත් කිරීමෙන් පැන නගින වලංගු හිමිකම් සම්බන්ධයෙන් ප්‍රතිමුඛ ප්‍රේෂණ සිදුකිරීම සඳහා ද බලයලත් වෙළෙන්දකුට හෝ පරිසීමිත වෙළෙන්දකුට අවසර ලබා දෙනු ලැබේ.

උ. ශ්‍රී ලංකාවෙන් පිටත නියාමනය කරන ලද මූල්‍ය ආයතන සමඟ ගිණුමක් විවෘත කිරීමට, පවත්වාගෙන යාමට සහ ක්‍රියාත්මක කිරීමට අවසර ලත් තැනැත්තන් -

1. ශ්‍රී ලංකාවෙන් පිටත නියාමනය කරන ලද මූල්‍ය ආයතනයක් සමඟ විදේශ ව්‍යවහාර ගිණුම් විවෘත කිරීමට, පවත්වාගෙන යාමට සහ ක්‍රියාත්මක කිරීමට පහත දැක්වෙන තැනැත්තන් වෙත අවසර ලබා දෙනු ලැබේ -

   (අ) ව්‍යාපාර සඳහා, අධ්‍යාපනය සඳහා හෝ වෛද්‍යමය කාර්ය සඳහා තාවකාලිකව ශ්‍රී ලංකාවෙන් බැහැරව ගොස් ඇති ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තකුට;

   (ආ) ශ්‍රී ලංකා රුපියල් විදේශ විනිමයට පරිවර්තනය කිරීමක් සිදු නොකර ශ්‍රී ලංකාවෙන් පිටත දී විදේශ විනිමය උපයාගන්නා ලද හෝ අන්‍යාකාරයෙන් අත්පත් කරගන්නා ලද, මේ පනත ක්‍රියාත්මක වීමට පෙරාතුව හෝ ඉන්පසු යම් අවස්ථාවක දී ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසිකයකුව සිටි ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තකුට;

   (ඇ) ශ්‍රී ලංකාවෙන් පිටත වෘත්තීමය හෝ වෘත්තීය සේවා සපයනු ලබන සහ එකී සේවාවන් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකුගෙන් විදේශ විනිමයෙන් ගෙවීම් ලබා ගනු ලබන තනි පුද්ගලයකුට, ශ්‍රී ලංකාවේ ලියාපදිංචි වූ සමාගමකට හෝ ව්‍යාපාර ආයතනයකට;

   (ඈ) ආයෝජනය කිරීම සඳහා වන නියමයක් වශයෙන් යම් තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත ගිණුමක් විවෘත කිරීමට නියම කරනු ලබන අවස්ථාවක දී එසේ ශ්‍රී ලංකාවෙන් පිටත ආයෝජනය කිරීම සඳහා පනතේ විධිවිධාන යටතේ සාමාන්‍ය හෝ විශේෂ අවසරයක් ප්‍රදානය කරන ලද තනි පුද්ගලයකුට, ශ්‍රී ලංකාවේ ලියාපදිංචි වූ සමාගමකට හෝ ව්‍යාපාර ආයතනයකට;

   (ඉ) වෙළඳ භාණ්ඩ අපනයනකරුවකුට;

   (ඊ) වෙනත් රටක නිත්‍ය නේවාසිකත්වය දරනු ලබන තැනැත්තකුට;

   (උ) ද්විත්ව පුරවැසියකුට;

   (ඌ) යම් රටක අධ්‍යාපනය ලැබීම සඳහා ශ්‍රී ලංකාවෙන් බැහැරව යාමට අදහස් කරන ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තකුට වීසා බලපත්‍රයක් ප්‍රදානය කිරීම සඳහා වන කොන්දේසීන් වශයෙන් යම් රටක නියාමනය කරන ලද මූල්‍ය ආයතනයක් සමඟ ගිණුමක් විවෘත කර පවත්වාගෙන යාම සඳහා වීසා බලපත්‍ර ප්‍රදානය කරනු ලබන අධිකාරිය විසින් නියම කරනු ලබන අවස්ථාවක දී එම තැනැත්තාට;

   (එ) විදේශ බැංකුවකින් හෝ මූල්‍ය ආයතනයකින් මුදල් ණයට ගැනීම සඳහා හිමිකම් ලබන ශ්‍රී ලංකාවේ සංස්ථාගත කරන ලද සමාගමකට එකී ණය ගිවිසුමේ කොන්දේසියක් වශයෙන් ශ්‍රී ලංකාවෙන් පිටත ගිණුමක් විවෘත කිරීම සඳහා නියම කරනු ලබන්නේ නම්, එවැනි සමාගමකට.

2. (1) ශ්‍රී ලංකාවෙන් පිටත නියාමනය කරන ලද මූල්‍ය ආයතනයක් සමඟ ගිණුමක් විවෘත කර පවත්වාගෙන යනු ලැබූ මේ උපලේඛනයේ "උ" ශීර්ෂයේ 1 වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති යම් තැනැත්තකු විසින්, මේ නියෝගවල අනුකූලවීමේ කාර්ය සඳහා එම ගිණුම් වසා දමනු ලැබිය හැකි ය.

   (2) මේ උපලේඛනයේ "උ" ශීර්ෂයේ 1 වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති තැනැත්තකු විසින් විවෘත කරන ලද ගිණුමකට, ශ්‍රී ලංකාවෙන් පිටත දී නීත්‍යනුකූලව උපයන ලද, ලබාගන්නා ලද හෝ අත්පත් කරගන්නා ලද හෝ එම තැනැත්තාගේ නාමයෙන් පනතේ විධිවිධාන යටතේ බලයලත් වෙළෙන්දකුගෙන් හෝ පරිසීමිත වෙළෙන්දකුගෙන් ශ්‍රී ලංකාවේ දී ලබා ගන්නා ලද විදේශ ව්‍යවහාර මුදල් බැර කරනු ලැබිය හැකි ය.

   (3) මේ උපලේඛනයේ "උ" ශීර්ෂයේ 1 වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති තැනැත්තන් විසින් විවෘත කරන ලද ගිණුම්වල අරමුදල්, ගිණුම් හිමියාගේ යම් විදේශ විනිමය ගනුදෙනුවක් සඳහා යොදා ගනු ලැබිය හැකි ය.

   (4) මේ උපලේඛනයේ "උ" ශීර්ෂයේ 1 වන ඡේදයේ (ආ), (ඇ), (ඊ), (උ) සහ (ඌ) අනුඡේදවල නිශ්චිතව සඳහන් වර්ග සඳහා හැර 1 වන ඡේදය යටතේ ශ්‍රී ලංකාවෙන් පිටත මූල්‍ය ආයතනයක් සමඟ ගිණුමක් ආරම්භ කර පවත්වාගෙන යාම සඳහා අවසර ලබාදෙන ලද යම් තැනැත්තකු විසින් එම ගිණුම විවෘත කරනු ලැබූ අරමුණු ඉටු වූ දින සිට මාසයක කාලය

ඇතුළත ශ්‍රී ලංකාවෙන් පිටත එම තැනැත්තා විසින් විවෘත කරන ලද ගිණුම්වල ඉතිරිව පවතින යම් ශේෂ අරමුදල් ශ්‍රී ලංකාව වෙත ආපසු සියරට රැගෙන එනු ලැබිය යුතු ය.

(5) මේ උපලේඛනයේ "උ" ශීර්ෂයේ 1 වන ඡේදයේ (උ) අනුඡේදයේ නිශ්චිතව දක්වා ඇති වර්ගය යටතේ ශ්‍රී ලංකාවෙන් පිටත ගිණුමක් විවෘත කර පවත්වාගෙන යාම සඳහා අවසර ලත් යම් තැනැත්තකුට ශිෂ්‍ය වීසා බලපත්‍රයක් ලබාදීම එම රට විසින් ප්‍රතික්ෂේප කරනු ලැබ ඇති අවස්ථාවක දී හෝ ශිෂ්‍ය වීසා බලපත්‍රය ලබාගැනීමෙන් පසු අධ්‍යයන කටයුතු ආරම්භ නොකිරීමට එම තැනැත්තා විසින් තීරණය කරනු ලබන අවස්ථාවක දී, එම තීරණය ගනු ලැබූ දින සිට මාසයක කාලයක් ඇතුළත එකී තැනැත්තා විසින්, මේ නියෝගය යටතේ ශ්‍රී ලංකාවෙන් පිටත එම තැනැත්තා විසින් විවෘත කරන ලද ගිණුමේ බැරට පවතින සියලු මුදල් ආපසු සියරට රැගෙන එනු ලැබිය යුතු ය.

ඌ. ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික විජාතිකයන්හට ජීවිත රක්ෂණ ඔප්පු නිකුත් කිරීම.

1. රක්ෂණය සම්බන්ධයෙන් වන ශ්‍රී ලංකාවේ යම් ලිඛිත නීතියකට යටත්ව, ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික විජාතිකයන් (එනම්,රක්ෂණය වූ) සම්බන්ධයෙන් අවස්ථාවෝචිත පරිදි, 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය නියාමනය කිරීමේ පනත යටතේ ශ්‍රී ලංකාවේ රක්ෂණ ව්‍යාපාරයේ යෙදී සිටීම සඳහා ලියාපදිංචි වී ඇති සමාගමකට, ශ්‍රී ලංකා රුපියල්වලින් හෝ විදේශ විනිමයෙන් නම් කරන ලද ජීවිත රක්ෂණ ඔප්පු නිකුත් කිරීමට අවසර ලබා දෙනු ලැබේ.

2. රක්ෂණය සම්බන්ධයෙන් වන ශ්‍රී ලංකාවේ යම් ලිඛිත නීතියකට යටත්ව, අදාළ ජීවිත රක්ෂණ ඔප්පුවලට අනුකූලව ප්‍රතිලාභ වශයෙන් (එනම්, ඔප්පුව දරන්නා රක්ෂණ ඔප්පුවේ සඳහන් කාලයට වඩා වැඩි කාලයක් ජීවත් වන අවස්ථාවක දී රක්ෂණය වූ තැනැත්තාට දෙනු ලබන කල්පිරීමේ ප්‍රතිලාභ, රක්ෂණය වූ තැනැත්තාගේ මරණයෙන් පසු මරණයේදී ප්‍රතිලාභියාට දෙනු ලබන ප්‍රතිලාභ හෝ ඔප්පුව ආපසු භාරදෙන තැනැත්තාට ගෙවිය යුතු වටිනාකම) මේ ශීර්ෂය යටතේ ඉහත 1 වන ඡේදයේ සඳහන් සමාගමක් විසින් කරනු ලබන ගෙවීම් වශයෙන් වන ප්‍රතිමුඛ ප්‍රේෂණ සිදු කිරීම සඳහා බලයලත් වෙළෙන්දකුට හෝ පරිසීමිත වෙළෙන්දකුට අවසර ලබා දෙනු ලැබේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2213/38 - 2021 පෙබරවාරි මස 03 වැනි බදාදා - 2021.02.03

I වැනි කොටස : (I) වැනි ඡේදය – සාමාන්‍ය

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

රජයේ නිවේදන

2017 අංක 12 දරන විදේශ විනිමය පනත

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ (පනත) 7 වන වගන්තිය සමග කියවිය යුතු 29 වන වගන්තිය යටතේ සාදන ලද නියෝග.

මහින්ද රාජපක්ෂ,
මුදල් අමාත්‍ය.

2021 පෙබරවාරි මස 03 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 2021 අංක 5 දරන විදේශ විනිමය (විදේශ විනිමය ගනුදෙනුවල නිරතවීමේ කාර්යය සඳහා ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම) නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර 2021 මාර්තු මස 22 වන දින සිට ක්‍රියාත්මක විය යුතුය.

***I* වන කොටස**

ගිණුම් විවෘත කර පවත්වාගෙන යාම සඳහා වන බලය

2. (1) විදේශ විනිමය ගනුදෙනුවල නිරත වීමේ කාර්යය සඳහා යම් තැනැත්තකුගේ නමින් 5 වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති විදේශ විනිමය ගිණුම් හෝ ශ්‍රී ලංකා රුපියල් ගිණුම් විවෘත කර පවත්වාගෙන යාම සඳහා පනතේ 4 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ප්‍රමාණයට බලයලත් වෙළෙන්දකුට හෝ පරිසීමිත වෙළෙන්දකුට බලය තිබිය යුතු ය.

(2) බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු විසින් මේ නියෝග යටතේ ගනුදෙනු සිදු කිරීමේ දී, සෑම විටම පනතේ 9 වන වගන්තිය යටතේ, කලින් කලට, මහ බැංකුව විසින්, ඒ සම්බන්ධයෙන් නිකුත් කරනු ලබන විධානවලට අනුකූලවීම අවශ්‍ය වන්නේ ය.

3. ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික, නියාමනය කරන ලද යම් මූල්‍ය ආයතනයක් විසින් ගනුදෙනු පියවීම සඳහා ශ්‍රී ලංකාවේ යම් බලයලත් වෙළෙන්දකු සමග විදේශ විනිමය ගිණුම් සහ ශ්‍රී ලංකා රුපියල් ගිණුම් (වොස්ට්‍රෝ (Vostro) ගිණුම්) විවෘත කර පවත්වාගෙන යනු ලැබිය හැකි ය.

4. බලයත් වෙළෙන්දකු විසින්, එම බලයලත් වෙළෙන්දා විසින් වෙනත් රටවල විදේශ විනිමය ගනුදෙනු කාර්යක්ෂමව පියවීම සඳහා, පහසුකම් සැලසීම පිණිස, ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරනු ලැබූ බැංකුවක් සමඟ විදේශ විනිමය ගිණුම් (නොස්ට්‍රෝ (Nostro)) ගිණුම්) විවෘත කර පවත්වාගෙන යනු ලැබිය හැකි ය.

II වන කොටස

ගිණුම් වර්ග

5. පනතේ 4 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ප්‍රමාණයට බලයලත් වෙළෙන්දකු විසින් හෝ පරිසීමිත වෙළෙන්දකු විසින් පහත දැක්වෙන ගිණුම් වර්ග විවෘත කර පවත්වාගෙන යනු ලැබිය හැකි ය -

(අ) පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (PFCAs)
(ආ) ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (BFCAs)
(ඇ) රාජ්‍ය තාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (DFCAs)
(ඈ) රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුම් (DRAs)
(ඉ) අනේවාසික රුපියල් ගිණුම් (NRRAs)
(ඊ) ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් (OIAs)
(උ) ආමුඛ ආයෝජන ගිණුම් (IIAs)
(ඌ) ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් (CTRAs)
(එ) විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුම් (ERIAs)
(ඒ) විදේශීය වාණිජ ණය ගැනීමේ ගිණුම් (ECBAs)
(ඔ) පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධාන මගින් අවසර ලබා දෙනු ලැබිය හැකි බැර සහ හර සීමාවලට යටත්ව, විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (SFCAs)

6. බලපත්‍රලාභී වාණිජ බැංකු සම්බන්ධයෙන් වන විට, 5 වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති ගිණුම් එම බැංකුවල දේශීය බැංකු ඒකකවල විවෘත කර පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

7. යම් තැනැත්තකු මේ නියෝගවල උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පරිදි යම් ගිණුමක් විවෘත කිරීමට සුදුසුකම්ලත් අයකු නොවන අවස්ථාවකදී, එවන් කිසිදු තැනැත්තකු විසින් 5 වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති යම් ගිණුමක් විවෘත කරනු නොලැබිය යුතු ය.

8. (1) 5 වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති එක් එක් ගිණුම් වර්ගය විවෘත කර පවත්වාගෙන යාම සඳහා වන උපමාන සහ එම ගිණුම් සඳහා වන අවසරලත් හර සහ බැර පනතේ 9 වන වගන්තිය යටතේ කලින් කලට මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධානවල නිශ්චිතව දක්වනු ලබන පරිදි විය යුතු ය.

(2) 5 වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති ගිණුම් විවෘත කර පවත්වාගෙන යාමට අපේක්ෂා කරන තැනැත්තන්, පනතේ 9 වන වගන්තිය යටතේ මහ බැංකුව විසින් කලින් කලට නිකුත් කරනු ලබන විධානවල නිශ්චිතව දක්වා ඇති උපමාන යටතේ එම ගිණුම් විවෘත කර පවත්වාගෙන යාමට සුදුසුකම්ලත් තැනැත්තන් බවට නිශ්චය කර ගැනීම සඳහා බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු විසින් නිසි උද්යෝගය සහ සාධාරණ සැලකිල්ල දක්වනු ලැබිය යුතු ය.

9. (1) මේ නියෝග යටතේ විදේශ විනිමයෙන් වූ ගනුදෙනුවල නිරත වන සෑම බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු විසින් ම -

(අ) ගනුදෙනුව සිදු කරනු ලබන තැනැත්තාගේ සද්භාවය; සහ

(ආ) එම ගනුදෙනුව මේ නියෝගවලට අනුකූලව සිදු කර ඇති බව,

ඒ සම්බන්ධයෙන් වූ ලේඛනගත සාක්ෂි ලබා ගැනීම මගින් නිශ්චය කරනු ලැබිය යුතු ය.

(2) මේ නියෝග යටතේ විදේශ විනිමයෙන් වූ ගනුදෙනුවල නිරත සෑම තැනැත්තකු විසින් ම (1) වන ඡේදයේ කාර්යය සඳහා එම බලයලත් වෙළෙන්දා හෝ පරිසීමිත වෙළෙන්දා වෙත අවශ්‍ය සියලු ලේඛනගත සාක්ෂි සපයනු ලැබිය යුතු ය.

(3) මේ නියෝග යටතේ එම විදේශ විනිමයෙන් වූ ගනුදෙනු සිදු කිරීමේ දී සෑම බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු විසින් ම පූර්ණ නිසි උද්යෝගයෙන් කටයුතු කරනු ලැබිය යුතු ය.

10. මේ නියෝගවලට අනුකූල වීමට අපොහොසත් වන යම් බලයලත් වෙළෙන්දකු, පරිසීමිත වෙළෙන්දකු හෝ බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු නොවන වෙනත් යම් තැනැත්තකු සම්බන්ධයෙන් පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් අවශ්‍ය වන බවට සලකනු ලැබිය හැකි යම් ක්‍රියාමාර්ගයක් ගනු ලැබිය හැකි ය.

11. සෑම බලයලත් වෙළෙන්දකු, පරිසීමිත වෙළෙන්දකු හෝ එවන් බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු හරහා විදේශ විනිමයෙන් වූ ගනුදෙනුවල යෙදෙන යම් තැනැත්තකු, එම ගනුදෙනු මේ නියෝග යටතේ අවසරලත් ගනුදෙනු වන බවට ඔප්පු කිරීම සඳහා වන සියලු තොරතුරු සහ ලේඛනගත සාක්ෂි එම ගනුදෙනුවේ දින සිට වසර හයක කාලසීමාවක් සඳහා රඳවා තබා ගනු ලැබිය යුතු ය.

III වන කොටස

දැනට පවත්නා ගිණුම් නැවත නම් කිරීම ආදිය

12. (1) ඉවත් කරන ලද විනිමය පාලන පනතේ විධිවිධාන යටතේ විවෘත කරන ලද, විදේශ බැංකුවල සහ විදේශ විනිමය තැන්පතු ස්ථානවල ඇති සියලු අනේවාසික රුපියල් ගිණුම්, 3 වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති පරිදි ශ්‍රී ලංකා රුපියල්වලින් වූ වොස්ට්‍රෝ ගිණුම් ලෙස අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(2) දැනට පවත්නා සියලු නේවාසික ආගන්තුක යෝජනා ක්‍රම විශේෂ ගිණුම් සහ ජ්‍යෙෂ්ඨ විදේශීය ජාතිකයන්ගේ විශේෂ ගිණුම්, නැවත නම් කිරීමකින් තොරව 2017 නොවැම්බර් මස 17 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(3) පිළිවෙලින්, ශ්‍රී ලංකාවෙන් පිටත ලියාපදිංචි කරන ලද විදේශීය ආයතන සහ සමාගම් විසින් සහ විගාමිකයන් හැර ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික විදේශයන් හි සේවයේ නියුක්ත ශ්‍රී ලාංකිකයන් විසින් පවත්වාගෙන යනු ලබන දැනට පවත්නා සියලු ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම්, පිළිවෙලින්, අනේවාසික රුපියල් ගිණුම් සහ ශ්‍රී ලංකා රුපියල් ගිණුම් ලෙස නැවත නම් කර අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(4) ඉවත් කරන ලද විනිමය පාලන පනතේ විධිවිධාන යටතේ 2010 මැයි මස 7 වන දින සිට 2017 ජූලි මස 5 වන දින දක්වා වූ කාලසීමාව තුළ දී ශ්‍රී ලංකාව තුළ නේවාසික සුදුසුකම්ලත් සේවා යෝජකයන් සහ සේවා නියුක්තිකයන් විසින් විවෘත කරන ලද දැනට පවත්නා සියලු ජාත්‍යන්තර සේවා සැපයුම්කරුවන් සහ ඔවුන්ගේ සේවානියුක්තිකයන් සඳහා වන විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්, 2017 නොවැම්බර් මස 20 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, පිළිවෙලින්, ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් සහ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් ලෙස ක්‍රියාත්මකව පවතින බවට සලකනු ලැබිය යුතු ය.

(5) ඉවත් කරන ලද විනිමය පාලන පනතේ විධිවිධාන යටතේ විවෘත කරන ලද, ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන රාජ්‍ය නොවන සංවිධානවල දැනට පවත්නා සියලු පශ්චාත් සුනාමි ආමුඛ ප්‍රේෂණ ගිණුම්, ශ්‍රී ලංකා රුපියල් ගිණුම් ලෙස අඛණ්ඩව ක්‍රියාත්මක වනු ලැබිය යුතු ය.

13. විගාමිකයන් හැර ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික ශ්‍රී ලාංකික ජාතිකයන් විසින්, ශ්‍රී ලංකාව තුළ සිදු කරන ආයෝජන ඇතුළුව දේශීය ගනුදෙනු සඳහා පමණක් බලයලත් වෙළෙන්දන් හෝ පරිසීමිත වෙළෙන්දන් සමග ශ්‍රී ලංකා රුපියල්වලින් වූ ජංගම, ඉතිරි කිරීමේ හෝ කාලීන තැන්පතු ගිණුම් විවෘත කර පවත්වාගෙන යනු ලැබිය හැකි ය.

14. (1) මේ නියෝගවල කාර්යය සඳහා "නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල්" යන්නෙන් -

(අ) එක්සත් ජනපද ඩොලර්;
(ආ) යුරෝ;
(ඇ) ස්විට්ස්ලිං පවුම්;
(ඈ) ඕස්ට්‍රේලියානු ඩොලර්;
(ඉ) සිංගප්පූරු ඩොලර්;
(ඊ) ස්වීඩන ක්‍රෝනර්;
(උ) ස්විස් ෆ්‍රෑන්ක්;
(ඌ) කැනේඩියානු ඩොලර්;
(එ) හොංකොං ඩොලර්;
(ඒ) ජපන් යෙන්;
(ඔ) ඩෙන්මාර්ක ක්‍රෝනර්;
(ඕ) නෝර්වීජියානු ක්‍රෝනර්;
(ක) චීන රෙන්මින්බි; සහ
(ග) නවසීලන්ත ඩොලර්,

අදහස් වේ.

(2) මහ බැංකුව විසින්, පනතේ 9 වන වගන්තිය යටතේ ඒ සම්බන්ධයෙන් නිකුත් කරනු ලබන විධාන මඟින් කලින් කලට (1) වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ එකතු කිරීම සිදු කරනු ලැබිය හැකි ය.

15. 2017 නොවැම්බර් මස 17 වන දින අංක 2045/56 දරන අතිවිශෙෂ ගැසට්පත්‍රයේ පළ කරන ලද, 2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ සාදන ලද 2017 අංක 2 දරන විදේශ විනිමය (ප්‍රාග්ධන ගනුදෙනුවල යෙදීමේ කාර්යය සඳහා ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම) නියෝග සහ 2017 අංක 3 දරන විදේශ විනිමය (විදේශ විනිමය ගිණුම් විවෘත කිරීමේ හා පවත්වාගෙන යාමේ) නියෝග ඒ යටතේ කරන ලද කිසිවකට අගතියක් නොමැතිව, මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ:

එසේ වුව ද, ඉහත සඳහන් නියෝග පරිච්ඡින්න කිරීම නොතකා, 2020 දෙසැම්බර් මස 18 වන දින අංක 2206/25 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද නියමය මගින් වලංගු කාල සීමාව දීර්ඝ කරන ලද, 2020 ජූලි මස 2 වන දින අංක 2182/37 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද සහ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 22 වන වගන්තිය යටතේ කරන ලද නියමය, එසේ දීර්ඝ කරන ලද කාල සීමාව තුළ දී බල පැවැත්විය විය යුතු ය.

16. මෙම නියෝගවල කාර්ය සඳහා -

"පනත" යන්නෙන්, 2017 අංක 12 දරන විදේශ විනිමය පනත අදහස් වේ;

"බලයලත් වෙළෙන්දා" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"පරිසීමිත වෙළෙන්දා" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"මහ බැංකුව" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ ඊට දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩලය" යන්නෙන් තානාපති කාර්යාලයක්, මහ කොමසාරිස් කාර්යාලයක්, කොන්සල් කාර්යාලයක්, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නිත්‍ය දූත මණ්ඩලයක්, යුරෝපා කොමිෂන් සභාවේ යුරෝපා සංගම් නියෝජිත පිරිසක්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ප්‍රතිසංවිධානය සහ සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව හෝ කලින් කලට විදේශ කටයුතු අමාත්‍යංශයේ (වි. ක. අ.) පිළිවෙත් (protocol) අංශය විසින් රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩලයක් ලෙස පිළිගෙන ඇති ඒ හා සමාන වෙනත් යම් සංවිධානයක් අදහස් වේ;

"රාජ්‍ය තාන්ත්‍රික කාර්ය මණ්ඩලය" යන්නෙන් රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩලයක් මගින් නියෝජනය වන්නා වූ විදේශ රටක පුරවැසියන් අදහස් වේ;

"විගාමිකයා" යන්නෙන් 2021 පෙබරවාරි මස 03 දිනැති අංක 2213/36 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2021 අංක 3 දරන විදේශ විනිමය (විගාමිකයන් විසින් අරමුදල් ප්‍රේෂණය කිරීම) නියෝගවල නිශ්චිතව දක්වා ඇති විගාමිකයකු අදහස් වේ;

"බලපත්‍රලාභී වාණිජ බැංකුව" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ ඊට දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"තැනැත්තා" යන්නට, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ ඊට දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"නියාමනය කරන ලද මූල්‍ය ආයතනය" යන්නෙන් විදේශ රටක යම් නීතියක් යටතේ නියාමනය කරන ලද මූල්‍ය ආයතනයක් අදහස් වේ;

"ඉවත්කරන ලද විනිමය පාලන පනත" යන්නෙන් 2017 අංක 12 දරන විදේශ විනිමය පනත මගින් ඉවත් කරන ලද (423 වන අධිකාරය වූ) විනිමය පාලන පනත අදහස් වේ.

(7 වන නියෝග)

උපලේඛනය

ගිණුම් විවෘත කිරීමට සුදුසුකම්ලත් තැනැත්තන්

1. පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (PFCAs)

(1) බාලවයස්කරුවකු ද ඇතුළුව ශ්‍රී ලාංකික ජාතිකයකු වන පුද්ගලයකු;

(2) බාලවයස්කරුවකු ද ඇතුළුව ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසිකයකු වන ශ්‍රී ලාංකික සම්භවයක් ඇති පුද්ගලයකු;

(3) ශ්‍රී ලංකාවේ නේවාසික විජාතිකයෙකු;

(4) ශ්‍රී ලංකාව වෙත තාවකාලිකව පැමිණ සිටින හෝ ශ්‍රී ලංකාව වෙත පැමිණීමේ චේතනාවෙන් සිටින විජාතිකයකු සහ

(5) මියගිය තැනැත්තකුගේ බූදලය අද්මිනිස්ත්‍රාසි කිරීම සම්පූර්ණ කරන තෙක්, බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු සමග පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් පවත්වාගෙන යනු ලැබූ, මිය ගිය තැනැත්තකුගේ බූදලයේ අද්මින්ස්ත්‍රාසිකරු හෝ පොල්මඃකරු.

2. ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (BFCAs)

(1) ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකුගෙන් විදේශ විනිමය උපයන්නා වූ ශ්‍රී ලංකාවේ නේවාසික පහත දැක්වෙන තැනැත්තන්-

(අ) ශ්‍රී ලාංකාවේ නේවාසික පුද්ගලයකු;

(ආ) හිමිකරු හෝ බහුතර හවුල්කරුවන් ශ්‍රී ලංකාවේ නේවාසිකයන් වන අවස්ථාවකදී ශ්‍රී ලංකාවේ ලියාපදිංචි තනි පුද්ගල ව්‍යාපාරයක් හෝ හවුල් ව්‍යාපාරයක් (හවුල්කරුවන් දෙදෙනකු සිටින හවුල් ව්‍යාපාරයක් වන අවස්ථාවක දී, අවම වශයෙන් එක් හවුල්කරුවකු ශ්‍රී ලංකාවේ නේවාසිකයකු විය යුතු ය);

(ඇ) ශ්‍රී ලංකාවේ සංස්ථාගත කරන ලද සමාගමක්;

(ඈ) 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ විදේශ සමාගමක් ලෙස ලියාපදිංචි කරන ලද ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද සමාගමක්;

(ඉ) අදාළ රේඛීය අමාත්‍යංශයේ ලේකම්වරයාගේ හෝ අදාළ අධිකාරියේ නිර්දේශය සහිත රාජ්‍ය ආයතනයක්;

(ඊ) මියගිය තැනැත්තකුගේ බූදලය අද්මිනිස්ත්‍රාසි කිරීම සම්පූර්ණ කරන තෙක්, බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු සමග ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් පවත්වාගෙන යනු ලැබූ මිය ගිය තැනැත්තකුගේ බුදලයේ අද්මින්ස්ත්‍රාසිකරු හෝ පොල්මඃකරු; සහ

(උ) නඩු කටයුතු අවසන් වන තෙක්, බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු සමඟ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් පවත්වාගෙන යනු ලැබූ ලැබුම්කරුවකු හෝ ඇවරකරුවකු.

(2) රාජ්‍ය නොවන සංවිධානයකට ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් විවෘත කිරීමට සහ පවත්වාගෙන යාමට අවසර ලබා නොදිය යුතු ය.

3. **රාජ්‍ය තාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්** (DFCAs)

(1) විදේශ රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩල;

(2) ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන නේවාසික වීසා ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන්නිදහස් කරනු ලැබූ යම් රාජ්‍ය තාන්ත්‍රික කාර්ය මණ්ඩලයක්; සහ

(3) ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන නේවාසික වීසා ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබූ ශ්‍රී ලංකාවේ රාජ්‍ය තාන්ත්‍රික කාර්ය මණ්ඩලයක පවුල් සාමාජිකයන්.

4. **රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුම්** (DRAs)

(1) විදේශ රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩල;

(2) ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන නේවාසික වීසා ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබූ යම් රාජ්‍ය තාන්ත්‍රික කාර්ය මණ්ඩලයක්; සහ

(3) ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන නේවාසික වීසා ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබූ ශ්‍රී ලංකාවේ රාජ්‍ය තාන්ත්‍රික කාර්ය මණ්ඩලයක පවුල් සාමාජිකයන්.

5. **අනේවාසික රුපියල් ගිණුම්** (NRRAs)

(1) ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද හෝ පිහිටුවන ලද ව්‍යාපාර ආයතන සහ සමාගම්;

(2) විගාමිකයන්; සහ

(3) මහ බැංකුව විසින් කලින් කලට බලය ලබා දෙනු ලැබිය හැකි වෙනත් යම් තැනැත්තකු.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2213/39 - 2021 පෙබරවාරි මස 03 වැනි බදාදා - 2021.02.03

I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

රජයේ නිවේදන

2017 අංක 12 දරන විදේශ විනිමය පනත

8 වන වගන්තිය යටතේ වූ නියමය

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 8 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේද මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මා විසින්, 2021 මාර්තු මස 22 වන දින සිට ක්‍රියාත්මක වන මේ නියමය මගින්, ශ්‍රී ලංකාවෙහි සිටින හෝ නේවාසික තැනැත්තකු විසින්-

(අ) යම් විදේශ ව්‍යවහාර මුදල් හෝ ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල්, ශ්‍රී ලංකාවෙන් අපනයනය කිරීමේ දී හෝ ශ්‍රී ලංකාවට ආනයනය කිරීමේ දී හෝ

(ආ) ශ්‍රී ලංකාව තුළ, විදේශ විනිමය තම සන්තකයේ හෝ බැංකු ගිණුමක තබා ගැනීමේ දී,

යටත් විය යුතු මෙහි I උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇතිපරිදි වූ කාර්ය, සීමාවන්, නියමයන් සහ කොන්දේසි, මෙයින් නියම කරනු ලැබේ. 2020 ජූලි මස 1 වැනි දින අංක 2182/33 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 8 වන වගන්තිය යටතේ සාදන ලද නියමය, එය යටතේ කරන ලද කිසිවකට අගතියක් නොවන පරිදි මෙයින් අවලංගු කරනු ලැබේ.

මහින්ද රාජපක්ෂ,
මුදල් අමාත්‍ය.

2021 පෙබරවාරි මස 03 වැනි දින,
කොළඹ දී ය.

උපලේඛනය

I වන කොටස

විදේශ ව්‍යවහාර මුදල් හෝ ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල් අපනයනය කිරීම සහ ආනයනය කිරීම සම්බන්ධයෙන් වන කාර්ය, සීමාවන්, නියමයන් සහ කොන්දේසි

1. (1) ශ්‍රී ලංකාවෙන් පිටතට යන්නා වූ හෝ ශ්‍රී ලංකාවට පැමිණෙන්නා වූ යම් තැනැත්තකු විසින්, තමා රැගෙන යනු ලබන විදේශ විනිමයේ මුළු අගය එක්සත් ජනපද ඩොලර් 15000 ක් හෝ වෙනත් විදේශ ව්‍යවහාර මුදල්වලින් ඊට සමාන අගයක් ඉක්මවන්නේ නම්, පිළිවෙලින්, පිටත් වන හෝ පැමිණෙන තොටුපොළේ දී රේගු දෙපාර්තමේන්තුව වෙත ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමට යටත්ව, එම තැනැත්තා විසින් නීත්‍යානුකූලව අත්පත් කර ගත් ව්‍යවහාර මුදල් නෝට්ටු, බැංකු අණකර, චෙක්පත්, සංචාරක කාඩ්පත් ආදී ආකාරයෙන් වන විදේශ විනිමය ඕනෑම ප්‍රමාණයක් රැගෙන යනු ලැබිය හැකි ය. එම තැනැත්තා විසින්, එම විදේශ විනිමය අත්පත් කර ගැනීමට අදාළ ලේඛනගත සාක්ෂි රේගු දෙපාර්තමේන්තුව වෙත හෝ පසුව, එම තොරතුරු ලබා දෙන ලෙස ඉල්ලා සිටින්නේ නම්, මහ බැංකුවේ විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වෙත හෝ එම තොරතුරු ඉල්ලා සිටීමට නීතියෙන් බලය ලබා දී ඇති වෙනත් යම් තැනැත්තකු වෙත ලබා දීම අවශ්‍ය වන්නේ ය.

(2) එසේ වුව ද, ශ්‍රී ලංකාවට පැමිණෙන තැනැත්තකු විසින් එක්සත් ජනපද ඩොලර් 10,000 ක් හෝ වෙනත් විදේශ ව්‍යවහාර මුදල්වලින් ඊට සමාන අගයක් ඉක්මවන්නා වූ ඉහත 1 වන ඡේදයේ (1) වන අනුඡේදය යටතේ තමා විසින් ශ්‍රී ලංකාවට රැගෙන එන ලද භාවිත නොකළ විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු ආපසු රැගෙන යාමට අදහස් කරනු ලබන අවස්ථාවක දී හෝ ශ්‍රී ලංකාවෙන් පිටතට යන තැනැත්තකු විසින් එක්සත් ජනපද ඩොලර් 10,000 ක් හෝ වෙනත් විදේශ ව්‍යවහාර මුදල්වලින් ඊට සමාන අගයක් ඉක්මවන්නා වූ විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු රැගෙන යනු ලබන අවස්ථාවක දී එම තැනැත්තා විසින් ඒ සම්බන්ධයෙන් රේගු දෙපාර්තමේන්තුව වෙත ප්‍රකාශයක් ඉදිරිපත් කිරීම අවශ්‍ය වන්නේ ය.

(3) ශ්‍රී ලංකාවට පැමිණෙන තැනැත්තකු විසින්, ශ්‍රී ලංකාව තුළ ආයෝජනය කිරීමේ කාර්යය සඳහා සිය ආමුඛ ආයෝජන ගිණුමට විදේශ ව්‍යවහාර මුදල් බැර කිරීමට අදහස් කරනු ලබන අවස්ථාවකදී, එම විදේශ ව්‍යවහාර මුදල්, ඒවායෙහිවටිනාකම නොසලකා, රේගු දෙපාර්තමේන්තුව වෙත ප්‍රකාශ කළ යුතු අතර රේගු දෙපාර්තමේන්තුවේ මුද්‍රාව තබන ලද ප්‍රකාශය, බැර කිරීම තහවුරු කිරීම සඳහා රඳවා තබා ගැනීම පිණිස බලයලත් වෙළෙන්දා වෙත ලබා දිය යුතු ය.

2. ශ්‍රී ලංකාවේ සිටින හෝ නේවාසික තැනැත්තකු විසින්:-

(අ) ශ්‍රී ලංකා රුපියල් 20,000 ක අගයක් දක්වා ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල් පිළිවෙළින්, ශ්‍රී ලංකාවෙන් පිටතට රැගෙන යාම හෝ ශ්‍රී ලංකාව තුළට රැගෙන ඒම හෝ (ආ) විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ ප්‍රධානයාගේ අවසරයට යටත්ව මහ බැංකුවේ ව්‍යවහාර මුදල් අධිකාරීවරයා විසින් නිර්දේශ කරනු ලබන කාර්ය, සීමාවන්, නියමයන් සහ කොන්දේසි සඳහා, ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල් අපනයනය හෝ ආනයනය කිරීම, සිදු කරනු ලැබිය හැකි ය.

3. යම් බලයලත් වෙළෙන්දකු විසින් සිය සාමාන්‍ය ව්‍යාපාර කටයුතු තුළදී හෝ ඒ සඳහා සහ සිය බලය ලබා දීමේ නියමයන් තුළ කටයුතු කිරීමේ දී අත්පත් කරගත් විදේශ ව්‍යවහාර මුදල්, ශ්‍රී ලංකාවෙන් අපනයනය කිරීම හෝ ශ්‍රී ලංකාව තුළට ආනයනය කිරීම සිදු කරනු ලැබිය හැකි ය.

4. මේ කොටසේ කාර්යය සඳහා -

"බලයලත් වෙළෙන්දා" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ ඊට ලබා දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"මහ බැංකුව" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ ඊට ලබා දී ඇති අර්ථයම තිබිය යුතු ය.

II වන කොටස

විදේශ විනිමය සන්තකයේ තබා ගැනීම සම්බන්ධයෙන් වන කාර්ය, සීමාවන්, නියමයන් සහ කොන්දේසි

1. ශ්‍රී ලංකාවේ සිටින හෝ නේවාසික තැනැත්තකු විසින් විදේශ විනිමය සන්තකයේ තබා ගැනීම.

(1) ශ්‍රී ලංකාවේ සිටින හෝ නේවාසික යම් තැනැත්තකු විසින් එක්සත් ජනපද ඩොලර් 15,000ක් හෝ වෙනත් විදේශ ව්‍යවහාර මුදල්වලින් ඊට සමාන අගයක් දක්වා විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු -

(අ) එම තැනැත්තාගේ විදේශ සංචාර සඳහා එම තැනැත්තා විසින් බලයලත් වෙළෙන්දකුගෙන් හෝ පරිසීමිත වෙළෙන්දකුගෙන් මිල දී ගනු ලැබ, ශ්‍රී ලංකාවට නැවත පැමිණීමේ දී භාවිත නොකළ ව්‍යවහාර මුදල් ලෙස ආපසු ගෙන එනු ලබන විදේශ ව්‍යවහාර මුදල්; හෝ

(ආ) එම තැනැත්තා විසින් ශ්‍රී ලංකාවෙන් බැහැර නේවාසික තැනැත්තකු වෙත විදේශයන්හි ලබාදෙන ලද සේවාවක් හෝ සපයන ලද භාණ්ඩයක් සඳහා වන ගෙවීම් ලෙස හෝ වෙනත් යම් නීත්‍යානුකූල මූලාශ්‍රයකින් එම තැනැත්තා විසින් ශ්‍රී ලංකාවෙන් බැහැර දී ලද විදේශ ව්‍යවහාර මුදල්; හෝ

(ඇ) සංචාරය කිරීමේ අරමුණ වෙනුවෙන් එම තැනැත්තා විසින් සිය පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලින් හෝ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලින් ආපසු ලබා ගත් විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු,

වන්නේ නම්, මෙහි 2 වන ඡේදයේ සඳහන් කාලසීමාව පිළිබඳ සීමා කිරීම් නොසලකා ඕනෑම කාලසීමාවක් දක්වා සිය සන්තකයේ රඳවා තබා ගනු ලැබිය හැකි ය.

(2) (අ) යම් තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවෙන් බැහැර නේවාසික තැනැත්තකුට එම තැනැත්තා විසින් සපයන ලද භාණ්ඩ හා සේවා සඳහා භාර ගත් විදේශ ව්‍යවහාර මුදල්, තම සන්තකයේ රඳවා තබා ගනු ලැබිය හැකි ය.

(ආ) තීරු බදු සහනයක් යටතේ ශ්‍රී ලංකාවේ වරායක දී හෝ ගුවන් තොටුපළක දී ශ්‍රී ලංකාවට පැමිණෙන හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරට යන මගීන් වෙත, භාණ්ඩ හා සේවා සැපයීම සඳහා අවසරලත් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන ශ්‍රී ලංකාව තුළ සිටින හෝ නේවාසික තැනැත්තකු විසින්, එම මගියා නේවාසික වුව ද නේවාසික නොවූව ද, එම මගියාට භාණ්ඩ හා සේවා සැපයීම සඳහා එම මගියාගෙන් භාර ගත් විදේශ ව්‍යවහාර මුදල් රඳවා තබා ගනු ලැබිය හැකි ය.

(ඇ) මේ ඡේදයේ විධිවිධාන යටතේ විදේශ විනිමය අත්පත් කර ගත් තැනැත්තකු විසින්, එසේ භාර ගත් විදේශ ව්‍යවහාර මුදල් ඒ බවට සාක්ෂි ඉදිරිපත් කිරීමෙන් පසු, එම විදේශ ව්‍යවහාර මුදල් භාර ගත් තැනැත්තාගේ නමට ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක තැන්පත් කිරීමෙන් හෝ බලයලත් වෙළෙන්දකුට විකිණීමෙන් තොරව, භාරගත් දිනයේ සිට දින හතක් (7) ඉක්මවන කාලසීමාවක් දක්වා රඳවා තබා ගනු නොලැබිය යුතු ය.

(3) ශ්‍රී ලංකාවෙන් බැහැර නේවාසික තැනැත්තකු විසින් තමා ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සිටින විට දී නීත්‍යානුකූලව විදේශ ව්‍යවහාර මුදල් අත්පත් කර ගත්තේ නම් හෝ බලයලත් වෙළන්දන් හෝ පරිසීමිත වෙළෙන්දන් සමඟ පවත්වා ගෙන යනු ලැබූ විදේශ විනිමය ගිණුම්වලින් විදේශ ව්‍යවහාර මුදල් ආපසු ලබා ගත්තේ නම්, එවැනි විදේශ ව්‍යවහාර මුදල් ඕනෑම ප්‍රමාණයක්, එවැනි තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව තුළ සිටින විට දී සිය සන්තකයේ රඳවා තබා ගනු ලැබිය හැකි ය.

එසේ වුව ද, එම තැනැත්තා විසින්, විදේශ විනිමය අත්පත් කර ගැනීමට අදාළ ලේඛනගත සාක්ෂි, රේගු දෙපාර්තමේන්තුව වෙත හෝ පසුව, එම තොරතුරු ලබා දෙන ලෙස ඉල්ලා සිටින්නේ නම්, මහ බැංකුවේ විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වෙත හෝ එම තොරතුරු ඉල්ලා සිටීමට නීතියෙන් බලය ලබා දී ඇති වෙනත් යම් තැනැත්තකු වෙත හෝ ලබා දියයුතු ය.

2. විදේශ විනිමය රඳවා තබා ගැනීමට අදාළ කාලසීමාව පහත සඳහන් පරිදි විය යුතු ය :-

(1) තමා විසින් බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලුම්පත්‍රයක සඳහන් කාර්යයක් සඳහා එම බලයලත් වෙළෙන්දාගෙන් හෝ පරිසීමිත වෙළෙන්දාගෙන් ලබාගත් විදේශ ව්‍යවහාර මුදල් එකී කාර්යය සඳහා භාවිත නොකරන යම් තැනැත්තකු විසින් එකී විදේශ ව්‍යවහාර මුදල් ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය නොකර, එම විදේශ ව්‍යවහාර මුදල් ලද දිනයේ සිට දින අනූවක් (90) ඉක්මවන කාලසීමාවක් දක්වා රඳවා තබා ගනු නොලැබිය යුතු ය.

(2) (අ) තමා විසින් බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලුම්පත්‍රයක සඳහන් කාර්යයක් සඳහා එම බලයලත් වෙළෙන්දාගෙන් හෝ පරිසීමිත වෙළෙන්දාගෙන් විදේශ ව්‍යවහාර මුදල් ලබා ගෙන ඉන්පසු එකී විදේශ ව්‍යවහාර මුදල් හෝ ඉන් කොටසක් ශ්‍රී ලංකාවට නැවත රැගෙන එනු ලබන යම් තැනැත්තකු විසින් එකී විදේශ ව්‍යවහාර මුදල් ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය නොකර එකී විදේශ ව්‍යවහාර මුදල් ශ්‍රී ලංකාවට නැවත රැගෙන එන ලද දිනයේ සිට දින අනූවක් (90) ඉක්මවන කාලසීමාවක් දක්වා රඳවා තබාගනු නොලැබිය යුතු ය.

(ආ) එසේ වුව ද, සංචාරය කිරීමේ කාර්යය සඳහා 1 වන ඡේදයේ (1)වන අනුඡේදයේ (අ) අයිතමය යටතේ එක්සත් ජනපද ඩොලර් 15,000ක සමුච්චිත අගයක් දක්වා හෝ වෙනත් විදේශ ව්‍යවහාර මුදල්වලින් ඊට සමාන අගයක් දක්වා විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු ලබා ගත් තැනැත්තකු, එම විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දෙකු සමග විවෘත කර පවත්වාගෙන යනු ලැබිය හැකි පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක තැන්පත් කිරීම සඳහා අවසර ලබන්නේ ය.

(3) රැකියාවක හෝ වෘත්තියක නිරත වීම සඳහා හෝ ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා ශ්‍රී ලංකාවෙන් පිටතට නික්ම ගොස් එකී රැකියාවෙන්, වෘත්තියෙන් හෝ ව්‍යාපාරයෙන් විදේශ ව්‍යවහාර මුදල් උපයාගෙන හෝ ලබා ගෙන එම විදේශ ව්‍යවහාර මුදල් ශ්‍රී ලංකාවට නැවත රැගෙන එනු ලබන යම් තැනැත්තකු එකී විදේශ ව්‍යවහාර මුදල් ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය නොකර හෝ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ විධිවිධානවලට අනුකූලව එම තැනැත්තා විසින් විවෘත කර පවත්වාගෙන යනු ලැබිය හැකි විදේශ විනිමය ගිණුමකට බැර නොකර හෝ එම විදේශ ව්‍යවහාර මුදල් ශ්‍රී ලංකාවට නැවත රැගෙන එන ලද දිනයේ සිට දින අනූවක් (90) ඉක්මවන කාලසීමාවක් දක්වා රඳවා තබා ගැනීමට හිමිකම් නොලැබිය යුතු ය.

3. මේ කොටසේ කාර්යය සඳහා -

"බලයලත් වෙළෙන්දා" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ ඊට ලබා දී ඇති අර්ථය ම තිබිය යුතු ය.

"පරිසීමිත වෙළෙන්දා" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ ඊට ලබා දී ඇති අර්ථයම තිබිය යුතු ය.

"මහ බැංකුව" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ ඊට ලබා දී ඇති අර්ථයම තිබිය යුතු ය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2213/40 - 2021 පෙබරවාරි මස 03 වැනි බදාදා - 2021.02.03

I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

රජයේ නිවේදන

2017 අංක 12 දරන විදේශ විනිමය පනත 31 වන වගන්තිය යටතේ වූ නියමය

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 31 වන වගන්තියේ (3) වන උපවගන්තිය මගින් මාවෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මා විසින්, 2021 මාර්තු මස 22 වන දින සිට ක්‍රියාත්මක වන මේ නියමය මගින්, එකී පනතේ කාර්යය සඳහා මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති තැනැත්තන්, ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන් වන බවට නිශ්චය කරනු ලැබේ.

2017 නොවැම්බර් මස 17 වන දින අංක 2045/56 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 31 වන වගන්තිය යටතේ සාදන ලද නියමය, එය යටතේ කරන ලද කිසිවකට අගතියක් නොවන පරිදි මෙයින් අවංලගු කරනු ලැබේ.

මහින්ද රාජපක්ෂ,
මුදල් අමාත්‍ය.

2021 පෙබරවාරි මස 03 වැනි දින,
කොළඹ දී ය.

උපලේඛනය

1. පෙරාතුව වූ මාස දොළහ (12) තුළ, සමස්තය දින එකසිය අසූ තුනක් (183) හෝ ඊට වැඩි කාල සීමාවක් ශ්‍රී ලංකාව තුළ සිටියාවූ යම් ශ්‍රී ලාංකික පුරවැසියකු හෝ ශ්‍රී ලාංකික පුරවැසියකු හා විවාහ වී සිටින විදේශ රටක යම් පුරවැසියකු.

2. (අ) පෙරාතුව වූ මාස දොළහ (12) තුළ, සමස්තය දින එකසිය අසූ දෙකකට (182) නොවැඩි වූ කාලසීමාවක්, නිවාඩුවක් සඳහා, අධ්‍යාපනය සඳහා, ව්‍යාපාර සඳහා, වෛද්‍ය ප්‍රතිකාර සඳහා හෝ ඒ හා සමාන වෙනත් යම් හේතුවක් මත තාවකාලිකව ශ්‍රී ලංකාවෙන් බැහැරට නික්ම ගොස් ඇති;

(ආ) වෙනත් රටක් මගින් ප්‍රදානය කළ ශිෂ්‍ය වීසා බලපත්‍රයක් හෝ ඒ හා සමාන වීසා බලපත්‍රයක් මත සහ එම අධ්‍යයන කටයුතු අවසන් වීමෙන් පසු දින එකසිය අසූ දෙකකට (182) නොවැඩි වැඩිදුර කාල සීමාවක් ශ්‍රී ලංකාවෙන් බැහැරව නික්ම ගොස් ඇති,

යම් ශ්‍රී ලාංකික පුරවැසියකු.

3. රාජ්‍ය සංස්ථා, රාජ්‍ය ආයතන, ව්‍යවස්ථාපිත මණ්ඩල, රාජ්‍ය නියෝජ්‍යායතන සහ රාජ්‍ය හිමිකම සහිත වෙනත් යම් අස්ථිත්ව ද ඇතුළත්ව ශ්‍රී ලංකා රජය.

4. (අ) ශ්‍රී ලංකාවෙන් බැහැර නේවාසික (නම් කරනු ලැබ ඇති නාමය හෝ පදවි නාමය කුමක් වුව ද එම නාමයෙන් හෝ පදවිනාමයෙන්) ශ්‍රී ලංකා රජයේ රාජ්‍ය තාන්ත්‍රික නියෝජිතයන්, කොන්සල්වරුන් හෝ වෙළඳ කොමසාරිස්වරුන්;

(ආ) වීසා ප්‍රදානය කිරීමේ බලධරයා විසින් වීසා ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කර ඇති ඉහත 4 වන ඡේදයේ (අ)

අනුඡේදයේ සඳහන් යම් තැනැත්තුගේ කාර්ය මණ්ඩල සාමාජිකයකු වන්නා වූ ශ්‍රී ලාංකික පුරවැසියකු වන යම් තැනැත්තකු;

(ඇ) ශ්‍රී ලංකාවෙන් බැහැර දී බඳවා ගනු ලැබූ තැනැත්තන් හැර, ශ්‍රී ලංකාවෙන් බැහැර සේවය කරනු ලබන, රාජ්‍ය සංස්ථාවක, රාජ්‍ය ආයතනයක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක, බලපත්‍රලාභී බැංකුවක හෝ ශ්‍රී ලංකාව තුළ සංස්ථාගත කරනු ලැබූ සමාගමක කාර්ය මණ්ඩල සාමාජිකයකු;

(ඈ) ඉහත (4) වන ඡේදයේ (අ), (ආ) හෝ (ඇ) වන අනු ඡේද යටතේ ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තකු ලෙස නිශ්චය කරනුලැබූ යම් තැනැත්තකුගේ පවුලේ යම් සාමාජිකයකු.

5. ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අදාළ වීසා බලපත්‍රය යටතේ ශ්‍රී ලංකාවේ නේවාසික හෝ සේවා නියුක්තියේ යෙදී සිටින, එහෙත් වෙනත් රටවලට යන අතර මග සිටින මගීන් හෝ විනෝද හෝ ව්‍යාපාර කටයුතු සඳහා රටේ සංචාරය කරනු ලබන සංචාරකයන් නොවන, විදේශ රටවල පුර වැසියන්.

6. හිමිකාරත්වය දරනු ලබන, පාලනය කරනු ලබන හෝ කළමනාකරණය කරනු ලබන තැනැත්තන්ගේ පුරවැසිභාවයේ තත්ත්වය නොසලකා, ශ්‍රී ලංකාව තුළ සංස්ථාගත කරනු ලැබූ හෝ ලියාපදිංචි කරනු ලැබූ පහත සඳහන් ආයතන:-

(අ) ශ්‍රී ලංකාව තුළ සංස්ථාගත කරනු ලැබූ සමාගම්;

(ආ) ශ්‍රී ලංකාවෙන් බැහැර සංස්ථා ගත කරනු ලැබූ බලපත්‍රලාභී බැංකුවල (විදේශ බැංකු) ශාඛා ඇතුළු 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ විදේශ සමාගම්;

(ඇ) අක්වෙරළ සමාගම් ලෙස ලියාපදිංචි කරනු ලැබූ සමාගම්;

(ඈ) ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි කරනු ලැබූ රාජ්‍ය නොවන සංවිධාන ඇතුළු සමාජ, සමිති හෝ වෙනත් යම් සංවිධාන.

7. මිය යෑම සිදුවූ අවස්ථාවේ දී, මියගිය තැනැත්තා හෝ ගිවිසුම ඇතිකර ගත් අවස්ථාවේ දී ගිවිසුම්කරු ඉහත 1 සිට 5 දක්වා වන ඡේද ප්‍රකාර නේවාසිකයකු වූ අවස්ථාවක දී, හුදෙක්ම අදාළ තත්ත්වයෙහි කටයුතු කරනු ලබනවිට දී, අන්තිම කැමති පත්‍ර භාර හෝ ජීවත් වන්නන් අතර වන ගිවිසුම්වල වෙනත් රටක භාරකරුවන් සහ බූදලයන්හි අද්මිනිස්ත්‍රාසිකරුවන් හෝ අන්තිම කැමති පත්‍රයන්හි පොල්ම:කරුවන්.

8. 1971 අංක 52 දරන වෙළෙඳ නැව් පනතේ අර්ථානුකූලව ශ්‍රී ලංකාවේ නැවක සේවයේ නියුක්ත කාල සීමාව තුළ දී, එසේ සේවයේ නියුක්තව සිටින ශ්‍රී ලාංකික පුරවැසියන්.

9. ඉහත 1 වන, 2 වන, 4 වන හෝ 7 වන ඡේදවල නිශ්චිතව දක්වා ඇති කොන්දේසි සපුරා නොමැති ශ්‍රී ලාංකික පුරවැසියන් වන හෝ ශ්‍රී ලාංකික සම්භවයක් ඇති තැනැත්තන්, 2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ නිකුත් කරන ලද නියෝග, නියම සහ විධානවලට යටත්ව, පෞද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් විවෘත කිරීමේ කාර්යය සඳහා පමණක්, ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන් ලෙස සලකනු ලැබිය යුතු ය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2215/39 - 2021 පෙබරවාරි මස 18 වැනි බ්‍රහස්පතින්දා - 2021.02.18

I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

ශ්‍රී ලංකා මහ බැංකු නිවේදන

1949 අංක 58 දරන මුදල් නීති පනත

1949 අංක 58 දරන මුදල් නීති පනතෙහි 68 වන වගන්තිය සමග එක්ව කියවිය යුතු 10 (c) වන වගන්තිය යටතෙහි සාදනු ලබන රීති.

මහාචාර්ය ඩබ්ලිව්. ඩී. ලක්ෂ්මන්,
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති.

2021 පෙබරවාරි මස 18 වැනි දින,
ශ්‍රී ලංකා මහ බැංකුව,
කොළඹ දී ය.

අපනයනය මගින් ලද මුදල් ශ්‍රී ලංකාව වෙත ගෙන්වා ගැනීම

1. මේ රීති "2021 අංක 1 දරන අපනයනය මගින් ලද මුදල් ශ්‍රී ලංකාව වෙත ගෙන ඒමේ රීති" යනුවෙන් හඳුන්වනු ලැබිය යුතුය.

2. ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින්, 1949 අංක 58 දරන (සංශෝධිත) මුදල් නීති පනතෙහි 10 (c) වගන්තියෙහි විධිවිධාන සමග එක්ව කියවිය යුතු එම පනතේ 68 වන වගන්තියෙහි විධිවිධාන අනුව, අපනයනය මගින් ලද මුදල් ශ්‍රී ලංකාව වෙත ලැබීම සහ එකී මුදල් ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කිරීමට අදළ රීති මෙමගින් නිකුත් කරනු ලබයි.

3. සෑම භාණ්ඩ අපනයනකරුවෙකුම, නැවත දැනුම් දෙන තුරු :

   (i) අපනයනය කරන ලද සියලු භාණ්ඩවලට අදළව අපනයනය කිරීමෙන් ලද මුදල්, භාණ්ඩ නැව්ගත කරන ලද දිනයේ සිට දින එකසිය අසූවක් (180) ඇතුළත ශ්‍රී ලංකාව වෙත ගෙන්විය යුතුය, සහ

   (ii) සෑම අපනයනයක් සඳහාම ලද සියලු මුදල් ලැබීම්වලට අදළ සියලු ලේඛනගත සාක්ෂි, එම මුදල් ලබන්නාවූ බලපත්‍රලාභී වාණිජ බැංකුවට හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවට (මෙහි මින්මතු "බලපත්‍රලාභී බැංකුව" වශයෙන් හඳුන්වනු ලබන) නොපමාව ඉදිරිපත් කළ යුතුය.

4. සෑම භාණ්ඩ අපනයනකරුවෙකුම, ඉහත 3 වන රීතිය යටතේ ඉල්ලා ඇති පරිදි අපනයනය මගින් ලද මුදල් ලැබුණු වහාම, බලපත්‍රලාභී බැංකුවක් මගින් එකී අපනයනය මගින් ලද මුළු මුදලින් සියයට විසි පහක ප්‍රතිශතයක් (25%) ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කළ යුතුය.

5. ඉහත සඳහන් කරන ලද අපනයනය කිරීම මගින් ලද මුදල් සියයට විසි පහක (25%) ප්‍රතිශතයකින් පරිවර්තනය කිරීමේ අවශ්‍යතාවය, මුදල් මණ්ඩලය මගින් කලින් කලට යම් වෙනත් ප්‍රතිශතයක් නියම කරනු ලබන තෙක් අඛණ්ඩව පවත්වාගෙන යා යුතුය.

6. සෑම බලපත්‍රලාභී බැංකුවක් විසින්ම ඉහත 3 වන රීතියෙන් නියම කරන ලද කාලය තුළ අපනයන කිරීම මගින් ලද මුදල් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම සහ ඉහත 4 වන රීතියෙන් නියම කර ඇති පරිදි එම මුදල් ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කිරීම අනිවාර්යයෙන්ම අධීක්ෂණය කළ යුතු අතර, ඒ සඳහා අදළවන හෝ ඒ හා බැඳෙන සියලු ලිඛිත සාක්ෂි පවත්වාගෙන යා යුතුය.

7. සෑම බලපත්‍රලාභී බැංකුවක් විසින්ම කලින් කලට නියම කරනු ලබන පරිදි වාර්තා, ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත යොමු කළ යුතු අතර, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති හෝ නියෝජ්‍ය අධිපති විසින් බලය දෙනු ලබන ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරීන්හට ඉහත 6 වන රීතිය යටතේ පවත්වාගෙන යනු ලබන වාර්තා පරීක්ෂා කිරීම සහ එකී බලපත්‍රලාභී බැංකු විසින් මෙම රීතින් විෂයෙහි අනුකූලතාවය තහවුරු කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග පරීක්ෂා කිරීම සඳහා බාධාවකින් තොරවූ ප්‍රවේශයක් ලබා දිය යුතුය.

8. මෙකී රීති, අපනයනය කරන ලද සියලු භාණ්ඩ සඳහා සහ භාණ්ඩ නැව් ගත කරන ලද දිනයේ සිට එකසිය අසූව (180) වන දිනය මෙම රීති බලාත්මක වීමෙන් පසුව ඕනෑම දිනයක එළැඹෙන්නේ වී නම්, අදළ විය යුතුය.

9. මෙම රීති, මෙහි මතු සඳහන් වන දිනයේ සිට වහාම ක්‍රියාත්මක වන පරිදි බලපැවැත්වේ.

10. සැක දුරුකර ගැනීම පිණිස හා මෙකී රීතිවල කාර්යය සඳහා "අපනයනය මගින් ලද මුදල්" යන්නට, 2019.10.17 දිනැති අංක 2145/49 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි 7 වන වගන්තිය සමග කියවිය යුතු 29 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද රෙගුලාසි ප්‍රකාරව ශ්‍රී ලංකාවට නැවත ගෙන්වා ගැනීමට අවශ්‍ය වන මුදල් ඇතුළත් වේ.

11. මෙම රීතීන් හි කාර්යය සඳහා, "බලපත්‍රලාභී වාණිජ බැංකුවක්" සහ "බලපත්‍රලාභී විශේෂිත බැංකුවක්" යන්නට, 1988 අංක 30 දරන බැංකු පනතේ ප්‍රතිපාදන යටතේ ඒවාට දී ඇති අර්ථයන් අදහස් වේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2218/38 - 2021 මාර්තු මස 09 වැනි අඟහරුවාදා - 2021.03.09

I වැනි කොටස : (I) වැනි ඡේදය – සාමාන්‍ය

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම්

1949 අංක 58 දරන මුදල් නීති පනත

1949 අංක 58 දරන මුදල් නීති පනතෙහි 68 වන වගන්තිය සමග එක්ව කියවිය යුතු
10 (c) වන වගන්තිය යටතෙහි සාදනු ලබන රීති

මහාචාර්ය ඩබ්ලිව්. ඩී. ලක්ෂ්මන්,
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති.

2021 මාර්තු මස 09 වැනි දින

කොළඹ දී ය.

අපනයනය මගින් ලද මුදල් ශ්‍රී ලංකාව වෙත ගෙන්වා ගැනීම

1. මෙම රීති "2021 අංක 2 දරන අපනයනය මගින් ලද මුදල් ශ්‍රී ලංකාව වෙත ගෙන ඒමේ රීති" යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු ය.

2. ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය මගින් නිකුත් කල සහ 2021 පෙබරවාරි මස 18 වැනි දිනැති අංක 2215/39 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි ප්‍රකාශයට පත් කළ 2021 අංක 1 දරන අපනයනය මගින් ලද මුදල් ශ්‍රී ලංකාව වෙත ගෙන ඒමේ රීති, එහි 4 වන රීතිය ඉවත් කිරීමෙන් සහ පහත සඳහන් රීතිය ඒ වෙනුවට ආදේශ කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

   "4. සෑම භාණ්ඩ අපනයනකරුවෙකුම, ඉහත 3 වන රීතිය යටතේ ඉල්ලා ඇති පරිදි අපනයනය මගින් ලද මුදල් ලැබී දින දාහතරක් (14) ඇතුළත, බලපත්‍රලාභී බැංකුවක් මගින් එකී අපනයනය මගින් ශ්‍රී ලංකාවට ලද මුළු මුදලින් සියයට විසි පහක ප්‍රතිශතයක් (25%) ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කළ යුතු ය.

   කෙසේ වෙතත්, ඉහත සඳහන් පරිවර්තනය කරන දිනය ඉහත 3 (i) රීතියට අනුව ශ්‍රී ලංකාවට අපනයන ආදායම ලැබීමට නියමිත දිනයට වඩා පසු දිනයක් නොවිය යුතුය. (එනම්, භාණ්ඩ නැව්ගත කළ දින සිට දින එකසිය අසූවකට (180) නොවැඩි දිනයක් විය යුතුය.)".

විදේශ විනිමය දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා මහ බැංකුව

2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2021 අංක 02 දරන විධානයන්

ජංගම ගනුදෙනු සම්බන්ධයෙන් බලයලත් වෙළඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ (මින්මතු පනත ලෙස හඳුන්වන ලබන) 5 වන වගන්තිය සමඟ කියවිය යුතු විදේශ විනිමය පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව, එකී පනතේ 6 වන වගන්තිය යටතේ ජංගම ගනුදෙනු ක්‍රියාත්මක කිරීම සඳහා පහත කොන්දේසීන්ට යටත්ව බලයලත් වෙළඳුන්හට අවසර ලබා දෙනු ලැබේ.

1. යම් බලයලත් වෙළෙන්දෙකු විසින්, පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව සිය අදාළ අවසරපත්‍රයේ නිශ්චය කර ඇති ප්‍රමාණය දක්වා ප්‍රධානියෙකු ලෙස හෝ මැදිහත්කරුවෙකු ලෙස පනතේ 33 වන වගන්තියේ අර්ථ නිරූපණය කර ඇති පරිදි ජංගම ගනුදෙනු සඳහා විදේශ විනිමය වෙළඳාම් කළ හැක.

2. ශ්‍රී ලංකාව තුළ සිටින හෝ ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තෙකු විසින් ශ්‍රී ලංකා රුපියල් විදේශ විනිමය වලට පරිවර්තනය කිරීම හෝ විදේශ විනිමය ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කිරීම මගින් තමාගේ (තම කලත්‍රයා, දරුවන් හෝ දෙමාපියන් ද ඇතුළුව) ජංගම ගනුදෙනුවල නිරත විය හැක.

3. බලයලත් වෙළඳුන් විසින් පනතේ 6(3) වගන්තියේ සඳහන් කර ඇති පරිදි, ඉල්ලීම්වල සද්භාවය පිළිබඳ සෑහීමකට පත්වීමෙන් හා සත්‍යාපනය කිරීමෙන් අනතුරුව, ජංගම ගනුදෙනු සඳහා විදේශ විනිමය නිකුත් කළ යුතුය. මෙම **විධානයන්හි** I වන උපලේඛනයේ යම් යම් ජංගම ගනුදෙනු වර්ග සඳහා නිර්දේශ ඉදිරිපත් කරනු ලැබේ. කෙසේ වුව ද, එය ජංගම ගනුදෙනු පිළිබඳ නිරවශේෂ (සියල්ල ඇතුළත්) ලැයිස්තුවක් නොවේ.

4. ගනුදෙනුවේ සද්භාවය තක්සේරු කිරීමේ දී සහ සත්‍යාපනය කිරීමේ දී, ලේඛනගත සාක්ෂි හෝ ගනුදෙනුවේ ස්වභාවයට අදාළව ලබාගත හැකි වෙනත් යම් තොරතුරු සහ ප්‍රේෂණයේ ප්‍රතිලාභියා පිළිබඳව බලයලත් වෙළෙන්දන් විසින් සැලකිල්ලට ගත යුතුය.

5. ජංගම ගනුදෙනු සම්බන්ධයෙන් විදේශ විනිමය වෙළඳාම් කිරීමේ දී අදාළ කරගත හැකි මාර්ගෝපදේශයන් මෙම විධානයන්හි **උපලේඛන** II හි දක්වනු ලැබේ. මෙම ගනුදෙනු මගින් මුදල් ගෙවීම් (මුදල් ගලා යාම්) හා මුදල් ලැබීම් (මුදල් ගලා ඒම්) යන ද්විත්වයම ආවරණය කෙරෙන අතර, ඕනෑම ආකාරයේ ජංගම ගනුදෙනුවක් සඳහා වන ඕනෑම ප්‍රතිමුඛ /ආමුඛ ප්‍රේෂණයක් කළ හැක.

6. බලයලත් වෙළඳුන් විසින් සෑම ජංගම ගනුදෙනුවක්ම සිදු කරන ලද පදනමට අදාළ ඕනෑම තොරතුරක් හෝ ලේඛන (විද්‍යුත් මාධ්‍යයෙන් හෝ ලිඛිත මාධ්‍යයෙන්), මහ බැංකුව විසින් නිවැරදි බව තහවුරු කර ගැනීම පිණිස, එම ගනුදෙනුව සිදු වූ දිනයේ සිට වසර හයක කාල සීමාවක් හෝ වාර්තා තබා ගත යුතු කාල සීමාව ඉක්මවා යන දිනයෙන් වඩාත් දීර්ඝතම කාල සීමාව දක්වා රඳවා ගත යුතු වේ.

7. යම් බලයලත් වෙළෙන්දෙකු විසින් පනතේ 6(5) වගන්තියට අනුකූල බවට යටත්ව පනතේ 6(4) වන වගන්තියේ සඳහන් කර ඇති හේතු සැලකිල්ලට ගෙන ජංගම ගනුදෙනුවක් සඳහා විදේශ විනිමය වෙළඳාම් කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකිය.

8. මෙකී විධානයන්ගේ පහසුව තකා

   (අ) "**විද්‍යුත් මුදල් මාරු කිරීමේ කාඩ්පත්**" යනු ඒ හා සම්බන්ධයෙන් විදේශ විනිමය හුවමාරු පනත යටතේ නිකුත් කරන ලද විධානයන් හා අනුගත වීම සඳහා බලයලත් වෙළඳුන්හට ගනුදෙනු සම්බන්ධ තොතුරු හඳුනා ගැනීමට හැකි ණය කාඩ්පත්, හර කාඩ්පත් හා වටිනාකම තැන්පත් කළ කාඩ්පත් වන අතර එය පරිශීලකයාට වටිනාකම ණය, හර හෝ වෙනත් ආකාරයකින් මාරු කළ හැකි පහසුකම සපයන කාඩ්පතක් හෝ උපාංගයක් වේ.

   (ආ) "**විගාමිකයා**" යනු 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ නියාමනයන්හි නිශ්චය කර ඇති පරිදි විගාමිකයකු වේ.

   (ඇ) "**ආසන්නතම පවුලේ සාමාජිකයින්**" යනු කලත්‍රයා, දෙමාපියන් සහ දරුවන් වේ.

(ඈ) විදුලි පැවරුම්, අනිකුත් අන්තර් බැංකු හුවමාරු, බැංකු අණකර, අනිකුත් ගෙවීම් උපකරණ, ව්‍යවහාර මුදල් හැරුනු විට අනිකුත් ජාත්‍යන්තරයේ පිළිගත් ගෙවීම් ක්‍රම හෝ ප්‍රවාහ හරහා ලැබෙන ගෙවීම් හෝ විදේශ විනිමය සමාගම්/ ආයතන හරහා ලැබෙන අරමුදල් "**ප්‍රේෂණ**" යන්නෙහි අන්තර්ගත වේ.

(ඉ) "**විදේශ විනිමය සහ ව්‍යවහාර මුදල්**" යන්න 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 33 වන වගන්තියේ දක්වා ඇති අර්ථ දැක්වීම හා සමාන විය යුතු වේ.

(ඊ) "**විදේශ විනිමය වෙළඳාම් කිරීම**" 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 33 වන වගන්තියේ දක්වා ඇති අර්ථ දැක්වීම හා සමාන විය යුතු වේ.

9. ජංගම ගනුදෙනු හා සම්බන්ධයෙන් බලයලත් වෙළඳුන් වෙත 2017 නොවැම්බර් 20 වන දින දාතම 2017 අංක 01 දරන විධානයන් සහ 2020 මාර්තු 19 වන දින දාතම 2020 අංක 01 දරන විධානයන් ද මෙයින් ඉවත් කෙරේ.

10. ඉහත පරිච්ඡේදය 9හි පෙර විධානයන් අවලංගු කිරීම ඒ යටතේ අවලංගු කිරීමට පෙර උපචිත අයිතීන්, දඬුවම් හෝ වගකීම් සඳහා බලපෑම් නොකළ යුතුය.

11. බලයලත් වෙළඳුන් හෝ මෙම විධානයන් යටතේ විදේශ විනිමය වෙළඳාම් කරනු ලබන තැනැත්තන් මෙම විධානයන්ගෙන් අවසර ලබා දෙන දෑ වෙනත් නීතියක විධිවිධාන හා අනුගත වීමේ අවශ්‍යතාව නිදහස් කිරීමට, විශෝධනයට හෝ වැළැක්වීමට අර්ථකථනය නොකළ යුතුය.

12. මෙම විධානයන් **2021 මාර්තු 22** වන දින සිට ක්‍රියාත්මක වනු ඇත.

අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව
2021 මාර්තු 18

2021 අංක 02 දරන විධානයන්හි 1 වන උපලේඛනය

ජංගම ගනුදෙනු පිළිබඳ ප්‍රතීයමාන ලැයිස්තුව

1. විදේශ වෙළඳාම, සේවාවන් සහ බැංකු සහ ණය පහසුකම් ඇතුළු අනෙකුත් ජංගම ව්‍යාපාර

1.1 විදේශ වෙළඳාම

1.1.1 ශ්‍රී ලංකාවට භාණ්ඩ ආනයනය කිරීම සහ ශ්‍රී ලංකාවෙන් භාණ්ඩ අපනයනය කිරීම.

1.1.1.1 චංචල භාණ්ඩ ඇතුළු සාමාන්‍ය වෙළඳ භාණ්ඩ

1.1.1.2 අළුත්වැඩියා කිරීම හෝ සැකසීම සඳහා භාණ්ඩ ආනයනය කිරීම හෝ අපනයනය කිරීම.

1.1.1.3 වරායන් තුළ බර වාහන මගින් ප්‍රසම්පාදනය කරනු ලබන ඉන්ධන, බඩුබාහිරාදිය, ගබඩා ද්‍රව්‍ය ආදී භාණ්ඩ

1.1.2 අන්තරාල වෙළඳාම

1.1.2.1 තෙවන රටකට ප්‍රතිඅපනයනය කරන තුරු ආනයනය කොට රේගු බන්ධිත ගුදමක හෝ වෙන් කර ඇති බන්ධිත ප්‍රදේශයක ගබඩා කර ඇති භාණ්ඩ

1.1.2.2 ආනයනික භාණ්ඩ තෙවන රටකට අපනයනය කිරීමට පෙර රේගු බන්ධිත ගුදමක දී හෝ වෙන් කර ඇති බන්ධිත ප්‍රදේශයක දී නැවත ඇසුරුම් කිරීම/ නැවත ලේබල් කිරීම හෝ සරලව සකස් කිරීම.

1.1.2.3 භෞතිකව භාණ්ඩ ශ්‍රී ලංකාවට පැමිණීමකින් තොරව එක් රටක සිට භාණ්ඩ තවත් රටකට සෘජුව අපනයනය කිරීම (උදා: එක් රටකින් ප්‍රසම්පාදනය කරන ලද හෝ නිෂ්පාදනය කරන ලද භාණ්ඩ තවත් රටකට නැව්ගත කිරීම)

1.1.2.4 රේගු බන්ධිත ගුදමකට හෝ වෙන් කර ඇති බන්ධිත ප්‍රදේශයක් තුළට භාණ්ඩ ඇතුළත් කර නොගෙන ශ්‍රී ලංකාවේ පිහිටි වරායක දී, එක් නැවකින් හෝ ගුවන් යානයකින් වෙනත් නැවකට හෝ ගුවන් යානයකට මාරු කිරීම.

1.2 සේවාවන් ඇතුළුව අනෙකුත් ජංගම ව්‍යාපාර

1.2.1 සකස් කිරීම, එකලස් කිරීම, ලේබල් කිරීම හා ඇසුරුම් කිරීම ඇතුළු වෙනත් පුද්ගලයින් විසින් භාවිත කරනු ලබන භෞතික යෙදවුම්හී නිෂ්පාදන සේවා (සැකසුම් සේවා)

1.2.2 නැව්, ගුවන් යානා සහ වෙනත් ප්‍රවාහන උපකරණ ආදියෙහි අලුත්වැඩියාවන් සහ නඩත්තු කිරීම ඇතුළු නඩත්තු සහ අලුත්වැඩියා සේවා

1.2.3 මගීන් ප්‍රවාහනය, භාණ්ඩ එහා මෙහා ගෙනයාම (ප්‍රවාහන භාණ්ඩ) සම්බන්ධ සේවා සහ තැපැල්, කුරියර්, නැව් භාණ්ඩ හැසිරවීම හා ගබඩා කිරීමේ සේවා යනාදී ආශ්‍රිත සහායක සේවා ඇතුළුව ප්‍රවාහන සේවා

1.2.4 සංචාරක නියෝජිතයින්/ සංචාර මෙහෙයවන්නන් හෝ වෙනත් සේවා සපයන්නන් හරහා සැලසුම් කරනු ලබන සංචාරක සේවා ද ඇතුළුව ව්‍යාපාර, අධ්‍යාපන, සෞඛ්‍යය, නිවාඩු, වන්දනා, සමුළු, ක්‍රීඩා, සම්මන්ත්‍රණ, සංස්කෘතික ක්‍රියාකාරකම්, චාරිකා ආදිය හා සම්බන්ධ සංචාර

1.2.5 ඉදි කිරීම් කටයුතු ආදිය හා සම්බන්ධ ශ්‍රී ලංකාව තුළ හෝ පිටත භාණ්ඩ සහ සේවා ප්‍රසම්පාදනය ඇතුළු ඉදි කිරීම් සේවා

1.2.6 තැපැල්, කුරියර්, ගුවන් විදුලි සහ විදුලි සංදේශ සේවා ආදිය ඇතුළු සන්නිවේදන සේවා

1.2.7 රක්ෂණයට අදාළ දේශීය/ ජාත්‍යන්තර රෙගුලාසිවලට යටත්ව රක්ෂණය, ප්‍රතිරක්ෂණය සහ වෙනත් අදාළ සේවා (ජීවිත රක්ෂණය හැර)

1.2.8 ණයවර ලිපි සඳහා කොමිස් මුදල් සහ ගාස්තු/ කාලීන ණය/ විදේශ විනිමය හුවමාරු/ පාරිභෝගික සහ ව්‍යාපාර ණය සේවා/ තැරැව්කාර සේවා/ සාධක සේවා/ ලියා හැරීමේ සේවා/ අවදානම් ආවරණය කිරීමේ උපකරණ සැලසුම්/ මූල්‍ය වෙළඳපොළ මෙහෙයුම් සහ නියාමන සේවා/ ආරක්ෂක භාරකාර සේවා/ ගෙවීම් නිෂ්කාෂණ සේවා/ ණය ශ්‍රේණිගත කිරීමේ ගාස්තු, භාර ගාස්තු සහ වෙනත් අතරමැදි සේවා ගාස්තු යනාදිය ඇතුළත් මූල්‍ය සේවා

1.2.9 විකාශන සහ සම්ප්‍රේෂණ සේවා, ව්‍යාපාරික ජාල සේවා, පරිගණක දෘඩාංග සහ මෘදුකාංග සේවා, පද්ධති නඩත්තුකරණය සහ අනෙකුත් සහායක සේවා (ස්ථාපනය කිරීම, අලුත්වැඩියාව, භාවිත කිරීමට අදාළ බලපත්‍ර ආදිය), නිර්මාණකරණය සහ වැඩසටහන්කරණය, වගකීම් හිමිකම්, අලුත් කිරීමේ ගාස්තු සහ දත්ත සැකසීම හෝ වෙබ් සත්කාර සේවා ඇතුළුව විදුලි සංදේශ, පරිගණක සහ තොරතුරු සේවා

1.2.10 බලපත්‍ර ගාස්තු, වරලත් ව්‍යාපාරික ගාස්තු, කළමනාකරණ ගාස්තු, නිෂ්පාදන සහායක සේවා ගාස්තු, ඇතුළුවීමේ ගාස්තු, අවසන් කිරීමේ ගාස්තු සහ අවලංගු කිරීමේ ගාස්තු යනාදිය ඇතුළත් පුරස්කාර සහ අනෙකුත් ව්‍යාපාර හා සම්බන්ධිත ගාස්තු

1.2.11 පේටන්ට් බලපත්‍ර, වෙළඳ සලකුණු, කතෘ හිමිකම්, කාර්මික ක්‍රියාවලීන්, මෝස්තර, වෙළඳ රහස්, අනුග්‍රාහකත්වයන් සම්බන්ධයෙන් වන පරිපූර්ණ හිමිකම්, මාධ්‍ය බලපත්‍ර, කල්බදු කුලී සහ අනෙකුත් පරිවර්ත්‍ය ගිවිසුම් ආදී බුද්ධිමය දේපළ හිමිකම් භාවිත කිරීමට අදාළ ගාස්තු

1.2.12 පර්යේෂණ හා සංවර්ධන සේවා, වෘත්තියමය හා කළමනාකරණ උපදේශන සේවා (නෛතික, ගනකාධිකරණ, කළමනාකරණ, උපදේශන, මහජන සම්බන්ධතා, ප්‍රචාරණය, වෙළඳපොළ පර්යේෂණ සේවා ආදිය ඇතුළත්ව), තාක්ෂණික සේවා (ගෘහ නිර්මාණ, ඉංජිනේරු සේවා ඇතුළත්ව), වෙළඳාම හා සම්බන්ධ සේවා (ගෘහ නිර්මාණ, ඉංජිනේරු සේවා ඇතුළත්ව), වෙළඳාම හා සම්බන්ධ සේවා ඈවෙළඳ නැව් සේවා (අන්තරාල) දේශිය නැව් සමාගම් විසින් ජාත්‍යන්තර මුහුදු තීරයන්හී කරනු ලබන යාත්‍රා මෙහෙයුම් කටයුතු (විදේශීය නාවුක පිරිස්වල වැටුප් බෙදා හැරීම ද ඇතුළත්ව), ප්‍රතිපාදනයන් සම්පාදනය, අදාළ ව්‍යවස්ථාපිත ගෙවීම්, නැව්, ගුවන් යානා හා බහාලුම් ආදිය කුලියට ගැනීමට අදාළ ගෙවීම්% සහ අනෙකුත් ව්‍යාපාරික සේවා

1.2.13 ඕනෑම ලිත් වර්ෂයක් තුළ එවැනි කල්බදු වාරිකවලින් මාස දොළහකට නොවැඩි එවැනි කල්බදු වාරික ගණනකට සීමා වන මෙහෙයුම් කල්බදු (වාරික) සේවා

1.2.14 ශ්‍රව්‍ය දෘශ්‍ය සහ ඒ ආශ්‍රිත සේවා ඇතුළුව පුද්ගලික, සංස්කෘතික හා විනෝදාත්මක සේවා

1.2.15 සාමාජික ගාස්තු, ගෝලීය සමුළු/ සම්මන්ත්‍රණ/ පාඨමාලා සඳහා ලියාපදිංචි වීමේ ගාස්තු හා සහභාගී වීමේ ගාස්තු, විභාග ගාස්තු, ගෞරව දීමනා, සම්බන්ධීකරණ ගාස්තු, පොරොන්දු ගාස්තු, අන්තර්ජාතික ප්‍රකාශනයන් සඳහා අයකිරීම් යනාදිය ඇතුළත් ගාස්තු සහ අයකිරීම්

1.2.16 තානාපති කාර්යාලවල වියදම්, වීසා ගාස්තු, කුසලතා ඇගයීම් ගාස්තු, වෛද්‍ය පරීක්ෂණ ගාස්තු සහ වීසා ලියාපදිංචි කිරීමේ ලේඛන සැකසුම් ගාස්තු වැනි රජයන් අතර, ජාත්‍යන්තර හා කලාපීය සංවිධාන සහ රාජ්‍ය හා පුද්ගලික ආයතන අතර වන සියළුම සේවා ද ඇතුළත් අනිකුත් සේවා

1.2.17 පහත දෑ ඇතුළත් අනිකුත් ජංගම ව්‍යාපාර

1.2.17.1 පාදක වූ ජංගම ගනුදෙනුවකට අදාළව ශ්‍රී ලංකාවෙන් පිටත වාසික පුද්ගලයින් වෙනුවෙන් ශ්‍රී ලංකාවේ වාසික පුද්ගලයින් විසින් හෝ ශ්‍රී ලංකාවේ වාසික පුද්ගලයින් වෙනුවෙන් ශ්‍රී ලංකාවෙන් පිටත වාසික පුද්ගලයින් විසින් කල්තියා තබනු ලබන නැවත ගෙවනු ලබන තැන්පතු හා සුරැකුම්

1.2.17.2 පාර්ශවයන් අතර වන පාදක ජංගම ගනුදෙනුවක් වෙනුවෙන් ආමුඛ ප්‍රේෂණ ලෙස ලද මුදල්, ව්‍යාපාරය, සේවා ගිවිසුම් හෝ කොන්ත්‍රාත් අවලංගු කිරීම හේතුවෙන්, ශ්‍රී ලංකාවෙන් පිටත වාසික පුද්ගලයන්හට නැවත ගෙවීම

1.2.17.3 නේවාසික සේවා යෝජක සමගම්/ ආයතන වෙනුවෙන් ශ්‍රී ලංකාව තුළ කරගෙන යනු ලැබූ ව්‍යාපෘති/ කොන්ත්‍රාත් සාර්ථකව නිම කිරීමෙන් පසුව රඳවාගත් මුදල් විදේශ කොන්ත්‍රාත්කරුවන්ට නිදහස් කිරීම.

1.2.17.4.1 අදාල විදේශ ප්‍රධානීන් වෙත, ශ්‍රී ලංකා රුපියල් වලින් රැස් කරන ප්‍රවාහන කුලී සහ වෙනත් ගාස්තු රැස් කිරීම් ලෙස, නියෝජිත ගිවිසුම් සතු සේවා සපයන්නන් වන නැව්, ගුවන් සේවා නියෝජිත ආයතන සහ භාණ්ඩ ප්‍රවාහනය කරන්නන්

1.2.17.4.2 වලංගු ගිවිසුමක් ඇති විදේශයන්හි විදේශ සබඳතා අමාත්‍යංශ, විදේශ තානාපති කාර්යාල හෝ විදේශීය නියෝජිත ආයතන වෙත ශ්‍රී ලංකා රුපියල් වලින් හෝ විදේශ මුදලින් එකතු කර ගන්නා වීසා ගාස්තු, වීසා සේවා/සැකසුම් මධ්‍යස්ථාන (රාජ්‍යතාන්ත්‍රික මෙහෙයුම් නොවන)

වලංගු ගිවිසුම් ඇති විදේශ විශ්ව විද්‍යාල/ ආයතන / පාසැල් වෙත, අදාල වන පරිදි, ශ්‍රී ලංකා රුපියල් වලින් හෝ විදේශ මුදලින් දේශීය සිසුන්ගේ විභාග හෝ ලියාපදිංචි ගාස්තු ලෙස එකතු කර ගන්නා මුදල් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි අධ්‍යාපන/ පුහුණු ආයතන.

1.2.17.4.4 ශ්‍රී ලංකාවේ මෙහෙයුම් සිදු කරන විදේශීය සමාගම් වලට විදේශීය මව් සමාගම් වෙත වියදම ප්‍රතිපූර්ණය ලෙස/ අරමුදල් ආපසු ලබා දීම ලෙස 2007 අංක 07 දරන සමාගම් පනත (සංශෝධිත පරිදි) යටතේ ලියාපදිංචි වූ විදේශීය සමාගමක්

1.2.17.4.5 බහුජාතික සමාගම් වෙත අන්තර්සමාගම් ගාස්තු ලෙස (ජංගම ගනුදෙනුවකට අදාලව) බහුජාතික සමාගමකට අනුබද්ධ ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සමාගමක්

1.2.17.4.6 රට තුළ අදාල නීතිවලට යටත්ව, ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කර ගෙන යනු ලබන දායක අරමුදල් ව්‍යාපෘති වලට අදාළව ආමුඛ ප්‍රේෂණ ලෙස ලැබුනු වියදම් නොකරන ලද හෝ භාවිතා නොකළ අරමුදල්, දායකය/ අරමුදල් සපයන නියෝජිත ආයතන වෙත නේවාසික ව්‍යාපෘති සමාගම් විසින් සිදු කරනු ලබන අරමුදල් ප්‍රේෂණ.

1.3 **බැංකු සහ ණය පහසුකම්**

1.3.1 ණයවර ලිපි

ජාත්‍යන්තර වෙළඳ ගනුදෙනු සඳහා පහසුකම් සපයන සමාගම් වලට අදාල සමරූපී රේගු ප්‍රතිපත්තීන් හි කොන්දේසි, බලයලත් වෙළඳුන් හට අදාල වන හෝ බැඳියාවක් ඇති ශ්‍රී ලංකාවේ පවතින නීති හා රෙගුලාසීන් හා ගැලපෙන තාක් දුරට, බලයලත් වෙළඳුන් විසින් සමරූපි රේගු ප්‍රතිපත්ති අනුව ස්ථාපනය කරන ලද ණයවර ලිපි නිකුත් කිරීම, වලංගු කාලය දීර්ඝ කිරීම සහ වගන්ති සංශෝධනය කිරීම කළ හැකි ය.

1.3.2 විදේශ සැපයුම්කරු ණය පහසුකම් මත පොලී ගෙවීම්

ණය මුදල් ලබා දුන් මුදල් වර්ගය සඳහා පවතින ජාත්‍යන්තර පොලී අනුපාතයට නොවැඩි සහ ලබාදුන් ණය කාල සීමාවට එහා ගිය දිනක් හෝ සත්‍ය පියවීම් දිනය යන දෙකෙන් පලමුව එළැඹෙන දිනෙන් ඔබ්බට නොයන දිනක, විදේශීය සැපයුම්කරුවන් විසින් ආනයනකරුවන් වෙත ලබාදුන් ණය පහසුකම් හි පොලී ගෙවීමට (කෙසේද යත්, ගෙවීම් කොන්දේසි දේශීය ආනයකරුට ලබා දුන් ණය පහසුකම් හා සම්බන්ධ වීම) අදාල ප්‍රේෂණයන් සිදු කිරීමට බලයලත් වෙළෙඳුන් හට හැකි ය.

2. ණය සහ අනෙකුත් ආයෝජනවලින් ලැබෙන ශුද්ධ ආදායම් මත පොලිය

2.1 ලාභාංශ, පොලිය, කුලී ආදායම සහ ලාභ ඇතුළත් වන ආයෝජන ආදායම.

2.1.1 ශ්‍රී ලංකාව තුළ නැතහොත් ඉන් පිටත අවසරලත් ආයෝජනවලින් හට ගනු ලබන ආයෝජන ආදායම. ශ්‍රී ලංකාව තුළ සිදු කරන අවසරලත් ආයෝජනවලින් හට ගත් ඕනෑම ආදායමක දී, එවැනි ආදායමක් අභ්‍යන්තර ආයෝජන ගිණුම සඳහා අදාළ වන විදේශ විනිමය පනත යටතේ නිකුත් කරන ලද රෙගුලාසි සහ නියමයන් ප්‍රකාරව අභ්‍යන්තර ආයෝජන ගිණුමක් ඔස්සේ ආ යුතුය.

2.1.2 ණය පොලී ගෙවීම, පොරොන්දු ගාස්තු, ණය පරිපාලන සහ අනෙකුත් ආශ්‍රිත ගාස්තු සහ වියදම් (විදේශ විනිමය පනතේ නැතහොත් අහෝසි කළ විනිමය පාලන පනතේ විධිවිධාන යටතේ අවසරලත් ණයවලට අදාළව) අදාළ විය හැකි පරිදි, අභ්‍යන්තර ආයෝජන ගිණුමක් නැතහොත් බාහිර වාණිජ ණය ගැනීමේ ගිණුමක් ඔස්සේ සිදු විය යුතුය.

3. ණය ක්‍රමක්ෂය සඳහා ගෙවීම්

3.1 විදේශ විනිමය පනතේ නැතහොත් අවලංගු කරන ලද විනිමය පාලන පනතේ විධිවිධාන යටතේ අවසරලත් ණය නියමයන් සහ කොන්දේසිවලට අනුකූල වන ණය අගයන්, මුල් මුදල ආපසු ගෙවීම් සහ පොලී ගෙවීම් සහිත ණය ගිවිසුම්වලට අදාළව උපචිත වන ගෙවීම්.

4. පවුල් ජීවන වියදම් සහ සේවක වන්දි සඳහා ප්‍රේෂණ

4.1 පවුල් ජීවන වියදම්

4.1.1 විදේශයේ රැකියාවල නිරත ශ්‍රී ලාංකික පුරවැසියන් විසින් සිදු කරනු ලබන ප්‍රේෂණ.

4.1.2 විගාමිකයන් සඳහා හැරුණුකොට, පවුලේ නැතහොත් යැපෙන්නන් (දෙමව්පියන්, කලත්‍රයා, දරුවන්) ගේ නඩත්තුව සඳහා විගාමිකයන් විසින් ප්‍රේෂණය කරනු ලබන අරමුදල්.

4.1.3 ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් සඳහා අදාළ වන විදේශ විනිමය පනත යටතේ නිකුත් කරන ලද රෙගුලාසි සහ විධානවලට යටත්ව, විදේශයෙහි වාසය කරන පවුලේ නැතහොත් යැපෙන්නන් (දෙමව්පියන්, කලත්‍රයා, දරුවන්) ගේ නඩත්තුව සඳහා විගාමිකයන් විසින් ප්‍රේෂණය කරනු ලබන අරමුදල්.

4.2 ප්‍රවාසික සේවා නියුක්තිකයන් වෙත ලබා දෙන වන්දි

4.2.1 වේතන, වැටුප්, දීමනා සහ විශ්‍රාම දීමනා ඇතුළු අනෙකුත් සේවා නියුක්ති ප්‍රතිලාභ ඇතුළත් වන ප්‍රවාසික සේවා නියුක්තිකයන් (ජාතිය නොතකමින්) වෙත සිදු කරනු ලබන ප්‍රේෂණ හෝ සේවා යෝජකයන් විසින් ගෙවනු ලබන සේවක අර්ථසාධක අරමුදල් දායකත්වයන් සහ ජීවන සහ රැකියාව ආශ්‍රිත වියදම් ප්‍රතිපූරණය නැතහොත් ශ්‍රී ලංකාව තුළ සේවා නියුක්තව සිටින අතරතුර,එවැනි ප්‍රවාසිකයන් විසින් ලබා ගන්නා ලද මෝටර් වාහන විකිණීමෙන් ලත් මුදල්

4.2.2 පෙර රැකියාවෙහි නිරතව සිටි නැතහොත් වර්තමානයේ රැකියාවක නිරතව සිටින සේවකයන්ගේ සමුච්චිත වැටුප්, රැකියාමය නැතහොත් අනෙකුත් ආශ්‍රිත ප්‍රතිලාභ ගෙවීම් හෝ ප්‍රතිපූරණය කිරීම් ලෙස විදේශයෙහි ඇති ප්‍රවාසිකයන්ගේ ගිණුමට හෝ නම් කරන ලද ජාත්‍යන්තර විශ්‍රාම අරමුදල් / යෝජනා ක්‍රමයකට හෝ නැතහොත් විදේශයන්හි මව් සමාගම් වෙත ඍජුවම සිදු කරන ප්‍රේෂණ.

5. විවිධ වර්තන පැවරුම්

5.1 ආහාර, ඇඳුම් සහ අනෙකුත් පාරිභෝගික භාණ්ඩ, වෛද්‍ය සැපයුම්, සහන ප්‍රයත්නයන් හා ආශ්‍රිත තාක්ෂණික සහාය කාර්යමණ්ඩල සඳහා ගෙවීම්වලට අදාළ රජයේ පැවරුම්

5.2 අනුකූල නොවීම් හෝ උල්ලංඝනයන් සහ වන්දි ගෙවීම් මත අධිකරණ සහ වෙනත් රජයන් විසින් හෝ ආයතනික නියාමන ආයතන විසින් පනවනු ලබන දඩ ගාස්තු, දඩ මුදල්, ගාස්තු සහ හිමිකම්, ප්‍රදානය කරන ලද අනිවාර්ය ගෙවීම්, නැතහොත් අධිකරණයේ දී ඈවර කිරීමක්/ බේරුම් කිරීමක් සහ අනෙකුත් ආරවුල්වලට අදාළව එකඟ වනු ලබන විසඳීම්.

5.3 බදු සඳහා අදාළ වන දේශීය/ ජාත්‍යන්තර නීති සහ රෙගුලාසිවලට යටත්ව බදු ආපසු ලබා දීම ඇතුළු ප්‍රවර්තන බදු ගෙවීම්;

2021 අංක 02 දරන විධාන සඳහා වන II වන උපලේඛනය

ජංගම ගනුදෙනු සඳහා විදේශ විනිමයෙන් ගනුදෙනු කිරීමට මාර්ගෝපදේශය

1. **වෙළඳ ගෙවීම්**

1.1 **වෙළඳ භාණ්ඩ අපනයන**

1.1.1 **සාමාන්‍ය ප්‍රතිපත්තිය**

1.1.1.1. රජයේ වෙළඳ ප්‍රතිපත්තියට යටත්ව, රටට විදේශ විනිමය ඉපැයීම් උත්පාදනය කරන වෙළඳ භාණ්ඩ අපනයන සඳහා ගෙවීම් සිදු කිරීමට අවසර ලැබේ.

1.1.1.2. අපනයනවලින් ලත් මුදල් අපනයනකරු විසින් බලයලත් වෙළෙන්දෙකු සමඟ ආරම්භ කර පවත්වා ගෙන යනු ලබන ඕනෑම ශ්‍රී ලංකා රුපියල් ගිණුමකට නැතහොත් ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට බැර කළ යුතුය.

1.1.2. **කොමිස් සහ හිමිකම්**

1.1.2.1 ශ්‍රී ලංකාවේ නේවාසිකයෙකු විසින් ලබා ගන්නා ලද වෙළඳ භාණ්ඩ අපනයන හෝ ව්‍යාපාර ගනුදෙනුවලට අදාළව විදෙස් නියෝජිතයන් වෙත සිදු කරන කොමිස් ප්‍රේෂණ, එවැනි අපනයනවලින් ලත් ආදායම් නැතහොත් ආමුඛ ප්‍රේෂණ පෙරළා ශ්‍රී ලංකාවට යවා ඇති විට.

1.1.2.2. අපනයනවලින් ලත් ආදායම ශ්‍රී ලංකාවට ලැබී ඇති විට දී, අපනයනය කළ භාණ්ඩවල ගුණත්වයේ සහ ප්‍රමාණයේ පවතින ඌණතාවලට අදාළව විදේශීය ගැනුම්කරුවන් වෙත හිමිකම් සඳහා සිදු කරන ප්‍රේෂණ.

1.1.3 **ආමුඛ ප්‍රේෂණ හරවා යැවීම හෝ අවලංගු කිරීම** - එවැනි අපනයන ඇනවුම් සම්පූර්ණ කර නොමැති විට දී නැතහොත් අරමුදල් අතිරික්තව හෝ භාවිතයට නොගෙන ඇති විට දී, බලයලත් වෙළෙඳුන් විසින් වෙළඳ භාණ්ඩ අපනයන සඳහා ශ්‍රී ලංකාව තුළ දී ලැබුණ සහ පසු කාලීනව විදේශයේ ගැනුම්කරු/ යවන්නා විසින් යළි කැඳවනු ලබන ආමුඛ ප්‍රේෂණ හරවා යවනු ලැබීම හෝ ආපසු ලබා දීම සිදු කෙරේ.

1.2 **වෙළඳ භාණ්ඩ අපනයන**

1.2.1 **සාමාන්‍ය ප්‍රතිපත්තිය** - රජයේ වෙළඳ ප්‍රතිපත්තියට යටත්ව, භාණ්ඩ ආනයන සඳහා ගෙවීම් සිදු කිරීමට අවසර හිමි වේ.

1.2.2 නම් කරන ලද තෙවන පාර්ශ්වයන් වෙත සිදු කරන ආනයන ගෙවීම් තවත් විදෙස් සැපයුම්කරුවෙකු (ගැනුම්කරුවන් සහ විකුණුම්කරුවන් අතර එකඟ වූ විකුණුම් ගිවිසුම්වලට අනුව) විසින් සපයනු ලබන භාණ්ඩවලට අදාළව, බලයලත් වෙළෙඳුන් විසින් විදේශයන්හි නම් කළ තෙවන පාර්ශ්වයන් වෙත භාණ්ඩ ආනයනකරුවන් විසින් සිදු කරනු ලබන ගෙවීම් සඳහා විදේශ විනිමය මුදා හැරිය යුතුය.

1.3 **අන්තරාල වෙළඳාම**

1.3.1 **සාමාන්‍ය ප්‍රතිපත්තිය**

1.3.1.1 රජයේ වෙළඳ ප්‍රතිපත්තියට යටත්ව, අන්තරාල වෙළඳාම යටතේ ප්‍රතිඅපනයන අරමුණු උදෙසා භාණ්ඩ අපනයනය සඳහා ගෙවීම් විද්‍යුත් අරමුදල් පැවරුම් කාඩ්පත් ඔස්සේ හැරුණු කොට බැංකු පද්ධතිය ඔස්සේ සිදු කිරීමට අවසර ලබා දෙයි.

1.3.1.2 අගය එකතු කරන ලද පිරිවැය, බැංකු ගාස්තු ඇතුළු වෙනත් දේශීය ගාස්තු සහ ලාභ ආවරණය කිරීමට දේශීය වෙළෙන්දාට (අතරමැදි) ප්‍රමාණවත් ලාභාන්තිකයක් තහවුරු කරමින්, අන්තරාල වෙළඳාම යටතේ භාණ්ඩ ආනයනය සඳහා ගෙවීම් සිදු කිරීම ලැබෙනු ඇති අනුරූපී ගෙවීමට වඩා අඩු විය යුතුය.

2. **සේවා ගෙවීම්**

2.1 **සාමාන්‍ය ප්‍රතිපත්තිය** - ජංගම ගනුදෙනු යටතට එන සේවා සඳහා ගෙවීම් නිදහස්ව සිදු කිරීමට අවසරය ඇත.

2.2 ආමුඛ ප්‍රේෂණ හරවා යැවීම හෝ අවලංගු කිරීම අරමුදල් අතිරික්තව ලැබී ඇති විට නැතහොත් භාවිතයට නොගෙන ඇති විට, බලයලත් වෙළෙඳුන් විසින් එවන්නා විසින් නැවත ඉල්ලූ විට ශ්‍රී ලංකාවට ලැබුණ ආමුඛ ප්‍රේෂණ හරවා යවනු ලැබිය හැක.

3. **සාමාන්‍ය**

3.1. **ප්‍රවාහන අරමුණු සඳහා විදේශ විනිමය මුදා හැරීම.**

3.1.1. බලයලත් වෙළෙඳුන් විසින් ශ්‍රී ලංකා ආගමන විගමන පාලක ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද ගුවන් බලපත්‍රය මත සිදු කළ නිසි පිටසන් කිරීමක් සහිතව, විවේකය සහ නිවාඩු, ක්‍රීඩා, විනෝදායන සහ සහ සංස්කෘතික කටයුතු, නැදෑ සහ හිතමිතුරන් බැලීමට, වන්දනා, ව්‍යාපාරික අරමුණු, පුහුණු කිරීම්, වෛද්‍ය සහ විදෙස් අධ්‍යාපනය සඳහා සංචාරය කිරීම (පුද්ගලයන් ශිෂ්‍ය වීසා යටතේ සිටින අවස්ථාවේ දී මෙම දීමනාව අදාළ විය හැකි පරිදි, අදාළ අධ්‍යාපන ආයතන නැතහොත් විදෙස් රාජ්‍ය බලධාරීන්ගෙන් ලබා ගත් ලේඛනමය සාක්ෂි සමඟ ඉදිරිපත් කළ යුතු වේ) ඇතුළු අරමුණු සඳහා විදේශයන් වෙත

සංචාරය කරන ශ්‍රී ලංකා පුරවැසියකු වන ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයන්ට ප්‍රවාහන දීමනාවේ කොටසක් ලෙස එ.ජ.ඩො. 5000ක උපරිමයක් හෝ වෙනත් විදේශ ව්‍යවහාර මුදලකින් ඊට සමාන අගයක් දක්වා නිකුත් කරනු ඇත.

3.1.2 ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම සඳහා අදාළ වන විදේශ විනිමය පනත යටතේ නිකුත් කරන ලද රෙගුලාසි සහ විධානයන්ට යටත්ව, බලයලත් වෙළෙඳුන් විසින් තවත් රටක ස්ථිර නේවාසියකයන් වන හෝ වර්තමානයේ ශ්‍රී ලංකාවේ සේවය කරන නමුත් ස්ථිර නේවාසිකභාවය නැතහොත් පුරවැසිභාවය ලබා ගත් රටට සංචාරය කරන නැතහොත් වාසය කරන ද්විත්ව පුරවැසියන් වන ශ්‍රී ලාංකිකයන් සඳහා එ.ජ.ඩො. 5000ක උපරිමයක් දක්වා හෝ වෙනත් විදේශ ව්‍යවහාර මුදලකින් ඊට සමාන අගයක සාධාරණ විදේශ විනිමය මුදලක් හෝ විදේශ සංචාර කාඩ්පත් නිකුත් කළ යුතුය.

3.2 තාවකාලික නේවාසික වීසා යටතේ ශ්‍රී ලංකාව අත්හැර යන පුද්ගලයන්ට විදේශ විනිමය මුදා හැරීම.

බලයලත් වෙළෙඳුන් විසින් 2021 අංක 04 දරන විදේශ විනිමය (විවිධ ප්‍රාග්ධන ගනුදෙනු පන්ති) රෙගුලාසි ප්‍රකාරව, මූලික දීමනාව ලෙස තාවකාලික නේවාසික වීසා (අනාගත දිනයක දී එම රටෙහි ස්ථිර නේවාසිකභාවය නැතහොත් පුරවැසිභාවය ලබා ගැනීමට පුද්ගලයෙකුට හිමිකම ලබා දෙන තාවකාලික වීසා හැරුණුකොට) යටතේ ශ්‍රී ලංකාව අත්හැර යෑමට අදහස් කරන ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයන්ට සාධාරණ විදේශ විනිමය අගයක් නිකුත් කළ යුතුය.

3.3 විදේශ සංචාර කාඩ්පත්

3.3.1 විදේශ සංචාර කාඩ්පත් නිකුත් කිරීමට අදාළව, ශ්‍රී ලංකා ආගමන විගමන පාලක ජනරාල් වරයා විසින් නිකුත් කරන ලද ගුවන් බලපත්‍රය මත නිසි පිටසන් කිරීමකින් අනතුරුව, විදේශ සංචාරය සඳහා ශ්‍රී ලංකාව අත්හැර යාමේ දී බලයලත් වෙළෙඳුන් විසින් ශ්‍රී ලංකාවෙහි නේවාසික පුද්ගලයන්ට විදේශ සංචාර කාඩ්පත් නිකුත් කරනු ඇත.

3.3.2 සංචාර අරමුණු සඳහා විදේශ විනිමය නිකුත් කිරීමට අවසරය ලබා දී ඇති විට ඕනෑම ශ්‍රී ලංකා රුපියල් ගිණුමක් නැතහොත් විදේශ ව්‍යවහාර ගිණුමක් හර කිරීම මගින් විදේශ සංචාර කාඩ්පතක් නිකුත් කළ යුතුය.

3.3.3 විදේශ සංචාර කාඩ්පත්ලාභියාගේ ඉල්ලීම මත (මින්මතු 'කාඩ්පත්ලාභියා' ලෙස හැඳින්වෙන) හෝ ශ්‍රී ලංකාවට කාඩ්පත්ලාභියා ආපසු පැමිණෙන දිනයේ සිට දින 90ක් ඉක්මවා යෑම මත යන දින දෙකෙන් පළමුව පැමිණෙන දිනයේ දී, විදේශ සංචාර කාඩ්පතෙහි ඉතිරිව පවතින භාවිත නොකළ අගය;

(අ) කාඩ්පත්ලාභියා විසින් ශ්‍රී ලංකා රුපියල්වලින් මුදල් ආපසු ගනු ලැබීම නැතහොත් කාඩ්පත්ලාභියාගේ ශ්‍රී ලංකා රුපියල් ගිණුමකට බැර කෙරෙනු ඇත; නැතහොත්

(ආ) හර කොට ඇති අගය දක්වා, එවැනි විදේශ ව්‍යවහාර ගිණුමක් හර කිරීම මගින් විදේශ සංචාර කාඩ්පත පුරවා ඇත්නම්, පුද්ගලික විදේශ ව්‍යවහාර ගිණුමකට (PFCA) නැතහොත් ව්‍යාපාරික විදේශ ව්‍යවහාර ගිණුමකට (BFCA) බැර කෙරෙනු ඇත.

3.3.4 කාඩ්පත්ලාභියෙකු පහත 3.3.5 ඡේදයට යටත්ව විය යුතු ශිෂ්‍ය වීසා යටතේ විදෙස් අධ්‍යාපනය සඳහා ශ්‍රී ලංකාවෙන් පිටතට ගොස් සිටින ශ්‍රී ලංකා නේවාසිකයෙකු වන අවස්ථාවේ දී හැරුණු කොට, කාඩ්පත්ලාභියා විදේශයක සිටින්නේ නම්, විදේශ සංචාර කාඩ්පතක් පූරණය නොකළ යුතුය.

3.3.5 බලයලත් වෙළෙඳුන් විසින් විදේශයන්හි සිටින ශිෂ්‍යයන්ගේ අදාළ ජීවන වියදම්වලට අදාළව, සද්භාවය සත්‍යාපනය කිරීමක් සහ අදාළ විය හැකි පරිදි, අදාළ විදේශීය විශ්වවිද්‍යාල/ අධ්‍යාපනික ආයතන නැතහොත් විදේශ රාජ්‍ය අධිකාරයන් විසින් නිකුත් කරනු ලබන අවශ්‍ය ලේඛනමය සාක්ෂි ලබා ගැනීම මත ශිෂ්‍යයන් වෙත විදේශ සංචාර කාඩ්පත් උඩුගත කළ යුතුය.

3.4 ගෙවීම් කාඩ්පත්

බලයලත් වෙළෙඳුන් හට පෞද්ගලික ස්වභාවයේ ගනුදෙනු, එනම්, EFTC කාඩ්පත්ලාභියෙකු නැතහොත් ඔවුන්ගේ සමීපතම පවුලේ සාමාජිකයෙකුගේ අරමුණු සඳහා විද්‍යුත් අරමුදල් හුවමාරු කාඩ්පත් (EFTC) එනම්, බැරපත්/ හරපත්/ අගය තැන්පත් කළ කාඩ්පත් ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත නේවාසික පුද්ගලයන් වෙත විදේශ විනිමයෙන් ගෙවීම් සිදු කිරීම සඳහා නිකුත් කළ හැකි ය. විද්‍යුත් අරමුදල් හුවමාරු කාඩ්පත් නිකුත් කිරීම සහ භාවිතය මේ හා සම්බන්ධව මහ බැංකුව විසින් නිකුත් කරන ලද විධාන සහ මාර්ගෝපදේශයන්ට යටත් විය යුතු වේ.

3.5 ශිෂ්‍ය වීසා ලබා ගැනීම සඳහා අත්තිකාරම් ලෙස අරමුදල් ප්‍රේෂණ අත්තිකාරම්

3.5.1 ගනුදෙනුවේ සද්භාවය සත්‍යාපනය කිරීම සහ එය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ලේඛනමය සාක්ෂි ලබා ගැනීම මත, විදේශ රාජ්‍යයන්හි ඇතැම් රජයයන්වල අවශ්‍යතාව අනුව, ශිෂ්‍ය වීසා (ප්‍රධාන වශයෙන් අනුමත කරන ලද ශිෂ්‍ය වීසා) සඳහා අයදුම් කරනු ලැබූ ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයන්ගේ ජීවන වියදම් සපුරාලීමට බලයලත් වෙළෙඳුන් හට අත්තිකාරම් වශයෙන් අරමුදල් ප්‍රේෂණය කළ හැකි ය.

3.5.2 විදේශ විනිමය පනතේ විධිවිධාන යටතේ ලබා දුන් අවසරය ප්‍රකාරව විවෘත කරන ලද, ශ්‍රී ලංකාවෙන් පිටත නියාමනය කෙරෙන මූල්‍ය ආයතනයක් තුළ පවතින ශිෂ්‍යයාගේ ගිණුමට සිදු කෙරෙන ප්‍රේෂණ බලයලත් වෙළෙඳුන් විසින් නියාමනය කළ යුතුය.

3.5.3 බලයලත් වෙළෙඳුන් විසින් මුදල් අගය සහ අරමුණ ඇතුළුව, ප්‍රේෂණවල විස්තර නිශ්චිතව දක්වමින්, එක් එක් ශිෂ්‍යයාගේ ගුවන් බලපත්‍රය මත සුදුසු පිටසන් කිරීමක් සිදු කළ යුතුය.

3.6 අධ්‍යාපනික අරමුණු සඳහා ශ්‍රී ලංකාවෙන් පිටතට ගොස් සිටින ශ්‍රී ලාංකිකයන්ට අදාළව අරමුදල් ප්‍රේෂණය කිරීම්

3.6.1. 2021 අංක 04 දරන විදේශ විනිමය (විවිධ ප්‍රාග්ධන ගනුදෙනු පන්ති) රෙගුලාසි ප්‍රකාරව, ගනුදෙනුවේ සද්භාවය සත්‍යාපනය කිරීම සහ අවශ්‍ය ලේඛනමය සාක්ෂි ලබා ගැනීම මත අමතර අධ්‍යාපනය/ ජීවන වියදම් සහ අධ්‍යාපනයට අදාළ වෙනත්

වියදම් සපුරා ගැනීමට ශ්‍රී ලංකාවෙන් පිටතට ගොස් සිටින ශ්‍රී ලාංකිකයන් විසින් එවැනි ණය මුදල් ලබා ගෙන ඇති විට, බලයලත් වෙළෙඳුන් විසින් ශ්‍රී ලංකාවේ දෙමව්පියන් සහ භාරකරුවන් විසින් ආපසු ගෙවනු ලබන ණය සඳහා විදේශයන්හි (එනම්, බැංකු, මූල්‍යායතන, විශ්වවිද්‍යාල සහ අධ්‍යාපනික ආයතන) අදාළ ණය දෙන ආයතන වෙත අරමුදල් ප්‍රේෂණය කළ යුතුය.

3.7 **වියදම් නොකළ රුපියල් ආපසු හැරවීම** - බලයලත් වෙළෙඳුන්/ පරිසීමිත වෙළෙඳුන් විසින් නිකුත් කරනු ලබන අදාළ මුදල් කළ හැකි ලදුපත් ඉදිරිපත් කිරීම මත ශ්‍රී ලංකාවෙන් පිටත වාසය කරන පුද්ගලයන්ගේ ඕනෑම වියදම් නොකළ ඕනෑම ශ්‍රී ලංකා රුපියලින් යුත් මුදල් අගයක් බලයලත් වෙළෙඳුන් හට විදේශ ව්‍යවහාර මුදලට ආපසු හැරවිය හැකි ය.

විදේශ විනිමය දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2021 අංක 03 දරන විධානය

විද්‍යුත් මුදල් මාරු කිරීමේ කාඩ්පත් සම්බන්ධයෙන් බලයලත් වෙළඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 5,6 සහ 7 වගන්ති සමඟ කියවිය යුතු එම පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකාවෙන් පිටත වාසය කරන පුද්ගලයින් හට විදේශ විනිමය භාවිත කරමින් ගෙවීම් කිරීම සඳහා ශ්‍රී ලංකාව තුළ සිටින පුද්ගලයින් හට හෝ ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයන් හට විද්‍යුත් මුදල් මාරු කිරීමේ කාඩ්පත් නිකුත් කිරීම සඳහා පහත නියමයන්ට යටත්ව බලයලත් වෙළඳුන් හට අවසර දෙනු ලැබේ.

2. ශ්‍රී ලංකාව තුළ සිටින හෝ නේවාසික පුද්ගලයන් හට (මින් මතුවට "කාඩ්පත් හිමියා" ලෙස හැඳින්වෙන) නිකුත් කරන ලද විද්‍යුත් මුදල් මාරු කිරීමේ කාඩ්පත් මෙකී විධානයන්ගේ පරිච්ඡේද 10.1හි සඳහන් කර ඇති අරමුණු සඳහා ගෙවීම් කිරීමට භාවිත කිරීම හැරුණු විට පුද්ගලික වර්ගයේ ජංගම ගනුදෙනු වෙනුවෙන් ශ්‍රී ලංකාවෙන් පිටත වාසය කරන පුද්ගලයින් හට විදේශ විනිමය භාවිත කරමින් ගෙවීම් කිරීම සඳහා භාවිත වන බවට බලයලත් වෙළඳුන් විසින් තහවුරු කරගත යුතු වේ.

3. තවද, එවැනි කාඩ්පත් හිමියන්ගේ අදාළ ගිණුම්වල පවතින අරමුදල් මත පහත සඳහන් පුද්ගලයින් සඳහා හරපත් නිකුත් කිරීමට බලයලත් වෙළඳුන් සඳහා අවසර ඇත.

(අ) ව්‍යාපාර, අධ්‍යාපනික හෝ වෛද්‍ය හේතු සඳහා තාවකාලිකව ශ්‍රී ලංකාවෙන් පිටතට ගොස් සිටින ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයෙක්

(ආ) ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හිමියෙක්

(ඇ) පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හිමියෙක්

(ඈ) විදේශ සේවයේ නියුතු තැනැත්තන් සඳහා වන විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හිමියෙක් හෝ විදේශ සේවයේ නියුතු තැනැත්තන් සඳහා වන රුපියල් ගිණුම් හිමියෙක්

(ඉ) ආමුබ ආයෝජන ගිණුම් හිමියෙක්

(ඊ) ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් හිමියෙක්

(උ) විගාමිකයින්ගේ ප්‍රේෂිත ආදායම් ගිණුම් හිමියෙක්

(ඌ) අනේවාසික රුපියල් ගිණුම් හිමියෙක්

(එ) නේවාසික ආගන්තුකයින් සඳහා වන රුපියල් ජංගම ගිණුම් හිමියෙක්

(ඒ) ජ්‍යෙෂ්ඨ පුරවැසි විදේශ ජාතිකයින් සඳහා වන රුපියල් ගිණුම් හිමියෙක්

4. ණය අවදානම අවම කිරීම සඳහා අත්‍යවශ්‍ය අභ්‍යන්තර පාලනයන් සහ යාන්ත්‍රණ ක්‍රියාත්මක කිරීම මත පහත සඳහන් පුද්ගලයින් සඳහා ණය කාඩ්පත් නිකුත් කිරීමට බලයලත් වෙළඳුන් සඳහා අවසර ඇත.

(අ) රාජ්‍යතාන්ත්‍රික ගමන්බලපත්‍ර සහ/ හෝ ශ්‍රී ලංකා විදේශ කටයුතු අමාත්‍යංශය මගින් නිකුත් කරන ලද රාජ්‍යතාන්ත්‍රික හැඳුනුම්පත් හිමි විදේශ රටක පුරවැසියන්හට.

(ආ) ණය කාඩ්පත මගින් කරනු ලැබූ වියදම්, විදේශයෙන් ලද ආමුබ ප්‍රේෂණ මගින්, විදේශ ව්‍යවහාර මුදල් ගිණුමේ මුදල් හෝ විගාමිකයන්ගේ ප්‍රේෂිත ආදායම් ගිණුමක් තිබේ නම් එම මුදල් වලින් පියවිය හැකි පරිදි, කාඩ්පත් හිමියාගේ ශ්‍රී ලංකාවේ විදේශ ව්‍යවහාර මුදල් ගිණුමේ ඇති මුදල් වලින් 90% ක සීමාවක් දක්වා පමණක් ඇප/සුරැකුම් ලෙස තබාගෙන, ශ්‍රී ලංකාවෙන් පිටත වාසික පුද්ගලයන් හට

(ඇ) ණය කාඩ්පත් මගින් දරන ලද වියදම් විදේශයෙන් ලද ආමුබ ප්‍රේෂණ මගින්, විදේශ ව්‍යවහාර මුදල් ගිණුමේ හෝ විගාමිකයන්ගේ ප්‍රේෂිත ආදායම් ගිණුම් (තිබේනම්) මුදල් මගින් හෝ කාඩ්පත් හිමියාගේ ශ්‍රී ලංකා රුපියල් ඉපැයීම් වලින් පියවීමට යටත්ව, ශ්‍රී ලංකාවේ නේවාසික, ශ්‍රී ලංකාවේ හා වෙනත් ඕනෑම රටක ද්විත්ව පුරවැසිභාවය ලබා ගෙන ඇති ශ්‍රී ලාංකිකයන් හට

5. මෙම විධානයන්ගේ පරිච්ඡේද 3 සහ 4 හි සඳහන් කර ඇති කාඩ්පත් හිමියන් සඳහා නිකුත් කරන ලද විද්‍යුත් මුදල් මාරු කිරීමේ කාඩ්පත් පහත සඳහන් නියාමනයන්ට යටත්ව භාවිතා කරන වග බලයලත් වෙළඳුන් විසින් තහවුරු කරගත යුතු වේ.

(අ) ශ්‍රී ලංකාව තුළ ආයෝජනවලට ගෙවීම් කිරීමට හැර ශ්‍රී ලංකා රුපියල් වලින් ශ්‍රී ලංකාව තුළ ඕනෑම ගෙවීමක්;

(ආ) පහත සඳහන් අයෙක්හට විද්‍යුත් මුදල් මාරු කිරීමේ කාඩ්පතක් නිකුත් කර ඇත්නම්, ඒ තැනැත්තාහට ශ්‍රී ලංකාවෙන් පිටත වාසික තැනැත්තෙකු වෙත ඕනෑම අරමුණක් වෙනුවෙන් කරනු ලබන ඕනෑම ගෙවීමක් සඳහා අවසර ඇත.

i. ශ්‍රී ලංකාවෙන් පිටත වාසික පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හිමියෙක්

ii. විදේශ සේවයේ නියුතු තැනැත්තන් සඳහා වන විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හිමියෙක්

iii. ආමුඛ ආයෝජන ගිණුම් හිමියෙක්

iv. විගාමිකයින්ගේ ප්‍රේෂිත ආදායම් ගිණුම් හිමියෙක්

(ඇ) පුද්ගලික ස්වභාවයේ ජංගම ගනුදෙනුවක් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත වාසික තැනැත්තෙකු හට කරනු ලබන ඕනෑම ගෙවීමක් සඳහා අවසර හිමිවන අතර, (මෙම විධානයන්ගේ 10.1 පරිච්ඡේදයේ සඳහන් කර ඇති අරමුණු සඳහා ගෙවීම් කිරීමට භාවිත කිරීම හැර), විද්‍යුත් මුදල් මාරු කිරීමේ කාඩ්පත් නිකුත් කරනු ලබන අය නම්;

i. ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක හිමියෙක්

ii. ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක හිමියෙක්

iii. ව්‍යාපාරික, අධ්‍යාපනික හෝ වෛද්‍ය හේතු සඳහා තාවකාලිකව ශ්‍රී ලංකාවෙන් පිටත සිටින ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තෙකු

iv. ශ්‍රී ලංකාවෙන් පිටත ස්ථාපිත/ සංස්ථාගත ආයතනයක් හෝ සමාගමක් වන අනේවාසික රුපියල් ගිණුම් හිමියෙක්

v. විදේශ සේවයේ නියුතු තැනැත්තන් සඳහා වන රුපියල් ගිණුම් හිමියෙක්

vi. නේවාසික ආගන්තුකයින් සඳහා වන රුපියල් ජංගම ගිණුම් හිමියෙක්

vii. ජ්‍යෙෂ්ඨ පුරවැසි විදේශ ජාතිකයින් සඳහා වන රුපියල් ගිණුම් හිමියෙක් සඳහා වේ.

(ඈ) විද්‍යුත් මුදල් මාරු කිරීමේ කාඩ්පත් හිමිකරුගේ ප්‍රාග්ධන ගනුදෙනු සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත වාසික තැනැත්තෙකු සඳහා කරනු ලබන ඕනෑම ගෙවීමක් සඳහා අවසර හිමිවන අතර, එවැනි කාඩ්පතක් නිකුත් කරනු ලබන අය නම්;

i. ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හිමියෙක්

ii. ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හිමියෙක්

6. පහත 10.1 පරිච්ඡේදයෙහි සඳහන් කර ඇති අරමුණු සඳහා ගෙවීම් කිරීම සඳහා හැරුණු විට, ආයතනයන්හී ජංගම ගනුදෙනු සම්බන්ධයෙන් විදේශ විනිමය භාවිත කරමින් සිදු කරනු ලබන ඕනෑම ගෙවීමක් සඳහා අනුමත අභ්‍යන්තර ක්‍රියාපටිපාටියක් අනුව, ශ්‍රී ලංකාවේ නේවාසික අනුමත සේවකයින් හෝ එවැනි ආයතනයන්හී අධ්‍යක්ෂවරුන්ගේ නමින් ශ්‍රී ලංකාවේ සංස්ථාපිත හෝ ලියාපදිංචි සමාගම්/ ආයතන වෙත බලයලත් වෙළඳුන් විද්‍යුත් මුදල් මාරු කිරීමේ කාඩ්පත් නිකුත් කළ හැක.

7. ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්, පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්, විදේශ සේවයේ නියුතු තැනැත්තන් සඳහා වන විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්, විදේශ සේවයේ නියුතු තැනැත්තන් සඳහා වන රුපියල් ගිණුම්, ආමුඛ ආයෝජන ගිණුම්, විගාමිකයින්ගේ ප්‍රේෂිත ආදායම් ගිණුම්හී ඇති අරමුදල් මත විදේශ විනිමය මගින් පියවීම් කිරීම සඳහා විද්‍යුත් මුදල් මාරු කිරීමේ කාඩ්පත් නිකුත් කිරීම හෝ ආමුඛ ප්‍රේෂණ තුළින් නොපියවූ මුදල් ප්‍රමාණයන් පියවනු ඇතැයි යන පදනම මත හැරුණු විට, කාඩ්පත් හිමියා ශ්‍රී ලංකාවෙන් සංක්‍රමණය වීම හෝ ස්ථිර පදිංචිය හෝ විදේශ රැකියාවක් සඳහා මෙරටින් පිටවීම යන අවස්ථාවන්හී දී, එවැනි තැනැත්තන් සඳහා ශ්‍රී ලංකාවේ දී නිකුත් කරන ලද කාඩ්පත්, කාඩ්පත් නිකුත් කරන ලද බැංකුව වෙත නැවත ලබාදෙන කොන්දේසියට යටත්ව බලයලත් වෙළෙඳුන්හට විද්‍යුත් මුදල් මාරු කිරරීමේ කාඩ්පත් ශ්‍රී ලංකාව තුළ සිටින හෝ ශ්‍රී ලංකාවේ නේවාසිකයින් සඳහා නිකුත් කළ හැක.

8. හර කාඩ්පතක් භාවිත කරමින් විදේශ ව්‍යවහාර මුදල් ආපසු ගැනීම් හෝ ණය කාඩ්පතක් තුළින් මුදල් අත්තිකාරම් ලබා ගැනීම සම්බන්ධයෙන් ව්‍යවස්ථාපිත වාර්තා තබා ගැනීමේ අවශ්‍යතා අනුව එවැනි ව්‍යවහාර මුදල් මෙම විධානයන් යටතේ අවසර ලබා දී ඇති ගනුදෙනු සඳහා භාවිත කර ඇති බවට සාක්ෂි පවත්වාගෙන යෑමට බලයලත් වෙළඳුන් විසින් කාඩ්පත්හිමියන් දැනුවත් කළ යුතු වේ.

9. මෙම විධානයන්ගේ විෂය පථයෙන් බාහිර ඕනෑම අරමුණක් සඳහා විද්‍යුත් මුදල් මාරු කිරීමේ කාඩ්පතක් තුළින් ශ්‍රී ලංකාවෙන් පිටත වාසික තැනැත්තෙකු වෙත කරනු ලබන ඕනෑම ගෙවීමක් සඳහා විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාගේ පූර්ව ලිඛිත අවසරය ලබා ගැනීම සඳහා බලයලත් වෙළඳුන් විසින් කාඩ්පත්හිමියන් යොමු කළ යුතු වේ.

10. අනෙකුත් කොන්දේසි

10.1 කාඩ්පත් හිමියන්ට නිකුත් කරන ලද විද්‍යුත් මුදල් මාරු කිරීමේ කාඩ්පත් පහත සඳහන් කරුණු සඳහා භාවිත කිරීම් සිදු නොවන බවට බලයලත් වෙළඳුන් විසින් සහතික විය යුතු ය.

අ. විදේශ විනිමය වෙළඳාම්

ආ. අතථ්‍ය ව්‍යවහාර මුදල් ගනුදෙනු සම්බන්ධ ගෙවීම්

ඇ. ශ්‍රී ලංකාවෙන් පිටත සූදු ක්‍රීඩා කිරීම, පරිගණක ක්‍රීඩා කිරීම සහ ඔට්ටු දැමීම ආදී වූ කටයුතු සම්බන්ධ ගෙවීම්

ඈ. 1969 අංක 01 දරන ආනයන සහ අපනයන (පාලන) පනත සහ එහි ඕනෑම සංශෝධනයක් යටතේ නිකුත් කරන ලද නියාමන සහ මෙහෙයුම් උපදෙස් යටතේ වාණිජ පරමාර්ථ සඳහා ශ්‍රී ලංකාව වෙත භාණ්ඩ ආනයන කිරීමට ගෙවීම් කිරීම සඳහා

10.2 මෙම විධානයන්ගේ, විද්‍යුත් මුදල් මාරු කිරීමේ කාඩ්පත් සම්බන්ධයෙන් දැනට පවතින නියෝග කාඩ්පත්හිමියා වෙත ලිඛිතව (විද්‍යුත් හෝ ලේඛනගත ලෙස) සන්නිවේදනය කිරීමට කැමති භාෂාවකින් දැනුවත් කිරීම සහ සන්නිවේදනය කිරීම සහ එවැනි කාඩ්පත් හිමියන්ගේ විද්‍යුත් මුදල් මාරු කිරීමේ කාඩ්පත් නිකුත් කරන විට **ඇමුණුම I** අනුව ප්‍රතිඥාවක් ලබා ගත යුතු වේ.

10.3 මෙම විධානයන්ගේ නිශ්චය කර ඇති පරිදි අනුමත ගනුදෙනු පමණක් කාඩ්පත්හිමියන් විසින් විද්‍යුත් මුදල් හුවමාරු කිරීමේ කාඩ්පත් භාවිත කරමින් සිදු කරන බවට බලයලත් වෙළඳුන් විසින් සහතික විය යුතු ය.

10.4 මෙම විධානයන්ගෙන් අවසර දී නොමැති අරමුණු සඳහා කිසියම් කාඩ්පත්හිමියෙකු විසින් විදේශ විනිමය භාවිත කරමින් ගෙවීම් කිරීම/ මුදල් ආපසු ගැනීම සිදු කරන්නනේ යැයි සැක කිරීමට සාධාරණ හේතු තිබේ නම්, බලයලත් වෙළඳුන් විසින් යථායෝගී අයුරින් කටයුතු කරමින් විද්‍යුත් මුදල් මාරු කිරීමේ කාඩ්පත් තුළින් විදේශ විනිමය ගෙවීම්/ මුදල් ආපසු ගැනීම් අත්හිටුවීම සඳහා කඩිනමින් පියවර ගත යුතු වන අතර, විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට මෙම කරුණ යොමු කළ යුතු ය.

10.5 සෑම කාඩ්පත්හිමියෙකුගේ ම විදේශ විනිමය ගනුදෙනු සහ ශ්‍රී ලංකා රුපියල් ගනුදෙනු වෙන වෙනම බලයලත් වෙළඳුන් විසින් හඳුනා ගත යුතු වේ.

10.6 ප්‍රාථමික කාඩ්පත්හිමියන් ශ්‍රී ලංකාවෙන් පිටත වාසික තැනැත්තන් වන අවස්ථාවලදී හැර, ශ්‍රී ලංකාවෙන් පිටත වාසික තැනැත්තෙකු වෙත බලයලත් වෙළඳුන් විසින් අතිරේක කාඩ්පත් ලෙස විද්‍යුත් මුදල් මාරු කිරීමේ කාඩ්පත් නිකුත් කිරීම නොකළ යුතුය. අතිරේක කාඩ්පත් නිකුත් කිරීම සහ භාවිත කිරීම මෙම විධානයන්ගේ පෙන්වා දී ඇති නියමයන් සහ කොන්දේසි වලට යටත්ව සිදු කළ යුතු වේ.

10.7 ශ්‍රී ලංකාවෙන් පිටත විදේශ රැකියාවක් හෝ අධ්‍යාපන කටයුතු සඳහා යොමුවී ඇති කාඩ්පත්හිමියන්ගේ නේවාසික තත්ත්වයේ වෙනස්කම් සිදු වීම සම්බන්ධයෙන් තහවුරු කිරීමට සහ මෙම විධානයන් හා අනුරූපීව සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට බලයලත් වෙළඳුන් විසින් සෑම විටම කටයුතු කළ යුතු වේ.

10.8 අවලංගු කරන ලද විනිමය පාලන පනතේ ප්‍රතිපාදන යටතේ මේ වන විට නිකුත් කර ඇති විද්‍යුත් මුදල් මාරු කිරීමේ කාඩ්පත් මෙම විධානයන් යටතේ දක්වා ඇති නියමයන් සහ කොන්දේසීන්ට යටත් විය යුතු වේ.

11. **මාසික වාර්තාකරණය** - විදේශ විනිමය මුදල් ආපසු ගැනීම් සහ කාඩ්පත් හිමියන් විසින් විදේශ විනිමයෙන් කරනු ලැබූ ගෙවීම් වල වටිනාකම් නොතකමින් බලයලත් වෙළඳුන් විසින් සියළුම ගනුදෙනු පිළිබඳ තොරතුරු විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා වෙත ඉලෙක්ට්‍රොනික මාධ්‍ය තුළින් පමණක් විදේශ විනිමය ගනුදෙනු අධීක්ෂණ පද්ධතිය (FOREX Net) හරහා මාසිකව යොමු කළ යුතු වේ.

12. ශ්‍රී ලංකා මහ බැංකුවේ සත්‍යාපනය සඳහා මෙහි සඳහන් ඇමුණුම I සහ ඇමුණුම II ඇතුළුව විද්‍යුත් මුදල් මාරු කිරීමේ කාඩ්පත් නිකුත් කිරීම සහ අලුත් කිරීම සම්බන්ධ තොරතුරු සහ ලිපි ලේඛන වසර හයක කාල සීමාවක් දක්වා හෝ සංස්ථාපිත වාර්තා තබා ගැනීමේ කාල සීමාවක් දක්වා යන දෙකෙන් වැඩි කාලයක් පවතින ක්‍රමයෙන් පවත්වා ගත යුතු වේ.

13. මෙම විධානයන්හී අරමුණු සඳහා;

i. ''විද්‍යුත් මුදල් මාරු කිරීමේ කාඩ්පත් (EFTC) යන්නෙන් බැර, හර හෝ වෙනත් යම් ආකාරයක වටිනාකමක් මාරු කිරීම සඳහා භාවිතා කරන්නාට හැකියාව ලබා දෙන කාඩ්පතක් හෝ උපකරණයක් අදහස් වන අතර, විදේශ විනිමය පනතේ විධිවිධානයනට අනුකූල වීමේ අරමුණින් බලයලත් වෙළඳුන් හට ගනුදෙනු වල විස්තර හඳුනාගත හැකි පරිදි ලබා දී ඇති ණය කාඩ්පත්, හර කාඩ්පත් සහ වටිනාකම තැන්පත් කළ කාඩ්පත් ඊට අදාල වේ.

ii. හර කාඩ්පතක් යන්නෙන් කාඩ්පත් හිමියාගේ ගිණුමේ බැර ශේෂය සෘජුවම හර කිරීමෙන් මුදල් ලබා ගැනීම සහ/හෝ භාණ්ඩ හා සේවා මිලදී ගැනීම සඳහා ගෙවීම් කිරීමට භාවිත කළ හැකි ගෙවීම් කාඩ්පතක් අදහස් වේ.

iii. ''ණය කාඩ්පත්'' යනුවෙන්, කාඩ්පත දරන්නා වෙත එය නිකුත් කරන්නා විසින් ප්‍රදානය කරන ලද ණය පහසුකමක් සහිත කාඩ්පත දරන්නා විසින් භාවිතා කරන ලද ණය මුදල සම්පූර්ණයෙන් හෝ කොටසක් නියමිත දින හෝ ඊට පෙර ගෙවා නිම කළ හැකි කාඩ්පතක් අදහස් වේ. නිශ්චිත දිනට නොපියවන ලද ඕනෑම ණය ප්‍රමාණයක් සඳහා පොලියක් හෝ වෙනත් ගාස්තුවක් අය කිරීමට නිකුත් කරන්නාට හැකියාව ඇත.

iv. පුද්ගලික ස්වභාවය යනු කාඩ්පත්හිමියාගේ, කලත්‍රයාගේ, දරුවන්ගේ සහ දෙමව්පියන්ගේ භාවිතය සඳහා පමණක් යොදා ගත හැකි යන්න වේ.

v. ජංගම ගනුදෙනු යන්න 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ නිරූපිත අර්ථ හා සමාන වේ.

vi. ප්‍රාග්ධන ගනුදෙනු යන්න 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ නිරූපිත අර්ථ හා සමාන වේ.

vii. අතථ්‍ය මුදල් යනු ඩිජිටල් ලෙස වෙළඳාම් කළ හැකි සහ හුවමාරු මාධ්‍යයක් ලෙස ක්‍රියාත්මක වන; සහ/ හෝ ගිණුම් ඒකකයක්; සහ/ හෝ අගය ගබඩා කිරීමක් ලෙස කටයුතු කරන, නමුත් කිසිඳු අධිකරණයක දී වලංගු මුදල් ඒකකය තත්ත්වයක් නොමැති සහ කිසිඳු අධිකරණයකින් නිකුත් කරන හෝ සහතික කරනු නොලබන වටිනාකමෙහි විද්‍යුත් නිරූපණයක් වේ.

viii. ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන් යන්න 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 31 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද නියමය ප්‍රකාරව තීරණය කළ යුතු වේ

14. ශ්‍රී ලංකාවේ සිටින සහ නේවාසික තැනැත්තන් සඳහා විද්‍යුත් මුදල් මාරු කිරීමේ කාඩ්පත් නිකුත් කිරීම සම්බන්ධයෙන් වන අවශ්‍යතා පිළිබඳව බලයලත් වෙළඳුන් වෙත නිකුත් කරන ලද 2017 නොවැම්බර් 20 වන දිනැති 2017 අංක 02 දරන විධානයන් මෙයින් අවලංගු කෙරේ.

15. ඉහත 14 වන වගන්තියෙහි සඳහන් පෙර විධානයන් අවලංගු කිරීම, අවලංගු කිරීමට පෙර ඒ යටතේ එකතු වී ඇති හිමිකම් හෝ දඩ හෝ වගකීම් මත බලපෑමක් නොමැත.

16. බලයලත් වෙළඳුන් හෝ මෙම විධානයන් යටතේ විදේශ විනිමය වෙළඳාම් කරනු ලබන තැනැත්තන් හට වෙනත් නීතියක විධිවිධාන හා අනුගත වීමේ අවශ්‍යතාවෙන් නිදහස් වීමට, විශෝධනයට හෝ වැළැක්වීමට අර්ථකථනය කිරීමට අවසර නොමැත.

17. 2021 මාර්තු 22 වන දින සිට මෙම විධානයන් ක්‍රියාත්මක විය යුතු වේ.

අධ්‍යක්ෂ -විදේශ විනිමය දෙපාර්තමේන්තුව
2021 මාර්තු 18

2021 අංක 3 දරන නියෝගයේ ඇමුණුම I

(විද්‍යුත් මුදල් හුමවමාරු කාඩ්පත් අයදුම්පතේ හෝ කාඩ්පත් හිමියන් බැංකුව සමඟ ගිවිසුම්ගතව ඇති විද්‍යුත් මුදල් හුවමාරු කාඩ්පත් ගිවිසුමේ ඇතුලත් කිරීම සඳහා)

ශ්‍රී ලංකා මහ බැංකුව

අයදුම්පත්‍රලාභියා විසින් විද්‍යුත් මුදල් හැවමාරු කාඩ්පත් සඳහා කරනු ලබන ප්‍රකාශය

වෙත : අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව

(ණය/හර කාඩ්පත් මගින් හෝ වෙනත් ඕනෑම විද්‍යුත් මුදල් හුවමාරු කාඩ්පත් මඟින් විදේශ විනිමය ලබාගැනීමට අයදුම්කරු/කරුවන් විසින් පිරවීම සඳහා)

.....(ප්‍රාථමික/අතිරේක කාඩ්පත්හිමි), ...(ප්‍රාථමික/අතිරේක කාඩ්පත් හිමි) වන මම/අපි විසින් මෙම පෝරමයේ ලබා දී ඇති සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවට ප්‍රකාශ කරමි/කරමු.

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව 2021 මාර්තු 18 දින නිකුත් කරන ලද 2021 අංක 03 දරන නියෝගයන් (ඇමුණුම් කර ඇත) හි විස්තර කර ඇති පරිදි විද්‍යුත් මුදල් කාඩ්පත්, විදේශ විනිමය ගනුදෙනු සඳහා භාවිතා කිරීමය යටත්ව අදාල නියම හා කොන්දේසි පිළිබඳව මම/අපි දැනුවත් බවට මම/අපි විසින් මෙහිදී සහතික කරමි/කරමු. තවද එකී කොන්දේසි වලට බැඳී සිටීමට මම/අපි පොරොන්දු වෙමි/වෙමු.

විදේශ විනිමය පනතේ කාර්යය සඳහා ..... බැංකුවේ අවශ්‍යතාව මත මම/අපි විසින් කාඩ්පත් මඟින් සිදුකළ විදේශ විනිමය ගනුදෙනු පිළිබඳ ඕනෑම තොරතුරක් ලබාදීමට මම/අපි තවදුරටත් එකඟ වෙමි/වෙමු.

විදේශ විනිමය පනතේ ප්‍රතිපාදන යටතේ නිකුත් කල ඇමුණුම් කළ විධානයන් ප්‍රකාරව අවසර දී නොමැති විදේශ විනිමය ගනුදෙනු මට/අපට නිකුත් කරන ලද විද්‍යුත් මුදල් හුවමාරු කාඩ්පත් මගින් සිදුව ඇති බවට සැක කිරීමට සාධාරණ හේතු පවතී නම්, විද්‍යුත් මුදල් හුවමාරු කාඩ්පතේ විදේශ විනිමය ලබාගැනීමේ හැකියාව අත්හිටුවීමට සහ අදාල කාරණය විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත වාර්තා කිරීමට බැංකුවට පවතින අවශ්‍යතාව පිළිබඳව මම/අපි දැනුවත් වී සිටිමි/සිටිමු.

මම/අපි, රැකියාව සඳහා හෝ වෙනත් රටක ස්ථිර නේවාසිකත්වය සඳහා ශ්‍රී ලංකාවෙන් සංක්‍රමණය හෝ ශ්‍රී ලංකාව හැර යන්නේ නම් විද්‍යුත් මුළු හුවමාරු කාඩ්පත් බැංකුවට බාරදීමට පොරොන්දු වෙන බවට මම/අපි තවදුරටත් සහතික කර සිටිමි/සිටිමු. තවදුරටත්, මගේ/අපගේ නේවාසික තත්ත්වයේ වෙනස්වීමක් වන්නේ නම් ඒ අනුව, බැංකුවට දැනුම් දීමට මම/අපි එකඟ වෙමි/වෙමු.

.....
ප්‍රාථමික කාඩ්පත් හිමිකරුගේ අත්සන

....

දිනය, මාසය, අවුරුද්ද අතිරේක කාඩ්පත් හිමිකරුගේ අත්සන

2021 අංක 3 දරන නියෝගයේ ඇමුණුම II

(යෝග්‍ය පුද්ගලයන්හට විද්‍යුත් මුදල් හුවමාරු කාඩ්පත් නිකුත් කිරීමේ දී/බලය පැවරීමේ දී ..... (බැංකුව) වෙනුවෙන් බලයලත් නිලධාරියා විසින් සම්පූර්ණ කිරීමට)

ශ්‍රී ලංකා මහ බැංකුව

බලයලත් වෙළෙන්දා විසින් විද්‍යුත් මුදල් හුවමාරු කාඩ්පත් සඳහා කරනු ලබන ප්‍රකාශය

වෙත :- අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව,

මම , බැංකුවේ බලයලත් නිලධාරියා ලෙස අයදුම්කරු/කරුවන් විසින් දෙනු ලැබූ තොරතුරු අදාල ලිපිලේඛන සමඟ සැලකිල්ලෙන් පරීක්ෂා කල අතර මෙකී තොරතුරු හා ලිපිලේඛන වල සද්භාවය පිළිබඳ සෑහීමට පත් වෙමි.

තවදුරටත් මම බැංකුවේ බලයලත් නිලධාරියා ලෙස **2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ විධිවිධාන යටතේ නිකුත් කරන ලද 2021.03.18 දිනැති 2021 අංක 03 දරන නියෝගය** ප්‍රකාරව අවසර දී නොමැති විදේශ විනිමය ගනුදෙනු සිදුකිරීම පිළිබඳ සැකකිරීමට සාදාරණ හේතු පවතී නම්, කාඩ්පත් හිමියන් ඔහුගේ/ඇයගේ විද්‍යුත් මුදල් හුවමාරු කාඩ්පත්වල විදේශ විනිමය මගින් නීති උල්ලංඝනය කරමින් සිදුකරන ලද ගනුදෙනු පිළිබඳ සහ විද්‍යුත් මුදල් හුවමාරු කාඩ්පතේ විදේශ විනිමය ගනුදෙනු කිරීමේ හැකියාව අත්හිටුවීමට සහ මෙම කරුණු **විදේශ විනිමය අධ්‍යක්ෂතුමාගේ අවධානයට යොමු කරවීමට නිසි උද්යෝගයෙන් කටයුතු කිරීමට** සෑම විමට පොරොන්දු වී සිටිමි.

....

දිනය. මාසය. අවුරුද්ද බලයලත් නිලධාරියාගේ අත්සන

විදේශ විනිමය දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා මහ බැංකුව

2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2021 අංක 04 දරන විධානයන්

පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් පිළිබඳව බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්

විදේශ විනිමය පනතේ 5,6,7 සහ 8 වගන්ති සමඟ කියවිය යුතු, 2021 අංක 05 දරන විදේශ විනිමය(විදේශ විනිමය ගනුදෙනුවල නිරත වීමේ කාර්යය සඳහා ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම) නියෝග සහ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ වගන්ති 9 ප්‍රකාරව, පහත කරුණුවලට යටත්ව පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් පවත්වා ගෙන යාමට බලයලත් වෙළෙඳුන්ට අවසරය හිමි වේ.

1.1 සුදුසුකම්ලත් තැනැත්තන්

(අ) බාලවයස්කරුවකු ද ඇතුළුව ශ්‍රී ලාංකික ජාතිකයෙකු වන පුද්ගලයෙකු;

(ආ) බාලවයස්කරුවකු ද ඇතුළුව ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසිකයෙකු වන ශ්‍රී ලාංකික සම්භවයක් සහිත පුද්ගලයෙකු;

(ඇ) බාලවයස්කරුවකු ද ඇතුළුව ශ්‍රී ලංකාවේ නේවාසික විජාතිකයෙකු

(ඈ) ශ්‍රී ලංකාව වෙත තාවකාලිකව පැමිණ සිටින හෝ ශ්‍රී ලංකාව වෙත පැමිණීමේ චේතනාවෙන් සිටින විජාතිකයෙකු; සහ

(ඉ) මියගිය තැනැත්තෙකුගේ බූදලය අද්මිනිසත්‍රාසි කිරීම සම්පූර්ණ කරන තෙක්, බලයලත් වෙළෙන්දකු සමඟ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් පවත්වාගෙන යනු ලැබූ, මියගිය තැනැත්තෙකුගේ බූදලයේ අද්මියස්ත්‍රාසිකරු හෝ පොල්මඃකරු;

1.2 **ගිණුම් විවෘත කිරීම සහ පවත්වා ගෙන යාම**

(අ) පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්, දේශීය බැංකු ඒකකය තුළ නම් කරන ලද ඕනෑම විදේශ ව්‍යවහාර මුදලකින් ඉතුරුම්, ජංගම (අයිරා පහසුකම රහිතව) නැතහොත් කාලීන තැන්පතු ගිණුම් ලෙස විවෘත කිරීම සහ පවත්වා ගෙන යාම කළ හැක.

(ආ) පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් තවත් සුදුසුකම් ලබන පුද්ගලයෙකු සමඟ බද්ධ ගිණුම් ලෙස පවත්වා ගෙන යා හැක. කෙසේවෙතත්, ශ්‍රී ලංකාවට තාවකාලිකව පැමිණ සිටන හෝ ශ්‍රී ලංකාව වෙත පැමිණීමේ චේතනාවෙන් සිටින විජාතිකයෙකු මෙම ගිණුම් බද්ධ ගිණුම් ලෙස විවෘත කිරීමට සහ පවත්වා ගෙන යෑමට සුදුසුකම් නොලබති.

(ඇ) ශ්‍රී ලාංකික ජාතිකයෙකු හෝ ශ්‍රී ලාංකික සම්භවයක් ඇති ශ්‍රී ලංකාවේ නේවාසිකයෙකු වන බාලවයස්කරුවෙකුගේ නමින් පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් විවෘත කරන අවස්ථාවක දී, එවැනි ගිණුම් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසිකයන් වන ඔවුන්ගේ දෙමව්පියන්, මුත්තා/මිත්තණිය හෝ භාරකරුවන්ගෙන් විදේශ විනිමයෙන් ලත් ප්‍රේෂණ බැර කිරීමෙන් හෝ දෙමව්පියන්, මුත්තා/මිත්තණිය හෝ භාරකරුවන්ගේ දැනට පවත්වාගෙන යන පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් වලින් අරමුදල් මාරු කරමින් විවෘත කළ යුතුය.

(ඈ) නව පුද්ගලික විදේශ ව්‍යවහාර ගිණුමක් බලයලත් වෙළෙන්දා විසින් සලකා බලනු ලබන ගනුදෙනුවේ සද්භාවය සහ මූල්‍ය තත්ත්ව විශ්ලේෂණය පිහිටු වීමට යටත්ව, විදේශයක සංචාරය කිරීමේ අරමුණැතිව බලයලත් වෙළෙන්දෙකු නැතහොත් පරිසීමිත වෙළෙන්දෙකුගෙන් මිල දී ගන්නා ලද විදේශ ව්‍යවහාර මුදල් සතු, එය තමන් විසින් භාවිත නොකරන ලද සංචාරක දීමනාවක් වශයෙන් නැවත මෙරටට ගෙන ආ විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටුවලින් යුත් තැන්පතුවක් හිමි පුද්ගලයෙකු සඳහා ද ආරම්භ කළ හැකි ය.

1.3 අවසරලත් හර කිරීම්

(අ) බැංකු පද්ධතිය හරහා ගිණුම්හිමියෙකු වෙනුවෙන් ශ්‍රී ලංකාවට පිටතින් විදේශ විනිමයෙන් ලැබෙන ප්‍රේෂණ;

(ආ) ගිණුම්හිමියාගේම සහ/හෝ පවුලේ ආසන්නතම සාමාජිකයන්ගේ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමෙන් කරනු ලබන මාරු කිරීම්;

(ඇ) ජංගම ගනුදෙනුවකට අදාළව, පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකින් හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික පුද්ගලයෙකුගේ අක්වෙරළ බැංකු ඒකකය තුළ පවත්වා ගෙන යනු ලබන ගිණුමකින් කරනු ලබන මාරු කිරීම්;

(ඈ) ශ්‍රී ලංකාව තුළ ආයෝජන හෝ වත්කම් විකිණීම / අත්පත් කර ගැනීමේ අරමුණු සඳහා හැරුණු කොට, දෙපාර්ශ්වයන් ම ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික පුද්ගලයන් වන විට දී ගිණුම්හිමියා කවුරුන් ද යන්න නොසලකමින්, අනෙකුත් පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හෝ අක්වෙරළ බැංකු ඒකකය තුළ පවත්වා ගෙන යනු ලබන ගිණුම්වලින් කරනු ලබන මාරු කිරීම්;

(ඉ) ගිණුම්හිමියා සහ/ හෝ ආසන්නතම පවුලේ සාමාජිකයෙකු විසින් සංචාරක අරමුණ සඳහා ලබා ගන්නා ලද භාවිත නොකළ විදේශ ව්‍යවහාර මුදල්;

(ඊ) රේගු දෙපාර්තුමේන්තුව වෙත යොමු කළ ප්‍රකාශයක් මත, එම අගය එ.ජ.ඩො. 15,000ක් නැතහොත් වෙනත් විදේශ ව්‍යවහාර මුදලින් ඊට සමාන අගය ඉක්මවන විට හෝ එවැනි විදේශ විනිමය අගයක් එ.ජ.ඩො. 15,000කට හෝ වෙනත් විදේශ ව්‍යවහාර මුදල්වලින් එහි සමාන අගයට වඩා අඩු හෝ ඊට සමාන වන අවස්ථාවක දී බලයලත් වෙළෙඳුන් වෙත සිදු කළ සුදුසු ප්‍රකාශනයක් මගින් ගිණුම්හිමියා විසින් ශ්‍රී ලංකාව තුළට ගෙන එන ලද විදේශ විනිමය;

(උ) ගිණුම්හිමියාගේ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමෙන් විදේශ සංචාර කාඩ්පතකට අරමුදල් සපයා ඇති අගය දක්වා, ගිණුම්හිමියාගේ නැතහොත් ඔහුගේ / ඇයගේ ආසන්නතම පවුලේ සාමාජිකයන්ගේ විදේශ සංචාර කාඩ්පත තුළ ඉතිරිව පවතින භාවිත නොකළ ශේෂය;

(ඌ) ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම, ආමුඛ ආයෝජන ගිණුම හෝ අක්වෙරළ බැංකු ඒකකයෙහි පවත්වා ගෙන යනු ලබන එම ගිණුම්හිමියාගේම ගිණුමකින් කරන මාරුකිරීම්;

(එ) භාණ්ඩ හා සේවා සැපයුමට අදාළව, ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික පුද්ගලයෙකුගේ රාජ්‍යතාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකින් කරන මාරු කිරීම්;

(ඒ) ගිණුම්හිමියාගේ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම හර කිරීම මගින් මුල් ආයෝජනය සිදු කර ඇත්නම්, විදේශ ව්‍යවහාර මුදලින් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර තුළ සිදු කළ ආයෝජනවලින් හට ගන්නා කුපන් ආදායම, විකුණුම්/ කල්පිරීමෙන් ලත් මුදල් සහ ආශ්‍රිත වෙනත් ලැබීම්;

(ඔ) ගිණුම්හිමියාගේ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම හර කිරීම, එම ගිණුම්හිමියාගේ පුද්ගලික විදේශ ව්‍යවහාර ගිණුමෙන් ප්‍රතිමුඛ ආයෝජන ගිණුමකට මාරු කරන ලද අරමුදල් භාවිත කරමින් ආයෝජනයක් සිදු කර ඇති විටක එකී දායකත්වයට සමානුපාතිකව ප්‍රතිමුඛ ආයෝජන වලින් ලත් යම් ආදායමක් හෝ ප්‍රාග්ධන ලැබීමක් ලෙස ප්‍රතිමුඛ ආයෝජන ගිණුමකින් කරන මාරුකිරීම්;

(ඕ) ගිණුම්හිමියාගේ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම හර කිරීම මගින් මුල් ආයෝජනය සිදු කර ඇති විට, තවත් පුද්ගලයෙකුගේ ප්‍රතිමුඛ ආයෝජන ගිණුමකින් එවැනි ගැනුම්කරුවෙකු වෙත විදේශයෙහි අවසරලත් ආයෝජන විකිණීමකින් ලත් මුදල් ලෙස ලැබෙන මාරුකිරීම්;

(ක) ගිණුම්හිමියා ශ්‍රී ලංකාවෙන් පිටත වාසික විගාමික නේවාසිකයෙකු නැතහොත් ශ්‍රී ලංකාව අත්හැර යන විගාමිකයෙකු (ප්‍රථමව හෝ පසුකාලීනව) වන අවස්ථාවක දී, සහ ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම හෝ විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුමක් ගිණුම්හිමියා සතු වන්නේ නම්, සුදුසුකම් ලත් සංක්‍රමනික දීමනාව සහ ශ්‍රී ලංකාවෙන් ව්‍යුත්පන්න වූ ජංගම ආදායම මාරු කිරීම්;

(ග) ගිණුම්හිමියා ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැර සිටින ශ්‍රී ලාංකිකයෙකු නොවන නේවාසිකයෙකු (බාලවයස්කරුවෙකු ඇතුළුව) වන අවස්ථාවක දී, ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් පිළිබඳ 2021 මාර්තු 18 දිනැති 2021 අංක 16 දරන විධානයන්හි 5 (ආ) පරිච්ඡේදයේ සඳහන් අවසරලත් අය වෙත අනුරූප වන අරමුදල් මාරු කිරීම්;

(ච) ගිණුම්හිමියා ශ්‍රී ලාංකිකයෙකු නොවන හෝ ද්විත්ව පුරවැසියෙකු වන අවස්ථාවක දී, ශ්‍රී ලංකාවේ රැකියාවේ යෙදී සිටින විට, සේවාදායකයාගේ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් වලින්, අක්වෙරළ බැංකු ඒකකයේ පවත්වා ගෙන යනු ලබන ගිණුම් වලින් හෝ රුපියල් ගිණුම් වලින් හෝ සේවක අර්ථසාධක අරමුදල, සේවක භාරකාර අරමුදල හෝ කම්කරු කොමසාරිස් ජනරාල්වරයා විසින් ප්‍රකාශයට පත් කරන ලද වෙනත් ඕනෑම අනුමත අර්ථසාධක අරමුදලකින් වැටුප්, සේවා නියුක්ති සහ විශ්‍රාමික ප්‍රතිලාභ හෝ සේවානියුක්තිකයාට ගෙවිය යුතු ඕනෑම ගෙවීමක් ලෙස කරන මාරුකිරීම්;

(ඡ) ඉහත ඡේද 1.1 හි (ඉ) අයිතමය යටතේ සුදුසුකම් ලබන පරිදි, ගිණුම්හිමියා මිය ගිය පුද්ගලයෙකුගේ දේපළෙහි නාමිකයෙකු හෝ පරිපාලකයෙකු හෝ පොල්මොඃකරු වන අවස්ථාවක දී, එම මිය ගිය පුද්ගලයාගේ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකින් කරන මාරුකිරීම්;

(ට) ප්‍රතිලාභියෙකු ලෙස නම් කරන ලද ශ්‍රී ලංකාව තුළ නේවාසික පුද්ගලයෙකුට අදාළව, මිය ගිය පුද්ගලයෙකුගේ දේපළවල පරිපාලකයා/ පොල්මඃකාරුගේ හෝ සමාගමක ප්‍රතිග්‍රාහකයා/ ඇවරකරුගේ ආමුඛ ආයෝජන ගිණුමකින් කරන මාරුකිරීම්;

(ඩ) ගිණුම්හිමියා විදේශ සේවාදායකයෙකුට ශ්‍රී ලංකාවෙන් පිටත සේවා සපයන ශ්‍රී ලාංකික පුරවැසියෙකු වන අවස්ථාවක දී; ගිණුම්හිමියා වෙත වැටුප් සහ/ හෝ ඉපැයුම් ගෙවීම සඳහා විදේශ සේවාදායකයා සමඟ එකඟතාවයට එළැඹ ඇති ශ්‍රී ලංකාව තුළ සංස්ථාගත සමාගමක ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකින් ලැබෙන පැවරුම්;

(ණ) ගිණුම්හිමියා දේශීය නැව්/ ගුවන්සේවා සමාගමක් හිමිකාරීත්වය දරන යාත්‍රාවක්/ ගුවන්යානයක් තුළ විදේශයෙහි සේවයේ නිරත ශ්‍රී ලාංකික පුරවැසියෙකු වන අවස්ථාවක දී; කාර්යමණ්ඩල වැටුප්/ වේතන සහ ආශ්‍රිත වෙනත් සේවානියුක්ති සහ විශ්‍රාම ප්‍රතිලාභවලට අදාළව, එවැනි දේශීය නැව්, ගුවන්සේවා සමාගමක (සේවාදායකයා) ව්‍යාපාරික විදේශ ව්‍යවහාර ගිණුමකින් නැතහොත් අක්වෙරළ බැංකු ඒකකය තුළ පවත්වා ගෙන යනු ලබන ගිණුමකින් කරන මාරුකිරීම්;

(ත) විශේෂ තැන්පතු ගිණුම් සඳහා අදාළ වන විදේශ විනිමය පනත යටතේ නිකුත් කරන ලද නියෝග සහ විධානයන් ප්‍රකාරව ගිණුම්හිමියා විසින් විවෘත කර, පවත්වා ගෙන යනු ලබන විශේෂ තැන්පතු ගිණුම් මත ලැබෙන පොලිය ඇතුළු කල්පිරීම්වලින් ලත් මුදල්; සහ

(ද) ගිණුමෙහි පවත්වා ගෙන යන අරමුදල් මත විදේශ ව්‍යවහාර මුදලින් උපයන ලද පොලිය.

1.4 අවසරලත් හර කිරීම්

(අ) ගිණුම්හිමියාගේ සහ/ හෝ ශ්‍රී ලංකාවෙහි නේවාසික පුද්ගලයන් වන ආසන්නතම පවුලේ සාමාජිකයන්ගේ ජංගම ගනුදෙනුවලට අදාළව ශ්‍රී ලංකාවෙන් පිටතට සිදු කරන ලද ඕනෑම ප්‍රතිමුඛ ප්‍රේෂණයක්;

(ආ) ශ්‍රී ලංකාවෙහි නේවාසික පුද්ගලයෙකු වන ගිණුම්හිමියෙකුගේ ප්‍රාග්ධන ගනුදෙනුවකට අදාළව, ශ්‍රී ලංකාවෙන් පිටතට සිදු කරනු ලබන ඕනෑම ප්‍රතිමුඛ ප්‍රේෂණයක්;

(ඇ) ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසිකයෙකු වන ගිණුම්හිමියෙකුගේ ඕනෑම අරමුණක් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටතට සිදු කරනු ලබන ඕනෑම ප්‍රේෂණයක්;

(ඈ) ශ්‍රී ලංකා රුපියල්වලින් ශ්‍රී ලංකාව තුළ සිදු කරනු ලබන වියදම්;

(ඉ) ගිණුම්හිමියාගේම සහ/ හෝ ආසන්නතම පවුලේ සාමාජිකයන්ගේ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමට සිදු කරන මාරුකිරීම්;

(ඊ) ගිණුම්හිමියාගේම ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට අක්වෙරළ බැංකු ඒකකය තුළ පවත්වා ගෙන යනු ලබන ගිණුමකට සිදු කරන මාරුකිරීම්;

(උ) ජංගම ගනුදෙනුවකට අදාළව ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික පුද්ගලයෙකුගේ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට හෝ අක්වෙරළ බැංකු ඒකකය තුළ පවත්වා ගෙන යනු ලබන ගිණුමකට සිදු කරන මාරුකිරීම්;

(ඌ) ශ්‍රී ලංකාව තුළ ආයෝජන හෝ වත්කම් අත්පත් කර ගැනීමේ අරමුණු සඳහා හැර, දෙපාර්ශ්වය ම ශ්‍රී ලංකාවෙන් පිටත සිටින නේවාසිකයන් වන අවස්ථාවක දී ගිණුම්හිමියා කවුරුන් ද යන්න නොසලකමින්, වෙනත් පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හෝ අක්වෙරළ බැංකු ඒකකය තුළ පවත්වා ගෙන යනු ලබන ගිණුම් වෙත සිදු කරන මාරුකිරීම්;

(එ) ගිණුම්හිමියාගේ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමෙහි පවතින අරමුදල් භාවිත කරමින් විදේශ ව්‍යවහාර මුදලින් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර තුළ සිදු කරන ආයෝජන සඳහා ගෙවීම්;

(ඒ) තවත් පුද්ගලයෙකුගේ (විකුණුම්කරු) ප්‍රතිමුඛ ආයෝජන ගිණුමක් හරහා විදේශයන්හි සිදු කරන ලද අවසරලත් ආයෝජනයක් මිල දී ගැනීම සඳහා එම විකුණුම්කරුගේ ප්‍රතිමුඛ ආයෝජන ගිණුමට සිදු කරන පැවරුම්;

(ඔ) ජංගම ගිණුම්වලට අදාළව විදේශ විනිමය පනත යටතේ නිකුත් කරන ලද විධාන ප්‍රකාරව ගිණුම්හිමියා සහ/ හෝ ආසන්නතම පවුලේ සාමාජිකයන් (එක් පුද්ගලයෙකුට) සඳහා එ.ජ.ඩො. 5,000ක් හෝ වෙනත් ඕනෑම විදේශ ව්‍යවහාර මුදලකින් ඊට සමාන අගයක් දක්වා විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු ආපසු ගැනීම හෝ විදේශ සංචාරක කාඩ්පත් සඳහා අරමුදල් මාරු කිරීම්;

(ඕ) විදේශයෙහි සේවා නියුක්ත ශ්‍රී ලාංකිකයන් (විගාමිකයන් හැර) වෙත ලබා දෙන ණය සහ අත්තිකාරම් පිළිබඳව වන 2021 මාර්තු 18 දිනැති 2021 අංක 10 දරන විධානයන් ප්‍රකාරව ගිණුම්හිමියා විසින් ලබා ගන්නා ලද ණය සහ අත්තිකාරම් ආපසු ගෙවීම/ සේවාකරණය සඳහා අරමුදල් මාරුකිරීම්;.

(ක) වෙනත් රටක ස්ථිර නේවාසික වීසා මත ශ්‍රී ලංකාවෙන් පිටත සිටින නේවාසිකයන් සහ ද්විත්ව පුරවැසිභාවය හිමි ශ්‍රී ලාංකිකයන්ට ලබා දෙන ණය පිළිබඳව වන 2021 මාර්තු 18 දිනැති 2021 අංක 11 දරන විධානයන් ප්‍රකාරව ලබා ගත් ණය ආපසු ගෙවීම/ සේවාකරණය සඳහා එම ගිණුම්හිමියාගේ ම විදේශ ව්‍යවහාර මුදල් ණය ගිණුමට නැතහොත් ශ්‍රී ලංකා රුපියල් ණය ගිණුමට සිදු කරන අරමුදල් මාරුකිරීම්;

(ග) ගිණුම්හිමියා ශ්‍රී ලංකාවේ තාවකාලිකව සංචාරයේ නිරත, ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික ශ්‍රී ලාංකිකයෙකු නොවන පුද්ගලයෙකු වන අවස්ථාවක දී විදේශ මුදල් ආපසු ගැනීම්;

(ච) ගිණුම්හිමියා ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික හෝ පුද්ගලයෙකු ශ්‍රී ලංකාවෙහි නේවාසික විජාතිකයෙකු වන අවස්ථාවක දී, එම ගිණුම්හිමියාගේ ම ආමුඛ ආයෝජන ගිණුමට සිදු කරන මාරුකිරීම්;

(ඡ) ගිණුම්හිමියා විජාතිකයෙකු වන හෝ නැතහොත් ශ්‍රී ලංකාවේ සේවයේ නියුක්ත ද්විත්ව පුරවැසියෙකු වන අවස්ථාවක දී, අතිරික්ත වැටුප් ගෙවීම, සේවයේ නියුක්ත සහ විශ්‍රාම ප්‍රතිලාභ හෝ එවැනි සේවා යෝජකයෙකුට ගෙවිය යුතු වන වෙනත් ඕනෑම ගෙවීමකට අදාළව, සේවායෝජකයාගේ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්, අක්වෙරළ බැංකු ඒකකයෙහි පවත්නා ගිණුම් හෝ සේවා යෝජකයාගේ ශ්‍රී ලංකා රුපියල් ගිණුම් වෙත සිදු කරන මාරුකිරීම්;

(ට) ගිණුම්හිමියා දේශීය නැව්/ ගුවන් සේවා සමාගමක් විසින් හිමිකාරීත්වය දරනු ලබන යාත්‍රාවක්/ ගුවන් යානාවක් තුළ විදේශයෙහි සේවය කරන ශ්‍රී ලාංකික පුරවැසියෙකු වන අවස්ථාවක දී, එවැනි සේවා යෝජකයෙකුට ගෙවිය යුතු වන අතිරික්ත කාර්ය මණ්ඩල වැටුප්/ වේතන සහ අනෙකුත් ආශ්‍රිත ගෙවීම් යනාදිය , එවැනි දේශීය නැව්/ ගුවන් සේවා සමාගමක ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට හෝ අක්වෙරළ බැංකු ඒකකයෙහි පවත්වා ගෙන යන ගිණුමකට සිදු කරන මාරුකිරීම්;

(ඩ) ගිණුම්හිමියා විදේශයෙහි සේවය කරන ශ්‍රී ලාංකික පුරවැසියෙකු වන අවස්ථාවේ දී, ගිණුම්හිමියා වෙත ලබා දුන් විදේශ ව්‍යවහාර මුදලින් වන නිවාස ණය සුරක්ෂිත කිරීම වෙනුවෙන් නිකුත් කරන ලද රක්ෂණ ප්‍රතිපත්තිවලට අදාළව රක්ෂණ ගෙවීම් වන ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් නියාමනය කරනු ලබන රක්ෂණ සමාගම්වල ව්‍යාපාරික විදේශ ව්‍යවහාර ගිණුම් වෙත සිදු කරන මාරුකිරීම්; සහ

(ණ) විදේශ විනිමය පනතේ වගන්ති 8 (3) ප්‍රකාරව, අරමුදල් ශ්‍රී ලංකාව වෙත ප්‍රේෂණය කර ඇති අවස්ථාවක දී ගිණුම්හිමියාගේ ඕනෑම අරමුණක් සඳහා සිදු කරන ප්‍රතිමුබ ප්‍රේෂණ.

2. වාර්තාකරණ අවශ්‍යතාව

(අ) බලයලත් වෙළෙඳුන් විසින් **ඇමුණුම I** ට අනුව මාසික පදනම මත සකසන ලද වාර්තාවක් dfem@cbsl.lk යන විද්‍යුත් තැපැල් ලිපිනය ඔස්සේ එළැඹෙන මාසයේ 15 වන දිනට හෝ ඊට ප්‍රථම මෙම දෙපාර්තමේන්තුවට යොමු කළ යුතුය.

(ආ) ඉහත වාර්තාකරණ අවශ්‍යතාව අනුව, බලයලත් වෙළඳුන් විසින් ඔවුන්ගේ අදාළ ගිණුම් පොත්වලින් අදාළ තොරතුරු උත්පාදනය කිරීම නැතහොත් උපුටා ගැනීම සඳහා බැංකුව තුළ පද්ධතියක් ක්‍රියාත්මක කරනු ලැබීමට අවශ්‍ය වේ.

3. බලයලත් වෙළෙඳුන් මෙම විධානයන්හි විෂය පථයෙන් පරිහාහිර ඕනෑම අරමුණක් සඳහා පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකින් හෝ එම ගිණුමක් වෙත සිදු කරන ඕනෑම ගනුදෙනුවක් හෝ මාරුකිරීමක් සඳහා, විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාගේ පූර්ව අවසරය ලබාගැනීම අවශ්‍ය වේ.

4. මෙම විධානයන්හි අරමුණ සඳහා;

(අ) **"ආසන්නතම පවුලේ සාමාජිකයන්"** යන්නෙන් කලත්‍රයා, දෙමව්පියන් සහ දරුවන් යන්න අර්ථවත් විය යුතුය;

(ආ) **"ප්‍රේෂණ"** යන්නෙන් ව්‍යවහාර මුදල් නෝට්ටු හැරුණු කොට, විදුලි පණිවුඩ පැවරුම්, වෙනත් අන්තර්බැංකු පැවරුම්, බැංකු අණකර, වෙනත් ගෙවීම් උපකරණ, ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ගෙවීමේ යාන්ත්‍රණ හෝ චේදිකා හරහා ලද ගෙවීම් සහ විදේශ ව්‍යවහාර මුදල් හුවමාරු කිරීමේ සමාගම් වලින් ලද විදේශීය අරමුදල් ඇතුළත් විය යුතුය.

(ඇ) **"ජංගම ගනුදෙනු"** යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ ඊට දී ඇති අර්ථය ම තිබිය යුතුය.

(ඈ) **"ප්‍රාග්ධන ගනුදෙනු"** යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ ඊට දී ඇති අර්ථය ම තිබිය යුතුය.

5. පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් ක්‍රියාත්මක කිරීමට සම්බන්ධව පවතින අවශ්‍යතා නිශ්චය කරමින් නිකුත් කරන ලද 2017 නොවැම්බර් 20 දිනැති 2017 අංක 03 දරන විධානයන් සහ 2020 ඔක්තෝබර් 07 දිනැති අංක 07 දරන විධානයන් මින් අවලංගු කෙරේ.

6. ඉහත 5 පරිච්ඡේදයේ සඳහන් පරිදි පෙර පැවති විධානයන් අවලංගු වීම, එකී අවලංගු වීමට ප්‍රථම ලබාගත් හිමිකම් හෝ අය වූ දඩමුදල් හෝ වගකීම් වෙනුවෙන් බලපෑමක් සිදු නොකරනු ලබයි.

7. මෙම විධාන මඟින් අවසරය ලබා දී ඇති කිසිවක්, බලයලත් වෙළඳුන් හෝ මෙම විධාන යටතේ විදේශ විනිමයෙන් ගනුදෙනු කරන වෙනත් ඕනෑම පුද්ගලයෙක්, වෙනත් ඕනෑම නීතියක විධිවිධාන සමඟ අනුකූල වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීමක්; නිදොස් කිරීමක් හෝ වැළැක්වීමක් ලෙස වටහා නොගත යුතුය.

අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව
2021 මාර්තු 18

2021 අංක 04 දරන විධානයන්හි ඇමුණුම 1

පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමේ මාසික ප්‍රකාශය

බැංකුවෙහි නම: .....

වාර්තාකරණ මාසය සහ වර්ෂය: .....

ව්‍යවහාර මුදල් වර්ගය	ආරම්භක ශේෂය		බැර					හර						අවසාන ශේෂය	
	ගිණුම් සංඛ්‍යාව	ශේෂය	විදේශයෙන් ආපසු ප්‍රේෂණ	වෙනත් ගිණුම්වලින් පැවරුම්	බැර කළ මුළු පොලිය	අනෙකුත් බැර	මුළු එකතුව	ශ්‍රී ලංකාවෙන් පිටතට සිදු කළ ප්‍රතිලාභ ප්‍රේෂණ	වෙනත් ගිණුම් වෙත මාරු කිරීම්	අනෙකුත් හර	විදේශයෙහි සේවයේ නියුතු ශ්‍රී ලාංකිකයන් වෙත ලබා දෙන ණය සහ අත්තිකාරම් යෝජනා ක්‍රමය යටතේ ණය සහ අත්තිකාරම් ආපසු ගෙවීම	වෙනත් රටක නිත්‍ය නේවාසිකභාවය මත ශ්‍රී ලංකා-වෙත් පිටත නේවාසික ශ්‍රී ලාංකිකයන්ගේ ණය ගිණුම් වෙත අරමුදල් මාරු කිරීම්	මුළු එකතුව	ගිණුම් සංඛ්‍යාව	වටිනාකම
ස්විස් ෆ්‍රෑන්ක්															
කැනේඩියානු ඩොලර්															
ඕස්ට්‍රේලියානු ඩොලර්															
අනෙකුත් නම් කළ විදේශ ව්‍යවහාර මුදල් *															

*වෙනත් නම් කරන විදේශ ව්‍යවහාර මුදල් සඳහා ඔබට අවශ්‍ය පරිදි පේළි දීර්ඝ කළ හැකිය.

බලයලත් වෙළෙඳුන් විසින් වාර්තාවේ පරිලෝකන පිටපතක් සහ ඉහත දක්වා ඇති පරිදි මයික්‍රොසොෆ්ට් එක්සෙල් ස්වරූපයේ පිටපතක් යන දෙකම ලබා දිය යුතු වේ.

බැංකුවෙහි ගිණුම් පොත්වලින් උපුටා ගත්/ උත්පාදනය වූ ඉහත තොරතුරු නිවැරදි බවට අපි සහතික වන්නෙමු.

බලයලත් නිලධාරියාගේ නම සහ තනතුර:

අත්සන සහ මුද්‍රාව:

දිනය:

අනුකූලතා නිලධාරියාගේ නම:

අත්සන:

දිනය:

විදේශ විනිමය දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා මහ බැංකුව

2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2021 අංක 05 දරන විධානයන්

ව්‍යාපාරික විදේශ ව්‍යවහාර ගිණුම් (BFCAs) පිළිබඳව බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්

විදේශ විනිමය පනතේ 5,6,7 සහ 8 වගන්ති සමඟ කියවිය යුතු, 2021 අංක 05 දරන විදේශ විනිමය(විදේශ විනිමය ගනුදෙනුවල නිරත වීමේ කාර්යය සඳහා ගිණුම් විවෘත කිරීම සහ පවත්වා ගෙන යාම) නියෝග සහ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ වගන්ති 9

ප්‍රකාරව, පහත කරුණුවලට යටත්ව ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් පවත්වා ගෙන යාමට බලයලත් වෙළෙඳුන්ට අවසරය හිමි වේ.

1.1 **සුදුසුකම් ලත් තැනැත්තන්**

(අ) ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තෙකුගෙන් ගෙන් විදේශ විනිමය උපයනන්නා වූ , ශ්‍රී ලංකාවේ නේවාසික පහත දැක්වෙන තැනැත්තන්:

(i) ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයෙකු;

(ii) හිමිකරු හෝ බහුතර හවුල්කරුවන් ශ්‍රී ලංකාවේ නේවාසිකයන් වන අවස්ථාවකදී, ශ්‍රී ලංකාවේ ලියාපදිංචි තනි පුද්ගල ව්‍යාපාරයක් හෝ හවුල් ව්‍යාපාරයක් (හවුල්කරුවන් දෙදෙනෙකු සිටින හවුල් ව්‍යාපාරයක් වන අවස්ථාවක දී, අවම වශයෙන් එක් හවුල්කරුවෙකු ශ්‍රී ලංකාවේ නේවාසිකයෙකු විය යුතුය);

(iii) ශ්‍රී ලංකාවෙහි සංස්ථාගත කරන ලද සමාගමක්;

(iv) 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ විදේශීය සමාගමක් ලෙස ලියාපදිංචි කරන ලද ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද සමාගමක්;

(v) අදාළ රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ හෝ අදාල අධිකාරියේ නිර්දේශය සහිත රාජ්‍ය ආයතනයක්;

(vi) මිය ගිය තැනැත්තෙකුගේ බූදලය අද්මිනිස්ත්‍රාති කිරීම සම්පූර්ණ කරන පතෙක්, බලයලත් වෙළෙන්දෙකු සමඟ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් පවත්වා යනු ලැබූ මිය ගිය තැනැත්තෙකුගේ බූදලයේ අද්මිනිස්ත්‍රාතිකරු හෝ පොල්ම:කරුවෙකු; සහ

(vii) නඩු කටයුතු අවසන් වන තෙක්, බලයලත් වෙළෙන්දෙකු සමඟ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් පවත්වා ගෙන යනු ලැබූ ලැබුම්කරුවෙකු හෝ ඇවරකරුවෙකු

(ආ) රාජ්‍ය නොවන සංවිධානයකට ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් විවෘත කිරීමට සහ පවත්වා ගෙන යෑමට අවසර ලබා නොදිය යුතුය.

1.2 **ගිණුම් ආරම්භ කිරීම සහ පවත්වා ගෙන යාම**

(අ) ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් දේශීය බැංකු ඒකකය තුළ නම් කරන ලද ඕනෑම විදේශ ව්‍යවහාර මුදලකින් ඉතුරුම්, ජංගම හෝ කාලීන තැන්පතු ගිණුම් ලෙස විවෘත කිරීම සහ පවත්වා ගෙන යාම කළ හැක.

(ආ) ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික පුද්ගලයෙකුගෙන් විදේශ විනිමයෙන් ලබන ඉපැයුම්වලට අදාළව ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් විවෘත කිරීමට සහ පවත්වා ගෙන යාමට අයදුම්කරු සතුව පවත්නා යෝග්‍යතාව තීරණය කිරීමට ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් විවෘත කරන විට දී, බලයලත් වෙළෙඳුන් විසින් යම් අධිකාරිත්වයක් ඇත්නම් එම අදාළ අධිකාරීත්වයේ අවසරය ඇතුළු ලේඛනමය සාක්ෂි ලබා ගත යුතුය.

(ඇ) ව්‍යාපාරික විදේශ ව්‍යවහාර ගිණුම් හිමිකරුවන්ට ලබා දෙන ණය පහසුකම් පිළිබඳව වන 2021 මාර්තු 18 දිනැති 2021 අංක 09 දරන විධානයන් යටතේ ලබා දෙන ලද අයිරා පහසුකමක් හැර, ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක හර ශේෂයක් නොපෙන්විය යුතුය.

(ඈ) ගිණුම් හිමියා පිළිවෙලින් වෙළඳ නාවික අධ්‍යක්ෂ ජනරාල් හෝ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් බලපත්‍රලාභී නැව් නියෝජිතයෙකු හෝ සාමාන්‍ය විකුණුම් නියෝජිතයෙකු වන අවස්ථාවකදී, ප්‍රවාහන ගාස්තු වශයෙන් සලකනු නොලබන වදේශීය ගාස්තු හෝ අය කිරීම් ලෙස රැස් කර ගත් සහ තැන්පතු ව්‍යාපාරික විදේශ ව්‍යවාහර මුදල් ගිණුමට බැර නොකළ යුතුය.

(ඉ) කිසිදු අවස්ථාවක දී ශ්‍රී ලංකා රුපියල් විදේශ ව්‍යවහාර මුදල් බවට පරිවර්තනය කර හෝ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට බැර නොකළ යුතුය.

1.3 **අවසරලත් බැර කිරීම්**

(අ) භාණ්ඩ හා සේවා අපනයනය, අන්තරාල වෙළෙඳාම, ගිණුම් හිමියා විසින් සිදු කරන විදේශ ව්‍යාපෘති සහ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික පුද්ගලයින්ට භාණ්ඩ හා සේවා සැපයීම යන කටයුතු වලට අදාළව බැංකු පද්ධතිය හාරහා විදේශයන්ගෙන් විදේශ මුදලින් ලද ප්‍රේෂණ;

(ආ) ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික පුද්ගලයෙකුට සපයනු ලබන භාණ්ඩ සහ සේවාවලට අදාළව ගිණුම් හිමියා විසින් ශ්‍රී ලංකාව තුළදී පිළිගත් විදේශ විනිමය;

(ඇ) ගිණුම් හිමියා විසින්, විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු එ.ජ.ඩො 15,000 ක් හෝ වෙනත් විදේශ ව්‍යවහාර මුදලකින් ඊට සමාන අගයක් ඉක්මවන හෝ ඊට සමාන විටදී ශ්‍රී ලංකා රේගුවට ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමෙන් පසු හෝ එම විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු එ.ජ. ඩොලර් 15,000 කට හෝ වෙනත් විදේශ ව්‍යවහාර මුදලකින් ඊට සමාන අගයකට වඩා අඩු වන විට බලයලත් වෙළෙන්දාට හෝ පරිසීමිත වෙළෙන්දාට උචිත ප්‍රකාශයක් කිරීමෙන් පසු ශ්‍රී ලංකාව තුළට රැගෙන එන ලද විදේශ ව්‍යවහාර මුදල්;

(ඈ) පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම, ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම හෝ එම ගිණුම් හිමියාගේ අක්වෙරළ බැංකු ඒකකයෙහි පවත්වා ගෙන යන ලද ගිණුමකින් සිදු කළ මාරු කිරීම්;

(ඉ) ජංගම ගනුදෙනුවකට අදාළව ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික පුද්ගලයෙකුගේ අක්වෙරළ බැංකු ඒකකයෙහි පවත්වා ගෙන යනු ලබන ගිණුමකින් සිදු කළ මාරු කිරීම්;

(ඊ) ගිණුම් හිමියා දේශීය නැව් / ගුවන් සේවා සමාගමක් වන අවස්ථාවක දී, එවැනි ගිණුම් හිමියෙකුට අයිති යාත්‍රා/ ගුවන් යානාවල සේවයේ නියුතු ශ්‍රී ලාංකික පුරවැසියෙකුගේ (සේවකයෙකුගේ) අධි ගෙවීමක් ලෙස ලද නාවික වැටුප්/ වේතන සහ ආශ්‍රිත

වෙනත් ගාස්තු වලට අදාළව පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකින් කරන මාරු කිරීම්;

(උ) භාණ්ඩ සහ සේවා සැපයීමට අදාළව, ශ්‍රී ලංකාවෙන් පිටත වාසය කරන පුද්ගලයෙකුගේ රාජ්‍යතාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමෙන් සිදු කළ මාරු කිරීම්;

(ඌ) ගිණුම් හිමියා නාවික නියෝජිතයෙකු හෝ සාමාන්‍ය විකුණුම් නියෝජිතයෙකු වන අවස්ථාවකදී, අදාළ නියෝජිත ආයතනයේ ගිවිසුම් යටතේ වන අරමුණු උදෙසා විදේශීය ප්‍රධානියා වෙනුවෙන් නම් කරන ලද තෙවන පාර්ශ්වයකින් හෝ අදාළ විදේශීය ප්‍රධානියාගෙන්, බැංකු පද්ධතිය හරහා විදේශ විනිමයෙන් ලත් ප්‍රේෂණ;

(එ) ගිණුම් හිමියා නැව් නියෝජිතයෙකු හෝ සාමාන්‍ය විකුණුම් නියෝජිතයෙකු වන අවස්ථාවකදී, ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් හෝ අක්වෙරළ බැංකු ඒකකයක් තුළ පවත්වා ගෙන යනු ලබන ගිණුමකට එරෙහිව බලයලත් වෙළෙන්දෙකු විසින් ශ්‍රී ලංකාව තුළ දී නිකුත් කරන ලද බැංකු පැවරුමක් හෝ බැංකු අණකරයක් මගින් විදේශීය ප්‍රධානියා වෙනුවෙන් එහි නියෝජිතයා විසින් විදේශ විනිමයෙන් රැස් කරනු ලැබූ ප්‍රවාහන කුලී සහ මඟී ගාස්තු;

(ඒ) ගිණුම්හිමියා ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත සමාගමක් වන අවස්ථාවකදී, ශ්‍රී ලංකාවෙන් පිටත සේවා සපයන ශ්‍රී ලාංකික පුරවැසියෙකුට වේතන ගෙවීම් සහ/හෝ ඉපයීම් ලබාදීමට අදාලව විදේශීය සේවාදායකයා සමග එකගතාවයකට එළඹ ඇති විටෙක, විදේශීය සේවාදායකයාගෙන් බැංකු පද්ධතිය හරහා විදේශයකින් විදේශ විනිමය වශයෙන් ලැබෙන ප්‍රේෂණ හෝ එවැනි විදේශීය සේවාදායකයාගේ අක්වෙරළ බැංකු ඒකකයක පවත්වාගෙන යන ගිණුමෙන් මාරු කිරීම්;

(ඔ) ශ්‍රී ලංකාවෙහි වරායක් හෝ ගුවන් තොටුපළක දී ශ්‍රී ලංකාව වෙත පැමිණෙන හෝ ශ්‍රී ලංකාවෙන් පිටත් වී යන මඟීන් (නේවාසික තත්ත්වය නොසලකමින්) වෙත සපයන ලද භාණ්ඩ සහ සේවා සඳහා ප්‍රතිෂ්ඨාව ලෙස, තීරු බදු සහන යටතේ අවසර ලත් ව්‍යාපාරයක් පවත්වා ගෙන යන ගිණුම් හිමියෙකුගෙන් විදේශ විනිමයෙන් ලත් ගෙවීම්;

(ඕ) ගිණුම් හිමියාගේ ඕනෑම විදේශීය වත්කමක් ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම හර කිරීමක් මඟින් අත්පත් කර ගෙන ඇත්නම්, එවැනි වත්කමකින් ලත් ඕනෑම ආදායමක් හෝ මුදලක්;

(ක) දායකත්වයන්ට සමානුපාතිකව, ගිණුම් හිමියාගේ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමෙන් හෝ එම ගිණුම් හිමියාගේ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර ගිණුමෙන් ප්‍රතිමුඛ ආයෝජන ගිණුමකට පවරන ලද අරමුදල් භාවිත කිරීම මගින්, ආයෝජන සිදු කර ඇති අවස්ථාවකදී, ප්‍රතිමුඛ ආයෝජන වලින් ලත් ඕනෑම ආදායමක් හෝ ප්‍රාග්ධන මුදලක් වන, ප්‍රතිමුඛ ආයෝජන ගිණුමකින් මාරු කිරීම්;

(ග) ගිණුම් හිමියාගේ එම ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම හර කිරීම මගින් මුල් ආයෝජනය සිදු කර ඇති අවස්ථාවක, එවැනි ගැනුම්කරුවෙකු වෙත විදේශයකදී අවසරලත් ආයෝජනයක් විකිණීමෙන් ලත් මුදල් වන, තවත් පුද්ගලයෙකුගේ (එනම් ගැනුම්කරුවෙකු) ප්‍රතිමුඛ ආයෝජන ගිණුමෙන් කරන ලද මාරු කිරීම්;

(ච) ගිණුම් හිමියාගේ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම හර කිරීම මගින් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල මුල් ආයෝජනය සිදු කර ඇත්නම්, විදේශ ව්‍යවහාර මුදලින් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර (SLDB) වල සිදු කර ඇති ආයෝජනවලින් උපයන කුපන් ආදායම, විකුණුම් / කල්පිරීම්වලින් ලත් මුදල් සහ වෙනත් ආශ්‍රිත ලැබීම්;

(ඡ) මෙම විධානයන්හි 1.4 පරිච්ඡේදයේ (ඉ), (ඊ) සහ (උ) යන අයිතම ප්‍රකාරව ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම හර කිරීම මගින් ගිණුම්හිමියා විසින් ලබා ගන්නා ලද භාවිත නොකළ විදේශ ව්‍යවහාර මුදල්;

(ට) ගිණුම් හිමියාගේ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමෙන් ම අරමුදල් සපයා ඇති විදේශ සංචාරක කාඩ්පතෙහි අගය දක්වා, ගිණුම්හිමියාගේ සංචාරක කාඩ් පතෙහි දැනට පවත්නා භාවිත නොකළ ශේෂය;

(ඩ) ගිණුම් හිමියා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL) විසින් නියාමනය කරනු ලබන රක්ෂණ සමාගමක් වන විට දී, සුදුසුකම්ලත් ගනුදෙනුකරුවන් සහ උප රක්ෂකයන් වෙත නිකුත් කරන ලද විදේශ ව්‍යවහාර මුදලින් නිරූපිත ආයෝජන ප්‍රතිපත්ති මත ලද රක්ෂණ වාරික සහ ප්‍රතිරක්ෂකයන් සහ ජාතික රක්ෂණ භාරකාර අරමුදලින් (NITF) ලද හිමිකම්;

(ණ) ගිණුම් හිමියා සේවා යෝජකයෙකු වන විට දී, එවැනි සේවකයෙකුට අතිරික්තව වැටුප් ගෙවීම, සේවානියුක්ති සහ විශ්‍රාම ප්‍රතිලාභ හෝ එවැනි සේවකයෙකු ගෙන් ලැබිය යුතු වෙනත් ඕනෑම ගෙවීමක් වන ශ්‍රී ලංකාවේ සේවා නියුක්ත විජාතිකයෙකු වන හෝ ද්විත්ව පුරවැසියෙකු වන පුද්ගලයෙකුගේ (එනම් සේවකයෙකුගේ) පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකින් මාරු කිරීම්;

(ත) ගිණුම් හිමියා දේපළ සංවර්ධකයෙකු වන විට දී, ආයෝජකයෙකු වෙත නිශ්චල දේපළ විකිණීමෙන් ලද ගෙවීම් වන ශ්‍රී ලංකාවෙන් පිටත වාසය කරන පුද්ගලයෙකුගේ (එනම් ආයෝජකයෙකුගේ) ආමුඛ ආයෝජන ගිණුමෙන් මුදල් මාරු කිරීම්;

(ද) ගිණුම් හිමියා දේපළ සංවර්ධකයෙකු වන විට දී, 2021 මාර්තු 18 දිනැති 2021 අංක 11 දරන විධාන මගින් අවසර ලබා දී ඇති පරිදි, තවත් රටක නිත්‍ය නේවාසිකභාවය මත ශ්‍රී ලංකාවෙන් පිටත ශ්‍රී ලාංකික නේවාසිකයෙකුගෙන් ලත් ගෙවීම් හෝ ද්විත්ව පුරවැසියෙකු ගෙන් ලත් ගෙවීම් ලෙස විදේශ ව්‍යවහාර ණය ගිණුමකින් (FCLA) මුදල් මාරු කිරීම්;

(න) විදේශ විනිමය පනතේ 8(3) වගන්ති ප්‍රකාරව ගිණුම්හිමියාගෙන් ශ්‍රී ලංකාවෙන් පිටත හට ගන්නා ප්‍රේෂණ;

(ප) **ඇමුණුම I** හි ලැයිස්තු ගත කර ඇති පුද්ගලයන් ප්‍රවර්ගයක් වන ගිණුම් හිමියෙකු විසින් සපයනු ලබන භාණ්ඩ සහ සේවා ප්‍රකාරව අක්වෙරළ බැංකු ඒකකය තුළ පවත්වා ගෙන යන ගිණුම් වලින් වෙනත් ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලින් මුදල් මාරු කිරීම්; සහ

(බ) ගිණුමෙහි පවත්නා අරමුදල් මත විදේශ ව්‍යවහාර මුදලින් උපයා ගත් පොලිය;

1.4 **අවසරලත් හර කිරීම්**

(අ) ගිණුම් හිමියාගේ ජංගම ගනුදෙනු සහ ප්‍රාග්ධන ගනුදෙනුවලට අදාළව ශ්‍රී ලංකාවෙන් පිටතට සිදු කරන ඕනෑම ප්‍රතිමුඛ ප්‍රේෂණයක්;

(ආ) ශ්‍රී ලංකා රුපියල්වලින් ශ්‍රී ලංකාව තුළදී සිදු කරන ගෙවීම්;

(ඇ) ගිණුම් හිමියාගේම අක්වෙරළ බැංකු ඒකකය තුළ පවත්වා ගෙන යනු ලබන පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට, ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට හෝ අක්වෙරළ බැංකු ඒකකය තුළ පවත්වා ගෙන යන ගිණුමකට සිදු කරන මාරු කිරීම්;

(ඈ) ජංගම ගනුදෙනු වෙනුවෙන් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තෙකු විසින් අක්වෙරළ බැංකු ඒකකයේ පවත්වාගෙන යන ගිණුමකට සිදු කරන මාරු කිරීම්;

(ඉ) 2021 මාර්තු 18 දිනැති 2021 අංක 02 දරන ජංගම ගනුදෙනු සඳහා වන විධානයන් ප්‍රකාරව ගිණුම්හිමියාගේ සංචාරක අරමුණු සඳහා විදේශ සංචාරක කාඩ්පතකට උඩුගත කිරීම සඳහා එ.ජ.ඩො. 5000 ක් දක්වා මුදල් මාරු කිරීම හෝ විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු ආපසු ගැනීම;

(ඊ) ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියෙන් ලබා ගත් තහවුරුවක් ඉදිරිපත් කිරීම මත කපා ඔප මට්ටම් කළ හෝ රළු මැණික් විදේශයෙන් මිල දී ගැනීමේ අරමුණ සඳහා මැණික් සහ ස්වර්ණාභරණ වෙළෙඳුන් විසින් වරකට එ.ජ.ඩො. 50,000 ක් දක්වා (නැතහොත් එම අගයට සමාන වෙනත් ඕනෑම විදේශ ව්‍යවහාර මුදලකින්) විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටුවලින් මුදල් ආපසු ගැනීම;

(උ) ගිණුම් හිමියා ශ්‍රී ලංකාවේ නාවික නියෝජිතයෙකු හෝ සාමාන්‍ය විකුණුම් නියෝජිතයෙකු වන අවස්ථාවක දී, බලයලත් වෙළෙඳුන් වෙත පිළිගත හැකි හේතූන් සමග ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් මත, විදේශීය ප්‍රධානියාගෙන් හෝ විදේශීය ප්‍රධානියා වෙනුවෙන් නම් කරන ලද තෙවන පාර්ශ්වයන්ගෙන් ලද ආමුඛ ප්‍රේෂණවලට හිලව්වක් සඳහා වූ මුදලක් (Cash - to - Masters) ලෙස එක් යාත්‍රාවකට එක් කැඳවුමකට එ.ජ.ඩො. 50,000ක් දක්වා (නැතහොත් එම අගයට සමාන වෙනත් ඕනෑම විදේශ ව්‍යවහාර මුදලකින) විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටුවලින් මුදල් ආපසු ගැනීම;

(ඌ) විදේශීය ණය දෙන්නෙකුගෙන් ලබා ගත් විදේශ ව්‍යවහාර ණයක් ආපසු ගෙවීම/ සේවාකරණයෙහි අරමුණ සඳහා එම ගිණුම් හිමියාගේම (එනම්, ණය ගැනුම්කරු) විදේශීය වාණිජ ණය ගැනීමේ ගිණුමකට (ECBA) මාරු කිරීම;

(එ) ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ණය ගිණුමකට මුදල් මාරු කිරීම ඇතුළුව ගිණුම්හිමියා විසින් බලයලත් වෙළෙඳුන්ගෙන් ලබා ගන්නා ලද ණය සේවාකරණ වියදම් සහ විදේශ ව්‍යවහාර මුදල් පහසුකම් ආපසු ගෙවීම;

(ඒ) ගිණුම් හිමියා විසින් (එනම්, ණයගැනුම්කරු) 2017 නොවැම්බර් 20 සිට මෙම විධානවල දිනය දක්වා යන කාලය තුළ දී ණය දෙන්නෙකුගෙන් ලබා ගත් විදේශ ව්‍යවහාර ණය ආපසු ගෙවීමක් සඳහා විදේශීය ණය දෙන්නාගේ, ආමුඛ ආයෝජන ගිණුමකට මාරු කිරීම්;

(ඔ) ගිණුම් හිමියාගේ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර ගිණුමේ අරමුදල් භාවිත කරමින් විදේශ ව්‍යවහාර මුදලින් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජනයන්ට අදාළව සිදු කරන මාරු කිරීම්;

(ඕ) තවත් පුද්ගලයෙකුගේ (එනම් විකුණුම්කරු) ප්‍රතිමුඛ ආයෝජන ගිණුමකට එම ප්‍රතිමුඛ ආයෝජන ගිණුම ඔස්සේ ම විකුණුම්කරු විසින් විදේශයෙහි සිදු කර ඇති අවසරලත් ආයෝජනයක් මිල දී ගැනීම සඳහා ගෙවීම් වන මාරු කිරීම්;

(ක) ගිණුම් හිමියා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL) සමඟ ලියාපදිංචි වී ඇති රක්ෂණ සමාගමක් වන අවස්ථාවක දී; විදේශ ව්‍යවහාර මුදලින් නිරූපිත ප්‍රතිපත්තිවලට අදාළව සුදුසුකම් ලත් ගනුදෙනුකරුවන් සහ උප රක්ෂකයන් වෙත හිමිකම් ගෙවීම්, දේශීය හෝ විදේශීය ප්‍රති රක්ෂකයන් වෙත වාරික සහ ජාතික රක්ෂණ භාරකාර අරමුදල් සහ තැරැව්කාර ගාස්තු ගෙවීම්;

(ග) ගිණුම් හිමියා ආයෝජනලාභියෙකු, කුලීබදුකාරයෙකු, බදු ගැනුම්කරුවෙකු හෝ ගැනුම්කරුවෙකු වන විට දී, ආමුඛ ආයෝජන ගිණුම් සඳහා අදාළ වන විදේශ විනිමය පනත යටතේ නිකුත් කරන ලද රෙගුලාසි සහ විධාන යටතේ අවසර ලබා දී ඇති පරිදි, එවැනි ආමුඛ ආයෝජන ගිණුම්හිමියෙකුගේ ශ්‍රී ලංකාවෙහි සිදු කළ ප්‍රාග්ධන ගනුදෙනුවලට ආරෝපිත ඕනෑම ආදායමක් හෝ ප්‍රාග්ධන ප්‍රතිලාභයක් ලෙස ආමුඛ ආයෝජන ගිණුමට මාරු කිරීම්;

(ච) ගිණුම් හිමියා ශ්‍රී ලංකාවේ සංස්ථාපිත, ශ්‍රී ලංකාවෙන් පිටත සේවා සපයන ශ්‍රී ලාංකික පුරවැසියන්ට වේතන සහ/ හෝ ඉපැයුම් විය පැහැදම් කිරීම සඳහා විදේශීය සේවා යෝජකයෙකු සමඟ කටයුතු යොදා තිබෙන සමාගමක් වන අවස්ථාවක දී, අදාළ සේවා නියුක්තිකයන්ගේ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම හෝ ශ්‍රී ලංකා රුපියල් ගිණුමකට මාරු කිරීම්;

(ඡ) ගිණුම් හිමියා දේශීය නැව්/ ගුවන්සේවා සමාගමක් වන විට දී; කාර්යමණ්ඩල වැටුප් / වේතන සහ වෙනත් ආශ්‍රිත සේවානියුක්ති ප්‍රතිලාභ ගෙවීමක් වන, එවැනි නැව්/ ගුවන් සේවා සමාගමක් විසින් හිමිකාරිත්වය දරන යාත්‍රා/ ගුවන්යානාවල විදේශයේ සේවය කරන ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ පුද්ගලික විදේශ ව්‍යවහාර ගිණුම්වලට මාරු කිරීම්;

(ට) **ඇමුණුම** I හි ලැයිස්තුගත කර තිබෙන පුද්ගලයන් ප්‍රවර්ගයක් වන ගිණුම්හිමියා විසින් භාණ්ඩ සහ සේවා මිල දී ගැනීමට අදාළව අක්වෙරළ බැංකු ඒකකය තුළ පවත්වා ගෙන යනු ලබන ගිණුම් හෝ වෙනත් ව්‍යාපාරික විදේශ ව්‍යවහාර ගිණුම් වෙත මාරු කිරීම්; සහ

(න) විදේශ විනිමය පනතෙහි 8(3) වන වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකාව වෙත එවැනි අරමුදල් ප්‍රේෂණය කර ඇති අවස්ථාවකදී, තනි පුද්ගලයෙකු වන ගිණුම් හිමියෙකුගේ ඕනෑම අරමුණක් සඳහා සිදු කරන අරමුදල් ප්‍රතිමුඛ ප්‍රේෂණ;

1.5 අනෙකුත් කොන්දේසි

(අ) ගිණුම්හිමියා විසින් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික පුද්ගලයෙකුට විකුණූ භාණ්ඩ සහ සපයන ලද සේවාවලට අදාළව, එම භාණ්ඩ සහ සේවා ශ්‍රී ලංකාවෙන් පිටත නිකුත් කරන ලද විද්‍යුත් අරමුදල් මාරු කිරීමේ කාඩ්පතක් (EFTC) භාවිත කිරීමෙන් සිදු කළ වියදම් එහි අඩංගු වන බවට සඳහන් කරමින් ඉලෙක්ට්‍රොනික දත්ත ග්‍රාහක පර්යන්තය/ අන්තර්ජාල ගෙවීම් පිවිසුමක් (EDC/IPG) විසින් ලබා දුන් ලිඛිත තහවුරු කිරීමක් මත පමණක් බලයලත් වෙළෙඳුන් විසින් එවැනි ගෙවීමක් බැර කළ කළ යුතුය යන නියමය යටතේ, ශ්‍රී ලංකාවෙන් පිටත නිකුත් කරන ලද විද්‍යුත් අරමුදල් මාරු කිරීමේ කාඩ්පතක් භාවිත කිරීම මගින්, විද්‍යුත් දත්ත ග්‍රාහක පර්යන්තයක දී හෝ අන්තර්ජාල ගෙවීම් පිවිසුමක් ඔස්සේ සිදු කර ඇති විට, ඒ සඳහා ලත් ගෙවීම් මත බලයලත් වෙළෙඳුන් විසින් ලිඛිත තහවුරු කිරීමක් ලබා ගත යුතුය.

(ආ) ගිණුම්හිමියා ශ්‍රී ලංකාවේ නාවික නියෝජිතයෙකු හෝ සාමාන්‍ය විකුණුම් නියෝජිතයෙකු වන අවස්ථාවකදී, රජයට සහ නියෝජිත කොමිෂන් සභාවට ගෙවිය යුතු බදු ඇතුළුව ශ්‍රී ලංකාවේ විදේශීය නියෝජකගේ සියලු දේශීය වගකීම් සපුරාලීමට, ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමෙහි ප්‍රමාණවත් අරමුදල් පවතී යන බලපෑමට ගිණුම්හිමියාගෙන් (එනම් නියෝජිතයා) ලබා ගත් ලිඛිත තහවුරු කිරීමක් මත පමණක්, අතිරික්ත අරමුදල් විදේශීය නියෝජක වෙත දේශප්‍රත්‍යාවර්තනය කිරීමට අවසරය ලබා දිය යුතුය.

(ඇ) ගිණුම්හිමියා ශ්‍රී ලංකාවෙහි සංස්ථාගත හෝ ලියාපදිංචි කළ ගිණුම්හිමියෙකු වන වන අවස්ථාවකදී, බලයලත් වෙළෙඳුන් විසින් 2021 මාර්තු 18 දිනැති 2021 අංක 02 දරන ජංගම ගනුදෙනු සඳහා වන විධානයන්ට යටත්ව, ගිණුම්හිමියාගේ (සේවායෝජකයා) ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම හර කිරීම මගින් එවැනි සේවකයෙකුගේ විදේශ සංචාර අරමුණු සඳහා පුද්ගලයෙකුට (එවැනි සමාගමක සේවකයෙකු වන) එ.ජ.ඩො. 5,000ක (වෙනත් විදේශ ව්‍යවහාර මුදලකින් එම අගයට සමාන) උපරිමයක් දක්වා විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු නිකුත් කළ හැකිය.

(ඈ) ගිණුම්හිමියා දේපළ සංවර්ධකයෙකු (එනම් විකුණුම්කරුවෙකු) වන විට දී, 2021 මාර්තු 18 දිනැති 2021 අංක 20 දරන ඇපකර නිකුත් කිරීම සහ අලුත් කිරීම සඳහා වන විධානයන්හි නිශ්චිතව දක්වා ඇති නියමයන් සහ කොන්දේසිවලට යටත්ව, මෙම විධානවල 1.3 පරිච්ඡේදයේ (අ:) අයිතමය ප්‍රකාරව ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම වෙත බැර කළ අරමුදල් විකුණුම්කරු වෙනුවෙන් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසිකයෙකු වන දේපළ මිල දී ගනු ලබන්නාට අනුග්‍රහය දක්වන බැංකු ඇපකරයක් හෝ සූදානම් කළ ණයවර ලිපියක් නිකුත් කිරීම සඳහා බලයලත් වෙළෙන්දා විසින් සමපාර්ශ්විකයක්/ ඇප සුරැකුමක් ලෙස තබා ගත හැකිය.

2. වාර්තා කිරීමේ අවශ්‍යතාව

(අ) **ඇමුණුම II** ට අනුව බලයලත් වෙළෙඳුන් විසින් මෙම දෙපාර්තමේන්තුව වෙත විද්‍යුත් තැපැල (dfe@cbsl'lk) හරහා එළඹෙන මාසයේ 15වන දිනට හෝ ඊට පෙර මාසික පදනමින් වාර්තාවක් යොමු කළ යුතුය.

(ආ) ඉහත වාර්තාකරණ අවශ්‍යතාවන්ට අනුව, බලයලත් වෙළෙඳුන් විසින් අදාළ බැංකුවල ගිණුම් පොත්වලින් අදාළ තොරතුරු උත්පාදනය කිරීම හෝ උපුටා ගැනීම සඳහා බැංකුව තුළ පද්ධතියක් ක්‍රියාත්මක කරනු ලැබීමට අවශ්‍ය වේ.

3. මෙම විධානවල විෂයපථය යටතට අයත් වන ඕනෑම අරමුණක් සඳහා ව්‍යාපාරික විදේශ ව්‍යවහාර ගිණුම්වලින්/ එම ගිණුම් වෙත මාරු කිරීම් හෝ ගනුදෙනු සිදු කිරීම් සඳහා විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාගේ පූර්ව අනුමැතිය අවශ්‍ය වේ.

4. මෙම විධානවල අරමුණු සඳහා;

(අ) "**ප්‍රේෂණ**" යන්නෙන් ව්‍යවහාර මුදල් නෝට්ටු හැරුණු කොට, විදුලි පණිවුඩ පැවරුම්, වෙනත් අන්තර්බැංකු පැවරුම්, බැංකු අණකර, වෙනත් ගෙවීම් උපකරණ, ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ගෙවීමේ යාන්ත්‍රණ හෝ වේදිකා හරහා ලද ගෙවීම් සහ විදේශ ව්‍යවහාර මුදල් හුවමාරු කිරීමේ සමාගම් වලින් ලද විදේශීය අරමුදල් ඇතුළත් විය යුතුය;

(ආ) "**ශ්‍රී ලංකාවෙන් පිටත සේවා සැපයීම**" යන්නෙන් මුහුදු යා හැකි යාත්‍රා/ නැව්, වාණිජ ගුවන් යානාවල විදේශයෙහි සපයන සේවා සහ විදේශීය රටවල දී සිදු කරන ඉදිකිරීම්, සනීපාරක්ෂණ, සෞඛ්‍යය, ආරක්ෂණ, ගිණුම්කරණ, නෛතික සහ වෙනත් සේවා සැපයීම ද ඇතුළත් විය යුතුය;

(ඇ) "**ජංගම ගනුදෙන**" යන්නෙන් 2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි දක්වා ඇති අර්ථය ම අර්ථවත් විය යුතුය;

(ඈ) "**ප්‍රාග්ධන ගනුදෙනු**" යන්නෙන් 2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි දක්වා ඇති අර්ථය ම අර්ථවත් විය යුතුය;

(ඉ) "**රාජ්‍ය නොවන සංවිධාන**" යන්නෙන් 1980 අංක 31 දරන ස්වෙච්ඡාමය සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය) සහ ඊට සිදු කරනු ලබන ඕනෑම සංශෝධනයක් ප්‍රකාරව රාජ්‍ය නොවන සංවිධාන සඳහා ජාතික ලේකම් කාර්යාලය යටතේ ලියාපදිංචි කරන ලද ස්වෙච්ඡාමය සමාජ සේවා සංවිධානයක් යන්න අර්ථවත් විය යුතුය;

(ඊ) "**විදේශ විනිමය සහ විදේශ වත්කම්**" යන්නෙන් 2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි 33 වන වගන්තිය දක්වා ඇති අර්ථය ම අර්ථවත් විය යුතුය;

(උ) "**නැව් නියෝජිත**" යන්නෙන් ශ්‍රී ලංකාවේ වාණිජ නැව් කටයුතුවල අධ්‍යක්ෂ ජෙනරාල් විසින් නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් හෝ බලය ලබා දීමේ ලිපියක් සමඟ විදේශීය නැව් සමාගම (විදේශීය නියෝජක) වෙනුවෙන් ශ්‍රී ලංකාව තුළ නාවික නියෝජිතයෙකු ලෙස ව්‍යාපාර කටයුතු සිදු කර ගෙන යෑමට බලය ලබා දුන් පුද්ගලයෙකු යන්න අර්ථවත් විය යුතුය;

(ඌ) "**විදේශීය නැව් සමාගම**" යන්නෙන් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසිකයෙකු වන 1972 අංක 10 දරන නැව් නියෝජිත ආයතන පනත (සංශෝධිත පරිදි) බලපත්‍රලාභී ඕනෑම නැව් සමාගමක් යන්න අර්ථවත් විය යුතුය;

(එ) "**සාමාන්‍ය විකුණුම් නියෝජිත**" යන්නෙන් ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ අධ්‍යක්ෂ ජෙනරාල්වරයා විසින් නිකුත්

කරන ලද වලංගු බලපත්‍රයක් හෝ බලයල ලබා දීමේ ලිපියක් සහිතව විදේශීය ගුවන් සේවයක් (විදේශීය නියෝජක) වෙනුවෙන් ශ්‍රී ලංකාව තුළ සාමාන්‍ය විකුණුම් නියෝජිතයෙකු ලෙස කටයුතු කිරීමට බලයලත් පුද්ගලයෙකු යන්න අර්ථවත් විය යුතුය;

(ඒ) **"විදේශීය ගුවන් සේවයක්"** යන්නෙන් ශ්‍රී ලංකාවෙන් පිටත නියෝජිතයෙකු වන, 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතෙහි (සංශෝදිත පරිදි) අර්ථය තුළ ඕනෑම " විදේශ ගුවන් ක්‍රියාකරුවෙකු" යන්න අර්ථවත් විය යුතුය;

(ඔ) **"වරාය පර්යන්ත ක්‍රියාකරුවන්"** යන්නට සී/ස ගුවන් තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකාව) සමාගම, සී/ස දකුණු ආසියා පිවිසුම් පර්යන්ත (පුද්) සමාගම සහ කොළඹ අන්තර්ජාතික බහාලුම් පර්යන්ත සමාගම ඇතුළත් විය යුතුය;

(ඕ) **"පුද්ගලයා"** යන්නෙන් ඕනෑම ස්වභාවික හෝ නෛතික පුද්ගලයෙකු යන්න අර්ථවත් විය යුතුය.

5. ව්‍යාපාරික විදේශ ව්‍යවහාර ගිණුම් ක්‍රියාත්මක කිරීමට සම්බන්ධ වන අවශ්‍යතාවන් නිශ්චිතව දක්වමින් බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරන ලද 2017 නොවැම්බර් 20 දිනැති 2017 අංක 04 දරන විධාන මින් අවලංගු කෙරේ.

6. ඉහත 5 පරිච්ඡේදයේ සඳහන් පරිදි පෙර පැවති විධානයක් අවලංගුවීම එකී අවලංගුවීමට ප්‍රථම ලබාගත් හිමිකම් හෝ අයවූ දඩමුදල් හෝ වගකීම් මත බලපෑමක් නොමැත.

7. මෙම විධාන මඟින් අවසරය ලබා දී ඇති කිසිවක්, බලයලත් වෙළෙඳුන් හෝ මෙම විධාන යටතේ විදේශ විනිමයෙන් ගනුදෙනු කරන වෙනත් ඕනෑම නීතියක විධිවිධාන සමඟ අනුකූල වීමේ අවශ්‍යතාවයෙන් නිදහස්වීමේ හෝ නිදෙස් කිරීමක් හෝ වැලැක්වීමක් ලෙස නොගත යුතය.

8. මෙම විධානයන් 2021 මාර්තු 22 වන දින සිට බල පැවැත්වෙන පරිදි ක්‍රියාත්මක විය යුතුය.

අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව
2021 මාර්තු 18

2021 අංක 05 දරන විධාන සඳහා වන ඇමුණුම I

පුද්ගල ප්‍රවර්ග

1. භාණ්ඩ අපනයනකරුවන් (වෙළෙඳ භාණ්ඩ)
2. වෘත්තීමය සේවා අපනයනකරුවන්
3. අතරමැදිකරුවන් ලෙස අන්තරාල වෙළෙඳාමෙහි නිරත වී සිටින පුද්ගලයන්
4. සංචාරක නියෝජිතවරුන් සහ සංචාරක ක්‍රියාකරුවන්
5. හෝටල් සහ ආපනශාලා
6. මැණික් සහ ස්වර්ණාභරණ වෙළඳුන්
7. විදේශ සේවානියුක්ති නියෝජිත ආයතන
8. ශ්‍රී ලංකා වාණිජ නැව් කටයුතුවල අධ්‍යක්ෂ ජෙනරාල් විසින් බලපත්‍ර/ බලය ලබා දී ඇති ප්‍රවාහන කුලීකරුවන් සහ වෙනත් කාර්ය සම්පාදන සේවා සපයන්නන්
9. ශ්‍රී ලංකා වාණිජ නැව් කටයුතුවල අධ්‍යක්ෂ ජෙනරාල් විසින් බලපත්‍ර/ බලය ලබා දී ඇති නාවික නියෝජිතයන්
10. ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා හි අධ්‍යක්ෂ ජෙනරාල් විසින් බලපත්‍ර/ බලය ලබා දී ඇති සාමාන්‍ය විකුණුම් නියෝජිතයන්
11. අදාළ රේඛීය අමාත්‍යාංශය විසින් බලපත්‍ර ලබා දී ඇති බංකර් ක්‍රියාකරුවන්
12. වරාය පර්යන්ත ක්‍රියාකරුවන්
13. ගුවන් සේවා පර්යන්ත සේවා සපයන්නන්
14. නැව් සහ ගුවන් සමාගම් වෙත ආහාර සහ පාන වර්ග සපයන්නන්
15. තීරුබදුවලින් තොර වෙළෙඳ සැල් (තීරුබදුවලින් තොර සහන යටතේ භාණ්ඩ සහ සේවා සැපයීමට අවසරය ලත් ව්‍යාපාරයන්හි නිරත වී සිටින)

2021 අංක 5 දරණ නියෝගයේ ඇමුණුම II

ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම මාසික ප්‍රකාශනය

බැංකුවේ නම : .....

වාර්තා කරන මාසය හා වර්ෂය : .....

ඇ.ඒ.ජ.ඩොලර්

ගිණුම් කාණ්ඩය	මුදල් වර්ගය	මාසය ආරම්භක දිනට ශේෂය	බැර						හර								මාසය අවසානයට ශේෂය	මාසය අවසානයට වූ ගිණුම් සංඛ්‍යාව
			ආමුල ප්‍රේෂණ	අනෙකුත් ගිණුම් වලින් මුදල් මාරු කිරීම	විදේශ විනිමය පනතේ ඡේද 8(3) ප්‍රතිපාදන යටතේ පුද්ගලයන් විසින් කරන ප්‍රේෂණ	බැර කරන ලද මූල පොලිය	අනෙකුත් බැර කිරීම්	එකතුව	ප්‍රතිමූල ප්‍රේෂණ	අනෙකුත් ගිණුම් වලට මුදල් මාරු කිරීම	ණය සේවාකරණ වියදම් සහ විදේශ ව්‍යවහාර මුදල් ප්‍රතියෝජන සහ ව්‍යාපාරික විදේශ ණය ගිණුමට මුදල් මාරුකිරීම	දේශීය වියදම්/රැසියල් ගිණුම් වලට මුදල් මාරු කිරීම	විදේශ විනිමය පනතේ ඡේද 8 (6) ප්‍රතිපාදන යටතේ පුද්ගලයන් විසින් කරන ප්‍රේෂණ	විදේශ ව්‍යවහාර මුදල් වලින් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජනයට මුදල් මාරු කිරීම	අනෙකුත් හර කිරීම	එකතුව		
භාණ්ඩ අපනයනකරුවන් (වෙළඳ භාණ්ඩ)																		
වෘත්තීමය සේවා අපනයනකරුවන්																		
අතරමැදිකරුවන් ලෙස අන්තර්ජාල වෙළෙඳාමෙහි නිරත වී සිටින පුද්ගලයන්																		
සංචාරක නියෝජිතවරුන් සහ සංචාරක ක්‍රියාකරුවන්																		
හෝටල් සහ ආපනශාලා																		
මැණික් සහ ස්වර්ණාභරණ වෙළෙඳුන්																		
රක්ෂණ නියෝජිත																		
විදේශ සේවා නියුක්ති නියෝජන ආයතන																		
ප්‍රවාහන කුලීකරුවන් හා වෙනත් කාර්ය සම්පාද සේවා සපයන්නන්																		
නාවික නියෝජිතයන්																		
සාමාන්‍ය විකුණුම් නියෝජිතයන් (ගුවන් සේවා)																		
අදාළ රේඛය අමාත්‍යංශය විසින් බලපත්‍ර ලබා දී ඇති බංකර් ක්‍රියාකරුවන්																		
වරාය පර්යන්ත ක්‍රියාකරුවන්																		
ගුවන් සේවා පර්යන්ත සේවා සපයන්නන්																		
නැව සහ ගුවන් සමාගම් වෙත ආහාර සහ පාන වර්ග සපයන්නන්																		
ශ්‍රී ලංකාවට වියදම් සඳහා වේතන සැපයීමට විදේශ සේවා නියුක්ති සමග සැලසුම් ඇති ආයතන																		
තීරු බදු රහිත සාප්පු																		
වෙනත් (සඳහන් කරන්න)																		
එකතුව																		

සටහන :- කරුණාකර සියලු ගිණුම්වලට අදාලව නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් වර්ග පිළිබඳ තොරතුරු සපයන්න.

බලයලත් වෙළඳුන් විසින් වාර්තාවේ පරිලෝකන පිටපතක් සහ ඉහත දක්වා ඇති පරිදි මයික්‍රොසොෆ්ට් එක්සෙල් ස්වරූපයේ පිටපතක් යන දෙකම ලබාදිය යුතු වේ.

බැංකු ගිණුමෙහි පොත්වලින් උපුටා ගත්/ උත්පාදනය වූ ඉහත තොරතුරු නිවැරදි බවට අපි සහතික වන්නෙමු.

බලයලත් නිලධාරියාගේ නම සහ තනතුර :-	අනුකූලතා නිලධාරියාගේ නම :
අත්සන සහ මුද්‍රාව :	අත්සන
දිනය :	දිනය

විදේශ විනිමය දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2021 අංක 06 දරන විධානයන්

රාජ්‍යතාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (DFCAs) සහ රාජ්‍යතාන්ත්‍රික රුපියල් ගිණුම් (DRAs) පිළිබඳ බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරන විධානයන්

2021 අංක 05 දරන විදේශ විනිමය නියෝග (විදේශ විනිමය ගනුදෙනුවල නිරත වීමේ අරමුණ සඳහා ගිණුම් විවෘත කිරීම සහ පවත්වා ගෙන යාම) සහ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි 9 වන වගන්තිය සමඟ කියවිය යුතු 6 සහ 7 වන වගන්ති ප්‍රකාරව, පහත කොන්දේසි වලට යටත්ව, රාජ්‍යතාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් සහ රාජ්‍යතාන්ත්‍රික රුපියල් ගිණුම් විවෘත කිරීමට සහ පවත්වා ගෙන යාමට බලයලත් වෙළෙඳුන් හට අවසර ලැබේ.

1.1 **සුදුසුකම් ලත් තැනැත්තන්**

(අ) විදේශීය රාජ්‍යතාන්ත්‍රික මෙහෙයුම්;

(ආ) ආගමන සහ විගමන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද නේවාසික වීසා ලබා ගැනීමේ අවශ්‍යතාවෙන් නිදහස් කර ඇති රාජ්‍යතාන්ත්‍රික කාර්ය මණ්ඩලය; සහ

(ඇ) ආගමන සහ විගමන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද නේවාසික වීසා ලබා ගැනීමේ අවශ්‍යතාවෙන් නිදහස් කර ඇති ශ්‍රී ලංකාවේ රාජ්‍යතාන්ත්‍රික කාර්ය මණ්ඩලයේ පවුලේ සාමාජිකයන්.

1.2 **ගිණුම් විවෘත කිරීම සහ පවත්වා ගෙන යාම**

(අ) රාජ්‍යතාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් සහ රාජ්‍යතාන්ත්‍රික රුපියල් ගිණුම් දේශීය බැංකුකරණ ඒකකය තුළ ඉතුරුම්, ජංගම (අයිරා පහසුකමින් තොර) සහ කාලීන තැන්පතු ගිණුම් ලෙස විවෘත කර, පවත්වා ගෙන යා හැකි ය.

(ආ) රාජ්‍යතාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් සහ රාජ්‍යතාන්ත්‍රික රුපියල් ගිණුම් පිළිවෙලින්, නම් කළ ඕනෑම විදේශීය ව්‍යවහාර මුදලකින් සහ ශ්‍රී ලංකා රුපියල්වලින් පවත්වා ගෙන යා හැකි ය.

(ඇ) තනි පුද්ගලයන් විසින් පවත්වා ගෙන යනු ලබන රාජ්‍යතාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් සහ රාජ්‍යතාන්ත්‍රික රුපියල් ගිණුම් තනි හෝ තවත් සුදුසුකම් ලත් පුද්ගලයෙකු සමඟ බද්ධ ගිණුම් ලෙස පවත්වා ගත හැකි ය.

1.3 **රාජ්‍යතාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල්** (DFCAs)

1.3.1 **අවසර ලත් බැර කිරීම්**

(අ) බැංකුකරණ පද්ධතිය ඔස්සේ ගිණුම්හිමියා වෙත ශ්‍රී ලංකාවට පිටතින් විදේශ විනිමයෙන් ලත් ප්‍රේෂණ;

(ආ) බලයලත් වෙළෙඳුන්ට මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම වැළැක්වීමේ (එබ/ඝඅ) නීති සමඟ අනුකූල වීමට හැකියාව ඇති කරමින්, බලයලත් වෙළෙඳුන් වෙත ප්‍රමාණවත් තොරතුරු/ සාක්ෂ්‍ය ඉදිරිපත් කිරීම මත, ගිණුම්හිමියා විසින් ශ්‍රී ලංකාව තුළට ගෙන එන ලද විදේශ විනිමය;

(ඇ) එම ගිණුම්හිමියාගේ ම අක්වෙරළ බැංකු ඒකකය තුළ පවත්වා ගෙන යනු ලබන ගිණුමකින් හෝ ආමුඛ ආයෝජන ගිණුමකින් මාරු කිරීම්;

(ඈ) ගිණුම්හිමියා නොසලකමින්, රාජ්‍යතාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් සහ රාජ්‍යතාන්ත්‍රික රුපියල් ගිණුම්වලින් මාරු කිරීම්; සහ

(ඉ) ගිණුමෙහි පැවති අරමුදල් මත උපයන ලද පොලිය විදේශ විනිමය වලින්.

1.3.2 **අවසර ලත් හර කිරීම්**

(අ) ශ්‍රී ලංකාවෙන් පිටත සිදු කරන ලද ඕනෑම ප්‍රතිමුඛ ප්‍රේෂණයක්;

(ආ) සංචාරක අරමුණු සඳහා විදේශ ව්‍යවහාර මුදලින් සිදු කළ මුදල් ආපසු ගැනීම්;

(ඇ) ශ්‍රී ලංකා රුපියල්වලින් ශ්‍රී ලංකාව තුළ සිදු කළ වියපැහැදම්;

(ඈ) එම ගිණුම් හිමියාගේ ම ආමුඛ ආයෝජන ගිණුමකට හෝ අක්වෙරළ ඒකකය තුළ පවත්වා ගෙන යනු ලබන ගිණුමකට මාරු කිරීම්;

(ඉ) ගිණුම්හිමියා නොසලකමින්, රාජ්‍යතාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් සහ රාජ්‍යතාන්ත්‍රික රුපියල් ගිණුම්වලට මාරු කිරීම්; සහ .

(ඊ) භාණ්ඩ සහ සේවා මිල දී ගැනුම්වලට අදාළව වෙනත් ඕනෑම පුද්ගලයෙකුගේ පෞද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (PFCAs), ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (BFCAs) වෙත මාරු කිරීම්.

1.4 රාජ්‍යතාන්ත්‍රික රුපියල් ගිණුම් (DRAs)

1.4.1 අවසර ලත් බැර කිරීම්

(අ) බැංකු පද්ධතිය ඔස්සේ ගිණුම්හිමියා වෙත ශ්‍රී ලංකාවට පිටතින් ලත් ප්‍රේෂණ;

(ආ) ශ්‍රී ලංකාවේ සිටින ඕනෑම පුද්ගලයෙකුගෙන් ගිණුම් හිමියා වෙත ලැබිය යුතු වීසා ගාස්තු රැස් කිරීම්, වැටුප් මුදල් ආපසු ලබා දීම්/ වැටුප් ප්‍රතිපූරණ සහ වෙනත් සමාන ගෙවීම්;

(ඇ) ගිණුම්හිමියා විසින් ඇමුණුම I හි ලැයිස්තුගත කර ඇති ලේඛන ඉදිරිපත් කිරීම මත ශ්‍රී ලංකාවෙහි හට ගත්, ගිණුම්හිමියා විසින් හිමිකාරීත්වය දරනු ලබන මෝටර් රථ වාහන විකිණීමෙන් ලත් මුදල්;

(ඈ) එම ගිණුම්හිමියාගේ ආමුඛ ආයෝජන ගිණුමකින් මාරු කිරීම්;

(ඉ) ගිණුම්හිමියා නොසලකමින්, රාජ්‍යතාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් සහ රාජ්‍යතාන්ත්‍රික රුපියල් ගිණුම්වලට මාරු කිරීම්; සහ

(ඊ) ගිණුමෙහි පවත්වා ගෙන යන ලද අරමුදල් මත ශ්‍රී ලංකා රුපියල්වලින් උපයා ගත් පොලිය.

1.4.2 අවසර ලත් හර කිරීම්

(අ) ශ්‍රී ලංකා රුපියල්වලින් ශ්‍රී ලංකාවෙහි සිදු කළ වියපැහැදම්;

(ආ) වීසා ගාස්තු, මුදල් ආපසු ලබා දීම්, ප්‍රතිපූරණය කිරීම් ඇතුළුව ගිණුම්හිමියාගේ ජංගම ගනුදෙනුවලට අදාළව සිදු කරන ප්‍රතිමුඛ ප්‍රේෂණ;

(ඇ) ගිණුම්හිමියා විසින් හිමිකාරීත්වය දරනු ලබන මෝටර් රථ වාහන විකිණීමෙන් ලත් මුදල්වලට අදාළව සිදු කරන ප්‍රතිමුඛ ප්‍රේෂණ;

(ඈ) එම ගිණුම්හිමියාගේ ම ආමුඛ ආයෝජන ගිණුමට පැවරුම්;

(ඉ) ගිණුම්හිමියා නොසලකමින්, රාජ්‍යතාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් සහ රාජ්‍යතාන්ත්‍රික රුපියල් ගිණුම්වලට මාරු කිරීම්; සහ

(ඊ) අදාළ රේඛීය අමාත්‍යාංශය විසින් අනුමත කරන ලද විදේශ විනිමයෙන් සිදු කළ වෙනත් ඕනෑම ගනුදෙනුවක්.

2. බලයලත් වෙළෙඳුන් හට මෙම විධානයන්හි විෂය පථයට අයත් නොවන ඕනෑම අරමුණක් සඳහා ඕනෑම ගනුදෙනුවකට/ රාජ්‍යතාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්/ රාජ්‍යතාන්ත්‍රික රුපියල් ගිණුම් වෙත සහ එම ගිණුම්වලින් මාරු කිරීම් සඳහා විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාගේ පූර්ව අනුමැතිය අවශ්‍ය වේ.

3. **මෙම විධානයන්හි අරමුණු සඳහා**

(අ) **"රාජ්‍යතාන්ත්‍රික මෙහෙයුම"** යන්නෙන් විදේශ කටයුතු අමාත්‍යාංශයේ රාජ්‍යතාන්ත්‍රික අංශය විසින් කලින් කලට රාජ්‍යතාන්ත්‍රික මෙහෙයුමක් ලෙස හඳුනා ගෙන ඇති තානාපති කාර්යාලයක්, මහ කොමසාරිස් කාර්යාලයක්, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නිත්‍ය මෙහෙයුමක්, යුරෝපානු කොමිෂන් සභාවේ යුරෝපානු සංගම් නියෝජිත මණ්ඩලය, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව හෝ වෙනත් සමාන සංවිධානයක් යන්න අර්ථවත් වේ;

(ආ) **"රාජ්‍යතාන්ත්‍රික කාර්ය මණ්ඩලය"** යන්නෙන් රාජ්‍යතාන්ත්‍රික මෙහෙයුම විසින් නියෝජනය කරනු ලබන විදේශීය රටක පුරවැසියන් යන්න අර්ථවත් වේ.

(ඇ) **"ප්‍රේෂණ"** යන්නට විදුලි පණිවුඩ පැවරුම්, අනෙකුත් අන්තර් බැංකු පැවරුම්, බැංකු අණකර, වෙනත් ගෙවීම් උපකරණ, ජාත්‍යන්තර වශයෙන් පිළිගත් අනෙකුත් ගෙවීම් යාන්ත්‍රණ හෝ වේදිකා සහ ව්‍යවහාර මුදල් නෝට්ටු හැරුණු කොට, විදේශයෙන් විදේශ ව්‍යවහාර මුදලින් හුවමාරු සමාගම්/ ආයතනවලින් ලත් අරමුදල් යන්න ඇතුළත් විය යුතුය;

(ඈ) **"ජංගම ගනුදෙනු"** යන්නෙන් 2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි දක්වා ඇති අර්ථය ම හැඟවිය යුතුය.

4. රාජ්‍යතාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් සහ රාජ්‍යතාන්ත්‍රික රුපියල් ගිණුම් ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ වන අවශ්‍යතා නිශ්චිතව දක්වමින් බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන 2017 නොවැම්බර් 20 දිනැති 2017 අංක 05 දරන විධාන

මෙමගින් අහෝසි කෙරේ.

5. 4 වන පරිච්ඡේදයෙහි සඳහන් පූර්ව විධාන අහෝසි කිරීම, එම අහෝසි කිරීමට පෙර ඒවා යටතේ අත් වූ දණ්ඩන හෝ වගකීම් මත උපචිත වූ කිසිදු හිමිකමකට බලපෑම් නොකළ යුතුය.

6. මෙම විධාන මගින් අවසරය ලබා දී ඇති කිසිවක් වෙනත් ඕනෑම නීතියක විධිවිධාන සමඟ අනුකූල වීමේ අවශ්‍යතාවෙන් නිදහස් කිරීමක්, නිදොස් කිරීමක් හෝ බලයලත් වෙළෙඳුන් හෝ මෙම විධාන යටතේ විදේශ විනිමයෙන් ගනුදෙනු කරන වෙනත් ඕනෑම පුද්ගලයෙකු වැළැක්වීමක් ලෙස වටහා නොගත යුතුය.

7. මෙම විධානයන් **2021 මාර්තු 22** වන දින සිට බලපැවැත්වෙන පරිදි ක්‍රියාත්මක විය යුතුය.

අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව
2021 මාර්තු 18

2021 අංක 06 දරන විධානයන් සඳහා වන ඇමුණුම I

රාජ්‍යතාන්ත්‍රික රුපියල් ගිණුම් මෝටර් වාහන විකිණීමෙන් ලත් මුදල් බැර කිරීමේ දී ලබා ගත යුතු ලේඛන

i. විකුණුම්කරුගේ නමින් ලියාපදිංචි කළ මෝටර් වාහනයේ සහතිකය.

ii. මෝටර් වාහනයේ හිමිකාරීත්වය ගැනුම්කරුට පැවරුණු බව සනාථ කිරීමට ලේඛනමය සාක්ෂියක් වන මෝටර් වාහනයේ හිමිකාරීත්වය වෙනස් කිරීමේ ප්‍රකාශය.

iii. මෝටර් වාහනයේ මිල තහවුරු කරන ගැනුම්කරුගෙන් ලත් ලිපියක්.

iv. රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුවෙන් සිදු කළ බදු ඇගයීම.

v. මෝටර් වාහනය පැවරීමට බලය ලබා දීමට අදාළ රේඛීය අමාත්‍යාංශයෙන් ලත් ලිපියක්.

vi. රේගු දෙපාර්තමේන්තුව විසින් ගණනය කරන ලද රේගු බදු සහ වෙනත් ගාස්තු.

vii. රේගු දෙපාර්තමේන්තුව - භාණ්ඩ ප්‍රකාශ කිරීමේ පෝරමය.

viii. රේගු දෙපාර්තමේන්තුව - තක්සේරුකරණ වාර්තාව.

විදේශ විනිමය දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2021 අංක 07 දරන විධානයන්

ජ්‍යෙෂ්ඨ විදේශීය ජාතිකයන්ගේ - විශේෂ ගිණුම් පිළිබඳව බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්:

2021 අංක 05 දරන විදේශ විනිමය නියෝග (විදේශ විනිමය ගනුදෙනු සිදු කිරීම අරමුණු කර ගනිමින් විදේශ විනිමය ගිණුම් විවෘත කිරීම සහ පවත්වා ගෙන යාම) නියාමනය සහ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 6 සහ 7 වගන්ති සමග කියැවෙනු ලබන, 9 වගන්ති ප්‍රකාරව, ආගමන සහ විගමන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද "ශ්‍රී ලංකාව - මගේ සිහින නිවහන වැඩසටහන" යටතේ නේවාසික වීසා මත ශ්‍රී ලංකාවේ දිගු කාලයක් ගත කිරීමට කැමති වයස අවුරුදු 55 ට වඩා වැඩි වූ ජ්‍යෙෂ්ඨ විදේශීය ජාතිකයන් වෙනුවෙන් පහත දැක්වෙන ගිණුම් බලයලත් වෙළෙඳුන් හට ඔවුන්ගේ දේශීය බැංකු ඒකක හරහා විවෘත කිරීම සහ පවත්වාගෙන යාම සඳහා පහත දැක්වෙන කොන්දේසි වලට යටත්ව අවසර දී ඇත.

2. ගිණුම් වර්ග:

(අ) ජ්‍යෙෂ්ඨ විදේශිකයන්ගේ ස්ථාවර තැන්පතු ගිණුම විදේශීය මුදල් (SFNFDAs)

(ආ) ජ්‍යෙෂ්ඨ විදේශිකයන්ගේ රුපියල් ගිණුම (SFNRAs)

3. ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම

(අ) ජ්‍යෙෂ්ඨ විදේශිකයන්ගේ ස්ථාවර තැන්පතු ගිණුම, අවම වශයෙන් එක්සත් ජනපද ඩොලර් 15,000 ක් හෝ ඒ හා සමාන වෙනත් විදේශීය මුදල් වර්ගයකින් ස්ථාවර තැන්පතු ගිණුමක් ලෙස විවෘත කළ හැකිය. මෙම අවම තැන්පතුව, නේවාසික වීසා යටතේ අයදුම්කරු ශ්‍රී ලංකාවේ රැඳී සිටින කාලය පුරාවට පවත්වාගෙන යා යුතුය.

(ආ) ජ්‍යෙෂ්ඨ විදේශිකයන්ගේ රුපියල් ගිණුම, මාසික ප්‍රේෂණයන් ලෙස එක්සත් ජනපද ඩොලර් 1,500 ක් හෝ ඊට සමාන වෙනත් විදේශීය මුදලක් ප්‍රධාන අයදුම්කරු සඳහා සහ එක්සත් ජනපද ඩොලර් 750 ක් හෝ ඊට සමාන වෙනත් විදේශීය මුදලක් එක් එක් යැපෙන දරුවන් හෝ කලත්‍රයාට අදාළව ශ්‍රී ලංකාව තුළ ඔවුන්ගේ නඩත්තුව සඳහා ශ්‍රී ලංකා රුපියල් වලින්, ජංගම ගිණුමක් ලෙස විවෘත කිරීම සහ පවත්වාගෙන යාමට හැකිය.

4. ජ්‍යෙෂ්ඨ විදේශිකයන්ගේ ස්ථාවර තැන්පතු ගිණුම (SFNFDA)

4.1 අවසරලත් හර කිරීම්

(අ) අයදුම්කරු විසින් පහත සඳහන් එක් විධියකින් රට තුළට ගෙන එනු ලබන අවම මූලික තැන්පතුව වන එක්සත් ජනපද ඩොලර් 15,000 ක් හෝ ඊට සමාන වෙනත් විදේශීය මුදලක්

i. ගිණුම් හිමියන් වෙනුවෙන් බැංකු පද්ධතිය හරහා ශ්‍රී ලංකාවෙන් පිටත සිට විදේශීය විනිමය ලෙස ලැබෙන ප්‍රේෂණයන්

ii. ශ්‍රී ලංකාව තුළ ගත කිරීමට අවශ්‍ය නඩත්තු කටයුතු සඳහා, ගිණුම් හිමියා විසින් ප්‍රකාශයක් ලබාදීම මත ශ්‍රී ලංකාව තුළට රැගෙන එන විදේශ විනිමය

iii. එම ගිණුම් හිමියාගේම ආමුඛ, ආයෝජන ගිණුම්වලින් හෝ අක්වෙරළ බැංකු ඒකකයක පවත්වාගෙන යනු ලබන ගිණුම්වලින් සිදු කරනු ලබන මාරු කිරීම්

(ආ) ගිණුමේ රඳවනු ලැබූ අරමුදල් මත විදේශ ව්‍යවහාර මුදල්වලින් උපයාගත් පොළිය

4.2 අවසරලත් බැර කිරීම්

(අ) ගිණුම් හිමියා ශ්‍රී ලංකාව තුළ නැවතී සිටීම අත්හිටුවීමට තීරණය කරනු ලබන අවස්ථාවකදී, පිටත්වයාම සහතික කිරීම සඳහා ලේඛනගත සාක්ෂි ලබා ගැනීමෙන් පසුව පමණක්, ජ්‍යෙෂ්ඨ විදේශිකයන්ගේ ස්ථාවර තැන්පතු ගිණුම වෙතින් මුදල් ආපසු ගැනීමට අවසර ලබාදිය යුතුය. මුදල් පහත පරිදි නිකුත් කළ යුතුය.

i. ගිණුම් හිමියාගේ හෝ නම් කරන ලද තුන්වන පාර්ශවයකගේ නමින් ශ්‍රී ලංකාවෙන් පිටත පවත්වාගෙන යන ගිණුමක් සඳහා මුදල් ප්‍රේෂණය කිරීම්

ii. එක්සත් ජනපද ඩොලර් 10,000 ක් දක්වා විදේශ මුදල් නෝට්ටු වලින් සිදු කරන ආපසු ගැනීම්

(ආ) ජ්‍යෙෂ්ඨ විදේශිකයන්ගේ ස්ථාවර තැන්පතු ගිණුම මත උපයාගත් පොළිය ගිණුම් හිමියාගේ ජ්‍යෙෂ්ඨ විදේශිකයන්ගේ රුපියල් ගිණුම වෙත මාරු කිරීම්.

5. ජ්‍යෙෂ්ඨ විදේශිකයන්ගේ රුපියල් ගිණුම (SFNRAs)

5.1 අවසරලත් හර කිරීම්

(අ) ගිණුම් හිමියා වෙනුවෙන් බැංකු පද්ධතිය හරහා ශ්‍රී ලංකාවෙන් පිටත සිට විදේශ විනිමය ලෙස ලැබුණු ප්‍රේෂණයන් හෝ ඉහත 3(ආ) ඡේදයේ අවශ්‍යතාවය පරිදි ගිණුම් හිමියා විසින්, ශ්‍රී ලංකාව තුළ ගත කිරීමට අවශ්‍ය නඩත්තු කටයුතු සඳහා ශ්‍රී ලංකාවට රැගෙන එන ලද විදේශ විනිමය

(ආ) ඡේද අංක 4.2(ආ) හි දක්වා ඇති පරිදි ගිණුම් හිමියාගේ ජ්‍යෙෂ්ඨ විදේශිකයන්ගේ ස්ථාවර තැන්පතු ගිණුමෙහි ඇති අරමුදල් මත ගෙවන ලද පොළිය, ශ්‍රී ලංකා රුපියල්වලට හැරවීමෙන්

5.2 අවසරලත් බැර කිරීම්

(අ) ගිණුම් හිමියා හෝ ශ්‍රී ලංකාවේ සිටින ඔහුගේ යැපෙන්නන්, ශ්‍රී ලංකා රුපියල්වලින්, ශ්‍රී ලංකාව තුළ කරනු ලබන වියදම්

(ආ) ගිණුම් හිමියා හෝ ශ්‍රී ලංකාවේ සිටින ඔහුගේ යැපෙන්නන්ගේ ජංගම ගනුදෙනු සම්බන්ධ ගෙවීම් සඳහා සිදු කරනු ලබන ප්‍රේෂණ

6. මාසික වාර්තා

(අ) බලයලත් වෙළෙඳුන් විසින් **ඇමුණුම** I සහ **ඇමුණුම** II හි පරිදි මාසික පදනමින් සකස් කළ වාර්තා එළඹෙන මාසයේ 15 වන දින හෝ ඊට ප්‍රථම dfem@cbsl.lk යන විද්‍යුත් ලිපිනය හරහා මෙම දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය.

(ආ) ඉහත වාර්තා සැපයීම සඳහා අදාල තොරතුරු බැංකුවල ගිණුම් පොත්වලින් උත්පාදනය/උපුටා ගැනීම පිණිස බලයලත් වෙළෙඳුන් විසින් බැංකුව තුළ නිසි පද්ධතියක් ක්‍රියාත්මක කිරීම අවශ්‍ය කෙරේ.

7. මෙම විධානයන් යටතේ විශේෂ ගිණුම් විවෘත කිරීමට සුදුසුකම් ලබන පුද්ගලයන් බැංකු පද්ධතිය තුළ ජ්‍යෙෂ්ඨ විදේශිකයන්ගේ ස්ථාවර තැන්පතු ගිණුම් සහ ජ්‍යෙෂ්ඨ විදේශිකයන්ගේ රුපියල් ගිණුම් එකක් පමණක් පවත්වාගෙන යා යුතු අතර, මෙම ගිණුම් කැටුව එන යැපෙන්නන් සමග අනුගාමිකව බද්ධ ගිණුම් ලෙස තබා ගැනීමට ඉඩකඩ පවතී.

8. බලයලත් වෙළෙඳුන් හට මෙම විධානයන්හි විෂය පථයට අයත් නොවන ඕනෑම අරමුණක් සඳහා ජ්‍යෙෂ්ඨ විදේශිකයන්ගේ ස්ථාවර තැන්පතු ගිණුම් හෝ ජ්‍යෙෂ්ඨ විදේශිකයන්ගේ රුපියල් ගිණුම් වෙත/වෙතින් කරන ඕනෑම ගනුදෙනුවක්/මාරු කිරීමක් සඳහා යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරන නියෝජිත ආයතනයේ හා විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂතුමාගේ පූර්ව අනුමැතිය ලබාගැනීමට අවශ්‍ය වේ.

9. මෙම විධානයන්හි කාර්යයන් සඳහා

(අ) **"ප්‍රේෂණ"** යන්නට විදුලි පණිවුඩ හුවමාරු, වෙනත් අන්තර් බැංකු හුවමාරු, බැංකු අණකර, වෙනත් ගෙවීම් උපකරණ, ජාත්‍යන්තරව පිළිගත් වෙනත් ගෙවීම් යාන්ත්‍රණ හරහා ලැබුණු ගෙවීම්, ව්‍යාවහාර මුදල් නෝට්ටු හැර විදේශයකින් විදේශ ව්‍යවහාර මුදල්වලින් විනිමය සමාගම් වලින්/නිවාසවලින් ලැබුණු විදේශ විනිමය අරමුදල් ඇතුළත් වේ.

(ආ) **"ප්‍රකාශ කිරීම"** යනු එක්සත් ජනපද ඩොලර් 15,000 (හෝ වෙනත් විදේශ ව්‍යවහාර මුදල්වලින් ඊට සමාන අගයක්) ඉක්මවන විට රේගු දෙපාර්තමේන්තුවට ප්‍රකාශ කිරීම හෝ එම විදේශ විනිමය එක්සත් ජනපද ඩොලර් 15,000 සමාන හෝ අඩු වන විට (හෝ වෙනත් විදේශ ව්‍යවහාර මුදල්වලින් ඊට සමාන අගයක්) බලයලත් වෙළෙන්දෙකු හට සුදුසු පරිදි කරන ප්‍රකාශනයක් වේ.

(ඇ) ජංගම ගනුදෙනු යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දක්වා ඇති අර්ථයට සමාන වේ.

10. ජ්‍යෙෂ්ඨ විදේශිකයන්ගේ ස්ථාවර තැන්පතු ගිණුම් සහ ජ්‍යෙෂ්ඨ විදේශිකයන්ගේ රුපියල් ගිණුම් සම්බන්ධ අවශ්‍යතාවයන් නිශ්චිකව දක්වමින් 2017 නොවැම්බර් 20 දිනැති 2017 අංක 07 දරන විධාන යටතේ බලයලත් වෙළෙන්දන් හට නිකුත් කරන ලද විධාන මෙමගින් අවලංගු කරනු ලැබේ.

11. ඉහත 10 ඡේදයේ සඳහක් පරිදි කලින් විදානයන් අවලංගුවීම, එහි අවලංගුවීමට ප්‍රථම ලබාගත් හිමිකම් හෝ අය වූ දඩමුදල් හෝ වගකීම් වෙනුවෙන් බලපෑමක් සිදු නොකරනු ලබයි.

12. මෙම විධාන මගින් අවසරය ලබා දී ඇති කිසිවක්, බලයලත් වෙළඳුන් හෝ මෙම විධාන යටතේ විදේශ විනිමයෙන් ගනුදෙනු කරන වෙනත් ඕනෑම පුද්ගලයෙක්, වෙනත් ඕනෑම නීතියක විධිවිධාන සමඟ අනුකූල වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීමක්, නිදොස් කිරීමක් හෝ වැලලලැක්වීමක් ලෙස වටහා නොගත යුතුය.

13. මෙම විධානයන් 2021 මාර්තු 22 වන දින සිට බල පැවැත්වෙන පරිදි ක්‍රියාත්මක විය යුතුය.

අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තුමේන්තුව
2021 මාර්තු 18

2021 අංක 7 දරණ විධානයන් හි ඇමුණුම I

ජ්‍යෙෂ්ඨ විදේශිකයන්ගේ ස්ථාවර තැන්පතු ගිණුම පිළිබඳ මාසික ප්‍රකාශනය

බැංකුවේ නම : .....

වාර්තා කරන මාසය හා වර්ෂය : .....

ඇ.එ.ජ.ඩොලර් වලින්

ගිණුම් හිමියාගේ නම	ගිණුම් අංකය	මුදල් වර්ගය	මූලික තැන්පතුව		ප්‍රතිමුබ ප්‍රේෂණ	රටින් බැහැරව යන අවස්ථාවේදී ආපසු ගැනීම්	පොළිය ඉපැයීම්	ජ්‍යෙෂ්ඨ විදේශිකයන්ගේ රුපියල් ගිණුමට පොළිය මාරු කිරීම්	වෙනත්	අවසාන ශේෂය
			දිනය	ප්‍රමාණය						

බලයලත් වෙළෙඳුන් විසින් වාර්තාවේ ස්කෑන් පිටපත සහ එහිම MS Excell අනුවාදය යන දෙකම සැපයිය යුතුය.

බැංකුවේ ගිණුම් පොත්වලින් උපුටාගත්/උත්පාදනය කරන ලද ඉහත තොරතුරු නිවැරදි බව අපි සහතික කරමු.

බලයලත් නිලධාරියාගේ නම සහ තනතුර : ..... අනුකූලතා නිලධාරියාගේ නම : .....

අත්සන සහ නිල මුද්‍රාව ..... අත්සන : .....

දිනය : ..... දිනය : .....

2021 අංක 7 දරණ විධානයන් ඇමුණුම II

ජ්‍යෙෂ්ඨ විදේශිකයන්ගේ රුපියල් ගිණුම පිළිබඳ මාසික ප්‍රකාශනය

බැංකුවේ නම : .....

වාර්තා කරන මාසය සහ වර්ෂය : .....

ගිණුම් හිමියාගේ නම	ගිණුම් අංකය	මුදල් වර්ගය	මාසයේ මුල ආරම්භක ශේෂය	බැර			හර			අවසන් ශේෂය
				ආමුබ ප්‍රේෂණ/ තැන්පතු	ජ්‍යෙෂ්ඨ විදේශිකයන්ගේ ස්ථාවර තැන්පතු ගිණුමන් අරමුදල්/පොළිය හුවමාරු කිරීම	වෙනත්	ජංගම ගනු දෙනු සඳහා ගෙවීම්	දේශීය වියදම්	වෙනත්	

බලයලත් වෙළෙඳුන් විසින් වාර්තාවේ ස්කෑන් පිටපත සහ එහිම MS Excell අනුවාදය යන දෙකම සැපයිය යුතුය.

බැංකුවේ ගිණුම් පොත්වලින් උපුටාගත්/උත්පාදනය කරන ලද ඉහත තොරතුරු නිවැරදි බව අපි සහතික කරමු.

බලයලත් නිලධාරියාගේ නම සහ තනතුර : .....

අත්සන සහ නිල මුද්‍රාව : .....

දිනය : : .....

අනුකූලතා නිලධාරියාගේ නම : .....

අත්සන : .....

දිනය : .....

විදේශ විනිමය දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා මහ බැංකුව

2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2021 අංක 08 දරන විධානයන්

නේවාසික ආගන්තුකයින් සඳහා වන යෝජනා ක්‍රමය - (විශේෂිත ගිණුම්) පිළිබඳව බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ වගන්ති 6 සහ 7 සමග කියවනු ලබන, 9 වගන්තිය ප්‍රකාරව, ආගමන සහ විගමන දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරන ලද "නේවාසික ආගන්තුකයින් පිළිබඳව වන යෝජනා ක්‍රමය" යටතේ ශ්‍රී ලංකාවට පැමිණෙන අනාගත ආයෝජකයින් හා වෘත්තිකයන් සඳහා පහත සඳහන් කොන්දේසිවලට යටත්ව මතු දැක්වෙන ගිණුම් දේශීය බැංකු ඒකකයන් තුල විවෘත කිරීමට හා පවත්වාගෙන යාමට බලයලත් වෙළෙඳුන් වෙත මෙයින් අවසර දෙනු ලැබේ.

2. විශේෂිත ගිණුම් වර්ග

(අ) නේවාසික ආගන්තුක විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (RGFCAs)

(ආ) නේවාසික ආගන්තුක රුපියල් ජංගම ගිණුම ආයෝජකයන් (RGFCAs - Investors)

(ඇ) නේවාසික ආගන්තුක රුපියල් ජංගම ගිණුම වෘත්තිකයන් (RGRCAs - Professional)

3. ගිණුම් විවෘත කිරීම් සහ පවත්වාගෙන යාම්

(අ) නේවාසික ආගන්තුක විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (RGFCAs)

ආයෝජකයන් ශ්‍රී ලංකාවේ ආයෝජනය සඳහා එක්සත් ජනපද ඩොලර් (එ.ජ.ඩො) 250,000 ක අවම මූලික තැන්පතුවක් හෝ ඊට සමාන වෙනත් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් ප්‍රමාණයක ස්ථිර තැන්පතු ගිණුමක් විවෘත කළයුතුය.

(ආ) නේවාසික ආගන්තුක රුපියල් ජංගම ගිණුම් ආයෝජකයින් (RGRCAs - Investors)

ආයෝජකයන් හට ඔහු හා ඔහු කැටුව එන සෑම යැපෙන්නෙක්ගේ (සහකරු හෝ සහකාරියද ඇතුලත්ව) ශ්‍රී ලංකාව තුල වියදම් (නඩත්තු) සඳහා එක් පුද්ගලයෙකුට අවම වශයෙන් එක්සත් ජනපද ඩොලර් (එ.ජ.ඩො) 35,000 ක හෝ ඊට සමාන වෙනත් නම් කරන ලද විදේශ මුදල් ප්‍රමාණයක්, ශ්‍රී ලංකා රුපියල් බවට හරවා ජංගම ගිණුම් විවෘත කර පවත්වාගෙන යා හැකිය.

(ඇ) නේවාසික ආගන්තුක රුපියල් ජංගම ගිණුම් වෘත්තිකයන් (RGRCA - Professionals)

ශ්‍රී ලංකාවේ නේවාසිකයෙකු වීමට අදහස් කරන වෘත්තිකයන් හට ශ්‍රී ලංකාවේදී සිය ජීවන වියදම් වශයෙන් මාසිකව එක්සත් ජනපද ඩොලර් (එ.ජ.ඩො) 2000 ක් හෝ ඊට සමාන වෙනත් නම් කරන ලද විදේශ මුදල් ප්‍රමාණයක් සහ තවදුරටත් එකී වෘත්තියා කැටුව එන සෑම යැපෙන්නෙක්ගේ ජීවන වියදම සඳහාම (සහකරු හෝ සහකාරිය ඇතුළත්ව) මාසිකව එක්සත් ජනපද ඩොලර් 1000 ක් හෝ ඊට සමාන වෙනත් නම් කරන ලද විදේශ මුදල් ප්‍රමාණයක් ජංගම ගිණුම් ගතකොට ශ්‍රී ලංකා රුපියල්වලින් පවත්වා ගෙන යා හැකිය.

4. නේවාසික ආගන්තුක විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (RGFCAs)

4.1 අවසරලත් බැර කිරීම්

(අ) ගිණුම් හිමියා වෙනුවෙන් බැංකු පද්ධතිය හරහා ශ්‍රී ලංකාවට පිටතින් ප්‍රේෂණය කරන ලද විදේශ විනිමය

(ආ) ගිණුම් හිමියා විසින් ප්‍රකාශ කොට මෙරටට ප්‍රේෂණය කරන ලද විදේශ විනිමය

(ඇ) ගිණුම්වල ඇති භාවිතයට නොගත් ශේෂයන් සඳහා මූලික වශයෙන් වසර 02 කාලයක් සඳහා වන පොළිය. (ක්‍රියාත්මක කිරීමට බලයලත් ආයතනයක පූර්ව අනුමැතිය නොමැතිව මුල් වසර දෙක අවසන් වීමෙන් පසු පොළී ගෙවීම සිදු නොකළ යුතුය.)

4.2 අවසරලත් හර කිරීම්

(අ) අදාල අවසරය ලබාගත් බවට ලේඛන ගත සාක්ෂි ඉදිරිපත් කිරීමට යටත්ව, පහත දැක්වෙන "අනුමාන ව්‍යාපෘතීන්හි" ආයෝජනය කිරීම සඳහා අරමුදල් ආපසු ලබා ගැනීම.

i. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය හෝ අදාල අධිකාරියක් විසින් අනුමත නව ව්‍යාපාර

ii. අදාල අධිකාරිය විසින් අනුමත කර ඇති ව්‍යාපෘතීන්හි නියැලෙන, පවත්නා හෝ නව සමාගම්

iii. කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කොටස්

(ආ) මෙරටට රැගෙනවිත් භාවිතා නොකොට එම ගිණුමෙහිම රඳවා තිබූ එක්සත් ජනපද ඩොලර් 250,000 ක් හෝ ඊට සමාන වෙනත් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් ප්‍රමාණයන් ඉක්මවා පවතින ශේෂය එම ආයෝජකයාගේ නමට ශ්‍රී ලංකාවට පිටත ඇති ගිණුමකට මාරු කිරීම.

(ඇ) ඉහත 4.2 (ආ) පරිච්ඡේදයේ ප්‍රකාශ කොට ඇති පරිදි ආයෝජනය නොකොට එම ගිණුමෙහිම රඳවා තිබූ මුදල් සඳහා උපයනු ලැබූ පොළිය එම ආයෝජකයාගේම, නේවාසික ආගන්තුක රුපියල් ජංගම ගිණුමට (සෘධසෘඪ්) මාරු කිරීම.

5. නේවාසික ආගන්තුක රුපියල් ජංගම ගිණුම් - (RGRCAs -ආයෝජකයන්)

5.1 අවසරලත් බැර කිරීම්

(අ) ශ්‍රී ලංකාව තුළ ජීවන වියදම් සඳහා ආයෝජකයා සහ ඔහු කැටුව එන සෑම යැපෙන්නෙක් සඳහාම ඉහත 3(ආ) පරිච්ඡේදයේ අවශ්‍ය යැයි සඳහන් පරිදි බැංකු පද්ධතිය හරහා මෙරටට ප්‍රේෂණය කළ හෝ සුදුසු පරිදි ප්‍රකාශ කොට මෙරටට ගෙන එනු ලැබූ විදේශ විනිමයවල ශ්‍රී ලංකා රුපියල් අගයන්

(ආ) ඉහත 4.2 (ඇ) ඡේදයේ සඳහන් පරිදි ආයෝජකයන්ගේ නේවාසික ආගන්තුක විදේශ ව්‍යවහාර මුදල් ගිණුමේ (RGFCA) අරමුදල් මත ගෙවන ලද රුපියල් බවට පරිවර්තනය කරන ලද පොළී

(ඇ) නේවාසික ආගන්තුක විදේශ ව්‍යවහාර මුදල් ගිණුමේ අරමුදල් භාවිතා කරමින් අත්පත් කරගත් ආයෝජන විකිණීමෙන් ලද මුදල් සහ ආදායම් (ලාභාංශ, ලාභ)

5.2 අවසරලත් හර කිරීම්

(අ) ආයෝජකයන්ගේ සහ ඔහුගේ යැපෙන්නන්ගේ ශ්‍රී ලංකාව තුල ශ්‍රී ලංකා රුපියල් වලින් සිදු කරන දේශීය වියදම්

(ආ) ඉහත 4.2 (අ) ඡේදයේ සඳහන් අනුමාන ව්‍යාපෘතීන්හි සිදු කරන ආයෝජනයන්

(ඇ) ආයෝජකයාගේ හෝ ශ්‍රී ලංකාවේ නේවාසික ඔහුගේ යැපෙන්නන්ගේ ජංගම ගනුදෙනු සඳහා කරනු ලබන ප්‍රේෂණයන්

6. නේවාසික ආගන්තුක රුපියල් ජංගම ගිණුම් - වෘත්තිකයන් (RGRCAs - වෘත්තිකයන්)

6.1 අවසරලත් බැර කිරීම්

(අ) ශ්‍රී ලංකාව තුල ජීවන වියදම් සඳහා වෘත්තිකයා සහ ඔහු කැටුව එන සෑම යැපෙන්නෙක් සඳහාම ඉහත 3(ඇ) පරිච්ඡේදයේ අවශ්‍ය යැයි සඳහන් පරිදි බැංකු පද්ධතිය හරහා මෙරටට ප්‍රේෂණය කළ හෝ සුදුසු පරිදි ප්‍රකාශ කොට මෙරටට ගෙන එනු ලැබූ විදේශ විනිමයවල ශ්‍රී ලංකා රුපියල් අගයන්.

(ආ) ගිණුම් හිමියා විසින් ශ්‍රී ලංකාවේදී සිදු කරන ලද වාත්තීමය සේවා වෙනුවෙන් ලද වැටුප්, උපදේශක සේවා ගාස්තු යනාදිය.

6.2 අවසරලත් හර කිරීම්

(අ) ගිණුම්හිමියා සහ ඔහුගේ යැපෙන්නන්ගේ ශ්‍රී ලංකාව තුළ ශ්‍රී ලංකා රුපියල්වලින් සිදු කරන දේශීය වියදම්

(ආ) වෘත්තිකයා හෝ ඔහුගේ ශ්‍රී ලංකාවේ නේවාසික යැපෙන්නන් ජංගම ගනුදෙනු සඳහා කරනු ලබන ප්‍රේෂණයන්

(ඇ) ශ්‍රී ලංකාවෙන් පිටව යන විට, භාවිතා නොකොට ගිණුමේ පවතින අරමුදල් ආපසු ගැනීම හෝ එවැනි අරමුදල් වෘත්තිකයාගේම නමට ඇති ශ්‍රී ලංකාවෙන් පිටත ගිණුමකට මාරු කිරීම.

7. (අ) බලයලත් වෙළෙඳුන් විසින් "නේවාසික ආගන්තුක විදේශ ව්‍යවහාර මුදල් ගිණුම" සහ "නේවාසික ආගන්තුක රුපියල් ජංගම ගිණුම් ආයෝජකයන්" යන ගිණුම් සඳහා ඇමුණු I සහ II පරිදි කාර්තුමය වාර්තා සෑම කාර්තුවක්ම ඉකුත්වී දින 15 ක් ඇතුළත සහ "නේවාසික ආගන්තුක රුපියල් ජංගම ගිණුම් වෘත්තියන්" ගිණුම් සඳහා මාසික වාර්තා ඇමුණුම III පරිදි සෑම මසක්ම ඉකුත්වී දින 15 ඇතුලත dfem@cbsl.lk යන විද්‍යුත් ලිපිනය හරහා එවිය යුතුය.

(ආ) ඉහත වාර්තා කිරීමේ අවශ්‍යතාවන් අනුව, අදාල බලයලත් වෙළෙඳුන් විසින් බැංකුව තුල අදාල තොරතුරු ගිණුම් පොත් වලින් ව්‍යුත්පන්න කිරීමට හෝ උකහා ගැනීමට හැකි පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වේ.

8. මෙකී විධානයන්හි සඳහන් විෂය පථයට අයත් නොවන ඕනෑම අරමුණක් සඳහා නේවාසික ආගන්තුක විදේශ ව්‍යවහාර මුදල් ගිණුම, නේවාසික ආගන්තුක රුපියල් ජංගම ගිණුම ආයෝජකයන් හෝ නේවාසික ආගන්තුක රුපියල් ජංගම ගිණුම වෘත්තිකයන් වෙත/වෙතින් කරන ඕනෑම ගනුදෙනුවක්/හුවමාරුවක් කිරීම සඳහා යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරන නියෝජිත ආයතනය හා සමගාමීව, බලයලත් වෙළෙඳුන් විසින් විදේශ විනිමය අධ්‍යක්ෂ තුමාගේ පූර්ව අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය වේ.

9. මෙම විධානයන්හි අරමුණු සඳහා,

(අ) **"ප්‍රේෂණ"** ලෙසට විදුලි මුදල් මාරුව (ටෙලි ග්‍රෑෆික් ට්‍රාන්ෆර්), අනෙකුත් අන්තර බැංකු මුදල් හුවමාරු, බැංකු අණකර, අනෙකුත් ගෙවීමේ මෙවලම්, අන්තර්ජාතික ලෙස පිළිගැනෙන ගෙවීම් ක්‍රමවේදයන් හෝ පද්ධතීන් තුලින් සිදු කරන ගෙවීම් සහ මුදල් හුවමාරු සමාගම්/හුවමාරු නිවාස තුලින් පිටරට සිට ලැබෙන අරමුදල් අඩංගු වියහැකි අතර මේ සඳහා නෝට්ටුමය මුදල් අඩංගු නොවේ.

(ආ) **"ප්‍රකාශ කිරීම"** යනුවෙන් ඇමරිකන් එක්සත් ජනපද ඩොලර් 15,000 ඉක්මවන විට (හෝ ඊට සමාන වෙනත් නම් කරන ලද විදේශ ව්‍යවහාර විදේශ මුදල් ප්‍රමාණයක්) රේගු දෙපාර්තමේනතුවට ප්‍රකාශ කිරීම හෝ, ඇමරිකන් එක්සත් ජනපද ඩොලර් 15,000 ට සමාන හෝ අඩු වන විට (හෝ ඊට සමාන වෙනත් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් ප්‍රමාණයක්) බලයලත් වෙළෙන්දෙකුට සුදුසු පරිදි ප්‍රකාශ කිරීම අදහස් වේ.

(ඇ) **"ජංගම ගනුදෙනු"** යනුවෙන් 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දක්වා ඇති අර්ථයම අදහස් වේ.

10. නේවාසික ආගන්තුක යෝජනා ක්‍රමයේ විශේෂිත ගිණුම සම්බන්ධ අවශ්‍යතාවයන් නිශ්චිතව සඳහන් කරමින් බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලැබූ 2017 නොවැම්බර් 20 දිනැති 2017 අංක 06 දරන විධානයන් මෙමගින් අවලංගු කරනු ලැබේ.

11. ඉහත 10 ඡේදය සඳහන් පරිදි කලින් විධානයන් අවලංගුවීම, එකී අවලංගු වීමට ප්‍රථම ලබාගත් හිමිකම් හෝ අය වූ දඩමුදල් හෝ වගකීම් වෙනුවෙන් බලපෑමක් සිදු නොකරනු ලබයි.

12. මෙම විධාන මගින් අවසරය ලබා දී ඇති කිසිවක්, බලයලත් වෙළඳුන් හෝ මෙම විධාන යටතේ විදේශ විනිමයෙන් ගනුදෙනු කරන වෙනත් ඕනෑම පුද්ගලයෙක්, වෙනත් ඕනෑම නීතියක විධිවිධාන සමඟ අනුකූල වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීමක්, නිදොස් කිරීමක් හෝ වැලැක්වීමක් ලෙස වටහා නොගත යුතු ය.

13. මෙම විධානයන් **2021 මාර්තු 22** වන දින සිට බලපැවැත්වෙන පරිදි ක්‍රියාත්මක විය යුතු ය.

අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තුමේන්තුව
2021 මාර්තු 18

2021 අංක 08 දරන විධානයන්හි ඇමුණුම I

නේවාසික ආගන්තුක විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වල (RGFCA) කාර්තුමය ප්‍රකාශය

බැංකුවේ නම:.....

වාර්තා කිරීමේ කාර්තුව සහ වර්ෂය:.....

ගිණුම් හිමියාගේ නම	ව්‍යවහාර මුදල	ආරම්භක තැන්පතුව		ආරම්භක ශේෂය	බැර			හර				අවසන් ශේෂය
		දිනය	අගය		ආමුඛ ප්‍රේෂණ/ තැන්පතු	බැර කළ පොලිය	වෙනත්	භාවිත නොකළ/ අතිරික්ත අරමුදල් පැවරුම	අනුමත කළ ආයෝජන සඳහා අරමුදල් ආපසු ගැනීම	RGFCA වෙත පැවරුම්	වෙනත්	

බලයලත් වෙළෙඳුන් විසින් වාර්තාවේ පරිලෝකිත පිටපත සහ ඉහත දක්වා ඇති පරිදි ම එහි මයික්‍රොසොෆ්ට් එක්සෙල් ආකාරයේ පිටපත යන දෙකම ලබා දිය යුතුය.

බැංකුවේ ගිණුම් පොත්වලින් උකහා ගත්/ ජනනය කළ ඉහත තොරතුරු නිරවද්‍ය බවට මම සහතික කරමි.

බලයලත් නිලධාරියාගේ නම සහ තනතුර:.....

අත්සන සහ මුද්‍රාව:.....

දිනය:.....

අනුකූලතා නිලධාරියාගේ නම:.....

අත්සන:.....

දිනය:.....

2021 අංක 08 දරන විධානයන්හි ඇමුණුම II

නේවාසික ආගන්තුක රුපියල් ජංගම ගිණුම් - කාර්තුමය ප්‍රකාශය - (RGRCAs -ආයෝජකයන්)

බැංකුවේ නම:.....

වාර්තා කිරීමේ කාර්තුව සහ වර්ෂය:..... රු. වලින්

ගිණුම් හිමියාගේ නම	ගිණුම් අංකය	ආරම්භක තැන්පතුව		ආරම්භක ශේෂය	බැර					හර			අවසන් ශේෂය
		දිනය	අගය		එ.ජ.ඩො. 35,000ක ආරම්භක අගය සඳහා ආමුඛ ප්‍රේෂණ/ තැන්පතු	ගිණුම් හිමියාගේ සහ ඔහුගේ යැපෙන්නන්ගේ ජීවන වියදම් සඳහා ආමුඛ ප්‍රේෂණ/ තැන්පතු	RGFCA වෙතින් පැවරුම්	ආයෝජන වලින් උපයා ගත් ආදායම	වෙනත්	දේශීය ආයෝජන	ජංගම ගනු-දෙනු සඳහා ගෙවීම්	වෙනත්	

බලයලත් වෙළෙඳුන් විසින් වාර්තාවේ පරිලෝකිත පිටපත සහ ඉහත දක්වා ඇති පරිදි ම එහි මයික්‍රොසොෆ්ට් එක්සෙල් ආකාරයේ පිටපත යන දෙකම ලබා දිය යුතුය.

බැංකුවේ ගිණුම් පොත්වලින් උකහා ගත්/ ජනනය කළ ඉහත තොරතුරු නිරවද්‍ය බවට මම සහතික කරමි.

බලයලත් නිලධාරියාගේ නම සහ තනතුර:.....

අත්සන සහ මුද්‍රාව:.....

දිනය:.....

අනුකූලතා නිලධාරියාගේ නම:.....

අත්සන:.....

දිනය:.....

2021 අංක 08 දරන විධානයන්හි ඇමුණුම III

නේවාසික ආගන්තුක රුපියල් ජංගම ගිණුම් මාසික ප්‍රකාශය - (RGRCAs - වෘත්තිකයන්)

බැංකුවේ නමඃ.....

වාර්තා කිරීමේ මාසය සහ වර්ෂයඃ.....

ගිණුම් හිමියාගේ නම	ගිණුම් අංකය	ආරම්භක ශේෂය	බැර				හර				අවසන් ශේෂය
			එ.ජ.ඩො. 2,000ක ආරම්භක අගය සඳහා ආමුබ ප්‍රේෂණ/ තැන්පතු	ගිණුම්හිමියාගේ සහ ඔහුගේ යැපෙන්නන්ගේ ජීවන වියදම් සඳහා ආමුබ ප්‍රේෂණ/ තැන්පතු	ලංකාවෙහි ලැබෙන ඉපැයීම්	වෙනත්	දේශීය විය-පැහැදම්	ජංගම ගනු-දෙනු සඳහා ගෙවීම්	භාවිත නොකළ ඕනෑම අරමුදල් ආපසු ගැනීම/ පැවරුම්	වෙනත්	

බලයලත් වෙළෙඳුන් විසින් වාර්තාවේ පරිලෝකිත පිටපත සහ ඉහත දක්වා ඇති පරිදි ම එහි මයික්‍රොසොෆ්ට් එක්සෙල් ආකාරයේ පිටපත යන දෙකම ලබා දිය යුතුය.

බැංකුවේ ගිණුම් පොත්වලින් උකහා ගත්/ ජනනය කළ ඉහත තොරතුරු නිරවද්‍ය බවට මම සහතික කරමි.

බලයලත් නිලධාරියාගේ නම සහ තනතුරඃ..... අනුකූලතා නිලධාරියාගේ නමඃ.....

අත්සන සහ මුද්‍රාවඃ..... අත්සන ඃ.....

දිනයඃ..... දිනයඃ.....

විදේශ විනිමය දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා මහ බැංකුව

2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2021 අංක 09 දරන විධානය

ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හිමියන් සඳහා වූ ණය පහසුකම් සම්බන්ධයෙන් බලයලත් වෙළඳුන් වෙත නිකුත් කරන ලද විධානයන්

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 9 වන වගන්තිය අනුව, පහත සඳහන් කොන්දේසි වලට යටත්ව, ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හිමියන් (ණය ගනුදෙනුකරුවන් ලෙස මින් මතුවට හැඳින්වෙන) වෙත දේශීය බැංකු ඒකක තුළින් විදේශීය ව්‍යවහාර මුදලින් ණය පහසුකම් සලසා දීම සඳහා බලයලත් වෙළඳුන් හට අවසර දෙනු ලැබේ.

2. ණය පහසුකම් ලබා දීම සඳහා අරමුණු

2.1 ශ්‍රී ලංකාවේ ඕනෑම අරමුණක් සඳහා භාවිත කිරීම සඳහා.

2.2 ණය ගනුදෙනුකරුගේ ජංගම ගනුදෙනු සම්බන්ධයෙන් ගෙවීම් කිරීම සඳහා.

3. ණය සේවාකරණය නිසි වේලාවට සම්පූර්ණ කිරීම සඳහා දෛනික ව්‍යාපාර කටයුතු වල දී නිරන්තර විදේශ විනිමය ප්‍රවාහ ණය ගනුදෙනුකරු වෙත හිමිවන බව, බලයලත් ගනුදෙනුකරුගේ තෘප්තියට සෑහෙන අයුරින්, තහවුරු කළ හැකි විදේශ විනිමය උපයන්නන් වන ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හිමියන් සඳහා පමණක් ණය පහසුකම් ලබා දිය යුතු වේ.

4 බලයලත් වෙළඳුන් විසින් විශේෂයෙන් ම, පවතින හෝ අපේක්ෂිත විදේශ විනිමය ලැබීම් තුළින් එවැනි පහසුකම් සේවාකරණය සඳහා ව්‍යාපාරික විදේශ ව්‍යවහාර ගිණුම් හිමියන් සඳහා ඇති හැකියාව ඇතුළුව ණය අවදානම විචක්ෂණශීලීව තක්සේරු කළ යුතු අතර, ඔවුන්ගේ තක්සේරුව සඳහා අවශ්‍ය වාර්තා පවත්වා ගත යුතු වේ.

5. ණය මුදල් මුදා හැරීම/ බැර කිරීම අරමුණු කරගනිමින් ණය ගනුදෙනුකරුගේ නමින් "ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ණය ගිණුමක්" විවෘත කළ යුතු වේ. විදේශ ව්‍යවහාර මුදල් ණය ගිණුමේ හර කිරීම් සහ බැර කිරීම් පහත සඳහන් කරුණු සඳහා සීමා විය යුතු වේ.

5.1 අවසරලත් බැර කිරීම්

අ. මෙම විධානයන්ගේ නියමයන් අනුව බලයලත් වෙළඳුන් විසින් විදේශ ව්‍යවහාර මුදලින් මුදා හරින ලද ණය පහසුකම්හී අරමුදල්.

ආ. මෙම විධානයන් යටතේ ණය සේවාකරණය/ ණය පහසුකම් ආපසු ගෙවීම සඳහා ණය ගනුදෙනුකරුගේ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකින් හෝ අක්වෙරළ බැංකු ඒකකයේ පවත්වාගෙන යනු ලබන ගිණුමකින් අරමුදල් මාරු කිරීම.

ඇ. ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හිමියෙකු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත වාසික තැනැත්තෙකුගෙන් කෙටි කාලීන ණය මුදලක් ලබා ගෙන ඇති අවස්ථාවකදී (උදා: ණය ලබාදෙන්නා); ණය අරමුදල් වන ආමුබ ප්‍රේෂණ හෝ ණය ලබා දෙන්නාගේ ආමුබ ආයෝජන ගිණුමකින් හෝ අක්වෙරළ බැංකු ඒකකයේ පවත්වාගෙන යන ගිණුමකින් අරමුදල් මාරු කිරීම.

5.2 අවසරලත් හර කිරීම්

අ. ණය ගනුදෙනුකරුගේ ජංගම ගනුදෙනු සම්බන්ධයෙන් වන ප්‍රතිමුබ ප්‍රේෂණ.

ආ. මෙම විධානයන් යටතේ ලබා ගත් ණය පහසුකම් ආපසු ගෙවීම.

ඇ. මෙම විධානයන්ගේ සඳහන් 5.1.ඇ. වගන්තියෙහි සඳහන් අයුරින් ලබා ගත් ණය සේවාකරණය/ ආපසු ගෙවීම සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත පවත්වාගෙන යනු ලබන ගිණුමකට ප්‍රේෂණය/ ණය ලබාදෙන්නාගේ ආමුබ ආයෝජන ගිණුමකට හෝ අක්වෙරළ බැංකු ඒකකයේ පවත්වාගෙන යනු ලබන ගිණුමකට අරමුදල් මාරු කිරීම.

ඈ. ණය ගනුදෙනුකරු අක්වෙරළ බැංකු ඒකකයෙන් ලබා ගත් අනිකුත් ණය පහසුකම් පියවීම සඳහා ණය ගනුදෙනුකරු විසින් අක්වෙරළ බැංකු ඒකකයේ පවත්වාගෙන යනු ලබන ගිණුමකට අරමුදල් හුවමාරු කිරීම.

ඉ. ශ්‍රී ලංකා රුපියල් වලින් ශ්‍රී ලංකාව තුළ මුදා හැරීම.

6. ජංගම සහ ප්‍රාග්ධන ගනුදෙනු සඳහා ඇප ආවරණ නිකුත් කිරීම සහ අලුත් කිරීම සම්බන්ධයෙන් 2021 මාර්තු 18 වන දිනැති 2021 අංක 20 දරන විධානය හා අනුරූපීව, වෙනත් බලයලත් වෙළෙන්දකු (එනම්, නිකුත් කරන්නා) සමඟ පවත්වාගෙන යනු ලැබූ ණය ගනුදෙනුකරුගේ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමේ ඇති අරමුදල් මත වෙනත් බලයලත් වෙළෙන්දෙකුගෙන් (නිකුත් කරන්නා) බැංකු ඇප ආවරණයක් හෝ පොරොත්තු ණය ලිපියක් ලබා ගැනීමෙන් පසු, මෙම විධානයන්ගේ නියමයන් සහ කොන්දේසි ප්‍රකාරව, බලයලත් වෙළෙන්දන්හට (එනම් ණය ලබාදෙන්නන්) ණය පහසුකම් ලබා දිය හැක.

7. ණය පහසුකම් ආපසු අය කර ගැනීම.

7.1 එවැනි ණය පහසුකම් විදේශ ව්‍යවහාර මුදලින් ආපසු ලබා ගැනීමේ හැකියාව දුරස්ථ නම්, අවසාන විකල්පය වශයෙන්, අවශ්‍ය අවස්තාවන්හි දී එවැනි ණය පහසුකමක් රුපියල් වලින් ආපසු අය කර ගැනීම සඳහා බලයලත් වෙළෙන්දන්ට හැකියාව ඇත. මේ සම්බන්ධයෙන්,

අ. විදේශ ව්‍යවහාර මුදලින් නම් කරන ලද ණය පහසුකම් ශ්‍රී ලංකා රුපියල් වලින් නම් කරන ලද ණය පහසුකම් බවට පරිවර්තනය කිරීම,

ආ. අදාළ ගිවිසුම්හි එකඟ වූ අයුරින්, නිසි කාල වේලාවට, ණය පහසුකම්/ වාරික සේවාකරණය සඳහා දෛනික සාමාන්‍ය ව්‍යාපාර කටයුතු තුළින් විදේශ විනිමය ප්‍රමාණවත් ලෙස ණය ගනුදෙනුකරුවන් සඳහා හිමි නොවන වග තහවුරු කිරීම සඳහා අවශ්‍ය ලේඛනගත සාක්ෂි පවත්වා ගැනීම,

කළ යුතු ය.

8. අනෙකුත් කොන්දේසි

8.1 බලයලත් වෙළඳුන් විසින් ණය ගනුදෙනුකරුවන් සඳහා ලබා දුන් විදේශ ව්‍යවහාර මුදලින් වන ණය පහසුකම්හී අරමුදල් සහ එවැනි ණය ගනුදෙනුකරුවන් විදේශයන්ගෙන් ගනු ලැබූ කෙටි කාලීන විදේශ ව්‍යවහාර ණය මුදල් කිසිඳු අවස්ථාවක දී ශ්‍රී ලංකාවෙන් පිටත ප්‍රාග්ධන ගනුදෙනු සඳහා භාවිත නොකරන බව තහවුරු කළ යුතු වේ.

8.2 මෙම විධානයන්ගේ නියමයන් අනුව ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හිමියෙකු සඳහා ණය පහසුකම් ලබා දීමට අමතරව, 2021 අංක 02 දරන විදේශ විනිමය (ශ්‍රී ලංකාවෙන් පිටත වාසික තැනැත්තෙකු විසින් ශ්‍රී ලංකාවේ සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු පන්ති) නියෝග නිශ්චය කරන ලද අනිකුත් නියමයන් සහ කොන්දේසි ප්‍රකාරව, මෙම විධානයන්ගේ 5.1.ඇ. සහ 5.2.ඇ වගන්තිහී සඳහන් අරමුණු සඳහා ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ණය ගිණුමක් විවෘත කළ හැක.

8.3 බලයලත් වෙළඳුන් විසින් ණය පහසුකමක් සම්පූර්ණයෙන් ම පියවන තෙක්, කිසියම් ව්‍යවස්ථාපිත වාර්තා තබා ගැනීමේ අවශ්‍යතා ඉක්මවා යමින් ණය පහසුකම ලබා දෙන අවස්ථාවේ ලබා ගත් ලේඛනගත සාක්ෂි පවත්වාගෙන යා යුතු වේ. ණය පහසුකම පියවීමෙන් පසු, සම්පූර්ණ පියවීම සිදු කළ දින සිට ව්‍යවස්ථාපිත වාර්තා තබා ගැනීමේ අවශ්‍යතාවය අනුව යමින් අදාළ ලේඛනගත සාක්ෂි මුද්‍රිත හෝ විද්‍යුත් මාධ්‍යයන්ගෙන් පවත්වා ගත යුතු වේ.

8.4 මෙම විධානයන් යටතේ දීර්ඝ කරන ලද ණය පහසුකම් පිළිබඳ මාසික වාර්තා සෑම මසකම 15 වන දින හෝ ඊට පෙර **ඇමුණුම I** අනුව විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා වෙත dfem@cbsl.lk යන ඊමේල් ලිපිනයට යොමු කළ යුතු වේ.

8.5 අවලංගු කරන ලද විදේශ විනිමය පාලන පනතේ ප්‍රතිපාදන සහ මෙම විධානයට පෙර නිකුත් කරන ලද විදේශ විනිමය පනතේ ප්‍රතිපාදන යටතේ නිකුත් කරන ලද නියෝග සහ විධාන ප්‍රකාරව විදේශ විනිමය උපයන්නන් සඳහා ලබා දුන් ණය පහසුකම් ආපසු අය කර ගැනීම් ද මෙම විධානයන් යටතේ ක්‍රියාත්මක වේ.

9. මෙම විධානයන්ගේ අරමුණු සඳහා

(අ) **"ණය පහසුකම්"** යන්න ණය සහ අත්තිකාරම්, ආදායම් හඳුනා ගැනීම සහ ප්‍රතිපාදන වෙන් කිරීම සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2008 අංක 03 දරන බැංකු පනතේ විධාන සහ එහි සංශෝධනයන්හී දක්වා ඇති අර්ථය හා සමාන අර්ථයක් ගත යුතු වේ.

(ආ) **"ජංගම ගනුදෙනු"** යන්න 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දක්වා ඇති අර්ථය හා සමාන අර්ථයක් ගත යුතු වේ.

(ඇ) **"ප්‍රාග්ධන ගනුදෙනු"** යන්න 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දක්වා ඇති අර්ථය හා සමාන අර්ථයක් ගත යුතු වේ.

(ඈ) **"ප්‍රේෂණ"** යන්නෙහි විදුලි පණිවිඩ පැවරුම්, අනිකුත් අන්තර් බැංකු හුවමාරු, බැංකු අණකර, අනිකුත් ගෙවීම් උපකරණ, අනිකුත් අන්තර්ජාතිකව පිළිගත් ගෙවීම් ක්‍රමවේද හෝ පද්ධති හරහා ලැබෙන ගෙවීම් හෝ ලෙස විදේශ විනිමය හුවමාරු ආයතන වෙතින් විදේශ මුදලින් ලැබෙන අරමුදල් අන්තර්ගත වන අතර, නෝට්ටුමය මුදල් ඇතුළත් නොවේ.

(ඉ) **"කෙටි කාලීන ණය"** යන්නෙන් 2021 අංක 02 දරන විදේශ විනිමය (ශ්‍රී ලංකාවෙන් පිටත වාසික තැනැත්තෙකු විසින් ශ්‍රී ලංකාවේ සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු පන්තිය) නියෝගයන්හි අවසර හිමිවන පරිදි ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හිමියෙකු විසින් වසර තුනකට අඩු කාල සීමාවක් තුළ ශ්‍රී ලංකාවෙන් පිටත වාසය කරන තැනැත්තෙකුගෙන් (එනම් විදේශීය ණය ලබාදෙන්නා) ලබා ගත් ණය අදහස් වේ.

10. විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හිමියන් වෙත ණය ලබා දීම සම්බන්ධයෙන් වන අවශ්‍යතා නිශ්චිතව දක්වමින් බලයලත් වෙළඳුන් වෙත නිකුත් කරන ලද 2017 නොවැම්බර් 20 වන දිනැති 2017 අංක 09 දරන විධානයන් සහ 2020 අප්‍රේල් 03 වන දිනැති 2020 අංක 03 දරන විධානයන් මෙයින් අවලංගු කරනු ලැබේ.

11. ඉහත 10 වන ඡේදයේ සඳහන් පෙර විධානයන් අවලංගු කිරීම, එකී අවලංගු කිරීමට පෙර ඒ යටතේ ලබා ගත් හිමිකම් හෝ අය වූ දඩ මුදල් හෝ වගකීම් වෙනුවෙන් බලපෑමක් සිදු නොකරනු ලබයි.

12. මෙම විධාන මගින් අවසරය ලබා දී ඇති කිසිවක්, බලයලත් වෙළඳුන් හෝ මෙම විධාන යටතේ විදේශ විනිමයෙන් ගනුදෙනු කරන වෙනත් ඕනෑම පුද්ගලයෙක්, වෙනත් ඕනෑම නීතියක විධිවිධාන සමඟ අනුකූල වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීමක්, නිදොස් කිරීමක් හෝ වැලැක්වීමක් ලෙස වටහා නොගත යුතු ය.

13. 2021 මාර්තු 22 වන දින සිට මෙම විධානයන් බලාත්මක විය යුතු වේ.

අධ්‍යක්ෂ - විදේශීය විනිමය දෙපාර්තමේන්තුව
2021 මාර්තු 18

2021 අංක 09 දරන විධානයන් සඳහා වූ ඇමුණුම I

ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හිමියන් සඳහා ණය පහසුකම් සැලසීම පිළිබඳ මාසික වාර්තාව

බැංකුවේ නම : .....

වාර්තා කරන මාසය සහ වසර : .....

වගුව 1 : ණය පහසුකම් -සක්‍රිය

මුදල් වර්ගය	මාසය ආරම්භයේ දී ණය පහසුකම් ගණන	මාසය ආරම්භයේ දී නොපියවූ ශේෂය	මාසය තුළ දී මුදා හැරීම්	ආපසු ගෙවීම් (ප්‍රාග්ධනය)	මාසය අවසානයේ දී ණය පහසුකම් ගණන	මාසය අවසානයේ දී නොපියවූ ශේෂය
ඔස්ට්‍රේලියානු ඩොලර්						
කැනේඩියානු ඩොලර්						
ස්විස් ෆ්‍රෑන්ක්						
අනිකුත් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් වර්ග						

■ අනිකුත් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් සඳහා අවශ්‍ය ලෙස පෙළ දීර්ඝ කළ ගත හැක.

වගුව 2- විදේශ ව්‍යවහාර මුදල් ණය ගිණුම් පිළිබඳ විස්තර

බැර			හර			
ණය පහසුකම්හි අරමුදල්	ආපසු ගෙවීම් සඳහා විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් සහ අක්වෙරළ බැංකු ගිණුම් තුළින් මාරු කිරීම්	එකතුව	ජංගම ගනුදෙනු සම්බන්ධයෙන් ප්‍රතිමුබ ප්‍රේෂණ	අක්වෙරළ බැංකු ඒකකයේ ගිණුමකට අරමුදල් හුවමාරු කිරීම	රුපියලින් මුදා හැරීම	එකතුව

වගුව 3- ණය පහසුකම් ආපසු අය කර ගැනීම

ණය ගනුදෙනුකරුගේ නම	ණය ගිණුම් අංකය	ව්‍යවහාර මුදල් කේතය	විදේශීය ව්‍යවහාර මුදලින් ලබා දෙන ලද ණය මුදල (ඇ.එ.ජ.ඩොලර් වලින්)	ණය මුදලේ කල් පිරීමේ කාලසීමාව	විදේශ ව්‍යවහාර මුදලින් ගෙවීම පැහැර හැර ඇති ප්‍රමාණය (ඇ.එ.ජ.ඩොලර් වලින්)	අවසාන විකල්පයක් වශයෙන් රුපියල්වලින් ආපසු අය කරගත් ප්‍රමාණය		මාසය අවසානයේ නොපියවා ඇති ණය ශේෂය රුපියල්වලින්
						ණය වාරික ලෙස	ණය ශේෂය පූර්ණයක් ලෙස (රුපියලෙන් නම් කරන ලද ණය ශේෂයක් ලෙස)	

වාර්තාවේ පරිලෝපිත පිටපතක් සහ ඉහත දක්වා ඇති ආකාරයේ මයික්‍රොසොෆ්ට් එක්සෙල් පිටපතක් යන ද්විත්වය ම ඉදිරිපත් කිරීමට බලයලත් වෙළඳුන් කටයුතු කළ යුතු වේ.

බැංකු ගිණුම් පොත්වලින් උපුටාගත්/ උත්පාදනය වූ ඉහත තොරතුරු නිවැරදි බවට අපි සහතික වෙමු.

බලයලත් නිළධාරියාගේ නම සහ අත්සන: ..... අනුකූලතා නිළධාරියාගේ නම: .....

අත්සන සහ මුද්‍රාව: ..... අත්සන: .....

දිනය: ..... දිනය: .....

විදේශ විනිමය දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා මහ බැංකුව

2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2021 අංක 10 දරන විධානයන්

විදේශයන්හි සේවා නියුක්ත ශ්‍රී ලාංකිකයන් (විගාමිකයන් හැරුණු කොට) හට ණය සහ අත්තිකාරම් ලබා දීම පිළිබඳව බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්

2021 අංක 04 දරන විදේශ විනිමය (විවිධ ප්‍රාග්ධන ගනුදෙනු වර්ග) නියෝග සහ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව, පහත කරුණුවලට යටත්ව, බලයලත් වෙළෙඳුන්ට පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් පවත්වා ගෙන යන විදේශයන්හි සේවා නියුක්ත ශ්‍රී ලාංකිකයන් වෙත (මින්මතු 'ණයගැනුම්කරුවන්' ලෙස හැඳින්වෙන) තම දේශීය බැංකු ඒකක වලින් විදේශ ව්‍යවහාර මුදලින් හෝ ශ්‍රී ලංකා රුපියල් වලින් නිරූපිත ණය සහ අත්තිකාරම් ප්‍රදානය කිරීම සඳහා පහත කරුණු වලට යටත්ව අවසර දෙනු ලැබේ.

2. **ණය සහ අත්තිකාරම් ලබා දීම සඳහා අරමුණු**

   2.1 ශ්‍රී ලංකාව තුළ දී ඕනෑම අරමුණක් සඳහා භාවිතා කිරීමට.

   2.2 ශ්‍රී ලංකාවේ නේවාසික ණයගැනුම්කරුවන්ගේ සමීපතම පවුලේ සාමාජිකයන්ගේ ජංගම ගනුදෙනුවලට අදාළව ගෙවීම් සිදු කිරීම සඳහා.

3. විශේෂයෙන් ම, ණයගැනුම්කරුට විදේශ ව්‍යවහාර මුදලින් ණය සහ අත්තිකාරම් ආපසු ගෙවීමට තිබෙන හැකියාව සලකා බලමින්, ණය අවදානම තක්සේරු කිරීමෙන් අනතුරුව ණය සහ අත්තිකාරම් ලබා දිය යුතුය.

4. විදේශ ව්‍යවහාර මුදලින් හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් නිරූපිත ණය සහ අත්තිකාරම් වලින් ලත් මුදල් ශ්‍රී ලංකාවේ දේපළ විකුණුම් ව්‍යාපාරයෙහි නිරතව සිටින සහ විදේශ ව්‍යවහාර මුදල් පිළිගැනීමට අවසරය තිබෙන දේපළ සංවර්ධකයෙකුගේ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට හෝ අක්වෙරළ බැංකු ඒකකය තුළ පවත්වා ගෙන යන ගිණුමකට මුදා හරින ලෙස ණය ගැනුම්කරු ඉල්ලා සිටින්නේ නම් මිස, ණය මුදල් මුදා හැරීම **පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ණය ගිණුම** (PFCA Loan Account) (PLA) ට බැර වන සේ ශ්‍රී ලංකා රුපියලින් වලින් නිදහස් කරනු ලැබිය යුතු ය.

5. PLA ණයගැනුම්කරුගේ නමින් ආරම්භ කළ යුතු අතර, පහත දැක්වෙන හර කිරීම් සහ බැර කිරීම් වලට සීමා වෙමින් ක්‍රියාත්මක කළ යුතුය.

5.1 **PLA වෙත අවසරලත් බැර කිරීම්**

අ. බලයලත් වෙළෙඳුන් විසින් මෙම විධාන ප්‍රකාරව ශ්‍රී ලංකා රුපියල් වලින් නිදහස් කරන ලද ණය සහ අත්තිකාරම්හි අරමුදල්.

ආ. ණය සහ අත්තිකාරම් සේවාකරණය/ ආපසු ගෙවීමේ අරමුණ සඳහා, ණයගැනුම්කරුගේ නමින් බැංකු පද්ධතිය ඔස්සේ විදේශයෙන් ලත් ප්‍රේෂණ හෝ ණයගැනුම්කරුගේ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්, ආමුඛ ආයෝජන ගිණුම් හෝ අක්වෙරළ බැංකු ඒකකය තුළ පවත්වා ගෙන යන ගිණුම් වලින් මාරු කළ අරමුදල්.

5.2 **PLA වෙත අවසරලත් බැර කිරීම්**

අ. ශ්‍රී ලංකා රුපියල්වලින් ශ්‍රී ලංකාව තුළ මුදා හැරීම.

ආ. ශ්‍රී ලංකාවෙහි නේවාසික ණයගැනුම්කරුගේ සමීපතම පවුලේ සාමාජිකයන්ගේ ජංගම ගනුදෙනුවලට අදාළව සිදු කරන ප්‍රතිමුඛ ප්‍රේෂණ.

ඇ. මෙම විධානයන් යටතේ ලබා ගත් ණය සහ අත්තිකාරම් ආපසු ගෙවීම.

6. ණයගැනුම්කරු විදේශයෙහි සේවානියුක්තව සිටින තාක්, ණය සහ අත්තිකාරම් ආමුඛ ප්‍රේෂණ ඔස්සේ විදේශ විනිමයෙන් හෝ එම ණයගැනුම්කරුගේ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වල පවත්නා අරමුදල් භාවිත කිරීම මගින් හෝ ඔහුගේ වෙනත් ඕනෑම විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකින් ආපසු ගෙවිය යුතුය.

7. ණයගැනුම්කරු ඔහුගේ/ ඇයගේ විදේශ රැකියාව අත්හිටුවා හෝ නවත්වා දමා, ශ්‍රී ලංකාවෙහි නේවාසිකයෙකු බවට පත් වූ විට, පවත්නා ඕනෑම නොපිය වූ ණය මුදලක්/ අත්තිකාරම් ශේෂයක් (ශ්‍රී ලංකා රුපියල් ණය/ අත්තිකාරම්වලට හැරවීමට නියමිත විදේශ ව්‍යවහාර මුදලින් නිරූපිත ණය/ අත්තිකාරම් ඇතුළුව) එවැනි ණය ගැනුම්කරුවෙකුගේ එතෙර සේවය නිමා කිරීමට අදාළව අවශ්‍ය ලේඛනමය සාක්ෂි සත්‍යාපනය කිරීමට යටත්ව,ශ්‍රී ලංකා රුපියල් වලින් සේවාකරණය කළ හැකි ය. කෙසේවෙතත්, ණයගැනුම්කරුගේ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හෝ වෙනත් ඕනෑම විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් වල පවත්නා සමස්ත ශේෂය ශ්‍රී ලංකා රුපියල් වලින් ණය සහ අත්තිකාරම් සේවාකරණය කිරීමට පෙර සම්පූර්ණයෙන් භාවිත කළ යුතුය.

8. සාමාන්‍ය බැංකු ක්‍රියාපටිපාටිය යටතේ, ශ්‍රී ලංකාවෙහි නේවාසික පුද්ගලයෙකු විසින් උකස්කර දේපළවල හිමිකාරීත්වය දරනු ලබන විට, මෙම ණය සහ අත්තිකාරම් ශ්‍රී ලංකාවෙහි නේවාසික පුද්ගලයෙකු වන ආසන්නතම පවුලේ සාමාජිකයෙකු සමඟ ඒකාබද්ධව, විදේශයන්හි සේවා නියුක්ත ශ්‍රී ලාංකිකයන් වෙත ලබා දිය හැකිය.

9. **ණය සහ අත්තිකාරම් ආපසු අය කර ගැනීම**

9.1 විදේශ ව්‍යවහාර මුදලින් යුත් ණය සහ අත්තිකාරම් ආපසු අය කර ගැනීමේ හැකියාව දුරස්ථ නම්, අවසාන විකල්පය වශයෙන්, අවශ්‍ය අවස්තාවන්හී දී, ශ්‍රී ලංකා රුපියල් වලින් ණය සහ අත්තිකාරම් ආපසු අය කර ගැනීම සඳහා බලයලත් වෙළෙන්දන්ට හැකියාව ඇත. මේ සම්බන්ධයෙන්, බලයලත් වෙළෙඳුන් විසින්;

අ. විදේශ ව්‍යවහාර මුදලින් නිරූපිත ණය සහ අත්තිකාරම් ශ්‍රී ලංකා රුපියල් වලින් නිරූපිත ණය සහ අත්තිකාරම් පහසුකම් බවට පරිවර්තනය කළ යුතු ය.

ආ. අදාළ ණය ගිවිසුමෙහි එකඟ වූ අයුරින් නිසි කාල වේලාවට, ණය සහ අත්තිකාරම් සේවාකරණය සඳහා ණයගැනුම්කරුවන්ට විදේශයෙහි සිදු කරන ඔහුගේ/ ඇයගේ රැකියාවෙන් ප්‍රමාණවත් විදේශ විනිමය නොලැබෙන බවට හෝ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වල පවතින ශේෂ ද ඇතුළුව විදේශ ව්‍යවහාර වත්කම් සතු නොවීම තහවුරු කිරීමට අවශ්‍ය ලේඛනමය සාක්ෂි පවත්වා ගෙන යාම සහ තෘප්තිමත් වීම සිදු කළ යුතුය.

10. **අනෙකුත් කොන්දේසි**

10.1 බලයලත් වෙළෙඳුන් විසින් ණය සහ අත්තිකාරම් සම්පූර්ණයෙන් පියවන තෙක්, කිසියම් ව්‍යවස්ථාපිත වාර්තා තබා ගැනීමේ අවශ්‍යතා ඉක්මවා යමින් ණය සහ අත්තිකාරම් ලබා දෙන අවස්ථාවේ දී ලබා ගත් ලේඛනගත සාක්ෂි පවත්වා ගෙන යා යුතු වේ. ණය සහ අත්තිකාරම් පියවීමෙන් පසු, සම්පූර්ණ පියවීම සිදු කළ දින සිට ව්‍යවස්තාපිත වාර්තා තබා ගැනීමේ අවශ්‍යතාවය අනුව යමින් අදාල ලේඛනගත සාක්ෂි මුද්‍රිත හෝ විද්‍යුත් මාධ්‍යයන්ගේ පවත්වා ගත යුතු ය.

10.2 බලයලත් වෙළෙඳුන් විසින් මෙම විධානයන් යටතේ ලබා දුන් ණය සහ අත්තිකාරම් පිළිබඳව මාසික වාර්තා සෑම මසකම 15 වන දින හෝ ඊට පෙර **ඇමුණුම I** ට අනුව විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා වෙත dfem@cbsl.lk යන විද්‍යුත් තැපෑලට යොමු කළ යුතුය.

10.3 මෙම විධානයන්ට පූර්වයෙන් විදේශ විනිමය පනතේ විධිවිධාන යටතේ නිකුත් කරන ලද රෙගුලාසි සහ විධාන හෝ අහෝසි කරන ලද විනිමය පාලන පනතේ විධිවිධාන යටතේ විදේශයන්හි සේවා නියුක්ත ශ්‍රී ලාංකිකයන් වෙත ලබා දී ඇති ණය සහ අත්තිකාරම් ආපසු අය කර ගැනීම සහ ඒවායේ කොන්දේසි සහ නියමයන් ද මෙම විධාන ප්‍රකාරව බලාත්මක විය යුතුය.

11. **මෙම විධානයන්ගේ කාර්යයන් සඳහා**

(අ) **"ආසන්නතම පවුලේ සාමාජිකයා"** යන්නෙන් කලත්‍රයා, දරුවන් සහ දෙමව්පියන් යන්න අර්ථවත් විය යුතුය;

(ආ) **"ජංගම ගනුදෙනු"** යන්නෙන් 2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි දැක්වෙන අර්ථය ම අදහස් විය යුතුය;

(ඇ) **"ප්‍රේෂණ"** යන්නට විදුලි පණිවුඩ පැවරුම්, අනෙකුත් අන්තර් බැංකු හුවමාරු, බැංකු අණකර, අනෙකුත් ගෙවීම් උපකරණ අනෙකුත් අන්තර්ජාතිකව පිළිගත් ගෙවීම් ක්‍රමවේද හෝ පද්ධති හරහා ලැබෙන ගෙවීම් හෝ විදේශ විනිමය ලෙස හුවමාරු ආයතන වෙතින් විදේශ මුදලින් ලැබෙන අරමුදල් අන්තර්ගත වන අතර, නෝට්ටුමය මුදල් ඇතුළත් නොවේ.

12. විදේශයන්හි සේවා නියුක්ත ශ්‍රී ලාංකිකයන් වෙත ණය සහ අත්තිකාරම් ලබා දීම සම්බන්ධයෙන් අවශ්‍යතා නිශ්චිතව දක්වමින් බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරන ලද 2017 නොවැම්බර් 20 දිනැති 2017 අංක 10 දරන විධානයන් සහ 2020 අප්‍රේල් 16 දිනැති 2020 අංක 05 දරන විධානයන් මෙමඟින් අවලංගු කෙරේ.

13. ඉහත 12 වන ඡේදයේ සඳහන් පරිදි පෙර විධානයන් අවලංගු වීම, එකී අවලංගු වීමට ප්‍රථම ලබා ගත් හිමිකම්, අය වූ දඩ මුදල් හෝ වගකීම් වෙනුවෙන් බලපෑමක් සිදු නොකරනු ලබයි.

14. මෙම විධාන මගින් අවසරය ලබා දී ඇති කිසිවක් නොකරනු ලබයි. වෙනත් ඕනෑම නීතියක විධිවිධාන සමඟ අනුකූල වීමේ අවශ්‍යතාවෙන් නිදහස් කිරීමක්, නිදොස් කිරීමක් හෝ ('බලයලත් වෙළෙඳුන්' හෝ මෙම විධාන යටතේ විදේශ විනිමයෙන් ගනුදෙනු කරන වෙනත් ඕනෑම පුද්ගලයෙකු) වැළැක්වීමක් ලෙස වටහා නොගත යුතුය.

15. **2021 මාර්තු 22** වන දින සිට මෙම විධානයන් බලාත්මක විය යුතුය.

අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව
2021 මාර්තු 18

2021 අංක 10 දරන විධානයන් සඳහා වූ ඇමුණුම I

විදේශයන්හි සේවා නියුක්ත ශ්‍රී ලාංකිකයන් හට ලබා දෙන ණය සහ අත්තිකාරම් පිළිබඳව මාසික ප්‍රකාශය

බැංකුවේ නම: .....

වාර්තා කරන මාසය සහ වර්ෂය: .....

1 වගුව: ණය සහ අත්තිකාරම් - සක්‍රීය

ණය අගයන්	ණයෙහි අරමුණ		මාසය ආරම්භයේ දී පවතින ණය මුදල් ගණන	මාසය ආරම්භයේ දී පවතින නොපිය වූ ශේෂය	මාසය තුළ සිදු කරන වියදම්		ආපසු ගෙවීම් (ප්‍රාග්ධනය)		මාසය අවසානයේ පවතින ණය මුදල් ගණන	මාසය අවසානයේ පවතින නොපිය වූ ශේෂය
	ශ්‍රී ලංකාවේ අරමුණු සඳහා	ජංගම ගනුදෙනු සඳහා			රු.	විදේශ ව්‍යවහාර මුදලින් (එ.ජ.ඩො.)	රු.**	විදේශ ව්‍යවහාර මුදලින් (එ.ජ.ඩො.)		
විදේශ ව්‍යවහාර මුදලින් (එ.ජ.ඩො.)										
රුපියල්										

** ශ්‍රී ලංකාවෙහි දේපළ විකුණුම් ව්‍යාපාරයන්හි නිරත වී සිටින විදේශ ව්‍යවහාර මුදල් හාර ගැනීමට අවසරය හිමිව ඇති දේපළ සංවර්ධකයෙකුගේ අක්වෙරළ බැංකු ඒකකයෙහි පවත්වා ගෙන යනු ලබන ගිණුමකට හෝ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට ණය අගයක් ලෙස ලත් මුදල් මාරු කරන මෙන් ණයගැනුම්කරු ඉල්ලා සිටින විට දී.

** ණයගැනුම්කරු විදේශ රැකියාව අත්හිටුවා ශ්‍රී ලංකාවේ නේවාසිකයෙකු බවට පත් වූ විට දී.

2 වගුව: ණය සහ අත්තිකාරම් ආපසු අය කර ගැනීම

ණයගැනුම්කරුගේ නම	ණය ගිණුම් අංකය	ව්‍යවහාර මුදල් කේතය	ණය මුදලෙහි කාල සීමාව	විදේශ ව්‍යවහාර මුදලින් ලබා දී ඇති ණය මුදල් (එ.ජ.ඩො. වලින්)	විදේශ ව්‍යවහාර මුදලින් පැහැර හරින ලද මුදල් (එ.ජ.ඩො. වලින්)	අවසාන විකල්පයක් වශයෙන් රුපියල් වලින් ආපසු අය කර ගත් ප්‍රමාණය		මාසය අවසානයේ නොපියවා ඇති ණය ශේෂය (එ.ජ.ඩො. වලින්)
						ණය වාරික ලෙස	ණය ශේෂය පූර්ණයක් ලෙස (ශ්‍රී ලංකා රුපියල් වලින් නිරූපිත ණය ශේෂයක් ලෙස)	

මෙම වාර්තාවේ පරිලෝපිත පිටපතක් සහ මයික්‍රොසොෆ්ට් එක්සෙල් පිටපතක් යන ද්විත්වයම ඉදිරිපත් කිරීමට බලයලත් වෙළෙඳුන් කටයුතු කළ යුතු වේ.

බැංකුවේ ගිණුම් පොත් වලින් උපුටා ගත්/උත්පාදනය වූ ඉහත තොරතුරු නිවැරදි බව අපි සහතික වන්නෙමු.

බලයලත් නිලධාරියාගේ නම සහ තනතුර:..... අනුකූලතා නිලධාරියාගේ නම:.....

අත්සන සහ මුද්‍රාව: ..... අත්සන:.....

දිනය:..... දිනය:.....

විදේශ විනිමය දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2021 අංක 11 දරන විධානයන්

ශ්‍රී ලංකාවෙන් පිටත වෙනත් රටක නිත්‍ය වාසික වීසා (PR) සහ ද්විත්ව පුරවැසිභාවය ලබා සිටින ශ්‍රී ලංකිකයන්හට ලබා දෙන ණය පිළිබඳ බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්

2021 අංක 04 දරන විදේශ විනිමය (විවිධ ප්‍රාග්ධන ගනුදෙනු කාණ්ඩය) නියෝග සහ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි 9 වන වගන්තිය ප්‍රකාරව, වෙනත් රටක ස්ථිර නේවාසික වීසා යටතේ ශ්‍රී ලංකාවෙන් පිටත වාසය කරන ශ්‍රී ලාංකිකයන්හට සහ ද්විත්ව පුරවැසිභාවය ලබා සිටින ශ්‍රී ලාංකික පුද්ගලයන් හට ඔවුන්ගේ නේවාසික තත්ත්වය (මින් මතුවට ණය ගනුදෙනුකරුවන් ලෙස හැඳින්වෙන) නොසළකා පහත සඳහන් රෙගුලාසිවලට යටත්ව, තම දේශීය බැංකු ඒකක වලින් ණය ප්‍රදානය කිරීම සඳහා බලයලත් වෙළඳුන් වෙත අවසර දෙනු ලැබේ.

2. ණය ප්‍රදානය කිරීමේ අරමුණු
   - 2.1 ශ්‍රී ලංකාව තුළ නේවාසික දේපළක් අත්පත් කර ගැනීම සඳහා.
   - 2.2 ශ්‍රී ලංකාව තුළ නේවාසික දේපළක් ඉදිකිරීම/ සංවර්ධනය කිරීම / නවීකරණය කිරීම සඳහා.

3. විදේශ ව්‍යවහාර මුදලින් ප්‍රදානය කරනු ලබන ණය (විදේශ ව්‍යවහාර මුදල් ණය)
   - 3.1 විශේෂයෙන්ම විදේශ ණය මුදලින් ණය ආපසු ගෙවීමට ණයගැතියාට ඇති හැකියාව පිළිබඳ සලකා බලමින් එකී ණය පිළිබඳව අවධානම තක්සේරු කිරීමෙන් අනතුරුව විදේශ ව්‍යාවහාර මුදල් ණය ලබා දිය යුතුය.
   - 3.2 ණය මුදල් නිදහස් කිරීම සහ ණය ආපසු ගෙවීම් ලබා ගැනීම සඳහා ණය ගැනුම්කරුගේ නමින් "විදේශ ව්‍යවහාර ණය මුදල් ගිණුමක්" විවෘත කළ යුතු වේ. ණය මුදල සම්පූර්ණයෙන් පියවා අවසන් වූ වහාම විදේශ ව්‍යවහාර ණය මුදල් ගිණුම වසා දැමිය යුතුය.
   - 3.3 ශ්‍රී ලංකාව තුළ දේපළ විකිණීමේ ව්‍යාපාරයන්හී නියුතු දේපළ සංවර්ධනය කරන්නෙකු විසින් පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට හෝ අක්වෙරළ බැංකු ඒකකයක පවත්වාගෙන යනු ලබන ගිණුමකට ණය මුදල් මාරු කිරීම සඳහා බලයලත් වෙළෙන්දාගෙන් ශ්‍රී ලංකාවෙන් පිටත වාසික ණය ගන්නා විසින් ඉල්ලා සිටිය විට හැර ණය මුදල් විදේශ ව්‍යවහාර ණය මුදල් ගිණුමෙන් ශ්‍රී ලංකා රුපියල් වලින් මුදා හැරිය යුතුය.
   - 3.4 ණය ගැනුම්කරුගේ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් , ආමුඛ ආයෝජන ගිණුම් හෝ ණය ගැනුම්කරුගේ අක්වෙරළ

බැංකු ඒකකයේ පවත්වාගෙන යනු ලබන ගිණුම්වල අරමුදල් හෝ ආමුබ ප්‍රේෂණ භාවිත කරමින් විදේශ ව්‍යවහාර මුදල් වලින් ණය ආපසු ගෙවිය යුතු වේ.

4. ශ්‍රී ලංකා රුපියල්වලින් ප්‍රදානය කරනු ලබන ණය (ශ්‍රී ලංකා රුපියල් ණය)

4.1 විශේෂයෙන්ම ණය ගැතියාගේ ණය ආපසු ගෙවීමට ඇති හැකියාව සැලකිල්ලට ගෙන , එකී ණය අවධානම තක්සේරු කිරීමෙන් පසුව ශ්‍රී ලංකා මුදලින් ණය ප්‍රදානය කළ යුතුය.

4.2 ණය මුදල් නිදහස් කිරීම සහ ණය ආපසු ගෙවීම් ලබා ගැනීම සඳහා ණය ගැනුම්කරුගේ නමින් ශ්‍රී ලංකා රුපියල් ගිණුමක් විවෘත කළ යුතු වේ.

4.3 ණය මුදල් ශ්‍රී ලංකා රුපියල්වලින් පමණක් නිදහස් කළ යුතුය.

4.4 විදේශ ව්‍යවහාර මුදලින් වන ආමුබ ප්‍රේෂණ මගින් හෝ ණය ගැනුම්කරුගේ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වල සහ ආමුබ ආයෝජන ගිණුම්වල, විගාමිකයින්ගේ ආදායම් ප්‍රේෂණය කළ හැකි ගිණුම්වල පවතින අරමුදල් භාවිත කරමින් හෝ ණය ගැනුම්කරු අක්වෙරළ බැංකු ඒකකයේ පවත්වාගෙන යනු ලබන ගිණුම් භාවිත කරමින් ආපසු ගෙවිය යුතුය. මේ සඳහා ආමුබ ආයෝජන රුපියල් ගිණුම හෝ විගාමිකයින්ගේ ආදායම් ප්‍රේෂණය කළ හැකි ගිණුම් ආමුබ ප්‍රේෂණ ලෙස පිළිගනු ලැබේ.

5. ණය ආපසු අය කර ගැනීම

5.1 ණය ගැනුම්කරුගේ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්හී ශේෂය ඇතුළුව විදේශිය ව්‍යවහාර මුදල් වත්කම් පූර්ණ වශයෙන් භාවිත කිරීමට යටත්ව, 2008 අංක 03 දරන සංශෝධිත ණය සහ අත්තිකාරම්, ආදායම් හඳුනා ගැනීම සහ ප්‍රතිපාදන වෙන් කිරීම සම්බන්ධ බැංකු පනත් විධානයන්ගේ නියමයන්ට යටත්ව, අවම වශයෙන් උපප්‍රාමාණික කාණ්ඩය යටතේ අක්‍රිය ලෙස වර්ගීකරණය කරන ලද අවස්ථාවක එවැනි ණය ආපසු අය කර ගැනීම (ආපසු ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවකදී) ශ්‍රී ලංකා රුපියල්වලින් සිදු කළ හැක. මේ අවස්ථාවේදී, විදේශ ව්‍යවහාර මුදලින් ණය මුදල් ආපසු අය කර ගැනීම සඳහා සියලුම ක්‍රියාමාර්ග ණය ගැනුම්කරුවන් විසින් ගෙන ඇති වගට බලයලත් වෙළෙන්දන් සෑහීමට පත් විය යුතු වේ.

5.2 මෙම විධානයන්ගේ වෙනත් ආකාරයකින් සඳහන් කර නොමැතිනම්, පැහැර හැර ඇති ණය ආපසු ශ්‍රී ලංකා රුපියල් වලින් අයකර ගැනීම සඳහා බලයලත් වෙළඳුන්හට අවසර ලබා දී නොමැත.

6. අනිකුත් කොන්දේසි

6.1 බලයලත් වෙළඳුන් විසින් ණය මුදල හා සම්බන්ධ සියලු අවදානම් තක්සේරු කළයුතු වන අතර, ණය අවදානම් අඩු කර ගැනීම සඳහා සුදුසු විචක්ෂණශීලී පියවර ගත යුතුය.

6.2 ණය ගැනුම්කරු හට උරුමයෙන් ලද දේපළක් ඉදිකිරීම/ සංවර්ධනය/ නවීකරණය සඳහා හෝ ණය ගැනුම්කරු ශ්‍රී ලංකාවේ නේවාසිකව සිටියදී දේපළක් අත්පත් කර ගැනීම සඳහා ණය මුදල් උපයෝගී කරගනු ලබන්නේ නම්, ණය ලබා දීම සඳහා ඇපකරයක් ලෙස දේපළ යොදා ගත් විටක දී, බලයලත් වෙළඳුන් විසින් ණය නිකුත් කිරීමට ප්‍රථමයෙන් 1988 අංක 30 දරන බැංකු පනත යටතේ නිකුත් කර ඇති විචක්ෂණශීලී නියෝග ප්‍රකාරව තෝරා ගනු ලැබූ තක්සේරුකරුවෙකු මගින් දේපළ සඳහා තක්සේරුවක් ලබා ගත යුතුය.

6.3 මෙම විධානයන් ප්‍රකාරව ලබාගත් ණය මුදල් උපයෝගී කරගනිමින් අත්පත් කර ගත්/ ඉදි කළ/ සංවර්ධනය කළ/ නවීකරණය කරන ලද දේපළක් විකිණීමෙන් ලද මුදල් පහත පදනම මත ශ්‍රී ලංකාවෙන් පිටතට ප්‍රේෂණය කරනු ලබන බවට (ගෙවීමට ඉතිරිව ඇති ණය සම්පූර්ණයෙන්ම ගෙවීමෙන් පසුව) බලයලත් වෙළඳුන් විසින් සහතික කරගත යුතු වේ.

අ) ණය ආපසු ගෙවීම සඳහා ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරනු ලැබූ මුදලට සමානුපාතිකව විකුණුම් මුදලක් (ණය ගැනුම්කරුගේ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්, ආමුබ ආයෝජන ගිණුම්, විගාමිකයින්ගේ ආදායම් ප්‍රේෂණය කළ හැකි ගිණුම්වලින් මාරු කරන ලද මුදල් හෝ ණය ආපසු ගෙවීම සඳහා අක්වෙරළ බැංකු ඒකකයේ පවත්වාගෙන යනු ලබන ගිණුම් ඇතුළුව) ආමුබ ආයෝජන ගිණුමක් හරහා නිදහසේ ප්‍රේෂණය කළ හැක.

ආ) ශේෂ වන යම් විකිණුම් මුදලක් වේ නම් එය සංක්‍රමණික දීමනාවට යටත්ව ප්‍රේෂණය කළ හැකිය.

6.4 එවැනි දේපළක විකුණුම් මුදලක් සම්බන්ධයෙන් අනාගත ප්‍රතිමුබ ප්‍රේෂණ සඳහා පහසුකම් සැලසීම පිණිස ණය අයකර ගැනීම සඳහා උපයෝගී කරගත් ආමුබ ප්‍රේෂණයන් පිළිබඳ තහවුරුවක් බලයලත් වෙළඳුන් විසින් ණය ගැතියාට නිකුත් කළ යුතුය.

6.5 ණය මුදල සම්පූර්ණයෙන් ගෙවා පියවන තෙක්, බලයලත් වෙළඳුන් විසින් ණය මුදල ප්‍රදානය කළ අවස්ථාවේ ලබා ගන්නා ලද ලේඛනගත සාක්ෂි, ඕනෑම ව්‍යවස්ථාපිත වාර්තා තබා ගැනීමේ අවශ්‍යතාවන් ඉක්මවා පවත්වාගෙන යා යුතුය. ණය මුදල සම්පූර්ණයෙන් පියවූ පසු, අදාළ ලේඛනගත සාක්ෂි, මුද්‍රිත හෝ ඉලෙක්ට්‍රොනික මාධ්‍යන්ගෙන් ව්‍යවස්ථාපිත වාර්තා තබා ගැනීමේ අවශ්‍යතාවන් පරිදි පවත්වාගෙන යා යුතුය.

6.6 බලයලත් වෙළඳුන් විසින් ඇමුණුම I පරිදි මෙම විධානයන් යටතේ ප්‍රදානය කරන ලද ණය මුදල් පිළිබඳව මාසික වාර්තාවන් එළඹෙන මාසයේ 15 වන දින හෝ ඊට පෙර dfe@cbsl.lk යන විද්‍යුත් ලිපිනය හරහා අධ්‍යක්ෂ විදේශ විනිමය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම කළ යුතු වේ.

7 අවලංගු කරන ලද විනිමය පාලන පනතේ විධිවිධාන යටතේ හෝ විදේශ විනිමය පනතේ ප්‍රතිපාදනයන් යටතේ මෙම විධානයට පෙරාතුව නිකුත් කරන ලද නියෝගයන් හා විධානයන් යටතේ , ශ්‍රී ලංකාවෙන් පිටත වෙනත් රටක නිත්‍ය වාසික වීසා යටතේ වාසය කරන සහ ද්විත්ව පුරවැසිභාවය ලබා සිටින ශ්‍රී ලාංකිකයන්හට ප්‍රදානය කරන ලද, ණය සම්බන්ධයෙන් වූ වගන්ති හා කොන්දේසී සහ ඒවා පියවා ගැනීමද මෙම නියෝග ප්‍රකාරව ක්‍රියාත්මක විය යුතුය.

8. වෙනත් රටක ස්ථිර නේවාසික වීසා යටතේ ශ්‍රී ලංකාවෙන් පිටත වාසය කරන ශ්‍රී ලාංකිකයන් සහ ද්විත්ව පුරවැසිභාවය ලබා සිටින

ශ්‍රී ලාංකික පුද්ගලයන්හට ණය ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් අවශ්‍යතා සඳහන් කරමින් බලයලත් වෙළඳුන් වෙත නිකුත් කරන ලද 2017 නොවැම්බර් 20 වන දිනැති 2017 අංක 11 දරන විධානයන් මෙයින් අවලංගු කෙරේ.

9. ඉහත 8 වන වගන්තියෙහි සඳහන් පෙර විධානයන් අවලංගු කිරීම, අවලංගු කිරීමට පෙර ඒ යටතේ එකතු වී ඇති හිමිකම් හෝ දඩ හෝ වගකීම් මත බලපෑමක් නොමැත.

10. මෙම විධානයන් යටතේ විදේශ විනිමය වෙළඳාම් කරනු ලබන බලයලත් වෙළෙඳුන්ගේ හෝ වෙනත් ඕනෑම තැනැත්තෙක් මෙම විධානයන්ගෙන් අවසර ලබා දෙන දෑ වෙනත් නීතියක විධිවිධාන හා අනුගත වීමේ අවශ්‍යතාවෙන් නිදහස් වීමට, විශෝධනයට හෝ වැළැක්වීමට අර්ථකථනය කිරීමට අවසර නොමැත.

11. 2021 මාර්තු 22 වන දින සිට මෙම විධානයන් ක්‍රියාත්මක විය යුතු වේ.

අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව
2021 මාර්තු 18

2021 අංක 11 දරන විධානයන් සඳහා වූ ඇමුණුම I

වෙනත් රටක ස්ථිර නේවාසික වීසා යටතේ ශ්‍රී ලංකාවෙන් පිටත වාසය කරන ශ්‍රී ලාංකිකයන්ට සහ ද්විත්ව පුරවාසිභාවය ලබා සිටින පුද්ගලයන් හට, ණය ප්‍රදානය කිරීම පිළිබඳව මාසික ප්‍රකාශනය

බැංකුවේ නම .....

වාර්තා කරන මාසය සහ වසර .....

වගුව : ණය පහසුකම් සක්‍රිය

ණය මුදල් වර්ගය	මාසය ආරම්භයේ දී ණය පහසුකම් ගණන	මාසය ආරම්භයේ දී නොපියවූ ශේෂය	මාසය තුළ දී මුදා හැරීම්		ආපසු ගෙවීම් (ප්‍රාග්ධනය)		මාසය අවසානයේ දී ණය පහසුකම් ගණන	මාසය අවසානයේ දී නොපියවූ ශේෂය
			ශ්‍රී ලංකා රුපියලින්	විදේශ ව්‍යවහාර මුදලින් * (ඇ.එ.ජ. ඩොලර්වලින්)	ශ්‍රී ලංකා රුපියලින් **	විදේශ ව්‍යවහාර මුදලින් * (ඇ.එ.ජ. ඩොලර්වලින්)		
විදේශ ව්‍යවහාර මුදලින් (ඇ.එ.ජ. ඩොලර්වලින්)								
ශ්‍රී ලංකා රුපියලින්								

* විදේශ ව්‍යවහාර මුදල් අනුමත කිරීම සඳහා අවසර හිමි ශ්‍රී ලංකාව තුළ දේපළ විකිණීමේ ව්‍යාපාරයන්හී නියුතු දේපළ සංවර්ධනය කරන්නෙකු අක්වෙරළ බැංකු ඒකකයක පවත්වාගෙන යනු ලබන ගිණුමක හෝ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට ණය මුදල් මාරු කිරීම සඳහා ණය ගැනුම්කරුවෙකු ඉල්ලීමක් කළ අවස්ථාවක දී.

** ණය මුදල රුපියලෙන් නාමනය කරන ලද අවස්ථාවක දී, විගාමිකයින්ගේ ආදායම් ප්‍රේෂණය කළ හැකි ගිණුම් හෝ ආමුඛ ආයෝජන රුපියල් ගිණුම් හරහා හුවමාරු කරන ලද අරමුදල් තුළින් ආපසු ගෙවීම සිදු කළ හැක.

වගුව : ණය -අක්‍රිය

ණය ගැනුම්කරුගේ නම	ණය නිරූපණය කිරීම		ව්‍යවහාර මුදල් කේතය	ණය මුදල		විදේශ ව්‍යවහාර මුදලින් පැහැර හැර ඇති ප්‍රමාණය (ඇ.එ.ජ. ඩොලර්වලින්)	මාසය තුළ ශ්‍රී ලංකා රුපියලින් ආපසු අයකර ගැනීම්	මාසය අවසානයේ දී නොපියවූ ශේෂය ශ්‍රී ලංකා රුපියලින්
	විදේශ ව්‍යවහාර මුදලින් (ඇ.එ.ජ. ඩොලර්වලින්)	ශ්‍රී ලංකා රුපියලින්		විදේශ ව්‍යවහාර මුදලින් (ඇ.එ.ජ. ඩොලර්වලින්)	ශ්‍රී ලංකා රුපියලින්			

වාර්තාවේ පරිලෝපිත පිටපතක් සහ ඉහත දක්වා ඇති ආකාරයේ මයික්‍රොසොෆ්ට් එක්සෙල් පිටපතක් යන ද්විත්වය ම ඉදිරිපත් කිරීමට බලයලත් වෙළඳුන් කටයුතු කළ යුතු වේ.
බැංකු ගිණුම් පොත්වලින් උපුටාගත්/ උත්පාදනය වූ ඉහත තොරතුරු නිවැරදි බවට අපි සහතික වෙමු.

බලයලත් නිළධාරියාගේ නම සහ අත්සන .....

අත්සන සහ මුද්‍රාව .....

දිනය .....

අනුකූලතා නිළධාරියාගේ නම .....

අත්සන .....

දිනය .....

විදේශ විනිමය දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 2021 අංක 12 දරන විධානයන්

බලයලත් වෙළෙඳුන් සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සඳහා අනුමත නියෝජිතයින් ලෙස පත් කරන ලද ප්‍රාථමික වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ (පනත) 7 වන වගන්තිය සමග කියවිය යුතු පනතේ 4 සහ 9 වන වගන්ති ප්‍රකාරව, බලයලත් වෙළෙඳුන්ට හා ශ්‍රී ලංකා රජය (රජය) මගින් නිකුත් කරනු ලබන ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර මිලදී ගැනීම සහ අලෙවි කිරීම සඳහා අනුමත නියෝජිතයන් ලෙස, ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය අධිකාරී (රාජ්‍ය ණය අධිකාරී) විසින් පත් කළ ප්‍රාථමික වෙළෙඳුන් වෙත පහත පරිදි මෙමගින් අවසර දෙනු ලැබේ.

2. පහත 3 ඡේදයේ සඳහන් ආයෝජක කාණ්ඩ මගින් රජයෙන් සෘජුවම මිලදී ගන්නා ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සඳහා රජයට ගෙවිය යුතු මුදල් බැර කිරීම සඳහා රජය වෙනුවෙන් "ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ආයෝජන ගිණුම" (SLDBIA) ලෙස නම් කරන ලද පොළී දරන, ඇ.එ.ජනපද ඩොලර් ගිණුමක් බලයලත් වෙළෙන්දෙකු සමග ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර අත්පත් කර ගැනීම, රඳවා ගැනීම හා පැවරීම සඳහා පවත්වාගෙන යාමට

3. **ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරයන්හි ආයෝජනයට සුදුසුකම් ලබන ආයෝජකයින් කාණ්ඩ:**
   (අ) විදේශ රාජ්‍යයන්හි පුරවැසියන් ඔවුන්ගේ නේවාසික තත්වය නොසලකා ආමුඛ ආයෝජන ගිණුම් හරහා
   (ආ) ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසිකව වාසය කරන ශ්‍රී ලාංකික පුරවැසියන් ආමුඛ ආයෝජන ගිණුම් හරහා
   (ඇ) පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්, ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හෝ අක්වෙරළ බැංකු ඒකක ගිණුම් හිමියන්
   (ඈ) ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපිත සමාගම් හෝ ශ්‍රී ලංකාවෙන් පිටත ලියාපදිංචි කළ හවුල් ව්‍යාපාර, ආමුඛ ආයෝජන ගිණුම් හරහා
   (ඉ) ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටුවා ඇති දේශීය අරමුදල්, ප්‍රාදේශීය අරමුදල්, අන්‍යෝන්‍ය අරමුදල්, ඒකක භාර සහ ආයතනික ආයෝජකයන්, ආමුඛ ආයොජන ගිණුම් හරහා
   (ඊ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලයලත් වෙළෙඳුන් ලෙස පත් කර ඇති බලපත්‍රලාභී වාණිජ බැංකු
   (එ) විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු භාර ගැනීම සඳහා අවසරලත් බලපත්‍රලාභී විශේෂිත බැංකු සහ බලපත්‍රලාභී මූල්‍ය සමාගම්.

4. **ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ආයෝජන ගිණුම (SLDBIA)**
   4.1 **අවසරලත් බැර කිරීම්**
   (අ) ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජනය කිරීම්වලට අදාළව ආශ්‍රිත සේවා ගාස්තු ද ඇතුළුව ශ්‍රී ලංකා රජයෙන් සංවර්ධන බැඳුම්කර මිල දී ගැනීම සඳහා ඉහත 3 වන ඡේදයේ දක්වා ඇති සුදුසුකම්ලත් ආයෝජකයන්ගෙන් ඇ. එ. ජ. ඩොලර් වලින් වන ලැබීම්

4.2 **අවසරලත් හර කිරීම්**

(අ) ඉහත 3 ඡේදයේ සඳහන් කර ඇති සුදුසුකම් සහිත ආයෝජකයින් විසින් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර මිලදී ගැනීම වෙනුවෙන් රජයට කරනු ලබන ගෙවීම වශයෙන්, රාජ්‍ය ණය අධිකාරී විසින් නිකුත් කරන ලද අර්පණ ලියවිල්ලෙහි හෝ චක්‍රලේඛයෙහි දී ඇති උපදෙස්වලට අනුකූලව මුදල් මාරු කිරීම්

(ආ) ඉහත 3 ඡේදයේ සඳහන් කර ඇති සුදුසුකම් සහිත ආයෝජකයන්ගේ ගිණුම්වලට රාජ්‍ය ණය අධිකාරීගේ උපදෙස් මත ආපසු ගෙවීම් සහ වෙනත් ඕනෑම අරමුණක් වෙනුවෙන් කරනු ලබන ගෙවීම් සඳහා වන මුදල් මාරු කිරීම්

(ඇ) ශ්‍රී ලංකා රුපියල් වලින් කරනු ලබන ගෙවීම් හෝ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජනයන්ට අදාළ සේවා ගාස්තු වෙනුවෙන් අනුමත නියෝජිතයන්ගේ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලට කරන මාරු කිරීම්

(ඈ) රාජ්‍ය ණය අධිකාරී වෙත ගෙවිය යුතු වෙනත් ඕනෑම ගෙවීමක් වෙනුවෙන්, රාජ්‍ය ණය අධිකාරී විසින් නිකුත් කරන ලද අර්පණ ලියවිල්ලෙහි හෝ චක්‍රලේඛයෙහි දී ඇති උපදෙස්වලට අනුකූලව මුදල් මාරු කිරීම

5. 2017 නොවැම්බර් 20 වන දින, 2017 අංක 12 දරන විධානයන්ට යටත්ව බලයලත් වෙළෙඳුන් සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සඳහා අනුමත නියෝජිතයින් ලෙස පත් කරන ලද ප්‍රාථමික වෙළෙඳුන් හට පෙර නිකුත් කරන ලද විධානයන් මෙමගින් අවලංගු කරනු ලැබේ.

6. ඉහත 5 ඡේදයේ සඳහන් පරිදි පෙර විධානයන් අවලංගුවීම, එකී අවලංගුවීමට ප්‍රථම ලබා ගත් හිමිකම්, දඩ මුදල් හෝ වගකීම් වෙනුවෙන් බලපෑමක් සිදු නොකෙරේ.

7. මෙම විධාන මගින් අවසරය ලබා දී ඇති කිසිවක් වෙනත් ඕනෑම නීතියක විධිවිධාන සමඟ අනුකූල වීමේ අවශ්‍යතාවෙන් නිදහස් කිරීමක්, නිදොස් කිරීමක් හෝ බලයලත් වෙළඳුන් හෝ මෙම විධාන යටතේ විදේශ විනිමයෙන් ගනුදෙනු කරන වෙනත් ඕනෑම පුද්ගලයෙකු වැළැක්වීමක් ලෙස වටහා නොගත යුතු ය.

8. මෙම විධානයන් **2021 මාර්තු 22** වන දින සිට බලපැවැත්වෙන පරිදි ක්‍රියාත්මක විය යුතු ය.

අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව
2021 මාර්තු 18

විදේශ විනිමය දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ වන 2021 අංක 13 දරන විධානයන්

විදේශ විනිමය විකුණුම් (1 පෝරමය) සහ විදේශ විනිමය මිල දී ගැනුම් (2 පෝරමය) පිළිබඳව බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්

2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි 6 වන සහ 7 වන වගන්තිය සමඟ කියවිය යුතු 9 වන වගන්තිය ප්‍රකාරව, බලයලත් වෙළෙඳුන් විසින් විදේශ විනිමය විකුණුම් හා මිල දී ගැනුම්, අධීක්ෂණ පද්ධතිය - විදේශ විනිමය පද්ධතිය ඔස්සේ සියලු විදේශ විනිමය විකුණුම් සහ මිල දී ගැනීමේ ගනුදෙනුවලට අදාළව, විදේශ විනිමය විකුණුම් (1 පෝරමය) සහ විදේශ විනිමය මිල දී ගැනුම් (2 පෝරමය) තොරතුරු විදේශ විනිමය දෙපාර්තමේන්තුව වෙත පහත නියමයන් සහ කොන්දේසි වලට යටත්ව යොමු කළ යුතු වේ.

1.1 බලයලත් වෙළෙන්දෙකු විසින් ගනුදෙනුවේ සද්භාවය සෑහීමකට පත් කිරීම මත, ශ්‍රී ලංකා රුපියල් විදේශ විනිමයට පරිවර්තනය කිරීම සහ එහි ප්‍රතිලෝම පරිවර්තනය සඳහා අවශ්‍ය වන, විදේශ විනිමය පනතෙහි විධිවිධාන යටතේ අවසරය දී ඇති සියලු ගනුදෙනුවලට අදාළව, පිළිවෙලින්, විදේශ විනිමය මිල දී ගන්නා සහ විකුණනු ලබන ස්වකීය ගනුදෙනුකරුවන්ගෙන්, පිළිවෙලින් **ඇමුණුම I සහ ඇමුණුම II** හි දී ඇති ආකෘතීන්ට අනුව නිරවද්‍ය සහ නිසි ලෙස සම්පූර්ණ කළ 1 පෝරමය සහ 2 පෝරමය ලබා ගත යුතුය.

1.2 බලයලත් වෙළෙන්දෙකු විසින් ගනුදෙනුකරුවන්ගෙන් විද්‍යුත් මාදිලියෙන් (ෆැක්ස්, විද්‍යුත් තැපෑලෙන් හෝ වෙනත් ඕනෑම විද්‍යුත් සම්ප්‍රේෂණ ආකාරයකින්) ලැබෙන ගනුදෙනු ක්‍රියාත්මක කිරීම සඳහා වන අත්සන් තබා සම්පූර්ණ කරන ලද 1 පෝරමය, 2 පෝරමය සහ ලේඛනමය සාක්ෂි පිළිගත යුතුය. එවැනි අවස්ථාවන්වල දී, බලයලත් වෙළෙඳුන් 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත යටතේ වන නෛතික සහ නියාමන වගකීම් සමඟ අනුකූල විය යුතුය. අතර එවැනි අවස්ථාවල දී, බලයලත් වෙළෙඳුන් එවැනි ගනුදෙනුකරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු/ විස්තරවල විශ්වසනීයභාවය සහ නිරවද්‍යභාවය සඳහා පූර්ණ වගකීම භාර ගත යුතුය යන කාරණය යටතේ, 2006 අංක 19 දරන විද්‍යුත් ගනුදෙනු පනත හා ඊට සිදු කරන ඕනෑම සංශෝධනයක් යටතේ, නෛතික සහ නියාමන වගකීම් සමඟ අනුකූල විය යුතුය.

1.3 බලයලත් වෙළෙඳුන් විසින් ඔවුන්ගේ ප්‍රධාන බැංකු පද්ධතිවලින් ගනුදෙනුවේ අගය නොසලකමින් 1 පෝරමය සහ 2 පෝරමයට අදාළ සියලු තොරතුරු උකහා ගත යුතු අතර, කිසිදු අයන්ත්‍රික මැදිහත්වීමකින් තොරව විදේශ විනිමය පද්ධතියට (https(//www.cbsl.lk/forex/) දෛනික පදනමින් නම් කළ කාල වේලාවන්වල දී උඩුගත කළ යුතු වේ. කෙසේවෙතත්, බලයලත් වෙළෙඳුන් විසින් එළඹෙන වැඩ කරන දිනයේ ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීමට පෙර, **විදේශ විනිමය පද්ධතිය වෙත** t+1 පදනමින් ප.ව. 4.30න් පසු ක්‍රියාත්මක කළ ගනුදෙනු පමණක් වාර්තා කළ යුතුය.

1.4 බලයලත් වෙළෙන්දෙකුට 1 පෝරමය සහ 2 පෝරමයේ සියලු අත්‍යවශ්‍ය කොටු ග්‍රහණය කිරීමට එහි ප්‍රධාන බැංකු පද්ධතියෙහි යාන්ත්‍රණයක් තිබිය යුතු අතර, බලයලත් වෙළෙන්දා විසින් විදේශ විනිමය පද්ධතියේ දැක්වෙන මාර්ගෝපදේශ සහ අතුරු මුහුණත් අවශ්‍යතා පිරිවිතරවලට අනුව විදේශ විනිමය දෙපාර්තමේන්තුව වෙත විද්‍යුත්මය වශයෙන් සහ එවැනි සියලු විදේශ විනිමය විකුණුම් සහ මිල දී ගැනුම් තොරතුරු ප්‍රේෂණය කිරීම තහවුරු කළ යුතුය.

1.5 බලයලත් වෙළෙන්දෙකු විසින් විදේශ විනිමය දෙපාර්තමේන්තුවට ක්‍රමික විමසීම්/ සෝදිසි කිරීම් සිදු කිරීමට හැකියාව ලබා දෙමින්, ගනුදෙනු දිනයේ සිට කේන්ද්‍රගත සැකසුම් ඒකකයක් තුළ හෝ බැංකු/ ශාඛා පරිශ්‍රයන් තුළ සටහන් තබා ගැනීමේ අවශ්‍යතාව දක්වා සලකා බැලෙන ගනුදෙනුවල සද්භාවය පිහිටු වීමට අවශ්‍ය ලේඛනමය සාක්ෂි සමඟ ඉහත 1.1 පරිච්ඡේදයට අනුව ලබා ගත් 1 සහ 2 පෝරමයන් භෞතික සහ විද්‍යුත්මය වශයෙන් රඳවා තබා ගත යුතුය.

2. අදාළ විය හැකි වෙනත් කොන්දේසි

2.1 බලයලත් වෙළෙන්දෙකු විසින් විදේශ විනිමය එ.ජ.ඩො. 5,000කට අඩු අගයක් හෝ ඊට සමාන අගයක් වෙනත් ඕනෑම විදේශ ව්‍යවහාර මුදලකින් මිලගන්නා අවස්ථාවේ දී, එම බලයලත් වෙළෙන්දා විසින් එවැනි සියලු තොරතුරු වාර්තා තබා ගැනීමේ අවශ්‍යතාව දක්වා සතිපතා යන පදනමක් මත ඒකාබද්ධ ප්‍රකාශයක ස්වරූපයෙන් පවත්වා ගෙන යා යුතුය.

2.2 බලයලත් වෙළෙන්දෙකු විසින් ඉල්ලීමෙහි නිසි උද්යෝගය සහ සද්භාවය තෘප්තිමත් කරවීම මත, පහත අවස්ථාවන්ට අදාළව, පිළිවෙලින්, විදේශ විනිමය මිලට ගන්නා සහ විකිණීම් සිදු කරන අයදුම්කරුවන් වෙනුවෙන් 1 සහ 2 පෝරමයන් අත්සන් කළ යුතුය.

I. අවශ්‍ය ලිඛිත තහවුරු කිරීම් ලබා ගැනීමෙන් අනතුරුව සිදු කරන අභ්‍යන්තර ප්‍රේෂණ.

II. අන්තර්ජාල බැංකුකරණය සහ ජංගම බැංකුකරණය ඔස්සේ ආරම්භ කරනු ලබන ගනුදෙනු.

III. නිත්‍ය නියෝග ඔස්සේ ආරම්භ කරනු ලබන ගනුදෙනු

IV. බලයලත් වෙළෙන්දාගේ ව්‍යාපාර ස්ථානයට ගනුදෙනුකරුට පැමිණීමට නොහැකි වන අවස්ථාවන්හි දී සහ බලයලත් වෙළෙඳුන් විසින් පහසුකම් සැලසීම මත නැවත අය කර ගැනීමේ ක්‍රියා මාර්ග ක්‍රියාත්මක කරන විට දී පමණක්, ශ්‍රී ලංකා රුපියල් විදේශ ව්‍යවහාර මුදලකට හැරවීම හෝ එහි ප්‍රතිලෝම ආකාරය සිදු වන ගනුදෙනුවක් ක්‍රියාත්මක කිරීමට පාරිභෝගිකයා උපදෙස්, කැමැත්ත සහ අධිකාරය ලබා දෙන්නේ නම්.

V. රටේ පවත්නා ඕනෑම නීති සහ රෙගුලාසි සමඟ අනුකූල වෙමින් විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකින්/ ලංකා රුපියල් ගිණුමකින් ඕනෑම බදු, ව්‍යවස්ථාපිත ගාස්තු හෝ ගාස්තුවක් හර කිරීම සහ බැංකු ගාස්තු/ ගාස්තු හර කිරීම.

VI. ශ්‍රී ලංකා රුපියල් විදේශ ව්‍යවහාර මුදලට හෝ එහි ප්‍රතිලෝම ආකාරයට හැරවීම සිදු වන, බැංකුවෙහි ප්‍රධාන කාර්යාලයෙන්/ ප්‍රධාන කාර්යාලය වෙත සිදු කරන ගෙවීම්/ මාරු කිරීම්.

VII. ශ්‍රී ලංකා රුපියල් විදේශ ව්‍යවහාර මුදලට හෝ එහි ප්‍රතිලෝම ආකාරයට හැරවීම ඇතුළත් වන, බැංකුවෙහි ප්‍රධාන කාර්යාලයෙන්/ ප්‍රධාන කාර්යාලය වෙත සිදු කරන ගෙවීම්/ මාරු කිරීම්.

3. තවද බලයලත් වෙළෙඳුන් විසින් 1 පෝරමයේ සහ 2 පෝරමයේ මෙන්ම, විදේශ විනිමය පද්ධතියට උඩුගත කරන තොරතුරුවල අව්‍යාජත්වය සහ නිරවද්‍යභාවය සඳහා පූර්ණ වගකීම භාර ගත යුතුය.

4. මෙම විධාන මගින් අවසරය ලබා දී ඇති කිසිවක් වෙනත් ඕනෑම නීතියක විධිවිධාන සමඟ අනුකූල වීමේ අවශ්‍යතාවෙන් නිදහස් කිරීමක්, නිදොස් කිරීමක් හෝ බලයලත් වෙළෙඳුන් හෝ මෙම විධාන යටතේ විදේශ විනිමයෙන් ගනුදෙනු කරන වෙනත් ඕනෑම පුද්ගලයෙකු වැළැක්වීමක් ලෙස වටහා නොගත යුතුය.

5. මෙම විධානයන් **2021 මාර්තු 22** වන දින සිට බලපැවැත්වෙන පරිදි ක්‍රියාත්මක විය යුතුය.

අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව
2021 මාර්තු 18

2021 අංක 13 දරන විධානයන් වල ඇමුණුම I

බලයලත් වෙළෙන්දෙකු විසින් විදේශ විනිමය විකිණීම 1 පෝරමය

ජා.හැ.අ./විදේශ ගමන බලපත්‍ර අංකය/ සමාගම් ලියාපදිංචි අංකය		අනුක්‍රමික අංකය	
අයදුම්කරුගේ නම		බැංකු කේතය	අරමුණු කේතය
අයදුම්කරුගේ ලිපිනය		ශාඛා කේතය	අනු අරමුණු කේතය
ගුවන් ප්‍රවේශ පත්‍ර අංකය (සංචාරක කාර්යයන් සඳහා පමණි)			
ප්‍රතිලාභියාගේ නම ප්‍රතිලාභියාගේ ලිපිනය අරමුණ		රටට අදාළ කේතය	ව්‍යවහාර මුදල් කේතය

		බැංකු අණකර	
		විදුලි පණිවුඩ මාරු කිරීම්	
අයදුම්කළ විදේශ විනිමය අගය	එ.ජ.ඩො.	සංචාරක කාඩ්පත්	
	යුරෝ		
	බ්‍රි.ස්ටර්ලින් පවුම	වෙනත් (නිශ්චිතව දක්වන්න)	
		මුදල් නිකුතුව	
මා විසින් ලබා දෙන ලද සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවට මම ප්‍රකාශ කරමි.			
..... දිනය	..... අයදුම්කරුගේ අත්සන		

බැංකුවේ භාවිතය සඳහා	..... දිනය ..... මුදල් අයකැමිගේ අත්සන ..... බැංකුවේ අත්සන සහ මුද්‍රාව	සටහන්	
සටහන:	අයදුම්කරු ශ්‍රී ලංකා රුපියල් විදේශ විනිමය වෙත හරවන පුද්ගලයා විය යුතුය. නිදසුනක් ලෙස, ව්‍යාපාරික සංචාරයක් සඳහා සේවකයෙකුට විදේශ විනිමය සපයන සමාගමක් අයදුම්කරුවා විය යුතු අතර, සේවකයා ප්‍රතිලාභයා විය යුතුය.		

2021 අංක 13 දරන විධානයන් වල ඇමුණුම II

බලයලත් වෙළෙන්දෙකු විසින් විදේශ විනිමය මිල දී ගැනීම **2 පෝරමය**

ජා.හැ.අ./ විදේශ ගමන බලපත්‍ර අංකය/ සමාගම් ලියාපදිංචි අංකය		අනුක්‍රමික අංකය	
ආදායම් බදු ගොනු අංකය			
අයදුම්කරුගේ නම අයදුම්කරුගේ ලිපිනය		බැංකු කේතය	අරමුණු කේතය
ප්‍රේෂකයාගේ නම ප්‍රේෂකයාගේ ලිපිනය අරමුණ		ශාඛා කේතය	අනු අරමුණු කේතය
		රටට අදාළ කේතය	ව්‍යවහාර මුදල් කේතය
		මුදාහල විදේශ විනිමය අගය	
		බැංකු අණකර	
		රුපියල් අගය	
පිළිගත් විදේශ විනිමය අගය	එ.ජ.ඩො. යුරෝ බ්‍රි.ස්ටර්ලින් පවුම්		
මා විසින් ලබා දෙන ලද සියලු තොරතුරු සත්‍ය සහ නිවැරදි බවට මම ප්‍රකාශ කරමි. ..... දිනය ..... අයදුම්කරුගේ අත්සන		මුළු	
බැංකුවේ භාවිතය සඳහා	..... දිනය ..... මුදල් අයකැමිගේ අත්සන ..... බැංකුවේ අත්සන සහ මුද්‍රාව	සටහන්	
සටහන:	2 පෝරමය අයදුම්කරුවා/ ප්‍රතිලාභියා විසින් පෞද්ගලිකව අත්සන් කළ යුතුය. බලයලත් වෙළෙන්දා ගනුදෙනුකරු වෙනුවෙන් අභ්‍යන්තර ප්‍රේෂණ මිල දී ගන්නා සහ මංගත බැංකු පද්ධතිය හරහා අන්තර් ගිණුම් මාරු කිරීම් සිදු කරන විට, බලයලත් වෙළෙන්දා විසින් අයදුම්පත්‍රය අත්සන් කළ යුතුය.		

විදේශ විනිමය දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ නිකුත් කරන විධාන අංක 14

ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් සම්බන්ධයෙන් බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධාන

2021 අංක 01 දරන විදේශ විනිමය නියෝග (විදේශ විනිමය නියෝග අංක 1) (ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන් විසින් ශ්‍රී ලංකාවෙන් පිටත සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු වර්ග) සහ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි (පනත) 6 සහ 7 වගන්ති සමග කියැවිය යුතු 9(1) සහ 9(2) වගන්ති ප්‍රකාරව, පහත සඳහන් කොන්දේසිවලට යටත්ව ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම සඳහා බලයලත් වෙළෙඳුන් හට අවසර ලබා දෙනු ලැබේ.

2. සුදුසුකම් ලත් තැනැත්තන්:

(අ) ඇපයෙන් සීමිත සමාගම් හැර 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත සමාගම්

(ආ) 1998 අංක 30 දරන බැංකු පනත ප්‍රකාරව, බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක්

(ඇ) ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව යටතේ නියාමනය වන/අවසරලත් ආයතන (ඉහත (අ) සහ (ආ) හි සඳහන් සුදුසුකම් ලත් ආයෝජකයන් හැර)

(ඈ) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ ස්ථාපිත සේවක අර්ථසාධක අරමුදල හෝ කම්කරු කොමසාරිස් විසින් ප්‍රකාශයට පත් කළ අනුමත අර්ථසාධක අරමුදල්

(ඉ) ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි වූ යම් හවුල් ව්‍යාපාරයක්; සහ

(ඊ) නේවාසික තනි පුද්ගලයෙකු හෝ එම පුද්ගලයා විසින් ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි කරන ලද ඒක පුද්ගල ව්‍යාපාරයක්

3. ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම

(අ) ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් ඉතිරිකිරීම් හෝ ස්ථාවර තැන්පතු (ශ්‍රී ලංකාවෙන් පිටත සිදුකළ ආයෝජන වලින් ලැබුණු ප්‍රතිලාභ මගින්) හෝ ජංගම (බැංකු අයිරා පහසුකම් හා චෙක්පත් පහසුකම් රහිත) විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් ලෙස, නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් වලින් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම කළ සිදු හැකිය.

(ආ) ප්‍රතිමුඛ ආයෝජන ගිණුමක් තනි ගිණුමක් ලෙස පවත්වාගෙන යා යුතුය. තනි පුද්ගලයන් හට එම තැනැත්තන් විසින් ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි කළ තනි පුද්ගල ව්‍යාපාර සමග, ප්‍රතිමුඛ ආයෝජන ගිණුම්, හවුල් ගිණුම් ලෙස පවත්වාගෙන යා හැකිය. තනි පුද්ගලයින් සහ තනි පුද්ගල ව්‍යාපාර විසින් විවෘත කරනු ලැබූ ප්‍රතිමුඛ ආයෝජන ගිණුම්වල වාර්තා පරීක්ෂා කිරීම සඳහා බලයලත් වෙළෙඳුන් විසින් අභ්‍යන්තර ක්‍රියාමාර්ගයක් ස්ථාපිත කර ගත යුතු ය.

(ඇ) මෙම විධානය ක්‍රියාත්මක වන දිනයට පෙර ශ්‍රී ලංකා රුපියල්වලින් විවෘත කරන ලද ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් මෙම විධානයෙහි 8 වන පරිච්ඡේදයට යටත්ව එම ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් වසා දමන තෙක්, පවත්වාගෙන යා හැකිය.

4. ප්‍රතිමුඛ ආයොජන ගිණුම් අනේවාසික රුපියල් ගිණුම් බවට පරිවර්තනය කිරීම

(අ) ශ්‍රී ලංකාවෙන් පිටත ස්ථිර නේවාසිකත්වය ලබාගත් රටකට, ස්ථිරව පදිංචිවීම සඳහා පිටත්වීමට බලාපොරොත්තු වන යම් සංක්‍රමණිකයෙකු විසින් පවත්වාගෙන යනු ලැබූ ප්‍රතිමුඛ ආයෝජන ගිණුම්, එම තැනැත්තාගේ සංක්‍රමණය පිළිබඳ අදාළ බලයලත් වෙළෙන්දා විසින් දැනුවත් වූ වහාම, අනේවාසික රුපියල් ගිණුම් ලෙස නැවත පරිවර්තනය කර පවත්වාගෙන යා යුතුය.

(ආ) එවැනි ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් අනේවාසික රුපියල් ගිණුම් ලෙස නැවත පරිවර්තනය කරනු ලැබීම පිළිබඳව එම තැනැත්තා විසින් ස්ථිර නේවාසිකත්වය/පුරවැසිභාවය ලබාගත් රටට කරනු ලැබූ බාහිර ප්‍රේෂණ (එ.ජ.ඩොලර්) වල එකතුව, ප්‍රේෂණය කළ දිනය ආදී විස්තර (ඇතුළුව) එම පරිවර්තනය සිදු කල දිනයේ සිට සතියක් ඇතුළත dfem@cbsl.lk යන විද්‍යුත් ලිපිනය ඔස්සේ විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත දැනුම් දිය යුතුය.

5. අවසරලත් බැර කිරීම්

(අ) විදේශ විනිමය පනත සහ අහෝසි කරන ලද විනිමය පාලන පනත යටතේ නිකුත් කරනු ලබන විදේශ විනිමය අංක 1 දරන විදේශ විනිමය නියෝග සහ විශේෂ අවසරයන්හි දක්වා ඇති සීමාවන්ට යටත්ව, ප්‍රතිමුඛ ආයෝජන සඳහා විදේශ ව්‍යවහාර මුදල් බවට පරිවර්තනය කළ ශ්‍රී ලංකා රුපියල්;

(ආ) එම ප්‍රතිමුඛ ආයෝජන ගිණුම මගින් සිදු කළ ප්‍රතිමුඛ ආයෝජන විකිණීමෙන් ලද මුදල් ලෙස, වෙනත් පුද්ගලයෙකුගේ (එනම්, ගැනුම්කරු) ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හෝ පෞද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හෝ ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් වලින් සිදු කරනු ලබන මුදල් මාරු කිරීම්;

(ඇ) බාහිර වාණිජ ණය ගිණුම හරහා විදේශ විනිමය පනත හෝ ඉවත් කරන ලද විනිමය පාලන පනත යටතේ අනුමත ප්‍රතිමුඛ ආයෝජන මූල්‍යනය කිරීම සඳහා විදේශ ණය දෙන්නෙකුගෙන් ගිණුම් හිමියා විසින් ලබා ගන්නා ලද ණය මුදල් මාරු කිරීම්;

(ඈ) බලපත්‍රලාභී වාණිජ බැංකු/බලපත්‍රලාභී විශේෂිත බැංකු/බලපත්‍රලාභී මූල්‍ය සමාගම්/රජයට අයත් ව්‍යාපාර විසින් විදේශ ණය දෙන්නෙකුගේ ශ්‍රී ලංකාවෙන් පිටත පවත්වාගෙන යන ගිණුමක් හෝ ආමුඛ ආයෝජන ගිණුමක් හෝ අක්වෙරළ බැංකු

ඒකකයක පවත්වාගෙන යන ගිණුමක් හරහා විදේශ විනිමය පනත හෝ අහෝසි කරන ලද විනිමය පාලන පනත යටතේ අවසර ලබා දී ඇති ප්‍රතිමුබ ආයෝජන මූල්‍යනය කිරීම සඳහා, ලබා ගන්නා ලද ණය මුදල් මාරු කිරීම්;

(ඉ) විදේශ විනිමය නියෝග අංක 1 හෝ විදේශ විනිමය පනත හෝ අහෝසි කරන ලද විනිමය පාලන පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව අනුමත ප්‍රතිමුබ ආයෝජන මූල්‍යනය කිරීමේ අරමුණින්, බලපත්‍රලාභී වාණිජ බැංකු/ බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින් ලබා ගත් විදේශ ණය මුදල් වශයෙන් ණය ලබා දෙන්නාගේ නොස්ට්‍රො (NOSTRO ගිණුමකින් ලැබෙන මාරු කිරීම්.

(ඊ) විදේශ විනිමය නියෝග අංක 1 හෝ විදේශ විනිමය පනත හෝ අහෝසි කරන ලද විනිමය පාලන පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව අවසරලත් ප්‍රතිමුබ ආයෝජන, එම ප්‍රතිමුබ ආයෝජන ගිණුම් හරහාම කර ඇති විටදී, එයට අදාළ ආදායම් සහ යම් ප්‍රාග්ධන ලැබීම් ආදී ප්‍රේෂණ;

(උ) ප්‍රතිමුබ ආයෝජන ගිණුම හරහා සිදු කරන ලද ප්‍රතිමුබ ආයෝජනයකට අදාළ උසාවි නියෝගයක් යටතේ ලැබෙන ගාස්තු ආදී ප්‍රේෂණ;

(ඌ) විදේශ විනිමය නියෝග අංක 1 න් විදේශ විනිමය පනත හෝ අහෝසි කරන ලද විනිමය පාලන පනතේ ප්‍රතිපාදන විදේශ විනිමය නියෝග අංක 1 හෝ ප්‍රකාරව, ගිණුම්හිමියා විසින්, ප්‍රතිෂ්ඨාවක් රහිතව (No consideration) අත්පත් කර ගන්නා ලද /දරනු ලබන විදේශයක පවතින යම් වත්කමකින්/ආයෝජනයකින් ලැබෙන යම් ආදායමක් හා යම් ප්‍රාග්ධන ලැබීමක් ආදී ප්‍රේෂණ;

(එ) විදේශ විනිමය නියෝග අංක 1 හෝ විදේශ විනිමය පනත හෝ යෝජනා අහෝසි කරන ලද විනිමය පාලන පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව අවසරලත් සේවක කොටස් හිමිකම් සැලැස්මක් හෝ සේවක කොටස් වරණීය යෝජනා ක්‍රමයක් හෝ යටතේ ලැබුණු කොටස් සඳහා අදාළ ප්‍රතිමුබ ප්‍රේෂණය ශ්‍රී ලංකාවේ සමාගමක් හෝ සමාගම් ශාඛාවක් (එනම් සේව්‍යයා) විසින් ගිණුම් හිමියා (එනම්, සේවකයා) වෙනුවෙන් කර ඇති අවස්ථාවක, ඊට අදාල ආදායමක් සහ යම් ප්‍රාග්ධන ලැබීමක් ආදී ප්‍රේෂණ;

(ඒ) අදාල රෙගුලාසි වලට යටත්ව. වෙනත් පුද්ගලයෙකුගේ ප්‍රතිමුබ ආයෝජන ගිණුමක් මගින් සිදු කර ඇති ප්‍රතිමුබ ආයෝජනයක් ගිණුම් හිමියාට උරුම වී ඇති අවස්ථාවක ඊට අදාල යම් ආදායම් සහ යම් ප්‍රාග්ධන ලැබීමක් ආදී ප්‍රේෂණ;

(ඔ) ගිණුම් හිමියා විසින් විදේශ විනිමය නියෝග අංක 1 හෝ විදේශ විනිමය පනත හෝ අහෝසි කරන ලද විනිමය පාලන පනතේ ප්‍රතිපාදන යටතේ අවසරලත් ප්‍රතිමුබ ආයෝජන සඳහා භාවිතා කිරීමට බලාපොරොත්තු වන්නේ නම්, ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සමාගමක් විසින් නිකුත් කළ කොටස් සහ ණය සුරැකුම්පත් වල සිදු කරන ආයෝජන වශයෙන් වෙනත් පුද්ගලයෙකුගේ (එනම් ආයෝජකයා) ආමුබ ආයෝජන ගිණුමකින් ලැබෙන මාරු කිරීම්;

(ඕ) ශ්‍රී ලංකාවේ උරුම සහ අනුප්‍රාප්තික නීති අනුව උරුමයක් වශයෙන් ලද වෙනත් පුද්ගලයෙකුගේ ප්‍රතිමුබ ආයෝජන ගිණුමක පවත්නා ශේෂය ලෙස, එම ප්‍රතිමුබ ආයෝජන ගිණුම හරහා සිදුකරන මාරු කිරීම්;

(ක) එම ප්‍රතිමුබ ආයෝජන ගිණුම හරහා විදේශ විනිමය පනත යටතේ අවසරලත් ප්‍රතිමුබ ආයෝජනයකට ගෙවූ නමුත්, ගෙවීම සිදු කළ දින සිට මාස 3 ක් ඇතුළත සිදු නොකළ ප්‍රතිමුබ ආයෝජනවලට අදාළ මුදල්;

(ග) ප්‍රතිමුබ ආයෝජන වලට අදාළ කළමනාකරණ ගාස්තු, උපදේශක ගාස්තු සහ කොමිස් මුදල්;

(ච) ගිණුමේ පවතින අරමුදල් මත උපයාගත් පොලිය.

6. අවසරලත් හර කිරීම්

(අ) විදේශ විනිමය රෙගුලාසි අංක 1 හෝ විදේශ විනිමය පනත හෝ අහෝසි කරන ලද විනිමය පාලන පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව ගිණුම් හිමියා විසින් කරන ලද ප්‍රතිමුබ ආයෝජනයන්ට අදාළ ප්‍රේෂණ;

(ආ) වෙනත් පුද්ගලයෙකුගේ (එනම් විකුණුම්කරු) ප්‍රතිමුබ ආයෝජන ගිණුමකින් හෝ පෞද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකින් හෝ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකින් ගෙවීමක් සිදු කර මිලදී ගෙන ඇති, විදේශ විනිමය නියෝග අංක 1 හෝ විදේශ විනිමය පනත හෝ අහෝසි කරන ලද විනිමය පාලන පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව අවසරලත් ආමුබ ආයෝජනයන් මිලදී ගැනීම සඳහා එම විකුණුම්කරුගේ අදාළ ප්‍රතිමුබ ආයෝජන ගිණුම් හෝ පෞද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හෝ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර ගිණුම් වෙත සිදු කරන මුදල් මාරු කිරීම්;

(ඇ) ගිණුම් හිමියාගේ ජංගම ගනුදෙනු සඳහා කරනු ලබන ගෙවීම්;

(ඈ) ගිණුම් හිමියාගේ පෞද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් හෝ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් හෝ අක්වෙරළ බැංකු ඒකකයක පවත්වාගෙන යන ගිණුමක් සෘජුවම හර කර හෝ එම ගිණුම්වලින් ප්‍රතිමුබ ආයෝජන ගිණුම් වෙත මුදල් මාරු කිරීමෙන් සිදු කරන ලද ප්‍රතිමුබ ආයෝජනයකින් ලද යම් ආදායමක් හෝ යම් ප්‍රාග්ධන ලැබීමක්, ආයෝජනයේ දායකත්වයට සමානුපාතිකව අදාළ පෞද්ගලික විදේශ ව්‍යවහාර ගිණුම හෝ ව්‍යාපාරික විනිමය පාලන ගිණුම හෝ අක්වෙරළ බැංකු ඒකකයක පවත්වාගෙන යන ගිණුම් වලට සිදුකරන මාරු කිරීම්;

(ඉ) ගිණුම් හිමියාගේ වෙනත් ප්‍රතිමුබ ආයෝජන ගිණුම්වලට මාරු කිරීම්;

(ඊ) විදේශ ණය දෙන්නෙකුගෙන් ලබාගත් ණය පියවීම සඳහා ගිණුම් හිමියාගේ බාහිර වාණිජ ණය ගිණුමට සිදු කරන මාරු කිරීම්;

(උ) ශ්‍රී ලංකාවේ උරුම සහ අනුප්‍රාප්තික නීතිවලට යටත්ව ගිණුමේ පවත්නා ශේෂය ප්‍රතිලාභියා/ උරුමක්කරුගේ ප්‍රතිමුබ ආයෝජන ගිණුමකට මාරු කිරීම්;

(ඌ) විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු ලෙස ආපසු ගැනීම් හෝ ජංගම ගනුදෙනු පිළිබඳ 2021 අංක 02 දරන විධානවලට අනුව ගිණුම් හිමියාගේ සහ/හෝ ආසන්නතම පවුලේ සාමාජිකයන්ගේ සංචාරක අරමුණු සඳහා විදේශ සංචාරක කාඩ්පතක ගබඩා කිරීම සඳහා මුදල් මාරු කිරීම;

(එ) ශ්‍රී ලංකා රුපියල් වලින් ශ්‍රී ලංකාව තුළදී සිදු කරන ගෙවීම්.

7. වෙනත් කොන්දේසි

(අ) රුපියල් ලැබීම් විදේශ මුදල් බවට පරිවර්තනය කර ප්‍රතිමුබ ආයෝජන ගිණුමකට බැර කළ යුත්තේ ප්‍රාග්ධන ගනුදෙනු පිළිබඳ නියෝගවල සඳහන් සියලු අවශ්‍යතා සහ මෙම විධානවල සඳහන් කොන්දේසි සපුරාලීමෙන් අනතුරුව පමණි. කිසිදු හේතුවක් මත ආයෝජනය කිරීමෙන් තොරව එම මුදල් ප්‍රතිමුබ ආයෝජන ගිණුම තුළ රඳවා තබා ගැනීම නොකළ යුතුය.

(ආ) මෙම විධානයේ 6(අ) උප ඡේදයෙහි සඳහන් ගෙවීම්, විදේශීය සමාගමේ (ආයෝජිතයා) ගිණුමකට හෝ අවසරලත් සුරැකුමෙහි විකුණුම්කරුගේ ගිණුමට (ආයෝජනය කොටස් හුවමාරුවක ලැයිස්තු ගත කර ඇති අවස්ථාවක කොටස් තැරැව්කරු හරහා) හෝ නේවාසික ආයෝජකයා විසින් එම රටෙහි පවත්වාගෙන යන ගිණුමකට (විදේශ ආයෝජන පිළිබඳව එම රටෙහි පවතින නෛතික අවශ්‍යතාව අනුව) හෝ ආයෝජිත සමාගම සංස්ථාගත කරමින් පවතින අවස්ථාවක පත් කරන ලද ලේකම්වරයාගේ හෝ රෙජිස්ට්‍රාවරයාගේ ගිණුමට ප්‍රේෂණය කළ යුතුය.

(ඇ) 5(ඇ), 5(ඈ) සහ 5(ඉ) ඡේදයන්හි සඳහන් බැර කිරීම් සිදු කළ යුත්තේ ප්‍රතිමුබ ආයෝජනය සිදු කරන අවස්ථාවේදී ප්‍රතිමුබ ආයෝජනයට අදාළ සියලු අනුමැතීන් ලබා ගැනීමෙන් අනතුරුව පමණි.

(ඈ) නේවාසික ආයෝජකයාට, ප්‍රතිමුබ ආයෝජන ගිණුමක් හරහා, දැනටමත් සිදු කර ඇති ආයෝජනයක් සම්බන්ධයෙන් අමතර ආයෝජනයක් සඳහා ආයෝජිතයාට ප්‍රතිමුබ ආයෝජන ගිණුමක් හරහා අරමුදල් යැවීමට අවශ්‍ය අවස්ථාවක, යෝජිත අමතර ආයෝජනය මුල් ආයෝජනය සිදු කරන ලද ප්‍රතිමුබ ආයෝජන ගිණුම හරහාම සිදු කළ යුතුය.

(ඉ) පහත කරුණු සනාත කර ගැනීම සඳහා බලයලත් වෙළෙඳුන් විසින් අදාළ පරිදි දිවුරුම් ප්‍රකාශයක් ලබාගත යුතුය. (මේ සඳහා බලයලත් වෙළෙඳුන් විසින් විශේෂ ආකෘතියක් පවත්වාගෙන යා යුතුය.)

(i) තනි පුද්ගලයෙක් හෝ තනි පුද්ගල ව්‍යාපාරයක් හෝ හවුල් ව්‍යාපාරයක් විසින් යම් ආයෝජනයක් සිදු කරන විටදී, විදේශ විනිමය පනතේ 31 වන වගන්තිය යටතේ වූ නියමය පරිදි එම තනි පුද්ගලයා හෝ තනි පුද්ගල ව්‍යාපාරය හෝ හවුල් ව්‍යාපාරය ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන් බව;

(ii) අදාළ විදේශ විනිමය රෙගුලාසි මගින් අවසර ලබා දී ඇති පරිදි, ප්‍රතිමුබ ආයෝජන වලට අදාළ ප්‍රතිමුබ ප්‍රේෂණ අදාළ කාල පරිච්ඡේදය තුළ සිදු කර ඇති ද යන වග එම ප්‍රතිමුබ ප්‍රේෂණ වලට අදාළ තොරතුරු සමඟ;

(iii) ආයෝජකයා තනි පුද්ගලයෙකු වන අවස්ථාවක, එම පුද්ගලයාට ශ්‍රී ලංකාව තුළ ලියාපදංචි කළ තනි පුද්ගල ව්‍යාපාරයක් හිමිද යන වග හා එවන් තනි පුද්ගල ව්‍යාපාරයක් විසින් විදේශ විනිමය රෙගුලාසි අංක 1 හෝ විදේශ විනිමය පනත හෝ අහෝසි කරන ලද විනිමය පාලන පනතේ ප්‍රතිපාදන යටතේ ශ්‍රී ලංකාවෙන් පිටත ආයෝජනය කර ඇත්ද යන වග. එසේ නම්, එම විස්තර;

(iv) ආයෝජකයා ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි කළ තනි පුද්ගල ව්‍යාපාරයක් වන අවස්ථාවක, එම තනි පුද්ගල ව්‍යාපාරයේ හිමිකරු විසින් මෙම රෙගුලාසි හෝ විදේශ විනිමය පනත හෝ අහෝසි කරන ලද විනිමය පාලන පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව ශ්‍රී ලංකාවෙන් පිටත ආයෝජනයක් කර ඇත්ද යන වග එසේ නම්, එම විස්තර.

(ඊ) සංක්‍රමණිකයෙකු විසින් ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුමක් (CTRA) ආරම්භ කරන විටදී, ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම ආරම්භ කරන බලයලත් වෙළෙන්දාගේ ඉල්ලීම මත අදාල බලයලත් වෙළෙන්දා විසින් එම සංක්‍රමණිකයා විසින් සිදු කළ ප්‍රතිමුබ ආයෝජන පිළිබඳ තොරතුරු [එම පුද්ගලයා විසින් සිදු කරන ලද ප්‍රතිමුබ ආයෝජනයන් පිළිබඳ විස්තර එම පුද්ගලයා ස්ථිර පදිංචිය හෝ පුරවැසිභාවය ලබාගත් රටට කරන ලද ආයෝජන (ඇ.එ.ඩො.), ප්‍රේෂණ සිදු කළ දිනය ඇතුළුව] දැනුම් දිය යුතුය.

(උ) බලයලත් වෙළෙන්දන් විසින් සිදු කිරීමට නියමිත ගනුදෙනුවේ නීත්‍යානුකූලත්වය සහ සද්භාවය තහවුරු කර ගැනීමටත් මෙම විධානයන් හා අදාළ විදේශ විනිමය රෙගුලාසි වලට අනුකූල බව සනාත කිරීමටත්, ඇමුණුම් 1 හි සඳහන් ලිපිලේඛන ද ඇතුළුව, නෛතිකව පිළිගත හැකි යෝග්‍ය ලේඛනගත සාක්ෂි (අවශ්‍ය පරිදි) ලබා ගත යුතුය.

(ඌ) ඇමුණුම 1 හි ඡේදයේ අංක 1 හි (ඇ) උපඡේදයේ සඳහන් අවසර ලිපිය ලබා ගැනීමෙන් අනතුරුව කුමන හෝ හේතුවක් මත යෝජිත ආයෝජනය සඳහා ප්‍රතිමුබ ප්‍රේෂණ සිදු නොකළ අවස්ථාවකදී, බලයලත් වෙළෙන්දා විසින් ඒ බව, විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත dfem@cbsl.lk යන විද්‍යුත් තැපැල් ලිපිනය ඔස්සේ අදාළ අවසර ලිපිය කල් ඉකුත් වී සතියක් ඇතුළත දැනුම් දිය යුතුය.

(එ) බලයලත් වෙළෙන්දන් විසින් ප්‍රතිමුබ ආයෝජන ගිණුම මගින් සිදු කළ ගනුදෙනු පිළිබඳ ලේඛනගත සාක්ෂි (දෘඪ පිටපත් ලෙස හෝ ඉලෙක්ට්‍රොනික/ඩිජිටල් ආකාරයෙන්) ව්‍යවස්ථාපිත වාර්තා පවත්වාගෙන යා යුතු කාලයෙන් ඔබ්බට ගිණුම පවත්වාගෙන යන කාලය පුරාවට සහ ගිණුම වසා දැමීමෙන් පසු අවම වශයෙන් වසර 6 ක් දක්වා, පවත්වාගෙන යා යුතුය.

8. ප්‍රතිමුබ ආයෝජන ගිණුම් වසා දැමීම

(අ) ප්‍රතිමුබ ආයෝජන ගිණුම වසා දැමිය යුත්තේ එම ගිණුම හරහා ගිණුම් හිමියා විසින් සිදු කරන ලද සියලුම ආයෝජන හමාර කිරීමෙන් පසුවය.

(ආ) කෙසේ නමුත්, ප්‍රතිමුබ ආයෝජන ගිණුම් හිමියෙකු විසින් එම ප්‍රතිමුබ ආයෝජන ගිණුම හරහා සිදු කළ ආයෝජනයන් හමාර කිරීමට හෝ, අනාගත ආදායම් හා ප්‍රාග්ධන ලැබීම් වෙනත් බලයලත් වෙළෙන්දෙකු සමග ආරම්භ කර පවත්වාගෙන යන ප්‍රතිමුබ ආයෝජන ගිණුමකට රැගෙන ඒමේ අරමුණෙන්, ප්‍රතිමුබ ආයෝජන ගිණුම වසා දැමීමට ඉල්ලීමක් කරන අවස්ථාවේදී, මුල් ප්‍රතිමුබ ආයෝජන ගිණුම පවත්වාගෙන ගිය බලයලත් වෙළෙන්දා විසින්, නව ප්‍රතිමුබ ආයෝජන ගිණුම පවත්වාගෙන යාමට අදහස් කරන බලයලත් වෙළෙන්දා වෙත පහත සඳහන් තොරතුරු සහ ලේඛන යැවීමෙන් අනතුරුව, එම ප්‍රතිමුබ ආයෝජන ගිණුම වසා දැමිය හැකිය.

(i) එම ප්‍රතිමුබ ආයෝජන ගිණුම හරහා සිදු කරන ලද දැනට පවතින ආයෝජන පිළිබඳ තහවුරුවක් (ප්‍රතිමුබ ප්‍රේෂණ පිළිබඳ විස්තර, ආයෝජිතයාගේ විස්තර, ආයෝජනයේ ස්වභාවය ආදී තොරතුරු ද ඇතුළුව)

(ii) එම ප්‍රතිමුඛ ආයෝජන ගිණුම හරහා සිදු කළ ගනුදෙනු පිළිබඳව ගිණුම් හිමියාගෙන් ලබා ගන්නා ලද ලේඛනගත සාක්ෂි;

(ඇ) ඉහත උපඡේද 8(අ) සහ 8(ආ) හි සඳහන් වසා දැමීම පිළිබඳව එම ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් හරහා සිදු කළ ආයෝජන, එම ආයෝජන වසා දැමීම හා ඊට පාදක වූ හේතු ඇතුළත් විස්තර, බලයලත් වෙළෙන්දන් විසින් dfem@cbsl.lk යන විද්‍යුත් තැපැල් ලිපිනය හරහා විදේශ විනිමය දෙපාර්තමේන්තුවෙහි අධ්‍යක්ෂ වෙත ගිණුම වසා දමා එක් දිනක් ඇතුළත දැනුම් දිය යුතුය.

9. වාර්තා කිරීමේ අවශ්‍යතා

(අ) බලයලත් වෙළෙන්දෙකු විසින් ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් පිළිබඳ තොරතුරු, දෛනිකව https://www.cbsl.lk/forexnet ඔස්සේ මෙම දෙපාර්තමේන්තුව වෙත සැපයිය යුතුය.

(ආ) ඉහත වාර්තා කිරීමේ අවශ්‍යතා අනුව, අදාල තොරතුරු තම බැංකුවල ගිණුම් පොත් ආශ්‍රයෙන් සකසා ගැනීම විගණනය කිරීම සහ උපුටා ගැනීම සඳහා, බලයලත් වෙළෙන්දන් විසින් සුදුසු තොරතුරු පද්ධතියක් ක්‍රියාත්මක කළ යුතු ය.

(ඇ) යම් බලයලත් වෙළෙන්දෙකු විසින්, විදේශ විනිමය දෙපාර්තමේන්තුව වෙත විද්‍යුත් මාධ්‍යයෙන් සපයන තොරතුරුවල නිරවද්‍යභාවය සහ සම්පූර්ණභාවය පිළිබඳව සත්‍යාපනය කිරීම සඳහා එම තොරතුරු අභ්‍යන්තර විගණන, කලින් කලට සිදු කරන සමාලෝචන සහ අනුකූලතා වැඩසටහන් සඳහා ඇතුළත් කළ යුතු ය. ඊට අදාළ සාක්ෂි ඕනෑම අවස්ථාවකදී විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ පරීක්ෂාව සඳහා ලබා ගත හැකි පරිදි සූදානම් කොට තැබිය යුතු ය.

(ඈ) බලයලත් වෙළෙඳුන් විසින් ඇමුණුම II හි සඳහන් ලේඛන නේවාසික ආයෝජකයාගෙන් ලබාගත යුතු අතර, එම ලිපිලේඛන නියමිත කාල සීමාව තුළ විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත ලබා දිය යුතුය.

10. මෙම විධානයන්ගේ විෂය පථයට අයත් නොවන අරමුණකට අදාළ, ප්‍රතිමුඛ ආයෝජන ගිණුම හරහා සිදු කරන ගනුදෙනු/මුදල් මාරුකිරීම් සඳහා, විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකගෙන් පූර්ව අවසරය ලබාගත යුතුය.

11. මෙම විධාන සම්බන්ධ අරමුණු සඳහා,

(අ) "ප්‍රතිමුඛ ආයෝජන" යන්නෙන් විදේශ විනිමය (ශ්‍රී ලංකාවේ නේවාසිකයන් විසින් ශ්‍රී ලංකාවෙන් පිටත සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු වර්ග) 2021 නියෝග අංක 01 හි (අදාළ සංශෝධන සහිතව) සඳහන් ප්‍රාග්ධන ගනුදෙනු අදහස් වේ.

(ආ) "ශ්‍රී ලංකා රජය සතු ව්‍යවසායයන්" යන්නෙන් විදේශ විනිමය (ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසිකයන් විසින් ශ්‍රී ලංකාව තුළ සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු වර්ග) 2021 නියෝග අංක 02 (අදාළ සංශෝධනය සහිතව) හි සඳහන් ශ්‍රී ලංකා රජය සතු ව්‍යවසායන් අදහස් වේ.

(ඇ) "ප්‍රේෂණ" යන්නට විදුලි පණිවුඩ හුවමාරු, වෙනත් අන්තර් බැංකු හුවමාරු, බැංකු අණකර, වෙනත් ගෙවීම් උපකරණ, ජාත්‍යන්තරව පිළිගත් වෙනත් ගෙවීම් යාන්ත්‍රණ, හරහා ලබාගත් ගෙවීම් ව්‍යවහාර මුදල් නෝට්ටු හැර විදේශයක සිට විදේශ ව්‍යවහාර මුදල් වලින් විනිමය හුවමාරු සමාගම්වලින් / ව්‍යාපාර වලින් ලබාගත් අරමුදල් ඇතුළත් වේ.

12. ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් සම්බන්ධයෙන් 2017 නොවැම්බර් 20 වන දින බලයලත් වෙළෙන්දන් වෙත නිකුත් කරන ලද 2017 අංක 14 දරන විධාන මෙමගින් අහෝසි කරනු ලැබේ.

13. ඉහත 10 වන ඡේදයේ සඳහන් පරිදි පැවති විධාන අවලංගු කිරීම මගින්, එම අවලංගු කිරීමට පෙර ලැබුණු හිමිකම් හෝ යටත් වූ වගකීම් හෝ දණ්ඩන සඳහා බලපෑමක් සිදු කළ නොහැකිය.

14. මෙම විධාන මගින් අවසරදී ඇති කිසිවක්, වෙනත් ඕනෑම නීතියක ප්‍රතිපාදන වලට අනුකූලවීමේ අවශ්‍යතාවෙන් විදේශ විනිමය ගනුදෙනු කරන බලයලත් වෙළෙන්දන් නිදහස් කිරීමක්, නිරපේක්ෂා කිරීමක් හෝ වැළැක්වීමක් ලෙස සැළකිය නොහැකිය.

15. මෙම විධාන වල අඩංගු සියලු හර කිරීම් සහ බැර කිරීම්, විදේශ විනිමය පනතේ වගන්ති අංක 22 යටතේ නිකුත් කරනු ලබන නියෝග වලට යටත් වේ.

16. මෙම විධාන 2021 මාර්තු 22 වන දා සිට බලාත්මක වේ.

අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව
2021 මාර්තු 18

ඇමුණුම I

1. මෙම විධානයන් යටතේ ඇති සියලු ප්‍රතිමුඛ ආයෝජන සම්බන්ධයෙන් පහත ලිපි ලේඛන ලබාගත යුතුය.

(අ) ඇමුණුම (III) හි සඳහන් තොරතුරු ඇතුළත් ඉල්ලීමක්

(ආ) ඇමුණුම (IV) හි සඳහන් ආකෘතිය පරිදි ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ අධි සාමාජිකයෙකු විසින් හෝ සහතිකලත් මූල්‍ය විශ්ලේෂකයන්ගේ ආයතනයේ වරලත් බලපත්‍ර හිමිකරුවෙකු විසින් ලබාදුන් නිර්දේශය *(සටහන : විදේශ විනිමය පනත ප්‍රතිපාදන යටතේ විශේෂ අවසරයක් ඇති හෝ සේවක නියුක්තිකයන්ගේ කොටස් වරණීය යෝජනා ක්‍රම හෝ සේවක කොටස් හිමිකාරිත්ව සැලැසුම් යටතේ හෝ විදේශ විනිමය රෙගුලාසි අංක 1 යටතේ විදේශයන්හි කොටස් හුවමාරුවල සිදු කිරීමට නියමිත ආයෝජන සඳහා මෙය අවශ්‍ය නොවේ.)*

(ඇ) විදේශයන්හි ආයෝජනය කිරීමට අදහස් කරන පුද්ගලයන්ට එරෙහිව 1953 අංක 24 දරන විනිමය පාලන පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව තීන්දු නොවූ නඩු විභාගයක්, ක්‍රියාමාර්ගයක් හෝ නීති කටයුත්තක් හෝ විදේශ විනිමය පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව නඩු

පැවරීමක්, විමර්ශන සිදු කිරීමක් හෝ අය කර ගැනීමේ ක්‍රියාමාර්ගයක් නොමැති බවට විදේශ විනිමය දෙපාර්තමේන්තුවෙන් ලබාගත් නිෂ්කාෂණ සහතිකයක් (ආයෝජනය සම්බන්ධ එක් එක් ප්‍රේෂණ හෝ මුදල් මාරු කිරීම් සඳහා)

(ඇ) ආයෝජන වටිනාකම ආවරණය කරන්නා වූ බදු නිෂ්කාශන සහතිකයක් (දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට අවශ්‍ය පරිදි)

(ඉ) පහත සඳහන් දෑ සනාථ කරමින් දිවුරුම් ප්‍රකාශයක් (තනි පුද්ගයෙක්, තනි පුද්ගල ව්‍යාපාරයක් හෝ හවුල් ව්‍යාපාරයක්)/ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරන ලද යෝජනාවක්.

i. යෝජිත ප්‍රතිමුඛ ආයෝජනය, ආයෝජිතයාගේ රටේ පවතින නීති/රෙගුලාසි වලට අනුකූලව සිදු කරන බව;

ii. ආයෝජිතයාගේ රට තුළ පනවා ඇති නීති/රෙගුලාසි අනුව ප්‍රතිමුඛ ආයෝජනයට අදාළ යම් ආදයමක්, යම් ප්‍රාග්ධන ලැබීමක් සහ සමාගම් අහවර කිරීමක් හෝ වසා දැමීම තුළින් ලැබෙන මුදල් / අතිරික්ත මුදල්, බාධාවකින් තොරව ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කළ හැකි බව ***සටහන:*** *බලයලත් වෙළෙන්දන් විසින් තමන් විසින්ම සෑහීමකට පත් විය හැකි ආකාරයට අදාළ බලධාරීන් විසින් නිකුත් කළ නීති / රෙගුලාසි සම්බන්ධ ලිඛිත සාක්ෂි ලබා ගත යුතු ය.*

2. මීට අමතරව, පහත වර්ගීකරණවලට අදාල විශේෂ ලේඛන ද ලබාගත යුතුය.

(අ) 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද සමාගම්

i. සංස්ථාපන සහතිකය සහ සාංගමික සංස්ථා පත්‍රය හා ව්‍යවස්ථාවලිය (සමාගම් ලේකම් විසින් සහතික කරන ලද)

ii. සමාගම් අධ්‍යක්ෂවරුන්ගේ තොරතුරු ඇතුළත් ලේඛන පිටපත් (සමාගම් ලේකම් විසින් සහතික කරන ලද)

iii. සාංගමික ව්‍යවස්ථාවලිය අනුව, යෝජිත ආයෝජනය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය හෝ කොටස් හිමියන්ගේ යෝජනා සම්මතය (සමාගම් ලේකම් විසින් සහතික කරන ලද)

(ආ) ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි වී ඇති හවුල් ව්‍යාපාර

i. හවුල් ව්‍යාපාර ගිවිසුමෙහි සහ ලියාපදිංචි සහතිකයෙහි සහතික කරන ලද පිටපතක්

ii. හවුල්කරුවන්ගේ නේවාසික තත්වය පිළිබඳ ලිඛිත සාක්ෂි

(ඇ) ශ්‍රී ලංකාව තුළ නේවාසික තනි පුද්ගලයන්

i. නේවාසික තත්ත්වය පිළිබඳ ලිඛිත සාක්ෂි

ii. ආයෝජනය සේවා නියුක්තිකයන්ගේ කොටස් වරණීය ක්‍රමයක හෝ සේවක කොටස් හිමිකාරිත්ව සැලැස්මක සිදු කිරීමට නියමිත නම්, ඊට අදාළ සංස්ථා ප්‍රකාශය

(ඈ) ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි තනි පුද්ගල ව්‍යාපාර:

i. තනි පුද්ගල ව්‍යාපාර පිළිබඳ ලියාපදිංචියේ සහතික පිටපතක්;

ii. තනි පුද්ගල ව්‍යාපාරයේ හිමිකරුගේ නේවාසික තත්වය පිළිබඳ ලිඛිත සාක්ෂි

(ඉ) ශ්‍රී ලංකා මහ බැංකුව, සුරැකුම්පත් හුවමාරු කොමිෂන් සභාව සහ රක්ෂණ මණ්ඩලය යටතේ නියාමනය වන/බලපත්‍රලාභී ආයතන හෝ කම්කරු දෙපාර්තමේන්තුවේ කම්කරු කොමසාරිස් ජනරාල් විසින් ප්‍රසිද්ධ කරන ලද අනුමත අර්ථසාධක අරමුදල් හෝ 1988 අංක 30 දරන බැංකු පනත ප්‍රකාරව බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු (අදාළ සංශෝධන සහිතව)

i. ආයතනය පිහිටුවීම සම්බන්ධ ලිඛිත සාක්ෂි;

ii. යෝජිත ආයෝජනය අනුමත කිරීම සඳහා ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය/කළමනාකරණය/පාලක මණ්ඩලය යනාදිය විසින් සම්මත කරන ලද යෝජනාව සහ නියාමන බලධාරීන්ගෙන් ලබාගත් වෙනත් අනුමත කිරීම්.

ඇමුණුම II

1. බලයලත් වෙළෙන්දන් විසින් විදේශ විනිමය ප්‍රතිමුඛ ප්‍රේෂණය සිදුකර තුන් මසක් ඇතුළත නේවාසික ආයෝජකයන්ගෙන් ලබාගත යුතු ලියවිලි:

(අ) ලැයිස්තුගත නොකළ සමාගමක ආයෝජනය සිදුකරන අවස්ථාවකදී ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපනය කරන ලද නව සමාගමේ සංස්ථාපන සහතිකය, සාංගමික සංස්ථා පත්‍රය හා ව්‍යවස්ථාවලිය.

(ආ) එතෙර කාර්යාලවල ලියාපදංචි සහතික පත්‍රය

(ඇ) ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපනය කරන ලද ලැයිස්තු ගත නොවූ සමාගමක කොටස්වල ආයෝජනය කරන ලද අවස්ථාවකදී, නිකුත් කරන ලද කොටස් (සාමාන්‍ය හෝ වරණීය) සහතිකපත්වල පිටපත් හෝ වෙනත් ඕනෑම සාක්ෂියක්

(ඈ) සේවක කොටස් වරණීය යෝජනා ක්‍රමයකට හෝ සේවක කොටස් හිමිකාරිත්ව සැලැස්මකට සම්මාදම් වී කර ඇති සියලුම නේවාසික සේවකයන් වෙත නිකුත් කරනු ලබන කොටස් ආයෝජන/ලියාපදිංචි සහතිකවල පිටපත්.

(ඉ) ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපිත සමාගම්වල ලැයිස්තුගත කොටස්වල (සාමාන්‍ය හෝ වරණීය), සාංගමික බැඳුම්කර සහ ණයකර සහ විදේශ රාජ්‍ය විසින් නිකුත් කරනු ලබන ස්වෛරීත්ව බැඳුම්කරවල ආයෝජනය කිරීම සම්බන්ධයෙන් අදාළ එතෙර කොටස්/බැඳුම්කර හුවමාරුවල මධ්‍යම තැන්පතු පද්ධතිය මගින් ලබා ගන්නා මාසික ප්‍රකාශ.

(ඊ) එතෙර ආයෝජකයා විසින් නිකුත් කළ ඒකක/ණයකර/සාංගමික බැඳුම්කර සහතික වල සහිතක කළ පිටපත්.

2. වාර්ෂික පදනමක් යටතේ

(අ) ලැයිස්තුගත නොකළ එතෙර සමාගම් සහ එතෙර කාර්යාලවල විගණනය කරන ලද වාර්ෂික ගිණුම් වාර්තා

(ආ) ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපිත සමාගම්වල ලැයිස්තුගත සාමාන්‍ය හෝ වරණීය කොටස්වල, සාංගමික බැඳුම්කර සහ ණයකර සහ විදේශීය රාජ්‍ය විසින් නිකුත් කරනු ලබන ස්වෛරිත්ව බැඳුම්කරවල ආයෝජනය කිරීම සම්බන්ධයෙන් අදාළ එතෙර කොටස්/බැඳුම්කර හුවමාරුවල මධ්‍යම තැන්පතු පද්ධතිය මගින් ලබා ගන්නා ප්‍රකාශ.

ඇමුණුම III

එතෙර ආයෝජන පිළිබඳ තොරතුරු:

1. සාමාන්‍ය තොරතුරු

(අ) සමාගමේ/හවුල් ව්‍යාපාරයේ/තනි පුද්ගලයාගේ හෝ තනි පුද්ගල ව්‍යාපාරයේ/ ආයතනයේ නම :

(ආ) ව්‍යාපාර ලියාපදිංචි අංකය/ජාතික හැඳුනුම්පත් අංකය/ගමන් බලපත් අංකය (නේවාසික ආයෝජකයා ශ්‍රී ලංකාවේ නේවාසික විදේශිකයෙකු වන සහ වලංගු ජාතික හැඳුනුම්පතක් නොමැති අවස්ථාවකදී පමණක් බලයලත් වෙළෙන්දාට විසින් ගමන් බලපත්‍ර අංකය ලබාගත හැකිය)

2. විදේශ ආයෝජනය පිළිබඳ තොරතුරු (අදාළ පරිදි)

(අ) සාමාන්‍ය කොටස් /වරණීය කොටස් /ඒකක/ණයකර/ස්වෛරිත්ව බැඳුම්කරවල ආයෝජන;

i. ආයෝජනය කිරීමට යෝජිත මුළු වටිනාකම (ඇ.එ.ජ. ඩොලර්වලින්);

ii. සමාගමේ/නිකුත් කරන්නාගේ නම සහ රට;

iii. ආයෝජනයේ ස්වභාවය (සාමාන්‍ය කොටස් හෝ වරණීය කොටස්/ඒකක/ණයකර/ස්වෛරිත්ව බැඳුම්කර)

iv. ආයෝජනය ලැයිස්තුගත ද නැත්ද යන වග

v. අත්පත් කර ගැනීමට යෝජිත සාමාන්‍ය කොටස්/වරණීය කොටස්/බැඳුම්කර/ඒකක/ණයකර/ස්වෛරිත්ව බැඳුම්කර ගණන;

vi. සාමාන්‍ය කොටසක හෝ වරණීය කොටසක/ඒකකයක/ණයකරයක/ස්වෛරිත්ව බැඳුම්කරයක මිල;

vii. කල් පිරෙන දිනය;

viii පොලී අනුපාතිකය;

ix. නිකුත් කරන්නාගේ ස්වෛරිත්ව ණය ශ්‍රේණිගත කිරීම;

(ආ) එතෙර කාර්යාල පිහිටුවීම සහ නඩත්තු කිරීම සඳහා සිදු කරන ආයෝජන

(i) ආයෝජනය කිරීමට යෝජිත මුළු වටිනාකම (ඇ.එ.ජ. ඩොලර්වලින්)

(ii) එතෙර කාර්යාල වර්ගය සහ එහි පිහිටුවීමේ අරමුණ සහිතව

ඉහත සඳහන් කරන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවට මම මෙයින් ප්‍රකාශ කර සිටිමි.

බලයලත් නිලධාරියාගේ අත්සන	බලයලත් නිලධාරියාගේ අත්සන
තනතුර:	තනතුර :
රබර් මුද්‍රාව:	රබර් මුද්‍රාව
දිනය :	දිනය

ඇමුණුම IV

නිර්දේශය සිදු කරන්නේ .....(නම)

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ ප්‍රතිපාදන යටතේ නිකුත් කර ඇති රෙගුලාසිවල සඳහන් අරමුණු සඳහා විදේශ විනිමය නිදහස් කිරීම සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයෙතනයේ අධි සාමාජික, හෝ සහතිකලත් මූල්‍ය විශ්ලේෂකයන්ගේ ආයතනයේ බලපත්‍රලාභියෙකු විසින් කරන නිර්දේශය :

යොමුව : කළමනාකරු

ශාඛාව :

බලයලත් වෙළෙන්දාගේ නම :

වගන්ති 1 : ..... (*සුදුසුකම් ලත් ආයෝජකයාගේ නම*) පසුගිය මූල්‍ය වර්ෂ තුන තුළ යහපත් මූල්‍ය තත්ත්වයක් සහ කාර්ය සාධනයක් පවත්වාගෙන ඇති බව මම මෙයින් සනාත කරමි.

වගන්ති 2 : පහත දැක්වෙන යෝජිත ආයෝජනයේ තොරතුරු මා විසින් ..... (*කරුණාකර භාවිතා කළ ක්‍රමය/ක්‍රම සඳහන් කරන්න*) යන ආයෝජන ඇගයීමේ ක්‍රම පාදක කොට ගෙන විශ්ලේෂණය කර ඇති බව සහ එම ආයෝජනය නිර්දේශ කරන බව මම සනාථ කරමි.

සටහන :

i. යෝජිත ආයෝජනය තක්සේරු කිරීමේදී සහ නිර්දේශ කිරීමේදී ආයෝජනයේ කාල අගය සහ එහි ප්‍රතිලාභ සළකා බැලිය යුතුය.

ii. ආයෝජකයාගේ මූල්‍ය තත්ත්වය සහ කාර්ය සාධනය පිළිබඳ වාර්තාව සහ නිර්දේශ සඳහා හේතු ඇතුලුව යෝජිත ආයෝජන පිළිබඳ විශ්ලේෂණය මෙහි සැපයිය යුතුය.

1. **සාමාන්‍ය තොරතුරු**

(අ) ආයොජකගේ නම :

(ආ) වටිනාකම ඇමෙරිකානු ඩොලර් වලින් (හෝ ඊට සමාන වෙනත් අනුමත විදේශ ව්‍යවහාර මුදල් ඒකකයකින්):

2. **ආයෝජනයේ තොරතුරු (අදාළ පරිදි)**

(අ) ආයෝජකයාගේ නම සහ රට:

(ආ) ආයෝජන වර්ගය (සාමාන්‍ය කොටස්/වරණීය කොටස්/ඒකක/ණයකර/සාංගමික බැඳුම්කර/ස්වෛරීත්ව බැඳුම්කර/එතෙර කාර්යාල)

(ඇ) ආයෝජනය ලැයිස්තුගත ද නැත්ද යන වග:

(ඈ) එතෙර කාර්යාලයක් නම්,

i. කාර්යාල වර්ගය (ශාඛා, ව්‍යාපෘති, සම්බන්ධීකරණ, නියෝජිත ආදී)

ii. එය පවත්වාගෙන යෑමේ අරමුණ:

(ඉ) සමාගමේ කොටස්/ස්වෛරිත්ව බැඳුම්කර/ඒකක/ණයකර ගණන:

(ඊ) සමාගමේ කොටසක/බැඳුම්කරයක/ඒකකයක/ණයකරයක මිල

(උ) කල්පිරෙන දිනය

(ඌ) පොලී අනුපාතිකය

(ඍ) වෙනත් විශේෂ තොරතුරු (ඇත්නම්):

බලයලත් නිලධාරියාගේ අත්සන :

තනතුර :

රබර් මුද්‍රාව :

දිනය :

විදේශ විනිමය දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා මහ බැංකුව

2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2021 අංක 15 දරන විධානයන්

ආමුඛ ආයෝජන ගිණුම් සම්බන්ධයෙන් බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්

2021 අංක 02 දරන විදේශ විනිමය (ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තෙකු විසින් ශ්‍රී ලංකාව තුළ දී සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු වර්ග) නියෝග (නියෝග) සහ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 6 සහ 7 වන වගන්ති සමග කියවිය යුතු 9 වන වගන්තිය ප්‍රකාරව, පහත සඳහන් කරුණු වලට යටත්ව, දේශීය බැංකු ඒකකය තුළ ආමුඛ ආයෝජන ගිණුම් විවෘත කිරීමට හා පවත්වාගෙන යාමට බලයලත් වෙළෙඳුන් වෙත අවසර දෙනු ලැබේ.

2. **සුදුසුකම්ලත් පුද්ගලයන්:**

(අ) ශ්‍රී ලංකාව තුළ හෝ පිටත නේවාසික විජාතිකයෙකු;

(ආ) ශ්‍රී ලංකාව තුළ හෝ පිටත නේවාසික ශ්‍රී ලාංකික ද්විත්ව පුරවැසියෙකු;

(ඇ) ශ්‍රී ලංකාව තුළ හෝ පිටත නේවාසික වෙනත් රටක නිත්‍ය වාසිකත්වය හෝ පුරවැසිභාවය ලබාගෙන ඇති ශ්‍රී ලාංකික ජාතිකයෙකු;

(ඈ) ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික, විදේශයක සේවයෙහි නියුක්ත ශ්‍රී ලාංකික පුරවැසියෙකු (විගාමිකයන් හැර);

(ඉ) ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපිත කරන ලද සමාගමක්;

(ඊ) ශ්‍රී ලංකාවෙන් පිටත ලියාපදිංචි කරන ලද හවුල් ව්‍යාපාරයක්;

(උ) ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටුවන ලද දේශීය අරමුදල්, ප්‍රාදේශීය අරමුදල්, අන්‍යෝන්‍ය අරමුදල්, ඒකක භාර සහ විදේශීය ආයතනික ආයෝජකයන්

(ඌ) බලයලත් වෙළෙන්දෙකු සමග ආමුඛ ආයෝජන ගිණුමක් පවත්වාගෙන යනු ලැබූ මියගිය තැනැත්තෙකුගේ බූදලයේ අද්මිනිස්ත්‍රාසිකරුවකු හෝ පොල්මඃකරුවකු;

(ඍ) බලයලත් වෙළෙන්දෙකු සමග ආමුඛ ආයෝජන ගිණුමක් පවත්වාගෙන යනු ලැබූ සමාගමක ප්‍රතිග්‍රාහකයකු හෝ ඇවරකරුවෙකු

3. ආමුඛ ආයෝජන ගිණුම් විවෘත කිරීම හා පවත්වාගෙන යාම

(අ) ආමුඛ ආයෝජන ගිණුම් ශ්‍රී ලංකා රුපියල්වලින් හෝ ඕනෑම නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින්, ඉතිරි කිරීමේ ගිණුම් හෝ ස්ථාවර තැන්පතු ගිණුම් හෝ ජංගම ගිණුම් (බැංකු අයිරා පහසුකම් හෝ චෙක්පත් මගින් ගනුදෙනු කිරීමේ පහසුකම් නොමැතිව), ලෙස විවෘත කර පවත්වාගෙන යා හැකිය.

(ආ) ආමුඛ ආයෝජන ගිණුම් තනි පුද්ගල ගිණුමක් ලෙස පවත්වාගෙන යා යුතුය. සුදුසුකම්ලත් පුද්ගලයන්ට 2 වන ඡේදයේ (අ), (ආ) සහ (ඇ) අනුඡේද යටතේ සුදුසුකම් ලබන පවුලේ සමීපතම සාමාජිකයෙකු සමග ආමුඛ ආයෝජන ගිණුම් බද්ධ ගිණුම් ලෙස පවත්වාගෙන යා හැකි ය.

(ඇ) මෙම විධානවල දිනයට පෙර, පවුලේ සමීපතම සාමාජිකයෙකු නොවන පුද්ගලයෙකු සමග දැනටමත් විවෘත කර ඇති ආමුඛ ආයෝජන ගිණුම් මෙම විධානවල 7(අ) වන ඡේදයට යටත්ව එම ගිණුම වසා දමන තුරු තවදුරටත් ක්‍රියාත්මකව පවත්වාගෙන යා හැකි ය.

4. අවසරලත් බැර කිරීම්

(අ) ගිණුම් හිමියා වෙනුවෙන් බැංකු පද්ධතිය හරහා ශ්‍රී ලංකාවට පිටතින් ලැබෙන්නා වූ විදේශ විනිමය;

(ආ) විදේශ විනිමය පනතේ 8 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද නියෝගයට යටත්ව, ශ්‍රී ලංකා රේගුවට ප්‍රකාශ කිරීම මත ගිණුම් හිමියා ශ්‍රී ලංකාව තුළට රැගෙන ආ විදේශ විනිමය;

(ඇ) ගිණුම් හිමියාගේ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හෝ ආමුඛ ආයෝජන ගිණුම් හෝ විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුම් හෝ රාජ්‍ය තාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හෝ රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුම් හෝ අක්වෙරළ බැංකු ඒකකයක පවත්වාගෙන යන ගිණුම්වලින් කරනු ලබන මාරු කිරීම්

(ඈ) නියෝග හෝ අවලංගු කරන ලද විනිමය පාලන පනතේ හෝ විදේශ විනිමය පනතේ ප්‍රතිපාදන යටතේ ගිණුම් හිමියා විසින් ශ්‍රී ලංකාව තුළ සිදු කරන ලද ප්‍රාග්ධන ගනුදෙනු වලින් ලැබෙන ඕනෑම ආදායමක් හෝ ප්‍රාග්ධන ලැබීමක්, වෙනත් පුද්ගලයෙකුගේ (එනම් ආයෝජිතයා හෝ බදු කරු, හෝ ගැනුම්කරු) ශ්‍රී ලංකා රුපියල් ගිණුමකින්, හෝ ව්‍යාපාර විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකින් හෝ අක්වෙරළ බැංකු ඒකකයෙහි පවත්වාගෙන යන ගිණුමකින් සිදු වන මාරු කිරීම් ලෙස

(ඉ) නියෝග හෝ අවලංගු කරන ලද විනිමය පාලන පනතේ හෝ විදේශ විනිමය පනතේ ප්‍රතිපාදන යටතේ ආමුඛ ආයෝජන ගිණුමක් හරහා සිදු කරන ලද ආයෝජන විකුණන අවස්ථාවක දී, එම ආයෝජන මිලදී ගන්නා තැනැත්තාගේ ආමුඛ ආයෝජන ගිණුමෙන් විකුණුම් මුදල් ලෙස කරනු ලබන මාරු කිරීම්

(ඊ) ආමුඛ ආයෝජන ගිණුම හරහා සිදු කළ ප්‍රාග්ධන ගනුදෙනු සම්බන්ධයෙන් වූ උසාවි නියෝගයක් යටතේ ලැබිය යුතු මුදල

(උ) සෙන්ට්‍රල් ඩිපොසිටරි සිස්ටම්ස් පුද්ගලික සමාගම සහ කොළඹ කොටස් වෙළඳපොළ මගින් නිශ්චය කරනු ලබන පරිදි ගිණුම්හිමියා වෙත ලැබෙන හිමිකම්

(ඌ) නියෝගවල අවසර දී ඇති පරිදි හෝ අවලංගු කරන ලද විනිමය පාලන පනතේ හෝ විදේශ විනිමය පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව, ආමුඛ ආයෝජන ගිණුම හරහා ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයෙකු (එනම්, ණයගැතියා) හට ප්‍රදානය කළ ණය මුදල්වල පියවීම් ලෙස ණයගැතියාගේ විදේශීය වාණිජ ණය ගැනීමේ ගිණුම හරහා වූ හුවමාරු ලෙස කරනු ලබන මාරු කිරීම්.

(එ) නියෝග හෝ විදේශ විනිමය පනතේ ප්‍රතිපාදන යටතේ, ආමුඛ ආයෝජන ගිණුම හරහා බලපත්‍රලාභී වාණිජ බැංකු හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකු හෝ ශ්‍රී ලංකා රජය හෝ රාජ්‍ය හිමිකම සහිත ව්‍යවසායයන් (එනම්, ණයගැතියා) වෙත ප්‍රදානය කළ ණය මුදල් වල නැවත ගෙවීම් ලෙස ණයගැතියාගේ ශ්‍රී ලංකා රුපියල් ගිණුමකින් වන මාරු කිරීම්

(ඒ) 2017 නොවැම්බර් මස 20 සිට මෙම විධානවල දිනය තෙක් කාලපරිච්ඡේදය තුළ ආමුඛ ආයෝජන ගිණුම හරහා ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයන් (එනම්, ණයගැතියා) හට ලබා දුන් ණය මුදල් පියවීම් ලෙස ණයගැතියාගේ ශ්‍රී ලංකා රුපියල් ගිණුම හෝ ව්‍යාපාර විදේශ ව්‍යවහාර මුදල් ගිණුම හෝ අක්වෙරළ බැංකු ඒකකයෙහි පවත්වාගෙන යන ගිණුම්වලින් සිදු කරනු ලබන ගෙවීම්

(ඔ) මෙම විධානවල 6(ඉ) අනුඡේදයට යටත්ව, ගිණුම් හිමියා විසින් 2021 අංක 11 දරන විධාන යටතේ ලබාගත් ණය මුදලක් මගින් අත්කරගත් නේවාසික දේපළක් මගින් උපයාගනු ලබන ඕනෑම ආදායමක් හෝ ප්‍රාග්ධන ලැබීමක්.

(ඕ) ආයෝජනය සඳහා ගෙවීම් කරනු ලැබූ දිනයේ සිට මාස තුනක් ඇතුළත, අරමුදල් ප්‍රේෂණය කරනු ලැබූ ආමුඛ ආයෝජන ගිණුමටම බැර කරනු ලබන, ණය ප්‍රදානය හැර, සිදු කරනු ලැබූ ප්‍රාග්ධන ගනුදෙනු (මූලික කොටස් නිකුතුව ඇතුළුව) සම්පූර්ණ නොවීම හේතුවෙන් ඒ සඳහා යෙදවූ මුදල. නිවාස සංකීර්ණයක සිදු කරනු ලබන ආයෝජනවල දී, ගිවිසුමෙහි කොන්දේසි සපුරාලීමට අපොහොසත් වීම හෝ පාර්ශ්ව අතර එළඹෙන ලද ගිවිසුම් අවසන් වීම නිසා, එම දේපළවල ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ වීමට පෙර, දේපළ සංවර්ධනය කරන පුද්ගලයාගේ ව්‍යාපාර විදේශ ව්‍යවහාර මුදල් ගිණුම මගින් නැවත ගෙවනු ලබන මුදල්

(ක) ගිණුම් හිමියාගේ ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුමෙන් මාරු කරනු ලැබූ සංක්‍රමණික දීමනාව සහ වර්තන ආදායම

(ග) 2020 අප්‍රියෙල් 08 දිනැති අංක 2170/4 දරන ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නියෝග (එම නියෝගවලට කරනු ලබන ඕනෑම සංශෝධනයකට යටත්ව) සහ විශේෂ තැන්පතු ගිණුම්වලට අදාළ වන විධාන යටතේ විවෘත කර පවත්වාගෙන යනු ලබන විශේෂ තැන්පතු ගිණුම්වල පොළිය ඇතුළුව කල්පිරීමේ මුදල්

(ච) ගිණුම් හිමියා ශ්‍රී ලංකාව තුළ හෝ පිටත නේවාසික විජාතිකයෙකු වන අවස්ථාවක;

i. ගිණුම් හිමියා ශ්‍රී ලංකාවේ නේවාසිකයෙකුව සිටින කාලය තුළ දී ඔහුගේ/ඇයගේ වේතන, විශ්‍රාමික පාරිතෝෂික ප්‍රතිලාභ (සේවා නියුක්තිකයන්ගේ අර්ථසාධක අරමුදල, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල, පාරිතෝෂිකය හා විශ්‍රාම වැටුප් හෝ වෙනත් විශ්‍රාමික ප්‍රතිලාභ භාවිතයෙන් සිදු කරන ලද ප්‍රාග්ධන ගනුදෙනුවලින් ලැබෙන ඕනෑම ආදායමක් හෝ ප්‍රාග්ධන ලැබීමක්

ii. ගිණුම් හිමියාගේ ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුමෙන් ලිත් වර්ෂයක් ඇතුළත එ. ජ. ඩො. 30,000 ක මාරු කිරීම්

(ජ) ගිණුම් හිමියා ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත සමාගමක් වන අවස්ථාවක දී, ගිණුම් හිමියාගේ අනේවාසික රුපියල් ගිණුමෙන් ලිත් වර්ෂයක් ඇතුළත එ. ජ. ඩො. 30,000 ක මාරු කිරීම්

(ට) ගිණුම් හිමියා මියගිය තැනැත්තෙකුගේ බූදලයේ අද්මිනිස්ත්‍රාසිකරු හෝ පොල්මඃකරු හෝ සමාගමක ප්‍රතිග්‍රාහකයෙකු හෝ ඇවරකරු වන අවස්ථාවක;

i. මියගිය පුද්ගලයා හෝ ඇවරවන සමාගම විසින් නියෝග හෝ අවලංගු වූ විනිමය පාලන පනතේ හෝ විදේශ විනිමය පනතේ ප්‍රතිපාදනවල අවසර ලබා දී ඇති පරිදි සිදු කළ ප්‍රාග්ධන ගනුදෙනු වලින් ලද ඕනෑම ආදායමක් හෝ ප්‍රාග්ධන ලැබීමක්

ii. එම මියගිය පුද්ගලයාගේ හෝ ඇවරවන සමාගමේ ආමුබ ආයෝජන ගිණුම් වලින් කරනු ලබන මාරු කිරීම්

(ඩ) ගිණුම් හිමියා ප්‍රතිලාභියෙකු වන අවස්ථාවක, මියගිය පුද්ගලයෙකුගේ බූදලයේ අද්මිනිස්ත්‍රාසිකරු හෝ පොල්මඃකරුගේ හෝ සමාගමක ප්‍රතිග්‍රාහකයාගේ හෝ ඇවරකරුගේ ආමුබ ආයෝජන ගිණුමෙන් කරනු ලබන මාරු කිරීම්

(ත) ගිණුමේ පවතින ශේෂය මත උපයාගත් පොලිය

5. **අවසරලත් හර කිරීම්**

(අ) ගිණුම් හිමියාගේ නමින් ශ්‍රී ලංකාවෙන් පිටතට කරනු ලබන ඕනෑම ප්‍රතිමුඛ ප්‍රේෂණයක්;

(ආ) ගිණුම් හිමියාගේ දේශීය වියදම් සඳහා ශ්‍රී ලංකා රුපියල්වලින් කරනු ලබන ආපසු ගැනීම්;

(ඇ) ගිණුම් හිමියාගේ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හෝ ආමුබ ආයෝජන ගිණුම් හෝ රාජ්‍ය තාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්, රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුම් හෝ අක්වෙරළ බැංකු ඒකකයක පවත්වාගෙන යන ගිණුම් වලට කරනු ලබන මාරු කිරීම්;

(ඈ) නියෝග යටතේ හෝ විදේශ විනිමය පනතේ ප්‍රතිපාදන යටතේ ප්‍රදානය කරන ලද අවසර ප්‍රකාරව, ගිණුම් හිමියා විසින් ශ්‍රී ලංකාව තුළ සිදු කරන ප්‍රාග්ධන ගනුදෙනු වලට අදාළ වන ගෙවීම් ලෙස පහත සඳහන් ගිණුම් වලට සිදු කරන හර කිරීම්;

i. ආයෝජනය විකුණනු ලබන පුද්ගලයාගේ හෝ ආයෝජිතයාගේ (නේවාසිකයෙකු වන) ශ්‍රී ලංකා රුපියල් ගිණුමකට;

ii. විදේශ විනිමය නියෝග හෝ ප්‍රදානය කරන ලද විශේෂ අවසරයක් ප්‍රකාරව විදේශ ව්‍යවහාර මුදලින් ආයෝජිත මුදල් ලබා ගැනීමට අවසරලත් නේවාසිකයෙකු වන ආයෝජිතයෙකු හෝ නිකුත් කරන්නෙකුගේ විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට;

iii. අවසරලත් ආයෝජනයක් මිලදී ගැනීම වෙනුවෙන් වෙනත් පුද්ගලයෙකුගේ (එනම්, විකුණුම්කරු) ආමුබ ආයෝජන ගිණුමකට;

iv. නිවාස සංකීර්ණයක් මිලදී ගැනීම සඳහා වන ආයෝජනයක් නම්, දේපළ සංවර්ධනය කරන තැනැත්තාගේ ව්‍යාපාර විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට;

v. ආයෝජන මණ්ඩල නීතිය යටතේ ආයෝජිතයා ශ්‍රී ලංකාව තුළ සිදු කරන ආයෝජන සම්බන්ධයෙන් වන විදේශ විනිමය පනතෙහි අදාළ ප්‍රතිපාදන වලින් නිදහස් කර ඇත්නම්, ආයෝජිතයා විසින් අක්වෙරළ බැංකු ඒකකයෙහි පවත්වාගෙන යන ගිණුමකට.

(ඉ) නියෝග හෝ විදේශ විනිමය පනතේ ප්‍රතිපාදන යටතේ, බලපත්‍රලාභී වාණිජ බැංකුවකට හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවකට හෝ ශ්‍රී ලංකා රජයට හෝ රාජ්‍ය හිමිකම සහිත ව්‍යවසායකට (එනම්, ණය ගැතියා), ප්‍රදානය කර ඇති ණය මුදලක්, එම ණයගැතියාගේ ශ්‍රී ලංකා රුපියල් ගිණුමකට මාරු කිරීම;

(ඊ) නියෝග හෝ විදේශ විනිමය පනතේ ප්‍රතිපාදන යටතේ, බලපත්‍රලාභී වාණිජ බැංකුවකට හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවකට (එනම්, ණය ගැතියා), ප්‍රදානය කරන ලද ණය මුදලක් එම ණය ලබා ගැනීම, නියෝග හෝ විදේශ විනිමය පනතේ විධිවිධාන යටතේ සිදු කරන විදේශ ආයෝජන මූල්‍යනය කිරීමේ අරමුණ සඳහා සිදු කරයි නම්, ණය ගැතියාගේ ප්‍රතිමුඛ ආයෝජන ගිණුමකට මාරු කිරීම;

(උ) නියෝග හෝ විදේශ විනිමය පනතේ ප්‍රතිපාදන යටතේ ප්‍රදානය කරන ලද ණය මුදල් ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයෙකුගේ (එනම්, ණය ගැතියා) විදේශීය වාණිජ ණය ගිණුමකට මාරු කිරීම;

(ඌ) නියෝග හෝ විදේශ විනිමය පනතේ ප්‍රතිපාදන යටතේ, ශ්‍රී ලංකාවේ සංස්ථාගත සමාගමක් විසින් නිකුත් කරනු ලබන කොටස් හෝ ණය සුරැකුම්පත්වල කරනු ලබන ආයෝජන, නියෝග හෝ විදේශ විනිමය පනතේ ප්‍රතිපාදන යටතේ ආයෝජිතයාගේ ප්‍රතිමුඛ ආයෝජනයක් මූල්‍යනය කිරීමේ අරමුණ සඳහා භාවිත කරයි නම්, ආයෝජකයාගේ ප්‍රතිමුඛ ආයෝජන ගිණුමකට කරනු ලබන එම ආයෝජන වලට අදාළ ගෙවීම්;

(එ) ආමුබ ආයෝජන ගිණුම හරහා සිදු කරන ලද ප්‍රාග්ධන ගනුදෙනු වලට අදාළ උසාවි නියෝගයක් යටතේ වන පියවීම් ගාස්තු

(ඒ) සෙන්ට්‍රල් ඩිපොසිටරි සිස්ටම්ස් පුද්ගලික සමාගම සහ කොළඹ කොටස් වෙළඳපොළ මගින් නියම කරනු ලබන පරිදි ගිණුම්හිමියා විසින් ගෙවීමට නියමිත හිමිකම්

(ඔ) ගිණුම් හිමියා යම් මියගිය තැනැත්තෙකුගේ බූදලයේ අද්මිනිස්ත්‍රාසිකරු / පොල්මඃකරු හෝ සමාගමක ප්‍රතිග්‍රාහකයෙකු / ඇවරකරු වන අවස්ථාවක දී;

i. ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික ප්‍රතිලාභියාගේ හෝ අද්මිනිස්ත්‍රාසිකරු / පොල්මඃකරු හෝ සමාගමක ප්‍රතිග්‍රාහකයෙකු / ඇවරකරුවෙකු නමින් සිදු කරන ප්‍රතිමුඛ ප්‍රේෂණ.

ii. ප්‍රතිලාභියාගේ ආමුබ ආයෝජන ගිණුමට කරනු ලබන මාරු කිරීම්;

iii. ප්‍රතිලාභියා ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයෙකු වන අවස්ථාවක දී, ප්‍රතිලාභියාගේ ශ්‍රී ලංකා රුපියල් ගිණුමකට හෝ පවතින පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට මාරු කිරීම්.

6. අනෙකුත් කොන්දේසි

(අ) 2 (උ) සහ 2 (එ) අනුඡේද යටතේ සඳහන් කර ඇති ගිණුම ආරම්භ කිරීමට සුදුසුකම්ලත් පුද්ගලයන් පිළිවෙලින් 4(අ), 4(ඊ), 4(ට), 4(ඩ), 4(ත) සහ 5(ආ), 5(ඔ) අනුඡේද යටතේ වූ අවසරලත් බැර කිරීම් සහ හර කිරීම් සඳහා පමණක් සුදුසුකම් ලබයි.

(ආ) නියෝගවල නියම කර ඇති පරිදි, ආමුබ ආයෝජන ගිණුම හරහා සිදු කළ සියලුම ආයෝජනවල සියලුම ආදායම් හෝ ප්‍රාග්ධන ලැබීම් එම ආමුබ ආයෝජන ගිණුමටම හර වන බවට බලයලත් වෙළෙඳුන් සහතික විය යුතුය.

(ඇ) ආමුබ ආයෝජන ගිණුම බද්ධ ගිණුමක් වන අවස්ථාවක දී, මෙම විධාන යටතේ අවසරලත් ගනුදෙනු/මාරු කිරීම් සිදු කරන විට, බලයලත් වෙළෙඳුන් විසින් සාමාන්‍ය බැංකු කටයුතු වල දී "බද්ධ ගිණුමකින්" බද්ධ ගිණුමේ එක් පාර්ශ්වයක "තනි පුද්ගල ගිණුමකට" මුදල් මාරු කිරීමට අදාළ පිළිවෙත අනුගමනය කළ යුතුය.

(ඈ) ශ්‍රී ලංකාවෙන් පිටත සේවයේ නියුතු ශ්‍රී ලාංකික පුරවැසියන් (විගාමිකයන් හැර) විවෘත කරන ලද ආමුබ ආයෝජන ගිණුම්, ඔවුන් නැවත ශ්‍රී ලංකාවේ නේවාසිකයන් බවට පත්වීමෙන් පසුවද, එම ගිණුම හරහා සිදු කළ ආයෝජන අවසන්/ඈවර වනතුරු පවත්වා ගෙන යා හැකි ය. එම ගිණුම්වල මෙහෙයුම් කටයුතු මෙම විධානවල 4(ඈ), 4(ඉ) සහ 4(ඊ) අනුඡේද යටතේ නිශ්චිතව දක්වා ඇති අවසරලත් බැර කිරීම් සහ 5(ආ) සහ 5(ඇ) අනුඡේද යටතේ නිශ්චිතව දක්වා ඇති අවසරලත් හර කිරීම් සඳහා පමණක් සීමා වේ.

(ඉ) 4(ඔ) අනුඡේදය යටතේ වන බැර කිරීමකදී, එම දේපළ විකිණීමෙන් ලත් ප්‍රාග්ධන ලැබීම් ප්‍රමාණය, ගිණුම් හිමියා වෙත ලැබුණු ආමුබ ප්‍රේෂණ මගින් හෝ ගිණුම් හිමියාගේ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම මගින් හෝ ආමුබ ආයෝජන ගිණුම මගින් හෝ විගාමිකයාගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුම මගින් හෝ අක්වෙරළ බැංකු ඒකකයෙහි පවත්වාගෙන යන ගිණුමක් මගින් ණය මුදල පියවා ඇති ප්‍රමාණයට සමානුපාතික විය යුතු ය.

(ඊ) මෙම විධානවල 5(ඈ) ඡේදයෙහි (ii) වන අනුඡේදය යටතේ සිදු කරන ලද ආයෝජන සම්බන්ධයෙන් ආයෝජිතයාගෙන් හෝ නිකුත් කරන්නාගෙන් ලැබෙන සියලුම ආදායම් සහ ප්‍රාග්ධන ලැබීම්, එම ආයෝජිතයාගේ හෝ නිකුත්කරන්නාගේ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් වෙතින් ලැබිය යුතු අතර, එකී අරමුණ සඳහා රුපියල් බවට පරිවර්තනය කිරීම් සඳහා අවසර නොලැබේ. මෙම විධානවල 5 (ඈ) ඡේදයෙහි (ii) වන අනුඡේදය යටතේ අවසර දී ඇති පරිදි ආමුබ ආයෝජන ගිණුමෙන් ආයෝජිතයාගේ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් වලට ආයෝජන සඳහා මුදල් මාරු කරන අවස්ථාවේ දී, බලයලත් වෙළෙඳුන් විසින්, මෙම කොන්දේසිය සම්බන්ධයෙන් සුදුසු පරිදි ආයෝජිතයාගේ හෝ නිකුත් කරන්නාගේ කැමැත්ත ලබා ගත යුතු ය.

(උ) 2(අ) සිට 2(උ) ඡේද යටතේ සඳහන් කර ඇති සුදුසුකම්ලත් ආයෝජකයින් විසින් සිදු කරන ආයෝජන වලට අදාළ ගනුදෙනු සඳහා පහත ආකාරයට පහසුකම් සැලසීමට බලයලත් වෙළෙඳුන් හට අවසර දෙනු ලැබේ.

i. සුදුසුකම්ලත් ආයෝජකයන්ගේ ආමුබ ආයෝජන ගිණුමකට බැර කරන ලද මුදල් වොස්ට්‍රො ගිණුමක් හරහා යැවිය හැකි ය.

ii. ඉහත 6(උ)(i) ඡේදය යටතේ දක්වා ඇති ආයෝජනවල ඕනෑම ආදායමක් හෝ ප්‍රාග්ධන ලැබීමක් ආයෝජනය සිදු කළ ආකාරයෙන්ම නැවත සියරට රැගෙන යා හැකි ය.

iii. වෙනත් බලයලත් වෙළෙන්දෙකු සමඟ ආමුබ ආයෝජන ගිණුමක් පවත්වා ගෙන යන විට, එම වෙනත් බලයලත් වෙළෙන්දා විසින් සෑම ගනුදෙනුවක් සම්බන්ධයෙන්ම ලේඛනගත සාක්ෂි සැපයීම මත පාදක වූ ගනුදෙනු තහවුරු කරගන්නා ගනුදෙනුකරුවන්ගේ ආමුබ ආයෝජන ගිණුම හරහා සිදු කිරීමට නියමිත අවසරලත් ප්‍රාග්ධන ගනුදෙනු වලට අදාළ ගෙවීම් සඳහා රුපියල් විදේශ විනිමය බවට පරිවර්තනය කිරීම සිදු කළ හැකි ය.

iv. වෙනත් බලයලත් වෙළෙන්දෙකු සමඟ ආමුබ ආයෝජන ගිණුමක් පවත්වාගෙන යන අවස්ථාවක දී, නියෝගවලට අනුකූලව යම් ආයෝජනයක් සඳහා අරමුදල් එම ආමුබ ආයෝජන ගිණුම මගින් ලැබූ බව සහ ඒ සඳහා වූ ආදායම් සහ ප්‍රාග්ධන මුදල් ලැබීම් එම ගිණුමට බැර කළ බවට සහතික කරන්නේ නම්, තවත් බලයලත් වෙළෙන්දෙකු හට එම ආයෝජන වලින් ලත් ආදායම් සහ ප්‍රාග්ධන ලැබීම් ඉහත කී ආමුබ ආයෝජන ගිණුම් හිමියාගේ නමින් ශ්‍රී ලංකාවෙන් පිටතට ප්‍රේෂණය කළ හැකි ය.

(ඌ) සිදු කිරීමට නියමිත පාදක වූ ගනුදෙනුවෙහි නිත්‍යානුකූලභාවය හා සද්භාවය තහවුරු කර ගැනීමට සහ නියෝග සහ මෙම විධානවලට අනුකූල බව සහතික කර ගැනීම සඳහා බලයලත් වෙළෙඳුන් විසින් සුදුසු නෛතිකව පිළිගතහැකි ලේඛනගත සාක්ෂි ලබාගත යුතුය.

(එ) බලයලත් වෙළෙඳුන් විසින් ආමුබ ආයෝජන ගිණුම හරහා ගනුදෙනු සිදු කිරීමේදී ලබාගත් ලේඛනගත සාක්ෂි (දෘඪ පිටපත් හෝ ඉලෙක්ට්‍රොනික / ඩිජිටල් පිටපත් ලෙස), ව්‍යවස්ථාපිත වාර්තා තබා ගැනීමේ අවශ්‍යතාව ඉක්මවා යමින් ආමුබ ආයෝජන ගිණුම පවත්වාගෙන යන කාලය තුළ සහ ගිණුම වසා දැමීමෙන් පසු වසර හයකට නොඅඩු කාලයක් පවත්වා ගත යුතුය.

7. ආමුබ ආයෝජන ගිණුම් වසා දැමීම

(අ) ගිණුම් හිමියා විසින් ආමුබ ආයෝජන ගිණුම මගින් අත්පත් කර ගන්නා ලද සියලුම ආයෝජන නිම කර ඒවායේ ලැබීම් නැවත සියරට රැගෙන යාමෙන් හෝ මාරු කිරීමෙන් පසු පමණක්, එම ආමුබ ආයෝජන ගිණුම වසා දැමිය හැකි ය.

(ආ) එසේ වුව ද, ආමුබ ආයෝජන ගිණුම හරහා සිදු කරන ලද ආයෝජනය අවසන් කිරීමට පෙර එම ආමුබ ආයෝජන ගිණුම වසා දැමීම සඳහා ආමුබ ආයෝජන ගිණුම්හිමියා ඉල්ලා සිටින අවස්ථාවක දී, වෙනත් බලයලත් වෙළෙන්දෙකු සමඟ විවෘත කර පවත්වාගෙන යනු ලබන ආමුබ ආයෝජන ගිණුමකට උක්ත ආයෝජන වල ඉදිරි ආදායම් සහ එම ආයෝජන වලින් උපචිත වන යම් ප්‍රාග්ධන ලැබීමක් බැර කිරීමේ අරමුණ සඳහා, එම බලයලත් වෙළෙන්දා සෑහීමට පත්වන පරිදි පහත සඳහන් තොරතුරු/ලේඛන එවීමෙන් පමණක්, මුල් ආමුබ ආයෝජන ගිණුම පවත්වාගෙන යන බලයලත් වෙළෙන්දාට එම ආමුබ ආයෝජන ගිණුම වසා දැමිය හැකි ය.

(i) වසා දැමීමට නියමිත ආමුබ ආයෝජන ගිණුමෙහි මුදල් වලින් සිදු කරන ලද ආයෝජනවල ශේෂයෙහි තහවුරුවක් (ආමුබ ප්‍රේෂණවල විස්තර, ආයෝජිතයාගේ විස්තර, ආයෝජන කාණ්ඩය යනාදිය)

(ii) ආමුබ ආයෝජන ගිණුම හරහා සිදු කරන ලද ගනුදෙනු වලට සාක්ෂි වශයෙන්, ආමුබ ආයෝජන ගිණුම්හිමියාගෙන් ලබා ගත් ලේඛනගත සාක්ෂි

(ඇ) ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික ශ්‍රී ලාංකික සේවා නියුක්තිකයන් (විගාමිකයන් හැර) ආමුබ ආයෝජන ගිණුමක් පවත්වාගෙන යන අවස්ථාවක දී,

i. ගිණුම් හිමියා නේවාසිකයෙකු බවට පත් වූ පසු, ගිණුම් හිමියාගේ ඉල්ලීම පරිදි එවැනි ආමුබ ආයෝජන ගිණුම් වසා දැමිය හැකි ය.

ii. මෙම විධානවල 6 (ඇ) අනුඡේදය යටතේ අවසර දී ඇති පරිදි ආමුබ ආයෝජන ගිණුම පවත්වාගෙන යන්නේ නම්, අවසරලත් හර කිරීම් සහ බැර කිරීම් යටතේ එම ආයෝජන අවසන් කිරීමේ දී ලද මුදල් සම්පූර්ණ ලෙස උපයෝජනය කිරීමෙන් පසු ආමුබ ආයෝජන ගිණුම වසා දැමිය යුතු ය.

(ඈ) යම් මිය ගිය තැනැත්තෙකුගේ බූදලයේ අද්මිනිස්ත්‍රාසිකරු/පොල්මෑකරු හෝ යම් සමාගමක ප්‍රතිග්‍රාහකයෙකු/ඇවරකරු විසින් පවත්වාගෙන යන ආමුබ ආයෝජන ගිණුමක්, ශ්‍රී ලංකාවේ නීතිමය අවශ්‍යතා සපුරාලීමට යටත්ව අරමුදල් නැවත සියරට රැගෙන යාම සම්පූර්ණ වූ පසුව වහාම වසා දැමිය යුතු ය.

(ඉ) බලයලත් වෙළෙඳුන් විසින් ඉහත (අ) සිට (ඈ) දක්වා වූ ආමුබ ආයෝජන ගිණුම් වසා දැමීමට අදාළ තොරතුරු dfem@cbsl.lk විද්‍යුත් තැපෑල හරහා වසා දැමූ දින සිට සතියක් ඇතුළතදී, විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ හට දැනුම් දිය යුතු ය.

8. බලයලත් වෙළෙඳුන් විසින් මෙම විධානවල විෂයපථයට පරිබාහිර වන්නා වූ ආමුබ ආයෝජන ගිණුම හරහා සිදු කරන ගනුදෙනු/මාරුකිරීම් සඳහා විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂගේ විශේෂ අවසරය ලබා ගත යුතුය.

9. **වාර්තා කිරීමේ අවශ්‍යතාව**

(අ) බලයලත් වෙළෙඳුන් විසින් https://www.cbsl.lk/forexnet විද්‍යුත් තැපෑල හරහා මෙම දෙපාර්තමේන්තුව වෙත මාසිකව ආමුබ ආයෝජන ගිණුම් පිළිබඳ තොරතුරු සැපයිය යුතු ය.

(ආ) ඉහත වාර්තා කිරීමේ අවශ්‍යතාවන්ට අනුව බලයලත් වෙළෙඳුන් විසින් අදාළ බැංකුවල ගිණුම් පොත් වලින් අදාළ තොරතුරු ජනනය කිරීම හෝ උපුටා ගැනීම සඳහා බැංකුව තුළ පද්ධතියක් ස්ථාපනය කළ යුතු ය.

10. **මෙම විධානවල කාර්යය සඳහා;**

(අ) "සංක්‍රමණික දිමනාව" යන්නට 2021 අංක 3 දරන විදේශ විනිමය (විගාමිකයන් විසින් අරමුදල් ප්‍රේෂණය කිරීම) නියෝගවල අර්ථයම තිබිය යුතුය.

(ආ) "විගාමිකයා" යන්නට 2021 අංක 3 දරන විදේශ විනිමය (විගාමිකයන් විසින් අරමුදල් ප්‍රේෂණය කිරීම) නියෝගවල අර්ථයම තිබිය යුතුය.

(ඇ) "ප්‍රේෂණ" යන්නට මුදල් නෝට්ටු නොවන විදුලි පණිවුඩ හුවමාරු, වෙනත් අන්තර් බැංකු හුවමාරු, බැංකු අණකර, වෙනත් ගෙවීම් උපකරණ, වෙනත් ජාත්‍යන්තරව පිළිගත් ගෙවීම් යාන්ත්‍රණයක් හෝ ක්‍රම හරහා ලැබුණු ගෙවීම් සහ විනිමය හුවමාරු මධ්‍යස්ථාන/ව්‍යාපාර වලින් විදේශ වලින් ලැබුණු විදේශ ව්‍යවහාර මුදල් ඇතුළත් වේ.

11. මෙම විධාන මගින් අවසර ලබා දී ඇති කිසිවක් වෙනත් ඕනෑම නීතියක විධිවිධාන සමඟ අනුකූල වීමේ අවශ්‍යතාවෙන් නිදහස් කිරීමක්, නිදොස් කිරීමක් හෝ බලයලත් වෙළෙඳුන් හෝ මෙම විධාන යටතේ විදේශ විනිමයෙන් ගනුදෙනු කරන වෙනත් ඕනෑම පුද්ගලයෙකු වැළැක්වීමක් ලෙස වටහා නොගත යුතුය.

12. ආමුබ ආයෝජන ගිණුම් පවත්වාගෙන යාමට අදාළ අවශ්‍යතා නිශ්චිතව දක්වමින් බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරන ලද 2017 නොවැම්බර් මස 20 වන දිනැති 2017 අංක 13, 2018 දෙසැම්බර් මස 21 දිනැති 2018 අංක 2 සහ 2020 ඔක්තෝබර් 7 දිනැති 2020 අංක 8 දරන විධාන මෙයින් අවලංගු කරනු ලැබේ.

13. ඉහත 12 වන ඡේදයෙහි දක්වා ඇති පෙර පැවති විධාන අහෝසි කිරීම මගින් එය අහෝසි කිරීමට පෙරාතුව එකී විධාන යටතේ අයවීමට තිබූ යම් හිමිකමක් හෝ ගෙවීමට තිබූ දඩ මුදලක් හෝ වගකීමක් සඳහා කිසිදු බලපෑමක් සිදු නොවිය යුතුය.

14. මෙම විධානවල සියලු බැර කිරීම් සහ හර කිරීම් විදේශ විනිමය පනතෙහි 22 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද ඕනෑම නියමයකට යටත් විය යුතු ය.

15. මෙම විධාන 2021 මාර්තු මස 22 වන දින සිට ක්‍රියාත්මක වේ.

අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව
2021 මාර්තු 18

විදේශ විනිමය දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2021 අංක 16 දරන විධානයන්

ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් පිළිබඳ බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්

2021 අංක 03 දරන විදේශ විනිමය (විගාමිකයන් විසින් අරමුදල් ප්‍රේෂණය කිරීම) නියෝග සහ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි 6 සහ 7 වගන්ති සමග කියවිය යුතු පනතෙහි 9 වන වගන්ති ප්‍රකාරව, පහත කොන්දේසිවලට යටත්ව, දේශීය බැංකු ඒකකයෙහි ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් විවෘත කිරීම සහ පවත්වා ගෙන යාම සඳහා බලයත් වෙළෙඳුන් හට අවසර ලබා දෙනු ලැබේ.

2. සුදුසුකම්ලත් තැනැත්තන්

අ. ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික විගාමිකයෙකු.

ආ. බාල වයස්කරුවෙකු ද ඇතුළුව ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික විජාතිකයෙකු.

ඇ. වයස අවු.18ට හෝ ඊට වැඩි, වෙනත් රටක තාවකාලික නේවාසික වීසා යටතේ වෙනත් රටකට පිටත්වීමට අදහස් කරනු ලබන ශ්‍රී ලාංකික පුද්ගලයෙකු.

ඈ. මාපිය සංක්‍රමණ යෝජනා ක්‍රමයක් යටතේ අනාගත සංක්‍රමණිකයකු වන ශ්‍රී ලාංකික පුද්ගලයෙකු.

ඉ. සංක්‍රමණිකයකු වූ මියගිය පුද්ගලයෙකුගේ බූදලයේ අද්මිනිස්ත්‍රාත්කරුවෙකු හෝ පොල්මඃකරුවෙකු.

3. ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් විවෘත කිරීම හා පවත්වා ගෙන යාම.

අ. ශ්‍රී ලංකා රුපියල්වලින් ඉතුරුම් හෝ ජංගම (බැංකු අයිරා පහසුකම නොමැතිව) ගිණුම් ආකාරයෙන් ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් විවෘත කිරීම හා පවත්වාගෙන යාම සිදු කළ හැකි ය.

ආ. සුදුසුකම් ලත් පුද්ගලයෙකු විසින් බැංකු පද්ධතිය තුළ එක් ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුමක් පමණක් විවෘත කළයුතු අතර එකී ගිණුම තනි පුද්ගල ගිණුමක් ලෙස පවත්වාගෙන යා හැකි ය.

ඇ. ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම සහ විගාමිකයන්ගේ ප්‍රේෂණය කළහැකි ආදායම් ගිණුම යන දෙකම එකම බලයලත් වෙළෙන්දා සමග විවෘත කර පවත්වාගෙන යා යුතු ය.

ඈ. ශ්‍රී ලංකා මහ බැංකුව මගින් නිකුත් කරන ලද ලියාපදිංචි අංකයක් ලබාගත් ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් හැර දැනට පවත්නා සියලුම අනෙකුත් ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් මෙම නියෝග වල දින සිට මාස තුනක් ඇතුළත අනේවාසික රුපියල් ගිණුම් ලෙස නැවත නම් කර තවදුරටත් පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

ඉ. විදේශීය ආයතන/ශ්‍රී ලංකාවෙන් පිටත ලියාපදිංචි/සංස්ථාපනය කරන ලද සමාගම් විසින් පවත්වාගෙන යන දැනට පවත්නා සියලුම ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම්, මෙම නියෝගවල දින සිට මාස තුනක් ඇතුළත අනේවාසික රුපියල් ගිණුම් ලෙස නැවත නම් කර පවත්වාගෙන යා යුතු ය.

ඊ. ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික, විදේශයක රැකියාවේ නියුතු ශ්‍රී ලාංකිකයන් විසින් පවත්වාගෙන යන දැනට පවතින සියලුම ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම්, මෙම නියෝග වල දින සිට මාස තුනක් ඇතුළත අනේවාසික රුපියල් ගිණුම් ලෙස නැවත නම් කර පවත්වාගෙන යා යුතු ය.

4. අවසරලත් බැර කිරීම්

අ. ගිණුම් හිමියා ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික විගාමිකයෙකු වන අවස්ථාවකදී,

i. ශ්‍රී ලංකාව තුළ දී සිදු කරනු ලබන ගෙවීම් සඳහා, බැංකු පද්ධතිය හරහා ගිණුම් හිමියාගේ නමට ශ්‍රී ලංකාවට පිටතින් විදේශ විනිමයෙන් ලැබෙන ප්‍රේෂණ.

ii. ශ්‍රී ලංකාවේ නේවාසිකයෙකු ව සිටිය දී, (චංචල, නිශ්චල, ස්පෘශ්‍ය සහ අස්පෘශ්‍ය වත්කම් ඇතුළුව) විගාමිකයාට අයිතිව තිබූ හෝ මේ නියෝග බලාත්මක වීමට පෙර එම තැනැත්තාගේ ශ්‍රී ලංකා රුපියල් ගිණුම හරහා අරමුදල් භාවිතා කර අත්පත් කරගත් ශ්‍රී ලංකාව තුළ ඇති යම් වත්කමකින් උපචිත වූ යම් ලැබීම්.

iii. ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තකුගෙන් විගාමිකයෙකුට උරුම වූ (චංචල, නිශ්චල, ස්පෘශ්‍ය සහ අස්පෘශ්‍ය වත්කම් ඇතුළුව) ශ්‍රී ලංකාව තුළ ඇති යම් වත්කමකින් උපචිත වූ යම් ලැබීම්.

iv. ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තකු වන සමීපතම පවුල් සාමාජිකයෙකුගෙන් විගාමිකයෙකු ත්‍යාගයක් ලෙස ලබන (චංචල, නිශ්චල, ස්පෘශ්‍ය සහ අස්පෘශ්‍ය වත්කම් ඇතුළුව) ශ්‍රී ලංකාව තුළ ඇති යම් වත්කමකින් උපචිත වූ යම් ලැබීම්.

v. ශ්‍රී ලංකාවේ නේවාසිකයෙකු ව සිටිය දී සිදු කරන ලද හෝ මේ නියෝග බලාත්මක වීමට පෙර ඔහුගේ හෝ ඇයගේ ශ්‍රී ලංකා රුපියල් ගිණුම් හරහා සිදු කරන ලද හෝ පැවරුම්කරු වෙත උරුමයෙන් ලද හෝ පැවරුම්කරු විසින් ත්‍යාගයක් ලෙස ලද හෝ 2021 අංක 2 දරන විදේශ විනිමය (ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව තුළ දී සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු වර්ග) නියෝග යටතේ අවසර ලබා දී ඇති පරිදි පැවරුම්කරුගේ අනේවාසික රුපියල් ගිණුම හරහා සිදු කරන ලද ආයෝජනයන්ගෙන්, සමීපතම පවුල් සාමාජිකයෙකු වන වෙනත් විගාමිකයකුගෙන් (එනම්, පැවරුම්කරු), විගාමිකයකු වෙත උරුම වූ හෝ ත්‍යාගයක් වශයෙන් ලැබුණු (පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හෝ ආමුඛ ආයෝජන ගිණුම් වල ඇති අරමුදල් හැර චංචල, නිශ්චල, ස්පෘශ්‍ය සහ අස්පෘශ්‍ය වත්කම් ඇතුළුව) ශ්‍රී ලංකාව තුළ ඇති යම් වත්කමකින් උපචිත වූ යම් ලැබීම්.

vi. සමීපතම පවුල් සාමාජිකයෙකුගෙන් විගාමිකයා ලද (චංචල, නිශ්චල, ස්පෘශ්‍ය සහ අස්පෘශ්‍ය වත්කම් ඇතුළුව) ශ්‍රී ලංකාව තුළ ඇති යම් වත්කමකින් උපචිත වූ අරමුදල් වලින් ලද මුදල් ත්‍යාග.

vii. මෙම විධානයන්හි 4(අ) (ii) සිට 4(අ)(v) දක්වා අනුඡේදයන්හි සඳහන් පරිදි විගාමිකයාට අයිතිව තිබූ හෝ උරුමයෙන් ලද හෝ ත්‍යාගයක් වශයෙන් ලද ආයෝජනයකින් උපචිත වූ යම් ආදායමක්.

viii. ගිණුම් හිමියාගේ විශ්‍රාම පාරිතෝෂික දීමනා (සේවක අර්ථසාධක අරමුදල (EPF), සේවා නියුක්තයන්ගේ භාර අරමුදල (ETF), පාරිතෝෂිකය සහ විශ්‍රාම වැටුප් හෝ වෙනත් යම් විශ්‍රාම ප්‍රතිලාභ ඇතුළුව).

ix. ගිණුම් හිමියාගේ අනේවාසික රුපියල් ගිණුම් වලින් කරනු ලබන මාරු කිරීම්.

(ආ) බාලවයස්කරුවෙකු ද ඇතුළුව, ගිණුම් හිමියා ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික විජාතිකයෙකු වන අවස්ථාවක දී,

i. 2021 අංක 02 දරන විදේශ විනිමය (ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව තුළ දී සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු වර්ග) නියෝගවල 1 වන උපලේඛනයේ අ ශීර්ෂය යටතේ 4(5)(ඇ), 4(5)(ඈ) සහ 4(7) අනුඡේදයන් යටතේ අවසරලත් ආයෝජනවලින් ලද යම් ආදායමක් හෝ යම් ප්‍රාග්ධන ලැබීම්.

ii. ගිණුම් හිමියාගේ විශ්‍රාම පාරිතෝෂික දීමනා (සේවක අර්ථසාධක අරමුදල (EPF), සේවා නියුක්තයන්ගේ භාර අරමුදල (ETF), පාරිතෝෂිකය සහ විශ්‍රාම වැටුප් හෝ වෙනත් යම් විශ්‍රාම ප්‍රතිලාභ ඇතුළුව).

(ඇ) ගිණුම් හිමියා, අවුරුදු 18 හෝ ඊට වැඩි, වෙනත් රටක තාවකාලික නේවාසික වීසා ලබාගත් ශ්‍රී ලාංකිකයෙකු වන අවස්ථාවක දී, නියෝග මගින් අවසරලත් පරිදි එ.ජ.ඩොලර් 30,000 ක උපරිමයක් දක්වා විදේශ විනිමය ලබා ගැනීමට.

(ඈ) ගිණුම් හිමියා, මාපිය සංක්‍රමණ යෝජනා ක්‍රමයක් යටතේ සංක්‍රමණය කිරීමට අපේක්ෂිත ශ්‍රී ලාංකිකයෙකු වන අවස්ථාවක දී, නියෝග මගින් අවසරලත් පරිදි, එකී මාපිය සංක්‍රමණ යෝජනා ක්‍රමය යටතේ වීසා ලබා ගැනීම සඳහා විදේශ අධිකාරීන්ට සිදු කිරීමට ඇති ගෙවීම්.

(ඉ) විගාමිකයෙකු වූ මියගිය පුද්ගලයෙකුගේ බූදලයේ අද්මිනිස්ත්‍රාසිකරු හෝ පොල්මඃකරු වන අවස්ථාවකදී;

i. එම මියගිය පුද්ගලයාගේ ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුමෙන් හෝ අනේවාසික රුපියල් ගිණුමෙන් හෝ විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුමෙන් මාරු කිරීම්.

ii. මෙම විධානයෙහි 4(අ) (vi) හැර 4(අ) ඡේදයෙහි සඳහන් පරිදි එම මියගිය පුද්ගලයාට ලැබිය යුතු යම් ආදායමක් හෝ ප්‍රාග්ධන ලැබීමක්

(ඊ) ගිණුම් හිමියා විසින් සපයන ලද සේවාවක් වෙනුවෙන් ලද ආදායම්.

(උ) ගිණුමේ පවතින අරමුදල් වෙනුවෙන් ශ්‍රී ලංකා රුපියල් වලින් උපයන ලද පොළී ආදායම්

5. අවසරලත් හර කිරීම්

(අ) ගිණුම් හිමියා, ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික විගාමිකයෙකු හෝ ශ්‍රී ලංකාව හැර යන විගාමිකයෙකු (මුල් වරට හෝ පසුව සිදුවන) වන අවස්ථාවක දී;

i. සුදුසුකම් ලත් සංක්‍රමණික දීමනාව, ගිණුම් හිමියාගේ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට හෝ ආමුඛ ආයෝජන ගිණුමකට හෝ අක්වෙරළ බැංකු ඒකකයෙහි පවත්වාගෙන යන ගිණුමකට හෝ ශ්‍රී ලංකාවෙන් පිටත පවත්වාගෙන යන ගිණුමකට ප්‍රේෂණය කිරීම/මාරු කිරීම.

ii. ඉහත 4(අ) (vii) සිට 4(අ) (viii) යන ඡේද යටතේ බැර කරන ලද අරමුදල්, ගිණුම් හිමියාගේ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට හෝ ආමුඛ ආයෝජන ගිණුමකට හෝ විගාමිකයන්ගේ ප්‍රේෂණය කළහැකි ආදායම් ගිණුමකට හෝ අක්වෙරළ බැංකු ඒකකයෙහි පවත්වාගෙන යන ගිණුමකට හෝ ශ්‍රී ලංකාවෙන් පිටත පවත්වාගෙන යන ගිණුමකට ප්‍රේෂණය කිරීම/මාරු කිරීම.

iii. නියෝග වලට යටත් ව, ගිණුම් හිමියාගේ දරුවකුගේ, මුණුපුරෙකුගේ/මිණිපිරියෙකුගේ, කලත්‍රයාගේ හෝ සහෝදර සහෝදරියන්ගේ ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුමකට, ත්‍යාගයක් වශයෙන් කරන ලද මාරු කිරීම්.

iv. ගිණුම් හිමියාගේ අනේවාසික රුපියල් ගිණුමකට මාරු කිරීම.

(ආ) ගිණුම් හිමියා, ශ්‍රී ලංකාවේ නේවාසික විගාමිකයෙකු වන අවස්ථාවක දී;

i. ගිණුම් හිමියා, ශ්‍රී ලංකාවේ නේවාසිකයෙකු වන අවස්ථාවක දී, සංචාරය කිරීමේ කාර්යය සඳහා, ජංගම ගනුදෙනු සම්බන්ධ විධානවල නිශ්චිතව දක්වා ඇති උපරිම සීමාවක් දක්වා විදේශ මුදල් නෝට්ටු ආපසු ගැනීම හෝ විදේශ සංචාරක කාඩ්පතක් උඩුගත කිරීම (upload) කිරීම සඳහා අරමුදල් මාරු කිරීම.

ii. ශ්‍රී ලංකාවේ නේවාසිකයෙකු වන ගිණුම් හිමියාගේ සමීපතම පවුල් සාමාජිකයෙකුගේ (ශ්‍රී ලංකාවෙන් පිටත වාසය කරන යැපෙන්නන්) ජීවන වියදම් සඳහා ප්‍රේෂණය කිරීම.

(ඇ) බාලවයස්කරුවෙකු ද ඇතුළුව, ගිණුම් හිමියා ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික විජාතිකයෙකු වන අවස්ථාවක දී;

i. 4 (ආ) (i) අනුඡේදය යටතේ බැර කරන ලද අරමුදල් වලින්, ලිත් වර්ෂයකට එ.ජ. ඩොලර් 30,000 ක් දක්වා, ගිණුම් හිමියාගේ ආමුඛ ආයෝජන ගිණුමකට හෝ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට හෝ අක්වෙරළ බැංකු ඒකකයෙහි පවත්වාගෙන යන ගිණුමකට හෝ ශ්‍රී ලංකාවෙන් පිටත පවත්වාගෙන යන ගිණුමකට ප්‍රේෂණය කිරීම/ මාරු කිරීම.

ii. ඉහත (4) (ආ) (ii) අනුඡේදය යටතේ බැර කරන ලද අරමුදල්, ගිණුම් හිමියාගේ ආමුඛ ආයෝජන ගිණුමකට හෝ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට හෝ අක්වෙරළ බැංකු ඒකකයේ පවත්වාගෙන යන ගිණුමකට හෝ ශ්‍රී ලංකාවෙන් පිටත පවත්වාගෙන යන ගිණුමකට ප්‍රේෂණය කිරීම/මාරු කිරීම.

(ඈ) ගිණුම් හිමියා, වෙනත් රටක තාවකාලික නේවාසික වීසා ලබාගත් අවුරුදු 18 හෝ ඊට වැඩි ශ්‍රී ලාංකිකයෙකු වන අවස්ථාවකදී, එ.ජ ඩොලර් 30,000 ක උපරිමයක් දක්වා විදේශ විනිමය නිකුත් කිරීම.

(ඉ) ගිණුම් හිමියා, මාපිය සංක්‍රමණ යෝජනා ක්‍රමයක් යටතේ අනාගතයේ සංක්‍රමණය කිරීමට අපේක්ෂිත ශ්‍රී ලාංකිකයෙකු වන අවස්ථාවකදී, මාපිය සංක්‍රමණ යෝජනා ක්‍රමය යටතේ වීසා ලබා ගැනීම සඳහා විදේශ අධිකාරීන්ට ගෙවීම්.

(ඊ) විගාමිකයෙකු වූ මියගිය පුද්ගලයෙකුගේ බූදලයෙහි අද්මිනිස්ත්‍රාසිකරු හෝ පොල්මඃකරු වන අවස්ථාවකදී, මියගිය පුද්ගලයාගේ උරුමකරුවන්ගේ ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුමට අරමුදල් මාරු කිරීම.

(උ) ශ්‍රී ලංකා රුපියල් වලින් ශ්‍රී ලංකාව තුළදී සිදු කරන ගෙවීම්.

6. ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුමක් විවෘත කිරීමේ ක්‍රියා පිළිවෙල.

(අ) සුදුසුකම් ලත් පුද්ගලයෙකු සඳහා ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුමක් විවෘත කිරීමට ප්‍රථම හෝ පහත සඳහන් පරිලෝකනය කරන ලද ලියවිලි (අදාළ පරිදි) CTRA@cbsl.lk හරහා ඉදිරිපත් කිරීම මගින් බලයලත් වෙළෙඳුන් විසින් විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකගෙන් ලියාපදිංචි අංකයක් ලබා ගත යුතුය.

i. නිසි පරිදි සම්පූර්ණ කරන ලද ඇමුණුම I

ii. වර්තමාන විදේශ ගමන් බලපත්‍රයේ හඳුනා ගැනීමේ, විකල්ප සහ නිරීක්ෂණ පිටුවල පිටපතක්.

iii. නිත්‍ය නේවාසිකත්වය සඳහා අදාල පිටසනෙහි පිටපතක් හෝ නිත්‍ය නේවාසිකත්වය ලබාගත් දිනය සහ රට තහවුරු කර ගැනීම සඳහා අදාළ වෙනත් ලියවිල්ලක පිටපතක්.

iv. පුරවැසි සහතිකයේ හෝ ද්විත්ව පුරවැසි සහතිකයේ පිටපතක්.

v. විගාමිකයා, ශ්‍රී ලංකාවෙන් පිටත ඉපදී ඇති අවස්ථාවක, එකී උපත ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක් (තිබේ නම්).

(ඇ) විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක විසින් නිකුත් කරන ලද ලියාපදිංචි අංකයක් ලැබීමෙන් අනතුරුව බලයලත් වෙළෙඳුන් විසින් ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම විවෘත කළ යුතුය. ඕනෑම අවස්ථාවකදී, විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක විසින් නිකුත් කරන ලද ඉහත කී ලියාපදිංචි අංකය යටතේම එම ගිණුම් හිමියාගේ නමින්ම විගාමිකයන්ගේ ප්‍රේෂණය කළහැකි ආදායම් ගිණුම විවෘත කළහැකිය. විගාමිකයෙකු සතුව, විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් නිකුත් කරන ලද, ලියාපදිංචි අංකයක් සහිත විගාමිකයින්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුමක් දැනටමත් තිබේ නම් සහ ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුමක් විවෘත කිරීමට අවශ්‍ය වන අවස්ථාවක දී ඉහත ලියාපදිංචි අංකය යටතේම ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුමක් විවෘත කිරීමට බලයලත් වෙළඳුන්හට අවසර ඇත.

7. අනෙකුත් කොන්දේසි

(අ) සංක්‍රමණික දීමනාව ලබාගත හැක්කේ, ශ්‍රී ලංකාව හැර යන අවස්ථාවක දී (මුල් වරට හෝ පසුව සිදුවන) හෝ විගාමිකයා ශ්‍රී ලංකාවෙන් පිටත වාසය කරන අවස්ථාවකදී පමණි.

(ආ) සුදුසුකම් ලත් පුද්ගලයෙකු වෙනුවන් නියම කරන ලද ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් අංකය CTRA@cbsl.lk හරහා එය පැවරූ වහාම අධ්‍යක්ෂ, විදේශ විනිමය දෙපාර්තමේන්තුව වෙත දැන්විය යුතුයි.

(ඇ) බලයලත් වෙළෙඳුන් විසින් සුදුසුකම්ලත් බාල වයස්කරුවන් (අවු. 18 ට අඩු පුද්ගලයින්) වෙනුවෙන් ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් විවෘත කිරීම, ඔහුගේ/ඇයගේ ස්වභාවික හෝ නීත්‍යානුකූලව පත් කරන ලද භාරකරු හරහා සිදු කළ යුතුය. නියෝග වලින් අවසරලත් පරිදි එවැනි බාලවයස්කරුවන්ට වයස අවුරුදු 18 වූ පසුව ඔවුන්ගේ සුදුසුකම්ලත් සංක්‍රමණික දීමනාව සඳහා හිමිකම් පෑමට හැකි ය.

(ඈ) මෙම විධානයෙහි 4(අ)(ix) ඡේදයෙහි අවසරලත් ගනුදෙනු සිදු කිරීමේදී, බලයලත් වෙළෙන්දන් විසින් අනේවාසික රුපියල් ගිණුම පවත්වාගෙන යන බලයලත් වෙළෙන්දාගෙන් අරමුදල් මූලාශ්‍රය පිළිබඳව තහවුරුවක් ලබා ගත යුතුය.

(ඉ) මෙම විධානයෙහි 5(ආ) ඡේදයෙහි අවසරලත් ගනුදෙනු සිදු කිරීමේදී,

i. ගිණුම් හිමියා නිත්‍ය නේවාසිකත්වය හෝ පුරවැසිභාවය ලබා ඇති රටටම සංචාරය කිරීමේ අරමුණින් සංචාරක දීමනාවට හිමිකම් පාන්නේ නම් සහ එම කාර්යය සඳහා භාවිතා කිරීමට අපේක්ෂිත අරමුදල් මෙම විධාන වල 4 (අ) (i) සිට 4 (අ) (vi) ඡේද යටතේ බැර කර ඇත්නම්, එකී මුදල සුදුසුකම් ලත් සංක්‍රමණික දීමනාවට හිමිකම් පාන අවස්ථාවේදී, එම දීමනාවෙන් අඩු කරනු ලැබිය යුතු ය.

ii. ගිණුම් හිමියා නිත්‍ය නේවාසිකත්වය හෝ පුරවැසිභාවය ලබාගත් රටෙහිම ජීවත් වන ඔහුගේ/ඇයගේ යැපෙන්නන් සඳහා ජීවන වියදම් ප්‍රේෂණය කරන්නේ නම් සහ එම කාර්යය සඳහා භාවිතා කිරීම ට අපේක්ෂිත අරමුදල් මෙම විධාන වල 4 (අ) (i) සිට 4 (අ) (vi) ඡේද යටතේ බැර කර ඇත්නම්, එකී මුදල, සුදුසුකම් ලත් සංක්‍රමණික දීමනාවට හිමිකම් පාන අවස්ථාවේදී, එම දීමනාවෙන් අඩු කරනු ලැබිය යුතු ය.

(ඊ) මෙම විධාන වල 5 (අ) (vi) සහ 5 (ඊ) ඡේද යටතේ අවසරලත් ගනුදෙනු සිදු කිරීමේ දී, බලයලත් වෙළෙන්දන් විසින්, ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් පවත්වාගෙන යන බලයලත් වෙළෙන්දා වෙත අරමුදල් වල මූලාශ්‍රය පිළිබඳ තහවුරුවක් ලබා දිය යුතු ය.

(උ) විගාමිකයෙකු මුල් වරට ශ්‍රී ලංකාව හැරයන අවස්ථාවක දී හෝ ඉහත 5 (ඈ) අනුඡේදය යටතේ අවසරලත් ගනුදෙනු සිදු කිරීමේ දී, ගමනාන්තය, ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් ලියාපදිංචි අංකය, විදේශ විනිමය ප්‍රමාණය, දිනය ඇතුළත්ව

බලයලත් වෙළෙන්දා විසින් විදේශ ගමන් බලපත්‍රය මත යොදන ලද සුදුසු පිටසනක් සහිතව, විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු ආකාරයෙන්, එ.ජ.ඩො. 5,000 ක් හෝ වෙනත් ඕනෑම නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් ඊට සමාන ප්‍රමාණයක උපරිමයකට යටත්ව, සුදුසුකම්ලත් සංක්‍රමණික දීමනාව මත, විදේශ විනිමය නිකුත් කිරීමට බලයලත් වෙළෙඳුන්හට හැකියාව ඇත.

(උ) විගාමිකයා ශ්‍රී ලංකාවේ නේවාසිකයෙකු ව සිටියදී ප්‍රතිමුඛ ආයෝජන ගිණුමක් හරහා, එම පුද්ගලයා නිත්‍ය වාසිකත්වය හෝ පුරවැසිභාවය ලබා ඇති රටෙහි ආයෝජන කර ඇති බව නිරීක්ෂණයට හෝ දැනගැනීමට ලැබුනේ නම්, බලයලත් වෙළෙන්දා විසින් ප්‍රතිමුඛ ආයෝජන ගිණුම පවත්වාගෙන යන බලයලත් වෙළෙන්දාගෙන් එවැනි ආයෝජනවල විස්තර ලබා ගත යුතු අතර, එම ආයෝජන සඳහා සිදුකල ප්‍රතිමුඛ ප්‍රේෂණ වල අගය එවැනි විගාමිකයන්ගේ සුදුසුකම්ලත් සංක්‍රමණික දීමනාවෙන් අඩුකල යුතුය. එවැනි ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් අනේවාසික රුපියල් ගිණුම් බවට පරිවර්තනය කිරීම සඳහා එම විගාමිකයාගේ සංක්‍රමණය පිළිබඳව ප්‍රතිමුඛ ආයෝජන ගිණුම පවත්වාගෙන යන බලයලත් වෙළෙන්දාට ඒ බව දැනුම් දිය යුතුය.

(ඌ) මෙම දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ලියාපදිංචි අංකය මෙන්ම ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් අංකය මඟින් ද පුද්ගලයෙකු හඳුනා ගැනීම සඳහා ක්‍රියාපිළිවෙළක් බලයලත් වෙළඳුන් සතු විය යුතුය.

(ඒ) සිදු කිරීමට අපේක්ෂිත පාදක වූ ගනුදෙනුවෙහි නීත්‍යානුකූලභාවය සහ සද්භාවය තහවුරු කර ගැනීම සඳහා බලයලත් වෙළෙන්දන් විසින් ඇමුණුම 2 හා 3 හි සඳහන් ලියවිලි ද ඇතුලත්ව සුදුසු නීත්‍යානුකූලව පිළිගත හැකි ලේඛනගත සාක්ෂි (අවශ්‍ය වන අවස්ථාවකදී) ලබා ගත යුතු අතර මෙම විධානවලට සහ නියෝගවලට අනුකූලවීම සහතික කල යුතු අතරම එවැනි ලේඛනගත සාක්ෂි / වාර්තා (දෘඪ පිටපතක් හෝ ඉලෙක්ට්‍රොනික/ ඩිජිටල් ආකාරයෙන්) ව්‍යවස්ථාපිත වාර්තා තැබීමේ අවශ්‍යතාවය ඉක්මවා යමින් සහ ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම වසා දමන තෙක් පවත්වාගෙන යා යුතුය.

8. **ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් වැසීම.**

(අ) මෙම විධාන වල 2 (ඉ) ඡේදය යටතේ අවසරලත් පරිදි මියගිය පුද්ගලයෙකුගේ බූදලයෙහි අද්මිනිස්ත්‍රාසිකරුවෙකු හෝ පෝල්මඃකරුවෙකු හැර අනෙකුත් සුදුසුකම් ලත් තැනැත්තන් විසින් විවෘත කර පවත්වාගෙන යන ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් වසා දැමීම සඳහා බලයලත් වෙළෙන්දන් විසින් විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකගේ පූර්ව අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය වේ.

(ආ) බලයලත් වෙළෙන්දන් විසින්, මියගිය පුද්ගලයෙකුගේ බූදලයෙහි අද්මිනිස්ත්‍රාසිකරුවෙකු හෝ පෝල්මඃකරුවෙකු වෙනුවෙන් විවෘත කරන ලද ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුමක්, එම මියගිය පුදුගලයාගේ බූදලයෙහි ශ්‍රී ලංකාව තුළ අද්මිනිස්ත්‍රාසිකරණ කටයුතු අවසන් වූ පසුව වසා දැමිය යුතුය.

(ඇ) ඉහත 8 (ආ) යටතේ සඳහන් කළ වසාදැමීමක් පිළිබඳව, එවැනි වසාදැමීමක් සිදු කළ දින සිට වැඩ කරන දින තුනක් ඇතුළත ඒ පිළිබඳව CTRA@cbsl.lk හරහා විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක වෙත දැනුම් දිය යුතුය.

9. මෙම විධාන වල විෂය පථයෙන් පරිබාහිර වෙනත් ඕනෑම කාර්යයක් සඳහා ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුමකින්/ගිණුමකට ඕනෑම මාරුකිරීමක්/ ඕනෑම ගණුදෙනුවක් සඳහා බලයලත් වෙළඳුන් විසින් විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකගේ පූර්ව අවසරය ලබාගත යුතුය.

10. **වාර්තාකිරීමේ අවශ්‍යතාව**

මෙම විධාන වල ඇමුණුම 4 අනුව සකස් කරන ලද වාර්තාවක් මාසික පදනම මත විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක වෙත විද්‍යුත් තැපෑල dfem@cbsl.lk හරහා එළඹෙන මාසයේ 15 වැනි දිනට පෙර යොමු කළ යුතුය.

11. **මෙම විධානවල කාර්යය සඳහා,**

(අ) **"විගාමිකයා"** යන්නට 2021 අංක 3 දරන විදේශ විනිමය (විගාමිකයන් විසින් අරමුදල් ප්‍රේෂණය කිරීම) නියෝගවල දී ඇති අර්ථයම තිබිය යුතුය.

(ආ) **"සමීපතම පවුල් සාමාජිකයා"** යන්නට 2021 අංක 03 දරන විදේශ විනිමය (විගාමිකයන් විසින් අරමුදල් ප්‍රේෂණය කිරීම) නියෝගවල දී ඇති අර්ථයම තිබිය යුතුය.

(ඇ) **"මාපිය සංක්‍රමණ යෝජනා ක්‍රමය"** යන්නට 2021 අංක 3 දරන විදේශ විනිමය (විගාමිකයන් විසින් අරමුදල් ප්‍රේෂණය කිරීම) නියෝගවල දී ඇති අර්ථයම තිබිය යුතුය.

(ඈ) **"තාවකාලික නේවාසික වීසා"** යන්නට 2021 අංක 3 දරන විදේශ විනිමය (විගාමිකයන් විසින් අරමුදල් ප්‍රේෂණය කිරීම) නියෝගවල දී ඇති අර්ථයම තිබිය යුතුය.

(ඉ) **"සංක්‍රමණික දීමනාව"** යන්නට 2021 අංක 3 දරන විදේශ විනිමය (විගාමිකයන් විසින් අරමුදල් ප්‍රේෂණය කිරීම) නියෝගවල දී ඇති අර්ථයම තිබිය යුතුය.

(ඊ) **"ප්‍රේෂණ"** යන්නට විදුලි පණිවුඩ පැවරුම් , අනෙකුත් අන්තර් බැංකු පැවරුම්, බැංකු අණකර, අනෙකුත් ගෙවීම් උපකරණ, අනෙකුත් ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ගෙවීම් යාන්ත්‍රණ හෝ ක්‍රම හරහා ලද ගෙවීම් සහ ව්‍යවහාර මුදල් නෝට්ටු හැර විනිමය මධ්‍යස්ථාන / ආයතනවලින් විදේශයන්ගෙන් විදේශ ව්‍යවහාර මුදලින් ලද අරමුදල් යනාදිය ඇතුළත් විය යුතුය.

12. මෙම විධානවල අවසර ලබා දුන් කිසිවක් වෙනත් ඕනෑම නීතියක විධිවිධාන සමඟ අනුකූල වීමේ අවශ්‍යතාවෙන්, මෙම විධාන යටතේ විදේශ විනිමයෙන් ගනුදෙනු කරන බලයලත් වෙළෙන්දෙකු හෝ ඕනෑම පුද්ගලයෙකු නිදහස් කිරීමක්, නිදොස් කිරීමක් හෝ වැළැක්වීමක් ලෙස අර්ථ විග්‍රහ නොකළ යුතුය.

13. ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් සඳහා අදාළවන අවශ්‍යතා දක්වමින් බලයලත් වෙළඳුන් වෙත නිකුත් කරන ලද 2017 නොවැම්බර් 20 දිනැති 2017 අංක 08 දරන විධානයන් මෙමඟින් අහෝසි කෙරේ.

14. ඉහත 13 ඡේදයේ සඳහන් කර ඇති විධානයන් අහෝසි කිරීම මඟින් එම අහෝසි කිරීමට පෙර උපචිත වූ කිසිදු අයිතියකට හෝ දඩමුදලකට හෝ වගකීම් වලට බලපාන්නේ නැත.

15. මෙම විධානවල සියළු හර කිරීම් සහ බැර කිරීම් 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 22 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද යම් නියමයකට යටත් විය යුතුය.

16. මෙම විධාන 2021 මාර්තු 22 වන දින සිට ක්‍රියාත්මක විය යුතුය.

අධ්‍යක්ෂක- විදේශ විනිමය දෙපාර්තමේන්තුව
2021 මාර්තු 18

2021 අංක 16 දරන විධානයන් සඳහා වූ ඇමුණුම 1

ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් සහ විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුම් විවෘත කිරීම සඳහා ලියාපදිංචි අංකයක් ඉල්ලුම් කිරීම

1. ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් සහ විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුම් හිමියාගේ තොරතුරු

අ) සම්පූර්ණ නම: : .....

ආ) ජාතික හැඳුනුම්පත් අංකය: .....

ඇ) පුද්ගලික හඳුනාගැනීමේ අංකය (විදේශ):.....

ඈ) වත්මන් විදේශ ගමන් බලපත්‍ර අංකය: .....

ඉ) ශ්‍රී ලංකා විදේශ ගමන් බලපත්‍ර අංකය (ඇත්නම්): .....

ඊ) උපන්දිනය (දිනය/මාසය/වසර): .....

උ) නිත්‍ය වාසිකතත්වය ලබා ගත් දිනය (දිනය/මාසය/වසර): .....

ඌ) නිත්‍ය වාසිකතත්වය/ පුරවැසිභාවය හිමි රට: .....

එ) විවෘත කළ යුතු ගිණුම (ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම හෝ:.....
විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුම හෝ ද්විත්වයම)

ඒ) ගිණුම්හිමියා සුදුසුකම්ලත් කාණ්ඩය (සුදුසුකම්ලත් :.....
කාණ්ඩය සඳහන් කරන්න)

2. බලයලත් වෙළෙන්දාගේ තොරතුරු

අ) නම :.....

ආ) ශාඛාව:.....

ඇ) ශාඛාවේ ලිපිනය:.....

ඈ) විද්‍යුත් තැපැල:.....

ඉ) ඉල්ලීම කරනු ලබන නිලධාරියාගේ නම:.....

ඊ) තනතුර:.....

උ) දුරකථන අංක: රාජකාරී :.....
පුද්ගලික:.....

ඌ) අත්සන සහ දිනය:.....

සටහන 1: බලයලත් වෙළෙඳුන් විසින් නිරවද්‍ය හා සම්පූර්ණ තොරතුරු භාවිතා කරමින් ඉහත සඳහන් ඇමුණුම 1 සම්පූර්ණ කර යොමු කිරීම අවශ්‍ය වේ.

2021 අංක 16 දරන විධානයන් සඳහා වූ ඇමුණුම 2

සංක්‍රමණික දීමනාව සඳහා විදේශ විනිමය නිකුත් කිරීමේදී ලබාගත යුතු ලියවිලි

i. විගාමිකයාගෙන් විධිමත් ඉල්ලීමක් (මේ සඳහා අකෘතියක් පවත්වාගැනීමට බලයලත් වෙළඳුන්හට උපදෙස් දෙනු ලැබේ).

ii. පුද්ගලික හඳුනාගැනීමේ කාඩ්පතෙහි (විදේශ) පිටපතක්.

iii. විගාමිකයාගේ උපත ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක්.

iv. නිත්‍ය වාසිකත්වය හෝ පුරවැසිභාවය (ඇත්නම්) සහ ද්විත්ව පුරවැසිභාවය (ඇත්නම්) සනාථ කිරීම සඳහා ලියවිලි.

v. විගාමිකයාගේ වත්මන් විදේශ ගමන් බලපත්‍රයේ හඳුනා ගැනීමේ පිටුවල පිටපත් (අදාළ පරිදි).

vi. අරමුදල් වල මූලාශ්‍රය / මූලාශ්‍ර සනාථ කිරීමට වලංගු ලියවිලි (උදා: මාරු කිරීමේ ඔප්පුව). නියෝගවල අවසරලත් පරිදි ත්‍යාගයක් වශයෙන් ලැබුනේ නම්, විගාමිකයා සහ දීමනාකරු අතර සම්බන්ධතාව (සමීපතම පවුල් සාමාජිකයෙකු බව) තහවුරු කරගැනීමට උප්පැන්න සහතිකය / සහතිකවල පිටපත් හෝ විවාහ සහතිකය හෝ වෙනත් ලේඛනගත සාක්ෂි (අදාළ පරිදි) සමඟ දීමනාකරු විසින් අත්සන් කරන ලද කැමැත්ත ප්‍රකාශ කරන ලද ලිපියක් යොමු කිරීම අනිවාර්ය වේ.

vii. ප්‍රේෂණය කිරීමට බලාපොරොත්තු වන මුදලට අදාළව ශ්‍රී ලංකාවේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද බදු නිෂ්කාශන සහතිකයක් (දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නියෝගවලට අනුව අවශ්‍ය නම්).

viii. පහත කරුණු ප්‍රකාශ කරමින්, සාමදාන විනිශ්චකාර / දිවුරුම් කොමසාරිස්/ සොලිසිටර් වරයෙකු විසින් සහතික කර නිසි පරිදි මුද්‍රා තැබූ දිවුරුම් ප්‍රකාශයක්.

(අ) අදාළ පරිදි, එ. ජ. ඩො. 200,000 මූලික දීමනාව හෝ එ.ජ.ඩො. 30,000 වාර්ෂික දීමනාව ඉක්මවා කිසිදු මාරුකිරීමක් සිදුකර නොමැති බවට හා එසේ නොකරන බව. මෙම ප්‍රකාශනයේ දිනයට පෙර යම් සංක්‍රමණික දීමනාවක් ලබාගෙන ඇත්නම්, ඒ බව ප්‍රකාශ කළ යුතුය.

(ආ) ශ්‍රී ලංකාවෙන් පිටත ආයෝජනයට / වත්කමක් අත්පත් කරගැනීමේ කාර්යය සඳහා කිසිදු මාරුකිරීමක් සිදු කර නොමැති බව. ආයෝජනයක් සිදු කර ඇත්නම්, එම ආයෝජනවල තොරතුරු (ප්‍රේෂණ සිදු කළ බලයලත් වෙළෙන්දාගේ නම, ප්‍රේෂණය සිදු කළ දිනය, මුදල් ප්‍රමාණය, ව්‍යවහාර මුදල් වර්ගය, ගිණුමේ නම සහ අංකය, ආයෝජනයේ ස්වාභාවය, ආයෝජිතයාගේ තොරුතුරු) සමඟ ලේඛනගත සාක්ෂි ප්‍රකාශ කළ යුතුය.

ix. ගුවන් ටිකට්පතෙහි පිටපතක් (අදාළ පරිදි).

x විගාමිකයාගේ ඇටෝර්නි බලපත්‍රයේ පිටපතක් (අදාළ පරිදි).

xi. ඉහත දැක්වෙන ලියවිලි වලට අමතරව, බලයලත් වෙළෙඳුන් විසින් ඔවුන්ගේ අභ්‍යන්තර ක්‍රියාපටිපාටි වලට අනුකූල වීම සඳහා සහ මෙම විධානවල 7 (ඒ) ඡේදයේ අවශ්‍යතාව පරිදි වෙනත් ඕනෑම ලේඛනගත සාක්ෂි / තොරතුරු ලබා ගත හැකිය.

2021 අංක 16 දරන විධානයන් සඳහා වූ ඇමුණුම 3

මෙම විධාන යටතේ "ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික විජාතිකයෙකු" සඳහා අවසරලත් ප්‍රාග්ධන ගනුදෙනු සඳහා විදේශ විනිමය නිකුත් කිරීමේ දී ලබාගත යුතු ලියවිලි

i. අයදුම්කරු විසින් ඉදිරිපත් කරන විධිමත් අයදුම්පතක් (මේ සඳහා ආකෘතියක් පවත්වාගෙන යන ලෙස බලයලත් වෙළෙඳුන්හට උපදෙස් දෙනු ලැබේ).

ii. පුද්ගලික හඳුනාගැනීමේ කාඩ්තෙහි (විදේශ) පිටපතක්.

iii. අයදුම්කරුගේ වත්මන් විදේශ ගමන් බලපත්‍රයෙහි හඳුනාගැනීමේ පිටුවල පිටපත්.

iv. අරමුදල් වල මූලාශ්‍රය / මූලාශ්‍ර තහවුරු කරගැනීම සඳහා වලංගු ලියවිලි.

v. ප්‍රේෂණය කිරීමට බලාපොරොත්තු වන මුදල සඳහා ශ්‍රී ලංකා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද බදු නිශ්කාශන සහතිකයක් (දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නියෝග අනුව අවශ්‍ය නම්).

vi. ඉහත දක්වා ඇති ලියවිලිවලට අමතරව, බලයලත් වෙළඳුන් විසින් ඔවුන්ගේ අභ්‍යන්තර ක්‍රියාපටිපාටීන්ට අනුකූල වීම සඳහා සහ විධානයේ 7 (ඒ) ඡේදයේ අවශ්‍යතාව පරිදි වෙනත් ඕනෑම ලියවිල්ලක් ලබා ගත හැකිය.

2021 අංක 16 දරන විධානය සඳහා වූ ඇමුණුම 4

ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම්වල මාසික ප්‍රකාශන

බැංකුවේ නම : .....

වාර්තා කරන මාසය හා වර්ෂය : .....

වගුව 1 : ගිණුමේ තොරතුරු සහ ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම්වලින් මුළු හර කිරීම්.

එ.ජ. ඩොලර් වලින්

ගිණුම්හිමියාගේ තොරතුරු					ගිණුමේ තොරතුරු		හර කිරීම්							
							ශ්‍රී ලංකාවෙන් පිටත ගිණුම්වලට මාරු කිරීම					විදේශ විනිමය නිකුත් කිරීම	දේශීය ගිණුම් වලට මාරු කිරීම**	ශ්‍රී ලංකාව තුළදී ශ්‍රී ලංකා රුපියල් වලින් සිදුකරන ගෙවීම්
සම්පූර්ණ නම	විදේශ ගමන් බලපත්‍ර අංකය (දේශීය/ විදේශීය)	ජාතික හැඳුනුම්පත් අංකය	පුද්ගලයාගේ සුදුසුකම්ලත් කාණ්ඩය*	නිත්‍ය වාසික ත්වය/ ජාතිකත්වය හිමි රට	ලියාපදිංචි අංකය	ගිණුම් අංකය	ගනුදෙනුවේ දිනය	සංක්‍රමණික දීමනාව	මාපිය සංක්‍රමණ යෝජනා ක්‍රමය යටතේ වීසා සඳහා ගෙවීම්	ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික විජාතිකයෙකු ප්‍රකාරව	වර්තන ආදායම			
							එකතුව							

ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් හිමියන්ගේ තොරතුරු ඇතුළත් කිරීම සඳහා අවශ්‍ය පරිදි පේළි වැඩිකරගත හැකිය.

* විධානය අනුව අංක අනුපිළිවෙල අනුගමනය කරන්න.

** 1 වන වගුව අනුව දේශිය ගිණුම්වලට සිදුකරන මාරු කිරීම් බෙදා පෙන්විය යුතුය

වගුව 01

ගිණුමේ තොරතුරු		දේශීය විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලට මාරු කිරීම				
ලියාපදිංචි අංකය	ගිණුම් අංකය	පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම	ආමුඛ ආයෝජන ගිණුම	අක්වෙරළ බැංකු ඒකකයේ ගිණුම	අනේවාසික රුපියල් ගිණුම	ත්‍යාගයක් ලෙස ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම

බලයලත් වෙළෙන්දන් විසින් ඉහත පරිදි සකස් කරන ලද වාර්තාවේ පරිලෝකනය කළ පිටපතක් සහ MS Excel පිටපතක් යන ද්විත්වයම ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ.

බැංකුවේ ගිණුම් පොත්වලින් උපුටාගත් / ජනනය කරන ලද ඉහත තොරතුරු සත්‍ය බවට අපි සහතික වෙමු.

බලයලත් නිලධාරියාගේ නම : .....

අත්සන : .....

දිනය : .....

අනුකූලතා නිලධාරියාගේ නම සහ මුද්‍රාව : .....

අත්සන : .....

දිනය : .....

විදේශ විනිමය දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2021 අංක 17 දරන විධානයන්

විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුම් සම්බන්ධයෙන් බලයලත් වෙළඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්

2021 අංක 05 දරන විදේශ විනිමය (විදේශ විනිමය ගනුදෙනුවල නිරතවීමේ කාර්යය සඳහා ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම) නියෝග (නියෝග) සහ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 6 වන සහ 7 වන වගන්තිය සමග කියවිය යුතු පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව විගාමිකයෙකු විසින් ගෝලීය වශයෙන් උපචය කරගන්නා ලද වර්තන ආදායම හඳුනා ගැනීම සඳහා එම විගාමිකයා ස්ථිර වශයෙන් නේවාසිකව සිටින රට තුළ නියාමන අවශ්‍යතාවයක් පවතී නම් පමණක් විගාමිකයා විසින් උපචය කරනු ලබන වර්තන ආදායම ආපසු සියරට යැවීමේ කාර්යය සඳහා දේශීය බැංකු ඒකකයේ විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුම් විවෘත කර පවත්වාගෙන යාම සඳහා බලයලත් වෙළඳුන්හට අවසර ලබා දෙනු ලැබේ.

2. සුදුසුකම් ලත් තැනැත්තන්

(අ) විගාමිකයෙකු.

3. විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම

(අ) ශ්‍රී ලංකා රුපියල් වලින් ඉතුරුම් හෝ ජංගම (බැංකු අයිරා පහසුකම නොමැතිව) ගිණුම් ආකාරයෙන්, තනි පුද්ගල ගිණුමක් ලෙස විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම සිදු කළ යුතුය.

(ආ) සුදුසුකම් ලත් තැනැත්තන් විසින් බැංකු පද්ධතිය තුළ එක් විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුමක් පමණක් විවෘත කළ යුතුය.

(ඇ) ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම සහ විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුම යන ගිණුම් දෙකම එකම බලයලත් වෙළෙන්දෙකු සමඟ විවෘත කර පවත්වාගෙන යනු ලැබිය යුතුය.

(ඈ) විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා විසින් නිකුත් කරන ලද ලියාපදිංචි අංකය සමග ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුමක් මේ වන විටත් විවෘත කර ඇති විගාමිකයන්ගේ නමින් විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුම් විවෘත කර පවත්වාගෙන යෑමට බලයලත් වෙළෙන්දෙකු සඳහා අවසර හිමි වේ. එවැනි විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුම් පිළිබඳ විස්තර (ලියාපදිංචි අංකය, විගාමිකයාගේ නම, විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුම් අංකය), විවෘත කළ දින සිට සතියක් ඇතුළත විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක වෙත CTRA@cbsl.lk යන විද්‍යුත් ලිපිනය හරහා දැනුම් දිය යුතු වේ.

4. විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුම් විවෘත කිරීමේ ක්‍රියාපිළිවෙල

(අ) සුදුසුකම් ලත් තැනැත්තකු සඳහා විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුමක් විවෘත කරන විට දී, බලයලත් වෙළඳුන් විසින් පහත සඳහන් ලියවිලි වල පරිලෝකන පිටපත් (අදාළ පරිදි) CTRA@cbsl.lk යන විද්‍යුත් ලිපිනය හරහා විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක වෙත යොමු කිරීමෙන් පසු ලියාපදිංචි අංකයක් ලබා ගත යුතුය.

i. නිසි ලෙස සම්පූර්ණ කරන ලද ඇමුණුම I.

ii. වත්මන් විදේශ ගමන් බලපත්‍රයේ හඳුනාගැනීමේ, පිටුව සහ විකල්ප සහ නිරීක්ෂණ පිටුවල පිටපතක්.

iii. නිත්‍ය නේවාසිකත්වය (PR) සඳහා අදාළ පිටසනෙහි පිටපතක් හෝ නිත්‍ය නේවාසිකත්වය ලබාගත් දිනය සහ රට තහවුරු කිරීම සඳහා අදාළ වෙනත් ලේඛනගත සාක්ෂියක්/ සාක්ෂි.

iv. පුරවැසි සහතිකයේ හෝ ද්විත්ව පුරවැසි සහතිකයේ පිටපතක්.

v. විගාමිකයා ශ්‍රී ලංකාවෙන් පිටත ඉපදී ඇති අවස්ථාවක, එකී උපත ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක් (තිබේ නම්).

(ආ) විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක විසින් නිකුත් කරන ලද ලියාපදිංචි අංකයක් ලැබීමෙන් පසු බලයලත් වෙළඳුන් විසින් විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුමක් විවෘත කළ යුතු වේ. ඕනෑම අවස්ථාවක දී, විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක විසින් නිකුත් කරන ලද එම ලියාපදිංචි අංකය යටතේ ම එම ගිණුම්හිමියාගේ නමින් ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුමක් විවෘත කිරීමට බලයලත් වෙළඳුන්ට හැකිය. විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් ලියාපදිංචි අංකයක් නිකුත් කරන ලද ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුමක් මේ වන විටත් හිමි විගාමිකයෙකු සඳහා විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුමක් විවෘත කිරීමට අවශ්‍ය වන අවස්ථාවකදී, එම ලියාපදිංචි අංකය යටතේ ම විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුමක් විවෘත කිරීමට බලයලත් වෙළඳුන්ට අවසර ලැබේ.

5. අවසරලත් හර කිරීම්

(අ) ශ්‍රී ලංකාවේ නේවාසිකයෙකුව සිටිය දී, විගාමිකයෙකුගේ අයිතිව තිබූ හෝ නියෝග බලාත්මක වීමට පෙර එවැනි විගාමිකයෙකුගේ ශ්‍රී ලංකා රුපියල් ගිණුමකින් අරමුදල් භාවිත කරමින් අත්පත් කරගත් ශ්‍රී ලංකාවේ ඇති ඕනෑම වත්කමකින් (චංචල, නිශ්චල, ස්පෘශ්‍ය සහ අස්පෘශ්‍ය වත්කම් ඇතුළුව) උපචිත වූ යම් ආදායමක්.

(ආ) ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයකුගෙන් විගාමිකයා වෙත උරුම වූ ශ්‍රී ලංකාව තුළ ඇති යම් වත්කමකින් (චංචල, නිශ්චල, ස්පෘශ්‍ය සහ අස්පෘශ්‍ය වත්කම් ඇතුළුව) උපචිත වූ ආදායමක්.

(ඇ) ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයකු වන සමීපතම පවුලේ සමාජිකයකුගෙන් විගාමිකයෙකු ත්‍යාගයක් ලෙස ලබන ශ්‍රී ලංකාව තුළ ඇති යම් වත්කමකින් (චංචල, නිශ්චල, ස්පෘශ්‍ය සහ අස්පෘශ්‍ය වත්කම් ඇතුළුව) උපචිත වූ යම් ආදායමක්.

(ඈ) ශ්‍රී ලංකාව තුළ නේවාසිකයෙකුව සිටිය දී සිදු කරන ලද හෝ මේ නියෝග බලාත්මක වීමට පෙර ඔහුගේ/ඇයගේ ශ්‍රී ලංකා රුපියල් ගිණුම් හරහා සිදුකරන ලද හෝ පැවරුම්කරු වෙත උරුමයෙන් ලද හෝ පැවරුම්කරු විසින් ත්‍යාගයක් ලෙස ලද හෝ 2021 අංක 2 දරණ විදේශ විනිමය (ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තෙකු විසින් ශ්‍රී ලංකාව තුලදී සිදුකරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු වර්ග) නියෝග යටතේ අවසර ලබා දී ඇති පරිදි පැවරුම්කරුගේ අනේවාසික රුපියල් ගිණුම හරහා සිදුකරන ලද ආයෝජනයන්ගෙන්, සමීප සාමාජිකයෙකු වන වෙනත් විගාමිකයෙකුගෙන් (එනම් පැවරුම්කරු) විගාමිකයෙකු වෙත උරුම වූ හෝ ත්‍යාගයක් වශයෙන් ලැබුණු (පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හෝ ආමුබ ආයෝජන ගිණුම්වල ඇති අරමුදල් හැර චංචල, නිශ්චල, ස්පෘශ්‍ය සහ අස්පෘශ්‍ය වත්කම් ඇතුළුව) ශ්‍රී ලංකාව තුළ ඇති යම් වත්කමකින් උපචිත වූ යම් ලැබීම්.

(ඉ) ගිණුම්හිමියා විසින් සපයනු ලබන සේවාවන් සඳහා ලැබෙන ආදායම.

(ඊ) ගිණුම්හිමියාගේ විශ්‍රාම පාරිතෝෂික දීමනා (සේවක අර්ථසාධක අරමුදල (EPF), සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල (ETF) පාරිතෝෂිකය සහ විශ්‍රාම වැටුප් හෝ වෙනත් යම් විශ්‍රාම ප්‍රතිලාභ).

(උ) ගිණුම්හිමියාගේ අනේවාසික රුපියල් ගිණුමකින් හෝ ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුමකින් මාරු කරන ලද ගිණුම්හිමියාගේ වර්තන ආදායම.

(ඌ) ගිණුමේ ඇති අරමුදල් මත උපයාගත් පොලිය.

6. අවසරලත් බැර කිරීම්

(අ) ගිණුම්හිමියාගේ නමට එවනු ලබන ප්‍රේෂණ

(ආ) ගිණුම්හිමියාගේ ආමුබ ආයෝජන ගිණුමකට හෝ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට හෝ අක්වෙරළ බැංකු ඒකකයේ පවත්වාගෙන යනු ලබන ගිණුමකට හෝ ශ්‍රී ලංකාවෙන් පිටත පවත්වාගෙන යන ගිණුමකට කරනු ලබන මාරු කිරීම්.

(ඇ) මියගිය පුද්ගලයෙකුගේ (එනම් ගිණුම්හිමියා) බූදලයේ අද්මිනිස්ත්‍රාසිකරු/ පොල්මඃකරුගේ ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුමකට මාරු කිරීම.

(ඈ) 2021 අංක 11 දරන විධාන (ඉදිරියේ දී සංශෝධනය කරනු ලබන පරිදි) යටතේ ගිණුම්හිමියා ලබාගත් ණය මුදල හා සම්බන්ධ ගෙවීම්.

(ඉ) 2021 අංක 02 දරන විධාන (ඉදිරියේ දී සංශෝධනය කරනු ලබන පරිදි) ප්‍රකාරව නිකුත් කරන ලද ගිණුම්හිමියාගේ විද්‍යුත් අරමුදල් හුවමාරු කාඩ්පත් පියවීම සඳහා සිදු කරනු ලබන ගෙවීම්.

(ඊ) ශ්‍රී ලංකාව තුළ දී ශ්‍රී ලංකා රුපියලින් සිදු කරනු ලබන ගෙවීම්.

7. අනෙකුත් නියම සහ කොන්දේසි

(අ) සුදුසුකම්ලත් තැනැත්තන් සඳහා වෙන්කරන ලද විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුම සඳහා වෙන් කරන ලද ගිණුම් අංකය එය පැවරූ වහාම විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක වෙත CTRA@cbsl.lk යන විද්‍යුත් ලිපිනයට කඩිනමින් දැනුම් දිය යුතු වේ.

(ආ) මෙම විධානවල 5 (උ) අනු ඡේදය යටතේ සඳහන් කරන ලද ගනුදෙනු සිදු කිරීමේ දී, බලයලත් වෙළඳුන් විසින් අනේවාසික රුපියල් ගිණුම හෝ ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම පවත්වාගෙන යනු ලබන බලයලත් වෙළෙන්දාගෙන් අරමුදල්වල මූලාශ්‍රය පිළිබඳව තහවුරු කිරීමක් ලබා ගත යුතුය.

(ඇ) බලයලත් වෙළෙන්දන් විසින් විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුම විවෘත කිරීමේ අවශ්‍යතාව පිළිබඳව බලයලත් වෙළඳුන් සෑහීමකට පත් වීමට හැකි වන සේ ලේඛනගත සාක්ෂි ලබා ගත යුතුය.

(ඈ) විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුම හරහා සිදු කිරීමට නියමිත ගනුදෙනුවල නීත්‍යානුකූලභාවය සහ සද්භාවය සනාථ කර ගැනීම සඳහා බලයලත් වෙළෙන්දන් විසින් සුදුසු නීත්‍යානුකූලව පිළිගත හැකි ලේඛනගත සාක්ෂි (අවශ්‍ය පරිදි) ලබා ගත යුතු අතර, මෙම විධානවලට සහ නියෝග වලට අනුකූල වීම සහතික කළ යුතුය.

(ඉ) මෙම දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ලියාපදිංචි අංකය සහ විගාමිකයන්ගේ ආදායම් ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුම් අංකය මගින් පුද්ගලයෙකු හඳුනා ගැනීම සඳහා ක්‍රියාපිළිවෙළක් බලයලත් වෙළඳුන් සතු විය යුතුය.

(ඊ) බලයලත් වෙළෙන්දන් විසින්, විගාමිකයන් සතු විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුම හරහා සිදු කරන ලද ගනුදෙනු සම්බන්ධ ලේඛනගත සාක්ෂි (දෘඩ පිටපතක් හෝ ඉලෙක්ට්‍රොනික/ ඩිජිටල් ආකාරයෙන්) ව්‍යවස්ථාපිත වාර්තා තැබීමේ අවශ්‍යතාවය ඉක්මවා යමින් සහ ගිණුම පවත්වාගෙන යනතෙක් පවත්වාගෙන යා යුතුය.

8. විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුම් වැසීම

(අ) විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුමක් අනාගතයේ දී විවෘත කිරීමට ගිණුම්හිමියාට අවශ්‍යතාවයක් නොමැති බවට ඔහුගෙන්/ ඇයගෙන් තහවුරු කිරීමක් ලබා ගැනීමෙන් අනතුරුව, ගිණුම්හිමියාගේ ඉල්ලීම මත විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුම වසා දැමිය හැකිය.

(ආ) බලයලත් වෙළෙන්දන් විසින් එවැනි වසා දැමීමක් සිදු කළ දින සිට වැඩකරන දින තුනක් ඇතුළත, තම වසා දැමීම පිළිබඳව CTRA@cbsl.lk යන විද්‍යුත් ලිපිනය හරහා විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක වෙත දැනුම් දිය යුතුය.

9. මෙම විධානවල විෂය පථයෙන් පරිබාහිර වෙනත් ඕනෑම කාර්යයක් සඳහා විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුමකින්/ ගිණුමකට ඕනෑම මාරු කිරීමක්/ ඕනෑම ගනුදෙනුවක් සිදු කිරීම සඳහා බලයලත් වෙළෙන්දන් විසින් විදේශ විනිමය දෙපාර්තමේන්තුවෙ අධ්‍යක්ෂකගේ පූර්ව අවසරය ලබා ගත යුතුය.

10. වාර්තාකිරීමේ අවශ්‍යතාව

මෙම විධානවල ඇමුණුම 2 අනුව සකස් කරන ලද වාර්තාවක් මාසික පදනම මත විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක වෙත විද්‍යුත් තැපැල dfem@cbsl.lk හරහා එළඹෙන මාසයේ 15 වැනි දිනට පෙර යොමු කළ යුතුය.

11. මෙම විධානයන්ගේ කාර්යය සඳහා

(අ) **"විගාමිකයා"** යන්නෙන් වෙනත් රටක නිත්‍ය නේවාසික තත්ත්වය හෝ පුරවැසිභාවය ලබා ගෙන ඇති ශ්‍රී ලාංකිකයෙකු, ශ්‍රී ලාංකික සම්භවයක් සහිත ද්විත්ව පුරවැසියෙකු (ශ්‍රී ලාංකික සම්භවයක් යනු අවම වශයෙන් දෙමව්පියන්ගෙන් එක් අයෙකු හෝ ශ්‍රී ලංකාවේ උපත ලද අයකු විය යුතු වේ) සහ බාලවයස්කරුවන් ද ඇතුළුව, සිය උපත ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර ඇති ශ්‍රී ලංකාවෙන් පිටත වාසික ශ්‍රී ලාංකික සම්භවයක් සහිත විජාතිකයෙකු අදහස් වේ.

(ආ) **"ප්‍රේෂණ"** යන්නට විදුලි පණිවුඩ පැවරුම්, අනෙකුත් අන්තර් බැංකු පැවරුම්, බැංකු අණකර, අනෙකුත් ගෙවීම් උපකරණ, අනෙකුත් ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ගෙවීම් යාන්ත්‍රණ හෝ ක්‍රම හරහා ලද ගෙවීම් සහ ව්‍යවහාර මුදල් නෝට්ටු හැර විනිමය මධ්‍යස්ථාන/ ආයතනවලින් විදේශයන්ගෙන් විදේශ ව්‍යවහාර මුදලින් ලද අරමුදල් යනාදිය ඇතුළත් විය යුතුය.

(ඇ) **"සමීපතම පවුල් සාමාජිකයා"** යන්නට 2021 අංක 03 දරන විදේශ විනිමය (විගාමිකයන් විසින් අරමුදල් ප්‍රේෂණය කිරීම) නියෝගවල ද ඇති අර්ථය ම තිබිය යුතුය.

12. මෙම විධාන වල අවසර ලබාදුන් කිසිවක් වෙනත් ඕනෑම නීතියක විධිවිධාන සමඟ අනුකූල වීමේ අවශ්‍යතාවයෙන්, මෙම විධාන යටතේ විදේශ විනිමයෙන් ගනුදෙනු කරන බලයලත් වෙළෙන්දන් හෝ ඕනෑම පුද්ගලයෙකු නිදහස් කිරීමක්, නිදොස් කිරීමක් හෝ වැළක්වීමක් ලෙස අර්ථ විග්‍රහ නොකළ යුතුය.

13. මෙම විධානවල සියළු හර කිරීම් සහ බැර කිරීම් 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 22 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද යම් නියමයකට යටත් විය යුතුය.

14. මෙම විධාන 2021 මාර්තු 22 වන දින සිට ක්‍රියාත්මක විය යුතුය.

අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව
2021 මාර්තු 18

2021 අංක 17 දරන විධානයන් සඳහා වූ ඇමුණුම I

ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් සහ විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුම් විවෘත කිරීම සඳහා ලියාපදිංචි අංකයක් ඉල්ලුම් කිරීම

1) ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් සහ විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුම් හිමියාගේ තොරතුරු

අ) සම්පූර්ණ නම : .....

ආ) ජාතික හැඳුනුම්පත් අංකය : .....

ඇ) පුද්ගලික හඳුනා ගැනීමේ අංකය (විදේශ) : .....

ඈ) වත්මන් විදේශ ගමන් බලපත්‍ර අංකය : .....

ඉ) ශ්‍රී ලංකා විදේශ ගමන් බලපත්‍ර අංකය. (තිබේ නම්) : .....

ඊ) උපන්දිනය (දිනය/ මාසය/ වසර) : .....

උ) නිත්‍ය නේවාසිකත්වය ලබා ගත් දිනය (දිනය/ මාසය/ වසර) : .....

ඌ) නිත්‍ය නේවාසිකත්වය / පුරවැසිභාවය හිමි රට : .....

එ) විවෘත කළ යුතු ගිණුම (ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම හෝ විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුම හෝ ද්විත්වයම) : .....

ඒ) ගිණුම්හිමියාගේ සුදුසුකම් ලත් කාණ්ඩය (සුදුසුකම් ලත් කාණ්ඩය සඳහන් කරන්න) : .....

2) <u>බලයලත් වෙළෙන්දාගේ තොරතුරු</u>

අ) නම : .....

ආ) ශාඛාව : .....

ඇ) ශාඛාවේ ලිපිනය : .....

ඈ) ඊමේල් ලිපිනය : .....

ඉ) ඉල්ලීම කරනු ලබන නිළධාරියාගේ නම : .....

ඊ) තනතුර : .....

උ) දුරකථන අංක : රාජකාරි : .....

පෞද්ගලික : .....

ඌ) දිනය සහ අත්සන : .....

සටහන : 1. බලයලත් වෙළඳුන් විසින් නිරවද්‍ය සහ සම්පූර්ණ තොරතුරු භාවිත කරමින් ඉහත සඳහන් ඇමුණුම I සම්පූර්ණ කර යොමු කිරීම අවශ්‍ය වේ.

2021 අංක 17 දරන විධානයන් සඳහා වූ ඇමුණුම II

විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුම් වල මාසික ප්‍රකාශනය

බැංකුවේ නම : .....

වාර්තා කරන මාසය සහ වර්ෂය : .....

ඇ.එ.ජ. ඩොලර්වලින්*

ගිණුම්හිමියාගේ විස්තර				ගිණුම් තොරතුරු		ගිණුම් තොරතුරු - මුළු බැර කිරීම්				
සම්පූර්ණ නම	විදේශ ගමන් බලපත්‍ර අංකය (දේශීය/ විදේශීය)	ජා.හැ.අංකය	නිත්‍ය නේවාසිකත්වය/ පුරවැසිභාවය හිමි රට	ලියාපදිංචි අංකය	ගිණුම් අංකය	ප්‍රතිමුඛ ප්‍රේෂණ	ආමුඛ ආයෝජන ගිණුම/ අක්වෙරළ බැංකු ඒකකය/ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම වෙත කරනු ලබන පැවරීම්	ගිණුම්හිමියාගේ අද්මිනිස්ත්‍රාසිකරු හෝ පෙලේමෑකරුගේ ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම වෙත අරමුදල් මාරු කිරීම්	දේශීය ගෙවීම්	ශ්‍රී ලංකා මහ බැංකුවේ විශේෂ අවසරය යටතේ ප්‍රේෂණ

විගාමිකයන්ගේ ආදායම් ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුම් හිමියන්ගේ තොරතුරු ඇතුළත් කිරීම සඳහා අවශ්‍ය පරිදි පෙළ වැඩි කර ගත හැකිය.

*ගනුදෙනුව සිදු වන දින පවතින විදේශ විනිමය අනුපාත භාවිත කරමින් සෑම ගනුදෙනුවක් ම එ.ජ. ඩොලර්වලින් වාර්තා කළ යුතු වේ. බලයලත් වෙළඳුන් විසින් ඉහත පරිදි සකස් කරන ලද වාර්තාවේ පරිලෝකනය කළ පිටපතක් සහ MS Excel පිටපතක් යන ද්විත්වය ම ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ.

බැංකුවේ ගිණුම් පොත්වලින් උපුටාගත්/ ජනනය කරන ලද ඉහත තොරතුරු සත්‍ය බවට අපි සහතික වෙමු.

බලයලත් නිළධාරියාගේ නම සහ තනතුර : .....

අත්සන සහ මුද්‍රාව : .....

දිනය : .....

අනුකූලතා නිළධාරියාගේ නම : .....

අත්සන : .....

දිනය : .....

විදේශ විනිමය දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2021 අංක 18 දරන විධානයන්

අනේවාසික රුපියල් ගිණුම් සම්බන්ධයෙන් බලයලත් වෙළඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්

2021 අංක 5 දරන විදේශ විනිමය (විදේශ විනිමය ගනුදෙනුවල නිරත වීමේ කාර්යය සඳහා ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම) නියෝග (නියෝග) ප්‍රකාරව සහ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 6 වන සහ 7 වන වගන්ති සමඟ කියවිය යුතු 9 වන වගන්තිය ප්‍රකාරව, පහත කොන්දේසිවලට යටත්ව, දේශීය බැංකු ඒකකය තුළ අනේවාසික රුපියල් ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම සඳහා බලයලත් වෙළඳුන්හට අවසර ලබා දෙනු ලැබේ.

2. සුදුසුකම්ලත් තැනැත්තන්

අ) ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික විගාමිකයෙකු

ආ) ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද/පිහිටුවන ලද ව්‍යාපාර ආයතන සහ සමාගම්

3. අනේවාසික රුපියල් ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම.

(අ) ශ්‍රී ලංකා රුපියල්වලින් ඉතුරුම් හෝ ජංගම (බැංකු අයිරා පහසුකම නොමැතිව) හෝ කාලීන තැන්පතු ගිණුම් ආකාරයෙන් අනේවාසික රුපියල් ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම සිදු කළ හැකිය.

(ආ) අනේවාසික රුපියල් ගිණුම් තනි පුද්ගල ගිණුමක් ලෙස පවත්වාගෙන යා යුතුය. විගාමිකයන් විසින් පවත්වාගෙන යන අනේවාසික රුපියල් ගිණුම් තවත් විගාමිකයකු සමඟ හවුල් ගිණුමක් ලෙස පවත්වාගෙන යා හැකිය.

(ඇ) 2021 අංක 2 දරන විදේශ විනිමය (ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව තුළදී සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු වර්ග) නියෝගවල I වන උප ලේඛනයේ අ ශීර්ෂය යටතේ 4(7) අනුඡේදය යටතේ අවසරලත් ගනුදෙනු සිදු කිරීමට අපේක්ෂිත, ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද/ පිහිටුවන ලද ව්‍යාපාර ආයතන සහ සමාගම් පමණක්, එම කාර්යය සඳහා, බැංකු පද්ධතිය තුළ එක් අනේවාසික රුපියල් ගිණුමක් විවෘත කිරීමට සුදුසුකම් ලබයි.

(ඈ) මහ බැංකුව විසින් ලියාපදිංචි අංකයක් නිකුත් කර ඇති ගිණුම් හැර සියලු ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම්, නියෝග වල දිනයේ සිට මාස තුනක් ඇතුළත අනේවාසික රුපියල් ගිණුම් ලෙස නැවත නම් කර තවදුරටත් පවත්වාගෙන යා යුතුය.

(ඉ) ඔහු හෝ ඇය නිත්‍ය වාසිකත්වය ලබාගත් රටේ ස්ථිරවම පදිංචි වීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකාව හැර යාමට අදහස් කරනු ලබන විගාමිකයෙකු විසින් පවත්වාගෙන යනු ලබන සියලු ශ්‍රී ලංකා රුපියල් ගිණුම්, ඔහුගේ හෝ ඇයගේ සංක්‍රමණය පිළිබඳව බලයලත් වෙළෙන්දෙකු දැනගත් මොහොතට ඉක්බිතිව බලාත්මක වන පරිදි අනේවාසික රුපියල් ගිණුම් ලෙස නැවත නම් කර තවදුරටත් පවත්වාගෙන යා යුතුය.

4. නිත්‍ය නේවාසික වීසා යටතේ අනාගත සංක්‍රමණිකයෙකු වන ශ්‍රී ලාංකික පුද්ගලයෙකු පවත්වාගෙන ගිය සියලු ශ්‍රී ලංකා රුපියල් ගිණුම්, අනේවාසික රුපියල් ගිණුම් ලෙස නැවත නම් කිරීමේ ක්‍රියා පිළිවෙළ;

(අ) ඔහු හෝ ඇය නිත්‍ය වාසිකත්වය ලබාගත් රටේ ස්ථිරවම පදිංචි වීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකාව හැර යාමට අදහස් කරනු ලබන විගාමිකයෙකු විසින් "තනි පුද්ගල ගිණුමක් හෝ හවුල් ගිණුමක්" වශයෙන් පවත්වාගෙන යනු ලබන ඕනෑම ශ්‍රී ලංකා රුපියල් ගිණුමක්, අනේවාසික රුපියල් ගිණුම් ලෙස නැවත නම් කර පවත්වාගෙන යා යුතුය.

(ආ) ඔහු හෝ ඇය නිත්‍ය වාසිකත්වය ලබාගත් රටේ ස්ථිරවම පදිංචි වීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකාව හැර යාමට අදහස් කරනු ලබන විගාමිකයෙකු විසින් ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයෙකු සමඟ "හවුල් ගිණුමක්" ලෙස පවත්වාගෙන යන යම් ශ්‍රී ලංකා රුපියල් ගිණුමක් වසා දැමිය යුතු අතර එවැනි විගාමිකයෙකු විසින් අනේවාසික රුපියල් ගිණුමක් විවෘත කළ හැකිය (අවශ්‍යනම්). සාමාන්‍ය බැංකු කටයුතුවල ක්‍රියා පිළිවෙලට යටත්ව, එවැනි ශ්‍රී ලංකා රුපියල් ගිණුම්වල ඇති ඉතිරි මුදල්, අනාගත සංක්‍රමණිකයෙකු විසින් විවෘත කිරීමට අපේක්ෂිත අනේවාසික රුපියල් ගිණුමකට මාරු කළ හැකිය.

(ඇ) ඔහු හෝ ඇය නිත්‍ය වාසිකත්වය ලබාගත් රටේ ස්ථිරවම පදිංචි වීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකාව හැර යාමට අදහස් කරන විගාමිකයෙකු විසින් තවත් විගාමිකයෙකු සමඟ "හවුල් ගිණුමක්" ලෙස පවත්වාගෙන යන ශ්‍රී ලංකා රුපියල් ගිණුමක්, අනේවාසික රුපියල් ගිණුම් ලෙස නැවත නම් කර තවදුරටත් පවත්වාගෙන යා යුතුය.

(ඈ) ඔහු හෝ ඇය නිත්‍ය වාසිකත්වය ලබාගත් රටේ ස්ථිරවම පදිංචි වීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකාව හැර යාමට අදහස් කරන විගාමිකයෙකු විසින් පවත්වාගෙන යන ප්‍රතිමුඛ ආයෝජන ගිණුම්, ඔහුගේ/ඇයගේ සංක්‍රමණය පිළිබඳව බලයලත් වෙළෙන්දකු දැනගත් මොහොතට ඉක්බිතිවම බලාත්මක වන පරිදි, අනේවාසික රුපියල් ගිණුම් ලෙස පරිවර්තනය කර තවදුරටත් පවත්වාගෙන යා යුතුය. බලයලත් වෙළෙන්දන් විසින්, එලෙස අනේවාසික රුපියල් ගිණුම් ලෙස පරිවර්තනය කරන ලද ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් පිළිබඳව (ඔහු හෝ ඇය නිත්‍ය වාසිකත්වය ලබාගත් රටෙහි සිදු කරන ලද සියලුම ආයෝජන සඳහා ප්‍රේෂණ සිදු කළ දිනය, ප්‍රතිමුඛ ප්‍රේෂණවල එකතුව වැනි තොරතුරු ඇතුළත්ව), එලෙස පරිවර්තනය කරන ලද දිනයේ සිට සතියක් ඇතුළත dfem@cbsl.lk හරහා විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක වෙත දැනුම්දිය යුතුය.

5. අවසරලත් බැර කිරීම්

(අ) ශ්‍රී ලංකාව තුළ දී සිදු කරනු ලබන ගෙවීම් සඳහා, බැංකු පද්ධතිය හරහා ගිණුම් හිමියාගේ නමට ශ්‍රී ලංකාවට පිටතින් විදේශ විනිමයෙන් ලැබෙන ප්‍රේෂණ

(ආ) ගිණුම් හිමියා විගාමිකයෙකු වන අවස්ථාවක දී,

i. ශ්‍රී ලංකාවේ නේවාසිකයෙකු ව සිටිය දී (වංචල, නිශ්චල, ස්පෘශ්‍ය සහ අස්පෘශ්‍ය වත්කම් ඇතුළුව) විගාමිකයාට අයිතිව තිබූ හෝ මේ නියෝග බලාත්මක වීමට පෙර එම තැනැත්තාගේ ශ්‍රී ලංකා රුපියල් ගිණුම හරහා අරමුදල් භාවිත කර අත්පත් කරගත් හෝ 2021 අංක 2 දරන විදේශ විනිමය (ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව තුළ දී සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු වර්ග) නියෝග මගින් අවසරලත් පරිදි ගිණුම හරහා අරමුදල් යෙදවීමෙන් අත්පත් කරගත් යම් වත්කමකින් උපචිත වූ යම් ලැබීම්.

ii. ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තකුගෙන් විගාමිකයෙකුට උරුම වූ ශ්‍රී ලංකාව තුළ ඇති යම් වත්කමකින් (වංචල, නිශ්චල, ස්පෘශ්‍ය සහ අස්පෘශ්‍ය වත්කම් ඇතුළුව) උපචිත වූ යම් ලැබීම්

iii. ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තකු වන සමීපතම පවුල් සාමාජිකයෙකුගෙන් විගාමිකයෙකු ත්‍යාගයක් ලෙස ලබන ශ්‍රී ලංකාව තුළ ඇති යම් වත්කමකින් (වංචල, නිශ්චල, ස්පෘශ්‍ය සහ අස්පෘශ්‍ය වත්කම් ඇතුළුව) උපචිත වූ යම් ලැබීම්.

iv. 2021 අංක 2 දරන විදේශ විනිමය (ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව තුළ දී සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු වර්ග) නියෝග මගින් අවසරලත් පරිදි පැවරුම්කරුගේ අනේවාසික රුපියල් ගිණුමක් හරහා සිදු කරන ලද හෝ පැවරුම්කරු විසින් ත්‍යාගයක් ලෙස ලද හෝ පැවරුම්කරු වෙත උරුමයෙන් ලද හෝ මේ නියෝග බලාත්මක වීමට පෙර ඔහුගේ හෝ ඇයගේ ශ්‍රී ලංකා රුපියල් ගිණුම් හරහා සිදු කරන ලද හෝ ශ්‍රී ලංකාවේ නේවාසිකයෙකු ව සිටිය දී කරන ලද ආයෝජනයන්ගෙන්, සමීපතම පවුල් සාමාජිකයෙකු වන වෙනත් විගාමිකයෙකුගෙන් (එනම් පැවරුම්කරු) විගාමිකයෙකු වෙත උරුම වූ හෝ ත්‍යාගයක් වශයෙන් ලැබුණු ශ්‍රී ලංකාව තුළ ඇති යම් වත්කමකින් (පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හෝ ආමුබ ආයෝජන ගිණුම්වල ඇති අරමුදල් හැර, වංචල, නිශ්චල, ස්පෘශ්‍ය සහ අස්පෘශ්‍ය වත්කම් ඇතුළුව) උපචිත වූ ලැබීම්.

v. මෙම විධානයෙහි 5(ආ)(i) සිට 5(ආ)(iv) දක්වා අනුඡේදයන්හි සඳහන් කර ඇති පරිදි විගාමිකයාට අයිතිව තිබූ හෝ උරුමයෙන් ලද හෝ ත්‍යාගයක් වශයෙන් ලද ආයෝජනයකින් උපචිත වූ යම් ආදායමක්

vi. ගිණුම් හිමියාගේ විශ්‍රාම පාරිතෝෂිත දීමනා (සේවක අර්ථසාධක අරමුදල (EPF), සේවා නියුක්තයන්ගේ භාර අරමුදල (ETF), පාරිතෝෂිකය සහ විශ්‍රාම වැටුප් හෝ වෙනත් යම් විශ්‍රාම ප්‍රතිලාභ ඇතුළුව)

(ඇ) ගිණුම් හිමියා ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද/පිහිටුවන ලද ව්‍යාපාර ආයතන හෝ සමාගම් වන අවස්ථාවක දී,

i. ගනුදෙනුවල සද්භාවය සනාථ කර ගැනීමෙන් පසුව සහ ලේඛනගත සාක්ෂි තහවුරු කර ගැනීමට යටත්ව ජංගම ගනුදෙනුවකින් උපචිත වූ දේශීය ආදායම

ii. 2021 අංක 2 දරන විදේශ විනිමය (ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව තුළ දී සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු වර්ග) නියෝගවල 1වන උපලේඛනයේ අ ශීර්ෂය යටතේ 4(7) අනුඡේදය යටතේ අවසරලත් ආයෝජනවලින් ලද යම් ආදායමක් හෝ යම් ප්‍රාග්ධන ලැබීම්.

(ඈ) ගිණුමෙහි ඇති අරමුදල් මත උපයාගත් පොලිය

6. අවසරලත් හර කිරීම්

(අ) ගිණුම් හිමියා විගාමිකයෙකු වන අවස්ථාවක දී,

i. 2021 අංක 2 දරන විදේශ විනිමය (ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව තුළ දී සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු වර්ග) නියෝගවල අවසරලත් පරිදි ආයෝජන සම්බන්ධ ගෙවීම්.

ii. ගිණුම් හිමියාගේ ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුමකට මාරු කිරීම්

iii. 5(ආ)(v) ඡේදය යටතේ බැර කරන ලද ගිණුම් හිමියාගේ වර්තන ආදායම, ගිණුම් හිමියාගේ විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුමට මැරු කිරීම්.

iv. මියගිය පුද්ගලයෙකුගේ (එනම් ගිණුම් හිමියා) බූදලයේ අද්මිනිස්ත්‍රාසිකරු/පොල්මඃකරුගේ ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුමකට අරමුදල් මාරු කිරීම.

(ආ) ගිණුම් හිමියා ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද/පිහිටුවන ලද ව්‍යාපාර ආයතන හෝ සමාගම් වන අවස්ථාවක දී,

i. මෙම විධානවල 5(ඇ)(i) සහ 5(ඈ) ඡේද යටතේ බැර කරන ලද අරමුදල්වලින් සිදු කරන ප්‍රේෂණ

ii. මෙම විධානවල 5(ඇ)(ii) ඡේදය යටතේ බැර කරන ලද අරමුදල්වලින්, ලිත් වර්ෂයකට එ.ජ.ඩො. 30,000 දක්වා, ගිණුම් හිමියාගේ ආමුබ ආයෝජන ගිණුමකට හෝ අක්වෙරළ බැංකු ඒකකයෙහි පවත්වාගෙන යන ගිණුමකට හෝ ශ්‍රී ලංකාවෙන් පිටත පවත්වාගෙන යන ගිණුමකට ප්‍රේෂණය/ මාරු කිරීම

(ඇ) ශ්‍රී ලංකා රුපියල්වලින් ශ්‍රී ලංකාව තුළ දී සිදු කරනු ලබන ගෙවීම්.

7. අනෙකුත් නියම සහ කොන්දේසි

(අ) 2021 අංක 2 දරන විදේශ විනිමය (ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව තුළ දී සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු වර්ග) නියෝගවල අවසරලත් පරිදි අනේවාසික රුපියල් ගිණුම හරහා සිදු කරනු ලබන ආයෝජනවල යම් ආදායමක් හෝ ප්‍රාග්ධන ලැබීම්, ආයෝජනය සිදු කළ අදාළ අනේවාසික රුපියල් ගිණුමටම බැර කළ යුතුය.

(ආ) මෙම විධානවල 6(අ)(ii.) සිට 6(අ)(iv) දක්වා අනුඡේද යටතේ ඇති ගනුදෙනු සිදු කිරීමේ දී, බලයලත් වෙළඳුන් විසින්, ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම හෝ විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුම පවත්වාගෙන යන බලයලත් වෙළෙන්දා වෙත අරමුදල්වල මූලාශ්‍රය සම්බන්ධයෙන් තහවුරුවක් ලබා දිය යුතුය.

(ඇ) බලයලත් වෙළඳුන් විසින් පහත කරුණු තහවුරු කරන නීත්‍යානුකූලව පිළිගත හැකි ලියකියවිලි ලබා ගත යුතුය.

i. මෙම විධානවල 3(ඇ) අනුඡේදය යටතේ අනේවාසික රුපියල් ගිණුමක් විවෘත කරන විට, තවත් බලයලත් වෙළෙන්දෙකු සමඟ අනේවාසික රුපියල් ගිණුම් විවෘත කර නොමැති බවට.

ii. 7(ඇ)(i) යටතේ සඳහන් කර ඇති ප්‍රකාශය කිසියම් අවස්ථාවක අසත්‍ය නම්, අනාගත ප්‍රේෂණ අත්හැරීමට පිළිගැනීම.

(ඈ) අනේවාසික රුපියල් ගිණුම හරහා සිදු කිරීමට නියමිත ගනුදෙනුවල සද්භාවය සනාථ කර ගැනීම සඳහා බලයලත් වෙළෙන්දන් විසින් සුදුසු, නීත්‍යානුකූලව පිළිගත හැකි ලේඛනගත සාක්ෂි (අවශ්‍ය පරිදි) ලබාගත යුතු අතර මෙම විධානවලට සහ නියෝගවලට අනකූල වීම සහතික කළ යුතුය.

(ඉ) බලයලත් වෙළඳුන් විසින්, විගාමිකයන් සතු අනේවාසික රුපියල් ගිණුම හරහා සිදු කරන ලද ගනුදෙනුවලට සම්බන්ධ ලේඛනගත සාක්ෂි (දෘඪ පිටපත් හෝ ඉලෙක්ට්‍රොනික/ ඩිජිටල් ආකාරයෙන්) ව්‍යවස්ථාපිත වාර්තා තැබීමේ අවශ්‍යතාවය ඉක්මවා යමින්, පවත්වාගෙන යා යුතුය.

8. අනේවාසික රුපියල් ගිණුම් වැසීම

(අ) අනේවාසික රුපියල් ගිණුම හරහා සිදු කරන ලද සියලු ආයෝජන (තිබේ නම්) නිමා කර/ ඈවර කර ඇත්නම් සහ එම ආයෝජනවලින් ලද ලැබීම්, ගිණුම් හිමියාගේ ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුමකට මාරුකර ඇත්නම්, ගිණුම් හිමියාගේ ඉල්ලීම මත අනේවාසික රුපියල් ගිණුම වසා දැමිය හැක.

(ආ) බලයලත් වෙළෙන්දන් විසින්, එවැනි වසා දැමීමක් සිදු කළ දින සිට සතියක් ඇතුළත, එම වසා දැමීම පිළිබඳව dfem@cbsl.lk හරහා විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක වෙත දැනුම්දිය යුතුය.

9. මෙම විධානවල විෂය පථයෙන් පරිබාහිර වෙනත් ඕනෑම කාර්යයක් සඳහා අනේවාසික රුපියල් ගිණුමකින්/ගිණුමකට ඕනෑම මාරු කිරීමක්/ ඕනෑම ගනුදෙනුවක් සඳහා බලයලත් වෙළඳුන් විසින් විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකගේ පූර්ව අවසරය ලබාගත යුතුය.

10. වාර්තා කිරීමේ අවශ්‍යතාව

(අ) මෙම විධානවල ඇමුණුම අනුව සකස් කරන ලද වාර්තාවක් මාසික පදනම මත විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක වෙත විද්‍යුත් තැපෑල (dfem@cbsl.lk) හරහා එළඹෙන මාසයේ 15 වැනි දිනට පෙර එවිය යුතුය.

(ආ) 2021 අංක 2 දරන විදේශ විනිමය (ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව කුළ දී සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු වර්ග) නියෝගවල I වන උපලේඛනයේ අ ශීර්ෂය යටතේ 4(7) අනුඡේදය යටතේ අවසරලත් ගනුදෙනු සිදු කිරීමට අපේක්ෂිත, ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද/පිහිටුවන ලද ව්‍යාපාර ආයතන හෝ සමාගම් විසින් විවෘත කරන ලද අනේවාසික රුපියල් ගිණුම්වල තොරතුරු (ගිණුම් හිමියාගේ නම සහ ලිපිනය, එම රටෙහි එකී ආයතනය/ සමාගම ලියාපදිංචි කළ අංකය, ගිණුම් අංකය) බලයලත් වෙළඳුන් විසින්, එම ගිණුම විවෘත කළ දින සිට සතියක් ඇතුළත යොමු කළ යුතුය.

11. මෙම විධානවල කාර්යය සඳහා

(අ) **"විගාමිකයා"** යන්නට 2021 අංක 3 දරන විදේශ විනිමය (විගාමිකයන් විසින් අරමුදල් ප්‍රේෂණය කිරීම) නියෝගවල දී ඇති අර්ථයම තිබිය යුතුය.

(ආ) **"ප්‍රේෂණ"** යන්නට විදුලි පණිවුඩ පැවරුම්, අනෙකුත් අන්තර් බැංකු පැවරුම්, බැංකු අණකර අනෙකුත් ගෙවීම් උපකරණ, අනෙකුත් ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ගෙවීම් යාන්ත්‍රණ හෝ මධ්‍යස්ථාන හරහා ලද ගෙවීම් සහ ව්‍යවහාර මුදල් නෝට්ටු හැර විනිමය මධ්‍යස්ථාන/ ආයතනවලින් විදේශයන්ගෙන් විදේශ ව්‍යවහාර මුදලින් ලද අරමුදල් යනාදිය ඇතුළත් විය යුතුය.

(ඇ) **"සමීපතම පවුල් සාමාජිකයන්"** යන්නට 2021 අංක 3 දරන විදේශ විනිමය (විගාමිකයන් විසින් අරමුදල් ප්‍රේෂණය කිරීම) නියෝගවල දී ඇති අර්ථයම තිබිය යුතුය.

12. මෙම විධානවල අවසර ලබා දුන් කිසිවක් වෙනත් ඕනෑම නීතියක විධිවිධාන සමඟ අනුකූල වීමේ අවශ්‍යතාවෙන්, මෙම විධාන යටතේ විදේශ විනිමයෙන් ගනුදෙනු කරන බලයලත් වෙළෙන්දෙක් හෝ ඕනෑම පුද්ගලයෙකු නිදහස් කිරීමක්, නිදොස් කිරීමක් හෝ වැළැක්වීමක් ලෙස අර්ථ විග්‍රහ නොකළ යුතුය.

13. මෙම විධානවල සියලු හර කිරීම් සහ බැර කිරීම් 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 22වන වගන්තිය යටතේ නිකුත් කරන ලද යම් නියමයකට යටත් විය යුතුය.

14. මෙම විධාන 2021 මාර්තු 22වන දින සිට ක්‍රියාත්මක විය යුතුය.

අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව
2021 මාර්තු 18

ඇමුණුම

අනේවාසික රුපියල් ගිණුම්වල මාසික ප්‍රකාශනය

බැංකුවේ නම: .....

වාර්තා කරන මාසය සහ වර්ෂය: .....

වගුව 1 : අනේවාසික රුපියල් ගිණුම්වල සාරාංශගත වාර්තාව

මාසය මුලදී ආරම්භක ශේෂය	බැර කිරීම්					හර කිරීම්					මාසය අවසානයේ ශේෂය	මාසය අවසානයේ ගිණුම් ගණන
	ආමුඛ ආයෝජන	විගාමිකයෙකු විසින්	ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද සමාගම්/ ව්‍යාපාර ආයතන විසින්	පොලිය	වෙනත්	විගාමිකයකු විසින් ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුමට මාරු කිරීම	ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද සමාගම්/ව්‍යාපාර ආයතන		දේශීය ගෙවීම්	වෙනත්		
							වර්තන ආදායමෙන් සිදුකරන ප්‍රතිමුණ ප්‍රේෂණ	එ.ජ.ඩො. 30,000ට යටත්ව සිදුකරන ප්‍රතිමුබ ප්‍රේෂණ				

වගුව 2 : අනේවාසික රුපියල් ගිණුම් හරහා ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත/පිහිටුවන ලද ව්‍යාපාර ආයතනයක් හෝ සමාගමක් විසින් සිදුකරන ලද ප්‍රාග්ධන මාරු කිරීම් පිළිබඳ වාර්තාව

ගිණුම් හිමියාගේ විස්තර			මුළු හර කිරීම්		
ව්‍යාපාර ආයතනයේ/ සමාගමේ නම	ව්‍යාපාර ලියාපදිංචි අංකය	ගිණුම් අංකය	ගනුදෙනුවේ දිනය	වර්තන ආදයමෙන් සිදුකරන ප්‍රතිමුබ ප්‍රේෂණ	එ.ජ. ඩො. 30,000 යටත්ව සිදුකරන ප්‍රතිමුබ ප්‍රේෂණ

බලයලත් වෙළෙන්දන් විසින් ඉහත පරිදි සකස් කරන ලද වාර්තාවේ පරිලෝකනය කළ පිටපතක් සහ Ms Excel පිටපතක් යන ද්විත්වය ම ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ.

බලයලත් නිලධාරියාගේ තනතුර සහ නම : .....
අත්සන සහ නිල මුද්‍රාව : .....
දිනය : .....

අනුකූලතා නිලධාරියාගේ නම : .....
අත්සන : .....
දිනය : .....

විදේශ විනිමය දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2021 අංක 19 දරන විධානයන්

විදේශීය වාණිජ ණය ගැනීමේ ගිණුම් පිළිබඳව බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්

2021 අංක 02 දරන විදේශ විනිමය (ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව තුළ දී සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු වර්ග) නියෝග (මෙම නියෝග) සහ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි 6 වන සහ 7 වන වගන්ති සමඟ කියවිය යුතු 9 වන වගන්තිය ප්‍රකාරව, පහත කොන්දේසිවලට යටත්ව, දේශීය බැංකු ඒකකය තුළ විදේශීය වාණිජ ණය ගැනීමේ ගිණුම් ආරම්භ කිරීම සහ පවත්වා ගෙන යාම සඳහා බලයලත් වෙළෙඳුන්හට අවසර ලබා දෙනු ලැබේ.

2. සුදුසුකම් ලත් තැනැත්තන්

(අ) 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කරන ලද සමාගම්.

3. විදේශීය වාණිජ ණය ගැනීමේ ගිණුම් විවෘත කිරීම සහ පවත්වා ගෙන යාම

(අ) විදේශීය වාණිජ ණය ගැනීමේ ගිණුම් ඕනෑම නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් ඉතුරුම් හෝ කාලීන තැන්පතු ආකාරයෙන් විවෘත කර පවත්වා ගෙන යා හැකි අතර, තනි පුද්ගල ගිණුම් ලෙස පවත්වා ගෙන යා යුතුය.

4. අවසරලත් බැර කිරීම්

(අ) විදේශීය ණය හිමියාගේ ශ්‍රී ලංකාවෙන් පිටත පවත්වා ගෙන යනු ලබන ගිණුමකින් හෝ ආමුඛ ආයෝජන ගිණුමකින් හෝ අක්වෙරළ බැංකු ඒකකය තුළ පවත්වා ගෙන යන ගිණුමකින්, එවැනි ණය හිමියෙකුගෙන් ගිණුම්හිමියෙකු ලබා ගත් ණය මුදල් ප්‍රේෂණය/ මාරු කිරීම්.

(ආ) ණය සේවාකරණ කාර්යය සඳහා, ගිණුම්හිමියාගේ ප්‍රතිමුඛ ආයෝජන ගිණුමකින් හෝ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකින්, අක්වෙරළ බැංකු ඒකකය තුළ පවත්වා ගෙන යන ගිණුමකින් හෝ ශ්‍රී ලංකා රුපියල් ගිණුමකින් සිදු කරනු ලබන මාරු කිරීම්.

(ඇ) ගිණුම්හිමියාගේ තවත් විදේශීය වාණිජ ණය ගැනීමේ ගිණුම්වලින් සිදු කරන මාරු කිරීම්.

(ඈ) ගිණුමෙහි ඇති අරමුදල් මත උපයාගත් පොලිය.

5. අවසරලත් හර කිරීම්

(අ) ණය ගිවිසුම ප්‍රකාරව, ණය සේවාකරණය සහ ණය ආපසු ගෙවීමේ කාර්යය සඳහා ණය හිමියාගේ අක්වෙරළ බැංකු ඒකකය තුළ පවත්වා ගෙන යන ගිණුමකට හෝ ආමුඛ ආයෝජන ගිණුමකට හෝ ශ්‍රී ලංකාවෙන් පිටත පවත්වා ගෙන යන ගිණුමකට අරමුදල් මාරු කිරීම්/ ප්‍රේෂණය කිරීම.

(ආ) ගිණුම්හිමියාගේ ශ්‍රී ලංකා රුපියල් ගිණුමකට ණය මුදල් මාරු කිරීම්.

(ඇ) 2021 අංක 01 දරන විදේශ විනිමය (ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු වර්ග) නියෝගවල හෝ අවලංගු කරන ලද විනිමය පාලන පනත හෝ විදේශ විනිමය පනතෙහි විධිවිධාන ප්‍රකාරව අවසරලත් පරිදි, ප්‍රතිමුඛ ආයෝජන මූල්‍යනය කිරීමේ කාර්යය සඳහා ණය මුදල ලබා ගෙන ඇත්නම් පමණක්, ගිණුම්හිමියාගේ ප්‍රතිමුඛ ආයෝජන ගිණුමකට ණය මුදල් මාරු කිරීම්.

(ඈ) ගිණුම්හිමියාගේ ජංගම ගනුදෙනුවලට අදාළ ප්‍රේෂණ

(ඉ) ගිණුම්හිමියාගේ විදේශීය වාණිජ ණය ගැනීමේ ගිණුම් වෙත මාරු කිරීම්.

(ඊ) ණය මුදලකට අදාළව ගෙවිය යුතු බැංකු ගාස්තු, ගාස්තු, කොමිස් යනාදිය.

(උ) ශ්‍රී ලංකා රුපියල්වලින් ශ්‍රී ලංකාව තුළ දී සිදු කරනු ලබන ගෙවීම්.

6. අනෙකුත් කොන්දේසි

(අ) බලයලත් වෙළෙඳුන් විසින් එක් එක් ණය මුදල් ලැබීමට අදාළව විදේශීය වාණිජ ණය ගැනීමේ ගිණුමක් විවෘත කළ යුතු අතර, එවැනි ණය මුදලක සියලු ආපසු ගෙවීම් (පොලිය ඇතුළුව) එම විදේශීය වාණිජ ණය ගැනීමේ ගිණුම හරහා ම සිදු කළ යුතුය. විදේශීය වාණිජ ණය ගැනීමේ ගිණුම විවෘත කරන අවස්ථාවේ දී බලයලත් වෙළෙන්දා විසින් මේ පිළිබඳව දිවුරුම් ප්‍රකාශයක් ලබා ගත යුතුය.

(ආ) ගිණුම් හිමියා විසින්, විදේශ විනිමය අවදානම අවම කිරීම සඳහා, බලයලත් වෙළෙන්දකුගෙන් ලබා ගැනීමට අපේක්ෂිත ශ්‍රී ලංකා රුපියල් ණය මුදලකට උකස ලෙස තැබීමේ කාර්යය සඳහා පමණක් විදේශීය වාණිජ ණය ගැනීමේ ගිණුම කාලීන තැන්පතු ආකාරයෙන් විවෘත කළ හැකිය. එවැනි ගිණුම්හිමියන් විසින් විදේශීය වාණිජ ණය ගැනීමේ ගිණුම් කාලීන තැන්පතුවේ පවතින අරමුදල් භාවිත කරමින් එකී විදේශීය ව්‍යවහාර ණය මුදල්වල ප්‍රාග්ධන මුදල් ආපසු ගෙවීම් සිදු කළ යුතු අතර, මෙම කාර්යය සඳහා රුපියල් විදේශීය විනිමයට පරිවර්තනය කිරීමට අවසර දෙනු නොලැබේ. විදේශීය වාණිජ ණය ගැනීමේ ගිණුම් කාලීන තැන්පතුව මත ලැබෙන පොලිය ද විදේශ ව්‍යවහාර ණය මුදලෙහි පොලිය ආපසු ගෙවීම සඳහා භාවිත කළ යුතු අතර, එකී විදේශ ව්‍යවහාර ණය මුදලෙහි පොලිය ආපසු ගෙවීමෙහි යම් හිඟයක් සඳහා පමණක් රුපියල් විදේශ විනිමය බවට පරිවර්තනයකට අවසර දිය හැකිය.

(ඇ) විදේශීය වාණිජ ණය ගැනීමේ ගිණුම් කාලීන තැන්පතු, පිළිවෙලින්, 4 වන ඡේදයේ (ඇ), (ඈ) අනු ඡේද සහ 5 වන ඡේදයේ (ආ) (ඉ), (උ) යන අනු ඡේද යටතේ වන අවසර ලත් බැර කිරීම් සහ හර කිරීම් සඳහා පමණක් සීමා කෙරේ. බලයලත් වෙළෙඳුන් විසින්, සුදුසු පරිදි විදේශීය වාණිජ ණය ගැනීමේ ගිණුම් කාලීන තැන්පතුවක් ආරම්භ කරන අවස්ථාවේ දී මෙම විධානවල 6 (ආ) ඡේදය යටතේ සඳහන් කළ කොන්දේසි සම්බන්ධයෙන් ගිණුම්හිමියාගේ කැමැත්ත ලබා ගත යුතුය.

(ඈ) විදේශීය වාණිජ ණය ගැනීමේ ගිණුම් හරහා සිදු කරන ලද ගනුදෙනුවල නීත්‍යානුකූලභාවය සහ සද්භාවය සනාථ කර ගැනීම සඳහා බලයලත් වෙළෙන්දන් විසින් පහත තොරතුරු/ ලේඛන ඇතුළුව සුදුසු නීත්‍යානුකූලව පිළිගත හැකි ලේඛනගත සාක්ෂි (අවශ්‍ය පරිදි) ලබා ගත යුතු අතර, මෙම විධානවලට සහ නියෝගවලට අනුකූල වීම සහතික කළ යුතුය.

I. ණය ආපසු ගෙවීමේ ක්‍රියා පටිපාටිය පිළිබඳ ලේඛනය ඇතුළුව ණය ගිවිසුමෙහි සහතික කරන ලද පිටපතක්.

II. ණය දෙන්නාගේ සහ ණය ගැනුම්කරුගේ විස්තර

III. සමාගම් ලේකම්වරුන් විසින් සහතික කරන ලද, යෝජිත ණය මුදල සම්බන්ධව අනුමැතිය සඳහා ණය ගැනුම්කරුවෙකු වන සමාගමෙහි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් සම්මත කරනු ලබන යෝජනා සම්මතයෙහි පිටපතක්.

(අ) බලයලත් වෙළෙඳුන් විසින් විදේශීය වාණිජ ණය ගැනීමේ ගිණුම හරහා සිදු කරන ලද ගනුදෙනුවලට සම්බන්ධ ලේඛනගත සාක්ෂි (දෘඪ පිටපත් හෝ ඉලෙක්ට්‍රොනික/ ඩිජිටල් ආකාරයෙන්) ව්‍යවස්ථාපිත වාර්තා තැබීමේ අවශ්‍යතාවය ඉක්මවා යමින්, පවත්වාගෙන යා යුතුය.

7. විදේශීය වාණිජ ණය ගැනීමේ ගිණුම් වැසීම

(අ) ණය ගැනුම්කරු විසින් අදාළ ණය මුදල සම්පූර්ණයෙන් පියවා ඇත්නම්, බලයලත් වෙළෙන්දා විසින් විදේශීය වාණිජ ණය ගැනීමේ ගිණුම වසා දැමිය යුතුය.

(ආ) කෙසේ වෙතත්, විදේශීය වාණිජ ණය ගැනීමේ ගිණුම්හිමියෙකු අදාළ ණය මුදල සම්පූර්ණයෙන් පියවා දැමීමට පෙර විදේශීය වාණිජ ණය ගැනීමේ ගිණුම වසා දමන මෙන් ඉල්ලා සිටින අවස්ථාවක දී, වෙනත් බලයලත් වෙළෙන්දෙකු සමඟ ආරම්භ කිරීමට නියමිත විදේශීය වාණිජ ණය ගැනීමේ ගිණුමක් ඔස්සේ එකී ණය මුදලෙහි අනාගත ගෙවීම් අඛණ්ඩ සිදු කර ගෙන යාමේ අරමුණ සඳහා, මුල් විදේශීය වාණිජ ණය ගැනීමේ ගිණුම පවත්වාගෙන ගිය බලයලත් වෙළෙන්දා විසින් නව විදේශීය වාණිජ ණය ගැනීමේ ගිණුම ආරම්භ කිරීමට අපේක්ෂා කරන බලයලත් වෙළෙන්දා සෑහීමකට පත්වන ලෙස පහත තොරතුරු/ ලේඛන ඉදිරිපත් කිරීමෙන් අනතුරුව පමණක් එම විදේශීය වාණිජ ණය ගැනීමේ ගිණුම වසා දැමිය යුතුය.

I. ණය මුදල ලැබීමේ විස්තර පිළිබඳ තහවුරු කිරීමක් (දිනය, ව්‍යවහාර මුදල් වර්ගය සමඟ ණය මුදල් ප්‍රමාණය, ණය හිමියා, ණය ගැනුම්කරු යනාදිය), සියලු ආපසු ගෙවීම් (දිනය, මුදල, ප්‍රතිලාභියාගේ ගිණුම් විස්තර) සහ නොගෙවූ ශේෂය.

II. විදේශීය වාණිජ ණය ගැනීමේ ගිණුම ඔස්සේ සිදු කරන ලද ගනුදෙනුවලට සාක්ෂි ලෙස, විදේශීය වාණිජ ණය ගැනීමේ ගිණුම්හිමියාගෙන් රැස් කර ගත් ලේඛනගත සාක්ෂි.

(ඇ) බලයලත් වෙළෙඳුන් විසින් එවැනි ගිණුම් වසා දැමීමක් සිදු කළ දිනයේ සිට වැඩ කරන දින තුනක් ඇතුළත, එම වසා දැමීම පිළිබඳව dfem@cbsl.lk විද්‍යුත් තැපෑල ඔස්සේ විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක වෙත දැනුම් දිය යුතුය.

8. මෙම විධානවල විෂයපථයෙන් පරිබාහිර වෙනත් ඕනෑම කාර්යයක් සඳහා විදේශීය වාණිජ ණය ගැනීමේ ගිණුමකින්/ ගිණුමකට සිදු කරන ඕනෑම ගනුදෙනුවක්/ මාරු කිරීමක් සඳහා, බලයලත් වෙළඳුන් විසින්, විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකගේ පූර්ව අවසරය ලබාගත යුතුය.

9. වාර්තා කිරීමේ අවශ්‍යතා

බලයලත් වෙළෙඳුන් විසින්, මෙම විධානවල ඇමුණුමට අනුව සකස් කරන ලද වාර්තාවක් මාසික පදනම මත විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක වෙත dfem@cbsl.lk යන විද්‍යුත් තැපැල් ලිපිනය හරහා එළඹෙන මාසයේ 15 වැනි දිනට පෙර යොමු කළ යුතුය.

10. මෙම විධානවල කාර්යය සඳහා

(අ) "ප්‍රේෂණ" යන්නට විදුලි පණිවුඩ පැවරුම්, අනෙකුත් අන්තර් බැංකු පැවරුම්, බැංකු අණකර, අනෙකුත් ගෙවීම් උපකරණ, අනෙකුත් ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ගෙවීම් යාන්ත්‍රණ හෝ ක්‍රම හරහා ලද ගෙවීම් සහ ව්‍යවහාර මුදල් නෝට්ටු හැර විනිමය මධ්‍යස්ථාන/ ආයතනවලින් විදේශ ව්‍යවහාර මුදලින් ලත් අරමුදල් යනාදිය ඇතුළත් විය යුතුය.

11. මෙම විධානවල අවසර ලබා දුන් කිසිවක් වෙනත් ඕනෑම නීතියක විධිවිධාන සමඟ අනුකූල වීමේ අවශ්‍යතාවෙන් මෙම විධාන යටතේ විදේශ විනිමයෙන් ගනුදෙනු කරන බලයලත් වෙළෙන්දන් හෝ ඕනෑම පුද්ගලයෙකු නිදහස් කිරීමක්, නිදොස් කිරීමක් හෝ වැළැක්වීමක් ලෙස අර්ථ විග්‍රහ නොකළ යුතුය.

12. බලපත්‍රලාභී මූල්‍ය සමාගම් සඳහා තාවකාලික විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් ක්‍රියාත්මක කිරීමට අදාළ වන අවශ්‍යතා දක්වමින් බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරන ලද 2021 ජනවාරි 15 දිනැති 2021 අංක 01 දරන විධානයන් මෙමගින් අහෝසි කෙරේ.

13. මෙම විධාන 2021 මාර්තු 22 වන දින සිට ක්‍රියාත්මක විය යුතුය.

අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව
2021 මාර්තු 18

විදේශීය වාණිජ ණය ගැනීමේ ගිණුමේ/ගිණුම්වල මාසික ප්‍රකාශනය

ඇමුණුම

බැංකුවේ නම: .....

වාර්තා කරන මාසය සහ වර්ෂය: .....

වගුව 1 : මාසය තුළ ප්‍රදානය කරන ලද නව ණය මුදල්වල තොරතුරු

විදේශීය වාණි ණය ගැනීමේ ගිණුම් හිමියාගේ තොරතුරු				ණය දෙන්නාගේ තොරතුරු			ණය මුදලෙහි තොරතුරු										
නම	ලිපිනය	ව්‍යාපාර ලියාපදිංචි අංකය	ගිණුම් අංකය	නම	රට	ණය ලබාදෙන පාර්ශවය*	අරමුණ	මුදල් ලැබුණු දිනය	ව්‍යවහාර මුදල් වර්ගය	ප්‍රමාණය	ආපසු ගෙවීමේ කාලය	සහන කාලය ඇත්නම්	පොලී අනුපාතය	අනෙකුත් ගාස්තු**	ඇපකර	ආපසු ගෙවීමේ කොන්දේසි***

විදේශීය වාණිජ ණය ගැනීමේ ගිණුම් හිමියන්ගේ තොරතුරු සඳහා අවශ්‍ය පරිදි පේළි වැඩි කරගත හැකිය.

* මව් සමාගම්, කොමිස් හිමියන්, අනුබද්ධ සමාගම, සම්බන්ධ සමාගම්, තනි පුද්ගලයන්, බැංකු, මූල්‍ය සමාගම් ආදිය විය හැකිය.

** වගකීම් ගාස්තුව, නීති ගාස්තුව, ලියවිලි සඳහා ගාස්තු ආදිය විය හැකිය.

*** මාසිකව, කාර්තු වශයෙන්, අර්ධ වාර්ෂිකව, වාර්ෂිකව, එකවර ගෙවීම, වෙනත් (සඳහන් කරන්න)

වගුව 2 : ලැබිය යුතු සමහ ආපසු ගෙවිය යුතු ණය මුදල් පිළිබඳ තොරතුරු

විදේශීය වාණිජ ණය ගැනීමේ ගිණුම් හිමියාගේ තොරතුරු		ව්‍යවහාර මුදල් වර්ගය	බැර කිරීම්							හර කිරීම්									මාසය අවසානයේ ශේෂය
			ණය දෙන්නාගෙන් ණය මුදල් ලැබීම්			ණය මුදල් ආපසු ගෙවීම සහ බැර කිරීම්		පොලී අනුපාතය	ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද විශේෂ අවසරය	ණය මුදල් ආපසු ගෙවීම්			තම ගිණුම්වලට මාරු කිරීම්		අනුබද්ධ ගෙවීම්	දේශීය ගෙවීම්	ජංගම ගනුදෙනු ප්‍රතිමුබ ප්‍රේෂණ	ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද විශේෂ අවසරය	
නම	ගිණුම් අංකය		ආමුද ආයෝජන ගිණුම	අක් වෙරළ බැංකු ගිණුම	ශ්‍රී ලංකාවෙන් පිටත ඇති ගිණුම	මාරු කිරීම් (OIA, BFCA, OBU)	ශ්‍රී ලංකා රුපියල් පරිවර්තනය			ආමුද ආයෝජන ගිණුම	අක් වෙරළ බැංකු ගිණුම	ශ්‍රී ලංකාවෙන් පිටත ගිණුම	ශ්‍රී ලංකා රුපියල්	ප්‍රතිමුද ආයෝජන ගිණුම					

විදේශීය වාණිජ ණය ගැනීමේ ගිණුම් හිමියන්ගේ තොරතුරු සඳහා අවශ්‍ය පරිදි පේළි වැඩිකරගත හැකිය.

බලයලත් වෙළෙන්දන් විසින් ඉහත පරිදි සකස් කරන ලද වාර්තාවේ පරිලෝකනය කළ පිටපතක් සහ Ms Excel පිටපතක් යන ද්විත්වය ම ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ.

බලයලත් නිලධාරියාගේ තනතුර සහ නම : .....

අත්සන සහ නිල මුද්‍රාව : .....

දිනය : .....

අනුකූලතා නිලධාරියාගේ නම : .....

අත්සන : .....

දිනය : .....

විදේශ විනිමය දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2021 අංක 20 දරන විධානයන්

ජංගම හා ප්‍රාග්ධන ගනුදෙනුවලට අදාළ ඇපකර නිකුත් කිරීම හා අලුත් කිරීම සම්බන්ධයෙන් බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්

2021 අංක 04 දරන විදේශ විනිමය (විවිධ ප්‍රාග්ධන ගනුදෙනු වර්ග) නියෝග සහ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 9 වන වගන්තිය ප්‍රාකාරව, පහත දක්වා ඇති ජංගම ගනුදෙනු හා ප්‍රාග්ධන ගනුදෙනු සම්බන්ධයෙන් දේශීය බැංකු ඒකකවලින් ඇපකර (එනම්, බැංකු ඇපකර, බැඳුම්කර, ණයවර ලිපි) නිකුත් කිරීම සහ අලුත් කිරීමට (අදාළ පරිදි) සහ එම බැංකු ඇපකර, බැඳුම්කර, ණයවර ලිපි සහ සංස්ථාපිත ඇපකර සම්බන්ධයෙන් වන හිමිකම් ගෙවීම් පහත සඳහන් කරුණු වලට යටත්ව සිදුකිරීමට බලයලත් වෙළෙඳුන් හට අවසර දෙනු ලැබේ.

1. **ජංගම ගනුදෙනු සම්බන්ධයෙන් නිකුත් කිරීමට අවසර දී ඇති ඇපකර**

   (අ) ජංගම ගනුදෙනු සම්බන්ධයෙන් වන විධාන යටතේ අවසර දී ඇති ජංගම ගනුදෙනු සඳහා ඇපකර නිකුත් කිරීමට හා අලුත් කිරීමට බලයලත් වෙළඳුන්හට අවසර දෙනු ලැබේ.

2. **ප්‍රාග්ධන ගනුදෙනු සම්බන්ධයෙන් නිකුත් කිරීමට අවසර දී ඇති ඇපකර**

   (අ) ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සමාගමක් (එනම්, ආයෝජකයා) විසින් එකී ආයෝජකයා කොටස් හිමියකු වන්නා වූ ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපිත සමාගමකට (එනම්, ආයෝජිතයා), එම ආයෝජිතයා සංස්ථාගත කරනු ලැබූ රටෙහි මූල්‍ය ආයතනයකින් පහසුකම් ලබා ගැනීමට හැකියාව ලබා දීම සඳහා ඇපකරයක් ලබා දීමට අවශ්‍ය වන විටදී, ඉවත් කළ විනිමය පාලන පනතේ හෝ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ විධි විධාන වලට අනුකූලව එකී ආයෝජනය සිදු කර තිබේ නම්, එ.ජ.ඩො. 1,000,000ක උපරිම සීමාවකට යටත්ව ඇපකරයක් නිකුත් කළ හැකිය. එම ඇපකරයේ වටිනාකම දී ඇති අවස්ථාවක දී ආයෝජකයාගේ කොටස් හිමිකාරීත්වයේ ප්‍රතිශතයට සමානුපාතික විය යුතුය.

   (ආ) ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සමාගමක් (එනම්, ආයෝජකයා) විසින්, එකී ආයෝජකයා විසින් ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටුවන ලද ශාඛාවකට හෝ ව්‍යාපෘති කාර්යාලයකට, එම ශාඛාව හෝ ව්‍යාපෘති කාර්යාලය පිහිටුවා ඇති රටෙහි මූල්‍ය ආයතනයකින් පහසුකම් ලබා ගැනීමට හැකියාව ලබා දීම සඳහා ඇපකරයක් ලබා දීමට අවශ්‍ය වන විටදී, ඉවත් කළ විනිමය පාලන පනතේ හෝ විදේශ විනිමය පනතේ විධිවිධානවලට අනුකූලව එකී ශාඛාවේ හෝ ව්‍යාපෘති කාර්යාලයේ ආයෝජනය සිදුකර තිබේ. එම ආයෝජකයා විසින් ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටුවන ලද එක් ශාඛාවක් හෝ ව්‍යාපෘති කාර්යාලයක් සඳහා එ.ජ.ඩො. 500,000ක් දක්වා වන ඇපකරයක් ලබා දිය හැකිය.

   (ඇ) මෙම විධානයන්වල 2(අ) සහ 2(ආ) අනුඡේද යටතේ නිශ්චිතව දක්වා ඇති ඇපකර ආයෝජිතයා වෙනුවෙන් ලබාදීමට ආයෝජකයාට හැකියාවක් නොමැති විට, ආයෝජිතයාගේ මව් සමාගම හෝ පූර්ණ අනුබද්ධ සමාගමක් (එනම්, ඇපකරු) ආයෝජකයාගේ කැමැත්ත සහිතව බලයලත් වෙළෙන්දෙකු හරහා එවැනි ඇපකරයක් නිකුත් කරන ලෙස ඉල්ලා සිටිය හැකිය. මෙම විධානවල 2(අ) සහ 2(ආ) යන අනුඡේදයන් වල අවසර දී ඇති සීමාවන්ට යටත්ව බලයලත් වෙළෙඳුන්ට එවැනි ඇපකර නිකුත් කළ හැකිය. ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම හරහා විදේශයන් වල ආයෝජන කර ඇති අවස්ථාවකදී මෙම අවසරය අදාළ නොවේ.

   (ඈ) ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සමාගමක් දෙපාර්ශ්වය අතර ඇති කරගත් ගිවිසුමකට (නියෝජිත ගිවිසුම) යටත්ව සමාගමක් ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපිත සමාගමක නියෝජිතයා, (එනම්, ප්‍රධානියා) ලෙස කටයුතු කරනු ලබන අවස්ථාවක දී එකී නියෝජිත ගිවිසුමේ නියම කර ඇති පරිදි එම නියෝජිතයා වෙනුවෙන් ප්‍රධානියාගේ නමට ඇපකරයක් ලබා දිය යුතුය.

   (ඉ) ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික පුද්ගලයෙකු (එනම්, ආයෝජකයා) එකී ආයෝජකයාගේ ආමුඛ ආයෝජන ගිණුමේ බැර ශේෂයට එදිරිව කොළඹ කොටස් වෙළඳපොලේ ලැයිස්තුගත සමාගම්වල කොටස් මිලදී ගැනීම සම්බන්ධයෙන් ඇපකරයක් නිකුත්කළ හැකිය.

3. **අනෙකුත් ඇපකර**

   (අ) බලයලත් වෙළෙන්දෙකු සමඟ ව්‍යාපාර විදේශ ව්‍යවහාර මුදල් ගිණුම පවත්වාගෙන යන තැනැත්තකුට 2021 අංක 9 දරන විධාන යටතේ බලයලත් වෙළෙන්දෙකුගෙන් පහසුකම් ලබාගැනීම සඳහා එම වෙනත් බලයලත් වෙළෙන්දා නමට නිකුත්කරන ඇපකර.

   (ආ) දේපල සංවර්ධකයෙකු (එනම්, දේපල විකුණුම්කරු) වෙනුවෙන් ආමුඛ අයෝජන ගිණුම් හිමියෙකු නමට (එනම්, දේපල ගැණුම්කරු), විකුණුම්කරුගෙන් නිවාස සංකීර්ණයක් මිලදී ගැනීමේ අරමුණ සඳහා එම ආමුඛ ආයෝජන ගිණුම හරහා කරන ලද ගෙවීම් වලින් 50%ක් දක්වා නිකුත් කරන ඇපකර.

4. **අනෙකුත් කොන්දේසි හා නියමයන්**

   (අ) මේ දක්වා තුන්වන පාර්ශවයකට සපයන ලද ඇපකර සම්බන්ධයෙන් ඇපකර නිකුත් කරන සමාගමෙහි අවිනිශ්චිත වගකීම් සහ නිකුත් කිරීමට නියමිත ඇපකරවලින් පැනනගින යම් අවිනිශ්චිත වගකීමක් පියවීම සඳහා එම සමාගමට ඇති මූල්‍ය ශක්තිය සහ එකී සමාගම විසින් එකී ඇපකරය මඟින් සුරක්ෂිත කරනු ලබන එහි බැඳීම් ඉටුකිරීම සඳහා ඇපකරයේ ප්‍රතිලාභියාට ඇති හැකියාව පිළිබඳව බලයලත් වෙළෙන්දන් ඇගයීම සහ සහතික වීම කළ යුතුය.

(ආ) මෙම විධානයන්වල 2වන ඡේදයේ (අ), (ආ) සහ (ඇ) අනුඡේද යටතේ ඇපකර නිකුත් කිරීමේදී පහත සඳහන් කොන්දේසි ද අදාළ වේ.

(i) ඇපකරය නිකුත් කිරීමට පෙර ආයෝජකයා / ඇපකරු විසින් හිමිකම්පෑමේ වටිනාකම් නැවත අයකර ගැනීමට (ගෙවීම පැහැර හැරීමකදී) ආයෝජිතයා සමඟ සුදුසු නෛතික ගිවිසුමක් ඇති කර ගත යුතුය.

(ii) ඉහත අනුඡේද (i) හි දැක්වෙන නැවත අයකර ගැනීම්, හිමිකම්පෑම් සඳහා ගෙවීම් කරන ලද ආයෝජකයාගේ ප්‍රතිමුඛ ආයෝජන ගිණුම හෝ ව්‍යාපාර විදේශ ව්‍යවහාර මුදල් ගිණුම හෝ ආයෝජකයාගේ/ ඇපකරුගේ රුපියල් ගිණුමකට ගෙන ආ යුතුය.

(iii) ආයෝජකයා විසින් ආයෝජනය සිදු කර ඇත්තේ ආයෝජකයාගේ ව්‍යාපාර විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් හරහා නම්, යෝජිත ඇපකරය නිකුත් කළ යුත්තේ අදාළ ඇපකරය මගින් පැන නගින ඕනෑම ප්‍රතිමුඛ ප්‍රේෂණයක් ව්‍යාපාර විදේශ ව්‍යවහාර මුදල් ගිණුමෙහි ඇති අරමුදල් මගින් හිමිකම්පෑමේ කොන්දේසියට යටත්වය.

(iv) බලයලත් වෙළෙඳුන් විසින් පහත දෑ සම්බන්ධයෙන් ලේඛනගත සාක්ෂි ලබාගත යුතුය.

(අ) ඉහත අනුඡේද ආ (i) සමඟ අනුකූල වීම සම්බන්ධව

(ආ) මෙම විධානවල අනුඡේද 4(ආ)(ii) සහ 4(ආ)(iii) සමඟ අනුකූල වීමට ප්‍රතිඥ දෙන බවට (එනම්, ආයෝජකයා සහ ඇපකරු) සමාගමේ ලේකම්වරුන් විසින් සහතික කරන ලද සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරන ලද යෝජනාවක් හෝ දිවුරුම් ප්‍රකාශයක් හෝ අනෙකුත් ඕනෑම නෛතිකව පිළිගත හැකි ලියවිල්ලක්

(ඇ) මෙම විධානවල අනුඡේද 2 හා 3 යටතේ අවසර දී ඇති ඇපකර ලබාදීමේදී, සමාගමේ ලේකම්වරුන් විසින් සහතික කරන ලද සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරන ලද යෝජනාවක් බලයලත් වෙළෙඳුන් විසින් පහත කරුණු සම්බන්ධයෙන් ලබා ගත යුතුය.

(i) යෝජිත ඇපකරය සඳහා අනුමැතිය සහ එම අරමුණ සඳහාම ඇපකරයක් වෙනත් බලයලත් වෙළෙන්දෙකු වෙතින් ලබාගෙන නොමැති බවට

(ii) නිකුත් කිරීමට නියමිත ඇපකරයෙන් පැන නගින ඕනෑම අවිනිශ්චිත වගකීමක් සපුරාලීමට සමාගමට මූල්‍ය ශක්තියක් ඇති බව සහතික කරමින්

(ඈ) සිදු කිරීමට නියමිත ගනුදෙනුවේ නීත්‍යානුකූලභාවය සහ සද්භාවය තහවුරු කර ගැනීමට සහ එම ගනුදෙනුව නියෝග සහ මෙම විධානවලට අනුකූල වන බව සහතික කර ගැනීමට නෛතිකව පිළිගත හැකි සුදුසු ලේඛනගත සාක්ෂි (අවශ්‍ය පරිදි) බලයලත් වෙළෙඳුන් විසින් ලබා ගත යුතුය.

(ඉ) ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තෙකු (එනම්, ප්‍රධාන බන්ධනදරියා) විසින් ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තෙකු සමඟ ජංගම ගනුදෙනුවක නිරත වීමට බලාපොරොත්තු වන අවස්ථාවක, බලයලත් වෙළෙන්දෙකු ලෙස පිළිගත හැකි තත්ත්වයෙන් යුතු ශ්‍රී ලංකාවෙන් බැහැර පිළිගත් ජාත්‍යන්තර බැංකුවක් විසින් නිකුත් කළ ප්‍රතිඇපකරයක් ලබා ගැනීමට යටත්ව, ප්‍රධාන බන්ධනදාරියා හෝ එම තැනැත්තාගේ ශ්‍රී ලංකා නියෝජිතයාගේ ඉල්ලීම මත ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තකුගේ නමට ශ්‍රී ලංකාවෙන් බැහැර නේවාසිකයෙකු වන්නා වූ ප්‍රධාන බන්ධනදාරියකු වෙනුවෙන් වන ඇපකරයක් නිකුත් කළ යුතුය.

(ඊ) (i) අත්තිකාරම් ගෙවීම් ඇපකරයක් නිකුත් කරන අවස්ථාවකදී,

(අ) මෙම විධානයන්හි 3(ආ) වන ඡේදය යටතේ, ඇපකරයක වටිනාකම ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තෙකුහට ශ්‍රී ලංකාවෙන් බැහැර නේවාසික තැනැත්තෙකුගෙන් ලැබෙන අත්තිකාරම් ගෙවීමේ වටිනාකමට අඩු හෝ සමාන විය යුතුය.

(ආ) ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තාගේ ශ්‍රී ලංකාව තුළ පවත්නා ගිණුම්වලට ශ්‍රී ලංකාවෙන් බැහැර නේවාසික තැනැත්තෙකුගෙන් අත්තිකාරම් ගෙවීමක් හිමි වීමෙන් පසුව පමණක් ඇපකරය වලංගුභාවයට පත්වන බවට යන කොන්දේසියක් ඇපකරයට ඇතුළත් කළ යුතුය.

(ii) කාර්යසාධන බැඳුම්කර, කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට අදාළ සාක්ෂි සහ එහි සඳහන් කොන්දේසි වලට යටත්ව කළ යුතුය.

(iii) ලංසු බැඳුම්කර, ටෙන්ඩරයෙහි හෝ මිල කැඳවුමෙහි සඳහන් කොන්දේසිවලට යටත්ව කළ යුතුය.

5. වලංගු හිමිකම්වලින් පැන නැගෙන ප්‍රතිමුඛ ප්‍රේෂණ

(අ) පාදක වූ ගනුදෙනුවෙහි සද්භාවය පිළිබඳව සෑහීමකට පත් වීමෙන් අනතුරුව, මෙම විධානයන්හි අවසර දී ඇති ඇපකර, නියෝග 2021 අංක 1 දරන විදේශ විනිමය (ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තෙකු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත සිදු කරනු ලබන ගනුදෙනු වර්ග) නියෝගයේ (I) වන උපලේඛනයේ (II)වන ඡේදය මගින් අවසර දී ඇති සංස්ථාපිත ඇපකර සහ නියෝග 2021 අංක 4 දරන විදේශ විනිමය (විවිධ ප්‍රාග්ධන ගනුදෙනු වර්ග) නියෝගයේ (I)වන උපලේඛනය මගින් අවසර දී ඇති ස්වෛරී ඇපකරවලට අදාළව වලංගු හිමිකම් නිසා පැන නැගෙන ප්‍රතිමුඛ ප්‍රේෂණ/ගෙවීම්, පහත සඳහන් කොන්දේසිවලට යටත්ව ගෙවීමට බලයලත් වෙළෙඳුන් හට අවසර ලබා දෙනු ලැබේ.

(i) ඇපකරයක උපරිම වලංගු හිමිකම් වටිනාකම පාදක වූ ප්‍රාග්ධන ගනුදෙනුවෙහි ඉතිරිව පවත්නා බැඳීමෙහි සමානුපාතිකය දක්වා සීමා විය යුතුය.

(ii) මෙම විධානවල (අ) උප ඡේදයට ප්‍රකාරව නිකුත් කරන ලද ඇපකරවලට අදාළ උපරිම වලංගු හිමිකම් වටිනාකම හිමිකම් පෑ අවස්ථාවේ දී ආයෝජිතයාගේ ඉතිරිව පවත්නා බැඳීම තුළ ඇති ආයෝජකයාගේ කොටස් හිමිකාරීත්වයේ ප්‍රතිශතයට අඩු හෝ සමානුපාතිකය දක්වා සීමා විය යුතුය.

(iii) මෙම විධානවල 2 (අ) සහ 2 (ආ) උප ඡේදවලට ප්‍රකාරව ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් හරහා කර ඇති ආයෝජනයක් සඳහා නිකුත් කරන ලද ඇපකරයන්ගෙන් පැන නැගෙන ඕනෑම වලංගු හිමිකමක්, එම ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමේ තිබෙන අරමුදල්වලින් කළ යුතුය.

(iv) ඉහත සඳහන් විධානයන්හි 3 (අ) සහ 3 (ආ) උපඡේදවලට ප්‍රකාරව නිකුත් කරන ලද ඇපකරයන්ගෙන් පැන නැගෙන ඕනෑම වලංගු හිමිකමක්, එම අවස්ථානුකූල ගැනුම්කරුගේ හෝ දේපල සංවර්ධකයාගේ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමේ තිබෙන අරමුදල්වලින් පමණක් කළ යුතුය.

6. බලයලත් වෙළෙඳුන් විසින් මෙම විධානයන්හි විෂය පථයෙන් පරිබාහිර ඕනෑම කාර්යයක් සඳහා නිකුත් කරනු ලබන ඕනෑම ඇපකරයක් වෙනුවෙන් විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය.

7. වාර්තා කිරීම

ඇමුණුම I ට අනුව මෙම විධානයන් මගින් අවසර දී ඇති පරිදි බලයලත් වෙළෙඳුන් විසින් නිකුත් කරන ලද සහ අලුත් කරන ලද ඇපකරවල කාර්තුමය වාර්තාවක් එළඹෙන මාසයේ 15වන දිනට හෝ ඊට පෙර, විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක වෙත යොමු කළ යුතුය. එම අත්සන් කළ වාර්තාවේ පරිලෝකන පිටපතක් සහ MS Excel පිටපතක් dfem@cbsl.lk හරහා යොමු කළ යුතුය.

8. මෙම විධානවල කාර්යය සඳහා

(අ) "**ජංගම ගනුදෙනු**" යන්නට , 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතුය.

(ආ) "**ප්‍රාග්ධන ගනුදෙනු**" යන්නට, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතුය.

9. මෙම විධානවල අවසර ලබා දුන් කිසිවක් වෙනත් ඕනෑම නීතියක විධිවිධාන සමඟ අනුකූලවීමේ අවශ්‍යතාවෙන්, මෙම විධාන යටතේ විදේශ විනිමයෙන් ගනුදෙනු කරන බලයලත් වෙළෙන්දෙක් හෝ ඕනෑම පුද්ගලයකු නිදහස් කිරීමක්, නිදොස් කිරීමක් හෝ වැළැක්වීමක් ලෙස අර්ථ විග්‍රහ නොකළ යුතුය.

10. බැංකු ඇපකර, බැඳුම්කර, පොරොත්තු ණයවර ලිපි සහ සංස්ථාපිත ඇපකර නිකුත් කිරීමට සහ අළුත් කිරීමට අදාළ අවශ්‍යතා දක්වමින් බලයලත් වෙළෙඳුන් වෙත පෙර නිකුත් කරන ලද 2017 නොවැම්බර් 20 වන දිනැති 2017 අංක 15 දරන විධානයන් මෙයින් අවලංගු කරනු ලැබේ.

11. ඉහත 10 වගන්තිය ප්‍රකාරව පෙර පැවති විධානයන් අහෝසි කිරීම මගින් එය අහෝසි කිරීමට පෙරාතුව එකී විධානයන් යටතේ අයවීමට තිබූ හිමිකමක් හෝ ගෙවීමට තිබූ දඩ මුදලක් හෝ වගකීමක් සඳහා කිසිඳු බලපෑමක් සිදු නොවිය යුතුය.

12. මෙම විධානයන් 2021 මාර්තු මස 22 වන දින සිට ක්‍රියාත්මක විය යුතුය.

අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව
2021 මාර්තු 18

ඇමුණුම I

ඇපකර පිළබඳ කාර්තු ප්‍රකාශය

බලයලත් වෙළෙන්දාගේ නම :.....

වර්ෂය / කාර්තුව :.....

වගුව 1 : නිකුත් කළ ඇපකර

සාමාගමේ නම	ඇපකර වර්ගය (සංස්ථාපිත / කලින් කළ ගෙවීම්/ ණයවර ලිපි ආදිය	නිකුත් කළ දිනය	කල් ඉකුත්වන දිනය	වටිනාකම (එ.ජ.ඩොලර්)

වගුව 2 : කාර්තුව අග ඇපකර මුළු ශේෂය (එ.ජ. ඩොලර්)

ආරම්භක ශේෂය	කාර්තුව තුළ නිකුත් කළ ඇපකරවල වටිනාකම	කාර්තුව තුළ නිදහස් කළ ඇපකර වටිනාකම		අවසාන ශේෂය
		විග්‍රාමික ඇපකර වටිනාකම	හිමිකම් පාන ලද ඇපකර වටිනාකම	

වගුව 3 : වලංගු හිමිකම්පෑම යටතේ සිදුකරන ලද බාහිර ප්‍රේෂණ ඇත්නම් ඒ පිළිබඳ විස්තර

සමාගමේ නම	ප්‍රේෂණ පිළිබඳ විස්තර		ඇපකරයේ මූලික වටිනාකම (එ.ජ. ඩොලර්)	ඇපකර වර්ගය (සංස්ථාපිත / කලින් කළ ගෙවීම් / ණයවර ලිපි ආදිය)
	දිනය	වටිනාකම (එ.ජ. ඩොලර්)		

බලයලත් වෙළෙඳුන් විසින් ඉහත ආකෘතියට අනුව පරිලෝකන පිටපතක් සහ MS Excel පිටපතක් එවිය යුතුය.

බැංකුවේ ගිණුම් පොත්වලින් උපුටා ගන්නා ලද/ජනනය වූ ඉහත තොරතුරු නිවැරදි බව සහතික කරමු.

බලයලත් නිලධාරීයාගේ නම සහ අත්සන :	අනුකූලතා නිලධාරීයාගේ නම : .....
අත්සන සහ නිල මුද්‍රාව :	අත්සන : .....
දිනය :	දිනය : .....

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2220/69- 2021 මාර්තු මස 26 වැනි සිකුරාදා - 2021.03.26

I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

රජයේ නිවේදන

2017 අංක 12 දරන විදේශ විනිමය පනත

4 වන වගන්තිය යටතේ වූ නියමය

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ (පනත) 4 වන වගන්තියේ (2) වන උප වගන්තියේ (ඇ) ඡේදය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මා විසින් මෙම නියමය මගින් මෙහි දක්වා ඇති අරමුණු, නියමයන් හා කොන්දේසිවලට යටත්ව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි ඕනෑම හෝටලයකට (හෝටල්), ශ්‍රී ලංකාව තුළ විදේශ විනිමය ගනුදෙනු සිදු කළ හැකි බව නියම කරමි.

පනතේ 8 වන වගන්තිය යටතේ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරන ලද නියමයන් සහ කොන්දේසිවලට යටත්ව විදේශ ව්‍යවහාර මුදල් තම සන්තකයේ තබා ගෙන ඇති ශ්‍රී ලංකාව තුළ නේවාසික පුද්ගලයින්ගෙන්, හෝටල් මගින් ඔවුන්ට ලබා දෙන සේවාවන් සඳහා විදේශ ව්‍යවහාර මුදල්වලින් ගෙවීම් ලබා ගැනීමට එම හෝටල් සඳහා අවසර දෙනු ලැබේ.

එසේ අත්පත් කරගත් විදේශ ව්‍යවහාර මුදල්;

(අ) බලයලත් වෙළෙන්දෙකු හෝ පරිසීමිත වෙළෙන්දෙකු සමග අදාළ හෝටලය නමින් විවෘත කර පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක (BFCA) තැන්පත් කිරීම, හෝ

(ආ) ගනුදෙනු සඳහා අදාළ සාක්ෂි ඉදිරිපත් කිරීමෙන් පසු බලයලත් වෙළෙන්දෙකුට විකිණීම

සිදු කිරීමකින් තොරව අත්පත් කර ගත් දිනයේ සිට දින හතක (07) කාලසීමාවක් ඉක්මවා මෙම හෝටල් සන්තකයේ තබා නොගත යුතු ය.

මහින්ද රාජපක්ෂ,
මුදල් අමාත්‍ය.

2021 මාර්තු මස 26 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2222/37- 2021 අප්‍රේල් මස 07 වැනි බදාදා - 2021.04.07

I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

රජයේ නිවේදන

2017 අංක 12 දරන විදේශ විනිමය පනත

2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි 7 වන වගන්තිය සමග කියවිය යුතු 29 වන වගන්තිය යටතේ සාදනු ලබන නියෝග.

1. 2020 නොවැම්බර් මස 17 වන දින අංක 2202/7 දරන රජයේ (අති විශේෂ) ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නියෝග මගින් සංශෝධනය කරන ලද 2020 අප්‍රේල් මස 8 වන දින අංක 2170/4 දරන රජයේ (අති විශේෂ) ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නියෝග, පහත දැක්වෙන පරිදි තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

   (අ) 1 වන ඡේදයෙහි දැක්වෙන ''මාස දොළහක'' යන වචන මෙමගින් ඉවත් කරනු ලබන අතර එම වචන වෙනුවට ''මාස විසිහතරක'' යන වචන ආදේශ කරනු ලැබේ.

2. 2020 නොවැම්බර් මස 17 වන දින අංක 2202/7 දරන රජයේ (අති විශේෂ) ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නියෝග මගින් සංශෝධනය කරන ලද 2020 ජූලි මස 1 වන දින අංක 2182/32 දරන රජයේ (අති විශේෂ) ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නියෝග, පහත දැක්වෙන පරිදි තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

   (අ) 1 වන ඡේදයෙහි සහ 2 වන ඡේදයෙහි දැක්වෙන ''මාස 12 ක්'' යන වචන මෙමගින් ඉවත් කරනු ලබන අතර එම වචන වෙනුවට ''මාස 24 ක්'' යන වචන ආදේශ කරනු ලැබේ.

මහින්ද රාජපක්ෂ,
මුදල් අමාත්‍ය.

2021 අප්‍රේල් මස 07 වැනි දින,
කොළඹ දී ය.

විදේශ විනිමය දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2021 අංක 21 දරන විධානයන්

විශේෂ තැන්පතු ගිණුම පිළිබඳ බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරන විධානයන්

2020 අප්‍රියෙල් මස 08 දිනැති අංක 2170/4 දරන රජයේ ගැසට් පත්‍රයෙහි (අතිවිශෙෂ) පළ කරන ලද නියෝග, 2020 ජූලි 01 දිනැති අංක 2182/32, 2020 ඔක්තෝබර් 06 දිනැති අංක 2196/22 සහ 2021 අප්‍රියෙල් 07 දිනැති අංක 2222/37 දරන රජයේ ගැසට් පත්‍රවල (අතිවිශෙෂ) පසුව පළ කරන ලද නියෝග (නියෝග) සහ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි (පනත) 9 වන වගන්තිය ප්‍රකාරව, පහත කොන්දේසිවලට යටත්ව, දේශීය බැංකු ඒකකයෙහි විශේෂ තැන්පතු ගිණුම් විවෘත කිරීමට සහ පවත්වාගෙන යාමට බලයලත් වෙළෙඳුන් හට අවසර ලැබේ.

2. සුදුසුකම් ලත් තැනැත්තන්

(අ) ශ්‍රී ලංකාවේ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික ශ්‍රී ලාංකික පුද්ගලයින්;

(ආ) ද්විත්ව පුරවැසිභාවය ලබාගත් පුරවැසියන්;

(ඇ) ශ්‍රී ලාංකීය සම්භවයක් ඇති වෙනත් රටවල පුරවැසියන්;

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික විජාතිකයින්;

(ඉ) ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපිත/ලියාපදිංචි කළ අරමුදල්, සංස්ථාපිත මණ්ඩල සහ සංගම්;

(ඊ) සුභසිද්ධිය පතන වෙනත් ඕනෑම පාර්ශ්වයක්.

3. විශේෂ තැන්පතු ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම

(අ) 2020 අප්‍රියෙල් 08 දින සිට මාස විසිහතරක කාලයක් ඇතුලත විශේෂ තැන්පතු ගිණුම් විවෘත කළ යුතුය.

(ආ) විශේෂ තැන්පතු ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම කාලීන තැන්පතු ආකාරයෙන් පමණක් සිදු කළ යුතුය. කාලීන තැන්පතු තැබීමට අරමුදල් ලබා ගැනීමේ කාර්යය සහ කාලීන තැන්පතු අරමුදල් ශ්‍රී ලංකාවෙන් පිටතට ආපසු යැවීම සඳහා පමණක් ක්‍රියාකාරීත්ව ගිණුම් වශයෙන් විශේෂ තැන්පතු ගිණුම් ඉතුරුම් ගිණුම් ආකාරයෙන් විවෘත කළ හැකිය.

(ඇ) නම් කරන ලද ඕනෑම විදේශ ව්‍යවහාර මුදලකින් හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් විශේෂ තැන්පතු ගිණුම් විවෘත කිරීම හා පවත්වාගෙන යාම කළ යුතුය.

(ඈ) විශේෂ තැන්පතු ගිණුම් සුදුසුකම්ලත් තැනැත්තන් විසින් හවුල් ගිණුම් ලෙස පවත්වාගෙන යා හැකිය.

4. අවම කාලසීමාව:

මාස හයයි (6)

5. ගෙවිය යුතු පොළිය:

අදාළ බලයලත් වෙළෙන්දා විසින් සමාන කල්පිරීම් සහිත සාමාන්‍ය තැන්පතු සඳහා ගෙවනු ලබන තැන්පතු පොළී අනුපාතවලට අමතරව වාර්ෂිකව ප්‍රතිශතාංක එකක් සහ ප්‍රතිශතාංක දෙකක් පිළිවෙලින් මාස 6 ක සහ මාස 12 ක කාලසීමාවක් සහිත විශේෂ තැන්පතු ගිණුම් සඳහා විශේෂ තැන්පතු ගිණුම කල් පිරීමේදී ගෙවනු ලැබේ (තැන්පතුව පවත්වාගෙන යන ව්‍යවහාර මුදලින්).

සටහන: තැන්පතුව කල්පිරීමේදී පොළිය ගෙවනු ලබන දිනයට අදාළව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විශේෂණය කරනු ලබන දර්ශක අනුපාතයක් භාවිතයෙන් පරිවර්තිත අමතර පොළිය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලයලත් වෙළෙඳුන් හට ශ්‍රී ලංකා රුපියල් වලින් කලින් කලට ප්‍රතිපූර්ණය කරනු ලැබේ.

6. අරමුදල් ආපසු යැවීම :

කාලීන තැන්පතුව කල්පිරීමේදී විදේශ මුදල් බවට පරිවර්තනය සහ ශ්‍රී ලංකාවෙන් පිටතට ආපසු යැවීම බාධාවකින් තොරව සිදු කළ හැකිය.

7. අවසරලත් බැර කිරීම්

(අ) බැංකු පද්ධතිය හරහා ගිණුම් හිමියාගේ නමට ශ්‍රී ලංකාවට පිටතින් ලැබෙන විදේශ මුදලින් වූ ආමුබ ප්‍රේෂණ

(ආ) 2020 අප්‍රියෙල් 08 වනදා සිට මාස විසිහතරක කාලයක් තුළ ආමුබ ප්‍රේෂණ ලෙස ගිණුම් හිමියාගේ ආමුබ ආයෝජන ගිණුමකට හෝ අක්වෙරළ බැංකු ඒකකයක පවත්වාගෙන යන ගිණුමකට ලැබුණු මුදල් වලින් වන මාරු කිරීම්

(ඇ) පනතෙහි 8 වන වගන්තිය යටතේ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරන ලද පරිදි, පැමිණෙන තොටුපොළෙහිදී රේගු දෙපාර්තමේන්තුව වෙත ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමට යටත්ව, 2020 ජනවාරි 01 දින හෝ එදිනට පසුව ශ්‍රී ලංකාවට පැමිණි ගිණුම්හිමියෙකු විසින් නීත්‍යානුකූලව අත්පත් කරගන්නා ලද සහ රැගෙන එන ලද විදේශ විනිමය

(ඈ) බලයලත් වෙළෙන්දා හට සුදුසු පරිදි කරනු ලබන ප්‍රකාශයකට යටත්ව, 2020 ජනවාරි 01 දින හෝ එදිනට පසුව ශ්‍රී ලංකාවට පැමිණි ගිණුම් හිමියෙකු විසින් නීත්‍යානුකූලව අත්පත් කර ගන්නා ලද සහ රැගෙන එන ලද ඇ.එ.ජ. ඩොලර් 15,000 හෝ වෙනත් ඕනෑම විදේශ ව්‍යවහාර මුදලකින් එයට සමාන ප්‍රමාණයකට සමාන වන හෝ අඩුවන විදේශ විනිමය

බලයලත් වෙළෙන්දා හට අරමුදල්හි මූලාශ්‍රය පිළිබඳව කරන ලද ප්‍රකාශයකට යටත්ව, පනතෙහි 8 වන වගන්තිය යටතේ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරන ලද පරිදි එම කොන්දේසි සහ නියමයන්ට යටත්ව සහ එම සීමාවන් දක්වා ශ්‍රී ලංකාවෙහි නේවාසික තැනැත්තෙකු සන්තකයෙහි ඇති විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු

8. අවසරලත් හර කිරීම්

(අ) තැන්පතුව කල්පිරීමේදී ලද මුදලින් කරනු ලබන ප්‍රතිමුබ ප්‍රේෂණ

(ආ) විශේෂ තැන්පතු ගිණුම් - කාලීන තැන්පතුවල කල් පිරීමේ මුදල්, එම ගිණුම් හිමියාගේම ආමුබ ආයෝජන ගිණුමකට හෝ අක්වෙරළ බැංකු ඒකකයක පවත්වාගෙන යන ගිණුමකට මාරු කිරීම

(ඇ) 2021 පෙබරවාරි 03 දිනැති අංක 2213/35 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනයේ පළ කරන ලද 2021 අංක 2 දරන නියෝග ප්‍රකාරව, ආමුබ ආයෝජන ගිණුමක් පවත්වාගෙන යාමට සුදුසුකම් ලබන විශේෂ තැන්පතු ගිණුම් හිමියෙකු නම්, පොළියද ඇතුළුව විශේෂ තැන්පතු ගිණුම් කල් පිරීමේ මුදල්, එම ගිණුම් හිමියාගේම ආමුබ ආයෝජන ගිණුමකට මාරු කිරීම.

(ඈ) 2021 පෙබරවාරි 03 දිනැති අංක 2213/38 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනයේ පළ කරන ලද 2021 අංක 5 දරන නියෝග ප්‍රකාරව, පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් පවත්වාගෙන යාමට සුදුසුකම් ලබන විශේෂ තැන්පතු ගිණුම් හිමියෙකු නම්, පොළියද ඇතුළුව විශේෂ තැන්පතු ගිණුම් කල් පිරීමේ මුදල්, එම ගිණුම් හිමියාගේම පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට මාරු කිරීම.

(ඉ) ශ්‍රී ලංකා රුපියල් වලින් ශ්‍රී ලංකාව තුළ දී සිදු කරන ගෙවීම්

9. අනෙකුත් කොන්දේසි

(අ) සමාන ගිණුම් හිමියාගේ ආමුබ ආයෝජන ගිණුමක් හෝ අක්වෙරළ බැංකු ඒකකයේ පවත්වාගෙන යන ගිණුමක් හරහා අරමුදල් ලැබෙන්නේ නම්, එම අරමුදල් 2020 අප්‍රියෙල් 08 වනදා හෝ ඉන්පසුව ශ්‍රී ලංකාවට ආමුබ ප්‍රේෂණ වශයෙන් ලැබී ඇති බව බලයලත් වෙළෙඳුන් තහවුරු කර ගත යුතුය.

(ආ) අපනයන මගින් ලද සහ ලැබිය යුතු මුදල්, නේවාසික ආයෝජකයන් විසින් ශ්‍රී ලංකාවෙන් පිටත සිදු කරන ලද ආයෝජනවල ප්‍රතිලාභ/විකිණීම මගින් ලද මුදල් සහ ලැබිය යුතු මුදල් වැනි වෙනත් නියාමන අවශ්‍යතාවන්ට යටත් වන ආමුබ ප්‍රේෂණ හෝ වෙනත් ඕනෑම ව්‍යවස්ථාපිත අවශ්‍යතාවකට යටත් වන වෙනත් ආමුබ ප්‍රේෂණ, විශේෂ තැන්පතු ගිණුමට බැර කිරීමට සුදුසුකම් නොලබන බව බලයලත් වෙළෙඳුන් තහවුරු කරගත යුතුය.

(ඇ) මාස 6 හි අවම කල්පිරීමේ කාලසීමාවට පෙර සිදු කරනු ලබන ආපසු ගැනීම් අධෛර්යමත් කළ යුතුය. විශේෂ තැන්පතු ගිණුම් වලින් කල්පිරීමට පෙර සිදුකරනු ලබන ආපසු ගැනීම් ඉහත 5 වන ඡේදයෙහි පරිදි අමතර පොළියක් ගෙවනු ලැබීම සඳහා සුදුසුකම් නොලැබිය යුතුය.

(ඈ) මාස 6 ක කල්පිරීම් කාලයක් සහිත විශේෂ තැන්පතු ගිණුම්, තවත් මාස 6 ක කාලයක් සඳහා පමණක් නැවත ආයෝජනය කළ හැකි අතර (පොළිය නොමැතිව) මාස 6 ක කාලසීමාවෙහි විශේෂ තැන්පතු ගිණුම සඳහා පිරිනමන ලද අමතර පොළිය සඳහා පමණක් සුදුසුකම් ලබනු ඇත. (එනම් අදාළ බලයලත් වෙළෙන්දා විසින් සමාන කල්පිරීම් සහිත සාමාන්‍ය තැන්පතු සඳහා ගෙවනු ලබන තැන්පතු පොළී අනුපාතවලට වඩා වාර්ෂිකව ප්‍රතිශතාංක එකක්)

(ඉ) විශේෂ තැන්පතු ගිණුම් ඇපකර වශයෙන් තබාගෙන, බලයලත් වෙළෙඳුන්ට ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයන් වෙත ශ්‍රී ලංකා රුපියල්වලින් ණය ප්‍රදානය කිරීම සඳහා සලකා බැලිය හැකිය. තවද, 2021 පෙබරවාරි 03 දිනැති අංක 2213/37 දරන (අතිවිශෙෂ) ගැසට් පත්‍රයෙහි පළ කරන ලද 2021 අංක 04 දරන නියෝගවල අවසර දී ඇති පරිදි ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික ඕනෑම පුද්ගලයෙකු හට ණය ප්‍රදානය කිරීමට අදාළ නියෝගවලට යටත්ව, එවැනි පුද්ගලයන් හට ශ්‍රී ලංකා රුපියල්වලින් හෝ විදේශ ව්‍යවහාර මුදලින් ණය ප්‍රදානය කිරීම සඳහා ඇපකර වශයෙන් විශේෂ තැන්පතු ගිණුම් යොදා ගත හැකිය.

(ඊ) ඉහත 8 (ඉ) ඡේදය යටතේ ආපසු ලබාගන්නා ලද අරමුදල් විශේෂ තැන්පතු ගිණුමකට නැවත බැර කළ නොහැකිය.

(උ) අනුරූපී බැංකු සබැඳියාවන් හේතුවෙන් ගිණුම් හිමියා වෙනුවෙන් ආමුබ ප්‍රේෂණ වෙනත් බලයලත් වෙළෙන්දෙකු මාර්ගයෙන් ලැබෙන්නේ නම්, එම ආමුබ ප්‍රේෂණ ලබන බලයලත් වෙළෙන්දා විසින් එකී අරමුදල් මාරු කරන අවස්ථාවේදී එකී අරමුදල් නියමිත පරිදි ආමුබ ප්‍රේෂණ ලෙස ලැබී ඇති බවට ප්‍රකාශ කරමින් විශේෂ තැන්පතු ගිණුම විවෘත කිරීමට නියමිත බලයලත් වෙළෙන්දා වෙත තහවුරුවක් නිකුත් කළ යුතුය.

(ඌ) අරමුදල්, නියෝගයට අනුකූලව ගිණුම් හිමියාගේ විශේෂ තැන්පතු ගිණුමට බැර කරන ලද බවට සහ එම ගිණුමෙන් හර කරන ලද බවට, විශේෂ තැන්පතු ගිණුම පවත්වාගෙන යන බලයලත් වෙළෙන්දාගෙන් තහවුරුවක් ලබා ගැනීමට යටත්ව, විශේෂ තැන්පතු ගිණුම පවත්වාගෙන යනු ලබන බලයලත් වෙළෙන්දා හැර වෙනත් බලයලත් වෙළෙන්දෙකු මගින් ගිණුම් හිමියාට ප්‍රතිමුබ ප්‍රේෂණ සිදු කළ හැකිය.

(එ) තැන්පතුව විවෘත කරන අවස්ථාවේදී, බලයලත් වෙළෙඳුන් විශේෂ තැන්පතු ගිණුම්වලට අදාළ නියම සහ කොන්දේසි පිළිබඳව පාරිභෝගිකයා දැනුවත් කළ යුතුය.

(ඒ) මෙම නියෝග යටතේ විශේෂ තැන්පතු ගිණුම්, තැන්පතු කල් පිරීම සඳහා නම් කරන ලද දිනය ඉක්මවීමෙන් පසුව ද "විශේෂ තැන්පතු ගිණුම" නමින් දේශීය බැංකු ඒකකයෙහි, සාමාන්‍ය කාලීන තැන්පතු ලෙස තවදුරටත් පවත්වාගෙන යාමට බලයලත් වෙළෙඳුන්ට හැකියාව ඇත. මෙලෙස තැන්පතු කල් පිරීම සඳහා නම් කරන ලද දිනය ඉක්මවීමෙන් පසුව පවත්වාගෙන යන විශේෂ තැන්පතු ගිණුම් සඳහා බලයලත් වෙළෙඳුන් විසින් අනෙකුත් කාලීන තැන්පතු සඳහා ප්‍රදානය කරනු ලබන සාමාන්‍ය තැන්පතු පොළී අනුපාත පමණක් ප්‍රදානය කළ යුතුය.

10. වාර්තා කිරීමේ අවශ්‍යතාවය

(අ) බලයලත් වෙළෙඳුන් විසින් dfem@cbsl.lk විද්‍යුත් තැපෑල හරහා මෙම දෙපාර්තමේන්තුව වෙත පහත පරිදි විශේෂ තැන්පතු ගිණුම් පිළිබඳ තොරතුරු සැපයීම අවශ්‍ය වේ.

(i) එළඹෙන සතියේ 2 වන රාජකාරි දිනය අවසන් වීමට පෙර, මෙම විධානවල **ඇමුණුම I** හි දැක්වෙන ආකෘතියට අනුව, **සතිපතා**

(ii) එළඹෙන මාසයේ 15 වන දින හෝ ඊට පෙර, මෙම විධානවල **ඇමුණුම II** හි දැක්වෙන ආකෘතියට අනුව, **මාසිකව**

(ආ) ඉහත වාර්තා කිරීමේ අවශ්‍යතාවන්ට අනුව බලයලත් වෙළෙඳුන් විසින් අදාළ බැංකුවල ගිණුම් පොත්වලින් අදාළ තොරතුරු ජනනය කිරීම හෝ උපුටා ගැනීම සඳහා බැංකුව තුළ පද්ධතියක් ස්ථාපනය කිරීම අවශ්‍ය වේ.

11. 2020 ජූලි 06 දිනැති 2020 අංක 06, 2020 ඔක්තෝබර් 07 දිනැති 2020 අංක 09 සහ 2020 නොවැම්බර් 25 දිනැති 2020 අංක 10 දරන විධානයන් යටතේ විශේෂ තැන්පතු ගිණුම් පිළිබඳව බලයලත් වෙළෙඳුන් හට නිකුත් කරන ලද පූර්ව විධානයන් මෙමගින් අවලංගු කරනු ලැබේ.

12. ඉහත 11 වන ඡේදයෙහි දක්වා ඇති පූර්ව විධානයන් අවලංගු කිරීම මගින් එම අවලංගු කිරීමට පෙර ඒවා යටතේ උපචිත යම් අයිතියකට හෝ දැරිය යුතු වූ දඩ මුදල් හෝ වගකීම්වලට බලපෑමක් සිදු නොවිය යුතුය.

අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව
2021 අප්‍රේල් 08 වැනි දින

සටහන :

* එකම පුද්ගලයා තැන්පතු කිහිපයක් පවත්වාගෙන යන්නේ නම්, සෑම තැන්පතුවක් සඳහාම වෙන වෙනම පේළි භාවිත කරන්න.

** ගිණුම් හිමියාගේ නේවාසිකභාවය R නේවාසික

NR නේවාසික නොවන

*** අනෙකුත් නම්කරන ලද විදේශ ව්‍යවහාර මුදල් සඳහා අවශ්‍ය පරිදි පේළි වැඩි කර ගත හැකිය.

ඉහත පරිදි සකස් කරන ලද වාර්තාවල ස්කෑන් කරන ලද සහ MS Excel යන පිටපත් දෙකම බලයලත් වෙළෙඳුන් විසින් සැපයීම අවශ්‍ය වේ.

බැංකුවෙහි ගිණුම් පොත් වලින් උපුටාගත් / ජනනය කරන ලද ඉහත තොරතුරු සත්‍ය බවට තහවුරු කරමු.

බලයලත් නිලධාරියාගේ නම :	අනුකූලතා නිලධාරියාගේ නම සහ මුද්‍රාව : .....
අත්සන :	අත්සන : .....
දිනය :	දිනය : .....

අංක 21 දරණ විධානවල ඇමුණුම I

විශේෂ තැන්පතු ගිණුම්වල සතිපතා ප්‍රකාශනය - කාලීන තැන්පතු

බැංකුවෙහි නම:

වාර්තා කරන සතිය, මාසය සහ වර්ෂය:

1 වන වගුව - සතිය තුළ විවෘත කරන ලද විශේෂ තැන්පතු ගිණුම්

ශාඛාව	ශාඛා කේතය	ගිණුම් හිමියාගේ නම*	ගිණුම් හිමියාගේ සේවායිත භාවය**	ජා.හැ.ප / විදේශ ගමන් බලපත්‍ර අංකය	ව්‍යවහාර මුදල් කේතය	ගිණුම් අංකය	විවෘත කළ දිනය (dd-mm-yy)	තැන්පතුවේ ප්‍රමාණය	තැන්පතු කාලසීමාව මාසවලින් (අදාළ තීරය සලකුණු කරන්න)		කල්පිරීමේ දිනය (dd-mm-yy)	බැංකුව විසින් ප්‍රදානය කරන ලද සාමාන්‍ය පොළී අනුපාතය (ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රදානය කරන ලද අමතර පොළිය හැර) (වාර්ෂිකව %)	අදාළ අමතර පොළී අනුපාතය (මාස 6ක් සඳහා වාර්ෂිකව 1% හෝ මාස 12ක් සඳහා වාර්ෂිකව 2%)	කල්පිරීමේදී බැංකුව විසින් ගෙවීමට නියමිත පොළිය (ප්‍රමාණය)	ශ්‍රී ලංකා මහ බැංකුවෙන් හිමිකම් පෑ යුතු පොළිය (ප්‍රමාණය)
									6	12					

2 වන වගුව - සතිය තුළ විවෘත කරන ලද විශේෂ තැන්පතු ගිණුම්වල අරමුදල් මූලාශ්‍රය

ව්‍යවහාර මුදල් කේතය***	ආමුඛ ප්‍රේෂණ	මාරු කිරීම්		විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු
		ආමුඛ ආයෝජන ගිණුම්වල සිට	අක්වෙරළ බැංකු ඒකකයෙහි ගිණුම්වල සිට	
එ.ජ.ඩොලර්				
යූරෝ				
ශ්‍රී ලංකා රුපියල්				

අංක 21 දරන විධානවල ඇමුණුම **II** හි පිටු අංක 1

කල් පිරුණු / නැවත ආයෝජනය කළ / සාමාන්‍ය තැන්පතු ලෙස ඉදිරියට පවත්වාගෙන යන විශේෂ තැන්පතු ගිණුම්වල මාසික ප්‍රකාශනය

බැංකුවෙහි නම:

වාර්තා කරන මාසය සහ වර්ෂය:

1 වන වගුව - 2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ නිකුත් කරන ලද 2021 අංක 21 දරන විධානවල 9(ඇ) ඡේදය යටතේ, මාසය තුළදී නැවත ආයෝජනය කරන ලද විශේෂ තැන්පතු

ශාඛාව	ශාඛා කේතය	ගිණුම් හිමියාගේ නම*	ගිණුම් හිමියාගේ නේවාසික භාවය**	ජා.හැ.ප/ විදේශ ගමන් බලපත්‍ර අංකය	ව්‍යවහාර මුදල් කේතය	ගිණුම් අංකය	නැවත ආයෝජනය කළ දිනය **(dd-mm-yy)**	තැන්පතුවේ ප්‍රමාණය	කල්පිරීමේ දිනය **(dd-mm-yy)**	බැංකුව විසින් ප්‍රදානය කරන ලද සාමාන්‍ය පොළී අනුපාතය (ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රදානය කරන ලද අමතර පොළිය හැර) (වාර්ෂිකව %)	කල්පිරීමේදී බැංකුව විසින් ගෙවීමට නියමිත පොළිය (ප්‍රමාණය)	ශ්‍රී ලංකා මහ බැංකුවෙන් හිමිකම් පෑ යුතු පොළිය (ප්‍රමාණය)

2 වන වගුව - 2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ නිකුත් කරන ලද 2021 අංක 21 දරන විධානවල 9(ඒ) ඡේදය යටතේ, මාසය තුළදී සාමාන්‍ය තැන්පතු ලෙස ඉදිරියට පවත්වාගෙන යන විශේෂ තැන්පතු ගිණුම්

ශාඛාව	ශාඛා කේතය	ගිණුම් හිමියාගේ නම*	ගිණුම් හිමියාගේ නේවාසික භාවය**	ජා.හැ.ප/ විදේශ ගමන් බලපත්‍ර අංකය	ව්‍යවහාර මුදල් කේතය	ගිණුම් අංකය	සාමාන්‍ය තැන්පතුවක් ලෙස ඉදිරියට පවත්වාගෙන යාම ආරම්භ කළ දිනය **(dd-mm-yy)**	තැන්පතුවේ ප්‍රමාණය	කල්පිරීමේ දිනය **(dd-mm-yy)**	බැංකුව විසින් ප්‍රදානය කරන ලද පොළී අනුපාතය	කල්පිරීමේදී බැංකුව විසින් ගෙවීමට නියමිත පොළිය (ප්‍රමාණය)

අංක 21 දරන විධානවල ඇමුණුම **II** හි පිටු අංක 2

3 වන වගුව - 2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ නිකුත් කරන ලද 2021 අංක 21 දරන විධානවල 9(ඇ) ඡේදය යටතේ නැවත ආයෝජනය නොකළ හෝ 9(ඒ) ඡේදය යටතේ සාමාන්‍ය තැන්පතු ලෙස ඉදිරියට ගෙනයාම සිදු නොකළ, මාසය තුළදී කල් පිරුණු විශේෂ තැන්පතු ගිණුම්

ශාඛාව	ශාඛා කේතය	ගිණුම් හිමියාගේ නම*	ගිණුම් හිමියාගේ නේවාසික භාවය**	ජා.හැ.ප/ විදේශ ගමන් බලපත්‍ර අංකය	ව්‍යවහාර මුදල් කේතය	ගිණුම් අංකය	විවෘත කළ දිනය (dd-mm-yy)	තැන්පතුවේ ප්‍රමාණය	කල්පිරීමේ දිනය (dd-mm-yy)	බැංකුව විසින් ප්‍රදානය කරන ලද පොළී අනුපාතය	කල්පිරීමේදී බැංකුව විසින් ගෙවන ලද පොළිය (ප්‍රමාණය)

4 වන වගුව - 2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ නිකුත් කරන ලද 2021 අංක 21 දරන විධානවල 9(ඇ) ඡේදය යටතේ නැවත ආයෝජනය නොකළ හෝ 9(ඒ) ඡේදය යටතේ සාමාන්‍ය තැන්පතු ලෙස ඉදිරියට ගෙනයාම සිදු නොකළ, මාසය තුළදී කල් පිරුණු විශේෂ තැන්පතු ගිණුම් වලින් හර කිරීම් සිදු කරන ලද ආකාරය

ව්‍යවහාර මුදල් කේතය***	ශ්‍රී ලංකාව තුළදී ආපසු ගන්නා ලද	ශ්‍රී ලංකාවෙන් පිටතට ප්‍රේෂණය කරන ලද	මාරු කරන ලද		
			ආමුඛ ආයෝජන ගිණුම් වෙත	පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් වෙත	අක්වෙරළ බැංකු ඒකකයෙහි ගිණුම් වෙත
එ.ජ.ඩොලර්					
යූරෝ					
ශ්‍රී ලංකා රුපියල්					

සටහන :

* එකම පුද්ගලයා තැන්පතු කිහිපයක් පවත්වාගෙන යන්නේ නම්, සෑම තැන්පතුවක් සඳහාම වෙන වෙනම පේළි භාවිත කරන්න.

** ගිණුම් හිමියාගේ නේවාසිකභාවය R නේවාසික

NR නේවාසික නොවන

*** අනෙකුත් නම්කරන ලද විදේශ ව්‍යවහාර මුදල් සඳහා අවශ්‍ය පරිදි පේළි වැඩි කර ගත හැකිය.

ඉහත පරිදි සකස් කරන ලද වාර්තාවල ස්කෑන් කරන ලද සහ MS Excel යන පිටපත් දෙකම බලයලත් වෙළෙඳුන් විසින් සැපයීම අවශ්‍ය වේ.

බැංකුවෙහි ගිණුම් පොත් වලින් උපුටාගත් / ජනනය කරන ලද ඉහත තොරතුරු සත්‍ය බවට තහවුරු කරමු.

බලයලත් නිලධාරියාගේ නම : .....
අත්සන : .....
දිනය : .....

අනුකූලතා නිලධාරියාගේ නම සහ මුද්‍රාව : .....
අත්සන : .....
දිනය : .....

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2222/60 - 2021 අප්‍රේල් මස 09 වැනි සිකුරාදා - 2021.04.09

I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම්

1949 අංක 58 දරන මුදල් නීති පනත

1949 අංක 58 දරන මුදල් නීති පනතෙහි 68 වන වගන්තිය සමග එක්ව කියවිය යුතු 10(c) වන වගන්තිය යටතෙහි සාදනු ලබන රීති.

මහාචාර්ය ඩබ්ලිව්. ඩී. ලක්ෂ්මන්,
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති.

2021 අප්‍රේල් මස 09 වැනි දින,
ශ්‍රී ලංකා මහ බැංකුව,
කොළඹ දී ය.

අපනයනය මගින් ලද මුදල් ශ්‍රී ලංකාව වෙත ගෙන්වා ගැනීම

1. මෙම රීති ''2021 අංක 3 දරන අපනයනය මගින් ලද මුදල් ශ්‍රී ලංකාව වෙත ගෙන ඒමේ රීති'' යනුවෙන් හඳුන්වනු ලැබිය යුතුය.

2. 2021 මාර්තු 09 වැනි දිනැති අංක 2218/38 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි ප්‍රකාශයට පත් කළ 2021 අංක 2 දරන අපනයනය මගින් ලද මුදල් ශ්‍රී ලංකාව වෙත ගෙන ඒමේ රීති මගින් සංශෝධනය කරන ලද ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය මගින් නිකුත් කල සහ 2021 පෙබරවාරි 18 වැනි දිනැති අංක 2215/39 දරන අති විශෙෂ පත්‍රයෙහි ප්‍රකාශයට පත් කළ 2021 අංක 1 දරන අපනයනය මගින් ලද මුදල් ශ්‍රී ලංකාව වෙත ගෙන ඒමේ රීති, එහි 4 වන රීතිය ඉවත් කිරීමෙන් සහ පහත සඳහන් රීතිය ඒ වෙනුවට ආදේශ කිරීම මගින් තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

> ''4. සෑම භාණ්ඩ අපනයන කරුවෙකුම, ඉහත 3 වන රීතිය යටතේ ඉල්ලා ඇති පරිදි අපනයනය මගින් ලද මුදල් ලැබී දින තිහක් (30) ඇතුළත, බලපත්‍රලාභී බැංකුවක් මගින් එකී අපනයනය මගින් ශ්‍රී ලංකාවට ලද මුළු මුදලින් සියයට දහයක ප්‍රතිශතයක් (10%) ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කළ යුතුය.
>
> කෙසේ වෙතත්, ඉහත සඳහන් පරිවර්තනය කරන දිනය ඉහත 3(i) රීතියට අනුව ශ්‍රී ලංකාවට අපනයන ආදායම ලැබීමට නියමිත දිනයට වඩා පසු දිනයක් නොවිය යුතුය (එනම්, භාණ්ඩ නැව්ගත කළ දින සිට දින එකසිය අසූවකට (180) නොවැඩි දිනයක් විය යුතුය).''

විදේශ විනිමය දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2021 අංක 22 දරන විධානයන්

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි හෝටල් වෙත නිකුත් කරනු ලබන විධානයන්

2021.03.26 වන දිනැති 2220/69 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ (ඇ) පරිච්ඡේදයේ 4 වන වගන්තියේ 2 වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද නියෝගය ප්‍රකාරව, පහත සඳහන් කරුණුවලට යටත්ව ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයින්ගෙන් එවැනි පුද්ගලයින් සඳහා සපයන ලද සේවාවන් සඳහා විදේශ ව්‍යවහාර මුදල් භාර ගැනීමට ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි හෝටල් සඳහා මෙයින් අවසර ලබා දෙනු ලැබේ.

2. ඒ අනුව හෝටල් විසින් එසේ භාර ගත් විදේශ ව්‍යවහාර මුදල් භාර ගත් දින සිට දින හතක් (7) ඉක්මවන තුරු සන්තකයේ තබා නොගත යුතු අතර, එකී විදේශ ව්‍යාවහාර මුදල්

   (අ) බලයලත් වෙළෙන්දෙකු හෝ පරිසීමිත වෙළෙන්දෙකු වෙත හෝටලයේ නමින් විවෘත කර පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට තැන්පතු කිරීම; හෝ

(ආ) තහවුරු කිරීම සඳහා සාක්ෂි සැපයීමෙන් පසු බලයලත් වෙළෙන්දෙකු වෙත විකිණීම අවශ්‍ය වේ.

3. අනිකුත් කොන්දේසි

3.1 භාර ගනු ලබන විදේශ ව්‍යවහාර මුදල් ප්‍රමාණය හෝටලය විසින් සපයනු ලබන සේවාවන්ගේ අගයට සීමා විය යුතු අතර, එවැනි භාර ගැනීම් සඳහා නිකුත් කරනු ලබන වලංගු ලැබීම් සඳහා යටත් වේ.

3.2 ශ්‍රී ලංකාවේ නේවාසිකයින් වන හෝටලයේ අමුත්තන් වෙත ගෙවිය යුතු ඕනෑම ශේෂයක් ශ්‍රී ලංකා රුපියල් වලින් ගෙවිය යුතු වේ.

3.3 බලයලත් වෙළඳුන් විසින් ලබා දෙනු ලබන පවතින විදේශ විනිමය අනුපාත අනුව විදේශ ව්‍යවහාර මුදල් භාර ගැනීම සිදු කළ යුතු වේ.

3.4 පාදක වූ ගනුදෙනුවේ සද්භාවය සනාථ කිරීම සඳහා අදාළ ලේඛනගත සාක්ෂි සමඟ විදේශ ව්‍යවහාර මුදල් භාර ගැනීම සම්බන්ධ සියලුම ගනුදෙනු වෙනත් ලේඛනයක වාර්තා තබා ගත යුතු වන අතර, අවශ්‍ය වූ විටක දී ශ්‍රී ලංකා මහ බැංකුවේ නිරීක්ෂණ කටයුතු සඳහා හෝටල් පරිශ්‍රය තුළ තබා ගත යුතු වේ.

3.5 ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයින් සපයනු ලබන සේවාවන් සම්බන්ධයෙන් නීත්‍යානුකූල නොවන මාර්ගයකින් ව්‍යුත්පන්න වූ හෝ උපලබ්ධිත විදේශ ව්‍යවහාර මුදල් ඔබ භාර ගෙන ඇතැයි විශ්වාස කිරීමට කිසියම් හේතුවක් ඔබ සතු වේ නම්, 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණ වැළැක්වීමේ පනතේ 5.1 වගන්තියේ නියමයන් ප්‍රකාරව, ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කිරීමට ඔබ කටයුතු කළ යුතු වේ.

4. වාර්තාකරණ අවශ්‍යතා

මෙම විධානයන්ගෙන් අවසර ලබා දෙන හෝටල්, එළඹෙන මස 15 වන දින හෝ ඊට පෙර ඇමුණුම I අනුව සකස් කළ වාර්තාවක් කාර්තුමය පදනම මත ශ්‍රී ලංකා සංවර්ධන අධිකාරිය වෙත ලබාදිය යුතු අතර dfem@cbsl.lk යන විද්‍යුත් ලිපිනයට ඊමේල් පණිවිඩයක් ලෙස යොමු කළ යුතු වේ.

5. මෙම විධානයන්ගේ අවශ්‍යතාව සඳහා;

(අ) **"බලයලත් වෙළඳුන්"** යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දක්වා ඇති අර්ථයම වේ.

(ආ) **"පරිසීමිත වෙළඳුන්"** යන්න 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දක්වා ඇති අර්ථයම වේ.

(ඇ) **"නියමය"** යන්න 2021. 03. 26 දිනැති අංක 2220/ 69 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ ඇමුණුම II හි ප්‍රකාශයට පත් කර ඇති නියමය විය යුතු වේ.

6. මෙම විධානයන් යටතේ විදේශ විනිමය වෙළඳාම් කරනු ලබන හෝටල් විදේශ විනිමය පනතේ විධිවිධාන හෝ වෙනත් ලිඛිත නීතියක් සඳහා අනුගත වීමේ අවශ්‍යතාව විවිර්ජනයට, විශෝධනයට හෝ වැළැක්වීමට මෙම විධානයන්ගෙන් අවසර ලබා දෙන ලෙස අර්ථකථනය නොකළ යුතුය.

අතිරේක අධ්‍යක්ෂ -විදේශ විනිමය
දෙපාර්තමේන්තුව

2021 මැයි 04

2021 අංක 22 දරන විධානයන් සඳහා වූ ඇමුණුම I

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි හෝටල් විසින් සපයන ලද සේවාවන් වෙනුවෙන් ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයින්ගෙන් විදේශ ව්‍යවහාර මුදල් භාර ගැනීම.

හෝටලයේ නම: .....

වාර්තා කරන කාර්තුව සහ වසර: .....

භාර ගන්නා ලද ප්‍රමාණය (ඇ.එ.ජ. ඩොලර් වලින් සමාන අගය) *	විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු කිරීම/ විකිණීම හා සම්බන්ධ තොරතුරු* (ඇ.එ.ජ. ඩොලර් වලින් සමාන අගය)*	
	බලයලත් වෙළෙන්දෙකු/ පරිසීමිත වෙළෙන්දෙකු වෙත පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට තැන්පත් කරන ලද ප්‍රමාණය	බලයලත් වෙළෙන්දෙකු වෙත විකුණන ලද ප්‍රමාණය

* ගනුදෙනුව සිදුකරන දින පවතින විදේශ විනිමය අනුපාත භාවිත කරමින් සෑම ගනුදෙනුවක් ම ඇ.එ.ජ. ඩොලර්වලින් වාර්තා කළ යුතු වේ.

හෝටලයේ පොත්වලින් උපුටාගත්/ උත්පාදනය වූ ඉහත තොරතුරු නිවැරදි බවට අපි සහතික වෙමු.

බලයලත් නිළධාරියාගේ නම සහ තනතුර: .....

අත්සන සහ නිළ මුද්‍රාව : .....

දිනය : .....

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2229/5 - 2021 මැයි මස 25 වැනි අඟහරුවාදා - 2021.05.25

I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

රජයේ නිවේදන

1917 අංක 12 දරන විදේශ විනිමය පනත

4 වන වගන්තිය යටතේ වූ නියමය

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 4 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මුදල් අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මා විසින්, මෙම නියමය මගින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවෙහි සංස්ථාපිත සමාගම් ශ්‍රී ලංකාව තුළ විදේශ විනිමය වෙළෙඳාම් සිදු කිරීමේදී යටත් විය යුතු, මේ යටතේ නිශ්චිතව දක්වා ඇති පරිදි, කාර්යයන්, නියම සහ කොන්දේසි නියම කරනු ලැබේ.

2. 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවෙහි සංස්ථාපනය කරන ලද සමාගම්වලට (මෙහි මින්මතු "මවු සමාගම" වශයෙන් හඳුන්වනු ලබන) ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ පූර්ව අවසරය සහිතව, විදේශ විනිමය උපයන්නන් වන ශ්‍රී ලංකාවෙහි සංස්ථාපනය කරන ලද ඔවුන්ගේ පාලිත සමාගම් වෙත ඕනෑම නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් ණය දීම සඳහා, පහත කරුණුවලට යටත්ව, මෙමගින් අවසර දෙනු ලැබේ.

   i. 2021 පෙබරවාරි මස 3 දිනැති අංක 2213/35 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද 2021 අංක 2 දරන විදේශ විනිමය නියෝග (මෙහි මින්මතු "2021 අංක 2 දරන නියෝග" වශයෙන් හඳුන්වනු ලබන) සහ මෙම නියමය යටතේ දක්වා ඇති නියම සහ කොන්දේසිවලට යටත්ව, මවු සමාගම විසින් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තෙකුගෙන් ලබාගත් ණය මුදලකින් (මෙහි මින්මතු "විදේශ ණය" වශයෙන් හඳුන්වනු ලබන) පමණක් පාලිත සමාගම වෙත එකී විදේශ ව්‍යවහාර මුදල් ණය (මෙහි මින්මතු "විදේශ ව්‍යවහාර මුදල් ණය" වශයෙන් හඳුන්වනු ලබන) ප්‍රදානය කළ යුතු ය.

ii. ඉහත අවසරය යටතේ ප්‍රදානය කරන ලද විදේශ ව්‍යවහාර මුදල් ණය නැවත ගෙවීම් වශයෙන් පාලිත සමාගම්වලින් ලැබුණු විදේශ විනිමය ඇතුළු ව මවු සමාගමෙහි විදේශ විනිමය ඉපැයීම්වලින් එකී විදේශ ණයට අදාළ නැවත ගෙවීම් එම සමාගම විසින් සිදුකළ යුතුය. එකී නැවත ගෙවීම්, රුපියල් විදේශ ව්‍යවහාර මුදල් බවට පරිවර්තනය කිරීම මගින් සිදු කිරීමට අවසර ලබා දී ඇත්තේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද විධානවලට යටත්ව අවසාන පිළියමක් වශයෙන් පමණි.

iii. පාලිත සමාගම විසින් මවු සමාගමෙන් ලබා ගන්නා ලද විදේශ ව්‍යවහාර මුදල් ණය, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් ප්‍රදානය කරන ලද අවසරයට අනුව පාලිත සමාගම විසින් බලයලත් වෙළෙන්දෙකු සමග විවෘත කරන ලද විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට බැර කළ යුතු අතර, එකී ණය මුදලට අදාළ සියලුම නැවත ගෙවීම් (මුල් මුදල සහ පොළිය) එම විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම හරහාම සිදුකළ යුතු ය.

iv. පාලිත සමාගමට අනාගත විදේශ විනිමය ඉපැයීම් තිබිය යුතු අතර මවු සමාගමෙන් ලබාගන්නා ලද එකී විදේශ ව්‍යවහාර මුදල් ණයට අදාළ සියලුම නැවත ගෙවීම් පාලිත සමාගමෙහි විදේශ විනිමය ඉපැයීම්වලින් පමණක් සිදු කළ යුතු ය.

v. පාලිත සමාගම විසින් එකී විදේශ ව්‍යවහාර මුදල් ණය එහි ව්‍යාපාරික මෙහෙයුම් කටයුතු (ශ්‍රී ලංකාවෙන් පිටත සිදුකරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු හැර) සඳහා පමණක් යොදාගත යුතු ය.

vi. කිසිදු අවස්ථානුගත කරුණක් යටතේ, පාලිත සමාගමට, රුපියල් විදේශ විනිමය බවට පරිවර්තනය කිරීම මගින් එකී විදේශ ව්‍යවහාර මුදල් ණයට අදාළ නැවත ගෙවීම් (මුල් මුදල සහ පොළිය) සිදුකළ නොහැකි ය.

මහින්ද රාජපක්ෂ,
මුදල් අමාත්‍ය.

2021 මැයි මස 25 වැනි දින,
කොළඹ දී ය.,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
අති විශෙෂ
අංක 2229/9 - 2021 මැයි මස 28 වැනි සිකුරාදා - 2021.05.28

I වැනි කොටස : (I) වැනි ඡෙදය – සාමාන්‍ය

ශ්‍රී ලංකා මහ බැංකු නිවේදන

1949 අංක 58 දරන මුදල් නීති පනත

1949 අංක 58 දරන මුදල් නීති පනතේ 68 වන වගන්තිය සමග කියවිය යුතු
10 (c) වගන්තිය යටතේ සකස් කළ රීතීන්

මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්,
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති.

2021 මැයි මස 28 වැනි දින,
ශ්‍රී ලංකා මහ බැංකුව,
කොළඹ දී ය.

අපනයන මගින් ලද මුදල් ශ්‍රී ලංකාව වෙත ගෙන්වා ගැනීම

1. මෙම රීති "2021 අංක 4 දරන අපනයන මගින් ලද මුදල් ශ්‍රී ලංකාව වෙත ගෙන ඒමේ රීති" යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු ය.

2. 2021 මාර්තු 9 වැනි දිනැති අංක 2218/38 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි ප්‍රකාශයට පත් කළ අපනයන මගින් ලද මුදල් ශ්‍රී ලංකාව වෙත ගෙන ඒමේ රීති සහ 2021 අප්‍රේල් 9 වන දිනැති අංක 2222/60 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි ප්‍රකාශයට පත් කළ අපනයන මගින් ලද මුදල් ශ්‍රී ලංකාව වෙත ගෙන ඒමේ රීති මගින් සංශෝධනය කරන ලද ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය මගින් නිකුත් කළ සහ 2021 පෙබරවාරි මස 18 වැනි දිනැති අංක 2215/39 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි ප්‍රකාශයට පත් කළ 2021 අංක 1 දරන අපනයන මගින් ලද මුදල් ශ්‍රී ලංකාව වෙත ගෙන ඒමේ රීති, තවදුරටත් මෙමගින් සංශෝධනය කරනු ලැබේ.

අ.එහි 4 වන රීතිය ඉවත් කිරීමෙන් සහ පහත සඳහන් රීති ඒ වෙනුවට ආදේශ කිරීම මගින්

"4. සෑම භාණ්ඩ අපනයනකරුවෙකුම, ඉහත 3 වන රීතිය යටතේ ඉල්ලා ඇති පරිදි අපනයන මගින් ලද මුදල් ලැබී දින (30) ඇතුළත, බලපත්‍රලාභී බැංකුවක් මගින් එකී අපනයනය මගින් ශ්‍රී ලංකාවට ලද මුළු මුදලින් සියයට විසි පහක (25%) ප්‍රතිශතයකට නොඅඩු ප්‍රමාණයක් ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කළ යුතු ය.

4 අ. කෙසේ වෙතත්, විශේෂිත අපනයන අංශයන්හි හෝ අපනයන කර්මාන්තයන්හි හෝ තනි අපනයනකරුවන්ගේ අපනයන භාණ්ඩ සහ නිෂ්පාදන ක්‍රියාවලිය තුළ දේශීය වශයෙන් සපයාගත නොහැකි ආනයනික භාණ්ඩ ඉතා ඉහළ ප්‍රතිශතයක් භාවිත කරන බවට මුදල් මණ්ඩලය සෑහීමකට පත්වේ නම්, එවන් විශේෂිත අපනයන අංශයකට හෝ අපනයන කර්මාන්තයක් හෝ තනි අපනයනකරුවන්ට, ඔවුන්ගේ ශ්‍රී ලංකාවට ලැබෙන මුළු අපනයන ආදායමෙන් සියයට විසිපහක (25%) ප්‍රතිශතයකට වඩා අඩු ප්‍රමාණයක් රුපියල් බවට පරිවර්තනය කිරීමට අවසර දීමට මුදල් මණ්ඩලයට එහි අභිමතය පරිදි තීරණය කළ හැකි ය.

කෙසේ වෙතත්, කිසිඳු අවස්ථාවක, ඉහත සඳහන් කළ පරිදි, මුදල් මණ්ඩලය සිය අභිමතය පරිදි ලබා දිය හැකි එවැනි ආංශික නිදහස් කිරීමක් මුළු අපනයන ආදායමෙන් සියයට දහයකට (10%) අඩු නොවිය යුතු ය."

"4 ආ. ඉහත රීති 4 සහ 4අ හි සඳහන් එම පරිවර්තන දිනය, ඉහත 3 (ස) රීතියට අනුව ශ්‍රී ලංකාවට අපනයන ආදායම් ලැබීමට නියමිත දිනයට පසු දිනයක් නොවිය යුතු ය. (එනම්, නැව් ගත කළ දින සිට දින එකසිය අසූවකට (180) නොවැඩි විය යුතු ය.)"

ආ. 5 වන රීතිය ඉවත් කිරීමෙන් සහ පහත සඳහන් රීතිය ඒ වෙනුවට ආදේශ කිරීම මගින්

"5. මුදල් මණ්ඩලයට විදේශ විනිමය වෙළෙඳපොළෙහි ද්‍රවශීලතා තත්ත්වය සහ ශ්‍රී ලංකාවේ දළ නිල සංචිත මට්ටම් සළකා බලා ශ්‍රී ලංකාවට බලපත්‍රලාභී බැංකු හරහා ලැබෙන අපනයන ආදායම්වලින් ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කළ යුතු යැයි පවත්නා තත්ත්වයන් යටතේ යෝග්‍ය හා ගැලපෙනු ඇතැයි සිතිය හැකි, එවැනි වෙනත් ප්‍රතිශතයක අවශ්‍ය පරිදි කලින් කලට පොදුවේ තීරණය කළ හැකි ය."

විදේශ විනිමය දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා මහ බැංකුව

2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2021 අංක 23 දරන විධානයන්

රාජ්‍ය තාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් සහ රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුම් පිළිබඳව බලයලත් වෙළඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්

2021.02.03 දිනැති අතිවිශෙෂ ගැසට් නිවේදන අංක 2213/38න් ප්‍රසිද්ධියට පත් කර ඇති පරිදි 2021 අංක 05 දරන විදේශ විනිමය (විදේශ විනිමය ගනුදෙනුවල නිරත වීමේ කාර්යය සඳහා ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම) නියෝග සහ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ වගන්ති 9 ප්‍රකාරව, 2021.03.18 දිනැති 2021 අංක 6 දරන විධානයන්හි 1.3.2 ඡේදයේ අයිතම (ආ) යටතේ දක්වා ඇති කරුණු පහත පරිදි සංශෝධනය කර ආදේශ කරනු ලැබේ.

"(ආ) සංචාරක අරමුණුද ඇතුළුව ගිණුම් හිමියාගේ දේශීය වියදම් සඳහා විදේශ මුදල් ආපසු ගැනීම,"

අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව

2021 ජූනි 11

විදේශ විනිමය දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා මහ බැංකුව

2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2021 අංක 24 දරන විධානයන්

ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම පිළිබඳව බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්

2021.02.03 දිනැති අතිවිශෙෂ ගැසට් නිවේදන අංක 2213/33 න් ප්‍රකාශිත 2021 අංක 5 දරන විදේශ විනිමය (විදේශ විනිමය ගනුදෙනු වල නිරත වීමේ කාර්යය සඳහා ගිණුම් විවෘත කිරීම සහ පවත්වා ගෙන යාම) නියෝග සහ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ වගන්ති 9 ප්‍රකාරව, 2021.03.18 දිනැති 2021 අංක 5 දරන විධානයන් පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

(i) විධානයන්හි ඇමුණුම I මෙයින් සංශෝධනය කර ආදේශ කරනු ලැබේ.

(ii) විධානයන්හි 1.5 ඡේදයේ දක්වා ඇති කොන්දේසි වලට අමතරව පහත ඡේදය ඇතුළත් කොට එහි **අයිතමය (ඉ)** ලෙස කියවිය යුතුය.

(ඉ) ශ්‍රී ලංකාවෙන් පිටත පදිංචිකරුවෙකුගෙන් විදේශ විනිමය උපයන බව නොසළකා හැර, අවලංගු කරන ලද විනිමය පාලන පනතේ විධිවිධාන හෝ මෙම විධිවිධාන වලට පෙර විදේශ විනිමය පනතේ විධිවිධාන යටතේ නිකුත් කරන ලද නියෝග සහ නියම යටතේ මෙම විධානයෙහි ඇමුණුම 1 හි 16 වන අයිතමයේ දක්වා ඇති නිර්ණායක සපුරාලන වක්‍ර අපනයනකරුවන් වන පුද්ගලයන් උදෙසා බලපත්‍රලාභී වෙළෙඳුන් විසින් දැනටමත් විවෘත කර ඇති ව්‍යාපාර විදේශ විනිමය මුදල් ගිණුම් පවත්වාගෙන යා හැකිය.

අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව

2021 ජූනි 17

ඇමුණුම I

පුද්ගල කාණ්ඩ

1. භාණ්ඩ අපනයනකරුවන් (වෙළඳ)
2. වෘත්තීයමය සේවා අපනයනකරුවන්
3. අතරමැදියන් ලෙස අන්තරාල වෙළෙඳාමේ යෙදී සිටින පුදුගලයන්
4. සංචාරක නියෝජිතයින් හා සංචාරක ක්‍රියාකරුවන්
5, හෝටල් හා ආපනශාලා
6. මැණික් හා ස්වර්ණාභරණ වෙළෙඳුන්
7. විදේශ සේවානියුක්ති නියෝජිත ආයතන
8. ශ්‍රී ලංකාවේ වෙළෙඳ නැව් අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන්/බලපත්‍රලත්/අවසරලත් භාණ්ඩ ප්‍රවාහනය කරන්නන් හා වෙනත් සැපයුම් සේවා සපයන්නන්
9. ශ්‍රී ලංකාවේ වෙළෙඳ නැව් අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් බලපත්‍රලත්/අවසරලත් නැව් නියෝජිතයින්
10. ශ්‍රී ලංකා ගුවන් සේවා අධිකාරීයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් බලපත්‍රලත්/අවසරලත් සාමාන්‍ය විකුණුම් නියෝජිතයින්
11. අදාළ රේඛීය අමාත්‍යාංශයෙන් අවසරලත් බංකර ක්‍රියාකරුවන්
12. වරාය පර්යන්ත ක්‍රියාකරුවන්
13. ගුවන් සේවා පර්යන්ත සේවා සපයන්නන්
14. නැව් හා ගුවන් සමාගම් සඳහා ආහාර හා පාන වර්ග සැපයුම්කරුවන්
15. තීරුබදු රහිත සාප්පු (තීරුබදු රහිත සහන යටතේ භාණ්ඩ හා සේවා සැපයීමට අවසරලත් ව්‍යාපාර)
16. ඍජු අපනයනකරුවන්ට සැපයීම සඳහා භාණ්ඩ ආනයනය කරන සහ අපනයන පිරිසැකසුම් සඳහා තාවකාලික ආනයනය (TIEP) යෝජනා ක්‍රමය යටතේ ලියාපදිංචි හෝ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ හෝ අපනයන සංවර්ධන මණ්ඩලයේ අවශ්‍යතාවය සහ/හෝ නිර්දේශයට අනුකූල වක්‍ර භාණ්ඩ අපනයනකරුවන්.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2234/19 - 2021 ජූනි මස 30 වැනි බදාදා - 2021.06.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස : I වැනි ඡේදය - සාමාන්‍ය

රජයේ නිවේදන

2017 අංක 12 දරන විදේශ විනිමය පනත

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වන වගන්තිය සමඟ කියවිය යුතු 29 වන වගන්තිය යටතේ සාදනු ලබන නියෝග

2020 නොවැම්බර් මස 17 සහ 2021 අප්‍රේල් මස 7 දිනැති පිළිවෙළින් අංක 2202/7 සහ අංක 2222/37 දරන අති විශෙෂ ගැසට් නිවේදන මගින් සංශෝධනය කරන ලද පරිදි, 2020 අප්‍රේල් මස 8, 2020 ජූලි මස 1 සහ 2020 ඔක්තෝබර් මස 6 දිනැති පිළිවෙළින් අංක 2170/4, අංක 2182/32 සහ අංක 2196/22 දරන අති විශෙෂ ගැසට් නිවේදනවල පළ කරන ලද "විශේෂ තැන්පතු ගිණුම්" පිළිබඳ නියෝගවලට (නියෝග) අමතරව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද විධානවලට අනුකූලව, විශේෂ තැන්පතු ගිණුම්වල සමුච්ඡිත කාල පරිච්ඡේදය එම තැන්පතු තැබීමේ පළමු දිනයේ සිට මාස විසි හතරක උපරිමයක් නොඉක්මවීමට යටත්ව, ඉහත නියෝග යටතේ විවෘත කරන ලද විශේෂ තැන්පතු ගිණුම් මාස හයක හෝ දොළහක කාලසීමාවලින් නැවත ආයෝජනය කිරීම සඳහා (පොලිය නොමැතිව) අවසර ප්‍රදානය කරනු ලැබේ.

එලෙස නැවත ආයෝජනය කරන ලද විශේෂ තැන්පතු ගිණුම්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විශේෂ තැන්පතු ගිණුම් පිළිබඳව නිකුත් කරන ලද විධානවලට යටත්ව, 2020 අප්‍රේල් මස 8 දිනැති අංක 2170/4 දරන අති විශෙෂ ගැසට් නිවේදනවල පළ කරන ලද නියෝගවල දක්වා ඇති පරිදි රජය විසින් පිරිනමනු ලබන අමතර පොළිය සඳහා සුදුසුකම් ලබනු ඇත.

මහින්ද රාජපක්ෂ
මුදල් අමාත්‍ය

2021 ජූනි මස 30 වැනි දින,
කොළඹ දී ය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
අති විශෙෂ
අංක 2234/20 - 2021 ජූනි මස 30 වැනි බදාදා - 2021.06.30
(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස : I වැනි ඡේදය - සාමාන්‍ය

රජයේ නිවේදන

2017 අංක 12 දරන විදේශ විනිමය පනත

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වන වගන්තිය සමඟ කියවිය යුතු 29 වන වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග

මහින්ද රාජපක්ෂ
මුදල් අමාත්‍ය

2021 ජූනි මස 30 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2021 අංක 6 දරන විදේශ විනිමය (ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන ලද ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල ආයෝජනය) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.
2. විදේශ විනිමය නියෝග ප්‍රකාරව ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකුගෙන් විදේශ ව්‍යවහාර ණය මුදලක් ලබාගෙන ඇති, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත සමාගම් (2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත අනුව මුදල් ව්‍යාපාර කටයුතුවල නිරත වන සමාගම් හැර) සඳහා, එම ණය මුදලින් සියයට පනහක් (50%) යොදා ගනිමින්, පහත නියම සහ කොන්දේසිවලට යටත්ව සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද විධානවලට අනුකූලව, ද්විතීයික වෙළෙඳපොළෙන්, ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන ලද ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර මිලදී ගැනීමට මෙයින් අවසර ප්‍රදානය කරනු ලැබේ.

   i. ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් එවැනි ඉල්ලුම්පත් සලකා බලා, එක් එක් ඉල්ලීම මත පදනම්ව අනුමැතිය ලබා දෙනු ඇත.

   ii. එම ණය මුදලින් ඉතිරි සියයට පනහක (50%) මුදල් ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජනය කළ යුතු ය.

   iii. ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරල ලද ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජන සඳහා වන අරමුදල් ප්‍රභවයන්, විදේශයන්ගෙන් බාහිර ණය ගැනීම් පමණක් ම විය යුතු අතර, ශ්‍රී ලංකාවට ආමුඛ ප්‍රේෂණ ලෙස ලැබිය යුතු ය.

   iv. විදේශ ණය ලබා ගැනීම් සඳහා පවතින, 2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ නිකුත් කරන ලද නියෝගවලට යටත්ව, සුදුසුකම්ලත් සමාගම් විසින් බලයලත් වෙළෙන්දකු සමග විවෘත කරන ලද, විදේශීය වාණිජ ණය ගැනීමේ ගිණුමකට එම ණය මුදල් ලබාගත යුතු අතර ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන ලද ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජන සම්බන්ධයෙන් වන සියලු ප්‍රේෂණ, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද විධානවලට අනුකූලව, එම විදේශීය වාණිජ ණය ගැනීමේ ගිණුම හරහා සිදු කළ යුතු ය.

   v. එසේ අත්පත් කරගන්නා ලද ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන ලද ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර කල්පිරීමෙන් ලද මුදල් සහ කුපන් (coupons) ලැබීම්, එම ආයෝජනය සිදු කරන ලද විදේශීය වාණිජ ණය ගැනීමේ ගිණුමේ බැරට ආපසු ගෙන එනු ලැබිය යුතු ය.

vi. ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන ලද ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල අනුරූප ආයෝජනයන්හි කුපන් (coupons) ලැබීම් සහ කල්පිරීමෙන් ලද මුදල් ලැබීමට එදිරිව ගැළපෙන පරිදි අනුරූප ණය ලබාගැනීම්වල පොළිය සහ ප්‍රාග්ධනය ආපසු ගෙවීම(ණය ගැනුම්කරු සහ ණය ලබාදෙන්නා අතර එකඟ වූ පරිදි) සැලසුම් කළ යුතු ය.

vii. කිසිඳු අවස්ථානුගත කරුණක් යටතේ, ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන ලද ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජනය කිරීමේ කාර්යය සඳහා විදේශයන්ගෙන් ලබාගත් එම ණය මුදල් ශ්‍රී ලංකා රුපියල් විදේශ විනිමය බවට පරිවර්තනය කිරීම මගින් ආපසු ගෙවීම සිදු නොකළ යුතු ය.

viii. තව ද, බලයලත් වෙළෙන්දා සැමවිටම, සුදුසුකම්ලත් සමාගම් විසින් යථායෝගී ව කටයුතු කරන බව සහ නියෝගවලට අනුකූලවීම සහතික කළ යුතුය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2234/49 - 2021 ජූලි මස 02 වැනි සිකුරාදා - 2021.07.02

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

රජයේ නිවේදන

2017 අංක 12 දරන විදේශ විනිමය පනත

22 වන වගන්තිය යටතේ වන නියමය

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ (පනත) 22 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මුදල් අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මා විසින්, මෙම නියමය මගින්,

i 2021 පෙබරවාරි මස 03 දිනැති අංක 2213/36 දරන අති විශේෂ ගැසට් නිවේදනවල පළ කරන ලද 2021 අංක 3 දරන නියෝගවල (මෙහි මින්මතු " 2021 අංක 3 දරන නියෝග" වශයෙන් හඳුන්වනු ලබන) උපලේඛනයේ I කොටසෙහි ප්‍රදානය කර ඇති පොදු අවසරය යටතේ, ශ්‍රී ලංකාව තුළ ඇති යම් වත්කමකින් උපලබ්ධි වූ (චංචල, නිශ්චල, ස්පර්ශ්‍ය සහ අස්පර්ශ්‍ය වත්කම් ඇතුළුව) සම්පතම පවුලේ සාමාජිකයෙකුගෙන් මුදල් ත්‍යාග ලෙස විගාමිකයෙකු ලද අරමුදල්වලින් සංක්‍රමණික දීමනාව යටතේ අරමුදල් ආපසු සියරට යැවීම අත්හිටුවීම.

ii. 2021 අංක 3 දරන නියෝගවල දක්වා ඇති පොදු අවසරය යටතේ, මෙම නියමයෙහි දිනය දක්වා, සංක්‍රමණික දීමනාවට හිමිකම් පාන ලද විගාමිකයන් විසින් ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් හරහා සංක්‍රමණික දීමනාව යටතේ අරමුදල් ආපසු සියරට යැවීම, මෙම නියමය බලපැවැත්වෙන කාල පරිච්ඡේදය තුළ, එ.ජ.ඩො. 10,000 හෝ වෙනත් ඕනෑම නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් එයට සමාන ප්‍රමාණයක උපරිමයක් දක්වා සීමා කිරීම.

iii. 2021 අංක 3 දරන නියෝගවල දක්වා ඇති පොදු අවසරය යටතේ සංක්‍රමණික දීමනාවට පළමුවරට හිමිකම් කියනු ලබන විගාමිකයන් සඳහා සුදුසුකම්ලත් සංක්‍රමණික දීමනාව, මෙම නියමය බලපැවැත්වෙන කාල පරිච්ඡේදය තුළ, එ.ජ.ඩො. 30,000 හෝ වෙනත් ඕනෑම නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් එයට සමාන ප්‍රමාණයක උපරිමයක් දක්වා සීමා කිරීම.

iv. 2021 අංක 3 දරන නියෝගවල ප්‍රදානය කර ඇති පොදු අවසරය යටතේ ඕනෑම වර්තන ආදායමක් හෝ සමුච්ඡිත වර්තන ආදායමක් (සේවක අර්ථසාධක අරමුදල, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල, පාරිතෝෂිකය සහ විශ්‍රාම වැටුප් හෝ වෙනත් ඕනෑම විශ්‍රාම ප්‍රතිලාභ ඇතුළුව) විගාමිකයන් විසින් ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් හෝ විගාමිකයන්ගේ ප්‍රේෂණය කළහැකි ආදායම් ගිණුම් හරහා ආපසු සියරට යැවීම, මෙම නියමය බලපැවැත්වෙන කාල පරිච්ඡේදය තුළ, එ.ජ.ඩො. 30,000 හෝ වෙනත් ඕනෑම නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් එයට සමාන ප්‍රමාණයක උපරිමයක් දක්වා සීමා කිරීම.

v. 2021 අංක 3 දරන නියෝගවල ප්‍රදානය කර ඇති පොදු අවසරය යටතේ ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික සහ වෙනත් රටක තාවකාලික නේවාසික වීසා ලබා ගෙන ඇති ඕනෑම ශ්‍රී ලාංකික පුද්ගලයෙකු වෙනුවෙන් කරනු ලබන ප්‍රතිමුඛ ප්‍රේෂණ හෝ විදේශ විනිමය නිකුත් කිරීම, එක් පුද්ගලයෙකු සඳහා එ.ජ.ඩො. 20,000 හෝ වෙනත් ඕනෑම නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් එයට සමාන ප්‍රමාණයක උපරිමයක් දක්වා සීමා කිරීම.

vi. 2021 පෙබරවාරි මස 03 දිනැති අංක 2213/37 දරන අති විශේෂ ගැසට් නිවේදනවල පළ කරන ලද 2021 අංක 4 දරන නියෝගවල උපලේඛනයෙහි ප්‍රදානය කර ඇති පොදු අවසරය යටතේ, වෙනත් රටක තාවකාලික නේවාසික වීසා යටතේ ශ්‍රී ලංකාව හැර යාමට අදහස් කරන ශ්‍රී ලංකාව තුළ නේවාසික ඕනෑම පුද්ගලයෙකු වෙනුවෙන් විදේශ විනිමය නිකුත් කිරීම එක් පුද්ගලයෙකු සඳහා එ.ජ.ඩො. 10,000 හෝ වෙනත් ඕනෑම නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් එයට සමාන ප්‍රමාණයක උපරිමයක් දක්වා සීමා කිරීම.

vii. 2021 පෙබරවාරි මස 03 දිනැති අංක 2213/34 දරන අති විශේෂ ගැසට් නිවේදනවල පළ කරන ලද, 2021 අංක 1 දරන විදේශ විනිමය නියෝගවල උපලේඛනයෙහි ප්‍රදානය කර ඇති පොදු අවසරය යටතේ ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන් විසින් විදේශයන්හි ආයෝජන කිරීම සඳහා ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් හරහා පහත (අ) සිට (ඈ) දක්වා අවශ්‍යතාවයන් ඉටු වන බවට විදේශ විනිමය

දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ සෑහීමකට පත් වන ගෙවීම් හැර අනෙකුත් ගෙවීම්, අත්හිටුවනු ලැබේ.

(අ) විදේශ විනිමය පනතේ විධිවිධාන යටතේ ආයෝජකයා විසින් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකුගෙන් ලබා ගන්නා විදේශ ව්‍යවහාර ණය මුදලක් මගින් මූල්‍යනය කිරීමට යෝජිත ආයෝජන, හෝ

(ආ) පනතේ හෝ අවලංගු කරන ලද විනිමය පාලන පනතේ විධිවිධානවලට අනුකූලව ආයෝජිත රටෙහි සමාගමක හෝ ශාඛා කාර්යාලයක දැනටමත් සිදු කරන ලද ආයෝජනයකට අදාළව එම රටෙහි පවතින නියාමන අවශ්‍යතාවක් සපුරාලීම සඳහා සිදු කරන අමතර ආයෝජනයක්, හෝ

(ඇ) ආයෝජිතයාගේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා එ.ජ.ඩො. 15,000 ක උපරිමයක් දක්වා, පනතේ හෝ අවලංගු කරන ලද විනිමය පාලන පනතේ විධිවිධානවලට යටත්ව දැනටමත් විදේශයක සංස්ථාපිත/පිහිටුවා ඇති පාලිත සමාගම්වල හෝ ශාඛා කාර්යාලවල සුදුසුකම්ලත් නේවාසික සමාගම් විසින් සිදු කිරීමට නියමිත අමතර ආයෝජනයක්/අරමුදල් යෙදවීමක් (අදාළ පරිදි), හෝ

(ඈ) සුදුසුකම්ලත් නේවාසික සමාගම් විසින්, පනතෙහි හෝ අවලංගු කරන ලද පනතෙහි විධිවිධානවලට යටත්ව විදේශයක දැනටමත් පිහිටුවා ඇති සම්බන්ධීකරණ, අලෙවිකරණ, අනුයෝජිත, ව්‍යාපෘති, නියෝජිත හෝ වෙනත් ඕනෑම සමාන කාර්යාල නඩත්තු කිරීමේ අරමුණ සඳහා එ.ජ.ඩො. 30,000 ක උපරිමයක් දක්වා සිදු කරන ප්‍රේෂණ.

viii. ශ්‍රී ලංකාව තුළ නේවාසික පුද්ගලයෙකුගේ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හෝ/සහ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හරහා සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු සඳහා වන ප්‍රතිමුබ ප්‍රේෂණ, මෙම නියමය බලපැවැත්වෙන කාලපරිච්ඡේදය තුළ, එ.ජ.ඩො.20, 000 හෝ වෙනත් ඕනෑම නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් එයට සමාන ප්‍රමාණයක උපරිමයක් දක්වා සීමා කිරීම.

ix. 2021 අංක දරන විදේශ විනිමය නියෝගවල ප්‍රදානය කර ඇති පොදු අවසරයෙහි නිශ්චිතව දක්වා ඇති සීමාවන් ඉක්මවා යන ආයෝජන සඳහා, පහත අවස්ථාවල දී, එක් එක් ආයෝජනය මත පදනම්ව, විදේශ විනිමය පනතෙහි 7(10) වගන්තිය ප්‍රකාරව අවසර ලබාදීම සඳහා මුදල් මණ්ඩලයට බලය පවරනු ලැබේ.

(අ) විදේශ විනිමය පනතෙහි විධිවිධාන යටතේ ආයෝජකයා විසින් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකුගෙන් ලබා ගන්නා විදේශ ව්‍යවහාර ණය මුදලක් මගින් යෝජිත ආයෝජනය මූල්‍යනය කිරීම, හෝ

(ආ) පනතේ හෝ අවලංගු කරන ලද විනිමය පාලන පනතේ විධිවිධානවලට අනුකූලව ආයෝජිත රටෙහි සමාගමක හෝ ශාඛා කාර්යාලයක දැනටමත් සිදු කරන ලද ආයෝජනයකට අදාළව එම රටෙහි පවතින නියාමන අවශ්‍යතාවක් සපුරාලීම සඳහා යෝජිත ආයෝජනය සිදු කිරීම.

මෙම නියමය, මෙම නියමයෙහි දින සිට මාස හයක කාලයක් සඳහා වලංගු වේ.

මහින්ද රාජපක්ෂ
මුදල් අමාත්‍ය

2021 ජූනි මස 30 වැනි දින,
කොළඹ දී ය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
අති විශෙෂ
අංක 2235/22 - 2021 ජූලි මස 06 වැනි අඟහරුවාදා - 2021.07.06
(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)
I **වැනි කොටස**: (I) **වැනි ඡේදය - සාමාන්‍ය**

රජයේ නිවේදන

2017 අංක 12 දරන විදේශ විනිමය පනත

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වන වගන්තිය සමග කියවිය යුතු 29 වන වගන්තිය යටතේ සාදනු ලබන නියෝග.

මහින්ද රාජපක්ෂ
මුදල් අමාත්‍ය

2021 ජූලි මස 06 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ නිකුත් කරන ලද 2021 පෙබරවාරි මස 03 දිනැති අංක 2213/35 දරන රජයේ අති විශේෂ

ගැසට් නිවේදනයෙහි පළ කරන ලද 2021 අංක 2 දරන විදේශ විනිමය (ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තෙකු විසින් ශ්‍රී ලංකාව තුළ දී සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු වර්ග) නියෝග (නියෝග), මෙමගින් පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

(1) නියෝගවල උපලේඛනයෙහි I වන කොටසෙහි 'අ' ශීර්ෂය යටතේ 1 වන ඡේදයෙහි (8) වන අනුඡේදයෙහි (උ) අයිතමය මෙමගින් අවලංගු කරනු ලබන අතර පහත අයිතමය සමග ආදේශ කරනු ලැබේ.

(උ) "කොළඹ කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගත, ශ්‍රී ලංකා රුපියල්වලින් වන ණය සුරැකුම්පත්වල"

(2) නියෝගවල උපලේඛනයෙහි I වන කොටසෙහි 'අ' ශීර්ෂය යටතේ 1 වන ඡේදයෙහි (8) වන අනුඡේදයෙහි (ඌ) අයිතමය ලෙස පහත අයිතමය ඇතුළත් කරනු ලැබේ.

(ඌ) "කොළඹ කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගත, ඕනෑම නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් වන ණය සුරැකුම්පත්වල"

(3) නියෝගවල උපලේඛනයෙහි I වන කොටසෙහි 'අ' ශීර්ෂය යටතේ 1 වන ඡේදයෙහි (11) වන අනුඡේදය ලෙස පහත අනුඡේදය ඇතුළත් කරනු ලැබේ.

(11) "උපලේඛනයෙහි මෙම කොටසේ (අ) ශීර්ෂය යටතේ, 7 සහ 8 ඡේදවල දක්වා ඇති බැහැර කිරීම් සහ සීමා කිරීම්වලට යටත්ව, කොළඹ කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගත කර ඇති සහ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සමාගම් විසින් නිකුත් කරනු ලබන, ඕනෑම නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් වන සියලුම වර්ගවල කොටස් (කොටස් සඳහා හිමිකම යටතේ වන කොටස් හෝ කොටස් බවට පරිවර්තනය කිරීම ඇතුළුව) අත්පත් කර ගැනීම, දැරීම හෝ අත්හැර දැමීම."

(4) නියෝගවල උපලේඛනයෙහි I වන කොටසෙහි 'අ' ශීර්ෂය යටතේ 4 වන ඡේදයෙහි (9) වන අනුඡේදය ලෙස පහත අනුඡේදය ඇතුළත් කරනු ලැබේ.

(9) "කිසිදු අවස්ථානුගත කරුණක් යටතේ, උපලේඛනයෙහි 1 වන කොටසෙහි 'අ' ශීර්ෂය යටතේ, (8) වන අනුඡේදයෙහි (ඌ) අයිතමය සහ (11) වන අනුඡේදය යටතේ, ශ්‍රී ලංකාවේ සමාගම් විසින් නිකුත් කරන ලද නම් කරන ලද ඕනෑම විදේශ ව්‍යවහාර මුදලකින් වන ඉහත සඳහන් ලැයිස්තුගත කොටස් හෝ ලැයිස්තුගත ණය සුරැකුම්පත්, ශ්‍රී ලංකාවේ නේවාසික විජාතිකයින් ආමුඛ ආයෝජන ගිණුම් හරහා ආයෝජන සිදු කරන අවස්ථාවක දී හැර, ශ්‍රී ලංකාවේ නේවාසික කිසිදු පුද්ගලයෙකුට විකිණීමට අවසර නොලැබේ."

(5) නියෝගවල උපලේඛනයෙහි I වන කොටසෙහි 'අ' ශීර්ෂය යටතේ 4 වන ඡේදයෙහි (10) වන අනුඡේදය ලෙස පහත අනුඡේදය ඇතුළත් කරනු ලැබේ.

(10) "ඕනෑම නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් ලැයිස්තුගත කොටස් හෝ ලැයිස්තුගත ණය සුරැකුම්පත්වල සිදු කරනු ලබන ආයෝජන සඳහා තවදුරටත් අදාළ වන කොන්දේසි.

(අ) සමාගම කොළඹ කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගතවීමට පෙර ආසන්නතම පූර්ව වර්ෂ තුන සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, එ.ජ.ඩො. මිලියන 5ක අවමයකට අවම වශයෙන් සමාන වන පරිදි, සමාගමෙහි මුළු වාර්ෂික ආදායමෙන් 50% ක අවම මට්ටමක විදේශ විනිමය ඉපැයීම් අඛණ්ඩව පවත්වාගත් විදේශ විනිමය උපයන්නෙකු විය යුතු ය (එනම්, ආයෝජිතයා). මෙම නියෝග යටතේ එලෙස සුදුසුකම් ලබන ආයෝජිතයාට, එම මට්ටමෙහිම ඉදිරි විදේශ විනිමය ඉපැයීම් ද තිබිය යුතුය.

(ආ) නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලින් නිකුත් කරන ලද ලැයිස්තුගත කොටස්වල ආයෝජනයට අනේවාසික ආයෝජකයාගේ ආමුඛ ආයෝජන ගිණුම හරහා ලැබෙන අදාළ මුදල, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද විධානවලට යටත්ව ආයෝජිතයා විසින් බලයලත් වෙළෙන්දෙකු සමග ආරම්භ කර පවත්වාගෙන යනු ලබන විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට බැර කරනු ලැබිය යුතුය.

(ඇ) ඉහත 10 වන අනුඡේදයෙහි (ආ) අයිතමය යටතේ සඳහන් කර ඇති මුදල්වලින් 60% කට සමාන ප්‍රමාණයක්, ආයෝජිතයාගේ ශ්‍රී ලංකාවෙන් පිටත සිදු කරන ඕනෑම ප්‍රාග්ධන ගනුදෙනුවක් සඳහා භාවිතා කළ හැකි ය.

(ඈ) මෙම නියෝග යටතේ අවසර ලබා දී ඇති පරිදි විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම හරහා සිදු කරන ලද එකී ආයෝජනවල යම් ආදායමක් හෝ ප්‍රාග්ධන ලැබීමක් ආයෝජිතයා විසින් බලයලත් වෙළෙන්දෙකු සමග ආරම්භ කර පවත්වාගෙන යනු ලබන එම ආයෝජන සිදු කරනු ලැබූ විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම වෙත, එම ගෙවීම් ලැබුණු දින සිට මාසයක් ඇතුළත, ශ්‍රී ලංකාව වෙත ආපසු රැගෙන එනු ලැබිය යුතු ය.

(ඉ) එලෙස ලැබෙන ලැබීම්වල ප්‍රාග්ධන ලාභයෙන් 50% ක කොටසකට සමාන ප්‍රමාණයක් විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම හරහා ශ්‍රී ලංකාවෙන් පිටත සිදු කරනු ලබන ඕනෑම ප්‍රාග්ධන ගනුදෙනුවක් සඳහා යොදාගත හැකි ය. එවැනි අඛණ්ඩ ආයෝජනවල යම් ආදායමක් හෝ ප්‍රාග්ධන ලැබීමක් ද ඉහත 10 වන අනුඡේදයේ (ඈ) අයිතමය යටතේ වන කොන්දේසියට යටත් විය යුතු ය.

(ඊ) ඕනෑම නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් නිකුත් කරන ලද ලැයිස්තුගත ණය සුරැකුම්පත්වල ආයෝජනයට අනේවාසික ආයෝජකයාගේ ආමුඛ ආයෝජන ගිණුම හරහා ලැබෙන අදාළ මුදල, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද විධාන යටතේ ආයෝජිතයා විසින් ආරම්භ කර පවත්වාගෙන යනු ලබන විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුමට බැර කරනු ලැබිය යුතු ය.

(උ) නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලින් නිකුත් කරන ලද ලැයිස්තුගත ණය සුරැකුම්පත් හෝ ලැයිස්තුගත කොටස් මත ලැබෙන යම් ආදායමක් හෝ කල් පිරීමෙන් ලද මුදල් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද විධාන යටතේ ආයෝජිතයා විසින් බලයලත් වෙළෙන්දෙකු සමග ආරම්භ කර පවත්වාගෙන යනු ලබන විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුමේ පවත්නා ආයෝජිතයාගේ විදේශ විනිමය ඉපැයීම්වලින් පමණක් ගෙවනු ලැබිය යුතු ය.

(ඌ) මේ සම්බන්ධයෙන් නිකුත් කරන ලද කොළඹ කොටස් හුවමාරුවෙහි නීතිරීති ආයෝජකයා විසින් පිළිපැදිය යුතු ය."

විදේශ විනිමය දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා මහ බැංකුව

2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2021 අංක 25 දරන විධානයන්

විශේෂ තැන්පතු ගිණුම පිළිබඳ බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරන විධානයන්

2020 අප්‍රියෙල් මස 08 දිනැති අංක 2170/4 දරන රජයේ ගැසට් පත්‍රයෙහි අතිවිශෙෂ පළ කරන ලද නියෝග, 2020 ජූලි 01 දිනැති අංක 2182/32, 2020 ඔක්තෝබර් 06 දිනැති අංක 2196/22 සහ 2021 අප්‍රියෙල් 07 දිනැති අංක 2222/37 දරන රජයේ ගැසට් පත්‍රවල අතිවිශෙෂ පසුව පළ කරන ලද නියෝග සහ 2021 ජුනි 30 දිනැති අංක 2234/19 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නියෝග (නියෝග) සහ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි (පනත) 9 වන වගන්තිය ප්‍රකාරව, පහත කොන්දේසිවලට යටත්ව, දේශීය බැංකු ඒකකයෙහි විශේෂ තැන්පතු ගිණුම් විවෘත කිරීමට සහ පවත්වාගෙන යාමට බලයලත් වෙළෙඳුන් හට අවසර ලැබේ.

2. සුදුසුකම් ලත් තැනැත්තන්

(අ) ශ්‍රී ලංකාවේ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික ශ්‍රී ලාංකික පුද්ගලයින්;

(ආ) ද්විත්ව පුරවැසිභාවය ලබාගත් පුරවැසියන්;

(ඇ) ශ්‍රීලාංකීය සම්භවයක් ඇති වෙනත් රටවල පුරවැසියන්;

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික විජාතිකයින්;

(ඉ) ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපිත/ලියාපදිංචි කළ අරමුදල්, සංස්ථාපිත මණ්ඩල සහ සංගම්;

(ඊ) සුභසිද්ධිය පතන වෙනත් ඕනෑම පාර්ශ්වයක්.

3. විශේෂ තැන්පතු ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම

(අ) 2020 අප්‍රියෙල් 08 දින සිට මාස විසිහතරක කාලයක් ඇතුලත විශේෂ තැන්පතු ගිණුම් විවෘත කළ යුතුය.

(ආ) විශේෂ තැන්පතු ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම කාලීන තැන්පතු ආකාරයෙන් පමණක් සිදු කළ යුතුය. කාලීන තැන්පතු තැබීමට අරමුදල් ලබා ගැනීමේ කාර්යය සහ කාලීන තැන්පතු අරමුදල් ශ්‍රී ලංකාවෙන් පිටතට ආපසු යැවීම සඳහා පමණක් ක්‍රියාකාරීත්ව ගිණුම් වශයෙන් විශේෂ තැන්පතු ගිණුම් ඉතුරුම් ගිණුම් ආකාරයෙන් විවෘත කළ හැකිය.

(ඇ) නම් කරන ලද ඕනෑම විදේශ ව්‍යවහාර මුදලකින් හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් විශේෂ තැන්පතු ගිණුම් විවෘත කිරීම හා පවත්වාගෙන යාම කළ යුතුය.

(ඈ) විශේෂ තැන්පතු ගිණුම් සුදුසුකම්ලත් තැනැත්තන් විසින් හවුල් ගිණුම් ලෙස පවත්වාගෙන යා හැකිය.

4. අවම කාලසීමාව:

මාස හයයි (6)

5. ගෙවිය යුතු පොළිය:

අදාළ බලයලත් වෙළෙන්දා විසින් සමාන කල්පිරීම් සහිත සාමාන්‍ය තැන්පතු සඳහා ගෙවනු ලබන තැන්පතු පොළී අනුපාතවලට අමතරව වාර්ෂිකව ප්‍රතිශතාංක එකක් (1) සහ ප්‍රතිශතාංක දෙකක් (2) පිළිවෙලින් මාස 6 ක සහ මාස 12 ක කාලසීමාවක් සහිත විශේෂ තැන්පතු ගිණුම් සඳහා විශේෂ තැන්පතු ගිණුම කල් පිරීමේදී ගෙවනු ලැබේ (තැන්පතුව පවත්වාගෙන යන ව්‍යවහාර මුදලින්).

සටහන: තැන්පතුව කල්පිරීමේදී පොළිය ගෙවනු ලබන දිනයට අදාළව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විශේෂණය කරනු ලබන දර්ශක අනුපාතයක් භාවිතයෙන් පරිවර්තිත අමතර පොළිය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලයලත් වෙළෙඳුන් හට ශ්‍රී ලංකා රුපියල් වලින් කලින් කලට ප්‍රතිපූර්ණය කරනු ලැබේ.

6. **අරමුදල් ආපසු යැවීම:** කාලීන තැන්පතුව කල්පිරීමේදී විදේශ මුදල් බවට පරිවර්තනය සහ ශ්‍රී ලංකාවෙන් පිටතට ආපසු යැවීම බාධාවකින් තොරව සිදු කළ හැකිය.

7. අවසරලත් බැර කිරීම්

(අ) බැංකු පද්ධතිය හරහා ගිණුම් හිමියාගේ නමට ශ්‍රී ලංකාවට පිටතින් ලැබෙන විදේශ මුදලින් වූ ආමුඛ ප්‍රේෂණ

(ආ) 2020 අප්‍රියෙල් 08 වනදා සිට මාස විසිහතරක කාලයක් තුළ ආමුඛ ප්‍රේෂණ ලෙස ගිණුම් හිමියාගේ ආමුඛ ආයෝජන ගිණුමකට

හෝ අක්වෙරළ බැංකු ඒකකයක පවත්වාගෙන යන ගිණුමකට ලැබුණු මුදල් වලින් වන මාරු කිරීම්

(ඇ) පනතෙහි 8 වන වගන්තිය යටතේ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරන ලද පරිදි, පැමිණෙන තොටුපොළෙහිදී රේගු දෙපාර්තමේන්තුව වෙත ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමට යටත්ව, 2020 ජනවාරි 01 දින හෝ එදිනට පසුව ශ්‍රී ලංකාවට පැමිණි ගිණුම්හිමියෙකු විසින් නීත්‍යානුකූලව අත්පත් කරගන්නා ලද සහ රැගෙන එන ලද විදේශ විනිමය

(ඈ) බලයලත් වෙළෙන්දා හට සුදුසු පරිදි කරනු ලබන ප්‍රකාශයකට යටත්ව, 2020 ජනවාරි 01 දිනට පසුව ශ්‍රී ලංකාවට පැමිණි ගිණුම් හිමියෙකු විසින් නීත්‍යානුකූලව අත්පත් කර ගන්නා ලද සහ රැගෙන එන ලද ඇ.එ.ජ. ඩොලර් 15,000 හෝ වෙනත් ඕනෑම විදේශ ව්‍යවහාර මුදලකින් එයට සමාන ප්‍රමාණයකට සමාන වන හෝ අඩුවන විදේශ විනිමය

(ඉ) බලයලත් වෙළෙන්දා හට අරමුදල්හි මූලාශ්‍රය පිළිබඳව කරන ලද ප්‍රකාශයකට යටත්ව, පනතෙහි 8 වන වගන්තිය යටතේ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරන ලද පරිදි එම කොන්දේසි සහ නියමයන්ට යටත්ව සහ එම සීමාවන් දක්වා ශ්‍රී ලංකාවෙහි නේවාසික තැනැත්තෙකු සන්තකයෙහි ඇති විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු

8. අවසරලත් හර කිරීම්

(අ) තැන්පතුව කල්පිරීමේදී ලද මුදලින් කරනු ලබන ප්‍රතිමුබ ප්‍රේෂණ

(ආ) විශේෂ තැන්පතු ගිණුම් - කාලීන තැන්පතුවල කල් පිරීමේ මුදල්, එම ගිණුම් හිමියාගේම ආමුබ ආයෝජන ගිණුමකට හෝ අක්වෙරළ බැංකු ඒකකයක පවත්වාගෙන යන ගිණුමකට මාරු කිරීම

(ඇ) 2021 පෙබරවාරි 03 දිනැති අංක 2213/35 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනයේ පළ කරන ලද 2021 අංක 2 දරන නියෝග ප්‍රකාරව, ආමුබ ආයෝජන ගිණුමක් පවත්වාගෙන යාමට සුදුසුකම් ලබන විශේෂ තැන්පතු ගිණුම් හිමියෙකු නම්, පොළියද ඇතුළුව විශේෂ තැන්පතු ගිණුම් කල් පිරීමේ මුදල්, එම ගිණුම් හිමියාගේම ආමුබ ආයෝජන ගිණුමකට මාරු කිරීම.

(ඈ) 2021 පෙබරවාරි 03 දිනැති අංක 2213/38 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනයේ පළ කරන ලද 2021 අංක 5 දරන නියෝග ප්‍රකාරව, පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් පවත්වාගෙන යාමට සුදුසුකම් ලබන විශේෂ තැන්පතු ගිණුම් හිමියෙකු නම්, පොළියද ඇතුළුව විශේෂ තැන්පතු ගිණුම් කල් පිරීමේ මුදල්, එම ගිණුම් හිමියාගේම පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට මාරු කිරීම.

(ඉ) ශ්‍රී ලංකා රුපියල් වලින් ශ්‍රී ලංකාව තුළ දී සිදු කරන ගෙවීම්

9. අනෙකුත් කොන්දේසි

(අ) එම ගිණුම් හිමියාගේ ආමුබ ආයෝජන ගිණුමක් හෝ අක්වෙරළ බැංකු ඒකකයේ පවත්වාගෙන යන ගිණුමක් හරහා අරමුදල් ලැබෙන්නේ නම්, එම අරමුදල් 2020 අප්‍රියෙල් 08 වනදා හෝ ඉන්පසුව ශ්‍රී ලංකාවට ආමුබ ප්‍රේෂණ වශයෙන් ලැබී ඇති බව බලයලත් වෙළෙඳුන් තහවුරු කර ගත යුතුය.

(ආ) අපනයන ඉපැයීම්, නේවාසික ආයෝජකයන් විසින් ශ්‍රී ලංකාවෙන් පිටත සිදු කරන ලද ආයෝජනවල ප්‍රතිලාභ/විකිණීම මගින් ලද මුදල් සහ ලැබිය යුතු මුදල් වැනි වෙනත් නියාමන අවශ්‍යතාවන්ට යටත් වන ආමුබ ප්‍රේෂණ හෝ වෙනත් ඕනෑම ව්‍යවස්ථාපිත අවශ්‍යතාවකට යටත් වන වෙනත් ආමුබ ප්‍රේෂණ, විශේෂ තැන්පතු ගිණුමට බැර කිරීමට සුදුසුකම් නොලබන බව බලයලත් වෙළෙඳුන් තහවුරු කරගත යුතුය.

(ඇ) මාස 6 හි අවම කල්පිරීමේ කාලසීමාවට පෙර සිදු කරනු ලබන ආපසු ගැනීම් අධෛර්යමත් කළ යුතුය. විශේෂ තැන්පතු ගිණුම් වලින් කල්පිරීමට පෙර සිදු කරනු ලබන ආපසු ගැනීම් ඉහත 5 වන ඡේදය පරිදි අමතර පොළියක් ගෙවනු ලැබීම සඳහා සුදුසුකම් නොලැබිය යුතුය.

(ඈ) නියෝග යටතේ මාස හයක හෝ දොළහක කාලසීමාවලින් නැවත ආයෝජනය කරන ලද විශේෂ තැන්පතු ගිණුම්, 2020 අප්‍රියෙල් මස 08 දිනැති අංක 2170/4 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයෙහි දක්වා ඇති පරිදි තැන්පතු කාලසීමාවන් සඳහා අමතර පොළියක් ලැබීමට සුදුසුකම් ලබනු ඇත.

(ඉ) විශේෂ තැන්පතු ගිණුම් ඇපකර වශයෙන් තබාගෙන, බලයලත් වෙළෙඳුන්ට ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයන් වෙත ශ්‍රී ලංකා රුපියල්වලින් ණය ප්‍රදානය කිරීම සඳහා සලකා බැලිය හැකිය. තවද, 2021 පෙබරවාරි 03 දිනැති අංක 2213/37 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද 2021 අංක 04 දරන නියෝගවල අවසර දී ඇති පරිදි ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික ඕනෑම පුද්ගලයෙකු හට ණය ප්‍රදානය කිරීමට අදාළ නියෝගවලට යටත්ව, එවැනි පුද්ගලයන් හට ශ්‍රී ලංකා රුපියල්වලින් හෝ විදේශ ව්‍යවහාර මුදලින් ණය ප්‍රදානය කිරීම සඳහා ඇපකර වශයෙන් විශේෂ තැන්පතු ගිණුම් යොදා ගත හැකිය.

(ඊ) ඉහත 8 (ඉ) ඡේදය යටතේ ආපසු ලබාගන්නා ලද අරමුදල් විශේෂ තැන්පතු ගිණුමකට නැවත බැර කළ නොහැකිය.

(උ) අනුරූපී බැංකු සබැඳියාවන් හේතුවෙන් ගිණුම් හිමියා වෙනුවෙන් ආමුබ ප්‍රේෂණ වෙනත් බලයලත් වෙළෙන්දෙකු මාර්ගයෙන් ලැබෙන්නේ නම්, එම ආමුබ ප්‍රේෂණ ලබන බලයලත් වෙළෙන්දා විසින් එකී අරමුදල් මාරු කරන අවස්ථාවේදී එකී අරමුදල් නියමිත පරිදි ආමුබ ප්‍රේෂණ ලෙස ලැබී ඇති බවට ප්‍රකාශ කරමින් විශේෂ තැන්පතු ගිණුම විවෘත කිරීමට නියමිත බලයලත් වෙළෙන්දා වෙත තහවුරුවක් නිකුත් කළ යුතුය.

(ඌ) අරමුදල්, නියෝගයට අනුකූලව ගිණුම් හිමියාගේ විශේෂ තැන්පතු ගිණුමට බැර කරන ලද බවට සහ එම ගිණුමෙන් හර කරන ලද බවට, විශේෂ තැන්පතු ගිණුම පවත්වාගෙන යන බලයලත් වෙළෙන්දාගෙන් තහවුරුවක් ලබා ගැනීමට යටත්ව, විශේෂ තැන්පතු ගිණුම පවත්වාගෙන යනු ලබන බලයලත් වෙළෙන්දා හැර වෙනත් බලයලත් වෙළෙන්දෙකු මගින් ගිණුම් හිමියාට ප්‍රතිමුබ ප්‍රේෂණ සිදු කළ හැකිය.

(එ) තැන්පතුව විවෘත කරන අවස්ථාවේදී, බලයලත් වෙළෙඳුන් විසින් විශේෂ තැන්පතු ගිණුම්වලට අදාළ නියම සහ කොන්දේසි පිළිබඳව පාරිභෝගිකයා දැනුවත් කළ යුතුය.

(ඒ) මෙම නියෝග යටතේ විශේෂ තැන්පතු ගිණුම්, තැන්පතු කල් පිරීම සඳහා නම් කරන ලද දිනය ඉක්මවීමෙන් පසුව ද "විශේෂ තැන්පතු ගිණුම" නමින් දේශීය බැංකු ඒකකයෙහි, සාමාන්‍ය කාලීන තැන්පතු ලෙස තවදුරටත් පවත්වාගෙන යාමට බලයලත් වෙළෙඳුන්ට හැකියාව ඇත. මෙලෙස තැන්පතු කල් පිරීම සඳහා නම් කරන ලද දිනය ඉක්මවීමෙන් පසුව පවත්වාගෙන යන විශේෂ තැන්පතු ගිණුම් සඳහා බලයලත් වෙළෙඳුන් විසින් අනෙකුත් කාලීන තැන්පතු සඳහා ප්‍රදානය කරනු ලබන සාමාන්‍ය තැන්පතු පොළී අනුපාත පමණක් ප්‍රදානය කළ යුතුය.

(ඔ) 2021 අප්‍රියෙල් මස 08 දින සිට 2021 ජුනි 30 දිනැති අංක 2234/19 දරන නියෝගවල දිනය දක්වා කාලපරිච්ඡේදය තුළ සාමාන්‍ය කාලීන තැන්පතු සඳහා බලයලත් වෙළෙඳුන් විසින් පිරිනමන ලද පොළිය සඳහා පමණක් සුදුසුකම් ලැබූ විශේෂ තැන්පතු ගිණුම් නමින් සාමාන්‍ය කාලීන තැන්පතු ලෙස ඉදිරියට පවත්වාගෙන යනු ලැබූ විශේෂ තැන්පතු ගිණුම්, නියෝග යටතේ නැවත ආයෝජනය කරන ලද විශේෂ තැන්පතු ගිණුම් ලෙස සැලකිය හැකි අතර, ගිණුම් හිමියාගේ ඉල්ලීම මත නියෝගවල අවසර ලබා දී ඇති පරිදි අමතර පොළිය සඳහා සුදුසුකම් ලබනු ඇත.

10. වාර්තා කිරීමේ අවශ්‍යතාවය

(අ) බලයලත් වෙළෙඳුන් විසින් dfem@cbsl.lk විද්‍යුත් තැපෑල හරහා මෙම දෙපාර්තමේන්තුව වෙත පහත පරිදි විශේෂ තැන්පතු ගිණුම් පිළිබඳ තොරතුරු සැපයීම අවශ්‍ය වේ.

(i) එළඹෙන සතියේ 2 වන රාජකාරි දිනය අවසන් වීමට පෙර, මෙම විධානවල ඇමුණුම I හි දැක්වෙන ආකෘතියට අනුව, **සතිපතා**, සහ

(ii) එළඹෙන මාසයේ 15 වන දින හෝ ඊට පෙර, මෙම විධානවල ඇමුණුම II හි දැක්වෙන ආකෘතියට අනුව, **මාසිකව**

(ආ) ඉහත වාර්තා කිරීමේ අවශ්‍යතාවන්ට අනුව බලයලත් වෙළෙඳුන් විසින් අදාළ බැංකුවල ගිණුම් පොත්වලින් අදාළ තොරතුරු ජනනය කිරීම හෝ උපුටා ගැනීම සඳහා බැංකුව තුළ පද්ධතියක් ස්ථාපනය කිරීම අවශ්‍ය වේ.

11. 2021 අප්‍රියෙල් මස 07 දිනැති 2021 අංක 21 දරන විධානයන් යටතේ විශේෂ තැන්පතු ගිණුම් පිළිබඳව බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරන ලද පූර්ව විධානයන් මෙමගින් අවලංගු කරනු ලැබේ.

12. ඉහත 11 වන ඡේදයෙහි දක්වා ඇති පූර්ව විධානයන් අවලංගු කිරීම මගින් එම අවලංගු කිරීමට පෙර ඒවා යටතේ උපචිත යම් අයිතියකට හෝ දැරිය යුතු වූ දඩ මුදල් හෝ වගකීම්වලට බලපෑමක් සිදු නොවිය යුතුය.

අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව
2021 ජුලි 8 වැනි දින

2021 අංක 25 දරන විධානවල ඇමුණුම I

විශේෂ තැන්පතු ගිණුම්වල සතිපතා ප්‍රකාශනය - කාලීන තැන්පතු
බැංකුවෙහි නම:
වාර්තා කරන සතිය, මාසය සහ වර්ෂය:

1 වන වගුව සතිය තුළ විවෘත කරන ලද විශේෂ තැන්පතු ගිණුම්

ශාඛාව	ශාඛා කේතය	ගිණුම් හිමියාගේ නම	ගිණුම් හිමියාගේ නේවාසික භාවය	ජා.හැ.ප විදේශ ගමන් බලපත්‍ර අංකය	ව්‍යවහාර මුදල් සංකේතය	ගිණුම් අංකය	විවෘත කළ දිනය (dd-mm-yy)	තැන්පතුවේ ප්‍රමාණය	තැන්පතු කාලසීමාව මාස වලින් (අදාළ තීරය සලකුණු කරන්න)		කල්පිරීමේ දිනය (dd-mm-yy)	බැංකුව විසින් ප්‍රදානය කරන ලද සාමාන්‍ය පොළී අනුපාතය (ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රදානය කරන ලද අමතර පොළිය හැර) (වාර්ෂිකව1%)	අදාළ අමතර පොළී අනුපාතය (මාස 6ක් සඳහා වාර්ෂිකව 1% හෝ මාස 12 ක් සඳහා වාර්ෂිකව 2%	කල්පිරීමේදී බැංකුව විසින් ගෙවීමට නියමිත පොළිය (ප්‍රමාණය)	ශ්‍රී ලංකා මහ බැංකුවේ හිමිකම් පෑ යුතු පොළිය (ප්‍රමාණය)
									6	12					
					එ.ජ.ඩොලර්										
					යූරෝ										
					ශ්‍රී ලංකා රුපියල්										

2 වන වගුව - සතිය තුළ විවෘත කරන ලද විශේෂ තැන්පතු ගිණුම්වල අරමුදල් මූලාශ්‍රය

ව්‍යවහාර මුදල් සංකේතය	ආමුඛ පර්යේෂණ	මාරු කිරීම්		විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු
		ආමුඛ ආයෝජන ගිණුම්වල සිට	අක්වෙරළ බැංකු ඒකකයෙහි ගිණුම්වල සිට	
එ.ජ.ඩොලර්				
යූරෝ				
ශ්‍රී ලංකා රුපියල්				

සටහන: * සටහන එකම පුද්ගලයා තැන්පතු කිහිපයක් පවත්වාගෙන යන්නේ නම් සෑම තැන්පතුවක් සඳහාම වෙන වෙනම පේළි භාවිතා කරන්න.
** ගිණුම් හිමියාගේ නේවාසිකභාවය R - නේවාසික
NR - නේවාසික නොවන
*** අනෙකුත් නම්කරන ලද විදේශ ව්‍යවහාර මුදල් සඳහා අවශ්‍ය පරිදි පේළි වැඩිකරගත හැකිය.

ඉහත පරිදි සකස් කරන ලද වාර්තාවල ස්කෑන් කරන ලද සහ MS Excel යන පිටපත් දෙකම බලයලත් වෙළඳුන් විසින් සැපයීම අවශ්‍යවේ. බැංකුවෙහි ගිණුම් පොත් වලින් උපුටාගත්/ ජනනය කරන ලද ඉහත තොරතුරු සත්‍ය බවට තහවුරු කරමු.

බලයලත් නිලධාරියාගේ නම : .....
අත්සන : .....
දිනය : .....

අනුකූලතා නිලධාරියාගේ නම සහ මුද්‍රාව : .....
අත්සන : .....
දිනය : .....

වසර තුළදී රජය හා මුදල් මණ්ඩලය විසින් උපයෝගී කරගනු ලැබූ පරිපාලන සැකසුම් විධිවිධාන

2021 අංක 25 දරන විධානවල ඇමුණුම II හි පිටු අංක 1

කල් පිරුණු/ නැවත ආයෝජනය කළ / සාමාන්‍ය තැන්පතු ලෙස ඉදිරියට පවත්වාගෙන යන විශේෂ තැන්පතු ගිණුම්වල මාසික ප්‍රකාශනය

බැංකුවෙහි නම:

වාර්තා කරන සතිය, මාසය සහ වර්ෂය:

1 වන වගුව - 2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ නිකුත් කරන ලද 2021 අංක 25 දරන විධානවල 9 (ඇ) ඡේදය යටතේ මාසය තුළදී නැවත ආයෝජනය කරන විශේෂ තැන්පතු ගිණුම්

ශාඛාව	ශාඛා කේතය	ගිණුම් හිමියාගේ නම	ගිණුම් හිමියාගේ නේවාසික භාවය	ජා.හැ.ප විදේශ ගමන් බලපත්‍ර අංකය	ව්‍යවහාර මුදල් සංකේතය	ගිණුම් අංකය	නැවත ආයෝජනය කළ දිනය (dd-mm-yy)	තැන්පතුවේ ප්‍රමාණය	තැන්පතු කාලසීමාව මාස වලින් (අදාළ තීරය සලකුණු කරන්න)		කල්පිරීමේ දිනය (dd-mm-yy)	බැංකුව විසින් ප්‍රදානය කරන ලද සාමාන්‍ය පොළී අනුපාතය (ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රදානය කරන ලද අමතර පොළිය හැර) (වාර්ෂිකව1%)	අදාළ අමතර පොළිය (මාස 6ක් සඳහා වාර්ෂිකව 1% හෝ මාස 12 ක් සඳහා වාර්ෂිකව 2%	කල්පිරීමේදී බැංකුව විසින් ගෙවීමට නියමිත පොළිය (ප්‍රමාණය)	ශ්‍රී ලංකා මහ බැංකුවේ හිමිකම් පෑ යුතු පොළිය (ප්‍රමාණය)
									6	12					
					එ.ජ.ඩොලර්										
					යූරෝ										
					ශ්‍රී ලංකා රුපියල්										

2 වන වගුව - 2017 අංක 12 දරණ විදේශ විනිමය පණත යටතේ නිකුත් කරන ලද 2021 අංක 25 දරන විධානවල 9 (ඒ) ඡේදය යටතේ, මාසය තුළදී සාමාන්‍ය තැන්පතු ලෙස ඉදිරියට පවත්වාගෙන යන විශේෂ තැන්පතු ගිණුම්

ශාඛාව	ශාඛා කේතය	ගිණුම් හිමියාගේ නම	ගිණුම් හිමියාගේ නේවාසික භාවය	ජා.හැ.ප විදේශ ගමන් බලපත්‍ර අංකය	ව්‍යවහාර මුදල් සංකේතය	ගිණුම් අංකය	සාමාන්‍ය තැන්පතුවක් ලෙස ඉදිරියට පවත්වාගෙනයාම ආරම්භ කළ දිනය (dd-mm-yy)	තැන්පතුවේ ප්‍රමාණය	කල්පිරීමේ දිනය (dd-mm-yy)	බැංකුව විසින් ප්‍රදානය කරන ලද සාමාන්‍ය පොළී අනුපාතය	කල්පිරීමේදී බැංකුව විසින් ගෙවීමට නියමිත පොළිය (ප්‍රමාණය)
					එ.ජ.ඩොලර්						
					යූරෝ						
					ශ්‍රී ලංකා රුපියල්						

3 වන වගුව - 2017 අංක 12 දරණ විදේශ විනිමය පණත යටතේ නිකුත් කරන ලද 2021 අංක 25 දරන විධානවල 9 (ඇ) ඡේදය යටතේ නැවත ආයෝජනය නොකළ හෝ 9 (ඒ) ඡේදය යටතේ සාමාන්ය තැන්පතු ලෙස ඉදිරියට ගෙනයාම සිදු නොකළ, මාසය තුළදී කල් පිරුණු විශේෂ තැන්පතු ගිණුම්

ශාඛාව	ශාඛා කේතය	ගිණුම් හිමියාගේ නම	ගිණුම් හිමියාගේ නේවාසික භාවය	ජා.හැ.ප විදේශ ගමන් බලපත්‍ර අංකය	ව්‍යවහාර මුදල් සංකේතය	ගිණුම් අංකය	සාමාන්‍ය තැන්පතුවක් ලෙස ඉදිරියට පවත්වාගෙනයාම ආරම්භ කළ දිනය (dd-mm-yy)	තැන්පතුවේ ප්‍රමාණය	කල්පිරීමේ දිනය (dd-mm-yy)	බැංකුව විසින් ප්‍රදානය කරන ලද සාමාන්‍ය පොළී අනුපාතය	කල්පිරීමේදී බැංකුව විසින් ගෙවීමට නියමිත පොළිය (ප්‍රමාණය)
					එ.ජ.ඩොලර්						
					යූරෝ						
					ශ්‍රී ලංකා රුපියල්						

4 වන වගුව - 2017 අංක 12 දරණ විදේශ විනිමය පණත යටතේ නිකුත් කරන ලද 2021 අංක 25 දරන විධානවල 9 (ඇ) ඡේදය යටතේ නැවත ආයෝජනය නොකළ හෝ 9(ඒ) ඡේදය යටතේ සාමාන්ය තැන්පතු ලෙස ඉදිරියට ගෙනයාම සිදු නොකළ, මාසය තුළදී කල් පිරුණු විශේෂ තැන්පතු ගිණුම් වලින් හර කිරීම් සිදු කරන ලද ආකාරය

ව්‍යවහාර මුදල් සංකේතය	ශ්‍රී ලංකාව තුළදී ආපසු ගන්නා ලද	ශ්‍රී ලංකාවෙන් පිටතට ප්‍රේෂණය කරන ලද	මාරු කරන ලද		
			ආමුඛ ආයෝජන ගිණුම් වෙත	පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් වෙත	අක්වෙරළ බැංකු ඒකකයෙහි ගිණුම් වෙත
එ.ජ.ඩොලර්					
යූරෝ					
ශ්‍රී ලංකා රුපියල්					

සටහන: * එකම පුද්ගලයා තැන්පතු කිහිපයක් පවත්වාගෙන යන්නේ නම් සෑම තැන්පතුවක් සඳහාම වෙන වෙනම පේළි භාවිතා කරන්න.

** ගිණුම් හිමියාගේ නේවාසිකභාවය R - නේවාසි
NR - නේවාසික නොවන

*** අනෙකුත් නම්කරන ලද විදේශ ව්‍යවහාර මුදල් සඳහා අවශ්‍ය පරිදි පේළි වැඩිකරගත හැකිය.

ඉහත පරිදි සකස් කරන ලද වාර්තාවල ස්කෑන් කරන ලද සහ MS Excel යන පිටපත් දෙකම බලයලත් වෙළඳුන් විසින් සැපයීම අවශ්‍යවේ. බැංකුවෙහි ගිණුම් පොත් වලින් උපුටාගත්/ ජනනය කරන ලද ඉහත තොරතුරු සත්‍ය බවට තහවුරු කරමු.

බලයලත් නිලධාරියාගේ නම : .....
අත්සන : .....
දිනය : .....

අනුකූලතා නිලධාරියාගේ නම සහ මුද්‍රාව : .....
අත්සන : .....
දිනය : .....

විදේශ විනිමය දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2021 අංක 26 දරන විධානයන්

කොළඹ කොටස් හුවමාරුවෙහි විදේශ ව්‍යවහාර මුදලින් නිරූපිත ආයෝජන සඳහා පහසුකම් සැලසීම සඳහා පවත්වාගෙන යන විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් සම්බන්ධව බලයලත් වෙළෙඳුන් හට නිකුත් කෙරෙන විධානයන්

2021.07.06 වන දින අංක 2235/2 දරණ රජයේ ගැසට් (අති විශෙෂ) නිවේදනයේ පළ කරන ලද රෙගුලාසිය මගින් සංශෝධනය කළ, 2021.02.03 වන දිනැති අංක 2213 දරණ රජයේ ගැසට් (අති විශෙෂ) නිවේදනයේ පළ කරන ලද ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික පුද්ගලයකු විසින් ශ්‍රී ලංකාව තුළ සිදුකර ඇති ප්‍රාග්ධන ගනුදෙනු වර්ග පිළිබඳව 2021 අංක 02 දරණ රෙගුලාසිය සහ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි වගන්ති අංක 06 සහ 07 සමඟ කියවිය යුතු වගන්ති අංක 09 ප්‍රකාරව, කොළඹ කොටස් හුවමාරුවෙහි විදේශ ව්‍යාවහාර මුදලින් නම් කළ ආයෝජන සඳහා පහසුකම් සැළසීමට, විශේෂ විදේශ ව්‍යාවහාර මුදල් ගිණුම් ආරම්භ කිරීමට හා පවත්වාගෙන යාමට පහත කොන්දේසි වලට යටත්ව බලයලත් වෙළෙඳුන් හට අවසර හිමිවේ.

2. සුදුසුකම් ලබන පුද්ගලයන්

අදාළ රෙගුලාසි මගින් නියම කර ඇති පරිදි, කොළඹ කොටස් හුවමාරුවෙහි නම් කරන ලද ඕනෑම විදේශ ව්‍යවහාර මුදලකින් නම් කළ කොටස්/ ණය සුරැකුම්පත් ලැයිස්තුගත කර ඇති, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවෙහි සංස්ථාගත සමාගම්.

3. ගිණුම් ආරම්භ කිරීම සහ පවත්වා ගෙන යාම

(අ) කොළඹ කොටස් හුවමාරුවෙහි කොටස් හෝ ණය සුරැකුම්පත් ලැයිස්තුගත කර ඇති නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින්, ඉතුරුම් හෝ කාලීන තැන්පතු ගිණුම් ස්වරූපයෙන් විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් ආරම්භ කර පවත්වා ගෙන යා හැකිය.

(ආ) බලයලත් වෙළෙන්දෙකුගෙන් ගිණුම්හිමියෙකු විසින් ලබා ගන්නා ලද ශ්‍රී ලංකා රුපියල් ණය මුදලක් විදේශ විනිමය අවදානම අවම කිරීම සඳහා උකසක් ලෙස තැබීමේ අරමුණින් විශේෂ විදේශ ව්‍යවහාර මුදල් කාලීන තැන්පතු ගිණුම් ආරම්භ කළ හැකිය.

(ඇ) සුදුසුකම් ලත් පුද්ගලයන් බැංකු පද්ධතිය තුළ මෙම විධාන මගින් අවසර දී ඇති පරිදි එක් විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් පමණක් විවෘත කළ යුතු අතර එය තනිපුද්ගල ගිණුමක් ලෙස පවත්වා ගත යුතුය.

4. අවසර ලත් බැර කිරීම්

(අ) මෙම රෙගුලාසි ප්‍රකාරව කොළඹ කොටස් හුවමාරුවෙහි ඕනෑම නම් කළ විදේශ ව්‍යවහාර මුදලකින් නම්කරන ලද ලැයිස්තුගත කොටස්වලින් ලත් අරමුදල් ලෙස, සුදුසුකම් ලත් ආයෝජකයෙකුගේ ආමුඛ ආයෝජන ගිණුමකින් සිදු කරන අරමුදල් පැවරුම්;

(ආ) රෙගුලාසි ප්‍රකාරව කොළඹ කොටස් හුවමාරුවෙහි නම් කර ඇති ඕනෑම විදේශ ව්‍යවහාර මුදලකින් නම් කරන ලද ලැයිස්තුගත ණය සුරැකුම්පත්වලින් ලත් අරමුදල් ලෙස, සුදුසුකම් ලත් ආයෝජකයෙකුගේ ආමුඛ ආයෝජන ගිණුමකින් අරමුදල් මාරු කිරීම;

(ඇ) රෙගුලාසි ප්‍රකාරව ශ්‍රී ලංකාවට පිටතින් සිදු කරන ප්‍රාග්ධන ගනුදෙනුවලින් ලැබෙන ඕනෑම ආදායමක් හෝ ප්‍රාග්ධන අරමුදල් ලෙස, ගිණුම්හිමියාගේ නමට ශ්‍රී ලංකාවට පිටතින් බැංකු පද්ධතිය හරහා විදේශ විනිමයෙන් සිදු කර ප්‍රේෂණ;

(ඈ) පහත 5 (අ) ඡේදයේ සඳහන් අරමුණු සඳහා ගිණුම්හිමියාගේ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකින් හෝ අක්වෙරළ බැංකු ඒකකයෙහි පවත්වා ගෙන යන ගිණුමකින් විදේශ විනිමයෙන් ලත් ඉපැයුම් මාරු කිරීම; සහ

(ඉ) විදේශ ව්‍යවහාර මුදලින්, ගිණුමෙහි පවත්වා ගෙන යන අරමුදල් මත උපයන ලද පොලිය.

5. අවසර ලත් හර කිරීම්

(අ) මෙම රෙගුලාසි යටතේ අවසර දී ඇති පරිදි, ආමුඛ ආයෝජන ගිණුම්හිමියා විසින් කොළඹ කොටස් හුවමාරුවෙහි නම් කළ ඕනෑම විදේශ ව්‍යවහාර මුදලකින් නම් කරන ලද ලැයිස්තුගත කොටස් හෝ ලැයිස්තුගත ණය සුරැකුම්පත්වලින් සිදු කළ ආයෝජන කල් පිරීමේදී ලැබෙන මුදල් හෝ ආයෝජකයාට ගෙවිය යුතු ඕනෑම ආදායමක් සුදුසුකම්ලත් ආයෝජකයෙකුගේ ආමුඛ ආයෝජන ගිණුමකට මාරු කිරීම්;

(ආ) ගිණුම්හිමියාගේ ජංගම ගනුදෙනුවලට අදාළව සිදු කරන ප්‍රතිමුඛ ප්‍රේෂණ;

(ඇ) මෙම රෙගුලාසිවල දක්වා ඇති එබඳු සීමා සහ කොන්දේසිවලට යටත්ව, ණය සුරැකුම්පත්වල ආයෝජනයෙන් ලත් මුදල් හැර, ඉහත 4 (අ) සහ 4 (ඇ) පරිච්ඡේද ප්‍රකාරව ලැබෙන අරමුදල් ලෙස ගිණුම්හිමියාගේ ප්‍රාග්ධන ගනුදෙනු සඳහා සිදු කරන ප්‍රතිමුඛ ප්‍රේෂණ; සහ

(ඈ) ශ්‍රී ලංකා රුපියල්වලින්, ශ්‍රී ලංකාවෙහි සිදු කරන වියපැහැදම්.

6. අනෙකුත් කොන්දේසි

(අ) මෙම විශේෂ විදේශ ව්‍යවහාර ගිණුම් කිසිදු අවස්ථාවක දී එහි පවත්නා ශේෂය ඉක්මවා ගනුදෙනු සිදු නොකළ යුතුය.

(ආ) බලයලත් වෙළෙඳුන් විසින් අයදුම්කරුට ගිණුම විවෘත කිරීමට ඇති සුදුසුකම තීරණය කිරීම සඳහා මෙම විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම ආරම්භ කරන අවස්ථාවේ දී, අදාළ වන පරිදි, අදාළ අධිකාරිය/ අධිකාරීන් විසින් අවසර ලබා දී තිබීම ද ඇතුලත් ප්‍රමාණවත් ලේඛනමය සාක්ෂි ලබා ගත යුතුය.

(ඇ) බලයලත් වෙළෙඳුන් විසින්, මෙම රෙගුලාසි සහ මෙම විධානයන් ප්‍රකාරව, මෙම විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම හරහා විදේශ විනිමයෙන් ගනුදෙනු සිදු කිරීමේ දී, එබඳු ගනුදෙනු පිළිබඳ නිසි සුපරීක්ෂාවකින් ක්‍රියා කළ යුතුය.

(ඈ) බලයලත් වෙළෙඳුන් විසින් මෙම ගිණුම පවත්වා ගෙන යාමේ දී පවත්නා ඕනෑම වාර්තා තබා ගැනීමේ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවට වඩා වැඩි කාලයක් විශේෂ ව්‍යවහාර මුදල් ගිණුම ඔස්සේ සිදු කළ ගනුදෙනුවලට අදාළව ලේඛනමය සාක්ෂි (දෘඪ පිටපත් හෝ විද්‍යුත් / ඩිජිටල් දත්ත ස්වරූපයෙන්) පවත්වා ගෙන යා යුතුය.

7. තොරතුරු වාර්තා කිරීමේ අවශ්‍යතාව

(අ) මෙම විධානවල ඇමුණුම **I** ට අනුව බලයලත් වෙළෙඳුන් විසින් මෙම දෙපාර්තමේන්තුව වෙත ?ැපෙ?ජඉිකගකන නමැති විද්‍යුත් තැපැල් ලිපිනය වෙත මාසයේ 15 වන දින හෝ ඊට පෙර කාර්තුමය පදනමක් මත වාර්තාවක් යොමු කිරීමට අවශ්‍ය වේ.

(ආ) බලයලත් වෙළෙඳුන් විසින් ඉහත වාර්තා සකස් කිරීමේ අවශ්‍යතාව සඳහා, බැංකුවෙහි ගිණුම් පොත්වලින් අදාළ තොරතුරු ලබා ගැනීමට හෝ උකහා ගැනීමට බැංකුව තුළ ක්‍රම පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වේ.

8. විශේෂ විදේශ ව්‍යවහාර ගිණුම් වසා දැමීම

(අ) ගිණුම්හිමියා විසින් නිකුත් කළ, නම් කළ විදේශ ව්‍යවහාර මුදලකින් නම් කරන ලද කොටස් හෝ ණය සුරැකුම්පත්, කොළඹ කොටස් හුවමාරු ලේඛනයෙන් ඉවත් කර ඇති අවස්ථාවක දී සහ/හෝ ගිණුම්හිමියා තවදුරටත් විශේෂ විදේශ ව්‍යවහාර ගිණුමක් පවත්වා ගෙන යාමට සුදුසුකම් නොලබන අවස්ථාවේ දී, බලයලත් වෙළෙඳුන් විසින් මෙම විශේෂ විදේශ ව්‍යවහාර ගිණුම වසා දැමිය යුතුය.

(ආ) බලයලත් වෙළෙඳුන් විසින් එවැනි ගිණුම් වසා දැමීමක්, එය සිදු කළ දිනයේ සිට සතියක් ඇතුළත dfem@cbsl.lk යන විද්‍යුත් තැපැල් ලිපිනය වෙත විද්‍යුත් තැපැල් පණිවුඩයක් යොමු කිරීමෙන් විදේශ විනිමය දෙපාර්තමේන්තුවෙහි අධ්‍යක්ෂවරයා දැනුවත් කළ යුතුය.

9. මෙම විධානයන්හි කාර්යය සඳහා අර්ථකථන:

(අ) **"ප්‍රේෂණ"** යනු විදුලි පැවරුම්, අනෙකුත් අන්තර් බැංකු හුවමාරු, බැංකු අණකර, අනෙකුත් ගෙවීම් උපකරණ, ව්‍යවහාර මුදල් නෝට්ටු හැරුනු විට අනෙකුත් පිළිගත් ජාත්‍යන්තර ගෙවීම් ක්‍රම හෝ කවුලු හරහා ලැබෙන ගෙවීම් හෝ විදේශ විනිමය සම්ප්‍රේෂණ සමාගම්/ ආයතන හරහා ලැබෙන අරමුදල් වේ;

(ආ) **"කොටස් සහ ණය සුරැකුම්පත්"** යන්නෙන් සංශෝධිත පරිදි, 2021 අංක 02 දරන විදේශ විනිමය (ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික පුද්ගලයෙකු විසින් ශ්‍රී ලංකාව තුළ සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු වර්ග) රෙගුලාසි ප්‍රකාරව දක්වා ඇති අර්ථය හා සමාන අර්ථයක් ගත යුතු වේ;

(ඇ) **"ජංගම ගනුදෙනු"** යන්නෙන් 2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි දැක්වෙන අර්ථය ම අදහස් විය යුතුය;

(ඈ) **"ප්‍රාග්ධන ගනුදෙනු"** යන්නෙන් 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දක්වා ඇති අර්ථය හා සමාන අර්ථයක් ගත යුතු වේ.

(ඉ) **"නම් කළ විදේශ ව්‍යවහාර මුදලක්"** යන්නෙන් 2021.02.03 දිනැති අංක 2213/38 දරන රජයේ ගැසට් (අති විශේෂ) නිවේදනයේ පළ කරන ලද 2021 අංක 5 දරන විදේශ විනිමය (විදේශ විනිමය ගනුදෙනුවල නිරත වීමේ කාර්යය සඳහා ගිණුම් ආරම්භ කිරීම සහ පවත්වා ගෙන යාම) නියෝග ප්‍රකාරව දැක්වෙන අර්ථය ම අදහස් විය යුතුය;

(ඊ) **"සුදුසුකම්ලත් ආයෝජකයෙකු"** යන්නෙන් සංශෝධිත පරිදි, 2021 අංක 02 දරන විදේශ විනිමය (ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තෙකු විසින් ශ්‍රී ලංකව තුළදී සිදුකරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු වර්ග) නියෝගවල උපලේඛනයෙහි VI වන කොටසෙහි I වන පරිච්ඡේදයෙහි සඳහන් ආමුඛ ආයෝජන ගිණුම් ආරම්භ කිරීමට සහ පවත්වා ගෙන යාමට සුදුසුකම් ලත් පුද්ගලයෙකු යන්න අදහස් විය යුතුය.

11. මෙම විධානවල අවසර ලබාදුන් කිසිවක් වෙනත් ඕනෑම නීතියක විධිවිධාන සමඟ අනුකූල වීමේ අවශ්‍යතාවෙන්, මෙම විධාන යටතේ විදේශ විනිමයෙන් ගනුදෙනු කරන බලයලත් වෙළෙන්දෙකු හෝ ඕනෑම පුද්ගලයෙකු නිදහස් කිරීමක්, නිදොස් කිරීමක් හෝ වැළැක්වීමක් ලෙස අර්ථ විග්‍රහ නොකළ යුතුය.

අතිරේක අධ්‍යක්ෂ - විදේශ විනිමය
දෙපාර්තමේන්තුව
2021 ජූලි 30

2021 අංක 26 දරන විධානවල ඇමුණුම I

කොළඹ කොටස් හුවමාරුවේ විදේශ ව්‍යවහාර මුදලින් නිරූපිත ආයෝජන සඳහා පහසුකම් සැලසීම පවත්වාගෙන යන විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් වල කාර්තුමය ප්‍රකාශනය

බැංකුවේ නම : .....

වාර්තා කරන කාර්තුව හා වර්ෂය : .....

ගිණුම් හිමියාගේ නම	කාර්තුව ආරම්භයේදී ශේෂය	බැර කිරීම්					හර කිරීම්				කාර්තුව අවසානයට ශේෂය
		ආමුඛ ආයෝජන ගිණුම්වලින් මාරු කිරීම්	ප්‍රාග්ධන ගනුදෙනුවලින් ලබාගත් ප්‍රාග්ධන ලැබීම් හෝ ආදායම්වල ප්‍රේෂණ	ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් වලට මාරුකිරීම්	අක්වෙරළ බැංකු ඒකකවල පවත්වාගෙන යන ගිණුම් වලට මාරු කිරීම්	පොලිය	ආමුඛ ආයෝජන ගිණුම්වලට මාරු කිරීම්	ජංගම ගනුදෙනු වෙනුවෙන් සිදුකළ ප්‍රතිමුඛ ප්‍රේෂණ	ප්‍රාග්ධන ගනුදෙනු වෙනුවෙන් සිදුකළ ප්‍රතිමුඛ ප්‍රේෂණ	දේශීය වියදම්	

ඉහත ආකෘතියේ පරිලෝකන පිටපත් සහ මයික්‍රොසොෆ්ට් එක්සෙල් පිටපත් යන දෙකම, බලයලත් වෙළඳුන් විසින් සැපයීමට අවශ්‍ය වේ.
පොත්වලින් ලබාගන්නා ලද / උත්පාදනය කරන ලද ඉහත තොරතුරු සත්‍ය බවට සහතික කර සිටිමු.

බලයලත් නිලධාරියාගේ නම : .....

අත්සන : .....

දිනය : .....

අනුකූලතා නිලධාරියාගේ නම සහ මුද්‍රාව : .....

අත්සන : .....

දිනය : .....

විදේශ විනිමය දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා මහ බැංකුව

2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2021 අංක 27 දරන විධානයන්

ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් සම්බන්ධයෙන් බලයලත් වෙළඳුන් වෙත නිකුත් කරන ලද විධානයන්

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 9වැනි වගන්තිය සහ 2021.07.06 දිනැති අංක 2235/22 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනයෙන් සංශෝධනය වූ 2021.02.03 දිනැති අංක 2213/55 දරන අති විශෙෂ ගැසට් නිවේදනයෙන් ප්‍රකාශිත 2021 අංක 2 දරන විදේශ විනිමය (ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව තුළ දී සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු වර්ග) නියෝග ප්‍රකාරව 2021.03.18 දිනැති 2021 අංක 05 දරන විධානයේ දක්වා ඇති හර කිරීම්වලට අමතරව ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමට පහත හර කිරීම සිදු කිරීමට බලයලත් වෙළඳුන්හට අවසර ලබා දෙනු ලැබේ.

1.4. අවසරලත් හර කිරීම්

(ය) කොළඹ කොටස් වෙළඳපොළ තුළ නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල්වලින් ලැයිස්තුගත කොටස් ණය සුරැකුම්වල සුදුසුකම්ලත් ආයෝජකයන් විසින් සිදු කරන ලද ආයෝජන වෙනුවෙන් ලබන කිසියම් ආදායම් ගෙවීම් හෝ කල් පිරීම් ඉපැයීම් 2021 ජූලි 30 දිනැති හා 2021 අංක 26 දරන විධානය ප්‍රකාරව විවෘත කර ඇති විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුමට මාරු කිරීම සඳහා මෙම නියෝගවලින් අනුමැතිය ලබා දී ඇත.

අතිරේක අධ්‍යක්ෂ - විදේශ විනිමය
දෙපාර්තමේන්තුව
2021 ජූලි 30

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2251/42 - 2021 ඔක්තෝබර් මස 28 වැනි බ්‍රහස්පතින්දා - 2021.10.28

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

ශ්‍රී ලංකා මහ බැංකු නිවේදන

1949 අංක 58 දරන මුදල් නීති පනත

1949 අංක 58 දරන මුදල් නීති පනතේ 68 වන වගන්තිය සමග කියවිය යුතු 10 (c) වගන්තිය යටතේ සකස් කළ රීතීන්,

නිවාඩ් අජිත් ලෙස්ලි කබ්රාල්,
මුදල් මණ්ඩලයේ සභාපති සහ ශ්‍රී ලංකා මහ
බැංකුවේ අධිපති,

2021 ඔක්තෝබර් මස 28 වැනි දින,
ශ්‍රී ලංකා මහ බැංකුව,
කොළඹ දී ය.

අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම

1. මෙම රීති "2021 අංක 5 දරන අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන ඒමේ රීති" යනුවෙන් හඳුන්වනු ලැබිය යුතුය.

2. ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින්, 1949 අංක 58 දරන (සංශෝධිත) මුදල් නීති පනතෙහි 10 (c) වගන්තියෙහි විධිවිධාන සමග එක්ව කියවිය යුතු එම පනතේ 68 වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව ක්‍රියා කරමින්, අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාව වෙත ගෙන්වා ගැනීම සහ එකී මුදල් ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කිරීමට අදාළ රීතින් මෙමගින් නිකුත් කරනු ලබයි.

3. සෑම භාණ්ඩ හා සේවා අපනයනකරුවකුම :

(i) අපනයනය කරන ලද සියළු භාණ්ඩ හා ශ්‍රී ලංකාවෙන් පිටතට සපයන ලද සේවාවලට අදාළව අපනයන ඉපැයීම්, අදාළ පරිදි භාණ්ඩ නැව්ගත කරන ලද දිනයේ සිට හෝ සේවාවන් සැපයූ දිනයේ සිට, දින එකසිය අසූවක් (180) ඇතුළත අනිවාර්යයෙන්ම ශ්‍රී ලංකාව වෙත ගෙන්විය යුතුය.

(ii) භාණ්ඩ හා සේවා අපනයනය සම්බන්ධයෙන් වන සියලුම අපනයන ඉපැයීම් ලද විගස, සියලු අපනයන ඉපැයීම් ලැබීම්වලට අදාළ සියලු ලේඛනගත සාක්ෂි, එම මුදල් ලබන්නා වූ ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී වාණිජ බැංකුවකට හෝ අවසරලත් බලපත්‍රලාභී විශෙෂිත බැංකුවකට (මෙහි මින්මතු බලපත්‍රලාභී බැංකුව වශයෙන් හඳුන්වනු ලබන) නොපමාව ඉදිරිපත් කළ යුතුය.

4. ඉහත 3 රීතියට අනුව අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන්වා ගන්නා සෑම භාණ්ඩ හා සේවා අපනයනකරුවෙකුම, මාසයක් තුළ, ශ්‍රී ලංකාවට ලැබෙන එම ආදායමෙන් පහත සඳහන් අවසරලත් ගෙවීම් සඳහා පමණක් භාවිතයෙන් අනතුරුව, ශේෂය එළඹෙන මාසයේ හත්වන (7) දින හෝ ඊට ප්‍රථම ශ්‍රී ලංකා රුපියල්වලට අනිවාර්යයෙන්ම පරිවර්තනය කළ යුතුය.

(i) භාණ්ඩ හා සේවා අපනයනකරුවාගේ ජංගම ගනුදෙනු සඳහා වන ප්‍රතිමුඛ ප්‍රේෂණ;

(ii) භාණ්ඩ හා සේවා අපනයනකරුවාගේ විදේශ මුදල් නෝට්ටු ආපසු ලබා ගැනීම හෝ සංචාරක අරමුණු සඳහා මුදල් මාරු කිරීම;

(iii) 2017 අංක 12 දරන විදේශ විනිමය පනත හෝ 1988 අංක 30 දරන බැංකු පනත (සංශෝධිත) යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද රෙගුලාසි, නියෝග සහ විධාන ප්‍රකාරව, භාණ්ඩ හා සේවා අපනයනකරුවන් ලබා ගන්නා ලද විදේශ ව්‍යවහාර ණය මුදල්, ආපසු ගෙවීම් වියදම් සහ ණය වාරික;

(iv) එක් මසක වගකීම් ද ඇතුළත්ව භාණ්ඩ හා සේවා අපනයනකරු විසින් භාණ්ඩ හා සේවා අපනයනය කිරීම සම්බන්ධයෙන් භාණ්ඩ මිලදී ගැනීම හා සේවා ලබා ගැනීම සඳහා විදේශ ව්‍යවහාර මුදලින් කරනු ලබන ගෙවීම්; සහ

(v) ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජන සඳහා, එම ලබන්නා වූ අපනයන ආදායමෙන් ප්‍රතිශතාංක දහයක් (10%) දක්වා, සිදු කරන ගෙවීම්.

5. ඉහත 4 රීතියෙහි සඳහන් එකී පරිවර්තන දිනය ඉහත 3(i) රීතියට අනුව, අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ලැබිය යුතු දිනට පසු දිනයක් නොවිය යුතුය. (එනම්, භාණ්ඩ නැව්ගත කළ/සේවාව සැපයූ දිනයේ සිට දින එකසිය අසූවකට (180) පසු දිනයක් නොවිය යුතුය)

6. සෑම බලපත්‍රලාභී බැංකුවක් විසින්ම ඉහත 3 වන රීතියෙන් නියම කරන ලද කාලය තුළ අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම සහ ඉහත 4 වන රීතියෙන් නියම කර ඇති පරිදි එම මුදල් ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කිරීම අනිවාර්යයෙන්ම දැඩිව අධීක්ෂණය කළ යුතු අතර, ඒ සඳහා අදාළ වන හෝ ඒ හා බැඳෙන අවශ්‍ය සියලු ලිඛිත සාක්ෂි පවත්වාගෙන යා යුතුය.

7. සෑම බලපත්‍රලාභී බැංකුවක් විසින්ම කලින් කලට නියම කරනු ලබන පරිදි වාර්තා සහ/හෝ ප්‍රකාශන, ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත යොමු කළ යුතු අතර, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති හෝ නියෝජ්‍ය අධිපති විසින් බලය දෙනු ලබන ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරීන් හට ඉහත 6 වන රීතිය යටතේ පවත්වාගෙන යනු ලබන වාර්තා පරීක්ෂා කිරීම සහ එකී බලපත්‍රලාභී බැංකු විසින් මෙම රීතින් විෂයෙහි අනුකූලතාවය තහවුරු කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග සමාලෝචනය කිරීම සඳහා බාධාවකින් තොරවූ ප්‍රවේශයක් ලබා දිය යුතුය.

8. මෙම රීතින්ට අනුව, භාණ්ඩ හා සේවා අපනයනයේදී, ඕනෑම භාණ්ඩ හෝ සේවා අපනයවනකරුවෙකු හෝ බලපත්‍රලාභී බැංකුවක් විසින් මෙකී රීතින් සමග අනුකූල නොවීමට හෝ උල්ලංඝනය කිරීමට විරුද්ධව ක්‍රියාත්මකවීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාට අයිතිය ඇත.

9. මෙම රීතින් බලාත්මක වන දින හෝ ඉන් පසුව අපනයනය කරන ලද සියලුම සහ සෑම භාණ්ඩයකට හා සේවාවකට සහ මෙම රීතිය බලාත්මක කිරීමට පෙර දිනක ද අපනයනය කරන ලද එහෙත් නැව් ගත කළ දින සිට එකසිය අසූව (180) වැනි දිනය මෙම රීතිය ක්‍රියාත්මක වූ දිනට පසු ඕනෑම දිනයක් වන භාණ්ඩ හා සේවා සඳහා ද මෙම රීතිය අදාළ වේ.

10. සැක දුරුකර ගැනීම පිණිස හා මෙම රීතිවල කාර්යය සඳහා "අපනයන ඉපැයීම්" යන්නට, 2021 පෙබරවාරි 03 දිනැති අංක 2213/37 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද, 2021 අංක 4 දරන විදේශ විනිමය (විවිධ ප්‍රාග්ධන ගනුදෙනු වර්ග) නියෝග ප්‍රකාරව ශ්‍රී ලංකාවට නැවත ගෙන්වා ගැනීමට අවශ්‍ය වන අපනයන ඉපැයීම්වලින් ලද මුදල් සහ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසිකයෙකුට වෘත්තීමය, වෘත්තීය හෝ ව්‍යාපාරික සේවා ඇතුළුව සේවා සැපයීමෙන් ශ්‍රී ලංකාවේ නේවාසිකයෙකුට විදේශ විනිමයෙන් ලැබෙන ගෙවීම් ඇතුළත් වේ.

11. මෙකී රීතිවල කාර්යය සඳහා "බලපත්‍රලාභී වාණිජ බැංකු" සහ "බලපත්‍රලාභී විශේෂිත බැංකු" යන්නට, 1988 අංක 30 දරන (සංශෝධිත) බැංකු පනතේ විධිවිධාන ප්‍රකාරව නියම කරන ලද අර්ථය අදාළ වේ.

12. මෙම රීතිවල කාර්යය සඳහා "ජංගම ගනුදෙනු" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතුය.

13. මෙම රීතිවල කාර්යය සඳහා "විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු ආපසු ලබා ගැනීම හෝ සංචාරක අරමුණු වෙනුවෙන් මුදල් මාරු කිරීම" 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 9 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලද විධානයන් ප්‍රකාරව විය යුතුය.

14. 2021 මාර්තු 9 දිනැති අංක 2218/38 දරන ගැසට් (අති විශේෂ) නිවේදනයෙහි පළ වූ, 2021 අංක 2 දරන අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීමේ රීතිනි මගින් සංශෝධිත පරිදි, 2021 පෙබරවාරි මස 18 දිනැති, 2215/39 දරන ගැසට් (අති විශෙෂ) නිවේදනයෙහි පළ වූ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද, 2021 අංක 1 දරන අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීමේ රීතින්, 2021 අප්‍රේල් මස 9 දිනැති, අංක 2222/60 දරන ගැසට් (අති විශේෂ) නිවේදනයෙහි පළ වූ, 2021 අංක 3 දරන අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීමේ රීතින්, සහ 2021 මැයි මස 28 දිනැති, අංක 2229/9 දරන ගැසට් (අති විශේෂ) නිවේදනයෙහි පළ වූ, 2021 අංක 4 දරන අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීමේ රීතින් මෙමගින් අවලංගු කෙරේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
අති විශෙෂ

අංක 2258/23 - 2021 දෙසැම්බර් මස 15 වැනි බදාදා- 2021.12.15

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

රජයේ නිවේදන

2017 අංක 12 දරන විදේශ විනිමය පනත

22 වන වගන්තිය යටතේ වූ නියමය

2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි (පනත) 22 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මුදල් ආමාත්‍ය, බැසිල් රාජපක්ෂ වන මා විසින්, මෙම නියමය මගින්, 2021 ජූලි මස 02 දිනැති අංක 2234/49 දරණ අති විශේෂ ගැසට් නිවේදනයේ පළකරන ලද පනතෙහි 22 වන වගන්තිය යටතේ වූ නියමයෙහි වලංගු කාලය, 2022 ජනවාරි මස 02 වැනි දින සිට තවත් මාස හයක කාලයකින් දීර්ඝ කරනු ලැබේ.

බැසිල් රාජපක්ෂ
මුදල් අමාත්‍යය

2021 දෙසැම්බර් 13 වැනි දින,
කොළඹ 01
මුදල් අමාත්‍යාංශයේ දී ය.

විදේශ විනිමය දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2021 අංක 28 දරන විධානයන්

ජංගම ගනුදෙනු සඳහා පහසුකම් සැලසීමට ආයෝජිතයා සඳහා විශේෂ ව්‍යවහාර මුදල් ගිණුම් - ආයෝජිතයා සම්බන්ධව බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරන විධානයන්

2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි 6 වන වගන්තිය සමඟ කියවිය යුතු 9 වන වගන්තිය සහ 2021.02.03 දිනැති අංක 2213/38 දරන රජයේ ගැසට් පත්‍රයෙහි (අති විශේෂ) පළ කරන ලද 2021 අංක 5 දරන විදේශ විනිමය (විදේශ විනිමය ගනුදෙනුවල නිරත වීමේ කාර්යය සඳහා ගිණුම් ආරම්භ කිරීම සහ පවත්වා ගෙන යාම) රෙගුලාසි ප්‍රකාරව, පහත කොන්දේසිවලට යටත්ව, ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික පුද්ගලයෙකුගෙන් (එනම්, අනේවාසික ආයෝජකයෙකුගෙන්) සමාගමේ කොටස් ප්‍රාග්ධනයට සිදු කරන ආයෝජනයෙන් ලත් මුදල් භාවිතයෙන් සමාගමේ ජංගම ගනුදෙනු සඳහා පහසුකම් සැලසීමට "විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්-ආයෝජිතයා" විවෘත කිරීමට සහ පවත්වා ගෙන යාමට බලයලත් වෙළෙඳුන් හට අවසර ලැබේ.

2. සුදුසුකම් ලත් පුද්ගලයන්

සංශෝධිත පරිදි, 2021.02.03 දිනැති අංක 2213/35 දරන රජයේ ගැසට් පත්‍රෙයහි පළ කරන ලද 2021 අංක 2 දරන රෙගුලාසි හා අනුකූලව, විදේශ ව්‍යවහාර ණය මුදල් ආපසු ගෙවීම් සහ ජංගම ගනුදෙනු ආපසු ගෙවීම සපුරාලීමේ අවශ්‍යතාව පවතින අනේවාසික ආයෝජිතයන්ගෙන් සමාගමේ කොටස් ප්‍රාග්ධනයට ආයෝජන ලැබෙන 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සමාගම්.

3. ගිණුම් විවෘත කිරීම සහ පවත්වා ගෙන යාම

(අ) අනේවාසික ආයෝජකයන්ගේ ආමුඛ ආයෝජන ගිණුම් ඔස්සේ සමාගමේ කොටස් ප්‍රාග්ධනයට ආයෝජන ලෙස ලත් මුදලින්, නම් කළ ඕනෑම විදේශ ව්‍යවහාර මුදලකින් ඉතුරුම් හෝ ජංගම (බැංකු අයිරා සහ චෙක්පත් නිකුත් කිරීමේ පහසුකම නොමැතිව) ගිණුම් ආකාරයෙන්, විශේෂ ව්‍යවහාර මුදල් ගිණුම - ආයෝජිතයා විවෘත කිරීම හා පවත්වාගෙන යාම සිදුකළ හැකිය.

(ආ) සුදුසුකම් ලත් පුද්ගලයෙකු විසින් මෙම විධානයන් මගින් අවසර දී ඇති පරිදි බැංකු පද්ධතිය තුළ එක් විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම-ආයෝජිතයා පමණක් විවෘත කළ යුතු අතර එකී ගිණුම තනි පුද්ගල ගිණුමක් ලෙස පවත්වාගෙන යා යුතුය.

(ඇ) විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්-ආයෝජිතයා විවෘත කිරීම සහ පවත්වා ගෙන යාම මෙම විධානවල දිනයේ සිට වසරක කාලයක් සඳහා පමණක් වලංගු විය යුතුය.

4. අවසර ලත් බැර කිරීම්

(අ) සමාගමේ කොටස් ප්‍රාග්ධනයෙහි ආයෝජකයාගේ/ආයෝජකයන්ගේ ආමුඛ ආයෝජන ගිණුම තුළින් ආයෝජනය කරන ලද අරමුදල්.

(ආ) ගිණුමෙහි පවත්නා අරමුදල් මත පොලිය.

5. අවසර ලත් හර කිරීම්

(අ) ගිණුම්හිමියාගේ ජංගම ගනුදෙනුවලට අදාළව සිදු කරන ප්‍රතිමුඛ ප්‍රේෂණ.

(ආ) විදේශ විනිමය පනතේ විධිවිධාන යටතේ නිකුත් කරන ලද නියෝග සහ විධානවල සඳහන් කර ඇති විදේශ ව්‍යවහාර මුදලින් ලබා ගත් ණය නැවත ගෙවීම්, සේවා කිරීම සම්බන්ධයෙන් වන ක්‍රියාපටිපාටිවලට අනුකූල වෙමින්, ණය සේවාකරණ වියදම් සහ

එකී නියෝග, නියම හා විධාන ප්‍රකාරව අවසර ලබා දී ඇති පරිදි ගිණුම් හිමියා විසින් ලබාගත් විදේශ ව්‍යවහාර මුදල් ණය හා පහසුකම් නැවත ගෙවීම්.

(ඇ) ශ්‍රී ලංකා රුපියලින් සිදු කරන දේශීය වියදම් සඳහා වන ගෙවීම්.

6. අනෙකුත් කොන්දේසි

(අ) මෙම ගිණුමෙහි අවශ්‍යතාව ප්‍රකාරව මෙම ගනුදෙනුකරුගේ යෝග්‍යතාව නිර්ණය කිරීම සඳහා විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම-ආයෝජිතයා විවෘත කරන අවස්ථාවේ දී, බලයලත් වෙළෙඳුන් විසින් ප්‍රමාණවත් පරිදි ලේඛනමය සාක්ෂි ලබා ගත යුතුය.

(ආ) මෙම විධානයන් ප්‍රකාරව, විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම-ආයෝජිතයා ඔස්සේ විදේශ විනිමයෙන් සිදු කිරීමට අවසර දී ඇති ගනුදෙනු සිදු කිරීමේ දී බලයලත් වෙළෙඳුන් විසින් නිසි උද්යෝගයෙන් ක්‍රියා කළ යුතුය.

(ඇ) බලයලත් වෙළෙඳුන් විසින් විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම-ආයෝජිතයා වසා දැමූ දිනයේ සිට වසර 6ක කාලයක් දක්වා, විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම-ආයෝජිතයා ඔස්සේ සිදු කරන ලද ගනුදෙනු පිළිබඳව ලේඛනමය සාක්ෂි (දෘඪ පිටපතක් හෝ විද්‍යුත්/ ඩිජිටල් පිටපතක් ලෙස) පවත්වා ගෙන යා යුතුය.

7. වාර්තා කිරීමේ අවශ්‍යතාවය

(අ) විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා විසින් අනුමත කරන ලද ආකෘතියකින් මෙම විධාන යටතේ විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම-ආයෝජිතයා විවෘත කිරීම සහ පවත්වා ගෙන යාමේ තොරතුරු බලයලත් වෙළෙඳුන් විසින් dfem@cbsl.lk යන ලිපිනයට විද්‍යුත් තැපෑල ඔස්සේ එළඹෙන මාසයේ 15 වන දින හෝ ඊට පෙර යොමු කළ යුතු වේ.

(ආ) බලයලත් වෙළෙඳුන් විසින් ඉහත වාර්තා කිරීමේ අවශ්‍යතාවන්ට අනුව, බලයලත් වෙළඳුන් විසින් අදාළ බැංකු ගිණුම් පොත්වලින් අදාළ තොරතුරු ජනනය කිරීම හෝ උපුටා ගැනීම සඳහා බැංකුව තුළ පද්ධතියක් ස්ථාපනය කිරීම අවශ්‍ය වේ.

8. විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම-ආයෝජිතයා වසා දැමීම

(අ) ගිණුම්හිමියා විසින් අරමුණු කරන ලද කාර්යයන් සඳහා අරමුදල් සම්පූර්ණයෙන් භාවිත කර ඇත්නම්, බලයලත් වෙළෙඳුන් විසින් විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම-ආයෝජිතයා වසා දැමිය යුතුය.

(ආ) සියලු විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්-ආයෝජිතයා මෙම විධානයන්ගේ දිනයෙහි සිට වසරක (1) කාලයක් ඉක්මවූ පසුව වසා දැමිය යුතුය. මෙම අවස්ථාවේ දී, මෙම ගිණුමෙහි පවතින ඕනෑම නොපිය වූ ශේෂයක් ගිණුම්හිමියාගේ රුපියල් ගිණුමට මාරු කළ යුතුය.

(ඇ) බලයලත් වෙළෙඳුන් විසින්, එවැනි වසා දැමීමක්, සිදු කළ දිනයේ සිට සතියක කාලයක් තුළ දී dfem@cbsl.lk යන ලිපිනයට විද්‍යුත් තැපෑල ඔස්සේ දැනුම් දිය යුතුය.

9. මෙම විධානවල විෂය පථයෙන් පරිබාහිර වෙනත් ඕනෑම කාර්යයක් සඳහා මෙම විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම-ආයෝජිතයා ගිණුමකින් ඕනෑම මාරු කිරීමක්/ඕනෑම ගනුදෙනුවක් බලයලත් වෙළෙඳුන් විසින් විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාගේ පූර්ව අවසරය ලබාගත යුතු ය.

10. මෙම විධානයන්හි කාර්යය සඳහා අර්ථකථන:

(අ) "ජංගම ගනුදෙනු" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි දී ඇති අර්ථය ම තිබිය යුතුය;

(ආ) නම් කළ විදේශ ව්‍යවහාර මුදලක්" යන්නට 2021.02.03 දිනැති අංක 2213/38 දරන රජයේ ගැසට් (අති විශේෂ) නිවේදනයේ පළ කරන ලද 2021 අංක 5 දරන විදේශ විනිමය (විදේශ විනිමය ගනුදෙනුවල නිරත වීමේ කාර්යය සඳහා ගිණුම් ආරම්භ කිරීම සහ පවත්වා ගෙන යාම) නියෝග ප්‍රකාරව දැක්වෙන අර්ථයම තිබිය යුතුය.

11. මෙම විධානවල අවසර ලබාදුන් කිසිවක් වෙනත් ඕනෑම නීතියක විධිවිධාන සමඟ අනුකූල වීමේ අවශ්‍යතාවෙන්, මෙම විධාන යටතේ විදේශ විනිමය ගනුදෙනු කරන බලයලත් වෙළෙන්දෙක් හෝ ඕනෑම පුද්ගලයෙකු නිදහස් කිරීමක්, නිදෙස් කිරීමක් හෝ වැළකීමක් ලෙස අර්ථ විග්‍රහ නොකළ යුතුය.

අතිරේක අධ්‍යක්ෂ - විදේශ විනිමය
දෙපාර්තමේන්තුව
2021 දෙසැම්බර් 27

විදේශ විනිමය දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2021 අංක 29 දරන විධානයන්

ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හිමියන්හට ලබා දෙන පහසුකම් සම්බන්ධයෙන් බලයලත් වෙළඳුන් වෙත නිකුත් කරන ලද විධානයන්

ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හිමියන්හට ලබා දෙන පහසුකම් සම්බන්ධයෙන් 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 9 වැනි වගන්තිය අනුව බලයලත් වෙළඳුන් වෙත නිකුත් කර ඇති 2021.03.18 දිනැති 2021 අංක 9 දරන විධානය (විධානය) පහත පරිදි සංශෝධනය විය යුතුය.

(I) විධානයේ 5.1 ඡේදයේ දක්වා ඇති පරිදි ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හිමියන්ගේ ණය ගිණුමට අවසර ලබා දී ඇති බැරවලට අමතරව, පහත උපදෙස් ඇතුළත් කර ඇති 5.1 ඡේදයේ (ඈ) අයිතමය ලෙස කියවිය යුතුය.

(ඈ) ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හිමියාහට ශ්‍රී ලංකාවෙන් පිටත පදිංචි පුද්ගලයෙකුගෙන් (එනම් අනේවාසික ආයෝජකයෙකුගෙන්) ලැබී ඇති කොටස් ආයෝජන ඉපැයීම්, 2021 අංක 28 දරන විධානය ප්‍රකාරව විවෘත කර පවත්වාගෙන යනු ලබන විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුමෙන්, එකී ගිණුම් හිමියාගේ ජංගම ගනුදෙනු සිදු කිරීම පිණිස මුදල් මාරු කිරීම්, මෙම විධාන යටතේ ලබා ගෙන ඇති පහසුකම් සේවාකරණය/ නැවත ගෙවීම්.

අතිරේක අධ්‍යක්ෂ - විදේශ විනිමය
දෙපාර්තමේන්තුව
2021 දෙසැම්බර් 27.

චක්‍රලේඛ : 01/21 2021 අප්‍රේල් 27
යොමුව : 37/05/006/0004/018

මූල්‍ය ආයතන ප්‍රධාන විධායක නිලධාරීන්/සාමාන්‍යාධිකාරිවරුන් සහ කළමණාකාර අධ්‍යක්ෂවරුන් වෙත,

මහත්මයාණෙනි/මහත්මියනි,

මාර්ගගත ගෙවීම් පද්ධතීන් හා සම්බන්ධ වන පාර්ශ්වයන්ට අදාලව මුදල් විශුද්ධිකරණය වැලැක්වීම හා ත්‍රස්තවාදීන්ට අරමුදල් සැපයීම මැඩපැවැත්වීමට අදාල ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම

මෑත කාලීනව මූල්‍ය ආයතන විසින් හඳුන්වා දෙන ලද විවිධ මාර්ගගත ගෙවීම් පද්ධතීන් හා සම්බන්ධ වී කටයුතු කරන පාර්ශවයන් (ගනුදෙනුකරුවන් හා වෙළඳුන්) විසින් මුදල් විශුද්ධිකරණය වැලැක්වීම සහ ත්‍රස්වාදීන්ට අරමුදල් සැපයීම මැඩපැවැත්වීමට අදාල ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් බරපතල ඌනතාවක් මූල්‍ය බුද්ධි ඒකකයට නිරීක්ෂණය විය.

එවැනි මාර්ගගත ගෙවීම් පද්ධතීන් හා සම්බන්ධ වී කටයුතු කරන පාර්ශ්වයන් 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තාකරණ පනත, 2016 අංක 1 දරන මූල්‍ය ආයතන (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ) රීති සහ ඒ යටතේ පහත කරුණු සම්බන්ධයෙන් සාදන ලද රීති, රෙගුලාසි හා මාර්ගෝපදේශයන්ට අනුකූලව කටයුතු කරන බවට සහතික කර ගැනීමේ වගකීම අදාල මාර්ගගත ගෙවීම් පද්ධතියට පහසුකම් සලසන මූල්‍ය ආයතනයට පැවරේ. :

- ගනුදෙනුකරු හඳුනා ගැනීම හා සත්‍යායනය කිරීම
- ගනුදෙනුකරු පිළිබඳ අඛණ්ඩව නිසි උද්යෝගයෙන් කටයුතු කිරීම හා ගනුදෙනු සන්නිරීක්ෂණය
- සැකකටයුතු ගනුදෙනු හඳුනා ගැනීම හා වාර්තා කිරීම
- විද්‍යුත් ප්‍රේෂණ අවශ්‍යතාවන් (විශේෂයෙන්ම, විද්‍යුත් ප්‍රේෂණය සිදු කරන්නා පිළිබඳ විද්‍යුත් ප්‍රේෂණ සිදුකරන මූල්‍ය ආයතනය තුල පවත්නා තොරතුරු ප්‍රතිලාභී මූල්‍ය ආයතනය වෙත සැපයිය යුතු වේ.)
- ඉලක්කගත මූල්‍ය සම්බාධක පරීක්ෂාව
- වාර්තා පවත්වා ගැනීම
- වෙනත් වාර්තාකරණ අවශ්‍යතාවයන්

මීට විශ්වාසී
අධ්‍යක්ෂ,
මූල්‍ය බුද්ධි ඒකකය

පිටපත්: 1. අනුකූලතා නිලධාරී

2. ප්‍රධාන විධායක නිලධාරි/ලංකා ක්ලියර් (පුද්) සමාගම

3. අධ්‍යක්ෂ, ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

4. අධ්‍යක්ෂ, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

5. අධ්‍යක්ෂ, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

චක්‍රලේඛ : 02/21 2021 අප්‍රේල් 28

යොමුව : 37/03/009/0001/021

මූල්‍ය ආයතනවල විධායක නිලධාරීන්, සාමාන්‍යාධිකාරිවරුන්, කළමණාකරණ අධ්‍යක්ෂවරු වෙත,

මහත්මයාණෙනි/මහත්මියනි,

ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර හරහා විදේශ මුදල් පිටතට ගලා යාමේ ප්‍රවණතා : විදේශයන්හි දී මුදල් ආපසු ගැනීම්

ඉහත සඳහන් කරුණට අදාළව වාර්තා වන සැක කටයුතු ගනුදෙනු වල ඉහළ යාමේ ප්‍රවණතාවයක් මූල්‍ය බුද්ධි ඒකකය විසින් නිරීක්ෂණය කර ඇත. ඒ අනුව, ගනුදෙනුකරුවකු ඇතුලත් කර ගැනීමේ දී සහ ගනුදෙනු සිදු කිරීමේ දී 2016 අංක 01 දරන මූල්‍ය ආයතන (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ) රීති අනුව, ගනුදෙනුකරු පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමට අවශ්‍ය පියවර ගැනීමට ඔබට උපදෙස් දෙනු ලැබේ.

තව දුරටත්, 2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ අංක 02 ප්‍රතිපාදනයන්ට අනුකූලව අනන්‍යතාවය තහවුරු කළ හැකි ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් නොකරන අවස්ථාවක දී ගනුදෙනු තව දුරටත් ක්‍රියාත්මක නොකිරීමට මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ අංක 03 ප්‍රතිපාදන අනුව, ඔබේ අවධානය යොමු කෙරේ. ඒ අනුව, ගනුදෙනුව සිදු කරන පුද්ගලයා නිසි පරිදි හඳුනාගත නොහැකි නම් හෝ අනවසර, හඳුනා නොගත් තෙවන පාර්ශවයක් විසින් ගනුදෙනු සිදු කරන බවට සැකයක් ඇත්තේ නම් එවැනි අවස්ථාවක ඊට අදාළව වාර්තා වූ ගිණුමකට හෝ වෙනත් ගිණුමකට නිකුත් කරන ලද විද්‍යුත් අරමුදල් හුවමාරු කාඩ්පත් අවලංගු කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගත හැකිය.

මීට විශ්වාසී
අධ්‍යක්ෂ,
මූල්‍ය බුද්ධි ඒකකය

පිටපත්: 1. අනුකූලතා නිලධාරී

2. අධ්‍යක්ෂ, ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

3. අධ්‍යක්ෂ, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

4. අධ්‍යක්ෂ, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

5. අධ්‍යක්ෂ, විදේශ විනිමය දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

චක්‍රලේඛ : 03/21 2021 මැයි 04

යොමුව : 37/05/003/0005/016

මූල්‍ය ආයතනවල විධායක නිලධාරීන්, සාමාන්‍යාධිකාරිවරුන්, කළමණාකරණ අධ්‍යක්ෂවරු වෙත,

මහත්මයාණෙනි/මහත්මියනි,

කොවිඩ් - 19 වසංගතයේ තුන්වන රැල්ල සමග නැගී එන මුදල් විශුද්ධිකරණය/ත්‍රස්තවාදයට අරමුදල් සැපයීමේ අවදානම අවම කිරීමට අවශ්‍ය අතිරේක පියවර

2020.06.15 දිනැති අංක 03/2020 චක්‍රලේඛයට වැඩිමනත්, මූල්‍ය ආයතන මෙන්ම මූල්‍ය පද්ධතිය කොවිඩ් 19 වසංගතයේ තුන්වන රැල්ල සමග වර්ධනය වූ මුදල් විශුද්ධිකරණය/ත්‍රස්තවාදයට අරමුදල් සැපයීමේ අවදානමින් ආරක්ෂා කිරීම සඳහා මූල්‍ය ආයතන වෙත ඉතා සුපරීක්ෂාකාරීව සිටින ලෙසත් අමතර ක්‍රියාමාර්ග ගන්නා ලෙසත් මෙමඟින් උපදෙස් ලබා දෙනු ලැබේ.

වසංගත තත්ත්වය අවස්ථාවක් කරගනිමින් අපරාධකරුවන් ඔවුන්ගේ අපේක්ෂිත නීති විරෝධී ක්‍රියාකාරකම් සිදු කිරීමට මූල්‍ය ආයතන අනිසි ලෙස භාවිතා කිරීමට උත්සාහ කළ හැකිය. එබැවින්, මූල්‍ය ආයතන විසින් ගනුදෙනුකරුවන් සම්බන්ධ නිසි උද්යෝගයෙන් ක්‍රියාකාරීමේ, ගනුදෙනුකරුවන් අඛණ්ඩව අධීක්ෂණය කිරීමේ සහ ගනුදෙනු පිළිබඳව නිරන්තර අවධානයෙන් සිටීමේ ක්‍රියාවලි ශක්තිමත් කල යුතු අතර නිරාවරණය වන අවදානම් ඇතොත් ඒවා අවම කිරීම සඳහා එවැනි අවදානම් පිළිබඳව සියලු තරාතිරම්වල කාර්ය මණ්ඩලය දැනුවත් කල යුතුය.

මෙයට විශ්වාසී,
අධ්‍යක්ෂ,
මූල්‍ය බුද්ධි ඒකකය

පිටපත්:
1. අනුකූලතා නිලධාරි
2. අධ්‍යක්ෂ ජෙනරාල්, සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව
3. අධ්‍යක්ෂ ජෙනරාල්, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම
4. අධ්‍යක්ෂ, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව
5. අධ්‍යක්ෂ, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව
6. අධ්‍යක්ෂ, ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

මාර්ගෝපදේශ අංකඃ 02/2021 2021 ජූලි 20
යොමු අංකයඃ 037/06/008/0006/020

මූල්‍ය ආයතනවල විධායක නිලධාරීන්, සාමාන්‍යාධිකාරීවරුන්, කළමණාකරණ අධ්‍යක්ෂවරු වෙත,

මහත්මයාණෙනි/මහත්මියණි,

මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීමේ අරමුණ ඇතිව සංවෘත පරිපථ රූපවාහිනී පද්ධති (CCTV) මෙහෙයුම් සම්බන්ධයෙන් මූල්‍ය ආයතන වෙත නිකුත් කරනු ලබන 2021 අංක 02 දරන මාර්ගෝපදේශයන්

මෙම මාර්ගෝපදේශය වහාම බලාත්මක වන අතර, 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත සහ 2006 අංක 1 දරන මූල්‍ය ආයතන (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ) රීති සමග කියවිය යුතුය.

මීට විශ්වාසී
ඊ.එච්. මොහොට්ටි
අධ්‍යක්ෂ
මූල්‍ය බුද්ධි ඒකකය

පිටපත:
1. අධ්‍යක්ෂ, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

2. අධ්‍යක්ෂ, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව
3. අධ්‍යක්ෂ ජෙනරාල්, ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව
4. අනුකූලතා නිලධාරීන්, සියළුම මූල්‍ය ආයතන

මුදල් විශුද්ධිකරණය/ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීම අරමුණ ඇතිව සංවෘත පරිපථ රූපවාහිනී පද්ධති (CCTV) මෙහෙයුම් සම්බන්ධයෙන් මූල්‍ය ආයතන වෙත නිකුත් කරනු ලබන 2021 අංක 02 දරන මාර්ගෝපදේශ

I කොටස

හැඳින්වීම

1. 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 15(1) (ඒ) (මෙහි මින්මතු "පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) වගන්තිය ප්‍රකාරව මෙම මාර්ගෝපදේශ සංග්‍රහය නිකුත් කරනු ලබයි.
2. පනතේ 33 වගන්තියට අනුව, මූල්‍ය ව්‍යාපාරයන් හි නියැලී සිටින සහ සංවෘත පරිපථ රූපවාහිනී භාවිතා කරන (මෙහි මින්මතු CCTV යනුවෙන් සඳහන් කරනු ලබන) මූල්‍ය ආයතන සඳහා සුදුසු පරිදි මෙම මාර්ගෝපදේශ අදාළ වේ.
3. මෙම මාර්ගෝපදේශ, 2016 ජනවාරි 27 දිනැති අංක 1951/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයක් හරහා නිකුත් කරන ලද 2016 අංක 01 දරන මූල්‍ය ආයතන (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ) රීති සමග කියවිය යුතු වේ. විශේෂයෙන්ම, මූල්‍ය ආයතන (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ) රීති අංක 07 සහ 11 හි සඳහන්ව ඇති අන්දමට, හඳුනාගෙන ඇති මුදල් විශුද්ධිකරණ අවදානම සහ ත්‍රස්තවාදී ක්‍රියා මූල්‍යනය කිරීමේ අවදානම් කළමනාකරණය කිරීම හා අවම කිරීමට අවශ්‍ය අභ්‍යන්තර ප්‍රතිපත්ති, පාලනය කිරීම් හා කාර්යපටිපාටි පවත්වාගෙන යාමට සහ මූල්‍ය ආයතනයේ මුදල් විශුද්ධිකරණ අවදානම සහ ත්‍රස්තවාදී ක්‍රියා මූල්‍යනය කිරීමේ අවදානම කළමනාකරණය, මූල්‍ය ආයතනයට අදාල සමස්ත අවදානම් කළමනාකරණය සමග අනුබද්ධ කිරීම හා ඒකාබද්ධ කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම සිදුකළ යුතු බැවින් මෙම මාර්ගෝපදේශ එම අදාළ රීති අංක 07 සහ 11 සමග කියවිය යුතු වේ.
4. මූල්‍ය ආයතනයන්හී අදාළ නියාමන අධිකාරීන් විසින් CCTV පද්ධති සම්බන්ධයෙන් නිකුත් කර ඇති මෙහෙයුම් විධාන සහ චක්‍රලේඛනයන්ට අමතරව මෙම මාර්ගෝපදේශ නිකුත් කරනු ලබයි.
5. මෙම මාර්ගෝපදේශ සංග්‍රහය නිරවශේෂයෙන්ම සවිස්තරාත්මක යැයි අදහස් නොකරන අතර, මෙම මාර්ගෝපදේශ සංග්‍රහයෙහි කිසිවක් මූල්‍ය බුද්ධි ඒකකයෙන් ලද නෛතික උපදෙස් ලෙස අර්ථකතනය නොකළ යුතු වේ.

II කොටස

CCTV පද්ධතියක අවශ්‍යතාව

6. මෙහෙයුම් අවදානම් කළමනාකරණය ඉහළ නැංවීම සහ බැංකු මෙහෙයුම් හරහා මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම අවම කිරීමෙහි ලා නොකඩවා ගනු ලබන ක්‍රියාමාර්ගයන්ට අමතරව, සෑම මූල්‍ය ආයතනයක්ම සිය පරිශ්‍රය ඇතුළත සහ පිටත ආවරණය වන පරිදි ශක්තිමත් මෙන්ම ක්‍රියාකාරී CCTV පද්ධතියක් සවි කිරීම සිදුකළ යුතු වේ. මෙහි පරිශ්‍රය ලෙස මූලස්ථාන පරිශ්‍රය, ශාඛා පරිශ්‍රයන්, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATM), මුදල් තැන්පත් කිරීමේ යන්ත්‍ර (CDM) සහ මුදල් තැන්පත් කිරීමේ සහ ආපසු ගැනීමේ යන්ත්‍ර (CRM), මුදල් හුවමාරු වීම් සිදුවන ස්ථාන, සේවා සපයන ස්ථාන සහ ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් කටයුතු කිරීම සිදුකෙරෙන ඕනෑම ස්ථානයක් නිර්වචනය කළ හැක.
7. ව්‍යාපාර කටයුතු නිසියාකාරයෙන් සිදුවේ ද යන්න නිරීක්ෂණය සහ මනා ලෙස ආවේක්ෂණය කළ හැකිවන පරිද්දෙන් CCTV පද්ධතිය සවිකර ඇතිද යන්න තහවුරු කර ගැනීම සඳහා සෑම මූල්‍ය ආයතනයක්ම අවම වශයෙන් මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් කර ඇති අවශ්‍යතාවයන් ආවරණය වන පරිද්දෙන් නිසි ක්‍රියාවලීන්, සහ පාලනය කිරීම් සහිත උසස් තත්ත්වයෙන් යුතු පද්ධතියක් සවි කර ගැනීම සිදුකළ යුතු වේ.

CCTV කැමරා ස්ථානගත කිරීම

8. CCTV පද්ධතිය ඵලදායී අයුරින් භාවිතයට ගැනීම සඳහා ව්‍යාපාර කටයුතු සිදු කෙරෙන ස්ථානයන් පැහැදිළිව කැමරාවට හසු කර ගැනීම, නිරීක්ෂණය කිරීම සහ පටිගත කිරීම සිදු කළ හැකි වන අන්දමින් සුදුසු ස්ථානයක මෙම CCTV කැමරා ස්ථානගත

කිරීමට මෙම මූල්‍ය ආයතන වග බලා ගතයුතුය. මෙසේ හඳුනාගත් ස්ථාන අතරට කවුන්ටර්, ගනුදෙනුකරු පිළිබඳ නිසි උද්යෝග යෙන් කටයුතු කිරීම් සිදුවන ගනුදෙනුකරුවන් සමඟ ව්‍යාපාරික කටයුතු කරනු ලබන ස්ථාන, ආරක්ෂිත තැන්පතු සේප්පු තබා ඇති ස්ථාන, ආරක්ෂිතාගාර හෝ සුරක්ෂිතාගාර සහ මුදල් සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන වෙනත් ඕනෑම ස්ථානයක්, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර/මුදල් තැන්පත් කිරීමේ යන්ත්‍ර, රථ වාහන නැවතුම් ස්ථාන, ව්‍යාපාර පරිශ්‍රයට ඇතුළුවීමේ හා පිටවීමේ ස්ථාන සහ මූල්‍ය ආයතන මඟින් තීරණය කරනු ලබන පරිදි ව්‍යාපාරික ගොඩනැගිල්ල ඇතුළත හා පිටත වැනි ප්‍රදේශ අතුළත්ව තිබීම අත්‍යවශ්‍ය වේ.

9. අදාළ ප්‍රදේශය සම්පූර්ණයෙන්ම ආවරණය වන පරිදි බාධාවකින් තොරව දර්ශන ලබාගත හැකි වන පරිදි CCTV නිරීක්ෂණ පද්ධතිය සුදුසු ආකාරයකින් සුදුසු කෝණයකට යටත්ව ස්ථානගත කිරීම සිදුකළ යුතු වේ. තවද, CCTV පද්ධතිය වෙත තොරතුරු ග්‍රහණය කිරීමේ සහ තොරතුරු සැකසීමේ කටයුතු, අභ්‍යන්තර හෝ බාහිර ආලෝකය, දිලිසීම හෝ වෙනයම් වස්තුවක් වැනි කිසිඳු ආකාරයකින් හෝ බාධාවක් නොවන අයුරින් ස්ථානගත කිරීම සිදු කළ යුතුය.

CCTV පද්ධතියේ කාර්යභාරය

10. CCTV කැමරා හරහා ග්‍රහණය කරගනු ලබන සියලුම තොරතුරු සහ පටිගතවන තොරතුරු සියල්ල හොඳින් දෘශ්‍යමානව හඳුනාගතහැකි සහ පැහැදිලි තොරතුරු බව මූල්‍ය ආයතන විසින් තහවුරු කළ යුතු වේ. CCTV කැමරා හරහා ලබා ගන්නා දෘශ්‍ය රූප හෝ වීඩියෝ මඟින් එක් එක් පුද්ගලයන්ගේ ශාරීරික ලක්ෂණ හඳුනාගත හැකි විය යුතුය. එසේම අවශ්‍ය අවස්ථාවන්හි දී එක් දෘශ්‍ය රූපයක් තවත් දෘශ්‍ය රූපයකින් පැහැදිලිව වෙන්කොට හඳුනා ගත හැකි විය යුතුය. මීට අමතරව, පැහැදිළි CCTV දර්ශන ලබා ගැනීම සඳහා ප්‍රමාණවත් ආලෝකයක් පවත්වාගෙන යාමද සිදු කළ යුතු වේ.

11. එක් එක් පුද්ගලයන්ගේ ඉදිරිපස පැහැදිලිව දර්ශනය වන ලෙස උසස් තත්ත්වයේ ඩිජිටල් උපාංග මෙම CCTV පද්ධතීන් හි භාවිතා කළ යුතු වේ. CCTV පද්ධතිය තුළ අඩංගුව ඇති සියළු තොරතුරු පහසුවෙන් නැරඹීම, පටිගත කිරීම සහ උසස් තත්ත්වයෙන් යුතුව නැවත ලබා ගැනීම (උදා: ඉහළ විශාලන පරාසයන් සඳහා ප්‍රමාණවත් වන පික්සල සංඛ්‍යාවක්) සඳහා හැකියාව තිබිය යුතු වේ. ඵලදායී CCTV ආවේක්ෂණයක් ලබා ගැනීම සඳහා අවශ්‍ය තාක්ෂණික පිරිවිතර (උදා: විභේදන බලය (Resolution), රාමු අනුපාතය (Framework) සම්මත තත්ත්වයන් යටතේ පවත්වාගෙන යා යුතුය.

12. ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර/මුදල් තැන්පත් කිරීමේ යන්ත්‍ර/මුදල් තැන්පත් කිරීමේ සහ ආපසු ගැනීමේ යන්ත්‍රවලට ආශ්‍රිතව ස්ථානගත කර ඇති CCTV පද්ධති, මූල්‍ය ආයතන සිය ව්‍යාපාරයන් සඳහා වසා ඇති අවස්ථාවන් ද ඇතුළත්වන පරිදි දවසේ පැය 24 පුරාම වසරේ සෑම දිනකම ක්‍රියාත්මක විය යුතුය.

තත් කාලීනව නිරීක්ෂණය කිරීම

13. ප්‍රායෝගිකව සිදුකළ හැකි සෑම විටම මූල්‍ය ආයතනයන් හි මූලස්ථානයේ සහ/හෝ ශාඛාවන් හෝ මධ්‍යම නිරීක්ෂණ ස්ථානයක (central monitoring unit) තත්කාලීන නිරීක්ෂණයක් සිදුවන බව තහවුරු කළ යුතුය.

14. මූල්‍ය ආයතන පරිශ්‍රයට, උපාංගයන්ට, ගනුදෙනුකරුවන්ට හෝ ගනුදෙනුකරුවන් විය හැකි වෙනත් පුද්ගලයන්ට හෝ, CCTV කැමරා පද්ධතිය ආශ්‍රිතව සිටින වෙනත් ඕනෑම අයෙකුට තත්කාලීන CCTV දර්ශන මත පදනම් වූ යම් අවදානමක් නිරීක්ෂණය වුවහොත්, එසේ ඇති විය හැකි ක්ෂණික අවදානම අවම කිරීම සඳහා, මූල්‍ය ආයතනයට අදාළ ආරක්ෂක සේවා නිලධාරීන්ගේ හෝ නීතිය බලාත්මක කරනු ලබන ආයතනයන් හි සහාය ලබා ගන්නා ලෙස මූල්‍ය ආයතනයන්ට උපදෙස් ලබා දෙනු ලැබේ.

පටිගත වන තොරතුරු පවත්වාගෙන යාම

15. මූල්‍ය ආයතන සිය CCTV පද්ධතියේ පටිගතවන සියළු තොරතුරු අවම වශයෙන් දින 180 ක කාලපරිච්ඡේදයක් පුරා පවත්වාගෙන යාම සිදු කළ යුතු වේ.

16. මූල්‍ය ආයතනයන් විසින් නිරීක්ෂණයට ලක්කරන ලද සැක කටයුතු ක්‍රියාකාරකම්වලට අදාළ වන CCTV පටිගත කිරීම්, සිය අභිමතය පරිදි දිගු කාලයක් පුරා සංරක්ෂණය කොට තබා ගැනීමට මූල්‍ය ආයතනවලට හැකියාව ඇත.

17. මූල්‍ය ආයතන විසින් මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කරන ලද සැක කටයුතු ගනුදෙනු වාර්තාවන්ට අදාළ වන්නාවූ CCTV පටිගත කිරීම් හෝ අදාළ වෙනයම් වරදකට සම්බන්ධ CCTV පටිගත කිරීම් ආදිය මූල්‍ය බුද්ධි ඒකකය, නීතිය බලාත්මක කරන ආයතන හෝ වෙනත් නිසි බලධාරීන් විසින් සිය විමර්ශන අවසන්වන තෙක් මූල්‍ය ආයතනය සන්තකයේ තබා ගන්නා මෙන් විටින් විට උපදෙස් දීමක් සිදු කළ හැක.

18. සිය CCTV පද්ධතිවල තොරුතුරු දත්ත ගබඩා කළ හැකි උපාංගයන් වෙත හුවමාරු කිරීමේ හැකියාව සහිත බවත් පරිගණක වැනි උපාංග වෙත CCTV වාර්තා ලබා ගැනීමේ හැකියාව ඇති බව සහ නැරඹීමේ හැකියාව ඇති බවත් මූල්‍ය ආයතන විසින් තහවුරු කළ යුතු වේ.

19. CCTV වාර්තාවන්හි විශ්වාසනීයත්වය තහවුරු කිරීම සඳහා CCTV පද්ධතියේ වේලාව සමග නිසියාකාරව සැකසීම සහ සමමුහුර්තකිරීම (synchronize) සිදුකළ යුතු අතර, ව්‍යාපාර පරිශ්‍රය තුළ ව්‍යාපාර කටයුතු සිදු කරනු ලබන දිනය සහ වේලාව සමග අනුකූල විය යුතුය.

පද්ධතිය පරිපාලනය කිරීම සහ නඩත්තු කිරීම

20. CCTV පද්ධතිය නිරීක්ෂණය කිරීමට අවශ්‍ය වන සම්පත් ප්‍රමාණවත් පරිදි වෙන් කිරීම සහ CCTV පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා බලයලත් නිලධාරීන් සහ කාර්ය මණ්ඩලය පුහුණු කිරීම ද මූල්‍ය ආයතනයන්ගෙන් අපේක්ෂා කරනු ලබයි.

21. ව්‍යාපාර මෙහෙයුම් කටයුතු ඵලදායී අයුරින් නිරීක්ෂණය සහ අධීක්ෂණය වන බැව් තහවුරු කර ගැනීම සඳහා, ස්ථාපිත CCTV පද්ධති (ය) නිසියාකාරව නඩත්තු කර ක්‍රියාත්මක වන බවත් සෑම විටම උසස් සේවාවක් සැපයිය හැකි මට්ටමක පවත්වාගෙන යන බවත් මූල්‍ය ආයතන විසින් නිරන්තරයෙන්ම තහවුරු කළ යුතුය.

22. අනවසර පාර්ශ්වයන් විසින් CCTV පද්ධතිය අනිසි ලෙස භාවිතා කිරීම හෝ හැසිරවීම වළක්වා ගැනීම සඳහා අවශ්‍ය පාලන ක්‍රම ක්‍රියාත්මක කළ හැකි වන පරිදි CCTV පද්ධතිය ඊට අදාළ විශේෂිත ආරක්ෂණ ක්‍රියාවන් වලින් සමන්විත විය යුතුය.

23. අනවසර ප්‍රවේශයක් ඇති නොවන පරිද්දෙන් CCTV තොරතුරු සහ වාර්තාවන් ආරක්ෂාකාරීව පවත්වාගෙන යාම සිදු කළ යුතු අතර, හඳුනාගන්නා ලද එක් එක් වගකීම් සඳහා නිලධාරීන් පත්කිරීමත්, ඔවුනට නිසි පරිදි අවසර මට්ටම් (authorization level) නියම කිරීමත්, නියම කරන ලද එවැනි කාර්යභාරයන්ට නිලධාරීන්ගේ ඇති වගවීම තහවුරු කිරීම සඳහා අදාල නිලධාරීන්ට පමණක් පද්ධතිය වෙත ප්‍රවේශ වීම සීමා කිරීම ආදී සීමාවන් යෙදවීම හරහා, අනවසර පාර්ශ්වයන් පද්ධතිය තුළට අනවසරයෙන් ප්‍රවේශ වීම සහ අනවසරයෙන් තොරතුරු වෙනස් කිරීමෙන් වළක්වා ගැනීම සඳහා අවශ්‍ය නිසි පියවර ගැනීම සිදුකළ යුතු වේ.

24. නියාමන අධිකාරීන් නීතිය බලාත්මක කරන ආයතන සහ මූල්‍ය බුද්ධි ඒකකය විසින් සිදුකරනු ලබන මුදල් විශුද්ධිකරණයට අදාළ විමර්ශන සහ චෝදනා ගොනුකිරීම සම්බන්ධයෙන් අවශ්‍ය තොරතුරු සහ වාර්තාවන් ඉල්ලා සිටින අවස්ථාවන්හි දී නොපමාව එම තොරතුරු ලබා දීමට අවශ්‍ය ක්‍රියාවලියක් සහ යාන්ත්‍රණයක් මූල්‍ය ආයතන සතු විය යුතුය.

25. මූල්‍ය ආයතන, සිය CCTV පද්ධතිය ස්ථානගත කිරීම, ක්‍රියාත්මක කිරීම, නිරීක්ෂණය, වාර්තා තබා ගැනීම, CCTV පද්ධතිය නඩත්තු කිරීම සහ පරිපාලනය සම්බන්ධයෙන් අභ්‍යන්තරික මෙහෙයුම් උපදේශ සංග්‍රහයක් නිකුත් කිරීම අවශ්‍ය වන අතර එය අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීමේ ප්‍රතිපත්තියෙහි එක් කොටසක් ලෙසින් අන්තර්ගත කළ යුතුය.

26. ශාඛා පරිශ්‍රයන් සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර/මුදල් තැන්පත් කිරීමේ යන්ත්‍ර ආශ්‍රිතව තනි තනිව ස්ථාන ගත කර ඇති කැමරා සංඛ්‍යාව සම්බන්ධයෙන් විටින් විට සමාලෝචනයක් කරබැලීම සහ විගණනය කිරීම සඳහා සුදුසු ක්‍රියාපටිපාටියක් පවත්වාගෙන යා යුතුය. මෙම සමාලෝචනයන් සහ විගණන හරහා ප්‍රමාණවත් කැමරා සංඛ්‍යාවක් පවතී ද, එසේම එම කැමරාවන්හි ක්‍රියාකාරීත්වය, නිරවද්‍යතාවය, ක්‍රියාත්මක ද නැත්ද යන වග, වාර්තාවන් තබා ගැනීම සහ අනෙකුත් ප්‍රධානතම අවශ්‍යතාවයන් පිළිබඳව අවධානය යොමු කළ යුතු වේ. CCTV ආවරණයේ ප්‍රමාණවත් බව සම්බන්ධයෙන් කරන ලද එවැනි සමාලෝචනයන්/විගණන අධ්‍යක්ෂ මණ්ඩලය සහ ඉහළ කළමණාකාරීත්වය වෙත දැනුම් දිය යුතු වේ.

27. අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කරන ලද වාර්තාවට අනුව, CCTV ආවරණය ප්‍රමාණවත් නොවේ නම් හෝ ඉහළ තත්ත්වයක් සහ ආවරණයක් අවශ්‍ය වන්නේ නම්, එවැනි දුර්වලතා මග හරවා ගැනීමට හෝ සුදුසු පරිදි ආවරණය වැඩි කිරීමට අවශ්‍ය නිසි පියවර ගැනීම අධ්‍යක්ෂ මණ්ඩලය සහ ඉහළ කළමණාකාරීත්වය විසින් සිදුකළ යුතුය. තවද, CCTV පද්ධතියේ කිසියම් දෝෂයක් අනාවරණය වූ වහාම එම අදාළ උපකරණ වැඩිදියුණු කිරීමට හෝ නැවත ස්ථාන ගත කිරීම සඳහා කඩිනම් පියවර ගත යුතුය.

28. CCTV පද්ධතිය යාවත්කාලීන කිරීම, ප්‍රතිශෝධනය කිරීම සහ වාර්තාවන් ඉවත් කිරීම ඇතුළු CCTV පද්ධතිය සම්බන්ධයෙන් සිදුකරනු ලබන නඩත්තු කටයුතු සහ වෙනස් කිරීම් සම්බන්ධයෙන් පැහැදිලි ලෙස සටහන් තබා ගත යුතු අතර ඒ පිළිබඳව සුදුසු පරිදි ඉහළ කළමණාකාරීත්වය වෙත දැනුම් දීමක් ද සිදු කළ යුතු වේ.

චක්‍රලේඛ අංකඃ 04/2021 2021 ඔක්තෝම්බර් 04

බලපත්‍රලාභී බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන්, සාමාන්‍යාධිකාරිවරුන්, කළමනාකරණ අධ්‍යක්ෂවරු වෙත,

2021 අංක 18 දරන මුදල් පනත යටතේ කරන ලද තැන්පතු

2021 අංක 18 දරන මුදල් පනත යටතේ කිසියම් පුද්ගලයෙකු/ආයතනයක් බලපත්‍රලාභී බැංකුවක් හරහා අරමුදල් තැන්පත් කරන විට, එවැනි බලපත්‍රලාභී බැංකුවක් 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත සහ ඒ යටතේ නිකුත් කරන ලද ඕනෑම රීති, රෙගුලාසි, නියෝග සහ මාර්ගෝපදේශයන්හි නියම කර ඇති අවශ්‍යතාවලට අනුකූල වීම අවශ්‍ය වේ.

මීට අමතරව, ඉහත යෝජනා ක්‍රමය යටතේ ගනුදෙනුකරුවෙකු තැන්පතුවක් කරන විට, එවැනි තැන්පතුවක් "තැන්පත් කරනු ලබන්නේ 2021 අංක 18 දරන මුදල් පනත යටතේ" බව තැන්පතු පත්‍රිකාවේ සඳහන් කළ යුතුය.

මීට විශ්වාසී
අධ්‍යක්ෂ
මූල්‍ය බුද්ධි ඒකකය

පිටපතඃ 1. අධ්‍යක්ෂ, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

2. අනුකූලතා නිලධාරීන්

යොමු අංකය : 33/04/012/0011/005 2021 ජනවාරි 01

සියලුම බලපත්‍රලාභී බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන් වෙත,

"විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සඳහා දිරි දීමනා යෝජනා ක්‍රමය" සම්බන්ධයෙන් බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස් සඳහා සංශෝධන

2020.12.22 දිනැති "විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සඳහා දිරි දීමනා යෝජනා ක්‍රමය" පිළිබඳව බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස් (යොමුව: 33/04/012/0011/004) හා සබැඳේ.

ඉහත සඳහන් මෙහෙයුම් උපදෙස්හි 2(i) පරිඡේදය "විදේශයන්හි සේවයේ නියුතු / සේවය කර ඇති ශ්‍රී ලාංකිකයෙකු හෝ ශ්‍රී ලංකාවේ පදිංචිව සිටින ශ්‍රී ලාංකිකයෙකු විසින් විදේශයන්හි සේවා නියුක්ති ස්වභාවයේ සේවා සැපයීමක් තුළින් උපයන ලද විදේශ මුදල් ආදායම, 2020.12.28 දින හෝ එදිනට පසුව රුපියල්වලට පරිවර්තනය කිරීමේ දී එක්සත් ජනපද ඩොලරයකට රුපියල් 2.00ක අතිරේක මුදලක් ලබා ගැනීම සඳහා සුදුසුකම් ලබනු ඇත" යනුවෙන් මෙයින් සංශෝධනය කෙරෙනු ලැබේ.

ශ්‍රී ලංකා මහ බැංකුවේ ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු කාර්තුමය තොරතුරු සම්බන්ධ ආකෘතිය ඇමුණුම Iහි (යොමුව: පෙර නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස්හි 5(ii) වගන්තිය) දක්වා ඇත. ඇමුණුමෙහි ඇති ආකෘතියට අනුව පළමු වාර්තා කිරීම 2020.12.28 සිට 2021.03.31 දක්වා වූ කාලය සඳහා විය යුතු බව සලකන්න. පෙර නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස්වල සඳහන් අනෙකුත් අවශ්‍යතා (යොමුව: 33/04/012/0011/004) නොවෙනස්ව පවතී.

වැඩිදුර තොරතුරු සඳහා 0112398711, 0112477595 හෝ 0761754680 දුරකථන අංක ඔස්සේ ශ්‍රී ලංකා මහ බැංකුවේ ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව සම්බන්ධ කර ගත හැකි ය.

දේශමාන්‍ය මහාචාර්ය ඩබ්. ඩී, ලක්ෂ්මන්
අධිපති
ශ්‍රී ලංකා මහ බැංකුව

ඇමුණුම I

විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සඳහා දිරි දීමනා යෝජනා ක්‍රමය කාර්තුමය ප්‍රතිපූරණය සඳහා වන ඉල්ලීම

බැංකුවේ නම : .....

වාර්තා කිරීමේ කාලය : ..... දිනෙන් අවසන් වූ කාර්තුව

රුපියල්වලට පරිවර්තනය කරන ලද දිනය (අවු/මාසය/දිනය)	මුදල් වර්ගය	පරිවර්තනය කරන ලද මුදල			ගෙවන ලද දිරිදීමනාව රුපියල්වලින්
		මුදල් ප්‍රමාණයෙහි එ. ජ. ඩොලර් අගය	විනිමය අනුපාතය	මුදල් ප්‍රමාණයෙහි රුපියල් අගය	
..... කාර්තුව අවසානයේ දී ප්‍රතිපූරණය කළ යුතු මුළු මුදල					

ඉහත වාර්තාවේ අඩංගු තොරතුරු නිවැරදි සහ සම්පූර්ණ බවත්, එම තොරතුරු බැංකුව විසින් පවත්වාගෙන යනු ලබන ගිණුම් පොත් සහ ගනුදෙනුකරුවන්ගේ ලේඛනවලින් උපුටා ගෙන ඇති බවත් සහතික කරමු.

අත්සන : ....

නම : ....

තනතුරු: ප්‍රධාන විධායක නිලධාරී ප්‍රධාන අනුකූලතා නිලධාරී ප්‍රධාන මූල්‍ය නිලධාරි

දිනය : ....

යොමු අංකය : 33/04/012/0011/006 2021 ජනවාරි 27

සියලුම බලපත්‍රලාභී බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන් වෙත,

"විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සඳහා දිරිදීමනා යෝජනා ක්‍රමය" සම්බන්ධයෙන් බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස් සඳහා සංශෝධන

2020.12.22 සහ 2021.01.01 දිනැති "විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සඳහා දිරි දීමනා යෝජනා ක්‍රමය" පිළිබඳව බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස් හා සබැඳේ (යොමුව: 33/04/012/0011/004 සහ 33/04/012/0011/005).

ඉහත සඳහන් මෙහෙයුම් උපදෙස්හි, එක්සත් ජනපද ඩොලරයකට රුපියල් 2ක් වන දිරි දීමනාවේ වියදම ශ්‍රී ලංකා රජය විසින් දරනු ලැබේ.

ඒ අනුව, පහත ලැයිස්තුගත කර ඇති මාර්ගෝපදේශයන්ට යටත්ව, ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කෙරෙන විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවලින් සියයට දහයක්, සියලුම බලපත්‍රලාභී බැංකු විසින්, එක්සත් ජනපද ඩොලර්වලින්, ශ්‍රී ලංකා මහ බැංකුව වෙත වහාම ක්‍රියාත්මක වන පරිදි විකිණිය යුතු ය.

1. **ශ්‍රී ලංකා මහ බැංකුව වෙත එක්සත් ජනපද ඩොලර් විකිණීමේ වාර ගණන සහ සීමාව**

   (අ) බලපත්‍රලාභී බැංකුවක් විසින් රුපියල් බවට පරිවර්තනය කරන ලද විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවලින් සියයට දහයක අගය එක්සත් ජනපද ඩොලර් මිලියන එකකට සමාන වන දිනක දී, එම බලපත්‍රලාභී බැංකුව විසින් එම මුදල එක්සත් ජනපද ඩොලර්වලින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත විකිණිය යුතු වේ.

   (ආ) ඉහත 1.(අ) ඡේදයේ විධිවිධානවලට අනුකූල නොවන අවස්ථාවල දී, සෑම බලපත්‍රලාභී බැංකුවක් විසින්ම, පරිවර්තනය කරන ලද විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවලින් සියයට දහයක් අදාළ කාර්තුව තුළ දී එක්සත් ජනපද ඩොලර්වලින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත විකිණිය යුතු වේ.

   (ඇ) ඉහත 1.(අ) සහ (ආ) ඡේදවල සඳහන් කර ඇති විදේශ මුදල් පළමු වැඩ කරන දිනයේ දී ශ්‍රී ලංකා මහ බැංකුව වෙත විකිණීමේ දී:

      (i) ඉහත සඳහන් පරිදි රුපියල් බවට පරිවර්තනය කෙරෙන විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවලින් සියයට දහයක අගය එක්සත් ජනපද ඩොලර් මිලියන එකකට සමාන වන දිනට පසු වැඩ කරන දිනය, හෝ

      (ii) දී ඇති කාර්තුවක අවසාන වැඩ කරන දිනට පසුව හෝ, එළඹෙන පළමු වැඩ කරන දිනයේ දී සිදු කළ යුතු ය.

2. **ශ්‍රී ලංකා මහ බැංකුව වෙත එක්සත් ජනපද ඩොලර් විකිණීම සඳහා අදාළ වන එක්සත් ජනපද ඩොලර් / ශ්‍රී ලංකා රුපියල් විනිමය අනුපාතය**

   ශ්‍රී ලංකා මහ බැංකුව වෙත එක්සත් ජනපද ඩොලර් විකිණීම සඳහා පරිමාව මත පදනම් වූ බරිත සාමාන්‍ය එක්සත් ජනපද ඩොලර් / ශ්‍රී ලංකා රුපියල් විනිමය අනුපාතය අදාළ වේ. එක්සත් ජනපද ඩොලර් හැර පරිවර්තනය කරන ලද වෙනත් විදේශ මුදල් සම්බන්ධයෙන්, එම අගය එක්සත් ජනපද ඩොලර් / ශ්‍රී ලංකා රුපියල් විනිමය අනුපාතය අනුව සුදුසු පරිදි ගැලපිය යුතු ය.

3. **පියවිය යුතු කාල පදනම**

   ශ්‍රී ලංකා මහ බැංකුව සහ බලපත්‍රලාභී බැංකුවක් අතර සිදුවන සෑම ගනුදෙනුවක්ම, ගනුදෙනුව සිදු කරන දිනයට පසුදින එනම්, "T+1" පදනම මත පියවිය යුතු ය.

4. **පියවීම් හා සම්බන්ධ උපදෙස්**

   ගනුදෙනු පියවීමේ දී, බලපත්‍රලාභී බැංකු, සම්මත එක්සත් ජනපද ඩොලර් / ශ්‍රී ලංකා රුපියල් ගනුදෙනු සඳහා වන පියවීමේ උපදෙස් අනුගමනය කළ යුතු ය. බලපත්‍රලාභී බැංකු විසින් ගනුදෙනු ක්‍රියාත්මක කිරීම, "Thomson Reuters" හෝ "Bloomberg" ගනුදෙනු වේදිකා හරහා සිදු කළ යුතුය. කෙසේ වෙතත්, බලපත්‍රලාභී බැංකුවකට එවැනි ගනුදෙනු වේදිකා වෙත

ප්‍රවේශ වීමට පහසුකම් නොමැති නම්, එම බලපත්‍රලාභී බැංකුව ගනුදෙනුව ක්‍රියාත්මක කිරීම සඳහා මූලාශ්‍රයක් ලෙස නිල විද්‍යුත් තැපෑල භාවිත කළ යුතු ය.

5. තොරතුරු ඉදිරිපත් කිරීම

බලපත්‍රලාභී බැංකු විසින්, "..... දිනෙන් අවසන් වන සතිය / කාර්තුව සඳහා අදාළව රුපියල් බවට පරිවර්තනය කෙරෙන විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ - ..... (බලපත්‍රලාභී බැංකුවේ නම)" නමැති "MS Excel ආකෘතිය" සම්පූර්ණ කර dfx@cbsl.lk විද්‍යුත් තැපෑල වෙත, අදාළ පරිදි සතිපතා / කාර්තුමය පදනමින් යොමු කළ යුතු ය.

වැඩිදුර තොරතුරු හෝ පැහැදිලි කිරීම් සඳහා, 0112398711, 0112477595 හෝ 0761754680 දුරකථන අංක ඔස්සේ ශ්‍රී ලංකා මහ බැංකුවේ ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව සම්බන්ධ කරගත හැකි ය.

දේශමාන්‍ය මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
අධිපති
ශ්‍රී ලංකා මහ බැංකුව

යොමු අංකය: 33/04/012/0011/007 2021 පෙබරවාරි 18

සියලුම බලපත්‍රලාභී බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන් වෙත,

බලපත්‍රලාභී බැංකු සඳහා "අපනයන ආදායම ශ්‍රී ලංකාවට ආපසු ගෙන්වා ගැනීම" හා සම්බන්ධ මෙහෙයුම් උපදෙස්

සංශෝධිත 1949 අංක 58 දරන මුදල් නීති පනතේ 10(c) වගන්තිය සමග කියවිය යුතු 68 වැනි වගන්තියේ විධිවිධාන අනුව ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය (මෙතැන් සිට "ශ්‍රී ලංකා මහ බැංකුව" ලෙස හඳුන්වනු ලැබේ.) විසින් අපනයන ආදායම ශ්‍රී ලංකාවට ආපසු ගෙන්වා ගැනීම සහ එම අපනයන ආදායම ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කිරීම සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2021.02.18 දිනැති අංක 2215/39 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද 2021 අංක 1 දරන රීති (මෙතැන් සිට "රීති" ලෙස හඳුන්වනු ලැබේ.) හා සබැඳේ (රීතිවල පිටපතක් ඇමුණුම Iහි දක්වා ඇත).

එම රීතිවලට අනුව, සෑම භාණ්ඩ අපනයනකරුවෙකු විසින් ම, නැවත දැනුම් දෙන තුරු, අපනයන ආදායම ශ්‍රී ලංකාවට ලැබුණු වහාම, බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් (මෙතැන් සිට "බලපත්‍රලාභී බැංකු" ලෙස හඳුන්වනු ලැබේ.) හරහා එම අපනයන ආදායමෙන් සියයට විසිපහ (25%)ක්, ශ්‍රී ලංකා රුපියල් (මෙතැන් සිට "රුපියල්" ලෙසින්) බවට වහාම පරිවර්තනය කළ යුතු ය.

ඉහත සඳහන් රීති යටතේ භාණ්ඩ අපනයනකරුවන්ගෙන් මිලදී ගන්නා විවිධ මුදල් වර්ගවල අපනයන ආදායමෙන් සියයට පනහ (50%)ක් එක්සත් ජනපද ඩොලර්වලින් සියලුම බලපත්‍රලාභී බැංකු විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පහත සඳහන් මාර්ගෝපදේශ වලට යටත්ව, නැවත දැනුම් දෙන තුරු විකිණිය යුතු ය.

1. ශ්‍රී ලංකා මහ බැංකුව වෙත සිදු කරන එක්සත් ජනපද ඩොලර් විකිණීමේ වාර ගණන සහ සීමාව

භාණ්ඩ අපනයනකරුවන් විසින් විවිධ මුදල් ඒකකවලින් රුපියල් බවට පරිවර්තනය කළ මුළු අපනයන වටිනාකමෙන් සියයට පනහ (50%)ක අගය, ඕනෑම වැඩ කරන දිනයක දී එක්සත් ජනපද ඩොලර් මිලියන එකකට සමාන හෝ ඊට වඩා වැඩි වූ පසු, එම මුදල අදාළ බලපත්‍රලාභී බැංකුව විසින් ඊළඟ වැඩ කරන දිනයේ දී ශ්‍රී ලංකා මහ බැංකුව වෙත එක්සත් ජනපද ඩොලර්වලින් විකිණිය යුතු ය. (ඇමුණුම IIහි පෙන්වා ඇති උදාහරණය බලන්න).

2. ශ්‍රී ලංකා මහ බැංකුව වෙත එක්සත් ජනපද ඩොලර් විකිණීම සඳහා අදාළ වන එක්සත් ජනපද ඩොලර් / ශ්‍රී ලංකා රුපියල් විනිමය අනුපාතය

ශ්‍රී ලංකා මහ බැංකුව වෙත එක්සත් ජනපද ඩොලර් විකිණීම සඳහා පරිමාව මත පදනම් වූ බරිත සාමාන්‍ය එක්සත් ජනපද ඩොලර් / ශ්‍රී ලංකා රුපියල් විනිමය අනුපාතය අදාළ වේ. එක්සත් ජනපද ඩොලර් හැර පරිවර්තනය කරන ලද වෙනත් විදේශ මුදල් සම්බන්ධයෙන්, එම අගය එක්සත් ජනපද ඩොලර් / ශ්‍රී ලංකා රුපියල් විනිමය අනුපාතය අනුව සුදුසු පරිදි ගැළපිය යුතු ය.

3. පියවිය යුතු පදනම

ශ්‍රී ලංකා මහ බැංකුව සහ බලපත්‍රලාභී බැංකුවක් අතර සිදුවන සෑම ගනුදෙනුවක්ම ගනුදෙනුව සිදු කරන දිනයට පසුදින එනම්, "T+1" පදනම මත පියවිය යුතු ය.

4. පියවීම් හා සම්බන්ධ උපදෙස්

ගනුදෙනු පියවීමේ දී, බලපත්‍රලාභී බැංකු, සම්මත එක්සත් ජනපද ඩොලර් / ශ්‍රී ලංකා රුපියල් ගනුදෙනු සඳහා වන පියවීමේ උපදෙස් අනුගමනය කළ යුතු ය. බලපත්‍රලාභී බැංකු විසින් ගනුදෙනු ක්‍රියාත්මක කිරීම, "Thomson Reuters" හෝ Bloomberg" ගනුදෙනු වේදිකා හරහා සිදු කළ යුතු ය. කෙසේ වෙතත්, බලපත්‍රලාභී බැංකුවකට එවැනි ගනුදෙනු වේදිකා වෙත ප්‍රවේශ වීමට පහසුකම් නොමැති නම්, එම බලපත්‍රලාභී බැංකුව ගනුදෙනුව ක්‍රියාත්මක කිරීම සඳහා මූලාශ්‍රයක් ලෙස නිල විද්‍යුත් තැපෑල භාවිත කළ යුතු ය.

5. අපනයන ආදායම් අධීක්ෂණය කිරීම, වාර්තා තබාගැනීම සහ ගිණුම්කරණය

සියලුම බලපත්‍රලාභී බැංකු විසින් අදාළ රීතිවලට අනුව, ශ්‍රී ලංකාවට ලැබෙන අපනයන ආදායම් සහ එම ආදායම් රුපියල් බවට පරිවර්තනය කිරීම දැඩිව අධීක්ෂණය කළ යුතු අතර, මහ බැංකුව විසින් ඉල්ලා සිටින ඕනෑම අවස්ථාවක දී ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි, අවශ්‍ය සියලුම වාර්තා තහවුරු කිරීමේ ලියකියවිලි සමඟ පවත්වාගෙන යා යුතු ය. තව ද, බලපත්‍රලාභී බැංකු විසින් එම අපනයන ආදායම් සහ ඉහත අවශ්‍යතාවය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව වෙත එක්සත් ජනපද ඩොලර් විකිණීම සම්බන්ධයෙන් වෙනම ගිණුම් පවත්වාගෙන යා යුතු ය.

6. තොරතුරු ඉදිරිපත් කිරීම

සියලුම බලපත්‍රලාභී බැංකු විසින්, "..... දිනට පරිවර්තනය කරන ලද අපනයන ආදායම් ..... (බලපත්‍රලාභී බැංකුවේ නම)" නමැති පහත සඳහන් "MS Excel ආකෘතිය" නිසි පරිදි සම්පූර්ණ කර, ඉහත 1 ඡේදයේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුව, ඊළඟ වැඩ කරන දිනයේ දී dfx@cbsl.lk විද්‍යුත් තැපෑල වෙත යොමු කළ යුතු ය.

අ රුපියල් බවට පරිවර්තනය කළ දිනය (අවු/ මාසය/ දිනය)	ආ 25%ක අවශ්‍යතාවය යටතේ පරිවර්තනය කරන ලද මුළු අපනයන ආදායම එක් එක් මුදල් වර්ගය අනුව	ඇ පරිවර්තනය කරන ලද අපනයන ආදායමෙන් 50%ක වටිනාකම (ආ x 50%)	ඈ "ඇ"හි අගයට සමාන එක්සත් ජනපද ඩොලර් ප්‍රමාණය (ආසන්නත ම සම්පූර්ණ අගය)	ඉ අදාළ එක්සත් ජනපද ඩොලර්/ ශ්‍රී ලංකා රුපියල් විනිමය අනුපාතය
..... දිනට අදාළ එක්සත් ජනපද ඩොලර් / ශ්‍රී ලංකා රුපියල් පරිමාව මත බරිත සාමාන්‍ය විනිමය අනුපාතය (දශමස්ථාන දෙකකට වටයන ලද)				**XXX.XX**

වැඩිදුර තොරතුරු හෝ පැහැදිලි කිරීම් සඳහා, 0112398715, 0112477595 හෝ 0761754680 දුරකථන අංක ඔස්සේ ශ්‍රී ලංකා මහ බැංකුවේ ජාත්‍යන්තර මෙහෙයුම් දෙපාර්තමේන්තුව සම්බන්ධ කර ගත හැකි ය.

දේශමාන්‍ය මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
අධිපති
ශ්‍රී ලංකා මහ බැංකුව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
අති විශෙෂ

අංක 2215/39 - 2021 පෙබරවාරි මස 18 වැනි බ්‍රහස්පතින්දා - 2021.02.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

ශ්‍රී ලංකා මහ බැංකු නිවේදන

1949 අංක 58 දරන මුදල් නීති පනත

1949 අංක 58 දරන මුදල් නීති පනතේ 68 වන වගන්තිය සමග කියවිය යුතු 10 (c) වගන්තිය යටතේ සකස් කළ රීති.

අපනයනය මගින් ලද මුදල් ශ්‍රී ලංකාව වෙත ගෙන්වා ගැනීම

1. මේ රීති "2021 අංක 1 දරන අපනයනය මගින් ලද මුදල් ශ්‍රී ලංකාව වෙත ගෙන ඒමේ රීති" යනුවෙන් හඳුන්වනු ලැබිය යුතුය.

2. ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින්, 1949 අංක 58 දරන (සංශෝධිත) මුදල් නීති පනතෙහි 10 (c) වගන්තියෙහි විධිවිධාන සමග එක්ව කියවිය යුතු එම පනතේ 68 වන වගන්තියෙහි විධිවිධාන අනුව, අපනයනය මගින් ලද මුදල් ශ්‍රී ලංකාව වෙත ලැබීම සහ එකී මුදල් ශ්‍රී ලංකා රුපියල් බවට පරිව3රැ4තනය කිරීමට අරැළ රීති මෙමගින් නිකුත් කරනු ලබයි.

3. සෑම භාණ්ඩ අපනයනකරුවෙකුම, නැවත දැනුම් දෙන තුරු :

(i) අපනයනය කරන ලද සියලු භාණ්ඩවලට අරැළව අපනයනය කිරීමෙන් ලද මුදල්, භාණ්ඩ නැව්ගත කරන ලද දිනයේ සිට දින එකසිය අසූවක් (180) ඇතුළත ශ්‍රී ලංකාව වෙත ගෙන්විය යුතුය, සහ

(ii) සෑම අපනයනයක් සඳහාම ලද සියලු මුදල් ලැබීම්වලට අරැළ සියලු ලේඛනගත සාක්ෂි, එම මුදල් ලබන්නාවූ බලපත්‍රලාභී වාණිජ බැංකුවට හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවට (මෙහි මින්මතු "බලපත්‍රලාභී බැංකුව" වශයෙන් හඳුන්වනු ලබන)නොපමාව ඉදිරිපත් කළ යුතුය.

4. සෑම භාණ්ඩ අපනයනකරුවෙකුම, ඉහත 3 වන රීතිය යටතේ ඉල්ලා ඇති පරිදි අපනයනය මගින් ලද මුදල් ලැබුණු වහාම, බලපත්‍රලාභී බැංකුවක් මගින් එකී අපනයනය මගින් ලද මුළු මුදලින් සියයට විසි පහක ප්‍රතිශතයක් (25%) ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කළ යුතුය.

5. ඉහත සඳහන් කරන ලද අපනයනය කිරීම මගින් ලද මුදල් සියයට විසි පහක (25%) ප්‍රතිශතයකින් පරිවර්තනය කිරීමේ අවශ්‍යතාවය, මුදල් මණ්ඩලය මගින් කලින් කලට යම් වෙනත් ප්‍රතිශතයක් නියම කරනු ලබන තෙක් අඛණ්ඩව පවත්වාගෙන යා යුතුය.

6. සෑම බලපත්‍රලාභී බැංකුවක් විසින්ම ඉහත 3 වන රීතියෙන් නියම කරන ලද කාලය තුළ අපනයන කිරීම මගින් ලද මුදල් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම සහ ඉහත 4 වන රීතියෙන් නියම කර ඇති පරිදි එම මුදල් ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කිරීම අනිවාර්යයෙන්ම අධීක්ෂණය කළ යුතු අතර, ඒ සඳහා අරැළවන හෝ ඒ හා බැඳෙන සියලු ලිඛිත සාක්ෂි පවත්වාගෙන යා යුතුය.

7. සෑම බලපත්‍රලාභී බැංකුවක් විසින්ම කලින් කලට නියම කරනු ලබන පරිදි වාර්තා, ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත යොමු කළ යුතු අතර, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති හෝ නියෝජ්‍ය අධිපති විසින් බලය දෙනු ලබන ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරීන්හට ඉහත 6 වන රීතිය යටතේ පවත්වාගෙන යනු ලබන වාර්තා පරීක්ෂා කිරීම සහ එකී බලපත්‍රලාභී බැංකු විසින් මෙම රීතින් විෂයෙහි අනුකූලතාවය තහවුරු කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග පරීක්ෂා කිරීම සඳහා බාධාවකින් තොරවූ ප්‍රවේශයක් ලබා දිය යුතුය.

8. මෙකී රීති, අපනයනය කරන ලද සියලු භාණ්ඩ සඳහා සහ භාණ්ඩ නැව් ගත කරන ලද දිනයේ සිට එකසිය අසූව (180) වන දිනය මෙම රීති බලාත්මක වීමෙන් පසුව ඕනෑම දිනයක එළැඹෙන්නේ වී නම්, අදාළ විය යුතුය.

9. මෙම රීති, මෙහි මතු සඳහන් වන දිනයේ සිට වහාම ක්‍රියාත්මක වන පරිදි බලපැවැත්වේ.

10. සැක දුරුකර ගැනීම පිණිස හා මෙකී රීතිවල කාර්යය සඳහා "අපනයනය මගින් ලද මුදල්" යන්නට, 2019.10.17 දිනැති අංක 2145/49 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි 7 වන වගන්තිය සමග කියවිය යුතු 29 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද රෙගුලාසි ප්‍රකාරව ශ්‍රී ලංකාවට නැවත ගෙන්වා ගැනීමට අවශ්‍ය වන මුදල් ඇතුළත් වේ.

11. මෙම රීතීන් හි කාර්යය සඳහා, "බලපත්‍රලාභී වාණිජ බැංකුවක්" සහ "බලපත්‍රලාභී විශේෂිත බැංකුවක්" යන්නට, 1988 අංක 30 දරන බැංකු පනතේ ප්‍රතිපාදන යටතේ ඒවාට දී ඇති අර්ථයන් අදහස් වේ.

ඇමුණුම II

උදාහරණය: බැංකුව A - අපනයන ආදායම

(අ)	(ආ)	(ඇ)	(ඈ)	(ඉ)	(ඊ)	(උ)	(ඌ)	(එ)	(ඒ)	(ඔ)	(ඕ)
ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කළ දිනය	මුදල් වර්ගය	මුළු අපනයන ආදායම අදාළ මුදල් වර්ගයෙන්	පරිවර්තනය සඳහා අදාළ වන එක්සත් ජනපද ඩොලර් / ශ්‍රී ලංකා රුපියල් විනිමය අනුපාතය	මුළු අපනයන ආදායම එක්සත් ජනපද ඩොලර්වලට සමාන අගය	එක්සත් ජනපද ඩොලර්වලින් 25%ක අවශ්‍යතාවය යටතේ පරිවර්තිත මුළු මුදල [(ඉ) x 25%]	පරිවර්තිත අපනයන ආදායමෙන් 50% [(ඊ) x 50%]	(උ) හි සමුච්චිත අගය එක්සත් ජනපද ඩොලර්වලින්	ශ්‍රී ලංකා මහ බැංකුව වෙත විකිණීමට ඇති මුදල (එක්සත් ජනපද ඩොලර්වලින්)	අදාළ අනුපාතය	විකුණන දිනය	පියවීම් දිනය
2021.02.01	එ.ජ.ඩො.	10,000,000	194.00	10,000,000	2,500,000	1,250,000	1,250,000	1,250,000	194.00	2021.02.02	2021.02.03
2021.02.02	එ.ජ.ඩො.	5,000,000	194.20	5,000,000	1,250,000	625,000	625,000	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ
2021.02.03	එ.ජ.ඩො.	6,000,000	194.30	6,000,000	1,500,000	750,000	1,375,000	1,375,000	194.2545*	2021.02.04	2021.02.05
2021.02.04	යූරෝ	10,000,000	194.50**	12,000,000***	3,000,000	1,500,000	1,500,000	1,500,000	194.50	2021.02.05	2021.02.08
2021.02.05	යූරෝ	5,000,000	194.10	6,000,000***	1,500,000	750,000	750,000	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ	අදාළ නොවේ
2021.02.08	යූරෝ	6,000,000	194.20	7,200,000***	1,800,000	900,000	1,650,000	1,650,000	194.1545****	2021.02.09	2021.02.10

සටහන: ඉහත වගුවේ දක්වා ඇති සියලුම අංක, අනුපාත සහ දිනයන් මනඃකල්පිත වන අතර ඒවා නිදර්ශන අරමුණු සඳහා පමණක් භාවිත කර ඇත.

උපකල්පන: 2021.02.01 සඳුදා දිනයක් (ව්‍යාපාරික දිනයක්) වන අතර 2021 පෙබරවාරි මාසයේ සති අන්ත හැර නිවාඩු දින නොමැත.

*පරිමාව මත පදනම් වූ අදාළ බරිත සාමාන්‍ය අනුපාතය = [(194.20 x මිලියන 1.25) + (194.30 x මිලියන 1.5)] / (මිලියන 1.25 + මිලියන1.5)

= (242.75+291.45)/ මිලියන 2.75

= **194.2545**

**එක්සත් ජනපද ඩොලරය / ශ්‍රී ලංකා රුපියල් අනුපාතය, යුරෝ / ශ්‍රී ලංකා රුපියල් අනුපාතය සහ යුරෝ / එක්සත් ජනපද ඩොලර් අනුපාත මත පදනම්ව ව්‍යුත්පන්න කෙරේ. මෙම නිදර්ශනයේ, යුරෝ අපනයන ආදායම පරිවර්තනය කිරීමට භාවිත කරන යුරෝ / ශ්‍රී ලංකා රුපියල් අනුපාතය 233.40 ලෙස උපකල්පනය කෙරේ. තව ද, යුරෝ / එක්සත් ජනපද ඩොලර් අනුපාතය 1.2 ලෙස උපකල්පනය කෙරේ.

***පරිවර්තනය සඳහා අදාළ වන යුරෝ / එක්සත් ජනපද ඩොලර් අනුපාතය 1.2 වේ.

**** පරිමාව මත පදනම් වූ අදාළ බරිත සාමාන්‍ය අනුපාතය = [(194.10 x මිලියන1.50) + (194.20 ० මිලියන1.80)] / (මිලියන 1.50 + මිලියන 1.80)

= (291.15 + 349.56) / මිලියන 3.30

=**194.1545**

යොමු අංකය: 33/04/012/0011/008 2021 මාර්තු 17

සියලුම බලපත්‍රලාභී බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන් වෙත,

"විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සඳහා දිරි දීමනා යෝජනා ක්‍රමය" සම්බන්ධයෙන් බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස් සඳහා සංශෝධන

ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කරනු ලබන විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවලින් සියයට දහය (10%)ක් එක්සත් ජනපද ඩොලර්වලින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත විකුණන ලෙස 2021.01.27 දින බලපත්‍රලාභී බැංකු සඳහා නිකුත් කරන ලද විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ හා සම්බන්ධ සංශෝධිත මෙහෙයුම් උපදෙස් (යොමුව: 33/04/012/0011/006) හා සබැඳේ.

පවතින වෙළඳපොළ තත්ත්වයන් සැලකිල්ලට ගනිමින්, බලපත්‍රලාභී බැංකු විසින් පරිවර්තනය කරන ලද විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවලින් සියයට දහය (10%)ක් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත විකිණීමේ අවශ්‍යතාවය, නැවත දැනුම් දෙන තුරු 2021.03.17 දින සිට වහාම ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවා ඇත.

දේශමාන්‍ය මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
අධිපති
ශ්‍රී ලංකා මහ බැංකුව

යොමු අංකය: 33/04/012/0011/009 2021 මාර්තු 17

සියලුම බලපත්‍රලාභී බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන් වෙත,

"අපනයන ආදායම ශ්‍රී ලංකාවට ආපසු ගෙන්වා ගැනීම" සම්බන්ධයෙන් බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස් සඳහා සංශෝධන

ශ්‍රී ලංකාවට අපනයන ආදායම ආපසු ගෙන්වා ගැනීම හා සම්බන්ධ රීතිවලට අනුව, භාණ්ඩ අපනයනකරුවන්ගෙන් විවිධ මුදල් ඒකකවලින් මිලදී ගන්නා අපනයන ආදායමෙන් සියයට පනහ (50%)ක් එක්සත් ජනපද ඩොලර්වලින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත විකුණන ලෙසට බලපත්‍රලාභී බැංකු වෙත 2021.02.18 දින දී නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස් (යොමුව: 33/04/012/0011/007) හා සබැඳේ.

පවතින වෙළඳපොළ තත්ත්වයන් සැලකිල්ලට ගනිමින්, බලපත්‍රලාභී බැංකු විසින් අපනයන ආදායමෙන් සියයට පනහ (50%)ක් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත විකිණීමේ අවශ්‍යතාවය නැවත දැනුම් දෙන තුරු වහාම ක්‍රියාත්මක වන පරිදි 2021.03.17 දින සිට අත්හිටුවා ඇත.

දේශමාන්‍ය මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
අධිපති
ශ්‍රී ලංකා මහ බැංකුව

යොමු අංකය: 33/04/012/0011/002 2021 මාර්තු 29

සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකුවල සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරීන් සහ භාණ්ඩාගාර ප්‍රධානීන් වෙත,

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වනු ලබන, එක්සත් ජනපද ඩොලර් / ශ්‍රී ලංකා රුපියල් ගැණුම් - විකුණුම් හුවමාරු විදේශ මුදල් ගිවිසුම් වෙන්දේසි සඳහා සහභාගීවීමට අදාළව බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව වෙත මෙහෙයුම් උපදෙස්

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වනු ලබන එක්සත් ජනපද ඩොලර් (එ.ජ.ඩො.) / ශ්‍රී ලංකා රුපියල් (ශ්‍රී.ලං.රු.), ගැණුම් - විකුණුම් විදේශ මුදල් හුවමාරු ගිවිසුම් වෙන්දේසි සඳහා සහභාගී වීමේ දී පහත සඳහන් මෙහෙයුම් උපදෙස් අනුගමනය කරන ලෙස සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකුවලින් සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙන් ඉල්ලා සිටිනු ලැබේ.

1. **සහභාගී වීම සඳහා සුදුසුකම් ලබන බැංකු**

   සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව වෙන්දේසි සඳහා සහභාගී වීමට සුදුසුකම් ලබයි. බැංකුවල අභිප්‍රාය මත වෙන්දේසි සඳහා සහභාගී විය හැකි අතර, සහභාගී වීම අනිවාර්ය නොවේ.

2. **ආසන්න පියවීම් දිනයට (near leg) අදාළ එක්සත් ජනපද ඩොලර් / ශ්‍රී ලංකා රුපියල් විනිමය අනුපාතය**

   2.1 ආසන්න පියවීම් දිනය "එතැන් පදනම" මත නම්, ආසන්න පියවීම් දිනයට අදාළ එ.ජ.ඩො. / ශ්‍රී.ලං.රු. විනිමය අනුපාතය විය යුත්තේ ශ්‍රී ලංකා මහ බැංකුවේ නිල වෙබ් අඩවියේ අසන්නත ම දිනයේ දී පළ කර ඇති අනුරූපිත එ.ජ.ඩො. / ශ්‍රී.ලං.රු. එතැන් විනිමය අනුපාතයයි.

2.2 ආසන්න පියවීම් දිනය "එතැන් පදනම" මත නොවන්නේනම්, (එනම්, එදින, එදිනට පසුදින හෝ ඉදිරි පියවීම් පදනම මත) ආසන්න පියවීම් දිනයට අදාළ එ.ජ.ඩො. / ශ්‍රී.ලං.රු. විනිමය අනුපාතය විය යුත්තේ දිනකට ශත දෙක බැගින් සුදුසු ලෙස ගලපන ලද ඉහත 2.1හි සඳහන් අනුරූපිත එ.ජ.ඩො. / ශ්‍රී.ලං.රු. එතැන් විනිමය අනුපාතයයි (එනම් එදින සහ එදිනට පසුදින පියවීම් පදනම් සඳහා දිනකට ශත දෙක බැගින් එතැන් අනුරූපිත එ.ජ.ඩො. / ශ්‍රී.ලං.රු. එතැන් විනිමය අනුපාතයෙන් අඩු කළ යුතු අතර ඉදිරි පියවීම් පදනම් සඳහා දිනකට ශත දෙක බැගින් අනුරූපිත එ.ජ.ඩො. / ශ්‍රී.ලං.රු. එතැන් විනිමය අනුපාතයට එකතු කළ යුතු ය).

3. වෙන්දේසියේ කාලපරාසය

වෙන්දේසිය ආරම්භ වී විනාඩි තිහකින් වෙන්දේසිය අවසන් වේ.

4. වෙන්දේසි ක්‍රියාවලිය

4.1 එ.ජ.ඩො. / ශ්‍රී.ලං.රු., ගැණුම් - විකුණුම් විදේශ මුදල් හුවමාරු ගිවිසුම් වෙන්දේසි ක්‍රියාවලිය සඳහා fxswaps.iod@cbsl.lk විද්‍යුත් තැපැල් ලිපිනය භාවිත කළ යුතු ය.

4.2 වෙන්දේසියට අදාළ තොරතුරු අඩංගු වෙන්දේසි දැන්වීම, සුදුසුකම්ලත් බැංකුවල භාණ්ඩාගාර ප්‍රධානීන්ට සහ ඔවුන් විසින් නම් කරනු ලබන තවත් එක් විද්‍යුත් තැපැල් ලිපිනයකට, fxswaps.iod@cbsl.lk නිල විද්‍යුත් තැපැල් ලිපිනය මගින් සන්නිවේදනය කෙරෙනු ඇත. මීට සමගාමීව, වෙන්දේසියට අදාළ තොරතුරු "මධ්‍යම ඒකාග්‍රිත වෙළඳපොළ නිරීක්ෂණ (CIMM)" වෙබ් පිටුවේ ද පළ කෙරෙනු ඇත.

4.3 වෙන්දේසිය සඳහා වන ලංසු ඉදිරිපත් කිරීම සුදුසුකම්ලත් බැංකුවල අභිප්‍රාය මත සිදු කළ හැකි අතර, විය හැකි තාක්ෂණික දෝෂ මගහරවා ගැනීම සඳහා, වෙන්දේසිය නිමාවන වෙලාවට පෙර ලංසු ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

(එනම්, වෙන්දේසිය නිමාවන වේලාව දහවල් 12.00 නම්, දහවල් 12.00 දක්වා (දහවල් 12.00 ද ඇතුළුව) ශ්‍රී ලංකා මහ බැංකුවේ මේ සඳහා වෙන්කර ඇති fxswap.iod@cbsl.lk විද්‍යුත් තැපැල වෙත ලැබෙන සියලුම ලංසු සලකා බලනු ලබන අතර, දහවල් 12.01 සිට ලැබෙන ඕනෑම ලංසුවක් සලකා බලනු නොලැබේ).

4.4 වෙන්දේසි දැන්වීම සමඟ අමුණා ඇති excel ආකෘතියට අනුකූලව බැංකු විසින් සිය ලංසු ප්‍රමාණයන් සහ හුවමාරු මිල ගණන් (one-way ඒකමාර්ගික) fxswaps.iod@cbsl.lk විද්‍යුත් තැපැල වෙත එවිය යුතු ය.

4.5 වෙන්දේසිය සඳහා ඉදිරිපත් කරන ලද පරිමාව නොසලකා හැර, ලද ලංසුවලින් මුළු ප්‍රමාණයම පිළිගැනීම හෝ ඉන් කොටසක් පිළිගැනීම හෝ මුළු ප්‍රමාණයම ප්‍රතික්ෂේප කිරීම හෝ ඉන් කොටසක් ප්‍රතික්ෂේප කිරීම, ශ්‍රී ලංකා මහ බැංකුවේ ටෙන්ඩර් මණ්ඩලයේ අභිප්‍රාය මත සිදු කළ හැක.

5. වෙන්දේසියේ ප්‍රතිඵල සන්නිවේදනය කිරීම

5.1 fxswaps.iod@cbsl.lk විද්‍යුත් තැපැල් ලිපිනය ඔස්සේ වෙන්දේසියේ ප්‍රතිඵල සියලුම සුදුසුකම්ලත් බැංකු වෙත සන්නිවේදනය කෙරෙනු ඇත.

5.2 වෙන්දේසියේ දී පිළිගනු ලැබූ ලංසු ඉදිරිපත් කල බැංකු සඳහා අදාළ තොරතුරු fxswaps.iod@cbsl.lk විද්‍යුත් තැපැල් ලිපිනය මගින් සන්නිවේදනය කෙරෙනු ඇති අතර, අදාළ බැංකුව විසින් එලෙස සන්නිවේදනය කෙරෙන තොරතුරු තහවුරු කළ යුතු ය.

5.3 මෙම විද්‍යුත් තැපැල් සන්නිවේදනයන්, දෙපාර්ශ්වය අතර සිදු වූ ගනුදෙනු තහවුරු කිරීම් ලෙස සලකනු ලබන අතර, ඒ මත පදනම්ව ගණුදෙනු පියවීම් සඳහා වන ඉදිරි කටයුතු කළ යුතු ය.

5.4 ශ්‍රී ලංකා මහ බැංකුවේ ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තුමේන්තුවේ අභිප්‍රාය මත, අවශ්‍ය පරිදි සුදුසුකම්ලත් බැංකුවලින් වෙනත් ඕනෑම තොරතුරක් ඉල්ලා සිටිය හැකි ය.

6. ගණුදෙනු පියවීමේ උපදෙස්

සියලු බැංකු විසින් සම්මත ගනුදෙනු පියවීමේ පටිපාටීන් අනුගමනය කළ යුතු ය.

7. ශ්‍රී ලංකා මහ බැංකුව සම්බන්ධ කර ගත හැකි දුරකථන අංක

මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු හෝ පැහැදිලි කිරීම් සඳහා, 0112398715, 0112477595 හෝ 0112477084 දුරකථන අංක ඔස්සේ ශ්‍රී ලංකා මහ බැංකුවේ ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව සම්බන්ධ කර ගත හැකි ය.

ඩී කේ මායාදුන්න
අතිරේක අධ්‍යක්ෂ - ජාත්‍යන්තර මෙහෙයුම්
කටයුතු දෙපාර්තමේන්තුව

යොමු අංකය : 33/04/012/0011/010 2021 මැයි 28

සියලුම බලපත්‍රලාභී බැංකුවල ප්‍රධාන විධායක නිලධාධින් වෙත,

"විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සඳහා දිරි දීමනා යෝජනා ක්‍රමය" සම්බන්ධයෙන් බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස්

මෙය, 2020.12.22, 2021.01.01, 2021.01.27 සහ 2021.03.17 දිනැති "විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සඳහා දිරි දීමනා යෝජනා ක්‍රමය" පිළිබඳ බලපත්‍රලාභී බැංකු වෙත ලබා දුන් මෙහෙයුම් උපදෙස් හා සබැඳේ (යොමුවඃ පිළිවෙලින් 33/04/012/0011/004, 33/04/012/0011/005 සහ 33/04/012/0011/006, 33/04/012/0011/008).

2021.05.28 දින සිට ක්‍රියාත්මක වන පරිදි සියලුම බලපත්‍රලාභී බැංකු විසින්, ඉහත යෝජනා ක්‍රමය යටතේ ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කරන විවිධ විදේශ මුදල් ඒකකවල විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවලින් සියයට දහය (10%)ක් නැවත දැනුම් දෙන තුරු, සතිපතා එක්සත් ජනපද ඩොලර්වලින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත විකිණිය යුතු ය. මෙයට පෙර නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස්වල ඡේද 2, 3 සහ 4 යටතේ ඇති අනෙකුත් අවශ්‍යතා (ඇමුණුම Iහි ඇතුළත් 2021.01.27 දිනැති යොමුවඃ 33/04/012/0011/006) පෙර පරිදිම නොවෙනස්ව පවතිනු ඇත.

තවද, සියලුම බලපත්‍රලාභී බැංකු විසින් මෙහි ඇමුණුම IIහි දක්වා ඇති පරිදි විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ විකිණීම පිළිබඳව සතිපතා සහතිකයක්, එම ගණනය කිරීම තහවුරු කිරීම සඳහා ැංජැක වැඩ පත්‍රිකාවක් සමඟින් අදාළ වැඩකරන සතියේ ඩොලර් විකුණුම් සමඟ ඉදිරිපත් කළ යුතු අතර, එම ලියකියවිලි fxsales.mandatory@cbsl.lk විද්‍යුත් තැපෑල වෙත යොමු කළ යුතු ය.

වැඩිදුර තොරතුරු හෝ පැහැදිලි කිරීම් සඳහා 0112398715, 0112477595 හෝ 0761754680 දුරකථන අංක ඔස්සේ ශ්‍රී ලංකා මහ බැංකුවේ ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව සම්බන්ධ කර ගත හැකි ය.

දේශමාන්‍ය මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
අධිපති
ශ්‍රී ලංකා මහ බැංකුව

ඇමුණුම II

දිනයඃ

යොමුවඃ

අධ්‍යක්ෂ

ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා මහ බැංකුව

පරිවර්තනය කරන ලද විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවලින් සියයට දහය (10%)ක් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත විකිණීම

අමුණා ඇති excel වැඩ පත්‍රිකාවේ අඩංගු තොරතුරු නිවැරදි බවත්, උපුටා ගෙන ඇති බවත් ඒවා ..... (බැංකුවෙහි නම) හි ගිණුම් පොත්වලට අනුකූල බවත් අපි මෙයින් සහතික කරමු.

එම තොරතුරුවල ඇතුළත් වන්නේ ..... සිට ..... දක්වා සතියක කාලය තුළ ලද විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ වන, එක්සත් ජනපද ඩොලර් මිලියන ..... වේ. ඒ අනුව, එක්සත් ජනපද ඩොලර් මිලියන ....., ... දිනයේ දී පියවෙන පරිදි, ශ්‍රී ලංකා මහා බැංකුව වෙත විකුණන ලදී.

අත්සනඃ

නමඃ

තනතුරඃ ප්‍රධාන අනුකූලතා නිලධාරී

අත්සනඃ

නමඃ

තනතුරඃ ප්‍රධාන මූල්‍ය නිලධාරී

අත්සනඃ

නමඃ

තනතුරඃ ප්‍රධාන විධායක නිලධාරී

යොමු අංකය: 33/04/012/0011/011 2021 මැයි 28

සියලුම බලපත්‍රලාභී බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන් වෙත,

"අපනයන ආදායම ශ්‍රී ලංකාවට ආපසු ගෙන්වා ගැනීම" සම්බන්ධයෙන් බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස්

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද 2021.02.18 දිනැති අංක 2215/39 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද අපනයන ආදායම ශ්‍රී ලංකාවට ආපසු ගෙන්වා ගැනීමේ 2021 අංක 1 දරන රීතීන්, සහ සංශෝධිත 2021.03.09 දිනැති අංක 2018/38 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද අපනයන ආදායම ශ්‍රී ලංකාවට ආපසු ගෙන්වා ගැනීමේ 2021 අංක 2 දරන රීතීන්, 2021.04.09 දිනැති අංක 2222/60 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද අපනයන ආදායම ආපසු ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීමේ 2021 අංක 3 දරන රීතීන්, සහ 2021.05.28 දිනැති අංක 2229/09 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද අපනයන ආදායම ආපසු ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීමේ 2021 අංක 4 දරන රීතීන් අනුව, අපනයන ආදායම ශ්‍රී ලංකාවට ආපසු ගෙන්වා ගැනීම සහ එම අපනයන ආදායම ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කිරීම හා සබැඳේ.

2021.05.28 දිනැති අංක 2229/09 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පිටපතක් ඇමුණුම Iහි ඇත.

ඉහත සඳහන් කළ, "අපනයන ආදායම ශ්‍රී ලංකාවට ආපසු ගෙන්වා ගැනීම සඳහා අදාළ වන රීති" යටතේ සහ ඒ අනුව, සෑම භාණ්ඩ අපනයනකරුවෙකුම, අපනයන ආදායම ශ්‍රී ලංකාවට ලැබීමෙන් පසු දින තිහක් (30) ඇතුළත දී එම ලැබුණු අපනයන ආදායමෙන් සියයට විසිපහ (25%)කට නොඅඩු ප්‍රමාණයක් මුදල් මණ්ඩලය විසින් කලින් කලට තීරණය කරන හෝ වෙනත් ප්‍රතිශතයක් ශ්‍රී ලංකා රුපියල්වලට බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් (මින් ඉදිරියට "බලපත්‍රලාභී බැංකු" ලෙසින් හඳුන්වනු ලැබේ) හරහා, නැවත දැනුම් දෙන තුරු අනිවාර්යයෙන් පරිවර්තනය කළ යුතු ය.

ඒ අනුව, ඉහත රීති යටතේ, ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කරන ලද සියයට විසිපහ (25%)ක අපනයන ආදායමෙන් (එක්සත් ජනපද ඩොලර් වලට සමාන), සියයට දහය (10%)ක්, සියලුම බලපත්‍රලාභී බැංකු විසින් 2021.05.28 දින සිට බලපැවැත්වෙන පරිදි සතිපතා, එක්සත් ජනපද ඩොලර්වලින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත නැවත දැනුම් දෙන තුරු විකිණීම අවශ්‍ය වේ.

කලින් නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස්වල ඡේද 2, 3, 4 සහ 5 යටතේ ඇති අනෙකුත් අවශ්‍යතා (ඇමුණුම IIහි ඇතුළත් 2021.02.18 දිනැති යොමුව 33/04/012/0011/007) පෙර පරිදිම නොවෙනස්ව පවතිනු ඇත.

තවද, සියලුම බලපත්‍රලාභී බැංකු විසින් මෙහි ඇමුණුම IIIහි දක්වා ඇති පරිදි අපනයන ආදායම් විකිණීම පිළිබඳව සතිපතා සහතිකයක්, එම ගණනය කිරීම තහවුරු කිරීම සඳහා excel වැඩ පත්‍රිකාවක් සමඟින් අදාළ වැඩකරන සතියේ ඩොලර් විකුණුම් සමඟ ඉදිරිපත් කළ යුතු අතර, එම ලියකියවිලි fxsales.mandatory@cbsl.lk විද්‍යුත් තැපෑල වෙත යොමු කළ යුතු ය.

මුදල් නීති පනතේ විධිවිධානවලට අනුකූලව රීති සමඟ කියවෙන කවර හෝ මෙම මෙහෙයුම් උපදෙස්වලට අනුකූල වීමට අපොහොසත් වීම වරදක් වන බව සලකන්න.

වැඩිදුර තොරතුරු හෝ පැහැදිලි කිරීම් සඳහා, 0112398715, 0112477595 හෝ 0761754680 දුරකථන අංක ඔස්සේ ශ්‍රී ලංකා මහ බැංකුවේ ජාත්‍යන්තර පහසුකම් කටයුතු දෙපාර්තමේන්තුව සම්බන්ධ කර ගත හැකිය.

දේශමාන්‍ය මහාචාර්ය ඩබ්ලිව් ඩී ලක්ෂ්මන්
අධිපති
ශ්‍රී ලංකා මහ බැංකුව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
අති විශෙෂ
අංක 2229/9 - 2021 මැයි මස 28 වැනි සිකුරාදා - 2021.05.28
(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

ශ්‍රී ලංකා මහ බැංකු නිවේදන

1949 අංක 58 දරන මුදල් නීති පනත

1949 අංක 58 දරන මුදල් නීති පනතෙහි 68 වන වගන්තිය සමග එක්ව කියවිය යුතු 10 (c) වන වගන්තිය

යටතෙහි සාදනු ලබන රීති

දේශමාන්‍ය මහාචාර්ය ඩබ්ලිව් ඩී ලක්ෂ්මන්
අධිපති
ශ්‍රී ලංකා මහ බැංකුව

අපනයනය මගින් ලද මුදල් ශ්‍රී ලංකාව වෙත ගෙන්වා ගැනීම

1. මෙම රීති "2021 අංක 4 දරන අපනයන මගින් ලද මුදල් ශ්‍රී ලංකාව වෙත ගෙන ඒමේ රීති" යනුවෙන් හඳුන්වනු ලැබිය යුතුය.

2. 2021 මාර්තු 9 වැනි දිනැති අංක 2218/38 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි ප්‍රකාශයට පත් කළ අපනයන මගින් ලද මුදල් ශ්‍රී ලංකාව වෙත ගෙන ඒමේ රීති සහ 2021 අප්‍රේල් 9 වන දිනැති අංක 2222/60 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි ප්‍රකාශයට පත් කළ අපනයන මගින් ලද මුදල් ශ්‍රී ලංකාව වෙත ගෙන ඒමේ රීති මගින් සංශෝධනය කරන ලද ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය මගින් නිකුත් කළ සහ 2021 පෙබරවාරි මස 18 වැනි දිනැති අංක 2215/39 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි ප්‍රකාශයට පත් කළ 2021 අංක 1 දරන අපනයනය මගින් ලද මුදල් ශ්‍රී ලංකාව වෙත ගෙන ඒමේ රීති, තවදුරටත් මෙමගින් සංශෝධනය කරනු ලැබේ.

අ. එහි 4 වන රීතිය ඉවත් කිරීමෙන් සහ පහත සඳහන් රීති ඒ වෙනුවට ආදේශ කිරීම මගින්

"4. සෑම භාණ්ඩ අපනයනකරුවෙකුම, ඉහත 3 වන රීතිය යටතේ ඉල්ලා ඇති පරිදි අපනයනය මගින් ලද මුදල් ලැබී දින තිහක (30) ඇතුළත, බලපත්‍රලාභි බැංකුවක් මගින් එකී අපනයනය මගින් ශ්‍රී ලංකාවට ලද මුළු මුදලින් සියයට විසි පහක (25%) ප්‍රතිශතයකට නොඅඩු ප්‍රමාණයක් ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කළ යුතුය.

4 අ. කෙසේ වෙතත්, විශේෂිත අපනයන අංශයන්හි හෝ අපනයන කර්මාන්තයන්හි හෝ තනි අපනයනකරුවන්ගේ අපනයන භාණ්ඩ සහ නිෂ්පාදන ක්‍රියාවලිය තුළ දේශීය වශයෙන් සපයාගත නොහැකි ආනයනික භාණ්ඩ ඉතා ඉහළ ප්‍රතිශතයක් භාවිත කරන බවට මුදල් මණ්ඩලය සෑහීමකට පත්වේ නම්, එවන් විශේෂිත අපනයන අංශයකට හෝ අපනයන කර්මාන්තයකට හෝ තනි අපනයනකරුවන්ට, ඔවුන්ගේ ශ්‍රී ලංකාවට ලැබෙන මුළු අපනයන ආදායමෙන් සියයට විසිපහක (25%) ප්‍රතිශතයකට වඩා අඩු ප්‍රමාණයක් රුපියල් බවට පරිවර්තනය කිරීමට අවසර දීමට මුදල් මණ්ඩලයට එහි අභිමතය පරිදි තීරණය කළ හැකිය.

කෙසේ වෙතත්, කිසිදු අවස්ථාවක, ඉහත සඳහන් කළ පරිදි, මුදල් මණ්ඩලය සිය අභිමතය පරිදි ලබා දිය හැකි එවැනි ආංශික නිදහස් කිරීමක් මුළු අපනයන ආදායමෙන් සියයට දහයකට (10%) අඩු නොවිය යුතුය."

"4 ආ. ඉහත රීති 4 සහ 4අ හි සඳහන් එම පරිව3රැ4තන දිනය, ඉහත 3 (ස) රීතියට අනුව ශ්‍රී ලංකාවට අපනයන ආදායම් ලැබීමට නියමිත දිනයට පසු දිනයක් නොවිය යුතුය. (එනම්, නැව් ගත කළ දින සිට දින එකසිය අසූවකට (180) නොවැඩි විය යුතුය.)"

ආ. 5 වන රීතිය ඉවත් කිරීමෙන් සහ පහත සඳහන් රීතිය ඒ වෙනුවට ආදේශ කිරීම මගින්

"5. මුදල් මණ්ඩලයට විදේශ විනිමය වෙළෙඳපොළෙහි ද්‍රවශීලතා තත්ත්වය සහ ශ්‍රී ලංකාවේ දළ නිල සංචිත මට්ටම් සළකා බලා ශ්‍රී ලංකාවට බලපත්‍රලාභි බැංකු හරහා ලැබෙන අපනයන ආදායම්වලින් ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කළ යුතු යැයි පවත්නා තත්ත්වයන් යටතේ යෝග්‍ය හා ගැලපෙනු ඇතැයි සිතිය හැකි, එවැනි වෙනත් ප්‍රතිශතයක් අවශ්‍ය පරිදි කළින් කලට පොදුවේ තීරණය කළ හැකිය."

අධ්‍යක්ෂ
ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු
දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

ඇමුණුම III

දිනය:

යොමුව:

අධ්‍යක්ෂ

ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා මහ බැංකුව

පරිවර්තනය කරන ලද විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවලින් සියයට දහය (10%)ක් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත විකිණීම

අමුණා ඇති excel වැඩ පත්‍රිකාවේ අඩංගු තොරතුරු නිවැරදි බවත්, උපුටා ගෙන ඇති බවත් ඒවා ..... (බැංකුවෙහි නම) හි ගිණුම් පොත්වලට අනුකූල බවත් අපි මෙයින් සහතික කරමු.

එම තොරතුරුවල ඇතුළත් වන්නේ ..... සිට ..... දක්වා සතියක කාලය තුළ ලද විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ වන, එක්සත් ජනපද ඩොලර් මිලියන ..... වේ. ඒ අනුව, එක්සත් ජනපද ඩොලර් මිලියන ....., ... දිනයේ දී පියවෙන පරිදි, ශ්‍රී ලංකා මහා බැංකුව වෙත විකුණන ලදී.

අත්සනः
නमः
තනතුරः ප්‍රධාන අනුකූලතා නිලධාරී
අත්සනः
නमः
තනතුරः ප්‍රධාන විධායක නිලධාරී

අත්සනः
නमः
තනතුරः ප්‍රධාන මූල්‍ය නිලධාරි

(අත්සන් කළ ලිපියේ ස්කෑන් කළ පිටපතක් සමඟ excel වැඩ පත්‍රිකාව යොමු කරන්න)

යොමු අංකය : 33/04/012/0011/012 2021 අගෝස්තු 06

සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරීන් වෙත,

අපනයන ආදායම අපනයනකරුවන්ගේ අදාළ (විදේශ මුදල්) ගිණුම් වෙත බැර කිරීම සම්බන්ධයෙන් බලපත්‍රලාභී බැංකු වෙත මෙහෙයුම් උපදෙස්

බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව (මෙතැන් සිට "බලපත්‍රලාභී බැංකු" ලෙස හඳුන්වනු ලැබේ). අදාළ ලියකියවිලි ස්වකීය බැංකුව වෙත ඉදිරිපත් කරන තුරු අපනයන ආදායම අපනයනකරුවන්ගේ විදේශ මුදල් ගිණුම්වලට බැර කිරීම කල් දමන බවට නිරීක්ෂණය වී ඇති අතර බලපත්‍රලාභී බැංකුවල මෙම ක්‍රියාමාර්ගය හේතුවෙන් අපනයනකරුවන්ට සැලකිය යුතු පාඩු ඇති කරන බව පෙනී ගොස් ඇත.

එම නිසා, සියලුම බලපත්‍රලාභී බැංකු, අපනයන ආදායම අදාළ බැංකුව වෙත ලැබුණු වහාම, එම ආදායම බැංකුවේ පවත්වාගෙන යනු ලබන අදාළ අපනයනකරුගේ විදේශ මුදල් ගිණුම / ගිණුම්වලට බැර කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ. එසේ අපනයන ආදායම් අදාළ විදේශ මුදල් ගිණුම්වලට බැර කිරීමෙන් අනතුරුව අවශ්‍ය ලියකියවිලි සහ / හෝ තොරතුරු අපනයනකරු/ අපනයනකරුවන් විසින් සපයන තෙක්, එම අපනයන ආදායම විදේශ මුදල් ගිණුම්වලින් ආපසු ගැනීම සහ/ හෝ පරිවර්තනය කිරීම නැවැත්වීමට, බලපත්‍රලාභී බැංකු විසින් පියවර ගතයුතු වේ.

මේ සම්බන්ධයෙන් වැඩිදුර පැහැදිලි කිරීම් අවශ්‍යනම්, 0112398715, 0112398711 හෝ 0112477084 දුරකථන අංක ඔස්සේ ශ්‍රී ලංකා මහ බැංකුවේ ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව සම්බන්ධ කර ගත හැකි ය.

දේශමාන්‍ය මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
අධිපති
ශ්‍රී ලංකා මහ බැංකුව

යොමු අංකය : 33/04/012/0011/13 2021 නොවැම්බර් 01

සියලුම බලපත්‍රලාභී බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන් වෙත,

"අපනයන ආදායම ශ්‍රී ලංකාවට ආපසු ගෙන්වා ගැනීම" සම්බන්ධයෙන් බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලද සංශෝධිත මෙහෙයුම් උපදෙස්

ශ්‍රී ලංකාව තුළට අපනයන ආදායම ආපසු ගෙන්වා ගැනීම සහ එම අපනයන ආදායම ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කිරීම හා සම්බන්ධව, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද 2021 අංක 5 දරන අපනයන ආදායම ශ්‍රී ලංකාවට ආපසු ගෙන්වා ගැනීම සඳහා වන රීතීන් සහ 2021.10.28 දින ප්‍රකාශයට පත් කරන ලද, 2251/42 දරන අති විශෙෂ ගැසට් පත්‍රය හා සබැඳේ.

2021.10.28 දිනැති අංක 2251/42 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පිටපතක් ඇමුණුම Iහි ඇත.

ඉහත සඳහන් කළ "අපනයන ආදායම ශ්‍රී ලංකාවට ආපසු ගෙන්වා ගැනීම හා සම්බන්ධ රීතීන්" යටතේ සහ ඒ අනුව, සෑම භාණ්ඩ හා සේවා අපනයනකරුවෙකුම ශ්‍රී ලංකාවට ලැබුනු අපනයන ආදායමෙන්, ඉහත සඳහන් රීතිවල නිශ්චිතව දක්වා ඇති බලයලත් ගෙවීම් සඳහා පමණක් භාවිත කිරීමෙන් අනතුරුව ඉතිරිවන අපනයන ආදායම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් (මෙතැන් සිට "බලපත්‍රලාභී බැංකු" ලෙස හඳුන්වනු ලැබේ) හරහා, එළඹෙන මාසයේ හත්වන (7 වැනි) දිනට හෝ ඊට පෙර, ශ්‍රී ලංකා රුපියල් බවට නැවත දැනුම් දෙන තුරු, අනිවාර්යයෙන් පරිවර්තනය කළ යුතු ය.

ඒ අනුව, සියලුම බලපත්‍රලාභී බැංකු විසින්, ඉහත සඳහන් රීති යටතේ අනිවාර්යයෙන් පරිවර්තනය කළ යුතු ඉතිරි අපනයන ආදායමෙන්

(සමාන එක්සත් ජනපද ඩොලර් අගය) *සියයට දහය (10%)*ක්, 2021.11.01 දින සිට, නැවත දැනුම් දෙන තුරු, සතිපතා, එක්සත් ජනපද ඩොලර් වලින්, ශ්‍රී ලංකා මහ බැංකුව වෙත විකිණිය යුතු වේ.

කලින් නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස් වල අනෙකුත් අවශ්‍යතා (2021.05.28 දිනැති යොමුව 33/04/012/0011/11 සහ 2021.02.18 දිනැති යොමුව 33/04/012/0011/0007 යටතේ 2,3,4 සහ 5 ඡේදවල නිශ්චිතව දක්වා ඇති) නොවෙනස්ව පවතිනු ඇත.

වැඩිදුර තොරතුරු හෝ පැහැදිලි කිරීම් සඳහා, 0112398715, 0112477084, 0112398711 හෝ 0112398708 දුරකථන අංක ඔස්සේ ශ්‍රී ලංකා මහ බැංකුවේ ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව සම්බන්ධ කර ගත හැකි ය.

ඔබගේ විශ්වාසී,

අජිත් නිවාඩ් කබ්රාල්
අධිපති
ශ්‍රී ලංකා මහ බැංකුව

ඇමුණුම I

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
අති විශෙෂ

අංක 2251/42 - 2021 ඔක්තෝබර් මස 28 වැනි බ්‍රහස්පතින්දා - 2021.10.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

රජයේ නිවේදන

1949 අංක 58 දරන මුදල් නීති පනත

1949 අංක 58 දරන මුදල් නීති පනතේ 68 වන වගන්තිය සමග කියවිය යුතු 10 (c) වගන්තිය යටතේ සකස් කළ රීතීන්

නිවාඩ් අජිත් ලෙස්ලි කබ්රාල්,
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති.

2021 ඔක්තෝබර් මස 28 වැනි දින,
ශ්‍රී ලංකා මහ බැංකුව,
කොළඹ දී ය.

අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම

1. මෙම රීති "2021 අංක 5 දරන අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන ඒමේ රීති" යනුවෙන් හඳුන්වනු ලැබිය යුතුය.

2. ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින්, 1949 අංක 58 දරන (සංශෝධිත) මුදල් නීති පනතෙහි 10 (ජ) වගන්තියෙහි විධිවිධාන සමග එක්ව කියවිය යුතු එම පනතේ 68 වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව ක්‍රියා කරමින්, අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාව වෙත ගෙන්වා ගැනීම සහ එකී මුදල් ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කිරීමට අදළ රීතීන් මෙමගින් නිකුත් කරනු ලබයි.

3. සෑම භාණ්ඩ හා සේවා අපනයනකරුවෙකුම ;

   (i) අපනයනය කරන ලද සියලු භාණ්ඩ හා ශ්‍රී ලංකාවෙන් පිටතට සපයන ලද සේවාවලට අදළව අපනයන ඉපැයීම්, අදළ පරිදි භාණ්ඩ නැව්ගත කරන ලද දිනයේ සිට හෝ සේවාවන් සැපයූ දිනයේ සිට, දින එකසිය අසූවක් (180) ඇතුළත අනිවාර්යයෙන්ම ශ්‍රී ලංකාව වෙත ගෙන්විය යුතුය.

   (ii) භාණ්ඩ හා සේවා අපනයනය සම්බන්ධයෙන් වන සියලුම අපනයන ඉපැයීම් ලද විගස, සියලු අපනයන ඉපැයීම් ලැබීම්වලට අදළ සියලු ලේඛනගත සාක්ෂි, එම මුදල් ලබන්නාවූ ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී වාණිජ බැංකුවකට හෝ අවසරලත් බලපත්‍රලාභී විශේෂිත බැංකුවකට (මෙහි මින්මතු "බලපත්‍රලාභී බැංකුව" වශයෙන් හඳුන්වනු ලබන) නොපමාව ඉදිරිපත් කළ යුතුය.

4. ඉහත 3 රීතියට අනුව අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන්වා ගන්නා සෑම භාණ්ඩ හා සේවා අපනයනකරුවෙකුම, මාසයක් තුළ, ශ්‍රී ලංකාවට ලැබෙන එම ආදායමෙන් පහත සඳහන් අවසරලත් ගෙවීම් සඳහා පමණක් භාවිතයෙන් අනතුරුව, ශේෂය එළඹෙන මාසයේ හත්වන (7) දින හෝ ඊට ප්‍රථම ශ්‍රී ලංකා රුපියල්වලට අනිවාර්යයෙන්ම පරිවර්තනය කළ යුතුය.

(i) භාණ්ඩ හා සේවා අපනයනකරුවාගේ ජගංම ගනුදෙනු සඳහා වන ප්‍රතිමුඛ ප්‍රේෂණ ;

(ii) භාණ්ඩ හා සේවා අපනයනකරුවාගේ විදේශ මුදල් නෝට්ටු ආපසු ලබා ගැනීම හෝ සංචාරක අරමුණු සඳහා මුදල් මාරු කිරීම ;

(iii) 2017 අංක 12 දරන විදේශ විනිමය පනත හෝ 1988 අංක 30 දරන බැංකු පනත (සංශෝධිත) යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද රෙගුලාසි, නියෝග සහ විධාන ප්‍රකාරව, භාණ්ඩ හා සේවා අපනයනකරුවන් ලබා ගන්නා ලද විදේශ ව්‍යවහාර ණය මුදල්, ආපසු ගෙවීමේ වියදම් සහ ණය වාරික ;

(iv) එක් මසක වගකීම් ද ඇතුළත්ව භාණ්ඩ හා සේවා අපනයනකරු විසින් භාණ්ඩ හා සේවා අපනයනය කිරීම සම්බන්ධයෙන් භාණ්ඩ මිලදී ගැනීම හා සේවා ලබා ගැනීම සඳහා විදේශ ව්‍යවහාර මුදලින් කරනු ලබන ගෙවීම් ත සහ

(v) ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජන සඳහා, එම ලබන්නා වූ අපනයන ආදායමෙන් ප්‍රතිශතාංක දහයක් (10%) දක්වා, සිදු කරන ගෙවීම්.

5. ඉහත 4 රීතියෙහි සඳහන් එකී පරිවර්තන දිනය ඉහත 3(i) රීතියට අනුව, අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ලැබිය යුතු දිනට පසු දිනයක් නොවිය යුතුය. (එනම්, භාණ්ඩ නැව්ගත කළ/සේවාව සැපයූ දිනයේ සිට දින එකසිය අසූවකට (180) පසු දිනයක් නොවිය යුතුය.)

6. සෑම බලපත්‍රලාභී බැංකුවක් විසින්ම ඉහත 3 වන රීතියෙන් නියම කරන ලද කාලය තුළ අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම සහ ඉහත 4 වන රීතියෙන් නියම කර ඇති පරිදි එම මුදල් ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කිරීම අනිවාර්යයෙන්ම දැඩිව අධීක්ෂණය කළ යුතු අතර, ඒ සඳහා අදළ වන හෝ ඒ හා බැඳෙන අවශ්‍ය සියලු ලිඛිත සාක්ෂි පවත්වාගෙන යා යුතුය.

7. සෑම බලපත්‍රලාභී බැංකුවක් විසින්ම කලින් කලට නියම කරනු ලබන පරිදි වාර්තා සහ/හෝ ප්‍රකාශන, ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත යොමු කළ යුතු අතර, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති හෝ නියෝජ්‍ය අධිපති විසින් බලය දෙනු ලබන ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරීන් හට ඉහත 6 වන රීතිය යටතේ පවත්වාගෙන යනු ලබන වාර්තා පරීක්ෂා කිරීම සහ එකී බලපත්‍රලාභී බැංකු විසින් මෙම රීතින් විෂයෙහි අනුකූලතාවය තහවුරු කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග සමාලෝචනය කිරීම සඳහා බාධාවකින් තොරවූ ප්‍රවේශයක් ලබා දිය යුතුය.

8. මෙම රීතින්ට අනුව, භාණ්ඩ හා සේවා අපනයනයේ දී, ඕනෑම භාණ්ඩ හෝ සේවා අපනයනකරුවෙකු හෝ බලපත්‍රලාභී බැංකුවක් විසින් මෙකී රීතීන් සමග අනුකූල නොවීමට හෝ උල්ලංඝනය කිරීමට විරුද්ධව ක්‍රියාත්මක වීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාට අයිතිය ඇත.

9. මෙම රීතින් බලාත්මක වන දින හෝ ඉන් පසුව අපනයනය කරන ලද සියලුම සහ සෑම භාණ්ඩයකට හා සේවාවකට සහ මෙම රීතිය බලාත්මක කිරීමට පෙර දිනක අපනයනය කරන ලද එහෙත් නැව් ගත කළ දින සිට එකසිය අසූව (180) වැනි දිනය මෙම රීතිය ක්‍රියාත්මක වූ දිනට පසු ඕනෑම දිනයක් වන භාණ්ඩ හා සේවා සඳහා ද මෙම රීතිය අදළ වේ.

10. සැක දුරුකර ගැනීම පිණිස හා මෙකී රීතිවල කාර්යය සඳහා "අපනයන ඉපැයීම්" යන්නට, 2021 පෙබරවාරි 03 දිනැති අංක 2213/37 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද, 2021 අංක 4 දරන විදේශ විනිමය (විවිධ ප්‍රාග්ධන ගනුදෙනු වර්ග) නියෝග ප්‍රකාරව ශ්‍රී ලංකාවට නැවත ගෙන්වා ගැනීමට අවශ්‍ය වන අපනයන ඉපැයීම්වලින් ලද මුදල් සහ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසිකයෙකුට වෘත්තීමය, වෘත්තීය හෝ ව්‍යාපාරික සේවා ඇතුළුව සේවා සැපයීමෙන් ශ්‍රී ලංකාවේ නේවාසිකයෙකුට විදේශ විනිමයෙන් ලැබෙන ගෙවීම් ඇතුළත් වේ.

11. මෙකී රීතිවල කාර්යය සඳහා "බලපත්‍රලාභී වාණිජ බැංකු" සහ "බලපත්‍රලාභී විශේෂිත බැංකු" යන්නට, 1988 අංක 30 දරන (සංශෝධිත) බැංකු පනතේ විධිවිධාන ප්‍රකාරව නියම කරන ලද අර්ථය අදළ වේ.

12. මෙම රීතිවල කාර්යය සඳහා "ජංගම ගනුදෙනු" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතුය.

13. මෙම රීතිවල කාර්යය සඳහා "විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු ආපසු ලබා ගැනීම හෝ සංචාරක අරමුණු වෙනුවෙන් මුදල් මාරු කිරීම" 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 9 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලද විධානයන් ප්‍රකාරව විය යුතුය.

14. 2021 මාර්තු 9 දිනැති අංක 2218/38 දරන ගැසට් (අති විශෙෂ) නිවේදනයෙහි පළ වූ, 2021 අංක 2 දරන අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීමේ රීතීන් මගින් සංශෝධිත පරිදි, 2021 පෙබරවාරි මස 18 දිනැති, 2215/39 දරන ගැසට් (අති විශෙෂ) නිවේදනයෙහි පළ වූ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද, 2021 අංක 1 දරන අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීමේ රීතීන්, 2021 අප්‍රේල් මස 9 දිනැති, අංක 2222/60 දරන ගැසට් (අති විශෙෂ) නිවේදනයෙහි පළ වූ, 2021 අංක 3 දරන අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීමේ රීතීන්, සහ 2021 මැයි මස 28 දිනැති, අංක 2229/9 දරන ගැසට් (අති විශෙෂ) නිවේදනයෙහි පළ වූ, 2021 අංක 4 දරන අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීමේ රීතීන් මෙමගින් අවලංගු කෙරේ.

යොමු අංකය : **33/04/012/0011/014** 2021 දෙසැම්බර් 01

සියලුම බලපත්‍රලාභී බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන් වෙත,

"විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ සඳහා ලබා දෙන අතිරේක දිරි දීමනා යෝජනා ක්‍රමය" පිළිබඳ මෙහෙයුම් උපදෙස්

2020.12.22 දින බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලදුව, 2021.01.01 සහ 2021.01.27 යන දිනවල සංශෝධනය කරන ලද (යොමුව: 33/04/012/0011/004, 33/04/012/0011/005 සහ 33/04/012/0011/006), "විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ සඳහා ලබා දෙන දිරි දීමනා යෝජනා ක්‍රමය" පිළිබඳව මෙහෙයුම් උපදෙස් හා සබැඳේ.

ඉහත සඳහන් කළ මෙහෙයුම් උපදෙස් අනුව "විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ සඳහා ලබා දෙන දිරි දීමනා ක්‍රමය" යටතේ සුදුසුකම් ලබන විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ සඳහා 2020.12.22 දිනැති මෙහෙයුම් උපදෙස් (යොමුව: 33/04/012/0011/004) අනුව ගෙවනු ලබන එක්සත් ජනපද ඩොලරයකට රුපියල් 2.00ක දිරි දීමනාවට අමතරව 2021.12.01 සිට 2021.12.31 දක්වා (දින දෙක ම ඇතුළත්ව) කාලය තුළ එක්සත් ජනපද ඩොලරයකට රුපියල් 8.00ක අමතර දිරි දීමනාවක් ගෙවීමට ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය තීරණය කර ඇත. ඒ අනුව, 2021 වසරේ දෙසැම්බර් මාසය තුළ ශ්‍රී ලංකා රුපියල්වලට හුවමාරු කෙරෙන විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ සඳහා වන මුළු දිරි දීමනාව එක්සත් ජනපද ඩොලරයකට රුපියල් 10.00ක් වේ.

බලපත්‍රලාභී බැංකු විසින් මීට ඉහත දී භාවිත කරන ලද ආකෘති පත්‍රයට අනුව, සුදුසුකම් ලත් ගනුදෙනුකරුවන්ට ගෙවනු ලබන එක්සත් ජනපද ඩොලරයකට රුපියල් 8.00ක අමතර දිරි දීමනාවට අදාළ හිමිකම් ඉල්ලුම්පත්‍රය 2022.01.15 දින හෝ ඊට පෙර ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් උපදෙස් දෙනු ලැබේ.

මීට ඉහත දී නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස්වල සියලුම උපදෙස් සහ අවශ්‍යතා (යොමු අංක: 33/04/012/0011/004, 33/04/012/0011/005 සහ 33/04/012/0011/006) නො වෙනස්ව පවතිනු ඇත.

වැඩිදුර තොරතුරු සඳහා, 0112398707, 0112398718 හෝ 0112398711 දුරකථන අංක ඔස්සේ ශ්‍රී ලංකා මහ බැංකුවේ ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව සම්බන්ධ කර ගත හැකි ය.

අජිත් නිවාඩ් කබ්රාල්
අධිපති
ශ්‍රී ලංකා මහ බැංකුව

යොමු අංකය : **33/04/012/0011/015** 2021 දෙසැම්බර් 13

සියලුම බලපත්‍රලාභී බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන් වෙත,

"අතැති විදේශ මුදල් තැන්පත් කිරීම, හුවමාරු කිරීම සහ ආයෝජනය කිරීම සඳහා මහජනතාව වෙත ලබාදී ඇති දිරිගැන්වීම්" පිළිබඳ මෙහෙයුම් උපදෙස්

1. රට තුළ ඇති සියලුම විදේශ ව්‍යවහාර මුදල් විධිමත් බැංකු පද්ධතිය හරහා යොමු කිරීම ප්‍රවර්ධනය කිරීමේ අරමුණින්, බලපත්‍රලාභී බැංකුවක් හරහා තම සන්තකයෙහි ඇති විදේශ ව්‍යවහාර මුදල් වහාම තැන්පත් කිරීමට, හුවමාරු කිරීමට හෝ ආයෝජනය කිරීමට සාමාන්‍ය ජනතාව දිරිගන්වනු ලැබේ.

2. සාමාන්‍ය ජනතාව පහත දැක්වෙන ආකාරවලට ලබා ගෙන තම සන්තකයෙහි තබාගෙන සිටින විදේශ ව්‍යවහාර මුදල් මේ සඳහා සුදුසුකම් ලබයි.
   (i) විදේශ සංචාර සඳහා බලපත්‍රලාභී බැංකුවකින් හෝ බලයලත් මුදල් හුවමාරු කරන්නෙකුගෙන් මිලදී ගෙන භාවිතයට නොගෙන ශ්‍රී ලංකාවට ගෙන එන ලද විදේශ ව්‍යවහාර මුදල් (එක්සත් ජනපද ඩොලර් 15,000ක් දක්වා හෝ වෙනත් විදේශ ව්‍යවහාර මුදලකින් එම වටිනාකමට සමාන මුදලක්),
   (ii) විදේශ සංචාර සඳහා පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකින් ලබාගෙන භාවිතයට නොගෙන ශ්‍රී ලංකාවට ගෙන එන ලද විදේශ මුදල් (එක්සත් ජනපද ඩොලර් 15,000ක් දක්වා හෝ වෙනත් විදේශ ව්‍යවහාර මුදලකින් එම වටිනාකමට සමාන මුදලක්),
   (iii) විදේශගතව සිටියදී රැකියාවෙන්, වෘත්තියෙන් හෝ ව්‍යාපාරයෙන් උපයා ශ්‍රී ලංකාවට ගෙන එන ලද විදේශ ව්‍යවහාර මුදල්,
   (iv) 2020 ජනවාරි 01 හෝ ඊට පසු විශේෂ තැන්පතු ගිණුම්වල තැන්පත් කිරීම සඳහා ශ්‍රී ලංකාවට ගෙන එන ලද විදේශ ව්‍යවහාර මුදල්.

3. 2021 වසරේ දෙසැම්බර් 13 සිට 31 දක්වා කාලය තුළ ඉහත 2 වැනි ඡේදයේ දක්වා ඇති පරිදි එවැනි විදේශ ව්‍යවහාර මුදල් තැන්පත් කරන, හුවමාරු කරන හෝ ආයෝජනය කරන සාමාන්‍ය ජනතාවට පහත දිරිගැන්වීම් ලබා දෙන ලෙස බලපත්‍රලාභී බැංකුවලින් මෙයින් ඉල්ලා සිටිනු ලැබේ.
   (i) එවැනි විදේශ ව්‍යවහාර මුදල් ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කිරීමේ දී එක්සත් ජනපද ඩොලරයකට හෝ එම වටිනාකමට සමාන වෙනත් විදේශ ව්‍යවහාර මුදලක් සඳහා ශ්‍රී ලංකා රුපියල් 210.00ක් ගෙවීම (2021 වසරේ දෙසැම්බර් මාසය තුළ),

(ii) එවැනි විදේශ ව්‍යවහාර මුදල් ශ්‍රී ලංකා රුපියල් බවට හුවමාරු කර රුපියල් තැන්පතු ගිණුමක තැන්පත් කිරීමේ දී එක්සත් ජනපද ඩොලරයකට ශ්‍රී ලංකා රුපියල් 210.00ක් හෝ වෙනත් විදේශ ව්‍යවහාර මුදලක් සඳහා එම වටිනාකමට සමාන මුදලක් ගෙවීම (2021 වසරේ දෙසැම්බර් මාසය තුළ),

(iii) එවැනි විදේශ ව්‍යවහාර මුදල්, ගනුදෙනුකරුවන් ගේ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමට හෝ විශේෂ තැන්පතු ගිණුමට තැන්පත් කිරීමට අවසර දීම,

(iv) ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජනය කිරීමට අවසර දීම.

4. තවද, ඉහත 3(i) සහ 3(ii) ඡේදවල සඳහන් පරිදි 2021 වසරේ දෙසැම්බර් 13 සිට දෙසැම්බර් 31 දක්වා කාලය තුළ (දින දෙකම ඇතුළුව) ශ්‍රී ලංකා රුපියල් බවට හුවමාරු කරන ලද විදේශ ව්‍යවහාර මුදල්වලින් සියයට විස්ස (20%)ක් සතිපතා එක්සත් ජනපද ඩොලර්වලින් ශ්‍රී ලංකා මහ බැංකුවට විකිණීම සිදු කරන ලෙස සියලුම බලපත්‍රලාභී බැංකුවලින් මෙයින් ඉල්ලා සිටිනු ලැබේ. ඒ අනුව, බලපත්‍රලාභී බැංකු විසින් සාමාන්‍ය විදේශ විනිමය වෙළඳපොළ නිවාඩු සම්මුතිවලට යටත්ව, 2021 වසරේ දෙසැම්බර් 17 සිට ආරම්භ වන, යම් වැඩ කරන සතියක් සඳහා (සඳුදා සිට සිකුරාදා දක්වා) එම සතියේ ම සිකුරාදා (හෝ අවසාන වැඩ කරන දිනයේ දී) එම එක්සත් ජනපද ඩොලර් විකිණීම අවශ්‍ය වේ.

5. එක්සත් ජනපද ඩොලර් ශ්‍රී ලංකා මහ බැංකුවට විකිණීම සඳහා අදාළ එක්සත් ජනපද ඩොලර් ශ්‍රී ලංකා රුපියල් විනිමය අනුපාතිකය ශ්‍රී ලංකා මහ බැංකුව සහ බලපත්‍රලාභී බැංකු අතර ගනුදෙනු එක්සත් ජනපද ඩොලරයකට රුපියල් 200.00ක විනිමය අනුපාතිකයක් විය යුතු ය.

6. පියවීම් කාල සීමාව

ශ්‍රී ලංකා මහ බැංකුව සහ බලපත්‍රලාභී බැංකු අතර ගනුදෙනු TOM (එනම්, T+1)" පදනම මත විය යුතු ය.

7. පියවීම් උපදෙස්

ගනුදෙනු පියවීමේ දී, බලපත්‍රලාභී බැංකු සම්මත එක්සත් ජනපද ඩොලර් ශ්‍රී ලංකා රුපියල් පියවීම් උපදෙස් අනුගමනය කිරීම අවශ්‍ය වේ. ගනුදෙනු ක්‍රියාත්මක කිරීමේ දී බලපත්‍රලාභී බැංකු විසින් "Thomson Reuters" හෝ "Bloomberg" ගනුදෙනු වේදිකා හරහා ගනුදෙනු ක්‍රියාත්මක කළ යුතු ය. කෙසේ වෙතත්, බලපත්‍රලාභී බැංකුවකට එවැනි ගනුදෙනු වේදිකා සඳහා ප්‍රවේශය නොමැති නම්, එම බලපත්‍රලාභී බැංකුවට ගනුදෙනුව ක්‍රියාත්මක කිරීම සඳහා මූලාශ්‍රයක් ලෙස නිල විද්‍යුත් තැපෑල භාවිතා කළ හැකි ය.

8. තවද, බලපත්‍රලාභී බැංකු විසින් මෙහි ඇමුණුම I ප්‍රකාරව සාමාන්‍ය ජනතාවගෙන් පිළිගනු ලබන එවැනි විදේශ ව්‍යවහාර මුදල් විකිණීම පිළිබඳ සතිකයක් සතිපතා සාරාංශ ආකාරයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඉදිරිපත් කිරීම අවශ්‍ය වන අතර, ඒ සමඟ එම වැඩ කරන සතිය තුළ ශ්‍රී ලංකා මහ බැංකුවට එක්සත් ජනපද ඩොලර් විකිණීම සහ එම ගණනය කිරීමට සහය වීමට අදාළ Excel පත්‍රිකා fxsales.mandatory@cbsl.lk යන විද්‍යුත් තැපෑල වෙත යොමු කළ යුතු ය.

9. ඉහත 3(i) සහ 3(ii) ඡේදවල පරිදි බලපත්‍රලාභී බැංකු සාමාන්‍ය ජනතාවට ගෙවන එක්සත් ජනපද ඩොලරයකට රුපියල් 10.00ක (රුපියල් 210.00 - රුපියල් 200.00 (2021 වසරේ සැප්තැම්බර් 06 දිනැති බලපත්‍රලාභී බැංකු වෙත ශ්‍රී ලංකා මහ බැංකුවේ ඉල්ලීම පරිදි සාමාන්‍ය ගැනුම් විනිමය අනුපාතිකය)) දිරි දීමනාව සම්බන්ධයෙන් හිමිකම් අයදුම්පත 2022.01.15 දින හෝ ඊට පෙර ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඉදිරිපත් කරන ලෙස බලපත්‍රලාභී බැංකුවලට උපදෙස් දෙනු ලැබේ. අදාළ ආකෘති පත්‍රය ඇමුණුම IIහි ඇත.

10. ගිණුම්කරණය සහ වාර්තා තබා ගැනීම

බලපත්‍රලාභී බැංකු අවශ්‍ය අදාළ සියලුම ලියකියවිලි සමඟ ගෙවනු ලබන දිරි දීමනා සම්බන්ධයෙන් වෙනම ගිණුම් සහ වාර්තා පවත්වාගෙන යාම අත්‍යවශ්‍ය වේ.

වැඩිදුර තොරතුරු හෝ පැහැදිලි කිරීම් සඳහා, 0112398707, 0112398718 හෝ 0112398711 දුරකථන අංක ඔස්සේ ශ්‍රී ලංකා මහ බැංකුවේ ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව සම්බන්ධ කර ගත හැකි ය.

නිවාඩ් අජිත් ලෙස්ලි කබ්රාල්
අධිපති
ශ්‍රී ලංකා මහ බැංකුව

ඇමුණුම I

දිනය:

යොමුව:

අධ්‍යක්ෂ
ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

සාමාන්‍ය ජනතාව විසින් පරිවර්තනය කරන ලද විදේශ මුදල්වලින් සියයට 20ක් ශ්‍රී ලංකා මහ බැංකුවට විකිණීම

ඇමුණුමේ අමුණා ඇති Excel පත්‍රිකාවේ අඩංගු තොරතුරු නිවැරදි බවත්, ... (බැංකුවේ නම) ගිණුම් පොත්වලින් උපුටා ගෙන ඇති බවත්, ඒවාට අනුකූල බවත් අපි මෙයින් සහතික කරමු. එහි ..... දින සිට .....දින දක්වා සතිය තුළ සාමාන්‍ය ජනතාවගෙන් මිලදී ගෙන රුපියල් බවට පරිවර්තනය කරන ලද විදේශ මුදල් සඳහා එක්සත් ජනපද ඩොලර් වටිනාකම අන්තර්ගත වන අතර, ඒ අනුව ..... පියවීම් දිනයේ දී ශ්‍රී ලංකා මහ බැංකුවට එක්සත් ජනපද ඩොලර් ....ක් විකිණීම සිදු කරමු.

අත්සන: අත්සන:

නම: නම:

තනතුර: ප්‍රධාන අනුකූලතා නිලධාරි තනතුර: ප්‍රධාන මූල්‍ය නිලධාරි

අත්සන:

නම:

තනතුර: ප්‍රධාන විධායක නිලධාරි

(අත්සන් කළ ලිපියේ පරිලෝකනය කළ පිටපතක් Excel වැඩ පත්‍රිකාව සමඟ ඇමිණිය යුතු ය.)

ඇමුණුම II

දිනය:

යොමුව:

අධ්‍යක්ෂ
ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

සාමාන්‍ය මහ ජනතාවගෙන් භාර ගන්නා ලද විදේශ ව්‍යවහාර මුදල් බවට පත් කිරීමේ දී ලබා දෙන දිරි දීමනා 2021.12.13 සිට 2021.12.31 දක්වා ප්‍රතිපූරණ ඉල්ලීම

බැංකුවේ නම .....

(අ) ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කරන ලද දිනය දින/මාස/අවු	(ආ) මුදල් ඒකකය	(ඇ) එක්සත් ජනපද ඩොලර් බවට පරිවර්තනය කරන ලද මුදල	ගෙවන ලද දිරි දීමනාව ශ්‍රී ලංකා රුපියල්වලින් (ඈ = ශ්‍රී ලංකා රුපියල් 10 * ඇ)
මුළු මුදල			

ඉහත ඉල්ලීමේ අඩංගු තොරතුරු නිරවද්‍ය සහ සම්පූර්ණ වන අතර, බැංකුවේ පවත්වාගෙන යනු ලබන ගිණුම් පොත් සහ පාරිභෝගික ලැයිස්තු / වාර්තාවලින් උපුටා ගෙන ඇති බව අපි සහතික කරමු.

අත්සන	:	.....	.....
නම	:	.....	.....
තනතුර	: ප්‍රධාන අනුකූලතා නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි	ප්‍රධාන විධායක නිලධාරි

යොමු අංකය : 33/04/012/0011/016 2021 දෙසැම්බර් 15

සියලුම බලපත්‍රලාභී බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන් වෙත,

"අතැති විදේශ මුදල් තැන්පත් කිරීම, පරිවර්තනය කිරීම සහ ආයෝජනය කිරීම සඳහා මහජනතාව දිරිගැන්වීම" පිළිබඳ සංශෝධිත මෙහෙයුම් උපදෙස්

2021.12.13 දින නිකුත් කරන ලද "අතැති විදේශ මුදල් තැන්පත් කිරීම, පරිවර්තනය කිරීම සහ ආයෝජනය කිරීම සඳහා මහජනතාව දිරිගැන්වීම" පිළිබඳව බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස් හා සබැඳේ (යොමුව: 33/04/012/0011/015).

පහත 2 වන ඡේදය යටතේ පහත පරිදි නව අයිතමයක් ඇතුළත් කර ඇති බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

"2 (v) අදාළ ගනුදෙනුකරුවන් විසින් ප්‍රකාශ කරන ලද පරිදි වෙනත් මූලාශ්‍ර හරහා සිදු කළ අත්පත් කර ගැනීම් (ඇමුණුම අ)".

වැඩිදුර තොරතුරු හෝ පැහැදිලි කිරීම් සඳහා, 0112398707, 0112398718 හෝ 0112398711 දුරකථන අංක ඔස්සේ මහ බැංකුවේ ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව සම්බන්ධ කර ගත හැකි ය.

නිවාඩ් අජිත් ලෙස්ලි කබ්රාල්
අධිපති
ශ්‍රී ලංකා මහ බැංකුව

ඇමුණුම අ

කළමනාකරු
.....(බැංකු ශාඛාව)
.....(බැංකුව)

අරමුදල් මූලාශ්‍රය ප්‍රකාශනය

අද දින මා විසින් .....(බැංකුව සහ ශාඛාවේ නම) ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කරන ලද ..... (මුදල් වර්ගය) .....(මුදල් ප්‍රමාණය) නීත්‍යානුකූල මූලාශ්‍රවලින් ලබා ගත් ඒවා බව මෙයින් ප්‍රකාශ කරමි.

සම්පූර්ණ නමඃ ..... අත්සනඃ .....

ලිපිනය : .....

ජා.හැ. අංකයඃ ..... දිනය : (දින / මාස / වසර)

යොමු අංකය : 33/04/012/0011/017 2021 දෙසැම්බර් 27

සියලුම බලපත්‍රලාභී බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන් වෙත,

"සේවා නියුක්තියන්ගේ ප්‍රේෂණ සඳහා දිරිගැන්වීමේ යෝජනා ක්‍රමය", "අපනයන ආදායම ශ්‍රී ලංකාවට ආපසු ගෙන්වා ගැනීම", "සේවා නියුක්තියන්ගේ ප්‍රේෂණ සඳහා අමතර දිරි දීමනා යෝජනා ක්‍රමය" සහ "අතැති විදේශ මුදල් තැන්පත් කිරීම, පරිවර්තනය කිරීම සහ ආයෝජනය කිරීම සඳහා මහජනතාව දිරිගැන්වීම" පිළිබඳ සංශෝධිත මෙහෙයුම් උපදෙස්

ශ්‍රී ලංකා මහ බැංකුව වෙත අනිවාර්යෙන් විදේශ විනිමය විකිණීම සහ ඉහත යෝජනා ක්‍රම යටතේ පිරිනමනු ලබන දිරිගැන්වීම් හා සිදු කර ඇති පහත සඳහන් වෙනස්කම් බල ගැන්වීම සඳහා, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද ඉහත සඳහන් යෝජනා ක්‍රම 2021.12.27 වන දින සිට බල පැවැත්වෙන පරිදි සංශෝධනය වී ඇති බව සියලුම බලපත්‍රලාභී බැංකු වෙත මෙයින් දන්වා සිටිනු ලැබේ.

ඒ අනුව, සියලුම බලපත්‍රලාභී බැංකු පහත සඳහන් දෑ වලින් සියයට විසිපහ (25%)ක් සතිපතා එක්සත් ජනපද ඩොලර්වලින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත විකිණිය යුතු ය.

අ) ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කරනු ලබන සේවා නියුක්තියන්ගේ ප්‍රේෂණ (විවිධ මුදල් වර්ගවලින් ලැබුණු), නැවත දැනුම් දෙන තුරු,

ආ) ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කිරීම අනිවාර්ය වන අපනයන ආදායමේ ඉතිරිය, නැවත දැනුම් දෙන තුරු, සහ

ඇ) ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය වන සාමාන්‍ය ජනතාව අතැති විදේශ මුදල්, 2022.01.31 දක්වා.

තවද, 2021.12.01 දින නිකුත් කරන ලද "සේවා නියුක්තියන්ගේ ප්‍රේෂණ සඳහා අමතර දිරි දීමනා යෝජනා ක්‍රමය" සහ 2021.12.13 දින නිකුත් කරන ලද සහ 2021.12.15 දින සංශෝධිත "අතැති විදේශ මුදල් තැන්පත් කිරීම, පරිවර්තනය කිරීම සහ ආයෝජනය කිරීම සඳහා මහජනතාව දිරිගැන්වීම" මත නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස් යටතේ පිරිනැමෙන දිරිගැන්වීම්, 2022.01.31 දක්වා දීර්ඝ කර ඇති බව බලපත්‍රලාභී බැංකු වෙත මෙයින් දන්වා සිටිනු ලැබේ.

ඒ අනුව, බලපත්‍රලාභී බැංකු විසින් 2022.01.01 සිට 2022.01.31 දක්වා අදාළ හිමිකම් අයදුම්පත් 2022.02.15 දින හෝ ඊට පෙර ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඉදිරිපත් කළ යුතු ය.

ඉහත යෝජනා ක්‍රම මත මීට ඉහත දී නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස්හි දක්වා ඇති අනෙකුත් අවශ්‍යතා නොවෙනස්ව පවතී.

වැඩිදුර තොරතුරු හෝ පැහැදිලි කිරීම් සඳහා, 0112398707, 0112398711 හෝ 0112398715 දුරකථන අංක ඔස්සේ ශ්‍රී ලංකා මහ බැංකුවේ ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව සම්බන්ධ කර ගත හැකි ය.

අජිත් නිවාඩ් ලෙස්ලි කබ්රාල්
අධිපති
ශ්‍රී ලංකා මහ බැංකුව

යොමු අංකය : 08/25/001/0005/001 2021 ජනවාරි 05

මාර්ගෝපදේශ අංකය : SSSS/01/2021

ලංකාසෙට්ල් පද්ධතියේ සියලුම සහභාගිකරුවන් වෙත,

ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු තොරතුරු වාර්තා කිරීම සහ නිර්ලේඛිත සුරැකුම්පත් පියවීමේ පද්ධතිය වෙත සුරැකුම්පත් පියවීමේ උපදෙස් එවීම සඳහා වන මාර්ගෝපදේශයන්

2020.12.09 දින නිකුත් කරන ලද ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු තොරතුරු වාර්තා කිරීම සහ නිර්ලේඛිත සුරැකුම්පත් පියවීමේ පද්ධතිය වෙත සුරැකුම්පත් පියවීමේ උපදෙස් එවීම සඳහා වන මාර්ගෝපදේශයන් (අංක SSSS/02/2020) පහත පරිදි සංශෝධනය කෙරේ.

1. **මාර්ගෝපදේශ අංක 08** අවලංගු කරමින් පහත දැක්වෙන නව මාර්ගෝපදේශය ආදේශ කිරීම

''8. සහභාගිකරුවන් විසින් සුරැකුම්පත් පියවීමේ උපදෙස් ලංකාසෙක්‍යු පද්ධතියට ඇතුලත් කිරීම 2013 දී නිකුත් කරන ලද ලංකාසෙට්ල් පද්ධති රීතිවල අනුවාදය 2.1 හි, 3 වන වෙළුමේ 5.7 රීතියට අනුව සිදුකල යුතුය.''

එම්. ඉසඩ්.එම්. ආසිම්
රාජ්‍ය ණය අධිකාරී

ඩී. කුමාරතුංග
අධ්‍යක්ෂ ගෙවීම් හා පියවීම්

යොමු අංකය : 08/25/001/0005/001 2021 මාර්තු 26

චක්‍රලේඛ අංකය : PDD/01/2021

ලංකාසෙට්ල් පද්ධතියේ සියලුම සහභාගිකරුවන් වෙත,

චක්‍රලේඛය - රජයේ සුරැකුම්පත් ගනුදෙනු වාර්තාකරණය (ද්විතීයික වෙළඳපොළ)

1. රාජ්‍ය සුරැකුම්පත් ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු පිළිබඳ ක්‍රියාපිළිවෙත් වැඩි දියුණු කිරීම සහ ශක්තිමත් කිරීම, එවැනි ගනුදෙනුවල විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීම සහ ආයෝජකයින්ගේ ආරක්ෂාව සහ විශ්වාසය වැඩි කිරීම සඳහා **2021.04.01 දින සිට** ක්‍රියාත්මක වන පරිදි ද්විතීයික වෙළඳපොළෙහි රජයේ සුරැකුම්පත් ගනුදෙනු වාර්තාකරණ පද්ධතියක් හඳුන්වා දෙන ලදී.
2. අපේක්ෂිත ප්‍රාග්ධන වෙළඳපොළ සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියේදී වෙළඳපොළ හැසිරීම හඳුනා ගැනීම සඳහා මෙම ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය මඟින් ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරනු ලබයි.
3. ඒ අනුව, සහභාගිකරුවන් විසින් සියලුම **රජයේ සුරැකුම්පත් ගනුදෙනු** (හිමිකාරත්ව ගනුදෙනු, සේවාදායක ගනුදෙනු, ප්‍රතිමිලදී ගැනීමේ ගනුදෙනු, අත්පිට ගනුදෙනු) එහි **තහවුරු කරන ලද පියවීම්** සමඟ (පියවීම් දිනයේදී පියවීම් කරන ලද) දෛනිකව (2100 පැයේදී) FInNet පද්ධතිය හරහා වාර්තා කළ යුතුය.
4. වාර්තාකරණ උපදෙස් සඳහා ඇමුණුම සහ සවිස්තරාත්මක මෙහෙයුම් උපදෙස් සඳහා FInNet හි 'උපදෙස් සහිත මාර්ගෝපදේශය' බලන්න.
5. ඉහත (1) ට යටත්ව, සහභාගිකරුවෙකුට FInNet වාර්තාකරණය වැඩිදියුණු කිරීම හෝ සංවර්ධනය කිරීම සඳහා වන යම් කිසි අවශ්‍යතාවයක් තිබේ නම්, **2021.04.15 දක්වා** ඒ සඳහා ඉඩ සලසන අතර අවශ්‍යතා පදනම මත 2021.04.01 සිට 2021.04.15 දක්වා කාලය තුළ සුදුසු තාක්ෂණික සහාය ලබාදෙනු ලැබේ.

එම්. ඉසඩ්.එම්. ආසිම්
රාජ්‍ය ණය අධිකාරී

LSD-DF-01-TRD: ගනුදෙනු (අත්පිට / ප්‍රතිමිලදී ගැනීම් / ප්‍රතිවිකුණුම්) ඇමුණුම

Location: FInNet System → Daily Returns → LSD

- මෙම වාර්තාව ගනුදෙනුව ගිවිසුම්ගතවන දිනයේ දී ඉදිරිපත් කළ යුතුය.
- සුරැකුම්පත් හඳුනාගැනීමේ ජාත්‍යන්තර අංකය (සු.හ.ජා.අංකය) වෙන්කිරීම හෝ ගනුදෙනු තහවුරු කර තිබීම මෙම වාර්තාවේ දී බලාපොරොත්තු නොවේ.
- සියලුම ගනුදෙනු වාර්තා කරන්න.

				සුරැකුම්පත් බැර පාර්ශවය			සුරැකුම්පත් හර පාර්ශවය							
ගනුදෙනු යොමු අංකය	ගනුදෙනු වර්ගය	ගනුදෙනුව සිදුවන දිනය	ගනුදෙනු පියවීමේ දිනය	ලබන්නාගේ බැංකු හඳුනාගැනීමේ කේතය	ලබන්නාගේ ගිණුම	ලබන්නාගේ ප්‍රතිලාභ හිමි කේතය	නිකුත්කරන්නාගේ බැංකු හඳුනා ගැනීමේ කේතය	නිකුත්කරන්නාගේ ගිණුම	නිකුත් කරන්නාගේ ප්‍රතිලාභ හිමි කේතය	පියවීම් මුදල් ප්‍රමාණය (රු.)	නැවත පවරා ගන්නා/ කල් පිරෙන දිනය	නැවත පවරා ගන්නා/ කල් පිරෙන මුදල් ප්‍රමාණය (රු.)	ඵලදා/ පොලී අනුපාතය	ප්‍රකාශිත මිල
	උදා: AR													

*හිමිකාරත්ව/

සේවාලාභී (A/B)

සහ නැවත මිලදී ගැනීමේ/

අත්පිට ගනුදෙනු (R/O)

* - හිමිකාරත්ව ගනුදෙනු - සහභාගිකරුගේ ආයෝජන, වෙළඳාම හෝ අරමුදල් සම්පාදනය කිරීම අරමුණු කරගත් සහභාගිකරුගේ හිමිකාරත්ව (OWN) ගිණුමට බලපාන සුරැකුම්පත් චලනයන්

* - සේවාලාභී ගනුදෙනු - සහභාගිකරු විසින් ආයෝජන, වෙළඳාම හෝ අරමුදල් සම්පාදනය කිරීම අරමුණු කර නොගත්, ගනුදෙනුකරුවන් වෙනුවෙන් පමණක් සිදුකරන සුරැකුම්පත් චලනයන් (සහභාගිකරුවන් විසින් නියෝජිත කාර්යයක් ලෙස හෝ භාරකාර භූමිකාවේ ධාරිතාවයෙන් ගනුදෙනුකරුවන්ට සපයනු ලබන සේවාවන් මෙම කාණ්ඩය යටතේ ආවරණය කරනු ලැබේ)

LSD-DF-02-STR: පියවූ ගනුදෙනු (අත්පිට / ප්‍රතිමිලදී ගැනීම් / ප්‍රතිවිකුණුම්) **Location: FInNet System → Daily Returns → LSD**

- පියවීම් සිදුකරන දිනයේ දී වාර්තා කරන්න (පියවීම් සිදුකරන සැබෑ දිනයේ දී)
- සු.හ.ජා.අංකය වෙන්කිරීම (ISIN Allocation) ද ඒවාට අදාළ පියවීම් අගයන් / මුදල් ප්‍රමාණයන් නිවැරදිව වාර්තා කිරීම මෙම ලේඛනයේ දී අවශ්‍ය වේ.
- සියලු පියවූ ගනුදෙනු වාර්තා කරන්න (ප්‍රතිමිලදී ගැනීමේ ගනුදෙනුවල දී එක් එක් පාදයේ පියවීම් සිදුවන විට 1 පාදය සහ 2 පාදය යන දෙකම වාර්තා කල යුතුය)

ගනුදෙනු යොමු අංකය	ලංකාසෙක්‍යු හි අනුරූප TRN	ලබන්නාගේ බැංකු හඳුනාගැනීමේ කේතය	නිකුතු බැංකු හඳුනාගැනීමේ කේතය	සු.හ.ජා. අංකය (ISIN)	මුදල් ප්‍රමාණය / අගය	එක් එක් සු.හ.ජා. අංකයට (ISIN) එදිරිව පියවූ මුදල (රු.)

LSD-DF-01-TRD සහ **LSD-DF-02-STR** වාර්තා දෙකම සඳහා පහත ක්ෂේත්‍ර ආකෘති අනුගමනය කරන්න

a. දින ආකෘතිය : දිනය-මාසය - වර්ෂය (26 - මාර්තු - 2021) හෝ අදාළ නොවේ නම් " "
b. මුදල් ප්‍රමාණයන්: ගණන / අගය හෝ අදාළ නොවේ නම් '0'
c. බැංකු හඳුනාගැනීමේ කේත: අක්ෂර 11 කේතය
d. ගනුදෙනු වර්ගය= 'AO' හෝ 'BO' නම්, නැවත පවරා ගන්නා දිනය සහ නැවත පවරා ගන්නා මුදල හිස්ව තැබිය යුතුය
e. පියවීමේ දිනය ගනුදෙනුව සිදුවන දිනයට වඩා වැඩි හෝ සමාන විය යුතුය
f. නැවත පවරා ගන්නා දිනය පියවීමේ දිනයට වඩා වැඩි විය යුතුය
g. මෙම උපදෙස් වලට අනුව දත්ත අඩංගු ඕනෑම පේළියක් අදාළ සියලු තොරතුරු සමඟ සම්පූර්ණ කළ යුතුය (විශේෂයෙන්, එක් වෙළඳ වාර්තාවක් (one trade record) ලෙස වෙළඳ තොරතුරු වාර්තා කළ යුතු අතර, සුරැකුම්පත් මඟින් පියවීම සිදුකරන අවස්ථාවන්හිදී වෙන් වෙන් වශයෙන් විස්තර අවශ්‍ය නොවේ)

FInNet පද්ධතිය මඟින් වාර්තාවක් පිළිගන්නේ ද ප්‍රතික්ෂේප කරන්නේ ද යන වග ක්ෂේත්‍ර ආකෘති මත පදනම්ව තහවුරු කෙරේ. සවිස්තරාත්මක උපදෙස් සඳහා FInNet හි සපයා ඇති 'උපදෙස් සහිත මාර්ගෝපදේශය' බලන්න.

යොමු අංකය : 08/21/005/012/007 2021 සැප්තැම්බර් 23

භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රාථමික නිකුතුව සඳහා වන විධානයන්

1937 අංක 07 දරණ ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥා පනත යටතේ, 2009 ජුනි මස 24 වෙනි දින මුදල් අමාත්‍යාංශය මඟින් නිකුත් කරන ලද, 2009 අංක 01 දරන ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් (ප්‍රාථමික අලෙවිකරුවන්) රෙගුලාසි වලට අනුව රෙගුලාසි අංක 11 (1) යටතේ 2017 ජූලි 24 දින නිකුත් කරන ලද සහ 2019 ජුනි මස 09 වන දින සංශෝධනය කරන ලද භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රාථමික නිකුතුන් සඳහා වන විධානයන් සඳහා පහත සංශෝධන සිදු කරන ලද අතර 2021 සැප්තැම්බර් 23 වැනි දින සිට බලාත්මක වේ .

8.6. අදියර III — නිකුතුන් වලින් යම් ඉතිරි වූ ප්‍රමාණයන් වෙතොත් (අදාල කාණ්ඩය සඳහා අදියර I සහ II යටතේ නිවේදනය කරන ලද ප්‍රමාණය සහ නිකුත් කළ සම්පූර්ණ ප්‍රමාණය අතර වෙනස), අනිවාර්ය පදනම මත අදියර I හි දී තීරණය වූ බර තබන ලද සාමාන්‍ය ඵලදා අනුපාතිකය යටතේ, එක් එක් ප්‍රාථමික අලෙවිකරුවන්ගේ අදියර I සහ II හි සාර්ථක සහභාගීත්වය මත පදනම්ව, ප්‍රාථමික අලෙවිකරුවන්ට නිකුතු කිරීම සිදු වේ. කෙසේ වුවද ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඉදිරිපත් කළ ප්‍රමාණයෙන් අවම වශයෙන් 80% ක් වත් I වන අදියරේදී පිළිගැනීමක් නොකළහොත් මෙම අදියර ක්‍රියාත්මක නොවේ. මෙම අදියර යටතේ නිකුත් කිරීම ප්‍රාථමික අලෙවිකරුවන්ට පමණක් සීමා වේ. මෙම අදියර, කල් පිරීම සඳහා ඉතිරි කාලය අවුරුදු 5 හෝ ඊට අඩු භාණ්ඩාගාර බැඳුම්කර සඳහා පමණක් ක්‍රියාත්මක වේ.

11.1. — නිකුතු ක්‍රියාවලියේ අදියර I සහ II යටතේ නිකුත් කිරීමේ දී ටෙන්ඩර් කරන ලද මුළු ප්‍රමාණය නිකුත් කර නොමැති නම්, කල්පිරීම සඳහා ඉතිරි කාලය වසර 5 හෝ ඊට අඩු පරිණත කාලයක් ඇති භාණ්ඩාගාර බැඳුම්කර සඳහා ඉදිරිපත් කළ ප්‍රමාණයෙන් අවම වශයෙන් 80% ක ප්‍රමාණයක්වත් අදියර I යටතේ පිළිගෙන ඇති විටක පමණක්, අදියර II අවසන් වූ සැනින් ප. ව. 2.30 ට පමණ අදියර III ඉලෙක්ට්‍රොනිකව ක්‍රියාත්මක වනු ඇත. කල්පිරීම සඳහා ඉතිරි කාලය වසර 5ට වඩා වැඩි භාණ්ඩාගාර බැඳුම්කර සඳහා අදියර III ක්‍රියාත්මක නොවේ.

යොමු අංකය : 34/07/029/0001/002 2021 ජනවාරි 26

ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 01/2021

ලංකාසෙට්ල් පද්ධතියේ සියලුම සහභාගීත්ව ආයතන වෙත,

ලංකාසෙට්ල් පද්ධතියේ දෛනික මෙහෙයුම් කාල සටහන සංශෝධනය කිරීම

2021 පෙබරවාරි 01 වන දින සිට විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය, විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණය යන පද්ධති සඳහා (පැය 1545ට) නව පියවීම් චක්‍රයක් (චක්‍රය 5) ක්‍රියාත්මක කෙරේ.

පහත සඳහන් දෛනික මෙහෙයුම් කාල සටහන 2021 පෙබරවාරි 01 වන දින සිට අනුගමනය කෙරේ.

වේලාව	මෙහෙයුම	කාර්යයන්/ගනුදෙනු
0630 පැය	පද්ධතිය ආරම්භ කිරීම	තත්කාලීන දළ පියවීම් පද්ධතිය සහ නිර්ලේඛන සුරැකුම්පත් පද්ධතිය ආරම්භ කිරීම
0730 පැය සිට 0800 පැය දක්වා	දිනයේ ආරම්භක සැකසුම් කටයුතු	සුරැකුම්පත් සඳහා වන නිල මිල ගණන් යාවත්කාලීන කිරීම සහ දවස තුළ ලබා දෙන ද්‍රවශීලතා පහසුකම් සඳහා සුරැකුම්පත් හිමිකාරීත්වය සලකුණු කිරීම
0800 පැය	ලංකාසෙට්ල් පද්ධතිය ගනුදෙනු සඳහා විවෘත කිරීම	ගනුදෙනු ආරම්භ කිරීම සඳහා පද්ධතිය විවෘත කිරීම
0800 පැය	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම්/ප්‍රතිමිලදී ගැනීම් සහ නිත්‍ය තැන්පතු පහසුකම් ස්වයංක්‍රීයව පියවීම	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම් ලබා දීම සහ විවට වෙළඳ කටයුතු ආශ්‍රිත ප්‍රතිමිලදී ගැනීම්වල සහ නිත්‍ය තැන්පතු පහසුකම් වල දෙවැනි පාදයට අදාළ ආපසු ගෙවීම් කටයුතු

0815 පැය	දිනය ආරම්භයේ කරන කල් පිරීම්/පොලී ගෙවීම් ගොනු කිරීම් සහ ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් කල්පිරීම්	කල්පිරුණු සුරැකුම්පත් වලට අදාළ පියවීම්/සුරැකුම්පත් කුපන් සඳහා ගෙවීම්, ලංකාසෙටිල් පද්ධතියේ ගාස්තු/ දඩ මුදල් අය කිරීම් සහ ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් කල් පිරීම්
0830 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම.	ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් ක්‍රමයෙහි පළමු වන චක්‍රය ප්‍රධාන නිෂ්කාශන පද්ධතියට අදාළ ශුද්ධ නිෂ්කාශන ශේෂයන් පියවීම
0830 පැය	ස්ථිර පදනමක් මත මිලදී ගැනීම් හා විකුණුම්/ දිගුකාලීන ප්‍රතිමිලදී ගැනීම් වෙන්දේසිය/දිගුකාලීන ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් නිකුත් කිරීම	ස්ථිර පදනමක් මත මිලදී ගැනීම් හා විකුණුම් පියවීම/ දිගුකාලීන ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් වෙන්දේසිය සහ දිගුකාලීන ප්‍රතිමිලදී ගැනීම් වෙන්දේසියෙහි ප්‍රථම පාදය
0845 පැය	ප්‍රාථමික වෙන්දේසිය නිකුත් කිරීම (අදාල වන අවස්ථාවේදී)	ප්‍රාථමික වෙන්දේසිය නිකුත් කිරීම (අදාල වන අවස්ථාවේදී)
0845 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ පළමු චක්‍රය
0900 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ පළමු චක්‍රය
0900 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ පළමු චක්‍රය
1100 පැය	ප්‍රතිවිකුණුම් සහ ස්ථාවර ණය පහසුකමට අදාළ ආපසු ගෙවීම්	විවට වෙළඳ කටයුතු යටතේ ප්‍රතිවිකුණුම්වල සහ නිත්‍ය ණය පහසුකම්වල ප්‍රතිවිකුණුම්වල දෙවන පාදයට අදාළ පියවීම
1100 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ දෙවන චක්‍රය
1100 පැය	ද්‍රවශීලතා පහසුකමට අදාළ ආපසු ගෙවීම්	විවට වෙළඳ කටයුතු යටතේ ද්‍රවශීලතා පහසුකමෙහි දෙවන පාදයට අදාළ පියවීම
1115 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ දෙවන චක්‍රය
1115 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ දෙවන චක්‍රය
1145 පැය	දිගුකාලීන ප්‍රතිවිකුණුම් (වෙන්දේසිය)	විවට වෙළඳ කටයුතු යටතේ දිගුකාලීන ප්‍රතිවිකුණුම්වල ප්‍රථම පාදයට අදාළ පියවීම් කටයුතු
1300 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ තෙවන චක්‍රය
1300 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් ක්‍රමයෙහි දෙවන චක්‍රය
1300 පැය	ප්‍රාථමික වෙන්දේසියට අදාළ පියවීම් කටයුතු අවසන් කිරීම/කෙටි කාලීන ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් වෙන්දේසිය	ප්‍රාථමික වෙන්දේසියේ සුරැකුම්පත් පියවීම කෙටිකාලීන ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් වෙන්දේසිය පියවීම
1315 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ තෙවන චක්‍රය
1315 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ තෙවන චක්‍රය
1315 පැය	ද්‍රවශීලතා පහසුකම (වෙන්දේසිය)	විවට වෙළඳ කටයුතු යටතේ ද්‍රවශීලතා පහසුකම යටතේ ප්‍රථම පාදයට අදාළ පියවීම් කටයුතු

1315 පැය	කෙටිකාලීන ප්‍රතිමිලදී ගැනීම්/ ප්‍රතිවිකුණුම් (වෙන්දේසිය)	විවට වෙළඳ කටයුතු යටතේ කෙටිකාලීන ප්‍රතිමිලදී ගැනීම්/ ප්‍රතිවිකුණුම්වල ප්‍රථම පාදයට අදාළ පියවීම් කටයුතු
1445 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	පියවුම් නිෂ්කාශනය සහ ගැලපුම් නිෂ්කාශනය
1500 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් ක්‍රමයෙහි තෙවන චක්‍රය
1500 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ හතරවන චක්‍රය
1500 පැය	තුන්වන පාර්ශ්වීය ගනුදෙනු සඳහා පද්ධතිය වැසීම	අන්තර් බැංකුවලට අදාළ MT2XX කාණ්ඩයේ පණිවුඩ හැර එම දින තුළ තුන්වන පාර්ශ්වයේ අළුත් ගනුදෙනු (T+0) සඳහා පද්ධතිය වැසීම
1515 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ හතරවන චක්‍රය
1515 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ හතරවන චක්‍රය
1530 පැය	නිත්‍ය පහසුකම් ලබාගැනීම අවසන් කිරීම	සහභාගීත්ව ආයතන වලට නිත්‍ය ණය පහසුකම් හා නිත්‍ය තැන්පතු පහසුකම් 1530 පැයට වසනු ලැබේ.
1545 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ පස්වන චක්‍රය
1545 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි පස්වන චක්‍රය
1545 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ පස්වන චක්‍රය
1545 පැය	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ලබා දීම අවසන් කිරීම	සහභාගීත්ව ආයතන ද්‍රවශීලතා පහසුකම ලබා ගැනීම 1545 පැයෙන් පසු අවසන් කළ යුතුයි.
1600 පැය	නිත්‍ය තැන්පතු පහසුකම්	නිත්‍ය තැන්පතු පහසුකම් ප්‍රථම පාදයට අදාළ පියවීම
1615 පැය	නිත්‍ය ණය පහසුකම්	නිත්‍ය ණය පහසුකම් ප්‍රථම පාදයට අදාළ පියවීම
1615 පැය	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ආපසු ගෙවීම	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ආපසු අය කර ගැනීම
1630 පැය	ගනුදෙනු සඳහා පද්ධතිය වැසීම	පද්ධතිය විසින් මෙම වේලාවෙන් පසුව වැඩිදුරටත් ගනුදෙනු භාර නොගනී. ගනුදෙනු සඳහා පද්ධතිය වැසීමෙන් පසු එතෙක් පෙළගැසී තිබුණු ගනුදෙනු කිසිවක් වේ නම් ඒවා නතර කිරීම හා අවලංගු කිරීම සිදුවේ.
1630 පැය සිට 1700 පැය දක්වා	දවස අවසානයට අදාළ සැකසුම් කටයුතු	දවස අවසානයට අදාළ සැකසුම් කටයුතු උදා: වාර්තා පිළියෙළ කිරීම, අදාළ ගොනු පොදු ලෙජරය වෙත යොමු කිරීම, ලංකාසෙට්ල් ගාස්තු අය කිරීම සඳහා අදාළ දත්ත පිළියෙළ කිරීම සහ මුද්‍රණ වාර්තා සැකසීම අයත් වේ.
1700 පැය	පද්ධතිය සංවෘත කිරීම	තත්කාලීන දළ පියවීම් පද්ධතිය සහ නිර්ලේඛන සුරැකුම්පත් පියවීමේ පද්ධතියට අදාළ සියලුම මෘදුකාංග වසා දැමීම. දත්ත වෙනත් දත්ත ගබඩාවක සටහන් කිරීම.

සහභාගීත්ව ආයතන පිරික්සුම් නිකේතනය මඟින් සියලුම පියවීම් ගිණුම් නිරීක්ෂණය කල යුතු බවත්, බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනු තත්කාලීන දළ පියවීම් පද්ධතිය වෙත පියවීම් සඳහා යොමු කරන අවස්ථාවේදී තම පියවුම් ගිණුම්වල ප්‍රමාණවත් අරමුදල් ශේෂයක් පවත්වා ගැනීමට වගබලා ගතයුතු බවටත්, සහභාගීත්ව ආයතන වෙත මෙයින් උපදෙස් දෙනු ලැබේ.

ඩී. කුමාරතුංග
අධ්‍යක්ෂ, ගෙවීම් සහ පියවීම්

එම්. ඉසඩ්. එම් ආසීම්
අධිකාරී, රාජ්‍ය ණය

යොමු අංකය : 34/07/029/0001/002 2021 අප්‍රේල් 27

ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 02/2021

ලංකාසෙට්ල් පද්ධතියේ සියලුම සහභාගීත්ව ආයතන වෙත,

2021 අප්‍රේල් 30 වන දින සඳහා වූ ලංකාසෙට්ල් පද්ධතියෙහි විශේෂිත දෛනික මෙහෙයුම් කාල සටහන

සෙනසුරාදා දිනට යෙදෙන මැයි දිනය වෙනුවට 2021 අප්‍රේල් 30 වන දින විශේෂ අර්ධ දින බැංකු නිවාඩු දිනයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇති බැවින්, 2021 අප්‍රේල් 30 වන දින ලංකාසෙට්ල් පද්ධතියේ ව්‍යාපාරික වේලාවන් පහත සඳහන් මෙහෙයුම් කාල සටහනට අනුව සීමා කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව තීරණය කර ඇත.

වේලාව	මෙහෙයුම	කාර්යයන්/ගනුදෙනු
0630 පැය	පද්ධතිය ආරම්භ කිරීම	තත්කාලීන දළ පියවීම් පද්ධතිය සහ නිර්ලේඛන සුරැකුම්පත් පද්ධතිය ආරම්භ කිරීම
0730 පැය සිට 0800 පැය දක්වා	දිනයේ ආරම්භක සැකසුම් කටයුතු	සුරැකුම්පත් සඳහා වන නිල මිල ගණන් යාවත්කාලීන කිරීම සහ දවස තුළ ලබා දෙන ද්‍රවශීලතා පහසුකම් සඳහා සුරැකුම්පත් හිමිකාරිත්වය සලකුණු කිරීම
0800 පැය	ලංකාසෙට්ල් පද්ධතිය ගනුදෙනු සඳහා විවෘත කිරීම	ගනුදෙනු ආරම්භ කිරීම සඳහා පද්ධතිය විවෘත කිරීම
0800 පැය	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම්/ ප්‍රතිමිලදී ගැනීම් සහ නිත්‍ය තැන්පතු පහසුකම් ස්වයංක්‍රීයව පියවීම	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම් ලබා දීම සහ විවට වෙළඳ කටයුතු ආශ්‍රිත ප්‍රතිමිලදී ගැනීම්වල සහ නිත්‍ය තැන්පතු පහසුකම් වල දෙවැනි පාදයට අදාළ ආපසු ගෙවීම් කටයුතු
0815 පැය	දිනය ආරම්භයේ කරන කල් පිරීම්/පොලී ගෙවීම් ගොනු කිරීම් සහ ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් කල්පිරීම්	කල්පිරුණු සුරැකුම්පත් වලට අදාළ පියවීම්/ සුරැකුම්පත් කුපන් සඳහා ගෙවීම්, ලංකාසෙට්ල් පද්ධතියේ ගාස්තු/ දඩ මුදල් අය කිරීම් සහ ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් කල් පිරීම්
0830 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම.	ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් ක්‍රමයෙහි පළමු වන චක්‍රය ප්‍රධාන නිෂ්කාශන පද්ධතියට අදාළ ශුද්ධ නිෂ්කාශන ශේෂයන් පියවීම
0845 පැය	ප්‍රාථමික වෙන්දේසි නිකුත් කිරීම (අදාළ වන විට)	ප්‍රාථමික වෙන්දේසි නිකුත් කිරීම (අදාළ වන විට)
0845 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ පළමු චක්‍රය
0900 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ පළමු චක්‍රය
0900 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ පළමු චක්‍රය
1100 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ දෙවන චක්‍රය
1100 පැය	ප්‍රතිවිකුණුම් සහ ස්ථාවර ණය පහසුකම් වලට අදාළ ආපසු ගෙවීම්	විවට වෙළඳ කටයුතු යටතේ ප්‍රතිවිකුණුම්වල සහ නිත්‍ය ණය පහසුකම්වල ප්‍රතිවිකුණුම්වල දෙවන පාදයට අදාළ පියවීම්
1115 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ දෙවන චක්‍රය
1115 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ දෙවන චක්‍රය
1300 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් ක්‍රමයෙහි දෙවන චක්‍රය
1300 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ තෙවන චක්‍රය
1315 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ තෙවන චක්‍රය

1315 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ තෙවන චක්‍රය
1400 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	පියවුම් නිෂ්කාශනය සහ ගැලපුම් නිෂ්කාශනය
1415 පැය	තුන්වන පාර්ශ්වීය ගනුදෙනු සඳහා පද්ධතිය වැසීම	අන්තර් බැංකුවලට අදාළ MT2XX කාණ්ඩයේ පණිවුඩ හැර එම දින තුළ තුන්වන පාර්ශ්වයේ අළුත් ගනුදෙනු (T+0) සඳහා පද්ධතිය වැසීම
1430 පැය	නිත්‍ය පහසුකම් ලබාගැනීම අවසන් කිරීම	සහභාගීත්ව ආයතන විසින් 1430 පැයෙන් පසු නිත්‍ය ණය පහසුකම හා නිත්‍ය තැන්පතු පහසුකම ලබා ගත නොහැක.
1435 පැය	සහභාගීත්ව ආයතනවලට දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ලබා ගැනීම අවසන් කිරීම	සහභාගීත්ව ආයතන විසින් 1435 පැයෙන් පසු දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ප්‍රතිමිලදී ගැනීම සිදු නොකළ යුතුයි.
1445 පැය	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ආපසු ගෙවීම	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ආපසු අය කර ගැනීම
1500 පැය	ගනුදෙනු සඳහා පද්ධතිය වැසීම	පද්ධතිය විසින් මෙම වේලාවෙන් පසුව වැඩිදුරටත් ගනුදෙනු භාර නොගනී. ගනුදෙනු සඳහා පද්ධතිය වැසීමෙන් පසු එතෙක් පෙළගැසී තිබුණු ගනුදෙනු කිසිවක් වේ නම් ඒවා නතර කිරීම හා අවලංගු කිරීම සිදුවේ.
1500 පැය සිට 1515 පැය දක්වා	දවස අවසානයට අදාළ සැකසුම් කටයුතු	දවස අවසානයට අදාළ සැකසුම් කටයුතු උදා: වාර්තා පිළියෙළ කිරීම, අදාළ ගොනු පොදු ලෙජරය වෙත යොමු කිරීම, ලංකාසෙට්ල් ගාස්තු අය කිරීම සඳහා අදාළ දත්ත පිළියෙළ කිරීම සහ මුද්‍රණ වාර්තා සැකසීම අයත් වේ.
1515 පැය	පද්ධතිය සංවෘත කිරීම	තත්කාලීන දළ පියවීම් පද්ධතිය සහ නිර්ලේඛන සුරැකුම්පත් පියවීමේ පද්ධතියට අදාළ සියලුම මෘදුකාංග වසා දැමීම. දත්ත වෙනත් දත්ත ගබඩාවක සටහන් කිරීම.

විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේත්, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේත්, සහ විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේත් හතරවන සහ පස්වන චක්‍ර (2021 අප්‍රේල් 30ට අදාළ) පියවීම ඊළඟ ව්‍යාපාර දිනයේ (2021 මැයි 03) 0830 පැයට සිදු කරනු ලබයි.

2021 අප්‍රේල් 30ට අදාළ ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් ක්‍රමයෙහි තෙවන චක්‍රය අවලංගු කරනු ලැබේ.

සහභාගීත්ව ආයතන පිරික්සුම් නිකේතනය මඟින් ඔවුන්ගේ පියවීම් ගිණුම් නිරීක්ෂණය කළ යුතු බවත්, බහුපාර්ශ්වීය ශුද්ධ පියවුම් ගොනු තත්කාලීන දළ පියවීම් පද්ධතිය වෙත පියවීම සඳහා යොමුකරන අවස්ථාවේදී තම පියවුම් ගිණුම්වල ප්‍රමාණවත් අරමුදල් ශේෂයන් පවත්වා ගැනීමට වගබලා ගත යුතු බවටත්, සහභාගීත්ව ආයතන වෙත මෙයින් උපදෙස් දෙනු ලැබේ.

ඩී. කුමාරතුංග
අධ්‍යක්ෂ, ගෙවීම් සහ පියවීම්

එම්. ඉසඩ්. එම් ආසීම්
අධිකාරී, රාජ්‍ය ණය

යොමු අංකය : 34/07/029/0001/002 2021 මැයි 10

ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 03/2021

ලංකාසෙට්ල් පද්ධතියේ සියලුම සහභාගීත්ව ආයතන වෙත,

2021.05.11, 2021.05.12 සහ 2021.05.13 දින වලට අදාළ ලංකාසෙට්ල් පද්ධතියේ විශේෂිත දෛනික මෙහෙයුම් කාල සටහන

පහත සඳහන් දෛනික මෙහෙයුම් කාල සටහන 2021.05.11 සිට 2021.05.13 දක්වා දින වලදී අනුගමනය කෙරේ.

වේලාව	මෙහෙයුම	කාර්යයන්/ගනුදෙනු
0630 පැය	පද්ධතිය ආරම්භ කිරීම	තත්කාලීන දළ පියවීම් පද්ධතිය සහ නිර්ලේඛන සුරැකුම්පත් පද්ධතිය ආරම්භ කිරීම

0730 පැය සිට 0800 පැය දක්වා	දිනයේ ආරම්භක සැකසුම් කටයුතු	සුරැකුම්පත් සඳහා වන නිල මිල ගණන් යාවත්කාලීන කිරීම සහ දවස තුළ ලබා දෙන ද්‍රවශීලතා පහසුකම් සඳහා සුරැකුම්පත් හිමිකාරිත්වය සලකුණු කිරීම
0800 පැය	ලංකාසෙට්ල් පද්ධතිය ගනුදෙනු සඳහා විවෘත කිරීම	ගනුදෙනු ආරම්භ කිරීම සඳහා පද්ධතිය විවෘත කිරීම
0800 පැය	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම්/ප්‍රතිමිලදී ගැනීම් සහ නිත්‍ය තැන්පතු පහසුකම් ස්වයංක්‍රීයව පියවීම	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම් ලබා දීම සහ විවට වෙළඳ කටයුතු ආශ්‍රිත ප්‍රතිමිලදී ගැනීම්වල සහ නිත්‍ය තැන්පතු පහසුකම් වල දෙවැනි පාදයට අදාළ ආපසු ගෙවීම් කටයුතු
0815 පැය	දිනය ආරම්භයේ කරන කල් පිරීම්/පොලී ගෙවීම් ගොනු කිරීම් සහ ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් කල්පිරීම්	කල්පිරුණු සුරැකුම්පත් වලට අදාළ පියවීම්/සුරැකුම්පත් කුපන් සඳහා ගෙවීම්, ලංකාසෙට්ල් පද්ධතියේ ගාස්තු/ දඩ මුදල් අය කිරීම් සහ ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් කල් පිරීම්
0830 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් ක්‍රමයෙහි පළමු වන චක්‍රය ප්‍රධාන නිෂ්කාශන පද්ධතියට අදාළ ශුද්ධ නිෂ්කාශන ශේෂයන් පියවීම
0830 පැය	ප්‍රාථමික වෙන්දේසි නිකුතුව (ආදාළ අවස්ථාවේදී). ස්ථිර පදනමක් මත මිලදී ගැනීම් හා විකුණුම්/දිගුකාලීන ප්‍රතිමිලදී ගැනීම් වෙන්දේසිය/දිගුකාලීන ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් නිකුත් කිරීම	ප්‍රාථමික වෙන්දේසි නිකුතුව (අදාළ අවස්ථාවේදී), ස්ථිර පදනමක් මත මිලදී ගැනීම් හා විකුණුම් පියවීම, දිගුකාලීන ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් වෙන්දේසිය සහ දිගුකාලීන ප්‍රතිමිලදී ගැනීම් වෙන්දේසියෙහි ප්‍රථම පාදය
0845 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ හතරවන හා පස්වන චක්‍රය (පෙර ව්‍යාපාරික දිනය) ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ පළමුවන චක්‍රය (වර්තමාන ව්‍යාපාරික දිනය)
0900 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ හතරවන හා පස් වන චක්‍රය (පෙර ව්‍යාපාරික දිනය) විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ පළමු චක්‍රය (වර්තමාන ව්‍යාපාරික දිනය)
0900 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ හතරවන හා පස්වන චක්‍රය (පෙර ව්‍යාපාරික දිනය) විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ පළමු චක්‍රය (වර්තමාන ව්‍යාපාරික දිනය)
1000 පැය	ප්‍රතිවිකුණුම් සහ ස්ථාවර ණය පහසුකමට අදාළ ආපසු ගෙවීම්	විවට වෙළඳ කටයුතු යටතේ ප්‍රතිවිකුණුම්වල සහ නිත්‍ය ණය පහසුකම්වල ප්‍රතිවිකුණුම්වල දෙවන පාදයට අදාළ පියවීම
1000 පැය	ද්‍රවශීලතා පහසුකමට අදාළ ආපසු ගෙවීම්	විවට වෙළඳ කටයුතු යටතේ ද්‍රවශීලතා පහසුකමෙහි දෙවන පාදයට අදාළ පියවීම
1100 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ දෙවන චක්‍රය
1115 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ දෙවන චක්‍රය
1115 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ දෙවන චක්‍රය
1145 පැය	දිගුකාලීන ප්‍රතිවිකුණුම් (වෙන්දේසිය)	විවට වෙළඳ කටයුතු යටතේ දිගුකාලීන ප්‍රතිවිකුණුම්වල ප්‍රථම පාදයට අදාළ පියවීම් කටයුතු
1230 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි තෙවන චක්‍රය

1230 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ තෙවන චක්‍රය
1230 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ තෙවන චක්‍රය
1245 පැය	ද්‍රවශීලතා පහසුකම (වෙන්දේසිය)	විවට වෙළඳ කටයුතු යටතේ ද්‍රවශීලතා පහසුකමෙහි ප්‍රථම පාදයට අදාළ පියවීම් කටයුතු
1245 පැය	කෙටිකාලීන ප්‍රතිමිලදී ගැනීම්/ප්‍රතිවිකුණුම් (වෙන්දේසිය)	විවට වෙළඳ කටයුතු යටතේ කෙටිකාලීන ප්‍රතිමිලදී ගැනීම්/ප්‍රතිවිකුණුම්වල ප්‍රථම පාදයට අදාළ පියවීම් කටයුතු
1300 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් ක්‍රමයෙහි දෙවන චක්‍රය
1330 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	පියවුම් නිෂ්කාශනය සහ ගැලපුම් නිෂ්කාශනය
1330 පැය	තුන්වන පාර්ශ්වීය ගනුදෙනු සඳහා පද්ධතිය වැසීම	අන්තර් බැංකුවලට අදාළ MT2XX කාණ්ඩයේ පණිවුඩ හැර එම දින තුළ තුන්වන පාර්ශ්වයේ අළුත් ගනුදෙනු (T+0) සඳහා පද්ධතිය වැසීම
1335 පැය	නිත්‍ය පහසුකම් ලබාගැනීම අවසන් කිරීම	සහභාගීත්ව ආයතන සඳහා නිත්‍ය තැන්පතු පහසුකම හා නිත්‍ය ණය පහසුකම 1335 පැයෙන් පසු ලබා ගත නොහැක.
1345 පැය	සහභාගීත්ව ආයතනවලට දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ලබා ගැනීම අවසන් කිරීම	සහභාගීත්ව ආයතන විසින් 1345 පැයෙන් පසු දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ප්‍රතිමිලදී ගැනීම සිදු නොකළ යුතුය.
1350 පැය	නිත්‍ය තැන්පතු පහසුකම්	නිත්‍ය තැන්පතු පහසුකම් ප්‍රථම පාදයට අදාළ පියවීම
1355 පැය	නිත්‍ය ණය පහසුකම්	නිත්‍ය ණය පහසුකම් ප්‍රථම පාදයට අදාළ පියවීම
1400 පැය	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ආපසු ගෙවීම	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ආපසු අය කර ගැනීම
1410 පැය	ගනුදෙනු සඳහා පද්ධතිය වැසීම	පද්ධතිය විසින් මෙම වේලාවෙන් පසුව වැඩිදුරටත් ගනුදෙනු භාර නොගනී. ගනුදෙනු සඳහා පද්ධතිය වැසීමෙන් පසු එතෙක් පෙළගැසී තිබුණු ගනුදෙනු කිසිවක් වේ නම් ඒවා නතර කිරීම හා අවලංගු කිරීම සිදුවේ.
1410 පැය සිට 1420 පැය දක්වා	දවස අවසානයට අදාළ සැකසුම් කටයුතු	දවස අවසානයට අදාළ සැකසුම් කටයුතු උදා: වාර්තා පිළියෙළ කිරීම, අදාළ ගොනු පොදු ලෙජරය වෙත යොමු කිරීම, ලංකාසෙට්ල් ගාස්තු අය කිරීම සඳහා අදාළ දත්ත පිළියෙළ කිරීම සහ මුද්‍රණ වාර්තා සැකසීම අයත් වේ.
1420 පැය	පද්ධතිය සංවෘත කිරීම	තත්කාලීන දළ පියවීම් පද්ධතිය සහ නිර්ලේඛන සුරැකුම්පත් පියවීමේ පද්ධතියට අදාළ සියලුම මෘදුකාංග වසා දැමීම. දත්ත වෙනත් දත්ත ගබඩාවක සටහන් කිරීම.

2021.05.11, 2021.05.12 සහ 2021.05.13 යන දිනයන් වලට අදාළ ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් ක්‍රමයෙහි තෙවන චක්‍රය අවලංගු කරනු ලැබේ.

සහභාගීත්ව ආයතන පිරික්සුම් නිකේතනය මගින් ඔවුන්ගේ පියවීම් ගිණුම් නිරීක්ෂණය කළ යුතු බවත්, බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනු තත්කාලීන දළ පියවීම් පද්ධතිය වෙත පියවීම් සඳහා යොමුකරන අවස්ථාවේදී තම පියවුම් ගිණුම්වල ප්‍රමාණවත් අරමුදල් ශේෂයන් පවත්වා ගැනීමට වගබලා ගත යුතු බවටත්, සහභාගීත්ව ආයතන වෙත මෙයින් උපදෙස් දෙනු ලැබේ.

ඩී. කුමාරතුංග
අධ්‍යක්ෂ, ගෙවීම් සහ පියවීම්

එම්. ඉසඩ්. එම් ආසීම්
අධිකාරි, රාජ්‍ය ණය

යොමු අංකය : 34/07/029/0001/002 2021 මැයි 15

ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 04/2021

ලංකාසෙට්ල් පද්ධතියේ සියලුම සහභාගීත්ව ආයතන වෙත,

2021 මැයි 17 දින සිට ලංකාසෙට්ල් පද්ධතියේ මෙහෙයුම් වේලාවන් සීමා කිරීම

රට තුළ පවතින කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් ලංකාසෙට්ල් පද්ධතියේ මෙහෙයුම් වේලාවන් සීමා කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව තීරණය කර තිබේ.

ඒ අනුව, නැවත දැනුම් දෙන තුරු 2021 මැයි 17 දින සිට පහත සඳහන් දෛනික මෙහෙයුම් කාල සටහන අනුගමනය කෙරේ.

වේලාව	මෙහෙයුම	කාර්යයන්/ගනුදෙනු
0630 පැය	පද්ධතිය ආරම්භ කිරීම	තත්කාලීන දළ පියවීම් පද්ධතිය සහ නිර්ලේඛන සුරැකුම්පත් පද්ධතිය ආරම්භ කිරීම
0730 පැය සිට 0800 පැය දක්වා	දිනයේ ආරම්භක සැකසුම් කටයුතු	සුරැකුම්පත් සඳහා වන නිල මිල ගණන් යාවත්කාලීන කිරීම සහ දවස තුළ ලබා දෙන ද්‍රවශීලතා පහසුකම් සඳහා සුරැකුම්පත් හිමිකාරීත්වය සලකුණු කිරීම
0800 පැය	ලංකාසෙට්ල් පද්ධතිය ගනුදෙනු සඳහා විවෘත කිරීම	ගනුදෙනු ආරම්භ කිරීම සඳහා පද්ධතිය විවෘත කිරීම
0800 පැය	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම්/ප්‍රතිමිලදී ගැනීම් සහ නිත්‍ය තැන්පතු පහසුකම් ස්වයංක්‍රීයව පියවීම	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම් ලබා දීම සහ විවට වෙළඳ කටයුතු ආශ්‍රිත ප්‍රතිමිලදී ගැනීම්වල සහ නිත්‍ය තැන්පතු පහසුකම් වල දෙවැනි පාදයට අදාළ ආපසු ගෙවීම් කටයුතු
0815 පැය	දිනය ආරම්භයේ කරන කල් පිරීම්/පොලී ගෙවීම් ගොනු කිරීම් සහ ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් කල්පිරීම්	කල්පිරුණු සුරැකුම්පත් වලට අදාළ පියවීම්/සුරැකුම්පත් කුපන් සඳහා ගෙවීම්, ලංකාසෙට්ල් පද්ධතියේ ගාස්තු/ දඩ මුදල් අය කිරීම් සහ ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් කල් පිරීම්
0830 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම.	ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් ක්‍රමයෙහි පළමු වන චක්‍රය/ ප්‍රධාන නිෂ්කාශන පද්ධතියට අදාළ ශුද්ධ නිෂ්කාශන ශේෂයන් පියවීම
0830 පැය	ප්‍රාථමික වෙන්දේසි පියවීම් (අදාළ අවස්ථාවේ දී). ස්ථිර පදනමක් මත මිලදී ගැනීම් හා විකුණුම්/දිගුකාලීන ප්‍රතිමිලදී ගැනීම් වෙන්දේසිය/ දිගුකාලීන ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් නිකුත් කිරීම	ප්‍රාථමික වෙන්දේසිය (අදාළ අවස්ථාවේ දී). ස්ථිර පදනමක් මත මිලදී ගැනීම් හා විකුණුම් පියවීම/දිගුකාලීන ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් වෙන්දේසිය සහ දිගුකාලීන ප්‍රතිමිලදී ගැනීම් වෙන්දේසියෙහි ප්‍රථම පාදයට අදාළ පියවීම
0845 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ හතරවන හා පස්වන චක්‍ර (පෙර ව්‍යාපාරික දිනය) ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ පළමුවන චක්‍රය (වර්තමාන ව්‍යාපාරික දිනය)
0900 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ හතරවන හා පස්වන චක්‍ර (පෙර ව්‍යාපාරික දිනය) විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ පළමුවන චක්‍රය (වර්තමාන ව්‍යාපාරික දිනය)
0900 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ හතරවන හා පස්වන චක්‍ර (පෙර ව්‍යාපාරික දිනය) විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ පළමු චක්‍රය (වර්තමාන ව්‍යාපාරික දිනය)
1000 පැය	ප්‍රතිවිකුණුම් සහ ස්ථාවර ණය පහසුකමට අදාළ ආපසු ගෙවීම්	විවට වෙළඳ කටයුතු යටතේ ප්‍රතිවිකුණුම්වල සහ නිත්‍ය ණය පහසුකම්වල ප්‍රතිවිකුණුම්වල දෙවන පාදයට අදාළ පියවීම
1000 පැය	ද්‍රවශීලතා පහසුකමට අදාළ ආපසු ගෙවීම්	විවට වෙළඳ කටයුතු යටතේ ද්‍රවශීලතා පහසුකමෙහි දෙවන පාදයට අදාළ පියවීම
1100 පැය	ප්‍රාථමික වෙන්දේසිය පියවීම වසා දැමීම	ප්‍රාථමික වෙන්දේසිය යටතේ සුරැකුම්පත් පියවීම

1100 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ දෙවන චක්‍රය
1115 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ දෙවන චක්‍රය
1115 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ දෙවන චක්‍රය
1145 පැය	දිගුකාලීන ප්‍රතිවිකුණුම් (වෙන්දේසිය)	විවට වෙළඳ කටයුතු යටතේ දිගුකාලීන ප්‍රතිවිකුණුම්වල ප්‍රථම පාදයට අදාළ පියවීම් කටයුතු
1230 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ තෙවන චක්‍රය
1230 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ තෙවන චක්‍රය
1230 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ තෙවන චක්‍රය
1245 පැය	කෙටිකාලීන ප්‍රතිමිලදී ගැනීම්/ප්‍රතිවිකුණුම් (වෙන්දේසිය)	විවට වෙළඳ කටයුතු යටතේ කෙටිකාලීන ප්‍රතිමිලදී ගැනීම්/ ප්‍රතිවිකුණුම්වල ප්‍රථම පාදයට අදාළ පියවීම් කටයුතු
1245 පැය	ද්‍රවශීලතා පහසුකම (වෙන්දේසිය)	විවට වෙළඳ කටයුතු යටතේ ද්‍රවශීලතා පහසුකමෙහි ප්‍රථම පාදයට අදාළ පියවීම් කටයුතු
1300 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් ක්‍රමයෙහි තෙවන චක්‍රය
1330 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	පියවුම් නිෂ්කාශනය සහ ගැලපුම් නිෂ්කාශනය
1330 පැය	තුන්වන පාර්ශ්වීය ගනුදෙනු සඳහා පද්ධතිය වැසීම	අන්තර් බැංකුවලට අදාළ MT2XX කාණ්ඩයේ පණිවුඩ හැර එම දින තුළ තුන්වන පාර්ශ්වයේ අළුත් ගනුදෙනු (T+0) සඳහා පද්ධතිය වැසීම
1340 පැය	නිත්‍ය පහසුකම් ලබාගැනීම අවසන් කිරීම	සහභාගීත්ව ආයතන වලට 1340 පැයෙන් පසු නිත්‍ය ණය පහසුකම ලබා ගත නොහැක.
1345 පැය	සහභාගීත්ව ආයතනවලට දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ලබා ගැනීම අවසන් කිරීම	සහභාගීත්ව ආයතන විසින් 1345 පැයෙන් පසු දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ප්‍රතිමිලදී ගැනීම සිදු නොකළ යුතුය.
1350 පැය	නිත්‍ය තැන්පතු පහසුකම්	නිත්‍ය තැන්පතු පහසුකම් ප්‍රථම පාදයට අදාළ පියවීම
1355 පැය	නිත්‍ය ණය පහසුකම්	නිත්‍ය ණය පහසුකම් ප්‍රථම පාදයට අදාළ පියවීම
1400 පැය	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ආපසු ගෙවීම	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ආපසු අය කර ගැනීම
1410 පැය	ගනුදෙනු සඳහා පද්ධතිය වැසීම	පද්ධතිය විසින් මෙම වේලාවෙන් පසුව වැඩිදුරටත් ගනුදෙනු භාර නොගනී. ගනුදෙනු සඳහා පද්ධතිය වැසීමෙන් පසු එතෙක් පෙළගැසී තිබුණු ගනුදෙනු කිසිවක් වේ නම් ඒවා නතර කිරීම හා අවලංගු කිරීම සිදුවේ.
1410 පැය සිට 1420 පැය දක්වා	දවස අවසානයට අදාළ සැකසුම් කටයුතු	දවස අවසානයට අදාළ සැකසුම් කටයුතු උදා: වාර්තා පිළියෙළ කිරීම, අදාළ ගොනු පොදු ලෙජරය වෙත යොමු කිරීම, ලංකාසෙට්ල් ගාස්තු අය කිරීම සඳහා අදාළ දත්ත පිළියෙළ කිරීම සහ මුද්‍රණ වාර්තා සැකසීම අයත් වේ.

1420 පැය	පද්ධතිය සංවෘත කිරීම	තත්කාලීන දළ පියවීම් පද්ධතිය සහ නිර්ලේඛන සුරැකුම්පත් පියවීමේ පද්ධතියට අදාළ සියලුම මෘදුකාංග වසා දැමීම. දත්ත වෙනත් දත්ත ගබඩාවක සටහන් කිරීම.

ඉහත සීමාකරන ලද මෙහෙයුම් කාල සටහන ක්‍රියාත්මක වන කාල සීමාව තුළ, ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් ක්‍රමයෙහි තෙවන චක්‍රය ක්‍රියාත්මක නොවේ.

සියලුම ගනුදෙනු කටයුතුවල පියවීම් කටයුතු නිසියාකාරයෙන් සිදු කිරීම සඳහා පියවීම් ගිණුම් පිරික්සුම් නිකේතනය මඟින් නිරීක්ෂණය කල යුතු බවත් බහුපාර්ශ්වීය ශුද්ධ පියවුම් ගොනු තත්කාලීන දළ පියවීම් පද්ධතිය වෙත පියවීම් සඳහා යොමුකරන අවස්ථාවේදී තම පියවීම් ගිණුම්වල ප්‍රමාණවත් අරමුදල් ශේෂයන් පවත්වා ගැනීමට වගබලා ගත යුතු බවටත්, සහභාගීත්ව ආයතන වෙත මෙයින් උපදෙස් දෙනු ලැබේ.

ඩී. කුමාරතුංග
අධ්‍යක්ෂ, ගෙවීම් සහ පියවීම්

එම්. ඉසඩ්. එම් ආසීම්
අධිකාරි, රාජ්‍ය ණය

යොමු අංකය : 34/07/029/0001/002 2021 මැයි 19

ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 05/2021

ලංකාසෙට්ල් පද්ධතියේ සියලුම සහභාගීත්ව ආයතන වෙත,

ලංකාසෙට්ල් පද්ධතියේ දෛනික මෙහෙයුම් කාල සටහන සංශෝධනය කිරීම

පහත සඳහන් දෛනික මෙහෙයුම් කාල සටහන 2021 මැයි මස 20 වන දින සිට නැවත දැනුම් දෙන තුරු අනුගමනය කෙරේ.

වේලාව	මෙහෙයුම	කාර්යයන්/ගනුදෙනු
0630 පැය	පද්ධතිය ආරම්භ කිරීම	තත්කාලීන දළ පියවීම් පද්ධතිය සහ නිර්ලේඛන සුරැකුම්පත් පද්ධතිය ආරම්භ කිරීම
0730 පැය සිට 0800 පැය දක්වා	දිනයේ ආරම්භක සැකසුම් කටයුතු	සුරැකුම්පත් සඳහා වන නිල මිල ගණන් යාවත්කාලීන කිරීම සහ දවස තුළ ලබා දෙන ද්‍රවශීලතා පහසුකම් සඳහා සුරැකුම්පත් හිමිකාරීත්වය සලකුණු කිරීම
0800 පැය	ලංකාසෙට්ල් පද්ධතිය ගනුදෙනු සඳහා විවෘත කිරීම	ගනුදෙනු ආරම්භ කිරීම සඳහා පද්ධතිය විවෘත කිරීම
0800 පැය	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම්/ ප්‍රතිමිලදී ගැනීම් සහ නිත්‍ය තැන්පතු පහසුකම් ස්වයංක්‍රීයව පියවීම	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම් ලබා දීම සහ විවට වෙළඳ කටයුතු ආශ්‍රිත ප්‍රතිමිලදී ගැනීම්වල සහ නිත්‍ය තැන්පතු පහසුකම් වල දෙවැනි පාදයට අදාළ ආපසු ගෙවීම් කටයුතු
0815 පැය	දිනය ආරම්භයේ කරන කල් පිරීම්/පොලී ගෙවීම් ගොනු කිරීම් සහ ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් කල්පිරීම්	කල්පිරුණු සුරැකුම්පත් වලට අදාළ පියවීම්/ සුරැකුම්පත් කුපන් සඳහා ගෙවීම්, ලංකාසෙට්ල් පද්ධතියේ ගාස්තු/ දඩ මුදල් අය කිරීම් සහ ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් කල් පිරීම්
0830 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම.	ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් ක්‍රමයෙහි පළමු වන චක්‍රය ප්‍රධාන නිෂ්කාශන පද්ධතියට අදාළ ශුද්ධ නිෂ්කාශන ශේෂයන් පියවීම
0830 පැය	ස්ථිර පදනමක් මත මිලදී ගැනීම් හා විකුණුම්/ දිගුකාලීන ප්‍රතිමිලදී ගැනීම් වෙන්දේසිය/දිගුකාලීන ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් නිකුත් කිරීම	ස්ථිර පදනමක් මත මිලදී ගැනීම් හා විකුණුම් පියවීම, දිගුකාලීන ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් වෙන්දේසිය සහ දිගුකාලීන ප්‍රතිමිලදී ගැනීම් වෙන්දේසියෙහි ප්‍රථම පාදය
0845 පැය	ප්‍රාථමික වෙන්දේසි නිකුතුව (අදාළ වන අවස්ථාවේ දී)	ප්‍රාථමික වෙන්දේසි නිකුතුව (අදාළ වන අවස්ථාවේ දී)

0845 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ පළමු චක්‍රය
0900 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ පළමු චක්‍රය
0900 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ පළමු චක්‍රය
1100 පැය	ප්‍රතිවිකුණුම් සහ ස්ථාවර ණය පහසුකමට අදාළ ආපසු ගෙවීම්	විවට වෙළඳ කටයුතු යටතේ ප්‍රතිවිකුණුම්වල සහ නිත්‍ය ණය පහසුකම්වල ප්‍රතිවිකුණුම්වල දෙවන පාදයට අදාළ පියවීම
1100 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ දෙවන චක්‍රය
1100 පැය	ද්‍රවශීලතා පහසුකමට අදාළ ආපසු ගෙවීම්	විවට වෙළඳ කටයුතු යටතේ ද්‍රවශීලතා පහසුකමෙහි දෙවන පාදයට අදාළ පියවීම
1115 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ දෙවන චක්‍රය
1115 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ දෙවන චක්‍රය
1145 පැය	දිගුකාලීන ප්‍රතිවිකුණුම් (වෙන්දේසිය)	විවට වෙළඳ කටයුතු යටතේ දිගුකාලීන ප්‍රතිවිකුණුම්වල ප්‍රථම පාදයට අදාළ පියවීම් කටයුතු
1300 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ තෙවන චක්‍රය
1300 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් ක්‍රමයෙහි දෙවන චක්‍රය
1300 පැය	ප්‍රාථමික වෙන්දේසියට අදාළ පියවීම් කටයුතු අවසන් කිරීම/ කෙටිකාලීන ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් වෙන්දේසිය	ප්‍රාථමික වෙන්දේසියේ සුරැකුම්පත් පියවීම. කෙටිකාලීන ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් වෙන්දේසිය පියවීම
1315 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ තෙවන චක්‍රය
1315 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ තෙවන චක්‍රය
1315 පැය	කෙටිකාලීන ප්‍රතිමිලදී ගැනීම්/ප්‍රතිවිකුණුම් (වෙන්දේසිය)	විවට වෙළඳ කටයුතු යටතේ කෙටිකාලීන ප්‍රතිමිලදී ගැනීම්/ ප්‍රතිවිකුණුම්වල ප්‍රථම පාදයට අදාළ පියවීම් කටයුතු
1315 පැය	ද්‍රවශීලතා පහසුකම (වෙන්දේසිය)	විවට වෙළඳ කටයුතු යටතේ ද්‍රවශීලතා පහසුකමෙහි ප්‍රථම පාදයට අදාළ පියවීම් කටයුතු
1315 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	පියවුම් නිෂ්කාශනය සහ ගැලපුම් නිෂ්කාශනය
1330 පැය	තුන්වන පාර්ශ්වීය ගනුදෙනු සඳහා පද්ධතිය වැසීම	අන්තර් බැංකුවලට අදාළ MT2XX කාණ්ඩයේ පණිවුඩ හැර එම දින තුළ තුන්වන පාර්ශ්වයේ අළුත් ගනුදෙනු (T+0) සඳහා පද්ධතිය වැසීම

1330 පැය	නිත්‍ය පහසුකම් ලබාගැනීම අවසන් කිරීම	සහභාගීත්ව ආයතන වලට 1330 පැයෙන් පසු නිත්‍ය තැන්පතු පහසුකම සහ නිත්‍ය ණය පහසුකම් ලබා ගත නොහැක.
1345 පැය	සහභාගීත්ව ආයතනවලට දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ලබා ගැනීම අවසන් කිරීම	සහභාගීත්ව ආයතන විසින් 1345 පැයෙන් පසු දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ප්‍රතිමිලදී ගැනීම සිදු නොකළ යුතුය.
1400 පැය	නිත්‍ය තැන්පතු පහසුකම්	නිත්‍ය තැන්පතු පහසුකම් ප්‍රථම පාදයට අදාළ පියවීම
1415 පැය	නිත්‍ය ණය පහසුකම්	නිත්‍ය ණය පහසුකම් ප්‍රථම පාදයට අදාළ පියවීම
1415 පැය	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ආපසු ගෙවීම	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ආපසු අය කර ගැනීම
1430 පැය	ගනුදෙනු සඳහා පද්ධතිය වැසීම	පද්ධතිය විසින් මෙම වේලාවෙන් පසුව වැඩිදුරටත් ගනුදෙනු භාර නොගනී. ගනුදෙනු සඳහා පද්ධතිය වැසීමෙන් පසු එතෙක් පෙළගැසී තිබුණු ගනුදෙනු කිසිවක් වේ නම් ඒවා නතර කිරීම හා අවලංගු කිරීම සිදුවේ.
1430 පැය සිට 1500 පැය දක්වා	දවස අවසානයට අදාළ සැකසුම් කටයුතු	දවස අවසානයට අදාළ සැකසුම් කටයුතු උදා: වාර්තා පිළියෙළ කිරීම, අදාළ ගොනු පොදු ලෙජරය වෙත යොමු කිරීම, ලංකාසෙට්ල් ගාස්තු අය කිරීම සඳහා අදාළ දත්ත පිළියෙළ කිරීම සහ මුද්‍රණ වාර්තා සැකසීම අයත් වේ.
1500 පැය	පද්ධතිය සංවෘත කිරීම	තත්කාලීන දළ පියවීම් පද්ධතිය සහ නිර්ලේඛන සුරැකුම්පත් පියවීමේ පද්ධතියට අදාළ සියලුම මෘදුකාංග වසා දැමීම. දත්ත වෙනත් දත්ත ගබඩාවක සටහන් කිරීම.

සියලුම ගනුදෙනු කටයුතුවල පියවීම් කටයුතු නිසියාකාරයෙන් සිදු කිරීම සඳහා පියවීම් ගිණුම් පිරික්සුම් නිකේතනය මඟින් නිරීක්ෂණය කල යුතු බවත්, බහුපාර්ශ්වීය ශුද්ධ පියවුම් ගොනු තත්කාලීන දළ පියවීම් පද්ධතිය වෙත පියවීම් සඳහා යොමුකරන අවස්ථාවේදී තම පියවීම් ගිණුම්වල ප්‍රමාණවත් අරමුදල් ශේෂයන් පවත්වා ගැනීමට වගබලා ගත යුතු බවටත්, සහභාගීත්ව ආයතන වෙත මෙයින් උපදෙස් දෙනු ලැබේ.

ඩී. කුමාරතුංග
අධ්‍යක්ෂ, ගෙවීම් සහ පියවීම්

එම්. ඉසඩ්. එම් ආසීම්
අධිකාරී, රාජ්‍ය ණය

යොමු අංකය : 34/07/029/0001/002 2021 මැයි 25

ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 06/2021

ලංකාසෙට්ල් පද්ධතියේ සියලුම සහභාගීත්ව ආයතන වෙත,

2021.05.28 වන දින සිට ලංකාසෙට්ල් පද්ධතියේ මෙහෙයුම් වේලාවන් සීමා කිරීම

රට තුල පවතින කොවිඩ් 19 ආශ්‍රිත තත්ත්වය හේතුවෙන් ලංකාසෙට්ල් පද්ධතියේ මෙහෙයුම් වේලාවන් සීමා කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව තීරණය කර ඇත.

ඒ අනුව, පහත සඳහන් දෛනික මෙහෙයුම් කාල සටහන 2021.05.28 දින සිට නැවත දැනුම් දෙන තුරු ක්‍රියාත්මක වේ.

වේලාව	මෙහෙයුම	කාර්යයන්/ගනුදෙනු
0630 පැය	පද්ධතිය ආරම්භ කිරීම	තත්කාලීන දළ පියවීම් පද්ධතිය සහ නිර්ලේඛන සුරැකුම්පත් පද්ධතිය ආරම්භ කිරීම

0730 පැය සිට 0800 පැය දක්වා	දිනයේ ආරම්භක සැකසුම් කටයුතු	සුරැකුම්පත් සඳහා වන නිල මිල ගණන් යාවත්කාලීන කිරීම සහ දවස තුළ ලබා දෙන ද්‍රවශීලතා පහසුකම් සඳහා සුරැකුම්පත් හිමිකාරිත්වය සලකුණු කිරීම
0800 පැය	ලංකාසෙට්ල් පද්ධතිය ගනුදෙනු සඳහා විවෘත කිරීම	ගනුදෙනු ආරම්භ කිරීම සඳහා පද්ධතිය විවෘත කිරීම
0800 පැය	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම්/ප්‍රතිමිලදී ගැනීම් සහ නිත්‍ය තැන්පතු පහසුකම් ස්වයංක්‍රීයව පියවීම	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම් ලබා දීම සහ විවට වෙළඳ කටයුතු ආශ්‍රිත ප්‍රතිමිලදී ගැනීම්වල සහ නිත්‍ය තැන්පතු පහසුකම් වල දෙවැනි පාදයට අදාළ ආපසු ගෙවීම් කටයුතු
0815 පැය	දිනය ආරම්භයේ කරන කල් පිරීම්/පොලී ගෙවීම්, ගොනු කිරීම් සහ ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් කල්පිරීම්	කල්පිරුණු සුරැකුම්පත් වලට අදාළ පියවීම්/සුරැකුම්පත් කුපන් සඳහා ගෙවීම්, ලංකාසෙට්ල් පද්ධතියේ ගාස්තු/ දඩ මුදල් අය කිරීම් සහ ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් කල් පිරීම්
0830 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම.	ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් ක්‍රමයෙහි පළමු වන චක්‍රය ප්‍රධාන නිෂ්කාශන පද්ධතියට අදාළ ශුද්ධ නිෂ්කාශන ශේෂයන් පියවීම
0830 පැය	ප්‍රාථමික වෙන්දේසි නිකුතුව (අදාල අවස්ථාවේදී), ස්ථිර පදනමක් මත මිලදී ගැනීම් හා විකුණුම්/දිගුකාලීන ප්‍රතිමිලදී ගැනීම් වෙන්දේසිය/දිගුකාලීන ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් නිකුත් කිරීම	ප්‍රාථමික වෙන්දේසි නිකුතුව (අදාල අවස්ථාවේදී). ස්ථිර පදනමක් මත මිලදී ගැනීම් හා විකුණුම් පියවීම, දිගුකාලීන ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් වෙන්දේසිය සහ දිගුකාලීන ප්‍රතිමිලදී ගැනීම් වෙන්දේසියෙහි ප්‍රථම පාදය
0845 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සිව්වන හා පස්වන චක්‍ර (පෙර ව්‍යාපාරික දිනය) ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ පළමු චක්‍රය (වර්තමාන ව්‍යාපාරික දිනය)
0900 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සිව්වන හා පස්වන චක්‍ර පෙර ව්‍යාපාරික දිනය) විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ පළමු චක්‍රය (වර්තමාන ව්‍යාපාරික දිනය)
0900 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සිව්වන හා පස්වන චක්‍ර (පෙර ව්‍යාපාරික දිනය) විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ පළමු චක්‍රය (වර්තමාන ව්‍යාපාරික දිනය)
1000 පැය	ප්‍රතිවිකුණුම් සහ ස්ථාවර ණය පහසුකමට අදාළ ආපසු ගෙවීම්	විවට වෙළඳ කටයුතු යටතේ ප්‍රතිවිකුණුම්වල සහ නිත්‍ය ණය පහසුකම්වල ප්‍රතිවිකුණුම්වල දෙවන පාදයට අදාළ පියවීම
1000 පැය	ද්‍රවශීලතා පහසුකමට අදාළ ආපසු ගෙවීම්	විවට වෙළඳ කටයුතු යටතේ ද්‍රවශීලතා පහසුකමෙහි දෙවන පාදයට අදාළ පියවීම
1100 පැය	ප්‍රාථමික වෙන්දේසියට අදාළ පියවීම් කටයුතු අවසන් කිරීම (අදාල අවස්ථාවේදී)	ප්‍රාථමික වෙන්දේසියේ සුරැකුම්පත් පියවීම
1100 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ දෙවන චක්‍රය
1115 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ දෙවන චක්‍රය
1115 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ දෙවන චක්‍රය
1145 පැය	දිගුකාලීන ප්‍රතිවිකුණුම් (වෙන්දේසිය)	විවට වෙළඳ කටයුතු යටතේ දිගුකාලීන ප්‍රතිවිකුණුම්වල ප්‍රථම පාදයට අදාළ පියවීම් කටයුතු

1230 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ තෙවන චක්‍රය
1230 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ තෙවන චක්‍රය
1230 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ තෙවන චක්‍රය
1245 පැය	කෙටිකාලීන ප්‍රතිමිලදී ගැනීම්/ ප්‍රතිවිකුණුම් (වෙන්දේසිය)	විවට වෙළඳ කටයුතු යටතේ කෙටිකාලීන ප්‍රතිමිලදී ගැනීම්/ප්‍රතිවිකුණුම්වල ප්‍රථම පාදයට අදාළ පියවීම් කටයුතු
1245 පැය	ද්‍රවශීලතා පහසුකම (වෙන්දේසිය)	විවට වෙළඳ කටයුතු යටතේ ද්‍රවශීලතා පහසුකමෙහි ප්‍රථම පාදයට අදාළ පියවීම් කටයුතු
1300 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් ක්‍රමයෙහි දෙවන චක්‍රය
1330 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	පියවුම් නිෂ්කාශනය සහ ගැලපුම් නිෂ්කාශනය
1330 පැය	තුන්වන පාර්ශ්වීය ගනුදෙනු සඳහා පද්ධතිය වැසීම	අන්තර් බැංකුවලට අදාළ MT2XX කාණ්ඩයේ පණිවුඩ හැර එම දින තුළ තුන්වන පාර්ශ්වයේ අළුත් ගනුදෙනු (T+0) සඳහා පද්ධතිය වැසීම
1340 පැය	නිත්‍ය පහසුකම් ලබාගැනීම අවසන් කිරීම	සහභාගීත්ව ආයතන වලට 1340 පැයෙන් පසු නිත්‍ය ණය පහසුකම් හා නිත්‍ය තැන්පතු පහසුකම් ලබා ගත නොහැක.
1345 පැය	සහභාගීත්ව ආයතනවලට දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ප්‍රතිමිලදී ගැනීම අවසන් කිරීම	සහභාගීත්ව ආයතන විසින් 1345 පැයෙන් පසු දවස ඇතුලත ද්‍රවශීලතා පහසුකම ප්‍රතිමිලදී ගැනීම නොකළ යුතුය.
1350 පැය	නිත්‍ය තැන්පතු පහසුකම්	නිත්‍ය තැන්පතු පහසුකම් ප්‍රථම පාදයට අදාළ පියවීම
1355 පැය	නිත්‍ය ණය පහසුකම්	නිත්‍ය ණය පහසුකම් ප්‍රථම පාදයට අදාළ පියවීම
1400 පැය	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ආපසු ගෙවීම	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ආපසු අය කර ගැනීම
1410 පැය	ගනුදෙනු සඳහා පද්ධතිය වැසීම	පද්ධතිය විසින් මෙම වේලාවෙන් පසුව වැඩිදුරටත් ගනුදෙනු භාර නොගනී. ගනුදෙනු සඳහා පද්ධතිය වැසීමෙන් පසු එතෙක් පෙළගැසී තිබුණු ගනුදෙනු කිසිවක් වේ නම් ඒවා නතර කිරීම හා අවලංගු කිරීම සිදුවේ.
1410 පැය සිට 1420 පැය දක්වා	දවස අවසානයට අදාළ සැකසුම් කටයුතු	දවස අවසානයට අදාළ සැකසුම් කටයුතු උදා: වාර්තා පිළියෙළ කිරීම, අදාළ ගොනු පොදු ලෙජරය වෙත යොමු කිරීම, ලංකාසෙට්ල් ගාස්තු අය කිරීම සඳහා අදාළ දත්ත පිළියෙළ කිරීම සහ මුද්‍රණ වාර්තා සැකසීම අයත් වේ.
1420 පැය	පද්ධතිය සංවෘත කිරීම	තත්කාලීන දළ පියවීම් පද්ධතිය සහ නිර්ලේඛන සුරැකුම්පත් පියවීමේ පද්ධතියට අදාළ සියලුම මෘදුකාංග වසා දැමීම. දත්ත වෙනත් දත්ත ගබඩාවක සටහන් කිරීම.

ඉහත සීමා කල මෙහෙයුම් කාලසටහන බල පැවැත්වෙන කාලසීමාව තුළදී, ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් ක්‍රමයෙහි තෙවන චක්‍රය අවලංගු කරනු ලැබේ.

සහභාගීත්ව ආයතන පිරික්සුම් නිකේතනය මඟින් සියලුම පියවීම් ගිණුම් නිරීක්ෂණය කල යුතු බවත්, බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනු

තත්කාලීන දළ පියවීම් පද්ධතිය වෙත පියවීම් සඳහා යොමු කරන අවස්ථාවේදී තම පියවීම් ගිණුම්වල ප්‍රමාණවත් අරමුදල් ශේෂයක් පවත්වා ගැනීමට වගබලා ගතයුතු බවටත්, සහභාගීත්ව ආයතන වෙත මෙයින් උපදෙස් දෙනු ලැබේ.

ඩී. කුමාරතුංග
අධ්‍යක්ෂ, ගෙවීම් සහ පියවීම්

එම්. ඉසඩ්. එම් ආසීම්
අධිකාරි, රාජ්‍ය ණය

යොමු අංකය : 34/01/025/0038/003 2021 ජූනි 10

සියලුම බලපත්‍රලාභී බැංකු, බලපත්‍රලාභී මූල්‍ය ආයතන සහ බලපත්‍රලාභී ජංගම දුරකථන පදනම් කරගත් විද්‍යුත් මුදල් පද්ධති ක්‍රියාකරුවන්ගේ ප්‍රධාන විධායක නිළධාරීන් වෙත,

අතිරේකය 3 - ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 02/2019
දේශීය ගෙවීම් සඳහා ජාතික QR කේත ප්‍රමිතියක් පිහිටුවීම

2019.03.11 දින නිකුත් කරන ලද 2019 අංක 02 දරන දේශීය ගෙවීම් සඳහා ජාතික QR කේත ප්‍රමිතියක් පිහිටුවීම සඳහා වන චක්‍රලේඛය, 2019.10.30 දින නිකුත් කරන ලද එහි අතිරේක 1 සහ 2020.11.27 දින නිකුත් කරන ලද අතිරේක 2 හා බැඳේ. මෙම අතිරේකය, ඉහත චක්‍රලේඛය සහ අතිරේක සමඟ කියවිය යුතුය.

LANKAQR ආරම්භක ගනුදෙනු සඳහා 2020.01.01 සිට 2021.06.30 දක්වා බලපැවැත්වුණු වෙළඳ වට්ටම් අනුපාතය 1% සිට 0.5% දක්වා අඩු කිරීම, තවත් මාස 6ක කාලයක් සඳහා දීර්ඝ කරනු ලැබේ. ඒ අනුව, 2021.07.01 දිනෙන් ආරම්භව 2021.12.31 දිනෙන් අවසන් වන කාලය සඳහා උපරිම වෙළඳ වට්ටම් අනුපාතය 0.5% ක් ලෙස නොවෙනස්ව පවතී.

ඩී. කුමාරතුංග
අධ්‍යක්ෂ, ගෙවීම් සහ පියවීම්

යොමු අංකය : 34/07/029/0001/002 2021 ජූනි 22

ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 07/2021

ලංකාසෙට්ල් පද්ධතියේ සියලුම සහභාගීත්ව ආයතන වෙත,

2021.06.23 සහ 2021.06.25 දෙදින සඳහා වූ ලංකාසෙට්ල් පද්ධතියෙහි විශේෂිත දෛනික මෙහෙයුම් කාල සටහන

ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය හරහා වැටුප් ගෙවීම් කටයුතු සිදුකිරීම සඳහා 2021.06.23 සහ 2021.06.25 යන දෙදින තුලදී අනුගමනය කළ යුතු දෛනික මෙහෙයුම් කාල සටහන පහත පරිදි වේ. ඉන්පසුව, ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 06/2021 හි සඳහන් පරිදි දෛනික මෙහෙයුම් කාල සටහන 2021.06.28 දින සිට නැවත දැනුම් දෙන තුරු ක්‍රියාත්මක වේ.

වේලාව	මෙහෙයුම	කාර්යයන්/ගනුදෙනු
0630 පැය	පද්ධතිය ආරම්භ කිරීම	තත්කාලීන දළ පියවීම් පද්ධතිය සහ නිර්ලේඛන සුරැකුම්පත් පද්ධතිය ආරම්භ කිරීම
0730 පැය සිට 0800 පැය දක්වා	දිනයේ ආරම්භක සැකසුම් කටයුතු	සුරැකුම්පත් සඳහා වන නිල මිල ගණන් යාවත්කාලීන කිරීම සහ දවස තුළ ලබා දෙන ද්‍රවශීලතා පහසුකම් සඳහා සුරැකුම්පත් හිමිකාරීත්වය සලකුණු කිරීම
0800 පැය	ලංකාසෙට්ල් පද්ධතිය ගනුදෙනු සඳහා විවෘත කිරීම	ගනුදෙනු ආරම්භ කිරීම සඳහා පද්ධතිය විවෘත කිරීම

0800 පැය	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම්/ප්‍රතිමිලදී ගැනීම් සහ නිත්‍ය තැන්පතු පහසුකම් ස්වයංක්‍රීයව පියවීම	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම් ලබා දීම සහ විවට වෙළඳ කටයුතු ආශ්‍රිත ප්‍රතිමිලදී ගැනීම්වල සහ නිත්‍ය තැන්පතු පහසුකම් වල දෙවැනි පාදයට අදාළ ආපසු ගෙවීම් කටයුතු
0815 පැය	දිනය ආරම්භයේ කරන කල් පිරීම්/පොලී ගෙවීම් ගොනු කිරීම් සහ ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් කල්පිරීම්	කල්පිරුණු සුරැකුම්පත්වලට අදාළ පියවීම්/ සුරැකුම්පත් කුපන් සඳහා ගෙවීම්, ලංකාසෙට්ල් පද්ධතියේ ගාස්තු/ දඩ මුදල් අය කිරීම් සහ ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් කල් පිරීම්
0830 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම.	ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් ක්‍රමයෙහි පළමු වන චක්‍රය ප්‍රධාන නිෂ්කාශන පද්ධතියට අදාළ ශුද්ධ නිෂ්කාශන ශේෂයන් පියවීම
0830 පැය	ස්ථිර පදනමක් මත මිලදී ගැනීම් හා විකුණුම්/ දිගුකාලීන ප්‍රතිමිලදී ගැනීම් වෙන්දේසිය/දිගුකාලීන ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් නිකුත් කිරීම	ස්ථිර පදනමක් මත මිලදී ගැනීම හා විකුණුම් පියවීම, දිගුකාලීන ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් වෙන්දේසිය සහ දිගුකාලීන ප්‍රතිමිලදී ගැනීම් වෙන්දේසියෙහි ප්‍රථම පාදය
0845 පැය	ප්‍රාථමික වෙන්දේසි නිකුතුව (අදාල අවස්ථාවේදී)	ප්‍රාථමික වෙන්දේසි නිකුතුව (අදාල අවස්ථාවේදී)
0845 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ පස්වන චක්‍රය (පෙර ව්‍යාපාරික දිනය) ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ පළමු චක්‍රය (වර්තමාන ව්‍යාපාරික දිනය)
0900 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ පස්වන චක්‍රය (පෙර ව්‍යාපාරික දිනය) විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ පළමු චක්‍රය (වර්තමාන ව්‍යාපාරික දිනය)
0900 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ පස්වන චක්‍රය (පෙර ව්‍යාපාරික දිනය) විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ පළමු චක්‍රය (වර්තමාන ව්‍යාපාරික දිනය)
1100 පැය	ප්‍රතිවිකුණුම් සහ ස්ථාවර ණය පහසුකමට අදාළ ආපසු ගෙවීම	විවට වෙළඳ කටයුතු යටතේ ප්‍රතිවිකුණුම්වල සහ නිත්‍ය ණය පහසුකම්වල ප්‍රතිවිකුණුම්වල දෙවන පාදයට අදාළ පියවීම
1100 පැය	ද්‍රවශීලතා පහසුකමට අදාළ ආපසු ගෙවීම	විවට වෙළඳ කටයුතු යටතේ ද්‍රවශීලතා පහසුකමෙහි දෙවන පාදයට අදාළ පියවීම්
1100 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ දෙවන චක්‍රය
1115 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ දෙවන චක්‍රය
1115 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ දෙවන චක්‍රය
1145 පැය	දිගුකාලීන ප්‍රතිවිකුණුම්/දිගුකාලීන ද්‍රවශීලතා පහ සුකම් (වෙන්දේසිය)	විවට වෙළඳ කටයුතු යටතේ දිගුකාලීන ප්‍රතිවිකුණුම්වල/ දිගුකාලීන ද්‍රවශීලතා පහසුකම් වල ප්‍රථම පාදයට අදාළ පියවීම් කටයුතු
1300 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් ක්‍රමයෙහි දෙවන චක්‍රය

1300 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ තෙවන චක්‍රය
1300 පැය	ප්‍රාථමික වෙන්දේසියට අදාල පියවීම් කටයුතු /කෙටිකාලීන ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් වෙන්දේසි කටයුතු අවසන් කිරීම	ප්‍රාථමික වෙන්දේසියේ සුරැකුම්පත් පියවීම, කෙටිකාලීන ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් පියවීම
1315 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ තෙවන චක්‍රය
1315 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ තෙවන චක්‍රය
1315 පැය	කෙටිකාලීන ප්‍රතිමිලදී ගැනීම්/ප්‍රතිවිකුණුම් (වෙන්දේසිය)	විවට වෙළඳ කටයුතු යටතේ කෙටිකාලීන ප්‍රතිමිලදී ගැනීම් / ප්‍රතිවිකුණුම්වල ප්‍රථම පාදයට අදාළ පියවීම් කටයුතු
1315 පැය	ද්‍රවශීලතා පහසුකම (වෙන්දේසිය)	විවට වෙළඳ කටයුතු යටතේ ද්‍රවශීලතා පහසුකමෙහි ප්‍රථම පාදයට අදාළ පියවීම් කටයුතු
1445 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	පියවුම් නිෂ්කාශනය සහ ගැලපුම් නිෂ්කාශනය
1500 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් ක්‍රමයෙහි තෙවන චක්‍රය
1500 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සිව්වන චක්‍රය
1500 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සිව්වන චක්‍රය
1500 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සිව්වන චක්‍රය
1500 පැය	තුන්වන පාර්ශ්වීය ගනුදෙනු සඳහා පද්ධතිය වැසීම	අන්තර් බැංකුවලට අදාළ MT2XX කාණ්ඩයේ පණිවුඩ හැර එම දින තුළ තුන්වන පාර්ශ්වයේ අළුත් ගනුදෙනු (T+0) සඳහා පද්ධතිය වැසීම
1510 පැය	නිත්‍ය පහසුකම් ලබාගැනීම අවසන් කිරීම	සහභාගීත්ව ආයතන වලට 1510 පැයෙන් පසු නිත්‍ය තැන්පතු පහසුකම් සහ නිත්‍ය ණය පහසුකම් ලබා ගත නොහැක.
1515 පැය	සහභාගීත්ව ආයතනවලට දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ලබා ගැනීම අවසන් කිරීම	සහභාගීත්ව ආයතන විසින් 1515 පැයෙන් පසු දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ලබා ගැනීම නොකළ යුතුය.
1525 පැය	නිත්‍ය තැන්පතු පහසුකම්	නිත්‍ය තැන්පතු පහසුකම් ප්‍රථම පාදයට අදාළ පියවීම
1535 පැය	නිත්‍ය ණය පහසුකම්	නිත්‍ය ණය පහසුකම් ප්‍රථම පාදයට අදාළ පියවීම
1545 පැය	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ආපසු ගෙවීම	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ආපසු අය කර ගැනීම
1600 පැය	ගනුදෙනු සඳහා පද්ධතිය වැසීම	පද්ධතිය විසින් මෙම වේලාවෙන් පසුව වැඩිදුරටත් ගනුදෙනු භාර නොගනී.ගනුදෙනු සඳහා පද්ධතිය වැසීමෙන් පසු එතෙක් පෙළගැසී තිබුණු ගනුදෙනු කිසිවක් වේ නම් ඒවා නතර කිරීම හා අවලංගු කිරීම සිදුවේ.

1600 පැය සිට 1615 පැය දක්වා	දවස අවසානයට අදාළ සැකසුම් කටයුතු	දවස අවසානයට අදාළ සැකසුම් කටයුතු උදා: වාර්තා පිළියෙළ කිරීම, අදාළ ගොනු පොදු ලෙජරය වෙත යොමු කිරීම, ලංකාසෙට්ල් ගාස්තු අය කිරීම සඳහා අදාළ දත්ත පිළියෙළ කිරීම සහ මුද්‍රණ වාර්තා සැකසීම අයත් වේ.
1615 පැය	පද්ධතිය සංවෘත කිරීම	තත්කාලීන දළ පියවීම් පද්ධතිය සහ නිර්ලේඛන සුරැකුම්පත් පියවීමේ පද්ධතියට අදාළ සියලුම මෘදුකාංග වසා දැමීම. දත්ත වෙනත් දත්ත ගබඩාවක සටහන් කිරීම.

සහභාගීත්ව ආයතන පිරික්සුම් නිකේතනය මඟින් ඔවුන්ගේ පියවීම් ගිණුම් නිරීක්ෂණය කල යුතු බවත්, බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනු තත්කාලීන දළ පියවීම් පද්ධතිය වෙත පියවීම සඳහා යොමු කරන අවස්ථාවේදී තම පියවුම් ගිණුම්වල ප්‍රමාණවත් අරමුදල් ශේෂයක් පවත්වා ගැනීමට වගබලා ගතයුතු බවටත්, සහභාගීත්ව ආයතන වෙත මෙයින් උපදෙස් දෙනු ලැබේ.

ඩී. කුමාරතුංග
අධ්‍යක්ෂ, ගෙවීම් සහ පියවීම්

එම්. ඉසඩ්. එම් ආසීම්
අධිකාරී, රාජ්‍ය ණය

යොමු අංකය : 34/07/029/0001/002 2021 ජූලි 08

ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 08/2021

ලංකාසෙට්ල් පද්ධතියේ සියලුම සහභාගීත්ව ආයතන වෙත,

2021.07.12 දින සිට ලංකාසෙට්ල් පද්ධතියෙහි දෛනික මෙහෙයුම් කාල සටහන

පහත සඳහන් දෛනික මෙහෙයුම් කාල සටහන 2021.07.12 දින සිට අනුගමනය කෙරේ.

වේලාව	මෙහෙයුම	කාර්යයන්/ගනුදෙනු
0630 පැය	පද්ධතිය ආරම්භ කිරීම	තත්කාලීන දළ පියවීම් පද්ධතිය සහ නිර්ලේඛන සුරැකුම්පත් පද්ධතිය ආරම්භ කිරීම
0730 පැය සිට 0800 පැය දක්වා	දිනයේ ආරම්භක සැකසුම් කටයුතු	සුරැකුම්පත් සඳහා වන නිල මිල ගණන් යාවත්කාලීන කිරීම සහ දවස තුළ ලබා දෙන ද්‍රවශීලතා පහසුකම් සඳහා සුරැකුම්පත් හිමිකාරීත්වය සලකුණු කිරීම
0800 පැය	ලංකාසෙට්ල් පද්ධතිය ගනුදෙනු සඳහා විවෘත කිරීම	ගනුදෙනු ආරම්භ කිරීම සඳහා පද්ධතිය විවෘත කිරීම
0800 පැය	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම්/ප්‍රතිමිලදී ගැනීම් සහ නිත්‍ය තැන්පතු පහසුකම් ස්වයංක්‍රීයව පියවීම	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම් ලබා දීම සහ විවට වෙළඳ කටයුතු ආශ්‍රිත ප්‍රතිමිලදී ගැනීම්වල සහ නිත්‍ය තැන්පතු පහසුකම් වල දෙවැනි පාදයට අදාළ ආපසු ගෙවීම් කටයුතු
0815 පැය	දිනය ආරම්භයේ කරන කල් පිරීම්/පොලී ගෙවීම්, ගොනු කිරීම් සහ ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් කල්පිරීම්	කල්පිරුණු සුරැකුම්පත් වලට අදාළ පියවීම්/ සුරැකුම්පත් කුපන් සඳහා ගෙවීම්, ලංකාසෙට්ල් පද්ධතියේ ගාස්තු/ දඩ මුදල් අය කිරීම් සහ ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් කල් පිරීම්
0830 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම.	ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් ක්‍රමයෙහි පළමු වන චක්‍රය ප්‍රධාන නිෂ්කාශන පද්ධතියට අදාළ ශුද්ධ නිෂ්කාශන ශේෂයන් පියවීම

0830 පැය	ස්ථිර පදනමක් මත මිලදී ගැනීම් හා විකුණුම්/ දිගුකාලීන ප්‍රතිමිලදී ගැනීම් වෙන්දේසිය/ දිගුකාලීන ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් නිකුත් කිරීම	ස්ථිර පදනමක් මත මිලදී ගැනීම් හා විකුණුම් පියවීම, දිගුකාලීන ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් වෙන්දේසිය සහ දිගුකාලීන ප්‍රතිමිලදී ගැනීම් වෙන්දේසියෙහි ප්‍රථම පාදය
0845 පැය	ප්‍රාථමික වෙන්දේසි නිකුතුව (අදාල අවස්ථාවේදී)	ප්‍රාථමික වෙන්දේසි නිකුතුව (අදාල අවස්ථාවේදී)
0845 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ පළමු චක්‍රය
0900 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ පළමු චක්‍රය
0900 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ පළමු චක්‍රය
1100 පැය	ප්‍රතිවිකුණුම් සහ ස්ථාවර ණය පහසුකමට අදාළ ආපසු ගෙවීම්	විවට වෙළඳ කටයුතු යටතේ ප්‍රතිවිකුණුම්වල සහ නිත්‍ය ණය පහසුකම්වල ප්‍රතිවිකුණුම්වල දෙවන පාදයට අදාළ පියවීම
1100 පැය	ද්‍රවශීලතා පහසුකමට අදාළ ආපසු ගෙවීම්	විවට වෙළඳ කටයුතු යටතේ ද්‍රවශීලතා පහසුකමෙහි දෙවන පාදයට අදාළ පියවීම්
1100 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ දෙවන චක්‍රය
1115 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ දෙවන චක්‍රය
1115 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ දෙවන චක්‍රය
1145 පැය	දිගුකාලීන ප්‍රතිවිකුණුම් /දිගුකාලීන ද්‍රවශීලතා පහසුකම් (වෙන්දේසිය)	විවට වෙළඳ කටයුතු යටතේ දිගුකාලීන ප්‍රතිවිකුණුම්වල/ දිගුකාලීන ද්‍රවශීලතා පහසුකම් වල ප්‍රථම පාදයට අදාළ පියවීම් කටයුතු
1300 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් ක්‍රමයෙහි දෙවන චක්‍රය
1300 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ තෙවන චක්‍රය
1300 පැය	ප්‍රාථමික වෙන්දේසියට අදාල පියවීම් කටයුතු /කෙටිකාලීන ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් වෙන්දේසි කටයුතු අවසන් කිරීම	ප්‍රාථමික වෙන්දේසියේ සුරැකුම්පත් පියවීම්, කෙටිකාලීන ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් පියවීම්
1315 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ තෙවන චක්‍රය
1315 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ තෙවන චක්‍රය
1315 පැය	කෙටිකාලීන ප්‍රතිමිලදී ගැනීම්/ ප්‍රතිවිකුණුම් (වෙන්දේසිය)	විවට වෙළඳ කටයුතු යටතේ කෙටිකාලීන ප්‍රතිමිලදී ගැනීම්/ ප්‍රතිවිකුණුම්වල ප්‍රථම පාදයට අදාළ පියවීම් කටයුතු
1315 පැය	ද්‍රවශීලතා පහසුකම (වෙන්දේසිය)	විවට වෙළඳ කටයුතු යටතේ ද්‍රවශීලතා පහසුකමෙහි ප්‍රථම පාදයට අදාළ පියවීම් කටයුතු

1445 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	පියවුම් නිෂ්කාශනය සහ ගැලපුම් නිෂ්කාශනය
1500 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් ක්‍රමයෙහි තෙවන චක්‍රය
1500 පැය	තුන්වන පාර්ශ්වීය ගනුදෙනු සඳහා පද්ධතිය වැසීම	අන්තර් බැංකුවලට අදාළ MT2XX කාණ්ඩයේ පණිවුඩ හැර එම දින තුළ තුන්වන පාර්ශ්වයේ අළුත් ගනුදෙනු (T+0) සඳහා පද්ධතිය වැසීම
1500 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සිව්වන චක්‍රය
1515 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සිව්වන චක්‍රය
1515 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සිව්වන චක්‍රය
1530 පැය	නිත්‍ය පහසුකම් ලබාගැනීම අවසන් කිරීම	සහභාගීත්ව ආයතන වලට 1530 පැයෙන් පසු නිත්‍ය තැන්පතු පහසුකම සහ නිත්‍ය ණය පහසුකම ලබා ගත නොහැක
1545 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ පස්වන චක්‍රය
1545 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ පස්වන චක්‍රය
1545 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ පස්වන චක්‍රය
1545 පැය	සහභාගීත්ව ආයතනවලට දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ලබා ගැනීම අවසන් කිරීම	සහභාගීත්ව ආයතන විසින් 1545 පැයෙන් පසු දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ලබා ගැනීම නොකළ යුතුය.
1600 පැය	නිත්‍ය තැන්පතු පහසුකම්	නිත්‍ය තැන්පතු පහසුකම් ප්‍රථම පාදයට අදාළ පියවීම
1615 පැය	නිත්‍ය ණය පහසුකම්	නිත්‍ය ණය පහසුකම් ප්‍රථම පාදයට අදාළ පියවීම
1615 පැය	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ආපසු ගෙවීම	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ආපසු අය කර ගැනීම
1630 පැය	ගනුදෙනු සඳහා පද්ධතිය වැසීම	පද්ධතිය විසින් මෙම වේලාවෙන් පසුව වැඩිදුරටත් ගනුදෙනු භාර නොගනී. ගනුදෙනු සඳහා පද්ධතිය වැසීමෙන් පසු එතෙක් පෙළගැසී තිබුණු ගනුදෙනු කිසිවක් වේ නම් ඒවා නතර කිරීම හා අවලංගු කිරීම සිදුවේ.
1630 පැය සිට 1700 පැය දක්වා	දවස අවසානයට අදාළ සැකසුම් කටයුතු	දවස අවසානයට අදාළ සැකසුම් කටයුතු උදා: වාර්තා පිළියෙළ කිරීම, අදාළ ගොනු පොදු ලෙජරය වෙත යොමු කිරීම, ලංකාසෙට්ල් ගාස්තු අය කිරීම සඳහා අදාළ දත්ත පිළියෙළ කිරීම සහ මුද්‍රණ වාර්තා සැකසීම අයත් වේ.
1700 පැය	පද්ධතිය සංවෘත කිරීම	තත්කාලීන දළ පියවීම් පද්ධතිය සහ නිර්ලේඛන සුරැකුම්පත් පියවීමේ පද්ධතියට අදාළ සියලුම මෘදුකාංග වසා දැමීම. දත්ත වෙනත් දත්ත ගබඩාවක සටහන් කිරීම.

සහභාගීත්ව ආයතන පිරික්සුම් නිකේතනය මඟින් ඔවුන්ගේ පියවීම් ගිණුම් නිරීක්ෂණය කල යුතු බවත්, බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනු තත්කාලීන දළ පියවීම් පද්ධතිය වෙත පියවීම සඳහා යොමු කරන අවස්ථාවේදී තම පියවුම් ගිණුම්වල ප්‍රමාණවත් අරමුදල් ශේෂයක් පවත්වා ගැනීමට වගබලා ගතයුතු බවටත්, සහභාගීත්ව ආයතන වෙත මෙයින් උපදෙස් දෙනු ලැබේ.

ව්‍යාපාරික කාලසීමා දීර්ඝ කිරීම සඳහා කරනු ලබන ඉල්ලීම් අදාල ව්‍යාපාරික දින වලදී ප.ව. 04.00ට පෙර සන්නිවේදනය කල යුතුවේ. එසේ ප.ව. 04.00න් පසුව කරනු ලබන ඉල්ලීම් භාරගනු නොලැබේ.

ඩී. කුමාරතුංග
අධ්‍යක්ෂ, ගෙවීම් සහ පියවීම්

එම්. ඉසඩ්. එම් ආසීම්
අධිකාරි, රාජ්‍ය ණය

යොමු අංකය : 34/07/029/0001/002 2021 සැප්තැම්බර් 13

ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 09/2021

ලංකාසෙට්ල් පද්ධතියේ සියලුම සහභාගීත්ව ආයතන වෙත,

ලංකාසෙට්ල් පද්ධතියේ නීති නව සංස්කරණය - 2.2 සංස්කරණය

2020 දෙසැම්බර් 31 දින දක්වා සංශෝධනද ඇතුලත්ව, 2021 පෙබරවාරි 01 දිනැති අංක 2213/2 ගැසට් නිවේදනය මඟින් ලංකාසෙට්ල් පද්ධති නීතිවල නව සංස්කරණයක් ප්‍රකාශයට පත්කර ඇත. එය ශ්‍රී ලංකා මහ බැංකු නිල වෙබ් අඩවියේ පළකර ඇති අතර ඒ සඳහා පහත සබැඳියන් හරහා ප්‍රවේශ විය හැකිය.

සිංහල
https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/laws/acts/si/psd_gazette_20210805_lankasettle_system_rules_v2.2_s.pdf

ඉංග්‍රීසි
https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/laws/acts/en/psd_gazette_20210805_lankasettle_system_rules_v2.2_e.pdf

දෙමළ
https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/laws/acts/ta/psd_gazette_20210805_lankasettle_system_rules_v2.2_t.pdf

ඒ අනුව, සියලුම සහභාගීත්ව ආයතන වලට ලංකාසෙට්ල් පද්ධති නීති 2.2 සංස්කරණයට අනුකූල වන ලෙසට මෙයින් දන්වා සිටිමු.

ඩී. කුමාරතුංග
අධ්‍යක්ෂ, ගෙවීම් සහ පියවීම්

යොමු අංකය : 34/01/024/0106/06 2021 දෙසැම්බර් 02

ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 10/2021

ලංකාසෙට්ල් පද්ධතියේ සියලුම සහභාගීත්ව ආයතන වෙත,

2021 දෙසැම්බර් 09 සහ 10 දිනයන් හිදී ලංකාසෙට්ල් පද්ධතියේ සජීව මෙහෙයුම් කටයුතු ප්‍රතිප්‍රාප්ති වැඩබිමෙහි සිට සිදු කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිය ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් පරීක්ෂාවට ලක් කිරීමේ අරමුණ ඇතිව 2021 දෙසැම්බර් 09 සහ 10 දිනයන්හිදී ලංකාසෙට්ල් පද්ධතියේ (තත්කාලීන දළ පියවීම් පද්ධතිය සහ ලංකාසෙක්‍යු පද්ධතිය) සහ අනෙකුත් අදාල පද්ධතීන්හි මෙහෙයුම් කටයුතු ප්‍රතිප්‍රාප්ති වැඩබිමෙහි සිට සිදු කරනු ලබනු බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සීබීඑස්එල්නෙට් (CBSLNet) සමග සම්බන්ධ කර ඇති ඔබ ආයතනයෙහි පෞද්ගලික පරිගණකයන් ප්‍රතිප්‍රාප්ති වැඩබිම වෙත පිවිසිය හැකි වන පරිදි සකසා ඇත. කෙසේ වෙතත්, සූදානම් බව තහවුරු කිරීම සඳහා 2021 දෙසැම්බර් 08ට පෙර ශ්‍රී ලංකා මහ බැංකුවේ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් එම සම්බන්ධතාවයන් පරීක්ෂා කර ගන්නා මෙන් ඉල්ලා සිටී. මෙම ව්‍යාපාර අඛණ්ඩතා

සැලසුම් අභ්‍යාසයේදී ඇතිවන තොරතුරු තාක්ෂණ ගැටලු සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ පහත නිලධාරීන් එකම සබඳතා ලක්ෂ්‍යය ලෙස ක්‍රියා කරනු ඇත.

වී. කමල්නාත් මහතා	011 2477126 (kamalnath@cbsl.lk)
පී. අයි. හෙට්ටිආරච්චි	011 2477621 (gihanh@cbsl.lk)

කරුණාකර ඉහත නිළධාරීන් හා සම්බන්ධ වීමේදී එය ඔබ ආයතන විසින් නම්කරන ලද ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් නිළධාරී හරහා සිදුකරන ලෙස ඔබ ආයතන වල සියලුම මෙහෙයුම් නිළධාරීන් හට උපදෙස් ලබාදෙන ලෙස මෙයින් දන්වා සිටිමු.

එම්. ආර්. විජේවර්දන
අධ්‍යක්ෂ, ගෙවීම් සහ පියවීම්

පිටපත :
අධ්‍යක්ෂ, තොරතුරු තාක්ෂණ - ශ්‍රී ලංකා මහ බැංකුව
ප්‍රධාන විධායක නිලධාරී - ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම
මහ ලේකම් - ශ්‍රී ලංකා බැංකු සංගමය
සභාපති - ප්‍රාථමික අලෙවිකරුවන්ගේ සංගමය
ප්‍රධාන විධායක නිලධාරි - ලංකා මූල්‍ය සේවා කාර්යාංශය

යොමු අංකය : 34/07/029/0001/002 2021 දෙසැම්බර් 20

ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 11/2021

ලංකාසෙට්ල් පද්ධතියේ සියලුම සහභාගීත්ව ආයතන වෙත,

2021 දෙසැම්බර් 24 වන දින සඳහා වූ ලංකාසෙට්ල් පද්ධතියෙහි විශේෂිත දෛනික මෙහෙයුම් කාල සටහන

නත්තල් දිනය වෙනුවෙන් නම් කර ඇති විශේෂ බැංකු අර්ධ නිවාඩුව හේතුවෙන් පහත සඳහන් වූ විශේෂිත දෛනික මෙහෙයුම් කාල සටහන 2021 දෙසැම්බර් 24 වන දින අනුගමනය කෙරේ.

වේලාව	මෙහෙයුම	කාර්යයන්/ගනුදෙනු
0630 පැය	පද්ධතිය ආරම්භ කිරීම	තත්කාලීන දළ පියවීම් පද්ධතිය සහ නිර්ලේඛන සුරැකුම්පත් පද්ධතිය ආරම්භ කිරීම
0730 පැය සිට 0800 පැය දක්වා	දිනයේ ආරම්භක සැකසුම් කටයුතු	සුරැකුම්පත් සඳහා වන නිල මිල ගණන් යාවත්කාලීන කිරීම සහ දවස තුළ ලබා දෙන ද්‍රවශීලතා පහසුකම් සඳහා සුරැකුම්පත් හිමිකාරීත්වය සලකුණු කිරීම
0800 පැය	ලංකාසෙට්ල් පද්ධතිය ගනුදෙනු සඳහා විවෘත කිරීම	ගනුදෙනු ආරම්භ කිරීම සඳහා පද්ධතිය විවෘත කිරීම
0800 පැය	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම්/ප්‍රතිමිලදී ගැනීම් සහ නිත්‍ය තැන්පතු පහසුකම් ස්වයංක්‍රීයව පියවීම	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම් ලබා දීම සහ විවට වෙළඳ කටයුතු ආශ්‍රිත ප්‍රතිමිලදී ගැනීම්වල සහ නිත්‍ය තැන්පතු පහසුකම් වල දෙවැනි පාදයට අදාළ ආපසු ගෙවීම් කටයුතු
0815 පැය	දිනය ආරම්භයේ කරන කල් පිරිම්/පොලී ගෙවීම් ගොනු කිරීම් සහ ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් කල්පිරිම්	කල්පිරුණු සුරැකුම්පත් වලට අදාළ පියවීම්/ සුරැකුම්පත් කුපන් සඳහා ගෙවීම්, ලංකාසෙට්ල් පද්ධතියේ ගාස්තු/ දඩ මුදල් අය කිරීම් සහ ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් කල් පිරීම්
0830 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම.	ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් ක්‍රමයෙහි පළමු වන චක්‍රය ප්‍රධාන නිෂ්කාශන පද්ධතියට අදාළ ශුද්ධ නිෂ්කාශන ශේෂයන් පියවීම
0830 පැය	ප්‍රාථමික වෙන්දේසි නිකුතුව/ස්ථිර පදනමක් මත මිලදී ගැනීම් හා විකුණුම්/දිගුකාලීන ප්‍රතිමිලදී ගැනීම් වෙන්දේසිය/දිගුකාලීන ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් නිකුත් කිරීම	ප්‍රාථමික වෙන්දේසි නිකුතුව /ස්ථිර පදනමක් මත මිලදී ගැනීම් හා විකුණුම් පියවීම, දිගුකාලීන ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් වෙන්දේසිය සහ දිගුකාලීන ප්‍රතිමිලදී ගැනීම් වෙන්දේසියෙහි ප්‍රථම පාදය

0845 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ පළමු චක්‍රය
0900 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ පළමු චක්‍රය
0900 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ පළමු චක්‍රය
0930 පැය	ප්‍රතිවිකුණුම් සහ ස්ථාවර ණය පහසුකමට අදාළ ආපසු ගෙවීම්	විවට වෙළඳ කටයුතු යටතේ ප්‍රතිවිකුණුම්වල සහ නිත්‍ය ණය පහසුකම්වල ප්‍රතිවිකුණුම්වල දෙවන පාදයට අදාළ පියවීම
0930 පැය	ද්‍රවශීලතා පහසුකමට අදාළ ආපසු ගෙවීම්	විවට වෙළඳ කටයුතු යටතේ ද්‍රවශීලතා පහසුකමෙහි දෙවන පාදයට අදාළ පියවීම
1015 පැය	එක් දින/කෙටි කාලීන ප්‍රතිමිලදී ගැනුම්/ ප්‍රතිවිකුණුම් (වෙන්දේසිය)	විවට වෙළඳ කටයුතු යටතේ එක් දින/කෙටි කාලීන ප්‍රතිමිලදී ගැනුම්/ප්‍රතිවිකුණුම් වල පළමු පාදයට අදාල පියවීම
1030 පැය	ප්‍රාථමික වෙන්දේසියට අදාල පියවීම් කටයුතු අවසන් කිරීම /කෙටිකාලීන ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් වෙන්දේසිය	ප්‍රාථමික වෙන්දේසියේ සුරැකුම්පත් පියවීම, කෙටිකාලීන ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් වෙන්දේසිය පියවීම
1100 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ දෙවන චක්‍රය
1115 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ දෙවන චක්‍රය
1115 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ දෙවන චක්‍රය
1200 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් ක්‍රමයෙහි දෙවන චක්‍රය
1215 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම	පියවුම් නිෂ්කාශනය සහ ගැලපුම් නිෂ්කාශනය
1215 පැය	තුන්වන පාර්ශ්වීය ගනුදෙනු සඳහා පද්ධතිය වැසීම	අන්තර් බැංකුවලට අදාළ MT2XX කාණ්ඩයේ පණිවුඩ හැර එම දින තුළ තුන්වන පාර්ශ්වයේ අළුත් ගනුදෙනු (T+0) සඳහා පද්ධතිය වැසීම
1220 පැය	සහභාගීත්ව ආයතනවලට දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ලබා ගැනීම අවසන් කිරීම	සහභාගීත්ව ආයතන වලට 1220 පැයෙන් පසුව දවස ඇතුලත ද්‍රවශීලතා පහසුකම ලබාගැනීම සිදු නොකළ යුතුය.
1220 පැය	නිත්‍ය පහසුකම් ලබා ගැනීම අවසන් කිරීම	සහභාගීත්ව ආයතන විසින් 1220 පැයෙන් පසුව නිත්‍ය ණය පහසුකම හා නිත්‍ය තැන්පතු පහසුකම ලබාගත නොහැක.
1235 පැය	නිත්‍ය තැන්පතු පහසුකම්	නිත්‍ය තැන්පතු පහසුකම් ප්‍රථම පාදයට අදාළ පියවීම
1240 පැය	නිත්‍ය ණය පහසුකම්	නිත්‍ය ණය පහසුකම් ප්‍රථම පාදයට අදාළ පියවීම
1245 පැය	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ආපසු ගෙවීම	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ආපසු අය කර ගැනීම
1255 පැය	ගනුදෙනු සඳහා පද්ධතිය වැසීම	පද්ධතිය විසින් මෙම වේලාවෙන් පසුව වැඩිදුරටත් ගනුදෙනු භාර නොගනී. ගනුදෙනු සඳහා පද්ධතිය වැසීමෙන් පසු එතෙක් පෙළගැසී තිබුණු ගනුදෙනු කිසිවක් වේ නම් ඒවා නතර කිරීම හා අවලංගු කිරීම සිදුවේ.

1255 පැය සිට 1310 පැය දක්වා	දවස අවසානයට අදාළ සැකසුම් කටයුතු	දවස අවසානයට අදාළ සැකසුම් කටයුතු උදා: වාර්තා පිළියෙළ කිරීම, අදාළ ගොනු පොදු ලෙජරය වෙත යොමු කිරීම, ලංකාසෙට්ල් ගාස්තු අය කිරීම සඳහා අදාළ දත්ත පිළියෙළ කිරීම සහ මුද්‍රණ වාර්තා සැකසීම අයත් වේ.
1310 පැය	පද්ධතිය සංවෘත කිරීම	තත්කාලීන දළ පියවීම් පද්ධතිය සහ නිර්ලේඛන සුරැකුම්පත් පියවීමේ පද්ධතියට අදාළ සියලුම මෘදුකාංග වසා දැමීම. දත්ත වෙනත් දත්ත ගබඩාවක සටහන් කිරීම.

සහභාගීත්ව ආයතන පිරික්සුම් නිකේතනය මඟින් ඔවුන්ගේ පියවීම් ගිණුම් නිරීක්ෂණය කල යුතු බවත්, බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනු තත්කාලීන දළ පියවීම් පද්ධතිය වෙත පියවීම සඳහා යොමු කරන අවස්ථාවේදී තම පියවුම් ගිණුම්වල ප්‍රමාණවත් අරමුදල් ශේෂයක් පවත්වා ගැනීමට වගබලා ගතයුතු බවටත්, සහභාගීත්ව ආයතන වෙත මෙයින් උපදෙස් දෙනු ලැබේ.

විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සහ විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ තෙවන හා සිව්වන චක්‍ර (2021 දෙසැම්බර් 24 වන දිනට අදාළ) පියවීම ඊළඟ ව්‍යාපාරික දිනයේ (2021 දෙසැම්බර් 27) 0830 පැයට සිදු කරනු ලබයි.

2021 දෙසැම්බර් 24 දිනට අදාළ ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් ක්‍රමයෙහි තෙවන චක්‍රය අවලංගු කරනු ලැබේ.

එම්.ආර්. විජේවර්දන
අධ්‍යක්ෂ, ගෙවීම් සහ පියවීම්

එම්. ඉසඩ්. එම් ආසීම්
අධිකාරි, රාජ්‍ය ණය

යොමු අංකය : 34/01/025/0038/003

2021 දෙසැම්බර් 27

සියලුම බලපත්‍රලාභී බැංකු, බලපත්‍රලාභී මූල්‍ය ආයතන සහ බලපත්‍රලාභී ජංගම දුරකථන පදනම් කරගත් විද්‍යුත් මුදල් පද්ධති ක්‍රියාකරුවන්ගේ ප්‍රධාන විධායක නිළධාරීන් වෙත,

අතිරේකය 4 - ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 02/2019
දේශීය ගෙවීම් සඳහා ජාතික QR කේත ප්‍රමිතියක් පිහිටුවීම

2019.03.11 දින නිකුත් කරන ලද 2019 අංක 02 දරන දේශීය ගෙවීම් සඳහා ජාතික QR කේත ප්‍රමිතියක් පිහිටුවීම සඳහා වන චක්‍රලේඛය, 2019.10.30 දින නිකුත් කරන ලද එහි අතිරේක 1, 2020.11.27 දින නිකුත් කරන ලද අතිරේක 2 සහ 2021.06.10 දින නිකුත් කරන ලද අතිරේක 3 හා බැඳේ. මෙම අතිරේකය, ඉහත චක්‍රලේඛය සහ අතිරේක සමඟ කියවිය යුතුය.

2021.12.31 වන දිනෙන් අවසන් වීමට නියමිත LANKAQR ආරම්භක ගනුදෙනු සඳහා වෙළඳ වට්ටම් අනුපාතය ගනුදෙනුවක අගයෙන් 1% සිට 0.5% දක්වා අඩු කිරීම, නැවත දැනුම්දෙන තුරු දීර්ඝ කෙරේ. ඒ අනුව, උපරිම වෙළඳ වට්ටම් අනුපාතය ගනුදෙනුවක අගයෙන් 0.5% ක් ලෙස නොවෙනස්ව පවතී.

එම්. ආර්. විජේවර්දන
අධ්‍යක්ෂ, ගෙවීම් සහ පියවීම්

පරිශීලක අංකය : 32/ 04/034/ 0001/001

2021 මාර්තු 24

සහභාගීත්ව මූල්‍ය ආයතනයන්හි ප්‍රධාන විධායක නිලධාරී/ සාමාන්‍යාධිකාරී වෙත

මහත්මයාණෙනි/ මහත්මියනි,

සෞභාග්‍යා කොවිඩ් - 19 පුනරුද පහසුකම: සංචාරක කර්මාන්තය තුළ ව්‍යාපාර සහ තනි පුද්ගල ව්‍යාපාර සඳහා ලබාදෙන ලද සහන දීර්ඝ කිරීම.

පවතින කොවිඩ්-19 වසංගතය හේතුවෙන් සංචාරක කර්මාන්තය තුළ නියැලී සිටින ව්‍යාපාර සහ තනි පුද්ගලයන් විසින් මුහුණ පා තිබෙන අභියෝග හඳුනා ගැනීමෙන් අනතුරුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන පහසුකමෙහි අදියර I, II සහ III යටතේ, සංචාරක කර්මාන්තයේ නියැලෙන්නන් හට ලබා දී ඇති සහන කාලය 2021 සැප්තැම්බර් 30 වන දින දක්වා දීර්ඝ කිරීමට සහ සංචාරක කර්මාන්තය තුළ නියැලෙන ව්‍යාපාර සහ පුද්ගලයන් වෙත ලබා දුන් කාරක ප්‍රාග්ධන ණය සඳහා මාස 36ක් දක්වා ණය ආපසු ගෙවීමේ කාලය දීර්ඝ කිරීමට තීරණය කරන ලදී.

පහත ආයතනයන්හි ලියාපදිංචි වී සිටින ව්‍යාපාර සහ තනි පුද්ගල ව්‍යාපාර මෙම සහන දීර්ඝ කිරීම ලබා ගැනීමට සුදුසුකම් ලබයි.

i. සංචාරක අමාත්‍යාංශය
ii. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
iii. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය යටතේ පවතින නියෝජිත ආයතන
iv. සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
v. ශ්‍රී ලංකා හෝටල් සංගමය

මෙම සහනවලින් ප්‍රතිලාභ ලබා ගැනීමට අපේක්ෂා කරන සුදුසුකම්ලත් ණය ගැනුම්කරුවන් 2021 අප්‍රේල් 23 වන දිනට හෝ ඊට ප්‍රථම අදාළ සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත එම සහන සඳහා ඉල්ලීමක් සිදු කළ යුතුය.

ඒ අනුව, දීර්ඝ කරන ලද සහන ලබා ගැනීමට අපේක්ෂා කරන සුදුසුකම්ලත් ණය ගැනුම්කරුවන්ගේ ඉල්ලීම් සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් පිළිගන්නා ලෙසටත්, අමුණන ලද ආකෘතියට අනුව අදාල යෝජනා ක්‍රමයේ එක් එක් අදියර සඳහා වෙන් වෙන් වශයෙන් 2021 මැයි 7 වන දින වන විට ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත විස්තර වාර්තා කරන ලෙසටත් ඉල්ලා සිටිමි.

මේ සම්බන්ධව ඔබ විසින් දක්වන සහයෝගය බෙහෙවින් අගය කොට සලකමි.

මෙයට විශ්වාසී

බී. එල්. ජේ. එස්. බාලසූරිය
අධ්‍යක්ෂ/ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව

සෞභාග්‍යා කොවිඩ් - 19 පුනරුද සහන ණය පහසුකම

අදියර * : .....

සංචාරක ක්ෂේත්‍රය තුළ ව්‍යාපාර සහ පුද්ගලයන් සඳහා සපයන ලද සහන දීර්ඝ කිරීමේ විස්තර

සහභාගීත්ව මූල්‍ය ආයතනයේ නම: .....

#	ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි අංකය	ණය මුදල මුදාහරින ලද දිනය	ණය ගැනුම්කරුගේ නම	ජා.හැ.අ./ ව්‍යාපාර ලියාපදිංචි අංකය	ණය මුදලේ ප්‍රමාණය (රු.)	සහන කාලය			සහන කාලය ඇතුළුව ණය ආපසු ගෙවීමේ කාලය		සුදුසුකම් ලැබීමට ලියාපදිංචි කළ ආයතනය**
						පවතින (මාස ගණන)	ඉල්ලීම් කළ (මාස ගණන)	අවසන් දිනය	මුල් (මාස ගණන)	ඉල්ලීම් කළ (මාස ගණන)	

.....

දිනය

.....

(බලයලත් නිලධාරියාගේ නම, අත්සන සහ මුද්‍රාව)

* යෝජනා ක්‍රමයේ එක් එක් අදියරන් සඳහා වෙන වෙනම පත්‍රිකා සපයන්න

** ආයතනය නිශ්චිතව දක්වන්න.

මෙහෙයුම් උපදෙස් අංක : RDD/NCRCS/2011/2021/01

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
තැ.පෙ. 590
අංක 30, ජනාධිපති මාවත
කොළඹ 01

2021 අප්‍රේල් 05

සියලු සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත

නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමයෙහි මෙහෙයුම් උපදෙස් සඳහා වන සංශෝධනය 'සරුසාර' ණය ඇප ආවරණය සහ පොලී සහනාධාර යෝජනා ක්‍රමය

ගෙවතු වගාව සහ ගබඩා කුවිතාන්සි මූල්‍යකරණය ඇතුළුව කෙටි කාලීන භෝග වගා කිරීමෙහි නියැලී ක්ෂුද්‍ර සහ කුඩා පරිමාණ ගොවීන්ගේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා පහසුකම් සැලසීමේ අරමුණින් නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමයෙහි 'සරුසාර' (NCRCS) (මින් මතු 'සුමට යෝජනා ක්‍රමය' ලෙස හැඳින්වෙන) ක්‍රියාකාරිත්වය උදෙසා සියලු සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා විසින් 2013.01.10, 2014.06.06, 2015.07.06, 2016.08.22 සහ 2020.04.08 යන දිනයන් හි දී නිකුත් කරන ලද සංශෝධනයන් සහ අංක RDD/NCRCS/2011 දරන 2011.09.23 දිනැති මෙහෙයුම් උපදෙස් සඳහා මෙම සංශෝධනය තවදුරටත් නිකුත් කරනු ඇත.

1. හැඳින්වීම

1.1 වර්ෂය මුළුල්ලේම මෙම ණය යෝජනා ක්‍රමයෙහි සුමට ක්‍රියාකාරීත්වයක් පවත්වා ගෙන යෑමේ අරමුණින්, ශ්‍රී ලංකා රජයෙහි (GOSL) මුදල් අමාත්‍යාංශයේ සහයෝගය ඇතිව මෙම මෙහෙයුම් උපදෙස් නිකුත් කිරීමට ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව අදහස් කරනු ලබයි.

1.2 කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීමට සහ භාණ්ඩ ගබඩා කුවිතාන්සි මූල්‍යකරණය සඳහා අවම අරමුදල්කරණ පිරිවැයක් සැපයීම මගින් ගෙවතු වගාව ඇතුළුව කෙටි කාලීන භෝග වගා කිරීමෙහි නියැලී සිටින ක්ෂුද්‍ර සහ කුඩා පරිමාණ ව්‍යවසායකයන්ගේ සමාජ ආර්ථික තත්ත්වයන් ඉහළ නැංවීම සඳහා මෙම ණය යෝජනා ක්‍රමය හඳුන්වා දී ඇත. මෙම යෝජනා ක්‍රමය මගින් කුඩා පරිමාණ ගොවීන්ගේ ණය ගැනීමේ පිරිවැය අවම කිරීම, ස්වභාවික විපතකදී හෝ වෙනත් විපතකදී ණය දීර්ඝ කිරීමේ පහසුකම් සැපයීම, ණය වලින් කොටසක් සඳහා ඇප ආවරණයක් ලබාදීම සහ ඒ අනුව ණය පැහැර හැරීමේ අවධානමෙන් කොටසක් බෙදා ගැනීම මෙම යෝජනා ක්‍රමය මගින් අපේක්ෂිත ය.

1.3 ශ්‍රී ලංකා රජය වෙනුවෙන් පොලී සහනාධාරයක් සහ ණය ඇප ආවරණ යෝජනා ක්‍රමයක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් මෙම ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කෙරෙනු ඇත. මෙම යෝජනා ක්‍රමය සඳහා වන අරමුදල් වාර්ෂිකව අයවැය ප්‍රතිපාදනවලින් ශ්‍රී ලංකා රජය විසින් ලබාදෙනු ඇත.

1.4 සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් මෙම යෝජනා ක්‍රමය යටතේ ණය මුදල් ප්‍රදානය කිරීම සඳහා ඔවුන්ගේ ස්වකීය අරමුදල් භාවිත කරනු ඇතැයි අපේක්ෂා කරන අතර, ශ්‍රී ලංකා රජය විසින් සහභාගීත්ව මූල්‍ය ආයතනයේ අරමුදල් පිරිවැය ආවරණය කිරීමට එක් එක් උප ණය සඳහා පොලී සහනාධාරයක් සහ මෙම යෝජනා ක්‍රමය යටතේ ලබා දුන් ණය මුදලට එරෙහිව අවදානම් බෙදා ගැනීමේ උපකරණයක් ලෙස ණය ඇප ආවරණයක් සපයනු ඇත.

1.5 මෙම යෝජනා ක්‍රමය යටතේ කුඩා පරිමාණ ගොවීන් වෙත ලබා දුන් ණය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවෙන් පොලී සහනාධාර සහ ණය ඇප ආවරණ සඳහා හිමිකම් පෑමට සහභාගීත්ව මූල්‍ය ආයතන සුදුසුකම් ලබයි.

1.6 මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ අධිකාරිය ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවට පැවරී ඇත.

2. මෙම යෝජනා ක්‍රමයේ අරමුණු

2.1 ගෙවතු වගාව සහ ගබඩා කුවිතාන්සි ලැබීම් මූල්‍යකරණය ඇතුළුව කෙටි කාලීන භෝග සහ ඒවායෙහි පැළ තවාන් වගා කිරීම සඳහා ක්ෂුද්‍ර සහ කුඩා පරිමාණ ගොවීන්ගේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සැපයීම.

2.2 ගොවි ප්‍රජාවන් අතර මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීම.

2.3 රටෙහි දේශීය කෘෂිකාර්මික අංශය සංවර්ධනය/ ප්‍රවර්ධනය කිරීම.

2.4 ක්ෂුද්‍ර සහ කුඩා පරිමාණ ගොවීන්ගේ ආදායම් උත්පාදන කටයුතු සහ ජීවන තත්ත්වයන් ඉහළ නැංවීම.

2.5 ප්‍රාදේශීය විෂමතාව සහ ග්‍රාමීය දුගීභාවය අවම කිරීම.

3. අරමුදලෙහි ප්‍රභවය

ශ්‍රී ලංකා රජය විසින් මෙම යෝජනා ක්‍රමයට අරමුදල් සැපයෙනු ඇත.

4. සහභාගීත්ව මූල්‍ය ආයතන (PFIs)

ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කෙරෙන පහත සහභාගීත්ව මූල්‍ය ආයතන මෙම යෝජනා ක්‍රමයට සහභාගී වන්නේ නම්, NCRCS හි පහසුකම් ලැබීමට සුදුසුකම් ලබයි;

ලංකා බැංකුව, කොමර්ෂල් බැංකුව ඔෆ් සිලෝන් පී.එල්.සී, සීමාසහිත කාගිල්ස් බැංකුව, ඩී එෆ් සී සී බැංකුව, හැටන් නැෂනල් බැංකුව, නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව, ජාතික සංවර්ධන බැංකුව, මහජන බැංකුව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, සම්පත් බැංකුව, සීමාසහිත සණස සංවර්ධන බැංකුව, සෙලාන් බැංකුව පී.එල්.සී. සහ යුනියන් බෑන්ක් ඔෆ් කලම්බු පී.එල්.සි.

5. මෙම යෝජනා ක්‍රමයේ සාමාන්‍ය ලක්ෂණ

5.1	ණය ගැනුම්කරුවා සඳහා වන සුදුසුකම් නිර්ණායක	පහත කොන්දේසිවලට යටත්ව මෙම යෝජනා ක්‍රමය සඳහා ණය ගැනුම්කරුවා සුදුසුකම් ලැබිය යුතුය; (i) ණය ගැනුම්කරුවා ගොවියෙකු විය යුතුය. (ii) මෙම යෝජනා ක්‍රමය යටතේ ණය පහත ගොවීන් වෙත ලබා දෙනු ඇත; (I) ඉඩම් හිමිකාරීත්වය සහිත (II) කල්බදු හිමිකාරීත්වයක් සහිත (III) අඳ ගොවියෙකු (IV) ඉඩම් හිමිකාරීත්වයක් නොමැති එහෙත් රජයේ බලපත්‍රයක්, අවසරයක් සහිත ගොවියෙකු (V) ඉඩමක් සතු නොවන එහෙත්, යම් කාලයක් සඳහා වගා කිරීමට ඉඩම් හිමියාගෙන් හිමිකම් සහ අධිකාරය ලබා ගෙන ඇති ගොවියෙකු (iii) ණය ගැනුම්කරු ඕනෑම මූල්‍ය ආයතනයකින් ලබා ගත් ණය මුදලකට අදාළව ණය පැහැර හරින්නෙකු නොවිය යුතුය. (iv) අවුරුදු 65 හෝ ඊට වැඩි ණය ගැනුම්කරුවෙකු විසින් ණය මුදලක් ලබා ගැනීමට, පවුලේ සාමාජිකයෙකු (කලත්‍රයා, වයස අවුරුදු 18 ට වැඩි දියණිය හෝ පුත්‍රයා) සම ණය ගැනුම්ක රුවෙකු ලෙස ණය ගැනුම්කරුවන් සමඟ ලියාපදිංචි කළ යුතුය.
5.2	සැලකිය යුතු ක්‍රියාකාරකම්	(i) කෙටි කාලීන භෝග සහ ඒවායෙහි පැල තවාන් (ඇමුණුම I) වගා කිරීම (ii) ගෙවතු වගාව (iii) ගබඩා කුවිතාන්සි මූල්‍යකරණය
5.3	මූල්‍යය පරිමාණය	(i) ණය ගැනුම්කරුවෙකු සඳහා උපරිම ණය මුදල රුපියල් 504,000කි. අදාළ මූල්‍ය පරිමාණ ඇමුණුම II හි අමුණා ඇත. (ii) ගෙවතු වගාව සඳහා රුපියල් 40,000ක උපරිමයකි. (iii) සුදුසුකම් ලත් ණය ගැනුම්කරුවන්ට භෝග වගා කිරීමේ රටාව මත පදනම්ව වර්ෂය මුළුල්ලේ සහභාගීත්ව මූල්‍ය ආයතනවලින් ණය පහසුකම ලබා ගත හැකිය.
5.4	ණය ගැනුම්කරු වෙත අදාළ වන පොලී අනුපාතිකය	(i) වර්ෂයකට සියයට හතර බැගින් (4%) (ii) කිසිදු අවස්ථාවක දී සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් වර්ෂයකට සියයට හතරකට වඩා වැඩි අනුපාතිකයකට ණය ගැනුම්කරුවෙකුට මෙම යෝජනා ක්‍රමය යටතේ කිසිදු ණය මුදලක් ලබා නොදිය යුතුය. (4%)
5.5	පොලී සහනාධාරය	(i) ශ්‍රී ලංකා රජය විසින් ශ්‍රී ලංකා මහ බැංකුව හරහා සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත ලබා දෙන සෑම ණය මුදලක් සඳහා ම සියයට පහක (5%) පොලී සහනාධාරයක් සපයනු ලබයි.
5.6	ආපසු ගෙවීමේ කාලය	(i) උක් වගාව හැරුණු කොට ණය ආපසු ගෙවීමේ උපරිම කාල සීමාව දින 270කි. උක් වගාව සඳහා දින 365 කි. සහන කාලයක් නොමැති අතර, නියමිත ගෙවීමට වඩා අඩු එක් ගෙවීමක් සිදු කළ හැකිය.
5.7	ඇප ආවරණයේ ප්‍රමාණය	(i) මෙම යෝජනා ක්‍රමය මඟින් අලාභයකදී මුල් මුදලින් සියයට 60 ක ඇප ආවරණයක් හෝ සහතික කරන ලද අගය යන දෙකෙන් අඩු අගය සපයනු ලබයි.
5.8	ඇප වාරිකය	(i) ඉහත 5.3 ට යටත්ව මෙම යෝජනා ක්‍රමය යටතේ මුදා හළ සෑම වගා ණයක් සඳහාම සියයට භාගයක (1/2) ක අනුපාතිකයට වාරිකය ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ගෙවිය යුතු වේ.

5.9 පශ්චාත් හිමිකම්	(i)	ශ්‍රී ලංකා මහ බැංකුව හිමිකම් පියවීමෙන් පසු සහභාගීත්ව ආයතනයක් විසින් ණය ගැනුම්කරුවෙකුගෙන් ආපසු අය කර ගත් ඕනෑම අගයක් 60:40 අනුපාතයට ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ බෙදා ගත යුතුය.
5.10 ඇපකරය	(ii)	ණය ඇපකරයකට වඩා ගොවි ක්‍රියාකාරකම් වල ශක්‍යතාවය සලකා ණය ලබා දෙන ලෙස සහභාගීත්ව මූල්‍ය ආයතනවලට උපදෙස් දෙනු ලැබේ.

6. මූල්‍ය පරිමාණය

6.1 වගා කිරීමෙහි පවතින පිරිවැය මත පදනම් ව මෙම පරිමාණයන් සකස් කර ඇත. එක් එක් භෝගය සඳහා කෘෂිකාර්මික දෙපාර්තමේන්තුව විසින් තීරණය කරනු ලබන මූල්‍ය පරිමාණයන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එක් එක් වගා කන්නයෙහි ආරම්භයේ දී සහභාගීත්ව මූල්‍ය ආයතනවල ප්‍රධාන කාර්යාලය වෙත සන්නිවේදනය කරනු ඇත.

6.2 මෙම යෝජනා ක්‍රමය යටතේ පහසුකම් සපයනුයේ මූල්‍ය පරිමාණයන්හි සඳහන් භූමි ප්‍රමාණයට අනුකූලවය. පොලී සහනාධාර ලබා නොදෙන වාණිජ අනුපාතිකයකට (අතිරික්ත අගය), සඳහන් කර ඇති ප්‍රමාණය අභිබවා යමින් සහභාගීත්ව මූල්‍ය ආයතනයකට ණය පහසුකමක් ලබා දිය හැකිය.

6.3 ණය මුදල වගාවෙහි මුළු පිරිවැයෙන් සියයට 75ක් නොඉක්මවිය යුතුය. ගොවියා විසින් වගාවෙහි ඇස්තමේන්තුගත මුළු පිරිවැයෙන් සියයට 25ක අවම අගයකට දායකත්වය දැක්විය යුතුය.

6.4 කෘෂිකාර්මික දෙපාර්තමේන්තුව සහ වෙනත් අදාළ ආයතනයන්හි උපදේශය ඇතිව, කලින් කලට මූල්‍ය පරිමාණයන්හි වෙනස්කම් සිදු කිරීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතුවේ.

7. පොලී සහනාධාර ගෙවීම

මූල්‍ය පරිමාණයන්හි සඳහන් කර ඇති පරිදි, සහභාගීත්ව මූල්‍ය ආයතනවලට ඔවුන්ගේ ස්වකීය සම්පත්වලින් අත්තිකාරම් කරන ලද ණය සඳහා ශ්‍රී ලංකා රජය විසින් තීරණය කරනු ලබන අනුපාතිකයකට පොලී සහනාධාරයක් ශ්‍රී ලංකා රජය විසින් සපයනු ඇත. සහභාගීත්ව මූල්‍ය ආයතන, මෙම සහනාධාරය සඳහා සුදුසුකම් ලැබීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තීරණය කරනු ලබන පොලී අනුපාතිකයකට ගොවීන් වෙත ණය ලබා දිය යුතු වේ.

7.1 පොලී සහනාධාර ගෙවීම් අදියර දෙකකින් සිදු කෙරෙනු ඇත. එනම්, අත්තිකාරම් ගෙවීමක් සහ අවසාන ගෙවීමක් ලෙස ය.

7.1.1 අත්තිකාරම් ගෙවීම අනුමත මුදල මත ඉහත 5.5 කොටසට අනුව දින 90 ක කාලයක් සඳහා ගණනය කෙරෙනු ඇත. මෙම කාර්යය සඳහා, සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ඇමුණුම III හි දක්වා ඇති පරිදි නියමිත කාලසීමාව තුළදී නියම කරන ලද නිසි ලෙස සම්පූර්ණ කරන ලද ඇමුණුම IV, RDD/NCRCS/IS/1 යොමු කළ යුතුය.

7.1.2 ගැටළු සහගත ණය මුදල දින 270 ක් ගත වීමෙන් පසුව ද ආපසු අය කර ගැනීමට නොහැකි වී ඇත්නම්, එම සිදුවීමට අනුව, දින 180 ක උපරිමයකට යටත්ව ඉතිරි කාලය සඳහා සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් ණය ආපසු අය කර ගැනීමේ දින වාර්තා කිරීමෙන් පසු අවසාන ගෙවීම සිදු කරනු ඇත. මෙම අරමුණ සඳහා, RDD/NCRCS/IS/2 යන ආකෘතිය (ඇමුණුම V හි දී ඇති පරිදි) ලබා දුන් වගා ණය මුදල, එම ණය ආපසු අය කර ගත් දිනය සහ ප්‍රමාණය යනාදිය වාර්තා කිරීමට හැකි වන පරිදි සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත ඉදිරිපත් කෙරෙනු ඇත.

7.2 ණය ගැනුම්කරුවෙකුට ලබා දුන් ණය මුදල අනුමත ණය මුදලට වඩා ඉහළ අගයක් ගන්නේ නම්, අනුමත අගය සඳහා පොලී සහනාධාරයක් සැපයෙනු ඇති අතර, ලබා දුන් ණය මුදල අනුමත අගයට වඩා අඩු නම්, ලබා දුන් අගය සඳහා පමණක් පොලී සහනාධාරය සැපයෙනු ඇත.

7.3 සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ශ්‍රී ලංකා මහ බැංකුවෙන් පොලී සහනාධාර අත්තිකාරම් ගෙවීම සහ පොලී සහනාධාර අවසන් ගෙවීම සඳහා හිමිකම් පෑමට පිළිවෙලින් RDD/NCRCS/IS/1 (ඇමුණුම IV) සහ RDD/NCRCS/IS/2 (ඇමුණුම V) යන ආකෘතීන් භාවිත කළ යුතු වේ. ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් මෙම අරමුණු සඳහා නියමිත පෝරම සියලු සහභාගීත්ව මූල්‍ය ආයතනවල ප්‍රධාන කාර්යාල වෙත යවනු ලැබේ.

7.4 සහභාගීත්ව මූල්‍ය ආයතනයේ ප්‍රධාන කාර්යාලය විසින් ශාඛා අනුව තොරතුරු සාරාංශ ගත කළ යුතු අතර, පොලී සහනාධාර අයදුම්පත් (RDD/NCRCS/IS/1 සහ RDD/NCRCS/IS/2 ඇමුණුම IV සහ V) සමඟ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතුය.

7.5 සහභාගීත්ව මූල්‍ය ආයතනවල ප්‍රධාන කාර්යාල විසින් ඇමුණුම III හි දක්වා ඇති නියමිත දිනයේ දී හෝ ඊට ප්‍රථම/ නියම කර ඇති කාලය තුළ දී සුදුසුකම් ලත් වාරිකය සමඟ පොලී සහනාධාර හිමිකම් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත (මෘදු පිටපත් සහ දෘඩ පිටපත්) යොමු කළ යුතු වේ.

7.6 පොලී සහනාධාර හිමිකම් අයදුම්පතෙහි දෘඩ පිටපතක් සහභාගීත්ව මූල්‍ය ආයතනයේ අදාළ ප්‍රධාන කාර්යාලය ඔස්සේ අධ්‍යක්ෂ, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව, අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01 යන ලිපිනය වෙත එවිය යුතුය.

7.7 දී ඇති කාලය තුළ දී සියලු සහභාගීත්ව මූල්‍ය ආයතනවල අයදුම්පත් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලද පසු, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් හිමිකම් සත්‍යාපනය සිදු කෙරෙනු ඇති අතර, එක් එක් සහභාගීත්ව මූල්‍ය ආයතනය සඳහා මෙම යෝජනා ක්‍රමය යටතේ අර්ධ වාර්ෂිකව අදාළ පොලී සහනාධාර හිමිකම් සඳහා ඉල්ලීමක් සිදු කරමින් ශ්‍රී ලංකා රජය වෙත ඉදිරිපත් කෙරෙනු ඇත. තවද, නියමිත මුදල් ශ්‍රී ලංකා රජයෙන් ලැබීමෙන් පසු හිමිකම් පියවීම සිදු කෙරෙනු ඇත.

8. පැහැර හැර ඇති ණය

වගා කිරීමේ කාල සීමාවෙන් පසු ශාඛාවේ කළමනාකරු විසින් ණය ගෙවීම පැහැර හැර ඇති ගොවීන් කාණ්ඩ දෙකකට වර්ග කළ යුතු වේ; එනම්, සිතා මතා ණය ගෙවීම පැහැර හරින්නන් සහ එලෙස නොකරන්නන් ලෙසිනි. ක්ෂේත්‍ර නිළධාරීන් විසින් ශාඛාවේ කළමනාකරු වෙත ලබා දෙනු ලබන තොරතුරු මත පදනම්ව මෙම වර්ගීකරණය සිදු කළ යුතු වේ.

8.1 සිතා මතා ණය ගෙවීම පැහැර හරින්නන්

ණය ගනුදෙනුකරුවාට සරු අස්වැන්නක් ලැබුණ ද, සහභාගීත්ව මූල්‍ය ආයතනය වෙත සිය වගකීම් සම්පූර්ණ කිරීම සඳහා අපොහොසත් වී ඇති බව පවතින තොරතුරු මත ශාඛාවේ නිළධාරියා/ ක්ෂේත්‍ර නිළධාරියා විසින් නිරීක්ෂණය කර ඇති අවස්ථාවන්හී දී, එවැනි ණය ගනුදෙනුකරුවන් සිතා මතා ණය ගෙවීම පැහැර හරින්නන් ලෙස වර්ගීකරණය කළ හැක.

8.2 සිතා මතා නොවන ණය ගෙවීම පැහැර හරින්නන්

ණය ගනුදෙනුකරුගේ පාලනයෙන් තොර ගංවතුර, නියඟ හෝ කෘමීන් හෝ වෙනත් නිශ්චිත හේතුවක් ආදී වූ ස්වාභාවික ව්‍යසන තත්ත්වයක් හේතුවෙන් ණය ගනුදෙනුකරු සහභාගීත්ව මූල්‍ය ආයතනය වෙත සිය වගකීම් ඉටු කිරීමට අපොහොසත් වී ඇති අවස්ථාවකදී සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එය අනුමත කළේ නම්, එවැනි ණය ගනුදෙනුකරුවන් සිතා මතා නොවන ණය ගෙවීම පැහැර හරින්නන් ලෙස වර්ගීකරණය කළ හැක.

9. ණය ආපසු අයකර ගැනීම

9.1 9.2, 9.3 සහ 9.4 යන වගන්ති වල දක්වා ඇති පරිදි මෙම කාණ්ඩ දෙකෙහි ණය ආපසු අය කර ගැනීම සඳහා වූ ක්‍රියාපටිපාටිය.

9.1.1 නිත්‍යානුකූල ක්‍රියාමාර්ග මඟින් පැහැර හරින්නන්ගෙන් ණය මුදල් අය කර ගැනීමට වහාම ක්‍රියාමාර්ග ගත යුතුය. ගත හැකි නෛතික ක්‍රියාමාර්ග මාලාවක් 10 වන වගන්තියෙහි දක්වා ඇත.

9.2 සිතා මතා ණය පැහැර නොහරින්නන් සම්බන්ධව ගත් කල, සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ණය ගැනුම්කරු සමඟ පෞද්ගලික සබඳතා ඇති කරගත යුතු අතර, ණය ගැනුම්කරු වෙත මෙහෙයුම් උපදෙස් හි 14 වන වගන්තියෙහි සඳහන් පරිදි ණය ප්‍රතිලේඛනගත කිරීමේ පහසුකම ලබා දෙමින්, එම ණය ගැනුම්කරු විසින් ණය මුදල් සම්පූර්ණයෙන් පියවන තෙක් ක්‍රමිකව ඔහු පිළිබඳ පසු විපරම් කළ යුතුය.

9.3 සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් සියලු හැකි ආකාරවලින් ඕනෑම හිඟ ණය මුදලක් අය කර ගැනීම සඳහා කඩිනම් සහ ඵලදායී ක්‍රියා මාර්ග ගනු ඇතැයි අපේක්ෂා කෙරේ. හිමිකමක් යොමු කිරීමෙන් පසුව සහ ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ණය ඇපකරයක් ලැබීමෙන් පසුවත් ණය ආපසු අය කර ගැනීමේ දී සහභාගීත්ව මූල්‍ය ආයතන සක්‍රීයව කටයුතු කරනු ඇතැයි ශ්‍රී ලංකා මහ බැංකුව අපේක්ෂා කෙරේ. එබැවින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් යෝජනා කරනු ලබන ඕනෑම ක්‍රියාමාර්ගයක් ගැනීමට සහභාගීත්ව මූල්‍ය ආයතන බැඳී සිටියි.

9.4 ණය මුදලක් හිඟ වී ඇත්නම්, ණය මුදල කඩිනමින් ආපසු ගෙවීම සඳහා ණය ගනුදෙනුකරු පෙළඹවීමේ අරමුණින් කඩිනම් ණය ආපසු අයකර ගැනීමේ පියවර සහභාගීත්ව මූල්‍ය ආයතනයේ ශාඛා කළමනාකරු විසින් ගත යුතු වේ. යෝජනා ක්‍රමය යටතේ අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග පහත පරිදි වේ.

(i) ණය නොගෙවීම සම්බන්ධයෙන් හේතු සොයා බැලීම සඳහා ණය ගනුදෙනුකරු හමුවීමට යෑම (අවම වශයෙන් දෙවරක්) සහ ගෙවිය යුතු මුදල ගෙවීමට පෙළඹවීම.

(ii) ණය ගනුදෙනුකරු විසින් මුහුණ දෙන ගැටලු හඳුනා ගෙන පරීක්ෂා කර එවැනි ගැටලුවලින් මිදීම සඳහා ඔහු විසින් අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග ණය ගනුදෙනුකරුට නිර්දේශ කිරීම.

(iii) සලකා බැලෙන දුෂ්කරතා සද්භාවයෙන් යුත් ඒවා සහ ගොවියාට පාලනය කළ නොහැකි නම්, එම ණය මුදල ප්‍රතිලේඛන ගත කිරීම සහ ණය ගැනුම්කරුවාගේ ආදායම් ස්වරූපය සලකා බලමින් නව ණය ආපසු ගෙවීමේ සැලැස්මක් ණය ගැනුම්කරු වෙත ලබා දීම සිදු කළ යුතුය;

(iv) හිතා මතා ණය පැහැර හරින ලද ණය ගැනුම්කරුවෙකු සම්බන්ධව, ණය ගැනුම්කරු සහ ඇපකරුවන් හට ඉල්ලුම් නෝට්ටුවක් නිකුත් කළ යුතුය.

(v) ණයවලින් ලත් මුදල් අවභාවිත කර ඇති බවට පෙනී ගිය විට, ඒ හා සමඟ ඉල්ලුම් නෝට්ටුවක් නිකුත් කළ යුතු අතර, එවැනි ණය ගැනුම්කරුවන්ට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගැනීමට වහාම ක්‍රියාමාර්ග ගත යුතුය.

10. නෛතික ක්‍රියාමාර්ග

10.1 9.3 වගන්තියෙහි සඳහන් කරන ලද ණය ආපසු අය කර ගැනීමේ ක්‍රියාමාර්ගවලින් අනතුරුව ද සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ණය පැහැර හරින්නන්ගෙන් අය විය යුතු මුදල් ලබා ගැනීමට අපොහොසත් වන්නේ නම්, එවැනි සිද්ධීන් හිදී පළමු වාරිකය අය විය යුතු දිනයේ සිට මාස 6-9ත් ඇතුලත සමථ මණ්ඩලයකට යොමු කළ යුතුය.

10.2 ණය පැහැර හරින්නන් පියවීමකට එකඟ නොවන විට, සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් හිඟ පළමු වාරිකය අය විය යුතු දිනයේ සිට මාස 9-12 ත් අතර කාලය තුළ අධිකරණයක් තුළ එවැනි ණය පැහැර හරින්නන්ට එරෙහිව නඩු ගොනු කළ යුතුය.

11. **ණය ඇප ආවරණ පියවීම්**

ඇමුණුම I හී දක්වා ඇති අරමුණු සඳහා ලබා දී ඇති ණය වෙනුවෙන් ණය යෝජනා ක්‍රමය යටතේ සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදල් නීති පනතේ 108(අ) වගන්තිය (422 පරිච්ඡේදය) යටතේ ණය ඇප ආවරණ ලබාදෙනු ඇත. අපේක්ෂිත ණය වාරික ආපසු නොගෙවීම හේතුවෙන් පැන නැගෙන ද්‍රවශීලතා හිඟයන් මඟ හරවා ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ණය ඇප ආවරණ ලබා දෙන අතර, ණය පැහැර ඇති තැනැත්තන්ගෙන් ලැබිය යුතු මුදල ආපසු ලබා ගැනීමෙන් පසු, සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් අදාළ ණය ඇප ආවරණ පියවීම් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ප්‍රේෂණය කළ යුතු වේ.

11.1 ණය වාරික එකතු කිරීම, රජයේ දායක මුදල් ලබාගැනීම, අතිරික්ත අරමුදල් ආයෝජනය, ඇප ආවරණ හිමිකම් ගෙවීම් කිරීම සහ හිමිකම් පියවීමෙන් පසු ආපසු ගෙවීම් සඳහා සිහි කැඳවීම් ආදිය සඳහා ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත අධිකාරිය හිමි වී ඇත.

11.2 සුදුසුකම් ලබන ණය

මෙම ණය යෝජනා ක්‍රමයේ අරමුණු සඳහා, ණය යෝජනා ක්‍රමය යටතේ ලබාදෙන ලද සියලුම ණය, ඇප ආවරණ සඳහා සුදුසුකම් ලබයි. මෙම යෝජනා ක්‍රමය යටතේ ඇප ආවරණයක් අපේක්ෂා කර හැක්කේ,

11.2.1 ඇමුණුම I හී දක්වා ඇති අරමුණු සඳහා ලබා දී ඇත;

11.2.2 ණය මුදල් ඇමුණුම II හී දක්වා ඇති මුදල් පරිමාණයන් තුළ විය යුතුය;

11.2.3 දී ඇති කාල සීමාව තුළ වාරික ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ගෙවා තිබෙන;

ණය මුදල් සඳහා වේ.

11.3 ඇප ආවරණ සඳහා නුසුදුසුකම්

11.3.1 සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් රක්ෂණ ආවරණ ඇතුළුව රජයෙන් හෝ ඕනෑම රජයේ ආයතනයකින් ඇප ආවරණයක් ලබා ගෙන ඇති ඕනෑම ණය මුදල්.

11.3.2 දී ඇති කාල සීමාව තුළ ණය ඇප ආවරණ වාරිකය ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ගෙවා නොමැති ණය මුදල්.

11.4 ඇප ආවරණ දීර්ඝ කිරීම.

11.4.1 අලාභයක් ලෙස නොපියවූ ප්‍රාග්ධනයෙන් සියයට 60ක් හෝ ඇප ලබා දෙන ලද ප්‍රමාණයෙන් අඩු අගයක් ගන්නා ප්‍රමාණය මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ඇප ආවරණයක් ලෙස ලබාදෙනු ලබයි. වාරික දෙකකින් ණය ඇප ආවරණ හිමිකම් ගෙවීම කරනු ලබයි.

11.4.2 අයදුම්පත ලැබීමෙන් පසුව හිමිකමින් සියයට 75ක් වන පළමු වාරිකය ගෙවනු ලබන අතර, ගෙවීම පැහැර ඇති ණය ගනුදෙනුකරුට එරෙහිව සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් නීතිමය පියවර ගෙන ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත නඩු අංක දැනුම් දීමෙන් පසුව ඉතිරි සියයට 25 ගෙවීම කරනු ලබයි.

11.5 ණය ඇප වාරිකය

11.5.1 යෝජනා ක්‍රමය යටතේ සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් මුදාහරින ලද සෑම වගාකිරීමේ ණය මුදලක් සඳහා ම සියයට භාගයක (½) අනුපාතයකට ශ්‍රී ලංකා මහ බැංකුව වෙත වාරිකය ගෙවිය යුතු අතර ඇප ආවරණය සඳහා වෙනම අයදුම්පතක් නොමැති වේ. එබැවින් පොලී සහනාධාරය සඳහා අයදුම්පත සමඟ වාරිකය ගෙවිය යුතු අතර, ඇමුණුම II හී දක්වා ඇති මුදල් ප්‍රමාණයන් අනුව, යෝජනා ක්‍රමය යටතේ සුදුසුකම් ලබන මුළු ණය ප්‍රමාණය මත එය ගණනය කළ යුතු වේ.

11.5.2 අදාළ ප්‍රධාන කාර්යාලය හරහා අදාළ කාලය සඳහා වන වාරිකය සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ගෙවිය යුතු වේ. නියම කරන ලද කාල සීමාව තුළ පොලී සහනාධාර අයදුම්පතේ මෘදු සහ දෘඩ පිටපත් සමඟ 'අධ්‍යක්ෂ, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව' යන ආදායකයාගේ නමින් චෙක්පතක් ලෙස හෝ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ බැංකු ගිණුම් අංක 2-50519 වෙත තත්කාලීන දළ පියවුම් පද්ධතිය හරහා වාරිකය ප්‍රේෂණය කළ යුතු වේ. කෙසේ වුවද, වාරිකවලින් තොරව යොමු කරනු ලබන පොළි සහනාධාර අයදුම්පත් පොලී සහනාධාර සඳහා හිමිකම් කීමට හෝ යෝජනා ක්‍රමය යටතේ ඇප ආවරණ සඳහා සුදුසුකම් නොලබයි.

11.5.3 ණය ඇප ආවරණය සඳහා වන වාරිකය සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් දැරිය යුතු අතර, ණය ගනුදෙනුකරු වෙත යොමු නොකළ යුතු වේ.

11.5.4 චෙක්පත වලංගු වූ පසු හෝ තත්කාලීන දළ පියවුම් පද්ධතිය හරහා සිදු කළ ගෙවීම අනුමත වූ පසු ඇප ආවරණය වලංගු වනු ඇත. යොමු කරනු ලබන සෑම අයදුම්පත් කාණ්ඩය සඳහා ම වෙන වෙනම ඇප ආවරණ සටහනක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් යොමු කරනු නොලැබේ.

11.6 හිමිකම්

11.6.1 මෙම ඇප ආවරණයේ අරමුණ සඳහා දක්වා ඇති පරිදි කිසියම් මුදලක අලාභයක් සිදු වුවහොත්, ඇමුණුම VI (RDD/NCRCS/CG/1) හී දක්වා ඇති පෝරමය භාවිත කරමින් සහභාගීත්ව මූල්‍ය ආයතනයේ ප්‍රධාන කාර්යාලය මඟින් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත හිමිකම් අයදුම්පතක් යොමු කළ යුතු වේ. කාල සටහනේ දක්වා ඇති අයුරින් සියලුම සහභාගීත්ව මූල්‍ය ආයතනයන්හී ප්‍රධාන කාර්යාලයන්ට ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් මෙම පෝරම යවනු ඇත.

11.6.2 පහත සඳහන් පියවර සම්පූර්ණ කිරීමෙන් පසු යෝජනා ක්‍රමය යටතේ ණය මුදලක් අලාභ ලෙස සැලකේ;

(අ) ණය මුදල ආපසු ගෙවීම සඳහා ණය ගනුදෙනුකරු පෙළඹවීම සඳහා ණය ගනුදෙනුකරු මුණ ගැසීම, ඇප සඳහා අත්සන් තබන ලද ඇපකරුවන්ගේ සහය ලබා ගැනීම සහ ඉල්ලුම් නෝට්ටුවක් නිකුත් කිරීමෙන් පසුව ආදී වූ ණය මුදල ආපසු ලබා ගැනීම සඳහා වන සියලුම මාර්ග හරහා සහභාගීත්ව මූල්‍ය ආයතන කටයුතු කිරීමෙන් පසුව, ණය මුදල අලාභයක් ලෙස සැලකේ. ශ්‍රී ලංකා මහ බැංකුව වෙත හිමිකමක් යොමු කිරීමට පෙර, අවම වශයෙන් ණය ගනුදෙනුකරු දෙවරක් හෝ මුණ ගැසී තිබිය යුතු වේ. යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ නිළධාරීන් සහභාගීත්ව මූල්‍ය ආයතන අධීක්ෂණය කිරීම සඳහා පැමිණෙන විට එවැනි මුණ ගැසීම් පිළිබඳව වාර්තා තබා ගත යුතු වේ. අදාළ වන සේ, ණය ගනුදෙනුකරු සහ ඇපකරුවන් සඳහා ඉල්ලුම් නෝට්ටුව සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් යොමු කළ යුතු වේ.

(ආ) ඉහත 11.6.2 සඳහන් කරන ලද පියවර තුළින් සැලකිය යුතු ප්‍රගතියක් සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් නිරීක්ෂණය කළේ නම්, සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් 10.1 වගන්තියෙහි සඳහන් අයුරින් එවැනි අවස්ථා සමථ මණ්ඩලයට වාර්තා කිරීම අවශ්‍ය වේ.

11.6.3 එබැවින්, සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ඉහත සඳහන් පියවර අනුගමනය කළ යුතු අතර, නියම කරන ලද කාල සීමාව තුළ සුදුසු නීතිමය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කළ යුතු වන අතර, එවිට ඇමුණුම VI (RDD/NCRCS/CG/1) අනුව පළමු වාරිකය සඳහා ණය ඇප ආවරණ අයදුම්පත යොමු කරනු ලබන දිනය වන විට, ණය පැහැර හරින ලද ණය ගනුදෙනුකරුවන් සමථ මණ්ඩලය වෙත යොමු කර තිබිය යුතුවේ.

11.6.4 ශ්‍රී ලංකා මහ බැංකුවේ පූර්ව අනුමැතියෙන් තොරව, ඕනෑම තත්ත්වයක් යටතේ වුවද ණය ඇප ආවරණය ගෙවා ඇති ණය කපා හැරීමට සහභාගීත්ව මූල්‍ය ආයතනයන්ට අධිකාරීත්වයක් නොමැත. ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ඇප ආවරණ හිමිකම් ලැබීමෙන් පසුව වුවද, ණය ආපසු ලබා ගැනීම සඳහා සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් සියලුම සාධාරණ පියවර ගත යුතු වේ.

11.6.5 ප්‍රතිව්‍යුහගත කළ ණය මුදලක් සම්බන්ධයෙන් සහ ප්‍රතිව්‍යුහගත කළ ණය මුදල හා සම්බන්ධ වගකීම් සම්පූර්ණ කිරීමට ණය ගනුදෙනුකරු අපොහොසත් වන අවස්ථාවක දී, ණය මුදල අලාභයක් ලෙස සළකා හිමිකමක් යොමු කිරීමට පෙර, 11.6.2 වගන්තියේ සඳහන් පියවර අනුගමනය කළ යුතු වේ.

11.6.6 RDD/NCRCS/CG/1 දරන හිමිකම් පෝරමය ලැබීමෙන් පසුව, අවශ්‍ය පරිදි අදාළ අධීක්ෂණ කටයුතු සිදු කිරීමට සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් අපොහොසත් වී ඇති බවට පසුව අනාවරණය වුවහොත් හෝ සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් ලැබිය යුතු මුදල පසුව අයකර එය ශ්‍රී ලංකා මහ බැංකුව වෙත දැනුම් දීමෙන් වැලකී සිටිය හොත්, නැවත කැඳවීමේ අයිතියට යටත්ව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ වගකීමෙන් සියයට 75ක් ගෙවනු ලැබේ.

11.6.7 අධිකරණ ක්‍රියාමාර්ග මඟින් ජනනය වන නඩු අංක සමග RDD/NCRCS/CG/2 (ඇමුණුම VII) පෝරම සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යොමු කිරීමෙන් පසුව, හිමිකමේ ඉතිරි සියයට 25 ගෙවීම් කරනු ඇත. ඉහත 11.6.6 හී සඳහන් පළමු ගෙවීමෙන් මාස 6ක් ඇතුළත, සියලුම සහභාගීත්ව මූල්‍ය ආයතනයන්ගේ ප්‍රධාන කාර්යාල වෙත මේ සඳහා නිර්දේශිත පෝරමය (RDD/NCRCS/CG/2) ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් යවනු ලබන අතර අධිකරණ ක්‍රියාමාර්ග මඟින් ජනනය වන නඩු අංක සමග ඉතිරි හිමිකම් ඉල්ලීම් සමඟින් ඉදිරිපත් කරන ලෙස සහභාගීත්ව මූල්‍ය ආයතන වෙතින් ඉල්ලා සිටියි.

11.6.8 සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් දෙවැනි වාරිකය සඳහා RDD/NCRCS/CG/2 පෝරමය සමග නඩු අංක යොමු නොකළේ නම්, පළමු වාරිකය ලෙස ඇප ආවරණයේ ගෙවන ලද ඕනෑම ප්‍රමාණයක් නැවත කැඳවීමට අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතුවේ.

11.7 අලාභය සහ හිමිකම් ගණනය කිරීම.

11.4.1 අලාභයේ ප්‍රමාණය ගණනය කිරීමේ අරමුණ සඳහා 11.4.1 වගන්තියේ විස්තර කර ඇති පරිදි හිඟ ප්‍රාග්ධනය සැලකිල්ලට ගනු ඇත.

12. සහභාගීත්ව මූල්‍ය ආයතනවල භූමිකාවන් සහ කාර්යභාරයන්

සහභාගීත්ව මූල්‍ය ආයතන මෙම යෝජනා ක්‍රමය සඳහා සුදුසුකම් ලැබීමට පහත දක්වා ඇති භූමිකාවන් සහ කාර්යයන් සිදු කළ යුතුය;

12.1 මෙම ණය යෝජනා ක්‍රමයේ නියමයන් සහ කොන්දේසිවලට අනුකූල වෙමින්, සහභාගීත්ව මූල්‍ය ආයතනයේ ස්වකීය අරමුදල් භාවිත කරමින් ණය පහසුකම් ලබා දීම.

12.2 ඇමුණුම I හි දී ඇති අරමුණු සඳහා පමණක් ණය ලබා දීම.

12.3 මෙම මෙහෙයුම් උපදෙස් හි දක්වා ඇති පොලී අනුපාතිකයක් (වර්තමානයේ දී වර්ෂයකට සියයට 4ක්) ණය ගැනුම්කරුවන් ගෙන් අය කිරීම

12.4 ණය ප්‍රදානය කිරීම සලකා බැලීම සඳහා මෙම ණය යෝජනා ක්‍රමය යටතේ සුදුසුකම්ලත් ණය ගැනුම්කරුවන් ලෙස සැබෑ ගොවීන් හඳුනාගැනීමේ වගකීම සහභාගිත්ව මූල්‍ය ආයතන වෙත පැවරෙන අතර, සහභාගීත්ව මූල්‍ය ආයතනවල ශාඛා කළමනාකරුවන් විසින් ක්ෂේත්‍ර නිලධාරීවරුන් මඟින් අදාළ ණය ගැනුම්කරු සැබෑ ගොවියෙකු ද නැද්ද යන වග තහවුරු කරමින්, තහවුරු කිරීමක් ලබා ගත යුතුය.

12.5 සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ණය මුදලක් ලබා දීමේ දී භූමියක යෝග්‍යතාව, ජලය තිබීම, කෘෂිකාර්මික විභවතාව යනාදී වගා කිරීම සඳහා අවශ්‍ය වන සම්පත් තිබීම සහ ණය ගැනුම්කරුගේ ණය ආපසු ගෙවීමේ හැකියාව ආදිය තහවුරු කරගත යුතුවේ.

12.6 සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ණය ගැනුම්කරුගෙන් ඉල්ලුම් පොරොන්දු නෝට්ටුක් ලබා ගැනීම, අදාළ අවස්ථාවන් හි දී වගා රක්ෂණ ප්‍රතිපත්තියක් පැවරීම සහ ණය පැහැර නොහරින ලද වෙනත් ගොවීන් දෙදෙනෙකුගේ අන්‍යෝන්‍ය ඇපකරයක් ලබා ගැනීම සිදු කළ යුතුය.

12.7 ණය ගැනුම්කරුගේ කෘෂිකාර්මික මෙහෙයුම්වල විවිධ අදියර තුළ පවත්නා අවශ්‍යතා සමඟ සමපාත වන පරිදි, ණය මුදලක් මුදා හැරීම අදියරවලින් සිදු විය යුතුය. ණය මුදල් එම ආකාරයෙන් වාරික තුනක් හෝ ඊට වැඩි ගණනකින් ලබා දිය යුතු අතර, එක් එක් වාරිකය ඊට පෙර වාරිකයන් ඒ සඳහා භාවිත කළ බව සත්‍යාපනය කිරීමෙන් අනතුරුව මුදා හැරිය යුතුය.

12.8 සහභාගීත්ව මූල්‍ය ආයතන පහත දෑ සඳහා වගකිව යුතුය.

12.8.1 දී ඇති කාලය තුළ ශ්‍රී ලංකා මහ බැංකුව වෙත වාරිකය ගෙවීමට.

12.8.2 පොලී සහනාධාර, ණය ඇපකර සහ පශ්චාත් හිමිකම් ආශ්‍රිත අවශ්‍ය දත්ත සහ තොරතුරු ලබා දීම, අදාළ ආකෘතිවලින් පශ්චාත් හිමිකම් ආපසු අය කර ගැනීම් අවසාන දිනට හෝ ඊට ප්‍රථම අදාළ ප්‍රධාන කාර්යාල මඟින් ප්‍රේෂණය කිරීම. ඇමුණුම III හි අමුණා ඇති කාල කාර්ය දර්ශකයේ එවැනි තොරතුරු යොමු කිරීම සඳහා නියමිත කාලය සඳහන් කර ඇත.

12.9 පොලී සහනාධාර අයදුම්පත්, ණය ඇපකර අයදුම්පත් සහ අවසාන දිනවලින් පසු සිදු කළ වාරික ගෙවීම් ස්වයංක්‍රීයව ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

12.10 සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ණය ගැනුම්කරුවන් සඳහා ලබා දුන් ණය සඳහා පූර්ව සහ පශ්චාත් සුපරීක්ෂණ කටයුතු සිදු කළ යුතුය.

12.10.1 ණය ගැනුම්කරුවන් වෙත ණය මුදල් ලබා දීමේ දී නිසි සැලකිල්ලෙන් සහ විචක්ෂණභාවයෙන් කටයුතු කිරීම සහ එම ණය ලබා දුන් අරමුණ සඳහා ඒවා භාවිත කර ඇති ද යන වග තහවුරු කිරීමට සාධාරණ පියවර ගැනීම;

12.10.2 අය විය යුතු මුදල් ආපසු ලබා ගැනීමට ගත හැකි සියලු ආකාර සහ ක්‍රමවේද ගැනීම සහභාගීත්ව මූල්‍ය ආයතන අස්වැනු නෙළන කාලයේ දී ආපසු අය කර ගැනීමේ ක්‍රියාමාර්ග ගත යුතු බවට උපදෙස් ලබා දීම;

යනාදිය සහභාගීත්ව මූල්‍ය ආයතනයේ වගකීමකි.

12.11 සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ණය ලබා දීමේ දී නිසි සුපරීක්ෂණය, සැලකිල්ල සහ විචක්ෂණභාවය තහවුරු කිරීමට ප්‍රමාණවත් පියවර ගැනීමේ දී එය හිතාමතා නොසලකා ඇති බවට සාක්ෂි ඇතිවිටද, ව්‍යාජ ණය මුදල්, ණය ගැනුම්කරුවන් විසින් ණය මුදල් අවභාවිත කිරීම හෝ සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් මුදා හළ ණය මුදලෙහි සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් විෂමාචාර ක්‍රියාවක් සිදු කර ඇති බවට සාක්ෂි ඇත්නම්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වගකීම ප්‍රතික්ෂේප කරනු ඇති අතර, හිමිකමක් පිළිගෙන ඇති විටෙක දී, සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත සිදු කළ හිමිකමක් පෑමක් මත ගෙවන ලද ඕනෑම මුදලක් ආපසු කැඳවීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතු වන්නේ ය.

13. ශ්‍රී ලංකා මහ බැංකුවේ වගකීම්

ණය යෝජනා ක්‍රමය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව තම ධාරිතාව තුළ පහත සඳහන් කාර්යයන් ඉටු කරනු ලබයි;

13.1 ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ණය යෝජනා ක්‍රමයේ අධීක්ෂණය සහ ඇගයීම් ක්‍රියාවලිය සිදු කරනු ලබන අතර, අවශ්‍ය වූ විට අවශ්‍ය වන ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගද ක්‍රියාත්මක කිරීම කරනු ඇත.

13.2 ක්ෂේත්‍ර පරීක්ෂා සිදු කිරීම, සහභාගීත්ව මූල්‍ය ආයතනයන්ට පිවිස ලෙජර් සහ පොත් ආදිය පරීක්ෂා කිරීම සහ අවශ්‍ය වන අවස්ථාවන්හී දී වෙනත් ඕනෑම අධීක්ෂණ ක්‍රියාවක් සිදු කිරීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතු වේ.

13.3 ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වත්මන් වර්ෂය සඳහා පොලී සහනාධාර සහ ණය ඇපකර ගෙවීම් සඳහා අයවැය ප්‍රතිපාදන පුරෝකතනය කර ශ්‍රී ලංකා රජය වෙත යොමු කරනු ඇත.

13.4 ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සහභාගීත්ව මූල්‍ය ආයතන සඳහා ගෙවිය යුතු පොලී සහනාධාර ගණනය කර නිර්දේශ කිරීමෙන් පසුව, ශ්‍රී ලංකා රජය වෙත එම තොරතුරු යොමු කරනු ලබයි.

13.5 ශ්‍රී ලංකා රජයේ අරමුදල් ලබාගැනීමට යටත්ව, සිතාමතා ණය ගෙවීම පැහැර හරිනු ලබන ණය ගනුදෙනුකරුවන් වෙනුවෙන් සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ණය ඇප ආවරණයක් ලබා දෙනු ලබයි.

13.6 එක් බෝගයකට වඩා එක් ගොවි ණය ගැනුම්කරුවෙකුට ණය ලබා දුන් පසු, සුදුසුකම් ලබන උපරිම ණය මුදල තීරණය කිරීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතු වේ.

13.7 මෙහෙයුම් උපදෙස්, මුදල් පරිමාණ සහ වෙනත් කිසියම් තොරතුරක වෙනසක් වූ විට, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අදාළ තොරතුරු සහභාගීත්ව මූල්‍ය ආයතනයේ ප්‍රධාන කාර්යාලයට සන්නිවේදනය කරනු ඇත.

14 සිතා මතා නොවන ණය පැහැර හරින්නන්ගේ ණය මුදල් ප්‍රතිලේඛනගත කිරීම

14.1 ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හඳුන්වා දෙන ලද ප්‍රතිලේඛනගත කිරීමේ වැඩසටහනට අනුව, ගංවතුර, නියඟය, කෘමි උවදුරු සහ ස්වභාවික උවදුරු හා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිළිගනු ලබන වෙනත් හේතූන් මත පාලනය කළ නොහැකි සාධක හේතුවෙන් හෝ අසාර්ථක වී ණය ගැනුම්කරුවන් වෙත ලබා දුන් ණය මුදල්වලට අදාළව අය විය යුතු ණය ප්‍රතිලේඛන ගත කිරීමේ පහසුකම සහභාගීත්ව මූල්‍ය ආයතනවලට පවතී. බලපෑමට ලක් වූ ප්‍රදේශය සහ භෝගවලට සිදුවූ හානිය හෝ අපේක්ෂිත අස්වැන්න තීරණය කිරීම සහ තක්සේරු කිරීම අදාළ ප්‍රදේශය තුළ පිහිටු වනු ලැබූ කමිටුවක් මඟින් සිදු කළ යුතුය.

14.2 එක් එක් දිස්ත්‍රික්කය තුළ ණය ප්‍රතිලේඛනගත කිරීම පිළිබඳව තීරණය කිරීම සඳහා වගකිව යුතු කමිටුව පහත සඳහන් නිලධාරීන් ගෙන් සමන්විත වේ;

(අ) ප්‍රදේශ කළමනාකරු - ලංකා බැංකුව

(ආ) ප්‍රාදේශීය කළමනාකරු - මහජන බැංකුව

(ඇ) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - ප්‍රාදේශීය සංවර්ධන බැංකුව

(ඈ) වෙනත් සහභාගීත්ව මූල්‍ය ආයතන නියෝජනය කරන ජ්‍යෙෂ්ඨ නිලධාරී - බලපෑමට ලක් වූ ප්‍රදේශය තුළ විශාල පරිමාණයක ණය මුදල් ලබා දී ඇති සහභාගීත්ව මූල්‍ය ආයතනවලින් (ඉහත ත්‍රිත්වය හැරුණු කොට)

(ඉ) අදාළ පළාතෙහි පළාත් කළමනාකරු - ශ්‍රී ලංකා මහ බැංකුව

(ඊ) රක්ෂණ මණ්ඩලයේ බලයලත් නිලධාරී

තවද, අදාළ කෘෂිකාර්මික නිලධාරීන් ගෙන් හෝ වෙනත් ඕනෑම නිලධාරියෙකු ගෙන් නිර්දේශ ලබා ගැනීමේ අධිකාරය කමිටුව සතු වේ. කමිටුව විසින් අදාළ බෝගයට නැතහොත් අපේක්ෂිත අස්වැන්නට සිදු ව ඇති හානියේ ප්‍රමාණය තීරණය කරනු ඇති අතර, ශ්‍රී ලංකා මහ බැංකුව වෙත එය වාර්තා කරනු ඇත. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කමිටුවෙහි සොයා ගැනීම් අවසානය ලෙස පිළිගනු ලැබේ.

14.3 14.2 වගන්තියේ දක්වා ඇති අදාළ කමිටුව මඟින් බලපෑමට ලක්වූ ණය ගැනුම්කරුවන්ට ප්‍රතිලේඛනගත කිරීමේ පහසුකම භාවිතා කිරීමට මෙන්ම, ගොවියෙකුට නව ණය මුදල් ලබා ගැනීම සඳහා එවැනි සාධක මඟින් බලපෑමට පත් ප්‍රදේශ තීරණය කිරීමේ කාර්යය උපරිම ව්‍යාපෘති කාලයක් තුළ සම්පූර්ණ කිරීමට අපේක්ෂා කෙරේ.

14.4 ණය ප්‍රතිලේඛනගත කිරීමේදී, සම්පූර්ණයෙන්ම බෝගය හානිවී ඇත්ද නැතහොත් ණය ගැනුම්කරු විසින් ගෙවිය යුතු සියයට 10ක මූලික ගෙවීමේ අවශ්‍යතාවය ලිහිල් කිරීමට ප්‍රමාණවත් විශාලත්වයකින් යුතුද යන්න කමිටුව විසින් තීරණය කළ යුතුය.

14.5 ඉහත 14.1 වගන්තියේ සඳහන් කර ඇති පරිදි සිතාමතා නොවන ණය පැහැර හරින්නෙකු ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිළිගෙන ඇති ණය ගැනුම්කරුවෙකු පහත දක්වා ඇති සහන සඳහා සුදුසුකම් ලබයි;

(අ) ඉහත 14.4 ට යටත්ව සලකා බැලෙන ණය ගැනුම්කරු විසින් සහභාගීත්ව මූල්‍ය ආයතනය වෙත ණය මුදලෙන් අවමය 10% ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් තැන්පත් කළ යුතුය.

(ආ) පහත 14.6 කොටසෙහි විස්තර කර ඇති ආකාරයට සාර්ථක වගා කන්න 4ක් පුරා හෝ මාස 36ක් පුරා හිඟ ණය සඳහා ණය ප්‍රතිලේඛන ගත කිරීමේ පහසුකම

(ඇ) ණය ගැනුම්කරුගේ ණය ආපසු ගෙවීමේ හැකියාව සලකා බලා ඉදිරි කන්නය සඳහා නැවුම් වගා ණයක් ලබා ගැනීම.

(ඈ) අය විය යුතු ණය මත කිසිදු දඩ පොලී අනුපාතිකයක් අය නොකිරීම

(ඉ) මෙම මෙහෙයුම් උපදෙස් හි තීරණය කර ඇති පොලී අනුපාතිකය ප්‍රතිලේඛනගත කළ ණය සඳහා ගැනුම්කරුවන් ගෙන් අය කර ගත යුතුය.

14.6 ඉහත සඳහන් නියමයන් සහ කොන්දේසිවලට අනුව, ප්‍රතිලේඛන ගත කරන ලද ණය සම්බන්ධයෙන් පොලී සහනාධාර සඳහා වන අයදුම්පත් RDD/NCRCS/RES/1 (ඇමුණුම VIII) ආකෘතියට අදාලව සකස් කළ යුතුය. සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් මාස 36ක කාලයක් ආවරණය වන පරිදි ප්‍රතිලේඛනගත කරන ලද ණය සඳහා අදාල ගැනුම්කරුගෙන් ඉල්ලූම්

පොරොන්දු නෝට්ටුවක් ලබා ගත යුතු වේ.

14.7 හිඟ ණය සාර්ථක වගා කන්න 4ක කාලයක් සඳහා හෝ මාස 36ක කාලයක් සඳහා ප්‍රතිලේඛනගත කළ යුතුය. එවැනි ප්‍රතිලේඛනගත කළ පහසුකම සඳහා ගෙවිය යුතු පොලී සහනාධාර අනුපාතිකය ශ්‍රී ලංකා රජය විසින් පවතින පොලී අනුපාතිකය වේ.

14.8 ප්‍රතිලේඛනගත ණයවලට අදාළව සාර්ථක වගා කාලයක් තුළ සිදු කළ ණය ආපසු අය කර ගැනීම් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත වාර්තා කළ යුතුය. ණය ගැනුම්කරුවෙකු විසින් මාස 36ක කාලයක් ගත වී යාමට පෙර ප්‍රතිලේඛනගත ණය සම්පූර්ණයෙන් ම ගෙවනු ලබන්නේ නම්, එවැනි ආපසු අය කර ගැනීම් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත වාර්තා කළ යුතුය.

14.9 ණය මුදල ප්‍රතිලේඛනගත කිරීමෙන් අනතුරුව ණය වාරික ක්‍රමිකව ආපසු ගෙවනු ලබන්නේ නම්, අදාළ වගා කන්නය අවසානයේ දී නොපියවන ලද ණය ශේෂය අංක RDD/NCRCS/RES/1 දරන පෝරමයේ 5 වන තීරුවෙහි දැක්විය යුතුය.

නිදසුන: ප්‍රතිලේඛනගත කරන ලද ණය මුදල රු.10,000/ වන්නේ නම්,
පළමු කන්නය අවසානයේ දී නොපිය වූ ණය ශේෂය රු.7,500/ ක් ද,
දෙවන කන්නය අවසානයේ දී නොපිය වූ ණය ශේෂය රු.5,000/ක් ද,
තෙවන කන්නය අවසානයේ දී නොපිය වූ ණය ශේෂය රු.2,500/ ක් ද වනු ඇත.

14.10 ප්‍රතිලේඛනගත කළ ණය වල ප්‍රතිලාභ ණය ගැනුම්කරුවන් වෙත ලබානොදී ප්‍රතිලේඛනගත කිරීමේ පහසුකම යටතේ ලබා ගත හැකි ප්‍රතිලාභ සඳහා අයදුම්පත් යොමු නොකරන මෙන් සහභාගීත්ව මූල්‍ය ආයතනවලට දැඩිව අවවාද කෙරේ.

14.11 ප්‍රතිලේඛනගත කළ ණයවලට අදාළව පොලී සහනාධාර ගෙවීම් පහත පරිදි සිදු කෙරෙනු ඇත;

(අ) පොලී සහනාධාර ගෙවීම සෑම වගා කන්නයක් අවසානයේ දී ම ගෙවිය යුතු අගය අඩු කිරීමෙන් පසුව ඉතිරිව පවතින ශේෂය හෝ ණය වාරිකය අඩු කිරීමෙන් පසු ඉතිරි වී ඇති ශේෂය යන දෙකෙන් අඩු අගයට පොලි සහනාධාර ගෙවනු ලබයි.

(ආ) ප්‍රතිලේඛනගත ණය මුදලට අදාළව පොලී සහනාධාර ගෙවීම් මාස 36ක උපරිම කාලයක් දක්වා සීමා කෙරෙනු ඇත. වගා කාලයක දිග දින 270ක් ලෙස සැලකෙයි.

14.12 ප්‍රතිලේඛනගත ණය මුදලට අදාළව නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් සලකා බලන සහභාගීත්ව මූල්‍ය ආයතනයේ ප්‍රධාන කාර්යාලය මඟින් අධ්‍යක්ෂ, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව, කොළඹ 01 යන ලිපිනය වෙත, යොමු කළ යුතුය.

14.13 ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පහත කාලයන් තුළ දී ණය ප්‍රතිලේඛනගත කිරීම සඳහා වන අයදුම්පත් භාර ගනු ලැබේ;

පළමුවන කාලය	මැයි 1 සිට ජූනි 30 දක්වා
දෙවන කාලය	නොවැම්බර් 1 සිට දෙසැම්බර් 31 දක්වා

15 පසුහිමිකම් පියවීම

15.1 ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හිමිකම් පියවීමෙන් පසු ණය ගනුදෙනුකරුවන්ගෙන් සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් නැවත අයකර ගනු ලැබූ සියලුම මුදල් ශ්‍රී ලංකා මහ බැංකුව සහ සහභාගීත්ව මූල්‍ය ආයතනය අතර 60-40 අනුපාතයට බෙදා ගත යුතු වේ. හිමිකමක් පියවීමෙන් පසු සිදු කරන ලද ඕනෑම අයකිරීමකින් සියයට 60ක් සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යොමු කළ යුතු වේ. මේ සඳහා. ඇමුණුම X (RDD/NCRCS/PC/1) යොදා ගැනීමට සහභාගීත්ව මූල්‍ය ආයතනයන්ට දැනුම් දෙනු ඇත.

අ. සෑම වසරකම ජනවාරි සිට ජූනි දක්වා සහ ජූලි සිට දෙසැම්බර් දක්වා කාල සීමාවන් ආවරණය කරමින් ඇමුණුම් VI සහ VII අනුව සකස් කළ ඇප ආවරණ හිමිකම් වසරකට දෙවරක් යොමු කළ යුතු වේ. සහභාගීත්ව මූල්‍ය ආයතනයේ ප්‍රධාන කාර්යාලය මඟින් පිළිවෙලින් ජූනි 30 සහ දෙසැම්බර් 31 සිට ලිත් මාස දින 30ක් ඇතුළත, ණය ආපසු අයකර ගැනීම් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලබාදිය යුතු වේ.

15.2 ණය මුදල ආපසු අයකර ගැනීම බලාත්මක ජූනි 30 සහ දෙසැම්බර් 31 සිට ලිත් මාස දින 30ක් පසු වී ණය ගනුදෙනුකරුවන්ගෙන් එක් රැස් කරන ලද අරමුදල් සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ප්‍රේෂණය කිරීම ප්‍රමාද වන්නේ නම්, එම ප්‍රමාද වන කාල සීමාව සඳහා 0.1ක දඩ පොලී අනුපාතයක් අදාළ වේ. ප්‍රමාදයක් සිදු වූ විට ප්‍රේෂණය කිරීමේ දී එවැනි දඩ පොලී මුදලක් එකතු කිරීමට සහභාගීත්ව මූල්‍ය ආයතන අපේක්ෂා කෙරේ.

15.3 ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ලැබුන මුළු ඇප ආවරණය, අය කළ පොලිය සහ ආපසු අය කරගත් මුදල් ආදිය දක්වමින් සුදුසු වාර්තා තබා ගැනීමට සහභාගීත්ව මූල්‍ය ආයතන කටයුතු කළ යුතු අතර, විමර්ශන කටයුතු වලදී එවැනි වාර්තා ශ්‍රී ලංකා මහ බැංකුවේ නිළධාරීන් සඳහා ලබා දීමට කටයුතු කළ යුතුය.

15.4 සහභාගීත්ව මූල්‍ය ආයතනයේ ප්‍රධාන කාර්යාලය විසින් ණය ආපසු අයකර ගැනීමේ පෝරමයද සමග සෑම ශාඛාවකින්ම ගෙවිය යුතු මුදල් එකතුකර සෑම වසරකම ජූනි 30 සහ දෙසැම්බර් 31 සිට ලිත් මාස දින 30ක් ඇතුළත ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු චෙක්පත යොමු කළ යුතු වේ. ප්‍රමාද වීමක් සිදු වුවහොත්, චෙක්පත සහ පෝරම යොමු

කළ යුතු අවසාන දිනයේ සිට ප්‍රමාද වූ කාල සීමාව සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තීරණය කරන ලද දඩ පොලිය ද ප්‍රධාන කාර්යාලය විසින් එකතු කළ යුතු වේ.

16 පරීක්ෂා කිරීම

යෝජනා ක්‍රමය යටතේ අනුමත ඕනෑම ණය මුදලක් සඳහා සහභාගීත්ව මූල්‍ය ආයතනයේ ගිණුම් පොත් සහ අනිකුත් වාර්තා පරීක්ෂා කිරීමට සහ ක්ෂේත්‍ර චාරිකා සිදු කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවට අයිතිය ඇත.

17 සංශෝධන සහ අතිරේක ප්‍රතිපාදන

යෝජනා ක්‍රමය යටතේ එවැනි දැනුම්දීමේ දිනයකට පෙර යෝජනා ක්‍රමය යටතේ නිකුත් කරන ලද ඕනෑම ඇපකරයකින් පැන නගින අයිතිවාසිකම් සහ බැඳීම් වලට බලපෑමක් නොකර ණය යෝජනා ක්‍රමය සංශෝධනය කිරීමට හෝ ඉවත් කර ගැනීමේ අයිතිය ශ්‍රී ලංකා රජය සහ ශ්‍රී ලංකා මහ බැංකුව සතු වේ. ණය යෝජනා ක්‍රමයේ නිශ්චිත ලෙස සඳහන් කර නොමැති කරුණු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව මෙම ණය යෝජනා ක්‍රමයේ අරමුණ සඳහා අවශ්‍ය වන පරිපූරක හෝ අතිරේක ප්‍රතිපාදන සම්පාදනය කළ යුතු වේ.

බී. එල් ජේ. එස්. බාලසූරිය
අධ්‍යක්ෂ/ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව

ඇමුණුම I

නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය - සරුසාර ණය ප්‍රදානය කිරීම සඳහා වන සුදුසුකම් ලැබීමේ නිර්ණායක

1. පහත භෝග වගා කිරීම, සරුසාර යෝජනා ක්‍රමය යටතේ ණය පහසුකම් ලබා ගැනීම සඳහා සුදුසුකම් ලබයි.

භෝග ප්‍රභේදය	භෝගය
වී	වී
අමු මිරිස්	අමු මිරිස්
ඊෑනු	ඊෑනු
මාෂභෝග	කව්පි, මුං ඇට, උඳු, සෝයා බෝංචි, බඩ ඉරිඟු, කුරක්කන්
තෙල් සහිත බීජ	රට කජු, තල, සූරියකාන්ත
මුල සහ ආකන්ද	අර්තාපල්, බතල, මඤ්ඤොක්කා, කිරි අල
එළවළු	වම්බටු, බණ්ඩක්කා, බීට්, බෝංචි, ගෝවා, කැරට්, මාළු මිරිස්, තක්කාලි ලීක්ස්, රාබු, නෝකෝල්, වැටකොළු, කරවිල, පතෝල, වට්ටක්කා
වෙනත්	ඉඟුරු උක්

2. ඉහත භෝගවල පැළ තවාන් (අදාළ වන පරිදි)
3. ගෙවතු වගාව

ඇමුණුම II

නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය - සරුසාර
සුදුසුකම්ලත් භෝග සඳහා මූල්‍ය පරිමාණ

	භෝගය සහ කේත අගය		භූමි සැකැස්ම (රු.)	බීජ තවාන් දමීම සහ රෝපණය (රු.)	පොහොර (රු.)	රසායනික (පළිබෝධ/ වල් පැළෑටි/ දිලීර) (රු.)	වෙනත් (රු.)	මුළු පිරිවැය (රු.)	අක්කරයකට උපරිම නය මුදල (රු.)	ඉඩම් ඒකකයෙහි විශාලත්වය (අක්කර)	
										උපරිම	අවම
1	වී										
		වාරි මාර්ග වලින් පෝෂිත (PI)	12,274	4,796	1,870	3,677	17,348	39,965	30,000	0.25	10
		වැසි ජලයෙන් පොෂිත (PR)	13,241	6,844	2,336	5,290	15,066	42,777	32,000	0.25	
2	අමු මිරිස්	(C)	24,002	17,959	17,468	31,832	25,680	116,941	88,000	0.125	2
3	ඌනු	(O)	14,089	74,589	34,727	15,895	48,010	187,310	140,000	0.125	2
4	මාෂභෝග										
		කව්පි (M1)	4,147	4,838	-	8,262	11,215	28,462	21,000	0.125	5
		මුං ඇට (M2)	10,108	4,269	-	6,715	14,726	35,818	27,000	0.125	
		උඳු (M3)	12,509	2,830	-	1,645	11,317	28,301	21,000	0.125	
		සෝයා බෝංචි (M4)	5,612	3,904	4,963	6,710	8,113	29,302	22,000	0.125	
		කුරක්කන් (M5)	11,367	5,969	-	-	7,537	24,873	19,000	0.125	
		බඩ ඉරිඟු (M)	13,617	9,572	7,268	7,704	7,421	45,582	34,000	0.125	10
5	තෙල් සහිත බීජ										
		රට කජු (L1)	5,085	16,077	-	8,897	11,799	41,858	31,000	0.125	5
		තල (L2)	9,329	4,979			10,694	25,002	19,000	0.125	
		සූරියකාන්ත (L3)	5,160	3,870	3,225	1,290	5,160	18,705	14,000	0.125	
6	මුල සහ ආකන්ද										
		අර්තාපල් (T)	31,291	176,812	70,804	29,640	27,069	335,616	252,000	0.125	2
		බලත (T1)	10,449	5,515	7,013	6,192	16,254	45,423	34,000	0.125	5
		මඤ්ඤොක්කා (T2)	3,225	7,869	8,483	8,514	14,964	43,055	32,000	0.125	
		කිරි අල (T3)	25,800	15,480	6,450	-	10,320	58,050	44000	0.125	

7	එළවළු										
		වම්බටු (V1)	7,920	6,336	14,494	27,324	24,288	80,362	60,000	0.125	2
		බණ්ඩක්කා (V2)	5,720	7,260	9,479	7,480	11,220	41,159	31,000	0.125	
		බීට් (V3)	32,844	21,349	11,885	10,532	16,065	92,674	70,000	0.125	
		බෝංචි (V4)	12,180	33,640	17,400	15,776	12,760	91,756	69,000	0.125	
		ගෝවා (V5)	37,513	30,246	29,389	30,236	31,492	158,876	119,000	0.125	
		කැරට් (V6)	36,740	16,636	34,618	27,052	27,858	142,904	107,000	0.125	
		මාළු මිරිස් (V7)	27,086	18,503	23,108	43,305	37,888	149,890	112,000	0.125	
		තක්කාලි (V8)	23,457	9,343	22,050	42,430	55,234	152,514	114,000	0.125	
		ලීක්ස් (V9)	34,748	19,100	15,148	13,328	28,917	111,240	83,000	0.125	
		රාබු (V10)	18,088	9,282	5,614	5,593	10,829	49,406	37,000	0.125	
		නෝකෝල් (V11)	18,088	14,923	5,614	6,188	9,996	54,809	41,000	0.125	
		වැටකොළු (V12)	6,050	11,220	8,847	12,100	33,220	71,437	54,000	0.125	
		කරවිල (V13)	6,380	14,410	8,472	10,450	35,970	75,682	57,000	0.125	
		පතෝල (V14)	6,050	12,760	9,750	11,770	34,210	74,540	56,000	0.125	
		වට්ටක්කා (V15)	19,986	8,313	7,498	8,686	6,256	50,739	38,000	0.125	
8	වෙනත්										
		ඉඟුරු (W1)	4,640	75,400	6,960	-	5,800	92,800	70,000	0.250	2
		උක් (W2)	6,206	4,137	13,653	5,792	37,650	67,438	50,000	1.00	5
		කහ	72,000	295,000	35,500	12,000	224,100	638,600	480,000	0.125	1
9	ගෙවතු වගාව සඳහා වන උපරිම අගය රු. 40,000/ කි.										
10	පැල තවාන් සඳහා උපරිම අගය රු. 500,000/ කි.										

සටහන: භූමි සකස් කිරීම, බීජ පැළෑටි, පොහොර, දිලීර නාශක, කෘමිනාශක යනාදිය සඳහා මුළු ණය අගයේ සීමාවෙන් 60% ක උපරිමයකට යටත්ව ණය ගැනුම්කරුගේ අවශ්‍යතාවලට අනුව වගා ණය මුදා හැරීමේ බලය සහභාගිත්ව මූල්‍ය ආයතනවලට පැවරී ඇති අතර, ක්ෂේත්‍ර නිලධාරියා විසින් නිර්දේශ කර ඇති පරිදි පොහොර හෝ අස්වනු නෙළීම සඳහා ඉතිරි මුදල වාරික එකක් හෝ දෙකකින් මුදා හැරිය හැකිය. එක් එක් ගොවි මහතාට ඉහත වගුවේ දී ඇති පිරිවැය සංරචක සපුරාලීමට ඔවුන් සතු හැකියාව සලකා බලමින්, ඔවුන් වෙත අවශ්‍ය ණය මුදල පමණක් මුදා හරින මෙන් ශාඛා කළමනාකරුවන් ගෙන් ඉල්ලා සිටියි.

වගා කිරීමේ රටාව, යල හෝ මහ වගා කන්නය පෝෂණය කොට ඇත්තේ වාරි මාර්ගවලින් ද නැතහොත් වැසි ජලයෙන් ද යන වග, භෝග මිශ්‍රණය සහ ගොවි මහතුන්ගේ ණය ආපසු ගෙවීමේ හැකියාව ආදිය සලකා බලමින් ඉහත අක්කරයකට දක්වා ඇති උපරිම ණය අගයන් තුළ එක් එක් ගොවියාට ලබාදිය යුතු ණය මුදල තීරණය කිරීමට කළමනාකරුවන්ට හිමිකමක් ඇත.

නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය - සරුසාර
වගා කිරීමේ කටයුතු සඳහා වන කාල රාමුවඇමුණුම III

ඉදිරි වසරෙහි අයවැය ප්‍රතිපාදන සඳහා සෑම වර්ෂයක ම ජූනි 15 වන දින මහා භාණ්ඩාගාරයට ඉල්ලීම සිදු කළ යුතුය.

ගෙවීමේ කාල රාමුව	1 වන අර්ධ වර්ෂය ජනවාරි 01 දින සිට ජූනි 15 දින දක්වා		11 වන අර්ධ වර්ෂය ජූනි 15 දින සිට දෙසැම්බර් 31 වන දින දක්වා	
1 පොලී සහනාධාරය පළමු වන වාරිකය				
1.1 සහභාගීත්ව මූල්‍ය ආයතන මඟින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පොලී සහනාධාර අයදුම්පත් එවිය යුතු අවසාන දිනය	ජූනි 15 වන දින	1 වර්ෂය	දෙසැම්බර් 31 වන දින	1 වර්ෂය
1.2 මහා භාණ්ඩාගාරය වෙත පළමු වාරිකය ගෙවීම සඳහා නිර්දේශ කිරීම.	ජූලි 31 වන දින	1 වර්ෂය	ජනවාරි 31 වන දින	2 වර්ෂය
2 පොලී සහනාධාරය දෙවන වාරිකය				
2.1 සහභාගිත්ව මූල්‍ය ආයතනවලට ණය අයකර ගැනීමේ වාර්තාවල මුද්‍රණ පිටපත් යැවීම	දෙසැම්බර් 31 වන දින	1 වර්ෂය	ජූලි 15 වන දින	2 වර්ෂය
2.2 සහභාගිත්ව මූල්‍ය ආයතන මඟින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ණය ආපසු අයකර ගැනීමේ වාර්තාවල මුද්‍රණ පිටපත් යැවිය යුතු අවසාන දිනය	පෙබරවාරි 28 වන දින	2 වර්ෂය	සැප්තැම්බර් 15 වන දින	2 වර්ෂය
2.3 මහා භාණ්ඩාගාරය වෙත 2වන වාරිකයෙහි ගෙවීම නිර්දේශ කිරීම	අප්‍රේල් 31 වන දින	2 වර්ෂය	නොවැම්බර් 15 වන දින	2 වර්ෂය
3 ණය ඇප ආවරණය 1				
3.1 සහභාගිත්ව මූල්‍ය ආයතන වෙත ණය ඇපකර 1 පෝරම යැවීම.	ජූලි 01 වන දින	2 වර්ෂය	පෙබරවාරි 01 වන දින	3 වර්ෂය
3.2 සහභාගීත්ව මූල්‍ය ආයතන මඟින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඇපකර 1 පෝරම යැවිය යුතු අවසාන දිනය	අගෝස්තු 15 වන දින	2 වර්ෂය	මාර්තු 15 වන දින	3 වර්ෂය
3.3 ණය ඇප ආවරණ පළමු වන වාරිකය ගෙවීම	සැප්තැම්බර් 30 වන දින	2 වර්ෂය	අප්‍රේල් 31 වන දින	3 වර්ෂය
4 ණය ඇප ආවරණය 2				
4.1 සහභාගිත්ව මූල්‍ය ආයතනවලට ණය ඇපකර පෝරම යැවීම	පෙබරවාරි 28 වන දින	3 වර්ෂය	නොවැම්බර් 30 වන දින	3 වර්ෂය
4.2 සහභාගිත්ව මූල්‍ය ආයතන මඟින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඇපකර 2 පෝරම යැවිය යුතු අවසාන දිනය	මාර්තු 31 වන දින	3 වර්ෂය	දෙසැම්බර් 31 වන දින	3 වර්ෂය
4.3 ණය ඇප ආවරණ දෙවන වාරිකය ගෙවීම	අප්‍රේල් 30 වන දින	3 වර්ෂය	ජනවාරි 31 වන දින	4 වර්ෂය

මෙහෙයුම් උපදෙස් අංක : RDD/NCRCS/2011/2021/02

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
අංක 30. ජනාධිපති මාවත,
කොළඹ 01.
දුරකථන අංක : 2477452, 2398748
ෆැක්ස් : 2477724
2021 අප්‍රේල් 20

සියලු සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත,

මහත්ම/මහත්මියණි,

නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමයේ මෙහෙයුම් උපදෙස් සඳහා වන සංශෝධන

2013 ජනවාරි 10, 2014 ජූනි 06, 2015 ජූලි 06, 2016 අගෝස්තු 22, 2020 අප්‍රේල් 08 සහ 2021 අප්‍රේල් 05 දිනට සංශෝධිත, 2011 සැප්තැම්බර් 23 වන දිනැති මෙහෙයුම් උපදෙස් අංක RDD/NCRCS/2011, පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලබන බව නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ ලියාපදිංචි වී ඇති සියලුම සහභාගීත්ව මූල්‍ය ආයතන සඳහා මෙයින් දැනුම් දෙනු ලබයි.

ඒ අනුව, 2021 අප්‍රේල් 16 වන දින සිට පහත සඳහන් සංශෝධන බලාත්මක වේ.

I. ඇමුණුම I (RDD/NCRCS/2011/2021/01) - නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ මූල්‍යකරණය සඳහා ඇමුණුම I හි (ණය ලබාදීම සඳහා සුදුසුකම්ලත් නිර්ණායක) 'වෙනත්' කාණ්ඩය යටතේ කහ වගාව ඇතුළත් කරන ලදී.

II. ඇමුණුම II (RDD/NCRCS/2011/2021/01) - පහත සඳහන් අයුරින් ඇමුණුම II (සුදුසුකම් ලත් බෝග සඳහා මූල්‍ය පරිමාණ) යටතේ කහ වගාව පිළිබඳ විස්තර ද ඇතුළත් කරන ලදී.

බෝගය	භූමිය සකස් කිරීම රු.	බීජ තවාන් සහ රෝපණය රු.	පොහොර රු.	රසායනික ද්‍රව්‍ය රු.	වෙනත් රු.	මුළු වියදම රු.	අක්කරයක් සඳහා උපරිම ණය සීමාව රු.	ඉඩම් ඒකකයෙහි විශාලත්වය (අක්කර)	
								අවම	උපරිම
කහ	72,000	295,000	35,500	12,000	224,100	638,600	480,000	0.125	1

III. 5.6 වගන්තිය (RDD/NCRCS/2011/2021/01) ණය මුදල ආපසු ගෙවීමේ උපරිම කාල සීමාව (උක් වගාව සහ කහ වගාව හැරුණු විට) දින 270කි. උක් සහ කහ වගාවන් සඳහා ණය මුදල ආපසු ගෙවීමේ උපරිම කාල සීමාව දින 365කි. ණය සඳහා සහන කාල සීමාවක් හෝ ණය මුදල එකවර ගෙවීමක් සිදුකළ නොහැක.

IV. 7.1 වගන්තිය (RDD/NCRCS/2011/2021/01)

උක් සහ කහ වගාවන්;

7.1.3 (අ) ඉහත 5.5 වගන්තිය අනුව, අනුමත කර ඇති ප්‍රමාණය මත දින 180ක කාල සීමාවක් සඳහා අත්තිකාරම් ගෙවීම් ගණනය කරනු ඇත. මෙම අරමුණ සඳහා, ඇමුණුම III (අ) හී දක්වා ඇති කාල සීමාව තුළ නිසි ලෙස සම්පූර්ණ කරන ලද ඇමුණුම IV RDD/NCRCS/IS/I සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් යොමු කළ යුතු වේ.

(ආ) දින 365ක සීමාවෙන් පසුව වුවද අදාළ ණය ආපසු අය කර නොගත්තේ නම්, අදාළ පරිදි, උපරිම දින 185කට යටත්ව ඉතිරි කාල සීමාව සඳහා සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ණය ආපසු අයකර ගැනීමේ දින වාර්තා කිරීමෙන් පසු අවසාන ගෙවීම සිදු කරනු ලබයි. මේ අරමුණ සඳහා, ලබා දෙන ලද මුදල් ප්‍රමාණය, දිනය සහ වගා ණය අයකර ගැනීමේ ප්‍රමාණය වාර්තා කිරීම සඳහා ආකෘතිය RDD/NCRCS/IS/1 (ඇමුණුම V හි දක්වා ඇති) සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත යොමු කරනු ඇත.

7.1.4 ඇමුණුම III (අ) හී නියම කර ඇති කාල සීමාව තුළ නිසි ලෙස සම්පූර්ණ කරන ලද ආකෘති පත්‍ර උක් සහ කහ වගාවන් සඳහා වෙන වෙනම (පොලී සහනාධාර/ ඇප ආවරණ/ ප්‍රතිව්‍යුහගත කිරීම) සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් යොමු කළ යුතු වේ.

නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස්හී නියම කරන ලද අනිකුත් සියලුම නියමයන් සහ කොන්දේසි නොවෙනස්ව පවතී.

බී. එල් ජේ. එස්. බාලසූරිය
අධ්‍යක්ෂ/ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව

මෙහෙයුම් උපදෙස් අංකය : RDD/DAD-PP/2021/01

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
තැ.පෙ. 590
අංක 30, ජනාධිපති මාවත
කොළඹ 01
2021.05.04

සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත,

දේශීය කෘෂිකාර්මික සංවර්ධන (DAD) වැඩසටහන - නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වන මෙහෙයුම් උපදෙස්

තෝරාගත් කෘෂිකාර්මික අගය දාමයන් හි නිරත පුද්ගලයින්ගේ (AVCs) දේශීය මූල්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා තෝරාගත් සහභාගීත්ව මූල්‍ය ආයතන හරහා දේශීය කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහනෙහි නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අදාලව (DAD-PP) නව ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රමයක් හඳුන්වාදීමේ සහ ක්‍රියාත්මක කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ (RDD) අධ්‍යක්ෂ විසින් අංක RDD/DAD-PP/2021/01 දරන 2021.05.04 දිනැති මෙම මෙහෙයුම් උපදෙස් තෝරාගත් සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත නිකුත් කරන ලදි.

1. **හැඳින්වීම**

1.1 කෘෂිකාර්මික අංශයේ සංවර්ධනය කිරීමේ ඇති ජාතික වැදගත්කම සහ විශේෂයෙන් කොවිඩ්19 වසංගතය පැතිරීයාම හේතුවෙන් කෘෂිකාර්මික අංශය කෙරෙහි ජනතාව තුල ඇතිවූ ධනාත්මක වෙනස්කම් මඟින් නිර්මාණය කරන ලද පරිසරය සැලකිල්ලට ගනිමින් සාර්ථක කෘෂිකාර්මික අගය දාමයන් පිහිටුවීම තුළින් දේශීය කෘෂිකර්මාන්තයෙහි නියැලි සිටින කුඩා ව්‍යවසායකයින්ට සහය වීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් පුළුල් යෝජනාවක් සකස් කර ඇත. මෙම යෝජනාව 2020 වර්ෂයේ මුල් භාගයේදී ශ්‍රී ලංකා රජය වෙත ඉදිරිපත් කරන ලදී.

1.2 මෙම යෝජිත යාන්ත්‍රණය හැකි ඉක්මණින් ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයට හඳුන්වාදීමේ වැදගත්කම සලකා බලා, දේශීය කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහන ආරම්භ කිරීම සඳහා ශක්‍යතා අධ්‍යයන අවසන් වන තෙක් නියමු වැඩසටහනක් ලෙස දේශීය කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදල් අමාත්‍යාංශය සහ ආසියානු සංවර්ධන බැංකුව සමඟ සාකච්ඡා කිරීමේදී තීරණය කරන ලදී. දේශීය කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහනෙහි නියමු අදියර යටතේ එළවළු, කිරි සහ කුළුබඩු අංශ පමණක් සලකා බලනු ලැබේ.

1.3 ක්ෂේත්‍ර මට්ටමින් සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදයක් සකස් කිරීමට සහ දේශීය කෘෂිකාර්මික අංශය තුළින් තෝරා ගන්නා ලද කෘෂිකාර්මික අගයදාමයන් හරහා ප්‍රායෝගික ගැටළු හඳුනාගැනීම ද මෙම කෘෂිකාර්මික සංවර්ධන නියමු ව්‍යාපෘතිය තුළින් අපේක්ෂා කෙරේ.

1.4 ඒ අනුව, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද යෝජනාවෙන් හඳුනාගත් පරිදි දේශීය කෘෂිකාර්මික සංවර්ධන නියමු ව්‍යාපෘතිය අවසන් කිරීමෙන් පසුව ආසියානු සංවර්ධන බැංකුවේ ද සහය ඇතිව, ජාතික මට්ටමින් ධාන්‍ය වර්ග, එළවළු, පලතුරු, අපනයන කෘෂිකාර්මික භෝග ඇතුළුව උප අංශ 10ක් ආවරණය වන පරිදි ශක්තිමත්, එකිනෙකට සම්බන්ධිත හා ක්‍රියාකාරී කෘෂිකාර්මික අගයදාම වැඩසටහන හඳුන්වා දීමට අපේක්ෂා කරනු ලබයි.

2 **යෝජනා ක්‍රමයේ අරමුණු**

2.1 දේශීය කෘෂිකාර්මික අංශයේ කුඩා ව්‍යවසායකයින්ගේ සමාජ ආර්ථික තත්ත්වයන් නඟා සිටුවීම සඳහා මූල්‍ය හා වෙළඳපොල අවස්ථාවන්ට ඇති ප්‍රවේශය ප්‍රවර්ධනය කරමින් නිෂ්පාදනය සහ නිෂ්පාදන වල ගුණත්වය ඉහළ නැංවීම සහ වෙළඳපොල තුළ ප්‍රධාන ආහාර ද්‍රව්‍යයන් හි සුලබතාවය සහතික කරමින්, කෘෂිකාර්මික අපනයන ප්‍රවර්ධනය කිරීම දේශීය කෘෂිකාර්මික සංවර්ධන නියමු ව්‍යාපෘතියේ මූලික අරමුණ වේ.

2.2 ඉහත ප්‍රධාන අරමුණ හැරුණු විට, දේශීය කෘෂිකාර්මික සංවර්ධන නියමු ව්‍යාපෘතිය පහත සඳහන් උප අරමුණු කෙරෙහි ද අවධානය යොමු කරනු ලබයි.

(i) අදාළ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතනවල සහ ගොවි ප්‍රජාවේ හැකියාවන් ශක්තිමත් කරමින් දේශීය කෘෂිකාර්මික අංශයේ ශක්තිමත් හා හොඳින් සම්බන්ධිත ක්‍රියාකාරි කෘෂිකාර්මික අගයදාම තුනක් ස්ථාපිත කිරීම.

(ii) දේශීය අංශයේ අපනයන බෝග, එනම් කුළුබඩු, එළවළු සහ කිරි නිෂ්පාදනය වැනි කටයුතුවල නියැලී සිටින ගොවි ප්‍රජාව හට තිරසාර ආදායම් උත්පාදනය කිරීමේ මාර්ග පවතින බව සහතික කිරීම සඳහා තෝරාගත් අගයදාමයන්හි වෙනත් පාර්ශවකරුවන් සමඟ කුඩා කෘෂි ව්‍යවසායකයින් සම්බන්ධ කිරීම සහ ප්‍රතිපාදන සැපයීම.

(iii) නව තාක්ෂණයන් හා නිවැරදි ක්‍රමවේදයන් අනුගමනය කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය හා තාක්ෂණික දැනුම ලබා දීමෙන් ගොවිපල මට්ටමින් නිෂ්පාදන හා ශුද්ධ ආදායම වැඩි කිරීම.

(iv) වෙළඳපල පහසුකම් සහතික කරමින් අවශ්‍ය වෙළඳපොල ප්‍රමිතීන්ට අනුකූලව නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමට ගොවීන්ට පහසුකම් සැපයීම.

(v) අගයදාමයන්හි සිටින සියලුම ක්‍රියාකාරි පාර්ශවයන්ට ඉහළ ආදායමක් ලබා දීම සඳහා අගය එකතු කළ නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම සහ අපනයන ඉලක්ක කරගත් කෘෂිකාර්මික නිෂ්පාදන වැඩි වටිනාකමක් සහිතව ප්‍රවර්ධනය කිරීම.

(vi) ගොවි ප්‍රජාවගේ මූල්‍ය සාක්ෂරතාව සහ ඔවුන් අතර මූල්‍ය ප්‍රවේශ ප්‍රවර්ධනය කරමින්, ගොවි ප්‍රජාවේ මූල්‍ය අන්තර්ගතභාවය ඉහළ නැංවීම.

3. යෝජනා ක්‍රමයේ ක්‍රියාකාරිත්වය සහ අරමුදල් ප්‍රභව

දේශීය කෘෂිකාර්මික සංවර්ධන නියමු ව්‍යාපෘතිය, ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුදල් තුලින් මුළු දිවයිනම ආවරණය වන පරිදි ක්‍රියාත්මක කරනු ලබයි.

4. දේශීය කෘෂිකාර්මික සංවර්ධන නියමු ව්‍යාපෘතිය හා සම්බන්ධ වන සහභාගීත්ව මූල්‍ය ආයතන

දේශීය කෘෂිකාර්මික සංවර්ධන නියමු ව්‍යාපෘතිය පහත දැක්වෙන සහභාගීත්ව මූල්‍ය ආයතන සහභාගී වනු ඇත.

ලංකා බැංකුව, කාගිල්ස් බැංකුව, මහජන බැංකුව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, සණස සංවර්ධන බැංකුව

5. යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කළ දිනය

RDD/DAD-PP/2021/01 අංක දරන මෙම මෙහෙයුම් උපදෙස් 2021.05.04 දින සිට බලාත්මක වේ.

6. අර්ථ දැක්වීම්

6.1 **'කෘෂිකාර්මික අගය දාමය** (AVC)' යනු දේශීය කෘෂිකාර්මික සංවර්ධන නියමු ව්‍යාපෘතිය යටතේ මූල්‍ය හා මූල්‍ය නොවන ආධාර සැපයීම සඳහා සහභාගීත්ව මූල්‍ය ආයතන සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තෝරාගන්නා ගන්නා ලද ඕනෑම කෘෂිකාර්මික අගයදාමයක් වේ.

6.2 **'අගය දාම සහභාගීකරු** (VCP)' යනු දේශීය කෘෂිකාර්මික සංවර්ධන නියමු ව්‍යාපෘතිය යටතේ කෘෂිකාර්මික අගය දාමය හා ක්‍රියාකාරීව සම්බන්ධ වී සිටින ඕනෑම පාර්ශවකරුවෙකු වේ.

6.3 **'වටිනාකම් දාම සහභාගීත්ව සහතිකය** (VCPC)' යනු කෘෂිකාර්මික අගයදාම ක්‍රියාවලියෙහි සහභාගීත්වය සනාථ කිරීම සඳහා ප්‍රමුඛ සහභාගීකරු විසින් කෘෂිකාර්මික අගයදාමයට ක්‍රියාකාරීව එක්වී සිටින පාර්ශවකරුවෙකුට නිකුත් කරනු ලබන ලේඛනයයි.

6.4 **'ප්‍රමුඛ සහභාගීකරු'** යනු හඳුනාගත් කෘෂිකාර්මික අගය දාමය විධිමත් කිරීමට සහ කෘෂිකාර්මික අගය දාමය හි සහභාගීත්වය තහවුරු කිරීමට මූලිකත්වය ගනු ලබන ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිළිගත් ආයතනයකි. මෙහිදී ප්‍රමුඛ සහභාගීකරු අලෙවිකරණ සංවිධානයක් හෝ සැකසුම් සමාගමක් හෝ එසේ නැතහොත් ප්‍රමුඛ සහභාගීකරුගේ භූමිකාව ඉටු කිරීමට එකඟ වූ වෙනත් ඕනෑම අගයදාම සහභාගීකරුවෙකු විය හැකිය.

6.5 **'සහභාගීත්ව මූල්‍ය ආයතනය'** යනු 1988 අංක 30 දරන බැංකු පනත (සංශෝධිත) යටතේ ලියාපදිංචි කරන ලද ඕනෑම වාණිජ බැංකුවක් හෝ විශේෂිත බැංකුවක් වන අතර දේශීය කෘෂිකාර්මික සංවර්ධන නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ ගිවිසුමකට එළඹි මූල්‍ය ආයතනයකි.

6.6 **'ගිවිසුම'** යනු දේශීය කෘෂිකාර්මික සංවර්ධන නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව සහ එක් එක් සහභාගීත්ව මූල්‍ය ආයතන අතර ඇති කර ගත් ගිවිසුමයි.

6.7 **'මෙහෙයුම් උපදෙස්'** යනු ශ්‍රී ලංකා මහ බැංකුවහි ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සකස් කර නිකුත් කරන ලද දේශීය කෘෂිකාර්මික සංවර්ධන නියමු ව්‍යාපෘතියට අදාල මෙහෙයුම් උපදෙස් සහ එම මෙහෙයුම් උපදෙස් සඳහා වන සංශෝධන යන්නයි.

6.8 **'සුදුසුකම් ලත් ණයගැතියා'** යනු මෙහෙයුම් උපදෙස් වල දක්වා ඇති පරිදි දේශීය කෘෂිකාර්මික සංවර්ධන නියමු ව්‍යාපෘතිය යටතේ සහභාගිත්ව මූල්‍ය ආයතන වෙතින් උප ණය ලබා ගැනීම සඳහා වන සුදුසුකම් සපුරා ඇති ඕනෑම පුද්ගලයෙකි/ආයතනයකි.

6.9 **'උප ණය ගැනුම්කරු'** යනු මෙහෙයුම් උපදෙස් වල දක්වා ඇති පරිදි දේශීය කෘෂිකාර්මික සංවර්ධන නියමු ව්‍යාපෘතිය යටතේ වන සහභාගිත්ව වන මූල්‍ය ආයතන වෙතින් උප ණය ලබා ගත් සුදුසුකම් ලත් ණයගැතියා වේ.

6.10 **'උප ණය ගිවිසුම'** යන්නෙන් අදහස් වනුයේ සුදුසුකම් ලත් උප ණය ගැනුම්කරුවන් සමඟ සහභාගීත්ව මූල්‍ය ආයතනය සෘජුවම අත්සන් කරන ලද ගිවිසුමයි.

6.11 **'උප ණය'** යනු සුදුසුකම් ලත් ණය ගැතියාට සෘජුවම සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් ලබාදෙනු ලබන ණය මුදලයි.

6.12 **'උප ව්‍යාපෘතිය'** යන්නෙන් අදහස් වනුයේ දේශීය කෘෂිකාර්මික සංවර්ධන නියමු ව්‍යාපෘතිය යටතේ උප ණයගැතියෙකු විසින් උප ණයක් ලබා ගන්නා ලද ව්‍යාපෘතියයි.

6.13 **'ප්‍රතිමූල්‍ය ණය'** යන්නෙන් අදහස් වනුයේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සහභාගීත්ව මූල්‍ය ආයතන සඳහා නිකුත් කරන ලද එක් එක් උප ණය සැලකිල්ලට ගෙන ලබා දෙන ලද ණය මුදල් වේ.

6.14 **'කෘෂිකාර්මික නොවන ක්‍රියාකාරකම්'** යනු කුඩා පරිමාණ නිෂ්පාදන, ප්‍රවාහන කටයුතු, ප්‍රජා සේවා ඇතුළුව සියළු කෘෂිකාර්මික නොවන ක්‍රියාකාරකම් ය.

7. දේශීය කෘෂිකාර්මික සංවර්ධන නියමු ව්‍යාපෘතියේ මෙහෙයුම් ක්‍රියාවලිය

දේශීය කෘෂිකාර්මික සංවර්ධන නියමු ව්‍යාපෘතියේ මෙහෙයුම් ක්‍රියාවලිය තෝරාගත් කෘෂිකාර්මික අගයදාමයන් සමඟ සම්බන්ධ වේ. අගයදාමයේ මට්ටම කුමක් වුවත් මෙම කෘෂිකාර්මික අගයදාමයන් හි අගයදාම සහභාගීකරුවන්ගේ මූල්‍ය හා මූල්‍ය නොවන අවශ්‍යතා සපුරාලීමට අපේක්ෂා කෙරේ. යෝජිත කෘෂිකාර්මික අගයදාමයන් ඇමුණුම I හි දක්වා ඇත.

දේශීය කෘෂිකාර්මික සංවර්ධන නියමු ව්‍යාපෘතියෙහි මෙහෙයුම් ක්‍රියාවලිය පහතින් දක්වා ඇත.

පියවර 01	සහභාගීත්ව මූල්‍ය ආයතනයන් හි සහය ඇතිව නියමු අදියර සඳහා සුදුසු ප්‍රමුඛ සහභාගීකරුවන් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් තෝරා ගනු ලැබේ.
පියවර 02	ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාල විසින් දේශීය කෘෂිකාර්මික සංවර්ධන නියමු ව්‍යාපෘතිය පිළිබඳව අගයදාම සහභාගීකරුවන් දැනුම්වත් කිරීමේ වැඩසටහන් පවත්වනු ඇත.
පියවර 03	තෝරා ගන්නා ලද ප්‍රමුඛ සහභාගීකරුවන් විසින් අගයදාම පාර්ශවකරුවන් වෙත අගයදාම සහභාගීත්ව සහතිකය ලබා දෙනු ඇත.
පියවර 04	දේශීය කෘෂිකාර්මික සංවර්ධන නියමු ව්‍යාපෘතිය යටතේ මූල්‍ය පහසුකම් ලබා ගැනීමට අපේක්ෂා කරන අගයදාම පාර්ශවකරුවන් හට අගයදාම සහභාගීත්ව සහතිකය ද සමඟ තමන් අපේක්ෂා කරන සහභාගීත්ව මූල්‍ය ආයතනයක ශාඛාවක් තෝරාගත හැකිය.
පියවර 05	සහභාගීත්ව මූල්‍ය ආයතනවල ශාඛා විසින් අගයදාම සහභාගිත්ව සහතිකය ඇති පාර්ශවකරුවන්ගේ ණය ලබාග ැනීමට ඇති සුදුසුකම් පිළිබඳව පරික්ෂා කිරීම අනිවාර්ය වන අතර, එසේ සුදුසුකම්ලත් පාර්ශවකරුවන් අතරින් දේශීය කෘෂිකාර්මික සංවර්ධන නියමු ව්‍යාපෘතිය යටතේ මූල්‍ය පහසුකම් ලබා ගැනීමට කැමැත්ත ප්‍රකාශ කළ, අගයදාම සහභාගීකරුවන්ගෙන් සුදුසුකම් ලත් ණය ගැතියන් ලෙස තෝරා ගත යුතුය.
පියවර 06	අදාළ කෘෂිකාර්මික අගයදාමය හි ප්‍රාග්ධන ආයෝජනවල ශක්‍යතාව සහතික කිරීම සඳහා සුදුසුකම් ලත් උප ණය ගැනුම්කරුවන්ගේ සහාය ඇතිව ගොවිපල සැලසුම් සහ ව්‍යාපෘති යෝජනා අදාළ සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් සැකසිය යුතුය. ණය යෝජනා ක්‍රමය යටතේ මූල්‍ය පහසුකම් ලබා ගැනීම සඳහා අවශ්‍ය වන ව්‍යාපෘති යෝජනාව සකස් කිරීම සඳහා ඇමුණුම I සහ ඇමුණුම II හි දක්වා ඇති ආකෘති පත්‍ර භාවිතා කළ හැකියි. (ණය මුදල රුපියල් 1,000,000 ට අඩු ණය සඳහා ඉල්ලුම් කිරීමට ඇමුණුම I භාවිතා කළ හැකි අතර රු. 1,000,000 හෝ ඊට වැඩි ණය සඳහා ඉල්ලුම් කිරීමට ඇමුණුම II භාවිතා කළ හැකිය).
පියවර 07	සහභාගිත්ව මූල්‍ය ආයතන ශාඛාවන් විසින් යෝජිත ව්‍යාපෘතිය සහ ව්‍යාපෘති යෝජනා/ගොවිපල සැලැස්මේ ශක්‍යතාව මත පදනම්ව ණය ඇගයීම් වාර්තාවක් සකස් කළ යුතුය.
පියවර 08	සහභාගිත්ව මූල්‍ය ආයතන ශාඛාවන් සාමාන්‍ය ණය නිකුත් කිරීමේ පටිපාටියට අනුව, මෙම මෙහෙයුම් උපදෙස් වල දක්වා ඇති පරිදි ණය සඳහා ලියාපදිංචිය, එම ණය නිකුත් කිරීම සහ ප්‍රතිමූල්‍ය ඉල්ලුම් කිරීම සිදු කළ යුතුය.
පියවර 09	සහභාගීත්ව මූල්‍ය ආයතනයන්හි ශාඛා වල සහාය ඇතිව ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාල විසින් මෙම ණය යෝජනා ක්‍රමයට අදාල උප ණය පිළිබඳව පසු විපරම් සිදු කරනු ඇත. තවද, සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් මෙම මෙහෙයුම් උපදෙස් වල 16.4 වගන්තියේ දක්වා ඇති අධීක්ෂණ අවශ්‍යතාවන්ට අනුකූලව කටයුතු කළ යුතුය.

8. දේශීය කෘෂිකාර්මික සංවර්ධන නියමු ව්‍යාපෘතියේ මූලික ලක්ෂණ

8.1 උප ණය ගැනුම්කරුවන් සඳහා සුදුසුකම් නිර්ණායක

(i) කෘෂිකාර්මික වටිනාකම් දාමයෙහි අදාළ අනෙකුත් සහභාගිවන්නන් සමඟ පිළිගත හැකි වෙළඳපොල සම්බන්ධතාවයක් සහිතව, මෙම මෙහෙයුම් උපදෙස් වල අර්ථ දක්වා ඇති පරිදි උප ණය ගැනුම්කරුවන්, අගයදාම පාර්ශවකරුවෙකු විය යුතු අතර මෙම ණය යෝජනා ක්‍රමය යටතේ නව පාර්ශවකරුවන් සහ දැනට සිටින පාර්ශවකරුවන් ද සලකා බලනු ලැබේ.

(ii) උප ණය ගැනුම්කරුවකු ලෙස සුදුසුකම් ලැබීමට නම්, මූල්‍ය ආයතනයකින් මීට පෙර ලබාගත් කිසියම් ණයක් සම්බන්ධයෙන් හිතාමතා ගෙවීම් පැහැර හරින ලද අයෙකු නොවිය යුතුය. කෙසේ වෙතත්, ණයක් ලබා දීම සඳහා තීරණ ගැනීමේ බලය සහභාගිත්ව මූල්‍ය ආයතනය වෙත ලබා දී ඇත.

(iii) වයස අවුරුදු 65 හෝ ඊට වැඩි උප ණයගැතියන්, දේශීය කෘෂිකාර්මික සංවර්ධන නියමු ව්‍යාපෘතිය යටතේ ණය පහසුකමක් ලබා ගැනීම සඳහා පවුලේ සාමාජිකයෙකු (කාලත්‍රයා හෝ අවුරුදු 18 ට වැඩි දරුවෙකු) සම-ණයගැතියෙකු ලෙස ඇතුළත් කරගත යුතුය.

(iv) සහභාගීත්ව මූල්‍ය ආයතනය වෙත පිළිගත හැකි පරිදි, එම ණය ගැනුම්කරු විසින් තම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන ඉඩම හෝ වෙනත් දේපල සඳහා උප ණය ගැනුම්කරුට අයිතියක් තිබිය යුතුය.

8.2 **සුදුසුකම්ලත් ක්‍රියාකාරකම්**

(i) සහභාගිත්ව මූල්‍ය ආයතනය විසින් සකස් කරන ලද ව්‍යාපෘති ඇගයීම් වාර්තාව මඟින් තීරණය කරනු ලබන පරිදි හොඳ ණය සේවා අනුපාත සමඟ ප්‍රමාණවත් මුදල් ප්‍රවාහයක් ඇති තෝරාගත් අගයදාමයන්හි, ආර්ථික හා මූල්‍යමය වශයෙන් ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් හෝ ව්‍යාපාර ක්‍රියාකාරකම්.

(ii) අගයදාමයේ එක් එක් කාණ්ඩ වල අවශ්‍යතාවන් හා ඒ සඳහා පහසුකම් ඇමුණුම II හි දක්වා ඇත.

8.3 **උපරිම ණය මුදල**

රුපියල් මිලියන විසිපහක් (රු.මි.25) හෝ මුළු ඇස්තමේන්තුගත ව්‍යාපෘති පිරිවැයෙන් සියයට අසූ පහක් (85%) යන දෙකින් අඩු අගය වේ.

8.4 **කොටස් දායකත්වය**

උප ණය ගැනුම්කරු විසින් ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැයෙන් අවම වශයෙන් සියයට පහළොවක් (15%) ප්‍රමාණයක් කොටස් ලෙස මුදලින් හෝ ඊට සමාන වෙනත් ආකාරයකින් යෙදිය යුතුයි.

8.5 **ප්‍රතිමූල්‍ය**

මෙහෙයුම් උපදෙස් වල දක්වා ඇති නියමයන් හා කොන්දේසි වලට යටත්ව ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලද ණය අයදුම්කරුවන් සඳහා සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් නිකුත් කරන ලද ණය සහ නිසි පරිදි සම්පූර්ණ කරන ලද ණය අයදුම්පත් සඳහා සියයට සියයක ප්‍රමාණයක් ප්‍රතිමූල්‍යණය කරනු ලබයි.

8.6 **පොලී අනුපාතය**

කිසිදු අවස්ථාවකදී සහභාගිත්ව මූල්‍ය ආයතන විසින්, පහත දැක්වෙන 8.6 (ii) හි දක්වා ඇති අනුපාතයට වඩා වැඩි අනුපාතයක් යටතේ උප ණයගැතියෙකුට ණය මුදලක් මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ලබා නොදිය යුතුය.

(i) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත

(අ) රුපියල් මිලියනයට අඩු ණය මුදල් සඳහා වාර්ෂිකව සියයට එකක (1%) පොලී ප්‍රතිශතයක්

(ආ) රුපියල් මිලියනයේ සිට රුපියල් මිලියන 25 දක්වා වන ණය මුදල් සඳහා වාර්ෂිකව සියයට දෙකක (2%) පොලී ප්‍රතිශතයක් අය කරනු ලබයි.

(ii) සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් උප ණය ගැනුම්කරු වෙත

(අ) රුපියල් මිලියනයට අඩු ණය මුදල් සඳහා වාර්ෂිකව සියයට හතරක (4%) පොලී ප්‍රතිශතයක්

(ආ) රුපියල් මිලියනයේ සිට රුපියල් මිලියන 25 දක්වා වන ණය මුදල් සඳහා - වාර්ෂිකව සියයට පහක (5%) පොලී ප්‍රතිශතයක්

8.7 **ණය ආපසු ගෙවීමේ කාල සීමාව**

ඇමුණුම II හි දක්වා ඇති නිර්දේශිත කාල සීමාවට යටත්ව උප ව්‍යාපෘතියේ ඉපැයීමේ ධාරිතාව සැලකිල්ලට ගෙන ව්‍යාපෘතියේ අවශ්‍යතාවය මත පදනම්ව වසරක උපරිම සහන කාලය ද ඇතුලත්ව උපරිම වශයෙන් අවුරුදු 5 කි.

8.8 **ණය සහන කාලය**

උප ණය ගැනුම්කරු විසින් සහභාගීත්ව මූල්‍ය ආයතනය වෙත කරනු ලබන ඉල්ලීම සැලකිල්ලට ගෙන වසරක උපරිම ණය සහන කාල සීමාවක් ලබාදෙනු ලබන අතර ණය සහන කාලය තුළ උප ණය ගැනුම්කරු විසින් එම කාලයට අදාල පොලිය ගෙවිය යුතුය.

8.9 **ඇප සුරැකුම්**

ක්ෂේත්‍ර පරීක්ෂණ වලදී තහවුරු කරන ලද ව්‍යාපෘති වල ශක්‍යතාව සහ අගයදාමයේ පිළිගත් ගැනුම්කරුවන්/වටිනාකම් දාම හවුල්කරුවන් සමඟ ඇතිකරගත් වෙළඳපොල සම්බන්ධතා සැලකිල්ලට ගෙන වටිනාකම්දාම ණය ලබා දෙන ලෙස සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත උපදෙස් දෙනු ලැබේ. ඒ අනුව, වටිනාකම්දාම සහභාගීත්ව සහතිකය හෝ ණය ලබාගැනීමේදී වෙළඳපොලක් පවතින බව සහතික කරමින් කෘෂිකාර්මික වටිනාකම් දාම ගැනුම්කරුවෙකු/වටිනාකම් අගයදාම සහභාගීකරුවෙකු විසින් ලබා දී ඇති තහවුරු කිරීමක් ඇපකරයක් ලෙස සහභාගීත්ව මූල්‍ය ආයතනයට ණය ලබාදීමේදී සලකා බැලිය හැකිය.

9. **ණය ගැනුම්කරුවන් ලියාපදිංචි කිරීම**

9.1 කෘෂිකාර්මික අගයදාමයන් හි උප ණයගැතියන් හඳුනාගැනීම, එම උප ණය ගැනුම්කරුවන්ගෙන් ණය අයදුම්පත් එක්රැස් කිරීම සහ මෙම මෙහෙයුම් උපදෙස් හි දක්වා ඇති මෙහෙයුම් ක්‍රියාවලියට අනුගතවිය යුතු ආකාරය දක්වමින් සහභාගීත්ව මූල්‍ය ආයතනයන් හි ප්‍රධාන කාර්යාල විසින් ශාඛා නිලධාරින්ට අදාල මාර්ගෝපදේශ හා උපදෙස් නිකුත් කිරීම හා ලබාදීම සිදුකළ යුතුය.

9.2 ඇමුණුම III හි දක්වා ඇති පරිදි නිසි ලෙස සම්පූර්ණ කරන ලද ණය ලියාපදිංචි කිරීමේ ආකෘති පත්‍රය සහ අනෙකුත් ලියකියවිලි අදාල ශාඛා විසින් තම ප්‍රධාන කාර්යාලයට ඉදිරිපත් කළ යුතුය. සුදුසුකම්ලත් ණයගැතියෙකු මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ලියාපදිංචි කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලි සහභාගීත්ව මූල්‍ය ආයතනයේ ප්‍රධාන කාර්යාලය මගින් අධ්‍යක්ෂ/ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය.

(අ) ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකය *

(ආ) සේවක අර්ථසාදක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට ගෙවීම පිළිබඳ වාර්තාවන් වල පිටපත් *

(ඇ) බදු ගෙවීම පිළිබඳව වාර්තාවන් වල පිටපත් *

(ඈ) ඕනෑම මිලදී ගැනීමකට අදාළව මෑතකදී ගත් මිල කැඳවීම්/ඉන්වොයිසි

(ඉ) ව්‍යාපෘති ඇගයීම් වාර්තාව

(ඊ) ව්‍යාපෘතියේ යෝග්‍යතාවය හා ශක්‍යතාව සනාථ කරන වෙනත් සහතික

* රුපියල් මිලියනය ඉක්ම වූ ණය සහ වගාවන් නොවන ක්‍රියාකාරකම් සඳහා අදාළ වේ.

9.3 ඇමුණුම III හි දක්වා ඇති පරිදි නිසි පරිදි සම්පූර්ණ කරන ලද ණය ලියාපදිංචි කිරීමේ ආකෘති පත්‍රය හි දෘඩ පිටපතක් අධ්‍යක්ෂක/ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමෙන් දේශීය කෘෂිකාර්මික සංවර්ධන නියමු ව්‍යාපෘතිය යටතේ ණය ලබා ගැනීමට අපේක්ෂා කරන අයදුම්කරුවන්ගේ තොරතුරු සහභාගි වන මූල්‍ය ආයතනය හි ප්‍රධාන කාර්යාලය විසින් ඉදිරිපත් කළ යුතුය. තනි පුද්ගල ණයගැතියකු හෝ ණයගැතියන් කිහිප දෙනෙකුගේ ඉල්ලීම සැලකිල්ලට ගනිමින්, එක් ණය ලියාපදිංචි කිරීමේ ආකෘති පත්‍රයක අයදුම්කරුවන් කිහිප දෙනෙකු ඇතුළත් කළ හැකිය.

9.4 ඉහත 9.2 වගන්තියේ දක්වා ඇති සියලුම අතිරේක ලියකියවිලි සහභාගිත්ව මූල්‍ය ආයතනයෙ හි ප්‍රධාන කාර්යාලය භාරයේ තබා ගත යුතුය.

9.5 ණය ලියාපදිංචි කිරීමේ සෑම ආකෘති පත්‍රයක් මගින්ම ප්‍රාදේශීය ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවට ලබා දී ඇති තොරතුරු වල නිරවද්‍යතාවය හා අනුකූලතාවය සහභාගිත්ව මූල්‍ය ආයතනයේ ප්‍රධාන කාර්යාලය විසින් සහතික කළ යුතුය.

9.6 ණය ලියාපදිංචි කිරීමේ ආකෘති පත්‍රයෙහි දක්වා ඇති තොරතුරු මත පදනම්ව සහ දේශීය කෘෂිකාර්මික සංවර්ධන නියමු ව්‍යාපෘතිය යටතේ පවතින අරමුදල් ප්‍රමාණයට යටත්ව උප ණය ගැනුම්කරුවන් ගේ ණය අයදුම්පත් ලැබීමේ පිළිවෙල අනුව ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් එම අයදුම්පත් ලියාපදිංචි කරනු ඇත.

9.7 ණය අයදුම්පත් ලියාපදිංචි කිරීමේදී ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවට තොරතුරු හෝ පැහැදිලි කිරීම් තවදුරටත් අවශ්‍ය වුවහොත් ලියාපදිංචි කිරීමේ අයදුම්පත සහභාගිත්ව මූල්‍ය ආයතනය වෙත යොමු කිරීමේ අයිතිය ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව සතු වේ.

9.8 උප ණය ගැනුම්කරු ලියාපදිංචි කිරීමෙන් පසු, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් එක් එක් උප ණය ගැනුම්කරුට හිමි ලියාපදිංචි අංකය අදාළ සහභාගිත්ව මූල්‍ය ආයතනයෙහි ප්‍රධාන කාර්යාලයට දන්වනු ඇත. ණය යෝජනා ක්‍රමයේ උප ණය ගැනුම්කරු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ ඇති ඕනෑම ලිපි හුවමාරුවක් හෝ විමසීමක් සඳහා මෙම ලියාපදිංචි අංකය භාවිතා කළ යුතුය.

9.9 ණය ලියාපදිංචි කිරීමේ ආකෘති පත්‍රයෙහි දක්වා ඇති තොරතුරුවල කිසියම් විෂමතාවයක් දක්නට ලැබුනහොත්, 9.10 වගන්තිය ප්‍රකාරව මේ සම්බන්ධයෙන් අදාළ සහභාගිත්ව මූල්‍ය ආයතනය කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති නම් සහභාගිත්ව මූල්‍ය ආයතනය වෙත දින 14 ක දැනුම්දීමකට යටත්ව තොරතුරු සාවද්‍ය බව තහවුරු වුවහොත් අදාළ උප ණය ගැනුම්කරුගේ ලියාපදිංචිය අවලංගු කිරීමේ අයිතිය ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව සතුය. කෙසේ වෙතත්, අධ්‍යක්ෂක/ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිමූල්‍ය නිකුත් කිරීමෙන් පසු කිසියම් විෂමතාවයක් නිරීක්ෂණය කළහොත්, මෙම දිනය වන විට ප්‍රතිමූල්‍යකරණය කළ හෝ ඉතිරිව ඇති මුදල නැවත කැඳවීමේ අයිතිය ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව සතු වන අතර, ණයගැතියාගෙන් අමතර මුදලක් අය නොකොට සහභාගිත්ව මූල්‍ය ආයතනය විසින් ගෙවිය යුතු මුළු මුදල ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ප්‍රේෂණය කළ යුතුය.

9.10 ඉහත 9.9 වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් යොමු කරන ලද දැන්වීමක් ලැබීමෙන් පසු, සහභාගිත්ව මූල්‍ය ආයතනය විසින් විමසන කරුණු පිළිබඳව පැහැදිලි කිරීමක් සැපයීමට අදහස් කරන්නේ නම් සහ එවැනි දැනුම්දීමක් ලැබී දින 14 ක් ඇතුළත එම කරුණට අදාළ පැහැදිලි කිරීම් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත වහාම ලබාදිය යුතු අතර ඒ පිළිබඳ අවසන් තීරණය අධ්‍යක්ෂ/ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ගනු ලැබේ.

10. උප ණය මුදා හැරීම

10.1 ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි කිරීමෙන් සති 3 ක් ඇතුළත සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් ලියාපදිංචි උප ණය ගැනුම්කරුවන් සඳහා උප ණය මුදල මුදාහළ යුතුය.

10.2 නියමිත කාල සීමාව තුළ උප ණයක් මුදාහැරීමට සහභාගිත්ව මූල්‍ය ආයතනයට නොහැකි නම්, ලියාපදිංචි කරන ලද ණය ලබා දීම ප්‍රමාද වීම සම්බන්ධයෙන් පිළිගත හැකි හේතු හෝ හේතු වූ කරුණු වහාම ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවට දැනුම් දිය යුතු අතර ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ප්‍රමාදයට හේතු වූ කරුණු සලකා බලා ඒ සම්බන්ධයෙන් සුදුසු තීරණයක්/ක්‍රියාමාර්ග ගනු ඇත.

10.3 සහභාගිත්ව මූල්‍ය ආයතන උප ණය මුදාහැරීමට අපොහොසත් වුවහොත් සහ එවැනි ලියාපදිංචිය දැනුම් දීමෙන් දින 30 ක් ඇතුළත වලංගු හේතු ඉදිරිපත් කිරීමට නොහැකි වුවහොත් සහභාගිත්ව මූල්‍ය ආයතනය වෙත පූර්ව දැනුම්දීමකින් තොරව ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් උප ණය ගැනුම්කරුවන්ගේ ලියාපදිංචිය අවලංගු කරනු ඇත.

11. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රතිමූල්‍ය ලබා දීමේ ක්‍රියා පටිපාටිය

11.1 පහත සඳහන් පරිදි ලියාපදිංචි උප ණය ගැනුම්කරුවන් හට උප ණය මුදා හැරීමෙන් පසු ප්‍රතිමූල්‍ය සඳහා අයදුම් කිරීමට සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් පහත සඳහන් අයදුම්පත් සම්පූර්ණ කළ යුතුය.

(i) ප්‍රතිමූල්‍ය අයදුම්පතෙහි ප්‍රකාශය - ඇමුණුම IV

(ii) ණය මුදාහැරීම සඳහා වන අයදුම්පත්‍රය - ඇමුණුම V

(iii) ඉල්ලුම් පොරොන්දු පත්‍රය - ඇමුණුම VI

(iv) භාරදීමේ ලිපිය - ඇමුණුම VII

(v) ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයට ඇප වන බවට ලබාදෙනු ලබන ප්‍රතිඥාව - ඇමුණුම VIII

(vi) මුදාහැරීමේ ලිපිය - ඇමුණුම IX

11.2 සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් මුදාහරින ලද ණය වලට අදාලව ප්‍රතිමූල්‍ය ලබා ගැනීම සඳහා සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් ඇමුණුම IV, V සහ VI ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඉදිරිපත් කළ යුතුය.

11.3 නිසි පරිදි පුරවන ලද ඇමුණුම VII, VIII සහ IX සහභාගිත්ව මූල්‍ය ආයතනයන් හි ප්‍රධාන කාර්යාලයේ තබා ගත යුතු අතර ඒවා අවශ්‍ය වූ විට ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඉදිරිපත් කළ යුතුය.

11.4 ණය මුදාහැරීම සඳහා වන අයදුම්පත (ඇමුණුම IV) සමඟ ප්‍රතිමූල්‍ය ණය අයදුම්පතෙහි ප්‍රකාශය (ඇමුණුම V) සහ ඉල්ලුම් පොරොන්දු පත්‍රයෙහි (ඇමුණුම VI) තොරතුරු සම්පූර්ණ කිරීම පිළිබඳව ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව, සෑහීමකට පත්වීමෙන් පසු එම ප්‍රතිමූල්‍ය අයදුම්පත් අනුමත කරනු ලබන අතර ඉහත සඳහන් කළ පරිදි නිසිලෙස සම්පූර්ණ කරන ලද ප්‍රතිමූල්‍ය අයදුම්පත් ලැබීමෙන් පසු වැඩකරන දින 14 ක් ඇතුළත එම අයදුම්පත් ලැබීමේ පිළිවෙලට ප්‍රතිමූල්‍ය පහසුකම් ලබාදෙනු ඇත.

11.5 ලියාපදිංචි උප ණයගැතියෙකුට ණය ලබා දී දින 30 ක් ඇතුළත ප්‍රතිමූල්‍ය පහසුකම් සඳහා හිමිකම් පෑමට අදාල අයදුම්පත් සහභාගිත්ව මූල්‍ය ආයතනය තම ප්‍රධාන කාර්යාල මඟින් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය.

11.6 සහභාගිත්ව මූල්‍ය ආයතන ශාඛා විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත සෘජුවම ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් සඳහා ප්‍රතිමූල්‍ය පහසුකම් ලබා නොදෙනු ඇත.

12. ණය ආපසු අයකර ගැනීම

12.1 එක් එක් උප ණය සඳහා අදාළ වන කොන්දේසිවලට අනුව උප ණයගැතියාගෙන් වාරික මුදල සහ පොලි මුදල් අයකර ගත යුතුය.

12.2 දේශීය කෘෂිකාර්මික සංවර්ධන නියමු ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදාහරින ලද ප්‍රතිමූල්‍ය පහසුකම් මත පදනම්ව සහ එක් එක් උප ණය ගැනුම්කරුවන් සඳහා වන ණය ආපසු ගෙවීමේ කාල රාමුවට අනුකූලව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත නිකුත් කරන ප්‍රතිමූල්‍ය පහසුකම් සඳහා වන වාරික සහ පොලි මුදල් පිළිබඳ ලේඛණයට අනුව අර්ධ වාර්ෂිකව එනම් සෑම වසරකම ජූනි මස 30 වන දිනයෙහි සහ දෙසම්බර් මස 31 වැනි දිනයේදී ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ප්‍රේෂණය කළ යුතුය.

13. ලේඛන වල භාරකාරත්වය

13.1 සෑම උප ණයගැතියෙකුම පරීක්ෂා කිරීම සඳහා අදාල ණය ඇගයීම් කිරීම පිළිබඳ සියලු සාක්ෂි සහ ලේඛන සහභාගිත්ව මූල්‍ය ආයතන සතුව තබා ගැනීමට සෑම සහභාගිත්ව මූල්‍ය ආයතනයක්ම කටයුතු කළ යුතු අතර එවැනි ඕනෑම ලේඛනයක් විමසූ විටක ඒවා පරීක්ෂා කිරීමට හෝ ගෙන්වා ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුවට හැකියාව ඇත.

13.2 සහභාගිත්ව මූල්‍ය ආයතනයන් හි අභිමතය පරිදි, ඉහත 9.2 සහ 11.1 වගන්තිවලට අදාල නොවන නමුත් දේශීය කෘෂිකාර්මික සංවර්ධන නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අදාළ වෙනත් ලියකියවිලි පවතී නම් ඒවා සහභාගිත්ව මූල්‍ය ආයතනයේ ප්‍රධාන කාර්යාලය හෝ සහභාගිත්ව මූල්‍ය ආයතන ශාඛාවන් භාරයේ රඳවා තබාගත හැකිය.

14. ණය යෝජනා ක්‍රමය අධීක්ෂණය

14.1 ණය යෝජනා ක්‍රමය යටතේ මුදා හරින ලද ණය වල ශක්‍යතාව පිළිබඳව ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සෘජුවම අධීක්ෂණය කරනු ලබන අතර අවශ්‍ය විටකදී ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාල වල නිලධාරීන්ගේ සහාය ද ලබා ගනු ඇත.

15. ගිණුම් විගණනය

15.1 ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් දේශීය කෘෂිකාර්මික සංවර්ධන නියමු ව්‍යාපෘතිය යටතේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ඇති අතර විගණනය සඳහා එවැනි මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

15.2 තවද, දේශීය කෘෂිකාර්මික සංවර්ධන නියමු ව්‍යාපෘතිය යටතේ සිදුකරන ලද තක්සේරු කිරීම් නිසි පරිදි සිදුවී ඇත්දැයි තහවුරු කර ගැනීමට සහ උප ණය ගැනුම්කරුවන්ගෙන් සිදුවන පාඩු තක්සේරු කිරීම සඳහා සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් විශේෂ අභ්‍යන්තර විගණනයක් සිදු කළ යුතුය.

16. සහභාගිත්ව මූල්‍ය ආයතනයන් හි කාර්යභාරය සහ වගකීම්

මෙම ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් ක්‍රියාකාරී භූමිකාවක් ඉටු කළ යුතුය. එමෙන්ම මෙම මෙහෙයුම් උපදෙස් වල සඳහන් කර ඇති අවශ්‍යතාවන්ට අමතරව, පහත සඳහන් කරුණු වලට අනුකූලව සහභාගිත්ව මූල්‍ය ආයතන කටයුතු කළ යුතු වේ.

16.1 වටිනාකම් අගයදාම සහභාගීකරුවන්, විශේෂයෙන් කුඩා ව්‍යවසායකයින්ගේ ව්‍යාපාර වැඩිදියුණු කිරීමට හා තාක්ෂණික දැනුම ඉහළ නැංවීමටත්, වටිනාකම් අගයදාම සහභාගීකරුවන් අතර වෙළඳපල සම්බන්ධතා ඇති කිරීමටත් අවශ්‍ය සහය ලබාදීම.

16.2 දේශීය කෘෂිකාර්මික සංවර්ධන නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ සම්බන්ධ වීමට සහ කෘෂිකාර්මික සංවර්ධන නියමු ව්‍යාපෘතියට අදාළ ණය යෝජනා ක්‍රමයේ අඛණ්ඩ ක්‍රියාකාරිත්වය පවත්වා ගැනීමට සහභාගිත්ව මූල්‍ය ආයතනයන්හි ප්‍රධාන කාර්යාලයේ නිලධාරියෙකු පත් කළ යුතු ය.

16.3 උප ණය ගැනුම්කරුවන්ට ණය ලබා දීමේ සහ නියමිත පරිදි ප්‍රතිමූල්‍ය අයකර ගැනීමේ සම්පූර්ණ වගකීම ගැනීම.

16.4 ණය යෝජනා ක්‍රමයේ ක්‍රියාකාරිත්වය සහ එහි මෙහෙයුම් පිළිබඳ නිරන්තර අධීක්ෂණය සිදු කිරීම සහ සහභාගිත්ව මූල්‍ය ආයතනයන්හි අලාභ අවම කර ගැනීම සඳහා අවශ්‍ය අවස්ථාවන්හිදී කඩිනම් ක්‍රියාමාර්ග ගනිමින් මෙම යෝජනා ක්‍රමය සඳහා වෙනම ණය ගිණුමක් පවත්වාගෙන යාම.

16.5 ගිණුම් හා මූල්‍ය ප්‍රකාශන පවත්වාගෙන යාම.

(i) අන්‍යෝන්‍ය ණය, උප ණය ඇගයීම්, අනුමත කිරීම්, මුදාහැරීම් සහ ණය ආපසු අයකර ගැනීම් දැක්වීම සඳහා සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් සුදුසු ලෙජර ගිණුම් සහ වාර්තා පවත්වා ගැනීම.

(ii) සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් මෙම යෝජනා ක්‍රමයට අදාලව මුදල් නිදහස් කිරීම හා ප්‍රතිමූල්‍ය ලබාගැනීම සඳහා වෙනම ගිණුමක් පවත්වාගෙන යාම.

(iii) සහභාගි වන මූල්‍ය ආයතන විසින් මෙම යෝජනා ක්‍රමයට අදාළ ගිණුම් හා මූල්‍ය ප්‍රකාශන, ගිණුම් ගනුදෙනු සහ ශේෂය තහවුරු කිරීම ඇතුළු ඕනෑම තොරතුරක් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව ඉල්ලා සිටින ඕනෑම අවස්ථාවකදී ඉදිරිපත් කළ යුතුය.

17. ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යභාරය

මෙහෙයුම් උපදෙස් වල දක්වා ඇති කාර්යයන්ට අමතරව, මෙම ණය යෝජනා ක්‍රමය සාර්ථකව සිදුකරගෙන යාම සඳහා ක්‍රියාත්මක කිරීමේ ආයතනය ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවට පහත සඳහන් කාර්යයන් පිළිබඳව අවධානය යොමු කරනු ඇත.

17.1 මෙහෙයුම් උපදෙස් නිකුත් කිරීම සහ එම මෙහෙයුම් උපදෙස් අවශ්‍ය අවස්ථාවන් හිදී සංශෝධනය කිරීම.

17.2 ණය යෝජනා ක්‍රමයේ අධීක්ෂණ කටයුතු හා ඇගයීම් ක්‍රියාවලිය සිදු කිරීම සහ කලින් කලට අවශ්‍ය ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ගැනීම.

17.3 අත්‍යවශ්‍ය යැයි හැඟුණ අවස්ථාවන්හි දී ක්ෂේත්‍ර පරීක්ෂණ පැවැත්වීම, සහභාගිත්ව මූල්‍ය ආයතන වෙත ගොස් ලෙජර්, පොත් සහ ලේඛන ආදිය පරීක්ෂා කිරීම සහ වෙනත් අධීක්ෂණ ක්‍රියාමාර්ග ගැනීම.

17.4 අනෙකුත් අදාළ ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම සහ අවශ්‍ය වූ විටදී දැනුම්වත් කිරීමේ වැඩසටහන්, තාක්ෂණික වැඩමුළු සහ වෙළඳපොල සම්බන්ධතා වැඩසටහන් පැවැත්වීම සඳහා සහභාගිත්ව මූල්‍ය ආයතන වලට සහාය ලබාදීම.

17.5 තෝරාගත් වටිනාකම් අගයදාම සහභාගීකරුවන් සඳහා මූල්‍ය සාක්ෂරතා වැඩසටහන් පැවැත්වීම සහ අගයදාම මූල්‍යකරණය පිළිබඳ සහභාගිත්ව මූල්‍ය ආයතනයන් හි නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

18. වෙනත්

ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ සතුව පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කිරීමට අයිතිය පවති.

18.1 2021.05.04 දිනැති අංක: RDD/DAD-PP/2021/01 හි දරන මෙහෙයුම් උපදෙස් හි නියමයන් හා කොන්දේසි අවශ්‍ය අවස්ථාවනහි දී සංශෝධනය කිරීම,

18.2 දේශීය කෘෂිකාර්මික සංවර්ධන නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සහභාගිත්ව මූල්‍ය ආයතනය වෙත මාර්ගෝපදේශ නිකුත් කිරීම සහ අවශ්‍ය වූ විට එම මාර්ගෝපදේශ සංශෝධනය කිරීම,

18.3 මෙම මෙහෙයුම් උපදෙස් වලට අනුකූලව කටයුතු නොකරන බව නිරීක්ෂණය වුවහොත්, ගිවිසුමේ සඳහන් නියමයන් හා කොන්දේසි වලට අනුව, දේශීය කෘෂිකාර්මික සංවර්ධන නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන ඕනෑම සහභාගිත්ව මූල්‍ය ආයතනයක් ඉවත් කිරීම සහ

18.4 ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන වෙනත් ණය යෝජනා ක්‍රම මඟින් අවශ්‍ය මූල්‍ය පහසුකම් ලබා ගැනීම සඳහා මෙම ණය යෝජනා ක්‍රමය යටතේ සුදුසුකම් ලත් උප ණය ගැනුම්කරුවන් යොමු කිරීම,

බී. එල්. ජේ. එස්. බාලසූරිය
අධ්‍යක්ෂ,
ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

උප ග්‍රන්ථය 1

දේශීය කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහනේ නියමු ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කරනු ලබන කෘෂිකාර්මික අගයදාමයන් හි දළ සටහන



සටහන 2- එළවළු ආශ්‍රිත අගය දාමය



සටහන 3- කිරි ආශ්‍රිත අගය දාමය



සටහන 4 - අපනයන බෝග ආශ්‍රිත ආගයදාමය (කුළු බඩු)

උප ග්‍රන්ථය 2

අගයදාම සහභාගීවන්නන්ගේ මූල්‍ය අවශ්‍යතා

අගයදාමය තුළ සහභාගිවන්නන්ගේ භාණ්ඩය	අවශ්‍යතාවයන්	නිර්දේශිත මූල්‍ය පහසුකම්
යෙදවුම් සැපයුම්කරුවන්	ගොවීන්ගේ අවශ්‍යතාවය පරිදි තොග වශයෙන් යෙදවුම් ප්‍රසම්පාදනය. (බීජ, පොහොර, යන්ත්‍රෝපකරණ සහ උපකරණ ආදිය)	ප්‍රධාන වශයෙන් කෙටිකාලීන* කාරක ප්‍රාග්ධන ණය
කුඩා වතු හිමියන්	වගා පිරිවැය සපුරාලන පරිදි අවශ්‍ය ව්‍යුහයන් සහ උපකරණ සහිත තිරසර ගොවිපල ඒකකයන් ස්ථාපනය කිරීම.	අවුරුදු 3 සිට 5 දක්වා ණය ආපසු ගෙවීමේ කාලයක් සහිත ප්‍රාග්ධන ආයෝජන ණය කෙටි කාලීන වගා ණය ගබඩා කිරීම සඳහා ගුදම් කුවිතාන්සි ණය මුදල් ලැබීම
භාණ්ඩ එකතු කරන්නන් ප්‍රවාහකයන් බෙදාහරින්නන්	ජාත්‍යන්තර/ශ්‍රී ලංකා ප්‍රමිතීන්ට අනුකූලව භාණ්ඩ එකතු කිරීමට සහ ගබඩා කිරීමට ව්‍යුහයන් ඉදිකිරීම සහ ප්‍රති සංශෝධනය කිරීම. භාණ්ඩ ප්‍රසම්පාදනය සඳහා ඩීසල් ට්‍රක්/වෙනත් උපකරණ සහ කාරක ප්‍රාග්ධනය	අවුරුදු 3 සිට 5 දක්වා ණය ආපසු ගෙවීමේ කාලයක් සහිත ප්‍රාග්ධන ආයෝජන කෙටිකාලීන කාරක ප්‍රාග්ධන ණය අගයදාමය තුළ භාණ්ඩ මිලදී ගන්නන් සමඟ එකඟතාවයකින් යුතුව Factoring පහසුකම් සකස් කළ හැකිය.
සකසන්නන් අගය එකතු කළ නිෂ්පාදනයන් හි නිරත නිෂ්පාදකයින් ගබඩාකරුවන් අපනයනකරුවන්	ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව අගය එකතු කළ නිෂ්පාදනයන් නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය අති නවීන තාක්ෂණය සහ ව්‍යුහයන් යොදා ගැනීම. යන්ත්‍රෝපකරණ සහ ගබඩා උපකරණ ගොවීන්ගෙන් හෝ එකතු කරන්නන්ගෙන් අමුද්‍රව්‍ය ප්‍රසම්පාදනය කිරීම හෝ සකසන්නන්ගේ හෝ නිෂ්පාදකයින්ගේ නිමි භාණ්ඩ අපනයන කටයුතු සිදුවෙන තුරු මුදල් අරමුදල් අවශ්‍යතා සපුරාලීම	අවුරුදු 3 සිට 5 දක්වා ආපසු ගෙවීමේ කාලය සමඟ ප්‍රාග්ධන ආයෝජන කෙටිකාලීන කාරක ප්‍රාග්ධන ණය ගුදම් කුවිතාන්සි ණය පහසුකම් අවශ්‍යතාවයට අනුව සම්මත අපනයන ණය පහසුකම් හෝ Factoring පහ සුකම්
සිල්ලර වෙළෙන්දන්	නිෂ්පාදකයෙකු සමඟ ජාලයක ලියාපදිංචි වී සිටින සිල්ලර වෙළෙන්දන් හෝ තෝරාගත් අගයදාමයක සිටින බෙදාහරින්නෙකු භාණ්ඩ නිෂ්පාදන ප්‍රසම්පාදනය සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.	දාමය තුළ සිටින නිෂ්පාදකයන් සහ බෙදාහරින්නන්ගේ නිර්දේශය මත

ඇමුණුම III

මෙහෙයුම් උපදෙස් අංක RDD/RF/LS/YEAR/No:

ණය ලියාපදිංචි කිරීමේ අයදුම්පත : ණය යෝජනා ක්‍රමය*

අයදුම්පත් අංකය : .....

ණය යෝජනා ක්‍රමය : .....

සහභාගිත්ව මූල්‍ය ආයතනයේ නම : .....

	සහභාගිත්ව මූල්‍ය ආයතන පිළිබඳ තොරතුරු			ණය ගැනුම්කරු පිළිබඳ තොරතුරු								ව්‍යාපෘතිය පිළිබඳ තොරතුරු								වියදම් ඇස්තමේන්තුව සහ අනුමැතිය		
අංකය	බැංකු ශාඛාව	දුරකථන/ෆැක්ස්	අගය දාමයේ නම	අයදුම්කරුගේ නම/ව්‍යාපාරයේ නම	ලිපිනය	ජාතික හැඳුනුම්පත් අංකය	අයදුම්කරුගේ දුරකථන අංකය	ව්‍යාපාර ලියාපදිංචි අංකය	ස්ත්‍රී/ පුරුෂ ආවයා	ඉහළම අධ්‍යාපන සුදුසුකම	දිස්ත්‍රික්කය	ව්‍යාපෘතියේ ස්වභාවය	අංශය/ ව්‍යාපෘතිය ක්ෂේත්‍රය	ව්‍යාපෘතියේ ස්වභාවය	වාර්ෂික පිරිවැටුම (රු.)	දැනට සිටින සේවකයන් ගණන (ස්ථිර/තාවකාලික)	අපේක්ෂිත රැකියා උත්පාදනය (වසර 1-3)	ව්‍යාපෘතියේ තක්සේරු වටිනාකම (රු.)	ණය ගැනුම්කරුගේ දායකත්වය (රු.)	අපේක්ෂිත අර්මුදල් අවශ්‍යතාවය (රු.)	සහභාගිත්ව මූල්‍ය ආයතනය මගින් අනුමත කරන ලද මුදල (රු.)	ශ්‍රී ලංකා මහ බැංකුවේ භාවිතයට පමණි

ඉහත විස්තර කරන ලද තොරතුරු ශාඛා මට්ටමින් අනුමත කරන ලද අයදුම්පත/ත් සලකා බලා, ඇමුණුම III ශ්‍රී ලංකා මහ බැංකුවට ඉදිරිපත් කිරීමට ප්‍රථම මා විසින්/ ප්‍රධාන කාර්යාලයේ ණය නිලධාරියා විසින් නිසි පරිදි පරීක්ෂා කරන ලද බවට සහතික වෙමි. තවද මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ලියාපදිංචි කිරීම සඳහා ඉහත සඳහන් කරන ලද ණය ගැනුම්කරු/වන් ශ්‍රී ලංකා මහ බැංකුවේ මෙහෙයුම් උපදෙස්වලට අනුකූල බවත් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එවැනි ණය ගැණුම්කරුවන් ලියාපදිංචි කිරීමෙන් පසු ලබා දී ඇති කාල සීමාව තුළ ශාඛා ජාලය හරහා අරමුදල් නිදහස් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බවටත් මෙයින් සහතික වෙමි.

දිනය.....

ප්‍රධාන කාර්යාලයේ බලයලත් නිලධාරියාගේ අත්සනඃ .....

රබර් මුද්‍රාවඃ .....

ඇමුණුම IV

ප්‍රතිමූල්‍ය අයදුම්පත් අංකය :-.....

(2021/05/04 දිනැති මෙහෙයුම් උපදෙස් අංක RDD/DAD-PP/2021/01 අනුකූලව)

ලිපිනය:

දිනය:

ගෘහස්ථ කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහනේ නියමු ව්‍යාපෘතිය යටතේ
ප්‍රතිමූල්‍ය අයදුම්පත

ශ්‍රී ලංකා මහ බැංකුව වෙත.

මහත්මයාණෙනි,

..... (සහභාගිත්ව මූල්‍ය ආයතනයේ නම) වන අප මුදල් නීති පනතේ (422 පරිච්ඡේදයේ) 88 F වගන්තිය අනුව සහ එහි වරින් වර සිදුවන සංශෝධනයන් අනුව ලියාපදිංචි වාණිජ බැංකුවක්/ ලියාපදිංචි විශේෂිත බැංකුවක් බවට සහතික කරන ලද ව්‍යවස්ථාවලියේ පිටපතක් මේ සමඟ ඔබ වෙත එවා ඇති අතර, මුදල් නීති පනතේ 88A වගන්තියේ ප්‍රතිපාදන අනුව උක්ත ණය යෝජනා ක්‍රමය යටතේ රුපියල්.....

.....(රු. .....) ණය මුදල අයදුම් කරමු.

2. මෙම අයදුම්පත ඉදිරිපත් කිරීමේදී ඔබගේ 2021.05.04 දිනැති මෙහෙයුම් උපදෙස් අංක RDD/DAD-PP/2021/01 හි සඳහන් නියමයන් හා අවශ්‍යතාවන්ට අනුකූල වන බවට අපි එකඟ වෙමු.

3. ඉහත සඳහන් කරන ලද මෙහෙයුම් උපදෙස් මඟින් අවශ්‍ය පරිදි සහ එයට අනුකූලව "DAD-PP" ණය යෝජනා ක්‍රමය යටතේ මෙම අයදුම්පත ඉදිරිපත් කළ දිනට මාස 6කට පෙර අප විසින් ලබා නොදුන් ණය අනු පිටපත් වල ප්‍රකාශනයක් අප මේ සමඟ එවා ඇත. මෙම ප්‍රකාශනයෙහි සඳහන් ණය කිසිවක් ප්‍රතිමූල්‍ය ණය සඳහා මීට පෙර ඉදිරිපත් කරන ලද කිසිම ප්‍රකාශනයක සඳහන් නොවන බවට සහතික කරමු.

4. මෙම අයදුම්පතෙහි දක්වා ඇති පරිදි ඔබ අප වෙත මුදාහරින ලද මුදල් වාරික ..... (වාරික ගණන) කින් ආපසු ගෙවීමට එකඟ වන අතර, සෑම අර්ධ වාර්ෂික වාරිකයක් සඳහා රු. ..... බැගින් පළමු වාරිකය ..... දින සිට ඔබ වෙත ගෙවීමට එකඟ වෙමු.

5. (i) තුන්වන ඡේදයේ සඳහන් ණයගැතියන් සඳහා ලබාදුන් ණය ඔවුන්ගේ ණය ගැනීමේ හැකියාවට යටත්ව ලබාදුන් බවටත්,

   (ii) එම ණය ආපසු ගෙවීම සඳහා ලබාගත් ඇපකර සම්බන්ධයෙන් සලකන විට එවැනි ඇප ලබාදීමට ඇපකරුවනට හැකියාවක් පවතින බවටත් අප විසින් සහතික වන බව මෙයින් දන්වා සිටිමු.

රබර් මුද්‍රාව

සහභාගිත්ව මූල්‍ය ආයතනයේ බලයලත්
නිලධාරියාගේ/නිලධාරින්ගේ නම, තනතුර, අත්සන
කළමනාකරු, ප්‍රතිමූල්‍ය ඒකකය

ඇමුණුම V

මෙහෙයුම් උපදෙස් අංක RDD/RF/LS/YEAR/No:

ණය මුදාහැරීම සඳහා අයදුම් පත්‍රය

අයදුම්පත් අංකය : .....

ණය යෝජනා ක්‍රමය : .....

සහභාගිත්ව මූල්‍ය ආයතනයේ නම : .....

අංකය	ශ්‍රී ලංකා මහ බැංකුව මගින් ලබාදෙන ලද ලියාපදිංචි අංකය	බැංකු ශාඛාව	අයදුම්කරුගේ නම : ව්‍යාපෘතියේ නම*	ශ්‍රී ලංකා මහ බැංකුව මගින් අනුමත කරන ලද මුදල (රු.)	ණය මුදාහැරීමේ අදියර	ශ්‍රී ලංකා මහ බැංකුව වෙතින් අපේක්ෂිත ප්‍රතිමූල්‍ය ප්‍රමාණය (රු.)	ශාඛාව මගින් ණය මුදල මුදාහල දිනය (DD/MM/YYYY)	අයදුම්කරුට ලබාදෙන ලද සහන කාලය	ශ්‍රී ලංකා මහ බැංකුවට ගෙවිය යුතු ණය වාරික ප්‍රමාණය	වාරික මුදල (රු.)	පළමු වාරිකය ගෙවීමට නියමිත දිනය (DD/MM/YYYY)	අවසන් වාරිකය ගෙවීමට නියමිත දිනය (DD/MM/YYYY)	අදාල දිනය වන විට අයදුම්කරුට මුදාහල මුළු ණය මුදල (රු.)	අයදුම්කරුට මුදාහැරීමට ඇති ඉතිරි මුදල (රු.)	ශ්‍රී ලංකා මහ බැංකුවේ නාමයට පමණි

ණය යෝජනා ක්‍රමය යටතේ නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස්වලට අනුකූලව ඉහත ණය මුදල ශ්‍රී ලංකා මහ බැංකුවට ගෙවීමට අප පොරොන්දු වන අතර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලබාදුන් මුදල ණය යෝජනා ක්‍රමයේ දක්වා ඇති අරමුණ සඳහාම පමණක් භාවිතා කරන බවටත් මෙයින් පොරොන්දු වෙමු.

ණය යෝජනා ක්‍රමය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද සෑම ණය අයදුම්කරුවෙකු සඳහාම අපගේ ශාඛා මගින් ලබාදෙන ලද ණය මුදාහැරීමේ සැලැස්ම/සැලසුම් අනුව සලකා බලා ඉහත සඳහන් විස්තර නිවැරදිව පුරවා ඇති බවට අප විසින් සහතික වෙමු. ඒ අනුව මෙම ණය යෝජනා ක්‍රමයේ අයදුම්කරුට/වන්ට නිකුත් කරන ලද ණය පියවීමට රු..... මුදලක් අප වෙත මුදා හරින ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ඉල්ලා සිටිමු. තවද, මෙහෙයුම් උපදෙස්වලට අනුකූලව අවශ්‍ය සියලු ලියකියවිලි/තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකුවට අවශ්‍ය වූ විට පරීක්ෂා කිරීම සඳහා ප්‍රධාන කාර්යාලයේ තබා ඇති බව ද තවදුරටත් දැනුම් දෙමු.

දිනය: .....

ප්‍රධාන කාර්යාලයේ බලයලත් නිලධාරියාගේ අත්සන : .....

රබර් මුද්‍රාව: .....

ඇමුණුම **VI**

මෙහෙයුම් උපදෙස් අංක : RDD/RF/LS/YEAR/NO

දිනය :.....

අයදුම්පත් අංකය :.....

ඉල්ලුම් පොරොන්දු පත්‍රය
(ණය යෝජනා ක්‍රමයේ නම)

රු:.....

ඉල්ලුම මත, ... (සහභාගීත්ව මූල්‍ය ආයතනයේ නම හා ලිපිනය) වන පහත අත්සන් තබනලද අප විසින් මුළු ණය මුදල වූ රුපියල් .....
.....
.....(රු. .....), වාර්ෂිකව ..... පොලී අනුපාතය යටතේ වූ අදාළ පොලී මුදල ද සමඟ මෙහි සඳහන් දිනට, ශ්‍රී ලංකා මහ බැංකුව හෝ ඉල්ලන පියවීම සිදු කරන බවට කොළඹදී මෙයින් පොරොන්දු වෙමු.

(සහභාගිත්ව මූල්‍ය ආයතනයේ නම) ප්‍රතිමූල්‍ය ඒකක/ප්‍රධාන කාර්යාලය වෙනුවෙන්

රබර් මුද්‍රාව

1. .....
2. .....

(බලයලත් නිලධාරීන්ගේ අත්සන්)

සාක්ෂි :

1. .....
2. .....

ඇමුණුම VII

ප්‍රතිමූල්‍ය අයදුම්පත් අංකය :.....

(2021/05/04 දිනැති මෙහෙයුම් උපදෙස් අංක RDD/DAD-PP/2021/01 අනුකූලව)

භාරදීමේ ලිපිය

කොළඹ
දිනය

ශ්‍රී ලංකා මහ බැංකුව වෙත.

මහත්මයාණෙනි,

මුදල් නීති පනතේ (422 පරිච්ඡේදයේ) 88 A වගන්තිය අනුව සහ එහි වරින් වර සිදුවන සංශෝධනයන් අනුව ඔබගේ 2021/05/04 දිනැති මෙහෙයුම් උපදෙස් අංක RDD/DAD-PP/2021/01 පරිදි දේශීය කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහනේ නියමු ව්‍යාපෘතිය (DAD-PP) යටතේ ණය ලබාදීම සලකා බලා අප වෙත ලබාදීමට එකඟ වූ ණය ප්‍රමාණය වන රුපියල් ..... (රු. .....) මුදල අපගේ පොරොන්දු නෝට්ටුවේ සඳහන් රුපියල් ..... (රු. .....) ක ගෙවිය යුතු මුදල හා ඉල්ලුම් කරන ලද පොළී මුදල ද සමඟ ඔබ වෙත මෙයින් එවනු ලැබේ.

ඉහත කී පොරොන්දු නෝට්ටුව ගෙවීම සඳහා ඉදිරිපත් කිරීමෙන් වැළකෙන අතර, එය අගරු කිරීම පිළිබඳව දැනුම් දීමේ අවශ්‍යතාවයක් ඇති නොවනු ඇත.

(සහභාගිත්ව මූල්‍ය ආයතනයේ නම)
ප්‍රතිමූල්‍ය ඒකකය
ප්‍රධාන කාර්යාලය වෙනුවෙන්

රබර් මුද්‍රාව

සාක්ෂි :

1. .....
2. .....

.....
(බලයලත් නිලධාරියාගේ අත්සන)

ඇමුණුම VIII

ප්‍රතිමූල්‍ය අයදුම්පත් අංකය :- .....

(2021/05/04 මෙහෙයුම් උපදෙස් අංක **RDD/DAD-PP/2021/01** අනුකූලව)

මුදල් නීති පනතේ (422 පරිච්ඡේදයේ) 88 A වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයට ඇප වන බවට ලබා දෙනු ලබන ප්‍රතිඥාව*

කොළඹ.

දිනය:

..... (සහභාගිත්ව මූල්‍ය ආයතනයේ නම හා ලිපිනය) වන අප, ශ්‍රී ලංකා මහ බැංකුවේ, 1963 අංක 11 දරන මූල්‍ය පනතේ 67 වගන්තිය සහ 1968 අංක 21 දරන මූල්‍ය නීති පනත (සංශෝධිත) මඟින් සංශෝධනය කරන ලද මුදල් නීති පනතේ 88 A වගන්තිය පරිදි ප්‍රතිඥා මාර්ගයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත අය විය යුතු ණය කුමක්ද යන්න ආකෘතියේ සඳහන් පරිදි සුරැකුමක් ලෙස/ තවදුරටත් සුරැකුම්පත් ලෙස පියවීමට ඇති රුපියල්..... ..... (රු. .....) සමඟ ..... වාර්ෂික අනුපාතිකය යටතේ පොලියද සමඟ ගෙවන බවට මෙයින් ප්‍රකාශ කර සිටිමු.

ආකෘතිය

ණය මුදල (රු)	ණයකරුගේ නම හා ලිපිනය	දිනය	නොතාරිස්

රබර් මුද්‍රාව

.....
බලයලත් නිලධාරියාගේ අත්සන
(සහභාගිත්ව මූල්‍ය ආයතනයේ නම)
ප්‍රතිමූල්‍ය ඒකකය
ප්‍රධාන කාර්යාලය වෙනුවෙන්

* බලපත්‍රලාභී වාණිජ බැංකු/ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා පමණි.

ඇමුණුම IX

මුදාහැරීමේ ලිපිය

(2021/05/04 දිනැති මෙහෙයුම් උපදෙස් අංක

RDD/DAD-PP/2021/01 අනුකූලව)

බැංකුවේ නම :
බැංකු කේත අංකය :
ශාඛාවේ නම :
ශාඛාවේ කේත අංකය :
ණය මුදලේ අනුක්‍රමික අංකය :
දිනය :
මුදාහැරීම :

1	2	3	4	5	6	7	8	9	10

දේශීය කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහනේ නියමු ව්‍යාපෘතිය යටතේ ණය මුදාහැරීමේ ප්‍රකාශය

විමසීම් අංකය :

1. **ණයකරුගේ තොරතුරු** :

   1.1 ණයකරුගේ නම :

   1.2 ණයකරුගේ ලිපිනය :

2. **ණය මුදලේ තොරතුරු** :

   2.1 ණය මුදලේ අරමුණ :

   2.2 ව්‍යාපෘතිය පිහිටි ප්‍රදේශය :

   2.3 ආරම්භයේදී අනුමත කරන ලද ණය මුදල : රු.

   ඉන් පසුව ණය මුදලේ වැඩි කිරීම : රු.

   මුළු මුදල : රු.

   =========

2.4 ණය මුදල අනුමත කරන ලද දිනය :

ණය මුදලේ වැඩි වීම අනුමත කරන ලද දිනය :

2.5 ප්‍රතිමූල්‍ය ඉල්ලුම් කළ ණය මුදල නැවත ගෙවන ආකාරය :

දිනය : වටිනාකම (රු.) :

2.6 පොළී අනුපාතිකය :

3. **ණය මුදලේ තත්ත්වය** :

   3.1 පෙර නිකුත් කළ මුදල් සහ) රු.

   ශ්‍රී ලංකා මහ බැංකුවෙන් හිමිකම් පාන ලද ප්‍රතිමූල්‍ය මුදල)

   3.2 මේ අවස්ථාවේ දී මුදා හරින ලද මුදල සහ) රු.

   ඒ සඳහා අපේක්ෂිත ප්‍රතිමූල්‍ය මුදල)

   මුළු මුදල රු.

   =======

ඉහත තොරතුරු සත්‍ය හා නිවැරදි බවට මම මෙයින් සහතික කරමි.

ශාඛා කළමනාකරුගේ අත්සන

දිනය :

රබර් මුද්‍රාව

ශාඛා කළමනාකරුගේ නම

- වාරිකය පළමු, දෙවන හෝ කී වැන්නද යන්න සුදුසු කොටුව තුළ කතිරයක් යොදා සඳහන් කරන්න.

ඇමුණුම I

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි
ව්‍යාපාර යොමුව : .....

ව්‍යාපෘති යෝජනාවේ ආකෘතිය (රුපියල් මිලියන 1ට වඩා අඩු ණය මුදල් සඳහා)

1. ව්‍යාපෘති අනන්‍යතාවය/විශ්ලේෂණය

1.1 ව්‍යාපෘති යොමුව :

1.2 ව්‍යාපෘති නාමය :

1.3 ව්‍යාපෘති ස්ථානය :

පළාත	දිස්ත්‍රික්කය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	ග්‍රාම නිලධාරි කොට්ඨාශය

1.4 ව්‍යාපෘති ස්ථානයේ ලිපිනය :

1.5 ව්‍යාපෘතියේ ස්වභාවය :

නව ව්‍යාපෘති		දැනට පවත්වාගෙන යනු ලබන ව්‍යාපෘති	

1.6 ව්‍යාපෘතියේ වර්ගය

එළවළු		කිරි		කුළුබඩු	

1.7 සම්පූර්ණ කරන ලද ව්‍යාපෘති සැලැස්ම භාරදුන් දිනය :

2. තනි පුද්ගල/ව්‍යාපාර තොරතුරු

2.1 තනි පුද්ගල/ව්‍යාපාරයේ සම්පූර්ණ නම :

2.2 ජා. හැ. අංකය/ව්‍යාපාර ලියාපදිංචි අංකය සහ දිනය (ඇත්නම්) :

2.3 ව්‍යාපාරය ආරම්භ කළ දිනය :

2.4 නීතිමය තත්ත්වය (පවතිනම්) :

2.5 දැනට පවතින බැංකු භාවිතය පිළිබඳ තොරතුරු

බැංකුව	ශාඛාව	ගිණුම් වර්ගය	ගිණුම් අංකය

2.6 සම්බන්ධතා තොරතුරු

- තැපැල් ලිපිනය :
- දුරකතන අංකය :

2.7 විගණන තොරතුරු (ඇත්නම්) :

3. වත්මන් මූල්‍ය තත්ත්වය (දැනට පවත්නා අගය දාම සාමාජිකයින් සඳහා)

3.1 පසුගිය වසර 3 සඳහා ආදායම (තිබේ නම්)

මූල්‍ය වසර	මුළු ආදාමය (රු.)

3.2 නව/පවත්නා ව්‍යාපෘතිය සඳහා පෙර ලබාගත් ණය පිළිබඳ තොරතුරු

බැංකුව	ණය මුදල (රු.)	කාල සීමාව	ණය මුදල ලබාගත් දිනය	සටහන්

4. යෝජිත ව්‍යාපෘතිය පිළිබඳ විස්තර (ව්‍යාපෘතිය පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න)

4.1 අරමුණ

(ව්‍යාපෘතිය මඟින් සාක්ෂාත් කරගත යුතු ප්‍රධාන අරමුණ පැහැදිලි කළ යුතුය.)

4.2 නව නිෂ්පාදන/නව තාක්ෂණය

(ව්‍යාපෘතියේ නව නිෂ්පාදන සහ භාවිතා කිරීමට අපේක්ෂිත නව තාක්ෂණික ක්‍රමවේද පිළිබඳ ව පැහැදිලි කළ යුතුය)

නිෂ්පාදන පරාසය/සේවාවන්

නිෂ්පාදනයෙහි/සේවාවෙහි නම	මිනුම් ඒකකය	නිෂ්පාදන වියදම	විකුණුම් මිල : (රු)	දළ ලාභය (රු)

4.3 සැලසුම් සහ ක්‍රියාවලිය

(නිෂ්පාදන සැලසුම් පැහැදිලි කළ යුතුය)

5. ප්‍රතිලාභ සහ ආරක්ෂණ ක්‍රම

(ව්‍යාපාරය මඟින් ගම/නගරය/ප්‍රදේශයට හෝ රටට අත්වන ප්‍රතිලාභ සහ ව්‍යාපාරය සඳහා භාවිතා කිරීමට අපේක්ෂිත ආරක්ෂණ ක්‍රමවේද පිළිබඳ පැහැදිලි කළ යුතුය)

6. පාරිසරික ආරක්ෂණය

(පාරිසරික ආරක්ෂණය වෙනුවෙන් යෙදීමට අපේක්ෂිත ක්‍රමවේදයන් පිළිබඳ පැහැදිලි කළ යුතුය)

7. තාක්ෂණික හැකියාව

7.1 තාක්ෂණය

(ව්‍යාපාරය වෙනුවෙන් භාවිතා කිරීමට අපේක්ෂිත නව තාක්ෂණික ක්‍රමවේද පිළිබඳ ව පැහැදිලි කළ යුතුය)

7.2 තාක්ෂණය උපයෝගී කර ගැනීම සඳහා වූ යෝජකයාගේ ධාරිතාව

(තාක්ෂණය භාවිතා කර ගැනීම සඳහා යෝජකයාට ඇති හැකියාව පැහැදිලි කළ යුතුය)

7.3 යන්ත්‍රෝපකරණ/කර්මාන්තශාලා ධාරිතාව

යන්ත්‍රයේ නම	වෙළඳ නාමය	උපරිම ධාරිතාව	භාවිතා කිරීමට යෝජිත ධාරිතාව	එක් දිනක නිෂ්පාදනය	භාවිතා කිරීමේ අරමුණ

8. මූල්‍ය පුරෝකථනය

ආපසු ගෙවීමේ කාලය:

මාසික වාරිකය (මුල් මුදල සහ පොලිය පැහැදිලිව සඳහන් කළ යුතුය)

9. ප්‍රධාන නීතිමය ලියකියවිලි පිළිබඳ අදහස්

9.1 ව්‍යාපාර ලියාපදිංචිය (තිබේ නම්)

9.2 වෙනත් නීතිමය ලියකියවිලි (තිබේ නම්)

10. යෝජිත සවිස්තරාත්මක අයවැය

අයිතම අංකය	අයිතමය/ක්‍රියාකාරකම්	පවතින		යෝජිත		මුළු ආයෝජනය (රු.)
		බැංකුව : (රු.)	ණය හිමියාගේ දායකත්වය (රු.)	බැංකුව (රු.)	ණය හිමියාගේ දායකත්වය (රු.)	
එකතුව						

මෙම පත්‍රිකාවේ ඉදිරිපත් කර ඇති ඉහත කරුණු සහ සංඛ්‍යා ලේඛන මගේ දැනුමට අනුව නිවැරදි ය.

.....

සහභාගිත්ව මූල්‍ය ආයතනයේ බලයලත් නිලධාරියාගේ අත්සන

.....

අයදුම්කරු

ඉහත යෝජනාව පිළිගෙන රු. ..... ක උපරිම ණය මුදලක් ප්‍රදානය කිරීමට කළමනාකරුගේ අනුමැතිය ඉල්ලා සිටී.

අනුමත කරන ලදී/අනුමත කර නැත

.....

අදාළ සහභාගීත්ව මූල්‍ය ආයතනයේ
ශාඛා කළමනාකරුගේ අත්සන

රබර් මුද්‍රාව

ඇමුණුම **II**

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි
ව්‍යාපාර යොමුව : .....

ව්‍යාපෘති යෝජනාවේ ආකෘතිය (රුපියල් මිලියන 1ට වඩා වැඩි ණය මුදල් සඳහා)

1. ව්‍යාපෘති අනන්‍යතාවය/විශ්ලේෂණය

1.1 ව්‍යාපෘති යොමුව :

1.2 ව්‍යාපෘති නාමය :

1.3 ව්‍යාපෘති ස්ථානය :

පළාත	දිස්ත්‍රික්කය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය	ග්‍රාම නිලධාරි කොට්ඨාශය

1.4 ව්‍යාපෘති ස්ථානයේ ලිපිනය :

1.5 ව්‍යාපෘතියේ ස්වභාවය :

නව ව්‍යාපෘති		දැනට පවත්වාගෙන යන ව්‍යාපෘති	

1.6 ව්‍යාපෘතියේ වර්ගය

එළවළු		කිරි		කුළුබඩු	

1.7 සම්පූර්ණ කරන ලද ව්‍යාපෘති සැලැස්ම භාරදුන් දිනය :

2. තනි පුද්ගල/ව්‍යාපාර තොරතුරු

2.1 තනි පුද්ගල/ව්‍යාපාරයේ සම්පූර්ණ නම :

2.2 ජා. හැ. අංකය/ව්‍යාපාර ලියාපදිංචි අංකය සහ දිනය (ඇත්නම්) :

2.3 ව්‍යාපාරය ආරම්භ කළ දිනය :

2.4 නීතිමය තත්ත්වය (තිබේනම්) :

2.5 දැනට පවතින බැංකු භාවිතය පිළිබඳ තොරතුරු

බැංකුව	ශාඛාව	ගිණුම් වර්ගය	ගිණුම් අංකය

2.6 සම්බන්ධතා තොරතුරු

- තැපැල් ලිපිනය :
- දුරකතන අංකය :

2.7 විගණන තොරතුරු (ඇත්නම්) :

3. වත්මන් මූල්‍ය තත්ත්වය (දැනට පවත්නා අගය දාම සාමාජිකයින් සඳහා)

3.1 පසුගිය වසර 3 සඳහා ආදායම (තිබේ නම්)

මූල්‍ය වසර	මුළු ආදායම (රු.)

3.2 නව/පවත්නා ව්‍යාපෘතිය සඳහා පෙර ලබාගත් ණය පිළිබඳ තොරතුරු

බැංකුව	ණය මුදල (රු.)	කාල සීමාව	ණය මුදල ලබාගත් දිනය	සටහන්

4. යෝජිත ව්‍යාපෘතිය පිළිබඳ කෙටි විස්තර (ව්‍යාපෘතිය පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න)

4.1 අරමුණ

(ව්‍යාපෘතිය මඟින් සාක්ෂාත් කරගත යුතු ප්‍රධාන අරමුණ පැහැදිලි කළ යුතුය.)

4.2 ව්‍යාපෘතියේ ප්‍රතිඵල

දර්ශක	මිනුම් ඒකකය	වසර 0*	ඉලක්ක අගයන් (සමුච්චිත සංඛ්‍යා)				
			වසර 1	වසර 2	වසර 3	වසර 4	වසර 5

වසර 0* නව ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර

4.3 නවෝත්පාදන/නව තාක්ෂණය

(ව්‍යාපාරයේ නව නිෂ්පාදන සහ භාවිතා කිරීමට අපේක්ෂිත නවතම තාක්ෂණික ක්‍රමවේද පිළිබඳ ව පැහැදිලි කළ යුතුය)

4.4 එකතු කළ වටිනාකම්

(නිෂ්පාදනයට අදාළ අගය එකතු කිරීමේ මාර්ගය/ක්‍රියාවලිය පිළිබඳ ව පැහැදිලි කළ යුතුය)

නිෂ්පාදන පරාසය/ සේවාවන්

නිෂ්පාදනයෙහි/සේවාවෙහි නම	මිනුම් ඒකකය	නිෂ්පාදන වියදම	විකිණුම් මිල (රු.)	දළ ලාභය (රු.)

4.5 සැලසුම් සහ ක්‍රියාවලිය

(නිෂ්පාදන සැලැස්ම සහ නිෂ්පාදනය සඳහා භාවිතා කිරීමට අපේක්ෂිත උපාය මාර්ග පිළිබඳව පැහැදිලි කළ යුතුය)

5. සමාජ ප්‍රතිලාභ සහ ආරක්ෂණය

(ව්‍යාපාරය මඟින් ගම/නගරය/ප්‍රදේශයට හෝ රටට අත්වන ප්‍රතිලාභ සහ ව්‍යාපාරය සඳහා භාවිතා කිරීමට අපේක්ෂිත ආරක්ෂණ ක්‍රමවේද පිළිබඳ පැහැදිලි කළ යුතුය)

6. පාරිසරික ආරක්ෂණය

(පාරිසරික ආරක්ෂාව වෙනුවෙන් යෙදීමට අපේක්ෂිත ක්‍රමවේදයන් පිළිබඳ පැහැදිලි කළ යුතුය)

7. තාක්ෂණික ශක්‍යතාව

7.1 තාක්ෂණය

(ව්‍යාපාරය සඳහා භාවිතා කිරීමට අපේක්ෂිත තාක්ෂණය / නව ක්‍රමවේද පිළිබඳ ව පැහැදිලි කළ යුතුය)

7.2 තාක්ෂණය යොදා ගැනීම සඳහා වූ යෝජකයාගේ ධාරිතාව

(තාක්ෂණය භාවිතා කිරීම සඳහා යෝජකයාට ඇති හැකියාව පැහැදිලි කළ යුතුය)

7.3 යන්ත්‍රෝපකරණ/කර්මාන්තශාලා ධාරිතාව

යන්ත්‍රයේ නම	වෙළඳ නාමය	උපරිම ධාරිතාව	භාවිතා කිරීමට යෝජිත ධාරිතාව	එක් දිනක නිෂ්පාදනය	භාවිතා කිරීමේ අරමුණ

8. මූල්‍ය පුරෝකථනය

අභ්‍යන්තර ප්‍රතිලාභ අනුපාතය (IRR) :

ආපසු ගෙවීමේ කාලය:

0 වසර* සඳහා ක්ෂණික ආදායම (දැනට පවත්නා ව්‍යාපෘති සඳහා පමණි) :

පලමු වසර සඳහා අපේක්ෂිත ආදායම (රු.) :

දෙවන වසර සඳහා අපේක්ෂිත ආදායම (රු.) :

0 වසර* නව ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර :

9. ප්‍රධාන නීතිමය ලියකියවිලි පිළිබඳ අදහස්

9.1 ව්‍යාපාර තත්ත්වය

(තනි පුද්ගල / පුද්ගලික සමාගම් / තනි හිමිකරු / හවුල්කාරිත්ව / සමූපකාර / සංගම් ආදී වශයෙන් අදාල ලිපිලේඛණ ඉදිරිපත් කල යුතු ය.)

9.2 ව්‍යාපාරය පිහිටි ඉඩම

(හිමිකාරිත්වයට, අදාල ලියකියවිලි සහ ව්‍යාපෘති ඉඩමට අදාල වෙනත් තොරතුරු ඉදිරිපත් කල යුතුය.)

9.3 වෙනත් නීතිමය ලියකියවිලි

10. යෝජිත සවිස්තරාත්මක අයවැය

අයිතම අංකය	අයිතමය/ක්‍රියාකාරකම්	පවතින		යෝජිත		මුළු ආයෝජනය (රු.)
		බැංකුව : (රු.)	ණය හිමියාගේ දායකත්වය (රු.)	බැංකුව (රු.)	ණය හිමියාගේ දායකත්වය (රු.)	
එකතුව						

මෙම පත්‍රිකාවේ ඉදිරිපත් කර ඇති ඉහත කරුණු සහ සංඛ්‍යා ලේඛන මගේ දැනුමට අනුව නිවැරදි ය.

.....

සහභාගිත්ව මූල්‍ය ආයතනයේ බලයලත් නිලධාරියාගේ අත්සන

.....

අයදුම්කරු

ඉහත යෝජනාව පිළිගෙන රු. ..... ක උපරිම ණය මුදලක් ප්‍රදානය කිරීමට කළමනාකරුගේ අනුමැතිය ඉල්ලා සිටී.
අනුමත කරන ලදී/අනුමත කර නැත

.....
අදාළ සහභාගීත්ව මූල්‍ය ආයතනයේ
ශාඛා කළමනාකරුගේ අත්සන

රබර් මුද්‍රාව

පරිශීලක අංකය: : 32/04/034/0001/001

2021 ජූනි 09

සහභාගිත්ව මූල්‍ය ආයතනයන්හි ප්‍රධාන විධායක නිළධාරීන්/සාමාන්‍යාධිකාරීන් වෙත,

මහත්මයාණෙනි/මහත්මියණි,

සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකම: සහන දීර්ඝ කිරීම

පවතින කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් ව්‍යාපාර සහ තනි පුද්ගල ව්‍යාපාර මුහුණ දෙන අභියෝග සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකම අදියර I, II සහ III යටතේ ව්‍යාපාර සහ පුද්ගලයින් හට ලබා දුන් කාරක ප්‍රාග්ධන ණය සඳහා පමණක් ණය සහන කාලය 2021 සැප්තැම්බර් 30 වන දින දක්වා ද, ණය ආපසු ගෙවීමේ කාල සීමාව මාස දොළහකින් (12) ද (සමස්ත ආපසු ගෙවීමේ කාලය මාස 36ක් දක්වා ණය සහන කාලය ද ඇතුළත්ව) දීර්ඝ කරන ලදී.

ඉහත ණය සහනය යටතේ ණය ආපසු ගෙවීම වෙනුවෙන් දීර්ඝ කරන ලද කාල සීමාව සහ සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකම අදියර III යටතේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2021 මාර්තු 24 වන දින නිකුත් කරන ලද ලිපිය අනුව සංචාරක ක්ෂේත්‍රයේ ණය ගනුදෙනුකරුවන් සඳහා ඒ වන විටත් දීර්ඝ කරන ලද ණය ආපසු ගෙවීමේ කාලය වෙනුවෙන් සියයට බින්දුවයි දශම දෙකයි පහක (0.25%) අමතර ණය ඇප වාරිකයක් සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ගෙවිය යුතු වේ. මූලිකව නිදහස් කරන ලද උප ණය මුදලේ අගයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ගෙවිය යුතු වාරිකය ගණනය කළ යුතු වේ. ණය ඇප වාරිකයේ පිරිවැය සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් දැරිය යුතු අතර, ණය ගැනුම්කරුවන් වෙත පැවරීම සිදු නොකළ යුතුය.

ණය සහන ලබා ගැනීමට අපේක්ෂිත සුදුසුකම් ලත් ණය ගැනුම්කරුවන් 2021 ජූනි 30 වන දින හෝ ඊට පෙර අදාළ සහභාගීත්ව මූල්‍ය ආයතනයන්ගෙන් ඒ සඳහා ඉල්ලීමක් කළ යුතු වේ. සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් අදාල සහන, නියමිත අවසාන දිනයන් සහ අයදුම් පත්‍ර, ආකෘති යනාදිය විද්‍යුත් තැපෑල හෝ කෙටි පණිවිඩ ඇතුළු මුද්‍රිත සහ/හෝ ඉලෙක්ට්‍රොණික ක්‍රමවේද ඔස්සේ ණය සහන ලබාගැනීම සඳහා අයදුම් කරනු ලබන සුදුසුකම් ලත් ණය ගැනුම්කරුවන්ට කඩිනමින් දැනුම් දිය යුතුය.

ඒ අනුව, සහන ලබා ගැනීමට අපේක්ෂිත සුදුසුකම් ලත් ණය ගැනුම්කරුවන්ගේ ඉල්ලීම් අනුමත කරන මෙන් සහභාගීත්ව මූල්‍ය ආයතනයන්ට දන්වා සිටින අතර, අමුණා ඇති ආකෘතියට (RDD-09.06.2021 -ඇමුණුම 1) අනුව සෞභාග්‍යා කොවිඩ්-19 අදියර III යටතේ ලබාදෙන සෑම උප ණයක් සඳහා ඊට අදාල වන සියයට බින්දුවයි දශම දෙකයි පහක (0.25%) ණය ඇප වාරිකය ද සහිතව ණය යෝජනා ක්‍රමයට අදාළ තොරතුරු වෙන වෙනම 2021 ජූලි 31 වන දින වන විට ප්‍රාදේශිය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත වාර්තා කළ යුතු වේ. තොරතුරු ඇතුළත් එක්සෙල් ආකෘතියේ මෘදු පිටපතක් bashika@cbsl.lk සහ sehan@cbsl.lk යන විද්‍යුත් ලිපිනයන්ට එවිය යුතු වේ.

මෙම ලිපියෙහි සඳහන් කරුණු ඔබගේ බැංකුවේ අදාළ දෙපාර්තමේන්තු/ ශාඛා නිළධාරීන්ගේ අවධානයට රැගෙන එන ලෙස ඉල්ලා සිටිමි.

මෙයට විශ්වාසී

අත්සන් කළේ බී. එල්. ජේ. එස්. බාලසූරිය
අධ්‍යක්ෂ/ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව

RDD : 2021.06.09 ඇමුණුම I

සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකම
ව්‍යාපාර සහ තනි පුද්ගල ව්‍යාපාර සඳහා සපයන ලද ණය සහන දීර්ඝ කිරීමේ විස්තර

අදියර [1] : .....

සහභාගිත්ව මූල්‍ය ආයතනයේ නම : .....

#	ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි අංකය	ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිමූල්‍යන අංකය (අදාළ වන්නේ නම්)	ණය ගැනුම්කරුගේ නම	ජා.හැ. අංකය	ව්‍යාපාර ලියාපදිංචි අංකය (අදාළ වන්නේ නම්)	ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද ණය ප්‍රමාණය (රුපියල්)	සහභාගිත්ව මූල්‍ය ආයතනය විසින් මුදාහරින ලද ණය ප්‍රමාණය (රුපියල්)	සහභාගිත්ව මූල්‍ය ආයතනය විසින් ණය මුදාහරින ලද දිනය	2 - ගෙවිය යුතු වාරිකය (සම්පූර්ණ ණය මුදලින් සියයට 0.25කි) (රුපියල්)	ණය සහනය දීර්ඝ කළ දිනය	ණය සහන කාලසීමාව				සහන කාලය ඇතුලත්ව ණය ආපසු ගෙවීමේ කාලය	
											දැනට පවතින මාස ගණන	3 - ඉල්ලුම් කළ/ලබාදුන් මාස ගණන	4 - ලබාදුන් මාස ගණන	ණය සහනය අවසන් වන දිනය	ආරම්භක කාලසීමාව (මාස ගණන)	ඉල්ලුම් කල කාලසීමාව

....

නම, අත්සන සහ බලයලත් නිලධාරියාගේ මුද්‍රාව දිනය

1. යෝජනා ක්‍රමයේ එක් එක් අදියර සඳහා වෙන වෙනම විස්තර සපයන්න.
2. අදියර III යටතේ පවතින ණය සඳහා පමණක් අදාල වේ.
3. ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2021.06.09 දිනැති ලිපියට අදාලව ලබා ගන්නා ණය සහන සඳහා පමණක් අදාල වේ.
4. සංචාරක ක්ෂේත්‍රය යටතේ ලබාදුන් ණය සඳහා පමණක් අදාල වේ.

2021 ජූනි 17

යොමු අංකය : 32/04/034/0001/001

සහභාගීත්ව මූල්‍ය ආයතනයන්හි ප්‍රධාන විධායක නිළධාරී/ සාමාන්‍යාධිකාරී වෙත

මහත්මයාණෙනී/මහත්මියනි

සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද ණය සහන ණය පහසුකම: සංචාරක කර්මාන්තයේ නියුතු ව්‍යාපාර සහ පුද්ගලයින් සඳහා ලබා දුන් සහන දීර්ඝ කිරීම සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකම : සහන දීර්ඝ කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශිය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක විසින් 2021.03.24 සහ 2021.06.09 යන දින පිළිවෙලින් ඉහත සඳහන් ශීර්ෂ යටතේ නිකුත් කරන ලද ලිපිවල අන්තර්ගතය පැහැදිලි කිරීම මෙහි අරමුණ වේ.

සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකම අදියර I, II සහ III ක්‍රියාත්මක කිරීමේ දී ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශිය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක විසින් නිකුත් කරන ලද අදාළ මෙහෙයුම් උපදෙස් සහ පසුව නිකුත් කරන ලද සංශෝධනයන් හි සඳහන් කර ඇති පරිදි වසරකට සියයට 4ක පොලී අනුපාතය හා අනුරූපීව, දීර්ඝ කරන ලද සහන කාල සීමාව තුළින් හට ගන්නා ප්‍රාග්ධන ඒකරාශීකරණය මත පොලී ගණනය කිරීම සඳහා කටයුතු කරන මෙන් සියලු සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත මෙයින් දැනුම් දෙනු ලබයි.

සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකම අදියර I සහ II ක්‍රියාත්මක කිරීමේ දී සහන කාල සීමාව තුළ ඕනෑම උප ණය ගනුදෙනුකරුවෙකු පොලී නොගෙවා සිටීමට තීරණය කර ඇත්නම්, ඉතිරිව ඇති ණය වාරික අතර එවැනි ණය සහන කාල සීමාවක එක්ව ඇති පොලිය සමව බෙදිය යුතු වේ. ණය සහන කාල සීමාව තුළ ඒකරාශීකරණය වූ පොලිය සඳහා පොලියක් අය නොකළ යුතු අතර, ණය සහන කාල සීමාව තුළ වැල් පොලිය ගණනය කිරීම නොකළ යුතු ය. වැඩිදුර විස්තර සඳහා bashika@cbsl.k සහ sehan@cbsl.lk යන විද්‍යුත් ලිපිනයන්ට ඊමේල් පණිවිඩයක් යොමු කරන්න.

තවද, දීර්ඝ කරන ලද ණය සහන කාලය බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ පරිදි ණය පහසුකම් වර්ගීකරණය පිළිබඳ රෙගුලාසි වලට අනුකූලව, අක්‍රීය ණය සඳහා ද ක්‍රියාත්මක කළ හැක. මෙම උපදෙස් පිළිබඳව සහභාගීත්ව මූල්‍ය ආයතනයන්හි අනුකූලතාවය තහවුරු කර ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව සමගින් එක්ව අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලබයි.

මෙම ලිපියේ අඩංගු දෑ ඔබගේ බැංකුවේ අදාළ දෙපාර්තමේන්තු/ ශාඛා නිළධාරීන්ගේ අවධානයට රැගෙන එන ලෙස ඉල්ලා සිටිමි.

මෙයට විශ්වාසී,

අත්සන් කළේ බී. එල්. ජේ. එස්. බාලසූරිය
අධ්‍යක්ෂ/ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව

මෙහෙයුම් උපදෙස් අංක : RDD/CG/RM/2021/01

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
තැ.පෙ. 590
අංක 30, ජනාධිපති මාවත
කොළඹ 01

2021.09.01

සියලු සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත,

මෙහෙයුම් උපදෙස්
ශ්‍රී ලංකාවේ සහල් මෝල් හිමියන් වෙත ලබා දීමට නියමිත ණය සඳහා ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය

සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ශ්‍රී ලංකාවේ සහල් මෝල් හිමියන් වෙත ලබා දීමට නියමිත ණය සඳහා ණය ඇප ආවරණ යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (මින්මතු 'පරිපාලකවරයා' ලෙස හැඳින්වෙන) විසින් සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත 2021.09.01 දිනැති මෙහෙයුම් උපදෙස් අංක RDD/CG/RM/2021/01 නිකුත් කරනු ලැබේ.

1. **හැඳින්වීම**

1.1 සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් සහල් මෝල් හිමියන් වෙත (මින්මතු 'ණය ගැනුම්කරුවන්' ලෙස හැඳින්වෙන) ලබා දීමට

නියමිත ණය සඳහා වන ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය (මින්මතු 'යෝජනා ක්‍රමය' ලෙස හැඳින්වෙන), සුදුසුකම්ලත් ණය ගැනුම්කරුවන්ට වී මිල දී ගැනීමේදී ඔවුන්ගේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සැපිරීමට, මෙම යෝජනා ක්‍රමය යටතේ සුදුසුකම්ලත් ණය ගැනුම්කරුවන්ට ලබා දුන් ණය සඳහා සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත ණය ඇප ආවරණයක් සැපයීමට ශ්‍රී ලංකා රජයේ මාර්ගෝපදේශය යටතේ පරිපාලකවරයා විසින් හඳුන්වා දෙනු ලැබේ.

1.2 සහල් මෝල් හිමියන් විසින් ඔවුන්ගේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීමේ දී මුහුණ දෙනු ලබන දුෂ්කරතා සලකා බැලීමෙන් අනතුරුව, මෙම යෝජනා ක්‍රමය 2021.01.07 දින ගරු අග්‍රාමාත්‍යතුමන් සභාපතීත්වය දරන ලද රැස්වීමේදී ගන්නා ලද තීරණය පරිදි හඳුන්වා දෙන ලදී.

1.3 පරිපාලකවරයා විසින් මෙම යෝජනා ක්‍රමය යටතේ සුදුසුකම්ලත් ගනුදෙනුකරුවන්ට ප්‍රදානය කිරීමට නියමිත, ණය ප්‍රමාණය සඳහා සියයට හැටක් (60%) දක්වා ණය ඇප ආවරණයක් සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත සපයනු ලබයි. ණය මුදලෙහි ඉතිරි සියයට හතළිහක (40%) ණය අවදානම සහභාගීත්ව මූල්‍ය ආයතනවලට දරා ගතයුතු වේ.

2. යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම

මෙම යෝජනා ක්‍රමය සහභාගීත්ව මූල්‍ය ආයතනවල සහභාගීත්වය ඇතිව පරිපාලකවරයා විසින් ක්‍රියාත්මක කෙරෙනු ලැබේ.

3. යෝජනා ක්‍රමයෙහි අරමුණු

යෝජනා ක්‍රමයෙහි අරමුණු පහත පරිදි වේ.

3.1 වී මිලදී ගැනීමේදී සහල් මෝල් හිමියන් මුහුණ දෙන මූල්‍ය බාධාවන් මඟහරවා ගැනීම සඳහා ඔවුන්ට පහසුකම් සැපයීම.

3.2 ඵලදායී ආකාරයකින් හඳුනාගත් අංශ වෙත ණය ප්‍රවේශනය වර්ධනය කිරීම.

3.3 යෝජිත සහල් මෝල් හිමියන් ශක්තිමත් කිරීම මඟින් රට සහලින් ස්වයංපෝෂිත කිරීමේ ජාතික අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා සහල් මෝල් හිමියන්ගේ දායකත්වය ඉහළ නැංවීම.

3.4 ණය අවදානම අවම කිරීම සඳහා සහභාගීත්ව මූල්‍ය ආයතනවලට සහාය වීම.

4. නියමයන් සහ කොන්දේසි

4.1 පොදු අවශ්‍යතා

4.1.1 සුදුසුකම්ලත් ණය ගැනුම්කරුවන්ට තම අරමුදල් භාවිත කරමින් වී මිල දී ගැනීම සඳහා ණය ලබා දෙන සහභාගීත්ව මූල්‍ය ආයතනවලට මෙම යෝජනා ක්‍රමය යටතේ ණය ඇප ආවරණ පහසුකම ලැබීමට හිමිකම් ඇත.

4.1.2 සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ණය අවදානම අවම කිරීමට ප්‍රමාණවත් ඇප සුරැකුම් ලබා ගනු ඇත.

4.1.3 සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් සුදුසුකම්ලත් ණය ගැනුම්කරුවන්ට ණය ලබා දීමට පෙර පරිපාලකවරයාගෙන් ණය ඇප ආවරණ අනුමැතිය ලබා ගත යුතුය.

4.2 ක්‍රියාත්මක වන ප්‍රදේශයඃ මුළු දිවයින ම

4.3 සුදුසුකම් නිර්ණායකය

4.3.1 වාර්ෂික පිරිවැටුම රු. මිලියන 750කට වඩා අඩු සහල් මෝල් හිමියන් වෙත ලබා දුන් කාරක ප්‍රාග්ධන ණය සඳහා පහත දක්වා ඇති සහනවලින් ප්‍රතිලාභ ලැබීමට සහභාගීත්ව මූල්‍ය ආයතන සුදුසුකම් ලබයි.

4.3.2 සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් අදාළ ණය ගැනුම්කරුගේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවේ මූල්‍ය පරතරයන් පියවා ගැනීමට ණය ගැනුම්කරුවන් සඳහා සිදුකරනු ලබන නිසි ණය ඇඟයීමකට යටත්ව මෙම යෝජනා ක්‍රමය යටතේ පහත පරිදි ණයක් ලබා දෙනු ඇත;

4.3.2.1 මෙම යෝජනා ක්‍රමය යටතේ, සහභාගීත්ව මූල්‍ය ආයතනවලට ශ්‍රී ලංකා රුපියල් මිලියන විසි පහක (රු. මිලියන 25) උපරිමයකට යටත්ව මූල්‍ය පරතරයන් පියවා ගැනීම සඳහා ණය ගැනුම්කරුවාගේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවට සමාන ණයක් ලබා දීම සලකා බැලිය හැකිය.

4.3.2.2 මෙම යෝජනා ක්‍රමය යටතේ ලබා දුන් ණය මුදලෙහි උපරිම ණය ආපසු ගෙවීමේ කාලය වනුයේ මාස නවය (09) කි.

4.3.2.3 යෝජනා ක්‍රමය යටතේ ලබා දුන් ණය සඳහා පොලී අනුපාතිකය, පවතින වෙළෙඳපොල අනුපාතිකය (බැංකු අරමුදලින් සපයනු ලබන ණය) වේ.

5. සුදුසුකම් ලත් සහභාගීත්ව මූල්‍ය ආයතන

මෙම යෝජනා ක්‍රමය ලංකා බැංකුව, මහජන බැංකුව සහ ග්‍රාමීය සංවර්ධන බැංකුව මඟින් ක්‍රියාත්මක කරනු ලැබේ.

6. ණය ඇප ආවරණය සඳහා අයදුම් කිරීම

6.1 සහභාගීත්ව ආයතන විසින් පහත දෑ තහවුරු කරනු ලැබිය යුතුය.

6.1.1 ඇමුණුම I (RDD/CG/RM/1) සඳහා සපයන ලද තොරතුරුවල නිරවද්‍යතාව සහ ගැළපුම

6.1.2 මෙම යෝජනා ක්‍රමය යටතේ ණය ගැනුම්කරුවන්ගේ යෝග්‍යතාව නිසි ලෙස තක්සේරු කළ බව,

6.1.3 එවැනි තක්සේරුවලට සම්බන්ධ සියලු අදාළ ලේඛන රැස් කළ බව,

6.1.4 සුදුසුකම්ලත් ගනුදෙනුකරුගෙන් ලිඛිත ප්‍රකාශනයක් ලබා ගැනීම මඟින් එක් කන්නයක් තුළ දී එක් සහල් මෝලක් සඳහා එක් ණය මුදලකට වඩා සුදුසුකම්ලත් එම ණය ගැනුම්කරු ලබා නොගෙන ඇති බව.

6.2 මෙම යෝජනා ක්‍රමය යටතේ සුදුසුකම් ලබන ණය ගැනුම්කරුවන්ගේ විස්තර ලියාපදිංචියට පෙර සතිය සඳහා එක් එක් සතියේ අඟහරුවාදා දිනට හෝ ඊට ප්‍රථම සතිපතා සහභාගිත්ව මූල්‍ය ආයතනයේ ප්‍රධාන කාර්යාලය විසින් පත් කරන ලද බලයලත් නිලධාරියා මඟින්, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා විසින් නම් කරන ලද විද්‍යුත් තැපැල් ලිපිනය/ ලිපිනයන්ට මෘදු පිටපතකින් දී ඇති ආකෘතිය (RDD/CG/RM/I ඇමුණුම I) භාවිත කරමින් වෙනම පෝරමයක් මත මෙම යෝජනා ක්‍රමය යටතේ ණය ගැනුම්කරුවන්ගේ විස්තර සැපයිය යුතුය.

6.3 ඇමුණුම I හි සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් සපයන ලද තොරතුරු ප්‍රමාණවත් නොවන හෝ නිරවද්‍ය නොවන බවට පරිපාලකවරයාට හැඟෙන්නේ නම්, අදාළ ඇමුණුම I සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත ආපසු යොමු කිරීමේ සහ පැහැදිලි කිරීම සඳහා තොරතුරු සහ ලිපි ලේඛන ඉල්ලා සිටීමේ අයිතිය පරිපාලකවරයා සතු වන්නේ ය.

6.4 ඇමුණුම I මඟින් සපයන ලද තොරතුරු සාවද්‍ය බව පෙනී ගියහොත් හෝ පරිපාලකවරයා සෑහීමට පත් නොවන්නේ නම්, ලියාපදිංචිය ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය පරිපාලකවරයා සතු වන්නේ ය.

6.5 සුදුසුකම්ලත් ණය ගැනුම්කරුවන්ට ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ලියාපදිංචි අංකය ලැබී වැඩ කරන දින 10ක් ඇතුළත ණය ලබා දිය යුතු වේ.

6.6 සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් මෙම යෝජනා ක්‍රමය යටතේ ණය ඇප ආවරණ පහසුකම ලබා ගැනීමට අපේක්ෂා කරන ප්‍රදානය කළ ණය මුදල්හි විස්තර, අදාළ වාරිකය සමඟ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් නම් කරන ලද විද්‍යුත් තැපැල් ලිපිනය/ ලිපිනයන්ට ඇමුණුම II හි දී ඇති ආකෘතිය භාවිත කරමින්, පෙර මාසය සඳහා ඊට පසු මාසයන් හි 10 වන දිනට හෝ ඊට ප්‍රථම මාසික පදනම මත ඉදිරිපත් කරනු ලැබිය යුතුය. සහභාගීත්ව මූල්‍ය ආයතන සෑම මසකම 15 වන දිනට හෝ ඊට ප්‍රථම ඇමුණුම I/II හි අත්සන් කරන ලද දෘඩ පිටපත් (දැනටමත් විද්‍යුත් තැපෑලෙන් යවන ලද) යොමු කළ යුතුය.

6.7 නිසි ලෙස සම්පූර්ණ කරන ලද ඇමුණුම II විධිමත්ව භාර ගත් විට, එවැනි සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ඇප වාරික වෙනුවට ගෙවීම සම්පූර්ණ කිරීමට යටත්ව, පරිපාලකවරයා විසින් සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත ඇමුණුම III (RDD/CG/ RM/III) හි දී ඇති ඇප ආවරණ සටහන නිකුත් කරනු ඇත.

7. ණය ඇප ආවරණ ප්‍රමාණය

7.1 මෙම යෝජනා ක්‍රමය යටතේ ලබා දුන් ණය අහිමිවීමකදී ප්‍රාග්ධන හිඟ මුදලින් සියයට හැටක් (60%) ක් දක්වා පමණක් ඇප ආවරණය සපයනු ඇත.

8. ණය ඇප ආවරණ පියවීම

8.1 මුදල් නීති පනතේ වගන්ති 108 අ (1) ප්‍රකාරව, සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ණය ගැනුම්කරුවන් වෙත ප්‍රදානය කළ ණය සඳහා, ණය පරිපාලකවරයා විසින් ඇප ආවරණ නිකුත් කරනු ඇත.

8.2 වාරිකය රැස් කිරීමට, හිමිකම් ගෙවීමට සහ හිමිකම් සහ ඊට සම්බන්ධ කරුණු නිරවුල් කිරීමෙන් පසු ණය ආපසු අය කර ගැනීම් සඳහා කැඳවීමේ අධිකාරය පරිපාලකවරයා සතු වන්නේ ය.

9. ඇප ආවරණය

9.1 සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් ඇප වාරිකය පරිපාලකයා වෙත ගෙවා ඇත්නම් පමණක්, සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් මෙම යෝජනා ක්‍රමය යටතේ ලබා දුන් ණය මුදලෙහි පළමු වාරිකය ගෙවීමේ දින පටන් මෙම ඇප ආවරණය බලාත්මක වේ.

9.2 සහභාගීත්ව මූල්‍ය ආයතනය නිසි සැලකිල්ලෙන් සහ විචක්ෂණශීලීව කටයුතු කිරීමට අපොහොසත් වී තිබීම සහ ණය මුදල ප්‍රදානය කිරීමේ දී නොසැලකිලිමත්ව කටයුතු කර ඇති බව සහ ඵලදායී ලෙස ණය නැවත අය කර ගැනීමේ ක්‍රියාවලියක්/ක්‍රියාමාර්ග ගැනීමකින් තොරව ගිණුම අධීක්ෂණය කර ඇති බවට පරිපාලකවරයාට හැඟේ නම්, මෙම ඇප ආවරණය තවදුරටත් බලනොපැවැත්වෙනු ඇත.

10. ඇප ආවරණ වාරිකය ගෙවීම

10.1 මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ලබා දුන් ණය මුදලෙහි මුළු අගයෙන් සියයට එකක (1%) අනුපාතිකයට පරිපාලකවරයා වෙත වාරිකය ගෙවිය යුතුය. [නිදසුන; ණය මුදල රු. 100ක් නම්, වාරිකය 0.01 (1% වාරිකය) රු. 100ට වාරිකය රු.1000ක් වනු ඇත.]

10.2 ඇප ආවරණය ගෙවීමට අපොහොසත් වීම මඟින් සහභාගීත්ව මූල්‍ය ආයතනය ඇප ආවරණය ලබා ගැනීමට සුදුසුකම් නොලබයි.

10.2.1 වාරිකය ප්‍රේෂණය කිරීම ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ බැංකු ගිණුම් අංක 2-54518 වෙත (කරුණාකර විස්තරය තුළ 'බැංකු නම් සහ 'යෝජනා ක්‍රමයේ නම් සඳහන් කරන්න) තත් කාලීන දළ පියවීම් පැවරුමක් ලෙස සිදු කළ යුතුය. මුදල් පැවරුම සිදු කර දිනක් ඇතුළත අදාළ තත් කාලීන ගෙවීමෙහි විස්තර විද්‍යුත් තැපෑල ඔස්සේ එක්සෙල් ආකෘතියකින් අධ්‍යක්ෂ/ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත යැවිය යුතුය.

10.3 ණය ඇප ආවරණය සඳහා වන වාරිකයේ පිරිවැය සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් දරනු ලැබිය යුතු අතර, ණය ගැනුම්කරු වෙත නොපැවරිය යුතුය.

11. සහභාගීත්ව මූල්‍ය ආයතනයන්හි වගකීම්

11.1 සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ණය මුදල මුදාහැරීමට ණය ගැනුම්කරුගේ/ ව්‍යාපාරයේ සුදුසුකම සහ සැබෑ මූල්‍ය අවශ්‍යතාව තක්සේරු කිරීමට සියලු පියවර ගත යුතුය.

11.2 ණය ගැනුම්කරුගෙන් ලිඛිත ප්‍රකාශනයක් ලබා ගැනීම මඟින් එක් කන්නයක් තුළ දී එකම සහල් මෝලක් සඳහා ණය ගැනුම්කරු විසින් මෙම යෝජනා ක්‍රමය යටතේ එක් ණය මුදලකට වඩා ලබා නොගන්නා බවට සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් තහවුරු කළ යුතුය. කිසියම් අවස්ථාවක දී ණය ගැනුම්කරු විසින් එක් කන්නයක් තුළ එකම සහල් මෝල සඳහා විවිධ සහභාගීත්ව මූල්‍ය ආයතනවලින් ණය මුදල් දෙකක් හෝ වැඩි ගණනක් ලබා ගෙන ඇත්නම්, ණය ගැනුම්කරු/ ගැනුම්කරුවන් වෙත මුදාහැර ඇති සහ අදාළ වන වාරිකය පරිපාලකවරයා වෙත ගෙවා ඇති යන කොන්දේසියට යටත්ව, මෙම යෝජනා ක්‍රමය යටතේ එම ණය ගැනුම්කරු/ ණය ගැනුම්කරුවන්ට අදාළව ලියාපදිංචි කළ පළමු ණය වෙත ණය ඇප ආවරණ පහසුකම ලබා දීමේ ප්‍රමුඛත්වය ලබා දෙනු ඇත.

11.3 තවද, එක් කන්නයක් තුළ දී එකම ණය ගැනුම්කරු සඳහා එකම සහල් මෝල සඳහා ලියාපදිංචි කරන ලද වෙනත් ඕනෑම ණය මුදලක් මෙම යෝජනා ක්‍රමය යටතේ ඇප ආවරණ සහතික නොකෙරෙනු ඇත. කෙසේවෙතත්, ඉහත වගන්ති 11.2 හි දක්වා ඇති පරිදි, එවැනි ණය මුදලක්, මුදාහැර නොමැති බවට හෝ වාරිකය නොගෙවා ඇති බවට තහවුරු වන්නේ නම්, ණය ගැනුම්කරු/ ගැනුම්කරුවන් වෙත ණය මුදාහැර ඇති සහ අදාළ වන වාරිකය පරිපාලකවරයා වෙත ගෙවා ඇති යන කොන්දේසියට යටත්ව, මෙම යෝජනා ක්‍රමය යටතේ එම ණය ඇප ආවරණ පහසුකම සැපයීම සඳහා ගනුදෙනුකරුට අදාළව මීළඟට ලියාපදිංචි කර ඇති ණය මුදල සලකා බැලෙනු ඇත.

11.4 සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ණය ගැනුම්කරු වෙත ණය මුදාහැරීමේදී සෑමවිටකදීම නිසි සැලකිල්ල සහ විචක්ෂණශීලීභාවයෙන් කටයුතු කළ යුතු අතර, ලබා දුන් ණය, ණය ලබාදුන් අරමුණ සඳහා පමණක් භාවිත කරන බවටත්, අක්‍රීය ණය කාණ්ඩය යටතේ වන පෙර ලබාදුන් ණය මුදල් පියවීමට හෝ වෙනත් ඕනෑම අරමුණක් සඳහා භාවිත නොකරන බවටත් තහවුරු කළ යුතුය.

11.5 සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ගිණුමේ තත්ත්වය සහ මෙහෙයුම් ද අධීක්ෂණය කළ යුතු අතර, සහභාගීත්ව මූල්‍ය ආයතනයන් වෙත සිදුවිය හැකි ඕනෑම අලාභයක් අවම කර ගැනීමට, අවශ්‍ය විට දී කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම.

11.6 සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් මෙම යෝජනා ක්‍රමය යටතේ ලබා දුන් ණය නැවත අය කර ගැනීම සඳහා අවශ්‍ය සහ ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගත යුතුය.

11.7 සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් මෙහෙයුම් උපදෙස්හි 10 වන වගන්තියෙහි දක්වා ඇති පරිදි පරිපාලකවරයා වෙත වාරිකය ගෙවිය යුතුය.

11.8 සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් වාර්තා තබා ගත යුතු අතර, සෑම ණය මුදලකට ම අදාළ තොරතුරු පරිපාලකවරයා වෙත සැපයිය යුතුය.

11.9 සහභාගීත්ව මූල්‍ය ආයතනවලට පරිපාලකවරයාගේ පූර්ව ලිඛිත අනුමැතියෙන් තොරව මෙම යෝජනා ක්‍රමය යටතේ ලබා දුන් කිසිදු ණය මුදලක් ලියා හැරීමට අවසර නොලැබේ.

11.10 සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් මෙම මෙහෙයුම් උපදෙස් චක්‍රලේඛයේ සියලු විධානයන්ට අනුකූල වීම තහවුරු කිරීම සඳහා විශේෂ අභ්‍යන්තර විගණන ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කළ යුතු අතර, පරිපාලකවරයා විසින් එවැනි විගණන කටයුතුවල වාර්තා සඳහා ඉල්ලීම් කරනු ඇත.

12. පරිපාලකවරයාගේ වගකීම්

12.1 අවශ්‍ය අවස්ථාවන්හිදී සංශෝධන නිකුත් කිරීමට යටත්ව, සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත මෙම යෝජනා ක්‍රමයේ මෙහෙයුම් උපදෙස් නිකුත් කිරීම.

12.2 මෙම මෙහෙයුම් උපදෙස්හි 10 වන වගන්තිය ප්‍රකාරව සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ඇප ආවරණ වාරිකය ගෙවිය යුතුය යන කොන්දේසියට යටත්ව, සුදුසුකම් ලත් ණය ගැනුම්කරුවන්ට අදාළව සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත ඇප ආවරණ නිකුත් කිරීම.

12.3 මෙහෙයුම් උපදෙස්හි දක්වා ඇති පරිදි සහභාගීත්ව මූල්‍ය ආයතනවලින් වාරිකය රැස් කිරීම.

12.4 මෙම යෝජනා ක්‍රමයේ නිරීක්ෂණ සහ අධීක්ෂණ ක්‍රියාවලිය සිදු කර ගෙන යෑම සහ අවශ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම.

12.5 සහභාගීත්ව මූල්‍ය ආයතනය මෙම යෝජනා ක්‍රමයේ අවශ්‍යතා/ නියමයන් සහ කොන්දේසි හෝ මෙම යෝජනා ක්‍රමය යටතේ ණය ලබා දීමේ දී විචක්ෂණශීලී බැංකු පරිචයන් උල්ලංඝනය කර ඇති බවට හැඟෙන්නේ නම්, ණය ඇප ආවරණ සුරැකුම් අහෝසි කිරීමේ අයිතිය පරිපාලකවරයා සතු වන්නේ ය.

13. කල් ඉකුත් වීම් සහ ණය ගෙවීම් පැහැර හැරීම වාර්තා කිරීම

13.1 ණය මුදල නැතහොත් එයින් ඕනෑම වාරිකයක් නියමිත දිනයේ දී ආපසු නොගෙවූයේ නම්, සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ණය ගැනුම්කරුවා/ ණය ගැනුම්කරුවන් ගෙන් එවැනි හිඟ මුදල් ආපසු අය කර ගැනීමට කඩිනම් සහ සඵලදායී පියවර ගත යුතුය.

13.2 මෙම යෝජනා ක්‍රමය යටතේ ණය ලබාදීමේදී, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද ණය ආදායම් හඳුනා ගැනීම, ප්‍රතිපාදන සහ අනෙකුත් අදාළ උපදෙස් වල ණය පහසුකම් වර්ගීකරණය කිරීම ණය ගැනුම්කරුගේ තත්ත්වය ලබා දෙමින් පරිපාලකවරයා වෙත හිමිකම් පෑමක් ඉදිරිපත් කිරීමට ප්‍රථම වාර්තාවක් යොමු කළ යුතුය. මෙම වාර්තාවට පහත දෑ ඇතුළත් විය යුතුය.

13.2.1 ණය ගැනුම්කරු විසින් මුහුණ දෙනු ලබන ගැටලුව/ ගැටලුවල තක්සේරුවක්;

13.2.2 ණය මුදල ආපසු ගෙවීම සඳහා ණය ගැනුම්කරුගේ හැකියාවේ තක්සේරුවක්;

13.2.3 සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ණය මුදල ආපසු අය කර ගැනීමට ගත් පියවර සහ අනාගතයේ ගැනීමට අපේක්ෂිත පියවර;

13.2.4 ආපසු අය කර ගැනීම/ නැවත සකස් කිරීම සම්බන්ධව සහභාගීත්ව මූල්‍ය ආයතනයන්හි මතය;

13.2.5 පරිපාලකවරයා හට අවශ්‍ය එවැනි අනෙකුත් තොරතුරු.

14. හිමිකම්පෑමේ ක්‍රියාවලිය

14.1 යෝජනා ක්‍රමය යටතේ ලබා දී ඇති ණය මුදලේ කිසියම් ප්‍රමාණයක් ගෙවීම පැහැර හරිනු ලැබුවහොත් අදාළ ණය මුදල අක්‍රිය ණය කාණ්ඩයට හුවමාරු කළ දිනයේ සිට මසක් ඇතුළත ඒක්ෂණ නිවේදනය යැවිය යුතු වේ.

14.2 එසේම, ණය ගනුදෙනුකරුට ඉල්ලුම් දැන්වීම යොමු කළ දින සිට මසකට පසුව, නමුත් මාස දෙකක් ගත වීමට පෙර ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාට ඇමුණුම VI (RDD/CG/RM/VI - Annex VI) අයදුම්පත භාවිත කරමින් හිමිකම් පෑමත් සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් යැවිය යුතු වේ.

14.3 ඉහත සඳහන් කරන ලද 14.1 වගන්තියේ අරමුණ සඳහා ණය ගෙවීම පැහැර හැර ඇති ණය ගනුදෙනුකරු වෙත ඉල්ලුම් ලිපියක් මඟින් දැන්වීම.

14.4 හිමිකම් අයදුම්පත සමඟ ණය ගෙවීම පැහැර හරින ලද ණය ගනුදෙනුකරු වෙත යොමු කරන ලද නිවේදනයේ සහතික කරන ලද පිටපත් සහ නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කිරීම සඳහා ගනු ලැබූ පියවර සඳහා සාක්ෂි තිබිය යුතු වේ.

14.5 ගෙවීම පැහැර හැර ඇති මුදල ඇපකරය මඟින් ආවරණය වන මූලික මුදල ලෙස සලකනු ලැබේ.

14.6 හිමිකම් පෝරමය ලැබීම මත, පරිපාලකයා විසින් මෙම යෝජනා ක්‍රමය යටතේ ලබා දුන් ණය මුදලෙහි නොපියවූ ප්‍රාග්ධන කොටසෙන් සියයට හැටක් (60%) 14.7 සහ 14.8 වගන්තිවලට යටත්ව වාරික දෙකකින් (02) ගෙවිය යුතුය. කෙසේවෙතත්, සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් මෙම මෙහෙයුම් උපදෙස් යටතේ අවශ්‍ය පරිදි අවශ්‍ය සුපරීක්ෂණය සහ ක්‍රියාමාර්ග ගැනීමට අසමත් වී ඇත්නම් හෝ නොසැලකිලිමත් වී ඇති බවට පරිපාලකවරයාට හැඟී යන්නේ නම්, ගෙවනු ලබන අගය සඳහා නියෝග කිරීමේ අයිතිය පරිපාලකවරයා සතු වන්නේ ය.

14.7 ඇමුණුම IV (RDD/CG/RM/IV) හි දී ඇති නිශ්චිත ආකෘතියෙන් හිමිකම් පෝරමය ලැබීමෙන් පසුව, පරිපාලකවරයා විසින් මෙහෙයුම් උපදෙස්හි 7.1 වගන්තිය තුළ සඳහන් සීමාවට යටත්ව මෙම යෝජනා ක්‍රමය යටතේ ලබා දුන් ණය මුදලෙහි නොපියවූ ප්‍රාග්ධන අගයෙන් සියයට පනහක් (50%) ගෙවනු ඇත. සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් අදාළ සියලු ලේඛනමය සාක්ෂි සහිතව, ණය ආපසු අය කර ගැනීමේ ක්‍රියාමාර්ග පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් පරිපාලකවරයා වෙත යොමු කළ යුතුය.

14.8 සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් ඉහත 14.7 වගන්තියෙහි සඳහන් ප්‍රථම ගෙවීමෙන් මාස නවයක් (09) ක් ඇතුළත, නෛතික ක්‍රියාමාර්ග සමඟ RDD/CG/RM/V පෝරමය (ඇමුණුම IV) පරිපාලකවරයා වෙත ලබා දුන් විගස, ප්‍රථම ගෙවීමෙන් පසුව; එනම්, මෙම යෝජනා ක්‍රමය යටතේ ලබා දුන් ණය මුදලෙහි නොපියවූ ප්‍රාග්ධනයෙන් පරිපාලකවරයා විසින් සහතික කරන ලද හිමිකමෙන් සියයට පනහක් (50%) ගෙවීමෙන් පසුව පවත්නා ශේෂය ගෙවනු ඇත.

14.9 සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් ගනු ලබන ණය ආපසු අය කර ගැනීමට ගනු ලබන ක්‍රියාමාර්ග සහ පරිපාලකවරයා විසින් ව්‍යාපාර පරීක්ෂා කිරීමට යටත්ව, පරිපාලක විසින් එක් එක් සිදුවීම් අනුව ඉහත 14.8 හි සඳහන් පැමිණිලි අංක රහිතව ඇප හිමිකම් භාර ගනු ඇත.

14.10 සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් 2 වන වාරිකය සඳහා ඇමුණුම v හිමිකම් පෝරමය සමඟ අධිකරණ පැමිණිලි ගණන සපයනු නොලබන්නේ නම් සහ/ හෝ පළමු වාරික දිනය ගෙවීමෙන් මාස 09ක් ඇතුළත සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් සැලකිය යුතු වශයෙන් ණය ආපසු අය කර ගැනීමේ ක්‍රියාමාර්ග නොගන්නේ නම්, ණය ඇප ආවරණයේ ප්‍රථම වාරිකය සඳහා ගෙවන ලද අගයන් නැවත කැඳවීමේ අයිතිය පරිපාලකවරයා සතු වන්නේ ය.

15. පැහැර හරින ලද ණය

15.1 හිමිකම් පෑමක් පිය වූ සෑම විටක දී ම, සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් අදාළ ණය සඳහා ගෙවන ලද ණය ඇප ආවරණයට අදාළව මෙම යෝජනා ක්‍රමය යටතේ ලබා දුන් ණය අගයන්හි අක්‍රීය ණය ශේෂයන් හිලව් කරනු ඇත.

16. ණය අයකර ගැනීමේ ක්‍රියාමාර්ග

16.1 ණය ඇප ආවරණයක් පැවතුණ ද, යෝජනා ක්‍රමය යටතේ ණය ආපසු අය කර ගැනීම නියාමනය කිරීම සඳහා සුදුසු අභ්‍යන්තර මෙහෙයුම් යාන්ත්‍රණයක් සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ක්‍රියාත්මක කළ යුතු වේ.

16.2 සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ඔවුනට හැකි සෑම අයුරකින්ම කල්ඉක්මවූ මුදල් ආපසු ලබා ගැනීම සඳහා කඩිනම් සහ කාර්යක්ෂම පියවර ගත යුතු අතර, ගනු ලැබූ පියවර පිළිබඳව පරිපාලකවරයා දැනුම්වත් කර තිබිය යුතු සේම ව්‍යාපෘතියේ ප්‍රගතිය පිළිබඳව ද කලින් කලට දැනුම් දිය යුතු වේ.

16.3 ගෙවීම පැහැර හැර ඇති ණය ගනුදෙනුකරුවන්ට එරෙහිව ප්‍රතිසාධන ක්‍රියාමාර්ග ගැනීම සඳහා පරිපාලකවරයා විසින් නිර්දේශ කරනු ලබන ඕනෑම පියවරක් සහභාගීත්ව මූල්‍ය ආයතන ක්‍රියාත්මක කළ යුතු වේ. යෝජනා ක්‍රමය යටතේ හිමිකමක් පියවූ පසුව වුව ද, එවැනි ණය ගනුදෙනුකරුවන්ට එරෙහිව ඒ වන විටත් ක්‍රියාත්මක කරන ලද ඕනෑම ප්‍රතිසාධන ක්‍රියාවක් නැවැත්වීම සඳහා සහභාගීත්ව මූල්‍ය ආයතන කටයුතු නොකළ යුතුය.

17. පසු හිමිකම් පියවීම්

17.1 ඇප හිමිකමක් ගෙවීමෙන් පසු සුදුසුකම් ලත් ණය ගනුදෙනුකරුගෙන් ණය ආපසු අයකර ගැනීම් පරිපාලකවරයා සහ සහභාගීත්ව මූල්‍ය ආයතනය අතර, ණය මුදලේ හිඟය බෙදී ගිය ලෙසින් පිළිවෙලින් 60:40 සමානුපාතිකයෙන් බෙදිය යුතු වේ. මේ සඳහා ඇමුණුම VI (RDD/CG/RM/VI) හී දක්වා ඇති නියමිත ආකෘතිය යොදා ගන්න.

17.2 සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ජනවාරි සිට ජූනි දක්වා සහ ජූලි සිට දෙසැම්බර් දක්වා යන කාල සීමාවන් සඳහා අර්ධ වාර්ෂිකව ඉහත සඳහන් කළ අයදුම්පත (RDD/CG/RM/VI - Annex VI) එවිය යුතු වේ. සෑම වසරකම ජූනි 30 සහ දෙසැම්බර් 31 සිට දින 30ක් ඇතුළත පරිපාලකවරයා වෙත ආපසු අයකර ගැනීම ලැබීමට සැලැස්විය යුතු වේ.

17.3 පරිපාලකවරයාගෙන් ලැබුණු සම්පූර්ණ සහතික මුදල සහ ණය ආපසු අයකර ගැනීම සඳහන් කරමින් රෙජිස්ටරයක් සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් පවත්වාගෙන යා යුතු අතර, පරිපාලකවරයා හෝ ඒ සඳහා ඔහු විසින් බලය පවරා ඇති වෙනත් නිළධාරියෙකු සඳහා පරීක්ෂා කරනු ලබන කාල සීමාව තුළ රෙජිස්ටරය ලබා ගැනීම සඳහා අවකාශ තිබිය යුතුය.

17.4 ණය ගනුදෙනුකරුගෙන් නැවත අය කර ගනු ලැබූ ප්‍රමාණයෙන් නීතිමය කටයුතු සඳහා වැය වූ පිරිවැය ඇතුළුව යෝජනා ක්‍රමය යටතේ ණය ආපසු අය කර ගැනීම සඳහා වැය කළ පිරිවැය ප්‍රථමයෙන් අය කර ගත යුතු වේ. නැවත අය කර ගත් මුදලින් ඉතිරිය ඉහත සඳහන් 17.1 වගන්තියේ සඳහන් වන අනුපාතය අනුව බෙදිය යුතු වේ. පරිපාලකවරයාගේ කොටස ප්‍රතිපූරණය කිරීමෙන් පසුව පමණක් අනිකුත් වියදම් අය කළ ගත යුතුය.

18. පරීක්ෂා කිරීම

18.1 පරිපාලකවරයා හට ණය යෝජනා ක්‍රමයේ අවශ්‍යතාවන් සඳහා මෙකී යෝජනා ක්‍රමය යටතේ ඇප ආවරණ සහතික කර ඇති ඕනෑම ණයක් හා සම්බන්ධව, සහභාගීත්ව මූල්‍ය ආයතනයේ ගිණුම් පොත් සහ අනිකුත් වාර්තා පරීක්ෂා කිරීමට අයිතිය ඇත.

18.2 යෝජනා ක්‍රමය යටතේ මූල්‍යකරණය කරන ලද කටයුත්තට අදාළ ලිපි ලේඛන, ගිණුම් පොත් ඉල්ලා සිටින විට ණය ගනුදෙනුකරු විසින් පරිපාලකවරයාට/ශ්‍රී ලංකා රජය වෙත ලබා දෙන බව සහ අවශ්‍ය වූ විටදී පරිපාලකවරයා/ශ්‍රී ලංකා රජය විසින් බලය ලබාදෙන නිළධාරීන්ට ව්‍යාපෘතිය පරීක්ෂා කිරීම සඳහා අවසර ලබා දීම සෑම ණයකම කොන්දේසියක් බවට පත් කිරීමට සහභාගීත්ව මූල්‍ය ආයතන කටයුතු කළ යුතු වේ.

18.3 සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් යෝජනා ක්‍රමයේ නියමයන් සහ කොන්දේසි උල්ලංඝනය කර ඇතැයි හඳුනා ගතහොත්, ඇප ආවරණ සහ හෝ හිමිකම් පියවීම සඳහා සිදු කරන ලද ඕනෑම ගෙවීමක් අවලංගු කිරීමේ හැකියාව පරිපාලකවරයා සතු වේ.

19. වාර්තා සහ තොරතුරු සැපයීම

පරිපාලකවරයා ඉල්ලා සිටින විටක, යෝජනා ක්‍රමය යටතේ සහතික කරන ලද ඕනෑම ණය මුදලක් සම්බන්ධ තොරතුරු පරිපාලකවරයා ඉල්ලා සිටින විටක අදාළ ප්‍රතිලාභ සහ තොරතුරු සැපයීමට සහභාගීත්ව මූල්‍ය ආයතනය කටයුතු කළ යුතු වේ.

20. වෙනස් කිරීම් සහ අතිරේක ප්‍රතිපාදන

20.1 යෝජනා ක්‍රමය යටතේ නිකුත් කරන ලද ඕනෑම ඇපයකින් මතුවන අයිතිවාසිකම් හෝ බැඳීම් සඳහා බලපෑමක් නොකරමින් යෝජනා ක්‍රමය වෙනස් කිරීමේ නැවැත්වීමේ අයිතිය පරිපාලකවරයා සතු වේ.

20.2 අවශ්‍ය විට, යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ සහභාගීත්ව මූල්‍ය ආයතනය වෙත ලබා දීම සඳහා අයිතිය පරිපාලකවරයා සතු වේ.

20.3 යෝජනා ක්‍රමයේ නිශ්චිතව යම්කිසි කරුණක් සටහන් කර නොමැති අවස්ථාවක දී, යෝජනා ක්‍රමය සඳහා අවශ්‍ය වෙතොත්, පරිපූරක සහ අතිරේක ප්‍රතිපාදන සැපයීමට පරිපාලකවරයාට හැකියාව ඇත.

යෝජනා ක්‍රමය 2021.09.01 වන දින සිට ක්‍රියාත්මක වේ.

අත්සන් කළේ
බී. එල්. ජේ. එස්. බාලසූරිය
අධ්‍යක්ෂ/ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව

RDD/CG/RM/I - ඇමුණුම I

ශ්‍රී ලංකාවේ සහල් මෝල් හිමියන් සඳහා ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය (CGRMO)

ලියාපදිංචිය සඳහා අයදුම් කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද ණය අගය2 (රු.)	සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් නිර්දේශ කරන ලද ණය අගය (රු.)	ණය අවශ්‍යතාව (රු.)	ව්‍යාපාරයේ හෝ ප්‍රධාන කාර්යාලයේ දිස්ත්‍රික්කය	ව්‍යාපාරයේ නැතහොත් ප්‍රධාන කාර්යාලයේ සම්පූර්ණ ලිපිනය/ ස්ථානය	ව්‍යාපාර ලියාපදිංචි අංකය (ඇත්නම්)	ව්‍යාපාරයේ නම	දුරකථන අංකය/ අංක	ස්ත්‍රී/ පුරුෂ භාවය	ජා.හැ.අංකය	අයදුම්කරු/ හවුල්කරුවන්/ අධ්‍යක්ෂවරුන්ගේ නම	අයදුම්කරුගේ තත්ත්වය 1	දිස්ත්‍රික්කය	ගොඩ කේතය	සහභාගීත්ව මූල්‍ය ආයතනයේ ගොඩ	සහභාගීත්ව මූල්‍ය ආයතනයේ නම	අනුක්‍රමික අංකය

උක්ත අයදුම්කරුවන් මෙම ණය යෝජනා ක්‍රමය යටතේ මෙහෙයුම් උපදෙස්වලට අනුව ණය මුදලක් ලබා ගැනීමට සුදුසුකම් ලබන බවත්, අයදුම්කරුවන්ගේ සියලු විස්තර නිරවද්‍ය බවත් මම සහතික කරමි.

සටහන: (දෘඪ පිටපත A3 කඩදාසියකින් සමන්විත විය යුතුය.)

1. තනිපුද්ගල (I), හවුල් ව්‍යාපාර (P), සීමිත වගකීම් සමාගම (L), වෙනත් (O) 2. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සම්පූර්ණ කළ යුතු

RDD/CG/RM/ II - ඇමුණුම II

ශ්‍රී ලංකාවේ සහල් මෝල් හිමියන් සඳහා ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය (CGRMO)

ණය ඇප ආවරණ වාරික ප්‍රකාශය

බැංකුව : .....

ශාඛාව .....

අනුක්‍රමික අංකය	ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවරන ලද ලියාපදිංචි අංකය	අයදුම්කරුවන් /හවුල්කරුවන් / අධ්‍යක්ෂවරුන්ගේ නම	ජා.හැ. අංකය	ව්‍යාපාර ලියාපදිංචි අංකය	ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද ණය අගය (රු.)	සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් මුදා හළ ණය අගය(රු.)	සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් ණය අගය නිකුත් කළ දිනය	හිඟ වාරිකය (මුළු ණය අගයෙන් සියයට 1 ක්) රු.

ශාඛා කළමනාකරුගේ නම : .....

ශාඛා කළමනාකරුගේ අත්සන .....

දිනය .....

ශාඛා මුද්‍රාව .....

RDD/CG/RM/III - ඇමුණුම III

ශ්‍රී ලංකාවේ සහල් මෝල් හිමියන් සඳහා වන ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය (CGRMO)

ශ්‍රී ලංකා මහ බැංකුව

ණය ඇප සුරැකුම් ආවරණ නෝට්ටුව

ශ්‍රී ලංකා මහ බැංකු යොමු අංකය .....

මෙම ඇප සුරැකුම් ආවරණ නෝට්ටුව

..... (බලපත්‍රලාභී වාණිජ බැංකුවේ නම) ..... (බැංකු ශාඛාවේ නම) විසින් ප්‍රදානය කරන ලද

(රු .....) (ගණන ඉලක්කමෙන්)

රුපියල් ..... (ගණන වචනයෙන්) ක ණය මුදලක්

(වර්ෂය/මාසය/දිනය) දින ලබා දීම සහතික කිරීමට නිකුත් කරන ලදී.

2021 ..... දාතම අංක RDD/CG/RM/2021/01 දරන මෙහෙයුම් උපදෙස්හි නියමයන් සහ කොන්දේසි ප්‍රකාරව ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් සඳහා වන ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය යටතේ සහතික කර ඇත, එහි පසුකාලීන සංශෝධන කිසිවක් ඇත්නම්, ඒවා සහ එකඟ වී ඇති ..... දාතම ගිවිසුම.

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය සහ ..... (බලපත්‍රලාභී වාණිජ බැංකුවේ නම) විසින් සහ අතර ගිවිස ගන්නා ලදී.

....

දිනය

අධ්‍යක්ෂ
ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව

RDD/CG/RM/IV - ඇමුණුම IV

ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් සඳහා ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය (CGRMO)

ණය ඇප ආවරණ පළමු වාරිකය සඳහා හිමිකම් අයදුම් කිරීම

බැංකුව : ..... ශාඛා කේතය : .....

ශාඛාව : ..... දිස්ත්‍රික්කය : .....

අනුක්‍රමික අංකය	ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවරන ලද ලියාපදිංචි අංකය	ජා.හැ. අංකය/ව්‍යාපාර ලියාපදිංචි අංකය	පිරිනමන ලද අගය (රු.)	ආපසු අය කර ගත් අගය (රු.)	*වාර්තාකරණ දිනයේ දී නොපිය වූ ප්‍රාග්ධන අගය (රු.)	ගෙන ඇති නෛතික ක්‍රියාමාර්ගය (සමථකරණ මණ්ඩල පැමිණිලි අංකය)	නෛතික ක්‍රියාමාර්ගය ලබා ගත් දිනය (දිනය/මාසය/ වර්ෂය)
මුළු එකතුව							

***** පොලිය සහ වෙනත් ගාස්තු ණය ඇප ආවරණ හිමිකම් පළමු වාරිකය තුළ ඇතුළත් නොකළ යුතුය.

ශාඛා කළමනාකරුගේ නම : ..... දිනය: : .....

ශාඛා කළමනාකරුගේ අත්සන : ..... ශාඛා මුද්‍රාව : .....

RDD/CG/RM/IV - ඇමුණුම V

ශ්‍රී ලංකාවේ සහල් මෝල් හිමියන් සඳහා ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය (CGRMO)

ණය ඇප ආවරණ දෙවන වාරිකය සඳහා හිමිකම් අයදුම් කිරීම.

බැංකුව : ..... ශාඛා කේතය : .....

ශාඛාව : ..... දිස්ත්‍රික්කය : .....

අනුක්‍රමික අංකය	ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවරන ලද ලියාපදිංචි අංකය	ජා.හැ. අංකය/ව්‍යාපාර ලියාපදිංචි අංකය	පිරිනමන ලද අගය (රු.)	අලාභ වූ අගය (රු.)	ප්‍රථම හිමිකම යොමු කිරීමෙන් අනතුරුව ආපසු අය කර ගැනීම* (රු.)	සිතාමතා ණය පැහැර හරින්නන්ට එරෙහිව ගනු ලැබූ නෛතික ක්‍රියාමාර්ග			ශුද්ධ අලාභය (රු.)
						පැමිණිල්ල ගොනු කළ දිනය (දිනය-මාසය-වර්ෂය)	අධිකරණයේ නම	බේරුම්කාර පැමිණිලි අංකය	
මුළු එකතුව									

* ප්‍රාග්ධනිත පොලිය රහිතව

ශාඛා කළමනාකරුගේ නම : ..... දිනය: : .....

ශාඛා කළමනාකරුගේ අත්සන : ..... ශාඛා මුද්‍රාව : .....

RDD/CG/RM/IV - ඇමුණුම VI

ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් සඳහා ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය (CGRMO)

ණය ඇප ආවරණ පළමු වාරිකය සඳහා හිමිකම් අයදුම් කිරීම.

බැංකුව : ..... ශාඛා කේතය : .....

ශාඛාව : ..... දිස්ත්‍රික්කය : .....

අනුක්‍රමික අංකය	ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවරන ලද ලියාපදිංචි අංකය	ජා.හැ. අංකය/ව්‍යාපාර ලියාපදිංචි අංකය	පිරිනමන ලද අගය (රු.)	ණය ඇප ආවරණයක් ලෙස පියවන ලද අගය (රු.)	ශ්‍රී ලංකා මහ බැංකුවට ප්‍රේෂණය කළ අගය(රු.)
මුළු එකතුව					

ශාඛා කළමනාකරුගේ නම :..... දිනය: .....

ශාඛා කළමනාකරුගේ අත්සන:..... ශාඛා මුද්‍රාව .....

මෙහෙයුම් උපදෙස් අංක : RDD/PR/2010/03 (A-06)

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
තැ.පෙ. 590
අංක 30, ජනාධිපති මාවත
කොළඹ 01

2021.09.01

සියලුම සහභාගීත්ව මූල්‍ය ආයතනයන් වෙත.

සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ දෙවන ණය ප්‍රතිපාදනය සම්බන්ධ මෙහෙයුම් උපදෙස් සංශෝධනය සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශිය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ලියාපදිංචි අයදුම්පත් යොමු කිරීමේ ක්‍රියාවලිය සරල කිරීම

සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශිය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා විසින් නිකුත් කරන ලද 2010. 03. 22 දිනැති අංක RDD/PR/2010/03 දරන මෙහෙයුම් උපදෙස් (කලින් කලට සංශෝධනය කළ පරිදි) සම්බන්ධයෙනි.

ණය ආපසු ගෙවීම හා සම්බන්ධව ව්‍යාපාරයේ ප්‍රගතිය සලකා බැලීමෙන් සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ රුපියල් මිලියන 25.0ක උපරිම සමුච්ඡිත ප්‍රමාණයකට යටත්ව ප්‍රතිලාභීන් සඳහා එක් වරකට වඩා වැඩි වාරයකදී ණය ලබා ගැනීම සඳහා ප්‍රතිපාදන සකස් කිරීම සහ ණය ලියාපදිංචි වීම සහ ප්‍රතිමූල්‍යන ක්‍රියාවලිය කඩිනමින් සිදු කිරීම තුළින් ඵලදායී සහ කාර්යක්ෂම ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණයක් තිබීමේ වැදගත්කම සඳහා පවතින අවශ්‍යතාව සැලකිල්ලට ගනිමින් ප්‍රාදේශිය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමයේ ණය සඳහා ලියාපදිංචි වීම සහ ප්‍රතිමූල්‍යන ක්‍රියාවලිය සරල කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශිය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා විසින් නිකුත් කරන ලද 2010.03.22 දිනැති අංක RDD/PR/2010/03 දරන මෙහෙයුම් උපදෙස් සහ පසුව ඉදිරිපත් කරන ලද සංශෝධන පහත දක්වා ඇති අයුරින් අනුපූරණය සහ සංශෝධනය කරනු ලබයි.

I. 2010. 03. 22 දිනැති අංක RDD/PR/2010/03 දරන ප්‍රධාන මෙහෙයුම් උපදෙස්හී (කලින් කලට සංශෝධනය කළ පරිදි) 3 වන වගන්තියේ 3.2 උප වගන්තියට අදාලව පහත සඳහන් නව නිර්ණායක හඳුන්වා දෙන ලදී.

3. ණය යෝජනා ක්‍රමය

ණය සීමාව : සුවිශේෂි අවස්ථා සඳහා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන්ට ලබාදෙන ලද උප ණය ව්‍යාපාති සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවෙන් රු. මිලියන 25ක උපරිමයක ප්‍රතිමූල්‍ය පහසුකම් ලබාගැනීම සඳහා සුදුසුකම් ලබයි.

(7.10 වගන්තිය අනුව උපරිම ණය සීමාවට වඩා අඩු ප්‍රමාණයක ණය පහසුකම් ලබා ගත් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට, දෙවන ණය සඳහා උපරිම ණය සීමාව වන රුපියල් මිලියන 25.0ක් දක්වා සලකා බැලීමට අවස්ථාව ඇත).

II. 2010.03.22 දිනැති අංක RDD/PR/2010/03 දරන ප්‍රධාන මෙහෙයුම් උපදෙස්හී (කලින් කලට සංශෝධනය කළ පරිදි) 7 වන සහ 10 වන වගන්ති පහත සඳහන් අයුරින් සංශෝධනය කරන ලදී.

7. උප ණය ගනුදෙනුකරුවන් ලියාපදිංචි කිරීම

7.1 එක් එක් ණය අයදුම්කරු වෙනුවෙන් ඇමුණුම (අ) හි දක්වා ඇති ණය ලියාපදිංචි කිරීමේ අයදුම්පත ඒ ආකාරයෙන්ම ශාඛාවේ කළමනාකරු විසින් සම්පූරණ කර, අදාළ සහභාගීත්ව මූල්‍ය ආයතනයේ ප්‍රධාන කාර්යාලය වෙත යැවිය යුතු වේ.

I. සමස්ත උප ණය ප්‍රමාණය ලියාපදිංචි කිරීම; රුපියල් මිලියන 1 කට වඩා වැඩි ඇමුණුම (අ) සහ ණය ලියාපදිංචි කිරීමේ අයදුම්පතෙහි නිසි ලෙස සහතික කළ පිටපත්, ණය තක්සේරු වාර්තාව ඇතුළු අදාළ ලිපි ලේඛන සියල්ල ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යොමු කරන මෙන් සහභාගීත්ව මූල්‍ය ආයතනයේ ප්‍රධාන කාර්යාලයන්ට දන්වා සිටිමු.

II. සමස්ත උප ණය ප්‍රමාණය ලියාපදිංචි කිරීම; රුපියල් මිලියන 1 ක් වඩා අඩු සහභාගීත්ව මූල්‍ය ආයතනයන්හි ප්‍රධාන කාර්යාල ඇමුණුම (ආ) පමණක් එවිය යුතුය. (7.2 හි විස්තර කර ඇති පරිදි)

7.2 ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබා ගැනීමට සුදුසුකම් ලබන උප ණය ගනුදෙනුකරුවන්ගේ තොරතුරු, ඇතුලත්ව නිසි ලෙස සම්පූර්ණ කරන ලද ණය ලියාපදිංචි ලැයිස්තුව (ඇමුණුම ආ) සහභාගිත්ව මූල්‍ය ආයතනයේ බලයලත් නිළධාරියාගේ අත්සනින් යුතුව ප්‍රාදේශිය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතුය. ප්‍රාදේශිය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද විද්‍යුත් ලිපිනයට ඇමුණුම (ආ) හී මෘදු පිටපතක් ද දෘඩ පිටපත සමඟ එවිය යුතුය. එමෙන්ම ණය අයදුම්පතේ

විස්තර ඇතුළත් ලැයිස්තුව පහත සඳහන් අයුරින් වෙන වෙනම එවිය යුතු වේ.

I. රුපියල් මිලියන 1.0ට වඩා වැඩි ණය ලැයිස්තුවක්

II. රුපියල් මිලියන 1.0ක් සහ ඊට වඩා අඩු ණය ලැයිස්තුවක්

7.3 සහභාගීත්ව මූල්‍ය ආයතන විසින්

I. ඇමුණුම (අ) සහ (ආ) හී සපයා ඇති තොරතුරුවල නිර්වද්‍යතාවය සහ ගැළපුම

II. ණය යෝජනා ක්‍රමය යටතේ ණය ගනුදෙනුකරුවන්ගේ සුදුසුකම් නිසි ලෙස ඇගයීමට ලක් කර ඇති බව සහ;

III. එවැනි ඇගයීමකට අදාළ සියලු ලේඛන එක් රැස් කර ඇති බවට තහවුරුවක් ලබා දිය යුතු වේ.

7.4 ඉහත සඳහන් කර ඇති පරිදි 7.3 වගන්තිය යටතේ තවදුරටත් පරීක්ෂා කිරීමක් හෝ පැහැදිලි කිරීමක් අවශ්‍ය අවස්ථාවක දී, සියලු උපකාරක ලේඛන සහ වාර්තා නීත්‍යානුකූලව අදාළ කාල සීමාව තුළ දී පවත්වාගෙන යෑමට සහභාගීත්ව මූල්‍ය ආයතන කටයුතු කළ යුතු වේ.

7.5 සහභාගීත්ව මූල්‍ය ආයතනයන්හි ප්‍රධාන කාර්යාල විසින් ඇමුණුම (අ) (රුපියල් මිලියන 1.0ට වඩා ඉහළ ණය සඳහා පමණක්) සහ ඇමුණුම (ආ) සමඟ අනිකුත් ලිපි ලේඛන සමඟ යොමු කළ විට, ශ්‍රී ලංකා මහ බැංකුව එහි සඳහන් තොරතුරු තහවුරු කිරීමෙන් පසු උප ණය ගනුදෙනුකරුවන්ගේ සුදුසුකම් තීරණය කිරීම සහ ලබා දෙන ණය මුදල තීරණය කරනු ලැබේ. ඒ අනුව, යෝජනා ක්‍රමය යටතේ සුදුසුකම් ලබන ණය ගනුදෙනුකරුවන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලියාපදිංචි කරනු ඇත.

7.6 ණය ගනුදෙනුකරු ලියාපදිංචි කිරීමෙන් පසු, එක් එක් උප ණය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනන්‍ය ලියාපදිංචි අංකයක් වෙන් කරනු ලබන අතර, අදාළ සහභාගීත්ව මූල්‍ය ආයතනයේ ප්‍රධාන කාර්යාලය වෙත එම ලියාපදිංචි අංකයන් දන්වනු ඇත. අදාළ ණය ගනුදෙනුකරු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව හා ඕනෑම තොරතුරු හුවමාරුවක දී එක් එක් උප ණය ගනුදෙනුකරුට අනන්‍ය මෙම ලියාපදිංචි අංකය උපයෝගී කර ගනු ඇත.

7.7 ඇමුණුම අ හෝ ආ හී සපයන ලද තොරතුරුවල යම් විෂමතාවක් හෝ සාවද්‍යතාවයක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිරීක්ෂණය කළේ නම්, තොරතුරු සාවද්‍ය යැ යි හඳුනාගත් අදාළ උප ගනුදෙනුකරුගේ ලියාපදිංචිය, සහභාගීත්ව මූල්‍ය ආයතනය වෙත දැනුම් දීමකින් තොරව අවලංගු කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවට අයිතියක් ඇත.

7.8 අයදුම්පතක් ලියාපදිංචි කිරීමේ අරමුණින්, තවදුරටත් තොරතුරු හෝ පැහැදිලි කිරීමක් ශ්‍රී ලංකා මහ බැංකුවට අවශ්‍ය වන්නේ නම්, සහභාගීත්ව මූල්‍ය ආයතනය වෙත එම ලියාපදිංචි අයදුම්පත යොමු කර තොරතුරු ලබා ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුවට හැකි වේ.

7.9 7.1 (I)වගන්තියෙහි සඳහන් ලේඛන සමඟ ණය ලියාපදිංචි කිරීමේ අයදුම්පතෙහි නිසි ලෙස සම්පූර්ණ කරන ලද දෘඩ පිටපතක් (ඇමුණුම අ) සහ 7.1 (II) වගන්තියෙහි සඳහන් ණය ගනුදෙනුකරුවන්ගේ ණය අයදුම්පත් තොරතුරු ලේඛනයක් (ඇමුණුම ආ) සහභාගීත්ව මූල්‍ය ආයතනයේ ප්‍රධාන කාර්යාලය මඟින් මෘදු පිටපත යොමු කරන අතරතුර පහත සඳහන් ලිපිනයට ණය අයදුම්පත ලියාපදිංචි කිරීම සඳහා යොමු කරන්න.

අධ්‍යක්ෂ
ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01.

7.10 ව්‍යාපාරයේ කාර්යසාධනය සහ ප්‍රතිලාභියාගේ පළමු ණය සැලකිල්ලට ගැනීමෙන් පසු ණය ගනුදෙනුකරුගේ ඉල්ලීම මත රු. මිලියන 25 දක්වා වන උපරිම ණය මුදලට යටත්ව දෙවන ණය ලබාදීම සඳහා සහභාගීත්ව මූල්‍ය ආයතනයට තීරණය කළ හැක. 7.1 වගන්තිය අනුව නිසි ලෙස සම්පූර්ණ කරන ලද ඇමුණුම (ඇ) යොමු කළ යුතු වේ. දෙවැනි ණයක් සඳහා අදාළ වන අනිකුත් ක්‍රියාපටිපාටි සහ වගන්ති 2010. 03. 22 දිනැති RDD/PR/2010/03 දරන මෙහෙයුම් උපදෙස්හී (කලින් කලට සංශෝධනය කළ පරිදි) සඳහන් කරන ලද ඒවා හා සමාන වේ.

10. ප්‍රතිමූල්‍යකරණය සඳහා අයදුම්පත්

10.1 සහභාගීත්ව මූල්‍ය ආයතන ප්‍රතිමූල්‍ය පහසුකම් ලබා ගැනීමට අපේක්ෂිත ණය ගනුදෙනුකරු/කරුවන්ගේ ලැයිස්තුවක් නිසි ලෙස සම්පූර්ණ කරන ලද එකී ප්‍රතිමූල්‍යකරණ අයදුම්පතක් සමඟ සහභාගීත්ව මූල්‍ය ආයතනයේ ප්‍රධාන කාර්යාලය මඟින් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත 15 වන දින සහ මාසයේ අවසාන දින (මසකට දෙවරක්), ඉහත 7.09 වගන්තියේ සඳහන් ලිපිනයට සහ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද විද්‍යුත් ලිපිනයට දෘඩ සහ මෘදු පිටපත් ලෙස මුළු මුදල සඳහා එක් නීතිමය ලේඛන කට්ටලයක් ද සමඟ යොමු කළ යුතු වේ. ප්‍රතිමූල්‍යකරණ අයදුම්පත සමඟ පහත සඳහන් දෑ ඇතුළත් කළ යුතු වේ.

I. ප්‍රතිමූල්‍යකරණය සඳහා අයදුම්පත් (උපග්‍රන්ථ I)
II. ණය බෙදාහැරීම් ප්‍රකාශය (උපග්‍රන්ථ II, සංශෝධනය කළ පරිදි)
III. ඉල්ලුම් පොරොන්දු නෝට්ටුව (උපග්‍රන්ථ III) (අදාළ මුද්දර ගාස්තු ද ඇතුළුව)
IV. භාරදීමේ ලිපිය (උපග්‍රන්ථ IV)
V. ණය ආයතනයේ ඇගයීම (උපග්‍රන්ථ V)
VI. බෙදාහැරීමේ ලිපිය (උපග්‍රන්ථ VI)

10.2 ණය ගනුදෙනුකරුවන්ගේ තොරතුරු සහ නීතිමය ලේඛන තහවුරු කරගත් පසු ප්‍රතිමූල්‍යකරණ පහසුකම් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ලබාදෙනු ඇත.

අනිකුත් මෙහෙයුම් උපදෙස් නොවෙනස්ව පවතී.

සංශෝධනය කරන ලද මෙහෙයුම් උපදෙස් කඩිනමින් බලාත්මක වනු ඇත.

මෙම ලිපියෙහි අන්තර්ගතය ඔබගේ බැංකුවේ අදාළ දෙපාර්තමේන්තුවේ/ශාඛාවේ නිළධාරීන්ගේ අවධානයට යොමු කරන ලෙස ඉල්ලා සිටිමු.

මෙයට විශ්වාසී

අත්සන් කළේ
බී. එල්. ජේ. එස්. බාලසූරිය
අධ්‍යක්ෂ/ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව

ඇමුණුම (අ)

ලියාපදිංචි අංකය: .....

සෞභාග්‍ය ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලියාපදිංචි කිරීමේ අයදුම්පත

1. නම/ සහභාගීත්ව මූල්‍ය ආයතනයනයේ ශාඛාව	
2. ශාඛාවේ ලිපිනය	
3. දුරකථන අංකය/ ෆැක්ස් අංකය	

4. අයදුම්කරුගේ තත්ත්වය පුද්ගල ☐ හවුල් ☐

5. අයදුම්කරුගේ/ හවුල්කරුගේ/ අධ්‍යක්ෂකගේ නම

නම	ලිපිනය	ජා.හැ. අංකය	ස්ත්‍රී පුරුෂ භාවය	ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම

6. ණය කාණ්ඩය (පළමු/ දෙවන ණය) :

7. සම්පූර්ණ ලිපිනය/ ව්‍යාපෘතිය පිහිටා ඇති ස්ථානය .....

8. දිස්ත්‍රික්කය .....

9. ව්‍යාපෘතියේ වර්ගය කුඩා ☐ මධ්‍යම ☐

10. සෞභාග්‍ය ණය යෝජනා ක්‍රමය යටතේ මූල්‍යනය කිරීමට අපේක්ෂිත ව්‍යාපෘතිය පිළිබඳ කෙටි විස්තරයක් (ණය ලබාගැනීමේ අරමුණ) .....

11. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය	
12. ණය ගැනුම්කරුගේ දායකත්වය	
13. අවශ්‍ය ණය ප්‍රමාණය	
14. නිර්දේශිත ණය ප්‍රමාණය/ සහභාගීත්ව මූල්‍ය ආයතනයනය අනුමත කළ	

ඉහත අංක 10හි සඳහන් කර ඇති යෝජිත ව්‍යාපෘතිය මම/ ණය නිළධාරියා නිරීක්ෂණය කළ බවට සහතික වන අතර, ලාභ අත්පත් කර ගැනීම සඳහා ප්‍රමාණවත් මුදල් ගලා ඒමක් ඇති බව සනාථ වූ බැවින් සෞභාග්‍ය ණය යෝජනා ක්‍රමය යටතේ මූල්‍යනය සඳහා නිර්දේශ කරමි.

දිනය: ශාඛා කළමනාකරුගේ අත්සන/ නිල මුද්‍රාව

ඇමුණුම (ආ)

සෞභාග්‍ය ණය යෝජනා ක්‍රමය

උප ණය ගැනුම්කරු ලියාපදිංචිය- ණය කාණ්ඩය - රු.මි. 1 සහ ඊට පහළ

අංකය	බැංකුව	බැංකු සංකේතය	බැංකු ශාඛාව	ශාඛා සංකේතය	ශාඛාව අයත් දිස්ත්‍රික්කය	අයදුම්කරුවන් / අයදුම්කරුවන්ගේ තත්ත්වය*	අයදුම්කරුවන් /අයදුම්කරුවන්ගේ අවසාන නම	මුලකුර	ස්ත්‍රී/පුරුෂ භාවය	ජාතික හැඳුනුම්පත් අංකය**	ව්‍යාපාර ලියාපදිංචි අංකය සහ දිනය	අයදුම්කරුවන්ගේ සෞභාග්‍ය ණය යටතේ දැනටමත් ණයක් ලබලාගෙන තිබී නම් කරුණාකර ණය විස්තර දක්වන්න			අයදුම්කරු/ අයදුම්කරුවන්ගේ ලිපිනය	අයදුම්කරු/ අයදුම්කරුවන්ගේ දුරකථන අංකය	ලබා ඇති ඉගෙනුම් අධ්‍යාපන සුදුසුකම්***	ව්‍යාපෘතියේ/ ව්‍යාපාරයේ නම	ව්‍යාපෘතියේ/ ව්‍යාපාරයේ ලිපිනය	ව්‍යාපෘතියේ/ ව්‍යාපාරයේ දිස්ත්‍රික්කය	ව්‍යාපෘතියේ/ ව්‍යාපාරයේ නම	ව්‍යාපාරයේ ස්වභාවය (ක්ෂුද්‍ර/ කුඩා/ මධ්‍ය/ක්ෂුද්‍ර කුඩා සහ මධ්‍ය පරිමාණ නොවන)*	අපේක්ෂිත පිරිවැය (රු.)	ණය ගැනුම්කරුගේ දායකත්වය (රු.)*	අවශ්‍ය ණය අගය (රු.)	සහතිකත්ව මූල්‍ය ආයතනය විසින් නිර්දේශ කරන ලද ණය අගය (රු.)*	ව්‍යාපාර ස්වභාවය මත සහතික කිරීමේ/ ලියාපදිංචි කිරීමේ අවශ්‍යතා සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් නිසි ලෙස ලද (ඔව්/ නැත)*						සහතිකත්ව මූල්‍ය ආයතනයේ කළමනාකරු/ නිලධාරියාගේ අදහස
												ඔව් / නැත	පූර්ව ණය ලියාපදිංචි අංකය	පූර්ව ණය අගය (රු.)													මූල් මිල කැඳවුම (ණය ගැනුම්කරු හෝ ශාඛා කළමනාකරු අත්සනින්)	ව්‍යාපාරය කෘෂිකර්මය හා සම්බන්ධ වන්නේ නම් ගොවිජන සංවර්ධන නිලධාරියා විසින් තක්සේරු කරනු ලැබීම මත සහතික කිරීම	ව්‍යාපාරය පසු පාලනය හා සම්බන්ධ වන්නේ නම් පසු වෛද්‍යවරයෙකු විසින් අගය කරනු ලැබීම මත සහතික කිරීම	ව්‍යාපාරය නවාකැන් පහසුකම් සැලසීම හා සම්බන්ධ වන්නේ නම් සංචාරක මණ්ඩලයේ ලියාපදිංචිය	ව්‍යාපාරය සෞඛ්‍ය සේවය සම්බන්ධ වන්නේ නම් පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාව	වෙනත්	

උක්ත අයදුම්කරුවන් මෙම ණය යෝජනා ක්‍රමය යටතේ මෙහෙයුම් උපදෙස්වලට අනුව ණය මුදලක් ලබා ගැනීමට සුදුසුකම් ලබන බවත්, අයදුම්කරුවන්ගේ සියලු විස්තර නිරවද්‍ය බවත් මම සහතික කරමි.

නම සහ බලයලත් නිලධාරියාගේ තනතුර .....

දිනය .....

* තනි පුද්ගල/හවුල්/සමාගම්

** 1998ට පෙර උපත් සඳහා පැරණි ජා.හැ. අංකය (හවුල් ව්‍යාපාරයක සියලු හවුල්කරුවන්ගේ සහ සමාගම්වල සියලු අධ්‍යක්ෂකවරුන්ගේ ජා.හැ අංක සපයන්න)

*** සාමාන්‍ය පෙළ/උසස් පෙළ/ඩිප්ලෝමා/පශ්චාත් උපාධි සුදුසුකම්

ඇමුණුම (ඇ)

සෞභාග්‍ය ණය යෝජනා ක්‍රමය - දෙවන ණය සඳහා නිර්දේශය

1. නම/ සහභාගීත්ව මූල්‍ය ආයතනයනයේ ශාඛාව	
2. ශාඛාවේ ලිපිනය	
3. දුරකථන අංකය/ ෆැක්ස් අංකය	

4. අයදුම්කරුගේ තත්ත්වය පුද්ගල ☐ හවුල් ☐

5. අයදුම්කරුගේ/ හවුල්කරුගේ/ අධ්‍යක්ෂකගේ නම

නම	ලිපිනය	ජා.හැ. අංකය	ස්ත්‍රී පුරුෂ භාවය	ලබාඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම

6. මූලිකව/ පළමු කාණ්ඩය යටතේ ලබා ගත් ණය ප්‍රමාණය:

   රු. .....

7. පළමු ණය ලබාගත් දිනය සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි අංකය/ ප්‍රතිමූල්‍ය පහසුකම් ලබාගත් අංකය:

   7.1 ලියාපදිංචිය : අංකය ..... දිනය .....

   7.2 ප්‍රතිමූල්‍ය : අංකය ..... දිනය .....

8. දෙවන ණය කාණ්ඩය යටතේ අවශ්‍ය ණය ප්‍රමාණය : .....

9. සෞභාග්‍ය ණය යෝජනා ක්‍රමය යටතේ මූල්‍යනය කිරීමට අපේක්ෂිත ව්‍යාපෘතිය පිළිබඳ කෙටි විස්තරයක් (ණය ලබාගැනීමේ අරමුණ)

10. ණය ආපසු ගෙවීමේ තත්ත්වය (සතුටුදායකයි/ අසතුටුදායකයි) :

    .....

11. මුල් ණය ලබා ගැනීමෙන් පසු ව්‍යාපාරයේ ක්‍රියාකාරීත්වය :

    .....

ඉහත අංක 9හි සඳහන් කර ඇති යෝජිත ව්‍යාපෘතිය මම/ ණය නිළධාරියා නිරීක්ෂණය කළ බවට සහතික වන අතර, ලාභ අත්පත් කර ගැනීම සඳහා ප්‍රමාණවත් මුදල් ගලා ඒමක් ඇති බව සොයා ගත් බැවින් සෞභාග්‍ය ණය යෝජනා ක්‍රමය යටතේ මූල්‍යනය සඳහා නිර්දේශ කරමි.

දිනය: ශාඛා කළමනාකරුගේ අත්සන/ නිල මුද්‍රාව

පරිශිෂ්ඨය I

ප්‍රතිමූල්‍යය අයදුම්පත් අංකය.....

(2010/03/22 දිනැති RDD/PR/2010/03 අංක දරන මෙහෙයුම් උපදෙස් අංක RDD/PR/2010/03 අනුව)

ලිපිනය:

දිනය:

'සෞභාග්‍යා' ණය යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිමූල්‍යය සඳහා අයදුම් කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුව වෙත.

මහත්මවරුනි,

මුදල් නීති පනත (පරිච්ඡේද 422) හි වගන්ති 88 ඊ හි අර්ථය තුළ ණය ආයතනයක් වන, ... වන අප, කලින් කලට සංශෝධනය වන පරිදි / ලියාපදිංචි ගත කළ මූල්‍ය කල්බදු ආයතනයක් වන අතර, මුදල් නීති පනතෙහි වගන්ති 88 අ හි විධිවිධාන යටතේ, ... (රු.....) ණය මුදලක් පිරිනැමීම සඳහා අයදුම් කිරීමට, මෙම ආයතනයේ සත්‍ය බවට සහතික කළ සමාගම් ව්‍යවස්ථාව සමඟ මෙමඟින් යොමු කරන්නෙමු/ දැනටමත් යොමු කර ඇත්තෙමු.

2. මෙම අයදුම්පත සෑදීමේ දී, 2010.03.22 දරන ඔබගේ මෙහෙයුම් උපදෙස් අංක RDD/2010/03 හි නියම කොට තිබෙන නියමයන් සහ කොන්දේසි සමඟ අනුකූල වීමට අපි එකඟ වන්නෙමු.

3. උක්ත සඳහන් මෙහෙයුම් උපදෙස්වලින් අවශ්‍ය වන පරිදි සහ ඊට අනුකූලව, සෞභාග්‍යය නම් වූ කෘෂිකර්මය, පශු සම්පත් සහ ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සඳහා වන විශේෂ ණය යෝජනා ක්‍රමය යටතේ මෙම අයදුම්පතෙහි සඳහන් දිනෙන් වහාම මාස හයක් ගත වීමට පෙර ලබා දුන් ණය අගයන්හි පිටපතක් මේ සමඟ අපි ඉදිරිපත් කරන්නෙමු. ප්‍රතිමූල්‍ය ණය සඳහා සිදු කරන අයැදුමකට සහාය වශයෙන් ප්‍රකාශයේ සඳහන් කර ඇති ණය අගයන් මින් පෙර කිසිදු ප්‍රකාශයක පිළිබිඹු කර නොමැති බවට අපි සහතික කරමු.

4. 20.... වර්ෂයේ ..... මාසයේ ..... දින ප්‍රථම වාරිකය ගෙවිය යුතු වන, එක් වාරිකයක් රු..... වන ..... කින් (වාරික ගණන) ..... (මාසිකව/ කාර්තුමය/ අර්ධ වාර්ෂිකව [වාර ගණන සඳහන් කරන්න]) මෙම අයදුම්පත ප්‍රකාරව අපට ලබා දුන් මුදල් ඔබ වෙත ආපසු ගෙවීමට අපි මෙමඟින් විශේෂයෙන් ම එකඟ වන්නෙමු.

5. (i) උක්ත 3 වන පරිච්ඡේදයේ සඳහන් රාජ්‍ය ව්‍යවසායන් වෙත ලබා දුන් ණය ඔවුන්ගේ ණය ගැනීමේ බලයන් තුළ පවත්නා බවටත්;

(ii) එවැනි ණය ආපසු ගෙවීම සඳහා ලබා ගත් ඇප සහතිකයන් ප්‍රකාරව, ඇපකරුවන්ට එවැනි ඇප සහතිකයන් ලබා දීමේ බලය සතු බවටත්;

යනාදී කරුණු සඳහා අප තෘප්තිකාරක වූ බවට අපි මින් සහතික කරමු.

අත්සන
සහභාගීත්ව මූල්‍ය ආයතන බලයලත්
නිලධාරියා (නිලධාරිවරුන්) ගේ
නම සහ විස්තරය
කළමනාකරු, ප්‍රතිමූල්‍යය ඒකකය.

උප ග්‍රන්ථය II

ප්‍රතිමූල්‍ය අයදුම්පත් අංකය.....

'සෞභාග්‍යා' විශේෂ ණය යෝජනා ක්‍රමය යටතේ මුදාහරින ලද ණය පිළිබඳ ප්‍රකාශය

(2010/03/22 දිනැති RDD/PR/2010/03 දරන මෙහෙයුම් උපදෙස් වෙත)

විසින්: ප්‍රතිමූල්‍ය ඒකකය

වෙත: ශ්‍රී ලංකා මහ බැංකුව

සහභාගීත්ව මූල්‍ය ආයතනය: ..... ශාඛාව: ..... දිස්ත්‍රික්කය:.....

විමසීම අංකය	ණය ගැනුම්කරුගේ නම, ලිපිනය සහ ජා.හැ.අංකය	ව්‍යාපෘතිය පිළිබඳ විස්තරය සහ ණය ලබාගැනීමේ අරමුණ	ණයෙහි කාණ්ඩය (පළමු/ දෙවන ණය)	උප ණය අගය (රු.)	මුදාහරින ලද ණය ප්‍රමාණය (රු.)	මුදාහරින ලද දිනය	මුදාහරින ලද ණය සඳහා අපේක්ෂිත ප්‍රතිමූල්‍ය අගය (රු.)	සහන කාලය	ණය ආපසු ගෙවීමේ කාල රාමුව			
									වාරික		පළමු වාරිකය සඳහා උපචිත දිනය	අවසාන වාරිකය සඳහා ගෙවිය යුතු දිනය
									වාරික ගණන	වාරිකවල අගය (රු.)		
මුළු												

ශ්‍රී ලංකා මහ බැංකුව සහ සහභාගීත්ව මූල්‍ය ආයතනය අතර තිබූ ප්‍රතිමූල්‍ය ගිවිසුමෙහි එකඟ වී ඇති පරිදි ඉහත ණය ආපසු ගෙවීමේ කාලරාමුවෙහි සඳහන් අර්ධ වාර්ෂික වාරිකවලින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඉහත ණය මුදල ගෙවීමට අපි පොරොන්දු වන්නෙමු.

.....

(බලයලත් නිලධාරියාගේ අත්සන)

පරිශිෂ්ටය III

ප්‍රතිමූල්‍ය අයදුම්පත් අංකය.....

(2010/03/22 දිනැති RDD/PR/2010/03 දරන මෙහෙයුම් උපදෙස් අංක වෙත)

ඉල්ලුම් පොරොන්දු නෝට්ටුව

දිනය: .....

කොළඹ දී ය.

රු.....

ඉල්ලුම මත, ... (සහභාගීත්ව මූල්‍ය ආයතනයේ නම හා ලිපිනය) වන පහත අත්සන් තබන ලද අප විසින් මුළු ණය මුදල වූ රුපියල් .....(රු..... .....) වාර්ෂිකව ..... පොලී අනුපාතය යටතේ එහි වූ පොලී මුදල ද සමග මෙහි සඳහන් දිනට, ශ්‍රී ලංකා මහ බැංකුව හෝ ඉල්ලන පියවීම සිදු කරන බවට කොළඹ දී මෙයින් පොරොන්දු වෙමු.

වෙනුවට (සහභාගීත්ව මූල්‍ය ආයතනයේ නම)

ප්‍රතිමූල්‍ය ඒකකය

ප්‍රධාන කාර්යාලය

1. .....

2. .....

....

(මුද්‍රාව) (බලයලත් නිළධාරියාගේ අත්සන)

සාක්ෂි:

1. .....

2. .....

පරිශිෂ්ටය IV

ප්‍රතිමූල්‍ය අයදුම්පත් අංකය.....

(2010.03.22 දිනැති මෙහෙයුම් උපදෙස් අංක RDD/PR/2010/03 වෙත)

භාරදීමේ ලිපිය

දිනය: .....

කොළඹ දී ය.

ශ්‍රී ලංකා මහ බැංකුව වෙත,

සෞභාග්‍යා කොවිඩ්19 පුනුරුද ණය සහන පහසුකම යටතේ වූ 2010.03.22 දිනැති ඔබගේ මෙහෙයුම් උපදෙස් අංක NoRDD/PR/2010/03 පරිදි, ණය යෝජනා ක්‍රමය යටතේ ක්‍රියාත්මක කරන ලද ණය මෙහෙයුම් සඳහා අපහට මූල්‍ය අනුග්‍රහය ලබා දීම අරමුණු කර ගනිමින්, කලින් කලට සංශෝධනය කරන මුදල් නීති පනතේ 88අ වගන්තියේ (422 පර්ච්ඡේදය) ප්‍රතිපාදන යටතේ සලකා බලා එකඟ වූ ණය ප්‍රමාණය වන රුපියල් ..... (රු. .....) මුදල සඳහා වූ පොරොන්දු නෝට්ටුවේ රුපියල් ..... (රු. .....) ක මුදල, ඉල්ලුම් කරන ලද පොලී මුදල ද සමඟ මෙයින් එවනු ලැබේ.

මෙහිදී ගෙවීමක් සිදු නොකරන අතර, පෙරොන්දු නෝට්ටුව අගරු වීම සම්බන්ධ දැන්වීම අවශ්‍ය නොවන බවට තහවුරු කරමු.

වෙනුවෙන් (සහභාගීත්ව මූල්‍ය ආයතනයේ නම)

ප්‍රතිමූල්‍ය ඒකකය

ප්‍රධාන කාර්යාලය

1. .....

2. .....

..... (බලයලත් නිළධාරියාගේ අත්සන)

(මුද්‍රාව)

පරිශිෂ්ටය V

ප්‍රතිමූල්‍ය අයදුම් කිරීමේ අංකය .....

(2010/03/22 දිනැති RDD/PR/2010/03 දරන මෙහෙයුම් උපදෙස් අංක වෙත)

මුදල් නීති පනතේ 88 අ වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය වෙත ලබා දෙන ප්‍රතිඥාවක ආකාරයේ පැවරුම් පෝරමය*

දිනය: .....

කොළඹ දී ය.

.....

..... (සහභාගීත්ව මූල්‍ය ආයතනයේ නම සහ ලිපිනය) වන අපි, 1963 අංක 11 දරන මුදල් පනතෙහි 67 වන වගන්තිය සහ 1968 අංක 21 දරන මුදල් නීති (සංශෝධනය) පනත මඟින් සංශෝධනය කළ පරිදි මුදල් නීති පනතෙහි 88 අ වගන්තිය ප්‍රකාරව, වර්ෂයකට සියයට ..... ක පොලියක් සමඟ ආපසු ගෙවිය යුතු වන, බැංකුව විසින් අප වෙත ලබා දුන් රුපියල් ..... (රු.....) ක ණය මුදලක් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ආපසු ගෙවීම සඳහා ඇප මුදලක්/ තවදුරටත් ඇප මුදලක් ලෙස, මේ සමඟ උපලේඛනයේ දක්වා ඇති විස්තර අනුව, අප වෙත ලැබිය යුතු ණය මුදල, ප්‍රතිඥාවක ආකාරයෙන්, ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පවරන්නෙමු.

උපලේඛනය

ණය අගය (රු)	ණය ගැනුම්කරුගේ ණය සහ ලිපිනය	දිනය	නොතාරිස්

බලයලත් නිලධාරියාගේ අත්සන .....

(සහභාගීත්ව මූල්‍ය ආයතනයේ නම සහ ලිපිනය) සඳහා

ප්‍රතිමූල්‍යය ඒකකය

ප්‍රධාන කාර්යාලය

* බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින් භාවිත කරනු ලැබීම සඳහා පමණි.

පරිශිෂ්ටය VI

ණය මුදාහැරීමේ ලිපිය

මෙහෙයුම් උපදෙස් අංක : **RDD/PR/2010/03**

බැංකුවේ නම :
බැංකු කේත අංකය :
ශාඛාවේ නම :
ශාඛා කේතය :
ණය මුදලේ අනු අංකය :
දිනය :
මුදාහැරීම :

*

1	2	3	4	5	6	7	8	9	10

සෞභාග්‍ය ණය යෝජනා ක්‍රමය යටතේ මුදාහරින ලද ණය පිළිබඳ වාර්තාව

විමසුම් අංකය

1. **ණය ගනුදෙනුකරුගේ විස්තර**

   1.1 ණය ගනුදෙනුකරුගේ නම :
   1.2 ණය ගනුදෙනුකරුගේ ලිපිනය :

2. **ණය පිළිබඳ විස්තර**

   2.1 ණය ලබා ගන්නා අරමුණ :
   2.2 උප ව්‍යාපෘතියේ පිහිටීම :
   2.3 අනුමත වූ මුළු ණය මුදල : මූලිකව : රු.
   පිරිවැය ඉහළ යෑම හේතුවෙන් ණය මුදලේ වැඩි කිරීම් : රු.
   මුළු මුදල : රු
   2.4 ණය අනුමත වූ දිනය :
   ණය වැඩිවීම අනුමත වූ දිනය :
   2.5 ඉල්ලුම් කළ ප්‍රතිමූල්‍ය සඳහා වාරික සඳහා ආපසු ගෙවීමේ වැඩසටහන :
   දිනය : ප්‍රමාණය (රු.) :
   2.6 පොලී අනුපාතය :

3. **ණය මුදලේ තත්ත්වය**

   3.1 පෙර නිකුත් කරන ලද මුදල හා ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ප්‍රතිමූල්‍ය අයදුම් කරන ලද ප්‍රමාණය : රු.
   3.2 දැනට මුදාහැර ඇති ණය මුදල හා ප්‍රතිමූල්‍ය ඉල්ලුම් කරන ප්‍රමාණය : රු.
   මුළු මුදල : රු.

   ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය සහ නිවැරදි බවට තහවුරු කරමි.
   දිනය: .....

ශාඛා කළමනාකරුගේ අත්සන
ශාඛා කළමනාකරුගේ නම
* ණය වාරික අනුපිළිවෙළ අනුව, අදාළ කොටුවේ × සලකුණක් යොදන්න.

පරිශීලක අංකය : 32/04/034/0001/001 2021.09.10

සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකමෙහි සියලු සහභාගීත්ව මූල්‍ය ආයතනවල ප්‍රධාන විධායක නිලධාරී/ සාමාන්‍යාධිකාරීවරුන් වෙත හිතවත් මහත්මයාණෙනි/ මහත්මියනි,

(1) **සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකම: සංචාරක ක්ෂේත්‍රයෙහි ව්‍යාපාර සහ පුද්ගලයන් සඳහා සපයන ලද සහන දීර්ඝ කිරීම**

(2) **සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකම: සහන දීර්ඝ කිරීම.**

මෙය ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් උක්ත විෂයයන් සම්බන්ධව 2021.03.24 සහ 2021.06.09 යන දිනවල දී පිළිවෙලින් නිකුත් කරන ලද ලිපිවලට තවදුරටත් අදාළ වේ.

2. සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකම (SCRF) යටතේ ලබා දුන් ණය සඳහා දීර්ඝ කරන ලද සහන

2.1 ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද 2021.09.01 දාතම 2021 අංක 08 දරන මුදල් මණ්ඩල චක්‍රලේඛයේ වගන්ති 09 (මුදල් මණ්ඩල චක්‍රලේඛය) (ඇමුණුම අ) අනුව යමින්, SCRF අදියර I, II සහ III යටතේ සංචාරක ක්ෂේත්‍රය සඳහා අවස්ථානුරූපිව 2021.12.31 දක්වා ලබා දුන් ණය සහන පහසුකම දීර්ඝ කිරීමට තීරණය කොට ඇත.

2.2 උප ණය ගැනුම්කරුවන් විසින් ඉල්ලීම් කර ඇති පරිදි, අදාළ ණය අගයන්හි ප්‍රාග්ධනය ආපසු ගෙවීම හෝ ප්‍රාග්ධනය සහ පොලී ගෙවීම් සඳහා පමණක් ණය සහන සැපයිය හැකිය. යෝජිත සහන සිද්ධියෙන් සිද්ධියට, මුදල් මණ්ඩල චක්‍රලේඛයෙහි නිර්වචනය කර ඇති පරිදි, කොවිඩ්-19 න් බලපෑමට පත් උප ණය ගැනුම්කරුවන් සඳහා ලබා දිය යුතුය.

2.3 සහනවලින් ප්‍රතිලාභ ලැබීමට අපේක්ෂා කරන සුදුසුකම්ලත් ණය ගැනුම්කරුවන් 2021.09.30 දිනට හෝ ඊට පෙර අදාළ සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත එවැනි ඉල්ලීමක් සිදු කළ යුතුය. සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් විද්‍යුත් තැපෑල සහ කෙටි පණිවුඩ ඇතුළු මුද්‍රිත සහ/ හෝ විද්‍යුත් ක්‍රමවේද ඔස්සේ මේ සඳහා අයදුම් කිරීම සඳහා සහන, නියමිත අවසාන දිනයන් සහ අයදුම් පත්‍ර ආකෘතිය යනාදිය සියලු සුදුසුකම් ලබන ණය ගැනුම්කරුවන්ට කඩිනම්ව දැනුම් දිය යුතුය.

2.4 ඒ අනුව, සහන දීර්ඝ කිරීමෙන් ප්‍රතිලාභ ලැබීමට අපේක්ෂා කරන සුදුසුකම්ලත් ණය ගැනුම්කරුවන්ගේ ඉල්ලීම භාර ගන්නා ලෙස සහභාගීත්ව මූල්‍ය ආයතනවලින් ඉල්ලා සිටින අතර, ඔවුන් විසින් 2021.10.15 දින වන විට, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත අමුණන ලද ආකෘතියට අනුව (RDD - SCRF-2021.09.10) යෝජනා ක්‍රමයේ එක් එක් අදියර සඳහා වෙන වෙනම විස්තර වාර්තා කළ යුතුය. විස්තර සහිත එක්සෙල් ආකෘතියේ මෘදු පිටපත vijithap@cbsl.lk යන විද්‍යුත් ලිපිනයට පිටපත් කර, bashika@cbsl.lk සහ sehan@cbsl.lk වෙත යැවිය යුතුය.

3. දීර්ඝ කළ ණය සහන කාල පරිච්ඡේදවලට අදාළව පොලී ගණනය කිරීම.

3.1 ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා විසින් සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකම SCRF I, II සහ III අදියරන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ නිකුත් කරන ලද අදාළ මෙහෙයුම් උපදෙස් සහ පසුකාලීන සංශෝධනයන්හි දක්වා ඇති සියයට 4ක් වන වාර්ෂික පොලී අනුපාතිකය අනුව යමින්, දීර්ඝ කළ ණය සහන කාලසීමාව හේතුවෙන් නිර්මාණය වන ප්‍රාග්ධන ඒකරාශීකරණය මත ගොඩනැගෙන පොලිය ගණනය කිරීමට මින් දැනුම් දෙනු ලැබේ.

3.2 ඕනෑම අවස්ථාගත කරුණක් යටතේ, සහභාගීත්ව මූල්‍ය ආයතනයක් විසින් ඕනෑම දී ඇති කාලයක දී, ඉහත සඳහන් පොලී අනුපාතිකයට වඩා ඉහළ අනුපාතිකයකට උප ණය ගැනුම්කරුවෙකුගෙන් පොලිය අය කර ඇති අවස්ථාවක දී, සහභාගීත්ව මූල්‍ය ආයතනයක් එවැනි පොලී අයකිරීම් ආපසු හැරවීමට වහාම කටයුතු කළ යුතු අතර, අදාළ උප ණය ගැනුම්කරුට එහි වෙනස ගෙවිය යුතු වේ.

3.3 සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකම I, II සහ III අදියරන්හි ඕනෑම උප ණය ගැනුම්කරුවෙකු ණය සහන කාලය තුළ පොලී නොගෙවීමට තීරණය කර ඇත්නම්, එවැනි කාලයක දී සමුච්චිතව තිබෙන පොලිය, ඉතිරිව පවතින ණය වාරික අතර සමානව බෙදා හැරිය යුතුය. ණය සහන කාලය තුළ දී සමුච්චිත පොලිය මත කිසිදු පොලියක් අය නොකළ යුතු අතර, ණය සහන කාලය තුළ කිසිදු වැල් පොලියක් ගණනය නොකළ යුතුය.

3.4 පොලී ගණනය කිරීම පිළිබඳව වන මෙම මාර්ගෝපදේශයන් 2021.03.24 සහ 2021.06.09 දාතම ලිපි මඟින් ලබා දුන් ණය සහන සඳහා ද අදාළ වේ.

4. අක්‍රීය ණය (NPLs) නැවත අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම

4.1 මුදල් මණ්ඩල චක්‍රලේඛයේ වගන්ති 2 (c) අනුව යමින්, සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකම I, II සහ III අදියරන්හි ණය පැහැර හරින ලද ණය ගැනුම්කරුවන් මත පැවති නැවත අයකර ගැනීම්, 2021.12.31 න් පසු මසක් තුළ, එම චක්‍රලේඛයේ ම මාර්ගෝපදේශවලට අනුව අහෝසි කරව, අවශ්‍ය ආරම්භක නැවත අය කර ගැනීමේ සියලු ක්‍රියාමාර්ග ආරම්භ කළ යුතු වේ.

4.2 සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකම III අදියරයෙහි පවතින මෙහෙයුම් උපදෙස් තුළ නියම කර ඇති පරිදි එම හිමිකම්වලට අදාළ අවශ්‍ය සියලු නැවත අය කර ගැනීමේ ක්‍රියාමාර්ග ගැනීමෙන් අනතුරුව, ණය ඇප ආවරණ හිමිකම් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත යැවිය යුතුය.

5. අක්‍රීය ණය කාණ්ඩයේ ණය සඳහා සහන සැලසීම

5.1 සහභාගීත්ව ආයතන අක්‍රීය ණයවලට අදාළව තීරණයක් ගැනීමේ දී, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද සියලු විධාන සමඟ අනුකූල විය යුතුය යන කොන්දේසියට යටත්ව, සහභාගීත්ව ආයතන විසින් ඉදිරි ණය වාරික සඳහා ණය සහන සැලසිය යුතු වේ. තවද, සහභාගීත්ව ආයතන විසින් දැනටමත් අක්‍රීය ණය කාණ්ඩයේ සිටින ණය ගැනුම්කරුවන් සඳහා ණය සහන පහසුකම පසු දාතම නොකළ යුතු අතර, එවැනි ණය ගැනුම්කරුවන් සක්‍රීය කාණ්ඩයට මාරු නොකළ යුතුය.

6. සහභාගීත්ව ආයතන මෙම උපදෙස්වලට අනුකූල වීම තහවුරු කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ සහයෝගයෙන් කටයුතු කෙරෙනු ඇත.

7. කරුණාකර සෞභාග්‍ය කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකම් යෝජනා ක්‍රමවල මෙහෙයුම් කාර්යක්ෂමතාව පවත්වා ගෙන යෑමට ඉහත සඳහන් කළ අවසාන දිනයන් සැපිරීම තහවුරු කිරීම සඳහා මෙම ලිපියේ අන්තර්ගතයන් ඔබේ බැංකුවේ අදාළ දෙපාර්තමේන්තු/ ශාඛාවන්හි නිලධාරීන්ගේ අවධානයට යොමු කරන ලෙස ඉල්ලා සිටිමි.

මෙයට විශ්වාසී,
අත්සන් කරන ලදී.

බී.එල්.ජේ.එස්. බාලසූරිය
අධ්‍යක්ෂ/ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව

RDD - SCRF- 2021.09.10 - ඇමුණුම **I**

'සෞභාග්‍ය කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකම'

ව්‍යාපාර සහ තනි පුද්ගල ව්‍යාපාර සඳහා සපයන ලද ණය සහන දීර්ඝ කිරීමේ විස්තර

අදියර:.....

සහභාගීත්ව මූල්‍ය ආයතනයේ නම: .....

#	ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි අංකය	ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රති මූල්‍යන අංකය (අදාළ වන්නේ නම්)	ණය ගැනුම්කරු/ ගැනුම්කරුවන්ගේ නම	ජාතික හැඳුනුම්පත් අංකය/ ව්‍යාපාර ලියාපදිංචි අංකය සහ නිෂ්පාදන අංකය	ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද ණය අගය (රු.)	සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් ණය මුදා හරින ලද දිනය	ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රදානය කරන ලද ප්‍රති මූල්‍යනයෙහි දිනය (SCRF අදියර I සහ II සඳහා)	සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් සහන දීර්ඝ කරන ලද දිනය	ණය මුදලෙහි පවතින ආපසු ගෙවීම් කාලය*	ණය සහනය				ණය සහන පහසුකම ඉල්ලුම් කරන ලද ණය සහන පහසුකම (ප්‍රාග්ධනය සඳහා පමණක්/ ප්‍රාග්ධනය හා පොලිය යන දෙකටම සඳහා) **	අංශය (සංචාරක කර්මාන්තය/ වෙනත්) **
										ණය සඳහා සපයන ලද ආරම්භක සහන කාලය (මාස ගණන)	මින් පෙර ලබා දුන් ණය සහනය නිමා වන දිනය (ඇත්නම්)	ඉල්ලීම් කළ නව ණය සහන පහසුකම (මාස ගණන)	ණය සහනය අවසන් වන දිනය		

* 2021.06.09 දාතම ලිපිය මගින් ලබා දුන් ණය සහනයෙන් පසුව. (ණය ආපසු ගෙවීමේ කාලය මෙම ණය සහනය මගින් දීර්ඝ නොකළ යුතු බව කරුණාවෙන් සලකන්න)

** සුදුසු පරිදි සඳහන් කරන්න.

පරිශීලක අංකය: 32/04/034/0001/001

2021.09.10

සහභාගීත්ව මූල්‍ය ආයතනයන්හි ප්‍රධාන විධායක නිළධාරීන්/ සාමාන්‍යාධිකාරීන් වෙත.

ගරු මහත්ම/ මහත්මියනි,

ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක කරන ලද ණය යෝජනාක්‍රම යටතේ ණය ඇප ආවරණ ඉල්ලීම් ඉදිරිපත් කිරීම සඳහා උපදෙස්

කොවිඩ්-19 වසංගතය හේතුවෙන් බලපෑමට ලක්වූ ව්‍යාපාර සහ තනි තනි පුද්ගලයින් සඳහා හඳුන්වාදුන් සහන ඇතුළත් කරමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් 2021.09.01 වන දිනැති මුදල් මණ්ඩල චක්‍රලේඛ අංක 08 නිකුත් කරන ලදී. ඉහත සඳහන් කරන ලද චක්‍රලේඛයේ 2 (ඇ) වන වගන්තිය අනුව, බලපත්‍රලාභී බැංකු විසින් ණය පහසුකම්වලට එරෙහිව නැවත අය කර ගැනීම් සඳහා ගනු ලබන සියලුම ක්‍රියාමාර්ග 2021.12.31 වන දින දක්වා අත්හිටුවිය යුතු වේ.

ඒ අනුව, සහභාගීත්ව මූල්‍ය ආයතනයන විසින් 2021.12.31 වන දිනෙන් මාසයක් ගත වූ පසු පහත සඳහන් ණය ඇප ආවරණ ණය යෝජනාක්‍රම යටතේ අක්‍රිය ණය ලෙස හඳුනාගන්නා ලද ණය ආපසු අයකර ගැනීම සඳහා අවශ්‍ය සියලුම ක්‍රියාමාර්ග ගත යුතුවේ.

- නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය
- සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද ණය සහන පහසුකම අදියර III
- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා ලබා දීමට අපේක්ෂිත කාරක ප්‍රාග්ධන ණය සඳහා වන ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය

ණය යෝජනාක්‍රම හා සම්බන්ධ මෙහෙයුම් උපදෙස්හී දක්වා ඇති ණය අයකර ගැනීමේ සියලුම ක්‍රියාමාර්ග ගැනීමෙන් පසු සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ණය ඇප ආවරණ හිමිකම්පෑම් එවිය යුතු වේ.

මෙම ලිපියේ අන්තර්ගතය ඔබගේ බැංකුවේ අදාළ දෙපාර්තමේන්තු/ශාඛා නිළධාරීන්ගේ අවධානයට යොමු කරන ලෙස ඉල්ලා සිටිමි.

මෙයට විශ්වාසී
අත්සන් කළේ, බී. එල්. ජේ. එස්. බාලසූරිය,
අධ්‍යක්ෂ/ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව

2021.09.21

කුඩා පරිමාණ තේ සහ රබර් පුනර්ජීවන ව්‍යාපෘතිය යටතේ සහභාගීත්ව මූල්‍ය ආයතනයන්හි ප්‍රධාන විධායක නිළධාරීන්/ සාමාන්‍ය විධායක නිළධාරීන් වෙත.

මහත්මයාණෙනී/ මහත්මියනි,

2021.09.01 දිනැති 2021 අංක 08 දරන මුදල් මණ්ඩල චක්‍රලේඛනය ප්‍රකාරව කුඩා පරිමාණ තේ සහ රබර් පුනර්ජීවන ව්‍යාපෘතිය යටතේ ලබා ගත් ණය සඳහා ලබා දීමට අපේක්ෂිත සහන

මෙරට ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීම උදෙසා කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් බලපෑමට ලක්වූ පුද්ගලයින් සහ ව්‍යාපාර සඳහා ණය සහන ලබා දීම අරමුණු කර ගනිමින් 2021.09.01 දිනැති 2021 අංක 08 දරන මුදල් මණ්ඩල චක්‍රලේඛය ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද බව ඔබ සියලු දෙනා මේ වන විටත් දන්නා කරුණකි (ඇමුණුම අ). ඒ අනුව, පහත සඳහන් කරුණු පිළිබඳව ඔබගේ අවධානය යොමු කරමි.

2. කුඩා පරිමාණ තේ සහ රබර් පුනර්ජීවන ව්‍යාපෘතිය යටතේ ලබා දීමට අපේක්ෂිත ණය සහන

2.1 මුදල් මණ්ඩල චක්‍රලේඛයේ 09 වන වගන්තිය හා ප්‍රකාරව, 2021.09.01 වන දින සිට 2021.12.31 දින දක්වා කුඩා පරිමාණ තේ සහ රබර් පුනර්ජීවන ව්‍යාපෘතිය යටතේ ලබා දුන් ණය සඳහා එක් එක් ණය මත පදනම්ව ණය සහන පහසුකම ලබා දීමට තීරණය කරන ලදී.

2.2 උප ණය ගනුදෙනුකරුවන් විසින් ඉල්ලා සිටි පරිදි, ප්‍රාග්ධන ආපසු ගෙවීම් හෝ අදාළ ණය මුදලේ ප්‍රාග්ධන සහ පොලී ගෙවීම් සඳහා පමණක් ණය සහනය ලබා දිය හැකිය. කොවිඩ්-19න් බලපෑමට ලක්වූ උප ණය ගනුදෙනුකරුවන් සඳහා එක් එක් ණය මත පදනම්ව යෝජිත සහන ලබා දිය යුතු වේ.

2.3 සහන ලබා ගැනීමට කැමැත්තක් දක්වන සුදුසුකම් ලබන ණය ගනුදෙනුකරුවන් විසින් 2021.10.15 වන දින හෝ ඊට පෙර එවැනි

සහන සඳහා ඉල්ලීමක් අදාළ සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත යොමු කළ යුතු වේ. සුදුසුකම් ලබන ණය ගනුදෙනුකරුවන් වෙත මුද්‍රිත සහ/ හෝ ඊමේල් පණිවිඩ හෝ කෙටි පණිවිඩ ඇතුළුව විද්‍යුත් මාධ්‍ය හරහා සහන, අවසන් දින සහ ඉදිරිපත් කිරීම සඳහා වන අයදුම්පත් සහ ආකෘතිය ආදිය කඩිනමින් දැනුම් දීමට සහභාගීත්ව මූල්‍ය ආයතන කටයුතු කළ යුතු වේ.

2.4 ඒ අනුව, සහන ලබා ගැනීමට කැමැත්තක් දක්වන සුදුසුකම් ලබන ණය ගනුදෙනුකරුවන්ගේ ඉල්ලීම් අනුමත කරන මෙන් සහභාගීත්ව මූල්‍ය ආයතනයන්ට දන්වා සිටින අතර, [2021.10.31 වන දින වන විට ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ සහ කුඩා පරිමාණ තේ සහ රබර් පුනර්ජීවන ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙත] අමුණා ඇති ආකෘතිය (RDD-STaRR- 21.09.2021 ඇමුණුම 1) අනුව ණය යෝජනා ක්‍රමයට අදාළ තොරතුරු වෙන වෙනම වාර්තා කළ යුතු වේ. තොරතුරු ඇතුළත් එක්සෙල් ආකෘතියේ මෘදු පිටපතක් gihan@cbsl.lk සහ sewwandi@cbsl.lk යන විද්‍යුත් ලිපිනයන්ට vijithap@cbsl.lk යන විද්‍යුත් ලිපිනයට පිටපත් කරමින් එවිය යුතු වේ.

3. දීර්ඝ කරන ලද ණය සහන කාලයන්ට අදාළව පොලිය ගණනය කිරීම

3.1 කුඩා පරිමාණ තේ සහ රබර් පුනර්ජීවන ව්‍යාපෘතිය ස්ථාපනය කිරීම හා සමගාමීව ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් නිකුත් කරන ලද අදාළ මෙහෙයුම් උපදෙස් සහ ඊට පසුව සිදු කරන ලද සංශෝධනයන්හී දක්වා ඇති පොලී අනුපාත හා අනුකූලව දීර්ඝ කරන ලද සහන කාල සීමාව හේතුවෙන් නිර්මාණය වන ප්‍රාග්ධන ඒකරාශීකරණය මත ගොඩනැගෙන පොලිය ගණනය කරන ලෙස සියලුම සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත මෙයින් දන්වා සිටියි.

3.2 උප ණය ගනුදෙනුකරුවෙකුගෙන් ඕනෑම අවස්ථාවක, ඕනෑම තත්ත්වයක් යටතේ ඉහත සඳහන් කර ඇති පොලී අනුපාතය ඉක්මවූ පොලියක් අය කර ගැනීමට කුමන හෝ සහභාගීත්ව මූල්‍ය ආයතනයක් කටයුතු කර ඇත්නම්, එවැනි සහභාගීත්ව මූල්‍ය ආයතන උප ණය ගනුදෙනුකරුට පක්ෂව එවැනි පොලී ගාස්තු ආපසු ගෙවීමට කඩිනමින් කටයුතු කළ යුතු අතර, අදාළ උප ණය ගනුදෙනුකරුට වෙනස ගෙවිය යුතු වේ.

3.3 ණය සහන කාල සීමාව තුළ කිසියම් උප ණය ගනුදෙනුකරුවෙකු පොලිය ගෙවීමෙන් වැළකී සිටියේ නම්, එම කාල සීමාව තුළ ඒකරාශී වූ පොලිය ඉතිරි ණය වාරික අතර සමව බෙදිය යුතු වේ. ණය සහන කාල සීමාව තුළ ඒකරාශීකරණය වූ පොලිය සඳහා පොලියක් අය නොකළ යුතු අතර, ණය සහන කාල සීමාව තුළ වැල් පොලිය ගණනය කිරීම නොකළ යුතු ය.

4. අක්‍රිය ණය යථා තත්ත්වයට පත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කිරීම

4.1 මුදල් මණ්ඩල චක්‍රලේඛයේ 2 (ඇ) වගන්තිය අනුව එම චක්‍රලේඛය මගින්ම තහනම් කරන ලද නැවත ණය අයකර ගැනීමේ ක්‍රියා පිළිවෙත සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ආරම්භ කළ යුතු අතර, 2021.12.31 දින සිට මාසයක් ඇතුලත තේ සහ රබර් පුනර්ජීවන ව්‍යාපෘතියේ ණය පැහැරහරින ලද උප ණය ගනුදෙනුකරුවන්ගෙන් එය අය කරගත යුතුය.

5. අක්‍රිය ණය කාණ්ඩයට අයත් ණය සඳහා සහන ලබා දීම

5.1 පියවිය යුතු ණය වාරික සඳහා අක්‍රිය ණය කාණ්ඩයට ද ණය සහන ලබා දීමට සහභාගීත්ව මූල්‍ය ආයතන කටයුතු කළ යුතු අතර, එහිදී තීරණයක් ගැනීමේ දී, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අක්‍රිය ණය සම්බන්ධයෙන් නිකුත් කරනු ලබන සියලුම විධානයන් හා අනුගත වන බවට වන කොන්දේසියට යටත් විය යුතු වේ. තවද, අක්‍රිය ණය කාණ්ඩයට ඒ වන විටත් අයත් ණය ගනුදෙනුකරුවන් සඳහා ණය සහන පහසුකම පෙර දිනක් යොදා සකස් කිරීම සහ එවැනි ණය ගනුදෙනුකරුවන් සක්‍රිය ණය කාණ්ඩයට යොමු කිරීමට සහභාගීත්ව මූල්‍ය ආයතන කටයුතු නොකළ යුතු වේ.

6. සහභාගීත්ව මූල්‍ය ආයතන මෙකී නියෝග හා අනුගත වීම තහවුරු කිරීම සඳහා අවශ්‍ය කටයුතු ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ සහයෝගීත්වයෙන් සිදු කරනු ඇත.

7. කුඩා පරිමාණ තේ සහ රබර් පුනර්ජීවන ව්‍යාපෘතියේ මෙහෙයුම් කාර්යක්ෂමතාවය පවත්වාගෙන යෑම සඳහා මෙම ලිපියේ අඩංගු දෑ ඔබගේ බැංකුවේ අදාළ දෙපාර්තමේන්තු/ශාඛා නිළධාරීන්ගේ දැනගැනීමට සලස්වන මෙන් ඉල්ලා සිටින අතර, ඉහත සඳහන් දින ඉක්මවා යෑමට පෙර අවශ්‍ය කටයුතු සම්පාදනය කරන මෙන් ඉල්ලා සිටිමි.

මෙයට විශ්වාසී
අත්සන් කළේ
බී. එල්. ජේ. එස්. බාලසූරිය
අධ්‍යක්ෂ/ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව

පිටපත් ; ව්‍යාපෘති අධ්‍යක්ෂ, කුඩා පරිමාණ තේ සහ රබර් පුනර්ජීවන ව්‍යාපෘතිය
ලේකම්, වැවිලි කටයුතු අමාත්‍යාංශය

2021 සැප්තැම්බර් 21

කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගිත්ව වැඩසටහන හා සම්බන්ධ සියලුම සහභාගීත්ව මූල්‍ය ආයතනයන්හි (PFIs) ප්‍රධාන විධායක නිලධාරීන්/ සාමාන්‍යාධිකාරීවරුන් වෙත

මහත්මයාණෙනි/ මහත්මියනි,

2021.09.01 දිනැති 2021 අංක 08 දරණ මුදල් මණ්ඩල චක්‍රලේඛනය ප්‍රකාරව කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගිත්ව වැඩසටහන (SAPP) යටතේ ක්‍රියාත්මක කරන ලද ණය යෝජනා ක්‍රම යටතේ ලබා ගත් ණය සඳහා ලබාදීමට අපේක්ෂිත ණය සහන.

ඔබ දැනටමත් දැනුම්වත්ව ඇති පරිදි, රටේ ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීම සඳහා සහාය ලබා දීමේ අරමුණින්, කොවිඩ්-19 වසංගතයෙන් බලපෑමට පත් වූ පුද්ගලයන් සහ ව්‍යාපාර සඳහා ණය සහන ලබා දීමට 2021.09.01 (මුදල් මණ්ඩල චක්‍රලේඛණය) දිනැති 2021 අංක 08 දරණ චක්‍රලේඛණය ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලදී (ඇමුණුම A). ඒ අනුව, පහත කරුණු කෙරෙහි ඔබේ කාරුණික අවධානය යොමු කෙරේ.

2. කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගිත්ව වැඩසටහනෙහි ණය යෝජනා ක්‍රමයන් යටතේ ලබාදීමට අපේක්ෂිත ණය සහන

2.1 මුදල් මණ්ඩල චක්‍රලේඛණයෙහි 09 වන වගන්තිය හා ප්‍රකාරව 2021.09.01 සිට 2021.12.31 දක්වා කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගිත්ව වැඩසටහනෙහි ණය යෝජනා ක්‍රමයන් යටතේ ලබා දුන් ණය සඳහා එක් එක් ණය පහසුකම මත පදනම්ව ණය සහන පහසුකම් ලබාදීමට තීරණය කොට ඇත.

2.2 උප ණය ගැනුම්කරුවන් විසින් ඉල්ලීම් කර ඇති පරිදි, මෙකී ණය සහන, අදාළ ණය අගයන්හි ප්‍රාග්ධනය ආපසු ගෙවීම හෝ ප්‍රාග්ධනය සහ පොලී ගෙවීම් සඳහා පමණක් ලබා දිය හැකිය. යෝජිත සහන එක් එක් ණය පහසුකම අනුව සලකා කොවිඩ්19න් බලපෑමට පත් උප ණය ගැනුම්කරුවන් සඳහා ලබා දිය යුතුය.

2.3 මෙම සහනවලින් ප්‍රතිලාභ ලබා ගැනීමට අපේක්ෂා කරනු ලබන සුදුසුකම්ලත් ණය ගැනුම්කරුවන් 2021.10.15 දිනට හෝ ඉන් පෙර අදාළ සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත එවැනි සහන සඳහා ඉල්ලීමක් සිදු කළ යුතුය. සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් අයදුම් කළ හැකි සහන, නියමිත කාල සහ අයදුම් කිරීමේ ආකෘතිය, විද්‍යුත් තැපෑල සහ කෙටි පණිවුඩ ඇතුළු මුද්‍රිත සහ/ හෝ විද්‍යුත් ක්‍රමවේද ඔස්සේ සියලුම සුදුසුකම්ලත් ණය ගැනුම්කරුවන් වෙත කඩිනම්ව සන්නිවේදනය කළ යුතුය.

2.4 ඒ අනුව, මෙම සහන ලබාගැනීමට අපේක්ෂා කරන සුදුසුකම් ලත් ණය ගැනුම්කරුවන්ගෙන් ලැබෙන ඉල්ලීම් පිළිගන්නා ලෙස සහභාගිත්ව මූල්‍ය ආයතන වෙත දැනුම් දෙන අතර ඒ පිළිබඳ වෙන වෙනම විස්තර ඇතුලත් වාර්තාවක් අමුණා ඇති ආකෘතියට අනුව (RDD/SAPP/21.09.2021 - ඇමුණුම I) ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකවරයා වෙත, කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගිත්ව වැඩසටහනෙහි ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙත පිටපතක් ද සහිතව 2021.10.31 දින වන විට එවිය යුතුය. මෙම විස්තරයන් හි එක්සෙල් (EXCEL) ආකෘතියෙන් යුතු මෘදු පිටපත vijithap@cbsl.lk වෙත පිටපත් කර, bashika@cbsl.lk සහ indeewarie@cbsl.lk වෙත එවිය යුතුය.

3. දීර්ඝ කරන ලද ණය සහන කාල පරිච්ඡේදවලට අදාළව පොලී ගණනය කිරීම.

3.1 ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකවරයා විසින් කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගිත්ව වැඩසටහනෙහි ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම පිළිබඳ නිකුත් කරන ලද අදාළ මෙහෙයුම් උපදෙස් සහ පසුකාලීන සංශෝධනයන්හි දක්වා ඇති පොලී අනුපාතික අනුව, දීර්ඝ කළ ණය සහන කාලපරිච්ඡේදයන් හේතුවෙන් සමුච්චිත වන ප්‍රාග්ධනය මත පොලිය ගණනය කිරීමට සහභාගිත්ව මූල්‍ය ආයතන වෙත මින් දැනුම් දෙනු ලැබේ.

3.2 කිසියම් සහභාගීත්ව මූල්‍ය ආයතනයක් විසින් ඕනෑම අවස්තාවකදී, ඉහත සඳහන් පොලී අනුපාතිකයට වඩා ඉහළ පොලී අනුපාතිකයක් යටතේ කිසියම් උප ණය ගැනුම්කරුවෙකුගෙන් පොලී අයකිරීමක් සිදු කර ඇත්නම්, එකී සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් එම උප ණය ගැනුම්කරුට එකී පොලී අයකිරීම් ආපසු හැරවීමට වහාම කටයුතු කළ යුතු අතර, අදාළ උප ණය ගැනුම්කරුට එකී වෙනස ගෙවිය යුතු වේ.

3.3 ඕනෑම උප ණය ගැනුම්කරුවෙකු ණය සහන කාලය තුළ පොලී නොගෙවීමට තීරණය කර ඇත්නම්, එවැනි කාලයක දී සමුච්චිතව තිබෙන පොලිය, ඉතිරිව පවතින ණය වාරික අතර සමානව බෙදා හැරිය යුතුය. ණය සහන කාලය තුළ දී සමුච්චිත පොලිය මත කිසිදු පොලියක් අය නොකළ යුතු අතර, ණය සහන කාලය තුළ කිසිදු වැල් පොලියක් ගණනය නොකළ යුතුය.

4. අක්‍රීය ණය (NPLs) නැවත අයකරගැනීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම

4.1 මුදල් මණ්ඩල චක්‍රලේඛනයේ වගන්ති 2 (ඇ) අනුව, සහභාගිත්ව මූල්‍ය ආයතන විසින්, කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර

සහභාගිත්ව වැඩසටහන යටතේ ඇති ණය යෝජනා ක්‍රමයන් හි, ණය ගෙවීම පැහැර හැර ඇති උපණය ගැනුම්කරුවන්ගෙන් 2021.12.31 න් පසු මාසයක් ඇතුළත, එම චක්‍රලේඛයේ ම මාර්ගෝපදේශවලට අනුව අත්හිටවන ලද ණය නැවත අයකර ගැනීමේ මූලික ක්‍රියාමාර්ග ආරම්භ කළ යුතුය.

5. අක්‍රීය ණය කාණ්ඩය තුළ ඇති ණය සඳහා සහන සැලසීම

5.1 සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් අක්‍රීය ණය සම්බන්ධව තීරණය ගැනීමේ දී, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද සියලු විධානවලට අනුකූල විය යුතුය යන කොන්දේසියට යටත්ව, සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් අක්‍රීය ණය කාණ්ඩයට අයත් ණය සඳහා වන ඉදිරි ණය වාරික සඳහා සහන කාලයක් ලබාදිය යුතුය. තවද, සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් දැනටමත් අක්‍රීය කාණ්ඩය තුළ සිටින ණය ගැනුම්කරුවන් සඳහා ණය සහන පහසුකම පසුදාතම නොකළ යුතු අතර, එවැනි ණය ගැනුම්කරුවන් සක්‍රීය කාණ්ඩයට මාරු නොකළ යුතුය.

6. සහභාගීත්ව ආයතන විසින් මෙම උපදෙස් සමඟ අනුකූලව කටයුතු කරන්නේ දැයි තහවුරු කර ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතිව, අවශ්‍ය කටයුතු සිදු කෙරෙනු ඇත.

7. මෙම ලිපියේ අන්තර්ගතයන් ඔබේ බැංකුවේ අදාළ දෙපාර්තමේන්තු/ ශාඛාවල නිලධාරීන්ගේ අවධානයට යොමු කිරීම සඳහා කටයුතු කළ යුතු අතර කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගිත්ව වැඩසටහන යටතේ ක්‍රියාත්මක ණය යෝජනා ක්‍රමයන් හි මෙහෙයුම් කාර්යක්ෂමතාව පවත්වා ගෙන යෑම සඳහා ඉහත සඳහන් නියමිත දින හා අනුකූළව කටයුතු කළ යුතුවේ.

මීට විශ්වාසී,

අත්සන් කළේ,
බී.එල්.ජේ.එස්. බාලසූරිය
අධ්‍යක්ෂ/ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව

පිටපත්: 1. ආචාර්ය යසන්තා මාපටුන මිය, වැඩසටහන් අධ්‍යක්ෂිකා/කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගිත්ව වැඩසටහන
2. ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය

RDD-SAPP- 2021.09.21- ඇමුණුම I

'කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන
කොවිඩ්-19න් බලපෑමට පත් ව්‍යාපාර සහ පුදුගලයන් සඳහා ණය සහන ඉල්ලීම්වල විස්තර'

ණය යෝජනා ක්‍රමය : .....

සහභාගිත්ව මූල්‍ය ආයතනයේ නම : .....

අ	ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි අංකය	ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රති මූල්‍යන අංකය (අදාළ වන්නේ නම්)*	ණය ගැනුම්කරු/ ගැනුම්කරුවන්ගේ නම්	ජා.හැ. අංකය/ව්‍යාපාර ලියාපදිංචි අංකය	ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද ණය ප්‍රමාණය*	සහභාගිත්ව මූල්‍ය ආයතනය විසින් ණය මුදා හරින ලද දිනය*	සහභාගිත්ව මූල්‍ය ආයතනය විසින් ණය මුදා හරින ලද දිනය	ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රතිමූල්‍ය ප්‍රදානය කරන ලද දිනය *	ආපසු ගෙවීමේ කාලය	ණය සඳහා සපයන ලද ආරම්භක සහන කාලය (මාස ගණන)	ගෙවිය යුතු වාරිකය (සම්පූර්ණ ණය මුදලින් සියයට 0.25%)*	ණය සහනය		
												ඉල්ලීම්කළ ණය සහන කාලය (මාස ගණන)	ණය සහනය නිමා වන දිනය	ඉල්ලීම් කළ ණය සහන පහසුකම (ප්‍රාග්ධනය පමණි/ ප්‍රාග්ධනය සහ පොලී යන දෙකම)

* සුදුසු පරිදි සඳහන් කරන්න.

පරිශීලක අංකය: 32/04/034/0001/001 2021 සැප්තැම්බර් 23

සෞභාග්‍යා කොවිඩ් 19 පුනරුද සහන ණය පහසුකමෙහි සියලු සහභාගීත්ව මූල්‍ය ආයතනවල ප්‍රධාන විධායක නිලධාරී/ සාමාන්‍යාධිකාරීවරුන් වෙත

මහත්මයාණෙනි/මහත්මියනි,

(1) සෞභාග්‍යා කොවිඩ් - 19 පුනරුද සහන ණය පහසුකම: සංචාරක කර්මාන්තයේ නියුතු ව්‍යාපාර සහ තනි පුද්ගල ව්‍යාපාර සඳහා සපයන ලද සහන දීර්ඝ කිරීම.

(2) සෞභාග්‍යා කොවිඩ් - 19 පුනරුද සහන ණය පහසුකම: සහන කාලය දීර්ඝ කිරීම.

ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් උක්ත විෂයයන් සම්බන්ධව 2021.03.24, 2021.06.09 සහ 2021.09.10 යන දිනයන්හි දී නිකුත් කරන ලද ලිපි හා බැඳේ.

2. සංචාරක ක්ෂේත්‍රයෙහි ව්‍යාපාර සහ තනි පුද්ගල ව්‍යාපාර වෙත සෞභාග්‍යා කොවිඩ්19 පුනරුද සහන ණය පහසුකම (SCRF) යටතේ ලබා දුන් ණය සඳහා සහන කාලය දීර්ඝ කිරීම.

2.1 ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් 2021.09.13 දිනැතිව නිකුත් කරන ලද 2021 අංක 10 දරන මුදල් මණ්ඩල චක්‍රලේඛනයට අනුව (මුදල් මණ්ඩල චක්‍රලේඛය) (ඇමුණුම 'අ'), සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකම, SCRF අදියර I, II සහ III යටතේ සංචාරක ක්ෂේත්‍රය සඳහා අවස්ථානුරූපිව 2022.06.30 දක්වා ලබා දුන් ණය සහන පහසුකම දීර්ඝ කිරීමට තීරණය කර ඇත.

2.2 ලබා දී ඇති ණය සහන කාලයෙහි බලපෑම සැලකිල්ලට ගනිමින් 2021.06.09 දිනැති අධ්‍යක්ෂ/ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ලිපිය මඟින් මාස 36ක උපරිම ආපසු ගෙවීමේ කාලසීමාව පිළිබඳව අවධානය යොමු නොකළ සංචාරක අංශයේ ණය ගැනුම්කරුවන් සඳහා ඔවුන්ගේ ණය ආපසු ගෙවීමේ කාලය සහන කාලය ද ඇතුලුව ණය ආපසු ගෙවීමේ කාලය මාස 36ක් දක්වා අවස්ථානුරූපිව දීර්ඝ කිරීමට තීරණය කර ඇත.

2.3 සෞභාග්‍යා කොවිඩ්19 පුනරුද පහසුකම අදියර III යටතේ, ණය ආපසු ගෙවීමේ කාලය දීර්ඝ කළ ණය ගැනුම්කරුවන් වෙනුවෙන් සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් සියයට දශම දෙකයි පහක (0.25%) අතිරේක ණය ඇප ආවරණ ගාස්තුවක් ගෙවිය යුතුය.

2.4 පහත ආයතන සමඟ ලියාපදිංචි වී සිටින ව්‍යාපාර සහ තනි පුද්ගල ව්‍යාපාර මෙම සහන කාලය දීර්ඝ කිරීම ලබා ගැනීම සඳහා සුදුසුකම් ලබයි.

i. සංචාරක අමාත්‍යාංශය
ii. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
iii. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය යටතේ පවතින නියෝජිත ආයතන
iv. සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව
v. ශ්‍රී ලංකා හෝටල් සංගමය

2.3 ණය ගැනුම්කරුවන් විසින් ඉල්ලීම් කර ඇති පරිදි ණය සහන ලබා දිය හැකි වනුයේ අදාළ ණය මුදල පමණක් හෝ ණය මුදල සහ පොලී මුදල පමණක් වශයෙන් හෝ ගෙවීම සඳහා පමණි. යෝජිත සහන ලබාදීම මුදල් මණ්ඩල චක්‍රලේඛනයෙහි දක්වා ඇති පරිදි, කොවිඩ්19 ව්‍යසනයෙන් පීඩාවට පත් ණය ගැනුම්කරුවන් සඳහා ලබා දිය යුතුය.

2.4 මෙම සහන ලබා ගැනීමට අපේක්ෂා කරන සුදුසුකම්ලත් ණය ගැනුම්කරුවන් 2021.10.20 දින හෝ ඊට පෙර අදාළ සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත එවැනි සහන සඳහා ඉල්ලීමක් සිදු කළ යුතුය. සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් අදාල සහන, නියමිත අවසාන දිනයන් සහ අයදුම් පත්‍ර ආකෘති යනාදිය මුද්‍රිත සහ/ හෝ විද්‍යුත් තැපැල හෝ කෙටි පණිවුඩ ඇතුළු විද්‍යුත් ක්‍රමවේද ඔස්සේ මේ සඳහා අයදුම් කරනු ලබන සුදුසුකම්ලත් ණය ගැනුම්කරුවන් හට කඩිනම්ව දැනුම් දිය යුතුය.

2.5 ඒ අනුව, සහන දීර්ඝ කිරීමෙන් ප්‍රතිලාභ ලැබීමට අපේක්ෂා කරන සුදුසුකම්ලත් ණය ගැනුම්කරුවන්ගේ ඉල්ලීම් භාර ගන්නා ලෙස සහභාගීත්ව මූල්‍ය ආයතනයන්ට දන්වා සිටින අතර, අමුණන ලද ආකෘතියට අනුව අදාළ යෝජනා ක්‍රමයේ එක් එක් අදියර වෙන් වෙන් වශයෙන් පුරවා සෞභාග්‍යා කොවිඩ්19 අදියර III යටතේ ලබා දෙන ලද එක් එක් ණය සඳහා අදාල සියයට බින්දුවයි දශම දෙකයි පහක (0.25%) ඇප වාරිකය සමඟ (RDD - SCRF-2021.09.22 ඇමුණුම I) 2021.10.30 දින වන විට ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත එවිය යුතුය. තොරතුරු ඇතුලත් එක්සෙල් ආකෘතියේ මෘදු පිටපත vijithap@cbsl.lk වෙත පිටපත් කර, bashika@cbsl.lk සහ sehan@cbsl.lk යන විද්‍යුත් ලිපිනයන්ට යැවිය යුතුය.

3. **දීර්ඝ කළ ණය සහන කාල පරිච්ඡේදවලට අදාළව පොලී ගණනය කිරීම.**

3.1 ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් සෞභාග්‍යා කොවිඩ්-19 අදියර I, II සහ III යටතේ නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස් සහ පසුකාලීන සංශෝධනයන්හි දක්වා ඇති පරිදි දීර්ඝ කළ ණය සහන කාල සඳහා වාර්ෂිකව සියයට හතරක (4%) පොලිය ගණනය කිරීම සිදු කළ යුතුය.

3.2 කිසියම් සහභාගීත්ව මූල්‍ය ආයතනයක් විසින් ඉහත සඳහන් පොලී අනුපාතිකයට වඩා ඉහළ අනුපාතිකයකට ණය ගැනුම්කරුවෙකුගෙන් පොලිය අය කර ඇති අවස්ථාවක දී, එම සහභාගීත්ව මූල්‍ය ආයතනය, අදාල ණය ගැනුම්කරු වෙත එම පොලී අයකිරීම් ආපසු හැරවීමට වහාම කටයුතු කළ යුතු අතර, අදාළ ණය ගැනුම්කරුට අදාල අතිරික්ත පොලි මුදල ද ගෙවිය යුතු වේ.

3.3 සෞභාග්‍යා කොවිඩ්-19 අදියර I, II සහ III යටතේ ඕනෑම උප ණය ගැනුම්කරුවෙකු ණය සහන කාලය තුළ පොලී නොගෙවීමට තීරණය කර ඇත්නම්, එම කාල සීමාව තුළ පවත්නා පොලි මුදල, ඉතිරිව පවතින ණය වාරික අතර සමානව බෙදා හැරිය යුතුය. ණය සහන කාලය තුළ දී සමුච්චිත පොලිය මත කිසිදු පොලියක් අය නොකළ යුතු අතර, ණය සහන කාලය තුළ කිසිදු වැල් පොලියක් ගණනය නොකළ යුතුය.

4. **අක්‍රීය ණය (NPL) යථා තත්ත්වයට පත් කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම**

4.1 මුදල් මණ්ඩල චක්‍රලේඛනයේ (ආ.)3 වගන්තියට අනුකූලව, සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් සෞභාග්‍යා කොවිඩ්-19 අදියර I, II සහ III යටතේ ගෙවීම් පැහැර හරින ලද ණය ගැනුම්කරුවන් සඳහා 2022.06.30 දිනට පසු මාසයක කාල සීමාවක් ඇතුළත, එම චක්‍රලේඛයේ මාර්ගෝපදේශයන්ට අනුව, අවශ්‍ය සියලු නැවත අය කර ගැනීමේ ක්‍රියාමාර්ග ආරම්භ කිරීම සිදුකළ යුතු වේ.

4.2 සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් සෞභාග්‍යා කොවිඩ්-19 අදියර III හි මෙහෙයුම් උපදෙස් යටතේ නියම කර ඇති පරිදි එම හිමිකම්වලට අදාළ අවශ්‍ය සියලු නැවත අය කර ගැනීමේ ක්‍රියාමාර්ග ගැනීමෙන් අනතුරුව, ණය ඇප ආවරණ හිමිකම් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත යැවිය යුතුය.

5. **අක්‍රීය ණය කාණ්ඩයේ ණය සඳහා සහන සැලසීම**

5.1 සහභාගිත්ව ආයතන අක්‍රීය ණය වලට අදාළව තීරණයක් ගැනීමේදී, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද සියලු විධිවිධාන සමඟ අනුකූල විය යුතුය යන කොන්දේසියට යටත්ව, සහභාගිත්ව ආයතන විසින් ඉදිරි ණය වාරික සඳහා ණය සහන සැලසිය යුතුවේ. තවද, සහභාගීත්ව ආයතන විසින් දැනටමත් අක්‍රීය ණය කාණ්ඩයේ සිටින ණය ගැනුම්කරුවන් සඳහා ණය සහන පහසුකම පසු දාතම නොකළ යුතු අතර, එවැනි ණය ගැනුම්කරුවන් සක්‍රීය කාණ්ඩයට මාරු නොකළ යුතුය.

6. ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ යොමු අංකඃ 32/04/034/0001/001 දරන 2021.09.10 දිනැති ලිපිය මඟින් ලබා දී ඇති සහනවලට තවදුරටත්, ආපසු ගෙවීමේ කාලය සහන කාලයද ඇතුළත්ව උපරිම මාස 36ක් දක්වා මාස 12කින් කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකමේ අදියර I,II සහ III යටතේ අවස්ථානුරූපිව දීර්ඝ කළ යුතුය.

සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකමේ අදියර III යටතේ, ණය ආපසු ගෙවීමේ කාලය දීර්ඝ කළ ණය ගැනුම්කරුවන් වෙනුවෙන් සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් සියයට දශම දෙකයි පහක (0.25) අතිරේක ණය ඇප ආවරණ ගාස්තු ගෙවිය යුතුය.

7. සහභාගීත්ව ආයතන මෙම උපදෙස්වලට අනුකූල වීම තහවුරු කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ සහයෝගයෙන් කටයුතු කෙරෙනු ඇත.

8. කරුණාකර සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකම් යෝජනා ක්‍රමවල මෙහෙයුම් කාර්යක්ෂමතාව පවත්වා ගෙන යෑම සඳහා ඉහත සඳහන් අවසාන දිනයන්ට යටත්ව මෙම ලිපියේ අන්තර්ගතයන් ඔබේ බැංකුවේ අදාළ දෙපාර්තමේන්තු/ශාඛාවන් හි නිලධාරින්ගේ අවධානයට යොමු කරන්න.

මීට විශ්වාසී,

අත්සන් කළේ,
බී.එල්.ජේ.එස්. බාලසූරිය
අධ්‍යක්ෂ/ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව

RDD 23.09.2021 (සංචාරක) - ඇමුණුම I

සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකම
ව්‍යාපාර සහ තනි පුද්ගල ව්‍යාපාර සඳහා සපයන ලද ණය සහන දීර්ඝ කිරීමේ විස්තර

අදියර : .....

සහභාගිත්ව මූල්‍ය ආයතනයේ නම : .....

අ	ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි අංකය	ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රති මූල්‍යන අංකය (ඇදෑස වන්නේ නම්)*	ණය ගැනුම්කරු/ ගැනුම්කරුවන්ගේ නම්	ජා.හැ. අංකය/ව්‍යාපාර ලියාපදිංචි අංකය	ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද ණය ප්‍රමාණය*	සහභාගිත්ව මූල්‍ය ආයතනය විසින් මුදා හරින ලද ණය ප්‍රමාණය*	සහභාගිත්ව මූල්‍ය ආයතනය විසින් ණය මුදා හරින ලද දිනය	ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රදානය කරන ලද ප්‍රති මූල්‍යනයෙහි දිනය (අදියර I සහ II)*	සහභාගිත්ව මූල්‍ය ආයතනය විසින් සහන දීර්ඝ කරන ලද දිනය	ප්‍රතිව්‍යුහගත කළ යුතු ප්‍රාග්ධන ශේෂය	ගෙවිය යුතු වාරිකය (සම්පූර්ණ ණය මුදලින් සියයට 0.25%)*	ණය සහනය/සහන කාලසීමාව*				සහන කාලය ඇතුලත්ව ණය ආපසු ගෙවීමේ කාලය			ඉල්ලුම් කරන ලද ණය පමා සහන කාලය (ප්‍රාග්ධනය පමණි ප්‍රාග්ධනය සහ පොලිය)***
												ණය සඳහා සපයන ලද ආරම්භක සහන කාලය (මාස ගණන)*	මින් පෙර ලබාදුන් ණය සහනය නිමා වන දිනය (ඇත්නම්)*	ඉල්ලුම් කළ නව ණය සහන පහසුකම (මාස ගණන)*	ණය සහනය අවසන් වන දිනය	ආරම්භක කාල සීමාව*	ඉල්ලුම් කල කාල සීමාව*	ආපසු ගෙවීමේ නව කාලසීමාව*	

* සෞභාග්‍යා කොවිඩ්-19 අදියර III යටතේ ණය ආපසු ගෙවීමේ කාලය දීර්ඝ කිරීමට ඉල්ලා ඇති ණය සඳහා පමණක් අදාළ වේ.

** සුදුසු පරිදි සඳහන් කරන්න.

2021 සැප්තැම්බර් 27

ශ්‍රී ලංකා මහ බැංකුව

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව

සැපයුම් දාම යළි ශක්තිමත් කිරීමේ ණය යෝජනා ක්‍රමයෙහි (SCREL) සියලු සහභාගීත්ව මූල්‍ය ආයතනවල (PFIS) ප්‍රධාන විධායක නිලධාරී/ සාමාන්‍යාධිකාරීවරුන් වෙත.

හිතවත් මහත්මයාණෙනි/ මහත්මියනි,

2021.09.01 දාතම 2021 අංක 08 දරන මුදල් මණ්ඩල චක්‍රලේඛය ප්‍රකාරව සැපයුම් දාම යළි ශක්තිමත් කිරීමේ ණය යෝජනා ක්‍රමය යටතේ ලබා ගත් ණය සඳහා ප්‍රදානය කළ සහන

ඔබ දැනටමත් දැනුවත් පරිදි, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් රටේ ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීමට සහාය ලබා දීමේ අරමුණැතිව, කොවිඩ්-19 වසංගතයෙන් බලපෑමට පත් වූ පුද්ගලයන් සහ ව්‍යාපාර සඳහා ණය සහන ලබා දීමට 2021.09.01 දාතම 2021 අංක 08 දරන චක්‍රලේඛය (මුදල් මණ්ඩල චක්‍රලේඛය) නිකුත් කරන ලදී. ඒ අනුව, පහත කරුණු කෙරෙහි ඔබේ කාරුණික අවධානය යොමු කෙරේ.

2. SCREL ණය යෝජනා ක්‍රමය යටතේ සැපයීමට නියමිත ණය සහන

2.1 මුදල් මණ්ඩල චක්‍රලේඛයෙහි 09 වන වගන්තිය හා අනුව යමින්, එක් එක් සිද්ධිය අනුව 2021.09.01 සිට 2021.12.31 දක්වා SCREL ණය යෝජනා ක්‍රමය යටතේ ලබා දුන් ණය සඳහා ණය සහන පහසුකමක් සැපයීමට තීරණය කොට ඇත.

2.2 උප ණය ගැනුම්කරුවන් විසින් ඉල්ලීම් කර ඇති පරිදි, ණය සහන අදාළ ණය අගයන්හි ප්‍රාග්ධනය ආපසු ගෙවීම නැතහොත් ප්‍රාග්ධනය සහ පොලී ගෙවීම් සඳහා පමණක් ලබා දිය හැකිය. යෝජිත සහන එක් එක් සිද්ධිය අනුව කොවිඩ්19න් බලපෑමට පත් උප ණය ගැනුම්කරුවන් සඳහා ලබා දිය යුතුය.

2.3 මෙම සහනවලින් ප්‍රතිලාභ ලබා ගැනීමට අපේක්ෂා කරන සුදුසුකම්ලත් ණය ගැනුම්කරුවන් 2021.10.20 දිනට හෝ ඉන් පෙර අදාළ සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත එවැනි සහන සඳහා ඉල්ලීමක් සිදු කළ යුතුය. සහන අයදුම් කිරීම සඳහා සහභාගීත්ව මූල්‍ය ආයතන, නියමිත කාල සහ අයදුම් කිරීමේ ආකෘතිය විද්‍යුත් තැපෑල සහ කෙටි පණිවුඩ ඇතුළු මුද්‍රිත සහ/ හෝ විද්‍යුත් ක්‍රමවේද ඔස්සේ සියලු සුදුසුකම්ලත් ණය ගැනුම්කරුවන් වෙත කඩිනම්ව සන්නිවේදනය කළ යුතුය.

2.4 ඒ අනුව, සහභාගීත්ව මූල්‍ය ආයතන 2021.10.30 දින වන විට මෙම අමුණන ලද ආකෘතියට (RDD - SCREL- 2021.09.27 ඇමුණුම I) අනුව ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා වෙත මෙම සහන ලබා ගැනීමට අපේක්ෂා කරන සුදුසුකම්ලත් ණය ගැනුම්කරුවන්ගෙන් ලැබෙන ඉල්ලීම පිළිගන්නා ලෙස දැනුම් දෙයි. විස්තර සහිතව එක්සෙල් ආකෘතියෙන් යුත් මෘදු පිටපත vijithap@cbsl.lk වෙත පිටපත් කර, lakminiws@cbsl.lk සහ chamali@cbsl.lk වෙත යොමු කළ යුතුය.

3. දීර්ඝ කළ ණය සහන කාල පරිච්ඡේදවලට අදාළව පොලී ගණනය කිරීම.

3.1 ශ්‍රී ලංකා මහ බැංකුවේ ග්‍රාමීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා විසින් SCREL ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම පිළිබඳ නිකුත් කරන ලද අදාළ මෙහෙයුම් උපදෙස් සහ පසුකාලීන සංශෝධනයන්හි දක්වා ඇති පොලී අනුපාතික අනුව යමින්, දීර්ඝ කළ ණය සහන කාලවලින් හට ගන්නා මූලධන එකතු වීම මත පොලිය ගණනය කිරීමට මින් දැනුම් දෙනු ලැබේ.

3.2 ඕනෑම අවස්ථාගත කරුණු යටතේ, ඕනෑම සහභාගීත්ව මූල්‍ය ආයතනයක් විසින් දී ඇති කාලයක දී, ඉහත සඳහන් පොලී අනුපාතිකයට වඩා ඉහළ අනුපාතිකයකට ඕනෑම උප ණය ගැනුම්කරුවෙකුගෙන් පොලිය අය කර ඇති අවස්ථාවක දී, එවැනි සහභාගීත්ව මූල්‍ය ආයතනයක් එම උප ණය ගැනුම්කරුවෙකුට පක්ෂව එවැනි පොලී අයකිරීම් ආපසු හැරවීමට වහාම කටයුතු කළ යුතු අතර, අදාළ උප ණය ගැනුම්කරුට එහි වෙනස ගෙවිය යුතු වේ.

3.3 ඕනෑම උප ණය ගැනුම්කරුවෙකු ණය සහන කාලය තුළ පොලී නොගෙවීමට තීරණය කර ඇත්නම්, එවැනි කාලයක දී සමුච්චිතව තිබෙන පොලිය, ඉතිරිව පවතින ණය වාරික අතර සමානව බෙදා හැරිය යුතුය. ණය සහන කාලය තුළ දී සමුච්චිත පොලිය මත කිසිදු පොලියක් අය නොකළ යුතු අතර, ණය සහන කාලය තුළ කිසිදු වැල් පොලියක් ගණනය නොකළ යුතුය.

4. අක්‍රීය ණය (NPLs) සඳහා යථා තත්ත්වයට පත් කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම

4.1 මුදල් මණ්ඩල චක්‍රලේඛයේ වගන්ති 2 (ආ) අනුව යමින්, SCREL ණය යෝජනා ක්‍රමයේ පැහැර හරින ලද ණය ගැනුම්කරුවන් මත, 2021.12.31 න් පසු මසක් තුළ, එම චක්‍රලේඛයේ ම මාර්ගෝපදේශ අනුව අහෝසි කෙරෙනු ඇති, අවශ්‍ය ආරම්භක නැවත අය කර ගැනීමේ සියලු ක්‍රියාමාර්ග ආරම්භ කළ යුතු වේ.

5. අක්‍රීය ණය කාණ්ඩය තුළ ණය සඳහා සහන සැලසීම

5.1 සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් අක්‍රීය ණයවලට අදාළව තීරණයක් ගැනීමේ දී, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද සියලු විධානවලට අනුකූල විය යුතුය යන කොන්දේසියට යටත්ව, සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ඉදිරි ණය වාරික සඳහා අක්‍රීය ණය කාණ්ඩය සඳහා ණය සහන කාල සපයනු ලැබිය යුතුය. තවද, සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් දැනටමත් අක්‍රීය කාණ්ඩය තුළ සිටින ණය ගැනුම්කරුවන් සඳහා ණය සහන පහසුකම පසුදාතම නොකළ යුතු අතර, එවැනි ණය ගැනුම්කරුවන් සක්‍රීය කාණ්ඩයට මාරු කළ යුතුය.

6. ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතිව, සහභාගීත්ව ආයතන මෙම විධාන සමඟ අනුකූල වීම තහවුරු කිරීමට කටයුතු සිදු කෙරෙනු ඇත.

7. කරුණාකර මෙම ලිපියේ අන්තර්ගතයන් ඔබේ බැංකුවේ අදාළ දෙපාර්තමේන්තු/ ශාඛාවල නිලධාරීන්ගේ අවධානයට යොමු කිරීමට සහ **SCREL** ණය යෝජනා ක්‍රමයේ මෙහෙයුම් කාර්යක්ෂමතාව පවත්වා ගෙන යෑමට, ඉහත සඳහන් නියමිත දින සැපිරීම තහවුරු කිරීමට කටයුතු කරන්න.

මීට විශ්වාසී,

අත්සන් කරන ලදී.
අධ්‍යක්ෂ/ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව

පිටපත්: 1. අධ්‍යක්ෂ ජෙනරාල්, ශ්‍රී ලංකා තේ මණ්ඩලය, 574, ගාලු පාර, කොළඹ 03.

2. වැවිලි අමාත්‍යාංශය, ලේකම්, 11 වන මහල, සෙත්සිරිපාය 2 වන අදියර, බත්තරමුල්ල.

මෙහෙයුම් උපදෙස් අංක : RDD/SAPP/RF/2019/01 (සංශෝධන - 02) 2021 සැප්තැම්බර් 30

කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගිත්ව වැඩසටහන යටතේ ක්‍රියාත්මක වන ණය යෝජනා ක්‍රමයන්හි සියලුම සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත,

මහත්මයාණෙනි/ මහත්මියනි,

කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගිත්ව වැඩසටහන (SAPP) යටතේ ක්‍රියාත්මක චක්‍රීය (RF) ණය යෝජනා ක්‍රමයෙහි මෙහෙයුම් උපදෙස් සඳහා වන දෙවන සංශෝධනය

2018.04.10 දාතම අංක RDD/SAPP/RF/2018/01 දරණ මෙහෙයුම් උපදෙස් (2018.12.05 දින සංශෝධිත පරිදි) සඳහා තවදුරටත් නිකුත් කර ඇති 2019.08.06 දාතම අංක RDD/SAPP/RF/2019/01 දරණ මෙහෙයුම් උපදෙස් (2020.11.03 දින සංශෝධිත පරිදි) පහත පරිදි සංශෝධනය කර ඇති බව කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගිත්ව වැඩසටහන යටතේ ක්‍රියාත්මක චක්‍රීය (RF) ණය යෝජනා ක්‍රමයන්හි සියලුම සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත මින් දැනුම් දෙනු ලැබේ.

1. මෙහෙයුම් උපදෙස්හි වගන්ති 9 (ඈ) හි නිශ්චිතව දක්වා ඇති 'ණය ගැනුම්කරුවන් ලියාපදිංචි කිරීම' අවලංගු කර ඒ සඳහා ආදේශ විය යුතුය;

   ණය ගැනුම්කරුවෙකු චක්‍රීය (RF) තුරුණු ණය යෝජනා ක්‍රමය, චක්‍රීය ප්‍රවර්ධක ණය යෝජනා ක්‍රමය, චක්‍රීය ප්‍රවර්ධක තොග ණය යෝජනා ක්‍රමය සහ චක්‍රීය තේ සහ රබර් අංශයේ ණය යෝජනා ක්‍රමය යටතේ ණයක් ලබා ගන්නේ නම්, සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් එක් එක් ණය ගැනුම්කරු සඳහා නිසි ලෙස සම්පූර්ණ කරන ලද ඇමුණුම 1 (අ) [iහෝ ii] සහ ඇමුණුම 1 (ආ) [iහෝ ii] සුදුසු පරිදි, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය හරහා ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත එවිය යුතුය.

   කෙසේවෙතත්, ණය ගැනුම්කරු විසින් චක්‍රීය තුරුණු ණය සහ චක්‍රීය තේ සහ රබර් අංශයේ ණය යෝජනා ක්‍රම යටතේ රු. 1,000,000 කට අඩු අගයක ණයක් ලබා ගන්නේ නම්, සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් එක් එක් සහ සෑම ණය ගැනුම්කරුවෙකුට ම අදාළව නිසි ලෙස සම්පූර්ණ කරන ලද ඇමුණුම 1 (අ) [iහෝ ii]රඳවා ගත යුතු අතර, නිසි ලෙස සම්පූර්ණ කරන ලද ඇමුණුම 1 (ආ) [iහෝ ii] සුදුසු පරිදි, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය හරහා ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත එවිය යුතුය.

   මෙහෙයුම් උපදෙස්හි (සංශෝධිත පරිදි) අඩංගු අනෙකුත් සියලුම නියමයන් සහ කොන්දේසි නොවෙනස්ව පවතී.

   මෙම සංශෝධනය සඳහා බලාත්මක වන දිනය 2021.09.30 වේ.

   මෙම සංශෝධනයේ අන්තර්ගතයන් ඔබේ බැංකු ශාඛාවන්හි අදාළ නිලධාරීන්ගේ අවධානයට යොමු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

මීට විශ්වාසී,

අත්සන් කළේ
බී. එල්. ජේ. එස්. බාලසූරිය
අධ්‍යක්ෂ/ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව

පිටපත: ආචාර්ය යසන්තා මාපටුන මිය, වැඩසටහන් අධ්‍යක්ෂිකා, කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගිත්ව වැඩසටහන

මෙහෙයුම් උපදෙස් අංකය: RDD/SAPP/4P/2019/01 (සංශෝධන - 02) 2021 සැප්තැම්බර් 30

කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගිත්ව වැඩසටහන යටතේ ක්‍රියාත්මක වන ණය යෝජනා ක්‍රමයන්හි සියලුම සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත

මහත්මයාණෙනි/ මහත්මියනි,

කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගිත්ව වැඩසටහන (SAPP) යටතේ ක්‍රියාත්මක 4P ණය යෝජනා ක්‍රමයෙහි මෙහෙයුම් උපදෙස් සඳහා වන දෙවන සංශෝධනය

2018.04.10 දාතම අංක RDD/SAPP/4P/2018/01 දරණ මෙහෙයුම් උපදෙස් (2018.12.05 දින සංශෝධිත පරිදි) සඳහා තවදුරටත් නිකුත් කර ඇති 2019.08.06 දාතම අංක RDD/SAPP/4P/2019/01 දරණ මෙහෙයුම් උපදෙස් (2020.11.03 දින සංශෝධිත පරිදි) පහත පරිදි සංශෝධනය කර ඇති බව කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගිත්ව වැඩසටහන යටතේ ක්‍රියාත්මක 4P ණය යෝජනා ක්‍රමයන්හි සියලුම සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත මින් දැනුම් දෙනු ලැබේ.

1. මෙහෙයුම් උපදෙස්හි වගන්ති 9 (ඇ) හි දක්වා ඇති 'ණය ගැනුම්කරුවන් ලියාපදිංචි කිරීම' අවලංගු කර ඒ සඳහා ආදේශ විය යුතුය;

   'ණය ගැනුම්කරුවෙකු 4P තුරුණු ණය යෝජනා ක්‍රමය, 4P ප්‍රවර්ධක ණය යෝජනා ක්‍රමය සහ 4P ප්‍රවර්ධක තොග ණය යෝජනා ක්‍රමය යටතේ ණයක් ලබා ගන්නේ නම්, සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් එක් එක් ණය ගැනුම්කරු සඳහා නිසි ලෙස සම්පූර්ණ කරන ලද ඇමුණුම 1 (අ) [iහෝ ii] සහ ඇමුණුම 1 (ආ) [iහෝ ii] සුදුසු පරිදි, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය හරහා ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත එවිය යුතුය.

   කෙසේවෙතත්, ණය ගැනුම්කරු විසින් 4P තුරුණු ණය යෝජනා ක්‍රමය යටතේ රු. 1,000,000 කට අඩු අගයක ණයක් ලබා ගන්නේ නම්, සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් සෑම එක් එක් ණය ගැනුම්කරුවෙකුට ම අදාළව නිසි ලෙස සම්පූර්ණ කරන ලද ඇමුණුම 1 (අ) [i]රඳවා ගත යුතු අතර, නිසි ලෙස සම්පූර්ණ කරන ලද ඇමුණුම 1 (ආ) [i] සුදුසු පරිදි, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය හරහා ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත එවිය යුතුය.

   මෙහෙයුම් උපදෙස්හි (සංශෝධිත පරිදි) අඩංගු අනෙකුත් සියලුම නියමයන් සහ කොන්දේසි නොවෙනස්ව පවතී.

   මෙම සංශෝධනය සඳහා බලාත්මක වන දිනය 2021.09.30 වේ.

   මෙම සංශෝධනයේ අන්තර්ගතයන් ඔබේ බැංකු ශාඛාවන්හි අදාළ නිලධාරීන්ගේ අවධානයට යොමු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

මීට විශ්වාසී,

අත්සන් කළේ.
බී. එල්. ජේ. එස්. බාලසූරිය
අධ්‍යක්ෂ/ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව

පිටපත: ආචාර්ය යසන්තා මාපටුන මිය, වැඩසටහන් අධ්‍යක්ෂිකා, කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගිත්ව වැඩසටහන

මෙහෙයුම් උපදෙස් අංකඃ RDD/COVID19-Phase IV/2021/01

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
අංක 30, ජනාධිපති මාවත
කොළඹ 01.
26.10.2021

සියලුම සහභාගීත්ව මූල්‍ය ආයතනයන් වෙත,

මෙහෙයුම් උපදෙස්

රාජ්‍ය ව්‍යවසායයන් යළි නඟා සිටුවීම සඳහා නව ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රමය (සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකම අදියර IV)

කොවිඩ්-19 ව්‍යාප්තියෙන් බලපෑමට ලක්වූ රාජ්‍ය ව්‍යවසායන්ගේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම සහ ව්‍යවස්ථාපිත වගකීම් පියවීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා විසින් සහභාගීත්ව මූල්‍ය ආයතනයන් වෙත 2021.10.26 වන දිනැති මෙහෙයුම් උපදෙස් අංක RDD/COVID19- Phase IV/2021/01 නිකුත් කරන ලදී.

1. හැඳින්වීම

1.1 ශ්‍රී ලංකා මහ බැංකුවේ සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකම (SCRF) සහ සෞභාග්‍යා අරමුදල යටතේ ලබා දුන් ණය ආපසු අය කර ගැනීම් තුළින් හිමිවුණු අරමුදල් අතුරින් රුපියල් බිලියන 10ක් වෙන්කරමින්, රාජ්‍ය ව්‍යවසායන් යළි නඟා සිටුවීම සඳහා සහනදායී නියමයන් යටතේ කාරක ප්‍රාග්ධන ණය යෝජනා ක්‍රමයක් ස්ථාපිත කිරීමට 2021.08.09 වන දින පැවති ආමාත්‍ය මණ්ඩල හමුවේ දී ගනු ලැබූ තීරණය මත, (අමාත්‍ය මණ්ඩල තීරණය), ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සංස්ථා ඇතුළුව රාජ්‍ය ව්‍යවසායන් සඳහා කාරක ප්‍රාග්ධන ණය ලබා දීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කරන ලදී.

1.2 තවද, ඉහත 1.1 වගන්තියෙහි සඳහන් වන ණය යෝජනා ක්‍රමය යටතේම රාජ්‍ය ව්‍යවසායන්, සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල සඳහා ව්‍යවස්ථාපිත වගකීම් පියවීමට අවශ්‍ය අරමුදල් ලබා දීමට 2021. 08. 17 වන දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල හමුවේ දී තීරණය කරන ලදී.

1.3 ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හඳුන්වා දෙනු ලැබූ සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමයේ ප්‍රධාන ණය සංරචකය සහ තදනන්තර සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකමේ සංරචක වෙන් කර හඳුනා ගැනීමේ අරමුණින් මෙම නව ප්‍රතිමූල්‍ය පහසුකම සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකම අදියර IV ලෙස හඳුන්වනු ඇත.

2. ව්‍යාපෘතියේ සමස්ත කළමනාකරණය

ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ වගකීම ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව සතු වේ.

3. ණය යෝජනා ක්‍රමය

3.1 යෝජනා ක්‍රමයේ නම	සෞභාග්‍යා කොවිඩ්-19 පුනුරුද සහන ණය පහසුකම අදියර IV
3.2 යෝජනා ක්‍රමයේ ස්වභාවය	රාජ්‍ය ව්‍යවසායන්ගේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම සහ ව්‍යවස්ථාපිත වගකීම් පියවීම ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රමයේ අරමුණ වේ.
3.3 සහභාගීත්ව මූල්‍ය ආයතන	ලංකා බැංකුව සහ මහජන බැංකුව
3.4 අරමුදල් මූලාශ්‍රය	ශ්‍රී ලංකා මහ බැංකුව
3.5 වෙන් කරන ලද අරමුදල්	රුපියල් බිලියන 10
3.6 උප ණය ගනුදෙනුකරුවකු සඳහා වන උපරිම ණය සීමාව	මාස 03ක උපරිම කාල සීමාවක් සඳහා කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සහ අදාළ රාජ්‍ය ව්‍යවසායන්ගේ ව්‍යාපාර සැලැස්ම සලකා බැලීමෙන් පසු ව්‍යවස්ථාපිත වගකීම හෝ මුදල් අමාත්‍යංශයේ රජයේ ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිර්දේශිත උපරිම සුදුසුකම් ලබන ප්‍රමාණය, යන ද්විත්වයෙන් අවමය.
3.7 සහභාගීත්ව මූල්‍ය ආයතන සඳහා ප්‍රතිමූල්‍ය ණය සඳහා ණය පොලී අනුපාතය*	වසරකට සියයට එකකි (1%)
3.8 උප ණය සඳහා ණය පොලී අනුපාතය	වසරකට සියයට හතරකි (4%)

3.9 සහභාගීත්ව මූල්‍ය ආයතන සඳහා සීමාව	වසරකට සියයට තුනකි (3%)
3.10 ණය ආපසු ගෙවීමේ කාලය (උපරිම)	මාස 36 (සහන කාලව ද ඇතුළත්ව)
3.11 සහන කාලය (උපරිම)	මාස 6
3.12 සුරැකුම්	සහභාගීත්ව මූල්‍ය ආයතන පිළිගත හැකි ඕනෑම සුරැකුමක්
3.13 ක්‍රියාත්මක කරන දිනය	2021. 10. 26 වන දින සිට මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වේ.
3.14 ක්‍රියාත්මක වන ප්‍රදේශ	මුළු දිවයින පුරා

- අනනුකූලතාවයක දී, පාලිත ණය ගිවිසුමේ ප්‍රතිපාදන අනුව නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය අය කරගනු ඇත.

4. සුදුසුකම් ලත් උප ණය ගැනුම්කරුවන්

4.1 මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ කරනු ලබන රාජ්‍ය ව්‍යවසායන් SCRF අදියර IV යටතේ සුදුසුකම් ලත් ණය ගැනුම්කරුවන් ලෙස සැලකිය යුතුය.

4.2 මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් දැනුම් දෙන ලද එවැනි සුදුසුකම් ලත් ණය ගැනුම්කරුවන්ගේ ලැයිස්තුවක් ඇමුණුම I හි දැක්වේ.

4.3 අවශ්‍ය යැයි හැඟී යන අවස්ථාවන්හි දී, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ උපදේශය ඇතිව මේ සම්බන්ධව සුදුසුකම් ලත් ණය ගැනුම්කරුවන්ගේ සංශෝධිත ලැයිස්තුව නිකුත් කිරීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතු වන්නේ ය.

5. සුදුසුකම් ලත් කටයුතු

5.1 සුදුසුකම් ලත් ණය ගැනුම්කරුවන්ගේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා පහසුකම් සැලසීමට හා නෛතික වගකීම් පියවීමට "SCRF අදියර IV" යටතේ උප ණය ලබා දිය යුතුය.

5.2 සුදුසුකම් ලත් කාරක ප්‍රාග්ධන අවශ්‍යතා ලැයිස්තුව සහ කාරක ප්‍රාග්ධන ණය ලබා දෙන නෛතික වගකීම්වල ලැයිස්තුවක් ඇමුණුම II හි දක්වා ඇත.

5.3 සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් සෑම සුදුසුකම් ලත් උප ණය අයදුම්කරුවකුගේම සුදුසුකම් ලත් කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සහ නෛතික වගකීම් සඳහා මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ කැමැත්ත/ නිර්දේශය ලබා ගත යුතුය.

5.4 සුදුසුකම් ලත් ණය ගැනුම්කරුවෙකුට බැංකු කිහිපයක බැංකු පහසුකම් සතු වුවත් එවැනි ණය ගැනුම්කරුවෙකුට මෙම යෝජනා ක්‍රමය යටතේ ලබා ගැනීමට හිමිකම් කිව හැක්කේ එක් ණය මුදලක් පමණි අනෙකුත් අවස්ථාවන්හි දී උප ණය ගැනුම්කරුවා වෙනත් බැංකු වෙත ප්‍රවේශ වී නොමැති බවට ලිඛිත තහවුරු කිරීමක් ලබා ගන්නා මෙන් සහභාගීත්ව මූල්‍ය ආයතනවලින් ඉල්ලා සිටී.

6. ණය ගැනුම්කරුවන් ලියාපදිංචිය

6.1 සහභාගීත්ව මූල්‍ය ආයතනවල ප්‍රධාන කාර්යාලය විසින් අදාළ මාර්ගෝපදේශ නිකුත් කළ යුතු අතර, සුදුසුකම් ලත් ණය ගැනුම්කරුවන්ට ණය අයදුම්පත් නිකුත් කිරීමට සහ එවැනි සුදුසුකම් ලත් ණය ගැනුම්කරුවන් ගෙන් ණය අයදුම්පත් රැස් කර ගැනීමට උපදෙස් ලබාදිය යුතුය.

6.2 සහභාගීත්ව මූල්‍ය ආයතනයේ ප්‍රධාන කාර්යාලය විසින් මෙම මෙහෙයුම් උපදෙස්වල ඇමුණුම III (අ) ඇමුණුම III (ආ) හි දී ඇති නිසි ලෙස සම්පූර්ණ කළ ණය ලියාපදිංචි කිරීමේ පෝරමයන්හි දෘඪ පිටපත් යොමු කිරීම මඟින්, "SCRF අදියර IV" යටතේ උප ණය ලබා ගැනීමට අපේක්ෂා කරන සුදුසුකම් ලත් ණය ගැනුම්කරුවන්ගේ විස්තර ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය.

6.3 කඩිනම් ක්‍රියාත්මක කිරීමක් සඳහා, සහභාගීත්ව මූල්‍ය ආයතනයන් විසින් සුදුසුකම් ලත් ණය ගැනුම්කරුවා ගෙන් උප ණය අයදුම්පත ලැබී වැඩ කරන දින 7ක් ඇතුළත, ඇමුණුම III (ආ) හි මෘදු පිටපත ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා විසින් දැනුම් දෙනු ලබනු ඇති විද්‍යුත් තැපැල් ලිපිනයට එවිය යුතුය.

6.4 මෙම මෙහෙයුම් උපදෙස්හී දී ඇති ඇමුණුම් යටතේ ලබා දී ඇති තොරතුරුවල සහ එවැනි ඇමුණුම්වල මෘදු පිටපත් සහ දෘඪ පිටපත්වල අනුකූලතාවය සහ නිවැරදිභාවය සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් තහවුරු කළ යුතු වේ.

6.5 ඇමුණුම III (ආ) හී සපයා ඇති තොරතුරු මත පදනම්ව වැඩ කරන දින 14ක් ඇතුළත, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් උප ණය ගනුදෙනුකරුවන්ගේ අයදුම්පත් ලැබීමේ පිළිවෙල මත පදනම්ව ප්‍රමුඛත්වය දී ලියාපදිංචි කරගනු ඇත.

6.6 ඇමුණුම III (අ) සහ ඇමුණුම III (ආ) හී දාම ලිපි ලේඛනයන්හී දෘඪ පිටපත් ලැබීමෙන් පසු එම තොරතුරුවල යම් වෙනසක් නිරීක්ෂණය වුවහොත්, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් දෘඪ පිටපතේ ලබා දී ඇති තොරතුරු සලකා බලනු ඇත.

6.7 යම් හෙයකින් අමතර තොරතුරු අවශ්‍ය විටෙක හෝ අමතර පැහැදිලි කිරීම් අවශ්‍ය වන අවස්ථාවක දී කිසියම් අයදුම්පතක් නැවත සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත යොමු කිරීමේ අයිතිය ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව සතු වේ.

6.8 උප ණය ගනුදෙනුකරුවන් ලියාපදිංචි කිරීමෙන් අනතුරුව, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ලියාපදිංචි කළ ණය සඳහා ලියාපදිංචි අංකයක් නිකුත් කොට එම අංකය සහභාගීත්ව මූල්‍ය ආයතනයන්හී ප්‍රධාන කාර්යාල වෙත දැනුම් දෙනු ලැබේ. කිසියම් ණය ගනුදෙනුකරුවෙකු සම්බන්ධ ඉදිරි කටයුතු වලදී මෙකී ලියාපදිංචි අංකය භාවිත කළ යුතු වේ.

7. උප ණය මුදා හැරීම්

7.1 කිසියම් ණය ගනුදෙනුකරුවෙකු ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලියාපදිංචි කර වැඩ කරන දින 21ක් තුළ ඊට අදාළ ණය මුදල සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් මුදා හැරිය යුතු වේ.

7.2 යම් හෙයකින් ඕනෑම උප ණය මුදලක් අදාළ කාල සීමාව තුළ දී මුදා හැරීමට සහභාගීත්ව මූල්‍ය ආයතන අපොහොසත් වේ නම්, ඊට අදාළ හේතු දක්වමින් ඒ පිළිබඳව නොපමාව ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේතුව දැනුම්වත් කළ යුතු අතර, එහි ලා ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් සුදුසු පරිදි අවශ්‍ය තීරණ/ ක්‍රියාමාර්ග වෙත එළඹෙනු ඇත.

7.3 සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් කිසියම් උප ණය මුදලක් මුදා නොහැරීම හා ඒ පිළිබඳව ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත දින 30ක් තුල පිළිගත හැකි හේතූන් ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එකී ණය ලියාපදිංචිය අවලංගු වේ.

7.4 සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් විශේෂ හේතූන් නිසි මුදා හැරීමට නොහැකි වූ ලියාපදිංචි වී ඇති ණය පිළිබඳ එක් එක් අයදුම්පත වෙනුවෙන් වෙනම වාර්තාවක් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවට අවශ්‍ය වන විට සහ අවස්ථාවේ දී යොමු කළ යුතු වේ.

8. ප්‍රතිමූල්‍යන ක්‍රියාවලිය

8.1 ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෙම මෙහෙයුම් උපදෙස්වලින් පනවා ඇති නියමයන් සහ කොන්දේසිවලට යටත්ව, සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් පිරිනමනු ලබන සියලු උප ණය සඳහා සියයට 100 ක ප්‍රතිමූල්‍යනයක් සපයනු ඇත.

8.2 ප්‍රතිමූල්‍යනය සඳහා නිසි ලෙස සම්පූර්ණ කළ අයදුම්පත්, ලියාපදිංචි ගත කළ උප ණය ගැනුම්කරුවන් වෙත උප ණය මුදා හැරීමෙන් අනතුරුව ප්‍රතිපූරණය කිරීම සඳහා ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතුය. සෑම ප්‍රතිමූල්‍යන අයදුම්පතක් සඳහාම පහත ලේඛන ඇතුලත් විය යුතුවේ.

i. ප්‍රතිමූල්‍ය අයදුම්පත ඇමුණුම IV
ii. ප්‍රතිමූල්‍ය සඳහා ණය මුදා හැරීමේ ප්‍රකාශය ඇමුණුම V
iii. ඉල්ලුම් පොරොන්දු නෝට්ටුව ඇමුණුම VI
iv. භාරදීමේ ලිපිය ඇමුණුම VII
v. ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ප්‍රතිඥා පැවරුම ඇමුණුම VIII
vi. මුදා හැරීමේ ලිපිය ඇමුණුම IX

8.3 ඉහත සඳහන් සියලු අදාළ ලේඛන සමඟ ප්‍රතිමූල්‍යන අයදුම්පතෙහි අවශ්‍ය තොරතුරු සම්පූර්ණ කිරීම පිළිබඳව ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව සෑහිමට පත්වන්නේ නම්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලබා ගත හැකි අරමුදල් ප්‍රමාණය සහ අදාළ සහභාගීත්ව මූල්‍ය ආයතනය වෙත වෙන් කළ අරමුදල් සැලකිල්ලට ගනිමින් අයදුම්පත් ලැබීමේ පිළිවෙල මත නිසි ලෙස සම්පූර්ණ කළ ප්‍රතිමූල්‍යන අයදුම්පත ලැබීමෙන් පසු වැඩ කරන දින 14ක් ඇතුළත එවැනි ප්‍රතිමූල්‍යන අයදුම්පතක් අනුමත කර, ප්‍රතිමූල්‍ය පහසුකම් ලබාදෙනු ඇත.

8.4 ප්‍රතිමූල්‍යන හිමිකම, ණය මුදාහළ දිනයේ සිට දින 90ක් ඇතුළත සහභාගීත්ව මූල්‍ය ආයතනයේ ප්‍රධාන කාර්යාලය මඟින් පමණක් ප්‍රතිමූල්‍ය පහසුකම් සඳහා හිමිකම් පෑමට ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතුය. සහභාගීත්ව මූල්‍ය ආයතන ශාඛා විසින් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත සෘජුව යොමු කළ ප්‍රතිමූල්‍ය හිමිකම් අයදුම්පත් සඳහා ප්‍රතිමූල්‍ය පහසුකම් ලබා නොදෙනු ඇත.

9. ණය මුදල් ආපසු අය කර ගැනීම

9.1 එක් එක් උප ණය සඳහා අදාළ වන කොන්දේසිවලට අනුව සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් උප ණය ගැනුම්කරුවන්ගෙන් ප්‍රාග්ධනය සහ පොලිය ආපසු අය කර ගත යුතුය.

9.2 සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත මුදා හරින ලද ප්‍රාග්ධනය සහ පොලිය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අර්ධ වාර්ෂිකව එනම්, එක් එක් වර්ෂයේ ජූනි 30 සහ දෙසැම්බර් 31 දිනයන්හි දී එක් එක් ණය ගැනුම්කරුගේ ණය ආපසු ගෙවීමේ උප ලේඛනය මත පදනම්ව සකස් කරන ලද ප්‍රතිමූල්‍යනය සඳහා ණය ආපසු ගෙවීමේ උප ලේඛනය අනුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ආපසු අය කර ගනු ඇත.

10. ලේඛනවල භාරකාරත්වය

10.1 සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් උප ණය ගැනුම්කරුගේ අලාභ සහ ණය ආපසු ගෙවීමේ හැකියාව තක්සේරු කිරීම සඳහා භාවිත කළ සියලු සාක්ෂි තබා ගැනීමට කටයුතු සලසනු ලැබිය යුතුය. එවැනි ලේඛන විමර්ශනය කිරීම හෝ වෙනත් අරමුණු සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඉල්ලා සිටි විට, ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඉදිරිපත් කළ යුතුය.

10.2 සහභාගීත්ව මූල්‍ය ආයතනයේ හුදු අභිමතය පරිදි, සහභාගීත්ව මූල්‍ය ආයතන ප්‍රධාන කාර්යාලය හෝ ශාඛාව විසින් ණය මුදා හැරීමට අදාළ වෙනත් ඕනෑම ලේඛනයක් රඳවා ගත යුතුය.

11. ගිණුම් විගණනය කිරීම

11.1 සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් SCRF අදියර IV යටතේ සපයන ලද උප ණය මත විශේෂ අභ්‍යන්තර විගණන පැවැත්විය යුතුය.

12. සහභාගීත්ව මූල්‍ය ආයතනවල කාර්යභාරය සහ වගකීම්

සහභාගීත්ව මූල්‍ය ආයතන "SCRF අදියර IV" ක්‍රියාත්මක කිරීමෙහිලා සක්‍රීය කාර්යභාරයක් ඉටු කළ යුතු වේ. මෙම මෙහෙයුම් උපදෙස්වල සඳහන් අවශ්‍යතාවන්ට අමතරව, සහභාගීත්ව මූල්‍ය ආයතන අතිරේක භූමිකාවන් සහ වගකීම් සමඟ අනුකූල විය යුතුය. මේ හා සම්බන්ධව, සහභාගීත්ව මූල්‍ය ආයතන විසින්;

12.1 නියම කළ කාල පරිච්ඡේදය තුළ "SCRF අදියර IV" කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා සහභාගීත්ව මූල්‍ය ආයතනවල ප්‍රධාන කාර්යාලයට සහ ශාඛාවන්ට ප්‍රමාණවත් පරිදි කාර්ය මණ්ඩලය වෙන් කර ඇති බවට තහවුරු කිරීම.

12.2 "SCRF අදියර IV ක්‍රියාත්මක කිරීමට අදාළව ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව සම්බන්ධීකරණය සඳහා ව්‍යාපෘති ණය පරිපාලකවරයෙකු ලෙස සහභාගීත්ව මූල්‍ය ආයතන ප්‍රධාන කාර්යාලයට ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කිරීම.

12.3 සුදුසුකම් ලත් ණය ගැනුම්කරුවන් වෙත ණය මුදල් මුදා හැරීමේදී සෑම විටම නිසි සැලකිල්ලෙන් සහ විචක්ෂණශීලීව කටයුතු කිරීම සහ "SCRF අදියර IV" හි අරමුණු සඳහා පමණක් ණය මුදා හරින බවට තහවුරු කිරීම සඳහා සියලු සාධාරණ පියවර ගැනීම.

12.4 නිසි කලට ණය බෙදා හැරීම සහ ණය ආපසු අය කර ගැනීමේ පූර්ණ වගකීම ගැනීම.

12.5 මෙම මෙහෙයුම් උපදෙස්හි සඳහන් පොලී අනුපාතිකයට වඩා ඉහළ අනුපාතිකයකට "SCRF අදියර IV" යටතේ ලියාපදිංචි ගත කළ උප ණය ගැනුම්කරුවන් සඳහා සහභාගීත්ව මූල්‍ය ආයතනයන්හි ශාඛාවන් කිසිදු අවස්ථාවක දී ණය ලබා නොදෙන බවට තහවුරු කිරීම.

12.6 එහි පොත්වල අදාළ ණය ගිණුමෙහි තත්ත්වය සහ මෙහෙයුම් නිති සුපරීක්ෂණය කෙරෙන බවට තහවුරු කිරීම සහ සහභාගීත්ව මූල්‍ය ආයතනය වෙත සිදුවිය හැකි ඕනෑම පාඩුවක් අවම කිරීම සඳහා අවශ්‍ය පරිදි, කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමට.

12.7 ගිණුම් සහ මූල්‍ය ප්‍රකාශ පවත්වා ගෙන යෑම.

i. සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් වෙනත් කරුණු අතර, උප ණය තක්සේරුව, අනුමත කිරීම්, වැය කිරීම් සහ ආපසු අය කර ගැනීම් දැක්වීමට නිසි ලෙජර ගිණුම් සහ සටහන් පවත්වා ගෙන යා යුතුය.

ii. සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ණය භාවිතය සහ ප්‍රතිමූල්‍ය මෙහෙයුම් සඳහා වෙන වෙනම ගිණුම් පවත්වා ගෙන යා යුතුය.

iii. සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ පරීක්ෂාව සහ සමාලෝචනය සඳහා ගිණුම් සහ මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කළ යුතුය. තවද, අවශ්‍ය අවස්ථාවන් හි දී "SCRF අදියර IV" ට අදාළව ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටිනු ලබන ගිණුම් ණය මූල්‍ය ප්‍රකාශ සහ ඕනෑම තොරතුරක් සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් ඉදිරිපත් කළ යුතුය.

12.8 මෙම මෙහෙයුම් උපදෙස්හි දන්වා ඇති පරිදි ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය සහ ප්‍රතිමූල්‍යන ක්‍රියාවලිය සිදුකළ යුතුය.

13. වෙනත්

සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් මෙම යෝජනා ක්‍රමය පිළිබඳ ඕනෑම පැහැදිලි කිරීමක් සඳහා දුරකථන අංක 011 2477348 ඔස්සේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ ව්‍යාපෘති මූල්‍ය අංශයේ ප්‍රධානියා ඇමතිය යුතුය.

ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාට පහත දක්වා ඇති හිමිකම් සතු වන්නේ ය.

13.1 අවශ්‍ය අවස්ථාවන් හිදී, මෙම මෙහෙයුම් උපදෙස් හි දන්වා ඇති නියමයන් සහ කොන්දේසි සංශෝධනය කිරීමට.

13.2 සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත අවශ්‍ය මාර්ගෝපදේශ, පැහැදිලි කිරීම් නිකුත් කිරීමට සහ "SCRF අදියර IV ක්‍රියාත්මක කිරීමට අදාළව අවශ්‍ය නියමිත දින තීරණය කිරීමට.

13.3 ශ්‍රී ලංකා මහ බැංකුව සහ සහභාගීත්ව මූල්‍ය ආයතනය අතර ගිවිසගත් අතිරේක ණය ගිවිසුමට අනුකූලව, මෙම යෝජනා ක්‍රමයේ මෙහෙයුම් උපදෙස් හා අනුගත නොවන ඕනෑම සහභාගීත්ව මූල්‍ය ආයතනයක් ඉවත් කිරීමට.

මීට විශ්වාසී

බී. එල්. ජේ. එස්. බාලසූරිය
අධ්‍යක්ෂ/ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව.

ඇමුණුම I

අංකය	කාරක ප්‍රාග්ධන ණයක් ලබාදීම සඳහා සලකා බැලිය යුතු රාජ්‍ය ව්‍යවසායන් ලැයිස්තුව			මාස 3ක පුරෝකතන කාරක ප්‍රාග්ධන අවශ්‍යතාව (රු.මිලියන)
	ආයතනය	2021.06.30 වන දිනට සත්‍ය සේවකයන් ගණන	2020.12.31 දිනට පිරිවැටුම (රු.මිලියන)	
	කුඩා			
1	සී/ ස කුසලතා සංවර්ධන අරමුදල් සමාගම	36	17	5
2	සමූපකාර තොග වෙළෙඳ සංස්ථාව	306	21	50
3	සී/ ස ජාතික කඩදාසි සමාගම	110	22	16
4	සී/ස සී නෝර් පදනම	72	37	10
5	ලංකා සෙරමික් සංස්ථාව	35	85	5
6	ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව	129	108	19
7	සී/ස කහටගහ මිනිරන් ලංකා සමාගම	116	126	17
8	සී/ස ලක්දිව ඉංජිනේරු සමාගම	104	130	15
9	තල් සංවර්ධන මණ්ඩලය	207	133	30
10	ශ්‍රී ලංකා පදනම් ආයතනය	155	153	22
11	ශ්‍රී ලංකා කජු සංස්ථාව	372	155	54
12	වී අලෙවි මණ්ඩලය	192	179	28
13	සී/ස ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ (පුද්) සමාගම	86	192	130
14	ජාතික ප්‍රවාහන කොමිෂන් සභාව	195	194	50
15	ශ්‍රී ලංකා අත්කම් නිර්මාණ මණ්ඩලය (ලක්සල)	139	194	30
16	සී/ස මන්තායි ලූණු සමාගම	173	202	25
17	සී/ස ලංකා පොස්පේට් සමාගම	25	218	21
18	සී/ස නෝත් සී සමාගම	250	245	50
	මධ්‍යම			
19	සී/ස බී සී සී ලංකා සමාගම	52	306	10
20	සී/ස පරන්තන් රසායන සමාගම	55	307	8
21	සී/ස ඇල්කඩුව වැවිලි සමාගම	1,545	328	222
22	ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය	190	341	27
23	ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය	197	377	120
24	ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව	710	545	102
25	වෛද්‍ය නෙවිල් ප්‍රනාන්දු ශික්ෂණ රෝහල	656	570	150
26	ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව	1,219	596	200
27	ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව	337	676	150
	මහා පරිමාණ			
28	ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය	317	771	46
29	හලාවත වැවිලි සමාගම	805	791	130
30	ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව	3,550	925	511
31	ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය	88	1,037	50
32	ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව	898	1,049	300
33	ජනතා වතු සංවර්ධන මණ්ඩලය	3,870	1,134	557
34	සී/ ස ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය	756	1,150	300
35	සී/ස කලුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගම	80	1,175	100
36	සී/ස රක්නා ආරක්ෂණ ලංකා සමාගම	3,616	1,224	250
37	සී/ස කොළඹ වාණිජ පොහොර සමාගම	132	1,330	250
38	මධ්‍ය සංස්කෘතික අරමුදල	2,509	1,415	150
39	රාජ්‍ය සංවර්ධන සහ ඉදිකිරීම් සංස්ථාව	594	1,449	400

	කාරක ප්‍රාග්ධන ණයක් ලබාදීම සඳහා සලකා බැලිය යුතු රාජ්‍ය ව්‍යවසායන් ලැයිස්තුව			මාස 3ක පුරෝකතන කාරක ප්‍රාග්ධන අවශ්‍යතාව (රු.මිලියන)
අංකය	ආයතනය	2021.06.30 වන දිනට සත්‍ය සේවකයන් ගණන	2020.12.31 දිනට පිරිවැටුම (රු.මිලියන)	
40	ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව (ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය - NEMO ඇතුළුව)	2,260	1,532	500
41	රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව	602	1,843	300
42	සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම (ලේක්හවුස්)	1,341	1,911	150
43	සී/ස ශ්‍රී ලංකා ත්‍රිපෝෂ සමාගම	246	1,996	300
44	සර් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය	1,709	2,062	264
45	සී/ස ලංකා පොහොර සමාගම	367	2,101	400
46	සී/ස එස් ටී සී පොදු වෙළෙඳ සමාගම	352	2,454	400
47	ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය	182	2,504	26
48	ලංකා ධීවර සංස්ථාව	672	2,900	500
49	ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය	1,988	3,232	300
50	සී/ස ශ්‍රී ලංකා නැව් සංස්ථාව	120	3,849	500
51	ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය	1,289	6,131	500
52	ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන සංස්ථාව	1,480	7,366	250
53	සී/ස මිල්කෝ (පුද්) සමාගම	1,422	11,047	1,000

ඇමුණුම II

ණය ලබාගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම්ලත් කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සහ නෛතික වගකීම් අදාළ වේ.

1. **තෙමසක් සඳහා කාරක ප්‍රාග්ධන අවශ්‍යතා**

- වැටුප් හා වේතන
- අමු ද්‍රව්‍ය මිල දී ගැනීම (දැනට ක්‍රියාත්මක නොවන රාජ්‍ය ව්‍යවසායන් සඳහා අදාල නැත)
- ණයහිමියන් පියවීම
- උපයෝගීතා බිල් පියවීම
- වෙනත් වර්තන වියදම්
- සහභාගීත්ව මූල්‍ය ආයතනයට පිළිගත හැකි වෙනත් ඕනෑම කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවක්
- මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ කරනු ලබන වෙනත් ඕනෑම කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවක්

2. **නෛතික වගකීම් පියවීම**

- ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල් සහ සේවක භාරකාර අරමුදල්
- සේවක අර්ථසාධක අරමුදල් සහ සේවක භාරකාර අරමුදල් සඳහා අධිභාර
- ගෙවිය යුතු පාරිතෝෂික
- අත්තිකාරම් සහ ණය (මූල්‍ය නොවන/ බැංකු අංශ)
- ශ්‍රී ලංකා මහ බැංකු විධාන තුළ තිබෙන බැංකු ණය, කල්බදු සහ බැංකු අයිරා (ශ්‍රී ලංකා මහ බැංකු විධාන යටතේ දී ඇති සහන හේතුවෙන් තාවකාලිකව අත්හිටුවීමට/ ප්‍රමාද කිරීමට සුදුසුකම් ලැබූ අයිතම හැර)
- සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත පිළිගත හැකි වෙනත් ඕනෑම නෛතික වගකීමක්
- මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ කරනු ලබන වෙනත් ඕනෑම කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවක්

ඇමුණුම III(අ)

ලියාපදිංචි අංකය :- .....

'සෞභාග්‍යා කොවිඩ් - 19 පුනරුද සහන ණය පහසුකම අදියර - IV'
ලියාපදිංචි පෝරමය

1. නම සහ සහභාගීත්ව මූල්‍ය ආයතනයේ ශාඛාව	
2. ශාඛාවේ ලිපිනය	
3. දුරකථන/ ෆැක්ස් අංකය	

4. අයදුම්කරුගේ තත්ත්වය. ව්‍යවස්ථාපිත මණ්ඩලය ☐ සංස්ථාව ☐ වෙනත් ☐

කරුණාකර නිශ්චිතව දක්වන්න .....

5. රාජ්‍ය ව්‍යවසායන්හි නම සහ සම්බන්ධ කර ගැනීමේ විස්තරඃ

රාජ්‍ය ව්‍යවසායන්හි නම	රාජ්‍ය ව්‍යවසායයෙහි ව්‍යාපාර ලියාපදිංචි/ පනත් අංකය	අධ්‍යක්ෂවරුන්ගේ නම්	තනතුර	අධ්‍යක්ෂවරයාගේ ජා.හැ.අංකය	දුරකථන අංකය

6. සම්පූර්ණ ලිපිනය/ රාජ්‍ය ව්‍යවසාය පිහිටි ස්ථානය
.....
.....

7. දිස්ත්‍රික්කයඃ : .....

8. රාජ්‍ය ව්‍යවසායයෙහි වර්ගයඃ කුඩා ☐ මධ්‍යම මහා පරිමාණ ☐

9. සෞභාග්‍යා කොවිඩ් 19 පුනරුද පහසුකම අදියර IV යටතේ ආවරණය කිරීමට නියමිත ක්‍රියාකාරකම් සහ වියදම්වල කෙටි විස්තරයක්
(ණය මුදලෙහි අරමුණ)
.....
.....
.....
.....

10. මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ නිර්දේශය/ කැමැත්ත ලබාදුන් දිනය
..... (පිටපත ඇමිණිය යුතුය)

11. අපේක්ෂිත කාරක ප්‍රාග්ධනය සහ නෛතික වගකීම්*	
12. අවශ්‍ය ණය ප්‍රමාණය	
13. සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් නිර්දේශ/ අනුමත කරන ලද අගය	

ඉහත 9 හි විස්තර කළ යෝජිත ක්‍රියාකාරකම් සහ වියදම් මා/ණය නිළධාරියා විසින් පරික්ෂා කරන ලද බවටත්, ඊට ප්‍රමාණවත් මුදල් ප්‍රවාහයක් සතු බවත්, මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යවහාර දෙපාර්තුමේන්තුව විසින් ලබාදුන් නිර්දේශයට එය ගැළපෙන බවත්, එබැවින් සෞභාග්‍යා කොවිඩ්- 19 පුනරුද සහන ණය පහසුකම අදියර -iv යටතේ මූල්‍යනය සඳහා නිර්දේශ කරන බවටත් සහතික කරමි.

දිනය : .....

.....
ශාඛා කළමණාකරුගේ අත්සන/ රබර් මුද්‍රාව

දිනය : .....

.....
සහභාගීත්ව මූල්‍ය ආයතන ප්‍රධාන කාර්යාලයේ
බලයලත් නිලධාරියාගේ අත්සන සහ
රබර් මුද්‍රාව

විස්තරාත්මක ගණනය කිරීම් සහිත තෙමසක කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සහ නෛතික වගකීම් ලැයිස්තුවක් ඇමිණිය යුතුය.

ඇමුණුම **III** (ආ):

'සෞභාග්‍ය කොවිඩ් - 19 පුනරුද සහන ණය පහසුකම අදියර - IV'
ණය ගැනුම්කරුවා (රාජ්‍ය ව්‍යවසායන්) ලියාපදිංචි කිරීම

අයදුම් කිරීමේ අංකය: .....

ශ්‍රී ලංකා මහ බැංකුව වෙත

සහභාගීත්ව මූල්‍ය ආයතනය හරහා,

සහභාගීත්ව මූල්‍ය ආයතනයන්හි නම: .....

සහභාගීත්ව මූල්‍ය ආයතනයන ශාඛාවේ නම: .....

ශාඛාව අයත් දිස්ත්‍රික්කය: .....

#	රාජ්‍ය ව්‍යවසායේ නම	ලිපිනය	ව්‍යාපාර ලියාපදිංචි/ පනත් අංකය	අධ්‍යක්ෂවරයාගේ නම	තනතුර	ජා.හැ. අංකය	රාජ්‍ය ව්‍යවසාය පිහිටි		ණය විස්තර			ශ්‍රී ලංකා මහ බැංකු ලියාපදිංචි අංකය*
							ලිපිනය	දිස්ත්‍රික්කය	අරමුණ	අපේක්ෂිත මුදල (රු.)	නිර්දේශිත අගය (රු.)	

උක්ත රාජ්‍ය ව්‍යවසායන්හි යෝජිත ක්‍රියාකාරකම් සහ වියදම් මා/ ණය නිලධාරී විසින් පරීක්ෂා කරනු ලැබූ බවත්, සෞභාග්‍යා කොවිඩ් - 19 පුනරුද සහන ණය පහසුකම අදියර - IV යටතේ ඒවා මූල්‍යනය කිරීමට සුදුසුකම් ලබන බවටත් සහතික කරමි.

....

(නම සහ අත්සන සහ බලයලත් නිලධාරියාගේ මුද්‍රාව) දිනය

*ශ්‍රී ලංකා මහ බැංකුවේ භාවිතය සඳහා පමණි.

ඇමුණුම **IV** - **ප්‍රතිමූල්‍යය සඳහා අයදුම් කිරීම**

ප්‍රතිමූල්‍ය අයදුම්පත් අංකය.....

(මෙහෙයුම් උපදෙස් අංක RDD/COVID-19-අදියර-IV/2021/01 අනුව)

ලිපිනය:

දිනය:

'සෞභාග්‍ය කොවිඩ් - 19 පුනරුද සහන ණය පහසුකම අදියර - IV'
යටතේ ප්‍රතිමූල්‍යන සඳහා අයදුම් කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුව වෙත,

මහත්මයාණෙනි,

මුදල් නීති පනත (පරිච්ඡේද 422) හි වගන්ති 88 (එෆ්) හි අර්ථය තුළ ණය ආයතනයක් වන, ... වන අප, කලින් කලට සංශෝධනය වන පරිදි / ලියාපදිංචි ගත කළ මූල්‍ය කල්බදු ආයතනයක් වන අතර, මුදල් නීති පනතෙහි වගන්ති 88 (ආ) හි විධිවිධාන යටතේ, ... (රු.....) ණය මුදලක් පිරිනැමීම සඳහා අයදුම් කිරීමට, මෙම ආයතනයේ සත්‍ය බවට සහතික කළ සමාගම් ව්‍යවස්ථාව සමඟ මෙමඟින් යොමු කරන්නෙමු/ දැනටමත් යොමු කර ඇත්තෙමු.

2. මෙම අයදුම්පත සෑදීමේ දී, 2021.10.06 දරණ ඔබගේ මෙහෙයුම් උපදෙස් අංක RDD/COVID19-අදියර-IV/2021/01 හි නියම කොට තිබෙන නියමයන් සහ කොන්දේසි සමඟ අනුකූල වීමට අපි එකඟ වන්නෙමු.

3. උක්ත සඳහන් මෙහෙයුම් උපදෙස්වලින් අවශ්‍ය වන පරිදි සහ ඊට අනුකූලව, රාජ්‍ය ව්‍යවසායන් හි කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සහ ව්‍යවස්ථාපිත වගකීම් පියවීම සඳහා 'සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද පහසුකම අදියර-IV' යටතේ අප විසින් මෙම අයදුම්පතෙහි දිනයට වහාම මාස හයක් නොඅඩු කාලයකට පෙර ලබා දුන් ණය මුදල්වල ප්‍රකාශයනයක් අනුපිටපතක් ලෙස මේ සමඟ අපි යොමු කරන්නෙමු. මෙම ප්‍රකාශනයෙහි සඳහන් ණය කිසිවක් ප්‍රතිමූල්‍ය සඳහා මීට පෙර ඉදිරිපත් කරන ලද කිසිම ප්‍රකාශනයක සඳහන් නොවන බවට සහතික කරමු.

4. 20 ..... මාසයේ ..... දින ප්‍රථම වාරිකය ගෙවිය යුතු වන, එක් වාරිකයක් රු..... වන ..... කින් (වාරික ගණන) ..... (මාසිකව/ කාර්තුමය/ අර්ධ වාර්ෂිකව [වාර ගණන සඳහන් කරන්න]) මෙම අයදුම්පත ප්‍රකාරව අපට ලබා දුන් මුදල් ඔබ වෙත ආපසු ගෙවීමට අපි මෙමඟින් විශේෂයෙන් ම එකඟ වන්නෙමු.

5. (i) උක්ත 3 වන පරිච්ඡේදයේ සඳහන් රාජ්‍ය ව්‍යවසායන් වෙත ලබා දුන් ණය ඔවුන්ගේ ණය ගැනීමේ බලයන් තුළ පවත්නා බවටත්;

   (ii) එවැනි ණය ආපසු ගෙවීම සඳහා ලබා ගත් ඇප සහතිකයන් ප්‍රකාරව, ඇපකරුවන්ට එවැනි ඇප සහතිකයන් ලබා දීමේ බලය සතු බවටත්;

යනාදී කරුණු සඳහා අප තෘප්තිකාරක වූ බවට අපි මින් සහතික කරමු.

සහභාගීත්ව මූල්‍ය ආයතන කළමනාකරුගේ
බලයලත් නිලධාරියා (නිලධාරිවරුන්) ගේ
අත්සන නම සහ තනතුර

ඇමුණුම V - ප්‍රතිමූල්‍ය අයදුම්පත සඳහා ණය මුදා හැරීමේ ප්‍රකාශය

ප්‍රතිමූල්‍ය අයදුම්පත් අංකය : .....

සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකම අදියර - IV' යටතේ ණය මුදාහැරීමේ ප්‍රකාශය

(මෙහෙයුම් උපදෙස් අංක : RDD/COVID-19-Phase-IV/2021/01)

වෙත : ශ්‍රී ලංකා මහ බැංකුව

වෙතින් : ප්‍රතිමූල්‍ය ඒකකය

ස.මු.ආ. : ..... ශාඛාව : ..... දිස්ත්‍රික්කය: .....

විමසීම් අංකය	රාජ්‍ය ව්‍යවසායෙහි නම සහ ලිපිනය	ව්‍යාපෘති විස්තරය සහ ණය ලබා ගන්නා අරමුණ	උප ණය මුදල (රු.)	මුදාහළ ණය මුදල (රු.)	ණය මුදාහළ දිනය	ප්‍රතිමූල්‍ය සඳහා බලාපොරොත්තු වන මුදාහළ ණය මුදල (රු.)	සහන කාල සීමාව	නැවත ගෙවීමේ ලේඛනය			
								වාරික		පළමු වාරිකය ගෙවිය යුතු දිනය	අවසන් වාරිකය ගෙවිය යුතු දිනය
								වාරික ගණන	වාරිකයේ වටිනාකම (රු.)		
එකතුව											

ශ්‍රී ලංකා මහ බැංකුව හා සහභාගිත්ව මූල්‍ය ආයතන අතර වූ උපණය ගිවිසුමට එකඟ වූ පරිදි ඉහත දෙන ලද ණය ආපසු ගෙවීමේ සැලැස්මෙහි දක්වා ඇති පරිදි මෙම ණය මුදල අර්ධ වාර්ෂිකව ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පියවන බවට අප විසින් පොරොන්දු වෙමු.

.....

බලයලත් නිලධාරියාගේ නම සහ අත්සන

ඇමුණුම VI - ඉල්ලුම් නෝට්ටුව

ප්‍රතිමූල්‍ය අයදුම්පත් අංකය.....
(මෙහෙයුම් උපදෙස් අංකඃ 2021.10.26 දිනැති RDD/COVID19- Phase-IV/2021/01)

ඉල්ලුම් පොරොන්දු නෝට්ටුව

දිනය : .....

කොළඹ දී ය.

රු. .....

..... (සහභාගීත්ව මූල්‍ය ආයතනයේ නම හා ලිපිනය) වන අප විසින් පහත අත්සන් කළ මුළු ණය මුදල වූ රු. ..... වාර්ෂිකව .... පොලී අනුපාතිකය යටතේ එහි වූ පොලී මුදල ද සමග මෙහි සඳහන් දිනට, ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පියවීම සිදු කරන බවට කොළඹ දී මෙයින් පොරොන්දු වෙමු.

.....

වෙනුවට (සහභාගීත්ව මූල්‍ය ආයතනයේ නම)
ප්‍රතිමූල්‍ය ඒකකය
ප්‍රධාන කාර්යාලය

..... 1. .....
(රබර් මුද්‍රාව)

2. .....
(බලයලත් නිළධාරියාගේ නම හා අත්සන)

සාක්ෂිඃ

1. .....

2. .....

ඇමුණුම VII- භාරදීමේ ලිපිය

ප්‍රතිමූල්‍ය අයදුම්පත් අංකය.....
(මෙහෙයුම් උපදෙස් අංකඃ 2021.10.26 දිනැති RDD/COVID19- Phase-IV/2021/01)

භාරදීමේ ලිපිය

දිනයඃ .....

කොළඹ දී ය.

ශ්‍රී ලංකා මහ බැංකුව වෙත,

සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද ණය සහන පහසුකම අදියර-IV යටතේ වූ 2021.10.26 දිනැති ඔබගේ මෙහෙයුම් උපදෙස් අංක RDD/COVID19-Phase-IV/2021/01 පරිදි, ණය යෝජනා ක්‍රමය යටතේ ක්‍රියාත්මක කරන ලද ණය මෙහෙයුම් සඳහා අපහට මූල්‍ය අනුග්‍රහය ලබා දීම අරමුණු කර ගනිමින්, කලින් කලට සංශෝධනය කරන මුදල් නීති පනතේ (422 පරිච්ඡේදය) 88(අ) වගන්තියේ ප්‍රතිපාදන යටතේ සලකා බලා එකඟ වූ ණය ප්‍රමාණය වන රුපියල් ..... (රු. .....) මුදල සඳහා වූ පොරොන්දු නෝට්ටුවේ රුපියල් ..... (රු. .....) ක ගෙවිය යුතු මුදල හා ඉල්ලුම් කරන ලද පොලී මුදල ද සමඟ මෙයින් එවනු ලැබේ.

ඉහත කී පොරොන්දු නෝට්ටුව ගෙවීම සඳහා ඉදිරිපත් කිරීමෙන් වැළකෙන බැවින් එය අගරු කිරීමට දැනුම් දීමේ අවශ්‍යතාවයක් ඇති නොවනු ඇත.

වෙනුවෙන් (සහභාගීත්ව මූල්‍ය ආයතනයේ නම)

ප්‍රතිමූල්‍ය ඒකකය

ප්‍රධාන කාර්යාලය

1. .....

2. .....
(බලයලත් නිළධාරීන්ගේ නම සහ අත්සන)

ඇමුණුම VIII - ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ප්‍රතිඥා පැවරුම

ප්‍රතිමූල්‍ය අයදුම්පත් අංකය.....
(මෙහෙයුම් උපදෙස් අංක: 2021.10.26 දිනැති RDD/COVID19-Phase-IV/2021/01)

මුදල් නීති පනතේ අංක 88(අ) වගන්තිය යටතේ, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයට ඇප වන බවට දෙනු ලබන ප්‍රතිඥාව*

දිනය: .....

කොළඹ දී ය.

..... (සහභාගීත්ව මූල්‍ය ආයතනයේ නම සහ ලිපිනය) වන අප 1963 අංක 11 දරන මුදල් පනතේ 67 වන වගන්තිය සහ 1968 අංක 21 දරන මුදල් නීති (සංශෝධිත) පනත මගින් සංශෝධිත මුදල් නීති පනතේ 88 (අ) වගන්තිය ප්‍රකාරව .....% වාර්ෂික පොලි අනුපාතය යටතේ ආපසු ගෙවීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අප වෙත ලබාදී ඇති රුපියල් .... (රු. .....) ක ණය මුදලට සුරක්ෂිත/වැඩිමනත් සුරක්ෂිත වශයෙන් මෙහි පහත උපලේඛනයේ විස්තර ලෙස දක්වා ඇති අපට අයවිය යුතු ණය ඔඩපනයක් වශයෙන් මෙයින් ශ්‍රී ලංකා මහ බැංකුවට පවරා දෙමු.

උපලේඛනය

ණය ප්‍රමාණය (රු.)	ණය ගනුදෙනුකරුගේ (රාජ්‍ය ව්‍යවසායකයින්ගේ) නම සහ ලිපිනය	දිනය	නොතාරිස්

.....
බලයලත් නිළධාරීන්ගේ නම සහ අත්සන
වෙනුවෙන් (සහභාගීත්ව මූල්‍ය ආයතනයේ නම)
ප්‍රතිමූල්‍ය ඒකකය
ප්‍රධාන කාර්යාලය

*රජය සතු බලපත්‍රලාභී වාණිජ බැංකු

ඇමුණුම IX : ණය මුදාහැරීමේ ලිපිය

ණය මුදාහැරීමේ ලිපිය

(මෙහෙයුම් උපදෙස් අංක : 2021.10.26 දිනැති RDD/COVID19-Phase-IV/2021/01)

බැංකුවේ නම :
බැංකු කේත අංකය :
ශාඛාවේ නම :
ශාඛා කේතය :
ණය මුදලේ අනු අංකය :
දිනය :
ණය මුදාහැරීම :

*

1	2	3	4	5	6	7	8	9	10

සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකම අදියර - IV යටතේ
ණය මුදාහැරීමේ ප්‍රකාශය

විමසුම් අංකය

1. **ණය ගනුදෙනුකරුගේ විස්තර**

1.1 ණය ගනුදෙනුකරුගේ නම (රාජ්‍ය ව්‍යවසායන්)

1.2 ණය ගනුදෙනුකරුගේ ලිපිනය (රාජ්‍ය ව්‍යවසායන්) :

1.3 සම්බන්ධ කළ ගත හැකි/ වගකිව යුතු පුද්ගලයා :

1.4 ණය ගනුදෙනුකරුගේ දුරකථන අංකය :

2. **ණය පිළිබඳ විස්තර**

2.1 ණය ලබා ගන්නා අරමුණ :

2.2 උප ව්‍යාපෘතියේ පිහිටීම :

2.3 අනුමත වූ මුළු ණය මුදල : රු.

පිරිවැය ඉහළ යෑම හේතුවෙන් ණය මුදලේ වැඩි කිරීම් : රු.

මුළු මුදල : රු

2.4 ණය අනුමත වූ දිනය :

ණය වැඩිවීම අනුමත වූ දිනය :

2.5 ඉල්ලුම් කළ ප්‍රතිමූල්‍ය සඳහා වාරික සඳහා ආපසු ගෙවීමේ වැඩසටහන :

දිනය : ප්‍රමාණය (රු.) :

2.6 පොලී අනුපාතය :

3. **ණය මුදලේ තත්ත්වය**

3.1 පෙර නිකුත් කරන ලද මුදල හා ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ප්‍රතිමූල්‍ය අයදුම් කරන ලද ප්‍රමාණය : රු.

3.2 දැන් මුදාහරින ණය මුදල හා ප්‍රතිමූල්‍ය ඉල්ලුම් කරන ප්‍රමාණය : රු

මුළු මුදල

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය සහ නිවැරදි බවට තහවුරු කරමි.

දිනය: .....

ශාඛා කළමනාකරුගේ අත්සන
ශාඛා කළමනාකරුගේ නම

* ණය වාරික අනුපිළිවෙළ අනුව, අදාළ කොටුවේ × සලකුණක් යොදන්න.

2021 ඔක්තෝබර් 29

යොමු අංකය : 32/004/021/001/005

සියලු සහභාගීත්ව මූල්‍ය ආයතනයන්හි ප්‍රධාන විධායක නිලධාරී/ සාමාන්‍යාධිකාරීවරුන් වෙත,
හිතවත් මහත්මයාණෙනි/ මහත්මියනි,

'ස්වශක්ති - රැකියා මිලියනයක් කරා' යන ණය යෝජනා ක්‍රමය යටතේ ලබා ගත් ණය සඳහා ප්‍රදානය කිරීමට නියමිත සහන.

ඔබ දැනටමත් දන්නා පරිදි, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් රටේ ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීමට සහාය ලබා දීමේ අරමුණැතිව, කොවිඩ් 19 වසංගතයෙන් බලපෑමට පත් පුද්ගලයන් සහ ව්‍යාපාර සඳහා ණය සහන කාලය ලබා දීමට 2021.09.01 දාතම 2021 අංක 08 දරන චක්‍රලේඛය නිකුත් කරන ලදී (ඇමුණුම අ). ඒ අනුව, ඔබේ කාරුණික අවධානය පහත කරුණු වෙත යොමු කෙරේ.

2. 'ස්වශක්ති රැකියා මිලියනයක් කරා' යන ණය යෝජනා ක්‍රමය යටතේ ලබා දුන් ණය සඳහා දීර්ඝ කරන ලද සහන

2.1 මුදල් මණ්ඩල චක්‍රලේඛයේ 09 වන වගන්තිය හා අනුව යමින්, එක් එක් සිද්ධිය අනුව 2021.09.01 සිට 2021.12.31 දක්වා ස්වශක්ති ණය යෝජනා ක්‍රමය යටතේ ලබා දුන් ණය සඳහා ණය සහන පහසුකමක් සැපයීමට තීරණය කොට ඇත.

2.2 උප ණය ගැනුම්කරුවන් විසින් ඉල්ලීම් කර ඇති පරිදි, ණය සහන අදාළ ණය අගයන්හි ප්‍රාග්ධනය ආපසු ගෙවීම නැතහොත් ප්‍රාග්ධනය සහ පොලී ගෙවීම් සඳහා පමණක් ලබා දිය හැකිය. යෝජිත සහන එක් එක් සිද්ධිය අනුව කොවිඩ්19න් බලපෑමට පත් උප ණය ගැනුම්කරුවන් සඳහා ලබා දිය යුතුය.

2.3 මෙම සහනවලින් ප්‍රතිලාභ ලබා ගැනීමට අපේක්ෂා කරන සුදුසුකම්ලත් ණය ගැනුම්කරුවන් අදාළ සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත එවැනි සහන සඳහා ඉල්ලීමක් සිදු කළ යුතුය. සහභාගීත්ව මූල්‍ය ආයතන අයදුම් කිරීම සඳහා සහන, නියමිත කාල සහ අයදුම් කිරීමේ ආකෘතිය විද්‍යුත් තැපෑල සහ කෙටි පණිවුඩ ඇතුළු මුද්‍රිත සහ/ හෝ විද්‍යුත් ක්‍රමවේද ඔස්සේ සියලු සුදුසුකම්ලත් ණය ගැනුම්කරුවන් වෙත කඩිනම්ව දැනුම් දිය යුතුය.

2.4 ඒ අනුව, සහභාගීත්ව මූල්‍ය ආයතන 2021.11.30 දින වන විට ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා වෙත මෙම සහන ලබා ගැනීමට අපේක්ෂා කරන (RDD - Swashakthi 2021.10.29 ඇමුණුම I) සුදුසුකම්ලත් ණය ගැනුම්කරුවන්ගෙන් ලැබෙන ඉල්ලීම පිළිගෙන විස්තර වාර්තා යොමු කරන ලෙස දැනුම් දෙයි. විස්තර සහිතව EXCEL ආකෘතියෙන් යුත් මෘදු පිටපත vijithap@cbsl.lk වෙත පිටපත් කර, lakminiws@cbsl.lk සහ chamali@cbsl.lk වෙත යොමු කළ යුතුය.

3. දීර්ඝ කළ ණය සහන කාල පරිච්ඡේදවලට අදාළව පොලී ගණනය කිරීම.

3.1 ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා විසින් ස්වශක්ති ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම පිළිබඳ නිකුත් කරන ලද අදාළ මෙහෙයුම් උපදෙස් සහ පසුකාලීන සංශෝධනයන්හි දක්වා ඇති පොලී අනුපාතික අනුව යමින්, දීර්ඝ කළ ණය සහන කාලවලින් හට ගන්නා මූලධන එකතු වීම මත පොලිය ගණනය කිරීමට මින් දැනුම් දෙනු ලැබේ.

3.2 ඕනෑම අවස්ථාගත කරුණක් යටතේ, ඕනෑම සහභාගීත්ව මූල්‍ය ආයතනයක් විසින් ඕනෑම දී ඇති කාලයක දී, ඉහත සඳහන් පොලී අනුපාතිකයට වඩා ඉහළ අනුපාතිකයකට ඕනෑම උප ණය ගැනුම්කරුවෙකුගෙන් පොලිය අය කර ඇති නම්, එවැනි සහභාගීත්ව මූල්‍ය ආයතනයක් එම උප ණය ගැනුම්කරුවෙකුට පක්ෂව එවැනි පොලී අයකිරීම් ආපසු හැරවීමට වහාම කටයුතු කළ යුතු අතර, අදාළ උප ණය ගැනුම්කරුට එහි වෙනස ගෙවිය යුතු වේ.

3.3 ඕනෑම උප ණය ගැනුම්කරුවෙකු ණය සහන කාලය තුළ පොලී නොගෙවීමට තීරණය කර ඇත්නම්, එවැනි කාලයක දී සමුච්චිතව තිබෙන පොලිය, ඉතිරිව පවතින ණය වාරික අතර සමානව බෙදා හැරිය යුතුය. ණය සහන කාලය තුළ දී සමුච්චිත පොලිය මත කිසිදු පොලියක් අය නොකළ යුතු අතර, ණය සහන කාලය තුළ කිසිදු වැල් පොලියක් ගණනය නොකළ යුතුය.

4. අක්‍රීය ණය (NPLs) සඳහා යථා තත්ත්වයට පත් කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම

4.1 මුදල් මණ්ඩල චක්‍රලේඛයේ වගන්ති 2 (ආ) අනුව යමින්, ස්වශක්ති ණය යෝජනා ක්‍රමයේ පැහැර හරින ලද ණය ගැනුම්කරුවන් මත, 2021.12.31 න් පසු මසක් තුළ, එම චක්‍රලේඛයේ ම මාර්ගෝපදේශවලට අනුව අහෝසි කෙරෙනු ඇති, අවශ්‍ය ආරම්භක නැවත අය කර ගැනීමේ සියලු ක්‍රියාමාර්ග ආරම්භ කළ යුතු වේ.

5. අක්‍රීය ණය කාණ්ඩය තුළ ණය සඳහා සහන සැලසීම

5.1 සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් අක්‍රීය ණයවලට අදාළව තීරණයක් ගැනීමේ දී, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද සියලු විධානවලට අනුකූල විය යුතුය යන කොන්දේසියට යටත්ව, සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ඉදිරි ණය වාරික සඳහා අක්‍රීය ණය කාණ්ඩය සඳහා ණය සහන කාල සපයනු ලැබිය යුතුය. තවද, සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් දැනටමත් අක්‍රීය කාණ්ඩය තුළ සිටින ණය ගැනුම්කරුවන් සඳහා ණය සහන පහසුකම පසුදාතම නොකළ යුතු අතර, එවැනි ණය ගැනුම්කරුවන් සක්‍රීය කාණ්ඩයට මාරු කළ යුතුය.

6. ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතිව, සහභාගීත්ව ආයතන මෙම විධාන සමඟ අනුකූල වීම තහවුරු කිරීමට කටයුතු සිදු කෙරෙනු ඇත.

7. කරුණාකර මෙම ලිපියේ අන්තර්ගතයන් ඔබේ බැංකුවේ අදාළ දෙපාර්තමේන්තු/ ශාඛාවල නිලධාරීන්ගේ අවධානයට යොමු කිරීමට සහ ස්වශක්ති ණය යෝජනා ක්‍රමයේ මෙහෙයුම් කාර්යක්ෂමතාව පවත්වා ගෙන යෑමට, ඉහත සඳහන් නියමිත දින සැපිරීම තහවුරු කිරීමට කටයුතු කරන්න.

මීට විශ්වාසී,
බී.එල්.ජේ.එස්. බාලසූරිය
අධ්‍යක්ෂ/ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
පිටපත්; ලේකම්, තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය.

2021 නොවැම්බර් 02

සහභාගීත්ව මූල්‍ය ආයතනයන්හි ප්‍රධාන විධායක නිළධාරීන්/ සාමාන්‍යාධිකාරීන් වෙත.

හිතවත් මහත්මයාණෙනි/ මහත්මියනි,

ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද ණය යෝජනාක්‍රම යටතේ ණය ලබාගත් ණය ගනුදෙනුකරුවන් සඳහා ලබා දුන් සහන

ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද පහත සඳහන් ණය යෝජනාක්‍රම යටතේ ණය ලබාගත් ණය ගනුදෙනුකරුවන් සඳහා ලබා දුන් සහන පිළිබඳව අප විසින් එවන ලද 2021.09.10, 2021.09.19 සහ 2021.09.23 දිනැති ලිපි හා බැඳේ.

- සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකම අදියර I, II සහ III
- සෞභාග්‍යා ණය යෝජනාක්‍රමය
- සැපයුම් ජාල යළි නඟා සිටුවීමේ ණය යෝජනා ක්‍රමය
- කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර හවුල්කාරීත්ව වැඩසටහන යටතේ ක්‍රියාත්මක ණය යෝජනාක්‍රමය
- කුඩා පරිමාණ තේ සහ රබර් පුනර්ජීවන ව්‍යාපෘතිය

ඉහත සඳහන් ණය යෝජනාක්‍රම යටතේ ණය සහන කාලයන් සඳහා එක් එක් ඉල්ලීම සලකා බලා ණය මත පදනම්ව ණය ගනුදෙනුකරුවන්ගේ ණය අයදුම්පත් අනුමත කිරීම සහ ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ණය සහන සඳහා ඉල්ලුම්පත් යැවීම සඳහා වන අවසාන දිනය 2021.11.15 වන දින දක්වා දීර්ඝ කළ බව මෙයින් දැනුම් දෙමි. ඒ අනුව, 2021.11.15 වන දිනට පෙර සියලුම ණය සහන අයදුම්පත් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යොමු කළ යුතු වේ. 2021 වසරේ දෙවන අර්ධ වාර්ෂිකය සඳහා අදාළ ණය සහන යටතේ පොලී සහනාධාර ගෙවීම හෝ ප්‍රතිමූල්‍ය අයකිරීම් ගණනය කිරීම් සඳහා අදාළ අවසාන දිනයන්ට ප්‍රථමයෙන් එවනු ලබන ණය සහන ඉල්ලුම්පත් පමණක් ප්‍රාදේශිය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සලකා බලනු ඇත.

මෙම ලිපියේ අන්තර්ගතය ඔබගේ බැංකුවේ අදාළ දෙපාර්තමේන්තුවේ/ශාඛාවේ නිළධාරීන්ගේ අවධානයට යොමු කරන ලෙස ඉල්ලා සිටින අතර, යෝජනාක්‍රමයන්ගේ මෙහෙයුම් කාර්යක්ෂමතාව පවත්වාගෙන යෑම සඳහා ඉහත සඳහන් අවසාන දිනය හා අනුගතව කටයුතු කරන මෙන් ඉල්ලා සිටිමි.

මෙයට විශ්වාසී

අත්සන් කළේ බී. එල්. ජේ. එස්. බාලසූරිය
අධ්‍යක්ෂ/ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ලියවිල්ල

මෙහෙයුම් උපදෙස් අංක : RDD/IS/SF/2021/01
සියලු සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත

ප්‍රාදේශීය සංවර්ධන
දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
තැ.පෙ. 590
නො. 30, ජනාධිපති මාවත,
කොළඹ 01

2021.12.21

මෙහෙයුම් උපදෙස්
ශ්‍රී ලංකාව තුල ඉස්සන් වගා කිරීමේ ගොවිපළ වැඩි දියුණු කිරීම සඳහා වන පොලී සහනාධාර ණය යෝජනා ක්‍රමය.

** ශ්‍රී ලංකාවේ ඉස්සන් වගා කිරීමේ ගොවිපළ වැඩි දියුණු කිරීම සඳහා වන පොලී සහනාධාර ණය යෝජනා ක්‍රමයක් (මින්මතු 'යෝජනා ක්‍රමය' ලෙස හැඳින්වෙන) හඳුන්වාදීමට සහ ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තුමේන්තුවේ අධ්‍යක්ෂවරයා විසින් RDD/IS/SF/2021/01 අංක දරණ මෙහෙයුම් උපදෙස් 2021.12.21 දින සියලු සහභාගිත්ව මූල්‍ය ආයතන වෙත නිකුත් කෙරේ.

1. හැඳින්වීම

1.1. නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ඉස්සන් වගාකරුවන්ගේ (මින්මතු 'ණය ගැනුම්කරුවන්' ලෙස හැඳින්වෙන) පහසුකම් ඉහළ නැංවීම මඟින් ශ්‍රී ලංකාව තුළ ඉස්සන් ගොවිපළ තීව්‍ර කිරීම සඳහා සහනදායී නියමයන් යටතේ පොලී සහනාධාර ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු

හා මත්ස්‍ය අපනයන පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශයේ (මින්මතු 'ධීවර රාජ්‍ය අමාත්‍යාංශය' ලෙස හැඳින්වෙන) ඉල්ලීම මත ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෙම යෝජනා ක්‍රමය හඳුන්වා දෙන ලදී.

1.2. සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් සුදුසුකම් ලත් ණය ගැනුම්කරුවන්ට සහනදායී පොලී අනුපාතිකයකට ණය ලබා දීම සඳහා ස්වකීය අරමුදල් භාවිත කරනු ඇති බවට අපේක්ෂා කෙරේ. මෙම යෝජනා ක්‍රමය යටතේ සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් ලබා දුන් ණය මුදල් සඳහා අදාල අරමුදල් පිරිවැය ආවරණය කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත පොලී සහනාධාර සපයනු ලැබේ.

1.3. මෙම යෝජනා ක්‍රමය යටතේ ණය ගැනුම්කරුවන් වෙත ලබා දුන් ණය මුදල් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලබාදෙන පොලී සහනාධාර සඳහා හිමිකම් පෑමට සහභාගීත්ව මූල්‍ය ආයතන සුදුසුකම් ලබයි.

1.4. මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතනය ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත බලය පැවරී ඇත.

2. අරමුදල් සැපයීම

2.1 ණය මුදා හැරීම සඳහා අරමුදල්: සහභාගීත්ව මූල්‍ය ආයතනවල ස්වකීය අරමුදල්

2.2 පොලී සහනාධාරයට වෙන් කිරීම සඳහා අරමුදල් සැපයීම : ධීවර රාජ්‍ය අමාත්‍යාංශය

3 සහභාගීත්ව මූල්‍ය ආයතන (PFI)

ලංකා බැංකුව, මහජන බැංකුව සහ ප්‍රාදේශීය සංවර්ධන බැංකුව

4 මෙම යෝජනා ක්‍රමයේ මූලික ලක්ෂණ

4.1 මෙම යෝජනා ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ

(i) ණය ගැනුම්කරුවෙකු සඳහා උපරිම ණය මුදල		රු. මිලියන 100 (තටාකයක් සඳහා උපරිම රුපියල් මිලියන 5)
(ii) ණය ගැනුම්කරුවෙකු සඳහා අදාළ වන පොලී අනුපාතිකය	ප්‍රථම මාස 18 තුළ දී	වසරකට සියයට 4.5
	ඉදිරි මාස 06 සඳහා	වසරකට සියයට 8.5
(iii) පොලී සහනාධාර	පළමු මාස 18 තුළ දී	වසරකට සියයට 4
	ඉදිරි මාස 06 සඳහා	පොලී සහනාධාර නොගෙවනු ඇත
(iv) සහන කාලය ඇතුළුව උපරිම ආපසු ගෙවීමේ කාලය		වසර දෙක (02)
(v) සහන කාලය		මාස හය (06)

4.2 පොදු ලක්ෂණ

i. ව්‍යාපෘතියේ ස්වභාවය	ඉස්සන් ගොවිපළ වැඩි දියුණු කිරීම සඳහා වන සහනදායී නියමයන් යටතේ පොලී සහනාධාර ණය යෝජනා ක්‍රමය
ii. යෝජනා ක්‍රමයෙහි අරමුණු	ඉස්සන් වගාකරුවන්ට ඔවුන්ගේ ගොවිපළ දියුණු කිරීමට අවශ්‍ය සහාය ලබා දීම
(iii) ඉලක්ක කණ්ඩායම/ණය ගැනුම්කරුවන්	දැනට 'B' ශ්‍රේණිය සහ 'C' ශ්‍රේණියේ ඉස්සන් ගොවිපළ සතු ඉස්සන් වගාකරුවන්
(iv) ක්‍රියාත්මක කිරීමේ වපසරිය	දිවයින පුරා
(v) ණය ගැනුම්කරුවන් තෝරා ගැනීම	තෝරා ගැනීමේ ක්‍රියාවලියක් ඔස්සේ, තාක්ෂණික සහ මූල්‍යමය යන දෙයාකාරයෙන් ම හැකියාවක් පවතින සුදුසුකම් ලත් ඉස්සන් වගාකරුවන්, අයදුම්පත් කැඳවීම මඟින් ධීවර රාජ්‍ය අමාත්‍යාංශය සහ/හෝ ශ්‍රී ලංකා ජාතික ජල ජීවී වගා සංවර්ධන අධිකාරිය (NAQDA) විසින් ණය ගැනුම්කරුවන් තෝරා ගනු ඇත. ලබා ගත හැකි අරමුදල් ප්‍රමාණය මත පදනම්ව, ප්‍රතිලාභීන් තෝරා ගැනීම ධීවර රාජ්‍ය අමාත්‍යාංශය සහ/හෝ NAQDA විසින් කලින් කලට තීරණය කළ යුතුය.
(vi) ඇප සුරැකුම්	NAQDA ගොවිපළ බලපත්‍ර/ ආපසු මිල දී ගැනීමේ සහතිකය/අපනයනකරුවන් ගෙන් විධිමත් ආයතනික සහතිකය නැතහොත් සහභාගීත්ව මූල්‍ය ආයතන NAQDA වෙත පිළිගත හැකි වෙනත් ඕනෑම ඇප සුරැකුමක්.

4.3 ණය ගැනුම්කරුවන් මාස 06ක සහන කාලයකට හිමිකම් ලබන අතර, ඉන් අනතුරුව ණය මුදල වසරක් තුළ වාරික දෙකකින් ගෙවිය යුතු වේ. ණය මුදල මුදා හරින ලද දිනයේ සිට මාස 12ක් නිමා වීමට පෙර ණය ගැනුම්කරු විසින් ණය මුදලෙන් අඩක් (එනම්, මුල් මුදලෙන් 50%ක් සහ අදාළ පොලිය) ගෙවිය යුතුවේ. ණය ආපසු ගෙවීමේ කාල සීමාව නිමා වීමට ප්‍රථම ඊළඟ මාස 6 තුළ ඉතිරි ගෙවීම සිදු කළ යුතුය.

4.4 සහභාගීත්ව මූල්‍ය ආයතන එකඟ වන්නේ නම්, ණය ගැනුම්කරුවන්ට තවත් මාස 06 ක කාලයක් (එනම්, සහන කාල සීමාවද ඇතුළුව සමස්ත ණය ආපසු ගෙවීම සඳහා උපරිම වසර දෙකක කාලයක් දක්වා) ඔවුන්ගේ ණය ආපසු ගෙවීමේ කාලසීමාව දීර්ඝ කර ගත හැකිය. කෙසේවෙතත්, එම අවස්ථාවේ දී පොලී සහනාධාරය දීර්ඝ කළ කාල පරිච්ඡේදය සඳහා ලබා නොදෙන අතර, ණය ගැනුම්කරුවන් වර්ෂයකට උපරිමය සියයට 8.5 ක් වන පරිදි, මුළු පොලිය සහභාගීත්ව මූල්‍ය ආයතනයන් වෙත ගෙවිය යුතුය.

4.5 ණය කාල පරිච්ඡේදය නොසලකමින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පොලී සහනාධාරය ණය මුදලෙහි පළමු මාස 18 දක්වා පමණක් ලබා දෙනු ලැබේ.

4.6 ඉහත 4.3 හි සඳහන් සහන කාලය තුළ දී ණය ගැනුම්කරුවන්ට පොලී නොගෙවා සිටීමට තීරණය කළ හැකි අතර, පවතින සමුච්චිත පොලිය ඉතිරි ණය කාල පරිච්ඡේදය අතර සමානව බෙදී යා යුතුය. සහන කාලයෙන් අනතුරුව සමුච්චිත වන පොලිය (මුල් මාස 06) ණය ගැනුම්කරුවා විසින් සහභාගීත්ව මූල්‍ය ආයතනය වෙත පළමු ගෙවීම සිදු කරන අතරතුර, සම්පූර්ණයෙන් ගෙවිය යුතු වේ. සහන කාලය තුළ දී සමුච්චිත වන පොලිය මත කිසිදු පොලියක් අය නොකළ යුතුය.

5. සහභාගීත්ව මූල්‍ය ආයතනවල කාර්යභාරයන් සහ වගකීම්

5.1. ශාඛා කාර්යාල, ධීවර රාජ්‍ය අමාත්‍යාංශය, NAQDA සහ ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ ණය මෙහෙයුම් කටයුතු සමායෝජනය කිරීමට සහ අධීක්ෂණය කිරීමට සහභාගීත්ව මූල්‍ය ආයතනයේ ප්‍රධාන කාර්යාලය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කිරීම.

5.2. ශාඛා ජාලය පුරා, මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කාර්ය මණ්ඩලය වෙන් කළ බවට තහවුරු කිරීම.

5.3. ණය ලබා දීම සඳහා ප්‍රමාණවත් ශාඛා ගණනක් නම් කිරීම සහ මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම පිළිබඳ එවැනි ශාඛා කාර්ය මණ්ඩල දැනුවත් කිරීම.

5.4. ණය බෙදා හැරීම සහ ණය ආපසු අය කර ගැනීමේ පූර්ණ වගකීම භාර ගැනීම.

5.5. හුදෙක්ම ධීවර රාජ්‍ය අමාත්‍යාංශය සහ/හෝ NAQDA විසින් දෙනු ලබන නිර්දේශයන් මත පදනම්ව තෝරා ගැනීමට සහ ණය ලබා දීමට සහතික වීම.

5.6. මෙම යෝජනා ක්‍රමය යටතේ සහභාගීත්ව මූල්‍ය ආයතනවලින් එක් ගනුදෙනුකරුවෙකු ණය කිහිපයක් ලබා ගැනීම වැළැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම.

5.7. කිසිම අවස්ථාවක දී, ඉහත 4.1 (ii) වගන්තියෙහි සඳහන් අනුපාතිකයට වඩා ඉහළ අනුපාතිකයකට, මෙම යෝජනා ක්‍රමය යටතේ සුදුසුකම් ලබන ණය ගැනුම්කරුවන් සඳහා සහභාගීත්ව මූල්‍ය ආයතන මඟින් ණය ලබා නොදිය යුතු බවට සහතික වීම.

5.8. සෑම ව්‍යාපෘතියක් ම ආර්ථිකමය සහ මූල්‍යමය වශයෙන් සාධ්‍ය බවට තහවුරු කිරීම.

5.9. ණය මුදලක් සම්බන්ධව සියලු තොරතුරු ප්‍රකාශ කිරීමට පහසුකම් සැලසීම සඳහා මෙම යෝජනා ක්‍රමයට අදාළව වාර්තා සහ වෙනම දත්ත ගබඩාවක් පවත්වා ගෙන යෑම.

5.10. සංරචකය සඳහා විශේෂයෙන් සංලක්ෂිත අරමුදල්වල පූර්ණ අවශෝෂණය තහවුරු කිරීම සඳහා ණය බෙදා හැරීම සහ ප්‍රතිලාභීන්ගේ ධාරිතා වර්ධනයට අදාළව මෙම යෝජනා ක්‍රමයේ ඉලක්කයන් අත්පත් කර ගනු පිණිස, ධීවර රාජ්‍ය අමාත්‍යාංශය සහ/හෝ NAQDA සමඟ සම්පූර්ණ සහයෝගයෙන් කටයුතු කිරීම

5.11. අදාළ ප්‍රධාන කාර්යාල හරහා, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෙම යෝජනා ක්‍රමයට අදාළව, අදාළ ආකෘතිවලින් කලින් කලට ඉල්ලා සිටිනු ලබන දත්ත සහ තොරතුරු සැපයීම.

5.12. මෙම යෝජනා ක්‍රමය යටතේ ලබා දුන් ණය සම්බන්ධ පූර්ව සහ පශ්චාත් අධීක්ෂණයන් සිදුකිරීම.

5.13. සුදුසුකම්ලත් ණය ගැනුම්කරුවන් වෙත ණය මුදා හැරීමේදි සහ ණය ලබා දුන් අරමුණු සඳහාම පමණක් එම මුදල් භාවිත කෙරෙන බවට තහවුරු කිරීම සඳහා ගතයුතු නිවැරදි ක්‍රියාමාර්ග ගැනීමට නිසි සැලකිල්ලෙන් සහ විචක්ෂණශීලීව ක්‍රියා කිරීම.

5.14. ගිණුම් සහ මූල්‍ය ප්‍රකාශ පවත්වා ගෙන යෑම.

(අ) සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් අදාල වෙනත් කරුණු, ණය ඇඟයීම, අනුමැතියන්, මුදාහැරීම සහ ණය ආපසු අය කර ගැනීම දැක්වීමට නිසි වාර්තා සහ ලෙජර ගිණුම් පවත්වා ගෙන යා යුතු වේ.

(ආ) සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ණයවලින් ලත් මුදල් සහ පොලී සහනාධාර මෙහෙයුම් භාවිත කිරීම සඳහා වෙනම ගිණුම් පවත්වා ගෙන යා යුතු වේ.

(ඇ) සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ විමර්ශනය සහ සමාලෝචනය සඳහා ගිණුම් සහ මූල්‍ය ප්‍රකාශ සපයනු ලැබිය යුතුය. තවද, සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් සුදුසු සහ අවශ්‍ය පරිදි ගිණුම් සහ මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යොමු කළ යුතු වේ.

5.15 (අ) සෑම මසකම 15 හෝ ඊට පෙර ඇමුණුම I හි දක්වා ඇති අයුරින් පෙර මාසය සඳහා ණය මුදා හැරීම පිළිබඳ තොරතුරු මාසිකව ධීවර රාජ්‍ය අමාත්‍යාංශයට සහ ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියට ද පිටපත් සහිතව ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යොමු කළ යුතු වේ.

(ආ) ඇමුණුම III ට අනුව, පෙර මාසය සඳහා සෑම මසකම 15 වන දිනට හෝ ඊට පෙර, පූර්ව ණය පියවීම් සහ ණය වාරික අධි පියවීම් සම්බන්ධයෙන් ධීවර රාජ්‍ය අමාත්‍යාංශයට සහ ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියට ද පිටපත් සමඟ මහ බැංකුව වෙත මාසිකව වාර්තා කළ යුතු වේ.

(ඇ) ඇමුණුම IV හි දක්වා ඇති පරිදි මුදා හැර ඇති ණයවල අක්‍රිය ණය තත්ත්වය වසරකට දෙවරක් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යොමු කරන්න.

5.16 ඉහත සඳහන් ඇමුණුම I, III සහ IV හි සියලුම දෘඪ පිටපත් අධ්‍යක්ෂ, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව, අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01 යන ලිපිනයට ද, මෘදු පිටපත් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ වෙනත් බලයලත් නිළධාරියෙකු විසින් දන්වනු ලබන විද්‍යුත් ලිපිනයට ද යොමු කළ යුතු වේ.

5.17 පොලී සහනාධාර ලබා ගැනීම සඳහා මෙහෙයුම් උපදෙස්හී දක්වා ඇති ක්‍රියා පටිපාටිය අනුගමනය කරන්න.

6 ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යභාරය

6.1 අවශ්‍ය පරිදි සහ අවශ්‍ය විට දී, සහභාගීත්ව මූල්‍ය ආයතනය වෙත මෙහෙයුම් උපදෙස් සහ සංශෝධන නිකුත් කිරීම.

6.2 යෝජනා ක්‍රමය හා සබැඳි මෙහෙයුම් උපදෙස් හා අනුකූලව නිසි ලෙස සකස් කරන ලද පොලී සහනාධාර අයදුම්පත ලැබීමෙන් පසු අයදුම්පත් ලැබීමේ පිළිවෙලට ප්‍රමුඛත්වය දෙමින් යෝජනා ක්‍රමය යටතේ පොලී සහනාධාර මුදා හැරීම සහ සහභාගීත්ව මූල්‍ය ආයතනයේ ප්‍රධාන කාර්යාලය වෙත පොලී සහනාධාර මුදා හැරීම පිළිබඳ විස්තර දන්වා සිටීම.

6.3 නිසි ලෙස සකස් කරන ලද පොලී සහනාධාර අයදුම්පත ලැබීමෙන් දින 45ක් ඇතුළත ගණනය කර නිර්දේශ කළ පොලී සහනාධාර අර්ධ වාර්ෂිකව ලබා දීමට කටයුතු කිරීම.

6.4 අවශ්‍ය වූ විට දී, ධීවර රාජ්‍ය අමාත්‍යාංශය, ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය සහ සහභාගීත්ව මූල්‍ය ආයතනයන්ගේ සහභාගීත්වයෙන් ධීවර රාජ්‍ය අමාත්‍යාංශය සහ හෝ ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය මඟින් යොමු කරන ලද ප්‍රතිලාභීන්ට අදාළව සහභාගීත්ව මූල්‍ය ආයතනය විසින් අරමුදල් මුදා හැරීම පිළිබඳව ප්‍රගති සමාලෝචන කිරීම.

7 ධීවර රාජ්‍ය අමාත්‍යාංශයේ කාර්යභාරය

7.1 ශ්‍රී ලංකා මහ බැංකුව, සහභාගීත්ව මූල්‍ය ආයතන සහ ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය සමඟ සම්බන්ධීකරණ කටයුතු සඳහා ධීවර රාජ්‍ය අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිළධාරියෙකු පත් කිරීම.

7.2 ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය සහ සහභාගීත්ව මූල්‍ය ආයතන සමඟ එක්ව යෝජනා ක්‍රමයේ අධීක්ෂණ සහ විශ්ලේෂණ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම, අවශ්‍ය ප්‍රතිපත්තිමය පියවර ක්‍රියාත්මක කිරීම සහ ණය මුදා හැරීමෙන් පසු අධීක්ෂණ සහ විශ්ලේෂණ කිරීම.

7.3 පරිපාලන ගිවිසුමේ දක්වා ඇති නියම සහ කොන්දේසි හා අනුකූලව ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ මෙහෙයුම් කටයුතු සිදු වනවා දැයි තහවුරු කර ගැනීම උදෙසා ඔවුන්ගේ කටයුතු අධීක්ෂණය කිරීම.

7.4 ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිර්දේශ කරන ලද පොලී සහනාධාර හිමිකම් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව හරහා සහභාගීත්ව මූල්‍ය ආයතන සඳහා ගෙවීම් කිරීම.

7.5 ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය විසින් සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත ණය ප්‍රමාණ නිර්දේශ කිරීමේ ක්‍රියාවලියේ දී මූලික ණය ප්‍රක්ෂේපණ සහ පොලී සහන ගණනය කිරීම් අනුමත සීමාවන්හී පවත්වාගෙන යෑම තහවුරු කිරීම.

7.6 අවශ්‍ය වූ විට දී, අදාළ සහභාගීත්ව මූල්‍ය ආයතනයන්ගේ සහභාගීත්වයෙන් ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය විසින් අයදුම්පත් යොමු කරන ලද ණය ගනුදෙනුකරුවන්ට අදාළව සහභාගීත්ව මූල්‍ය ආයතනයන්ගේ අරමුදල් බෙදා හැරීම පිළිබඳව පවත්වන ප්‍රගති සමාලෝචන හා සම්බන්ධ වීම.

7.7 ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය සමඟ සහයෝගීත්වයෙන් යුතුව යෝජනා ක්‍රමයේ අරමුදල් ගලා යෑම පවත්වාගෙන යෑම සහ අධීක්ෂණය කිරීම.

8 ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ කාර්යභාරය

8.1 ශ්‍රී ලංකා මහ බැංකුව, සහභාගීත්ව මූල්‍ය ආයතන සහ ධීවර රාජ්‍ය අමාත්‍යංශය සමඟ සම්බන්ධීකරණ කටයුතු කිරීම සඳහා ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ ජ්‍යෙෂ්ඨ නිළධාරියෙකු පත් කිරීම.

8.2 යෝජනා ක්‍රමය යටතේ ණය ලබා ගැනීම සඳහා ණය ගැනුම්කරුවෙකු තෝරා ගැනීම.

8.3 ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය මඟින් ණය ලබා ගැනීම සඳහා තෝරා ගත් ණය ගනුදෙනුකරුවන් සඳහා තම කැමැත්ත මත පදනම්ව සහභාගීත්ව මූල්‍ය ආයතනයක් තෝරා ගැනීම සඳහා අවස්ථාව ලබා දීම.

8.4 ණය ගනුදෙනුකරුවන් ඔවුන්ගේ සුදුසුකම් තහවුරු කිරීමට අවශ්‍ය තොරතුරු ඇතුළත් වලංගු ලිපි ලේඛන සහිතව සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත යොමු කිරීම සහ යෝජනා ක්‍රමය යටතේ ණය ලබා දීමට සහභාගීත්ව මූල්‍ය ආයතනයන්ට දැනුම් දීම මෙන්ම යෝජනාවේ දක්වා ඇති මූලික ගණනය කිරීම් පවත්වාගන්නා අතරතුර ණය ප්‍රමාණය නිර්දේශ කිරීම.

8.5 යෝජනා ක්‍රමය යටතේ එකම ගනුදෙනුකරු සහභාගිත්ව මූල්‍ය ආයතන මඟින් ණය කිහිපයක් ලබා ගැනීම වළක්වාලීම සඳහා පියවර ගැනීමට කටයුතු කිරීම.

8.6 ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය විසින් සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත ණය ප්‍රමාණ නිර්දේශ කිරීමේ ක්‍රියාවලියේ දී මූලික ණය ප්‍රක්ෂේපණ සහ පොලී සහන ගණනය කිරීම් අනුමත සීමාවන්හී පවත්වාගෙන යෑම තහවුරු කිරීම.

8.7 සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත යොමු කරන ලද ණය ගැනුම්කරුවන්, ඔවුන් වෙත මුදා හරින ලද ණය සහ මුදා හරින ලද සෑම ණයක් සඳහාම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලබා දෙන ලද පොලී සහනාධාර පිළිබඳ වාර්තා පවත්වාගෙන යෑම.

8.8 ධීවර රාජ්‍ය අමාත්‍යංශය සමඟ සහයෝගීත්වයෙන් යෝජනා ක්‍රමයේ අරමුදල් ගලා යෑම පවත්වාගෙන යෑම සහ අධීක්ෂණය කිරීම.

9 පොලී සහන ගෙවීම්

9.1 මෙම උපදෙස් මෙහෙයුම්හී දක්වා ඇති නියමන් සහ කොන්දේසි අනුව සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් තම අරමුදල් වලින් ලබා දෙන ලද ණය සඳහා පොලී සහනාධාර මෙම මෙහෙයුම් උපදෙස් හි සඳහන් කර ඇති අනුපාතිකයට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලබා දෙනු ඇත.

9.2 ණය යෝජනා ක්‍රමය යටතේ පොලී සහනාධාර සඳහා සුදුසුකම් ලැබීමට සහභාගිත්ව මූල්‍ය ආයතන සියලුම අවස්ථාවලදී, ඉහත 4.1 වගන්තියේ සඳහන් ණය අනුපාතිකය යටතේ ණය ලබා දීම අත්‍යාවශ්‍ය කරුණක් වේ. මෙහි අවශ්‍යතාව සම්පූර්ණ නොකරන ණය සඳහා මෙම යෝජනා ක්‍රමය යටතේ පොලී සහනාධාර සඳහා සුදුසුකම් නොලබනු ඇත.

9.3 අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග පහත දැක්වේ.

(අ) ණය මුදල මුදා හැරීමෙන් පසු, පහත සඳහන් 9.3 (ඇ) වගන්තියෙහි සඳහන් අවසාන දිනයන් හා අනුගත වෙමින් ඇමුණුම II හි දක්වා ඇති පොලී සහනාධාර සඳහා වන අයදුම්පත නිසි ලෙස සම්පූර්ණ කර සහභාගීත්ව මූල්‍ය ආයතනයේ ප්‍රධාන කාර්යාලය හරහා අර්ධ වාර්ෂිකව ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යොමු කළ යුතු වේ. පොලී සහන අයදුම්පතේ මෘදු පිටපත් සහ දෘඪ පිටපත් යන ද්විත්වයම ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලබා දිය යුතු වේ.

(ආ) හීනවන ශේෂ ක්‍රමයට සහ සැබෑ / දින 365 පදනමක් භාවිත කරමින් මාසිකව සහන කාල සීමාව ද ඇතුළුව ණය මුදලේ පළමු මාස 18 සඳහා වාර්ෂිකව සියයට 4ක පොලී අනුපාතිකයක් යටතේ ණය මුදලේ නොපියවා ඇති ප්‍රාග්ධනය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පොලී සහනයක් ගෙවනු ඇත. නොපියවා ඇති ප්‍රාග්ධනය ගණනය කිරීමේ දී අර්ධ හෝ සම්පූර්ණ ලෙස සිදු කළ පූර්ව ණය පියවීම් සලකා බලනු ලැබේ.

(ඇ) ණය යෝජනා ක්‍රමය යටතේ පොලී සහනාධාර මුදා හැරීම සඳහා සලකා බැලීමට සෑම වසරක ම ජූලි සහ ජනවාරි මාසයන්හී 31වන දින හෝ ඊට පෙර සහභාගීත්ව මූල්‍ය ආයතනයේ ප්‍රධාන කාර්යාලය හරහා මෙහි දක්වා ඇති ඇමුණුම II නිසි ලෙස සම්පූර්ණ කර ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යොමු කළ යුතු වේ.

(ඈ) නියමිත කාල සීමාව තුළ දී සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත සියලුම හිමිකම් අයදුම්පත් යොමු කළ පසු , ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පොලී සහනාධාර අයදුම්පත නිර්දේශ කොට, ණය යෝජනා ක්‍රමය යටතේ සෑම සහභාගීත්ව මූල්‍ය ආයතනයක් සඳහා ම අයදුම් කරන ලද පොලී සහනාධාර ධීවර රාජ්‍ය අමාත්‍යංශයෙන් අර්ධ වාර්ෂිකව ඉල්ලා සිටිනු ලබන අතර, අදාළ මුදල ධීවර රාජ්‍ය අමාත්‍යංශයෙන් හිමි වූ පසු, හිමිකම් පියවනු ඇත.

9.4 ණය යෝජනා ක්‍රමය යටතේ පොලී සහනාධාර හිමිකම් අපේක්ෂිත අයදුම්පත් සියල්ලේ දෘඩ පිටපත් අධ්‍යක්ෂ, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව, අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01 යන ලිපිනයට ද, මෘදු පිටපත් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ වෙනත් බලයලත් නිළධාරියෙකු විසින් දන්වනු ලබන විද්‍යුත් ලිපිනයන්ට ද යොමු කළ යුතු වේ.

9.5 තවදුරටත් පැහැදිලි කිරීම් අවශ්‍ය වූ අවස්ථාවක දී, පොලී සහනාධාර අයදුම්පත සහභාගීත්ව මූල්‍ය ආයතනයන් වෙත යොමු කිරීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතු වේ.

10 සාමාන්‍ය කොන්දේසි

ශ්‍රී ලංකා මහ බැංකුව

10.1 ක්ෂේත්‍ර පරික්ෂා පැවැත්වීම, සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත ගොස් ලෙජර සහ පොත්පත් ආදිය පරික්ෂා කිරීම සහ අවශ්‍ය යැයි සැලකෙන වෙනත් අධීක්ෂණ සහ නියාමන ක්‍රියාමාර්ග ගැනීම,

10.2 සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ණය ලබා දීමේදී නිසි අධීක්ෂණය, සැලකිල්ල සහ විචක්ෂණභාවය සහතික කිරීම සඳහා ප්‍රමාණවත් පියවර ගැනීම සහ දැනුම්වත්ව අතපසු කිරීම හේතුකොට ගෙන ව්‍යාජ ණය, ණය ගැතියන් විසින් ණය අවභාවිත කිරීම සිදු වී ඇති බවට සාක්ෂි තිබේ නම් හිමිකම් පෑමක් මත ගෙවා ඇති මුදලක් ආපසු කැඳවීම හෝ ණය ප්‍රදානය කිරීමේ දී සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් වරදක් කර ඇති බවට සාක්ෂි ඇත්නම්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හිමිකම් පෑමක් පිළිගෙන ඇති අවස්ථාවක වගකීම ප්‍රතික්ෂේප කරනු ඇත.

10.3 ණය යෝජනා ක්‍රමයේ මෙහෙයුම් උපදෙස් හා අනුකූල වන අවස්ථාවකදී, යෝජනා ක්‍රමය යටතේ සහභාගීත්ව මූල්‍ය ආයතනයක් ලෙස කටයුතු කිරීමට ඕනෑම බැංකුවකට ඇති සුදුසුකම අවලංගු කිරීම සහ

අවශ්‍ය අවස්ථාවන් හිදි , ණය යෝජනා ක්‍රමයේ නියමයන් සහ කොන්දේසි වෙනස් කිරීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතු වේ.

ණය යෝජනා ක්‍රමය 2021 දෙසැම්බර් 21 දින සිට ක්‍රියාත්මක වේ.

මීට විශ්වාසී,
අත්සන් කළේ,
එම්. එස්. කේ. ධර්මවර්ධන
අධ්‍යක්ෂ/ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

පිටපත්; ලේකම්, තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය.

ඇමුණුම I

ශ්‍රී ලංකාවේ ඉස්සන් වගාව වැඩි දියුණු කිරීම සඳහා පොලී සහනාධාර ණය යෝජනා ක්‍රමය
නව ණය පිළිබඳ තොරතුරු - මාසික වාර්තාව

බැංකුව :

වාර්තාකරණ මාසය / වසර :

අනුක්‍රමික අංකය	NAQDA ලියාපදිංචි අංකය	ශීර්ෂය	අයදුම්කරුගේ වාසගම	අයදුම්කරුගේ මුලකුරු	ජා.හැ අංකය	ලිපිනය (පළමු තීරුව)	ලිපිනය (දෙවන තීරුව)	ලිපිනය (තෙවන තීරුව)	දිස්ත්‍රික්කය	බැංකු කේතය	ශාඛාවේ කේතය	ශාඛාවේ නම	අනුමත ණය ප්‍රමාණය (රු.)	ණය මුදල මුදාහැරිය දිනය (වසර /මාසය /දිනය)	ණය මුදලේ මුදාහැරිය ප්‍රමාණය (රු.)	සහන කාලය (මාස වලින්)	ආපසු ගෙවීමේ කාලය මාස වලින් (සහන කාලය ඇතුළුව)	වාරික ගණන	වාරිකයේ ප්‍රමාණය (රු.)	පළමු වාරිකයේ දිනය (වසර /මාසය /දිනය)	අවසාන වාරිකයේ දිනය (වසර /මාසය /දිනය)

ඉහත සඳහන් ණය තොරතුරු සත්‍ය සහ නිවැරදි බව සහ වසරකට සියයට.....පොලී අනුපාතිකයක් යටතේ බැංකුව තම අරමුදල් තුළින් මෙය ලබාදුන් බවත්, මෙහෙයුම් උපදෙස් අංක RDD/IS/SF/2021/01 යටතේ පොලී සහනය ලැබීමට බැංකුව සුදුසුකම් ලබන බවත් මෙයින් තහවුරු කරමි.

.....
බලයලත් නිළධාරියාගේ නම

.....
බලයලත් නිළධාරියාගේ අත්සන

.....
දිනය

.....
බැංකුවේ මුද්‍රාව

සටහන : සෑම පිටුවකම බලයලත් නිලධාරියාගේ අත්සන සහ මුද්‍රාව තැබිය යුතු වේ.

ඇමුණුම II

ශ්‍රී ලංකාවේ ඉස්සන් වගාව වැඩි දියුණු කිරීම සඳහා පොලී සහනාධාර ණය යෝජනා ක්‍රමය
පොලී සහනාධාර හිමිකම් අයදුම්පත

බැංකුව : වාර්තාකරණ මාසය / වසර :

අනුක්‍රමික අංකය	NAQDA ලියාපදිංචි අංකය	ණය ගනුදෙනුකරුගේ තොරතුරු					ණය සඳහා ප්‍රාග්ධන ආපසු ගෙවීමේ තොරතුරු (රු.)												කාල සීමාවට සමස්ත පොලී සහනාධාර හිමිකම (රු)
		ශීර්ෂය	අයදුම්කරුගේ වාසගම	අයදුම්කරුගේ මුලකුරු	ජා.හැ. අංකය	ශාඛාව	ණය මුදල මුදාහරින ලද දිනය (වසර/මාසය/දිනය)	ණය මුදලේ මුදා හරින ලද ප්‍රමාණය (රු.)	සහන කාලය (මාස වලින්)	කාල සීමාව ආරම්භක දිනට නොපියවූ ප්‍රමාණය (රු.)	නොපියවූ ප්‍රාග්ධන ප්‍රමාණය .... දිනට						මාසයේ අවසාන දිනට නොපියවූ ප්‍රමාණය (රු.)	
											පළමු මාසයට	දෙවන මාසයට	තෙවන මාසයට	හතරවන මාසයට	පස්වන මාසයට	හයවන මාසයට		
සමස්තය																		

ඉහත සඳහන් ණය තොරතුරු සත්‍ය සහ නිවැරදි බව සහ වසරකට සියයට.....පොලී අනුපාතිකයක් යටතේ බැංකුව තම අරමුදල් තුළින් මෙය ලබාදුන් බවත්, මෙහෙයුම් උපදෙස් අංක RDD/IS/SF/2021/01 යටතේ පොලී සහනය ලැබීමට බැංකුව සුදුසුකම් ලබන බවත් මෙයින් තහවුරු කරමි.

....

බලයලත් නිළධාරියාගේ නම බලයලත් නිළධාරියාගේ අත්සන

....

දිනය බැංකුවේ මුද්‍රාව

සටහන : සෑම පිටුවකම බලයලත් නිලධාරියාගේ අත්සන සහ මුද්‍රාව තැබිය යුතු වේ.

ඇමුණුම III

ශ්‍රී ලංකාවේ ඉස්සන් වගාව වැඩි දියුණු කිරීම සඳහා පොලී සහනාධාර ණය යෝජනා ක්‍රමය

පූර්ව ණය කල් පිරීම අධි පියවීම් ප්‍රකාශය

බැංකුව :

වාර්තාකරණ මාසය / වසර :

අනුක්‍රමික අංකය	NAQDA ලියාපදිංචි අංකය	ණය ගනුදෙනුකරුගේ තොරතුරු						ප්‍රාග්ධනය සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් පියවීම : උප ණය තොරතුරු								
		ශීර්ෂය	අයදුම්කරුගේ වාසගම	අයදුම්කරුගේ මුලකුරු	ජා.හැ අංකය	ලිපිනය	දිස්ත්‍රික්කය	ශාඛාව	මාසයේ ආරම්භක දිනට නොපියවූ ප්‍රමාණය (රු.)	පළමු පියවීම		දෙවන පියවීම		තෙවන පියවීම		මාසයේ අවසාන දිනට නොපියවූ ප්‍රමාණය (රු.)
										දිනය (වසර/මාසය/දිනය)	ගෙවූ මුදල (රු.)	දිනය (වසර/මාසය/දිනය)	ගෙවූ මුදල (රු.)	දිනය (වසර/මාසය/දිනය)	ගෙවූ මුදල (රු.)	

ඉහත සඳහන් උප ණය තොරතුරු සත්‍ය සහ නිවැරදි බව මෙයින් තහවුරු කරමි.

.....
බලයලත් නිළධාරියාගේ අත්සන

.....
බලයලත් නිළධාරියාගේ අත්සන

.....
දිනය

.....
බැංකුවේ මුද්‍රාව

ඇමුණුම IV

ශ්‍රී ලංකාවේ ඉස්සන් වගාව වැඩි දියුණු කිරීම සඳහා පොලී සහනාධාර ණය යෝජනා ක්‍රමය

අක්‍රීවය ණය තත්වය

බැංකුවේ නම් :

වාර්තාකරණ කාලපරිච්ඡේදය (අර්ධ වාර්ෂිකව)

දිස්ත්‍රික්කය	ශාඛාව	..... දිනට මුළු නොපියවූ ශේෂය		විශේෂ සඳහන් කිරීම්		උප ප්‍රමාණික		අඩමාණ		අලාභය		මුළු අක්‍රීය ණය (රු.)	අක්‍රීය ණය* (%)	අක්‍රීය ණය* (%)	අක්‍රීය ණය* (%)
		මුළු ණය ගණන	වියදම (රු.)	ණය ගණන	අගය (රු.)	මුළු ණය ගණන	ගණන (රු.)	ණය ගණන	අගය (රු.)	ණය ගණන	වියදම (රු.)				

* ධීවර පොලී සහනාධාර ණය යෝජනා ක්‍රමයේ අක්‍රීය ණය එම යෝජනා ක්‍රමය යටතේ ම මුළු ණයවල ප්‍රතිශතයක් ලෙස

** ධීවර පොලී සහනාධාර ණය යෝජනා ක්‍රමයේ අක්‍රීය ණය බැංකුවේ මුළු සහ බැංකු අත්තිකාරම්වල ප්‍රතිශතයක් ලෙස

* බැංකුවේ මුළු සහ බැංකු අත්තිකාරම්වල ප්‍රතිශතයක් ලෙස බැංකුවේ අක්‍රීය ණය

බැංකුවේ මුළු ණය සහ අත්තිකාරම් (රු.මිලි.) :.....

බැංකුවේ මුළු අක්‍රීය ණය (රු.මිලි.) :.....

බලයලත් නිලධාරියාගේ නම සහ තනතුර

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2221/55-2021 අප්‍රේල් මස 01 වැනි බ්‍රහස්පතින්දා දින

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

1 කොටස : (1) වැනි ඡේදය සාමාන්‍ය

ශ්‍රී ලංකා මහ බැංකුවේ නිවේදන

මුදල් නීති පනත

(422 අධිකාරිය වූ) මුදල් නීති පනතේ 32ඉ වගන්තිය යටතේ මුදල් මණ්ඩලය විසින් පනවන ලද රෙගුලාසි

මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
සභාපති
මුදල් මණ්ඩලය

2021 අප්‍රේල් 01 වැනි දින
කොළඹ දී ය.

ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය පිළිබඳ රෙගුලාසි 2010 අංක 1 දරන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය පිළිබඳ රෙගුලාසි සඳහා සංශෝධන

හැඳින්වීම

1. මෙම රෙගුලාසි 2021 අංක 1 දරන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය පිළිබඳ රෙගුලාසි ලෙස හැඳින්විය යුතු ය.

මූලික රෙගුලාසි සඳහා සංශෝධන

2. 2010 සැප්තැම්බර් මස 28 දිනැති අංක 1673/11 දරන **අති විශේෂ** ගැසට් පත්‍රය මඟින් ප්‍රසිද්ධ කරන ලද 2010 අංක 1 දරන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය පිළිබඳ රෙගුලාසි පහත දැක්වෙන පරිදි සංශෝධනය කෙරේ:-

(අ) එහි 9 වන රෙගුලාසිය, 9.4 ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් පහත පරිදි සංශෝධනය කෙරේ:-

"9.4 දක්වා ඇති සීමාවන්ට යටත්ව, අදාළ වන පරිදි බලපත්‍රය අත්හිටවූ හෝ අවලංගු කළ දින සිට කඩිනමින් වන්දි මුදල් ගෙවීමට කටයුතු කරනු ලබන අතර එම දිනයෙන් පසු කාලයට අදාළව කිසිදු පොලියක් ගෙවනු නොලැබේ"

(ආ) එහි 9 වන රෙගුලාසිය, 9.6 ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් පහත පරිදි සංශෝධනය කෙරේ:-

"9.6. තැන්පතුකරුවෙකුට ගෙවිය යුතු වන්දි මුදල ඉහත ලෙස ගණනය කරනු ලැබූ මුළු රක්ෂිත තැන්පතු ප්‍රමාණයට සීමා විය යුතු අතර එම මුදල් ප්‍රමාණය ශ්‍රී ලංකා මුදලින් රුපියල් ලක්ෂ එකොළහක (රු.1,100,000) මුදලක හෝ විදේශ මුදල් තැන්පතු සම්බන්ධයෙන් නම් සහ එය රුපියල් ලක්ෂ එකොළහ (රු.1,100,000) ඉක්මවන්නේ නම් ශ්‍රී ලංකා මුදලින් රුපියල් ලක්ෂ එකොළහක මුදල නොඉක්මවන උපරිමයකට යටත් විය යුතු ය."

(ඇ) එහි 9 වන රෙගුලාසිය, 9.10 ඡේදයට පසු පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් සංශෝධනය කෙරේ:-

"9.11. බලපත්‍රය අවලංගු කරනු ලැබූ සාමාජික ආයතනයක් සම්බන්ධයෙන් වන විට, එම සාමාජික ආයතනය ඈවර කිරීම සම්බන්ධයෙන් නිසි අධිකරණයක් මඟින් ඈවරකරුවෙකු පත් කිරීමට පෙර, නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයක් ඉදිරිපත් කරනු ලබන රක්ෂණාවරණ හිමි තැන්පතුකරුවන් පමණක් මෙම රෙගුලාසි යටතේ වන්දි මුදල් ලැබීම සඳහා සුදුසුකම් ලැබිය යුතු ය."

අනුගතවීමේ වගන්ති 3. මෙම රෙගුලාසියේ බලාත්මක දිනයට පෙර අදාළ වන පරිදි බලපත්‍රය අවලංගු කළ හෝ අත්හිටවනු ලැබූ සාමාජික ආයතනයක රක්ෂණාවරණ හිමි තැන්පතුකරුවන් රුපියල් ලක්ෂ එකොළහක (රුපියල් 1,100,000) හෝ විදේශ මුදල් සම්බන්ධයෙන් වන විට ශ්‍රී ලංකා මුදලින් රුපියල් ලක්ෂ එකොළහකට (රුපියල් 1,100,000) සමාන මුදල් ප්‍රමාණයක උපරිමයකට යටත්ව වන්දි මුදල් ලබා ගැනීමට සුදුසුකම් ලැබිය යුතු ය. කෙසේ වෙතත් එසේ වන්දි මුදල් ලබාගැනීම සඳහා අදාළ තැන්පතුකරුවන්;

(අ) අදාළ දිනය වන විට වන්දි මුදල් සඳහා අයදුම් නොකළ අය හෝ

(ආ) වන්දි මුදල් අයදුම් කර ඇති නමුත් අදාළ දිනය වන විට කිසිදු වන්දි මුදලක් ලබා නොමැති අය හෝ

(ඇ) වන්දි මුදලක් ලබා ඇති නමුත් අදාළ දිනය වන විට මුදලින් රුපියල් ලක්ෂ එකොළහකට (රුපියල් 1,100,000) අඩුවෙන් වන්දි මුදල් ලබා ඇති අය විය යුතු ය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2239/52 - 2021 අගෝස්තු මස 06 වැනි සිකුරාදා දින
(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

1 කොටස : (1) වැනි ඡේදය සාමාන්‍ය

ශ්‍රී ලංකා මහ බැංකුවේ නිවේදන

මුදල් නීති පනත

(422 අධිකාරිය වූ) මුදල් නීති පනතේ 32ඉ වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් පනවනු ලබන ලද රෙගුලාසි

මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
සභාපති
මුදල් මණ්ඩලය

2021 අගෝස්තු මස 6 වැනි දින
කොළඹ

2021 අංක 02 දරන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය පිළිබඳ රෙගුලාසි

1. **හැඳින්වීම** 1.1 මෙම රෙගුලාසි "2021 අංක 2 දරන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය පිළිබඳ රෙගුලාසි" ලෙස හැඳින්විය යුතු ය.

2. **යෝජනා ක්‍රමයේ අරමුණු සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳ බලතල** 2.1 1949 අංක 58 දරන මුදල් නීති පනතින් බලය දී ඇති කටයුතු ඉටු කිරීම තුළින්, (අ) ආර්ථික හා මිල ස්ථායිතාවත් (ආ) මූල්‍ය පද්ධති ස්ථායිතාවත් යන ද්විත්ව අරමුණු හැකි උපරිමයෙන් සුරක්ෂිත කිරීමේ වගකීම, එකී පනතේ 5 වැනි වගන්තිය මගින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පවරනු ලැබ ඇත.

2.2 මුදල් නීති පනතේ 32අ සිට 32ඉ දක්වා වන වගන්ති ප්‍රකාරව, මුදල් මණ්ඩලය විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි, බැංකු ආයතනවල ඇති තැන්පතු සඳහා වන රක්ෂණ යෝජනා ක්‍රමයක් ස්ථාපිත කිරීම, පවත්වා ගැනීම, කළමනාකරණය කිරීම සහ පාලනය කිරීම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කරනු ලැබිය හැකිය.

2.3 1988 අංක 30 දරන බැංකු පනතේ 46(1) සහ 76(ඒ) වගන්ති ප්‍රකාරව, බැංකු පද්ධතියේ යහපැවැත්ම තහවුරු කිරීම උදෙසා බලපත්‍රලාභී වාණිජ බැංකු වල සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු වල ඕනෑම ව්‍යාපාරික කටයුත්තක් සිදු කල යුතු ආකාරය සම්බන්ධයෙන් එකී බැංකු වෙත විධානයන් නිකුත් කිරීමේ බලය මුදල් මණ්ඩලය වෙත පවරනු ලැබ ඇත.

2.4 2011 අංක 42 දරන මූල්‍ය ව්‍යාපාර පනතේ 38, 39 සහ 41 වන වගන්ති ප්‍රකාරව බලපත්‍රලාභී මූල්‍ය සමාගම් වල ඇති තැන්පතු සඳහා වන රක්ෂණ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමද ඔවුන්ගේ තැන්පතු වගකීම් එම යෝජනා ක්‍රමය යටතේ හෝ මුදල් මණ්ඩලය විසින් බලය පවරන ලද සංස්ථාපිත ආයතනයක් යටතේ හෝ රක්ෂණය කරන ලෙස නියම කිරීමද මුදල් මණ්ඩලය විසින් සිදු කරනු ලැබිය හැකිය.

2.5 ඒ අනුව, රටේ සමස්ථ මූල්‍ය පද්ධතියේ ස්ථායිතාවය උදෙසා ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය (මෙහි මින්මතු "යෝජනා ක්‍රමය" වශයෙන් හඳුන්වනු ලබන) ස්ථාපිත වේ. මූල්‍ය ආයතන අසාර්ථක වීම් වන අවස්ථාවකදී අගතියට පත්වන සුළු පරිමාණ තැන්පතු හිමියන් ආරක්ෂා කිරීමත්, ඒ තුලින් මහජනතාවගේ විශ්වාසය රඳවා ගැනීම හරහා මූල්‍ය ස්ථායිතාව පවත්වා ගැනීමේ යාන්ත්‍රනයක් එමගින් නිර්මාණය කෙරෙනු ඇත.

3. යෝජනා ක්‍රමයේ නාමය සහ බලාත්මක වන දිනය

3.1 මෙම යෝජනා ක්‍රමය "ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය" යනුවෙන් හඳුන්වනු ලැබිය යුතුය.

3.2 යෝජනා ක්‍රමය, මෙම රෙගුලාසි යටතේ 2021 අගෝස්තු මස 06 වැනි දින සිට බලාත්මක විය යුතුය.

4. යෝජනා ක්‍රමය මගින් ආවරණය වන සාමාජික ආයතන

4.1 සෑම බලපත්‍රලාභී බැංකුවක්ම සහ සෑම බලපත්‍රලාභී මූල්‍ය සමාගමක්ම මෙම යෝජනා ක්‍රමයේ සාමාජිකත්වය ලැබිය යුතුය. (මෙම රෙගුලාසි වල මින් මතු "සාමාජික ආයතන" වශයෙන් හඳුන්වනු ලැබේ).

5. රක්ෂණය කරනු ලැබීම සඳහා සුදුසුකම් සහිත තැන්පතු

5.1 රක්ෂණය කෙරෙන සුදුසුකම් ඇති තැන්පතු යටතට, සාමාජික ආයතන වල ඉල්ලුම්, කාලීන සහ ඉතුරුම් තැන්පතු වගකීම් සහ සාමාජික ආයතන වල තැන්පතු සහතික පත්‍ර වගකීම්, 2012.01.01 ට පෙර ක්‍රියාත්මක කරනු ලැබූ ව්‍යාපාර ප්‍රතිව්‍යුහගත කිරීමේ සැලසුම යටතේ මුලින් තැන්පතුකරුවන් වී පසුව 2010 සහ 2011 යන වසරවල නිකුත් කරනු ලැබූ මුදල් මණ්ඩල නියෝග පදනම් කරගෙන තැන්පතු කොටස් බවට පරිවර්තනය කරනු ලැබූ කොටස්කරුවන්ට එම කොටස් වල වටිනාකම ද, ඇතුලත් කල යුතු අතර, පොරොන්දු පත්‍ර, දෙමුහුන් හිමිකම් (ණය සහ හිමිකම් ලක්ෂන ඇති) සහ මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන එම ආකාරයේ අනෙකුත් ණය උපකරණ ඇතුළුව සියළුම ණය උපකරණ රක්ෂණය කෙරෙන සුදුසුකම් ඇති තැන්පතු යටතට ඇතුලත් නොකළ යුතුය.

මෙම කාරණය සඳහා තැන්පතු කොටස් බවට පරිවර්තනය කරනු ලැබූ කොටස්කරුවන්ගේ කොටස් වල වටිනාකම ලෙස කොටස් බවට පරිවර්තනය කරන ලද එම මූලික තැන්පතුව හෝ තැන්පතු වල වටිනාකම ගත යුතුය.

5.2 පහත දැක්වෙන තැන්පතු වගකීම් යෝජනා ක්‍රමයට ඇතුලත් නොකල යුතුය.

(i) සාමාජික ආයතනවලට අයත් තැන්පතු වගකීම්;

(ii) අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන කළමණාකාරවරුන්ට සහ බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා වන යහපාලනය පිලිබඳ 2007 අංක 11 දරන බැංකු පනත් විධානයන්, බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා වන යහපාලනය පිලිබඳ 2007 අංක 12 දරන බැංකු පනත් විධානයන් සහ බලපත්‍රලාභී මූල්‍ය ව්‍යාපාර සඳහා වන 2008 අංක 3 දරන මූල්‍ය සමාගම් පනත් (යහපාලන) විධානයන් මඟින් නිශ්චය කර ඇති කොටස් හිමියන් නොවන වෙනත් සම්බන්ධිත පාර්ශවයන් විසින් තනි පුද්ගල හෝ බද්ධ ලෙස වෙනත් පාර්ශවයක් සමග පවත්වාගෙන යනු ලබන තැන්පතු වගකීම්;

(iii) අදාල සාමාජික ආයතන වල පෙර සිටි අධ්‍යක්ෂවරුන්ට හෝ ප්‍රධාන කළමණාකාරවරුන්ට අදාල තනි පුද්ගල හෝ බද්ධ ලෙස වෙනත් පාර්ශවයක් සමග පවත්වාගෙන යනු ලබන තැන්පතු වගකීම්;

(අ) යම් කිසි සාමාජික ආයතනයක කිසියම් අධ්‍යක්ෂවරයෙකු හෝ අධ්‍යක්ෂවරුන් තම සාමාජික ආයතනයේ ව්‍යාපාරික කටයුතු කරගෙන යාමේදී හෝ කළමණාකරණය කිරීමේදී තැන්පතුකරුවන්ගේ හා අනෙකුත් ණය හිමියන්ගේ බැඳියාවන් වලට අනර්තකාරීවන, යහපැවත්මට අනුකූල නොවන කිසියම් නුසුදුසු, අනිසි, වංක, කූට හෝ වංචනික යම් මූල්‍ය පුරුද්දක් හෝ පුරුදු පවත්වා ගෙන යාම නිසා එකී අධ්‍යක්ෂවරයා හෝ අධ්‍යක්ෂවරුන් හෝ ප්‍රධාන කළමණාකරණ නිළධාරීන් අධ්‍යක්ෂ මණ්ඩලයෙන් සහ/හෝ ප්‍රධාන කළමණාකරණ ධුරය ආදී දරණ ලද තනතුරකින් හෝ තනතුරු වලින් ඉවත් කිරීම සඳහා මුදල් මණ්ඩලය විසින් නියෝගයන් නිකුත්කර ඇති විට;

(ආ) බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ/ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් සාමාජික ආයතනයක අධ්‍යක්ෂ හෝ අධ්‍යක්ෂවරුන් සහ/හෝ ඕනෑම ප්‍රධාන කළමනාකරණ නිලධාරීවරයෙකු හෝ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සහ/හෝ සාමාජික ආයතනයේ තනතුරු දැරීමට සුදුසු නොවන බව තීරණය කර ඇති අවස්ථාවක, යම් කිසි වංචාවකට, වංචනික ක්‍රියාවකට, අවභාවිතයකට හෝ ඒ හා සමාන සාපරාධී යම් ක්‍රියාවකට සම්බන්ධ වූ හෝ ඒවැනි ක්‍රියාවක් සඳහා පොලීසිය විසින් සිදුකරනු ලබන පරීක්ෂණයකට භාජනය වන හෝ ශ්‍රී ලංකාවේදී හෝ වෙනත් ඕනෑම අධිකරණ බල ප්‍රදේශයකදී ඕනෑම නියාමන හෝ අධීක්ෂණ අධිකාරියක්, වෘත්තීය සංගමයක්, විමර්ෂණ කොමිෂන් සභාවක්, විනිශ්චය සභාවක් හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් ආයතනයක් විසින් සිදුකරනු ලබන පරීක්ෂණයකට භාජනය වන හෝ කිසියම් වංචාවකට, වංචනික ක්‍රියාවකට, අවභාවිතයකට සම්බන්ධ ඕනෑම ක්‍රියාවකට වැරදිකරු වූ හෝ ඕනෑම අධිකරණයක්, නියාමන හෝ අධීක්ෂණ අධිකාරියක්, වෘත්තීය සංගමයක්, විමර්ශන කොමිෂන් සභාවක්, විනිශ්චය සභාවක් හෝ වෙනත් ආයතනයක් විසින් පිහිටුවන ලද වංචා, නුසුදුසු හැසිරීම් හෝ කිසියම් නීතියක් හෝ රීති, රෙගුලාසි, උපදෙස් හෝ ඒ අනුව කරන ලද නිර්ණායකයන්ට අනුකූල නොවී වැරදිකරුවෙකු වූ අවස්ථාවකදී;

(ඇ) යම් කිසි සාමාජික ආයතනයක කිසියම් අධ්‍යක්ෂවරයෙකු හෝ අධ්‍යක්ෂවරුන් හෝ කිසියම් ප්‍රධාන කළමනාකරණ නිලධාරීවරයෙකු හෝ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් තම සාමාජික ආයතනයේ ව්‍යාපාරික කටයුතු කරගෙන යාමේදී හෝ කළමණාකරණය කිරීමේදී, තැන්පතු කරුවන්ගේ හා අනෙකුත් ණය හිමියන්ගේ බැඳියාවන් වලට අනර්තකාරීවන, යහපැවත්මට අනුකූල නොවන කිසියම් නුසුදුසු, අනිසි, වංක, කූට හෝ වංචනික යම් මූල්‍ය පුරුද්දක් හෝ පුරුදු පවත්වා ගෙන යාම නිසා එකී අධ්‍යක්ෂවරයා හෝ අධ්‍යක්ෂවරුන් හෝ ප්‍රධාන කළමණාකරණ නිළධාරීන්ට, යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ අහිමි වෙන බව මුදල් මණ්ඩලය විසින් සිය මෙහෙයවීමෙන්, පවතින කරුණු මත තීරණය කර ඇති විට;

(iv) බැංකු පනත ප්‍රකාරව අත්හැර දැමූ දේපළ යටතට අයත් වන තැන්පතු වල මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද අදාළ නියෝගයන්ට අනුව ශ්‍රී ලංකා මහ බැංකුවට මාරු කරනු ලැබ ඇත්තාවූ අගයන්.

(v) මූල්‍ය ව්‍යාපාර පනත ප්‍රකාරව අක්‍රීය ගිණුම් යටතට ගැනෙන්නාවූ, මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද අදාළ නියෝගයන්ට අනුව ශ්‍රී ලංකා මහ බැංකුව වෙත මාරුකරනු ලැබ ඇත්තාවූ අගයන්.

5.3 විදේශ මුදල් තැන්පතු වගකීම් සම්බන්ධයෙන් වනවිට, ශ්‍රී ලංකා මහ බැංකුවේ ජාත්‍යන්තර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන දෛනික නිරූපිත විනිමය අනුපාතයන්, විදේශ මුදල් වගකීම් දේශීය මුදල් බවට පරිවර්තනය කිරීම සඳහා යොදා ගත යුතුය.

5.4 සාමාජික ආයතන විසින් සුදුසුකම් සහිත සියලුම තැන්පතු රක්ෂණය කල යුතුය.

6. රක්ෂණය කෙරෙන තැන්පතු මත ගෙවිය යුතු වාරික මුදල්

6.1 ඉහත 5.2 හි දක්වා ඇති තැන්පතු වගකීම් හැර, මුදල් මණ්ඩලය විසින් කළින් කලට තීරණය කරනු ලැබිය හැකි පරිදි, කාර්තුවක/ මාසයක අවසානයේදී පවත්නා සුදුසුකම් සහිත මුළු තැන්පතු ප්‍රමාණය උපචිත පොලියත් ඇතුළුව ගණනය කරනු ලබන වාරික මුදලක් සෑම සාමාජික ආයතනයක් විසින්ම මෙහි 7 වැනි රෙගුලාසියේ සඳහන් කරනු ලබන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක අරමුදල වෙත ගෙවනු ලැබිය යුතුය.

6.2 නැවත දැනුම් දෙන තෙක් වාරික මුදල ගණනය කිරීමේ කාර්යය පහත සඳහන් පරිදි සිදු කළ යුතු ය:

(i) බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ විසින් පිළිගනු ලබන විගණනයට ලක් කළ ගිණුම් අනුව ආසන්නතම පූර්ව මුදල් වර්ෂය අවසානයේ දී සියයට 14 ක් හෝ ඊට වැඩි ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතයක් පවත්වා ගනු ලැබූ බලපත්‍රලාභී බැංකු විසින් කාර්තුවක් අවසානයේ දී පවතින සුදුසුකම් සහිත මුළු තැන්පතු ප්‍රමාණය මත වර්ෂයකට සියයට 0.10 ක අනුපාතයක් අනුව කාර්තුමය වශයෙන් ගණනය කරනු ලබන වාරික මුදලක් ගෙවිය යුතුය.

(ii) අනෙකුත් සියලු ම බලපත්‍රලාභී බැංකු විසින් කාර්තුවක් අවසානයේ දී පවතින සුදුසුකම් සහිත මුළු තැන්පතු ප්‍රමාණය මත වර්ෂයකට සියයට 0.125 ක අනුපාතයක් අනුව කාර්තුමය වශයෙන් ගණනය කරනු ලබන වාරික මුදලක් ගෙවිය යුතු ය.

(iii) බලපත්‍රලාභී මූල්‍ය සමාගම් විසින් මාසයක් අවසානයේ දී පවතින සුදුසුකම් සහිත මුළු තැන්පතු ප්‍රමාණය මත වර්ෂයකට සියයට 0.15 ක අනුපාතයක් අනුව මාසිකව ගණනය කරනු ලබන වාරික මුදලක් ගෙවිය යුතු ය.

6.3 සෑම සාමාජික ආයතනයක් විසින්ම අදාළ කාර්තුව/ මාසය අවසානයේ සිට දින දර්ශන දින පහළොවක (15) කාලයක් ඇතුළත තමන්ට නියමිත රක්ෂණ වාරික මුදල ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක අරමුදල් ගිණුම වෙත ප්‍රේෂණය කල යුතු අතර, තැන්පතු සහ රක්ෂණ වාරික මුදල් ගණනය කිරීම පිළිබඳ තොරතුරු රෙගුලාසි අංක 10.1 හි දක්වා ඇති පරිදි යෝජනා ක්‍රමයේ මෙහෙයුම් සහ පරිපාලන කටයුතු සම්බන්ධව වගකීම දරන්නාවූ ශ්‍රී ලංකා මහ බැංකුවේ අදාළ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් නියම කරනු ලබන ආකෘතියට අනුව දැනුම් දිය යුතුය.

6.4 නියමිත මුදලට අඩුවෙන් කරනු ලබන ගෙවීම් ද ඇතුළුව වාරික මුදල් ගෙවීම ප්‍රමාද වන අවස්ථාවකදී, පවත්නා දින අනූ එක (91) ප්‍රාථමික භාණ්ඩාගාර බිල්පත්වල බරිත සාමාන්‍ය ඉපැයීම් අනුපාතයට පදනම් අංක දෙසිය (200) ක් එකතු කොට ගණනය කෙරෙන අනුපාතයකට හෝ මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන අනුපාතයකට අනුව ගණනය කෙරෙන දඩයක් පැනවෙනු ඇත.

7. ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක අරමුදල

7.1 යෝජනා ක්‍රමය සඳහා "ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක අරමුදල" (මෙහි මින්මතු "අරමුදල" වශයෙන් හඳුන්වනු ලබන) නමින් හැඳින්වෙන අරමුදලක් පවත්වා ගත යුතු අතර, එය පවත්වාගෙන යාම හා කළමනාකරණය කිරීම, මුදල් මණ්ඩලය විසින් සිදු කළ යුතුය. එසේ වුවද, අවශ්‍ය වන පරිදි ශ්‍රී ලංකා මහ බැංකුවේ දෙපාර්තමේන්තුවක් වෙත හෝ නිලධාරියෙකු වෙත එකී වගකීම පැවරීමේ හැකියාව මුදල් මණ්ඩලය සතු වන අතර වර්තමාන මෙහෙයුම් සහ කළමණාකරණ විධිවිධාන පහත දැක්වෙන රෙගුලාසි අංක 10.1 යටතේ සඳහන් කර ඇත.

7.2 ඇතිවිය හැකි ස්වාභාවික හෝ වෙනත් බැදියාවන් අතර සට්ටනයන් වලක්වා ගැනීම සඳහා හෝ නැතිකර ගැනීම සඳහා, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක අරමුදලේ පරිපාලන හා කලමණාකරණ විධිවිධාන, සාමාජික ආයතන වල අධීක්ෂණ දෙපාර්තමේන්තු වලින් වෙන්විය යුතු හා ස්වාධීන විය යුතුය.

7.3 අරමුදලට කෙරෙන බැර කිරීම් යටතට සාමාජික ආයතන විසින් ගෙවනු ලබන වාරික මුදල් සහ දඩ මුදල්, සියළුම ලාභ ඉපැයීම්, අරමුදලේ මුදල් ආයෝජනය කිරීම මගින් ලැබෙන ආදායම්, කිසියම් සාමාජික ආයතනයකට ලබා දී ඇති සුරක්ෂිත අත්තිකාරම් හෝ ණය අයකර ගැනීම්, තැන්පතුකරුවන්ට ගෙවන ලද වන්දි අයකර ගැනීම්, බැංකු පනතේ IX කොට සේ 72 සිට 76 දක්වා වන වගන්තිය යටතේ සහ මූල්‍ය ව්‍යාපාර පනතේ අදාළ වන 23 වන වගන්ති යටතේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබූ විධානයන් ප්‍රකාරව බලපත්‍රලාභී බැංකු සහ බලපත්‍රලාභී මූල්‍ය සමාගම් මගින් පිළිවෙලින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යවනු ලැබ ඇති අත්හැර දැමූ දේපළ සහ අක්‍රීය ගිණුම්වලින් මෙහි ලා අදාළ වන්නා වූ යම් මුදල් ප්‍රමාණයන් මෙන්ම මුදල් මණ්ඩලය මගින් අනුමත කරනු ලැබූ රජයෙන් සහ/හෝ වෙන යම් මූලාශ්‍රයන්ගෙන් ලැබෙන ණය සහ දායක මුදල්ද ඇතුලත් විය යුතුය.

7.4 අරමුදලට කෙරෙන හර කිරීම් යටතට තැන්පතුකරුවන් වෙත ගෙවනු ලබන වන්දි මුදල්, අරමුදලට ඇතුලත් කර ඇති යම් අත්හැර දැමූ දේපළක් හෝ අක්‍රීය ගිණුමකින් කෙරෙන ආපසු ගෙවීම් සහ මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි අරමුදල පවත්වාගෙන යාමේ වියදම් ද ඇතුලත් විය යුතුය.

8. අරමුදලට අයත් මුදල් භාවිතා කිරීම

8.1 අරමුදලට කෙරෙන හර කිරීම් වලට අමතරව අරමුදලෙහි වන මුදල් පහත දක්වා ඇති ආකාරයට භාවිතා කරනු ලැබිය හැකිය:-

(i) රජයේ සුරැකුම්පත් වල ආයෝජනය කිරීම - රජයේ සුරැකුම් යටතට ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන ලද භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර සහ වෙනත් සියලුම අලෙවි කල හැකි සුරැකුම් ඇතුලත් වනු ලැබිය හැකිය. සැක දුරු කර ගැනීම සහ මෙම රෙගුලාසියේ අරමුණු සඳහා, ප්‍රතිවිකුණුම් ගිවිසුම් මගින් කරනු ලබන ආයෝජනද මෙයට ඇතුලත් වනු ඇත.

(ii) යම් සාමාජික ආයතනයක් බරපතල ද්‍රවශීලතා අර්බුදයකට මුහුණ පා ඇති අවස්ථාවක එකී ආයතනයට ලබා දෙන සුරැකුම් අත්තිකාරම් හෝ ණය - (බලපත්‍රලාභී බැංකුවක් නම් බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ විසින් සහ බලපත්‍රලාභී මූල්‍ය සමාගමක් නම් බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් අදාළ ආයතනයේ ද්‍රවශීලතා තත්ත්වය පිළිබඳව ඉදිරිපත් කෙරෙනු ලබන තක්සේරු වාර්තාවක් සළකා බැලීමෙන් පසු) මුදල් මණ්ඩලයේ මතය අනුව එකී අත්තිකාරම/ණය එම අදාළ ආයතනයට හෝ ආයතනය සම්බන්ධයෙන් හෝ සමස්තයක් ලෙස මූල්‍ය පද්ධතිය පිළිබඳවම ඇති විය හැකි මූල්‍ය භීතියක් වළක්වා ගැනීම හෝ මගහරවා ගැනීම සඳහා සැලකිය යුතු ලෙස උපකාර වේය යන්න සහ එම ඉහත කී අවස්ථාවන් සම්පූර්ණයෙන්ම සහතික කල යුතුය.

8.2 සාමාජික ආයතන වෙත ඉහත රෙගුලාසි අංක 8.1 (ii) හි සඳහන් පරිදි අත්තිකාරම් හෝ ණය සැපයීමේ දී, අරමුදලේ ශක්‍යතාව සහ එවැනි තීරණයකින් අරමුදලට වන ආවස්ථික පිරිවැය සැලකිල්ලට ගනිමින් පවත්නා වෙළඳපොළ පොළී අනුපාත යටතේ හෝ මුදල් මණ්ඩලය විසින් ඒකමතිකව තීරණය කරනු ලබන වෙනත් අනුපාතයකට, සාමාජික ආයතන විසින් රජයේ සුරැකුම්පත් ඇපකරයන් වශයෙන් තැබීමෙන් එම අත්තිකාරම් හෝ ණය සැපයුම කල හැකි වේ.

8.3 එවැනි ණය හෝ අත්තිකාරම් ආපසු ගෙවීමේ කාල සීමාව මුදල් මණ්ඩලය මගින් තීරණය කරනු ලැබිය යුතුය.

8.4 එවැනි ණය හෝ අත්තිකාරම් ලබාදීම සම්බන්ධයෙන් මුදල් මණ්ඩලය විසින් මෙම රෙගුලාසි වලට අතිරේකව මෙහෙයුම් මාර්ගෝපදේශ නිකුත් කළ හැකිය.

9. රක්ෂණය කරන ලද තැන්පතු සඳහා හානිපූර්ණය කිරීම

9.1 රක්ෂණය කරන ලද තැන්පතු මත තැන්පතුකරුවන්ට හානිපූර්ණයන් ගෙවීම, මුදල් මණ්ඩලය විසින් කලින් කලට නිකුත් කරනු ලබන රෙගුලාසි අනුව හෝ මෙහි මින් මතු දක්වා ඇති පරිදි සිදු කරනු ලැබේ.

9.2 සාමාජික ආයතන විසින් සෑම තැන්පතුකරුවෙකුගේම සියළුම වාර්තා එක් එක් තැන්පත්කරුට අනන්‍යවූ හැඳුනුම් අංකයක් සහිතව පවත්වාගෙන යා යුතු අතර රෙගුලාසි අංක 10.1 හි දක්වා ඇති පරිදි මෙම යෝජනා ක්‍රමයේ මෙහෙයුම් හා පරිපාලන විධි විධානයන් සම්බන්ධයෙන් වගකිව යුතු ශ්‍රී ලංකා මහ බැංකුවේ දෙපාර්තමේන්තුවට, බලපත්‍රලාභී බැංකු කාර්තුමය වශයෙන් සහ බලපත්‍රලාභී මූල්‍ය සමාගම් විසින් මාසිකව, ඉදිරිපත් කල යුතුය. මෙම ඉදිරිපත් කිරීම ශ්‍රී ලංකා මහ බැංකුවේ ඉහත කී දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් කලින්කලට නියමකරනු ලබන ආකෘතියකට අනුව සිදුවිය යුතුය.

නේවාසික පුද්ගලයින් සම්බන්ධයෙන් වන විට අනන්‍යවූ හැඳුනුම් අංකය, ජාතික හැඳුනම්පත් අංකය විය යුතුය. සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති සමාගම්, සමාගම් ලියාපදිංචි අංකය අනන්‍යවූ හැඳුනුම්පත් අංකය ලෙස සැලකිය යුතු අතර අනෙක් සියළුම පුද්ගල නොවන තැන්පත්කරුවන්ගේ අනන්‍ය වූ හැඳුනුම් අංකය ලෙස අදාල සහ පිළිගත් අනුමත කිරීමේ අධිකාරීන් මගින් නිකුත්කරන ලද ලියාපදිංචි අංක භාවිතා කල යුතුය.

9.3 මුදල් මණ්ඩලය විසින් බැංකු ව්‍යාපාරයක් හෝ මූල්‍ය ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා යම් සාමාජික ආයතනයක් වෙත ලබා දී ඇති බලපත්‍රය අවලංගු කල පසු එකී සාමාජික ආයතනය යෝජනා ක්‍රමයේ සාමාජිකයෙකු වීම අත්හිටු විය යුතුය.

9.4 යම් සාමාජික ආයතනයක ඇති සුදුසුකම් සහිත තැන්පතු වගකීම් මත හානිපූර්ණ ගෙවීමක් සිදු කරනු ලබනුයේ එම සාමාජික ආයතනයේ බලපත්‍රය අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන අනුව මුදල් මණ්ඩලය විසින් අවලංගු කරනු ලැබූ විටෙකදී පමණි.

9.5 මුදල් මණ්ඩලය විසින් යම් සාමාජික ආයතනයක බලපත්‍රය අවලංගු කල තීරණය නිවේදනය කල දිනයේ සිට දින දර්ශන දින දහහතරක් (14) ඇතුළත, සාමාජික ආයතනය බලපත්‍රලාභී බැංකුවක් නම් බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ සහ බලපත්‍රලාභී මූල්‍ය සමාගමක් නම් බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් සහතික කරන ලද එකී සාමාජික ආයතනයේ මුදල් මණ්ඩලය විසින් බලපත්‍රය අවලංගු කරන ලද නියෝගයේ දිනට තැන්පතුකරුවන්ගේ ලැයිස්තුව රෙගුලාසි අංක 10.1 හි දක්වා ඇති පරිදි යෝජනා ක්‍රමයේ මෙහෙයුම් හා පරිපාලන විධිවිධාන සම්බන්ධයෙන් වගකිවයුතු ශ්‍රී ලංකා මහ බැංකුවේ අදාල දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් නියම කරනු ලබන ආකෘතිය අනුව වන්දි ගෙවීමේ අරමුණු සඳහා ඉදිරිපත් කල යුතුය.

තැන්පතුකරුවන්ගේ ලැයිස්තුව සහතික කිරීම සඳහා, බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයාට සහ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාට අවශ්‍ය නම් බාහිර විගණකවරයෙකුගේ සේවය ලබාගත හැක.

9.6 සාමාජික ආයතනයක රක්ෂණය කරන ලද තැන්පතු වගකීම් සඳහා වන්දි ගෙවීම බලපත්‍රය අවලංගු කල දින සිට දින දර්ශන දින හැටක් (60) ඇතුලත ආරම්භ කළ යුතු අතර බලපත්‍රය අවලංගු කල දින සිට වසර දෙකකට (02) නොඅඩු කාලයකදී ඉදිරිපත් කරන ලද රක්ෂණය කරන ලද තැන්පතුකරවන්ගේ හිමිකම් සඳහා වන්දි ගෙවීම සිදු කළ යුතුය.

මෙම රෙගුලාසි වල බලාත්මක දිනට පෙර බලපත්‍ර අවලංගු කර හෝ අත්හිටුවා ඇති සාමාජික ආයතනවල රක්ෂණය කරන ලද තැන්පතුකරුවන් විසින් අදාල ආයතනයේ බලපත්‍රය අවලංගු කල හෝ අත්හිටවූ දින සිට වසර හතරකට (04) නොඅඩු කාලයක් තුලදී හිමිකම් ඉදිරිපත් කල යුතුය.

9.7 බලපත්‍රය අවලංගු කරනු ලැබූ සාමාජික ආයතනයක් සම්බන්ධයෙන් වන විට, එහි රක්ෂණය කරන ලද තැන්පතුකරුවන්ට මෙම රෙගුලාසි යටතේ වන්දි ගෙවීම් සඳහා අයිතිය හිමිවන්නේ එම රක්ෂණය කරන ලද තැන්පතුකරුවන් සුදුසුකම් ලත් වන්දි මුදල සඳහා නිසි පරිදි සම්පූර්ණ කරන ලද හිමිකම් පෑමක් ඉදිරිපත් කල විට පමණි. මෙම හිමිකම්පෑම ඉදිරිපත් කල යුතු වන්නේ එම සාමාජික ආයතනය ඈවර කිරීම සම්බන්ධයෙන් නිසි අධිකරණයක් මඟින් ඈවරකරුවෙකු පත් කිරීමට පෙර හෝ ඉහත රෙගුලාසි අංක 9.6 හි දක්වා ඇති පරිදි හිමිකම් ඉදිරිපත් කිරීම සඳහා කාල සීමාවන් ඉකුත් වීමට පෙර හෝ යන අවස්ථා දෙකෙන් ප්‍රථමයෙන් උදාවන අවස්ථාවට පෙරය.

9.8 යම් සාමාජික ආයතනයක බලපත්‍රය අවලංගු කල දිනය වනවිට උපයන ලද පොලිය ද ඇතුළුව සෑම තැන්පතුකරුවෙකුම වෙත ගෙවිය යුතු ගණනය කරන ලද ඒකාබද්ධ තැන්පතු වගකීම් සැලකීමෙන් "එක් තැන්පතුකරුවෙකු සඳහා" යන පදනම මත ගෙවිය යුතු හානි පූර්ණ මුදල් තීරණය කෙරේ. හානි පූර්ණ මුදල් ගණනය කිරීමේදී, බලපත්‍රය අවලංගු කල දිනට පසු කාලය සඳහා පොළී ගෙවීමක් සිදු කරනු නොලැබේ.

9.9 එක් තැන්පතුකරුවෙකුට ගෙවිය යුතු වන්දි මුදල ඉහත ලෙස ගණනය කරනු ලැබූ මුළු රක්ෂණය කරන ලද තැන්පතු ප්‍රමාණයට සීමා විය යුතු අතර එම මුදල් ප්‍රමාණය ශ්‍රී ලංකා මුදලින් රුපියල් ලක්ෂ එකොළහක (රුපියල් 1,100,000) මුදලක් හෝ විදේශ මුදල් තැන්පතු සම්බන්ධයෙන් නම් එය රුපියල් ලක්ෂ එකොළහකට (රුපියල් 1,100,000) සමාන මුදල් ප්‍රමාණයක උපරිමයකට යටත් විය යුතුය.

9.10 මෙම රෙගුලාසි යටතේ, අදාල වන පරිදි, 2021.04.01 දිනට පෙර බලපත්‍රය අවලංගු කල හෝ අත්හිටවුනු ලැබූ සාමාජික ආයතනයක රක්ෂණාවරණ හිමි තැන්පතුකරුවන් රුපියල් ලක්ෂ එකොළහක (රුපියල් 1,100,000) හෝ විදේශ මුදල් සම්බන්ධයෙන් වනවිට ශ්‍රී ලංකා මුදලින් රුපියල් ලක්ෂ එකොළහකට (රුපියල් 1,100,000) සමාන මුදල් ප්‍රමාණයක උපරිමයකට යටත්ව වන්දි මුදල් ලබාගැනීමට සුදුසුකම් ලැබිය යුතුය. කෙසේ වෙතත් එසේ වන්දි මුදල් ලබාගැනීම සඳහා රක්ෂණය කරන ලද තැන්පතුකරුවන්;

(අ) 2021.04.01 වැනි දිනය වනවිට වන්දි මුදල් සඳහා අයදුම් නොකල අය හෝ

(ආ) වන්දි මුදල් සඳහා 2021.04.01 දින වන විට අයදුම් කර ඇති නමුත් මෙම රෙගුලාසි බලාත්මක වන දින වන විටත් කිසිදු වන්දි මුදලක් ලබා නොමැති අය හෝ

(ඇ) වන්දි මුදලක් ලබා ඇති නමුත් 2021.04.01 වන විට රුපියල් ලක්ෂ එකොළහකට (රුපියල් 1,100,000) අඩුවෙන් වන්දි මුදල් ලබා ඇති අය විය යුතුය.

9.11 තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක අරමුදලෙන් යම් සාමාජික ආයතනයක තැන්පතුකරුවන් වෙත කරනු ලබන ඕනෑම හානිපූර්ණ මුදල් ගෙවීමක් අදාළ තැන්පතුකරුවන් වෙත එකී සාමාජික ආයතන විසින් ගෙවිය යුතු වූ තැන්පතු වගකීම්වලින් අඩු කර එම ප්‍රමාණය අදාළ සාමාජික ආයතනය විසින් තැන්පතු රක්ෂණ අරමුදල වෙත ගෙවිය යුතු වගකීමක් ආකාරයෙන් එම සාමාජික ආයතනයේ පොත්වල ගිණුම්ගත කළ යුතු ය.

9.12 හානිපූර්ණ මුදල් ගෙවනු ලබන අවස්ථාවේදී යම් තැන්පතුකරුවෙකුට තමාට හිමිකම් ලබන හානිපූර්ණ මුදල භාර ගැනීමට හැකියාවක් නොමැති විට හෝ හානිපූර්ණ මුදල ලබා ගෙන නොමැති විටෙක, අදාළ වන නීතිමය විධිවිධාන සහ පටිපාටීන් අනුව, එම තැන්පතුකරුගේ නීත්‍යනුකූල අනුප්‍රාප්තිකයන් වෙත එම හානිපූර්ණ මුදල ගෙවනු ලැබිය යුතු ය.

9.13 බලපත්‍රය අවලංගු කර ඇති යම් සාමාජික ආයතනයක තැන්පතුකරුවන්ට වන්දි ගෙවීම් කඩිනම් කිරීම අවශ්‍ය යැයි හැඟෙන අවස්ථාවක, මුදල් මණ්ඩලයට ඒ සඳහා බලපත්‍රලාභී බැංකුවක් හෝ බැංකු සමග ගිවිසුමකට එළඹිය හැකිය.

9.14 සාමාජික ආයතනවල රක්ෂණය කරන ලද තැන්පතුකරුවන්ගේ වන්දි ගෙවීමේ ක්‍රියාවලියට අදාල කිසියම් නිශ්චිත උපදෙස් හෝ මාර්ගෝපදේශ, මුදල් මණ්ඩලය විසින් වරින්වර තීරණය කරනු ලැබේ.

9.15 කිසිදු තත්වයක් යටතේ හානිපූර්ණ වශයෙන් කළ යුතු යම් ගෙවීමක් මුදල් මණ්ඩලයේ වගකීමක් නොවිය යුතුය. තව ද ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක අරමුදල විසින් එසේ ගෙවිය යුතු මුළු හානිපූර්ණ මුදල් ප්‍රමාණය එකී අරමුදලේ අවසරලත් ණය හා එකතු වී ඇති වාරික මුදල් ද ඇතුළුව තැන්පතු රක්ෂණ අරමුදලෙහි රැස් වී ඇති පවත්නා මුදල් ප්‍රමාණයට පමණක් අනිවාර්ය වශයෙන්ම සීමා විය යුතු ය. අරමුදලට බැර වී ඇති මුළු මුදල් ප්‍රමාණය ඉක්මවන්නා වූ කිසිදු හානිපූර්ණ ගෙවීමක් හෝ වගකීමක් සම්බන්ධව මුදල් මණ්ඩලය කිසිදු අයුරකින් වගකීමට යටත් නොවිය යුතු ය.

10. අරමුදලේ පොත් සහ ගිණුම්

10.1 මුදල් මණ්ඩලය විසින් කලින් කලට අනුමත කරනු ලබන විධානයන්/ නියෝගයන් සහ ප්‍රතිපත්ති අනුව නිරාකරණ සහ බලගැන්වීම් අධ්‍යක්ෂගේ උපදේශකත්වය සහ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන්නා වූද, මෙහෙයුම් සහ කළමනාකරණ කටයුතු ඉටුකරන්නාවූ ද, තැන්පතු රක්ෂණ ඒකකයක් (මෙහි මින් මතු "ඒකකය" වශයෙන් හඳුන්වනු ලබන) ශ්‍රී ලංකා මහ බැංකුවේ නිරාකරණ සහ බලගැන්වීම් දෙපාර්තමේන්තුව යටතේ පිහිටුවනු ලැබිය යුතු ය.

10.2 ඒකකය විසින් අදාළ ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන්ට අනුකූලව අරමුදලේ මුදල් ගනුදෙනුවලට අදාළ පොත්, ගිණුම් සහ ලියකියවිලි පවත්වා ගත යුතු ය.

10.3 අරමුදලේ මුදල් වර්ෂය ලිත් වර්ෂයකට සමාන විය යුතු අතර විගණකාධිපතිවරයා එහි විගණකවරයා විය යුතු ය.

10.4 ඒකකය විසින් සෑම මුදල් වර්ෂයක් සඳහා ම ආදායම් සහ වියදම්, වත්කම් සහ බැරකම්, මුදල් තත්ත්වය සහ ආයෝජන පිළිබඳ මූල්‍ය ප්‍රකාශනයන් පිළියෙල කොට ඊලඟ වර්ෂයේ මාර්තු මස 31 වැනි දින හෝ ඊට පෙර මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු අතර එම ප්‍රකාශනයන් සාමාජික ආයතනයන්ගේ සහ මහජනතාවගේ දැනගැනීම සඳහා ප්‍රසිද්ධියට පත් කළ යුතු ද වේ.

10.5 ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක අරමුදලේ මූල්‍ය ප්‍රකාශනයන්, ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශනයන් ගෙන් පැහැදිලිවම වෙන් කොට සකස් කල යුතු අතර ඒ අනුව ශ්‍රී ලංකා මහ බැංකුවේ සහ ඒකකයේ මූල්‍ය ප්‍රකාශනයන් අතර කිසිදු ඒකාබද්ධතාවක් ඇති නොකළ යුතු ය.

11. අර්ථ නිරූපණය

11.1 මෙම රෙගුලාසීන්හි අරමුණ සඳහා,

(i) "බලපත්‍රලාභී බැංකු" යන්නෙන් අදහස් කරන්නේ 1988 අංක 30 දරන බැංකු පනත (සංශෝධිත) යටතේ බලපත්‍ර ලබා ඇති සියළුම බැංකු සහ "බලපත්‍රලාභී මූල්‍ය සමාගම්" යන්නෙන් අදහස් කරන්නේ 2011 අංක 42 දරන මූල්‍ය ව්‍යාපාර පනත (සංශෝධිත) යටතේ බලපත්‍ර ලබා ඇති සියළුම මූල්‍ය සමාගම්ය.

(ii) "ණය සහ අත්තිකාරම්" යන්නෙන් අදහස් වන්නේ නිශ්චිත කාලයක් තුල ආපසු ගෙවීම සඳහා නිශ්චිත ඇපකරයක් ඇතිව නිශ්චිත පොළී අනුපාතයකට සාමාජික ආයතනයකට ලබා දෙන නිශ්චිත මුදලකි.

(iii) "රක්ෂණය කරන ලද තැන්පතු" යන්නෙන් අදහස් කරන්නේ සුදුසුකම් ලත් සියළුම තැන්පතුය. කෙසේ වෙතත් එක් තැන්පතුකරුවෙකුට ගෙවිය යුතු උපරිම වන්දි මුදල ඉහත රෙගුලාසි අංක 9.9 හි දක්වා ඇති ප්‍රමාණයට සීමා වේ.

(iv) "රක්ෂණය කරන ලද තැන්පතුකරුවන්" යන්නෙන් අදහස් වන්නේ සුදුසුකම් ඇති තැන්පතු දරන්නන්ය. කෙසේ වෙතත්, එක් තැන්පතුකරුවෙකුට ගෙවිය යුතු උපරිම වන්දි මුදල ඉහත රෙගුලාසි අංක 9.9 හි දක්වා ඇති ප්‍රමාණයට සීමා වේ.

12. රෙගුලාසි අවලංගු කිරීම

12.1 2010 අංක 1 දරන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රම රෙගුලාසි (පසුව නිකුත් කරන ලද රෙගුලාසි මගින් සංශෝධිත) මෙයින් අවලංගු කර ඇත (මෙතැන්සිට "අවලංගු කරන ලද රෙගුලාසි" ලෙස හැඳින්වේ).

මෙම විධිවිධාන යටතේ අවලංගු කර තිබියදීත්, එම අවලංගු කරන ලද රෙගුලාසි යටතේ පිහිටුවා ඇති ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය මෙම රෙගුලාසි වල විධිවිධාන යටතේ බලාත්මකව සංරක්ෂණය කර ඇති අතර නව රෙගුලාසි වල විධිවිධානයන්ට යටත්ව අවහිරයකින් හෝ බාධාවකින් තොරව අඛන්ඩව පවතී.

12.2 මෙම රෙගුලාසි ක්‍රියාත්මක වන දිනට එම අවලංගු කරන ලද රෙගුලාසි යටතේ ක්‍රියාත්මක වූ ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක අරමුදලේ බැර වශයෙන් පවතින ශේෂය සහ අරමුදල් මෙම රෙගුලාසි යටතේ ක්‍රියාත්මක වන දිනට ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක අරමුදල ලෙස සලකනු ලැබේ.

12.3 අවලංගු කරන ලද රෙගුලාසි යටතේ ක්‍රියාත්මක වූ යෝජනා ක්‍රමයට ආරෝපණය කර තිබූ සියළුම අයිතිවාසිකම්, බැඳීම්, වත්කම්, වගකීම්, බලතල, වරප්‍රසාද, බලධාරීන් සහ එකී අයිතිවාසිකම්, බැඳීම්, වත්කම්, දේපල, වගකීම්, සියළු පොත්, ගිණුම් සහ යෝජනා ක්‍රමයට අදාළ වන හෝ සම්බන්ධ වන ලියකියවිලි මගින් පැන නගින බැඳියාවන්; නව රෙගුලාසි බලාත්මක වන දින සිට බලපැවැත්වෙන පරිදි නව රෙගුලාසි යටතේ අයිතිවාසිකම්, බැඳීම්, වත්කම්, දේපල, වගකීම්, බලතල, වරප්‍රසාද, බලධාරීන්, බැඳියාවන්, පොත්, ගිණුම් සහ ලියකියවිලි මෙම යෝජනා ක්‍රමයට අදාලව සැලකිය යුතුවේ.

මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරනු ලබන 2021 අංක 01 දරන විධානය 2021 ජනවාරි 01

නිශ්චල දේපල තක්සේරු කිරීමේ විධානය සංශෝධනය කිරීම

2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 12 වන වගන්තිය මඟින් පැවරී ඇති බලතල අනුව ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරන ලද 2018 අංක 04 දරන නිශ්චල දේපල තක්සේරු කිරීමේ විධානය සඳහා මුදල් මණ්ඩලය විසින් පහත සඳහන් සංශෝධන නිකුත් කරනු ලැබේ.

ඒ අනුව, බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා, මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරන ලද 2018 අංක 04 දරන නිශ්චල දේපල තක්සේරු කිරීම විධානයේ, අංක 4 සහ 6 විධානයන් පහත සඳහන් විධාන මඟින් ප්‍රතිස්ථාපනය වේ.

4. තක්සේරුකරුවන්ගේ යෝග්‍යතාවය සඳහා නිර්ණායකයන්

4.1 සෑම බලපත්‍රලාභී මුදල් සමාගමක්ම පහත සඳහන් දෑ තහවුරු කළ යුතුය.

අ. තක්සේරුකරුවන්ගේ යෝග්‍යතාවය පිළිබඳ නිර්ණායක පහත පරිදි වේ.

අ.1 ශ්‍රී ලංකා තක්සේරුකරුවන්ගේ සංගමයේ (අයි වී එස් එල්) සාමාජිකයෙකු විය යුතු අතර, ඔහු

i. සම සාමාජිකයෙකු හෝ

ii. අදාළ සාමාජිකත්ව ශ්‍රේණියේ වසර 5 ක පළපුරුද්දක් සහිත වෘත්තීය ආශ්‍රිත සාමාජිකයෙකු විය යුතුය.

වෘත්තීය ආශ්‍රිත සාමාජිකත්ව ශ්‍රේණියේ පළපුරුද්ද සහිත වසර ගණන නිර්ණය කිරීම සඳහා 2019 අංක 09 දරන ශ්‍රී ලංකා තක්සේරුකරුවන්ගේ ආයතන සංශෝධන පනතේ 24 වන වගන්තියේ දක්වා ඇති අන්තර්කාලීන විධිවිධාන අදාළ වේ.

අ.2 එක්සත් රාජධානියේ වරලත් මිනින්දෝරුවන්ගේ රාජකීය ආයතනයේ (ආර් අයි සී එස්) වරලත් තක්සේරුකරණ මිනින්දෝරුවෙක් විය යුතු අතර ඔහු,

i. ආර් අයි සී එස් හි සම සාමාජිකයෙකු හෝ,

ii. එවැනි සාමාජිකත්ව ශ්‍රේණියේ වසර 05 ක පළපුරුද්දක් ඇති ආර් අයි සී එස් හි අනෙකුත් සාමාජිකයින්

ආ. ඉහත 4.1 (අ) විධානයෙහි දක්වා ඇති සුදුසුකම් අනුව බලපත්‍රලාභී මුදල් සමාගම්වල තක්සේරුකරුවන්ගේ මණ්ඩලය සඳහා තෝරාගත් තක්සේරුකරුවන් අදාළ වෘත්තීය ආයතනය විසින් අනුමත කරන ලද /නිර්දේශිත පරිදි අඛණ්ඩ වෘත්තීය සංවර්ධනයන් ලබා ගත යුතුය.

ඇ. නිශ්චල දේපල තක්සේරු කිරීම සිදු කරනු ලබන අභ්‍යන්තර තක්සේරුකරුවන් විසින් ඉහත 4.1 (අ) විධානයෙහි දක්වා ඇති සුදුසුකම් නිර්ණායක සපුරාලිය යුතුය.

ඈ. නිශ්චල දේපල තක්සේරු කිරීමේ දී ඉහළම මට්ටමේ වෘත්තීය හැසිරීම, ආචාර ධර්ම සහ අඛණ්ඩතාව පවත්වා ගෙන යන තක්සේරුකරුවන් බලපත්‍රලාභී මුදල් සමාගම්වල තක්සේරුකරුවන්ගේ මණ්ඩලයට ඇතුළත් කළ යුතුය.

6. තක්සේරු කිරීමේ වාර ගණන

6.1 නිශ්චල දේපල තක්සේරු කිරීමේ වාර ගණන පහත පරිදි විය යුතුය.

අ. යම් නියාමන අරමුණක් සඳහා අක්‍රීය ලෙස වර්ගීකරණය කර ඇති ණය සහ අත්තිකාරම්වලට එරෙහිව සුරැකුම් ලෙස ලබාගෙන ඇති නිශ්චල දේපල තක්සේරු කිරීමේ වාර ගණන පහතින් දක්වා ඇත.

i. ණය ගැනුම්කරු විසින් තම නේවාසික අරමුණ සඳහා නේවාසික දේපලක් සඳහා ණය පහසුකම් ලබා ගන්නේ නම්, තක්සේරු වාර්තාව වසර පහකට නොවැඩි විය යුතුය.

ii. අනෙකුත් සියලුම ණය පහසුකම් සඳහා තක්සේරු වාර්තාව වසර හතරකට නොවැඩි විය යුතුය.

ආ. සක්‍රීය ණය සහ අත්තිකාරම් වලට එරෙහිව සුරැකුමක් ලෙස ලබාගෙන ඇති නිශ්චල දේපලෙහි තක්සේරු වාර්තාව ණය අත්තිකාරම් ලබා දෙන අවස්ථාවේ සහ ණය පහසුකම ක්‍රමයෙන් වැඩි කරන අවස්ථාවන් හිදී ලබා ගත යුතුය.

ඇ. මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරන ලද 2018 අංක 04 දරන නිශ්චල දේපල තක්සේරු කිරීම විධානයේ 3.1 ආ සහ ඇ විධානයෙහි සඳහන් පරිදි නිශ්චල දේපල ප්‍රත්‍යාගණනය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අභ්‍යන්තර ප්‍රතිපත්තිවලට අනුකූලව හෝ එවැනි නිශ්චල දේපලවල වටිනාකමෙහි සැලකිය යුතු වෙනස්කම් මත පදනම්ව සිදු කළ යුතුය. කෙසේ වෙතත්, එවැනි ප්‍රතිලාභ දෙවන පෙළ ප්‍රාග්ධනයට අන්තර්ගත කළ හැකි වන්නේ වසර තුනකට වරක් පමණි.

පෙර විධානයන් අවලංගු කිරීම

මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරන ලද 2019 අංක 04 දරන නිශ්චල දේපල තක්සේරු කිරීමේ විධානයට නිකුත් කරන ලද සංශෝධන විධානය මෙයින් අවලංගු කරන ලදී.

මහාචාර්ය ඩබ්. ඩී ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති සහ ශ්‍රී ලංකා
මහ බැංකුවේ අධිපති

කල්බදු මූල්‍යකරණ පනත යටතේ නිකුත් කරනු ලබන 2021 අංක 01 දරන විධානය 2021 ජනවාරි 01

නිශ්චල දේපල තක්සේරු කිරීමේ විධානය සංශෝධනය කිරීම

2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනතේ 34 වන වගන්තිය මඟින් පැවරී ඇති බලතල අනුව ශ්‍රී ලංකාවේ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත කල්බදු මූල්‍යකරණ පනත යටතේ නිකුත් කරන ලද 2018 අංක 04 දරන නිශ්චල දේපල තක්සේරු කිරීමේ විධානය සඳහා බැංකු නොවන ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් පහත සඳහන් සංශෝධන නිකුත් කරනු ලැබේ.

ඒ අනුව, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සඳහා කල්බදු මූල්‍යකරණ පනත යටතේ නිකුත් කරන ලද 2018 අංක 04 දරන නිශ්චල දේපල තක්සේරු කිරීම විධානයේ අංක 5 සහ 7 විධානයන් පහත සඳහන් විධාන මඟින් ප්‍රතිස්ථාපනය වේ.

5. තක්සේරුකරුවන්ගේ යෝග්‍යතාවය සඳහා නිර්ණායකයන්

5.1 සෑම විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමක්ම පහත සඳහන් දෑ තහවුරු කළ යුතුය.

අ. තක්සේරුකරුවන්ගේ යෝග්‍යතාවය පිළිබඳ නිර්ණායක පහත පරිදි වේ.

අ.1 ශ්‍රී ලංකා තක්සේරුකරුවන්ගේ සංගමයේ (අයි වී එස් එල්) සාමාජිකයෙකු විය යුතු අතර, ඔහු

i. සම සාමාජිකයෙකු හෝ

ii. අදාළ සාමාජිකත්ව ශ්‍රේණියේ වසර 5 ක පළපුරුද්දක් සහිත වෘත්තීය ආශ්‍රිත සාමාජිකයෙකු විය යුතුය.

වෘත්තීය ආශ්‍රිත සාමාජිකත්ව ශ්‍රේණියේ පළපුරුද්ද සහිත වසර ගණන නිර්ණය කිරීම සඳහා 2019 අංක 09 දරන ශ්‍රී ලංකා තක්සේරුකරුවන්ගේ ආයතන සංශෝධන පනතේ 24 වන වගන්තියේ දක්වා ඇති අන්තර්කාලීන විධිවිධාන අදාළ වේ.

අ.2 එක්සත් රාජධානියේ වරලත් මිනින්දෝරුවන්ගේ රාජකීය ආයතනයේ (ආර් අයි සී එස්) වරලත් තක්සේරුකරණ මිනින්දෝරුවෙක් විය යුතු අතර ඔහු,

i. ආර් අයි සී එස් හි සම සාමාජිකයෙකු හෝ,

ii. එවැනි සාමාජිකත්ව ශ්‍රේණියේ වසර 05 ක පළපුරුද්දක් ඇති ආර් අයි සී එස් හි අනෙකුත් සාමාජිකයෙකු විය යුතුය.

ආ ඉහත 5.1 (අ) විධානයෙහි දක්වා ඇති සුදුසුකම් අනුව විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල තක්සේරුකරුවන්ගේ මණ්ඩලය සඳහා තෝරාගත් තක්සේරුකරුවන් අදාළ වෘත්තීය ආයතනය විසින් අනුමත කරන ලද /නිර්දේශිත පරිදි අඛණ්ඩ වෘත්තීය සංවර්ධනයන් ලබා ගත යුතුය.

ඇ නිශ්චල දේපල තක්සේරු කිරීම සිදු කරනු ලබන අභ්‍යන්තර තක්සේරුකරුවන් විසින් ඉහත 5.1 (අ) විධානයෙහි දක්වා ඇති සුදුසුකම් නිර්ණායක සපුරාලිය යුතුය.

ඈ නිශ්චල දේපල තක්සේරු කිරීමේ දී ඉහළම මට්ටමේ වෘත්තීය හැසිරීම, ආචාර ධර්ම සහ අඛණ්ඩතාව පවත්වා ගෙන යන තක්සේරුකරුවන් විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල තක්සේරුකරුවන්ගේ මණ්ඩලයට ඇතුළත් කළ යුතුය.

7. තක්සේරු කිරීමේ වාර ගණන

7.1 නිශ්චල දේපල තක්සේරු කිරීමේ වාර ගණන පහත පරිදි විය යුතුය.

අ. යම් නියාමන අරමුණක් සඳහා අක්‍රීය ලෙස වර්ගීකරණය කර ඇති ණය සහ අත්තිකාරම්වලට එරෙහිව සුරැකුම් ලෙස ලබාගෙන ඇති නිශ්චල දේපල තක්සේරු කිරීමේ වාර ගණන පහතින් දක්වා ඇත.

i. ණය ගැනුම්කරු විසින් තම නේවාසික අරමුණ සඳහා නේවාසික දේපලක් සඳහා ණය පහසුකම් ලබා ගන්නේ නම්, තක්සේරු වාර්තාව වසර පහකට නොවැඩි විය යුතුය.

ii. අනෙකුත් සියලුම ණය පහසුකම් සඳහා තක්සේරු වාර්තාව වසර හතරකට නොවැඩි විය යුතුය.

ආ සක්‍රීය ණය සහ අත්තිකාරම්වලට එරෙහිව සුරැකුමක් ලෙස ලබාගෙන ඇති නිශ්චල දේපලෙහි තක්සේරු වාර්තාව ණය අත්තිකාරම් ලබා දෙන අවස්ථාවේ සහ ණය පහසුකම ක්‍රමයෙන් වැඩි කරන අවස්ථාවන් හිදී ලබා ගත යුතුය.

ඇ කල්බදු මූල්‍යකරණ පනත යටතේ නිකුත් කරන ලද 2018 අංක 04 දරන නිශ්චල දේපල තක්සේරු කිරීම විධානයේ 4.1 ආ සහ ඇ විධානයෙහි සඳහන් පරිදි නිශ්චල දේපල ප්‍රත්‍යාගණනය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අභ්‍යන්තර ප්‍රතිපත්තිවලට අනුකූලව හෝ එවැනි නිශ්චල දේපලවල වටිනාකමෙහි සැලකිය යුතු වෙනස්කම් මත පදනම්ව සිදු කළ යුතුය. කෙසේ වෙතත්, එවැනි ප්‍රතිලාභ දෙවන පෙළ ප්‍රාග්ධනයට අන්තර්ගත කළ හැකි වන්නේ වසර තුනකට වරක් පමණි.

පෙර විධානයන් අවලංගු කිරීම

කල්බදු මූල්‍යකරණ පනත යටතේ නිකුත් කරන ලද 2019 අංක 02 දරන නිශ්චල දේපල තක්සේරු කිරීමේ විධානයට නිකුත් කරන ලද සංශෝධන විධානය මෙයින් අවලංගු කරන ලදී.

ජේ. ඩී. එස්. ජේ. නානායක්කාර
අධ්‍යක්ෂ, බැංකු නොවන මූල්‍ය ආයතන
අධීක්ෂණ දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා මහ බැංකුව

මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරනු ලබන 2021 අංක 02 දරන විධානය 2021 පෙබරවාරි 17

මෝටර් වාහන සඳහා ණය පහසුකම් ලබා දීමේ දී වටිනාකම් මත ණය අනුපාත විධානය සංශෝධනය කිරීම

මෝටර් වාහන මිලදී ගැනීමේ හෝ භාවිතා කිරීමේ අරමුණ සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් ප්‍රදානය කරනු ලබන ණය පහසුකම් වෙනුවෙන් වටිනාකම් මත ණය අනුපාත ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පහත සඳහන් විධාන නිකුත් කරනු ලබයි.

1. මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරන ලද 2020 අංක 03 දරන මෝටර් වාහන සඳහා ණය පහසුකම් ලබා දීමේ දී වටිනාකම් මත ණය අනුපාත විධානය සංශෝධනය කිරීම සඳහා නිකුත් කරන ලද විධානයෙහි 1 (i) (ආ) විධානය පහත විධානය මඟින් ප්‍රතිස්ථාපනය කෙරේ.

   (ආ) පළමු ලියාපදිංචියෙන් පසු වසරකට වැඩි කාලයක් ශ්‍රී ලංකාව තුළ භාවිත කරන ලද ලියාපදිංචි වාහන සඳහා අනුපාතය සියයට 80 ක් විය යුතුය.

මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

කල්බදු මූල්‍යකරණ පනත යටතේ නිකුත් කරනු ලබන 2021 අංක 02 දරන විධානය 2021 පෙබරවාරි 17

මෝටර් වාහන සඳහා ණය පහසුකම් ලබා දීමේ දී වටිනාකම් මත ණය අනුපාත විධානය සංශෝධනය කිරීම

2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනතේ 34 වන වගන්තිය යටතේ නිකුත් කරන ලදී.

මෝටර් වාහන මිලදී ගැනීමේ හෝ භාවිතා කිරීමේ අරමුණ සඳහා විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් ප්‍රදානය කරනු ලබන ණය පහසුකම් වෙනුවෙන් වටිනාකම් මත ණය අනුපාත ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පහත සඳහන් විධාන නිකුත් කරනු ලබයි.

1. කල්බදු මූල්‍යකරණ පනත යටතේ නිකුත් කරන ලද 2020 අංක 03 දරන මෝටර් වාහන සඳහා ණය පහසුකම් ලබා දීමේ දී වටිනාකම් මත ණය අනුපාත විධානය සංශෝධනය කිරීම සඳහා නිකුත් කරන ලද විධානයෙහි 1 (i) (ආ) විධානය පහත විධානය මඟින් ප්‍රතිස්ථාපනය කෙරේ.

   (ආ) පළමු ලියාපදිංචියෙන් පසු වසරකට වැඩි කාලයක් ශ්‍රී ලංකාව තුළ භාවිත කරන ලද ලියාපදිංචි වාහන සඳහා අනුපාතය සියයට 80 ක් විය යුතුය.

ජේ. ඩී. එස්. ජේ. නානායක්කාර
අධ්‍යක්ෂ, බැංකු නොවන මූල්‍ය ආයතන
අධීක්ෂණ දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා මහ බැංකුව

2021 අංක 04 දරන චක්‍රලේඛය 2021 මාර්තු 12

මඟී ප්‍රවාහන සේවයේ නියුතු ව්‍යාපාර හා පුද්ගලයන් විසින් ලබා ගත් කල්බදු මූල්‍යකරණ පහසුකම් (ලීසිං) සඳහා ලබා දෙන සහන යෝජනා ක්‍රමය

මඟී ප්‍රවාහන සේවයේ නියුතු ව්‍යාපාර හා පුද්ගලයන් හට කොවිඩ්-19 වසංගත ව්‍යාප්තිය නිසා සිදු වූ දුෂ්කරතා සැලකිල්ලට ගනිමින්, එසේ දුෂ්කරතාවලට මුහුණ දුන් මඟී ප්‍රවාහන සේවයේ නියුතු ව්‍යාපාර හා පුද්ගලයන් විසින් ලබා ගෙන ඇති කල්බදු මූල්‍යකරණ පහසුකම් ආපසු ගෙවීම සඳහා 2021 අප්‍රේල් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි, මාස හයක කාල සීමාවක් සඳහා, පහත දක්වා ඇති පරිදි ණය සහන යෝජනා ක්‍රමයක් (මින් ඉදිරියට යෝජනා ක්‍රමය ලෙස හැඳින්වෙන) ක්‍රියාත්මක කරන ලෙසට ශ්‍රී ලංකා මහ බැංකුව විසින්, බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් (මින් ඉදිරියට බැංකු නොවන මූල්‍ය ආයතන ලෙස හැඳින්වෙන) වෙත ඉල්ලීමක් කර ඇත.

ඒ අනුව, සියලුම බැංකු නොවන මූල්‍ය ආයතන විසින් සමාන ලෙස ඉහත ණය සහන යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වීම තහවුරු කිරීම සඳහා මෙම චක්‍රලේඛය නිකුත් කර ඇත.

1. **කල්බදු වාරික කල් දැමීමේ කාල සීමාව**

   1.1. සුදුසුකම්ලත් ණය ගැනුම්කරුවන් මුහුණ දෙන මූල්‍ය දුෂ්කරතා සැලකිල්ලට ගනිමින් බැංකු නොවන මූල්‍ය ආයතන විසින් 2021 අප්‍රේල් මස 01 සිට හය මසක කාල සීමාවක් නොඉක්මවන හෝ අදාළ පරිදි ඊට අඩු කාල සීමාවක් සඳහා කල්බදු වාරික කල් දැමීම සිදු කළ හැක.

   1.2. බැංකු නොවන මූල්‍ය ආයතන විසින් දුෂ්කරතාවලට මුහුණපා ඇති ණය ගැනුම්කරුවන් විසින් කරන්නා වූ ඉල්ලීම් අනුව, කල්බදු වාරික (මුල් මුදල සහ පොලිය යන දෙකම) කල් දැමීම සිදු කළ හැක.

2. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය

2.1 සුදුසුකම්ලත් ණය ගැනුම්කරුවන් විසින් 2021 අප්‍රේල් 19 දින හෝ ඊට පෙර කල්බදු වාරික කල් දැමීම සඳහා ඉල්ලීමක් ලිඛිතව හෝ විද්‍යුත් මාධ්‍යයෙන් යොමු කළ යුතුය. බැංකු නොවන මූල්‍ය ආයතන විසින් දුෂ්කරතාවලට මුහුණපා ඇති ණය ගැනුම්කරුවන් හට ලබා දෙනු ලබන ණය සහන, අයදුම් කළ යුතු අවසාන දිනය සහ අයදුම්පතේ ආකෘතිය මුද්‍රිත සහ/හෝ විද්‍යුත් මාධ්‍යයෙන් (විද්‍යුත් තැපැල් සහ කෙටි පණිවිඩ සේවා ඇතුළත්ව) ප්‍රකාශයට පත් කිරීමට කඩිනමින් කටයුතු කළ යුතුය.

2.2 සාධාරණ හේතුවක් මත ණය සහන සඳහා ඉල්ලුම් කිරීම ප්‍රමාද වී ඇත්නම් පමණක්, 2021 අප්‍රේල් 19 දිනෙන් පසු ඉදිරිපත් කරන ඕනෑම ඉල්ලුම්පතක් බැංකු නොවන මූල්‍ය ආයතන විසින් පිළිගත යුතුය.

3. සුදුසුකම් ලබන ගනුදෙනුකරුවන්

3.1 පොදු මඟී ප්‍රවාහන පහසුකම් සපයන්නන්, පාසල් ළමුන් ප්‍රවාහන සේවා, කාර්යාල මඟී ප්‍රවාහන සේවා, ත්‍රී රෝද රථ ඇතුලු කුලී රථ සේවා ආදී පුද්ගලික මඟී ප්‍රවාහන සේවා සපයන සහ සංචාරක ක්ෂේත්‍රය සඳහා මඟී ප්‍රවාහන පහසුකම් සපයන ව්‍යාපාර සහ පුද්ගලයන් මෙම යෝජනා ක්‍රමය සඳහා සුදුසුකම් ලබයි.

3.2 ඉහත 3.1 ඡේදයේ සඳහන් කර ඇති අංශ සඳහා මඟී ප්‍රවාහන පහසුකම් සැලසීම සඳහා අදාළ වාහනය භාවිත කරන බව තහවුරු කර ගැනීමට අවශ්‍ය ලියවිලි සුදුසුකම්ලත් ණය ගැනුම්කරුවන්ගෙන් ඉල්ලා සිටීමට බැංකු නොවන මූල්‍ය ආයතනයන්ට හැකියාව ඇත.

4. සුදුසුකම් ලබන ණය පහසුකම්

2021 මාර්තු 31 දිනට සක්‍රීය තත්ත්වයේ පවතින පෙර ණය සහන යෝජනා ක්‍රම යටතේ ණය සහන ලබා ගත් ණය ගැනුම්කරුවන් ඇතුලු ඉහත අංක 03 හි දැක්වෙන්නා වූ කල්බදු මූල්‍යකරණ පහසුකම්.

5. ණය සහන කාලයේ සැකැස්ම

5.1 පවත්නා කල්බදු මූල්‍යකරණ පහසුකම්වල කාල සීමාව දීර්ඝ කිරීම

(අ) බැංකු නොවන මූල්‍ය ආයතන විසින් කල් දැමීමට සුදුසුකම් ලබන කල්බදු මූල්‍යකරණ පහසුකම් වල ආපසු ගෙවීමේ කාල සීමාව අදාළ කල් දැමීමේ කාල සීමාවෙන් දීර්ඝ කළ යුතුය.

(ආ) මෙලෙස කල් දැමූ කල්බදු මූල්‍යකරණ පහසුකම් වාරික සඳහා පමණක්, කල් දැමූ කාල සීමාව වෙනුවෙන් පොලියක් අය කිරීමට බැංකු නොවන මූල්‍ය ආයතනවලට හැකියාව ඇති අතර එම පොලී අනුපාතය, 2021 අප්‍රේල් 01 දිනට ආසන්නතම දිනකදී පවත්වන දින 364 භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසියේ පොලී අනුපාතයට සියයට 5.5 ක් එකතු කළ වාර්ෂික පොලිය විය යුතු අතර එම වාර්ෂික පොලී අනුපාතය සියයට 11.5 ක අගය නොඉක්මවිය යුතුය.

(ඇ) කල් දැමූ වාරික සඳහා උපචිත වූ පොලිය, 2023 අප්‍රේල් මස සිට කාල සීමාවට අදාළ කල්බදු වාරිකය සමඟ මාසිකව අයකර ගත යුතුය. 2023 අප්‍රේල් මාසයට පෙර කල්බදු මූල්‍යකරණ පහසුකමෙහි කාල සීමාව අවසන් වුවහොත්, බැංකු නොවන මූල්‍ය ආයතන විසින් පවත්නා කල්බදු මූල්‍යකරණ පහසුකමෙහි කාල සීමාව අවසන් වූ විට පොලිය අයකර ගැනීම ආරම්භ කළ හැකිය.

(ඈ) කල්බදු මූල්‍යකරණ පහසුකමෙහි පවත්නා කාල සීමාව අවසන් වූ පසු, ඉහත 5.1 (අ) ඡේදයේ සඳහන් පරිදි ණය ගැනුම්කරු විසින් කල් දැමූ වාරික ආපසු ගෙවීම ආරම්භ කළ යුතුය.

5.2 පෙර ණය සහන යෝජනා ක්‍රමයන්හි වාරික අයකර ගැනීම

(අ) පාසල්, කාර්යාල, ගුවන්තොටුපල යනාදිය යළි විවෘත කිරීම හේතුවෙන් (බොහෝ ප්‍රවාහන සැපයුම්කරුවන්ට මාසික ගාස්තු අඛණ්ඩව ලබා ගැනීමට හැකියාව ලැබීම), පොදු හා පුද්ගලික ප්‍රවාහන භාවිතය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීම, දීර්ඝ කරන ලද ණය සහන යෝජනා ක්‍රමය නිසා බැංකු නොවන මූල්‍ය ආයතනවලට වන බලපෑම සහ පවත්නා එන්නත්කරණ වැඩපිළිවෙල ආදී කරුණු සැලකිල්ලට ගනිමින් 2019 අප්‍රේල් 01 සිට 2020 මාර්තු 31 දක්වා, 2020 අප්‍රේල් 01 සිට 2020 සැප්තැම්බර් 30 දක්වා සහ 2020 ඔක්තෝබර් 01 සිට 2021 මාර්තු 31 දක්වා කාලය තුළ ලබා දී ඇති ණය සහන යෝජනා ක්‍රම (මින් ඉදිරියට පෙර ණය සහන යෝජනා ක්‍රම ලෙස හැඳින්වෙන) වලට අදාළ වාරික, ඉහත 5.1 (අ) ඡේදයේ සඳහන් කල්බදු වාරික කල් දැමීමේ කාල සීමාවේ දී අය කර ගැනීම ආරම්භ කළ යුතුය.

(ආ) ඉහත 5.2 (අ) ඡේදයේ සඳහන් පරිදි පෙර ණය සහන යෝජනා ක්‍රමයන්හි ඉතිරි වාරික ආපසු ගෙවීම, පවත්නා කල්බදු මූල්‍යකරණ පහසුකමේ දීර්ඝ කළ කාල සීමාව ඇතුලුව ආපසු ගෙවීමේ සීමාව අවසන් වන තෙක් කල් දැමිය යුතුය.

(ඇ) පෙර ණය සහන යෝජනා ක්‍රමයන්හි ඉතිරි වාරිකවල කල් දැමූ කාල සීමාව සඳහා, 2021 අප්‍රේල් 01 දිනට ආසන්නතම දිනකදී පවත්වන දින 364 භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසියේ පොලී අනුපාතයට සියයට 5.5 ක් එකතු කළ වාර්ෂික පොලියට නොවැඩි පොලී අනුපාතයක් අයකර ගත හැකි අතර එය වාර්ෂික පොලී අනුපාතය සියයට 11.5 ක අගය නොඉක්මවිය යුතුය.

(ඈ) 5.2 (ආ) ඡේදයේ සඳහන් කර ඇති පෙර ණය සහන යෝජනා ක්‍රමයන්හි කල් දැමූ වාරික සඳහා අදාළ උපචිත පොලිය, ඉහත 5.1 (ආ) සහ (ඇ) ඡේදවල සඳහන් පොලිය ගෙවීම අවසන් වූ වහාම කල්බදු මූල්‍යකරණ පහසුකමෙහි වාරික සහ කල් දැමූ වාරික සමඟ මාසිකව අයකර ගත යුතුය.

(ඉ) කල්බදු මූල්‍යකරණ පහසුකමෙහි කල් දැමූ කාල සීමාව ඇතුලුව පවත්නා කාල සීමාව අවසන් වූ පසු, ඉහත 5.2 (ආ) ඡේදයේ සඳහන් පෙර ණය සහන යෝජනා ක්‍රමයන්ට අදාළ ඉතිරි වාරික ආපසු ගෙවීම ණය ගැනුම්කරුවන් විසින් ආරම්භ කළ යුතුය.

5.3 ණය සහන යෝජනා ක්‍රම තුළ ගෙවීමට ඇති හිඟ මුදල සහ කල් දැමූ කාල සීමාව සඳහා පොලිය ද ඇතුලුව, කල් දැමූ කාල සීමාව තුළ ගෙවිය යුතු කල්බදු වාරික ගෙවීම සඳහා ණය ගැනුම්කරු විසින් කලින් ගෙවීමට ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කරන්නේ නම්, බැංකු නොවන මූල්‍ය ආයතන විසින් එවැනි ඉල්ලීම් සඳහා පහසුකම් සැපයිය යුතුය. එවැනි අවස්ථාවක දී, බැංකු නොවන මූල්‍ය ආයතන සහ ණය ගැනුම්කරුවන් යන දෙපාර්ශවය විසින් ණය මුදලේ/ගෙවීමේ ව්‍යුහය, පොලී අනුපාතය සහ කාල සීමාව පිළිබඳව එකඟ විය යුතුය.

5.4 මෙම චක්‍රලේඛය යටතේ ලබා දී ඇති ප්‍රතිලාභවලට වඩා ණය ගැනුම්කරුට ලැබෙන සමස්ත ප්‍රතිලාභ අඩු නොවන අයුරින් ණය ගැනුම්කරුගේ ඉල්ලීම පරිදි බැංකු නොවන මූල්‍ය ආයතන විසින් ණය ගැනුම්කරුවන්ට අමතර විකල්ප ලබා දිය හැකිය. එවැනි අවස්ථාවක දී, එවැනි සහනයක් අනුමත කිරීමට පෙර, මෙම චක්‍රලේඛයේ යෝජිත ව්‍යුහය ඇතුලුව සියලු විකල්පයන් යටතේ පොලී ගණනය කිරීම සම්බන්ධයෙන් බැංකු නොවන මූල්‍ය ආයතන විසින් පැහැදිලි කිරීමක් සිදු කළ යුතුය.

5.5 බැංකු නොවන මූල්‍ය ආයතන විසින් 2021 අප්‍රේල් 01 දින වන විට එකතු වී ඇති සහ නොපියවා ඇති දඩ පොලී කපා හැරිය යුතු අතර තවද, කල් දැමූ කාල සීමාව තුළ දී දඩ පොලී එකතු කිරීම හෝ අය කිරීම නොකළ යුතුවේ.

5.6 සහන ලබා දීමේ දී බැංකු නොවන මූල්‍ය ආයතන විසින් අධික ගාස්තු අය නොකළ යුතුය.

5.7 බැංකු නොවන මූල්‍ය ආයතන විසින් ණය සහන ලබා දීම ප්‍රතික්ෂේප කළ අවස්ථාවන්හී දී, ඒ සඳහා හේතුව පැහැදිලිව සඳහන් කළ යුතුය.

6. කල්බදු වාරික කල් දැමීම සඳහා ගිණුම්කරණය

බැංකු නොවන මූල්‍ය ආයතන විසින් ණය සහන කාලසීමාවට අදාළව ගිණුම් තැබීමේ දී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ කොවිඩ්-19 ව්‍යසනය සම්බන්ධව මූල්‍ය වාර්තාකරණයේ දී බලපාන කරුණු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් සපයනු ලබන මාර්ගෝපදේශ වේ නම් ඒ හා අනුගතව කටයුතු කළ යුතුය. බැංකු නොවන මූල්‍ය ආයතන හට මේ සම්බන්ධව අමතර මඟ පෙන්වීමක් අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයෙන් හෝ විගණකවරුන්ගෙන් විමසිය හැක.

7. වාර්තාකරණ අවශ්‍යතා

2021 අප්‍රේල් 30 දින සිට සෑම මසකම බැංකු නොවන මූල්‍ය ආයතන විසින් ආයතන වලින් ණය සහන ලබාගෙන ඇති ගනුදෙනුකරුවන් පිළිබඳ තොරතුරු සෑම මසකම අවසන් දිනයේ සිට වැඩකරන දින 15 ක් තුළ දී බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත වාර්තා කළ යුතුය. තොරතුරු ඉදිරිපත් කළ යුතු ආකෘතිය ඉදිරියේ දී යොමු කරනු ලැබේ.

මහාචාර්ය ඩබ්ලිව් ඩී ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

2021 අංක 05 දරන චක්‍රලේඛය 2021 මාර්තු 19

කොවිඩ්-19 නිසා බලපෑමට පත් සංචාරක ක්ෂේත්‍රයේ නියුතු ව්‍යාපාර හා පුද්ගලයන් වෙත ලබා දුන් ණය සහන කාලය දීර්ඝ කිරීම

පවත්නා කොවිඩ්-19 වසංගත තත්ත්වය හමුවේ, සංචාරක ව්‍යාපාරයේ නිරත ව්‍යාපාර හා පුද්ගලයන් විසින් මුහුණ දෙනු ලබන අභියෝගයන් සැලකිල්ලට ගනිමින් 2020 සැප්තැම්බර් 30 වැනි දින නිකුත් කරන ලද 2020 අංක 09 දරන චක්‍රලේඛය මඟින් සංචාරක ක්ෂේත්‍රය වෙත පිරිනමන ලද ණය සහන කාල සීමාව, 2021 අප්‍රේල් 01 දින සිට පහත සඳහන් පරිදි, තවත් මාස හයක කාලයක් සඳහා දීර්ඝ කරන මෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපතුලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් (මින් මතුවට බැංකු නොවන මූල්‍ය ආයතන ලෙස හැඳින්වෙන) වෙතින් ඉල්ලා සිටී. කෙසේ වෙතත්, ගනුදෙනුකරුවන් විසින් සිදුකරනු ලබන ඉල්ලීම් මත පදනම්ව මෙම චක්‍රලේඛය මඟින් පිරිනමනු ලබන සමස්ත ප්‍රතිලාභයන්ට වඩා අඩු නොවන පරිදි, ගනුදෙනුකරුවන් වෙත වෙනත් අමතර විකල්පයන් පිරිනැමීම සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන හට අවස්ථාව ඇත. ඉහත ණය සහන කාල සීමාව දීර්ඝ කිරීම සිදු කරනු ලබන්නේ ගනුදෙනුකරුවන්හට දීර්ඝ කාලීන වැඩපිළිවෙලක් සඳහා යෝජනා ඉදිරිපත් කිරීමට ප්‍රමාණවත් කාලයක් ලබාදීමේ අවශ්‍යතාවය මත වන අතර, ගනුදෙනුකරුවන් විසින් මෙම දීර්ඝ කරන ලද ණය සහන කාලය අවසන් වීමට පෙර, තම ණය පහසුකම් දීර්ඝ කාලයක් සඳහා ප්‍රතිව්‍යුහගත කිරීමට පිළිගත හැකි සැලැස්මක් බැංකු නොවන මූල්‍ය ආයතන වෙත ඉදිරිපත් කළ යුතුය. බැංකු නොවන මූල්‍ය ආයතන විසින් එවැනි සැලසුම් ඒ ඒ අවස්ථානුකූලව සලකා බැලීමට කටයුතු කළ යුතු අතර, ඉහත ණය සහන යෝජනා ක්‍රමය සියලු බැංකු නොවන මූල්‍ය ආයතන විසින් ඒකාකාරීව ක්‍රියාවට නැංවීම තහවුරු කිරීම සඳහා මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

2020 අංක 09 දරන චක්‍රලේඛයේ පහත සඳහන් ප්‍රතිපාදන, මෙහි සඳහන් වන ආකාරයට සංශෝධනය වනු ඇති අතර, එම චක්‍රලේඛයේ අනෙකුත් ප්‍රතිපාදනයන් නොවෙනස්ව පවතී.

1. පොදු කොන්දේසි හා නියමයන්

1 (iii) ණය සහන කාලය යනුවෙන් අදහස් කරන්නේ 2021 අප්‍රේල් 01 දින සිට 2021 සැප්තැම්බර් 30 වැනි දින දක්වා තවත් මාස හයක කාලසීමාවක් සඳහා මූලික ණය මුදල සහ පොලිය කල් තැබීම වේ.

1 (iv) මෙම ණය සහන ලබා ගැනීමට අපේක්ෂා කරන, සුදුසුකම් ලබන ණය ගනුදෙනුකරුවන් 2021 අප්‍රේල් 19 දින හෝ ඊට පෙර සිය බැංකු නොවන මූල්‍ය ආයතන වෙත ඉල්ලීමක් කළ යුතුය. කෙසේ වෙතත්, ගනුදෙනුකරුවන් විසින්, 2021

අප්‍රේල් 19 දිනෙන් පසුව කරනු ලබන ඉල්ලීම් සාධාරණ හේතු මත සලකා බැලීමට කටයුතු කරන මෙන් බැංකු නොවන මූල්‍ය ආයතන වෙත දන්වා සිටී. බැංකු නොවන මූල්‍ය ආයතන විසින් 2021 මැයි 31 දිනට පෙර නියමයන් හා කොන්දේසි සම්පාදනය අවසන් කර සුදුසුකම්ලත් ණය ගනුදෙනුකරුවන් සමඟ නව ගිවිසුමකට එළඹිය යුතුය.

1 (vii) ගනුදෙනුකරුවන් විසින් ඉල්ලීමක් කරන්නේ නම් පමණක්, 2020 අංක 03 සහ 2020 අංක 04 දරන විස්තර සටහන්වලට අනුව පොලී රහිත කාලීන ණයෙහි ගෙවීමට ඇති වාරික (එනම්, 2020 අප්‍රේල් 01 සිට 2020 සැප්තැම්බර් 30 දක්වා පළමු ණය සහන කාල සීමාවේ දී උපචිත පොලිය) සහ 2020 අංක 09 දරන චක්‍රලේඛයට අනුව පරිවර්තනය කරන ලද කාලීන ණයෙහි වාරිකය සුදුසුකම්ලත් ණය ගැනුම්කරුවන්ගෙන් 2021 ඔක්තෝබර් 01 දින සිට අයකර ගැනීමේ හැකියාව පවතී.

2. ණය සහන යෝජනා ක්‍රමයේ සැකැස්ම

2 (i) 2021 අප්‍රේල් 01 දින සිට 2021 සැප්තැම්බර් 30 දින දක්වා ණය සහන කාල සීමාව තුළ අයවීමට නියමිත මූලික ණය මුදල සහ පොලිය කාලීන ණයකට හැරවීමට බැංකු නොවන මූල්‍ය ආයතන කටයුතු කළ යුතුය.

2 (ii) බැංකු නොවන මූල්‍ය ආයතන විසින් මෙලෙස හරවන ලද ණය යළි අයකර ගැනීම ආරම්භ කිරීම, දීර්ඝ කරන ලද ණය සහන කාලය අවසන් වීමෙන් පසුව සිදු කළ යුතුය.

2 (v) මෙම චක්‍රලේඛය යටතේ සුදුසුකම් ලබන ණය සඳහා, බැංකු නොවන මූල්‍ය ආයතන විසින් 2021 අප්‍රේල් 01 දින වන විට එකතු වී නොපියවා ඇති දඩ පොලී කපා හැරිය යුතුය. තවද, ණය සහන කාල සීමාව තුළදී දඩ පොලී එකතු කිරීම හෝ අය කිරීම නොකළ යුතුවේ.

මහාචාර්ය ඩබ්ලිව් ඩී ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරනු ලබන 2021 අංක 03 දරන විධානය 2021 මාර්තු 31

ද්‍රවශීල වත්කම් විධානය සංශෝධනය කිරීම

කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ඇති වී තිබෙන අභියෝගාත්මක මෙහෙයුම් තත්ත්වය සලකා බලමින්, බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් පවත්වා ගත යුතු ද්‍රවශීල වත්කම් ප්‍රමාණය පිළිබඳ විධානයට පහත සංශෝධනයන් මුදල් මණ්ඩලය විසින් නිකුත් කරනු ලබයි.

ඒ අනුව, මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරන ලද 2020 අංක 07 දරන ද්‍රවශීල වත්කම් විධානය සංශෝධනය කිරීමේ විධානයේ අංක 5 විධානය පහත ලෙස ප්‍රතිස්ථාපනය කර සංශෝධනය කෙරේ.

5. වලංගු කාල පරිච්ඡේදය

5.1 වර්තමාන අභියෝගාත්මක තත්ත්වය මත ද්‍රවශීලතාවය පිළිබඳ අපහසුතාවයන්ට පත්ව සිටින බලපත්‍රලාභී මුදල් සමාගම්වලට පහසුකම් සැලසීම සඳහා අංක 2,3 සහ 4.1 විධානයන් 2021.06.30 දින දක්වා මාස තුනක (3) කාලයක් සඳහා දීර්ඝ කරන ලදී.

5.2 ඉහත 5.1 හි දක්වා ඇති දීර්ඝ කිරීමේ කාලය ඉකුත්වීමෙන් පසු 2013 අංක 04 දරන මුදල් සමාගම් (ද්‍රවශීල වත්කම්) විධානය අනුව ද්‍රවශීල වත්කම් අවශ්‍යතා පවත්වා ගැනීම සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් අවශ්‍ය පියවර ගත යුතුය.

මහාචාර්ය ඩබ්ලිව් ඩී ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති සහ ශ්‍රී ලංකා
මහ බැංකුවේ අධිපති

කල්බදු මූල්‍යකරණ පනත යටතේ නිකුත් කරනු ලබන 2021 අංක 03 දරන විධානය 2021 මාර්තු 31

ද්‍රවශීල වත්කම් විධානය සංශෝධනය කිරීම

2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනතේ 34 වන වගන්තිය යටතේ නිකුත් කරන ලදී.

කොවිඩ්-19 වසංගතයේ දෙවන ව්‍යාප්තිය හේතුවෙන් ඇති වී තිබෙන අභියෝගාත්මක මෙහෙයුම් තත්ත්වය සලකා බලමින්, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් කල්බදු මූල්‍යකරණ පනත යටතේ නිකුත් කරන ලද 2020 අංක 06 දරන ද්‍රවශීල වත්කම් විධානය සංශෝධනය කිරීමේ විධානයට පහත සංශෝධනයන් නිකුත් කරනු ලබයි.

ඒ අනුව, කල්බදු මූල්‍යකරණ පනත යටතේ නිකුත් කරන ලද 2020 අංක 06 දරන ද්‍රවශීල වත්කම් විධානය සංශෝධනය කිරීම විධානයේ අංක 2 විධානය පහත ලෙස ප්‍රතිස්ථාපනය කෙරේ.

2. වලංගු කාල පරිච්ඡේදය

2.1 වර්තමාන අභියෝගාත්මක තත්ත්වය මත ද්‍රවශීලතාවය පිළිබඳ අපහසුතාවයන්ට පත්ව සිටින විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වලට පහසුකම් සැලසීම සඳහා 2021.06.30 දින දක්වා මාස තුනක (3) කාලයක් සඳහා විධානය දීර්ඝ කරන ලදී.

2.2 ඉහත 2.1 හි දක්වා ඇති දීර්ඝ කිරීමේ කාලය ඉකුත්වීමෙන් පසු 2012 අංක 04 දරන කල්බදු මූල්‍යකරණ (ද්‍රවශීල වත්කම්) විධානය අනුව ද්‍රවශීල වත්කම් අවශ්‍යතා පවත්වා ගැනීම සඳහා විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් අවශ්‍ය පියවර ගත යුතුය.

ජේ. ඩී. එස්. ජේ. නානායක්කාර
අධ්‍යක්ෂ, බැංකු නොවන මූල්‍ය ආයතන
අධීක්ෂණ දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා මහ බැංකුව

මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරනු ලබන 2021 අංක 04 දරන විධානය 2021 අප්‍රේල් 09

විදේශ ව්‍යවහාර මුදල් ණය ගැනීම්

1. නීති ප්‍රතිපාදන

1.1 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 12 වන වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව, මුදල් මණ්ඩලය විසින් බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් විදේශ මුදල් ණයට ගැනීම සම්බන්ධයෙන් මෙම විධාන නිකුත් කරනු ලබයි.

2. විධානයන්හි අරමුණු

2.1 බලපත්‍රලාභී මුදල් සමාගම් අංශය විදේශීය අරමුදල් සඳහා නිරාවරණය වීම තුළින් රට තුළ පවතින අනවශ්‍ය සාර්ව ආර්ථික හා මූල්‍ය අංශයේ අස්ථාවරභාවයන් ස්ථාවර කිරීම.

2.2 විදේශීය අරමුදල් සඳහා නිරාවරණය වීම පිළිබඳ අවදානම් කළමනාකරණ රාමුවක් බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා සැපයීම.

3. අදාළත්වය සහ විෂය පථය

3.1 බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් ගනු ලබන සියලුම විදේශ ව්‍යවහාර මුදල් ණය සඳහා මෙම විධාන අදාළ වේ.

4. අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

4.1 බලපත්‍රලාභී මුදල් සමාගම්වල සියලුම විදේශ ව්‍යවහාර මුදල් ණය ගැනීම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තාර්කික තක්සේරුව, ණය ගැනීමේ පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණය සහ ප්‍රමාණවත් අවදානම් කළමනාකරණ භාවිතයන් තිබීම තක්සේරු කිරීමෙන් අනතුරුව අනුමත කළ යුතුය.

4.2 අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද විවක්ෂණශීලී විදේශ විනිමය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්ථාපිත කළ යුතු අතර ඒවා ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කළ යුතුය.

5. කාලසීමාව

5.1 විදේශ ණය මුදලෙහි කල්පිරීමේ කාලසීමාව අවුරුදු 2 ක් හෝ ඊට වැඩි විය යුතුය.

6. විදේශ මුදල් ණයට ගැනීමේ සීමාවන්

6.1 බලපත්‍රලාභී මුදල් සමාගමේ නිශ්චිත කාලසීමාවක දී ගෙවීමට ඇති විදේශ ව්‍යවහාර මුදල් ණය ප්‍රමාණය එම සමාගමේ මුළු වත්කම්වලින් ප්‍රතිශතයක් ලෙස නිර්ණය කෙරේ.

6.2 බලපත්‍රලාභී මුදල් සමාගමෙහි විදේශ ව්‍යවහාර මුදල් ණය ගැනීමේ ප්‍රතිශතය පහත අංක 1 වගුවෙහි දක්වා ඇති එක් එක් මට්ටම සඳහා ලබා දී ඇති නිර්ණායක මත පදනම් විය යුතුය.

වගු අංක 1 : විදේශ ව්‍යවහාර මුදල් ණය ගැනීමේ සීමාවන්, නිර්ණායක සහ අවශ්‍ය අනුමැතීන්

ස්ථරය	නිර්ණායක	විදේශ ව්‍යවහාර ණය මුදල් සීමාව මුළු වත්කම් වලින් ප්‍රතිශතයක් ලෙස	අවශ්‍ය අනුමැතීන්
1.	ණය ලබා ගැනීමේ දී 8.2 වගන්තියෙහි දක්වා ඇති විචක්ෂණශීලී අවශ්‍යතා සපුරාලන බලපත්‍රලාභී මුදල් සමාගම්	10.0	ණය මුදල් ලබා ගැනීමට පෙර සහ පසු අධ්‍යක්ෂවරයාට දැනුම් දීම
2.	i 1 වන ස්ථරයේ නිර්ණායක සපුරා තිබීම ii අවම ප්‍රාග්ධන අවශ්‍යතාවයට අමතරව සියයට 1 ක ප්‍රාග්ධන ස්වාරක්ෂකයක් පවත්වා ගැනීම, සහ iii ප්‍රකාශයට පත්කළ හැකි ණය ශ්‍රේණිගත කිරීමෙහි ආයෝජන ශ්‍රේණිය (බීබීබී) සහ ඊට ඉහළ අගයක් පැවතීම	10.0 ට වැඩි -15.0	අධ්‍යක්ෂවරයාගේ පූර්ව අනුමැතිය
3.	i 2 වන මට්ටමේ නිර්ණායක සපුරා තිබීම ii එවැනි ණය ගැනීම් සුරැකුමක් රහිත සහ තැන්පත්කරුවන්ගේ හිමිකම්වලට වඩා පහළ අගයක් විය යුතු සහ iii අපනයන අරමුණු සඳහා, ආනයන ආදේශන, රජයේ සංවර්ධන ව්‍යාපෘති, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර, විදේශ ආදායම් උත්පාදන ව්‍යාපෘති, මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන වෙනත් ඕනෑම අංශයක් ප්‍රමුඛතා අංශයන් සඳහා ණය ලබාදීම/ආයෝජනය කිරීම සඳහා එවැනි ණය ගැනීම් සම්පූර්ණයෙන්ම යෙදවිය යුතුය.	15.0 ට වැඩි-20.0	මුදල් මණ්ඩලයේ පූර්ව අනුමැතිය

7. අනුමැතිය සඳහා අවශ්‍යතා

7.1 ඉහත 6 වන වගන්තියේ දක්වා ඇති පරිදි විදේශ ව්‍යවහාර මුදල් ණය ගැනීම් සඳහා දැනුම් දීමේ දී හෝ අනුමැතිය ලබා ගැනීමේ දී ඕනෑම බලපත්‍රලාභී මුදල් සමාගමක් පහත සඳහන් අවශ්‍යතා සපුරාලිය යුතුය.

i 1 වන ස්ථරය

අ. බලපත්‍රලාභී මුදල් සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා දී ඇති අනුමැතිය, කොන්දේසි පත්‍රිකාව සහ අපේක්ෂා කරන විදේශ ව්‍යවහාර මුදල් ණය පිළිබඳ අදාළ අනෙකුත් විස්තර ණය පහසුකම ලබා ගැනීමට පෙර අධ්‍යක්ෂවරයාට ඉදිරිපත් කිරීම.

ආ. විදේශ මුදල් ණය ලබා ගැනීමෙන් අනතුරුව වැඩ කරන දින 3 ක් ඇතුළත ඒ පිළිබඳ විස්තර සහ බැංකු තහවුරු කිරීම් සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරයාට දැනුම් දීම.

ii. 2 වන ස්ථරය - බලපත්‍රලාභී මුදල් සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා දී ඇති අනුමැතිය, කොන්දේසි පත්‍රිකාව සහ අපේක්ෂිත විදේශ ව්‍යවහාර මුදල් ණය පිළිබඳ වෙනත් අදාළ විස්තර ඉදිරිපත් කිරීමෙන් අධ්‍යක්ෂවරයාගේ පූර්ව ලිඛිත අනුමැතිය ලබා ගැනීම.

iii. 3 වන ස්ථරය - බලපත්‍රලාභී මුදල් සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය, කොන්දේසි පත්‍රිකාව සහ අපේක්ෂිත විදේශ මුදල් ණය පිළිබඳ වෙනත් අදාළ විස්තර ඉදිරිපත් කිරීමෙන් මුදල් මණ්ඩලයේ පූර්ව ලිඛිත අනුමැතිය ලබා ගැනීම.

7.2 අධ්‍යක්ෂවරයා හෝ මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද විදේශ ව්‍යවහාර මුදල් ණය ගැනීම්, අනුමත කළ දින සිට මාස 3 ක් ඇතුළත ලබා ගත යුතුය.

8. අනෙකුත් නියමයන් සහ කොන්දේසි

8.1 බලපත්‍රලාභී මුදල් සමාගම්වල විදේශ ව්‍යවහාර මුදල් ණයට ගැනීම්, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ අදාළ විධිවිධාන හා ඒ යටතේ නිකුත් කර ඇති විධාන/රෙගුලාසි වලට අනුකූල විය යුතුය.

8.2 බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් අවම ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතයන්, අවම මූලික ප්‍රාග්ධනය සහ ද්‍රවශීල වත්කම් විධානයන් ද ඇතුළත්ව නමුත් එම විධානවලට පමණක් සීමා නොවී විචක්ෂණශීලී අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතුය.

8.3 බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් ගනු ලබන විදේශ ව්‍යවහාර මුදල් ණය භාවිත කළ යුත්තේ ප්‍රතිපාර්ශවය සමඟ ණය ගිවිසුමේ දක්වා ඇති අරමුණු සඳහා පමණි.

8.4 බලපත්‍රලාභී වාණිජ බැංකු හරහා ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ විනිමය හුවමාරු පහසුකම් සඳහා පවතින මාර්ගෝපදේශයන්ට අනුකූලව විනිමය හුවමාරු පහසුකම යොදා ගනිමින් විදේශ ව්‍යවහාර මුදල් ණයවල පවතින විදේශ විනිමය අවදානම වැළැක්වීම සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් කටයුතු කළ යුතුය. තවද, සුදුසු වෙළඳපොල ව්‍යුත්පන්න උපකරණ භාවිතා කිරීමෙන් සහ එවැනි විදේශ ව්‍යවහාර මුදල් ණය ගැනීමෙන් ඇති වන පොලී අනුපාත අවදානම කළමනාකරණය කිරීමෙන් පොලී ගෙවීමේදී ඇතිවන විදේශ විනිමය අවදානම සඳහා සුදුසු ක්‍රමෝපායන් යෙදවිය යුතුය.

8.5 පොලී අනුපාතය, අවදානම ආවරණ පිරිවැය සහ ණය ගැනීමට අදාළ සමස්ත පිරිවැය ඇතුලුව මුළු ණය ගැනීමේ පිරිවැය, තැන්පතු හා ණය උපකරණ මත උපරිම පොලී අනුපාත විධානයෙහි සහ ඒ සඳහා වන ඕනෑම සංශෝධනයක දක්වා ඇති ණය උපකරණ සඳහා නියම කර ඇති පොලී අනුපාතයන්හි උපරිම සීමාවට වඩා අඩු විය යුතුය.

9. සංක්‍රාමී සැලසීම්

විදේශ ව්‍යවහාර මුදල් ණය ලබාගෙන ඇති ඕනෑම බලපත්‍රලාභී මුදල් සමාගමක් මෙම විධානයන් නිකුත් කළ දිනය වන විට විධානයේ සඳහන් උපරිම සීමාවන් ඉක්මවා ඇති නම් ඉහත 6 වන වගන්තිය යටතේ දක්වා ඇති පරිදි දැනට තිබෙන විධිවිධානවලට අනුව සේවා සැපයීමට අවසර දෙනු ඇත.

10. අර්ථ නිරූපණයන්

10.1 'විදේශ ව්‍යවහාර මුදල්' යන්නෙන් අදහස් කරන්නේ ඕනෑම නම් කළ විදේශ ව්‍යවහාර මුදලක් වේ.

10.2 'අධ්‍යක්ෂ' යන්නෙන් අදහස් කරන්නේ ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා වේ.

10.3 'මුළු වත්කම්' යන්න බලපත්‍රලාභී මුදල් සමාගමෙහි බාහිර විගණක විසින් සහතික කරන ලද නවතම වාර්ෂික විගණනය කළ මූල්‍ය ප්‍රකාශන හෝ අතුරු මූල්‍ය ප්‍රකාශනවලට අනුව වත්කම් ප්‍රමාණය වේ.

මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

2021 අංක 06 දරන චක්‍රලේඛය 2021 ජූනි 09

කොවිඩ්-19 නිසා බලපෑමට ලක් වූ ව්‍යාපාර හා පුද්ගලයන් සඳහා සහන සැලසීම

කොවිඩ්-19 ව්‍යසනයේ තෙවන ව්‍යාප්තිය හමුවේ පීඩාවට පත් ණය ගැනුම්කරුවන්/පාරිභෝගිකයන්ට සහන සැලසීම සම්බන්ධව රාජ්‍ය ආයතන සහ අනෙකුත් පාර්ශව රැසක් ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ඉල්ලීම් කර ඇත. ඒ අනුව, කොවිඩ්-19 ව්‍යසනයේ තෙවන ව්‍යාප්තිය නිසා ව්‍යාපාර හා පුද්ගලයන් විසින් මුහුණපා ඇති ගැටලු සලකා බලමින්, බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් (මින් ඉදිරියට බැංකු නොවන මූල්‍ය ආයතන ලෙස හැඳින්වෙන) විසින් බලපෑමට ලක්ව ඇති ව්‍යාපාර හා පුද්ගලයන් වෙත ලබා දී ඇති ණය සහන යෝජනා ක්‍රමය (මින් ඉදිරියට යෝජනා ක්‍රමය ලෙස හැඳින්වෙන) යටතේ තවදුරටත් පහත සහනයන් ලබා දීමට කටයුතු කරන ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බැංකු නොවන මූල්‍ය ආයතන වෙතින් ඉල්ලා සිටී. කොවිඩ්-19 ව්‍යාප්තිය හේතුවෙන් පීඩාවට පත් වූ ව්‍යාපාර හා පුද්ගලයන්ගේ ඉල්ලීම පරිදි, මෙම චක්‍රලේඛය යටතේ ලබා දී ඇති සමස්ත ප්‍රතිලාභ අඩු නොවන අයුරින් අමතර සහන සැලසීම සඳහා බැංකු නොවන මූල්‍ය ආයතනවලට හැකියාව ඇත. මෙම යෝජනා ක්‍රමය සියලු බැංකු නොවන මූල්‍ය ආයතන විසින් ඒකාකාරී ලෙස ක්‍රියාත්මක කරවීම සඳහා සහ ව්‍යාපාර හා ආදායම් ඉපයීමේ කටයුතුවල සිදුව ඇති ඇනහිටීම් හේතුවෙන් ණය ගැනුම්කරුවන් හට ණය වාරික ආපසු ගෙවීමේ දී ඇතිවන පීඩාව ලිහිල් කිරීමේ අරමුණින් මෙම චක්‍රලේඛය නිකුත් කර ඇත.

1. 2021 මැයි 15 දින වන විට සක්‍රීයව පැවති ණය පහසුකම් කල් දැමීම සහ ප්‍රතිව්‍යුහගත කිරීම

(අ) සුදුසුකම්ලත් ණය ගනුදෙනුකරුවන් මුහුණ දී ඇති මූල්‍ය දුෂ්කරතා, එනම් රැකියා අහිමිවීම, ආදායම් අහිමිවීම හෝ ආදායම/වැටුප් අඩු වීම හෝ විකුණුම් අඩු වීම, ව්‍යාපාර වසා දැමීම යනාදිය සලකා බලා කොවිඩ්-19 තෙවන ව්‍යාප්තියෙන් පීඩාවට පත් වූ ණය ගනුදෙනුකරුවන්ගේ දැනට පවතින ණය පහසුකම්වල මුල් ණය මුදල හෝ පොලිය හෝ එම කොටස් දෙකම හෝ 2021 අගෝස්තු 31 දක්වා කාලය තුළ එක් එක් අවස්ථාව අනුව අය කර ගැනීම කල් දැමීමට බැංකු නොවන මූල්‍ය ආයතන විසින් කටයුතු කළ යුතුය.

(ආ) සුදුසුකම්ලත් ණය ගනුදෙනුකරුවන්ට ලබා දී ඇති ණය පහසුකම් එකක් හෝ ඊට වැඩි ගණනක මුල් ණය මුදල හෝ පොලිය හෝ ඒ දෙකම ගෙවීම කල් දැමීම, එම ගනුදෙනුකරුවන් විසින් මුහුණපා ඇති මූල්‍ය දුෂ්කරතා සහ ගනුදෙනුකරුගේ ආපසු ගෙවීමේ හැකියාව සැලකිල්ලට ගනිමින් සිදු කළ යුතුය.

(ඇ) ඉහත කල් දැමීම සඳහා සලකා බැලූ ණය පහසුකම් සඳහා, බැංකු නොවන මූල්‍ය ආයතන විසින් කල් දමන ලද කාලසීමාව සඳහා සහ කල් දමන ලද මුදල මත පමණක් 2021 මැයි 19 දින පැවති දින 364 භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසි අනුපාතයට සියයට 5.5 ක් එකතු කළ අගය නොඉක්මවන වාර්ෂික පොලී අනුපාතයක් අය කළ හැකිය. එනම් (5.18% + 5.5% = වසරකට 10.68%).

(ඈ) විකල්පයක් ලෙස, ණය ගනුදෙනුකරුගේ ආපසු ගෙවීමේ හැකියාව සහ පිළිගත හැකි ව්‍යාපාර නගා සිටුවීමේ සැලැස්මක් (Revival Plan) ඉදිරිපත් කිරීම සැලකිල්ලට ගනිමින්, දැනට පවතින ණය පහසුකම් දීර්ඝ කාලයක් සඳහා ප්‍රතිව්‍යුහගත කිරීමට බැංකු නොවන මූල්‍ය ආයතනවලට හැකියාව පවතින අතර මෙහිදී බැංකු නොවන මූල්‍ය ආයතන සහ ණය ගැනුම්කරු විසින් දැනට පවතින අඩු පොලී අනුපාතයන් සැලකිල්ලට ගනිමින් සුදුසු පොලී අනුපාතයකට එකඟ විය යුතුය.

(ඉ) ණය සහන කාලය තුළ එනම් 2021 මැයි 15 සිට 2021 අගෝස්තු 31 දක්වා දඩ පොලිය එකතු කිරීමක් හෝ අය කිරීමක් සිදු නොකළ යුතුය.

(ඊ) දැනට පවතින සංචරණ සීමා හේතුවෙන් බලපෑමට පත් ගනුදෙනුකරුවන් විසින් ණය ආපසු ගෙවීමේ නියමිත දිනය, දින කිහිපයකින් (උපරිම වැඩ කරන දින 10 ක් දක්වා) කල් දැමීමට කරන ඕනෑම ඉල්ලීමක් සඳහා ණය පහසුකම් කල් දැමීමක් හෝ ප්‍රතිව්‍යුහගත කිරීමක් ලෙස සැලකීමෙන් තොරව අවස්ථාව ලබා දිය යුතු අතර, බැංකු නොවන මූල්‍ය ආයතන විසින් ගනුදෙනුකරුවන්ගේ එවැනි ප්‍රමාදයන් සඳහා කිසිදු අමතර පොලියක් හෝ වෙනත් ගාස්තු අය නොකළ යුතුය.

(උ) 2021 මාර්තු 12 දින නිකුත් කරන ලද 2021 අංක 04 දරන චක්‍රලේඛය යටතේ කල්බදු මූල්‍යකරණ පහසුකම් ආපසු ගෙවීම් කල් දැමීමේ සහන භුක්ති විඳින හෝ 2021 මාර්තු 19 දින නිකුත් කරන ලද 2021 අංක 05 දරන චක්‍රලේඛය යටතේ ණය සහන ලබා ගත් ණය ගනුදෙනුකරුවන් ඉහත සහන සඳහා සුදුසුකම් නොලබනු ඇත.

2. 2021 මැයි 15 දිනට අක්‍රීය කාණ්ඩයේ පැවති ණය පහසුකම් සඳහා හිමිවන සහන

(අ) ණය ලබා ගත් තැනැත්තාගේ ආපසු ගෙවීමේ හැකියාව සහ පිළිගත හැකි ව්‍යාපාර නගා සිටුවීමේ සැලැස්මක් ඉදිරිපත් කිරීම සැලකිල්ලට ගනිමින් 2021 මැයි 15 දින වන විට අක්‍රීය තත්ත්වයේ පවතින ණය පහසුකම්, දීර්ඝ කාලයක් සඳහා ප්‍රතිලේඛනගත කිරීමට බැංකු නොවන මූල්‍ය ආයතන වෙත හැකියාව පවතින අතර මෙහිදී, පොලී අනුපාත ඇතුලු නියමයන් හා කොන්දේසි සම්බන්ධව බැංකු නොවන මූල්‍ය ආයතනය සහ ණය ගැනුම්කරු එකඟතාවයකට පැමිණිය යුතු වේ.

(ආ) 2 (අ) හි සඳහන් කර ඇති පරිදි, මෙම යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලේඛනගත කිරීම සඳහා සලකනු ලබන පහසුකම් සඳහා 2020 අප්‍රේල් 01 දින සිට 2021 මැයි 15 දින දක්වා කාලය තුළ එකතු කර ඇති හෝ අය කර ඇති දඩ පොලී කපා හැරීමට බැංකු නොවන මූල්‍ය ආයතන කටයුතු කළ යුතුය.

(ඇ) මෙම චක්‍රලේඛය යටතේ සුදුසුකම් ලබන ණය ගනුදෙනුකරුවන්ගේ 2020 අප්‍රේල් 01 දින හෝ ඊට පසුව අක්‍රීය ණය ලෙස වර්ගීකරණය කර ඇති ණය පහසුකම් වලට අදාළව සියලුම අත්පත් කර ගැනීමේ ක්‍රියාමාර්ග 2021 අගෝස්තු 31 දක්වා අත්හිටුවීමට බැංකු නොවන මූල්‍ය ආයතන විසින් කටයුතු කළ යුතුය.

(ඈ) බැංකු නොවන මූල්‍ය ආයතන විසින් ණය සහන ලබා දීමේ දී අධික ගාස්තු හෝ අය කිරීම් එකතු නොකළ යුතුය.

3. පැහැදිලිවම පීඩාවට පත් වූ ගනුදෙනුකරුවන් සඳහා 2021 ජූනි 30 දක්වා කාල සීමාව තුළ, ණය කාඩ්පත් සහ වෙනත් ණය පහසුකම් සඳහා ප්‍රමාද ගාස්තු අය කිරීම අත්හිටුවීම සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන කටයුතු කළ යුතුය.

4. පවත්නා ණය පහසුකම/පහසුකම් කල් දැමීම හෝ ප්‍රතිව්‍යුහගත කිරීම වෙනුවට ණය ගනුදෙනුකරු විසින් ඔහුගේ/ඇයගේ පවත්නා ණය පහසුකම් 2021 අගෝස්තු 31 දින වන විට පියවා අවසන් කිරීමට ඉල්ලා සිටී නම් එවැනි පහසුකම් සඳහා කිසිදු පූර්ව පියවීමේ ගාස්තුවක් අය කිරීමෙන් වැලකී සිටීමට බැංකු නොවන මූල්‍ය ආයතන කටයුතු කළ යුතුය.

5. ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය (CRIB) වෙත වාර්තා කිරීම්

(අ) බැංකු නොවන මූල්‍ය ආයතන විසින් මෙම යෝජනා ක්‍රමය යටතේ සුදුසුකම් ලබන ණය ගනුදෙනුකරුවන්ගේ ණය අයදුම්පත්, හුදෙක් අසතුටුදායක ණය තොරතුරු වාර්තාවක් මත පමණක් පදනම්ව ප්‍රතික්ෂේප කිරීමෙන් වැළකිය යුතුය.

(ආ) මෙම යෝජනා ක්‍රමයට සහභාගී වීම ණය ගැනුම්කරුවන්ගේ ඉදිරි ණය තොරතුරු වාර්තා සහ අනාගත ණය ශ්‍රේණිය කෙරෙහි බලපෑමක් ඇති නොවන ආකාරයෙන්, මෙම යෝජනා ක්‍රමය යටතේ ලබා දී ඇති ණය ආපසු ගෙවීම කල් දැමීම්/ ප්‍රතිව්‍යුහගත කිරීම් වාර්තා කිරීම සඳහා ක්‍රමවේදයක් බැංකු නොවන මූල්‍ය ආයතන විසින් ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය සමඟ සාකච්ඡා කර සකස් කළ යුතු වේ.

6. ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමේ අවසාන දිනය

(අ) ඉහත ණය සහන සඳහා සුදුසුකම්ලත් ණය ගනුදෙනුකරුවන් 2021 ජූලි 15 දිනට හෝ ඊට පෙර ලිඛිතව හෝ විද්‍යුත් මාර්ගයෙන් ඉල්ලීමක් කළ යුතු අතර බැංකු නොවන මූල්‍ය ආයතන විසින් මෙම ණය සහනයන්, අයදුම් කළ යුතු අවසාන දිනය සහ අයදුම්පතේ ආකෘතිය මුද්‍රිත සහ/හෝ විද්‍යුත් මාධ්‍යයෙන් (විද්‍යුත් තැපැල් සහ කෙටි පණිවිඩ සේවා ඇතුළත්ව) සන්නිවේදනය කිරීමට කඩිනමින් කටයුතු කළ යුතුය.

(ආ) සාධාරණ හේතුවක් මත ණය සහන සඳහා ඉල්ලුම් කිරීම ප්‍රමාද වී ඇත්නම් පමණක්, 2021 ජූලි 15 දිනෙන් පසු ඉදිරිපත් කරන ඕනෑම ඉල්ලුම්පතක් බැංකු නොවන මූල්‍ය ආයතන විසින් පිළිගත යුතුය.

(ඇ) සුදුසුකම් ලද මුත් ණය ආපසු ගෙවීමේ හැකියාව ඇති ණය ගනුදෙනුකරුවන් විසින් ණය පහසුකම් කල් දැමීම හෝ ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා අයදුම් කිරීම වෙනුවට ණය ආපසු ගෙවීම සඳහා කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

(ඈ) මෙම ණය සහන සඳහා අයදුම් කරනු ලබන ණය ගනුදෙනුකරුවන්ගේ ඉල්ලීම් අනුමත කිරීමට පෙර අදාළ ණය පහසුකම් කල් දැමීම හෝ ප්‍රතිව්‍යුහගත කිරීමේ ආකාරය පිළිබඳව දැනුවත් කිරීමට බැංකු නොවන මූල්‍ය ආයතන කටයුතු කළ යුතු අතර, එවැනි ඉල්ලීම් ප්‍රතික්ෂේප කිරීමේදී ද ඒ සඳහා හේතු පැහැදිලිව සඳහන් කිරීමට බැංකු නොවන මූල්‍ය ආයතන කටයුතු කළ යුතුය.

7. ණය සහන කාල සීමාව සම්බන්ධව ගිණුම් තැබීම

බැංකු නොවන මූල්‍ය ආයතන විසින් ණය සහන කාල සීමාවට අදාළව ගිණුම් තැබීමේ දී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2020 දෙසැම්බර් 31 දින නිකුත් කරන ලද ලිපියේ අන්තර්ගත අතිරේක උපදෙස් අනුව කටයුතු කළ යුතුය. බැංකු නොවන මූල්‍ය ආයතන හට මේ සම්බන්ධව අමතර මඟ පෙන්වීමක් අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයෙන් හෝ විගණකවරුන්ගෙන් විමසිය හැක.

8. වාර්තාකරණ අවශ්‍යතා

2021 ජූලි 30 දින සිට සෑම මසකම වැඩකරන දින 15 ක් තුළ දී බැංකු නොවන මූල්‍ය ආයතන විසින් එම ආයතන වලින් ණය සහන ලබාගෙන ඇති ගනුදෙනුකරුවන් පිළිබඳ තොරතුරු බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත වාර්තා කළ යුතුය. තොරතුරු ඉදිරිපත් කළ යුතු ආකෘතිය ඉදිරියේ දී යොමු කරනු ලැබේ.

මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

දේශීය භාණ්ඩාගාර බිල්පත් අඥාපනත සහ ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් අඥාපනත යටතේ නිකුත් කරනු ලබන 2021 අංක 01 දරන විධානය

2021 ජූලි 09

ප්‍රාථමික අලෙවිකාර සමාගම්වල අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය

1923 අංක 08 දරන දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥා පනත සහ 1937 අංක 07 දරන ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥා පනත යටතේ පැවරී ඇති බලතල මත මුදල් අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලද, පිළිවෙලින්, 2009 අංක 01 දරන දේශීය භාණ්ඩාගාර බිල්පත් (ප්‍රාථමික අලෙවිකරුවන්) නියෝගයෙහි 11 (1) සමඟ කියවිය යුතු විධාන 6 (1) හෝ එහි සංශෝධනයන් සහ 2009 අංක 01 දරන ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් (ප්‍රාථමික අලෙවිකරුවන්) නියෝගයෙහි 11 (1) සමඟ කියවිය යුතු විධාන 6 (1) හෝ එහි සංශෝධනයන් යටතේ ප්‍රාථමික අලෙවිකරුවන්ගේ පද්ධතියෙහි ශක්‍යතාවය සහ ස්ථාවරත්වය සලකා මුදල් මණ්ඩලය විසින් ප්‍රාථමික අලෙවිකාර සමාගම්වල අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය සඳහා පහත පරිදි විධානයන් නිකුත් කරනු ලැබේ.

1. දේශීය භාණ්ඩාගාර බිල්පත් (ප්‍රාථමික අලෙවිකරුවන්) නියෝගයන් සහ ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් (ප්‍රාථමික අලෙවිකරුවන්) නියෝගයන් යටතේ බලගැන්වීම

1.1 ප්‍රාථමික අලෙවිකරුවන්ගේ ප්‍රාග්ධනය, සංචිත, ප්‍රාග්ධන ප්‍රමාණාත්මක බව සහ අනෙකුත් විචක්ෂණශීලී සහ මෙහෙයුම් අවශ්‍යතාවයන් මත පනවන ලද විධානයන්ද ඇතුළත් නියෝගයන් සමඟ අනුකූල වීම තහවුරු කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2009 අංක 01 දරන දේශීය භාණ්ඩාගාර බිල්පත් (ප්‍රාථමික අලෙවිකරුවන්) නියෝගයෙහි 11 (1), හෝ එහි සංශෝධනයන් සහ 2009 අංක 01 දරන ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් (ප්‍රාථමික අලෙවිකරුවන්) නියෝගයෙහි 11 (1) හෝ එහි සංශෝධනයන් ප්‍රකාරව විධානයන් නිකුත් කළ හැකිය.

1.2 ප්‍රාථමික අලෙවිකරුවන්ගේ පද්ධතියෙහි ශක්‍යතාවය සහ ස්ථාවරත්වය සලකා 2009 අංක 01 දරන දේශීය භාණ්ඩාගාර බිල්පත් (ප්‍රාථමික අලෙවිකරුවන්) නියෝගයෙහි 6 (1) හෝ එහි සංශෝධනයන්ට සහ 2009 අංක 01 දරන ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් (ප්‍රාථමික අලෙවිකරුවන්) නියෝගයෙහි 6 (1) හෝ එහි සංශෝධනයන්ට අනුව මුදල් මණ්ඩලය විසින් ප්‍රාථමික අලෙවිකාර සමාගමක් පවත්වා ගත යුතු ප්‍රාග්ධන ප්‍රමාණය තීරණය කරනු ලබන අතර එම තීරණ වරින් වර වෙනස් වනු ඇත.

2. අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය

2.1 සියලුම ප්‍රාථමික අලෙවිකාර සමාගම් විසින් 2021.12.31 දින දක්වා සෑම විටම රුපියල් බිලියන 1 කට නොඅඩු මූලික ප්‍රාග්ධනයක් පවත්වා ගත යුතු අතර ඉන් පසුව එම ප්‍රාග්ධන මට්ටම පහත වගුවේ සඳහන් මට්ටමට නොඅඩු මට්ටමක අදාළ දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි පවත්වා ගත යුතුය.

වගු අංක 1- ප්‍රාථමික අලෙවිකාර සමාගම් සඳහා අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය

ක්‍රියාත්මක වන දිනය	වටිනාකම (රු. බිලියන)
2022.01.01	2.0
2023.01.01	2.5

3. විශේෂිත අවදානම් සංචිතය

3.1 ප්‍රාථමික අලෙවිකාර සමාගම් සහ එම පද්ධතියේ සුරක්ෂිතාවය, ශක්තිමත් බව සහ ස්ථාවරත්වය ප්‍රවර්ධනය කිරීම සහ ප්‍රාථමික අලෙවිකාර සමාගම්වල ප්‍රාග්ධන පදනම වර්ධනය කිරීම සඳහා සියලුම ප්‍රාථමික අලෙවිකාර සමාගම් විශේෂිත අවදානම් සංචිතයක් සෑම විටම පවත්වා ගත යුතුය.

3.2 සියලුම ප්‍රාථමික අලෙවිකාර සමාගම් විසින් සෑම මූල්‍ය වර්ෂයක ම විගණනය කරන ලද ලාභයෙන් (බදුවලට පසු) 10% කට නොඅඩු ප්‍රතිශතයක් විශේෂිත අවදානම් සංචිතයට මාරු කළ යුතුය.

3.3 ඉහත විධාන 3.2 එසේ වුවද, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා (අධ්‍යක්ෂ) ඕනෑම අවස්ථාවක, ඉහත විධාන 3.2 හි සඳහන් වටිනාකමට වැඩි වටිනාකමක් මාරු කිරීමට ප්‍රාථමික අලෙවිකාර සමාගමකට නියෝග කළ හැක.

3.4 විධාන 3.2 හි සඳහන් වටිනාකමට අඩු අගයක් මාරු කිරීමට හෝ විශේෂිත අවදානම් සංචිතයෙහි අගය අඩු කිරීමට ප්‍රාථමික අලෙවිකාර සමාගමක් අධ්‍යක්ෂ වෙත අයදුම් කරනු ලදුව, එම සමාගමේ කාර්යසාධනය, ප්‍රාග්ධන තත්ත්වය සහ අවදානම් ආකෘතිය තක්සේරු කර අධ්‍යක්ෂ විසින් අවශ්‍ය යැයි බලාපොරොත්තු වන නියමයන් සහ කොන්දේසිවලට යටත්ව අනුමැතිය ලබාදිය හැකිය.

4. ප්‍රාග්ධන තක්සේරුව සහ සැලසුම්කරණ ක්‍රියාවලිය

4.1 සෑම ප්‍රාථමික අලෙවිකාර සමාගමක් සතුව, ප්‍රාග්ධන මට්ටම නිර්ණයට සහ සාමාන්‍ය සහ ආතති අවස්ථාවන්හිදී සියලුම, තක්සේරු කළ හැකි අවදානම් සැලකිල්ලට ගෙන ගණනය කළ ස්වාරක්ෂක මට්ටම තීරණය කළ හැකි, ශක්තිමත් ප්‍රාග්ධන තක්සේරු ක්‍රියාවලියක් තිබිය යුතුය.

4.2 සෑම ප්‍රාථමික අලෙවිකාර සමාගමක් සතුව අවම තෙවසරක් සඳහා සිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද කාල සීමා සහිත ප්‍රාග්ධන සැලසුමක් තිබිය යුතු අතර, එය සමාගමේ උපාය මාර්ග, අවදානම් පැතිකඩ සහ නීතිමය අවශ්‍යතාවයන්ට අනුගත වර්තමාන සහ අනාගත ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලන මාර්ගයක් නියම කළ යුතුය. එවැනි සැලසුමක් මඟින් අනාගත ව්‍යාප්තීන්, වෙනත් අරමුදල් මූලාශ්‍ර, විසර්ජන ප්‍රතිපත්ති සහ සිදුවිය හැකි අවිනිශ්චිතතා ආවරණය විය යුතුය.

4.3 මෙම විධානයන් බලපැවැත්වෙන දින වන විට හෝ ඉන්පසු ඕනෑම අවස්ථාවක යම් ප්‍රාථමික අලෙවිකාර සමාගමක් සතු මූලික ප්‍රාග්ධනය රුපියල් බිලියන 2.5 ට අඩු මට්ටමක පවතී නම් සහ එම හිඟය මාස 3ට වැඩි කාලයක් පවතී නම්, එබඳු සමාගමක්, ඉහත විධාන 2.1 මඟින් නියම කරන ලද අවම ප්‍රාග්ධන අවශ්‍යතාවයන් හා දිනයන්ට අනුකූල වන සහ අධ්‍යක්ෂට එකඟ විය හැකි, කාල සීමාවන් සහිත ප්‍රාග්ධන වර්ධන සැලැස්මක් ඉදිරිපත් කළ යුතුය.

5. විසර්ජනය

5.1 සෑම ප්‍රාථමික අලෙවිකාර සමාගමක් සතුව ඉපයුම් විසර්ජනය කිරීමේ නිර්ණායක නියම කෙරෙන, එහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද, ඉපයුම් විසර්ජන ප්‍රතිපත්තියක් පැවතිය යුතුය.

5.2 ප්‍රාථමික අලෙවිකාර සමාගමක් විසින් විසර්ජනයකට පෙර, එම විසර්ජනය පිළිබඳව තොරතුරු අධ්‍යක්ෂ වෙත දැනුම් දිය යුතු අතර, පහත සඳහන් අවස්ථාවන්හිදී අධ්‍යක්ෂගේ පූර්ව අනුමැතිය ලිඛිතව ලැබිය යුතුය.

(i) අදාළ කාලපරිච්ඡේදයේ සමුච්චිත විසර්ජනය (යෝජිත විසර්ජනයද ඇතුළුව) එම කාල පරිච්ඡේදයෙහි බදු පසු ලාභය ඉක්මවා යන්නේ නම් හෝ පවතින නවතම මූල්‍ය ප්‍රකාශවලට අනුව ප්‍රාථමික අලෙවිකාර සමාගමක් විසින් එම සමුච්චිත අලාභයක් ඇති විට; හෝ

(ii) විසර්ජනය සිදු කිරීම සඳහා පෙර මූල්‍ය වර්ෂයේ ඉපැයීම් භාවිත කිරීමට අවශ්‍ය වන විට; හෝ

(iii) යෝජිත විසර්ජනයට පෙර හෝ පසු මූල්‍ය වර්ෂවල සමුච්චිත ඉපැයීම් සෘණ වන අවස්ථාවක; හෝ

(iv) යෝජිත විසර්ජනයට පෙර හෝ පසු මූලික ප්‍රාග්ධනය රුපියල් බිලියන 2.5 කට අඩු අගයක් ගන්නා විට

5.3 ප්‍රාථමික අලෙවිකාර සමාගමක්, අතුරු විසර්ජනයක් හෝ විගණනය කළ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ ලැබීමට පෙර විසර්ජනයක් කිරීමට තීරණය කල අවස්ථාවක, නවතම මූල්‍ය ප්‍රකාශවලට අනුව එම විසර්ජනයට අදාළ වන කාල පරිච්ඡේදයේ බදු පසු ලාභයෙන් ඉහත විධාන 3.2, 3.3 සහ 3.4 මඟින් දක්වා ඇති ප්‍රමාණයන්ට නොඅඩු අගයක් රඳවා ගත යුතුය.

5.4 ප්‍රාථමික අලෙවිකාර සමාගමක් විසර්ජනයට අදාළ වන කාල පරිච්ඡේදයේ අවසානය වන විට විධාන 2.1 න් නියම කරනු ලබන අවම ප්‍රාග්ධන අවශ්‍යතාවයට හෝ අවදානම් මත බර තබන ලද අවම ප්‍රාග්ධන අවශ්‍යතා අනුපාතයට හෝ අනුකූල වීමට අසමත් වූ විට හෝ, යෝජිත විසර්ජනයකට පසු එම අවශ්‍යතා සමඟ අනුකූල නොවන්නේ නම් එබඳු ප්‍රාථමික අලෙවිකාර සමාගමක්, එම විධානයන්ට අනුකූල වී එය අධ්‍යක්ෂ වෙත තහවුරු කරන තුරු, තවදුරටත් කිසිදු විසර්ජනයක් සිදු නොකළ යුතුය.

5.5 සෑම ප්‍රාථමික අලෙවිකාර සමාගමක් ම ඔවුන්ගේ විසර්ජනය සම්බන්ධයෙන් වන නීතිමය සහ/හෝ නියාමන අවශ්‍යතා සමඟ අනුකූල වන බවට සහතික විය යුතුය.

5.6 සමාගමේ ලාභයක් හෝ අලාභයක් අනිසි ලෙස පැවරීමේ අරමුණින් ප්‍රාථමික අලෙවිකාර සමාගමක් කිසිඳු පාර්ශවයක් සමඟ ගනුදෙනු නොකළ යුතුය.

6. අනාවරණය කිරීම්

6.1 ප්‍රාථමික අලෙවිකාර සමාගමක් විසින් ඔවුන්ගේ වාර්ෂික විගණනය කළ මූල්‍ය ප්‍රකාශන සමඟ පැහැදිලි කිරීමේ සටහන් මඟින් අනාවරණය කළ යුත්තේ;

(i) ප්‍රාථමික අලෙවිකාර සමාගමක් ඉහත විධාන 2.1 නියම කරන ලද අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය අදාළ කාල රාමුව තුළ දී සම්පූර්ණ කිරීමට අපොහොසත් වන විට එම හිඟ අවම ප්‍රාග්ධන වටිනාකම පිළිබඳව,

(ii) ආයතනයේ අවම ප්‍රාග්ධනය ඉහත විධාන 2.1 නියම කරන ලද අවම ප්‍රාග්ධන අවශ්‍යතාවයට වඩා අඩු මට්ටමකට ක්ෂය වීමට හේතුවන යම් සිදුවීමක් මූල්‍ය ප්‍රකාශන දිනයක් එම ප්‍රකාශන නිකුත් කිරීමට අවසර ලබා දුන් දිනයත් අතර කාල සීමාව තුළ සිදු වී ඇත්නම් ඒ පිළිබඳව,

7. ක්‍රියාත්මක වන දිනය සහ පෙර විධානයන් අවලංගු කිරීම

7.1 මෙම විධානයන් 2021.08.01 දින සිට බලපැවැත් වේ.

7.2 2015 අංක 01 දරන ප්‍රාථමික අලෙවිකාර සමාගම් (අවම මූලික ප්‍රාග්ධනය) සඳහා වන විධානය මෙයින් අවලංගු කරන ලදී.

8. අර්ථ නිරූපණයන්

8.1 මෙම විධානයන්හි අරමුණ සඳහා,

(i) "විසර්ජනය" යන්නට 2007 අංක 07 දරන සමාගම් පනත හෝ එහි සංශෝධනයන් හි ලබා දී ඇති අර්ථ නිරූපණය අදාළ විය යුතුය.

(ii) "ප්‍රාථමික අලෙවිකාර සමාගම" යන්නෙන්, 2009 අංක 01 දරන දේශීය භාණ්ඩාගාර බිල්පත් (ප්‍රාථමික අලෙවිකරුවන්) හෝ එහි සංශෝධනයන් සහ 2009 අංක 01 දරන ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් (ප්‍රාථමික අලෙවිකරුවන්) හෝ එහි සංශෝධනයන් යන නියෝගයන් යටතේ ප්‍රාථමික අලෙවිකරුවකු ලෙස පත් කරන ලද ලියාපදිංචි බලපත්‍රලාභී වාණිජ බැංකුවක් නොවන සමාගමක් යන්න අර්ථ නිරූපණය වේ.

(iii) "අවදානම් මත බර තබන ලද ප්‍රාග්ධන අවශ්‍යතා අනුපාතය" යන්න 2006.06.22 දිනැති අවදානම් මත බර තබන ලද ප්‍රාග්ධන අවශ්‍යතා රාමුව සඳහා වන විධානය හෝ එහි සංශෝධනයන්ට අනුව ගණනය කෙරෙන අනුපාතය මඟින් අර්ථ ගැන්වේ.

(iv) මූලික ප්‍රාග්ධනය යන්නෙන්, 2009 අංක 01 දරන දේශීය භාණ්ඩාගාර බිල්පත් (ප්‍රාථමික අලෙවිකරුවන්) නියෝගයෙහි හෝ එම සංශෝධනයෙහි සහ 2009 අංක 01 දරන ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් (ප්‍රාථමික අලෙවිකරුවන්) හෝ සංශෝධනයෙහි නිර්වචනය කරන ලද පළමු පෙළ ප්‍රාග්ධනය අදහස් වේ.

මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

2021 අංක 07 දරන චක්‍රලේඛය 2021 සැප්තැම්බර් 10

කොවිඩ්-19 නිසා බලපෑමට ලක් වූ ව්‍යාපාර හා පුද්ගලයන් සඳහා සහන සැලසීම සඳහා නිකුත් කරන ලද 2021 අංක 06 දරන චක්‍රලේඛය සඳහා සංශෝධන

කොවිඩ්-19 නිසා බලපෑමට ලක් වූ ව්‍යාපාර හා පුද්ගලයන් සඳහා සහන සැලසීම සඳහා නිකුත් කරන ලද 2021 අංක 06 දරන චක්‍රලේඛය සඳහා පහත සංශෝධනයන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබයි.

අංක 1 (අ), 1(ඉ), 1(ඊ), 2(ඇ) ඡේද සහ අංක 4 ඡේද පහත පරිදි සංශෝධනය කරන අතර අනෙකුත් සියලුම වගන්ති නොවෙනස්ව පවතී.

1 (අ) 2021 අංක 06 දරන චක්‍රලේඛය යටතේ ණය කල් දැමීම භුක්ති විඳින ණය ගනුදෙනුකරුවන්ගේ දැනට පවතින ණය පහසුකම්වල මුල් ණය මුදල, පොලිය හෝ එම දෙකොටසම හෝ අයකර ගැනීම, 2021 සැප්තැම්බර් 30 දක්වා කල් දැමීමට බැංකු නොවන මූල්‍ය ආයතන විසින් කටයුතු කළ යුතුය.

(ඉ) සහන කාලය තුළ එනම්, 2021 සැප්තැම්බර් 30 දක්වා දඩ පොලිය එකතු කිරීමක් හෝ අය කිරීමක් සිදු නොකළ යුතුය.

(ඊ) නිරෝධායන අගුළු දැමීම් හේතුවෙන් බලපෑමට පත් ගනුදෙනුකරුවන් විසින් ණය ආපසු ගෙවීමේ නියමිත දිනය, දින කිහිපයකින් (උපරිම වැඩ කරන දින 15 ක් දක්වා) කල් දැමීමට කරන ඕනෑම ඉල්ලීමක් සඳහා ණය පහසුකම් කල් දැමීමක් හෝ ප්‍රතිව්‍යුහගත කිරීමක් ලෙස සැලකීමෙන් තොරව අවස්ථාව ලබා දිය යුතුය. බැංකු නොවන මූල්‍ය ආයතන විසින් එවැනි ප්‍රමාදයන් සඳහා කිසිදු අමතර පොලියක් හෝ වෙනත් ගාස්තු අය නොකළ යුතුය.

2 (ඇ) සුදුසුකම් ලබන ණය ගනුදෙනුකරුවන්ගේ, 2020 අප්‍රේල් 01 දින හෝ ඊට පසුව අක්‍රීය ණය ලෙස වර්ගීකරණය කර ඇති ණය පහසුකම්වලට අදාළව සියලුම අත්පත් කර ගැනීමේ ක්‍රියාමාර්ග, 2021 සැප්තැම්බර් 30 දක්වා අත්හිටු වීමට බැංකු නොවන මූල්‍ය ආයතන විසින් කටයුතු කළ යුතුය.

4. පවත්නා ණය පහසුකම/පහසුකම් කල් දැමීම හෝ ප්‍රතිව්‍යුහගත කිරීම වෙනුවට ණය ගනුදෙනුකරු විසින් ඔහුගේ/ඇයගේ පවත්නා ණය පහසුකම් 2021 සැප්තැම්බර් 30 දින වන විට පියවා අවසන් කිරීමට ඉල්ලා සිටී නම්, එවැනි පහසුකම් සඳහා කිසිදු පූර්ව පියවීමේ ගාස්තුවක් අය කිරීමෙන් වැලකී සිටීමට බැංකු නොවන මූල්‍ය ආයතන කටයුතු කළ යුතුය.

මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

2021 අංක 08 දරන චක්‍රලේඛය 2021 සැප්තැම්බර් 24

ලංකා රේටින් ඒජන්සි ලිමිටඩ් පිළිගත හැකි ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනයක් ලෙස පිළිගැනීම

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලංකා රේටින් ඒජන්සි ලිමිටඩ් ආයතනය පහත සඳහන් අරමුණු සඳහා පිළිගත හැකි බාහිර ණය තක්සේරු කිරීමේ ආයතනයක් ලෙස පිළිගනු ලබයි.

(i) 2018 අංක 01 දරන ණය ශ්‍රේණිගත කිරීම් චක්‍රලේඛය;

(ii) 2018 අංක 03 දරන මුදල් ව්‍යාපාර පනත් විධාන - බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අවශ්‍යතා සහ 2018 අංක 03 දරන කල්බදු මූල්‍යකරණ පනත් විධාන - විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සඳහා ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අවශ්‍යතා;

(iii) 2020 අංක 01 දරන මුදල් ව්‍යාපාර පනත් විධාන - ණය පහසුකම් වර්ගීකරණය සහ මිනුම්කරණය සහ 2020 අංක 01 දරන කල්බදු මූල්‍යකරණ පනත් විධාන - ණය පහසුකම් වර්ගීකරණය සහ මිනුම්කරණය;

(iv) 2021 අංක 04 දරන මුදල් ව්‍යාපාර පනත් විධාන - විදේශ ව්‍යවහාර මුදල් ණය ගැනීම් සහ

(v) බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සඳහා වූ අනෙකුත් නියාමන අවශ්‍යතා.

ඒ අනුව, 2018 අංක 03 දරන මුදල් ව්‍යාපාර පනත් විධාන - බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අවශ්‍යතා සහ 2018 අංක 03 දරන කල්බදු මූල්‍යකරණ පනත් විධාන - විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සඳහා ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අවශ්‍යතා හි උපලේඛන 1 හි 2 කොටස වන අවදානම අනුව බර තබන වත්කම් හි 2.3 කොටස යටතේ සඳහන් වගු අංක 5, වගුව ඇමුණුමෙහි පරිදි සංශෝධනය කර ඇත.

ජේ පී ගමලත්
අධ්‍යක්ෂ
බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ
දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

වගු අංක 5- ශ්‍රී ලංකාවේ ණය ශ්‍රේණිගත කිරීමේ නියෝජිතායතනවල අංකනය

ෆිච් රේටින් ලංකා	ඉක්රා ලංකා ලිමිටඩ්	ලංකා රේටින් ඒජන්සි ලිමිටඩ්	ප්‍රාග්ධන අනුපාත සඳහා ශ්‍රේණිගත කිරීමේ පරිමාණය
AAA (lka)	(SL) AAA	AAA	AAA
AA+ (lka)	(SL) AA+	AA+	AA+
AA (lka)	(SL) AA	AA	AA
AA- (lka)	(SL) AA-	AA-	AA-
A+ (lka)	(SL) A+	A+	A+
A (lka)	(SL) A	A	A
A- (lka)	(SL) A-	A-	A-
BBB+(lka)	(SL) BBB+	BBB+	BBB+
BBB (lka)	(SL) BBB	BBB	BBB
BBB-(lka)	(SL) BBB-	BBB-	BBB-
BB+(lka)	(SL) BB+	BB+	BB+
BB (lka)	(SL) BB	BB	BB
BB- (lka)	(SL) BB-	BB-	BB-
B+(lka)	(SL) B+	B+	B+
B (lka)	(SL) B	B	B
B-(lka) සහ එයට අඩු	(SL)B- සහ එයට අඩු	B- සහ එයට අඩු	B- සහ එයට අඩු

2021 අංක 09 දරන චක්‍රලේඛය 2021 ඔක්තෝම්බර් 06

කොවිඩ්-19 හේතුවෙන් බලපෑමට ලක් වූ ව්‍යාපාර සහ පුද්ගලයන් සඳහා ලබා දුන් සහන දීර්ඝ කිරීම

ශ්‍රී ලංකාව තුළ කොවිඩ්-19 ව්‍යසනය අඛණ්ඩව පැවතීම හේතුවෙන් බලපෑමට ලක් වූ ණය ගනුදෙනුකරුවන්ට ලබා දුන් සහන දීර්ඝ කිරීමට රජයේ ආයතන සහ අනෙකුත් පාර්ශ්වයන් රැසක් ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ඉල්ලීම් කර ඇත. ඒ අනුව, ව්‍යාපාර සහ පුද්ගලයන් මුහුණ දෙනු ලබන අභියෝග සලකා බලමින් ඒ සඳහා පහසුකම් සැලසීම සඳහා කොවිඩ්-19 හේතුවෙන් බලපෑමට ලක් වූ ව්‍යාපාර සහ පුද්ගලයන්ට පහත ණය සහන යෝජනා ක්‍රමය (මින් ඉදිරියට යෝජනා ක්‍රමය ලෙස හැඳින්වෙන) දීර්ඝ කිරීමට කටයුතු කරන ලෙස බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වලින් (මින් ඉදිරියට බැංකු නොවන මූල්‍ය ආයතන ලෙස හැඳින්වෙන) ශ්‍රී ලංකා මහ බැංකුව ඉල්ලා සිටී.

තවද, කොවිඩ්-19 ව්‍යාප්තිය හේතුවෙන් පීඩාවට පත් වූ ව්‍යාපාර හා පුද්ගලයන්ගේ ඉල්ලීම පරිදි, මෙම චක්‍රලේඛය යටතේ ලබා දී ඇති සමස්ත ප්‍රතිලාභ අඩු නොවන අයුරින් අමතර සහන සැලසීමට බැංකු නොවන මූල්‍ය ආයතන හට හැකියාව ඇත. ඒ අනුව, බැංකු නොවන මූල්‍ය ආයතනවල ණය ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ ණය නිසි අයුරින් ආපසු ගෙවීමේ දී ඇතිවන පීඩාව ලිහිල් කිරීමේ අරමුණින්, බලපෑමට ලක් වූ සියලු ණය ගනුදෙනුකරුවන් සඳහා ඒකාකාරීව සහන සැලසීමට මෙම චක්‍රලේඛය නිකුත් කර ඇත.

1. සුදුසුකම් ලබන ණය ගනුදෙනුකරුවන්

1.1 කොවිඩ්-19 හේතුවෙන් ආදායම්/වැටුප් හෝ විකුණුම් අහිමි වීම හෝ අඩු වීම, ව්‍යාපාර වසා දැමීම හෝ රැකියාව අහිමි වීම වැනි මූල්‍ය දුෂ්කරතාවන්ට මුහුණ දෙන, බැංකු නොවන මූල්‍ය ආයතනයක ණය ගනුදෙනුකරුවෙකු මෙම සහන ලැබීමට සුදුසුකම් ලබනු ඇත.

1.2 2021 අංක 04 සහ අංක 05 දරන චක්‍රලේඛ යටතේ සහන ලැබූ, ප්‍රවාහන සහ සංචාරක ක්ෂේත්‍රයන්හි සුදුසුකම්ලත් ණය ගනුදෙනුකරුවන් ද මෙම යෝජනා ක්‍රමය යටතේ සහන ලැබීමට සුදුසුකම් ලබයි.

2. සුදුසුකම් ලබන සහන

2.1 මෙම යෝජනා ක්‍රමය යටතේ සහන සඳහා තෝරා ගැනෙන සුදුසුකම්ලත් ණය ගනුදෙනුකරුවන් පහත දී විකල්ප තුන අතරින් එකක් තෝරා ගත යුතු වේ.

(i) විකල්ප අංක 01 : ණය පහසුකම් ප්‍රතිව්‍යුහගත කිරීම

(අ) ණය ගනුදෙනුකරුගේ ආපසු ගෙවීමේ හැකියාව සහ දෙපාර්ශ්වය විසින් එකඟ වන පිළිගත හැකි නඟා සිටුවීමේ සැලැස්ම සලකා බලමින්, බැංකු නොවන මූල්‍ය ආයතන විසින් පවතින ණය පහසුකම් (2021 ඔක්තෝබර් 01 දිනට පවතින සක්‍රීය සහ අක්‍රීය ණය පහසුකම්) දිගු කාලයක් සඳහා ප්‍රතිව්‍යුහගත කළ යුතුය.

(ආ) ඉහත 2.1 (i) (අ) සඳහා අදාළ වන පොලී අනුපාතය, වසරකට සියයට 11.5 ක අවමයකට සහ වසරකට සියයට 15 ක උපරිමයකට යටත්ව, වසරකට මුල් ගිවිසුම්ගත පොලී අනුපාතයෙන් සියයට තුනක් අඩු කළ අගය විය යුතුය.

(ඇ) ප්‍රතිව්‍යුහගත නියමයන්ට අනුව වාරිකයේ මුල් මුදල් කොටස ආපසු ගෙවීම ආරම්භ කිරීම සඳහා අවම වශයෙන් මාස 3 ක සහන කාලයක් ලබා දිය යුතුය.

(ඈ) බැංකු නොවන මූල්‍ය ආයතන විසින් මින් පෙර ණය සහන යෝජනා ක්‍රම (එනම්, ණය සහන කාලය තුළ දී මුල් මුදල, පොලිය සහ ණය සහන කාලයට/කල් දැමීමට අදාළ පොලිය) තුළ දී ගෙවිය යුතු වූ අගයන් ප්‍රතිව්‍යුහගත කිරීමේ දී ගෙවිය යුතු මුල් මුදලෙහි ශේෂයට එකතු කළ හැක.

(ඉ) එකඟ වූ නියමයන්ට අනුව වාරිකය ආපසු ගෙවීමට නොහැකි වීම මත අය කරන අතිරේක පොලිය, වසරකට සියයට 2 ඉක්ම නොවිය යුතු අතර, හිඟ අගය මත පමණක් අය කළ යුතුය.

(ඊ) බැංකු නොවන මූල්‍ය ආයතන විසින් 2020 අප්‍රේල් 01 සිට 2021 සැප්තැම්බර් 30 දක්වා යන කාලය තුළ දී එකතු කර ඇති හෝ අය කරන ලද දඩ පොලිය කපා හැරිය යුතුය.

(ii) විකල්ප අංක 02 : පූර්ව පියවීම සඳහා පහසුකම් සැලසීම

සුදුසුකම්ලත් ණය ගනුදෙනුකරුවෙකු විසින් 2022 මාර්තු 31 වන දිනට හෝ ඊට පෙර පවතින ණය පහසුකම් සම්පූර්ණයෙන් පියවීමට කැමැත්ත දක්වන්නේ නම්, බැංකු නොවන මූල්‍ය ආයතන විසින් අනාගත පොලිය, ගාස්තු සහ අදාළ වන ගාස්තු සම්පූර්ණයෙන් අය කිරීමෙන් වැලකී සිටීමට කටයුතු කළ යුතුය.

(iii) විකල්ප අංක 03 : 2021 ඔක්තෝබර් 01 දිනට පවතින සක්‍රීය ණය පහසුකම් සඳහා ණය සහන කාලය දීර්ඝ කිරීම

(අ) බැංකු නොවන මූල්‍ය ආයතන විසින් මුල් මුදල, පොලිය නැතහොත් එම කොටස් දෙකම 2022 මාර්තු 31 දක්වා කල් දැමිය යුතුය.

(ආ) බැංකු නොවන මූල්‍ය ආයතන විසින් ණය සහන කාලය තුළ ගෙවිය යුතු වන මුල් මුදල සහ පොලිය කාලීන ණයකට පරිවර්තනය කළ යුතුය.

(ඇ) බැංකු නොවන මූල්‍ය ආයතන විසින් මින් පෙර ණය සහන යෝජනා ක්‍රම තුළ දී ගෙවිය යුතු වූ අගයන් (එනම්, ණය සහන කාලය තුළ දී මුල් මුදල, පොලිය සහ ණය සහන කාලයට/කල් දැමීමට අදාළ පොලිය) සහ ඉහත 2.1 (iii) (ආ) හි සඳහන් කළ කාලීන ණයට එකතු කර නව ණයකට පරිවර්තනය කළ යුතුය.

(ඈ) බැංකු නොවන මූල්‍ය ආයතනවලට මෙම නව ණය සඳහා සියයට 11.5 නොඉක්මවූ පොලියක් අය කිරීමේ හැකියාව පවතී.

(ඉ) බැංකු නොවන මූල්‍ය ආයතනයන් ඉහත 2.1(iii) (ඇ) හි දැක්වෙන නව ණය නැවත ගෙවීම මාස 12 ක අවම ආපසු ගෙවීමේ කාලයක් සමඟ 2022 ජූලි 01 දින සිට ආරම්භ කළ යුතුය.

(ඊ) ණය ගනුදෙනුකරු විසින් 2022 අප්‍රේල් 01 දින සිට දැනට පවතින ණය වාරිකය ආපසු ගෙවීම ආරම්භ කළ යුතුය.

(උ) 2021 ඔක්තෝම්බර් 01 දින සිට 2022 මාර්තු 31 දක්වා පියවීමට ඇති පිළිවැටුම් ණය පහසුකම් (Revolving Credit Facilities) 2022 මාර්තු 31 දින දක්වා දීර්ඝ කිරීමට බැංකු නොවන මූල්‍ය ආයතන කටයුතු කළ යුතුය.

(ඌ) ණය සහන කාලය තුළ දඩ පොලී එකතු කිරීම සහ අය කිරීම නොකළ යුතුය.

2.2 නැවත අයකර ගැනීම් අත්හිටුවීම: 2020 අප්‍රේල් 01 දින හෝ ඉන් පසුව ණය පහසුකමක් අක්‍රීය ණය ලෙස වර්ගීකරණය කර ඇත්නම් සහ අදාළ ණය ගනුදෙනුකරුවන්ගේ ආදායම් ඉපැයීමේ කටයුතු සඳහා බාධාවන් සිදු වීම හේතුවෙන් ණය අඛණ්ඩව ආපසු ගෙවීමට/එසැනින් ආපසු ගෙවීම ආරම්භ කිරීමට හැකි තත්ත්වයක නොසිටී නම්, සුදුසුකම් ලබන ණය ගනුදෙනුකරුවන්ගේ ණය පහසුකම් සඳහා වන නැවත අය කර ගැනීම් බැංකු නොවන මූල්‍ය ආයතන 2022 මාර්තු 31 දින දක්වා අත්හිටුවිය යුතුය.

3. ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය (CRIB) වෙත වාර්තා කිරීම

3.1 බැංකු නොවන මූල්‍ය ආයතන විසින් සුදුසුකම් ලබන ණය ගනුදෙනුකරුවන්ගේ ණය අයදුම්පත්, හුදෙක් අසතුටුදායක ණය තොරතුරු වාර්තාවක් මත පමණක් පදනම්ව ප්‍රතික්ෂේප කිරීමෙන් වැළකිය යුතුය.

3.2 මෙම යෝජනා ක්‍රමයට සහභාගි වීම ණය ගනුදෙනුකරුවන්ගේ ඉදිරි ණය තොරතුරු වාර්තා සහ අනාගත ණය ශ්‍රේණිගත කිරීම් කෙරෙහි බලපෑමක් ඇති නොවන ආකාරයෙන්, මෙම යෝජනා ක්‍රමය යටතේ ලබා දී ඇති ණය ආපසු ගෙවීම කල් දැමීම/ ප්‍රතිව්‍යුහගත කිරීම වාර්තා කිරීම සඳහා ක්‍රමවේදයක්, බැංකු නොවන මූල්‍ය ආයතන විසින් ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය සමඟ සාකච්ඡා කර සකස් කළ යුතු වේ.

4. ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමේ අවසාන දිනය සහ අභියාචනා පටිපාටිය

4.1 බැංකු නොවන මූල්‍ය ආයතන විසින් මෙම චක්‍රලේඛය වැඩ කරන දින 3 ක් තුළ සියලුම ශාඛා අතර සංසරණය කළ යුතු අතර, අවශ්‍ය අභ්‍යන්තර මාර්ගෝපදේශ/අභ්‍යන්තර චක්‍රලේඛ දින 7 ක් ඇතුළත සැපයිය යුතු වේ.

4.2 ඉහත සඳහන් පළමුවන විකල්පය හෝ තුන්වන විකල්පය යටතේ ණය සහන ලබා ගැනීමට අපේක්ෂිත සුදුසුකම් ලත් ණය ගනුදෙනුකරුවන් 2021 නොවැම්බර් 01 දින හෝ ඊට පෙර ලිඛිත හෝ විද්‍යුත් මාර්ගයන්ගෙන් ඉල්ලුම් කළ යුතු වේ. බැංකු නොවන මූල්‍ය ආයතන විසින් මෙම ණය සහනයන් සඳහා අයදුම් කළ යුතු අවසාන දිනය සහ අයදුම්පතේ ආකෘතිය මුද්‍රිත සහ/හෝ විද්‍යුත් මාධ්‍යයෙන් (විද්‍යුත් තැපැල් සහ කෙටි පණිවිඩ සේවා ඇතුළත්ව) සන්නිවේදනය කිරීමට කඩිනමින් කටයුතු කළ යුතුය.

4.3 සාධාරණ හේතුවක් මත ණය සහන සඳහා ඉල්ලුම් කිරීම ප්‍රමාද වී ඇත්නම් පමණක්, 2021 නොවැම්බර් 01 දිනෙන් පසු ඉදිරිපත් කරන ඕනෑම ඉල්ලුම්පතක් බැංකු නොවන මූල්‍ය ආයතන විසින් පිළිගත යුතුය.

4.4 ණය ගනුදෙනුකරුවන්ගේ ඉල්ලීම් අනුමත කිරීමට පෙර, ණය සහන පහසුකම කල් දැමීම හෝ ප්‍රතිව්‍යුහගත කිරීමේ ආකාරය පිළිබඳව දැනුම්වත් කිරීමට බැංකු නොවන මූල්‍ය ආයතන විසින් කටයුතු කළ යුතුය.

4.5 ඉල්ලීම් ප්‍රතික්ෂේප කිරීමේ දී, ඒ සඳහා හේතු ලිඛිත හෝ විද්‍යුත් මාර්ගයන්ගෙන් පැහැදිලිව සඳහන් කිරීමට බැංකු නොවන මූල්‍ය ආයතන විසින් කටයුතු කළ යුතුය.

4.6 අයදුම්පත ප්‍රතික්ෂේප වූ විටක, එවැනි ප්‍රතික්ෂේප කිරීමකට විරුද්ධව ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාට අභියාචනය කිරීමට අවස්ථාවක් ඇති වග ණය ගනුදෙනුකරුට දැනුම් දිය යුතුය.

5. ණය සහන කාල සීමාව සම්බන්ධ ගිණුම් තැබීම

බැංකු නොවන මූල්‍ය ආයතන විසින් ණය සහන කාල සීමාවට අදාළව ගිණුම් තැබීමේ දී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2020 දෙසැම්බර් 31 දින නිකුත් කරන ලද ලිපියේ අන්තර්ගත අතිරේක උපදෙස් අනුව කටයුතු කළ යුතුය. අවධානම ඉහළ ණය ගනුදෙනුකරුවන් හෝ අංශ සම්බන්ධයෙන්, බැංකු නොවන මූල්‍ය ආයතන විසින් ප්‍රමාණවත් වෙන් කිරීම් කළ යුතු වේ. බැංකු නොවන මූල්‍ය ආයතනහට මේ සම්බන්ධව අමතර මඟපෙන්වීමක්/පැහැදිලි කිරීමක් අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයෙන් හෝ විගණකවරුන්ගෙන් විමසිය හැක.

6. වාර්තාකරණ අවශ්‍යතා

2021 නොවැම්බර් 30 දින සිට වැඩකරන දින 15 ක් තුළ දී බැංකු නොවන මූල්‍ය ආයතන විසින් සෑම මසකම 30 දිනට එම ආයතන වලින් ණය සහන ලබාගෙන ඇති ණය ගනුදෙනුකරුවන් පිළිබඳ තොරතුරු බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත වාර්තා කළ යුතුය. තොරතුරු ඉදිරිපත් කළ යුතු ආකෘතිය ඉදිරියේ දී යොමු කරනු ලැබේ.

මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරනු ලබන 2021 අංක 05 දරන විධානය 2021 දෙසැම්බර් 31

ආයතනික යහපාලනය

මුදල් සමාගමේ ආයතනික යහපාලන පරිචයන් තවදුරටත් ශක්තිමත් කිරීමේ අරමුණින් 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 12 වන වගන්තිය මඟින් පැවරී ඇති බලතල ප්‍රකාරව, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් ආයතනික යහපාලන පිළිබඳ විධාන නිකුත් කරනු ලබන අතර, මුදල් ව්‍යාපාර පනත යටතේ බලපත්‍රලාභී සෑම මුදල් සමාගමක් සඳහා ම අදාළ වේ.

1. අධ්‍යක්ෂ මණ්ඩලයේ සමස්ත වගකීම්

1.1 උපායමාර්ගික දිශානතිය සකස් කිරීම, යහපාලන රාමුවක් ගොඩනැඟීම, ආයතනික සංස්කෘතියක් නිර්මාණය කිරීම සහ නියාමන අවශ්‍යතා සමඟ අනුකූල වීම තහවුරු කිරීම ඇතුළුව මුදල් සමාගමේ මෙහෙයුම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට සමස්ත වගකීම සහ වගවීම පැවරේ. තම වගකීම් ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා පහත සඳහන් 1.2 සිට 1.7 විධාන වල සඳහන් කර ඇති කාර්යයන් අධ්‍යක්ෂ මණ්ඩලය ක්‍රියාත්මක කළ යුතු අතර, නමුත් ඔවුන්ගේ කාර්යභාරය එයට පමණක් සීමා නොවිය යුතුය.

1.2 ව්‍යාපාර උපායමාර්ගය සහ යහපාලන රාමුව

අ) එළඹෙන වසර තුන සඳහා ළඟා කරගත හැකි ඉලක්ක සමඟ මුදල් සමාගමේ සමස්ත ව්‍යාපාර උපායමාර්ගය ක්‍රියාත්මක කිරීම අනුමත කිරීම සහ අධීක්ෂණය කිරීම සහ ව්‍යාපාර පරිසරයේ වෙනස්කම් හා අනුරූපීව එය වාර්ෂිකව යාවත්කාලීන කිරීම.

ආ) මුදල් සමාගමේ විශාලත්වය, සංකීර්ණත්වය, ව්‍යාපාර උපායමාර්ගය සහ නියාමන අවශ්‍යතාවලට අනුරූපව මුදල් සමාගමේ යහපාලන රාමුව අනුමත කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

ඇ) යහපාලන රාමුවේ ඵලදායීතාව කාලනුරූපීව තක්සේරු කිරීම.

ඈ) සභාපතිවරයෙකු සහ ප්‍රධාන විධායක නිලධාරියෙකු පත් කිරීම සහ ඔවුන්ගේ භූමිකාව සහ වගකීම් නිර්වචනය කිරීම

1.3 ආයතනික සංස්කෘතිය සහ වටිනාකම්

අ) සදාචාරාත්මක, විචක්ෂණශීලී සහ වෘත්තිමය හැසිරීම් රටාවන් තවදුරටත් ශක්තිමත් කරමින් මුදල් සමාගම තුළ වඩාත් හොඳ ආයතනික සංස්කෘතියක් පවත්වාගෙන යෑම තහවුරු කිරීම.

ආ) චර්යාධර්ම සංග්‍රහයක් ගොඩනැඟීම සහ බැඳියාවන් අතර ගැටුම් කළමනාකරණය ඇතුලුව මුදල් සමාගමේ ආයතනික සංස්කෘතිය සහ වටිනාකම් ස්ථාපනය කිරීම සඳහා ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කිරීම.

ඇ) මුදල් සමාගමේ ව්‍යාපාර උපායමාර්ගයෙහි සඳහන් සුදුසු පාරිසරික, සාමාජීය සහ යහපාලන සාධක හරහා තිරසාර මූල්‍යකරණය ප්‍රවර්ධනය කිරීම.

ඈ) මහජනතාව සහ නියාමන ආයතන අභිමුව මුදල් සමාගමේ ක්‍රියාකාරීත්වය, ස්ථාවරය සහ අභිලාෂ පිළිබඳ සමබර දැක්මක් සම්ප්‍රේක්ෂණය කිරීම සඳහා තැන්පතුකරුවන්, කොටස් හිමියන්, ණය ගැතියන් සහ වෙනත් ණය හිමියන් ඇතුලුව සියලුම ඇල්මැති පාර්ශවකරුවන් සන්නිවේදනය කිරීමේ ප්‍රතිපත්තියක් අනුමත කිරීම.

1.4 අවදානම් දැරීමට ඇති සූදානම, අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලනය

අ) මුදල් සමාගමේ ව්‍යාපාර උපායමාර්ගය සහ යහපාලන රාමුවට සමගාමීව අවදානම් දැරීමට සූදානම් වීමේ ප්‍රකාශය සමාලෝචනය කිරීම.

ආ) අවදානම් හඳුනා ගැනීම, මඟ හරවා ගැනීම සහ විචක්ෂණශීලී ලෙස කළමනාකරණය සඳහා සුදුසු පද්ධතීන් සහ පාලනයන් ක්‍රියාත්මක කිරීම තහවුරු කිරීම.

ඇ) මුදල් සමාගම්හි අභ්‍යන්තර පාලන පද්ධති සහ තොරතුරු කළමනාකරණ පද්ධති ප්‍රමාණාත්මකව සහ කාර්යක්ෂමව යොදා ගැනීම සහ කාලනුරූපීව සමාලෝචනය කිරීම.

ඈ) මුදල් සමාගමට ස්ථාවරත්වය, මූල්‍ය ශක්තිය සහ අනපේක්ෂිත තත්ත්වයන් යටතේ තීරණාත්මක මෙහෙයුම් හා සේවාවන් ආරක්ෂා කිරීම සඳහා ව්‍යාපාර අඛණ්ඩතාවය සහ ආපදා ප්‍රතිසාධන සැලැස්ම අනුමත කිරීම සහ අධීක්ෂණය කිරීම.

1.5 අධ්‍යක්ෂ මණ්ඩලයේ කැපවීම සහ නිපුණතාවය

අ) මුදල් සමාගමේ වැඩ කටයුතු හා සම්බන්ධ කරුණු සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලුම සාමාජිකයින් ප්‍රමාණවත් කාල සීමාවක් වෙන් කළ යුතු ය.

ආ) අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලුම සාමාජිකයින් අවශ්‍ය සුදුසුකම්, ප්‍රමාණවත් නිපුණතා, දැනුම සහ අත්දැකීම් වලින් පරිපූර්ණ විය යුතු ය.

ඇ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සියලු සාමාජිකයින්ගේ පුහුණුවීම් සහ සංවර්ධන අවශ්‍යතා නිතිපතා සමාලෝචනය කර එකඟ විය යුතු ය.

ඈ) සමස්ත අධ්‍යක්ෂ මණ්ඩලය වශයෙන් සහ එහි කමිටු සම්බන්ධයෙන් එක් එක් අධ්‍යක්ෂවරයා විසින් වාර්ෂිකව පුද්ගල කාර්යසාධනය සිදු කරන ස්වයං තක්සේරු ක්‍රමයක් ක්‍රියාත්මක කළ යුතු අතර එහි වාර්තා පවත්වා ගත යුතුය.

ඉ) මුදල් සමාගම් සඳහා වගකීම් සපුරාලීමට ස්වාධීන බාහිර වෘත්තිමය උපදේශනය ලබා ගැනීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කළ යුතුය.

1.6 ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය අධීක්ෂණය කිරීම.

අ) ප්‍රතිපත්ති සෘජු කටයුතු, ව්‍යාපාර කටයුතු සහ අවදානම් කළමනාකරණ කටයුතු පාලනය කිරීමට සැලකිය යුතු බලපෑමක් සිදු කළ හැකි තනතුරු දරන ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය හඳුනා ගැනීම සහ නම් කිරීම.

ආ) ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය සඳහා අදාළ බලතල සහ ප්‍රධාන වගකීම් නිශ්චය කිරීම.

ඇ) මුදල් සමාගමේ උපායමාර්ගික අරමුණු ළඟා කර ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම්, නිපුණතාවයන්, අත්දැකීම් සහ දැනුම ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය සතු වේ දැයි තහවුරු කිරීම.

ඈ) මුදල් සමාගමේ කටයුතු නිසි පරිදි සිදු කර ගෙන යනවා දැයි ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය විසින් අධීක්ෂණය කිරීම තහවුරු කිරීම.

ඉ) ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය සඳහා සුදුසු අනුප්‍රාප්තික සැලැස්මක් මුදල් සමාගම සතු වේ දැයි තහවුරු කිරීම.

ඊ) ප්‍රතිපත්ති සමාලෝචනය, සන්නිවේදන මාර්ග ස්ථාපිත කිරීම සහ ආයතනික අරමුණු කරා ගමන් කිරීමේ ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ කළමනාකාරීවය සමඟ නිරතුරුව රැස්වීම් පැවැත්වීම.

1.7 පවතින නෛතික රාමුවට අනුගත වීම

අ) තැන්පතුකරුවන්ගේ, කොටස් හිමියන්ගේ සහ අනෙකුත් ඇල්මැති පාර්ශවයන්ගේ අභිලාශ සහ වගකීම් වෙත අනර්ථයක් නොවන සේ මුදල් සමාගම ක්‍රියාත්මක වීම තහවුරු කිරීම.

ආ) නියාමන වටපිටාවට අනුගත වීම සහ අදාළ නීති, නියාමන, විධාන සහ ආචාර ධර්ම හා අනුගත වීම.

ඇ) නිසි සැලකිල්ලෙන්, විචක්ෂණශීලීව සහ අඛණ්ඩතාවයකින් යුතුව කටයුතු කිරීම සහ වගකීම් නිසි අයුරින් ඉටු නොකිරීම හේතුවෙන් පැන නගින සිවිල් සහ අපරාධ වගකීම් පිළිබඳව අවධානයෙන් සිටීම.

2. යහපාලන රාමුව

2.1 අ) අධ්‍යක්ෂ මණ්ඩලයේ භූමිකාව සහ වගකීම්;
ආ) අධ්‍යක්ෂ මණ්ඩලයට පැවරුණු කරුණු;
ඇ) අධිකාරිත්වය පැවරීම;
ඈ) අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය;
ඉ) අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්වාධීනත්වය;
ඊ) අධ්‍යක්ෂවරුන් නම් කිරීම, තෝරා පත් කිරීම සහ පත් කිරීම සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය පත් කිරීම;
උ) අභිමතාර්ථ ඝට්ටනය වන අවස්ථාවන්හී දී කළමනාකරණය කිරීම;
ඌ) තොරතුරු සඳහා ප්‍රවේශය සහ ස්වාධීන උපදෙස් ලබා ගැනීම;
එ) අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින්ගේ ධාරිතා ගොඩනැඟීම;
ඒ) අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යසාධනය ඇගයීම;
ඓ) සභාපතිවරයාගේ සහ ප්‍රධාන විධායක නිලධාරියාගේ භූමිකාව සහ වගකීම;
ඔ) සමාගමේ ලේකම්වරයාගේ භූමිකාව
ඕ) අධ්‍යක්ෂ මණ්ඩලයේ උප කමිටු සහ ඒවායේ භූමිකාව; සහ
ඖ) සම්බන්ධිත පාර්ශව හා සිදු කරන ගනුදෙනු සඳහා වන සීමා

ආදී විධාන ඇතුළත්ව, නමුත් එපමණකට සීමා නොවී, මෙම විධානවලට සමගාමීව යහපාලන රාමුවක් සංවර්ධනය සහ ක්‍රියාත්මක කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදු කළ යුතුය.

3. අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය

3.1 මුදල් සමාගමේ අවශ්‍යතා, එනම්, විශාලත්වය, සංකීර්ණත්වය සහ අවදානම හා අනුරූපීව සහ සුදුසු යැයි සැලකෙන ලෙස අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය, නිපුණතා සහ අත්දැකීම් සමබර ලෙස පවත්වාගෙන යෑම තහවුරු කළ යුතුය.

3.2 අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව හතකට වඩා නොඅඩු විය යුතු අතර, දහතුනකට වඩා නොවැඩි විය යුතුය.

3.3 ප්‍රධාන විධායක නිලධාරී/විධායක අධ්‍යක්ෂ යන තනතුරු දරන අධ්‍යක්ෂවරයෙකු හැරුණු විට, අධ්‍යක්ෂවරයෙකුගේ සමස්ත සේවා කාලය 3.4 විධානයට යටත්ව වසර නමය ඉක්ම නොවිය යුතුය.

3.4 4.2 සහ 4.3 විධානයන් හි සඳහන් ප්‍රතිපාදනවලට යටත්ව ඍජුව හෝ වක්‍රව සියයට 10 කට වඩා ඡන්ද අයිතිය හෝ සියයට 10 කට වඩා ඡන්ද අයිතිය හිමි කොටස් හිමියකු නියෝජනය කිරීම සඳහා පත් කරන ලද විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු, ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් කර, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාගේ පූර්ව අනුමැතිය සහිතව වසර නමය ඉක්මවා ධූරයේ රැඳී සිටීමට හැකියාව ඇත. කෙසේ වුව ද, වසර නමය ඉක්මවා ධූරයේ රැඳී සිටිය හැකි විධායක නොවන අධ්‍යක්ෂවරුන්, සමස්ත අධ්‍යක්ෂවරු සංඛ්‍යාවෙන් හතරෙන් එකකට (¼) කට සීමා විය යුතුය.

3.5 විධායක අධ්‍යක්ෂකවරු

(අ) මුදල් සමාගමේ විධායක අධ්‍යක්ෂවරයෙකු ලෙස නම් කිරීම, තෝරා පත් කිරීම සහ පත් කිරීම සඳහා හැකියාව ඇත්තේ මුදල් සමාගමක සේවකයෙකු පමණක් වන අතර, එහිදී, විධායක අධ්‍යක්ෂවරුන් අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවෙන් තුනෙන් එකක ($^1/_3$) ප්‍රමාණය නොඉක්ම විය යුතුය. විධායක අධ්‍යක්ෂවරුන් අතරින් එක් අයෙකු ප්‍රධාන විධායක නිලධාරියා ලෙස කටයුතු කළ යුතු අතර, සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂවරයා ලෙස නම් කළ හැක.

(ආ) මුදල් සමාගමේ ඍජුව හෝ වක්‍රව සියයට 10 කට වඩා ඡන්ද අයිතිය හිමි කොටස් හිමියෙකු විධායක අධ්‍යක්ෂවරයෙකු හෝ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය සඳහා පත් නොකළ යුතුය. කෙසේ වුවද, සේවා ගිවිසුමක් සහ ක්‍රියාකාරී වාර්තාකරණ ධූරාවලියක් සහිත දැනට කටයුතු කරන විධායක අධ්‍යක්ෂවරුන් සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයට මුදල් සමාගමේ විශ්‍රාම යා යුතු වයස් සීමාව දක්වා, විධායක අධ්‍යක්ෂවරයෙකු/ජ්‍යෙෂ්ඨ කළමනාකාරවරයෙකු ලෙස කටයුතු කිරීමට අවසර ඇති අතර, 4.2 සහ 4.3 විධානයන්හි ප්‍රතිපාදන ප්‍රකාරව විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස නැවත පත් කළ හැකිය. මෙම විධානය බලාත්මක වන දිනයේ සිට සේවා ගිවිසුමක් හෝ ක්‍රියාකාරී වාර්තාකරණ ධූරාවලියක් නොමැති විධායක අධ්‍යක්ෂවරුන් විසින් විධායක අධ්‍යක්ෂ ධූරයෙන් ඉවත් විය යුතු අතර, 4.2 සහ 4.3 විධානයන්හි ප්‍රතිපාදන ප්‍රකාරව විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස නැවත පත් විය හැකිය.

(ඇ) විධායක අධ්‍යක්ෂවරුන් සිටින අවස්ථාවක දී ප්‍රධාන විධායක නිලධාරී විධායක අධ්‍යක්ෂවරුන්ගෙන් එක් අයෙකු වන අතර මුදල් සමාගමේ කළමනාකර අධ්‍යක්ෂ ලෙස නම් කළ හැකිය.

(ඈ) මුදල් සමාගමේ සංවිධානාත්මක ව්‍යුහයේ සියලුම විධායක අධ්‍යක්ෂවරුන් සඳහා විධිමත් ධූරාවලියක් තිබිය යුතුය.

(ඉ) විධායක අධ්‍යක්ෂවරුන් ප්‍රධාන විධායක නිලධාරී හරහා අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කළ යුතුය.

(ඊ) විධායක අධ්‍යක්ෂකවරුන් වෙනත් ඕනෑම ආයතනයක විධායක අධ්‍යක්ෂ ධූරයක් හෝ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්ව තනතුරක් දැරීමෙන් වැළකිය යුතුය.

3.6 (අ) විධායක නොවන අධ්‍යක්ෂකවරු

උපායමාර්ගික, කාර්යසාධන, සම්පත් සහ ව්‍යාපාර පවත්වාගෙන යෑමේ ප්‍රමිති සම්බන්ධ ගැටලු විසඳීම සඳහා ස්වාධීන විනිශ්චයන් ලබා දීම සඳහා අවශ්‍ය වන සුදුසුකම්, කුසලතා සහ අත්දැකීම් මෙන්ම විශ්වසනීය පුද්ගල කාර්යසාධන වාර්තා විධායක නොවන අධ්‍යක්ෂකවරු සතු විය යුතුය.

(ආ) විධායක නොවන අධ්‍යක්ෂවරයකු මුදල් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරීවරයා/විධායක අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කිරීම හෝ ක්‍රියා කිරීම නොකළ යුතුය.

3.7 (අ) ස්වාධීන අධ්‍යක්ෂවරු

අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්වාධීන අධ්‍යක්ෂවරු සංඛ්‍යාව අවම වශයෙන් තුනක් හෝ සමස්ත අධ්‍යක්ෂවරු සංඛ්‍යාවෙන් තුනෙන් එකක් ($^1/_3$) අතුරින් ඉහළ අගය ගන්නා සංඛ්‍යාව විය යුතුය.

(ආ) පත් කරන ලද ස්වාධීන අධ්‍යක්ෂවරු වෘත්තීය සුදුසුකම්, සනාථ කළ වාර්තා සහ ප්‍රමාණවත් සුදුසුකම් සහිතව ඉහළ මට්ටමේ දක්ෂතා දැක් වූ අයෙකු විය යුතුය.

(ඇ) i මුදල් සමාගමේ සියයට 5 ඉක්මවා සෘජු හෝ වක්‍ර ඡන්ද අයිතිය හෝ වෙනත් මුදල් සමාගමක සියයට 10 ඉක්මවා ඡන්ද අයිතිය පැවතීම.

ii මෙහි විධාන අංක 12.1 (ඇ) විධානයෙහි සඳහන් කර ඇති පරිදි, මූල්‍ය තත්ත්වය පිළිබඳව ආසන්නතම විගණන ප්‍රකාශනයේ දක්වා ඇති පරිදි නොපියවා ඇති සමස්ත අගය මුදල් සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනයෙන් සියයට 10 ක් කිසියම් අවස්ථාවක ඉක්මවා ඇති සැලකිය යුතු ව්‍යාපාර සම්බන්ධතාවක් අධ්‍යක්ෂවරයා ලෙස පත් කිරීමට පෙර ආසන්නතම පළමු වසර තුළ දී අධ්‍යක්ෂවරයා හෝ සමීපතම ඥාතියෙකු මුදල් සමාගමක් සමඟ පවත්වාගෙන ඇති අවස්ථාවක දී,

iii අධ්‍යක්ෂවරයා ලෙස පත් කිරීමට පෙර ආසන්නතම පළමු වසර තුළ දී, මුදල් සමාගම හෝ එහි අනුබද්ධිත ආයතනයක අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කළේ නම් හෝ එහි ඕනෑම අනුබද්ධිත ආයතනයක අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කර හෝ කරමින් සිටියේ නම්,

iv අධ්‍යක්ෂවරයකු ලෙස පත් කිරීමට පෙර ආසන්නතම පළමු වසර තුළ දී, මුදල් සමාගම හෝ එහි අනුබද්ධිත ආයතනයකට උපදේශන ලබා දෙන ආයතනයක උපදේශකයෙක් හෝ ප්‍රධාන උපදේශකයෙක්/අනුශාසක ලෙස කටයුතු කිරීම,

v. අධ්‍යක්ෂවරයකු ලෙස පත් කිරීමට පෙර ආසන්නතම පළමු වසර තුළ දී, අධ්‍යක්ෂවරයෙකු හෝ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය ලෙස කටයුතු කළ හෝ අධ්‍යක්ෂවරයෙකු හෝ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය ලෙස කටයුතු කරමින් සිටින හෝ මුදල් සමාගමේ ඡන්ද බලයෙන් සියයට 10 ඉක්මවා යන සේ කොටස් සඳහා හිමිකම් කීම හෝ වෙනත් මුදල් සමාගමක ඡන්ද බලයෙන් සියයට 20 ඉක්මවා යන හිමිකාරීත්වයකින් යුතු ඥාතියෙකු සිටී නම්,

vi. මුදල් සමාගමේ කොටස් හිමිකරුවෙකු, ණය ගැතියෙකු, ණය හිමියෙකු හෝ එවැනි සමාන ඇල්මැති පාර්ශවයක් අධ්‍යක්ෂවරයා නියෝජනය කරන්නේ නම්,

vii. මුදල් සමාගමේ අනෙකුත් අධ්‍යක්ෂවරුන්, සේවකයෙකු හෝ අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කරන මුදල් සමාගමක, අධ්‍යක්ෂවරයා සේවකයෙකු හෝ අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කරයි නම් හෝ සෘජු හෝ වක්‍ර සියයට 10 ට හෝ ඊට වඩා ඡන්ද අයිතිය හිමි කොටස් හිමිකාරීත්වයක් පවතී නම්,

viii. 12.1 (ඇ) විධානයෙහි අර්ථකථනය කර ඇති පරිදි මුදල් සමාගම සමඟ ගනුදෙනුවක් ඇති අධ්‍යක්ෂවරයා සේවකයෙකු හෝ අධ්‍යක්ෂවරයෙකු හෝ සෘජු හෝ වක්‍ර ඡන්ද අයිතිය හිමි කොටස් ප්‍රමාණය සියයට 10 හෝ ඊට වැඩි වේ නම් හෝ 12.1 (ඇ) විධානයෙහි අර්ථකථනය කර ඇති පරිදි, මූල්‍ය තත්ත්වය පිළිබඳව ආසන්නතම විගණන ප්‍රකාශනයේ දක්වා ඇති පරිදි නොපියවා ඇති සමස්තය මුදල් සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනයෙන් සියයට 10 ක් කිසියම් අවස්ථාවක ඉක්මවා ඇති මුදල් සමාගමක් සමඟ ගනුදෙනුවක් හිමි මුදල් සමාගමේ අනෙකුත් අධ්‍යක්ෂවරයෙකු වේ නම්,

(ඈ) විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ස්වාධීන යැයි නොසැලකේ.

අධ්‍යක්ෂවරයෙකුගේ ස්වාධීනත්වය, හෝ ස්වාධීනත්වය පිළිබඳ දැක්ම සඳහා බලපෑමක් ඇති කළ හැකි, 3.7 විධානයෙහි සඳහන් නොවන කිසියම් සිදුවීමක් හෝ සම්බන්ධතාවයක් වේ දැයි නාමයෝජනා කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කළ යුතුය.

(ඉ) ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කිරීමේ දී, එම තත්ත්වයට බලපෑම් කළ හැකි අවස්ථාවන්ගේ කිසියම් වෙනසක් වේ නම්, ස්වාධීන අධ්‍යක්ෂවරයා විසින් එය කඩිනමින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අනාවරණය කළ යුතුය. එවැනි අවස්ථාවක දී, ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු ලෙස එවැනි අධ්‍යක්ෂවරයෙකුගේ තනතුර නැවත සලකා බැලීමට අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කළ යුතු අතර, අධ්‍යක්ෂවරයාගේ තනතුර තහවුරු කිරීමට හෝ වෙනස් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය ගත් තීරණය බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාට ලිඛිතව දැන්විය යුතුය.

3.8 (අ) i. විකල්ප අධ්‍යක්ෂවරුන්

මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරන ලද (ප්‍රධාන වගකිව යුතු පුද්ගලයන්ගේ යෝග්‍යතාවය තක්සේරු කිරීම) විධානය හෝ එහි සංශෝධන යටතේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාගේ පූර්ව අනුමැතිය සමඟ; සහ

ii. දීර්ඝ කාලීන අසනීප තත්ත්වයක් හේතුවෙන් අධ්‍යක්ෂ ධූරයේ වගකීම් නිසි ආකාරයෙන් සම්පූර්ණ කිරීමට වත්මන් අධ්‍යක්ෂවරයාට නොහැකි නම් හෝ විදේශගත වීම හේතුවෙන් අඛණ්ඩව රැස්වීම් තුනකට වඩා පැමිණීමට නොහැකි නම්; පමණක් විකල්ප අධ්‍යක්ෂවරයෙකු තුළින් නියෝජනය කිරීමට අවස්ථාව සැලසේ.

(ආ) ධූරය හොබවන අධ්‍යක්ෂවරයෙකු වෙනත් ධූරය හොබවන අධ්‍යක්ෂවරයෙකු සඳහා විකල්ප අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කළ නොහැක.

(ඇ) එක් අධ්‍යක්ෂවරයෙකු සඳහා විකල්ප අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කරන ලද තැනැත්තෙකු, එම මණ්ඩලයේම වෙනත් අධ්‍යක්ෂවරයෙකු සඳහා විකල්ප අධ්‍යක්ෂවරයෙකු ලෙස වැඩ බැලීමෙන් තනතුර දීර්ඝ කර ගත නොහැක.

(ඈ) විධායක අධ්‍යක්ෂවරයෙකු නියෝජනය කිරීම සඳහා විකල්ප අධ්‍යක්ෂවරයෙකු පත් කළ නොහැක.

(ඉ) ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු නියෝජනය කිරීම සඳහා විකල්ප අධ්‍යක්ෂවරයෙකු පත් කළ අවස්ථාවක දී, පත් කරන ලද තැනැත්තා විසින් ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු සඳහා අදාළ වන නිර්ණායක සම්පූර්ණ කළ යුතුය.

3.9 (අ) විරාම කාලය

වෙනත් මුදල් සමාගමක ප්‍රධාන විධායක නිලධාරියෙකු හෝ අධ්‍යක්ෂවරයෙකු ලෙස පෙර සේවයේ නියුතු තැනැත්තෙකු මුදල් සමාගමේ අධ්‍යක්ෂවරයා, ප්‍රධාන විධායක නිලධාරියා ලෙස පත් කිරීමට පෙර මාස හයක විරාම කාලයක් තිබිය යුතුය. මෙකී තත්ත්වයට වඩා වෙනස් ව්‍යතිරේක අවස්ථාවක දී, එනම් අධ්‍යක්ෂ මණ්ඩලය නැවත ගොඩනැඟීම සඳහා එවැනි තැනැත්තන්ගේ විශේෂඥ දැනුම අවශ්‍ය වූ විට, මුදල් මණ්ඩලයේ පූර්ව අනුමැතිය ඒ සඳහා අවශ්‍ය වේ.

(ආ) මෙම විධානයේ ප්‍රතිපාදන යටතේ අධ්‍යක්ෂවරයෙකු ස්වාධීන නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස මින් පෙර සලකා ඇත්නම්, එවැනි අධ්‍යක්ෂවරයෙකු ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු වීමට සුදුසුකම් සපුරා ඇති අවස්ථාවක දී, පත් කිරීම සඳහා සලකා බැලිය යුත්තේ වසරක විරාම කාලයකට පසුව වේ.

3.10 පොදු අධ්‍යක්ෂ තනතුරු

කිසියම් මුදල් සමාගමක, මව් සමාගම, පාලිත සමාගමක් හෝ ආශ්‍රිත සමාගමක් හෝ 3.5 විධානයෙහි නියම කර ඇති කොන්දේසි ප්‍රකාරව ප්‍රථමයෙන් සඳහන් කරන ලද මුදල් සමාගම සමඟ බද්ධ එකඟ වීමක් ඇති අවස්ථාවක හැරුණු විට, මුදල් සමාගමක අධ්‍යක්ෂවරයෙකු හෝ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය, වෙනත් මුදල් සමාගමක අධ්‍යක්ෂවරයෙකු ලෙස නම් කිරීම, තෝරා පත් කිරීම සහ පත් කිරීම නොකළ යුතුය.

3.11 අධ්‍යක්ෂවරුන් විසින් හෙබවිය හැකි අධ්‍යක්ෂ ධූර සඳහා යෝග්‍ය සීමාවන් අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කළ යුතුය. කෙසේ වුවද, මුදල් සමාගමක අධ්‍යකෂවරයෙකු විසින් මුදල් සමාගමේ පාලිත සමාගම් සහ ආශ්‍රිත සමාගම් ඇතුළුව, සමාගම්/සමිති/ආයතන ගණන විස්ස ඉක්මවා යමින් අධ්‍යක්ෂ ධූරයක් හෝ ඒ හා සමාන වෙනත් තනතුරක් (විකල්ප අධ්‍යක්ෂවරුන් ඇතුළත් විය යුතුය) දැරීම නොකළ යුතුය.

4. යෝග්‍යතාවය තක්සේරු කිරීමේ නිර්ණායක

4.1 මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරන ලද (ප්‍රධාන වගකිව යුතු පුද්ගලයන්ගේ යෝග්‍යතාවය තක්සේරු කිරීම) විධානය හා එහි සංශෝධනවලට අනුකූලව, මුදල් සමාගමක අධ්‍යක්ෂවරයෙකු ලෙස ධූරය දැරීම සඳහා කිසියම් තැනැත්තෙකු නම් කිරීම, තෝරා පත් කිරීම සහ පත් කිරීම සඳහා හෝ එවැනි මුදල් සමාගමක අධ්‍යක්ෂවරයෙකු ලෙස අඛණ්ඩව කටයුතු කිරීම සඳහා, එම තැනැත්තා තනතුර දැරීම සඳහා සුදුසු සහ යෝග්‍ය විය යුතුය.

4.2 වයස අවුරුදු 70 ඉක්මවූ පුද්ගලයෙකුට මුදල් සමාගමක අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කළ නොහැක.

4.3 ඉහත 4.2 හි සඳහන් ප්‍රතිපාදන නොසලකා හරිමින්, මෙම විධානය නිකුත් කළ දින වන විට තනතුර දරන, 2025.03.31 දින වන විට හෝ ඊට පෙර වයස 70 සම්පූර්ණ කරන්නා වූ අධ්‍යක්ෂවරයෙකු, පහත සඳහන් නිර්ණායකයන්ට යටත්ව අවුරුදු 70 ඉක්මවා උපරිම අවුරුදු 75 දක්වා අධ්‍යක්ෂවරයෙකු ලෙස තනතුරෙහි තවදුරටත් සේවය කිරීමට අවසර හිමි වේ.

(අ) මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරන ලද (ප්‍රධාන වගකිව යුතු පුද්ගලයන්ගේ යෝග්‍යතාවය තක්සේරු කිරීම) විධානයේ නිශ්චය කරන ලද නිර්ණායක මත පදනම්ව යෝග්‍යතාවය පිළිබඳව බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාගේ තක්සේරුව.

(ආ) 4.3 (අ) හි දක්වා ඇති බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාගේ තක්සේරුව මත පදනම්ව මුදල් මණ්ඩලයේ පූර්ව අනුමැතිය.

(ඇ) වයස 70 ඉක්මවන අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව සමස්ත අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවෙන් $\frac{1}{5}$ කට සීමා වීම.

(ඈ) අනුමත දිනය වන විට, අදාළ අධ්‍යක්ෂවරයා විසින් ධූරයෙහි අවම වශයෙන් වසර 03 කට වඩා සම්පූර්ණ කර තිබීම.

5. අධ්‍යක්ෂවරුන් සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය පත් කිරීම සහ ඉල්ලා අස්වීම.

5.1 මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරන ලද (ප්‍රධාන වගකිව යුතු පුද්ගලයන්ගේ යෝග්‍යතාවය තක්සේරු කිරීම) විධානයේ ප්‍රතිපාදනවලට අනුකූලව, පත් කිරීම, ඉල්ලා අස්වීම සහ ඉවත් කිරීම සිදු කළ යුතුය.

6. සභාපතිවරයා සහ ප්‍රධාන විධායක නිලධාරියා

6.1 සභාපතිවරයා සහ ප්‍රධාන විධායක නිලධාරියා අතර පැහැදිලිව වගකීම් බෙදා දීමක් සිදු විය යුතු අතර, මෙකී තැනැත්තන්ගේ වගකීම් ලිඛිතව සඳහන් කළ යුතුය.

6.2 පහත සඳහන් 6.3 වගන්තියට යටත්ව සභාපතිවරයා ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු විය යුතුය.

6.3 සභාපතිවරයා ස්වාධීන නොවන අවස්ථාවක දී, වඩාත් ස්වාධීන තත්ත්වයක් ඇති කරලීම සඳහා සුදුසු ලේඛනගත යොමු නියමයන් සහිතව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු, ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරයෙකු ලෙස තෝරා පත් කර ගත යුතුය. ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරයා විසින් අනෙකුත් අධ්‍යක්ෂවරුන් සහ කොටස් හිමියන් අතර අතරමැදියා ලෙස කටයුතු කරනු ඇත. ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරයාගේ ඇතුළුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් විසින් සභාපතිවරයාගේ කාර්යසාධනය අවම වශයෙන් වාර්ෂිකව තක්සේරු කළ යුතුය.

6.4 සභාපතිවරයාගේ වගකීම්
සභාපතිවරයාගේ වගකීම් යටතට පහත සඳහන් කරුණු අවම වශයෙන් ඇතුළත් විය යුතුය.

(අ) අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය ලබා දීම.

(ආ) විධායක සහ විධායක නොවන අධ්‍යක්ෂවරුන් අතර බල තුලනයක් පවත්වාගෙන යෑම සහ තහවුරු කිරීම.

(ඇ) විධායක සහ විධායක නොවන අධ්‍යක්ෂවරුන් යන දෙපාර්ශවයේ ම ඵලදායී සහභාගීත්වය තහවුරු කිරීම.

(ඈ) අධ්‍යක්ෂ මණ්ඩලය ඵලදායී ලෙස කටයුතු කිරීම සහ වගකීම් නිසි ආකාරයෙන් ඉටු කිරීම තහවුරු කිරීම.

(ඉ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සියලු ප්‍රධාන ගැටලු කාලෝචිත ලෙස සාකච්ඡා කිරීම තහවුරු කිරීම.

(ඊ) නියාමනකරු විසින් ලබා දෙන තීරණ/ විධාන ක්‍රියාත්මක කිරීම සඳහා වගකීමෙන් කටයුතු කිරීම.

(උ) සෑම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් සඳහා ම න්‍යාය පත්‍රය සකස් කිරීමට වගකීමෙන් කටයුතු කිරීම සහ න්‍යාය පත්‍රය සකස් කිරීමේ කටයුත්ත සහ රැස්වීම් වාර්තාව පවත්වාගෙන යෑම සඳහා සමාගම් ලේකම් වෙත පැවරීම.

(ඌ) ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ සෘජු අධීක්ෂණය අවශ්‍ය වන කටයුතු හා දෛනික මෙහෙයුම් කටයුතු හා සම්බන්ධ නොවීම.

(එ) කොටස් හිමියන් සමඟ ඵලදායී සන්නිවේදනයක් පවත්වාගෙන යෑම සහ කොටස් හිමියන්ගේ අදහස් අධ්‍යක්ෂ මණ්ඩලයට සන්නිවේදනය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම තහවුරු කිරීම.

(ඒ) අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ ප්‍රධාන විධායක නිලධාරියාගේ පසුගිය මාස 12 ඇතුළත කාර්යසාධනය සහ දායකත්වය පිළිබඳව වාර්ෂික තක්සේරුව සිදු කිරීම.

6.5 ප්‍රධාන විධායක නිලධාරියාගේ වගකීම්

මුදල් සමාගමේ මෙහෙයුම් සහ ව්‍යාපාර දෛනික කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු ඉහළම විධායක නිලධාරියා ලෙස ප්‍රධාන විධායක නිලධාරියා කටයුතු කළ යුතුය. ප්‍රධාන විධායක නිලධාරියාගේ වගකීම්වලට අවම වශයෙන්;

(අ) මුදල් සමාගමේ උපායමාර්ගික පරමාර්ථ ළඟා කර ගැනීම සඳහා ව්‍යාපාර සහ ආපදා කළමනාකරණ උපායමාර්ග ක්‍රියාත්මක කිරීම.

(ආ) මුදල් සමාගමේ මෙහෙයුම් ක්‍රියාත්මක වන අතරතුර වගවීම සහ විනිවිදභාවය ප්‍රවර්ධනය කිරීම සඳහා කළමනාකරණ ව්‍යුහයක් ස්ථාපිත කිරීම සහ පාලන කටයුතුවල ඵලදායීත්වය සහ ස්වාධීනත්වය සුරක්ෂිත කිරීම.

(ඇ) ආචාර්යමත්, විචක්ෂණශීලී සහ වෘත්තීමය හැසිරීම ශක්තිමත් කරනු ලබන වඩාත් යහපත් ආයතනික සංස්කෘතියක් අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ එක්ව ප්‍රවර්ධනය කිරීම.

(ඈ) සුදුසු අනුකූලතා සංස්කෘතියක් ගොඩනැඟීම තහවුරු කිරීම සහ නියාමන ආයතනය වෙත නිර්වද්‍ය තොරතුරු සැපයීම සඳහා වගවීම.

(ඉ) නියාමන සහ අධීක්ෂණ අනුකූලතා රාමුව ශක්තිමත් කිරීම.

(ඊ) අධීක්ෂණ ගැටලු සහ අනුකූල නොවීම් සමඟ නියාමන අවශ්‍යතා හෝ අභ්‍යන්තර ප්‍රතිපත්ති කාලෝචිතව සහ යෝග්‍ය අයුරින් භාවිතය පිළිබඳ කටයුතු කිරීම.

(උ) 3.10 වන විධානයෙහි ප්‍රකාරව, වෙනත් සමාගමක විධායක නොවන අධ්‍යක්ෂකවරයෙකු වීම හැර, තම සම්පූර්ණ වෘත්තීය සේවා කාලය ප්‍රධාන විධායක නිලධාරියෙකු විසින් මුදල් සමාගමේ කටයුතු වෙනුවෙන් යෙදවිය යුතු අතර, වෙනත් ව්‍යාපාරයක් සිදු නොකළ යුතුය.
යන්න ඇතුළත් විය යුතුය.

7. අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම්

7.1 ආසන්න වශයෙන් මාසික කාල පරතරයකින්, මූල්‍ය වර්ෂයන් සඳහා අවම වශයෙන් දොළොස්වතාවක් අධ්‍යක්ෂ මණ්ඩලය රැස්විය යුතුය. ලේඛන සංසරණය කිරීමෙන් මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමෙන් හැකිතාක් වැළකිය යුතුය.

7.2 නියමිත අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා න්‍යාය පත්‍රයට කරුණු සහ යෝජනා ඇතුළත් කිරීමට අධ්‍යක්ෂවරුන්ට අවස්ථාව ලබා දීම සඳහා අවශ්‍ය පහසුකම් සලසා දීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තහවුරු කළ යුතුය.

7.3 නියමිත අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා අවම වශයෙන් දින තුනකට පෙර දැනුම් දීමක් කළ යුතුය. අනෙකුත් සියලුම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා, සාධාරණ දැනුම් දීමක් යුතුය.

7.4 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සුදානම් වී සහභාගී වීම සඳහා අධ්‍යක්ෂවරයෙකු විසින් ප්‍රමාණවත් කාලයක් වෙන් කළ යුතු අතර, අදහස් සහ යෝජනා ලබා දෙමින් සක්‍රීයව දායක විය යුතුය.

7.5 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් පැවැත්වීමට අවශ්‍ය අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවේ ගණ පූරණය රැස්ව සිටිය ද, අධ්‍යක්ෂවරුන්ගේ සංඛ්‍යාවේ ගණ පූරණයෙන් අවම වශයෙන් හතරෙන් එකක් (¼) ස්වාධීන අධ්‍යක්ෂවරුන් නොවුණහොත්, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් නිසි පරිදි පැවැත්විය නොහැක.

7.6 අවශ්‍ය ලෙස සහ වසරකට දෙවරක් අවම වශයෙන් විධායක අධ්‍යක්ෂවරුන්ගේ සහභාගීත්වයෙන් තොරව, විධායක නොවන අධ්‍යක්ෂවරුන් සමඟ සභාපතිවරයා විසින් රැස්වීම් පැවැත්විය හැකිය.

7.7 අධ්‍යක්ෂවරයෙකු හෝ ඥාතියෙකු හෝ ඔහුට සැලකිය යුතු බැඳියාවක් ඇති, බැඳියාවක් ඇති කරගැනීමට අපේක්ෂිත කාරණයක් හා සම්බන්ධ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනාවක දී ඡන්දය ප්‍රකාශ කිරීමෙන් අධ්‍යක්ෂවරයෙකු වැලකී සිටිය යුතු අතර, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ අදාළ න්‍යාය පත්‍ර අයිතමය සඳහා වන ගණ පූරණයට ගණනය නොකළ යුතුය.

7.8 ආසන්නතම මාස 12 ක කාල සීමාව තුළ පැවැත්වුණු රැස්වීම් වලින් අවම වශයෙන් තුනෙන් දෙකකට ($^2/_3$) හෝ අඛණ්ඩව පැවැත්වුණු රැස්වීම් තුනකට සහභාගී නොවූ අධ්‍යක්ෂවරයෙකු, අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කිරීමෙන් ඉවත් වනු ඇත. විකල්ප අධ්‍යක්ෂවරුන් සඳහා බලපානු ලබන විධානයන්ට යටත්ව, විකල්ප අධ්‍යක්ෂවරයෙකු හරහා අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීම සඳහා සහභාගී වීමෙන් පැමිණීම තහවුරු කිරීම පිළිගත හැකි වේ.

7.9 නියමිත රැස්වීම් සහ නියමිත පරිදි සැලසුම් නොකරන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්
නියමිත රැස්වීම් සඳහා පුද්ගලිකව සහභාගී වීම දිරිමත් කරන අතර කෙටි කාලීන දැනුම් දීමකින් අධ්‍යක්ෂවරයාහට පැමිණීමට අපහසු, පෙර සැලසුම් නොකරන ලද රැස්වීම් සඳහා විද්‍යුත් මාධ්‍ය හරහා සහභාගී වීම අනුමත කෙරේ.

8. සමාගම් ලේකම්වරයා

8.1 (අ) අධ්‍යක්ෂ මණ්ඩලය සහ කොටස් හිමියන්ගේ රැස්වීම් සඳහා ලේකම් කටයුතු මෙහෙයවීම සහ ව්‍යවස්ථාවන්ගේ සඳහන් අනෙකුත් කාර්යයන් සහ අනෙකුත් නියාමන පවත්වාගෙන යෑම මූලික වගකීමක් වන ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය ලෙස නම් කර ඇති සමාගම් ලේකම්වරයෙකු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කළ යුතුය.

(ආ) පහත සඳහන් 19.2 හි සඳහන් අන්තර්කාලීන විධිවිධාන යටතේ මුදල් සමාගමක් විසින් 2007 අංක 07 දරන සමාගම් පනතේ 222 වන වගන්තිය ප්‍රකාරව, සමාගමක ලේකම්වරයෙකු සඳහා නිර්දේශිත සුදුසුකම් සහිත තැනැත්තෙකු පත් කළ යුතුය. මුදල් සමාගමේ ලේකම්වරයා ලෙස පත් කිරීමෙන් පසු, එවැනි තැනැත්තෙකු මුදල් සමාගමේ සේවකයෙකු වන අතර, මුදල් සමාගමේ ලේකම්වරයා ලෙස කටයුතු කරන තෙක්, වෙනත් ආයතනයක සේවකයෙකු නොවිය යුතුය.

8.2 අධ්‍යක්ෂ මණ්ඩලයේ ක්‍රියාපටිපාටි සහ අදාළ වන නීති, විධාන, රීති සහ නියාමනයන් අනුගමනය කිරීම තහවුරු කිරීම උදෙසා සමාගමේ ලේකම්වරයාගේ උපදෙස් සහ සේවාවන් සඳහා සියලුම අධ්‍යක්ෂවරුන්හට ප්‍රවේශය ලබා දිය යුතුය.

8.3 අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම් සඳහා න්‍යාය පත්‍රය සකස් කිරීමේ කාර්යය සමාගමේ ලේකම්වරයා වෙත සභාපතිවරයා පවරා ඇත්නම්, එවැනි කාර්යයන් සම්පූර්ණ කිරීමේ වගකීම සමාගමේ ලේකම්වරයාහට පැවරේ.

8.4 සමාගමේ ලේකම්වරයා විසින් අවම වශයෙන් වසර 06 ක කාල සීමාවක් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල හඬ පටිගත කිරීම්/ වීඩියෝ පටිගත කිරීම් සහ/ හෝ අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කිරීම් සමඟ රැස්වීම් වාර්තා පවත්වා ගත යුතුය. අධ්‍යක්ෂ මණ්ඩලයට යවනු ලබන සියලු ඉදිරිපත් කිරීම් මෙයට ඇතුළත් විය යුතුය. සාධාරණ දැනුම් දීමකින්, ඕනෑම සාධාරණ අවස්ථාවක අධීක්ෂණය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා ඕනෑම අධ්‍යක්ෂවරයෙකු වෙත ලබා දීමට හැකි විය යුතුය.

8.5 රැස්වීම් වාර්තා ක්‍රමවත් ආකාරයකින් පවත්වාගෙන යෑම සඳහා සමාගම් ලේකම්වරයාට වගකීම පැවරෙන අතර මුදල් සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියේ සඳහන් සුදුසු ක්‍රියාපටිපාටිය අනුගමනය කළ යුතුය.

8.6 අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තම වගකීම් ඉටු කිරීමේ දී නිසි සැලකිල්ලෙන් සහ විචක්ෂණශීලීව කටයුතු කර ඇත්දැයි වාර්තා මඟින් දැන ගැනීම සඳහා හැකි වන අයුරින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තාවල පහත දක්වා ඇති විස්තර පැහැදිලිව අන්තර්ගත විය යුතුය. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තාවක; (අ) අධ්‍යක්ෂ මණ්ඩලය තම සාකච්ඡාවන්හී දී භාවිත කරනු ලබන දත්ත සහ තොරතුරු හි සාරාංශයක්; (ආ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සලකා බලන ලද කරුණු; (ඇ) සෑම අධ්‍යක්ෂවරයෙකු ම පුද්ගලිකව ලබා දෙන දායකත්වය ද ඇතුළුව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිය වගකීම් නිසි සැලකිල්ලෙන් සහ විචක්ෂණශීලීව ඉටු කරන වග දක්වන කරුණු සෙවීමේ සාකච්ඡා සහ සම්මුතිය සහ විසම්මුතිය පිළිබඳ ගැටලු; (ඈ) අධ්‍යක්ෂ මණ්ඩලයේ උපායමාර්ග හා අනුකූලතාවය සහ ප්‍රතිපත්ති සහ අදාළ නීති, නියාමන සහ විධාන අනුගමනය කරන අදාළ පාර්ශවයන්ගේ පැහැදිලි කිරීම් සහ සහතික කිරීම්; (ඉ) අධ්‍යක්ෂ මණ්ඩලයේ දැනුම සහ මුදල් සමාගම නිරාවරණය වන අවදානම හඳුනා ගැනීම සහ ප්‍රතිග්‍රහණය කරන ලද අවදානම් කළමනාකරණ ක්‍රියාමාර්ග පිළිබඳ විශ්ලේෂණයක්; සහ (ඊ) තීරණ සහ අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා.

8.7 අධ්‍යක්ෂවරයෙකුගේ සාධාරණ දැනුම් දීමකින් රැස්වීම් වාර්තා පරීක්ෂා කිරීම සඳහා සාධාරණ කාලයක් ලබා දිය යුතුය.

9. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කාර්යයන් පැවරීම

9.1 අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධිකාරිය පැවරීම අනුමත කළ යුතු අතර, ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය විසින් තීරණ ගැනීමට පෙර, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ යුතු කරුණු සම්බන්ධයෙන් පැහැදිලි විධාන ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය වෙත මුදල් සමාගම වෙනුවෙන් ලබා දිය යුතුය.

9.2 පහත 10 වන විධානයේ සඳහන් අනු කමිටු කිසිවක් නොමැති අවස්ථාවේ දී, එවැනි අනු කමිටු යටතේ නියම කර ඇති කාර්යයන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ම සිදු කර ගෙන යන බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තහවුරු කළ යුතුය.

9.3 අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩල තීරණවලදී සහාය ලබා දීමට නිසි අධිකාරිය පැවරීම සමඟ නිසි කළමනාකරණ මට්ටමේ අනු කමිටු පිහිටු වනු ඇත.

9.4 අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එහි කාර්යයන් ඉටු කිරීමට සමස්තයක් ලෙස, අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටුව, විධායක අධ්‍යක්ෂවරුන් නැතහොත් ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ හැකියාව සැලකිය යුතු ලෙස පීඩාවට ලක් කරනු ලබන නැතහොත් අඩු කරනු ලබන ප්‍රමාණයකට කිසිදු කාර්යයක් නොපැවරිය යුතුය.

9.5 මුදල් සමාගමේ අවශ්‍යතාවලට අදාළව පැවරීම් ක්‍රියාවලිය පවතින බව තහවුරු කර ගැනීමට යොදවා ඇති පැවරීම් ක්‍රියාවලිය වාරාන්තර පදනමක් මත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කළ යුතුය.

10. අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු

10.1 (අ) අධ්‍යක්ෂ මණ්ඩල කමිටු සඳහා අවශ්‍යතාවක් නිශ්චිතව දැක්වීමේ අරමුණ සඳහා, අවසන් වරට විගණනය කරන ලද ශේෂ පත්‍ර දිනට වත්කම් පදනම මත පදනම්ව මුදල් සමාගම් කොටස් දෙකකට බෙදනු ලැබේ. ඒවා නම්, 19.3 හි සඳහන් අන්තර් කාලීන විධිවිධානවලට යටත්ව, රුපියල් බිලියන 20 ට වැඩි වත්කම් පදනමක් සහිත මුදල් සමාගම් සහ රුපියල් බිලියන 20ට අඩු වත්කම් පදනමක් සහිත මුදල් සමාගම් වේ.

	රුපියල් බිලියන 20ට වැඩි වත්කම් පදනමක් සහිත මුදල් සමාගම්	රුපියල් බිලියන 20ට අඩු වත්කම් පදනමක් සහිත මුදල් සමාගම්
අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු	අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව, නාම යෝජනා කමිටුව, මානව සම්පත් සහ වැටුප් කමිටුව සහ ආශ්‍රිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුව	අවම වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සහ ආශ්‍රිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුවක් පිහිටු විය යුතුය.
රැස්වීම්	අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සඳහා රැස්වීම් අවම වශයෙන් මාස දෙකකට වරක් පැවැත්විය යුතුය. වෙනත් කමිටු අවම වශයෙන් වාර්ෂිකව රැස්විය යුතුය.	අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සඳහා රැස්වීම් අවම වශයෙන් කාර්තුමය වශයෙන් පැවැත්විය යුතුය. වෙනත් කමිටු අවම වශයෙන් වාර්ෂිකව රැස්විය යුතුය.

(ආ) සෑම කමිටුවකටම එහි අධිකාරය සහ රාජකාරීන් පැහැදිලිව සඳහන් කරමින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ලිඛිත නිර්දේශ නියමයන් තිබිය යුතුය.

(ඇ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාගමෙහි වාර්ෂික මහා සභා රැස්වීමේ දී එක් එක් කමිටුවෙහි රාජකාරීන් සහ කාර්යයන් ඉටු කිරීම පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය.

(ඈ) සෑම කමිටුවක්ම කමිටුවෙහි සභාපතිවරයාගේ අධීක්ෂණය යටතේ එහි රැස්වීම් සූදානම් කිරීමට, රැස්වීම් වාර්තා, හඬ හෝ වීඩියෝ පටිගත කිරීම් සහ එවැනි වෙනත් ලේඛනමය කටයුතු පවත්වා ගෙන යෑමට ලේකම්වරයෙකු පත් කළ යුතුය.

(ඉ) සෑම අධ්‍යක්ෂ මණ්ඩල කමිටුවක් ම අවම වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත විය යුතු අතර, එවැනි සාමාජිකයෙකු පත් කරන ලද කමිටුවෙහි වගකීම්වලට අදාළව කුසලතා, දැනුම සහ අත්දැකීම ඇති අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් පමණක් සමන්විත විය යුතුය. අනිසි බල සාන්ද්‍රණය අවම කිරීමට සහ නව දෘෂ්ටිකෝණයන් ප්‍රවර්ධනය කිරීමට කලින් කලට සාමාජිකයන් සහ එවැනි කමිටුවල සභාපතිවරයා වෙනස් මාරු කිරීමට සලකා බලනු ඇත.

10.2 අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවට පහත දෑ අදාළ විය යුතුය.

(අ) අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවෙහි සභාපතිවරයා ගිණුම්කරණය සහ/හෝ විගණනයෙහි සුදුසුකම් සහ අත්දැකීම් සතු ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු විය යුතුය.

(ආ) අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවට පත් කළ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් විය යුතු අතර, ඉන් බහුතරය අවශ්‍ය සුදුසුකම් සහ අත්දැකීම සතු ස්වාධීන අධ්‍යක්ෂවරුන් විය යුතුය.

(ඇ) අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවෙහි ලේකම් ලෙස ප්‍රධාන අභ්‍යන්තර විගණක කටයුතු කිරීම වඩාත් සුදුසු වේ.

(ඈ) බාහිර විගණක කාර්යය

i. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් අදාළ ව්‍යවස්ථාවට අනුකූලව විගණන සේවාවන් සඳහා බාහිර විගණකවරයෙකු පත් කිරීම, විගණකවරයාගේ සේවා කාලය, විගණන ගාස්තු සහ ඕනෑම ඉල්ලා අස්වීමක් හෝ සේවයෙන් පහ කිරීමකට අදාළව කරුණුවල දී නිර්දේශ සැපයිය යුතුය.

ii. විගණන හවුල්කරුවෙකුගේ ගිවිසුම වසර පහක් නොඉක්මවිය යුතු අතර, එම අදාළ විගණන හවුල්කරු පූර්ව ධූර කාලය සම්පූර්ණ කිරීමේ දිනයේ සිට තෙවසරක් කල් පිරීමට ප්‍රථම විගණනය සඳහා යළි ගිවිස නොගත යුතුය. තවද, මුදල් සමාගම විසින් පිළිවෙලින් වසර දහයකට නොවැඩි කාලයක් සඳහා එකම බාහිර විගණන ආයතනයේ සේවය භාවිත නොකළ යුතුය.

iii. මුදල් සමාගමක විගණන හවුල්කරු කිසිදු මුදල් සමාගමක සැලකිය යුතු කොටස්කරුවෙකු, අධ්‍යක්ෂවරයෙකු, ජ්‍යෙෂ්ඨ කළමනාකරුවෙකු නැතහොත් සේවකයෙකු නොවිය යුතුය.

iv. කමිටුව විසින් බාහිර විගණකවරයාගේ ස්වාධීනභාවය සහ විෂයනුබද්ධතාව සහ විගණන ක්‍රියාවලියන්හි සඵලදායීතාව අදාළ ප්‍රමිති සහ මනා භාවිතයන් සමාලෝචනය සහ අධීක්ෂණය කළ යුතුය.

v. විගණනය පවත්වා ගෙන යන එම වර්ෂය තුළ දී විගණන හවුල්කරුට මුදල් සමාගමේ වෙනත් විගණන නොවන සේවාවන් නොපැවරිය යුතුය. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් අදාළ නියාමන රාමුව යටතේ අවසර ලබා දී ඇති විගණන නොවන සේවා සැපයීමට බාහිර විගණන ආයතනයක ගිවිසුම මත අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව ප්‍රතිපත්තියක් සංවර්ධනය සහ ක්‍රියාත්මක කළ යුතුය. එලෙස සිදු කිරීමේ දී, විගණන නොවන සේවා ලබා දෙන බාහිර විගණන ආයතනයක සේවා සැපයීම මඟින් බාහිර විගණකයාගේ ස්වාධීනභාවය සහ විෂයානුබද්ධතාවයට හානියක් සිදු නොකරන බවට කමිටුව විසින් තහවුරු කරනු ලැබිය යුතුය.

vi. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව, විගණනය ඇරඹීමට පෙර, පහත කරුණු ඇතුලුව විගණනයේ ස්වභාවය සහ විෂය පථය සාකච්ඡා කර අවසන් කළ යුතුය. (i) මූල්‍ය වාර්තාකරණය මඟින් කළමනාකරණයේ අභ්‍යන්තර පාලන සහ මෙම පනත යටතේ නිකුත් ලද විධාන සමඟ මුදල් සමාගමේ අනුකූලභාවයේ තක්සේරුවක්. (ii) අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වාර්තාකරණ වගකීම් හා අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම; සහ (iii) එක් විගණකයෙකුට වැඩි ගණනක් කාර්යයෙහි නිරත වී සිටින විට විගණකයන් අතර සම්බන්ධීකරණය.

vii. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් මුදල් සමාගමක් එහි වාර්ෂික වාර්තා තුළ ඇතුළත් කර ඇති මූල්‍ය ප්‍රකාශ, අනාවරණය සඳහා පිළියෙල කළ ගිණුම් සහ කලින් කල ඉදිරිපත් කරන වාර්තාවල සහ ඒවායෙහි අඩංගු සුවිශේෂී මූල්‍ය වාර්තාකරණ විනිශ්චයන් යනාදී එම මුදල් සමාගමෙහි මූල්‍ය තොරතුරු සමාලෝචනය කළ යුතුය. අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීමට ප්‍රථම, මුදල් සමාගමේ වාර්ෂික වාර්තාව සහ ගිණුම්, කලින් කල ඉදිරිපත් කරන වාර්තා සමාලෝචනය කිරීමේ දී, කමිටුව විසින් (i) ප්‍රධාන විනිශ්චයාත්මක අංශ; (ii) ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පරිචයන් තුළ සිදු කෙරෙන ඕනෑම වෙනස්කමක්; (iii) විගණනයෙන් හට ගන්නා සැලකිය යුතු ගැළපුම් (iv) අඛණ්ඩ පැවැත්ම උපකල්පනය; (v) අදාළ ගිණුම්කරණ ප්‍රමිති සහ වෙනත් නෛතික අවශ්‍යතා හා අනුකූල වීම යන කරුණු කෙරෙහි විශේෂයෙන් ම අවධානය යොමු කළ යුතුය.

viii. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් අතුරු සහ අවසන් විගණන වලින් හට ගන්නා විශේෂ නියමයන්, ගැටලු, ප්‍රශ්න මෙන්ම, අවශ්‍ය නම් ජ්‍යෙෂ්ඨ කළමනාකරණය නොමැති විට දී සාකච්ඡා කිරීමට අවශ්‍ය කරුණු ඇතුළුව විගණකවරයා විසින් සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වන ඕනෑම කරුණක් සාකච්ඡා කළ යුතුය.

ix. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් බාහිර විගණකවරයෙකුගේ කළමනාකරණ ලිපිය සහ කළමනාකරණයෙන් ඊට ලැබුණු ප්‍රතිචාරය එවැන්නක් යොමු කිරීමෙන් තෙමසක් ඇතුළත සමාලෝචනය කළ යුතු අතර, අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කළ යුතුය.

(ඉ) අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් අභ්‍යන්තර පාලන පද්ධතියේ ඵලදායීත්වය සමාලෝචනය අවම වශයෙන් වාර්ෂිකව සිදු කළ යුතුය.

(ඊ) මුදල් සමාගමේ අභ්‍යන්තර විගණන කාර්යයට අදාළව විගණකවරුන් සහ අධීක්ෂණ ආයතන විසින් හඳුනා ගනු ලබන අභ්‍යන්තර පාලන දුර්වලතා, ප්‍රතිපත්තිවලට අනුකූල නොවීම, නීති සහ රෙගුලාසි හා වෙනත් ගැටලු සඳහා පිළියම් යෙදීමට ජ්‍යෙෂ්ඨ කළමනාකරණය විසින් කාලීන ආකාරයකින් අවශ්‍ය නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගනු ලබන බවට කමිටුව විසින් තහවුරු කරනු ලැබිය යුතුය.

(උ) අභ්‍යන්තර විගණන කාර්යය

i. මුදල් සමාගමේ අභ්‍යන්තර පාලන, අවදානම් කළමනාකරණය, යහපාලන පද්ධති සහ ක්‍රියාවලියන්හි ගුණාත්මකභාවය සහ සඵලදායීත්වය පිළිබඳ කමිටුව වෙත විෂයානුබද්ධ සහතික කිරීමක් සලසන ස්වාධීන අභ්‍යන්තර විගණන කාර්යයක් (ව්‍යාපාර මෙහෙයුම් කටයුතු සම්බන්ධව බාහිර සේවා ලබා ගැනීම විධානයෙහි නියමකර ඇති විධිවිධාන ප්‍රකාරව අභ්‍යන්තර හෝ බාහිර) කමිටුව විසින් ස්ථාපිත කළ යුතුය.

ii. අභ්‍යන්තර විගණන කාර්යයට පැහැදිලි විධි නියෝගයක් තිබිය යුතු අතර, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවට වගකිව යුතුය. මුදල් සමාගමකට ඔවුන්ගේ පැවරුම් සඵලදායීව සහ විෂය මූලිකව සිදු කර ගෙන යාමට එම ආයතනය තුළ ප්‍රමාණවත් ප්‍රවීණතාව සහ අධිකාරිය සතු විය යුතුය.

iii. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් මුදල් සමාගමෙහි අභ්‍යන්තර විගණන කාර්යයට පහත පියවර ගත යුතුය.

(i) අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවෙහි විෂය පථය, කාර්යයන්, කුසලතා සහ සම්පත්වල ප්‍රමාණවත් බව සමාලෝචනය කළ යුතු අතර, දෙපාර්තමේන්තුවට එහි කාර්යයන් සිදු කර ගෙන යෑමට අවශ්‍ය බලතල පවතින බවට සහතික කිරීම.

(ii) අභ්‍යන්තර විගණන වැඩසටහන සහ අභ්‍යන්තර විගණන ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සහ අවශ්‍ය විට දී අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ නිර්දේශයන් මත නිසි ක්‍රියාමාර්ග ගන්නා බවට තහවුරු කිරීම.

(iii) අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන සහ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ කාර්යසාධනය තක්සේරු කිරීම

(iv) අභ්‍යන්තර විගණන කාර්යය එය විගණනය සිදු කරන කාර්යයන්ගෙන් ස්වාධීන බවට සහ එය අපක්ෂපාතීව, ප්‍රවීණත්වයෙන් සහ නිසි වෘත්තීමය සැලකිල්ලෙන් සිදු කෙරෙන බවට තහවුරු කිරීම.

(v) අභ්‍යන්තර විගණන කාර්යය අනුකූලතා කාර්යයෙහි සහ නියාමන වාර්තාකරණයෙහි කලින් කලට සමාලෝචනය සිදු කරනු ලබන බවට තහවුරු කිරීම.

(vi) අභ්‍යන්තර විමර්ශනයන්හි ප්‍රධාන සොයා ගැනීම් සහ ඊට කළමනාකරණය දැක් වූ ප්‍රතිචාර සලකා බලනු ලැබිය යුතු ය.

(ඌ) අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ව්‍යවස්ථාපිත පරීක්ෂණ වාර්තා සමාලෝචනය කරනු ලැබිය යුතු අතර, අවශ්‍ය නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග කාලීන ආකාරයකට ගෙන ඇති බවට තහවුරු කිරීම සහ කාර්තුමය වශයෙන් කාලානුරූපී ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය අධීක්ෂණය කළ යුතුය.

(එ) කමිටුවේ රැස්වීම්

(i) අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් සාකච්ඡා කිරීමට නියමිත ගැටලු සම්බන්ධ නිසි නිවේදනයක් සිදු කිරීමෙන්, ඉහත 10.1 හි නිශ්චිතව දක්වා ඇති පරිදි රැස් විය යුතු අතර, එහි යුතුකම් හා වගකීම් ඉටු කිරීමේ දී එය විසින් ගනු ලබන තීරණ වාර්තා කළ යුතුය.

(ii) වෙනත් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්, ජ්‍යෙෂ්ඨ කළමනාකරණය හෝ වෙනත් ඕනෑම සේවකයෙකු ඔවුන්ගේ විෂය පථය යටතේ කරුණු සාකච්ඡා කිරීමේ දී කමිටුවෙහි ආරාධනය මත රැස්වීම්වලට සහභාගී වනු ඇත.

(iii) අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් වෙනත් ඕනෑම අධ්‍යක්ෂවරයෙකු/සේවකයෙකුගේ සහභාගීත්වයෙන් තොරව බාහිර විගණකවරුන් සමඟ අවම වශයෙන් වසරකට දෙවරක් හමුවිය යුතුය.

10.3 අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව හා සම්බන්ධව පහත දෑ අදාළ විය යුතුය.

(අ) ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු විසින් අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවෙහි සභාපතීත්වය දැරිය යුතුය. අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට පත් කරන ලද අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් විධායක නොවන අධ්‍යක්ෂවරුන් ගෙන් සමන්විත විය යුතු අතර, බැංකුකරණය, මූල්‍යය, අවදානම් කළමනාකරණ ගැටලු සහ පරිචයන්හි දැනුම සහ අත්දැකීම් සහිත සාමාජිකයන් එහි ඇතුළත් විය යුතුය. ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන අවදානම් කළමනාකරුට ආරාධනය මත රැස්වීම් සඳහා සහභාගී විය හැකිය. අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව, ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය සමඟ සමීපව කටයුතු කළ යුතු අතර, කමිටුවට පවරා ඇති අධිකාරීත්ව සහ වගකීම් රාමුව තුළ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් තීරණ ගත යුතුය.

(ආ) කමිටුවේ ලේකම් ලෙස ප්‍රධාන අවදානම් නිලධාරී කටයුතු කිරීම වඩාත් සුදුසු වේ.

(ඇ) කමිටුව විසින් සුදුසු අවදානම් දර්ශක සහ කළමනාකරණ තොරතුරු ඔස්සේ අවම වශයෙන්, මාස දෙකකට වරක් යන පදනම මත මුදල් සමාගම වෙත සියලු අවදානම්, එනම්, ණය වෙළඳපොල, ද්‍රවශීලතාව, මෙහෙයුම්, ක්‍රමෝපායික, අනුකූලතා සහ තාක්ෂණික යනාදී අවදානම් තක්සේරු කළ යුතු අතර, අවදානම් ක්‍රමෝපායන් සහ අවදානම් අභිරුචිය පිළිබඳ නිර්දේශ සැපයිය යුතුය.

(ඈ) මුදල් සමාගමක් විසින් එහි ක්‍රමෝපායික ව්‍යාපාරික අරමුණු සාක්ෂාත් කර ගැනීමට පිළිගනු ඇති හෝ ප්‍රතික්ෂේප කරනු ඇති අවදානම් වර්ග සහ පුද්ගල සහ ඒකාබද්ධ මට්ටම සම්බන්ධ කරන, අවදානම් දැරීමට සූදානම් වීමේ ප්‍රකාශයක් ඔස්සේ මූල්‍ය සමාගමේ අභිරුචිය සංවර්ධනය කිරීම සහ නිර්වචනය කිරීම. කීර්තිය සහ අනුකූලතා අවදානම් මෙන්ම, මුදල් විශුද්ධිකරණය සහ සදාචාරාත්මක නොවන පරිචයන්ට පිළියම් යෙදීම සඳහා ඉපැයුම්, ප්‍රාග්ධනය, ද්‍රවශීලතාව යනාදී කරුණුවලට සාපේක්ෂව ප්‍රකාශිත ප්‍රමාණාත්මක පියවර සහ ගුණාත්මක පියවර අවදානම් දැරීමට සූදානම් වීමේ ප්‍රකාශයට ඇතුළත් විය යුතුය. මුදල් සමාගම ව්‍යාපාර ක්‍රමෝපාය අනුගමනය කිරීමේ දී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ආකාරයට අනුව අවදානම් දැරීමට සූදානම් වීමේ ප්‍රකාශය මඟින් සීමාවන් සහ ව්‍යාපාර ප්‍රතිෂ්ඨාවන් ද නිර්වචනය කළ යුතු අතර, මුදල් සමාගම මුළුල්ලේ අවදානම් ගැටලු සහ ක්‍රමෝපායික සලකා බැලීම් මතු කිරීමට විධික්‍රම පිහිටුවීම සහ අවදානම් අභිරුචිය දෛනික මෙහෙයුම් තීරණ ගැනීම වෙත සම්බන්ධ කරමින් එය සන්නිවේදනය කළ යුතුය.

(ඉ) ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් අවම වශයෙන් වාර්ෂිකව අවදානම් දැරීමට සූදානම් වීමේ ප්‍රකාශය ඇතුලුව මූල්‍ය සමාගමෙහි අවදානම් ප්‍රතිපත්තීන් සමාලෝචනය කළ යුතුය.

(ඊ) අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් නිශ්චිත කරනු ලැබූ පරිදි ගුණාත්මක සහ ප්‍රමාණාත්මක අවදානම් සීමා තුළ නිශ්චිත අවදානම් සඳහා පිළියම් යෙදීමට සහ එම අවදානම් කළමනාකරණය කිරීමට කළමනාකාරීත්ව මට්ටමේ කමිටුවල (ණය, වෙළඳපොල, ද්‍රවශීලතාව සහ මෙහෙයුම්) ප්‍රමාණාත්මකභාවය සහ සඵලදායීත්වය සමාලෝචනය කරනු ලැබිය යුතුය.

(උ) කමිටුව විසින් යාවත්කාලීන කළ ව්‍යාපාර අඛණ්ඩතාව සහ ආපදා ප්‍රතිසාධන සැලැස්ම ඇතුලුව අවදානම් කළමනාකරණයේ සියලු පැතිකඩ තක්සේරු කළ යුතුය.

(ඌ) කමිටුව විසින් අනුකූලතා නිලධාරිවරයාගේ සහ ප්‍රධාන අවදානම් නිලධාරීවරයාගේ කාර්යසාධනය වාර්ෂිකව තක්සේරු කළ යුතුය.

(එ) අනුකූලතා කාර්යය

i. ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් ව්‍යාපාර මෙහෙයුම්වල සියලු අංශ මත නීති, රෙගුලාසි, විධාන, රීති, නියාමන මාර්ගෝපදේශ සහ අනුමත ප්‍රතිපත්තීන් සමඟ මුදල් සමාගම දක්වන අනුකූලත්වය තක්සේරු කිරීමට ස්වාධීන අනුකූලත්ව කාර්යයක් පිහිටුවිය යුතුය.

ii. රුපියල් බිලියන 20 කට වැඩි වත්කම් පදනමක් සහිත බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා දෛනික කළමනාකරණයෙන් ස්වාධීන වන, ප්‍රමාණවත් ජ්‍යෙෂ්ඨත්වයක් සහිත ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය ලෙස සැලකෙන, කැප වූ ප්‍රධාන අනුකූලතා නිලධාරියෙකු අනුකූලතා කාර්යය සිදු කර ගෙන යා යුතු අතර, ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත ඍජුව වාර්තා කළ යුතුය. අනුකූලතා නිලධාරියාට කිසිදු මෙහෙයුම් ව්‍යාපාර ක්‍රියාමාර්ග නැතහොත් ආදායම් උත්පාදන කාර්යයන් හා සම්බන්ධ කළමනාකාරීත්ව හෝ මූල්‍ය වගකීමක් සතු නොවන අතර, ද්විත්ව කාර්යයන් පැවරීම සිදු නොකළ යුතුය. එනම්, ප්‍රධාන මෙහෙයුම් නිලධාරී, ප්‍රධාන මූල්‍ය නිලධාරී, ප්‍රධාන අභ්‍යන්තර විගණක, ප්‍රධාන අවදානම් නිලධාරී හෝ වෙනත් ඕනෑම ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයක් අනුකූලතා නිලධාරියා ලෙස කටයුතු නොකළ යුතුය.

iii. රුපියල් බිලියන 20 කට වඩා අඩු වත්කම් පදනමක් සහිත මූල්‍ය සමාගම් සඳහා, ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය බවට සැලකෙන ප්‍රමාණවත් ජ්‍යෙෂ්ඨත්වයක් සහිත නිලධාරියෙකු විවිධ අභිරුචීන් සඳහා මත ගැටුම් ඇති වීම වැළැක්වීමට අනුකූලතා නිලධාරියෙකු ලෙස පත් කළ යුතුය.

iv. අනුකූලතා නිලධාරියෙකුගේ වගකීම්වලට පුළුල් ලෙස පහත කරුණු ඇතුළත් වන බවට ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් තහවුරු කරනු ලැබිය යුතුය. (i) නියාමන අවශ්‍යතා උල්ලංඝනය කිරීමේ අවදානම තුරන් කිරීමට හෝ අවම කිරීමට සැලසුම් කර ඇති ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම. (ii) සියලු මට්ටම්වල අනුකූලතා සංස්කෘතිය වර්ධනය කිරීමට මූල්‍ය සමාගමෙහි සියලු මට්ටම් වෙත අනුකූලතා ප්‍රතිපත්ති සහ ක්‍රියාවලි පැහැදිලිව සන්නිවේදනය කෙරෙන බවට තහවුරු කිරීම; (iii) නියාමන රීති සහ අභ්‍යන්තර අනුකූලතා ප්‍රමිති සමඟ අනුකූලත්වය තක්සේරු කිරීමට සුදුසු වාර ගණනින් සමාලෝචන සිදු කෙරෙන බවට තහවුරු කිරීම; (iv) මුදල් සමාගමෙහි ව්‍යාපාරයට අදාළ සියලු නව නෛතික සහ නියාමන සංවර්ධනයන් අවබෝධ කර ගැනීම සහ යෙදවීම; (v) නියාමන අවශ්‍යතා, අභ්‍යන්තර අනුකූලතාව සහ සදාචාරාත්මක වන නව නිෂ්පාදන සහ පද්ධති අනුකූල වන බව තහවුරු කිරීමට ඒවායෙහි සැලැස්ම සහ ව්‍යුහකරණය තුළ පූර්ව මැදිහත් වීම තහවුරු කිරීම; (vi) තදබල සහ නොනැවතී පවත්නා අනුකූලතා ගැටලු ඉස්මතු කර, සුදුසු අවස්ථාවක දී, ඒවා පිළිගත හැකි කාලයක් තුළ දී නිවැරදි කෙරෙන බව තහවුරු කිරීමට කළමනාකාරීත්වය සමඟ කටයුතු කිරීම; සහ (vii) පැහැදිලි හා කාලීන සන්නිවේදනයක් සහ උසස් අඛණ්ඩතාවක් සමඟ නියාමකයන්ගේ අරමුණු අන්‍යෝන්‍ය වශයෙන් අවබෝධ කර ගැනීම මත පදනම්ව, නියාමකයන් සමඟ ක්‍රමවත් සම්බන්ධතාවක් සහ යහපත් රැකියා සබඳතාවක් පවත්වා ගෙන යෑම.

(එ) අවදානම් කළමනාකරණ කාර්යය

i. ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් මුදල් සමාගම හරහා අවදානම් ගැනීමේ කටයුතු කළමනාකරණය සඳහා වගකිව යුතු ස්වාධීන අවදානම් කළමනාකරණ කාර්යයක් පිහිටු විය යුතුය.

ii. රුපියල් බිලියන 20 ට වඩා වැඩි වත්කම් පදනමක් සහිත මුදල් සමාගම් සඳහා වෙනම අවදානම් කළමනාකරණ දෙපාර්තුමේන්තුවක් පවත්වා ගෙන යෑම අපේක්ෂා කරන අතර, ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය ලෙස සලකනු ලබන කැප වූ ප්‍රධාන අවදානම් නිලධාරියෙකු විසින් අවදානම් කළමනාකරණ කාර්යය සිදු කර ගෙන යෑම සහ වාරාන්තරව ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත වාර්තා කිරීම සිදු කළ යුතුය.

iii. මුදල් සමාගමෙහි අවදානම් කළමනාකරණ කාර්යය එහි ක්‍රමෝපායික අරමුණු කරා සහාය දැක්වීමට ශක්තිමත් සහ සඵලදායී බව තහවුරු කිරීම සඳහා සහ විවිධ ඇල්මැති පාර්ශ්වයන් වෙත වඩා පුළුල් වගකීම් ඉටු කිරීමට අවදානම් දැරීමට සූදානම් වීමේ ප්‍රකාශය ඇතුළුව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ ක්‍රියාවලි ක්‍රියාත්මක කිරීමේ මූලික වගකීම ප්‍රධාන අවදානම් නිලධාරියා සතු වේ.

iv. (i) විවිධ විභව අවදානම් සහ වංචා; (ii) එවැනි අවදානම් සහ වංචාව සිදු විය හැකි මූලාශ්‍ර; (iii) ආතති පරීක්ෂණය ආවරණය කරන, ප්‍රමාණාත්මක සහ ගුණාත්මක විශ්ලේෂණය ඇතුළත් වන එවැනි අවදානම් හඳුනා ගැනීමේ, තක්සේරු කිරීමේ, අධීක්ෂණය කිරීමේ සහ වාර්තා කිරීමේ යාන්ත්‍රණය; (iv) විචක්ෂණ මට්ටම්වල දී අවදානම් පාලනය සහ අවම කිරීමට ගනු ලබන සාර්ථක ක්‍රියාමාර්ග; සහ (v) එවැනි පාලන සහ අවම කිරීම් සඳහා වගකිව යුතු අදාළ නිලධාරීන් සහ කමිටු යන කරුණු ආවරණය කරන, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුවක් සංවර්ධනය සහ ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රධාන අවදානම් නිලධාරියා වගකිව යුතු බවට ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් තහවුරු කරනු ලැබිය යුතුය. මෙම රාමුව අවම වශයෙන් වාර්ෂිකව සමාලෝචනය කර යාවත්කාලීන කළ යුතුය.

v. ප්‍රධාන අවදානම් නිලධාරියා විසින් ප්‍රාග්ධන සහ ද්‍රවශීලතා සැලසුම්කරණය, නව නිෂ්පාදන සහ සේවා සංවර්ධනය යනාදී ප්‍රධාන තීරණ ගැනීමේ ක්‍රියාවලි සඳහා ද සහභාගී විය යුතු අතර, අවදානම් කළමනාකරණය පිළිබඳ නිර්දේශ සැපයිය යුතුය.

vi. ප්‍රධාන අවදානම් නිලධාරියා විසින් කාර්තුමය පදනමක් මත ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත යොමු කළ යුතු යාවත්කාලීන කළ අවදානම් ලේඛනයක් පවත්වා ගෙන යා යුතුය.

vii අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස්, සමගාමීත්වය සහ/ හෝ නිශ්චිත විධාන ප්‍රකාශයට පත් කරන මීළඟ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම සඳහා වහාම අවදානම් තක්සේරු වාර්තාවක් යොමු කළ යුතුය.

10.4 නාම යෝජනා කමිටුව

නාම යෝජනා කමිටුවට පහත දෑ අදාළ වේ:

(අ) කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත විය යුතු අතර, අභිමත පරිදි බහුතරය ස්වාධීන අධ්‍යක්ෂවරුන් විය යුතුය. ප්‍රධාන විධායක නිලධාරියාහට කමිටුවෙහි ආරාධනය මත රැස්වීම් සඳහා සහභාගී විය හැකිය.

(ආ) නාමයෝජනා කමිටුවෙහි ලේකම් ලෙස සමාගම් ලේකම් කටයුතු කිරීම වඩාත් සුදුසු වේ.

(ඇ) කමිටුව විසින් නව අධ්‍යක්ෂවරුන්, ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය තෝරා ගැනීම/ පත් කිරීම සඳහා විධිමත් හා පාරදෘශ්‍ය ක්‍රියාමාර්ගයක් ක්‍රියාත්මක කළ යුතුය. ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා හැරුණු කොට, ප්‍රධාන අවදානම් නිලධාරියා සහ ප්‍රධාන අනුකූලතා නිලධාරියා, වෙනත් ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය, අවශ්‍ය පරිදි ප්‍රධාන විධායක නිලධාරියාගේ නිර්දේශය මත පත් කළ යුතුය.

(ඈ) අධ්‍යක්ෂවරුන් සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරන ලද (ප්‍රධාන වගකිව යුතු පුද්ගලයන්ගේ යෝග්‍යතාවය තක්සේරු කිරීම) විධානයට අනුව ඔවුන්ගේ කාර්යයන් ඉටු කිරීමට සුදුසු සහ යෝග්‍ය බවට කමිටුව විසින් තහවුරු කළ යුතුය.

(ඉ) තෝරා ගැනීමේ ක්‍රියාවලියට යෝජිත අධ්‍යක්ෂවරුන්ට (i) අධ්‍යක්ෂ මණ්ඩලයෙහි ඔවුන්ගේ වගකීම් ඉටු කිරීමට දැනුම, කුසලතා, අත්දැකීම, ස්වාධීනත්වය සහ විෂයානුබද්ධතාව සතු වන්නේ ද (ii) අවංකභාවය සහ හොඳ කීර්තියක් සතු වන්නේද (iii) ඔවුන්ගේ වගකීම් සම්පූර්ණයෙන් කර ගෙන යෑමට ප්‍රමාණවත් කාලයක් සතු වන්නේ ද යන්න සමාලෝචනය කිරීම ඇතුළත් විය යුතුය.

(ඊ) අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය සමස්තයක් ලෙස මුදල් සමාගමෙහි ඇල්මැති පාර්ශවයන්ගේ අවශ්‍යතා වලට අනර්ථයක් වන තත්ත්වයක් ඇති කරන ඕනෑම පුද්ගලයෙකු නැතහොත් පුද්ගලයන්ගෙන් සමන්විත කුඩා කණ්ඩායමකින් බලනොපැවැත්වෙන බව තහවුරු කිරීමට කමිටුව උත්සාහ දැරිය යුතුය.

(උ) කමිටුව විසින් ප්‍රධාන විධායක නිලධාරියා සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයෙහි තනතුරු සඳහා පත් කිරීමට සලකා බැලිය යුතු සුදුසුකම්, අත්දැකීම සහ යෝග්‍යතාව සඳහා අවශ්‍ය වන නිර්ණායක සකස් කළ යුතුය.

(ඌ) නව අධ්‍යක්ෂවරයෙකු අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කිරීම මත, මුදල් සමාගම විසින් වහාම කොටස්කරුවන් වෙත පහත දෑ අනාවරණය කළ යුතුය: (i) අධ්‍යක්ෂවරයා පිළිබඳ කෙටි හැඳින්වීමක් (ii) අදාළ ක්‍රියාකාරී අංශවල ප්‍රවීණතාවයේ ස්වභාවය; (iii) අධ්‍යක්ෂවරයා, අධ්‍යක්ෂ මණ්ඩල කමිටුවල අධ්‍යක්ෂභාවයන් සහ සාමාජිකත්වයන් දරන සමාගම්වල නම්; සහ (iv) එවැනි අධ්‍යක්ෂවරයෙකු ස්වාධීන බවට සැලකිය හැකි ද යන වග.

(එ) ඒකාබද්ධ වූ දැනුම, මුදල් සමාගම විසින් මුහුණ දෙන ලද ක්‍රමෝපායික ඉල්ලුම් කරා කාර්යසාධනය සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ සමස්ත වගකීම් ඉටු කිරීම උදෙසා අධ්‍යක්ෂවරයා විසින් සිදු කරනු ලබන දායකත්වය යන කරුණු සැලකිල්ලට ගනිමින්, කමිටුව විසින් දැනට සිටින අධ්‍යක්ෂවරුන් යළි තෝරා පත් කිරීමට සලකා බැලීම සහ නිර්දේශ කිරීම (නැතහොත් නිර්දේශ නොකිරීම) සිදු කරනු ලැබිය යුතුය.

(ඒ) කමිටුව විසින් අතිරේක/නව ප්‍රවීණතාව සඳහා වන අවශ්‍යතාවන් සහ විශ්‍රාම යන අධ්‍යක්ෂවරුන් සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය සඳහා අනුප්‍රාප්ති සැකසුම් කලින් කලට සලකා බැලීම සහ නිර්දේශ කරනු ලැබීම සිදු කළ යුතුය.

(ඓ) නාම යෝජනා කමිටුවෙහි සාමාජිකයෙකු ස්වකීය පත් කිරීම/ යළි පත් කරනු ලැබීමට අදාළව තීරණ ගැනීම සඳහා සහභාගී නොවිය යුතු අතර, අධ්‍යක්ෂ මණ්ඩලයෙහි සභාපතිවරයා අනුප්‍රාප්තිකයකු පත් කිරීම සම්බන්ධව කටයුතු කරන කමිටුවක දී එහි සභාපතීත්වය නොදැරිය යුතුය.

10.5 මානව සම්පත් සහ වැටුප් කමිටුව

මානව සම්පත් සහ වැටුප් කමිටුවට පහත දෑ අදාළ විය යුතුය.

(අ) විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු විසින් කමිටුවේ සභාපතීත්වය දරනු ලැබිය යුතු අතර, සාමාජිකයන්ගෙන් බහුතරය විධායක නොවන අධ්‍යක්ෂවරුන් ගෙන් සමන්විත විය යුතුය.

(ආ) මානව සම්පත් සහ වැටුප් කමිටුවෙහි ලේකම් ලෙස සමාගම් ලේකම් කටයුතු කිරීම සුදුසු වේ.

(ඇ) කමිටුව විසින් මුදල් සමාගමෙහි විධායක අධ්‍යක්ෂවරුන් සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය මෙන්ම, විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ ගාස්තු සහ දීමනා ව්‍යුහයට අදාළව වැටුප් ප්‍රතිපත්තිය (වැටුප්, දීමනා, සහ වෙනත් මූල්‍ය ගෙවීම්) නියම කරනු ලැබිය යුතුය.

(ඈ) වැටුප් ප්‍රතිපත්තිය සංවර්ධනය කිරීමේ දී විධිමත් සහ පාරදෘශ්‍ය ක්‍රියාමාර්ගයක් තිබිය යුතුය.

(ඉ) කමිටුව විසින් මුදල් සමාගමෙහි සියලු සේවකයන් සඳහා වැටුප්, දීමනා සහ අනෙකුත් මූල්‍ය දිරි දීමනා ගෙවීම පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා වැටුප් ප්‍රතිපත්තිය නිර්දේශ කරනු ලැබිය යුතුය. වැදගත් වෙනස් වීම් සිදු කළ අවස්ථා ද ඇතුලුව, මෙම ප්‍රතිපත්තිය අධ්‍යක්ෂ මණ්ඩලයේ කලින් කලට සිදු කෙරෙන සමාලෝචනයට යටත් විය යුතුය.

(ඊ) වැටුප් ව්‍යුහය මුදල් සමාගමෙහි ව්‍යාපාර ක්‍රමෝපාය, අරමුණු, අගයන්, දිගු කාලීන අභිලාෂ සහ පිරිවැය ව්‍යුහය හා අනුකූල විය යුතුය. බැඳියාවන් අතර ගැටුම් වැළැක්වීම සඳහා පියවර ද එහි ඇතුළත් විය යුතුය. විශේෂයෙන්ම, වැටුප් ව්‍යුහයන් හා සම්බන්ධ කර තිබෙන දිරි දීමනා මඟින් කාර්ය මණ්ඩලය අධික අවදානම් ගැනීමට නැතහොත් ස්වයං අභිලාෂයෙන් ක්‍රියා කිරීමට පෙළඹවීම සිදු නොකළ යුතුය.

(උ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවම වශයෙන් වාර්ෂිකව අනුමත කර ඇති ඉලක්ක සහ අභිමතාර්ථවලට එරෙහිව කමිටුව විසින් ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ කාර්යසාධනය (ප්‍රධාන අභ්‍යන්තර විගණක, ප්‍රධාන අනුකූලතා නිලධාරී, ප්‍රධාන අවදානම් නිලධාරී හැරුණු කොට) සමාලෝචනය කරනු ලැබිය යුතු අතර, වැටුප්, ප්‍රතිලාභ සහ කාර්යසාධනය පදනම් කර ගත් දිරි දීමනාවන්හි වෙනත් ගෙවීම් ප්‍රතිශෝධනය සඳහා පදනම නිර්ණය කළ යුතුය.

(ඌ) ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය, කමිටු රැස්වීම්වලදී ඔවුනට සම්බන්ධ කරුණු සාකච්ඡා කරන විට දී, එම රැස්වීම්වලට සහභාගී වීමෙන් වැළකී සිටින බවට කමිටුව විසින් තහවුරු කළ යුතුය.

11. අභ්‍යන්තර පාලන

11.1 මුදල් සමාගම් විසින් සංවිධානාත්මක ව්‍යුහය, රාජකාරී කටයුතු බෙදා වෙන් කිරීම, පැහැදිලි කළමනාකරණ වාර්තා කිරීමේ මාර්ග සහ මෙහෙයුම් අවදානම් අවම කිරීම සඳහා ප්‍රමාණවත් මෙහෙයුම් ක්‍රියාමාර්ග ඇතුළත් වන, මනා ලෙස පිහිටුවන ලද අභ්‍යන්තර පාලන පද්ධතියක් අනුගමනය කළ යුතුය.

11.2 නිසි අභ්‍යන්තර පාලන පද්ධතියක් මඟින්: (අ) සඵලදායී සහ කාර්යක්ෂම මෙහෙයුම් ප්‍රවර්ධනය කිරීම; (ආ) විශ්වසනීය මූල්‍ය තොරතුරු සැපයීම; (ඇ) වත්කම් සුරැකීම; (ඈ) අක්‍රමිකතා, වංචා සහ දෝෂ වලින් හට ගන්නා මෙහෙයුම් අවදානමෙන් අත්වන අලාභ අවම කිරීම; (ඉ) සඵලදායී අවදානම් කළමනාකරණ පද්ධති තහවුරු කිරීම; සහ (ඊ) අදාළ නීති, රෙගුලාසි, විධාන සහ අභ්‍යන්තර ප්‍රතිපත්ති සමඟ අනුකූල වන බවට තහවුරු කිරීම සිදු කළ යුතුය.

11.3 සියලු සේවකයන් හට අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ඔවුන්ගේ වගවීමෙහි කොටසක් ලෙස අභ්‍යන්තර පාලන සඳහා වගකීම ලබා දිය යුතුය.

12. සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු

12.1 අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සඳහා පහත කරුණු ආවරණය කරන ප්‍රතිපත්තියක් පිහිටුවනු ලැබිය යුතුය.

(අ) සියලු මුදල් සමාගම් සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුවක් පිහිටුවිය යුතු අතර, ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු එහි සභාපතිවරයා විය යුතු අතර එහි සාමාජිකයන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් විය යුතුය.

(ආ) සියලු සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු පූර්ව සමාලෝචනයට ලක් කර, සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුව විසින් නිර්දේශ කරනු ලැබිය යුතුය.

(ඇ) මෙම විධානය තුළ ආවරණය කෙරෙනු ලබන සම්බන්ධිත පාර්ශ්වයක් සමඟ සිදු කරන ව්‍යාපාර ගනුදෙනු පහත ඒවා වේ:

i. පහසුකම් සැලසීම.

ii. තැන්පතු, ණය ගැනීම් සහ වෙනත් ඕනෑම ගෙවිය යුතු දෑ යන ස්වරූපයෙන් මුදල් සමාගම වෙත වගකීම් නිර්මාණය කිරීම.

iii. මුදල් සමාගම වෙත මූල්‍ය හෝ මූල්‍ය නොවන සේවා සැපයීම හෝ මුදල් සමාගමෙන් එම සේවා ලබා ගැනීම.

iv. මුදල් සමාගම සහ පොදු විෂය පථය තුළ නොතිබෙන හිමිකාරීත්ව, රහස්‍ය හෝ තොරතුරු හෝ එවැනි සම්බන්ධිත පාර්ශ්වයකට ප්‍රතිලාභ ලබා දෙන සංවේදී තොරතුරු හුවමාරු කර ගැනීමට හේතු වන ඕනෑම සම්බන්ධිත පාර්ශ්වයක් සමඟ වාර්තාකරණ මාර්ග සහ තොරතුරු ප්‍රවාහ නිර්මාණය කිරීම හෝ පවත්වා ගෙන යෑම.

12.2 ඕනෑම පුද්ගලයෙකු සමඟ සහ විශේෂයෙන් ම මෙම විධානයේ අරමුණු සඳහා "සම්බන්ධිත පාර්ශ්වයන්" ලෙස සැලකිය යුතු පහත පුද්ගල වර්ගයන් සමඟ මුදල් සමාගමක ඕනෑම ගනුදෙනුවකින් හට ගත හැකි ඕනෑම බැඳියාවන් අතර ගැටුමක් වැළැක්වීමට කමිටුව විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතුය. මේ හා සම්බන්ධව, අවශ්‍ය වූ විට කලින් කලට සමාලෝචනයට යටත් වන සම්බන්ධිත පාර්ශ්වයන් ලෙස හඳුනා ගත් ස්වභාවික පුද්ගලයන්/ආයතනයන්හි නාම ලැයිස්තුවක් පැවතිය යුතුය.

(අ) අධ්‍යක්ෂවරු සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය.

(ආ) සෘජු හෝ වක්‍ර සියයට 10 ට වඩා ඡන්ද අයිතිය හිමි කොටස් හිමියන්

(ඇ) මුදල් සමාගම විසින් පාලනය කරනු ලබන පාලිත සමාගම්, ආශ්‍රිත සමාගම්, අනුබද්ධ සමාගම් (සහෝදර සමාගම්), පාලක සමාගම්, අවසාන මව් සමාගම් සහ වෙනත් ඕනෑම පාර්ශ්වයක් (ඔවුන්ගේ පාලිත සමාගම්, ආශ්‍රිත සමාගම්, අනුබද්ධ සමාගම් ඇතුලුව) සහ ඊට ප්‍රතිලෝම වශයෙන්.

(ඈ) ඡේද (ආ) හෝ (ඇ) හි නෛතික පුද්ගලයන්ගේ අධ්‍යක්ෂවරු සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය.

(ඉ) ඡේද (අ), (ආ) හෝ (ඈ) හි විස්තර කර ඇති ස්වභාවික පුද්ගලයන්ගේ ඥාතීන්.

(ඊ) මුදල් සමාගමෙහි අධ්‍යක්ෂවරුන්, ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය හෝ මුදල් සමාගමෙහි අධ්‍යක්ෂවරයාගේ හෝ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ හෝ ඡන්ද අයිතිවාසිකම්/ සැලකිය යුතු සම්බන්ධතාවක් පවතින සියයට 10 කට වඩා වැඩි හිමිකාරීත්වයක් දරන එහි කොටස් හිමියන් පිළිබඳ සැලකිලිමත් විය යුතු ඕනෑම කරුණක්.

12.3 මෙම මුදල් සමාගම කිසිදු සම්බන්ධිත පාර්ශ්වයක් සමඟ එම සමාගමෙහි වෙනත් සමාන ගනුදෙනුකරුවන්ට වඩා සම්බන්ධිත පාර්ශව සඳහා "වඩාත් වාසිදායක සැලකිල්ලක්" සහිත ව්‍යාපාර ගනුදෙනුවල කිසිදු ආකාරයකින් නිරත නොවන බවට කමිටුව විසින් තහවුරු කරනු ලැබිය යුතුය. මෙම ඡේදයේ අරමුණු සඳහා, 'වඩාත් හිතකර සැලකිල්ලක්' වශයෙන් පහත දෑ අදහස් විය යුතුය.

(අ) කමිටුව විසින් තීරණය කර ඇති පරිදි, මුදල් සමාගම් නියාමන ප්‍රාග්ධනයේ විචක්ෂණ ප්‍රතිශතයක් ඉක්මවා යන, 'සමස්ත පහසුකමක්' සම්බන්ධිත පාර්ශ්වයකට ලබා දීම.

(ආ) අඩු පොලී අනුපාතිකයක් අය කිරීම හෝ සම්බන්ධිත නොවන සැසඳිය හැකි ප්‍රතිපාර්ශ්වයක් සමඟ සැසඳිය හැකි ගනුදෙනුවක් සඳහා ගෙවනු ලබන අනුපාතිකය අභිබවා යන පොලී අනුපාතිකයක් ගෙවීම.

(ඇ) සම්බන්ධිත නොවන පාර්ශ්ව සමඟ සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී ලබා දුන් නියමයන්ට ඔබ්බෙන් දීර්ඝ කෙරෙන, වාසිදායක නියමයන් වැනි පක්ෂපාතී සැලකිල්ලක් ලබා දීම.

(ඈ) නිසි ඇගයීමේ ක්‍රියාමාර්ගවලින් තොරව සම්බන්ධිත පාර්ශ්වයක් වෙත සේවාවන් සැපයීම හෝ සම්බන්ධිත පාර්ශ්වයකගෙන් සේවාවන් ලබා ගැනීම; හෝ

(ඉ) නෛතික රාජකාරි සහ කාර්යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය වූ විට හැරුණු කොට, සම්බන්ධිත පාර්ශ්වයකට ප්‍රතිලාභ ලබා දෙනු ඇති හිමිකාරීත්ව, රහස්‍යභාවීය හෝ සංවේදී තොරතුරු බෙදා ගැනීමට ඉඩ සලසනු ඇති, මුදල් සමාගම සහ ඕනෑම සම්බන්ධිත පාර්ශ්වයක් අතර වාර්තාකරණ මාර්ග සහ තොරතුරු ප්‍රවාහ පවත්වා ගෙන යෑම.

13. සමූහ යහපාලනය

13.1 පාලක සමාගමක් ලෙස මුදල් සමාගමක වගකීම්

(අ) මුදල් සමාගම විසින් පාලිත සමාගම් සහ ආශ්‍රිත සමාගම්වලට අදාළ වන ස්වාධීන, නෛතික, නියාමන සහ යහපාලන වගකීම්වලට අනුකූල වන අතරතුර, ඒවා ප්‍රමාණවත් පරිදි පාලනය කිරීම සඳහා වගකියනු ලැබේ.

(ආ) මුදල් සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින්:

i. සමූහයේ පාලන රාමුව මඟින් සමූහයේ පුළුල් ප්‍රතිපත්ති පාලනය සහ ක්‍රියාත්මක කිරීම සඳහා කාර්යභාරයන් සහ වගකීම් පැහැදිලිව නිර්වචනය කෙරෙන බවට තහවුරු කිරීම.

ii. එක් එක් සමාගම සඳහා වන නෛතික සහ නියාමන අවශ්‍යතා ඇතුලුව, මෙහෙයුම් පරිසරය තුළ පවතින වෙනස්කම් තහවුරු කිරීම සඳහා සමූහයේ පාලන රාමුව තුළ නිසි ආකාරයෙන් අවබෝධ කොට, පිළිබිඹු කෙරෙන බවට තහවුරු කිරීම.

iii. පාලක මුදල් සමාගමට සහ එහි පාලිත සමාගම්වලට බලපානු ඇති සැලකිය යුතු අවදානම් සහ ප්‍රවණතාවන් අවබෝධ කර ගැනීම සහ කළමනාකරණය ප්‍රවර්ධනය කිරීමට නිසි වාර්තාකරණ සැකසුම් යෙදීම.

iv. අභ්‍යන්තර පාලන රාමුව මඟින් අභ්‍යන්තර සමූහයේ ගනුදෙනුවලින් හට ගන්නා අවදානම් ඇතුලුව, සමූහය පුරා හට ගන්නා අවදානම් සඳහා ප්‍රමාණවත් පරිදි පිළියම් යෙදෙන බවට තක්සේරු කිරීම. සහ

v. අදාළ වන සියලුම නෛතික සහ නියාමන අවශ්‍යතා සමඟ මුදල් සමාගම සහ එහි පාලිත සමාගම් වල අනුකූලතාව සාර්ථකව අධීක්ෂණය කිරීමට ප්‍රමාණවත් සම්පත් තිබෙන බවට තහවුරු කිරීම.

(ඇ) අග්‍රස්ථ ආයතනය ලෙස, මෙම මුදල් සමාගම විසින් සමූහයේ ව්‍යුහය මඟින් සඵලදායී පාලනයක් ක්‍රියාත්මක කිරීමට එය සතු හැකියාව අවතක්සේරු නොකෙරන බවට තහවුරු කරනු ලැබිය යුතුය. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එහි කළමනාකරණය යටතේ නව නෛතික ආයතන නිර්මාණය අනුමත කිරීම පැහැදිලිව නිර්වචනය කළ ක්‍රියාවලියක් පිහිටුවිය යුතු අතර, ප්‍රමාණවත් සහ සාර්ථක ප්‍රතිපත්ති සහ පාලන ඔස්සේ සමූහයේ සියලු සැලකිය යුතු පුළුල් අවදානම් හඳුනා ගැනීම සහ කළමනාකරණය සිදු කළ යුතුය.

(ඈ) සමූහය මට්ටමින් සකස් කළ අරමුණු, ක්‍රමෝපායන්, ප්‍රතිපත්ති සහ පාලන රාමු මුදල් සමාගමෙහි නියාමන වගකීම් සමඟ සම්පූර්ණයෙන් අනුරූප වන බවට මුදල් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය විසින් සත්‍යාපනය කළ යුතු අතර, සමාගමට නිශ්චිත අවදානම් සඳහා ප්‍රමාණවත් පරිදි පිළියම් යෙදෙන බවට තහවුරු කළ යුතුය.

(ඉ) මුදල් සමාගම විසින් මෙහෙයුම්වල සංකීර්ණභාවය සැලකිය යුතු අයුරින් ඉහළ නැංවිය හැකි, ආර්ථික හරය හෝ ව්‍යාපාර අරමුණ ඌණ වූ සංකීර්ණ ව්‍යුහ සකස් කිරීම අවම කළ යුතුය.

13.2 පාලිත සමාගමක් ලෙස වගකීම්

මුදල් සමාගම විචක්ෂණ නියාමනයට යටත්ව, තවත් මුදල් සමාගමක පාලිත සමාගමක් වන්නේ නම්, මුදල් සමාගම විසින් එහි ස්වකීය නෛතික සහ පාලන වගකීම් ඉටු කළ යුතුය.

14. ආයතනික සංස්කෘතිය

14.1 මුදල් සමාගමක් විසින් මනා හැසිරීම පිළිබඳ මාර්ගෝපදේශ ඇතුළත් වන සහ රහස්‍යභාවය, බැඳියාවන් අතර ගැටුම, වාර්තාකරණයේ සෘජු බව, ආරක්ෂාව සහ සමාගම් වත්කම්වල නිසි භාවිතය සහ පාරිභෝගිකයන්ට සාධාරණව සැලකීම හා සම්බන්ධ ගැටලු ඇතුළත් වන ආචාර ධර්ම පද්ධතියක් අනුගමනය කළ යුතුය.

14.2 මුදල් සමාගම විසින් ආචාර ධර්ම පද්ධති උල්ලංඝනය කිරීම් පිළිබඳ වාර්තා පවත්වා ගෙන යා යුතු අතර, එවැනි උල්ලංඝනය කිරීම් සඳහා ආමන්ත්‍රණය කිරීමෙන් අඛණ්ඩතාවයේ උසස් ප්‍රමිතීන් රැකීම සිදුවේ.

14.3 මුදල් සමාගමක් විසින් විෂය මූලිකව විමර්ශනය කිරීමට සහ පිළියම් කිරීමට නියමිත නීත්‍යානුකූල ගැටලු සඳහා තොරතුරු ආරක්ෂා කිරීමේ ප්‍රතිපත්තියක් (Whistleblowing Policy) පිහිටුවිය යුතුය. සේවකයන්ට නීති විරෝධී, සාදාචාරාත්මක නොවන හෝ විශ්වසනීයත්වයෙන් සහ ප්‍රතිහිංසනයකින් තොරව ප්‍රශ්න කළ හැකි පරිචයන් පිළිබඳ ගැටලු මතු කිරීමට හැකි විය යුතුය. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් මෙම ප්‍රතිපත්තිය කලින් කලට සමාලෝචනය කළ යුතුය.

15. බැඳියාවන් අතර ගැටුම

15.1 (අ) අධ්‍යක්ෂවරුන් අතර පවත්නා සම්බන්ධතාවයන් මඟින් අනිසි බලපෑමක් හෝ බල කිරීම් ඇති නොකළ යුතුය. අධ්‍යක්ෂවරයෙකු විසින් එවැනි අධ්‍යක්ෂවරයෙකු හෝ ඕනෑම ඥාතියෙකුගෙන් ඕනෑම අයෙකු සෑහෙන සම්බන්ධතාවයක් දැක්වූ සෑහෙන සම්බන්ධතාවයක් දක්වන කිසිදු අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතයකට ඡන්දය ලබා දීමෙන් වැළකී සිටිය යුතුය. එමෙන්ම, එවැනි අධ්‍යක්ෂවරයෙකු අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමෙහි අදාළ න්‍යාය පත්‍ර අයිතමය සඳහා ගණ පූරණයෙහි ගණනය නොකළ යුතුය.

(ආ) සම්බන්ධිත පාර්ශ්ව සමඟ ඇති විය හැකි බැඳියාවන් අතර ගැටලුවලට පිළියම් යෙදීමට මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට විධිමත් ලිඛිත ප්‍රතිපත්තියක් මෙන්ම, විෂය මූලික අනුකූලතා ක්‍රියාවලියක් තිබිය යුතුය. මෙම ප්‍රතිපත්තිය මඟින්,

i. බැඳියාවන් අතර ගැටලු ඇති වීමට හේතු වන හෝ බැඳියාවන් අතර ගැටලුවලින් සමන්විත වන සිද්ධීන් හඳුනා ගැනීම.

ii. බැඳියාවන් අතර ගැටලු නිර්මාණය කරනු ඇති ක්‍රියාකාරකම් හැකිතාක් මට්ටමකට වළක්වා ගැනීම සඳහා අධ්‍යක්ෂවරුන්ගේ සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ වගකීම ප්‍රකාශ කිරීම.

iii. බැඳියාවන් අතර ගැටලුවකට තුඩු දෙන, සිදුවීමක ඕනෑම වෙනස් වීමක් පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කිරීමට අධ්‍යක්ෂවරුන් සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය සඳහා වන ක්‍රියාවලිය නිර්වචනය කිරීම.

iv. අධ්‍යක්ෂවරයෙකු සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය විසින් බැඳියාවන් අතර ගැටලු ඇති වීමට හේතු විය හැකි ඇතැම් ක්‍රියාවල නිරත වීමට පෙර, ඔවුන් සඳහා දැඩි සමාලෝචනයක් සහ අනුමත කිරීමේ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීම.

v. සම්බන්ධිත පාර්ශ්ව සමඟ බැඳියාවන් අතර ගැටුම් පිළිබඳ යාවත්කාලීන කරන ලද වාර්තා පවත්වා ගෙන යෑම සඳහා වගකිව යුතු පුද්ගලයන් හඳුනා ගැනීම.

vi. මෙම ප්‍රතිපත්තිය සමඟ සිදු කරන ඕනෑම අනුකූල නොවීමකට පිළියම් යෙදිය හැක්කේ කෙසේද යන්න පැහැදිලි කිරීම.

සිදු කරනු ලැබිය යුතුය.

16. අනාවරණය කිරීම්

16.1 (අ) වාර්ෂික විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ සහ වාරාන්තර මූල්‍ය ප්‍රකාශ, නියාමන සහ අධීක්ෂණ අධිකාරයන් සහ අදාළ වන ගිණුම්කරණ ප්‍රමිති මඟින් නියම කොට ඇති ආකෘති හා අනුකූලව සකස් කිරීම සහ ප්‍රකාශයට පත් කෙරෙන බවට ද, (ආ) එවැනි ප්‍රකාශ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි පුවත්පත්වල පළ කරන බවට ද අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තහවුරු කරනු ලැබිය යුතුය. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවම වශයෙන් පහත සඳහන් කරුණු වාර්ෂික වාර්තාව තුළ අනාවරණය කළ යුතුය.

විෂයය		අනාවරණය කිරීම
i.	මූල්‍ය ප්‍රකාශ	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 1 හෝ අදාළ ප්‍රමිතියකට අනුව සකස් කළ මූල්‍ය ප්‍රකාශ කට්ටලයට අමතරව, වාර්ෂික වාර්තාවෙහි පහත දෑ ඇතුළත් විය යුතුය. • වාර්ෂික විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ නිශ්චිත අනාවරණය කිරීම් ඇතුලුව, අදාළ ගිණුම්කරණ ප්‍රමිති සහ නියාමන අවශ්‍යතා හා අනුකූලව පිළියෙල කර ඇති බවට ප්‍රකාශයක්. • මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීමෙහිලා මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම පිළිබඳ ප්‍රකාශයක්.

ii.	සභාපති, ප්‍රධාන විධායක නිලධාරී සහ අධ්‍යක්ෂ මණ්ඩලය ආශ්‍රිත අනාවරණයන්	• නම, සුදුසුකම් සහ කෙටි විස්තරයක් • විධායක, විධායක නොවන සහ/හෝ ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු ද යන වග. • ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කරන අධ්‍යක්ෂවරයාගේ විස්තර කිසිවක් ඇත්නම්. • අදාළ ක්‍රියාකාරී අංශයෙහි පවත්නා ප්‍රවීණතාවෙහි ස්වභාවය • ඥාතීන් සහ/හෝ සමාගමේ වෙනත් අධ්‍යක්ෂවරුන් සමඟ පවත්නා ඕනෑම ව්‍යාපාර ගනුදෙනු සබඳතා. • සලකා බලනු ලබන අධ්‍යක්ෂවරයා, අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කරන වෙනත් සමාගම්වල නම් සහ විධායක හෝ විධායක නොවන ධාරිතාවෙන් ද යන වග. • වර්ෂය තුළ දී සහභාගී වන ලද මුදල් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ගණන/ එහි ප්‍රතිශතය; සහ • අධ්‍යක්ෂවරයා සභාපතිවරයෙකු ලෙස හෝ සාමාජිකයෙකු ලෙස සේවය කරන අධ්‍යක්ෂ මණ්ඩල කමිටුවල නම්.
iii.	අධ්‍යක්ෂ මණ්ඩල කාර්යසාධන ඇගයීම	• අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ එහි කමිටුවල කාර්යසාධන තක්සේරු කිරීම කෙසේ සිදු කර තිබන්නේ ද යන්න පිළිබඳ දළ විශ්ලේෂණයක්.
iv.	වැටුප්	• අධ්‍යක්ෂ මණ්ඩල ගාස්තු ව්‍යුහය සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණයේ වැටුප් බෙදා දැක්වීම, වැටුප් මට්ටම සහ මිශ්‍රය (මූල්‍ය සහ මූල්‍ය නොවන, වැටුප් සැකසීම සඳහා වන ක්‍රියාමාර්ගය සහ වැටුප්, කාර්යසාධනය සහ අගය නිර්මාණය අතර සබඳතා ඇතුළත් වන වැටුප් ප්‍රතිපත්තිය පිළිබඳ ප්‍රකාශයක් • මුදල් සමාගම විසින් එහි අධ්‍යක්ෂවරුන් සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණය වෙත ගෙවන ලද වැටුපෙහි ඒකාබද්ධ අගයන්.
v.	සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු	• සභාපතිවරයා සහ ප්‍රධාන විධායක නිලධාරියා අතර කිසිදු සබඳතාවක් ඇත්නම්, ඒවායෙහි ස්වභාවය [මූල්‍ය, ව්‍යාපාර, පවුල් හෝ වෙනත් සැලකිය යුතු/ අදාළ සබඳතාව(සබඳතාවන්)] සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් අතර සබඳතාවන්. • මුදල් සමාගමෙහි මූලික ප්‍රාග්ධනයේ ප්‍රතිශතයක් ලෙස සම්බන්ධිත පාර්ශ්වයන්ගේ එක් එක් වර්ගයට අදාළව ගෙවීමට තිබෙන ශුද්ධ පහසුකම් සහ සම්බන්ධිත පාර්ශවය හෝ එක් එක් වර්ගයට අදාළව ප්‍රදානය කරන ලද සමස්ත ශුද්ධ පහසුකම්.
vi.	අධ්‍යක්ෂ මණ්ඩල විසින් පත් කරන ලද කමිටු	• සභාපතිවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩල කමිටුවල සාමාජිකයන්ගේ විස්තර සහ එවැනි රැස්වීම් සඳහා සහභාගී වීම.
vii.	සමූහයේ ව්‍යුහය	• මුදල් සමාගම ක්‍රියාත්මක වන සමූහයේ ව්‍යුහය • සමූහයේ යහපාලන රාමුව
viii.	අධ්‍යක්ෂවරයාගේ වාර්තාව	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදු කළ පහත ප්‍රකාශයන්ගෙන් සමන්විත වාර්තාවක්: • මුදල් සමාගම නීති සහ රෙගුලාසි උල්ලංඝනය කරන කිසිදු කටයුත්තක නොයෙදී ඇත. • අධ්‍යක්ෂවරුන් මුදල් සමාගම සමඟ සියලු සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ප්‍රකාශ කර ඇති අතර, ඔවුන් සැලකිය යුතු මට්ටමින් උනන්දුවක් දැක් වූ කරුණු මත ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිට ඇත. • මුදල් සමාගම විසින් විශේෂයෙන් ම තැන්පත්කරුවන් ඇතුලුව, සියලු පාර්ශ්වකරුවන්ට සාධාරණව සැලකීමට සියලු ප්‍රයත්නයන් ගෙන ඇත. • ආධාරක උපකල්පන සමඟ මෙම ව්‍යාපාරය අඛණ්ඩ පැවැත්මක තිබේ. • අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මුදල් සමාගම වෙත පවතින සැලකිය යුතු අවදානම් ආවරණය කරනු ලබමින්, අභ්‍යන්තර පාලනයන්හි සමාලෝචනයක් සිදු කර ඇති අතර, ඔවුන්ගේ සඵලදායීත්වය වෙනුවෙන් සෑහෙන සහතික කිරීමක් ලබා ගෙන ඇත.

ix.	අභ්‍යන්තර පාලන පිළිබඳ ප්‍රකාශය	• මූල්‍ය වාර්තාකරණයේ විශ්වසනීයත්වය සම්බන්ධව සෑහෙන සහතික කිරීමක් ලබා දීමට මූල්‍ය වාර්තාකරණ පද්ධතිය නිර්මාණය කොට ඇති බවට සහ බාහිර අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ නියාමන අවශ්‍යතා සමඟ අනුකූලව සිදු කර ඇති බවට තහවුරු කරන මුදල් සමාගමෙහි අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සකස් කරනු ලබන වාර්තාවක්. • පිළියෙළ කළ හෝ ප්‍රකාශයට පත් කළ ඕනෑම ප්‍රකාශනයකට අදාළව, උක්ත සඳහන් අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයේ සඵලදායීත්වය පිළිබඳව බාහිර විගණකගේ සහතිකකරණ ප්‍රකාශය. • විචක්ෂණ අවශ්‍යතා, රෙගුලාසි, නීති සහ අභ්‍යන්තර පාලනයන්හි අනුකූලතාව පිළිබඳ විස්තර සහ ඕනෑම අනුකූල නොවීමක් නිවැරදි කිරීමට ගත් ක්‍රියාමාර්ගවල විස්තර දක්වන වාර්තාවක්. • මුදල් සමාගමෙහි අවදානම් කළමනාකරණය තුළ හට ගන්නා ප්‍රමාද දෝෂ පිළිබඳව හෝ මෙම පනත, රීතීන් සහ විධාන සමඟ අනුකූල නොවීම හා සම්බන්ධව නියාමන සහ අධීක්ෂණ ගැටලු දක්වන ප්‍රකාශයක්.
x.	ආයතනික යහපාලන වාර්තාව	• සමාගම ආයතනික යහපාලන විධානය සමඟ කොතෙක් දුරට අනුකූලව ක්‍රියා කොට ඇත් ද සහ එම ආකාරය සහ ආයතනික යහපාලන විධානය සමඟ අනුකූල වීමේ බාහිර විගණකවරයාගේ සහතිකකරණ ප්‍රකාශය.
xi.	ආචාර ධර්ම පද්ධතිය	• අධ්‍යක්ෂවරුන්, ජ්‍යෙෂ්ඨ කළමනාකරණය සහ සේවකයන් සඳහා මුදල් සමාගමෙහි ව්‍යාපාර ආචාර ධර්ම සහ ආචාර ධර්ම. • සමාගම විසින් මෙම සංග්‍රහයේ කිසිදු විධිවිධානයක් උල්ලංඝනය කර නොමැති බවට සභාපතිවරයා විසින් තහවුරු කරනු ලැබිය යුතුය.
xii.	කළමනාකරණ වාර්තාව	• කර්මාන්ත ව්‍යුහය සහ සංවර්ධන • අවස්ථා සහ තර්ජන • අවදානම් සහ සැලකිලිමත් විය යුතු කරුණු • සමාගම විසින් සිදු කර ගෙන යනු ලබන තිරසාරාත්මක මූල්‍ය කටයුතු • අනාගතය සඳහා අපේක්ෂා
xiii.	කොටස් හිමියන් සමඟ සන්නිවේදනය	• කොටස් හිමියන් සමඟ සන්නිවේදනය සඳහා වන ප්‍රතිපත්තිය සහ ක්‍රමවේදය. • එවැනි සන්නිවේදනයක් සඳහා සම්බන්ධ කර ගත යුතු පුද්ගලයා.

17. නිර්වචනය

"පනත" යන්නෙන් 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත හෝ එහි සංශෝධන යන්න අර්ථවත් විය යුතුය.

මුදල් සමාගමකට අදාළව "අනුබද්ධිත ආයතනයක්" යන්නෙන් එම මුදල් සමාගම ඍජුව හෝ වක්‍රව පාලනය කරන, හෝ එම මුදල් සමාගම සමඟ පොදුවේ පාලනය යටතේ සිටින සංස්ථාවක් යන්න අදහස් කෙරෙන අතර, පාලිත සමාගමක්, ආශ්‍රිත සමාගමක්, පාලක සමාගමක්, පොදු කාණ්ඩය යටතේ සමාගම් ඊට ඇතුළත් වේ.

"අධ්‍යක්ෂ මණ්ඩලය" යන්නට විධායක අධ්‍යක්ෂවරුන් ඇතුළත් හෝ එසේ නොමැති නම් විකල්ප අධ්‍යක්ෂවරුන් ද ඇතුළත් විය යුතුය.

"ඥාතියෙකු" යනු මුදල් ව්‍යාපාර පනතේ 74 වන වගන්තියේ දැක්වෙන අදහසට සමාන අදහසක් දැක්වේ.

"ඍජු හෝ වක්‍ර කොටස්හිමිකාරීත්වය" යනු සමාගමක, සංස්ථාපිත ආයතනයක, හෝ තනි පුද්ගලයෙකු, හෝ,

අ. සමාගමක් සහ පහත සඳහන් ඒවායින් එකක් හෝ කිහිපයක්:

i. එහි පාලිත සමාගම්
ii. එහි පාලක සමාගම
iii. එහි පාලක සමාගමේ පාලිත සමාගමක්; හෝ
iv. එම සමාගම හෝ එහි පාලිත සමාගම් හෝ එහි පාලක සමාගම් හෝ එහි පාලක සමාගමේ පාලිත සමාගමක් විසින් සැලකිය යුතු සම්බන්ධතාවක් දරන සමාගමක් හෝ;

ආ. තනි පුද්ගලයෙකු සහ පහත දැක්වෙන අය හෝ වැඩි ගණනක් විසින්;

i. ඥාතීන්
ii. ඔහු/ඇය හෝ ඔහුගේ/ඇයගේ ඥාතියෙකු සැලකිය යුතු සම්බන්ධතාවයක් ඇති සමාගමක්; එවැනි සමාගමක පාලිත සමාගමක්; එවැනි සමාගමක පාලක සමාගමක්; එවැනි සමාගමක පාලක සමාගමේ පාලිත සමාගමක්; එවැනි සමාගමක සැලකිය යුතු සම්බන්ධතාවයක් සහිත සමාගමක් හෝ එහි පාලිත සමාගම, හෝ එහි පාලක සමාගම, හෝ එහි පාලක සමාගමේ පාලිත සමාගමක්; හෝ

iii. සමාගමක් හැර, එවැනි පුද්ගලයෙකු; හෝ ඔහුගේ/ඇයගේ ඥාතියෙකු සැලකිය යුතු සම්බන්ධතාවයක් ඇති සංස්ථාපිත ආයතනයක්; හෝ සෘජුව, වක්‍රව, හෝ වාසිදායක ලෙස සැලකිය යුතු සම්බන්ධතාවයක් හෝ සැලකිය යුතු කළමනාකරණ සම්බන්ධතාවයක් යන බැඳියාවන් අතුරින් එකක් සහිත, තනි පුද්ගලයෙකු හෝ සමාගමක් සහිත සමාගමක්, විසින් සමස්තයක් ලෙස රඳවා තබා ගනු ලැබූ ඉන්ද අයිතිය හිමි කොටස් ලෙස සැලකිය යුතුය.

"විධායක අධ්‍යක්ෂවරයෙකු" යනු සේවා කොන්ත්‍රාතුවක් යටතේ සේවයේ නියුතු, මුදල් සමාගමේ වැටුප් ලේඛනයේ සිටින, එම මුදල් සමාගමේ පූර්ණ කාලීන වැටුප්ලාභී සේවකයෙකු වන අතර, දෛනික කළමනාකරණ වගකීම්වල නිරත වේ.

විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු මුදල් සමාගමේ සේවකයෙකු නොවන අතර, මුදල් සමාගමේ වැටුප් ලේඛනයේ නොසිටින අතර එමෙන්ම මුදල් සමාගමේ දෛනික කළමනාකරණ වගකීම් වල නිරත නොවෙයි.

විගණන නොවන සේවය යන්න 2012 දෙසැම්බර් මස නිකුත් කරන ලද බාහිර විගණකවරුන්ගේ මණ්ඩලය සඳහා වන මාර්ගෝපදේශය ලෙස හෝ එහි සංශෝධන යන අර්ථයෙන් යෙදෙයි.

බලපත්‍රලාභී මුදල් සමාගමේ "ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය" යන්නෙන්

i. ප්‍රධාන විධායක නිලධාරී

ii. අනුකූලතා නිලධාරී, අභ්‍යන්තර විගණක, ප්‍රධාන අවදානම් නිලධාරී, ප්‍රධාන තොරතුරු ආරක්ෂණ නිලධාරී සහ සමාගම් ලේකම් ඇතුලුව බලපත්‍රලාභී මුදල් සමාගම් සංවිධාන ව්‍යුහය මත ප්‍රධාන විධායක නිලධාරී මට්ටමට පහළ ආසන්නත ම ස්ථර දෙක තුළ සිටින නිලධාරීන් යන්න අර්ථවත් වේ. බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා විසින් තීරණය කරනු ලබන පරිදි, 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයෙහි නිලධාරීන් නිර්වචනය තුළ සඳහන් ආයතනයේ සහ වෙනත් ඕනෑම පුද්ගලයෙකුගේ ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, යොමු කිරීම සහ පාලනය කිරීමේ අධිකාරය සහ වගකීම එවැනි නිලධාරීන් සතු විය යුතුය.

18. බලාත්මක වන දිනය — මෙම විධානය පහත සඳහන් අන්තර්කාලීන විධිවිධාන වලට යටත්ව, 2022.07.01 දින සිට බලාත්මක වේ.

19. අන්තර්කාලීන විධිවිධාන

19.1 (අ) 3.2, 3.5 (අ) සහ 3.7 විධාන හෝ 2024.07.01 දින සිට බලාත්මක වේ. අන්තර් කාලපරිච්ඡේදය තුළ දී, 2008 අංක 03 දරන මුදල් සමාගම් (ආයතනික යහපාලනය) විධානයේ "4 වන වගන්තිය: අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය" හි ඇතුළත් වූ ප්‍රතිපාදන අදාළ වනු ඇත.

(ආ) 3.4 විධානය වහාම බලාත්මක වනු ඇත.

19.2 8.1 විධානය (ආ): 2024.07.01 දක්වා අන්තර් කාලපරිච්ඡේදයක් ලබා දෙනු ඇත.

19.3 10.1 විධානය: 2024.07.01 තෙක් අන්තර් කාලපරිච්ඡේදයක් ලබා දෙනු ඇත. කෙසේ වෙතත්, අන්තර් කාල පරිච්ඡේදය තුළ දී, 2008 අංක 03 දරන මුදල් සමාගම් (ආයතනික යහපාලනය) විධානයෙහි "වගන්ති 8: අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද කමිටු" යන විධානයෙහි ඇතුළත් ප්‍රතිපාදන අදාළ වනු ඇත.

20. පූර්ව විධාන අහෝසි කිරීම — 19 වන විධානයෙහි විශේෂයෙන් ම දක්වා ඇති අන්තර්කාලීන විධිවිධාන වලට යටත්ව, 2008 අංක 03 දරන මුදල් සමාගම් (ආයතනික යහපාලනය) විධානය, 2008 අංක 04 දරන මුදල් සමාගම් (ආයතනික යහපාලනය සංශෝධනය) සහ මුදල් ව්‍යාපාර පනතේ 2013 අංක 06 දරන (ආයතනික යහපාලනය සංශෝධනය) විධානය සහ මුදල් ව්‍යාපාර පනතේ 2020 අංක 05 දරන (ආයතනික යහපාලනය සඳහා සංශෝධනය) විධානය මෙම විධානය බලාත්මක දිනයේ සිට අවලංගු කෙරෙනු ඇත.

නිවාඩ් අජිත් ලෙස්ලි කබ්රාල්
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරනු ලැබූ 2021 අංක 06 දරන විධානය 2021 දෙසැම්බර් 31

ප්‍රධාන වගකිව යුතු පුද්ගලයන්ගේ යෝග්‍යතාවය තක්සේරු කිරීම

1. නෛතික ප්‍රතිපාදන

1.1 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 12 වන වගන්තිය මඟින් පැවරී ඇති බලතල ප්‍රකාරව, බලපත්‍රලාභී මුදල් සමාගම්වල ප්‍රධාන වගකිව යුතු පුද්ගලයන්ගේ යෝග්‍යතාවය තක්සේරු කිරීම විධානය මුදල් මණ්ඩලය විසින් මෙමඟින් නිකුත් කරනු ලැබේ.

2. අරමුණු

2.1 බලපත්‍රලාභී මුදල් සමාගමක ප්‍රධාන වගකිව යුතු පුද්ගලයන් හට එම බලපත්‍රලාභී මුදල් සමාගම නියමාකාරයෙන් සහ විචක්ෂණශීලීව කළමනාකරණය කිරීමට හැකි වන පරිදි ඔවුන්ගේ වගකීම් කාර්යක්ෂමව ඉටු කිරීමට හැකි වන බව තහවුරු කිරීම.

2.2 බලපත්‍රලාභී මුදල් සමාගමක සිටින ප්‍රධාන වගකිව යුතු පුද්ගලයා විසින් සමාගමේ ස්ථාවරභාවයට මඟ පාදන බලපත්‍රලාභී මුදල් සමාගම්හි ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන යෑම පිළිබඳ යහපාලන පරිචයන් ප්‍රවර්ධනය කරනු ඇත.

2.3 ඇල්මැති පාර්ශවකරුවන්ගේ යහපත වෙනුවෙන් කර්තව්‍යයන් සහ වගකීම් කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් යෝග්‍යතාවය සහිත පුද්ගලයෙකු පත් කිරීමට කටයුතු කළ යුතුය.

3. විෂය පථය සහ අදාළත්වය

3.1 මෙම විධානයන් බලපත්‍රලාභී මුදල් සමාගම්වල සිටින සියලු ප්‍රධාන වගකිව යුතු පුද්ගලයන්ට අදාළ වේ.

3.2 බලපත්‍රලාභී මුදල් සමාගමක නම් කිරීමට, තෝරා පත් කිරීමට හෝ පත් කිරීමට යෝජිත ප්‍රධාන වගකිව යුතු පුද්ගලයන්, මෙම විධානයන්හි ප්‍රතිපාදන ප්‍රකාරව බලපත්‍රලාභී මුදල් සමාගමක නියම කරන ලද තනතුරට පත් කිරීම හෝ එම තනතුරේ කටයුතු කරගෙන යෑම සඳහා අධ්‍යක්ෂවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු වේ.

3.3 7 වන විධානයට යටත්ව අධ්‍යක්ෂ මණ්ඩලය, ප්‍රධාන විධායක නිලධාරි සහ අනෙකුත් ප්‍රධාන වගකිව යුතු පුද්ගලයන් එම තනතුරේ අඛණ්ඩව කටයුතු කිරීමට ඇති යෝග්‍යතාවය වාර්ෂිකව තක්සේරු කළ යුතුය.

3.4 බලපත්‍රලාභී මුදල් සමාගමක ප්‍රධාන වගකිව යුතු පුද්ගලයෙකුගේ ඕනෑම ඉල්ලා අස්වීමක්, විශ්‍රාම යෑමක් හෝ සේවයෙන් ඉවත් කිරීමක්, 8 වන විධානයට යටත් වේ.

4. ප්‍රධාන වගකිව යුතු පුද්ගලයා

4.1 බලපත්‍රලාභී මුදල් සමාගමකට සම්බන්ධ ප්‍රධාන වගකිව යුතු පුද්ගලයා වන්නේ,

(අ) බලපත්‍රලාභී මුදල් සමාගමක අධ්‍යක්ෂ මණ්ඩලය (විධායක හෝ නොඑසේනම් සහ විකල්ප අධ්‍යක්ෂවරුන් ඇතුළත් විය යුතුය).

(ආ) බලපත්‍රලාභී මුදල් සමාගමක ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය.

i. ප්‍රධාන විධායක නිලධාරී

ii. අනුකූලතා නිලධාරී, ප්‍රධාන අභ්‍යන්තර විගණක, ප්‍රධාන අවදානම් නිලධාරී, ප්‍රධාන තොරතුරු ආරක්ෂණ නිලධාරී සහ සමාගම් ලේකම් ඇතුළු බලපත්‍රලාභී මුදල් සමාගම් සංවිධාන ව්‍යුහය මත ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ මට්ටමට පහළින් තිබෙන ආසන්නතම ස්ථර දෙක තුළ සිටින නිලධාරීන්. එවැනි නිලධාරීන් හට ආයතනයේ කටයුතු සැලසුම් කිරීම, යොමු කිරීම සහ පාලනය කිරීමේ අධිකාරය සහ වගකීම සතු විය යුතුය.

(ඇ) බලපත්‍රලාභී මුදල් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය, අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු හෝ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයට සිටින උපදේශකවරු හෝ අනුශාසකවරු සහ

(ඈ) අධ්‍යක්ෂවරයා විසින් තීරණය කරනු ඇති පරිදි, 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතෙහි 'ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ නිලධාරීන්' යන නිර්වචනයට ඇතුළත් වන වෙනත් ඕනෑම පුද්ගලයෙකු.

5. යෝග්‍යතාවය තක්සේරු කිරීමේ නිර්ණායක

5.1 ප්‍රධාන වගකිව යුතු පුද්ගලයාගේ යෝග්‍යතාවය පහත කරුණුවලට සීමා නොවෙමින් පහත නිර්ණායක යටතේ තක්සේරු කළ යුතුය.

5.1.1 නව ප්‍රධාන වගකිව යුතු පුද්ගලයා නම් කිරීම, තෝරා පත් කිරීම හෝ පත් කිරීම

(අ) අවංකභාවය, ඒකාග්‍රතාව සහ කීර්තිය
2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 21 වන වගන්තිය යටතේ දක්වා ඇති නිර්ණායක හෝ එහි සංශෝධන මත පදනම්ව තක්සේරු කළ යුතුය.

(ආ) නිපුණතාවය සහ හැකියාව
ප්‍රධාන වගකිව යුතු පුද්ගලයාගේ නිපුණතාවය සහ හැකියාව තනතුරේ අවශ්‍යතාවන් සමඟ ගැළපිය යුතු අතර, පහත සාධක මත පදනම්ව තක්සේරු කළ යුතුය.

(i) බැංකුකරණය, මූල්‍යය, ව්‍යාපාර හෝ පරිපාලනය, ආර්ථික විද්‍යාව, ගිණුම්කරණය, විගණනය, මූල්‍ය විශ්ලේෂණය, ආයෝජන කළමනාකරණය, ප්‍රාග්ධන වෙළෙඳපොල, තොරතුරු තාක්ෂණය, ක්‍රමෝපායික සැලසුම්කරණය, අවදානම් කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය, නීතිය, අලෙවිකරණය අංශයන්හි ශාස්ත්‍රීය හෝ වෘත්තිමය සුදුසුකම් හෝ ඵලදායී අත්දැකීම් සහ නිශ්චිත සුදුසුකම් සහ බලපත්‍රලාභී මුදල් සමාගමේ අවශ්‍යතා වලට අනුව නිශ්චිත අත්දැකීම්

(ii) ව්‍යාපාරයේ තාක්ෂණික අවශ්‍යතා, ආවේණික අවදානම් සහ කළමනාකරණ ක්‍රියාවලිය හඳුනා ගැනීමට හැකියාව ලබා දෙන කුසලතා.

(iii) පෙර අධ්‍යක්ෂභාවය රැකියා හෝ කොන්ත්‍රාත් කාල සීමාව තුළ ආයතනය සාර්ථකත්වය කරා ගෙන යාම සඳහා දැක්වූ කාර්යසාධන මට්ටම සහ දායකත්වය.

(ඇ) මූල්‍ය ස්ථාවරත්වය
ශ්‍රී ලංකාව තුළ හෝ වෙනත් රටක ඕනෑම මූල්‍ය වගකීමක් සපුරාලීමට එවැනි පුද්ගලයෙකුට හැකි වේද යන වග මත තක්සේරු කළ යුතුය.

(ඈ) සම්මත පසුබිම් පරීක්ෂා
ණය කාර්යාංශය, නිර්දේශ පරීක්ෂා, වෘත්තීමය ආයතන, නියාමන බලධාරීන් සහ/හෝ වෙනත් ඕනෑම බලධාරියෙකු ඔස්සේ යෝග්‍ය පරිදි තක්සේරු කළ යුතුය.

දැනට/අඛණ්ඩව කටයුතු කරන ප්‍රධාන වගකිව යුතු පුද්ගලයන්

5.1.2 (අ) අධ්‍යක්ෂ මණ්ඩලය සහ ප්‍රධාන විධායක නිලධාරී,

(i) 5.1.1 (ආ) (iii) වන විධානය හැරුණුකොට 5.1.1 වන විධානයෙහි දක්වා ඇති නිර්ණායක.

(ii) වර්තමාන අධ්‍යක්ෂභාවය හෝ රැකියාව තුළ ආයතනයේ සාර්ථකත්වය උදෙසා පවතින කාර්යසාධන සහ දායකත්ව මට්ටම.

(iii) නියාමන රාමුව සහ බලපත්‍රලාභී මුදල් සමාගමට නිශ්චිත මුදල් මණ්ඩල විධාන සමඟ පවතින බලපත්‍රලාභී මුදල් සමාගම් අනුකූලතා මට්ටම.

(ආ) වෙනත් ප්‍රධාන වගකිව යුතු පුද්ගලයන්

(i) 5.1.1 (ආ) (iii) වන විධානය හැරුණු කොට 5.1.1 වන විධානයෙහි දක්වා ඇති නිර්ණායක.

(ii) වර්තමාන රැකියා හෝ කොන්ත්‍රාත් කාලය තුළ ආයතනයේ සාර්ථකත්වය උදෙසා පවතින කාර්යසාධන සහ දායකත්ව මට්ටම.

6. අනුමත කිරීමේ ක්‍රියාවලිය සහ යෝග්‍යතාවය සඳහා පසුව සිදු කරන සංශෝධන

6.1 බලපත්‍රලාභී මුදල් සමාගමේ සමාගම් ලේකම් විසින් ප්‍රධාන වගකිව යුතු පුද්ගලයන්ගේ යෝග්‍යතාවය තක්සේරු කිරීම සඳහා ඇමුණුම I අනුව අවශ්‍ය තොරතුරු සහ ලේඛන සහතික කර එළිදරව් නොවන ආවරණයක් මඟින් අධ්‍යක්ෂවරයා වෙත යොමු කිරීම වගකීම වේ. සමාගම් ලේකම්ගේ යෝග්‍යතාවය තක්සේරු කිරීම සඳහා ඇමුණුම I අනුව අවශ්‍ය තොරතුරු සහ ලේඛන සහතික කර එළිදරව් නොවන ආවරණයක් මඟින් අධ්‍යක්ෂවරයා වෙත යොමු කිරීම බලපත්‍රලාභී මුදල් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරියාගේ වගකීම වේ.

6.2 අධ්‍යක්ෂවරයා විසින් 5.1 වන විධානය යටතේ නියම කොට ඇති නිර්ණායක මත පදනම්ව ඇමුණුම I ට අනුව යොමු කරන ලද තොරතුරු සහ ලේඛන තක්සේරු කළ යුතු අතර ඒ අනුව, ප්‍රධාන වගකිව යුතු පුද්ගලයාගේ යෝජිත තෝරා පත් කිරීම, පත් කිරීම හෝ අඛණ්ඩව එම ධූරය දැරීම අනුමත හෝ ප්‍රතික්ෂේප කරමින් ලිපියක් නිකුත් කළ යුතුය.

6.3 උපදේශකවරයා හෝ අනුශාසකවරයා ආයතනයක් වන අවස්ථාවේ දී, යෝග්‍යතාවය තක්සේරු කිරීම පිළිබඳ නිර්ණායක බලපත්‍රලාභී මුදල් සමාගම වෙත උපදේශනමය අනුශාසකත්වය ලබා දීමෙහි නිරත වන ප්‍රධාන උපදේශකවරයා හෝ අනුශාසකවරයා සඳහා අදාළ විය යුතුය.

6.4 යෝග්‍යතා තක්සේරුව මත බලපෑමක් එල්ල කරනු ලබන සපයන ලද තොරතුරුවලට අදාළ සියලු පසුකාලීන සිදුවීම් පිළිබඳ හැකිතාක් ඉක්මනින් සමාගම් ලේකම් පූර්ණ වශයෙන් දැනුවත් කිරීමට ප්‍රධාන වගකිය යුතු පුද්ගලයන් විසින් කටයුතු කළ යුතුය.

6.5 බලපත්‍රලාභී මුදල් සමාගමේ සමාගම් ලේකම්වරයා විසින් යෝග්‍යතා තක්සේරුව මත බලපෑමක් ඇති කරනු ඇති ප්‍රධාන වගකිව යුතු පුද්ගලයා පිළිබඳ සපයන ලද තොරතුරුවලට අදාළව සියලු පසුකාලීන අවස්ථා සම්බන්ධව එවැනි තොරතුරු දැන ගැනීමට ලැබීමෙන් දින හතක් (7) ඇතුළත අධ්‍යක්ෂවරයා වෙත දැනුම් දිය යුතු වේ.

6.6 බලපත්‍රලාභී මුදල් සමාගමක ඕනෑම ප්‍රධාන වගකිව යුතු පුද්ගලයෙකුට අදාළව අධීක්ෂණයේදී ගැටලු හඳුනා ගත් ඕනෑම අවස්ථාවකදී අධ්‍යක්ෂවරයා විසින් තීරණය කරන්නේ නම්, ප්‍රධාන වගකිව යුතු පුද්ගලයාගේ යෝග්‍යතාවය තක්සේරු කිරීම සිදු කළ යුතුය.

7. යෝග්‍යතාවය තක්සේරු කිරීම සඳහා කාල වකවානු

7.1 නව ප්‍රධාන වගකිව යුතු පුද්ගලයන් නම් කිරීම, තෝරා පත් කිරීම හෝ පත් කිරීම අපේක්ෂිත තෝරා පත් කිරීමේ හෝ පත් කිරීමේ දිනයට වැඩ කරන දින විස්සකට (20) පෙර තොරතුරු සහ ලේඛන යොමු කිරීම.

7.2 දැනට/අඛණ්ඩව කටයුතු කරන ප්‍රධාන වගකිව යුතු පුද්ගලයන්

(අ) අධ්‍යක්ෂ මණ්ඩලය සහ ප්‍රධාන විධායක නිලධාරී

අදාළ බලපත්‍රලාභී මුදල් සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීමට වැඩ කරන දින විස්සකට (20) පෙර හෝ අදාළ බලපත්‍රලාභී මුදල් සමාගමේ මුදල් වර්ෂයට පසු තෙමසක් ගත වන දිනය යන දින දෙකෙන් පූර්වයෙන් යෙදෙන දිනයේ දී වාර්ෂික තොරතුරු සහ ලේඛන යොමු කිරීම.

(ආ) අනෙකුත් ප්‍රධාන වගකිව යුතු පුද්ගලයන්
රැකියා උසස් වීම්, කොන්ත්‍රාත් අලුත් කිරීම් සහ විශේෂ දැනුමක් සහ/හෝ නිපුණතා අවශ්‍ය තනතුරු වෙත සිදු කරන පාර්ශ්වීය චලන වෙනස්කම් මත වැඩ කරන දින විස්සකට (20) පෙර තොරතුරු සහ ලේඛන යොමු කිරීම.

8. ඉල්ලා අස්වීම/ විශ්‍රාම යාම/ සේවයෙන් ඉවත් කිරීම

8.1 අධ්‍යක්ෂ මණ්ඩලයේ කිසිදු අධ්‍යක්ෂවරයෙකු හෝ ප්‍රධාන විධායක නිලධාරියෙකු අධ්‍යක්ෂවරයාගේ පූර්ව අනුමැතියෙන් තොරව, බලපත්‍රලාභී මුදල් සමාගමෙන් ඉල්ලා අස්වීම, විශ්‍රාම යෑම හෝ සේවයෙන් ඉවත් කිරීම සිදු නොකළ යුතුය. ඉල්ලා අස්වීම හෝ සේවයෙන් ඉවත් කිරීමේ අවස්ථාවක දී, බලපත්‍රලාභී මුදල් සමාගම විසින් අධ්‍යක්ෂවරයා වෙත ඊට හේතු යොමු කළ යුතුය.

8.2 අධ්‍යක්ෂ මණ්ඩලය සහ ප්‍රධාන විධායක නිලධාරී හැරුණු කොට බලපත්‍රලාභී මුදල් සමාගමේ වෙනත් ඕනෑම ප්‍රධාන වගකිව යුතු පුද්ගලයන්ගේ ඉල්ලා අස්වීම, විශ්‍රාම යෑම හෝ සේවයෙන් ඉවත් කිරීම සිදුවන අවස්ථාවේ සිට වැඩ කරන දින තුනක් (3) තුළ දී බලපත්‍රලාභී මුදල් සමාගම විසින් අධ්‍යක්ෂවරයා වෙත දැනුම් දිය යුතුය.

9. මුදල් මණ්ඩලය වෙත අභියාචනා ඉදිරිපත් කිරීම

9.1 ඉහත 6.2 වන විධානය යටතේ නම් කිරීම, තෝරා පත් කිරීම හෝ පත් කිරීම අධ්‍යක්ෂවරයා විසින් ප්‍රතික්ෂේප කිරීමෙන් අගතියට පත් පුද්ගලයෙකු බලපත්‍රලාභී මුදල් සමාගමක් විසින් සිදු කරන ලද එම දැනුම් දීම ලැබීමෙන් වැඩ කරන දින දහයක් (10) ඇතුළත මුදල් මණ්ඩලය වෙත හේතු දක්වමින් සාධාරණාත්මක ආකාරයෙන් අභියාචනයක් ඉදිරිපත් කළ යුතුය.

9.2 අධ්‍යක්ෂවරයා විසින් ලබා දෙන ලද හේතු සහ අගතියට පත් පාර්ශ්වයේ විරුද්ධත්වයන් සලකා බැලීමෙන් අනතුරුව, අධ්‍යක්ෂවරයා විසින් සිදු කරන ලද ප්‍රතික්ෂේප කිරීම තහවුරු කරන්නේ ද යන්න හෝ ඊට ඔබ්බෙන් ක්‍රියා කරන්නේ ද යන්න තීරණය කිරීමට මුදල් මණ්ඩලය කටයුතු කරනු ඇත.

10. බලාත්මක වන දිනය

10.1 මෙම විධාන 2022.04.01 දින සිට බලාත්මක විය යුතුය.

11. අර්ථ නිරූපණ

11.1 'අධ්‍යක්ෂ' යන්නෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවෙහි ''අධ්‍යක්ෂවරයා'', යන්න අදහස් විය යුතුය.

12. විධාන අහෝසි කිරීම

12.1 12.2 වන විධානයට යටත්ව, 2011 අංක 03 දරන මුදල් සමාගම් (අධ්‍යක්ෂවරුන්ගේ සහ විධායක කාර්යයන්හි නියුතු නිලධාරීන්ගේ යෝග්‍යතාවය තක්සේරු කිරීම) විධානය මෙම විධාන ක්‍රියාත්මක කිරීමේ දිනයේ සිට අහෝසි කෙරෙනු ඇත.

12.2 2011 අංක 03 දරන මුදල් සමාගම් (අධ්‍යක්ෂවරුන්ගේ සහ විධායක කාර්යයන්හි නියුතු නිලධාරීන්ගේ යෝග්‍යතාවය තක්සේරු කිරීම) විධානය යටතේ යෝග්‍ය බවට නිර්ණය කර ඇති, 4.1 වන විධානයෙහි සඳහන් බලපත්‍රලාභී මුදල් සමාගමක ප්‍රධාන වගකිව යුතු පුද්ගලයන් මෙම විධානයන් යටතේ යෝග්‍යතාවය තක්සේරුව කරන තෙක් සුදුසු සහ යෝග්‍ය බවට සැලකෙයි.

නිවාඩ් අජිත් ලෙස්ලි කබ්රාල්
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

ඇමුණුම I

ප්‍රධාන වගකිව යුතු පුද්ගලයන්ගේ යෝග්‍යතාවය තක්සේරු කිරීම සඳහා අවශ්‍ය තොරතුරු සහ ලේඛන

1. අවශ්‍ය තොරතුරු සහ ලේඛන

1.1 නව ප්‍රධාන වගකිව යුතු පුද්ගලයන් නම් කිරීම, තෝරා පත් කිරීම හෝ පත් කිරීම

(අ) විධානයන්හි දී ඇති මාර්ගෝපදේශ ප්‍රකාරව උපලේඛනය I ට අනුව සම්පූර්ණ කොට ඇති දිවුරුම් ප්‍රකාශයේ මුල් පිටපත.

(ආ) අදාළ ආයතනයේ පවරා ඇති රාජකාරීන්හි කාර්යසාධන මට්ටමට අදාළව පත්වීමට පෙර අධ්‍යක්ෂභාවය, රැකියාව හෝ කොන්ත්‍රාත් කාලය දැරූ සේවායෝජකයාගෙන් ලබාගත් ලිපියක්.

(ඇ) ඉහත කරුණුවලට අමතරව, බලපත්‍රලාභී මුදල් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය, අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු හෝ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය වෙත උපදේශකවරයෙකු හෝ අනුශාසකවරයෙකු පත් කිරීම සඳහා සාධාරණීකරණයක් සමඟ මණ්ඩල යෝජනා සම්මතයක්.

1.2 දැනට /අඛණ්ඩව කටයුතු කරන ප්‍රධාන වගකිව යුතු පුද්ගලයන්

1.2.1 අධ්‍යක්ෂ මණ්ඩලය සහ ප්‍රධාන විධායක නිලධාරී

අවශ්‍ය තොරතුරු සහ ලේඛන	සභාපති	අධ්‍යක්ෂ මණ්ඩලය	ප්‍රධාන විධායක නිලධාරී
(අ) <u>දිවුරුම් ප්‍රකාශයේ මුල් පිටපත</u> විධානයන්හි දී ඇති මාර්ගෝපදේශ වලට අනුකූලව සම්පූර්ණ කර දක්වා ඇති උපලේඛන අංක I අනුව	X	X	X
(ආ) <u>ස්වයං තක්සේරුව</u> පසුගිය මාස 12 තුළ දී මූල්‍ය කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා ඔහුගේ/ ඇයගේ නායකත්වය යටතේ සිදු කර ගෙන යනු ලබන විශේෂ පැවරුම්/ව්‍යාපෘති සහ මුදල් සමාගමේ අගය ඉහළ නැංවීමට ඔහු/ඇය සතු අනාගත සැලසුම් විස්තර යනාදී කරුණු ඇතුළත් කිරීම.	X	X	X
(ඇ) <u>සභාපතිගේ තක්සේරුව</u> පසුගිය මාස 12 තුළ දී ලබාගත් ප්‍රධාන ජයග්‍රහණ සමඟ දැක්වූ දායකත්වය සහ කාර්යසාධනය	-	X	X
(ඈ) <u>අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය</u> අධ්‍යක්ෂභාවය අඛණ්ඩව කර ගෙන යන, වයස අවුරුදු 70 ට වැඩි සහ උපරිම වයස අවුරුදු 75 වන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්. අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතයක් ඔස්සේ එවැනි අධ්‍යක්ෂ මණ්ඩලයක අධ්‍යක්ෂවරයෙකු /අධ්‍යක්ෂවරයන් අඛණ්ඩව කටයුතු කිරීම මඟින් බලපත්‍රලාභී මුදල් සමාගම වෙත අත්වන ප්‍රතිලාභය ප්‍රමාණවත් ලෙස විස්තර කළ යුතු අතර, එය ලේඛන/සාක්ෂි මඟින් හැකි සෑම අවස්ථාවක දී ම සනාථ කළ යුතුය.	-	X	-
(ඉ) <u>විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ තක්සේරු කිරීම සම්බන්ධයෙන් සභාපතිවරයාගේ කාර්යසාධනය</u> සභාපතිවරයාගේ කාර්යසාධනය, විධායක නොවන අධ්‍යක්ෂවරුන් විසින් වාර්ෂික ස්වාධීන තක්සේරුව සිදු කිරීම	X	-	-

1.2.2 වෙනත් ප්‍රධාන වගකිව යුතු පුද්ගලයන්

(අ) <u>දිවුරුම් ප්‍රකාශයේ මුල් පිටපත</u>
විධානයන්හි දී ඇති මාර්ගෝපදේශවලට අනුකූලව සම්පූර්ණ කොට ඇති උපලේඛන අංක I.

(ආ) <u>ස්වයං - තක්සේරුව</u>
පසුගිය මාස 12 තුළ දී මූල්‍ය කාර්යසාධනය ඉහළ නැංවීම, ඔහුගේ/ඇයගේ නායකත්වය යටතේ සිදු කර ගෙන යනු ලැබූ විශේෂ පැවරුම්/ව්‍යාපෘති සහ මෙම මූල්‍ය ආයතනයේ අගය ඉහළ නැංවීමට ඔහු/ඇය සතු අනාගත සැලසුම් විස්තර කිරීම යනාදී කරුණු.

(ඇ) උක්ත කරුණු වලට අමතරව, පසුගිය මාස 12 තුළ දී අත්කර ගත් ප්‍රධාන ජයග්‍රහණ සමඟ ලබා දුන් දායකත්වය සහ කාර්යසාධනය ආවරණය කරමින්, පහත තක්සේරු සිදු කිරීම අවශ්‍ය වේ.

(i) ප්‍රධාන විධායක නිලධාරියාගේ තක්සේරුව

- ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය වෙත උපදේශකවරයෙක් හෝ අනුශාසකවරයෙක්

- අනෙකුත් ප්‍රධාන වගකිව යුතු පුද්ගලයන්

(ii) සභාපතිවරයාගේ තක්සේරුව

- අධ්‍යක්ෂ මණ්ඩලය හෝ අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු වෙත උපදේශකවරයෙක් හෝ අනුශාසකවරයෙක්

උපලේඛනය I

බලපත්‍රලාභී මුදල් සමාගමක ප්‍රධාන වගකිව යුතු පුද්ගලයන්ගේ යෝග්‍යතාවය තක්සේරු කිරීම

දිවුරුම් ප්‍රකාශය

I වන කොටස: 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතෙහි 12 වන වගන්තිය ප්‍රකාරව යොමු කිරීමට නියමිත තොරතුරු

විදේශ ගමන් බලපත්‍රයේ ප්‍රමාණයේ ඡායාරූපය (පසුගිය මාස 6 තුළ දී ලබා ගත්)

බලපත්‍රලාභී මුදල් සමාගමේ නම :

ජාතික හැඳුනුම්පත් අංක[1] ..... දරන සහ විදේශ ගමන් බලපත්‍ර අංක..... දරන .... යන ලිපිනයෙහි පදිංචි ..... (සම්පූර්ණ නම) වන මා, [බෞද්ධ/හින්දු/මුස්ලිම්/ක්‍රිස්තියානි/කතෝලික/වෙනත් ..... (කරුණාකර සුදුසු පරිදි නිශ්චිතව දක්වන්න)] ආගමිකයෙකු වශයෙන් [ගම්භීරතා පූර්වකව, අවංකව හා සත්‍ය ලෙස ද මින් ප්‍රතිඥා/දිවුරුම් දෙන අතර, (කරුණාකර නිශ්චිතව දක්වන්න)] පහත පරිදි ප්‍රකාශ කරමි:

1) 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ බලපත්‍රලාභී මුදල් සමාගමක් වන ..... (මුදල් සමාගමේ නම) හි ..... (තනතුර) වශයෙන් නම් කිරීමට, තෝරා පත් කිරීමට හෝ පත් කිරීමට හෝ නම් කිරීමට, තෝරා පත් කිරීමට හෝ පත් කිරීමට යෝජනා කර ඇති ඉහත නම සඳහන් සන්තකකරු/දිවුරුම් ප්‍රකාශක[2] මම වෙමි.

2) මගේ පෞද්ගලික තොරතුරු පහත පරිදි වන බවට මම ප්‍රකාශ කරමි:

2.1	(i) මූලකුරු සමඟ නම:		
	(ii) නාමය: මයා/ මිය/ මෙනවිය/ ආචාර්ය/ මහාචාර්ය/ වෙනත් (කරුණාකර නිශ්චිතව දක්වන්න)		(iii) දිවුරුම් ප්‍රකාශය අත්සන් කරන දිනට වයස: අවුරුදු/මාස/දින
	(iv) උපන් දිනය: වර්ෂය/මාසය/දිනය		(v) ස්ත්‍රී/පුරුෂභාවය:
	(vi) සිවිල් තත්ත්වය:		(vii) ජාතිය:
	(viii) පුරවැසිභාවය[3]		(ix) දේශීය/විදේශීය:
2.2	(i) ඇමතුම් විස්තර	ස්ථිර ලිපිනය:	
		නේවාසික ලිපිනය:	
	(ii) දුරකථන අංක	ජංගම:	
		ස්ථාවර අංකය:	
		ෆැක්ස්:	

1 විදේශිකයන් සඳහා අදාළ නොවේ.

2 ප්‍රතිඥාවක් සිදු කරන පුද්ගලයෙකු ප්‍රකාශකයෙකු ලෙස හැඳින්වෙන අතර, දිවුරුම් දෙන පුද්ගලයෙකු දිවුරුම් සාක්ෂිකරුවෙකු ලෙස හැඳින්වේ. පුද්ගලයෙකුට දිවුරුම් දීමක් සිදු කිරීමට සවිඥානකව විරුද්ධත්වයක් ඇත්නම්, ඔහු දිවුරුම් දීම වෙනුවට, ප්‍රතිඥා දීමක් සිදු කරනු ඇත.

3 ද්විත්ව පුරවැසියෙකු ඔහු/ඇයව සැලකිය යුත්තේ දේශීය පුද්ගලයෙකු ලෙසද, නැතහොත් විදේශිකයෙකු ලෙස ද යන්න සඳහන් කළ යුතුය.

	(iii) විද්‍යුත් තැපෑල	විද්‍යුත් තැපෑල - නිල:		
		විද්‍යුත් තැපෑල - පෞද්ගලික:		
2.3	රැකියාව හෝ වෘත්තිය:			
2.4	(i) නම් කිරීම, තෝරා පත් කිරීම හෝ පත් කිරීම: බලපත්‍රලාභී මුදල් සමාගමේ තනතුර/නිල නාමය:		(ii) තනතුර/නිල නාමය සඳහා පත් කළ දිනය: (වර්ෂය/මාසය/දිනය)	
2.5	පත්වීමේ ස්වභාවය [අදාළ කොටුව (කොටු) තුළ x ලකුණ සළකුණු කරන්න]:			
	ස්වාධීන[4]		විධායක	
	ස්වාධීන නොවන		විධායක නොවන	
	ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ		වෛකල්පිත	
	වෙනත් (නිශ්චිතව දක්වන්න):			
	ස්වාධීන නොවන්නේ නම් ස්වාධීන නොවන ලෙස තීරණය කිරීමට හේතු:			
	ප්‍රධාන කොටස් හිමියා/හිමියන් විසින් නම් කරන ලද්දේ නම්, එලෙස නම් කරන ලද කොටස් හිමියා/හිමියන් ගේ නම/නම්:			
	වෛකල්පිත නම් ඔහුට/ඇයට අදාළ ප්‍රධාන අධ්‍යක්ෂවරයාගේ නම:			
2.6	(i) වාර්ෂික වේතනය (විස්තරාත්මක තොරතුරු සහිතව):			
	(ii) ප්‍රධාන වගකිව යුතු පුද්ගලයා විසින් ලබා ගන්නා ආදායම්/ප්‍රතිලාභ වල වාර්ෂික වටිනාකම සහ එය බලපත්‍රලාභී මුදල් සමාගමට සාපේක්ෂ අගය:			
	(iii) බලපත්‍රලාභී මුදල් සමාගම සහ එම ප්‍රධාන වගකිව යුතු පුද්ගලයාගේ ඥාතීන් විසින් දරන වියදම හෝ වියදමක් ප්‍රතිපූර්ණය කිරීම (ණයපත් බිල්, උපයෝගීතා බිල්පත් යනාදිය):			
2.7	2.7.1. 2011 අංක 42 දරන මූදල් ව්‍යාපාර පනතෙහි 74 වන වගන්තිය ප්‍රකාරව ඥාතීන් පිළිබඳ විස්තර			
	(i) භාර්යාව හෝ ස්වාමි පුරුෂයාගේ සම්පූර්ණ නම:			
	(ii) ජා.හැ.අංකය[1]:		ගමන් බලපත්‍ර අංකය:	
	2.7.2. යැපෙන දරුවන්ගේ විස්තර:			

සම්පූර්ණ නම	ජා.හැ.අංකය[1]	ගමන් බලපත්‍ර අංකය

3) පහත දක්වා ඇති අධ්‍යාපනික සහ/ හෝ වෘත්තීය සුදුසුකම/ සුදුසුකම් මා සතු බවට මම ප්‍රකාශ කරමි.

සුදුසුකම් (අධ්‍යාපනික)	අදාළ විෂයය[5]	රට	ආයතනයේ නම	සම්පූර්ණ කළ වර්ෂය
සුදුසුකම් (වෘත්තීමය)				

4) බැංකුකරණය, මූල්‍යය, ව්‍යාපාර හෝ පරිපාලනය හෝ වෙනත් අදාළ විෂයයක්[5] මා සතු සඵලදායී අත්දැකීම පහත පරිදි බව මම ප්‍රකාශ කරමි:

තනතුර	ආයතනයේ නම	නිල නාමය/ තනතුර	පත් කිරීමේ ස්වභාවය (අදාළ පරිදි)	කාර්ය විශේෂීකරණය	පත් කිරීමේ දිනය (වර්ෂය/ මාසය/දිනය)	සේවා කාලය (වර්ෂය/ මාසය/දිනය සිට වර්ෂය/ මාසය/දිනය දක්වා)
පෙර තනතුර						
(i) අධ්‍යක්ෂභාවය						
(ii) වෙනත්						
වර්තමාන තනතුර						
(i) අධ්‍යක්ෂභාවය						
(ii) වෙනත්						

මේ හා සම්බන්ධව, බලපත්‍රලාභී මුදල් සමාගම විසින් ලේඛනමය සාක්ෂි පවත්වා ගෙන යා යුතු අතර, අධ්‍යක්ෂවරයාට අවශ්‍ය වූ විට එවැනි සාක්ෂි යොමු කළ යුතුය.

4 මුදල් ව්‍යාපාර පනත ප්‍රකාරව, 2021 අංක 05 දරන ආයතනික යහපාලන විධානය

5 බැංකුකරණය/ මූල්‍යය, ව්‍යාපාර/ පරිපාලනය, ආර්ථික විද්‍යාව, ගිණුම්කරණය/ විගණනය/ මුදල් විශ්ලේෂණය, ආයෝජනය කළමනාකරණය/ ප්‍රාග්ධන වෙළඳපොල, තොරතුරු තාක්ෂණය, ක්‍රමෝපායික සැලසුම්කරණය, අවදානම් කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය, නීතිය සහ නියාමනය සහ බලපත්‍රලාභී මුදල් සමාගමෙහි විධිනියෝගයට අනුව අලෙවිකරණය සහ නිශ්චිත සුදුසුකම්

5) ඉහත සඳහන් තොරතුරුවලට අමතරව, පහත දක්වා ඇති අමතර සුදුසුකම් මා සතු වග ප්‍රකාශ කර සිටිමි.

විශේෂ පැවරුම්/උපදේශක ධූරයන්	ආයතනයේ නම	විස්තරය	සේවා කාලය (වර්ෂය/ මාසය/දිනය) සිට (වර්ෂය/ මාසය/දිනය) දක්වා
(i)			
(ii)			
කැපී පෙනෙන දායකත්වයන් (ප්‍රකාශන, පවත්වන ලද සම්මන්ත්‍රණ, පර්යේෂණ ආදිය)			
පර්යේෂණයේ/ ප්‍රකාශනයේ මාතෘකාව		ආයතනය/ස්ථානය	වර්ෂය

6) බලපත්‍රලාභී මුදල් සමාගම් සහ එහි සම්බන්ධිත ආයතන (පාලිත[6], හවුල්කාර[6] සහ අනෙකුත් සමාගම්[7]), බලපත්‍රලාභී බැංකු, කල්බදු මූල්‍යකරණ සමාගම් සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි වී ඇති/ බලපත්‍රලාභී ප්‍රාථමික වෙළඳුන් සමඟ කොටස් හිමිකාරීත්වය දරන බව/ නොදරන බව ප්‍රකාශ කරමි.

ආයතනයේ/ ආයතනයන්හි නම	ඡන්දය අයිතිය ඇති/නැති	කොටස් ප්‍රමාණය		ප්‍රතිශතයක් ලෙස	
		සෘජු	වක්‍ර	සෘජු	වක්‍ර

7) ව්‍යාපාර ගනුදෙනු

7.1. බලපත්‍රලාභී මුදල් සමාගම් සහ එහි සම්බන්ධිත ආයතන (පාලිත, හවුල්කාර සහ අනෙකුත් සමාගම්) සහ වෙනත් සම්බන්ධිත පාර්ශවල බලපත්‍රලාභී බැංකු, කල්බදු මූල්‍යකරණ සමාගම් සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි වී ඇති/ බලපත්‍රලාභී ප්‍රාථමික වෙළඳුන් සමඟ පත්වීමට පෙර ආසන්නතම වසර දෙක තුළ පහත සඳහන් ව්‍යාපාර ගනුදෙනු තවදුරටත් පවතින/ පවත්වාගෙන ගිය බව බව ප්‍රකාශ කරමි.

ආයතනයේ/ ආයතනයන්හි නම	ගනුදෙනුවේ දිනය (වර්ෂය/ මාසය/දිනය)	වර්ෂය/මාසය/දිනට මුදල් ප්‍රමාණය (රු. මිලි.)		වර්ගීකරණය (සක්‍රීය/ අක්‍රීය)	ඇප වර්ගය සහ වටිනාකම (රු. මිලි.)	බලපත්‍රලාභී මුදල් සමාගමේ මූලික ප්‍රාග්ධනයේ ප්‍රතිශතයක් ලෙස
		සීමාව	නොපියවූ ප්‍රමාණය			
ලබාගත් ණය						
(i) වර්තමාන						
(ii) පත්වීමට පෙර						
ආයෝජන[8]						
(i) වර්තමාන						
(ii) පත්වීමට පෙර						
තැන්පතු						
(i) වර්තමාන						
(ii) පත්වීමට පෙර						

8) සමීප ඥාතීන්ගේ පත්වීම්, කොටස් හිමිකාරීත්වයන් සහ ව්‍යාපාර ගනුදෙනු

8.1 බලපත්‍රලාභී මුදල් සමාගම් සහ ඔවුන්ගේ සම්බන්ධිත ආයතන (පාලිත, හවුල්කාර සහ අනෙකුත් සමාගම්), බලපත්‍රලාභී බැංකු, කල්බදු මූල්‍යකරණ සමාගම් සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි වී ඇති/ බලපත්‍රලාභී ප්‍රාථමික වෙළඳුන් සමඟ අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරීන් සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය ලෙස වර්තමානයේ තනතුරු දරන සමීප ඥාතීන්ගේ පහත සඳහන් තොරතුරු ප්‍රකාශ කර සිටිමි.

සමීප ඥාතියාගේ නම	ආයතනයේ නම	දරන තනතුර

6. 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 74 වන වගන්තිය ප්‍රකාරව අනෙකුත් ආයතන සමඟ සෑහෙන සබඳතාවක් පවතින ආයතන වේ.
7. මුදල් ව්‍යාපාර පනතේ 74 වන වගන්තිය ප්‍රකාරව වෙනත් සමාගම් කෙරෙහි සැලකිය යුතු උනන්දුවක් දක්වයි.
8 ණය උපකරණවල ආයෝජන

8.2 බලපත්‍රලාභී මුදල් සමාගම් සහ ඔවුන්ගේ සම්බන්ධිත ආයතන (පාලිත, හවුල්කාර සහ අනෙකුත් සමාගම්), බලපත්‍රලාභී බැංකු, කල්බදු මූල්‍යකරණ සමාගම් සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි වී ඇති/ බලපත්‍රලාභී ප්‍රාථමික වෙළඳුන් සමඟ කිසියම් සමීප ඥාතියෙකු ඍජු හෝ වක්‍ර කොටස් හිමිකාරීත්වය පිළිබඳ පහත සඳහන් තොරතුරු ප්‍රකාශ කර සිටිමි.

සමීප ඥාතීයාගේ නම	ආයතනයේ/ ආයතනයන්හි නම	කොටස් ප්‍රමාණය		ප්‍රතිශතයක් ලෙස	
		ඍජු	වක්‍ර	ඍජු	වක්‍ර

8.3 බලපත්‍රලාභී මුදල් සමාගම් සහ ඔවුන්ගේ සම්බන්ධිත ආයතන (පාලිත, හවුල්කාර සහ අනෙකුත් සමාගම්) බලපත්‍රලාභී බැංකු, කල්බදු මූල්‍යකරණ සමාගම් සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි වී ඇති/ බලපත්‍රලාභී ප්‍රාථමික වෙළඳුන් සමඟ පත්වීමට පෙර ආසන්නතම වසර දෙක තුළ පහත සඳහන් ව්‍යාපාර ගනුදෙනු මාගේ සමීප ඥාතීන් තවදුරටත් පවතින/ පවත්වාගෙන ගිය බව බව ප්‍රකාශ කරමි.

ආයතනයේ/ ආයතනයන්හි නම	ගනුදෙනුවේ දිනය (වර්ෂය/මාසය/දිනය)	වර්ෂය/මාසය/දිනට මුදල් ප්‍රමාණය (රු. මිලි.)		වර්ගීකරණය (සක්‍රීය/ අක්‍රීය)	ඇප වර්ගය සහ වටිනාකම (රු. මිලි.)	බලපත්‍රලාභී මුදල් සමාගමේ මූලික ප්‍රාග්ධනයේ ප්‍රතිශතයක් ලෙස
		සීමාව	නොපියවූ ප්‍රමාණය			
ලබාගත් ණය						
ආයෝජන[8]						

9) ශ්‍රී ලංකාවේ හෝ විදේශ රටක පොලීසියක, ඕනෑම නියාමන හෝ අධීක්ෂණ අධිකාරියක, වෘත්තිමය සංගමයක, විමර්ශන කොමිසමක, විනිශ්චය සභාවක හෝ නීතිය මඟින් ස්ථාපිත වෙනත් ආයතනයක වංචාවකට, රැවටීමකට, වංකභාවයකට හෝ ඒ හා සමාන අපරාධ කටයුත්තක් සම්බන්ධයෙන් විමර්ශනයකට හෝ පරීක්ෂණයකට මුහුණ දී සිටින බව/ මුහුණ දී නොසිටින බව ප්‍රකාශ කරමි.

10) ශ්‍රී ලංකාවේ හෝ විදේශ රටක ඕනෑම අධිකරණයක, නියාමන හෝ අධීක්ෂණ අධිකාරියක, වෘත්තිය සංගමයක, විමර්ශන කොමිසමක, විනිශ්චය සභාවක හෝ නීතිය මඟින් ස්ථාපිත වෙනත් ආයතනයක වංචාවකට, රැවටීමකට, වංකභාවයකට, නුසුදුසු හැසිරීමකට හෝ කිසියම් ව්‍යවස්ථාවකට හෝ රීතීන්ට, නියාමනයන්ට, විධානයන්ට හෝ නිර්ණායකයන්ට අනුකූල නොවීම ආදිය ඇතුළත් ඕනෑම ක්‍රියාවක් සිදු කිරීම හෝ සිදු කිරීම සම්බන්ධයෙන් පාර්ශවකරුවෙකු වූ බවට වැරදිකරුවෙකු වී ඇති බව/ නොමැති බව ප්‍රකාශ කරමි.

11) මූල්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් සිදු කරන ලද අපරාධයක් හෝ දූරාචාරය සම්බන්ධ කිසියම් වරදක් සිදු කිරීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ හෝ විදේශ රටක අධිකරණයක වරදකරුවෙකු වී ඇති බව/ වී නොමැති බව ප්‍රකාශ කරමි.

12) මා නිදහස නොලත් බුන්වත්කරුවෙකු වන/ නොවන බවත්, ශ්‍රී ලංකාවේ හෝ විදේශ රටක බංකොලොත් ලෙසින් ප්‍රකාශ කර ඇති/ නැති බව ප්‍රකාශ කරමි.

13) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් ස්ථානයක දී, ඕනෑම මූල්‍ය වගකීම් සපුරාලීමට මා හට හැකියාව ඇති/නැති බව ප්‍රකාශ කරමි.

14) ශ්‍රී ලංකාවේ හෝ විදේශ රටක කිසියම් අධිකරණයක් විසින් ලබා දෙන ලද තීන්දුවක් හෝ නියෝගයක් සම්පූර්ණ කිරීමට අසමත් වී ඇති/ නැති බව ප්‍රකාශ කරමි.

15) ශ්‍රී ලංකාවේ හෝ විදේශ රටක කිසියම් නිසි අධිකරණ බලතල හිමි අධිකරණයක් විසින් මානසික ගැටලුවක් ඇති ලෙස ප්‍රකාශ කර ඇති/ නැති බව ප්‍රකාශ කරමි.

16) ශ්‍රී ලංකාවේ හෝ විදේශ රටක බලපත්‍රලාභී බැංකුවක හෝ වෙනත් ඕනෑම මූල්‍ය ආයතනයක හෝ සංස්ථාපිත ආයතනයක අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී/ විධායක කාර්යයන් හි නියුතු නිලධාරියෙකු ලෙස කටයුතු කිරීම නියාමන හෝ අධීක්ෂණ අධිකාරියක් විසින් අත්හිටුවීම හෝ වළක්වා ඇති/ නැති බව ප්‍රකාශ කරමි.

17) (i) බලපත්‍රය අත්හිටුවන ලද හෝ අවලංගු කරන ලද; හෝ

(ii) ගණන් බේරා වසන ලද හෝ ගණන් බේරා වසා දැමීමට නියමිත හෝ අනිවාර්යෙන් ඈවර කරන ලද;

ශ්‍රී ලංකාවේ හෝ විදේශ රටක ඕනෑම බැංකුවක හෝ මූල්‍ය ආයතනයක අධ්‍යක්ෂවරයෙකු, ප්‍රධාන විධායක නිලධාරියෙකු හෝ වෙනත් ඕනෑම අධිකාරී තනතුරක් දරා ඇති/ නැති බව ප්‍රකාශ කරමි.

18) මාගේ තනතුරට අදාළව මුදල් ව්‍යාපාර පනතේ යෝග්‍යතාවය තක්සේරු කිරීමේ ප්‍රතිපාදනය පිළිබඳව මා දැනුවත් අතර, ඉහත තොරතුරු මාගේ දැනුම අනුව සත්‍ය සහ සම්පූර්ණ බව තහවුරු කරමි. ඉහත ලබා දී ඇති තොරතුරු හා සම්බන්ධ සියලුම පසු සිදුවීම්, හැකි විගසින් බලපත්‍රලාභී මුදල් සමාගම වෙත දන්වා සිටීමට ප්‍රතිඥා දෙමි.

19) මා, ඉහත තනතුර සඳහා පත් කිරීම කිසිඳු ලිඛිත නීතියකින් නොවළක්වන බව ප්‍රකාශ කර සිටිමි.

20) මා, මුදල් ව්‍යාපාර පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව බලපත්‍රලාභී මුදල් සමාගමක ..... (තනතුර) සඳහා නම් කිරීමට, තෝරා පත් කිරීමට හෝ පත් කිරීමට යෝග්‍ය පුද්ගලයෙකු බව මාගේ උපරිම දැනුමට අනුව ප්‍රකාශ කරමි.

මෙහි ඇතුළත් සියලු ප්‍රකාශයන් (සන්තකකරු /ප්‍රකාශක) හට කියවා දීමෙන් ද, ඒවායේ අන්තර්ගත කරුණු ඔහු/ඇය විසින් වටහා ගැනීමෙන් සහ ඒවා සත්‍ය බව පිළිගැනීමෙන් ද අනතුරුව ..... (වර්ෂය, මාසය) ..... දින දී ..... හී දී අත්සන් තැබූ බව සහතික කරමි.

මා ඉදිරිපිට දී

....

අදාළ පරිදි මුද්දර අලවන්න

දිවුරුම් කොමසාරිස්/සාමදාන විනිශ්චයකාර

දෙවන කොටස - සමාගම් ලේකම් විසින් සම්පූර්ණ කළ යුතු වේ.

1. ආයතනික තොරතුරු

අධ්‍යක්ෂවරුන් සඳහා නාමයෝජනා කමිටුවේ/පත් කිරීමේ අධිකාරියේ නිර්දේශය	
තක්සේරු කිරීමේ නිර්ණායක නාමයෝජනා කමිටුව/ පත් කිරීමේ අධිකාරිය විසින් සලකා බලන ලද විශේෂිත දැනුම/ කුසලතා සඳහන් කරන්න.	
නිර්දේශ නාමයෝජනා කමිටුවේ/පත් කිරීමේ අධිකාරියේ සම්මත / තීරණය කිරීමේ වාර්තා අමුණන්න.	

2. අධ්‍යක්ෂ මණ්ඩලයේ සටහන්

(i) ඉහත සඳහන් තොරතුරු සම්බන්ධයෙන් වෙනත් පැහැදිලි කිරීමක්/ තොරතුරු.

(ii) බලපත්‍රලාභී මුදල් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කරන ලදී/ ..... (වර්ෂය/මාසය/දිනය) දින පැවැත්වුණු රැස්වීමේ දී, ඉහත සඳහන් නම් කිරීම, තෝරා පත් කිරීම හෝ පත් කිරීම / යෝජිත නම් කිරීම, තෝරා පත් කිරීම හෝ පත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

නම:

සමාගම් ලේකම්ගේ අත්සන සහ නිල මුද්‍රාව

දිනය:

බලපත්‍රලාභී මුදල් සමාගම් හි ප්‍රධාන වගකිව යුතු පුද්ගලයන් විසින් යොමු කළ යුතු දිවුරුම් ප්‍රකාශය නිසි අයුරින් සම්පූර්ණ කිරීම සඳහා උපදෙස්

ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී මුදල් සමාගම්හි ප්‍රධාන වගකිව යුතු පුද්ගලයින් විසින් යෝග්‍යතාවය තක්සේරු කිරීම සඳහා ප්‍රමාණවත් සහ නිවැරදි තොරතුරු ලබා දීම තහවුරු කිරීම සඳහා මෙම උපදෙස් මාලාව නිකුත් කරන ලදී.

1. **දිවුරුම් ප්‍රකාශය ලබා ගැනීමේ අරමුණ**

(i) ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී මුදල් සමාගම්හි ප්‍රධාන වගකිව යුතු පුද්ගලයින්ගෙන් දිවුරුම් පෙත්සම් ලබා ගැනීමේ අරමුණ වනුයේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මුදල් ව්‍යාපාර පනතේ විධිවිධාන ප්‍රකාරව ඔවුන්ගේ යෝග්‍යතාවය තක්සේරු කිරීම වේ. ඒ අනුව, ප්‍රධාන වගකිව යුතු පුද්ගලයන්ගේ යෝග්‍යතාවය තක්සේරු කිරීම සඳහා

සුදුසුකම්, අත්දැකීම්, අවංකභාවය සහ මුදල් ව්‍යාපාර පනතේ නිශ්චය කර ඇති අනෙකුත් අවශ්‍යතා සමඟ අනුකූල වීම පරීක්ෂා කිරීම සඳහා සවිස්තරාත්මක තොරතුරු බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවට අවශ්‍ය වේ. ගැටලුකාරී තත්ත්වයක දී මෙම දිවුරුම් ප්‍රකාශය නීත්‍යානුකූලව බලපැවැත්වෙන ලේඛනය වේ.

2. දිවුරුම් ප්‍රකාශය

(i) බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ලබා දෙන ලද ආකෘතිය අනුව නව ලේඛනයක් ලෙස දිවුරුම් ප්‍රකාශය සකස් කිරීම වඩාත් සුදුසු වන අතර එමගින් අනවශ්‍ය වචන ඇතුළත් කිරීම වළක්වා ගත හැක. කෙසේ වුවද, ලබා දී ඇති ආකෘතිය සම්පූර්ණ කළේ නම්, සියලු වෙනස්කම්, මකා දැමීම් සහ පේළි අතර ලිවීම් ආදිය එකී සංශෝධනයන් කළ සැනින්, දිවුරුම් දීමේ කොමසාරිස්වරයකු/ සාමදාන විනිශ්චයකාරවරයෙකු විසින් අත්සන තැබිය යුතු වේ.

(ii) සියලුම හිස්තැන් නිසි අයුරින් සම්පූර්ණ කළ යුතු වේ.

(iii) නිලධාරියාගේ ආගම අනුව සුදුසු වචන භාවිත කළ යුතු වේ. නිලධාරියා විසින් ඔහුගේ/ඇයගේ ආගම හෙළි කිරීමෙන් වැළකී සිටින්නේ නම්/ විරෝධය පාන්නේ නම්,

අ) ඔහු/ඇය අදේව දෘශ්ටිකයෙකු බව හෝ දිවුරුම් ප්‍රකාශයෙහි සඳහන් නොවන ආගමකට අයත් වන බව; හෝ

ආ) ඔහු/ඇය විසින් ආගම හෙළි කිරීමට විරෝධයක් දක්වන බව;

සඳහන් කරමින් අදාළ නිළධාරියා විසින් තහවුරු කිරීමක් යොමු කළ යුතු වේ.

(iv) අනවශය වචන(ය) කපා හරින්න. අනවශ්‍ය වචන කපා හැර ඇත්නම්, එවැනි සංශෝධනයක් කළ සැනින් දිවුරුම් කොමසාරිස්වරයකු/ සාමදාන විනිශ්චයකාරවරයෙකු විසින් අත්සන තැබිය යුතු වේ.

(v) අදාළ පුද්ගලයා විදේශිකයෙකු සහ විදේශ රටක සිට දිවුරුම් ප්‍රකාශයට අත්සන් තැබුවේ නම්:

අ) ඔහු අත්සන තැබූ රටේ දිවුරුම් දීමේ කොමසාරිස්වරයකු හෝ ඒ හා සමාන බලතල හිමි තැනැත්තෙකු විසින් අදාළ පුද්ගලයාගේ අත්සන සහතික කළ යුතු වේ.

ආ) අදාළ ප්‍රධාන වගකිව යුතු පුද්ගලයා වාසය කරන රටේ ශ්‍රී ලංකා රාජ්‍යතාන්ත්‍රික හෝ කොන්සියුලර් නිලධාරියෙකු ඉදිරිපිට දී හෝ එවැනි රටක ක්‍රියාත්මක වන නීති ප්‍රකාරව සහතික කිරීම කළ යුතු වේ.

(vi) අදාළ වේ නම්, දිවුරුම් ප්‍රකාශය අත්සන් කරන දිනට අදාළ වටිනාකම අනුව මුද්දරයක් ඇලවිය යුතු වේ.

(vii) 'මා ඉදිරිපිට දී' අදාළ පුද්ගලයා අත්සන තැබූ සැනින් දිවුරුම් දීමේ කොමසාරිස්වරයකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු විසින් සහතික කළ යුතු වේ.

(viii) දෙවන කොටස සමාගම් ලේකම්වරයා විසින් සම්පූර්ණ කළ යුතු අතර, අදාළ පත්වීම සම්බන්ධයෙන් නාමයෝජනා කමිටුවේ/ පත් කිරීමේ අධිකාරියේ යෝජනාවේ/ තීරණයේ පිටපතක් අමුණන්න.

(ix) දෙවන දෙවන කොටසේ 2(1) අයිතමය සඳහා දැක්වීමට අදහස් නොමැති නම්, එහි, අදාළ නැත/ නැත/ කිසිවක් නැත ලෙස සඳහන් කරන්න.